unesco

විචාරශීලීව සිතමු, නැණවත්ව තෝරමු!

මාධ්‍ය හා
තොරතුරු
සාක්ෂර
පුරවැසියන්

ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා මාධ්‍ය හා
තොරතුරු සාක්ෂරතා විෂයමාලාව

ප්‍රංශයේ 75352, 07 SP පැරිසියේ නො. 07, "ප්ලාස් ද ෆොන්ටෙනොය"හි පිහිටි එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය විසින් 2021 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලදි.

© UNESCO 2021

ISBN 978-92-3-100448-3

Attribution-ShareAlike 3.0 IGO (CC-BY-SA 3.0 IGO) බලපත්‍රය යටතේ මෙම ප්‍රකාශනයට විවෘත ප්‍රවේශය ලබා ගත හැකි වේ(http://creativecommons.org/licenses/by-sa/3.0/igo/). මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය භාවිත කිරීම මගින්, එහි පරිශීලකයන් යුනෙස්කෝ විවෘත ප්‍රවේශ සුරක්ෂිතාගාරයේ භාවිතයට අදාළ කොන්දේසි පිළිගනිමින් එම නියමයන්ට බැඳි සිටිනු ඇත (http://en.unesco.org/open-access/terms-use-ccbysa-en).

මෙම ප්‍රකාශනය තුළ භාවිත කර තිබෙන තනතුරු නාම සහ කරුණු ඉදිරිපත් කිරීම් මගින් මොනයම් හෝ රටක, දේශයක, නගරයක හෝ ප්‍රදේශයක හෝ එහි බලධාරීන්ගේ නෛතික තත්ත්වය සම්බන්ධයෙන් හෝ එහි සීමා හෝ මායිම් නිර්ණය කිරීම සම්බන්ධයෙන් කවරහෝ ආකාරයකින් යුනෙස්කෝ පාර්ශ්වයෙන් කිසිදු මත ප්‍රකාශ කිරීමක් ගම්‍ය නොවේ.

මෙම පොතේ ඇතුළත් වන කරුණු තෝරා ගැනීම, ඉදිරිපත් කිරීම සහ එහි ප්‍රකාශිත අදහස් පිළිබඳ වගකීම කර්තෘ මණ්ඩලය සතු වන අතර, එම අදහස් කතුවරුන්ගේ මිස යුනෙස්කෝ සංවිධානයේ අදහස් නොවන අතර ඒ සම්බන්ධයෙන් සංවිධානය බැඳී නොසිටියි.

කර්තෘ මණ්ඩලය

ඇල්ටන් ග්‍රිස්ල් (Alton Grizzle), කැරොලින් විල්සන්(Carolyn Wilson), රමොන් තුවාසොන් (Ramon Tuazon), සී.කේ. චීන්ග් (C.K. Cheung), හෙසූස් ලාඕ (Jesus Lau), රේචල් ෆිෂර් (Rachel Fischer), ඩොරති ගෝර්ඩන් (Dorothy Gordon), ක්වාමෙ ආචියංපොන්ග් (Kwame Akyempong), ජග්තාර් සිං (Jagtar Singh), පෝල් ආර්. කාර් (Paul R' Carr), ක්‍රිස්ටීන් ස්ටුවර්ට් (Kristine Stewart), සැමි ටෙයියා (Samy Tayie), ඔලුනිෆෙසි සූරජ් (Olunifesi Suraj), මාරිට් යාක්කොලා (Maarit Jaakkola), ජීනා තෙසේ (Gina Théséé), කමයිරා කු (Curmira Gu), අන්ද්සොන්ගෝ මෙන්යන්ග් (Andzongo Menyeng), බ්ලේස් පස්කාල් (Blaise Pascal), සිබි ෆමා(Zibi Fama), පෝල් අලාන් (Paul Alain)

ඇල්ටන් ග්‍රිස්ල්, කැරොලයින් විල්සන්, ඩොරති ගෝර්ඩන් විසින් සංස්කරණ කටයුතු සිදු කරන ලදි.

කැතරින් මුග්‍රිජ්/ යුනෙස්කෝව විසින් ග්‍රැෆික් නිර්මාණ කටයුතු සිදු කරන ලදි.
කැතරින් මුග්‍රිජ්/ යුනෙස්කෝව විසින් පොත් පිටකවරය නිර්මාණය කරන ලදි.

යුනෙස්කෝව විසින් යතුරුලියනය සිදු කරන ලදී.
යුනෙස්කෝව විසින් මුද්‍රණය කරන ලදී.

ප්‍රංශයේ දී මුද්‍රණය කරන ලදි.

පෙරවදන

"විචාරශීලීව සිතමු, නැණවත්ව තෝරමු! මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුරවැසියන්"

ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා වන යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ දෙවන සංස්කරණය

ඔද්‍රේ අසුලේ
අධ්‍යක්ෂ ජනරාල් යුනෙස්කෝ සංවිධානය

කොවිඩ් 19 වසංගතය සුපැහැදිලිව පෙන්වා දුන් පරිදි, විභවීය වශයෙන් ජීවිතාරක්ෂණ තීරණ ගැනීම සඳහා සහ සමාජයේ සෑම අංශයකටම සහභාගි වීම සඳහා විශ්වසනීය හා පරිසිද්ධි-පාදක තොරතුරු සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව ඉතා වැදගත් වේ. දේශගුණික විපර්යාස, සංක්‍රමණය, ගැටුම් හෝ දරිද්‍රතාව යන කුමක් වුව ද, අප මුහුණ දෙන සෑම ප්‍රධාන ගැටලුවකටම විසඳුම් සෙවීම සඳහා තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව මූලික වන අතර එය ප්‍රජාතන්ත්‍රවාදයේ තීරණාත්මක ආධාරස්ථම්භයක් ලෙසට ද පෙන්වා දිය හැකි ය.

එබැවින්, එය අප පානය කරන්නා වූ ජලය සහ ආශ්වාස කරන්නා වූ වාතය හා සමානවම පොදු වූවක් ලෙස සැලකිය යුතු වේ.

විශේෂයෙන්ම සමාජ මාධ්‍ය හරහා ගෝලීය වසංගත තත්ත්වය පිළිබඳ සාවද්‍ය තොරතුරු සහ කටකතා බොහෝමයක් සමාජයේ සෑම ඉසව්වකට ම කෙතරම් දුරට පැතිර ගියේද යත්, එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා ඇතුළු බොහෝ පාර්ශ්වයන් විසින් එය "දුස්තොරතුරු වසංගත" තත්ත්වයක් ලෙස නම් කර ඇත. කෙසේ වුවද, මෙවැනි අභියෝග අනපේක්ෂිත ඒවා නොවේ. ඒවා මෑත දශකවලදී සිදු වූ දැවැන්ත තාක්ෂණික වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වන අතර එමගින් අප සන්නිවේදනය කරන, අන්තර්ක්‍රියා කරන මෙන්ම අප අවබෝධය ලබාගන්නා ක්‍රමවේද මුළුමනින්ම උඩු යටිකුරු කිරීමට සමත් වී ඇත. ලෝකයේ තරුණ තරුණියන්ගෙන් සියයට හැත්තෑවක් පමණ වර්තමානයේ දී අන්තර්ජාලය භාවිත කරති.[1] දෛනිකව, මිනිසුන් විසින් නරඹනු ලබන "යූටියුබ්"[2] හි වීඩියෝ පැය ගණන බිලියනය ඉක්මවා ඇති අතර ෆේස්බුක්[3] වෙත දෛනිකව ප්‍රවේශ වන පරිශීලක සංඛ්‍යාව බිලියන දෙකකට ආසන්න ය. බොහෝ දෙනා විසින් මෙම වේදිකා භාවිත කරනු ලබන්නේ ලෝකය පිළිබඳ පුවත් සහ තොරතුරු දැන ගැනීමේ ප්‍රාථමික මූලාශ්‍රයක් වශයෙනි.

1 ITU,2020.
2 යූ ටියුබ්, 2021.
3 ෆේස්බුක්, 2021.

මෙම තොරතුරු කෙරෙහි, විශේෂයෙන්ම මාර්ගගතව සොයාගත් මෙම තොරතුරු කෙරෙහි තබනු ලබන විශ්වාසය ගෝලීය වශයෙන් වාර්තාගත ලෙස පහත යාම අහඹුවක් නොවේ. මෙම තත්ත්වය සාම්ප්‍රදායික මාධ්‍ය සහ රජයන් විසින් සපයනු ලබන තොරතුරු සඳහා ද අදාළ විය.[4]

අප විසින් අපව දැනුම්වත් කිරීමට හා අප අතර වාද විවාද නිර්මාණය කිරීමට මෙන්ම අපගේ අදහස් ප්‍රකාශනයට මෙම වෙනස්වීම් මගින් නව අවස්ථා සුවිශාල ප්‍රමාණයක් උදා කර දී ඇත. එසේ වුවද, තොරතුරු පිළිබඳව සහ එම තොරතුරු පැතිරෙන ආකාර: මාර්ගගත හා මාර්ග අපගත යන දෙයාකාරයම පිළිබඳව, තොරතුරු ප්‍රභවය, සහ මාධ්‍ය සහ විද්‍යාත්මක පර්යේෂණ අවබෝධ කර ගැනීමේ සිට ආචාරධර්ම සහ දත්ත පෞද්ගලිකත්වයත්, ඇල්ගොරිතම සහ කෘත්‍රිම බුද්ධියේ බලපෑම දක්වා ඒ හා සම්බන්ධිත නා නා ප්‍රකාර ගැටලු පිළිබඳ පූර්ණ නව අවබෝධයක් අවශ්‍ය කෙරේ.

කෙටියෙන්ම හැඳින්වුවහොත් මේ වනාහී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවයි. ඊට අදාළව, මාස දහ අටක ගෝලීය උපදේශනවලින් පසුව දියුණු කරන ලද, යුනෙස්කෝව විසින් නිර්මාණය කරන ලද මෙම විෂයමාලාව, 2019 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී සර්බියා ජනරජයේ දී ජනසතු කිරීමේ භාග්‍යය මා හට හිමි විය. ඉදිරි වර්ෂ කිහිපය තුළ දී, විසි එක්වන ශතවර්ෂයට අදාළ මෙම මූලික නිපුණතා ඉගැන්වීම සඳහා භාවිත කළ හැකි නිශ්චිත ගෝලීය රාමුව වශයෙන් මෙය සැලසුම් කර ඇත. මෙම කාරණය ගෝලීය අධ්‍යාපන න්‍යාය පත්‍රයේ කේන්ද්‍රස්ථානය කරා ගෙන ඒම සඳහා අපි, රජයන්, මාධ්‍ය, සිවිල් සමාජය සහ මාර්ගගත වේදිකා සමග කටයුතු කරන විට, යුනෙස්කෝවේ අලුත් වූ අවධානය සඳහා ශක්තිමත් පදනමක් ද මෙමගින් සැපයෙනු ඇත.

මෙම අවස්ථා අප සැමට බලපානු ලබන ගැටලුකාරී තත්ත්ව වන අතර ඒවා පිළිබිඹු කිරීම සඳහා ජාතික හා ආයතනික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සෑම රටක් ම කටයුතු කළ යුතු ය. ලොව පුරා විසිර ඇති සෑම අධ්‍යාපන පද්ධතියක් විසින්ම වර්තමාන තොරතුරු ප්‍රවාහ හැසිරවීමට, මූලාශ්‍ර සත්‍යාපනය කිරීමට, ප්‍රබන්ධවලින් සත්‍ය කරුණු වෙන් කර ගැනීමට, වෛරී ප්‍රකාශවලට විරෝධය දැක්වීමට සහ, සියල්ලටම වඩා තම ජීවිත පිළිබඳ අවබෝධිත තීරණ ගැනීමට හැකි විචාරශීලී මනසක් ගොඩනැංවීම සිදු කළ යුතු ය.

එසේ වුවද, නිරන්තරයෙන් වෙනස් වන තොරතුරු පරිසරයට ප්‍රතිචාර දක්වන යාවජීව ඉගෙනුම් ප්‍රවේශයක් හරහා, සෑම වයස් කාණ්ඩයකටම ඇතුළත් සියලුම මිනිසුන් වෙත ළඟා විය හැකි නව මෙවලම් ගොඩනැගීම සඳහා අප විධිමත් අධ්‍යාපන ක්‍රමවලින් ඔබ්බට ගමන් කිරීම ද කළ යුතු ය. මෙයින් අදහස් කරනු ලබන්නේ සමාජ මාධ්‍ය වේදිකා ඇතුළුව සාවද්‍ය තොරතුරු ඔඩු දුවන ස්ථානවලම සහ ප්‍රධාන ධාරාවේ තොරතුරු පරිසර පද්ධතිවලින් මුළුමනින්ම පිටත පැවතිය හැකි ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් අතරම සිට කටයුතු කිරීමයි.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල අනාගතය සහ නා නා ප්‍රකාර ගෝලීය අභියෝග සඳහා වන අපගේ ප්‍රතිචාර, අර්ධ වශයෙන්, සෑම පුරවැසියෙක්ම "විචාරශීලීව සිතමු, නැණවත්ව තෝරමු!" යන්න අනුගමනය කරන බවට සහතික වීම මත රඳා පවතිනු ඇත. එය සැමට මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව සහතික කිරීම මත රඳා පවතිනු ඇත.

4 Edelman Trust Barometer 2021(රටවල් 28ක අවුරුදු 18ට වැඩි පුද්ගලයන් 33,000 මෙම සමීක්ෂණයට සහභාගී වී ඇත): විශ්වසනීය තොරතුරු වාර්තාගත පහළ මට්ටමක පවතී එම පුද්ගලයන්ගෙන් 35%ක් පමණක් සමාජ මාධ්‍ය තුළින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු මත විශ්වාසය තබන අතර සාම්ප්‍රදායික මාධ්‍ය තුළින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු කෙරෙහි 53%ක ප්‍රතිශතයක් විශ්වාසය තබති. ජනමාධ්‍යවේදීන් සහ රාජ්‍ය නායකයන් සිතාමතා ම ඔවුන්ව නොමග යැවීමට උත්සාහ කරන බව ජනතාවගෙන් 60%ක් පමණ විශ්වාස කරති.

කෙටි සාරාංශය

නැණවත්ව තෝරා ගැනීම තුළින් අපගේ සමාජය දියුණු කළ හැකි ද?

පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන්ට අන්තර්කරණීය හා තිරසර සංවර්ධනය සබල කළ හැකි ය. එසේ වුවද, ඔවුන් සෑම විටම මෙම පරමාදර්ශවලට අනුකූලව ජීවත් නොවන අතර, එමගින් සේවා පරිශීලනය කරන්නන් සඳහා අභියෝග නිර්මාණය කරයි. සියලු ප්‍රවර්ගවල අන්තර්ගත සපයන්නන් විසින් යාවජීව ඉගෙනුමක් සඳහා නව අවස්ථා විවර කෙරේ. එහෙත් ඒ සමගම, සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු, වෛරී ප්‍රකාශ සහ මාර්ගගත පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම වැනි අභියෝග ද අන් අයට විවර කෙරේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා යනු උපරිම වශයෙන් වාසි අත් කර ගනිමින්, හානිකර තත්ත්ව අවම කර ගැනීම සඳහා මිනිසුන්ට උපකාර කරන නිපුණතා සමූහයකි. සන්නිවේදන අන්තර්ගත හා එම අන්තර්ගතයට පහසුකම් සපයන ආයතන සමග මිනිසුන්ට විචාරශීලීව හා ඵලදායීව සම්බන්ධ වීමට සහ, ඩිජිටල් තාක්ෂණ භාවිත කිරීමට මිනිසුන් සබල කරන්නා වූ නිපුණතා, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් ආවරණය කෙරේ. මෙම ක්ෂේත්‍රයන්හි ශක්‍යතා සියලුම පුරවැසියන්ට තම වයස් හෝ පසුබිම් භේදයකින් තොරව අත්‍යවශ්‍ය වේ.

ආසන්න වශයෙන් ලෝක ජනගහණයෙන් 60% ක් අන්තර්ජාලය භාවිත කළ ද, සියලු දෙනා සඳහා පුළුල්ව පැතිරුණු සහ තිරසර මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පුහුණුවක් තවමත් නොමැත.

මෙම පුරෝගාමී විෂයමාලාව මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳව සවිස්තරාත්මක නිපුණතා රාමුවක් ඉදිරිපත් කරන අතර, එමගින් ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් වෙත ව්‍යුහගත ශික්ෂණවිද්‍යා යෝජනා ඉදිරිපත් කෙරේ. වර්තමාන සන්නිවේදන පරිසර පද්ධතිය තුළ සැරිසැරීමට අවශ්‍ය නිපුණතා පරාසය ආවරණය කරන්නා වූ විවිධ සවිස්තරාත්මක මොඩියුලවලින් මෙය සමන්විතය. මෙම පොත කෘත්‍රිම බුද්ධිය, ඩිජිටල් පුරවැසි අධ්‍යාපනය, තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය, සංස්කෘතික සාක්ෂරතාව සහ සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරුවල සීඝ්‍ර වර්ධනය වැනි වර්තමානයේ මතුවෙමින් පවතින ගැටලුවලට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ කරයි. මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ ඵලදායී භාවිතය තුළින් සෑම පුද්ගලයෙකුටම මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුද්ගලයෙකු වීමට මෙන්ම, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සමපදස්ථ ශික්ෂකයන් බවට පත් වීමට හැකි වේ.

UNESCO

යුද්ධය හට ගන්නේ කාන්තාවන්ගේ හා පිරිමින්ගේ මනස තුළ වන බැවින්, සාමයේ රැකවල් ගොඩනැගිය යුත්තේ ද ඔවුන්ගේ සිත් තුළමය.

පටුන

පෙරවදන	III
1 කොටස	**2**
විෂයමාලාව සහ නිපුණතා රාමුව	2
2 කොටස	**50**
මොඩියුල	50
හැඳින්වීම: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා පිළිබඳ මෙම විෂයමාලාව භාවිත කරන්නේ කෙසේද?	51
පාරිභාෂික පදමාලාව	368

"ප්‍රතිපත්ති, ක්‍රියාකාරී සැලසුම් සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට අදාළ උපායමාර්ග වැඩි දියුණු කර ක්‍රියාත්මක කිරීම සහ, යෝග්‍ය පරිදි, දුස්තොරතුරු හා සාවද්‍ය තොරතුරු පිළිබඳ දැනුවත්භාවය, වළක්වා ගැනීමේ ශක්‍යතාව සහ ප්‍රත්‍යාස්ථිතිය ඉහළ නැංවීම උදෙසා"

කැපවන ලෙස එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය සියලු සාමාජික රාජ්‍යයන්ගෙන් සහ වෙනත් පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටියි.

යෝජනාවලිය: ගෝලීය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සතිය A/RES/75/267

1 කොටස: විෂයමාලාව සහ නිපුණතා රාමුව	**2**
හැඳින්වීම	3
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ඒකීකාරක සංකල්පය	8
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ප්‍රතිලාභ සහ අවශ්‍යතා	14
ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා මාධ්‍ය හා තොරතුර සාක්ෂරතා විෂයමාලාවේ ප්‍රධාන මාතෘකා	15
විෂයමාලා රාමුව	20
ප්‍රතිපත්තිය හා දැක්ම	22
තිරසර සංවර්ධනය, සාමය, ප්‍රජාතාන්ත්‍රික කතිකාව හා සමාජ සහභාගිත්වය උදෙසා තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදනය පිළිබඳ දැනුම	22
තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන ඇගයීම	25
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා ඒ තුළ අන්තර්ගත සම්පාදනය හා භාවිතය	25
ශික්ෂකයන්ගේ හර නිපුණතා	26
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් ඉගැන්වීම් ශික්ෂණවිද්‍යා විෂයමාලාව ඇසුරෙන්	37
පරිශිෂ්ටය: තෝරාගත් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සම්පත් සහ වෙනත් සම්පත්	41
2 කොටස: මොඩියුල	**50**
හැඳින්වීම: මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව භාවිත කරන්නේ කෙසේ ද?	51
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සඳහා ඉලක්කගත ග්‍රාහක පිරිස	51
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ ප්‍රධාන ලක්ෂණ	52
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා අනුවර්තන ක්‍රියාවලිය: නිර්දේශ	53
සමෝධානය කිරීමේ උපායමාර්ග	54
1වන මොඩියුලය: පදනම් මොඩියුලය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ අනෙකුත් ප්‍රමුඛ සංකල්ප පිළිබඳ හැඳින්වීමක්	**56**
පසුබිම සහ තාර්කිකය	57
1වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව අවබෝධ කර ගැනීම: දිශානතියක්	**62**
ප්‍රධාන මාතෘකා	62
ඉගෙනුම් අරමුණු	62
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	65
ඇගයීම් හා නිර්දේශ	68
2වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ පුරවැසි සහභාගිත්වය	**69**
ප්‍රධාන මාතෘකා	69
ඉගෙනුම් අරමුණු	69
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	71
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	73
ඇගයීම් හා නිර්දේශ	74
3වන ඒකකය: පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන් සමග අන්තර්ක්‍රියා කිරීම	**75**
ප්‍රධාන මාතෘකා	75
ඉගෙනුම් අරමුණු	75
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	76
ඇගයීම් හා නිර්දේශ	79
4වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා, ඩිජිටල් කුසලතා, සංස්කෘතික සහභාගිත්වය/නිර්මාණශීලීත්වය සහ ව්‍යවසායකත්වය	**79**
ප්‍රධාන මාතෘකා	79

ඉගෙනුම් අරමුණු 80
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 82
ඇගයීම් හා නිර්දේශ 84
5වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, ඉගැන්වීම සහ යාවජීව ඉගෙනුම 85
ප්‍රධාන මාතෘකා 85
ඉගෙනුම් අරමුණු 85
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 85
ඇගයීම් හා නිර්දේශ 87

2වන මොඩියුලය: තොරතුරු හා තාක්ෂණය අවබෝධ කර ගැනීම 90
පසුබිම හා තාර්කිකය **91**
1වන ඒකකය: තාක්ෂණය, මාධ්‍ය සහ සමාජය 94
ප්‍රධාන මාතෘකා 94
ඉගෙනුම් අරමුණු 94
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 96
ඇගයීම් හා නිර්දේශ 98
2වන ඒකකය: නිදහස, ආචාරධර්ම හා සමාජ වගකීම 98
ප්‍රධාන මාතෘකා 98
ඉගෙනුම් අරමුණු 98
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 100
ඇගයීම් හා නිර්දේශ 102
3වන ඒකකය: ප්‍රවෘත්තියක් බවට පත්වන්නේ කෙසේ ද: නිර්ණායක ගවේෂණය 102
ප්‍රධාන මාතෘකා 102
ඉගෙනුම් අරමුණු 102
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 103
ඇගයීම් හා නිර්දේශ 105
4වන ඒකකය: ප්‍රවෘත්ති සැකසුම් ක්‍රියාවලිය: 5W සහ 1H න් ඔබ්බට යාම 106
ප්‍රධාන මාතෘකා 106
ඉගෙනුම් අරමුණු 106
ඇගයීම් හා නිර්දේශ 109

3වන මොඩියුලය: පර්යේෂණ, තොරතුරු චක්‍රය, ඩිජිටල් තොරතුරු සැකසීම, බුද්ධිමය දේපළ 114
පසුබිම හා තාර්කිකය **115**
1වන ඒකකය: ශාස්ත්‍රීය හා විද්‍යාත්මක තොරතුරු ගොඩනගා ඇති ආකාරය 119
ප්‍රධාන මාතෘකා 119
ඉගෙනුම් අරමුණු 119
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 119
ඇගයීම් හා නිර්දේශ 121
2වන ඒකකය: සෙවීම: උපායමාර්ගික තොරතුරු ගවේෂණය 121
ප්‍රධාන මාතෘකා 121
ඉගෙනුම් අරමුණු 121
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 122
ඇගයීම් හා නිර්දේශ 126

3වන ඒකකය: ශාස්ත්‍රීය හා විද්‍යාත්මක තොරතුරු ඇගයීම	**126**
ප්‍රධාන මාතෘකා	126
ඉගෙනුම් අරමුණු	126
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	127
ඇගයීම් හා නිර්දේශ	129
4වන ඒකකය: තොරතුරු සාක්ෂරතාවේ සංකල්ප සහ යෙදුම්	**129**
ප්‍රධාන මාතෘකා	129
ඉගෙනුම් අරමුණු	130
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	131
ඇගයීම් හා නිර්දේශ	133
5වන ඒකකය: ඉගෙනුම් පරිසර සහ තොරතුරු සාක්ෂරතාව	**133**
ප්‍රධාන මාතෘකා	133
ඉගෙනුම් අරමුණු	133
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	134
ඇගයීම් හා නිර්දේශ	136
6වන ඒකකය: ඩිජිටල් තොරතුරු සැකසීම	**137**
ප්‍රධාන මාතෘකා	137
ඉගෙනුම් අරමුණු	137
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	138
ඇගයීම් හා නිර්දේශ	139
7වන ඒකකය: බුද්ධිමය දේපළ සහ කර්තෘත්වය පිළිගැනීම	**140**
ප්‍රධාන මාතෘකා	140
ඉගෙනුම් අරමුණු	140
ඇගයීම් හා නිර්දේශ	142

4වන මොඩියුලය: සාවද්‍ය තොරතුරු, දුස්තොරතුරු සහ වෛර ප්‍රකාශ හමුවේ කටයුතු කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා: සත්‍යය සෙවීම සහ සාමය ආරක්ෂා කිරීම සඳහා	**146**
පසුබිම හා තාර්කිකය	147
1වන ඒකකය: සත්‍යය වැදගත් වේ	**151**
ප්‍රධාන මාතෘකා	151
ඉගෙනුම් අරමුණු	151
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	151
ඇගයීම් හා නිර්දේශ	153
2වන ඒකකය: සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු පාරිසරික පද්ධතිය	**154**
ප්‍රධාන මාතෘකා	154
ඉගෙනුම් අරමුණු	154
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	154
ඇගයීම් හා නිර්දේශ	157
3වන ඒකකය: මාධ්‍ය සහ සාවද්‍ය තොරතුරු	**158**
ප්‍රධාන මාතෘකා	158
ඉගෙනුම් අරමුණු	158
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	158
ඇගයීම් හා නිර්දේශ	159

4වන ඒකකය: සාවද්‍ය තොරතුරු ප්‍රචාරණයෙන් තනි පුද්ගලයන්ට සහ සමාජයට වන බලපෑම් 160
ප්‍රධාන මාතෘකා 160
ඉගෙනුම් අරමුණු 160
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 160
ඇගයීම් හා නිර්දේශ 161
5වන ඒකකය: 162
ප්‍රධාන මාතෘකා 162
ඉගෙනුම් අරමුණු 162
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 162
ඇගයීම් හා නිර්දේශ 163

5වන මොඩියුලය: පුරවැසියන් වන ග්‍රාහක පිරිස 166

පසුබිම සහ තාර්කිකය **167**
1වන ඒකකය: ගෝලීය පුරවැසිභාවය අවබෝධ කර ගැනීම 171
ප්‍රධාන මාතෘකා 171
ඉගෙනුම් අරමුණු 171
ඇගයීම් හා නිර්දේශ 175
2වන ඒකකය: ග්‍රාහක පිරිස්: ජාතික සහ ගෝලීය සන්දර්භ 175
ප්‍රධාන මාතෘකා 175
ඉගෙනුම් අරමුණු 175
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 177
ඇගයීම් හා නිර්දේශ 179
3වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, අන්තර්ගත සපයන්නන් සහ ප්‍රජා නියැලීම 179
ප්‍රධාන මාතෘකා 180
ඉගෙනුම් අරමුණු 180
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 181
ඇගයීම් හා නිර්දේශ 182
4වන ඒකකය: පුරවැසි-පාදක තොරතුරු සහ පුරවැසි මාධ්‍යවේදය 183
ප්‍රධාන මාතෘකා 183
ඉගෙනුම් අරමුණු 183
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 184
ඇගයීම් හා නිර්දේශ 186

6වන මොඩියුලය: මාධ්‍ය හා තොරතුරු තුළ නිරූපණය: ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව අවධානයට ලක් කිරීම 190

පසුබිම හා තාර්කිකය **191**
1වන ඒකකය: නිරූපණය යන සංකල්පය 194
ප්‍රධාන මාතෘකා 195
ඉගෙනුම් අරමුණු 195
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 195
ඇගයීම් හා නිර්දේශ 196
2වන ඒකකය: ප්‍රවෘත්ති වාර්තාකරණය සහ අනුරූපවල බලය 197
ප්‍රධාන මාතෘකා 197
ඉගෙනුම් අරමුණු 197

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 197

ඇගයීම් හා නිර්දේශ 201

3වන ඒකකය: විවිධත්වය සහ නිරූපණය පිළිබඳ කර්මාන්ත ආචාරධර්ම **202**

ප්‍රධාන මාතෘකා 202

ඉගෙනුම් අරමුණු 202

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 202

ඇගයීම් හා නිර්දේශ 203

4වන ඒකකය: රූපවාහිනිය, චිත්‍රපට හා වීඩියෝ, මුද්‍රිත ප්‍රකාශන, ප්‍රවෘත්ති මාධ්‍ය ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ නව තාක්ෂණ **203**

ප්‍රධාන මාතෘකා 203

ඉගෙනුම් අරමුණු 203

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 204

ඇගයීම් හා නිර්දේශ 205

5වන ඒකකය: සංගීත වීඩියෝ සහ නිරූපණය **206**

ප්‍රධාන මාතෘකා 206

ඉගෙනුම් අරමුණු 206

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 206

ඇගයීම් හා නිර්දේශ 207

7වන මොඩියුලය: මාධ්‍ය සහ තාක්ෂණය අන්තර්ගතයට බලපාන්නේ කෙසේ ද? **210**

පසුබිම හා තාර්කිකය **211**

1වන ඒකකය: තොරතුරු සහ මාධ්‍ය පෙළ කියවීම **215**

ප්‍රධාන මාතෘකා 215

ඉගෙනුම් අරමුණු 215

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 215

ඇගයීම් හා නිර්දේශ 217

2වන ඒකකය: මුද්‍රණ, විකාශන සහ ඩිජිටල් පුවත් **217**

ප්‍රධාන මාතෘකා 217

ඉගෙනුම් අරමුණු 217

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 218

ඇගයීම් හා නිර්දේශ 218

3වන ඒකකය: සමාජ මාධ්‍යවල ඩිජිටල් වේදිකා පිළිබඳ සන්නිවේදනය **219**

ප්‍රධාන මාතෘකා 219

ඉගෙනුම් අරමුණු 219

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 219

ඇගයීම් හා නිර්දේශ 220

4වන ඒකකය:සමාජ මාධ්‍යවල ඩිජිටල් වේදිකා පිළිබඳ සන්නිවේදනය **220**

ප්‍රධාන මාතෘකා 220

ඉගෙනුම් අරමුණු 220

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 221

ඇගයීම් හා නිර්දේශ 223

8වන මොඩියුලය: පෞද්ගලිකත්වය, දත්ත ආරක්ෂණය සහ ඔබ **226**

පසුබිම හා තාර්කිකය **227**

1වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ පෞද්ගලිකත්වය අවබෝධ කර ගැනීම 231
ප්‍රධාන මාතෘකා 231
ඉගෙනුම් අරමුණු 231
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 233
ඇගයීම් හා නිර්දේශ 235
2වන ඒකකය: පෞද්ගලිකත්වය, දත්ත සහ සංවර්ධනය 236
ප්‍රධාන මාතෘකා 236
ඉගෙනුම් අරමුණු 236
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 239
ඇගයීම් හා නිර්දේශ 240
3වන ඒකකය: පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය සඳහා වන ආයතනික බැඳීම් පිළිබඳ දැනුවත්භාවය 241
ප්‍රධාන මාතෘකා 241
ඉගෙනුම් අරමුණු 241
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 243
ඇගයීම් හා නිර්දේශ 245

9වන මොඩියුලය: අන්තර්ජාල අවස්ථා හා අභියෝග 248
පසුබිම හා තාර්කිකය 249
1වන ඒකකය: අතථ්‍ය ලෝකයේ තාරුණ්‍යය 252
ප්‍රධාන මාතෘකා 252
ඉගෙනුම් අරමුණු 252
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 252
ඇගයීම් හා නිර්දේශ 254
2වන ඒකකය: අතථ්‍ය ලෝකයේ අභියෝග හා අවදානම් 254
ප්‍රධාන මාතෘකා 254
ඉගෙනුම් අරමුණු 254
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 255
ඇගයීම් හා නිර්දේශ 262
3වන ඒකකය: ඉගෙනුම, ජාලකරණය හා මාර්ගගත සමාජීය නියැලීම 262
ප්‍රධාන මාතෘකා 262
ඉගෙනුම් අරමුණු 262
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 263
ඇගයීම් හා නිර්දේශ 266
4වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි පියසටහන්: ඔබගේ මාර්ගගත අභිමුඛයන් පාලනය කිරීම පිළිබඳ තවදුරටත් 267
ප්‍රධාන මාතෘකා 267
ඉගෙනුම් අරමුණු 267
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 268
ඇගයීම් හා නිර්දේශ269 269

10වන මොඩියුලය: වෙළෙඳ ප්‍රචාරණය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව 272
පසුබිම හා තාර්කිකය 273
1වන ඒකකය: වෙළෙඳ ප්‍රචාරණය, ආදායම් හා නියාමනය 277
ප්‍රධාන මාතෘකා 277

ඉගෙනුම් අරමුණු	277
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	278
ඇගයීම් හා නිර්දේශ	280
2වන ඒකකය: ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණය සහ දේශපාලනික කරලිය (සමාජ ජාල සහ විකුණුම්කරුවන් විසින් අලෙවිකරණය)	**281**
ප්‍රධාන මාතෘකා	281
ඉගෙනුම් අරමුණු	281
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	282
ඇගයීම් හා නිර්දේශ	283
3වන ඒකකය: මහජන සේවා නිවේදන	**284**
ප්‍රධාන මාතෘකා	284
ඉගෙනුම් අරමුණු	284
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	284
4වන ඒකකය: වෙළෙඳ ප්‍රචාරණය: නිර්මාණාත්මක ක්‍රියාවලිය	**286**
ප්‍රධාන මාතෘකා	286
ඉගෙනුම් අරමුණු	286
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	286
ඇගයීම් හා නිර්දේශ	288
5වන ඒකකය: අන්තර්ජාතික වෙළෙඳ ප්‍රචාරණය සහ 'සුපිරි වෙළෙඳ සන්නාම'	**288**
ප්‍රධාන මාතෘකා	288
ඉගෙනුම් අරමුණු	288
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	289
ඇගයීම් හා නිර්දේශ	290
11වන මොඩියුලය: කෘත්‍රිම බුද්ධිය, සමාජ මාධ්‍ය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා	**292**
පසුබිම හා තාර්කිකය	**293**
1වන ඒකකය: කෘත්‍රිම බුද්ධිය පිළිබඳ මූලික තොරතුරු සහ සමාජ මාධ්‍ය තුළ කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීම පිළිබඳ අවබෝධ කර ගැනීම	**297**
ප්‍රධාන මාතෘකා	297
ඉගෙනුම් අරමුණු	297
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	297
2වන ඒකකය: කෘත්‍රිම බුද්ධිය සහ සමාජ මාධ්‍ය පිළිබඳ යුගය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා	**299**
ප්‍රධාන මාතෘකා	299
ඉගෙනුම් අරමුණු	299
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	304
3වන ඒකකය: පුද්ගල හා සමාජ අයිතිවාසිකම්, තෝරා ගැනීම් සහ තාක්ෂණය	**308**
ප්‍රධාන මාතෘකා	308
ඉගෙනුම් අරමුණු	308
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	309
4වන ඒකකය: සංවර්ධනය සඳහා කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය භාවිතය	**312**
ප්‍රධාන මාතෘකා	312
ඉගෙනුම් අරමුණු	312
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	312
ඇගයීම් හා නිර්දේශ	315

12වන මොඩියුලය, ඩිජිටල් මාධ්‍ය, ක්‍රීඩා සහ සාම්ප්‍රදායික මාධ්‍ය **318**

පසුබිම හා තාර්කිකය 319

1වන ඒකකය: සාම්ප්‍රදායික මාධ්‍යවල සිට ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ දක්වා **322**

ප්‍රධාන මාතෘකා 323

ඉගෙනුම් අරමුණු 323

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 323

2වන ඒකකය: සමාජය තුළ නව මාධ්‍ය තාක්ෂණ භාවිතය - සමාජ පරිවර්තනය **325**

ප්‍රධාන මාතෘකා 325

ඉගෙනුම් අරමුණු 325

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 325

ඇගයීම් හා නිර්දේශ **328**

3වන ඒකකය: ඉගෙනුම් අවකාශ තුළ ඩිජිටල් ක්‍රීඩා ද ඇතුළුව අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්වල භාවිත 328

ප්‍රධාන මාතෘකා 328

ඉගෙනුම් අරමුණු 328

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 329

ඇගයීම් හා නිර්දේශ 331

13වන මොඩියුලය: මාධ්‍ය, තාක්ෂණය සහ තිරසර සංවර්ධන ඉලක්ක: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සන්දර්භය **333**

පසුබිම හා තාර්කිකය 333

1වන ඒකකය: තිරසර සංවර්ධන ඉලක්ක තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ භූමිකාව **337**

ප්‍රධාන මාතෘකා 337

ඉගෙනුම් අරමුණු 337

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 338

ප්‍රධාන මාතෘකා 341

2වන ඒකකය: මාධ්‍ය තුළ සමාජයීය, සංස්කෘතික, හා දේශපාලනික මාන **341**

ප්‍රධාන මාතෘකා 341

ඉගෙනුම් අරමුණු 341

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 341

3වන ඒකකය: මාධ්‍ය නිමිකාරිත්වය සහ තොරතුරු වෙළෙඳභාණ්ඩකරණය **342**

ප්‍රධාන මාතෘකා 342

ඉගෙනුම් අරමුණු 343

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 346

4වන ඒකකය: ඩිජිටල් තාක්ෂණය හරහා විකල්ප මාධ්‍ය ප්‍රවර්ධනය **347**

ප්‍රධාන මාතෘකා 347

ඉගෙනුම් අරමුණු 347

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් 348

ප්‍රධාන මාතෘකා 349

5වන ඒකකය: සමාජය තුළ නව මාධ්‍ය තාක්ෂණවල භාවිත- සමාජ විපර්යාස **349**

14වන මොඩියුලය: සන්නිවේදනය හා තොරතුරු, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ඉගෙනුම - සංයුක්ත මොඩියුලය	**352**
පසුබිම සහ තාර්කිකය	353
1වන ඒකකය: සන්නිවේදනය හා තොරතුරු, ඉගෙනුම්, ඉගැන්වීම්	**356**
ප්‍රධාන මාතෘකා	356
ඉගෙනුම් අරමුණු	356
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	358
2වන ඒකකය: ඉගෙනුම් න්‍යාය සහ, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව	**359**
ප්‍රධාන මාතෘකා	359
ඉගෙනුම් අරමුණු	359
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	361
3වන ඒකකය: පාසල් තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා සබල පරිසරයක් පෝෂණයක් කිරීම වෙනුවෙන් විපර්යාස කලමනාකරණය කිරීම	**362**
ප්‍රධාන මාතෘකා	362
ඉගෙනුම් අරමුණු	362
ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්	364
පාරිභාෂික පදමාලාව	**368**
ස්තුතිය	**389**

1 කොටස

විෂය මාලාව සහ නිපුණතා රාමුව

හැඳින්වීම

කොහි වේ ද ඒ දිවිය දිවි ගෙවුමෙන් අපට අහිමි වුණු? කොහි වේ ද ඒ නුවණ දැනුමින් අපට අහිමි වුණු? කොහි වේ ද ඒ දැනුම තොරතුරින් අපට අහිමි වුණු?

- ටී. එස්. එලියට්

මෙම විෂයමාලාව, විවිධ තාක්ෂණ ක්‍රම ඔස්සේ අනේකවිධ අන්තර්ගත සපයන්නන් විසින් අප වෙත ගෙන එනු ලබන අන්තර්ගත හමුවේ වර්තමානයේ අප සතුව තිබිය යුතු නිපුණතා කවරේ ද යන්න විමසුමට ලක් කරයි. පුළුල් පරාසයක පැතිරුණු, අන්තර්ගතයේ තොරතුරුමය සන්දේශ කෙරෙහි එමගින් අවධානය යොමු කරවයි. අන්තර්ගත ලබා ගැනීමට, බෙදා ගැනීමට සහ සැපයීමට අවශ්‍ය කෙරෙන, අඛණ්ඩව වර්ධනය වෙමින් ඩිජිටල් භව්‍යතා පිළිබඳව එමගින් පරීක්ෂා කෙරේ. අවසාන වශයෙන්, මෙම අන්තර්ගතය සපයන ප්‍රධාන ආයතන වර්ග, එනම් පුස්තකාල, කෞතුකාගාර, මාධ්‍ය සමාගම් සහ සමාජ මාධ්‍ය මෙන්ම, සන්දේශන සහ සෙවුම් සේවා සපයනු ලබන ඩිජිටල් සන්නිවේදන සමාගම් ආදිය කෙරෙහි එමගින් අවධානය යොමු කෙරේ. මේ සියල්ල වැදගත් වන්නේ ඇයි? තිරසර සංවර්ධනය සහ මානව හිමිකම් සඳහා ය.

2015 වසරේ දී, ජාත්‍යන්තරර සංවර්ධන සහයෝගීතාවෙහි මූලික සාමූහික අරමුණු වශයෙන් තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) 17කට ලොව පුරා රටවල් එකඟතාව පළ කර ඒ වෙනුවෙන් කැපවිණි. "කිසිවෙකු අත් නොහරින්න" යන පරමාදර්ශය මත තිරසර සංවර්ධන ඉලක්ක පදනම් විණි. එවකට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා 'අභිමානය සඳහා වන මාවත[1] (The Road to Dignity by 2030) නමැති තම වාර්තාවේ වැදගත් නිරීක්ෂණයක් ඉදිරිපත් කළේ ය. දරිද්‍රතාව තුරන් කිරීමටත්, ජනතාවගේ අවශ්‍යතා තෘප්තිමත් කරන හා ආර්ථික වර්ධනයට උරදෙන සමාජ පරිවර්තනයක් සහතික කිරීමටත් ගෝලීය නායකයින්ට මෙන්ම ලොව පුරා විසිරී සිටින ජනතාවට තිරසර සංවර්ධන ඉලක්ක මගින් අනන්‍ය අවස්ථා පිරිනමා ඇති බව ඔහු අවධානයට ලක් කළේ ය. පරිසරය සුරැකීම, සාමය සහතික කිරීම සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වූ කැපවීම මෙම අවස්ථා සාක්ෂාත් කරගැනීමෙහි ලා කේන්ද්‍රීය වේ. 2030 වසර වන විට තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට නම් පොදු යහපත උදෙසා තොරතුරු ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (Media and Information Literacy - MIL) සියලු තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට දායක වේ. නිදසුනක් වශයෙන්, සෞඛ්‍ය සම්පන්න ජීවිත සහ යහපැවැත්ම සහතික කිරීම සඳහා වූ 3වන තිරසර සංවර්ධන ඉලක්කය, සැමට ගුණාත්මක අධ්‍යාපනය සඳහා වූ 4වන තිරසර සංවර්ධන ඉලක්කය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා වූ 5වන තිරසර සංවර්ධන ඉලක්කය, තොරතුරු වෙත ප්‍රවේශය සහ නත් වැදෑරුම් මූලික නිදහස සඳහා වූ 16.10වන තිරසර සංවර්ධන ඉලක්කය සහ අන්තර්කරණීය සහ ප්‍රතිවර්තනීය නගර බවට පත් කිරීම සඳහා වූ 11වන තිරසර සංවර්ධන ඉලක්ක සඳහා එය සහය දක්වයි.

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වැනි වගන්තියේ සඳහන් වන ආකාරයට 'තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත; අනුන්ගේ බාධාවක් නොමැතිව, තම මත දැරීමටත්, දේශසීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමටත් ඇති අයිතිය ඊට ඇතුළත්ය'. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් පුරවැසියන්ව පහත සඳහන් නිපුණතාවන්ගෙන් සන්නද්ධ කෙරේ: පොදු යහපත උදෙසා තොරතුරු අවබෝධ කරගැනීමේ හැකියාව; තිරසර සංවර්ධනය සඳහා දායක වීම පිණිස තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදනයන්හි විචාරශීලීව නියැලීමට ඇති හැකියාව සහ මූලික මානව හිමිකම්වල පූර්ණ ප්‍රතිලාභ අපේක්ෂා කිරීමටත් භුක්ති විඳීමටත් ඇති හැකියාව. මෙම අර්ථයෙන් සලකා බලන කල, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන්න ද පොදු යහපතකි.

1 The Road to Dignity by 2030, https://www.un.org/disabilities/documents/reports/SG_Synthesis_Report_Road_to_Dignity_by_2030.pdf

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව අවශ්‍යයෙන්ම පොදු යහපත පිණිස ම වන්නේය යන අදහසට, 1982 ගෘන්වල්ඩ්ගේ (Grünwald) ප්‍රකාශය මගින් පිටුබලයක් සපයන අතර, එමගින් 'සන්නිවේදනයේ සංසිද්ධීන්' පිළිබඳ පුරවැසියන්ගේ විචාරශීලී අවබෝධය සහ මාධ්‍ය (නව සහ පැරණි) සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කරනු පිණිස දේශපාලන හා අධ්‍යාපන ක්‍රමයන්හි අවශ්‍යතාව හඳුනාගනු ලබයි. මේ සම්බන්ධයෙන් වන මෙම අවස්ථාව, අවශ්‍යතාව සහ අදහස තවදුරටත් සවිබල ගැන්වීමට 2003 තොරතුරු සාක්ෂරතා සමාජ සඳහා වන ප්‍රාග් ප්‍රකාශය (Prague Declaration towards Information Literate Societies of 2003)[2], තොරතුරු සංගමයේ ධාර ලෝකය : 2005 තොරතුරු සාක්ෂරතාව සහ යාවජීව ඉගෙනීම පිළිබඳ ඇලෙක්සැන්ඩ්‍රියා ප්‍රකාශනය (The Beacons of the Information Society Alexandria Proclamation on Information Literacy and Lifelong Learning of 2005)[3], 2011 මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ෆෙස් ප්‍රකාශනය[4] (The Fez Declaration on Media and Information Literacy of 2012), 2012 මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ මොස්කව් ප්‍රකාශනය[5] (The Moscow Declaration on Media and Information Literacy of 2012), 2016 මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ තරුණ ප්‍රකාශනය (Youth Declaration on Media and Information Literacy-2016), සහ 2020 දුස්තොරතුරු වසංගතයට එදිරි ආරක්ෂාව: සෑම අයෙකු සඳහාම සහ සෑම අයෙකුගෙන්ම මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සෝල් ප්‍රකාශනය[6] (Seoul Declaration on Media and Information Literacy for Everyone and by Everyone(A Defence against Disinfodemics of 2020) හේතු වී ඇත. දශක තුනකට වැඩි කාලයක් මුළුල්ලේ යුනෙස්කෝ සංවිධානය සහ එහි හවුල්කරුවන් විසින් මෙහෙයවන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල ප්‍රතිඵල මගින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යාවජීව ඉගෙනුමෙහි කේන්ද්‍රය බවට පත් කරයි. සෑම තරාතිරමකම පුරවැසියන්ට ස්වකීය පුද්ගලික, සමාජීය, වෘත්තීය, අධ්‍යාපනික සහ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම උදෙසා තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අන්තර්ගත ඵලදායී ආකාරයෙන් සෙවීමට, ඇගයීමට, භාවිත කිරීමට සහ නිර්මාණය කිරීමට ඔවුන්ව බලගැන්වීමේ හැකියාව මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සතුව පවතී.

තිරසර සංවර්ධන ඉලක්ක[7] ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ ප්‍රගතියක් පළමු වසර පහ තුළ දී ම අත්කරගෙන ඇත. එසේම, ඩිජිටල් පරිණාමනයේ ද සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. 2015 දී බිලියන 3.2 ක් වූ අන්තර්ජාලය පරිශීලනය කරන තනි පුද්ගලයන්ගේ සංඛ්‍යාව[8], තිරසර සංවර්ධන ඉලක්ක නිල වශයෙන් හඳුන්වා දීමෙන් අනතුරුව, 2020 වර්ෂයේ දී බිලියන 4.66ක සක්‍රීය අන්තර්ජාල පරිශීලක සංඛ්‍යාවක්[9] දක්වා වර්ධනය වී ඇත. එය වසර පහක් වැනි කාලයක් තුළ සිදු වූ සියයට 32ක වර්ධනයකි. සංවර්ධනය වෙමින් පවතින රටවල ඩිජිටල් මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරතරය ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින අතර, 2019 වසරේ සංඛ්‍යාලේඛනවලට අනුව, ගෝලීය වශයෙන් ගත් කල, පිරිමි අන්තර්ජාල පරිශීලකයන්ගේ ප්‍රතිශතය වන සියයට 58ට සාපේක්ෂව, කාන්තා අන්තර්ජාල පරිශීලකයන්ගේ ප්‍රතිශතය සියයට 48ක් වේ[10]. මෙම සන්දර්භය තුළ, තිරසර සංවර්ධනය වේගවත් කිරීම උදෙසා නව මංපෙත් විවර කිරීමට කෘත්‍රිම බුද්ධියේ පරිණාමය ඉවහල් වේ. මින් ගම්‍ය වන්නේ තීරණ ගැනීම සහ සමාජ සහභාගීත්වය සඳහා තොරතුරු වෙත ප්‍රවේශය බොහෝ පිරිසකට පවතින බව ය. තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම උදෙසා තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදනය වෙත ප්‍රවේශය පමණක්ම ප්‍රමාණවත් වන්නේ ද යන ප්‍රශ්නය පැන නගී. ඊට පිළිතුර පැහැදිලිවම 'නැත' යන්නයි.

2 http://www5.austlii.edu.au/au/journals/inCiteALIA/2004/17.pdf
3 The Beacons of the Information Society Alexandria Proclamation on Information Literacy and Lifelong Learning of 2005
4 The Fez Declaration on Media and Information Literacy of 2012
5 The Moscow Declaration on Media and Information Literacy of 2012
6 Seoul Declaration on Media and Information Literacy for Everyone and by Everyone: A Defence against Disinfodemics of 2020
7 SDGs – Sustainable Development Goals
8 ICT Facts and Figures. The World in 2015. ITU, https://www.itu.int/en/ITU-D/Statistics/Documents/facts/ICTFactsFigures2015.pdf
9 Measuring digital development Facts and figures 2020. ITU, https://www.itu.int/en/ITU-D/Statistics/Doc- uments/facts/FactsFigures2020.pdf
10 The digital gender gap is growing fast in developing countries, https://itu.foleon.com/itu/measuring-dig-ital-development/gender-gap/

බොහෝ ස්ථාන තුළ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ ප්‍රගතියක් පෙන්නුම් කරන නමුත්, ඒවා ක්‍රියාත්මක කිරීමේ දී, එය අපේක්ෂිත වේගයෙන් හෝ නිවැරදි පරිමාණයෙන් සිදුවන බවක් දක්නට නොහැකි බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිරීක්ෂණයට ලක් වී ඇත[11]. ඩිජිටල් පරිණාමනය නිසැක පොරොන්දු සහ අවස්ථා මෙන්ම තර්ජන ද රැගෙන එයි. "පරිගණක සහ රොබෝවරු දැන් තීරණ ගැනීමට ඉගෙන ගනිමින් සිටිති! සත්‍ය වශයෙන්ම, "තීරණ ගැනීම" යනු විඥානයක් නොමැති යන්ත්‍ර සඳහා බරපතල වචනයක් වන අතර ඒවායේ "තර්කන හැකියා" මට්ටම මැඩියකුගේ තර්කන හැකියා මට්ටම තරම්වත් පරිණාමනය වී නොමැත. එනමුත් කෘත්‍රිම බුද්ධියේ (AI) නවතම ප්‍රවණතා ඇතැමුන් බිය ගැන්වීමටත් තවත් අයගේ මනෝමායාවන් උද්දීපනයටත් සමත් වී ඇති බව" 2018 දී මහාචාර්ය යස්මිනා ෂොපෝවා (Jasmina Šopova) යුනෙස්කෝ කුරියර් සඟරාවෙහි[12] සඳහන් කර ඇත.

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය, තොරතුරු මත බලපෑම් ඇති කරන බැවින්, තොරතුරු සහ දත්තවල සදාචාරාත්මක භාවිතයට මෙන්ම ඩිජිටල් සන්නිවේදන සැකැස්මේ (landscape) ලක්ෂණවලට ද හේතුවන බැවින් ද එම නීතිය අවබෝධ කර ගැනීමට මිනිසුන්ට උපකාර කිරීම වැදගත් බවට අවධානය යොමු වෙමින් පවතී. වාණිජ තාක්ෂණ සපයන්නන් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලබා දෙන අතර, දිනෙන් දින ඉහළ යන සාවද්‍ය තොරතුරු, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතා පැවතීම[13], වාර්ගික වෙනස්කම් සහ නොඉවසිය හැකි සිද්ධීන් හා වෙනස් කොට සැලකීම් වැනි වෙනත් ආකාරයන් ද තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අභියෝගයක් ඇති කරයි. සාවද්‍ය තොරතුරු පෙර සිට පැවතෙන අභියෝගයක් වන නමුත් වර්තමානයේ අතිනවීන තාක්ෂණය[14] සහ ඇල්ගොරිතම ව්‍යාපාර මාදිලි ආදිය මගින් එහි ව්‍යාප්තිය තවදුරටත් විස්තාරණය කරනු ලබන අතර, සත්‍යය සහ ස්ථාපිත ආයතන කෙරෙහි වන විශ්වාසයද පළුදු කරමින් සහ සාමයට සංවර්ධනය හා ප්‍රජාතන්ත්‍රවාදයට හානි කළ හැකි ආකාරයේ කතිකාවන් දිරිමත් කෙරෙන බැවින් ගෝලීය සංවර්ධනයේ දී අවධානය ලක් විය යුතු ගැටලුවක් බවට පත්ව ඇත. මෙය ලියන අවස්ථාව වන විට, කොවිඩ් වසංගතයේ ව්‍යාප්තියත් සමගම දුස්තොරතුරු වසංගතය[15] ඇති විය. කොරෝනා වයිරස් අර්බුදයේ යථා තත්ත්වයන් සහ එන්නත්වල අවශ්‍යතාව ආදිය බැහැර කරමින් හානිකර සහ වැරදි තොරතුරු මෙන්ම කුමන්ත්‍රණ න්‍යායන් මාර්ගගත මෙන්ම මාර්ග අපගත ලෙස ලැව් ගින්නක් මෙන් සංසරණය වෙමින් පවතී.

විවෘත හා සමාන අයුරින් තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් තාක්ෂණය වෙත ප්‍රවේශ වීමට බාධා කරන භූගෝලීය වෙනස්කම්, පන්ති භේද, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, භාෂාමය සහ වෙනත් බෙදීම් සමගින්, මේ දැනුමේ පවතින හිඩැස් තවදුරටත් පුළුල් වන අතර එමගින් දුස්තොරතුරු සහ සාවද්‍ය තොරතුරුවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් පවතී. වසංගතයත් සමග දැනටමත් ඩිජිටල් වේදිකා, අධ්‍යාපනික, සංස්කෘතික සහ කලාත්මක යනාදී සියලු ආකාරයේ අන්තර්ගතවල ක්ෂණික පැතිරයාමක් අත්විඳීමට හැකිවී ඇත. කොවිඩ් වසංගතයෙන් පසු ලෝකය ඊළඟ අදියරට හෝ නව සාමාන්‍ය තත්ත්වයට පත්වන විට මෙය තවදුරටත් පවතිනු ඇතැයි සහ වඩාත් තීව්‍ර වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මහජනතාවගේ නියැලීමත් සමග ප්‍රවණතා වැඩි වැඩියෙන් එකතු වීම සිදුවන අතර ඔවුන් අන්තර්ගත සපයන්නන්ගේ සාම්ප්‍රදායික නාලිකාවලින් (outlets) ඔබ්බට, තොරතුරු ඇතුළුව, සියලු වර්ගවල අන්තර්ගතවල සක්‍රියව නියැලෙමින්, ඒවා සම්පාදනය කරමින් සහ බෙදා හරිමින් සිටී. ඩිජිටල් කුසලතා ඇතුළු මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා වර්ධනය කරගත හැකි ශක්‍යතාව ලබා දෙන පරිසරයක් මගින්, පුද්ගලයන් සවිබල ගැන්වීමට මෙන්ම අන්‍යෝන්‍ය අවබෝධය සහ අන්තර්-සංස්කෘතික සංවාදයට ද දායකත්වය ලබා දිය හැකි ය.

11 Decade of Action.United Nations,https://www.un.org/sustainabledevelopment/decade-of-action/

12 UNESCO Courier,2020.https://en.unesco.org/courier/2018-3

13 The World's Women 2020:Trends and Statistics. United Nations Department of Economic and Social Affairs, https://worlds-women-2020-data-undesa.hub.arcgis.com/

14 Journalism,~~Fakenews~~& Disinformation: Handbook for Journalism Education and Training.UNESCO Series on Journalism Education. UNESCO, 2018. Edited by Cherilyn Ireton and Julie Posetti.

15 DISINFODEMIC Policy Brief 1 and 2: Deciphering COVID-19 disinformation,and Dissecting responses to COVID-19 disinformation. UNESCO, 2020. Authors, Julie Posetti and Kalina Bontcheva. See also Balancing Act: Countering Digital Disinformation while respecting Freedom of Expression, Authors: Julie Posetti and Kalina Bontcheva. UNESCO, 2020.

මිනිසුන් සෑම දිනකම නිර්මාණය කරන දත්ත ප්‍රමාණය කොතරම් විශාල ද යත් ඒවාට ප්‍රවේශය ඇති ඇතැම් පුද්ගලයෝ නොදැරිය හැකි තරම් වූ අන්තර්ගතයකට මුහුණ දෙති. බිහි වන අන්තර්ගත ප්‍රමාණය අසීමාන්තික බැවින්, සත්‍යය කුමක් ද, ව්‍යාජ කුමක් ද සහ අවිනිශ්චිත දේ කුමක් ද යන බව තීරණය කිරීමේ දී ඇතැමෙක් දැඩි පීඩනයකට පත් වෙති. පවතින තොරතුරු ප්‍රමාණය සහ මහජනයාදැනුවත්ව භාවිත කරන ප්‍රමාණය අතර ද පරස්පරතා පවතී. සියලුම අන්තර්ගත තොරතුරු නොවේ; එයින් බොහෝ දේ විනෝදාස්වාදීය හෝ ප්‍රචාරණාත්මක අන්තර්ගත වන අතර, බහුතරයක් 'සාවද්‍ය තොරතුරු' සහ 'දුස්තොරතුරු' අන්තර්ගතයන් වේ (මෙහි දී සාවද්‍ය තොරතුරු සහ කුමන්ත්‍රණ න්‍යායන් ඇතුළත් වර්ගීය ලේබලයක් (generic label) ලෙස සලකනු ලැබේ). විබලිත කරන මේ ප්‍රතිවිපාක හමුවේ මේවා වෙන්කර හඳුනා ගැනීමට ජනතාව බලවත් වෙහෙසක් දරති. සත්‍යාපිත හෝ සත්‍යාපනය කළ හැකි අන්තර්ගත ආකාරයෙන්, තොරතුරු නොමැතිව ගනු ලබන තීරණ හුදෙක් හැඟීම් සහ/හෝ ව්‍යාජත්වය හෝ ව්‍යාජ සම්බන්ධතා මත රඳා පවතී.

පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර මෙන්ම, විශ්වසනීය, වෘත්තීය හා සදාචාර සම්පන්න මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන් සහ මැදිහත්කරුවන් යනු කිසිවෙකු අත්නොහරින සංවර්ධන මාවත් වෙත පිවිසීමෙහි ලා අවබෝධිත තීරණ ගැනීමට පුරවැසියන්ට අත්‍යාවශ්‍යයෙන්ම උපකාර කළ හැකි විභවයකින් යුත් පිරිස් බවට පුළුල් පිළිගැනීමක් පවතී. එහෙත් අවශ්‍ය පියවර නොගතහොත්, පවතින වර්තමාන තත්ත්වය අනතුරෙහි හෙළීම පමණක් නොව, විවිධ ආර්ථික හා සමාජයීය පසුබිම් සහිත පුරවැසියන් අතර ද දැනුම් පරතර වැඩිවීමේ අනතුරක් ද පවතී. ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කොට සැලකීම සම්බන්ධයෙන් ජනතාවට ලැබෙන අන්තර්ගත අනුව ඒ පිළිබඳව ඔවුන් සතු සැබෑ දැනුම විකෘත කළ හැක්කේ කෙසේ ද යන්න මීට නිදසුනකි. 2020 දී සිදුකරන ලද පර්යේෂණ අනුව ප්‍රවෘත්ති මාධ්‍ය කාර්යමණ්ඩල බඳවා ගැනීමේ දී හා අන්තර්ගත සැපයීමේ දී, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීමට, වත්මන් සීඝ්‍රතාව අනුව, වසර 70 ක්[16] ගතවනු ඇති බව පුරෝකථනය කර ඇත. එක් පසෙකින් අන්තර්ජාල සමාගම්, වෛරී ප්‍රකාශ සහ දුස්තොරතුරු මගින් ලාභ ලබන විට සහ, අනෙක් පසින් විවිධ මතිමතාන්තර දරමින් ජීවත් වන විවිධ ක්‍රියාකාරීන් අතර දැනුවත්භාවයට සහ තීරණ ගැනීමට මෙවැනි අන්තර්ගත බලපාන විට අසමානතා පරාස තවදුරටත් ඉහළ යාම සිදු වේ. ඇතැම් සමාජ විශ්වාස සහ පරිචයන් සාමාන්‍යකරණය කිරීමෙන් හෝ තිරසරබවට හානිකර පරිභෝජන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමෙන් සමාජයීය මතවාදය හැඩගැස්වීමේ හැකියාවක් අන්තර්ගත සපයන්නන් සතු ය.

කෙසේවෙතත්, සමාජයන් තමන් සහ අන් අය ගැන ඉගෙන ගන්නාවූත්, පොදු කතිකා හා සංවාද පවත්වාගෙන යන්නා වූත් සහ පොදු ප්‍රගතියේ අනාගතය සම්බන්ධ සාමූහික හැඟීම, ඉවසීම සහ අන්‍යෝන්‍ය ගෞරවය පිළිබඳ හැඟීමක් ගොඩනගන්නා වූත් මාධ්‍යයක් බවට පත්වීමට අන්තර්ගත සපයන්නන්ට සහ මැදිහත්කරුවන් සමූහයකට හැකි ය. යාවජීව අධ්‍යාපනයට ධනාත්මක බලපෑමක් ඇති කිරීමේ හැකියාව අන්තර්ගත සපයන්නන් සහ මැදිහත්කරුවන් සතු වේ. මෙය යථාර්ථයක් කිරීමට නම්, පුරවැසියන් හට ඉහත අන්තර්ගත සපයන්නන් සහ මැදිහත්කරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ මූලික දැනුමක් අවශ්‍ය වන අතර, එම පාර්ශ්ව විසින් සැපයෙන, පුරවැසියන් සමග අන්තර්ක්‍රියා කරන හෝ සිය අදහස් ප්‍රකාශනයේ කොටසක් ලෙස පුරවැසියන් විසින්ම සම්පාදනය කරනු ලබන අන්තර්ගත "පෙළ" ඇගයීමට ලක් කරන්නේ කෙසේද යන්න පිළිබඳව මූලික දැනුමක් ද අවශ්‍ය වේ. අන්තර්ගත සේවා පරිශීලකයන්ට මෙම දැනුම ලබාදීම මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවයේ අරමුණ වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ යුනෙස්කෝවේ සංකල්පය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ දිනෙන් දින වර්ධනය වන පොදු එකඟතාවක් පවතී. මෙහි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යනු වඩවඩාත් සංකීර්ණත්වයට පත්ව ඇති, වත්මන් සන්නිවේදන පරිසරයේ සැරිසැරීමට අවශ්‍ය විවිධාකාර වූ හා විකාශනය වන නිපුණතා ඇතුළත් ආවරණ පදයකි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විසින් විචාරශීලී චින්තනය සහ අනෙකුත් අවශ්‍ය නිපුණතා සමගින්, අවබෝධිත සහ සදාචාරාත්මක නියැලීම් සක්‍රීය කිරීම සඳහා අන්තර්ගත, අන්තර්ගත සපයන ආයතන (සහ තමන්ගේම අන්තර්ගත සම්පාදනය කිරීමට සහ බෙදා ගැනීමට අවස්ථා ලබාදීම) සහ ඩිජිටල් තාක්ෂණය ඒකාබද්ධ කිරීමට පුරවැසියන් සවිබල ගන්වයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තවදුරටත් ඉලක්ක කරන්නේ ඩිජිටල් තාක්ෂණය භාවිතා කරන්නන්ගේ අරමුණු සහ නිර්මාණාත්මක භාවිතයට සහාය වීම සහ පෞද්ගලිකත්ව අයිතීන්

16 Comparing Gender and Media Equality Across the Globe. A Cross-National Study of the Qualities, Causes,and Consequences of Gender Equality in and through the News Media.NORDICOM,2020. Editors: Monika Djerf-Pierre, Maria Edström.

සහ තොරතුරු වෙත ප්‍රවේශය සහ භාවිතය සම්බන්ධ සදාචාරාත්මක ගැටලු වැනි ගැටලුවලට සම්බන්ධ අයිතිවාසිකම් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමයි. මෙලෙස, සීඝ්‍රයෙන් ඩිජිටල්කරණය වෙමින් පවතින සමාජයක් තුළ අන්තර් සංස්කෘතිකමය සංවාදය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව, තොරතුරු වෙත ප්‍රවේශය, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ සාමය සහ තිරසර සංවර්ධනය යන ගුණාංග පෝෂණය කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉවහල් වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළින් ලබා ගන්නා නිපුණතා තුළින්, විචාරශීලී චින්තන කුසලතාවලින් පුද්ගලයන් සන්නද්ධ කළ හැකි අතර එමගින් උසස් ගුණාත්මක බවකින් හා අයිතිවාසිකම් සුරැකෙන ආකාරයේ සේවාවක් සියලුම අන්තර්ගත සපයන්නන්ගෙන් ඉල්ලා සිටීමට ඔවුනට හැකියාව ලැබේ.

තිරසර සංවර්ධන ඉලක්ක, සංස්කෘතීන්ගේ සීමාවන් ඉක්මවා යන බැවින් හා විෂයාන්තර වන බැවින් ඒ හා සම්බන්ධයෙන් වන සමාජ අවස්ථා සහ අභියෝග සංකීර්ණ වේ. සමාජ ප්‍රතිචාරවලටම අන්තර් සංස්කෘතික ප්‍රවේශයක් තිබිය යුතු අතර ම බහු-ශික්ෂණ (multi-disciplinary) විය යුතු ය. ඒ අනුව, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේදී, සංස්කෘතික සාක්ෂරතාව, අන්තර් සංස්කෘතික නිපුණතා, තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය, ගෝලීය පුරවැසි අධ්‍යාපනය, සෞඛ්‍ය සාක්ෂරතාව, විද්‍යා සාක්ෂරතාව ආදී අනෙකුත් සමාජ නිපුණතා සමග මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ වන ආකාරය පිළිබඳව යුනෙස්කෝ සංවිධානය අවධාරණය කරයි. මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ ඇති මොඩියුල 14, මේ අනුව දැනුම් මධ්‍යස්ථාන අතර මනා සම්බන්ධතා සහ තිරසර සංවර්ධනය සහ සාමය වෙනුවෙන් ඒවායේ භාවිත ප්‍රවර්ධනය කිරීම පිණිස මෙම බහු ශික්ෂණ දැක්මෙන් ඉදිරිපත් කර ඇත.

ඔවුන්ගේ භූගෝලීය සහ සංස්කෘතික සර්ව ව්‍යාප්තිය අනුව, සියලුම වර්ගයේ අන්තර්ගත සපයන්නන් හට මෙම විෂයමාලාව සහ නිපුණතා රාමුව තුළ ඉතා පැහැදිලි ස්ථාන ලැබී ඇත. මෙම අන්තර්ගත ප්‍රවාහවල බහු-ආංශික පද්ධතිය හඳුනාගත යුතු වේ.

ආයතනයක් ලෙස, තිරසර සංවර්ධන සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන්හි ඉටු කිරීමට අපේක්ෂා කරන සුවිශේෂී කාර්යයන් සමූහයක් ප්‍රවෘත්ති මාධ්‍ය (සහ පුළුල් මාධ්‍ය ආයතනවල කොටසක් වන ප්‍රවෘත්ති මාධ්‍ය සේවා) සතු වේ. ප්‍රජාතන්ත්‍රවාදී රටවල් බොහොමයක, විකාශන මාධ්‍ය (broadcast media) - ඒවායේ සර්ව ව්‍යාප්තිය සහ එහි පරාසයේ දුර්ලභත්වය (scarcity of spectrum) නිසා - සමතුලිතතාවය සහතික කිරීම සඳහා නියාමනය කර ඇත. ඩිජිටල් සන්නිවේදන සමාගම්, ක්‍රියාකාරී ප්‍රකාශකයන්ට වඩා නුදෙක් වේදිකා ලෙස ස්ථානගත ව ඇති බැවින් ප්‍රවෘත්ති මාධ්‍යවලට වඩා වැඩි නිදහසක් ඔවුනට ඇත. අන්තර්ගත පෝෂණ (content feeds), සෙවුම් ප්‍රතිඵල සහ නිර්දේශවල ඇල්ගොරිතම ප්‍රමුඛතා හරහා මෙන්ම අන්තර්ගතය හා විශේෂිත පරිශීලකයින්ගේ කාණ්ඩ හෝ අවස්ථා තීරණය කිරීම සඳහා සිදුකරන සෘජු මැදිහත්වීම් හරහා මෙම සමාගම් වඩාත් ක්‍රියාකාරීව සංස්කරණ භූමිකාවක් ඉටු කරන බැවින් මෙය වෙනස් වේ. යුනෙස්කෝ සාමාජික රටවල් විසින් එකඟ වූ ස්ථාවරයේ සිට, අනාගත ඩිජිටල් පාලනය මගින් අයිතිවාසිකම් මත පදනම් වූ, විවෘත සහ සැමට ප්‍රවේශ විය හැකි, සහ බහු පාර්ශ්වකරුවන්ගේ ප්‍රවේශ හරහා පාලනය වන සේවා සහතික කළ යුතු වේ[17].

පුළුල් පොදුජන යහපත පිණිස වැඩි වගවීමක් දැරීම සඳහා පනවන දැඩි රාජ්‍ය රෙගුලාසිවලට විකල්පයක් වශයෙන් පුවත් මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් තුළ ස්වයං-නියාමන ක්‍රම ගොඩනගා ඇත. තොරතුරු සඳහා ඩිජිටල් සන්නිවේදන සමාගම් මත මිනිසුන් වැඩි විශ්වාසයක් තැබීම සහ සමාජ ආඛ්‍යාන හා තොරතුරු ප්‍රවාහ පාලනය කිරීම සඳහා ඔවුන්ට පවතින බලය, මෙම සමාගම්වල වැඩි ස්වයං - නියාමනයක් හෝ ව්‍යවස්ථාපිත රෙගුලාසි පවා ඉල්ලා සිටීමේ වැඩිවීමක් දක්නට ලැබේ. ආයතනික ප්‍රමාණය (corporate size) සහ බලය (සංකේන්ද්‍රණය සහ/හෝ සීමා කිරීමේ බලය බෙදා හැරීමක අවශ්‍යතාව - උදාහරණයක් ලෙස අධික වෙළෙඳ ප්‍රචාරණ වෙළෙඳපොළවල් මත), පෞද්ගලිකත්ව රෙගුලාසි, විනිවිදභාවය සම්බන්ධ රෙගුලාසි, දත්ත සුවහනීයතාව (data portability) සහ අන්තර් ක්‍රියාකාරීත්වය, පාරිභෝගික ආරක්ෂණය සහ අන්තර්ගතය ඉලක්ක කළ නියාමනය වැනි ගැටලු එවන් රෙගුලාසි මගින් ආවරණය කෙරේ.

17 UNESCO'sInternet universality indicators:A framework for assessing Internet development.UNESCO, 2019. Authors: David Souter and Anri Van der Spuy.

විශේෂිත සදාචාරාත්මක අගයන් සහ ප්‍රතිපත්ති මගින් ස්වයං-නියාමන ක්‍රම සඳහා රුකුල් දී ඇත. එනිසා, මහජනතාවට ප්‍රවෘත්ති මාධ්‍ය සහ වැඩි වශයෙන් ඩිජිටල් සන්නිවේදන සමාගම් පිළිබඳ සුවිශේෂී අපේක්ෂා පවතින අතර, ඔවුන්ට ඒ පිළිබඳව නෛතික බැඳීමක් නොමැති අවස්ථාවල දී වුවද, එම අපේක්ෂාවලට අනුව ක්‍රියා නොකරන්නේ නම් ඒ සම්බන්ධයෙන් එල්ලවන මහජන විවේචනයට ලක්වීමට ඔවුන්ට සිදු වේ. මේ අනුව, ප්‍රවෘත්ති මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් ඔවුන් සිදුකරන ක්‍රියාකාරකම්, එම ක්‍රියාකාරකම් ඉටුකරනුයේ කවර කොන්දේසි යටතේද යන බව සහ ඒවායේ ප්‍රතිඵල ග්‍රාහක පිරිස විසින් විචාරශීලී ලෙස උකහා ගන්නා ආකාරය පිළිබඳව මනා පිළිබිඹුවක් මෙම රාමුව මගින් සැපයේ. මාධ්‍ය සහ අන්තර්ජාල සමාගම්වල භූමිකාව පිළිබඳව අවධානය මෙසේ පැවතිය ද, පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර වැනි තොරතුරු හා සන්නිවේදන පරිසරවේදයට අයත් වෙනත් අන්තර්ගත සපයන්නන්ගේ වැදගත්කම පිළිබඳව මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව පුරාවටම අවධානය යොමු කොට ඇත.

ශිෂ්‍යයන් සහ සියලු පුරවැසියන් අතර මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම උදෙසා ශික්ෂකයන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් යුතු වීම අවශ්‍ය කෙරේ. මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව; විධිමත්, නොවිධිමත් සහ අවිධිමත් යන විවිධාකාර වූ ඉගැනුම් අවකාශ තුළ සිටින ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් යන කොට්ඨාස දෙක කෙරෙහිම අවධානය යොමු කරනු ලබයි. එය පාසල්, ප්‍රජා මධ්‍යස්ථාන, සමාජ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, ගෘහස්ථ හෝ ආයතන තුළ සහ යන කුමන ස්ථානයක සිදුවුවද මෙම අවධානය යොමු කිරීම ගුණාත්මක ප්‍රතිඵලයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන උපායමාර්ගයක් වේ: එනම් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත ශික්ෂකයන්ගෙන් ශිෂ්‍යයන්ට ලැබී, අවසානයේ දී සමස්ත වශයෙන් මුළු සමාජයටමත් ලැබීම ය. ඉගෙනුම සඳහා ඉගෙනීම, ස්වෛරී ඉගෙනුම, යාවජීව ඉගෙනුම සහ තමන්ම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි සමපදස්ථ ශික්ෂකයන් බවට පත්වීම සඳහා කැපවීමට ශිෂ්‍යයන් බලගැන්වීම පිණිස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත ශික්ෂකයන් හට වර්ධනය වූ ශක්‍යතා ලැබෙනු ඇත. පුරවැසියන්ට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් යුතු වීමට ඉගැන්වීමෙන්, අවබෝධිත සහ විචක්ෂණශීලී පුරවැසියෙකු වෙනුවෙන් පෙනී සිටින ඔවුන්ගේ භූමිකාවට ශික්ෂකයන් පළමුව ප්‍රතිචාර දක්වනු ඇත. දෙවනුව, අධ්‍යාපන සහ ඉගෙනුම් ක්‍රියාවලි මගින්, ගුරු කේන්ද්‍රීය ප්‍රවේශ, වැඩි වශයෙන් ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාමාර්ග සමග තුලනය කරන බැවින්, ශික්ෂකයන් වශයෙන් ඔවුන්ගේ භූමිකාවෙහි වෙනස්කම්වලට ඔවුන් ප්‍රතිචාර දක්වනු ඇත.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව, විධිමත් අධ්‍යයන අවකාශවල සිට අවිධිමත් අධ්‍යයන අවකාශවලින් පරිබාහිර වූ සමාජ ඉගෙනුම් සම්බන්ධ කරමින්, එලෙස කිරීමෙන් ජනතාව ඉගෙන ගන්නා ආකාරය වර්ධනය කිරීමෙන් ශික්ෂණවිද්‍යා උපායමාර්ග සමග සම්බන්ධ වන විට, ශික්ෂකයන් එය වැළඳ ගැනීමට වැඩි ඉඩක් ඇත. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හඳුන්වා දීමෙන් සහ ශික්ෂකයාගේ වෘත්තීය දියුණුවට ඉන් ඇති කරන බලපෑම මගින් ඇති කරන විධිමත්, නොවිධිමත් සහ අවිධිමත් අධ්‍යාපන අංශවල වෙනස්කම්වලට ඉඩකඩ සකසාදීම මෙම විෂයමාලාවේ සහ නිපුණතා රාමුවේ වැදගත් අරමුණකි. සවිස්තරාත්මක වන අයුරින් සහ දේශීය සන්දර්භවලට අනුවර්තනය වීම පිළිබඳව අවධානය යොමු කරමින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව නිර්මාණය කර ඇත. විෂයමාලා රාමුව සහ අදාළ නිපුණතා පිළිබඳ වැඩිදුර විස්තර පහත සඳහන් කොටස්වලින් ඉදිරිපත් කෙරේ. 2වන කොටසෙහි දැක්වෙන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව භාවිත කරන්නේ කෙසේ ද යන කොටස ද බලන්න.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ඒකීකාරක සංකල්පය

යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සහ නිපුණතා රාමුව,එකිනෙකට වෙනස් ක්ෂේත්‍ර තුනක් එනම්: මාධ්‍ය සාක්ෂරතාව, තොරතුරු සාක්ෂරතාව, ඩිජිටල් සාක්ෂරතාව එක් ආවරණ පදයක් යටතට එනම්: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා යන්නට ඒකාබද්ධ කරනු ලබයි. 1වන රූප සටහනේ දක්වා ඇති[18], පාරිභාෂික පදමාලාවන්ගේ වෙන් වෙන් වශයෙන් සලකා බැලුනු කරුණුවල සිට, තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් සාක්ෂරතාවන්ගේ මූලිකාංග එකට එක් කරන ඒකීය සංකල්පයක් කරා යොමු වන අතර මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ඉලක්ක හා අරමුණු ගෙනහැර දක්වයි.

18 Ralph Catts & Jesus Lau, 2008 වෙතින් උපුටා ගැනුණකි.

1වන රූපසටහන : මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවේ ප්‍රධාන ඵල/ මූලිකාංග

තොරතුරු සාක්ෂරතාව[19]						
තොරතුරු අවශ්‍යතා පැහැදිලි කිරීම හා ප්‍රකාශ කිරීම	තොරතුරු පවතින ස්ථානය නිශ්චයනය හා තොරතුරු වෙත ප්‍රවේශය	තොරතුරු තක්සේරු කිරීම	තොරතුරු සංවිධානය කිරීම	තොරතුරුවල සදාචාරාත්මක භාවිතය	තොරතුරු සන්නිවේදනය	තොරතුරු සැකසීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) කුසලතා යොදා ගැනීම

මාධ්‍ය සාක්ෂරතාව[20]				
ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ මාධ්‍ය හා අන්තර්ජාල සන්නිවේදන සමාගම්වල භූමිකාව සහ කාර්යභාරය අවබෝධ කර ගැනීම.	මාධ්‍යයට සිය කාර්යයන් ඉටුකළ හැක්කේ කවර තත්ත්වයන් යටතේ දැයි අවබෝධ කර ගැනීම	මාධ්‍යවල කාර්යයන් සම්බන්ධයෙන් මාධ්‍යයේ අන්තර්ගතය විචාරශීලීව ඇගයීමට ලක්කිරීම.	ස්වයං ප්‍රකාශනය සහ ප්‍රජාතාන්ත්‍රික සහභාගීත්වය සඳහා මාධ්‍ය හා නියැලීම	පරිශීලක විසින් ජනිත, අන්තර්ගතය සම්පාදනය කිරීමට අවශ්‍ය කුසලතා (ICT ඇතුළුව) සමාලෝචනය කිරීම.

ඩිජිටල් සාක්ෂරතාව						
ඩිජිටල් මෙවලම් භාවිතය	ඩිජිටල් අනන්‍යතාව හඳුනා ගැනීම	ඩිජිටල් අයිතිවාසිකම් හඳුනා ගැනීම	කෘත්‍රිම බුද්ධිය හා සම්බන්ධ ගැටලු තක්සේරු කිරීම	ඩිජිටල් ක්‍රමයට සන්නිවේදනය කරන ආකාරය වැඩිදියුණු කිරීම	ඩිජිටල් සෞඛ්‍ය කළමනාකරණය	ඩිජිටල් ආරක්ෂාව සහ සුරක්ෂිතතාව භාවිතයේ යෙදවීම

එක් අතකට, සාම්ප්‍රදායික තොරතුරු සාක්ෂරතාව මගින් තොරතුරුවලට ප්‍රවේශය සහ එවන් තොරතුරු ඇගයුම සහ සදාචාර සම්පන්න භාවිතය පිළිබඳව අවධාරණය කෙරේ. අනෙක් අතට, සාම්ප්‍රදායික මාධ්‍ය සාක්ෂරතාව මගින්, තොරතුරු වෙත ප්‍රවේශය හා අදහස් ප්‍රකාශනයේ නිදහස පිළිබඳව අවධානය යොමු කෙරෙන අතර, ස්වකීය අන්තර්ගතය සහ එම කාර්යයන් සිදු කරනු ලබන ආකාරය ඇගයීම සඳහා මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල කාර්යය අවබෝධ කරගැනීමට සහ, තිරසර සංවර්ධනය සහ ස්වයං ප්‍රකාශනය සඳහා මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් සමග විචාරශීලීව නියැලීමට ඇති හැකියාව අවධාරණය කෙරේ. ඩිජිටල් සාක්ෂරතාව, බොහෝ විට දෘඩ තාක්ෂණික කුසලතා පිළිබඳ වැඩි අවධාරණය කරමින්, නමුත් ඩිජිටල් ගැටලුවලට සුවිශේෂී වූ මෘදු කුසලතා පිළිබඳව ද සලකා බලමින් සම්ප්‍රදායික තොරතුරු සහ මාධ්‍ය නිපුණතා අභිභවා යමින් තීර්යක් (transversal) ආකාරයෙන් පැවතේ. ඩිජිටල් සන්නිවේදන සමාගම්වල ජනප්‍රියභාවයත් සමග ඩිජිටල් සාක්ෂරතාවට ලියවිලි, අනුරූ, වීඩියෝ සහ නිර්මාණ සම්පාදනය කිරීම පිණිස ඩිජිටල් මෙවලම් භාවිත කිරීමට පවතින හැකියාව පිළිබඳවත් ඇතුළත් වී ඇත. මෙම මූලිකාංග සියලුම පුරවැසියන්, විශේෂයෙන්ම තරුණ තරුණියන් අතර තොරතුරු සහ සදාචාරාත්මක සම්පාදන පිළිබඳ අධ්‍යාපනය බෙදා දීමෙන්, අන්තර්ගතය ව්‍යාප්ත කිරීමෙන් මාධ්‍යයක් බවට සීඝ්‍රයෙන් පත්වන බැවින්, මාධ්‍ය තොරතුරු සාක්ෂරතා නිපුණතා සහ ඩිජිටල් කුසලතාවලට වැඩි වැදගත්කමක් හිමි වේ. මේ පිළිබඳව තවදුරටත් මතුවට විස්තර කෙරේ. ශික්ෂකයන් හා ශිෂ්‍යයන් සඳහා වන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සහ නිපුණතා රාමුවට නිපුණතා කාණ්ඩ තුනම ඇතුළත් කොට ඇත. මාධ්‍ය සාක්ෂරතා, තොරතුරු සාක්ෂරතා සහ ඩිජිටල් සාක්ෂරතා අධ්‍යාපනයේ සංකල්පීකරණය මගින් විමර්ශන-පාදක (enquiry-based) කුසලතා වැඩිදියුණු කිරීම සහ සියලු ආකාරයන්ගේ අන්තර්ගත භාවිතා කරන්නන් සහ මැදිහත්කරුවන් ඔවුන් කවර ආකාරයක තාක්ෂණ භාවිත කරනු ලැබුවද, ඔවුන් සමග අර්ථාන්විතව කටයුතු කිරීම යන අවධාරණය කෙරෙන නිපුණතා වෙත යොමු කෙරේ.

මාධ්‍ය සාක්ෂරතාව, තොරතුරු සාක්ෂරතාව සහ ඩිජිටල් සාක්ෂරතාව යන මෙම අභිසාරී ක්ෂේත්‍ර අතර පවතින සම්බන්ධතාව පිළිබඳ ප්‍රධාන ගුරු කුල (schools of thought) තුනක් පවතී. ඇතැමෙකු තොරතුරු සාක්ෂරතාව වඩාත් පුළුල් අධ්‍යයන ක්ෂේත්‍රයක් වශයෙන් හා අනෙක් ක්ෂේත්‍ර දෙක ඊට

19 WhitePaper.Digital Intelligence(DQ): A Conceptual Framework& Methodology for Teaching and Measuring Digital Citizenship.DQ Institute,2017 වෙතින් උපුටා ගැනුණකි.

20 UNESCO ICT Competency Standards forTeachers, 2008 මගින් මෙම විෂය පිළිබඳව ප්‍රමාණවත් ලෙස සාකච්ඡාවට ලක් කර ඇත.

උපග්‍රහණය කරන ලද ක්ෂේත්‍ර වශයෙන් සලකන අතර තවත් අයෙකුට අනුව තොරතුරු සාක්ෂරතාව හා ඩිජිටල් සාක්ෂරතාව හුදෙක් මාධ්‍ය සාක්ෂරතාවේ කොටසක් වන අතර මාධ්‍ය සාක්ෂරතාව වඩාත් පුළුල් ක්ෂේත්‍රය වශයෙන් සැලකේ. තෙවන විද්වත් කණ්ඩායම විසින් ඩිජිටල් සාක්ෂරතාව, අනෙකුත් ක්ෂේත්‍ර ද්විත්වය ද ආවරණය කරනු ලබන විශාල ක්ෂේත්‍රයක් වශයෙන් සලකනු ලබයි. කෙසේවුවද, යුනෙස්කෝ සංවිධානය මගින් කැඳවූ ජාත්‍යන්තර විද්වත් කණ්ඩායම් කීපයක් තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් නිපුණතා එකිනෙක හා බැඳී පවතින ස්වභාවය පෙන්වා දී ඇත. ලොව පුරා විවිධ ක්‍රියාකාරීන් විසින් මේ සම්බන්ධයෙන් භාවිතා කරන ලද පදමාලා පහත සඳහන් වේ.

- මාධ්‍ය සාක්ෂරතාව
- තොරතුරු සාක්ෂරතාව
- අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු සාක්ෂරතාව
- පුස්තකාල සාක්ෂරතාව
- ප්‍රවෘත්ති සාක්ෂරතාව
- සමාජ මාධ්‍ය සාක්ෂරතාව
- පෞද්ගලිකත්ව සාක්ෂරතාව
- විචාරශීලී සාක්ෂරතාව
- දෘශ්‍ය සාක්ෂරතාව
- මුද්‍රණ සාක්ෂරතාව
- පරිගණක සාක්ෂරතාව
- අන්තර්ජාල සාක්ෂරතාව
- ඩිජිටල් සාක්ෂරතාව
- සිනමා සාක්ෂරතාව
- චිත්‍රපට (Film) සාක්ෂරතාව
- ක්‍රීඩා සාක්ෂරතාව
- රූපවාහිනී සාක්ෂරතාව
- වෙළෙඳ ප්‍රචාරණ සාක්ෂරතාව
- කෘත්‍රිම බුද්ධි සාක්ෂරතාව
- දත්ත සාක්ෂරතාව
- පුරවැසි සාක්ෂරතාව
- සමාජීය සහ චිත්තවේගීය සාක්ෂරතාව
- ජාල සාක්ෂරතාව

මෙම සංකල්ප අතර පැහැදිලි සම්බන්ධතාවක් පවතී (2වන රූපසටහන බලන්න). මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා රාමුව දක්වන මෙම ලියවිල්ලෙන් මෙම සියලුම සම්බන්ධතා විස්තර කොට නොමැත. කෙසේවුවද, යුනෙස්කෝ සංවිධානය විසින් ඉදිරිපත් කොට ඇති මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව හඳුන්වා දීමේ මොඩියුලයෙහි (1වන මොඩියුලය) සම්බන්ධිත ක්‍රියාකාරකම්වල ඇතැම් විෂය වේ. මෙහි වැදගත් කරුණ වනුයේ, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ක්ෂේත්‍ර පිළිබඳව වැඩි වැඩියෙන් අවබෝධය ලබාගන්නා විට ඔවුන්ට මෙම පාරිභාෂික පද හමුවන අතර, අවම වශයෙන් ඔවුන් ඒ පිළිබඳව මනා අවබෝධයක් ලබා ගනු ඇත. මෙම පද බොහොමයක් උද්‍යෝගිමත් විවාදවලට භාජනය වී ඇති අතර ඒවා භාවිත වන අධ්‍යාපනික සහ වෘත්තීය සන්දර්භය නැතහොත් ඒවා භාවිතා කරන ප්‍රජාවන්ගේ සංස්කෘතිකමය පරිචයන් මත පදනම්ව, විවිධ ආකාරයන්ගෙන් යොදාගෙන ඇත. ගෝලීය වශයෙන්, බොහොමයක් සංවිධාන, මාධ්‍ය අධ්‍යාපනය (ME) යන පදය භාවිතා කරන අතර එහි දී ඇතැම් විට මාධ්‍ය සාක්ෂරතාව හා තොරතුරු සාක්ෂරතාව යන ක්ෂේත්‍ර ආවරණය කරන බවට ඇතැම් අවස්ථාවල පිළිගනු ලබයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන පදය යුනෙස්කෝ සංවිධානය විසින් භාවිත කිරීම මගින්, කතාබහට ලක්වන සේවා සැපයුම් වේදිකා (delivery platforms) සැලකිල්ලට ගැනීමේ දී විවිධ සංකල්ප සුසංගත කිරීමට අපේක්ෂා කරයි.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා යන්න ආවරණ පදයක් වශයෙන් සැලකීම පිළිබඳ එකඟතාවක් පවතී. එමගින් සන්නිවේදනය සහ අන්තර්ගතය සම්බන්ධ විවිධ ආකෘති (තොරතුරු, විනෝදාස්වාදය, ප්‍රචාරණය, සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු ආදිය) සමග පුරවැසියන්ගේ කටයුතු කිරීම්, මේවා සම්පාදනය කරන්නේ, ව්‍යාප්ත කරන්නේ කෙසේ ද කවුරුන් විසින් ද, මිනිසුන් අන්තර්ගත භාවිත කරන්නේ හෝ නොකරන්නේ කෙසේ ද, පුස්තකාල, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සපයන්නන් සම්බන්ධයෙන් ඔවුන් නියැලෙන්නේ සහ ඒවායේ වැදගත්කම හා මෙහෙයුම් හඳුනාගන්නේ හෝ එසේ නොවන්නේ කෙසේ ද; පුරවැසියන්, අන්තර්ගතය හා සම්බන්ධිත සපයන්නන් විචාරශීලීව ඇගයීමට ලක් කරනුයේ ඔවුන් සතු කවර දැනුමක්, කුසලතා සහ ආකල්ප පදනම් කර ගනිමින් ද; සහ ඔවුන්ගේ පුද්ගලික, සමාජයීය, දේශපාලනමය, ආර්ථික සහ සංස්කෘතිකමය ජීවිතවලින්[21] අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීම පිණිස තොරතුරු හා වෙනත් අන්තර්ගත වර්ග, මාධ්‍යය සහ ඩිජිටල් සන්නිවේදන මෙවලම් සමග ඔවුන්ගේ නියැලීම් වෙන්කොට හඳුනා ගැනීම සහ නිශ්චය කිරීම පිණිස පුද්ගලයන් ඔවුන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියා කළමනාකරණය කර ගන්නේ කෙසේ ද?

21 UNESCO Draft Global Standards for Media and Information Literacy Curricula Guidelines, https:// en.unesco.org/sites/default/files/belgrade_recommendations_on_draft_global_standards_for_mil_cur- ricula_guidelines_12_november.pdf

2වන රූපසටහන: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ පරිසර තත්ත්වය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සංකල්ප



මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ක්ෂේත්‍රය තුළ සබැඳුම් (linkages) ප්‍රවර්ධනය කිරීම පිණිස යුනෙස්කෝ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කොට ඇති මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ නීති පහක් ඉදිරිපත් කරන අධ්‍යයනයක සාරාංශ පහත 3වන රූපසටහන මගින් ඉදිරිපත් කොට ඇත. ඉන්දියාවේ පුස්තකාල විද්‍යාවේ පියා ලෙස සැලකෙන එස්.ආර්. රංගනාදන් විසින් 1931 දී ඉදිරිපත් කොට ඇති පුස්තකාල විද්‍යාවේ පස් වැදෑරුම් නීතිය මේ සඳහා ආශ්‍රය කොටගෙන ඇත. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි පස් වැදෑරුම් නීතිය; සියලු ආකාරයන්ට අයත් සංවර්ධන කාර්යයන් උදෙසා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව භාවිත කරනු ලබන සියලුම පාර්ශ්වකරුවන් සඳහා මාර්ගෝපදේශයක් වශයෙන්, වෙනත් යුනෙස්කෝ සම්පත්ද සමගින්, භාවිත කිරීමට අපේක්ෂා කෙරේ.

3වන රූපසටහන:

ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් හට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ලබා ගැනීමට හැකියාව ලබාදෙන වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා වන රාමුවක් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපන පද්ධතීන් වෙත ලබාදීම ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා වන යුනෙස්කෝ ආදර්ශ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සහ නිපුණතා රාමුව මගින් අපේක්ෂා කෙරේ. ශික්ෂකයන් විසින් මෙම රාමුව සමාලෝචනය කොට විෂයමාලාව සජීවී ලේඛනයක් වශයෙන් හැඩගැන්වීමේ සහ වඩාත් සඵලත්වයට පත් කිරීමේ සාමූහික ක්‍රියාවලියට සම්බන්ධ වීමේ අභියෝගය භාරගනු ඇතැයි යුනෙස්කෝ සංවිධානය අපේක්ෂා කරයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ පළමු සංස්කරණය සහ මෙම දෙවන සංස්කරණය, විද්වත් කණ්ඩායම්වල සහයෝගීත්ව අන්තර් සංස්කෘතිකමය විද්වත් වාද විවාද හා නිර්දේශ මාලාවක් ආශ්‍රය කොටගෙන සම්පාදනය කොට ඇත. වැඩි බරක් පටවා ඇති අධ්‍යාපන විෂයමාලාව මත දැඩි පීඩනයක් ඇති කිරීමෙන් තොරව, දැනට පවතින අධ්‍යාපන පද්ධතියට වඩාත් සුමටව ඒකාබද්ධ කිරීමට අවශ්‍ය කෙරෙන හර නිපුණතා සහ කුසලතා පිළිබඳව විෂයමාලාව මගින් අවධානය යොමු කෙරේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ප්‍රතිලාභ සහ අවශ්‍යතා

'තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත; අන් අයගේ බාධාවකින් තොරව තම මතය දැරීමටත්, දේශසීමා නොසලකා කවර මාධ්‍යයකින්හෝ තොරතුරු ලැබීමට හා ලබා දීමටත් ඇති අයිතිය ඊට ඇතුළත් වේ.' යනුවෙන් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19වන වගන්තියෙන් ප්‍රකාශයට පත්කර ඇති ආකාරයට පුරවැසියන් සිය මූලික අයිතිවාසිකම් භුක්ති විඳින අතරවාරයේ, තිරසර සංවර්ධන අරමුණු සහ පරමාදර්ශ සාක්ෂාත් කර ගැනීම ද ඇතුළත්ව විචාරශීලීව සහ අර්ථවත්ව තොරතුරු සමග සම්බන්ධ වීමට ඔවුනට පවතින හැකියාව, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් තවදුරටත් වර්ධනය කෙරේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ප්‍රධාන ප්‍රතිලාභ වනුයේ;

1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලි තුළ, අනාගත පුරවැසියන් හා ශිෂ්‍යයන් හට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි සමපදස්ථ ශික්ෂකයන් බවට පත් වීමට අවශ්‍ය සවිබලගැන්වීම සිදු කිරීම පිණිස තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් තාක්ෂණ සමග විචාරශීලීව කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව වඩාත් පෘථුල දැනුමකින් ශික්ෂකයන් සන්නද්ධ කිරීම එමගින් සිදු වේ.
2. මාධ්‍ය හා ඩිජිටල් මෙවලම් හරහා ජනතාවට සිදු කළ හැකි ධනාත්මක කටයුතු පිළිබඳ ඔවුනට අවබෝධයක් ලබා ගැනීම සඳහා ස්වයං-සවිබලගැන්වීමක් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හරහා අත්කරගත හැකි ය. එමගින් පොදු යහපත වෙනුවෙන් වඩා යහපත් අන්තර්ජාලයක් සහ තොරතුරු සඳහා දායකවීම තහවුරු කෙරේ.
3. පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගතය සපයන්නන් සහ මැදිහත්කරුවන්ගේ කාර්ය, එම කාර්ය ඵලදායීව ඉටු කිරීමට අවශ්‍ය කෙරෙන කොන්දේසි පිළිබඳව සෑහෙන තරම් අවබෝධයක් සහ අපේක්ෂිත කාර්ය සම්බන්ධයෙන් ගත් කල, අන්තර්ගත සපයන්නන්ගේ ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය මූලික විචාරශීලී කුසලතා පිළිබඳව ඉතා වැදගත් දැනුමක් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් ලබා දෙනු ලැබේ.
4. ඉහළ යන "දුස්තොරතුරු වසංගතය" නිරාකරණය කිරීමට තිරසර මාවතක් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ලබාදෙයි.
5. ප්‍රයෝජනවත් සහ හානිකර තොරතුරු හඳුනා ගැනීමටත් සහ එවන් අවස්ථා නිවැරදි මාවත කරා මෙහෙයවීමට අවශ්‍ය කුසලතා ශක්තිමත් කිරීම එමගින් සිදු කරන බැවින්, සෞඛ්‍ය සාක්ෂරතාව, මූල්‍ය සාක්ෂරතාව, විද්‍යා සාක්ෂරතාව, සංස්කෘතික සාක්ෂරතාව, ගෝලීය පුරවැසි අධ්‍යාපනය සහ තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය වැනි සාක්ෂරතාවෙහි වෙනත් ආකාරයන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පූර්වාවශ්‍යතාවක් වේ (මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවෙහි මීළඟ කොටසේ මේ පිළිබඳ සවිස්තරව දක්වා ඇත).
6. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සියලු ආකාරයන්ගේ ඉගෙනුම් සමග ඒකාබද්ධ කළ විට, එය පුද්ගලික අයිතිවාසිකම් කඩ කිරීමට එරෙහිව රැකවරණය ලැබීමට උපකාර වන අතර අන් අයගේ පෞද්ගලිකත්ව අයිතිවාසිකම්වලට ගරු කිරීමට සියලු පුද්ගලයන් හට හැකියාව ලබා දෙයි.
7. කෘතිම බුද්ධිය හා බැඳුණු ආචාරධර්ම සහ නිරතුරු වෙනස්වීම්වලට බඳුන්වන ඩිජිටල් පරිවර්තනීය ක්‍රියාවලි සමග සම්බන්ධ වන විට දී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාව අනිවාර්ය බවට පත් වීම.
8. සෑම අයෙකුගෙන් සහ සෑම අයෙකුම සඳහා වන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් සමාජයේ සෑම මට්ටමකටම ළඟා වන අන්තර්ජාලයෙහි බහු-පාර්ශ්වකාර පාලනය ශක්තිමත් කෙරේ.
9. මාර්ගගත හා මාර්ග අපගතව එදිනෙදා සමාජීය ඉගෙනුම සමග විධිමත් ඉගෙනුම් අවකාශවල ඉගෙනීම සම්බන්ධ කිරීම මගින් එය ගුණාත්මක අධ්‍යාපනය වර්ධනය කරයි.
10. සියලු වයස් කාණ්ඩවලට අයත් කාන්තාවන් සහ පිරිමින් අතර පවතින සමාජ අසමානතා සහ ජන කණ්ඩායම්, ආගම් ආදියට වෙනස්කොට සැලකීම වැනි අවස්ථා බලාත්මක කරන, සත්‍යාපනය නොකළ තොරතුරු, පක්ෂග්‍රාහීත්ව සහ ඒකාකෘති ප්‍රතික්ෂේප කිරීම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත පුද්ගලයන් තුළ බොහෝ විට දක්නට ලැබේ.

11. විශ්වාසය පරිහානියට පත්වෙමින් පවතින අවස්ථාවක, විශ්වාසය ඇති කරනුයේ කුමකින් ද යන්න තක්සේරු කිරීමට අවශ්‍ය හැකියාව පුරවැසියන් සහ පරිශීලකයන් තුළ ගොඩනැගීමට සියලු අන්තර්ගත සපයන්නන්ට සහ ස්ථාපිත ආයතනවලට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉඩ සලසයි. (මෙය එහි අවසානයක් වශයෙන් විශ්වාසය ගොඩනැංවීමට දරන ප්‍රයත්නයක් නොවන අතර සත්‍ය වශයෙන්ම අපේක්ෂාවල වැදගත්කම අවධාරණය කිරීම පිණිස වේ. - සාධාරණීකරණය කළ විට දී - ක්‍රියාකාරීන් පොදු යහපත පිණිස සද්භාවයෙන් සහ නිසි උද්‍යෝගයෙන් කටයුතු කරන බව ය. මේ අර්ථයෙන් ගත් කල, අවිචාරශීලීව ඉල්ලා සිටිනු ලබන හෝ පිරිනමනු ලබන විශ්වාසය වනාහී, එම විශ්වාසය සාධාරණීකරණය කර ඇත්දැයි මෙන්ම ඉන් අනතුරුව එය සිහිනුවණින් පිරිනැමීමට කටයුතු කළ යුතු දැයි ජනතාවට විචාරශීලීව තක්සේරු කළ හැකි වන්නා වූ සංශයවාදයෙන් (scepticism) වෙනස් වූවකි).
12. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවෙන් යුතු සමාජය තිරසර සංවර්ධනය සහ නිදහස්, ස්වාධීන හා බහුත්ව මාධ්‍ය හා විවෘත තොරතුරු සහ ඩිජිටල් සන්නිවේදන පද්ධති පෝෂණය කරයි.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ප්‍රතිලාභ අත්විඳීම පිණිස, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි පස් වැදෑරුම් නීතිය (ඉහත 3වන රූපසටහන බලන්න) හා සම්බන්ධයෙන් ප්‍රකාශ කොට ඇති මූලධර්මවලට අමතරව, පහත සඳහන් දෑ අවශ්‍ය කෙරේ.

1. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සමස්ථයක් වශයෙන් සැලකිය යුතු අතර ඊට නිපුණතාවල (දැනුම, කුසලතා, ආකල්ප හා ගුණාංග) සංකලනයක් ඇතුළත් විය යුතු ය.
2. කාරකත්වයක් සහිත, ස්වාධිකාරී හා විචාරශීලී චින්තනයෙන් යුතු පුරවැසියන් වශයෙන් තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් මෙවලම් භාවිත කිරීමේ අරමුණ සඳහා ශික්ෂකයන් හා ශිෂ්‍යයන් විසින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව උපාර්ජනය කරගැනීමටත් වෙනත් ශිෂ්‍යයන්ට මෙන්ම ඔවුන්ගේ සමපදස්ථයන් හට ද එම සාක්ෂරතාව බෙදාදීමටත් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව මගින් ශික්ෂකයන්ට සහ ශිෂ්‍යයන්ට හැකියාව ලබාදිය යුතු ය.
3. තොරතුරු නිශ්චයනය, භාවිත කිරීම පිළිබඳව මෙන්ම තොරතුරු සහ වෙනත් ආකාර අන්තර්ගත සම්පාදනය කිරීම පිළිබඳව ද දැනුමක් පුරවැසියන් හට තිබිය යුතු ය.
4. ආබාධ සහිත පුද්ගලයන්, ආදිවාසීන් හෝ සුළු ජන කොට්ඨාස වැනි ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් ඇතුළත්ව සියලුම වයස් කාණ්ඩවලට අයත් කාන්තාවන් සහ පුරුෂයින් හට තොරතුරුවලට හා දැනුමට සමාන ප්‍රවේශයක් තිබිය යුතු වේ.
5. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, අන්තර් සංස්කෘතිකමය කතිකාවත, අන්‍යොන්‍ය අවබෝධය සහ සංස්කෘතික සාක්ෂරතාවට පහසුකම් සලසන අත්‍යවශ්‍ය මෙවලමක් වශයෙන් දැකිය යුතු ය.

ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ ප්‍රධාන මාතෘකා

මෙම පැකේජය භාවිත කරන සුවිශේෂී සන්දර්භය හා සම්බන්ධ කොට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සහ නිපුණතා රාමුව නිර්වචනය කළ යුතු වේ. මෙම අර්ථයෙන් ගත් කල, විවිධ රටවල සන්දර්භයන්ට යොදාගත හැකි සුනම්‍ය මෙවලමක් වශයෙන් මෙය සැලකිය හැකි ය. මූලික වශයෙන්ම, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳව සහ තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදනය සමග කටයුතු කිරීමේ විවිධ මට්ටම තුළින් අධ්‍යයන වැඩසටහනක් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යුහයක් විෂයමාලා රාමුව මගින් විස්තර කෙරේ. නිපුණතා පිළිබඳ පුළුල් ලැයිස්තුව මගින් විෂයමාලාව වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරෙන දැනුම, කුසලතා සහ ආකල්ප හඳුනා ගැනේ.

මෙම පැකේජයේ ඇතුළත්ව ඇති මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව තුළින්, මතු සඳහන් පුළුල් ඉගෙනුම් ඵල, නිපුණතා හා ආකල්පවලට අවධානය යොමු කරමින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ගවේෂණය කිරීමටත්, තේරුම් ගැනීමටත් ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් හට සහාය වීමටත් අපේක්ෂා කෙරේ. පුළුල් මාධ්‍ය තොරතුරු සාක්ෂරතා ඉගැනුම් ඵල හෝ නිපුණතා 19ක් සහ සමාජ ගුණධර්ම/ ආකල්ප 6ක් මග පෙන්වීම සඳහා ඉදිරිපත් කොට ඇත. (පහත 4වන රූප සටහන හා 1වන වගුව බලන්න)

4වන රූප සටහන : මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පිළිබඳ දැනුම, නිපුණතා සහ, ආකල්ප

මූලාශ්‍රය : මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා මාර්ගෝපදේශ සඳහා කෙටුම්පත් ප්‍රමිති[22]

22 Standards for Media and Information Literacy Curricula Guidelines, https://en.unesco.org/sites/default/files/belgrade_recommendations_on_draft_global_standards_for_mil_curricula_guidelines_12_novem- ber.pdf

1වන වගුව : පුළුල් 'මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා' ඉගෙනුම් ඵල හෝ නිපුණතා[23]

පුළුල් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඉගෙනුම් ඵල		මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුද්ගලයන් සතු විය යුතු නිපුණතා
1.	පුද්ගලික හා ප්‍රජා ජීවිතයේ දී තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදනය සඳහා අවශ්‍යතාවක් හඳුනා ගැනීම සහ ප්‍රකාශ කිරීම	පෞද්ගලික, සමාජයීය හා පුරවැසි අවශ්‍යතා සහ අභිරුචිවලට අදාළ අන්තර්ගතවල, ආයතනවල සහ මාධ්‍ය හා ඩිජිටල් තාක්ෂණවල ස්වභාවය, වර්ගය, භූමිකාව හා විෂය පථය හඳුනා ගැනීමේ, නිර්ණය කිරීමේ හා පැහැදිලිව කියා පෑමේ හැකියාව. තමාගේ අවශ්‍යතා සහ අන්තර්ගත සේවා සපයන්නන්ගේ අවශ්‍යතා, පද්ධති හා අභිප්‍රායන් එකිනෙකින් වෙන් කොට හඳුනාගැනීමේ හැකියාව.
2.	පුස්තකාල, ලේඛනාගාර, ප්‍රකාශකයන්, කෞතුකාගාර, ඩිජිටල්, මාධ්‍ය සන්නිවේදන වැනි තොරතුරු සපයන්නන්ගේ භූමිකාව සහ කාර්යභාරය අවබෝධ කරගැනීම	මාධ්‍ය, තොරතුරු සහ අන්තර්ජාලය ද ඇතුළත් සමාජය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සපයන්නන්ගේ අවශ්‍යතාව හා කාර්යභාරයත්, විවෘත, පාරදෘශ්‍ය හා අන්තර්කරණීය සමාජ ද ඇතුළත්ව, තිරසර සංවර්ධනය සඳහා දායක වීමට ඩිජිටල් සන්නිවේදන සමාගම් හා මාධ්‍ය කටයුතු කළ හැක්කේ කෙසේ ද යන්නත් අවබෝධ කරගැනීමේ හැකියාව.
3.	අදාළ තොරතුරු සපයන්නන් හට ඔවුන්ගේ කාර්යභාරය සිදුකළ හැකි වන්නේ කවර තත්ත්ව යටතේ ද යන්න වටහා ගැනීම.	තොරතුරු නිදහස, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍ය නිදහසෙහි වැදගත්කම; මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන වේදිකා හිමිකාරිත්වය පිළිබඳ ගැටලු; හිමිකම්-පාදක, විවෘත, තීරණ-ගැනීමේ සම්මුති හා තාක්ෂණ; මෙන්ම තොරතුරු ගබඩා සඳහා වන වෘත්තීයතාව සහ ආචාරධර්ම ද අවබෝධ කරගැනීම. සපයන්නන් බොහෝ දෙනෙක් ලාභ ලැබීමේ අරමුණින් කටයුතු කරන අතර එමගින් පොදු යහපත හා සුබසිද්ධිය අපහසුවට ලක්කිරීමක් සිදු විය හැකි බවට දැනුවත්ව පසු වීම. පරිශීලන කොන්දේසි අවබෝධ කරගත හැකි වීම සහ තීරණ ගැනීමේ දී, ඇගයීමේ දී, හා කටයුතු කිරීමේ දී ඊට අනුගත වීම. වෛරී ප්‍රකාශ සහ/හෝ සාවද්‍ය තොරතුරු සම්පාදනය කිරීමට මිනිසුන් ඩිජිටල් සන්නිවේදන භාවිත කරන අවස්ථා හඳුනාගත හැකි වීම සහ ඊට පිළිතුරු ලෙස ධනාත්මක, සත්‍යාපනය කරන ලද ආඛ්‍යාන පිරිනැමීම සහ කරුණුවල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ කුසලතා ශක්තිමත් කරගැනීම. ලිහිල් කිරීමේ යාන්ත්‍රණ සහ වාර්තාකරණ උපායමාර්ග තහවුරු කිරීමට ඩිජිටල් සන්නිවේදන සමාගම්වලට ඇති අවශ්‍යතාව අවබෝධ කරගැනීම
4.	පුද්ගලික, අධ්‍යාපනික, සංස්කෘතික, දේශපාලන, ආගමික සහ වෙනත් සමාජයීය අවශ්‍යතා හා සම්බන්ධ අදාළ තොරතුරු නිශ්චයනය කිරීම සහ තක්සේරු කිරීම.	තොරතුරු, මාධ්‍ය හා අන්තර්ගත ඵලදායීව, කාර්යක්ෂමව සෙවුම් ශිල්ප ක්‍රම යොදා ගැනීම, නිශ්චයනය මෙන්ම ඇගයීමට ලක් කිරීම සහ ඒවායේ ප්‍රභවය, ශ්‍රේණිගත තර්කනය සහ සමාජ හා සංවර්ධන ගැටලු හා සම්බන්ධයෙන් ජනනය කළ සෙවුම් ප්‍රතිඵල හරහා ලබා ගත් දත්ත පිළිබඳ දැනුමින් යුතු වීම.
5.	තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අන්තර්ගත විචාරශීලීව ඇගයීමට ලක්කිරීම.	හමුවන හා ලැබෙන තොරතුරු ඇගයීම සඳහා වන ප්‍රාරම්භක නිර්ණායක මත පදනම්ව තොරතුරු හා මාධ්‍ය තක්සේරු කිරීම, විශ්ලේෂණය, සංසන්දනය හා ඇගයීමට ලක්කිරීමේ හැකියාවෙන් යුතු වීම; සාවද්‍ය තොරතුරු කුමන්ත්‍රණ න්‍යාය ලෙස හඳුනාගනිමින් ඒවා වැරදි බවට ඔප්පු කිරීමේ හැකියාවෙන් යුතු වීම; එමෙන්ම අවස්ථා හා විභවීය අවදානම් පිළිබඳ සැලකිල්ලට ගනිමින්, තොරතුරු සැපයුම්කරුවන්ගේ සත්‍යාසත්‍යතාව, අධිකාරිය, විශ්වසනීයත්වය හා වත්මන් අරමුණ, විචාරශීලීව ඇගයීමට ලක්කිරීමේ හැකියාව.
6.	මෘදුකාංග, අන්තර්ගත, සම්බන්ධතා හා අන්තර්ක්‍රියාවලට අදාළ මාර්ගගත අනතුරුවලින් ආරක්ෂා වීමට හැකි වීම.	ඩිජිටල් ආරක්ෂණ පරිචය සම්බන්ධයෙන් දැනුවත්ව සිටීම හා මෙම දැනුම මාර්ගගත අවදානම්වලින් (අන්‍යතනතා සොරාගැනීම්, තතුබැම් (phishing), වයිරස් ආසාදන, පෞද්ගලිකත්වය ආක්‍රමණය කිරීම්) ආරක්ෂා වීම සඳහා යොදා ගැනීමට හැකි වීම. පෞද්ගලික ආරක්ෂාවට (අයුතු දේට පොළඹවා ගන්නා අදහසින් බාලවයස්කරුවන් හා සමීප සබඳතා ඇති කරගැනීම (grooming), සයිබර් හිංසනය, හානිකාරක විය හැකි උපදෙස්, චරිත විග්‍රහ, වයසට නුසුදුසු අන්තර්ගත, නීති විරෝධී අන්තර්ගත, මානව හිමිකම් උල්ලංඝනය කිරීම ආදී.) ඇති තර්ජන පිළිබඳ දැනුවත්ව සිටීම සහ එවැනි අන්තර්ගත ව්‍යාප්ත කිරීම හෝ බෙදාගැනීම නොකළ යුත්තක් බව දැන සිටීම

7.	තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් අන්තර්ගත විශ්ලේෂණය, බෙදාගැනීම, සංවිධානය සහ ගබඩා කිරීම කළ හැකි වීම.	අනේකවිධ ක්‍රම සහ මෙවලම් භාවිතයෙන් තොරතුරු සහ මාධ්‍ය අන්තර්ගතය විශ්ලේෂණය කිරීමට හැකි වීම. අවශ්‍ය වන්නේ නම්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුද්ගලයකුට ස්වකීය අවශ්‍යතාවන්ට සහ/හෝ සම්පත්වලට ගැලපෙන අයුරින් පූර්ව-නිශ්චිත විශ්වසනීය විශ්ලේෂණීය ප්‍රවර්ගයන්ට අනුව තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අන්තර්ගතය සංවිධානය කිරීමට ද හැකි වීම.
8.	තොරතුරු හා මාධ්‍ය අන්තර්ගතවලින් වියුක්ත කරගත් අදහස් සංස්ලේෂණය හෝ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම	එක්රැස් කළ තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් අන්තර්ගත පරිතුලනය කර සාරාංශ කළ හැකි වීම. එක්රැස් කළ පසු, තොරතුරුවලින් සම්පත් වියුක්ත කර, අදහස් භාවිතයට ගත හැකි අතර තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අන්තර්ගත සමුද්ධරණය සහ සංවිධානය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සංකල්ප ක්‍රියාත්මක කළ හැකි වීම.
9.	සදාචාරාත්මකව සහ වගවීමෙන් තොරතුරු භාවිත කිරීම සහ කෙනෙකුගේ අවබෝධය හෝ දැනුම ග්‍රාහක පිරිසකට හෝ පාඨක ප්‍රජාවකට සුදුසු ආකෘතියකින් සහ මාධ්‍යයකින් සන්නිවේදනය කිරීම.	තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අන්තර්ගත සහ දැනුම සදාචාරාත්මක හා ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම සහ භාවිතා කිරීම. ප්‍රේක්ෂකයන්ගේ අවශ්‍යතා මත වඩාත් සුදුසු ආකෘතිය සහ ක්‍රමය තෝරා ගැනීමට ද හැකි වීම.
10.	මෘදුකාංග භාවිතා කිරීමට, තොරතුරු සැකසීමට සහ අන්තර්ගතය සම්පාදනය කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා යොදාගත හැකි වීම.	තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අන්තර්ගත සෙවීමට, ඇගයීමට සහ නිර්මාණය කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතා කිරීමේ හැකියාවකින් යුත් වන අතර, තොරතුරු උත්පාදනය සහ බෙදා හැරීමෙහි නියැලීමට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවලින් යුත් වීම.
11.	සමාජීය හෝ වාණිජමය වටිනාකමකින් යුත් නිෂ්පාදන සහ සේවා නිර්මාණය කිරීම මගින් ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා යෙදිය හැකි වීම.	ව්‍යවසායක්තව සමාගම් සඳහා තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අන්තර්ගත සහ අනෙකුත් සේවා නිර්මාණය කිරීමට හැකියාව සහ අවශ්‍ය නිපුණතා ඇති අතර එමගින් දැනුම් ආර්ථිකයේ (knowledge economy) නියැලීමට හැකි වීම.
12.	ඉතා වැදගත් ශක්‍යතා සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතා කිරීමට හැකිවීම.	ක්‍රියාවලි, යාන්ත්‍රණ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයේ කොන්දේසි, එහි හිමිකාරිත්වය, පාලනය සහ මාර්ග පරායත්තතා යන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන්හි සංවර්ධනය අවබෝධ කර ගැනීම පිණිස, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ මූලික භාවිතය ඉක්මවා යාමට හැකි වීම.
13.	සක්‍රීය සහ ගෝලීය පුරවැසියන් වශයෙන් අන්තර්ගත සපයන්නන් සමග සම්බන්ධ වීම.	පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල ඩිජිටල් භූමිකාවන්ට අදාළව, අයිතිවාසිකම් මත පදනම් වූ, විවෘත, ප්‍රවේශ විය හැකි සහ බහු පාර්ශ්වීය පාලනයක් ප්‍රවර්ධනය කිරීමෙහි ලා ආයතන සහ තනි පුද්ගලයන් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගන්නේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම.
14.	මාර්ගගත හා මාර්ග අපගත පෞද්ගලිකත්වය කළමනාකරණය කිරීම	අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කරන අතරම, කෙනෙකුගේ පෞරුෂයේ පූර්ණ සංවර්ධනය සඳහා සහ පුද්ගලයකුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා, මාර්ගගත හා මාර්ග අපගත ආකාරයෙන් වන පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය සඳහා වන අයිතීන්වල අවශ්‍යතාව සහ වටිනාකම අවබෝධ කර ගැනීම; බාධාකිරීම් හමුවේ මෙම අයිතිවාසිකම් ඉල්ලා සිටිය හැකි වීම; පෞද්ගලික චරිත සටහන (profile) සහ තොරතුරු වෙළෙඳභාණ්ඩකරණය සහ එමගින් මුදල් ඉපැයීම පිළිබඳ දැනුවත්භාවය; පෞද්ගලිකත්ව සිටුවම්/මට්ටම් සකස් කිරීමට හැකියාව ඇත; පෞද්ගලිකත්වය සහ පාරදෘශ්‍යතාව, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු වෙත ප්‍රවේශය යනාදියෙහි සමතුලිතතාවය ආමන්ත්‍රණය කළ හැකි වීම; අන්‍යයන්ගේ පෞද්ගලික තොරතුරු සදාචාර සම්පන්නව භාවිත කිරීමට සහ අන්‍යයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කිරීමට හැකි වීම.

23 විවිධ මූලාශ්‍ර භාවිතයට ගෙන ඇත.UNESCO Media and Information Literacy Assessment Framework: Country readiness and competencies,https://unesdoc.unesco.org/ ark:/48223/pf0000224655 n,kak' Accessed on 11 September 2019. Grizzle,A.(2018).Assessing Citizens' Responses to Media and Information Literacy Competencies through an online course: An Empirical Study and Critical Comparative Analysis of Experts' Views. Doctoral Dissertation. ISBN: 9788449084775: http://hdl.handle.net/10803/666860. ThesisDoctoralsenXarxa(TDX).AutonomousUniversityofBarcelona,Spain,andSeealsoFrau-Meigs,D.(2019).A Curriculum for MIL Teaching and Learning. In Carlsson,U.(2019).Understanding Media and Information Literacy (MIL) in the Digital Age. Department of Journalism, Media and Communication (JMG). University of Gothenburg, Sweden.

15.	පරිගණක ක්‍රීඩා තුළ කෘත්‍රිම බුද්ධිය භාවිත කරන විට ඇතුළුව, ඒවා සමග අන්තර්ක්‍රියා කළමනාකරණය කිරීම	ඉගෙනීම සහ තිරසර සංවර්ධනය සඳහා ක්‍රීඩාවල ප්‍රතිලාභ සහ අවදානම් අවබෝධ කර ගැනීම; ක්‍රීඩා කිරීමේ දී නිදහසට බාධා විය හැකි අවස්ථා තේරුම් ගැනීම; ක්‍රීඩා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමෙහි නිරත වීම; ක්‍රීඩාවල පාරදෘශ්‍යතාව සහ කෘත්‍රිම බුද්ධිය හා ක්‍රීඩා විඥානය වෙනුවෙන් පෙනී සිටින ආකාරය දැන සිටීම; කෘත්‍රිම බුද්ධිය හා ක්‍රීඩා සමග පෞද්ගලිකත්වය සහ අන්තර්ක්‍රියා අතර සම්බන්ධතා නිරීක්ෂණය කිරීම.
16.	තොරතුරු වෙත ප්‍රවේශය, අදහස් ප්‍රකාශනයේ නිදහස, අන්තර් සංස්කෘතික සංවාද හා අන්තර් ආගමික සංවාද, ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම සඳහා සහ සියලු ආකාරයේ විෂමතා, නොඉවසීම සහ වෙනස් කොට සැලකීමට එරෙහිව පෙනී සිටීම පිණිස මාධ්‍ය ආයතන (මාර්ග අපගත හෝ මාර්ගගත හෝ එම දෙආකාරයෙන්ම) සහ සියලුම අන්තර්ගත සපයන්නන් සමග කටයුතු කිරීම.	තොරතුරු වෙත ප්‍රවේශය, අදහස් ප්‍රකාශනයේ අයිතිය, මත දැරීමේ නිදහස (වෛරී ප්‍රකාශවල නොයෙදෙමින්) , අන්තර් සංස්කෘතික සංවාද, සදාචාරාත්මක දැනුවත්භාවයෙන් යුතුව විවිධ ක්‍රම ඔස්සේ ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවතට සහභාගී වීම යන කරුණු සම්බන්ධයෙන් අන්තර්ගත සේවාවන් සමග සම්බන්ධ වීමෙන් සමාජ සහභාගිත්වයේ වටිනාකම පිළිබඳව දැනුවත්භාවය.
17.	වෙනත් ආකාරයේ සමාජ සාක්ෂරතා සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යොදා ගැනීම	සෞඛ්‍ය සාක්ෂරතාව, මූල්‍ය සාක්ෂරතාව, විද්‍යා සාක්ෂරතාව, අන්තර් සංස්කෘතික සාක්ෂරතාව සහ අනෙකුත් සමාජ සාක්ෂරතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විචාරශීලි චින්තන නිපුණතා ඊට ඒකාබද්ධ කරන්නේ කෙසේදැයි තේරුම් ගැනීම.
18.	ගැටලු විසඳීම සහ සහයෝගීතාව සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යොදා ගැනීම	තොරතුරු මත පදනම් වූ ජීවිතයේ අවස්ථා සහ අභියෝග හඳුනා ගැනීම; අදහස් ගොඩනැගීම සහ ගැටලු විසඳීම පිණිස තොරතුරු සහ දැනුම ඒකාබද්ධ කිරීම සඳහා භෞතිකව මෙන්ම තාක්ෂණය සහ මාධ්‍ය හරහා අන් අය සමග සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න හඳුනාගැනීම.
19.	වෛරී ප්‍රකාශ සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය සඳහා නිර්මාණය කර ඇති අන්තර්ගත හඳුනාගැනීම සහ ඒවාට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව දැනසිටීම	වෛරය සහ ප්‍රචණ්ඩ අන්තවාදය යටපත් කිරීමට හෝ උත්සන්න කිරීමට අන්තර්ගතයට ඇති හැකියාව අවබෝධ කර ගැනීම ; වෙනස් කොට සැලකීම හෝ වෛරී අන්තර්ගතය සහ එවැනි අන්තර්ගතයක් හමු වූ විට ගත යුතු පියවර මොනවාදැයි හඳුනා ගැනීමට හැකි වීම.

මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා නිපුණතා මගින් දිරිමත් කළ හැකි වටිනාකම් සහ ආකල්ප	
20.	අන්තර් සංස්කෘතික සංවාදය සහ අන්තර් ආගමික සංවාදය
22.	අදහස් ප්‍රකාශනයේ නිදහස, තොරතුරු දැනගැනීමේ නිදහස සහ සහභාගී වීමේ නිදහස
22.	අන් අයගේ මත ඉවසීම සහ අන් අයට ගරු කිරීම
23.	තමා පිළිබඳ දැනුවත්භාවය සහ තමාගේම විශ්වාසයන්ට අභියෝග කිරීමේ වටිනාකම
24.	ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රඥප්ති පිළිබඳ අවබෝධය
25.	තිරසර සංවර්ධනය, එක්සත්බව සහ සාමයි

විෂයමාලා රාමුව

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) විසින් මෙහෙයවන ලද ප්‍රමුඛ විශේෂඥ කණ්ඩායම් රැස්වීම්වල නිර්දේශ, උපදේශන[24] සහ විෂයමාලාවේ විවිධ කතුවරුන් විසින් එම රාමුව හා සමගාමීව වැඩිදියුණු කරන ලද මොඩියුල මත පදනම්ව, ශික්ෂකයන් හා ශිෂ්‍යයන් සඳහා වන මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සකස්ව පවතින, ප්‍රධාන අන්තර් සම්බන්ධිත තේමාත්මක ක්ෂේත්‍ර ත්‍රිත්වය නිරූපණය කර ඇත. එම ක්ෂේත්‍ර වනුයේ:

1. තිරසර සංවර්ධනය,සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදී කතිකා සහ සමාජ සහභාගීත්වය සඳහා තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන පිළිබඳ දැනුම සහ අවබෝධය
2. අන්තර්ගතය සහ සම්බන්ධිත ආයතන ඇගයීම
3. අන්තර්ගතය සම්පාදනය සහ භාවිතය

මෙම ක්ෂේත්‍ර, ඒවායේ ප්‍රගාමී සහසම්බන්ධය දැක්වීමට හා ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා වන මෙම යුනෙස්කෝ ආදර්ශ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව (වගුව බලන්න) සඳහා විෂයමාලා රාමුවක් සැකසීම සඳහා පොදු අධ්‍යාපන හා ගුරු සංවර්ධනයේ ප්‍රධාන ක්ෂේත්‍ර හයක් සමග සම්බන්ධ කර ඇත. අධ්‍යාපනයේ සහ සමාජයේ සියලු මට්ටම් තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වැඩි දියුණු කිරීම හා ඒකාබද්ධ කිරීම සඳහා වඩා පුළුල් ප්‍රතිපත්ති සංවර්ධන සන්දර්භයක් හා මාර්ගෝපදේශ සැපයීම සඳහා යුනෙස්කෝව විසින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා මාර්ගෝපදේශ කෙටුම්පත් ප්‍රමිති (Standards for Media and Information Literacy Curricula Guidelines)[25] හා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්ති හා උපායමාර්ග මාර්ගෝපදේශ (Media and Information Policy and Strategy Guidelines)[26] සකස් කර ඇත.

ගෝලීය, කලාපීය හා ජාතික උපායමාර්ග සමග අනුවර්තනය කරගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා රාමුව හා සමගාමී විෂයමාලා මොඩියුල සර්වග්‍රාහී, හා නිර්දේශාත්මක නොවන ස්වරූපයෙන් පවතී. (වැඩි විස්තර සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව - 2 කොටසෙහි හඳුන්වාදීමෙහි අනුවර්තන ක්‍රියාවලිය හා ඒකාබද්ධ කිරීමේ උපායමාර්ග යන කොටස් බලන්න)

ඒවා විවිධ අධ්‍යාපනික හා ආයතනික පද්ධති හා දේශීය අවශ්‍යතා හා යථෝචිත වීම පිණිස අනුවර්තනය කරගැනීමට තරම් නම්‍යශීලී විය යුතු ය. එසේ වුවද, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වෙත ශික්ෂකයන්ගේ හා ශිෂ්‍යයන්ගේ කවර හෝ ප්‍රයෝජනවත් නිරාවරණය වීමක් තුළ, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තියේ දක්වා ඇති පරිදි තිරසර සංවර්ධන ඉලක්ක හා මූලික අයිතිවාසිකම්වල විචාරශීලි නියැලීමක අවශ්‍යතාව අවධාරණය කෙරෙන මූලිකාංග, අවශ්‍යයෙන්ම අන්තර්ගත විය යුතු බව යුනෙස්කෝව විසින් සලකනු ලබයි. කුමන ආකාරයේ අනුවර්තන අකෘතියක වුවද, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විෂයමාලාව, තිරසර සංවර්ධනය සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි වැදගත්කම හා පුරවැසි අධ්‍යාපනයේ අත්‍යාවශ්‍ය අංගයක් වශයෙන් මෙම මූලික අයිතීන්හි අවශ්‍යතාව පිළිබඳ ශික්ෂකයන් හා ශිෂ්‍යයන්ට අවබෝධ කර ගැනීමට උපකාරී විය යුතු වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව, මාර්ගගත හෝ මාර්ග අපගත පුවත්පත්, ග්‍රන්ථ, ගුවන්විදුලි හා රූපවාහිනී ආදී විද්‍යුත් ප්‍රචාරණ මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදනය ඇතුළු මුද්‍රිත හා ශ්‍රව්‍ය දෘශ්‍ය පරිසරවල සියලු ආකාරයේ අන්තර්ගත සපයන්නන්ට අදාළ වේ. එබැවින්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයන් හා සම-පදස්ථ ශික්ෂක පුහුණුව, උසස් ඩිජිටල් තාක්ෂණයක් හා ප්‍රවේශය සහිත අයවලුන් සඳහා පමණක් වෙන්කොට ඇති සෙයින් නොදැකිය යුතු ය. එය උසස් ඩිජිටල් තාක්ෂණයක් භාවිතය සීමිත සන්දර්භයන්හි පවා එක හා සමානව යොදා ගත හැකි ය.

24 2008 වසරේ ආරම්භ කරන ලද පළමු සංස්කරණයේ ඇතුළත් වූ ද, 2019/2020 ප්‍රකාශිත මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ මෙම දෙවන සංස්කරණයේ ද දක්වා ඇති විශේෂඥ කණ්ඩායම් රැස්වීම් හා උපදේශන මාලාවේ නිර්දේශ මත මෙම විෂයමාලාව පදනම් වේ.

25 Standards for Media and Information Literacy Curricula Guidelines, https://en.unesco.org/sites/default/files/belgrade_recommendations_on_draft_global_standards_for_mil_curricula_guidelines_12_novem- ber.pdf

26 Media and Information Policy and Strategy Guidelines.UNESCO,Paris, 2013.

2වන වගුව : ශික්ෂකයන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා රාමුව

විෂයමාලා මාන			
මූලික විෂයමාලා ක්ෂෙත්‍ර	තිරසර සංවර්ධනය හා ප්‍රජාතාන්ත්‍රික කතිකා උදෙසා තොරතුරු පිළිබඳ දැනුම	අන්තර්ගත ඇගයීම	අන්තර්ගතය සම්පාදනය හා භාවිතය
විෂයමාලාව හා ඇගයීම	අන්තර්ගතයන් සැපයුම්කරුවන්, ඔවුන්ගේ කාර්යයන් හා ඒවා ඉටු කිරීමට අවශ්‍ය වන කොන්දේසි පිළිබඳ දැනුම	අන්තර්ගතය ඇගයීම සඳහා වන නිර්ණායක අවබෝධ කර ගැනීම	අන්තර්ගත සම්පාදනය කෙරෙන ආකාරය, සම්පාදනයෙහි සමාජීය හා සංස්කෘතික සංදර්භය, පුරවැසියන්ගේ භාවිතයන් හා අරමුණු ගවේෂණය සඳහා කුසලතාව
ශික්ෂකයන්ගේ වෘත්තීමය සංවර්ධනය	පුරවැසි අධ්‍යාපනය, වෘත්තිය ප්‍රජාව තුළ සහභාගීත්වය හා ඔවුන්ගේ සමාජයන් පාලනය සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ දැනුම	වෘත්තීය ඉගෙනුම සඳහා මාධ්‍ය තොරතුරු, සහ තාක්ෂණය හා ඩිජිටල් නියැලුම් සම්පත් (Digital Engagement Resources) සම්පත් ඇගයීම හා කළමනාකරණය	නායකත්වය හා සක්‍රීය පුරවැසිභාවය; ශික්ෂකයන්ගේ හා ශිෂ්‍යයන්ගේ සංවර්ධනය සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය සහ භාවිතය වෙනුවෙන් සහයෝගය දීම හා පෙනී සිටීම.
අන්තර්ගතය	මාධ්‍ය ආයතන, පුස්තකාල, කෞතුකාගාර, ග්‍රන්ථ ආදී සාම්ප්‍රදායික සැපයුම්කරුවන් වෙතින්, මාර්ගගත හෝ මාර්ග අපගත, අන්තර්ගතය	ආයතනික හෝ තනි පුද්ගල මූලාශ්‍ර හා බැඳි අන්තර්ගත ලක්ෂණ	ඇල්ගොරිත්මික ශ්‍රේණිගත කිරීම හෝ බෙදාගැනීම වැනි ක්‍රම හරහා අන්තර්ගත භාවිතය, උත්පාදනය /නිර්මාණය
සංවිධානය හා පරිපාලනය	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පාඩම් සැලසුම් වැඩිදියුණු කිරීම සඳහා දැනුම	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් සහයෝගිතාව	යාවජීව ඉගෙනුම් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යොදා ගැනීම
ශික්ෂණ විද්‍යාව	අන්තර්ගතය, හර විෂයමාලාව/ ඉගෙනුම් අවකාශ සහ කතිකා වෙත ඒකාබද්ධ කිරීම	ගැටලු විසඳීම සඳහා අන්තර්ගත සහ අන්තර්ගත සපයන්නන් ඇගයීම	ඉගෙනුම් ඉගැන්වීම් සඳහා පරිශීලක ජනිත අන්තර්ගතය සහ භාවිතය
ප්‍රතිපත්ති හා දැක්ම	මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයන් හා ඉගෙනුම් අවකාශ සුදානම් කිරීම	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත ශිෂ්‍යයන්/පුරවැසියන් සුදානම් කිරීම	මාධ්‍ය හා තොරතුරු සාක්ෂර සමාජ අභිවර්ධනය කිරීම

ප්‍රතිපත්තිය හා දැක්ම

පොදුවේ ගත් කල, සියලු මට්ටමේ අධ්‍යාපන ක්‍රම සහ සමාජ වෙත මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ක්‍රමානුකූල හා ප්‍රග්‍රාමී ලෙස අන්තර්ග්‍රහණය කර ගැනීම සහතික වනු පිණිස ජාතික ප්‍රතිපත්තීන් අවශ්‍ය කෙරෙනු ඇත. ජාතික අධ්‍යාපනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICTs), තාරුණ්‍ය, අන්තර්ගතයට සහසම්බන්ධිත ආයතන හා කර්මාන්ත, සංස්කෘතික ප්‍රතිපත්ති, අදහස් ප්‍රකාශනයේ නිදහස හා තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ නීති සබල කිරීම සහ අනෙකුත් තිරසර සංවර්ධන ප්‍රතිපත්ති හා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්තීන් සමග ඒවායේ අන්තර් ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය එහි සමාරම්භක ලක්ෂ්‍ය විය යුතු ය. මාධ්‍ය තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්ති නොපවතින තැන ගැටලුව වන්නේ ඒවා සම්බන්ධයෙන් පෙනී සිටීමේ දී ශික්ෂකයන් හා ශිෂ්‍යයන් කුමන භූමිකාවක් නිරූපණය කළ යුතු ද? ප්‍රතිපත්ති පවතී නම්, ඒවා කෙතරම් දුරට අදාළ හා යාවත්කාලීන ද? ඒවා මගින් ජාත්‍යන්තර ප්‍රමිති සහ පරිචය කෙතරම් දුරට පිළිබිඹු කෙරෙන්නේද? ඒවා යාවත්කාලීන කළ හැක්කේ කෙසේ ද? යන්නයි. එබැවින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විෂයමාලාවේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවයේ "ප්‍රතිපත්ති හා දැක්ම" හා අධ්‍යාපනයේ හා සමාජයේ සියලු මට්ටම් හා වර්ග සඳහා එහි ගම්‍යාර්ථයයි. මෙම සාකච්ඡාව, ප්‍රතිපත්ති හා දැක්ම සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂණයන් හා ශිෂ්‍යයන් සූදානම් කිරීම සඳහා ඒවා සම්බන්ධ කර ගන්නේ කෙසේ ද යන්න විශ්ලේෂණය කිරීමක් දක්වා මග පෙන්විය යුතු වේ. අවසන් වශයෙන්, එමගින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂර සමාජ ඇති කිරීමේහිලා ශික්ෂකයන්ගේ භූමිකාව පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ. යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්තිය හා උපායමාර්ග මාර්ගෝපදේශ (UNESCO Media and Information Literacy Policy and Strategies Guidelines)[27] මගින් පියවරෙන් පියවර ක්‍රියාවලියක් යෝජනා කෙරේ.

තිරසර සංවර්ධනය, සාමය, ප්‍රජාතාන්ත්‍රික කතිකාව හා සමාජ සහභාගිත්වය උදෙසා තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදනය පිළිබඳ දැනුම.

මෙම පුළුල් තේමාත්මක ක්ෂේත්‍රයේ අරමුණ වනුයේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින්, තිරසර සංවර්ධනය, අදහස් ප්‍රකාශනයේ නිදහස, බහුත්වය, අන්තර් සංස්කෘතික සංවාදය හා ඉවසීම, ගෝලීය පුරවැසිභාවය හි භව්‍ය පහසුකම් සපයන්නන් ලෙස හා මහජන ප්‍රතිලාභය හා ප්‍රජාතන්ත්‍රවාදී විවාදය හා යහපාලනය සඳහා තොරතුරු දායකයන් ලෙස අන්තර්ගත සැපයුම්කරුවන් හා කටයුතු කිරීමට ශික්ෂකයන්ගේ, ශිෂ්‍යයන්ගේ හා පොදුවේ ගත් කළ සියලුම පුරවැසියන්ගේ ඇති හැකියාව කුමන ආකාරයෙන් ප්‍රවර්ධනය කළ හැකිදැයි යන්න පිළිබඳ විචාරශීලී අවබෝධයක් ඇති කරලීමයි. මෙම කොටස අවසානයේ දක්වා ඇති 05වන රූප සටහන මගින් මෙම සම්බන්ධතාවය විදහා දක්වයි. මෙම තේමාව පුස්තකාල, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් ඇතුළු විවිධ අන්තර්ගත සපයන්නන්ගේ කාර්යභාරය හා වැදගත්කම හා සම්බන්ධිත අභිවිෂාදන ගැටලු රාශියක් ආවරණය කරයි. එනම් ,

- පුරවැසියන්ට තමන්ගේ අයිතිවාසිකම් සඳහා එකිනෙකා හා සන්නිවේදනය කළ හැකි හා පෙනී සිටිය හැකි මාර්ග සැපයීම.
- පොදු යහපත සඳහා තොරතුරු ගබඩා කිරීම, සැකසීම, විශ්ලේෂණය හා බෙදාහැරීම.
- වෘතාන්ත, අදහස් හා තොරතුරු බෙදාහැරීම.

27 Media and Information Policy and Strategy Guidelines.UNESCO, Paris, 2013.

- පාලකයන් හා පාලිතයන් හා තරගකාරී පුද්ගලික නියෝජිතයන් අතර පවතින තොරතුරු අසමමිතිය නිවැරදි කිරීම.
- විවිධ සමාජ ක්‍රියාකාරීන් අතර අවබෝධිත විවාද සඳහා පහසුකම් සැලසීම හා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම මගින් ආරවුල් නිරාකරණය දිරිමත් කිරීම.
- සමාජයට එය පිළිබඳවම අවබෝධයක් ලබා ගෙන ප්‍රජා සංවේදනයක් ඇති කරගන්නා මාර්ගයක් සැපයීම.
- සංස්කෘතික ප්‍රකාශනය, ජාතීන් තුළ හා අතර සංස්කෘතික සහජීවනය සහ තිරසර සංවර්ධනය සඳහා මාධ්‍යකයක් සැපයීම.
- පොදුජන ජීවිතයේ පාරදෘශ්‍යතාව හා දූෂණ හා ආයතනික වැරදි අනාවරණය කිරීම තුළින් බලයේ සිටිනවුන් සුපරීක්ෂාවට ලක් කිරීම දිරි ගන්වමින් රජයේ සියලුම ආකාර පිළිබඳ අධීක්ෂයකු ලෙස ක්‍රියාකිරීම.
- සමාජයීය හා ආර්ථික ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා මෙවලමක් ලෙස ක්‍රියා කිරීම
- තිරසර සංවර්ධනය හා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලි සඳහා පහසුකම් සැලසීම හා නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා සහතික කිරීම සඳහා සහාය දැක්වීම
- බහුත්වවාදී අගයන් (ප්‍රවෘත්ති මාධ්‍ය) ගරු කරමින්, ස්වාධීන පෙනී සිටින්නකු (advocate) හා සමාජ කාරකයකු ලෙස ක්‍රියා කිරීම
- සමාජයේ සාමූහික ස්මෘතිය (පුස්තකාල) ලෙස ක්‍රියා කිරීම
- සංස්කෘතික උරුමය සුරක්ෂිත කිරීම
- තොරතුරු සඳහා ද්වාරයක් සැපයීම
- මහජනතාව වෙත ප්‍රවේශය සැපයීම හරහා ඩිජිටල් බෙදීම් පරතරය පියවීම සඳහා සහය වීම
- පුස්තකාල, ලේඛනාගාර හා කෞතුකාගාර සඳහා තොරතුරු නියෝජිතායතන හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන ලෙස ක්‍රියා ක්‍රියාකිරීමට ඉඩ ප්‍රස්ථා සැලැස්වීම
- පුස්තකාල තුළ සියලුම වර්ගයේ තොරතුරු සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම
- අධ්‍යයන පුස්තකාල හරහා ඉගැන්වීම, ඉගෙනුම සහ ඉගෙනීමට ඉගෙනුම සඳහා පහසුකම් සැපයීම
- පුස්තකාල පරිශීලකයන් දැනුවත් කිරීම

(2008 යුනෙස්කෝ මාධ්‍ය සංවර්ධන දර්ශක ඇසුරිනි)

යුනෙස්කෝ මාධ්‍ය සංවර්ධන දර්ශක තුළ කොසොවෝ පිළිබඳ සියලු යොමු, 1244 (1999) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල යෝජනාවේ සන්දර්භය තුළ අවබෝධ කර ගත යුතු වේ.

විවෘත තොරතුරු, මාධ්‍ය හා හා ඩිජිටල් පද්ධතිවලින් තොරව තිරසර සංවර්ධනය ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය යන මූලික කුලුනු, එනම් පාරදෘශ්‍යතාව, වගවීම හා පුරවැසි සහභාගිත්වය ළඟාකර ගැනීම අසීරු වේ. මෙම පද්ධති සජීවී සිවිල් සමාජයක් හෝ "ප්‍රජා සංස්කෘතියක්" උත්තේජනය කිරීම සඳහා උපකාරී විය හැකි ය.

මෙකී සේවා කාර්යන්ට පහත දෑ ඇතුළත් වේ.

- විවිධ පුද්ගල කණ්ඩායම්වලට අවබෝධ කරගත හැකි හා අදාළ වන්නා වූ තොරතුරු සහ දැනුම වෙත සමාන ප්‍රවේශයක් ලබා දීම; විවෘත විවාද හා සාකච්ඡා සඳහා වේදිකාවක් සැපයීම
- තිරසර සංවර්ධන, ප්‍රජාතන්ත්‍රවාදී හා යහපාලන වටිනාකම් පිළිගනු ලබන අගයන්ට හා ක්‍රියා පටිපාටිවලට පක්ෂපාතිත්වය හා අඛණ්ඩ කැපවීම ඇති කරවන පෙළඹවීමක්

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව මගින් , ශික්ෂකයන් හා ශිෂ්‍යයන් හට ඔවුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් භාවිත තුළ ශිෂ්‍යයන්ගේ මත, විවිධත්වය අගය කෙරෙන හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී වන ආකාරයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඒකාබද්ධ කිරීමේ නිපුණතාව වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය වන අන්තර්ගත සපයනු ලබයි. මෙහිදී ගැටලුව වනුයේ විවිධ අවබෝධ හා පර්යාලෝක වැඩි දියුණු කිරීම පිණිස, ස්වයං ප්‍රකාශනයට හා තනි පුද්ගල මත විස්තෘත කිරීමට පුද්ගලයකු අන්තර්ගත සපයන්නන් හා සමග යමෙකු සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න ය.

තොරතුරු ආයතන (පුස්තකාල, මාධ්‍ය ආයතන හා ඩිජිටල් සන්නිවේදන සමාගම්) වෘත්තිමය ඉගෙනුම්වල සහභාගිත්වය පුළුල් කිරීම සඳහා වේදිකා නිර්මාණය කරයි. ඇතැම් රටවල් තුළ ඒවා ශික්ෂකයන්ගේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් (ODL) හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා පවා යොදා ගනු ලැබීමේ හැකියාව ඇත. මෙම විෂයමාලා මගින් ශික්ෂකයන්ට ඔවුන්ගේම වෘත්තීය ප්‍රජාවන් තුළ සහභාගිත්වය වැඩි දියුණු කර ගැනීමට විවිධ තොරතුරු හා සන්නිවේදන පද්ධති භාවිතා කළ හැකිකේ කුමන ආකාරයටද යන්න ගවේෂණය කරනු ලබයි. විවිධ සමාජ සන්දර්භයන් හා භූගෝලීය ස්ථානවල සේවය කරන ශික්ෂකයන්ට වෘත්තීය ඉගෙනුම හා පරිචය පිළිබඳ දැනුම හා තොරතුරු බෙදා ගත හැකි ය.

05වන රූපසටහන: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ තිරසර සංවර්ධනය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා එහි වැදගත්කම



තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන ඇගයීම.

ගැටලු නිරාකරණය හා විචාරශීලී චින්තනය සියලු විෂයයන්හි මෙන්ම එදිනෙදා ජීවිතයේ ද ප්‍රධාන වැදගත් කොටසක් වේ. ගැටලු විවිධ මූලාශ්‍රවල අන්තර්ගතය විචාරශීලීව ඇගයීම සඳහා අවස්ථා බවට පත් වේ.

අන්තර්ගත සපයන්නන් වෙත ප්‍රතිමානකව ආරෝපණය කර ඇති විශේෂිත මහජන සේවා කාර්යයන් මත පදනම්ව මූලාශ්‍ර ඇගයීමට හා තොරතුරු තක්සේරු කිරීමට ශික්ෂකයන්ගේ හා ශිෂ්‍යයන්ගේ ධාරිතාව වැඩි කිරීම මෙහි අරමුණ වේ. ශික්ෂකයන් හා ශිෂ්‍යයන් හට සන්දේශ විසංයෝජනය හා ඒවා විචාරශීලීව හැසිරවීමට හැකි වීම තුළින්, ප්‍රයෝජනවත් හා පක්ෂග්‍රාහී හෝ අනර්ථකාරී අන්තර්ගත හඳුනාගැනීමට හා විශ්ලේෂණය කිරීමට මාධ්‍ය තොරතුරු සාක්ෂරතා නිපුණතාවලින් සමර්ථයන්ගෙන් සන්නද්ධ විය යුතු වේ. මෙම පද්ධතී අපේක්ෂිත භූමිකාවන්ගෙන් බැහැර වන විට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුමෙන් ශික්ෂකයන් හා ශිෂ්‍යයන් සන්නද්ධ කිරීම මෙහි තවත් අරමුණකි. විධිමත් හා නොවිධිමත් ඉගෙනුම් පසුබිම් තුළ හා ඒ සඳහා සම්පාදනය කෙරෙන අන්තර්ගතයට සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා සම්බන්ධ වන ආකාරය පිරික්සීමට ශික්ෂකයන්ට හැකි විය යුතු ය. මෙහි දී ඉස්මතු කෙරෙන කාරණය වන්නේ අධ්‍යාපන පද්ධති තුළ වන තොරතුරු හා අන්තර්ගතය පවා පක්ෂග්‍රාහී ඒකකෘතික අසම්පූර්ණ හා සමහරවිට වැරදි සහගත පවා විය හැකි බවයි. නිදසුනක් ලෙස පෙළ පොත්, විෂයමාලා හෝ පර්යේෂණවල මෙන්ම මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන පද්ධතිවලින් සැකසෙන නිකුත්වෙන තොරතුරු සහ දේශීය හා ගෝලීය වශයෙන් විවිධත්වය හා බහුත්වය ආමන්ත්‍රණය කෙරෙන විධීන්හි අන්තර්ගතයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය , වාර්ගික, ආගමික, හා වෙනත් ආකාරයේ නියෝජනයේ ගැටලු ගවේෂණය කිරීමට ශික්ෂකයන්ට හැකි විය යුතු ය.

අවසාන වශයෙන් ශික්ෂකයන් හා ශිෂ්‍යයන් විසින් සාමාන්‍ය මෙන්ම විවිධ මූලාශ්‍රවලින් එන විශේෂිත පෙළ හෝ අන්තර්ගත ඔවුන් විසින් අර්ථකතනය කරන ආකාරය හා මෙය ඔවුන්ගේ ඉගෙනුම් හා සමාජ ක්‍රියාකාරකම් වැඩිදියුණු කරන හෝ ඊට බාධා පමුණුවන ආකාරය පිළිබඳ ඇගයීමට තම ශක්‍යතා වර්ධනය කර ගත යුතු ය.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා හා ඒ තුළ අන්තර්ගත සම්පාදනය හා භාවිතය

ශික්ෂකයන් හා ශිෂ්‍යයන් විසින් අත් කරගත යුතු නිපුණතා විය යුත්තේ දී ඇති ඉගෙනුම් අරමුණු හා ඉගෙනුම් අවශ්‍යතා සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ද්‍රව්‍ය හා මෙවලම් තෝරාගැනීම, අනුවර්තනය හා /හෝ වැඩිදියුණු කිරීමේ හා භාවිතා කිරීමේ හැකියාවයි. මීට අමතරව ශික්ෂකයන් විසින් තම ඉගෙනුම්වලට විශේෂයෙන්ම අන්තර්ගතය නිෂ්පාදනයට අදාළව මෙම මෙවලම් හා සම්පත් යොදා ගැනීම සඳහා නිපුණතා සංවර්ධනය කරගත යුතු ය.

අන්තර්ගත සම්පාදනය හා භාවිතය මගින් ශික්ෂකයන්ගේ හා ශිෂ්‍යයන්ගේ අතින් ගත් කල විමර්ශනය හා ප්‍රත්‍යවේක්ෂණීය චින්තනය දිරිමත් කෙරෙන ශිෂ්‍ය කේන්ද්‍රීය ශීක්ෂණ විද්‍යාවක් බිහිකල යුතු ය. මෙහි දී අධ්‍යන අන්තර්ගත ජීවන චක්‍රයේ මූලික කරුණු හා ශාස්ත්‍රීය පර්යේෂණ නිපුණතා අවබෝධ කරගැනීමට වඩා අවධානයක් ලබා දිය යුතු ය. ක්‍රියා පාදක ඉගෙනුම, 21වන සියවස තුළ දැනුම උපාර්ජනය කිරීමේ වැදගත් ලක්ෂණයකි. අන්තර්ගත සම්පාදනය, ශික්ෂකයන් හා ශිෂ්‍යයන් විධිමත් ඉගෙනුම් පසුබිමක් තුළ හා ඉන් බාහිරව සහභාගිත්ව පරිසරයන්හි දී පෙළ හා අනුරූප සම්පාදන කාර්යය ඔස්සේ ඉගෙනුමෙහි නිමග්න කරවීමට මං පෙත් සපයයි. සහභාගිත්ව ඉගෙනුම සඳහා නිපුණතාවය/ ප්‍රවීණතා ශිෂ්‍යයන් විසින් වර්ධනය කර ගැනීමට නම් ශික්ෂකයන් මෙම ක්‍රියාවලියේ සක්‍රිය භූමිකාවක් ඉටු කළ යුතු වේ.

ඩිජිටල් සන්නිවේදන සමාගම් බොහෝ ගණනක් මෙන්ම සාම්ප්‍රදායික මාධ්‍ය ද පරිශීලක විසින් ජනිත අන්තර්ගත කෙරෙහි එක හා සමානව, දැඩි ආකර්ෂණයක් දක්වයි.

සමාජ ජාලකරණ වේදිකාවල සිටින වෙනත් පරිශීලකයන් සමග අන්තර්ක්‍රියා කිරීමේ හැකියාව, තරුණ පරම්පරාව විවිධ බෙදාහැරීමේ වේදිකා (delivery platforms) ඔස්සේ අන්තර්ජාලයට ප්‍රවේශ වෙමින් සිටීමට ප්‍රමුඛතම හේතු වේ. මෙය සංවර්ධිත රටවලට පමණක් සීමා නොවේ. අප්‍රිකාව, දකුණු ආසියාව, ලතින් ඇමරිකා, කැරිබියානු දූපත්වල පුරවැසියෝ වැඩි වශයෙන් ජංගම තාක්ෂණය වෙත ප්‍රවේශය ලබා ගනිමින් සිටින අතර, සන්දේශ ලබා ගැනීමට හා යැවීමට මෙන්ම ඔවුන්ගේ ජීවිතවලට බලපාන සමාජයීය, තිරසර සංවර්ධන හා දේශපාලන ගැටලු සම්බන්ධ විවාදවලට සහභාගි වීමට, එය භාවිත කරති. එමෙන්ම, ඔවුහු විනෝදාස්වාදය හා ප්‍රචාරණ කටයුතු හා අසත්‍ය හා නොමග යවන සුළු අන්තර්ගත ව්‍යාප්ති සංචාලනය කරන ආකාරය පිළිබඳව කටයුතුවල නිරත වන අතර ව්‍යාපෘති හා නොමග යවන සුලු අන්තර්ගත ව්‍යාප්තිය සංචලනය කරන ආකාරය පිළිබඳව කටයුතුවල ඔවුහු නියැලී සිටිති.

ශික්ෂකයන් හා ශිෂ්‍යයන් විසින් උපදේශනාත්මක භාවිත මාධ්‍ය හා ඩිජිටල් අන්තර්ගත සම්පාදනයෙහි හා භාවිතයෙහි නිපුණතාව හා විශ්වාසය වර්ධනය කර ගන්නා විට ඉගෙනුම් විෂයමාලාව තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේ නායකයන් බවට පත් වෙමින් ඔවුහු පෙරට යති. විවිධ කාර්යයන් සඳහා ඔවුන් මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවීණතාව ඉහළ නංවා ගන්නා විට, ශික්ෂකයෝ හා ශිෂ්‍යයෝ මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් හා සමාජ පරිසර මෙන්ම පුළුල් සමාජය තුළ මාධ්‍ය තොරතුරු සාක්ෂර ශූරයන් හා සම ශික්ෂකයන් බවට පත් වෙති.

ශික්ෂකයන්ගේ හර නිපුණතා

3වන වගුව මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව, ගුරුවරුන්/ ශික්ෂකයන් සඳහා වන ස්ථාපිත විෂයමාලා ක්ෂේත්‍ර හා තවදුරටත් සම්බන්ධ කරයි. මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලා රාමුවෙහි එක් එක් අංග යටතේ ශික්ෂකයන් විසින් අත්කර ගැනීමට හා ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන හර නිපුණතා මෙම කුසලතා මගින් විදහා දක්වයි. විෂයමාලා ක්ෂේත්‍රයන්ට අදාළව ශික්ෂකයන් විසින් කුසලතා කොපමණ දුරට වැඩි දියුණු කරගෙන ඇති ද යන්න ඇගයීම මගින් අපේක්ෂිත සමස්ථ ප්‍රතිඵල කුමක් විය යුතුද යන්න 03වන වගුව මගින් පෙන්නුම් කෙරේ.

03වන වගුව : යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා ඉලක්ක හා ශික්ෂක කුසලතා

විෂයමාලා ක්ෂේත්‍ර	විෂයමාලා ඉලක්ක	බලගැන්විය යුතු ශික්ෂක කුසලතා
ප්‍රතිපත්ති හා දැක්ම	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්ති හා දැක්ම පිළිබඳ ශික්ෂකයන් සංවේදි කිරීම	මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්ති සහ, ඒවා අධ්‍යාපනය (හා සමාජය) තුළ දී යථාර්ථයක් බවට පත් කර ගන්නේ කෙසේ ද යන්න ශික්ෂකයෝ අවබෝධ කර ගනිති. පුරවැසි අධ්‍යාපන හා ගෝලීය පුරවැසි අධ්‍යාපන සන්දර්භය තුළ ජීවන කුසලතා හා පුළුල් සංවර්ධනයට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව දායකවන්නේ කෙසේද යන්න ද ඔවුන් අවබෝධ කරගත යුතු ය.
විෂයමාලාව හා ඇගයීම	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සම්පත් භාවිතය සහ ඒවා යොදා ගැනීම අවධාරණය කිරීම	පාසල් විෂයමාලාව තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව උපයෝජනය කළ හැක්කේ කෙසේ ද යන්න ශික්ෂකයෝ අවබෝධ කර ගනිති. ඔවුන් වෙත ආරෝපිත කාර්යයන් සැලකිල්ලට ගනිමින් අන්තර්ගත සපයන්නන්ගේ පරාසය විචාරශීලීව ඇගයීමේ හැකියාව ඔවුන් සතු වන අතර, එකී අරමුණ සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ලබා දෙනු පිණිස අන්තර්ගත සපයන්නන් වෙතින් පුළුල් පරාසයක වන අන්තර්ගත තෝරා ගැනීමේ හැකියාව ද ඔවුන් සතු වේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සිසුන් තුළ ඇති අවබෝධය ඇගයීමට ලක් කිරීමේ කුසලතාව ඔවුන් සතු වේ.

තොරතුරු, මාධ්‍ය හා අන්තර්ජාල ආයතන	පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් ආදී තොරතුරු සපයන්නන් සමස්ත පරාසයෙහිම දැනුම ඉහළ නැංවීම	අන්තර්ගත සපයන්නන් සියලු දෙනාම සිය වර්තමාන ස්වභාවය දක්වා විකාසනය වූ ආකාරය පිළිබඳ දැනුමක් හා අවබෝධයක් ශික්ෂකයන් තුළ ඇත. විවිධ ග්‍රාහක පිරිස් වෙත ළඟාවීම සඳහා ඔවුහු පවතින තාක්ෂණය යොදා ගැනීමේ කුසලතා වැඩි දියුණු කර ගනිති. විචාරශීලි චින්තනය හා ගැටලු විසඳීමේ කුසලතා ඉහළ නැංවීමටත්, එම කුසලතා තම සිසුන් කරා විහිදුවා ලීමටත් ඔවුහු විවිධ අන්තර්ගත සම්පත් භාවිත කරති.
සංවිධානය හා පරිපාලනය	සියලු ඉගෙනුම් ඉගැන්වීම් කටයුතුවලට ඵලදායී සහභාගීත්වය සඳහා ඉගෙනුම් අවකාශ සංවිධානය කිරීමට ශික්ෂකයන්ගේ ධාරිතාව ඉහල නැංවීම සහ එය සාක්ෂාත් කරගැනීමේදී අන්තර්ගත සම්පත් අවශ්‍ය සාධකයක් බවට පත් කරගැනීම	මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයන්ට ඉගෙනුම් අවකාශ සංවිධානය කිරීම අවබෝධයක් තිබිය යුතු ය; ඉගෙනුම් අවකාශ, පසුබිම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොසලකා විවිධ අදහස් හා පර්යාලෝකවලට ගරු කරන්නා වූ අවකාශ බවට පත් කිරීමට හැකි වන ආකාරයෙන් ඉගෙනුම් සංවිධානය කිරීමේ කුසලතා පෙන්වීම ඇතුළු, පුරවැසි අධ්‍යාපනය හා යාවජීව ඉගෙනුම සඳහා විවිධ අන්තර්ගත සපයන්නන් යොදා ගැනීම උපරිම කරන ඉගෙනුම් ඉගැන්වීම් තත්ත්ව නිර්මාණය කිරීමේ හැකියාවද ඔවුන් සතු වේ.
ශික්ෂණවිද්‍යාව	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීමට අවශ්‍ය වන ශික්ෂකයන්ගේ ශික්ෂණවිද්‍යා පරිවයෙහි වෙනසක් ඇති කිරීම	සිසුන්ට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීමට අවශ්‍ය කෙරෙන ශික්ෂණ විද්‍යා කුසලතා මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයන් විසින් උපාර්ජනය කරගත යුතු වේ. යහ පාලනය, තිරසර සංවර්ධනය සහ අන්තර් සංස්කෘතික සංවාද යන පර්යාලෝක ඔස්සේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීමේ හැකියාව ඔවුන් සතුව පවතී. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඉගෙනුමට සහය දැක්වීමේ මූලික පියවර ලෙස, සියලුම අන්තර්ගත සපයන්නන් සමග සිසුන්ගේ අන්තර්ක්‍රියාකාරිත්වය සහ ඔවුනට සිසුන් දක්වන ප්‍රතිචාර පිළිබඳ ශික්ෂකයෝ දැනුම උපාර්ජනය කර ගනිති. ඉගෙනුම් අත්දැකීම් ශිෂ්‍යයන් හට අර්ථවත් කෙරෙන, ඔවුන්ව පුරවැසියන්ගේ භූමිකාව සඳහා සූදානම් කෙරෙන ඉගෙනුම් අත්දැකීම් නිර්මාණය කිරීමට ශික්ෂකයෝ කේන්ද්‍රීය සංකල්ප, විමර්ශන මෙවලම් සහ මාධ්‍ය තොරතුරු සාක්ෂරතා ව්‍යුහයන් අවබෝධ කර ගනිති.
ශික්ෂකයන්ගේ වෘත්තීය සංවර්ධනය	යාවජීව ඉගෙනුම හා වෘත්තීය සංවර්ධනය සඳහා අන්තර්ගත සම්පත් යොදා ගැනීම පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම	ස්වකීය වෘත්තීය සංවර්ධනයට රුකුලක් වශයෙන්, තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ විෂය කරුණු හා ශික්ෂණවිද්‍යා දැනුම උපාර්ජනය කරගැනීමට තාක්ෂණය භාවිත කිරීමටත්, අන්තර්ගත සපයන්නන් හා සම්බන්ධව කටයුතු කිරීමටත් අවශ්‍ය කුසලතා ශික්ෂකයන් සතුව ඇත.

මෙම රාමුව මගින් ගුණාත්මක මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා සඳහා හර මොඩියුල 14ක් හඳුන්වා දෙනු ලැබේ. එම මොඩියුල හරහා ශික්ෂකයන්, සියලු සමාජ කාරකයන් සහ ආයතන විසින්, ඔවුනට අදාළ රටවලට අනුහුරු කරගත හැකි තේමා, ඉගෙනුම් අරමුණු, අන්තර්ගත හා ක්‍රියාකාරකම්වල සංක්ෂිප්තයක් සපයනු ලැබේ. මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ මොඩියුල, ඒකක හා තේමා හා බැඳුණු, පහත දක්වා ඇති නිපුණතා මගින්, මොඩියුල භාවිතයෙන් කටයුතු කරගෙන යාමේදී ශික්ෂකයා විසින් උපාර්ජනය කරගත යුතු විශේෂිත දැනුම් සහ කුසලතා හුවා දක්වයි. අධ්‍යාපනය සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ විශේෂිත වැඩසටහනක් සඳහා මොඩියුල තෝරාගත් විට, ඒවායින් මෙම නිපුණතා බොහොමයක් ආවරණය විය යුතු ය. පහත දක්වා ඇති නිපුණතා මෙහි මොඩියුල 14 හි දක්වා ඇති සියලු නිපුණතාවල හුදු නිදර්ශකයක් පමණි. එක් එක් ඒකකය ආරම්භයේ විස්තරාත්මක නිපුණතා/ ඉගෙනුම් ඵල සඳහා එක් එක් මොඩියුලය බලන්න.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාව 1 ,

තිරසර සංවර්ධනය හා ප්‍රජාතන්ත්‍රවාදය තුළ තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදනයෙහි භූමිකාව අවබෝධ කරගැනීම

මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාවෙහි වන මෙම නිපුණතාවට සම්බන්ධිත මොඩියුල

1වන මොඩියුලය, පදනම් මොඩියුලය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ අනෙකුත් ප්‍රමුඛ සංකල්ප පිළිබඳ හැඳින්වීමක්; **2වන මොඩියුලය,** තොරතුරු හා තාක්ෂණය අවබෝධ කරගැනීම; **14වන මොඩියුලය,** සන්නිවේදනය හා තොරතුරු, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ඉගෙනුම් සංයුක්ත මොඩියුලය; **13වන මොඩියුලය,** මාධ්‍ය, තාක්ෂණය හා තිරසර සංවර්ධන ඉලක්ක: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්දර්භය.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයෝ, ක්‍රියාකාරීහු හෝ ශිෂ්‍යයෝ, සියලුම අන්තර්ගත සපයන්නන්ගේ ප්‍රතිමානක කාර්යයන් හා හුරුපුරුදු වීමට සහ පුරවැසිභාවය හා අවබෝධිත තීරණ ගැනීමට ඒවායේ විභව්‍ය වැදගත්කම අවබෝධ කරගැනීමට පටන් ගනු ලබති.

ශික්ෂකයන් හා ශිෂ්‍යයන් තුළ වන පහත හැකියාවන් ගොඩනැගීම මෙම නිපුණතාවයේ ඵලවලට ඇතුළත් වේ.

- ප්‍රධාන ඉගෙනුම් ඵල/ (මූලාංග) හා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා අභිසාරිතාව හඳුනා ගැනීම
- තිරසර සංවර්ධනය හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ වන සියලු අන්තර්ගත සපයන්නන්ගේ ප්‍රතිමානක මහජන සේවා කාර්යයන් හඳුනා ගැනීම, විස්තර කිරීම හා ඇගයීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ තිරසර සංවර්ධන අරමුණු (SDGS) අතර පවතින සම්බන්ධතාව හඳුනා ගැනීම, විවිධ සංවර්ධන ගැටලු සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යොදා ගැනීම විස්තර කිරීම
- පුස්තකාල, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් ඇතුළු අන්තර්ගත සපයන්නන් විසින් භාවිත කරනු ලබන මූලික සංකල්ප අවබෝධ කර ගැනීම හා විස්තර කිරීම
- පරිශීලකයන්ට/ පුරවැසියන්ට අන්තර්ගත සපයන්නන් සමග අන්තර්ක්‍රියා කිරීම සඳහා මෙම සංකල්පවල දැනුම උපකාරී වන්නේ කෙසේදැයි අවබෝධ කර ගැනීම
- එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් ප්‍රඥාප්තියෙහි (UDHR) 19 වන වගන්තියෙහි සඳහන් ඇති ප්‍රකාශනයේ නිදහස, තොරතුරු වෙත ප්‍රවේශය හා මූලික අයිතිවාසිකම් වැනි මූලික සංකල්ප පිළිබඳ අවබෝධ විදහා දැක්වීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, පුරවැසිභාවය, තිරසර සංවර්ධනය හා ප්‍රජාතන්ත්‍රවාදය අතර ඇති සම්බන්ධතාව අර්ථකථනය කිරීම හා විස්තර කිරීම
- බුද්ධිමය සංවාදයේ ක්‍රියාකාරීන් වශයෙන් සියලු ආකෘතියේ අන්තර්ගත සපයන්නන්ගේ මත සහ පර්යාලෝකවවල බහුත්වය හා ඒවා වැදගත් වන්නේ මන්ද යන්න විස්තර කිරීම
- සංස්කාරක ස්වාධීනත්වය, වෘත්තීය ප්‍රමිතීන් හා වගවීම විස්තර කිරීම
- මහජන සේවා ප්‍රේෂණය තුළ සත්‍යාපන විෂය ක්ෂේත්‍ර ලෙස ජනමාධ්‍යවේදය විස්තර කිරීම
- තොරතුරු, මාධ්‍ය හා තාක්ෂණික ආචාරධර්ම විස්තර කිරීම හා මේවා උල්ලංඝනය කර ඇති විට හඳුනා ගැනීම

- තොරතුරු, මාධ්‍ය හා තාක්ෂණික ආචාරධර්ම විස්තර කිරීම සහ ඒවා උල්ලංඝනය වීමක දී ඒ බව හඳුනා ගැනීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාව 2

අන්තර්ගතය අවබෝධය හා එහි භාවිත

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව තුළ වන මෙම නිපුණතාවට අදාළ මොඩියුල

2වන මොඩියුලය, තොරතුරු හා තාක්ෂණය අවබෝධ කර ගැනීම, **6වන මොඩියුලය,** මාධ්‍ය හා තොරතුරු තුළ නිරූපණය: ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව අවධානයට ලක් කිරීම; **7වන මොඩියුලය,** මාධ්‍ය හා තාක්ෂණය අන්තර්ගතයට බලපාන්නේ කෙසේද?; **5වන මොඩියුලය,** පුරවැසියන් වන ග්‍රාහක පිරිස; **10වන මොඩියුලය,** වෙළෙඳ ප්‍රචාරණය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව; **11වන මොඩියුලය,** කෘත්‍රිම බුද්ධිය, සමාජ මාධ්‍ය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා; **13වන මොඩියුලය,** මාධ්‍ය, තාක්ෂණය හා තිරසර සංවර්ධන ඉලක්ක: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්දර්භය.

සිය පෞද්ගලික හා පොදු ජීවිත තුළ පුද්ගලයන් තොරතුරු, මාධ්‍ය, හා ඩිජිටල් තාක්ෂණ භාවිත කරන ආකාර මෙන්ම, පුරවැසියන් හා අන්තර්ගත අතර ඇති සබඳතාවත්, විවිධ අරමුණු රැසක් සඳහා ඒ සියල්ල භාවිත කිරීමත් පිළිබඳ සිය දැනුම ප්‍රදර්ශනය කිරීමටත්, අවබෝධ කරගැනීමටත් මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයන්, කාරකයන් හෝ ශිෂ්‍යයන් සමත් වනු ඇත.

ශික්ෂකයන් හා ශිෂ්‍යයන් තුළ වන පහත හැකියාවන් ගොඩනැගීම මෙම නිපුණතාවයේ ඵලවලට, ඇතුළත් වේ.

- අන්තර්ගතය, සන්දර්භය හා සපයන්නන් විසින් පෙන්නුම් කරන වටිනාකම් අර්ථකතනය කිරීම හා ඒවා අතර සම්බන්ධතාවය ගොඩ නැගීම
- තොරතුරු හා දැනුම් සමාජ තුළ තොරතුරුවල භූමිකාව හා වැදගත්කම සහ තොරතුරු සාක්ෂරතා කුසලතා අවශ්‍යතාව විස්තර කිරීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ගෝලීය පුරවැසිභාවය අතර සම්බන්ධතාව සහ ඉගෙනුමට එහි ඇති අදාළත්වය විස්තර කිරීම
- තනි පුද්ගලයන් හා ග්‍රාහක පිරිස් විසින් අන්තර්ගතය විවිධාකාරයෙන් අර්ථකථනය කරන ආකාරය සඳහා බල පෑ හැකි සාධක ද ඇතුළුව ග්‍රාහක පිරිස යන සංකල්පය ගවේෂණය කිරීම
- පොදු මනුෂ්‍ය වර්ගයකට අයත්වීම, සහභාගී වටිනාකම් හා බැඳීම්, සහකම්පනය, සහයෝගීතාව සහ වෙනස්කම් හා විවිධත්වයට ගරු කිරීම වන ඒවායෙහි ප්‍රතිලාභ ලැයිස්තුගත කිරීම
- සම්පාදනය, සන්දේශය, නියැලීම හා ග්‍රාහක පිරිස අතර පවතින ගතික, අන්තර්-සම්බන්ධිත හා විභව පරිවර්තනීය සම්බන්ධතා පරීක්ෂා කිරීම
- සංවර්ධනය සඳහා යොදා ගැනෙන කෘත්‍රිම බුද්ධියෙහි සහ සමාජ මාධ්‍යයෙහි පොදු භාවිත කිහිපයක් හඳුනා ගැනීම හා ලැයිස්තුගත කිරීම
- කෘත්‍රිම බුද්ධිය (AI) වැඩි දියුණු කරන හා භාවිත කරන ප්‍රධාන ක්‍රියාකාරීන් කිහිපදෙනෙකු හඳුනා ගැනීම
- කෘත්‍රිම බුද්ධි ආචාරධර්ම, පාලනය හා නියාමනයන්හි මූලික කරුණු හඳුනා ගැනීම හා විස්තර කිරීම

- තොරතුරු හා මාධ්‍ය අන්තර්ගතයේ ඒකකෘති විශ්ලේෂණය කිරීම සඳහා උපායමාර්ග භාවිතා කිරීම (උදා, සමාජයේ සිටින යම් කණ්ඩායම්වල අභිලාෂයන් සඳහා අන් අයගේ ආධාරයෙන් සේවය සපයන ඒකකෘතීන් හඳුනා ගැනීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ජාතිවාදී ඒකකෘති ඇතුළුව, ඒකකෘති චිරස්ථායි කරන දෘශ්‍ය මාධ්‍යයෙහි භාවිත ශිල්පීය ක්‍රම හඳුනා ගැනීම හා විසංයෝජනය කිරීම
- තීරණ හා චර්යාව කෙරෙහි බලපෑම් කිරීමට අපේක්ෂා කරන වෙළෙඳ ප්‍රචාරණයෙහි (අනෙකුත් අන්තර්ගත වර්ගවල) භාවිත විවිධාකාර ශිල්පීය ක්‍රම හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම හා විචාරය කිරීම
- අන්තර්ගත තුළ වන නියෝජන, සාවද්‍ය නියෝජන හා නියෝජන රහිත බව විමසුම
- පෞද්ගලිකත්වය, පුද්ගල සංවර්ධනය හා සමාජ සංවර්ධනය අතර පවතින අන්තර්ක්‍රියාව විමසුම
- "සක්‍රීය" ග්‍රාහක පිරිසක් යන සංකල්පය වෙළෙඳ ප්‍රචාරණයට හා උපායමාර්ගික සන්නිවේදනයන්ට අදාළ වන ආකාරය, හෝ වඩාත් නිශ්චිත වශයෙන් ගත් කල ග්‍රාහක පිරිස විසින් අර්ථය සාකච්ඡා කෙරෙන ආකාරය විස්තර කිරීම (අනෙකුත් වෙළෙඳ දැන්වීම් පසෙකලා සමහර වෙළෙඳ දැන්වීම්වල සාර්ථකත්වය අප විසින් විස්තර කරන ආකාරය)
- අන්තර්ගතය හා සේවා මත වෙළෙඳ ප්‍රචාරණයෙහි බලපෑම ඇගයීම
- වෙළෙඳ ප්‍රචාරණයෙහි භාව විෂයක ආකර්ෂණය, සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු භාවිතය සැලකිල්ලට ගෙන, අවබෝධිත පුරවැසිභාවයක් පවත්වාගෙන යාමට උපායමාර්ග නිර්දේශ කිරීම
- මහජන සේවා විකාශකයන්ගේ (PSB) ලක්ෂණ හා වැදගත්කම අවබෝධ කරගැනීම හා විස්තර කිරීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව නිපුණතාව 3

ඵලදායීව හා කාර්යක්ෂමව තොරතුරු වෙත ප්‍රවේශය හා ආචාරධර්ම භාවිතාව

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විෂයමාලාව තුළ වන මෙම නිපුණතාවට අදාළ මොඩියුල

1වන මොඩියුලය, පදනම් මොඩියුලය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ අනෙකුත් ප්‍රමුඛ සංකල්ප පිළිබඳ හැඳින්වීමක්; **9වන මොඩියුලය,** අන්තර්ජාල අවස්ථා හා අභියෝග; **3වන මොඩියුලය,** පර්යේෂණ, තොරතුරු චක්‍රය, ඩිජිටල් තොරතුරු සැකසීම, බුද්ධිමය දේපළ; **8වන මොඩියුලය,** පෞද්ගලිකත්වය, දත්ත ආරක්ෂාව සහ ඔබ

මාධ්‍ය තොරතුරු සාක්ෂර ශික්ෂකයා, ක්‍රියාකාරිකයා හෝ ශිෂ්‍යයා හට යම් කාර්යයක් සඳහා අවශ්‍ය අන්තර්ගත වර්ග නිර්ණය කිරීමට සහ ඵලදායී හා කාර්යක්ෂම අයුරින් අන්තර්ගතය සෙවීමට හා ඊට ප්‍රවේශ වීමට හැකියාව ලැබෙනු ඇත.

ශික්ෂකයා හා ශිෂ්‍යයා තුළ පහත දැක්වෙන හැකියාවන් ගොඩනැගීම මෙම නිපුණතාවයෙහි ඵලවලට ඇතුළත් වේ.

- විමර්ශනාත්මක හෝ තොරතුරු සමුද්ධරණ අරමුණු සඳහා අවශ්‍ය කෙරෙන අන්තර්ගත සඳහා ප්‍රවේශ වීමට ඵලදායී හා කාර්යක්ෂම ප්‍රවේශ තෝරා ගැනීම
- දත්ත සමුදාය තුළ සෙවුම් විධාන (Search Command) භාවිත කරන ආකාරය ඉගෙන ගැනීම

- අන්තර්ගත සපයන්නන්ගේ භූමිකාව අවබෝධ කර ගැනීම (ඩිජිටල් තොරතුරු සංරක්ෂණය කිරීමෙහිලා අන්තර්ජාල සෙවුම් යන්ත්‍ර, පුස්තකාල, කෞතුකාගාර හා ලේඛනාගාරවල භූමිකාව ද ඇතුළත්ව)
- අදාළ ශිල්පීය ක්‍රම භාවිතයෙන් මාර්ගගත සෙවීම (සෙවුම් යන්ත්‍ර, විෂය නාමාවලි සහ ද්වාර)
- අවශ්‍ය අන්තර්ගතය වෙත ප්‍රවේශ වීම සඳහා මූලපද හා සම්බන්ධිත පද හඳුනා ගැනීම.
- අන්තර්ගතය සඳහා වූ විභවීය මූලාශ්‍රවල විවිධ වර්ග හා ආකෘති හඳුනා ගැනීම. අන්තර්ගත තීරණ හා තෝරා ගැනීම් සිදු කිරීමට භාවිත කරන ලද නිර්ණායක විස්තර කිරීම.
- මූලික විද්‍යා සාක්ෂරතාව සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ අර්ථ සහ ඒවා අතර සම්බන්ධය අවබෝධ කර ගැනීමට හැකි වීම.
- තොරතුරු සංවිධානය කිරීමේ මූලික අංග පිළිබඳ අවබෝධය විස්තර කිරීම සහ ප්‍රදර්ශනය කිරීම, එනම් අන්තර්ගත නිශ්චනය සඳහා වර්ගීකරණ ක්‍රම/ පද්ධති භාවිතා කිරීම (උදා: පුස්තකාල ග්‍රන්ථ එකතු වර්ගීකරණය, සුචි, සාරසංග්‍රහය, ග්‍රන්ථ නාමාවලි, දත්ත සමුදාය ආදිය)
- නිර්මාණාත්මක පොදු (Creative Common) බලපත්‍රය හා ප්‍රකාශන අයිතිය පිළිබඳ බලපත්‍ර ලබා ගැනීම ඇතුළුව ප්‍රකාශන අයිතිය පිළිබඳ නීති අවබෝධ කර ගැනීම හා අදාළ කර ගැනීම
- කර්තෘත්වය හා හිමිකාරිත්වය අතර වෙනස අවබෝධ කර ගැනීම
- විවිධ ආකාරයේ / වර්ගවල බුද්ධිමය දේපළ හා ඒවායෙහි වැදගත්කම හඳුනා ගැනීමට

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව නිපුණතාව 4:

තොරතුරු, තොරතුරු මූලාශ්‍ර හා ආචාරධර්මීය භාවිතා විචාරශීලිව ඇගයීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව තුළ වන මෙම නිපුණතාවට අදාළ මොඩියුල

සියලුම මොඩියුල විශේෂයෙන් **1වන මොඩියුලය,** පදනම් මොඩියුලය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ අනෙකුත් ප්‍රමුඛ සංකල්ප පිළිබඳ හැඳින්වීමක්; **2වන මොඩියුලය,** තොරතුරු හා තාක්ෂණය අවබෝධ කර ගැනීම; **3වන මොඩියුලය,** පර්යේෂණ, තොරතුරු චක්‍රය, ඩිජිටල් තොරතුරු සැකසීම, බුද්ධිමය දේපළ; **9වන මොඩියුලය,** අන්තර්ජාල අවස්ථා හා අභියෝග; **5වන මොඩියුලය,** පුරවැසියන් වන ග්‍රාහක පිරිස; **6වන මොඩියුලය,** මාධ්‍ය හා තොරතුරු තුළ නිරූපණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමාජභාවය අවධානයට ලක් කිරීම; **10වන මොඩියුලය,** වෙළෙඳ ප්‍රචාරණය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව; **4වන මොඩියුලය,** සාවද්‍ය තොරතුරු, දුස්තොරතුරු සහ වෛරී ප්‍රකාශ හමුවේ කටයුතු කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා: සත්‍ය සෙවීම සහ සාමය ආරක්ෂා කිරීම සඳහා.

මාධ්‍ය තොරතුරු සාක්ෂරතා ශික්ෂකයන්ට, ක්‍රියාකරුවන්ට හෝ ශිෂ්‍යයන්ට අන්තර්ගතය හා සියලු අන්තර්ගත සපයන්නන් විචාරාත්මක ඇගයීමට හා ගැටලු විසඳීමට හා අදහස් විශ්ලේෂණය කිරීම සඳහා තෝරාගත් තොරතුරු අන්තර්ගත කිරීමට හැකියාව ලැබෙනු ඇත.

ශික්ෂකයා හා ශිෂ්‍යයා තුළ පහත හැකියාවන් ගොඩනැගීම මෙම නිපුණතාවෙහි ඵලවලට ඇතුළත් වේ.

- තොරතුරු, විනෝදාස්වාදය, වෙළෙඳ ප්‍රචාරණය, සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරුවල විවිධ කාර්ය බද්ධ අංග ලක්ෂණ වෙන් වෙන්ව හඳුනා ගැනීම උදෙසා විවිධ අන්තර්ගත සපයන්නන් වෙතින් ලැබෙන අන්තර්ගතය පරීක්ෂා කිරීම හා සංසන්දනය කිරීම

- තොරතුරුමය අන්තර්ගතය, එහි විශ්වසනීයතාව, වලංගුතාව, නිරවද්‍යතාව, අධිකාරිත්වය, කාලීන බව හා පක්ෂපාතී බව අනුව ඇගයීම
- විශේෂිත පෙළ (වෙබ් අඩවි, වාර්තා වැඩසටහන්, වෙළෙඳ දැන්වීම්, ප්‍රවෘත්ති වැඩසටහන්) ඇගයීම සඳහා විවිධ නිර්ණායක (උදා: පැහැදිලි බව, නිරවද්‍ය බව සඵලදායී බව, පක්ෂග්‍රාහි බව, කරුණුවල අදාළත්වය) භාවිත කිරීම
- අගතිය, වෛරය, වංචාව හෝ අනිසි හැසිරවීම හඳුනා ගැනීම
- සත්‍යයේ විවිධ න්‍යායන් විස්තර කිරීම
- පශ්චාත් සත්‍ය යුගය (Post Truth Era) යන සංකල්පය පැහැදිලි කෙරෙන තත්ත්ව විශ්ලේෂණය කිරීම
- විවිධ ආකාරයේ සාවද්‍ය හා නොමග යවන සුළු අන්තර්ගත (එනම් කුමන්ත්‍රණ න්‍යායන් හා මිත්‍යා ද ඇතුළු දුස්තොරතුරු, සාවද්‍ය තොරතුරු) වෙන්කර හඳුනා ගැනීම
- දුස්තොරතුරුවලට අදාළව සහ මාර්ගගතව අන් අයව හිතාමතාම අපහසුතාවට ලක් කිරීම (Trolling) හා වෙබ් පිටුවක සබැඳිය මත ක්ලික් කිරීමට ආකර්ෂණය කර ගැනීම (Click bait) ක්‍රියාත්මක වන ආකාරය විස්තර කිරීම
- කුමන්ත්‍රණ න්‍යායන් වර්ග, ස්වභාවය, ප්‍රභව විස්තර කිරීම, මිනිසුන් ඒවාට ආකර්ෂණය වන්නේ මන්ද හා ඒවාට එරෙහිව ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න විස්තර කිරීම
- සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු ප්‍රගුණනය කිරීමෙහි ලා ව්‍යාපාර ආකෘතිවල භූමිකා ඇගයීම සහ අන්තර්ගත ප්‍රමිතකරණය හා සංස්කරණ ප්‍රමිති හරහා මෙය අවම කරගැනීමට ගන්නා ප්‍රයත්න තක්සේරු කිරීම
- අන්තර්ගතය නිර්මාණය කරන ලද සංස්කෘතික, සමාජීය හා අනෙකුත් සන්දර්භ හඳුනා ගැනීම හා එය අර්ථකථනය කිරීමේ දී සන්දර්භයන්හි ඇති බලපෑම අවබෝධ කරගැනීම
- දුර්බෝධ ප්‍රයෝග (Deep fakes) වැනි අංග ඇතුළුව හා ඩිජිටල් හැසිරවීම් සම්භාවිතා ඇතුළුව ඩිජිටල් ශිල්පීය ක්‍රමවල පරාසය හඳුනාගැනීම
- අන්තර්ගතයේ එකතු කළ අගය, පරස්පරතාවයන් හෝ වෙනත් අනන්‍ය ලක්ෂණ නිර්ණය කිරීම සඳහා නව දැනුම, පූර්ව දැනුම හා සංසන්දනය කිරීම
- දත්ත මූලාශ්‍ර, තොරතුරු රැස් කිරීමේ මෙවලම් හෝ උපාය මාර්ගවල සීමාවන් සහ නිගමනයන්ගේ සාධාරණත්වය ප්‍රශ්න කරමින් සම්භාවී නිරවද්‍යතාව නිර්ණය කිරීම
- පෙළ අර්ථකථනය කිරීමට උපායමාර්ග පරාසයක් භාවිතා කිරීම (නිගමනයන්ට එළඹීම, සාමාන්‍යකරණය, නරඹන ලද නිර්මාණ සංස්ලේෂණය කිරීම, දෘෂ්ටිකෝණයට ආධාර වශයෙන් දෘශ්‍ය මාධ්‍යයේ ඇති අනුරූප හෝ තොරතුරු වෙත යොමු වීම, අධිස්ථ පක්ෂපාතිත්වය නිර්ණය කරගැනීම සඳහා අන්තර්ගත විසංයෝජනය කිරීමට යටි පෙළ විකේත කිරීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය, සම්භවය, අනෙකුත් සංස්කෘතික අනන්‍යතා සලකුණු හා ලිංගිකත්වය නිරූපණය කෙරෙහි අවධාරණයක් ඇතිව, විවිධ සපයන්නන් වෙතින් ලැබෙන අන්තර්ගතය විශ්ලේෂණය කිරීම
- දැනුම, ආකල්ප හා කුසලතාවන්ට අදාළව විද්‍යමාන වන විශේෂිත කාර්ය සාධන දර්ශකයන් බවට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා පරිවර්තනය කිරීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි මාර්ගගත පෞද්ගලිකත්ව ප්‍රවේදිතා සහ ගම්‍යාර්ථ පැහැදිලි කිරීම
- මාර්ගගතව පවතින පෞද්ගලික තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා උපායමාර්ග හඳුනා ගැනීම
- මිනිස්සුන්ට නිදහසේ තම අදහස් ප්‍රකාශ කිරීමට හා තොරතුරු වෙත ප්‍රවේශ වෙමින් ප්‍රතිලාභ ලැබීම සඳහා (පෞද්ගලික රහස්‍යභාවය) වැදගත් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කිරීම

- විවිධ අන්තර්ගත තුළ අර්ථය ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරනු ලබන කේත හා සම්මුතීන් හඳුනා ගැනීම
- යම් මාධ්‍යයක් හා එහි විශේෂිත කේත හා සම්මුතීන්ට, සමර්පිත සන්දේශය හඳුනාගත හැකි ක්‍රම ඇගයීමට ලක් කිරීම
- යම් මාධ්‍යයක් භාවිතය හරහා සමර්පණය කළ හැකි අන්තර්ගතය තක්සේරු කිරීම
- ග්‍රාහක පිරිස නිශ්චිතව හා ගම්‍යමානව හඳුනා ගන්නා හා ඉලක්ක කර ගන්නා ආකාරය කෙසේ ද යන්න හා එහි ඇල්ගොරිතම භූමිකාව විශ්ලේෂණය කිරීම
- ග්‍රාහක පිරිස අන්තර්ගතයට ප්‍රතිචාර දක්වන ආකාරය විශ්ලේෂණය කිරීම සහ විශේෂයෙන්ම ගෝලීය පුරවැසි සන්දර්භය තුළ නිර්ණයන සාධක විස්තර කිරීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාව 5

ඩිජිටල් හා සාම්ප්‍රදායික මාධ්‍ය ආකෘති යොදා ගැනීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව තුළ වන මෙම නිපුණතාවට අදාළ මොඩියුල

9වන මොඩියුලය: අන්තර්ජාල අවස්ථා හා අභියෝග; **6වන මොඩියුලය:** මාධ්‍ය හා තොරතුරු නිරූපණය: ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව අවධානයට ලක් කිරීම, **7වන මොඩියුලය:** මාධ්‍ය හා තාක්ෂණය අන්තර්ගතයට බලපාන්නේ කෙසේද?; **4වන මොඩියුලය:** සාවද්‍ය තොරතුරු, දුස්තොරතුරු සහ වෛරී ප්‍රකාශ හමුවේ කටයුතු කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා: සත්‍යය සෙවීම සහ සාමය ආරක්ෂා කිරීම සඳහා; **11වන මොඩියුලය:** කෘත්‍රිම බුද්ධිය, සමාජ මාධ්‍ය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා; **12වන මොඩියුලය** : ඩිජිටල් මාධ්‍ය, ක්‍රීඩා , හා සම්ප්‍රදායික මාධ්‍ය; **13වන මොඩියුලය,** මාධ්‍ය, තාක්ෂණය හා තිරසර සංවර්ධන ඉලක්ක: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්දර්භය.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයන්ට, ක්‍රියාකාරීන්ට හෝ ශිෂ්‍යයන් හට තොරතුරු එක් රැස් කිරීම, තීරණ ගැනීම හා සමාජ පරිවර්තනය සඳහා, ඩිජිටල් තාක්ෂණය, සන්නිවේදන මෙවලම් හා ජාල භාවිතය අවබෝධ කරගැනීමට හැකි වනු ඇත.

ශික්ෂකයන් හා ශිෂ්‍යයන් තුළ පහත සඳහන් හැකියාවන් ගොඩනැගීම මෙම නිපුණතා ඵලවලට ඇතුළත් වේ.

- ඩිජිටල් තාක්ෂණය, සන්නිවේදන මෙවලම් හා ජාලවල මූලික කරුණු සහ විවිධ කාරණා සඳහා විවිධ සන්දර්භයන්හි ඒවායේ භාවිතය අවබෝධ කරගැනීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත වීම හරහා ශිෂ්‍යයන්ට කෘත්‍රිම බුද්ධියෙහි (AI) සමාජ සන්දර්භය වඩාත් හොඳින් අවබෝධ කර ගත හැකි ආකාරය හා කෘත්‍රිම බුද්ධි පද්ධති සමග විචාරශීලීව නිරත වන ආකාරය පැහැදිලි කිරීම
- කෘත්‍රිම බුද්ධි සහ සමාජ මාධ්‍ය පරිසරයන්හි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා යොදාගත හැකි ආකාරය අවබෝධ කරගැනීම සහ මෙම සන්දර්භයෙහි උපකාරී විය හැකි මෙවලම් හා සම්පත් හඳුනා ගැනීම
- විවිධ මාධ්‍ය ආකෘති (සම්ප්‍රදායික, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික, ඩිජිටල් ආදී) හරහා තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා පුළුල් පරාසයකින් යුත් මාධ්‍ය "පෙළ" භාවිත කිරීම
- මූලික මාර්ගගත අන්තර්ගත සෙවුම් කිරීමට භාර ගැනීම
- තරුණ ප්‍රජාව, තාරුණ්‍යය අන්තර්ජාලය භාවිතා කරන්නේ කුමන අරමුණු සඳහා ද යන්න අවබෝධ කර ගැනීම

- සාම්ප්‍රදායික හා ඩිජිටල් වේදිකා අතර තාක්ෂණික වෙනස්කම් සහ, ඩිජිටල් වේදිකා මගින් විභවීය හානි සමාජය වෙත මුදාහරිමින් හා ඒවා වර්ධනය කරන අතරම, සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය වැඩිදියුණු කර ඇති අයුරු විස්තර කිරීම
- විධිමත්, නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපනය තුළ ක්‍රීඩා භාවිතය ගවේෂණය කිරීම
- පන්ති කාමරය තුළ ක්‍රීඩා ශික්ෂණවිද්‍යාව අවබෝධ කරගැනීම, විස්තර කිරීම සහ යොදා ගැනීම
- අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්, විශේෂයෙන්ම ක්‍රීඩා භාවිත කරමින් සමාජ, බුද්ධිමය හා කාලවකාශ කුසලතා (spatio-temporal skills') වර්ධනය කර ගැනීම
- උපදෙස් ලබා දීම හා ඉගෙනුම් සඳහා අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්, විශේෂයෙන්ම ඩිජිටල් ක්‍රීඩා යොදා ගැනීම
- අධ්‍යයන විෂයවල (ගණිතය, විද්‍යාව, සමාජ අධ්‍යයනය ආදී) සංකල්ප හඳුන්වා දීම සඳහා අව/ අධි-තාක්ෂණික අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්/ ක්‍රීඩා භාවිත කිරීම
- උපදෙස් දීම හා ඉගෙනුම් සඳහා නිදහස් හා විවෘත මූලාශ්‍ර / හෝ හිමිකාර මෘදුකාංග භාවිතයෙන් වැඩිදියුණු කරන ලද විවිධ අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම් විශ්ලේෂණය කිරීම හා ඒවායේ ගම්‍යාර්ථ හා බලපෑම ඇගයීම
- නව මාධ්‍ය පරිසරයන් හා ව්‍යාපාර ආකෘති අතර පවතින සම්බන්ධය හා ඒවා මිනිස් ක්‍රියාකාරකම්, අන්තර් ක්‍රියා හා මාර්ගගත උපස්ථිතිය (online presence) සඳහා බලපාන ආකාරය විස්තර කිරීම
- අන්තර්ජාල සමාගම් විසින් පිරිනමනු ලබන නව තාක්ෂණ හා සේවා තිරසර සංවර්ධනයට හා සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන හා ක්‍රියාවලී සඳහා බලපාන්නේ කවරාකාරයෙන් ද යන්න හා ඒ කුමන දුරකට ද යන්න ඇගයීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාව 6

තොරතුරු මාධ්‍ය හා ඩිජිටල් අන්තර්ගතවල සමාජ සංස්කෘතික සන්දර්භය පිහිටුවීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව තුළ වන මෙම නිපුණතාවට සම්බන්ධිත මොඩියුල

1වන මොඩියුලය, පදනම් මොඩියුලය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ අනෙකුත් ප්‍රමුඛ සංකල්ප පිළිබඳ හැඳින්වීමක්; **2වන මොඩියුලය:** තොරතුරු හා තාක්ෂණය අවබෝධ කරගැනීම ; **13වන මොඩියුලය** : මාධ්‍ය, තාක්ෂණය හා තිරසර සංවර්ධන ඉලක්ක : මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්දර්භය

මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයන්ට, ක්‍රියාකරුවන්ට හෝ ශිෂ්‍යයන්ට, තොරතුරු, ඩිජිටල් සහ මාධ්‍ය අන්තර්ගතය සමාජ සහ සංස්කෘතික සන්දර්භය තුළින් සම්පාදනය වන බවට දැනුම හා අවබෝධය ප්‍රදර්ශනය කිරීමට හැකිවනු ඇත.

ශික්ෂකයන් හා ශිෂ්‍යයන් තුළ පහත සඳහන් හැකියාවන් ගොඩනැගීම මෙම නිපුණතා ඵලවලට ඇතුළත් වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සහ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) අතර ඇති සම්බන්ධය අවබෝධ කරගැනීම ; විවිධ සංවර්ධන ගැටලු සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා යොදාගැනීම විස්තර කිරීම

- මාර්ගගත පෞද්ගලිකත්ව රහස්‍යභාවය සම්බන්ධ කාරණා හා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ගම්‍යාර්ථ විස්තර කිරීම

- සමාජ හා ආර්ථික සංවර්ධනය හෝ ඌන සංවර්ධනය කරා ගෙන යාම සඳහා බලවත් ක්‍රියාකරුවන් විසින් දත්ත භාවිතා කරන ආකාරවල මූලික කරුණු අවබෝධ කර ගැනීම හා විස්තර කිරීම
- යම් විශේෂිත ප්‍රතිඵල හෝ අරමුණු සඳහා අන්තර්ගත ශාසනර පාලනය කෙරෙන නීති හා අපේක්ෂා හසුරුවන්නේ කෙසේ ද යන්න විශ්ලේෂණය කිරීම හා විස්තර කිරීම
- යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය හා තිරසර සංවර්ධනය ශක්තිමත් කිරීමේහි හා ඉදිරියට පවත්වාගෙන යාමේ දී ජනමාධ්‍යවේදයේ ප්‍රතිමානක අරමුණු නිරූපණය කිරීමට
- විවිධ ආකාරයේ පර්යාවලෝක හා නියෝජන ඉදිරිපත් කෙරෙන පෙළ නිර්මාණය කිරී
- අන්තර්ගත සපයන්නන්, බුද්ධිමය සංවාදය සඳහා ක්‍රියාකාරීන් ලෙස තක්සේරු කිරීමෝ, තිරසර සංවර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසිභාවය හා සංස්කෘතික විවිධත්වයට අදාළ අන්තර්ගත විචාරාත්මකව ඇගයීම සඳහා ඇති හැකියාව ප්‍රදර්ශනය කිරීම
- ප්‍රවෘත්ති විනිශ්චය කිරීමේ හෝ ප්‍රවෘත්ති සැකසීමෙහි ලා මූලික සිද්ධාන්ත විචාරශීලීව ඇගයීම
- සංස්කරණය මගින් දෘශ්‍ය මාධ්‍ය හා ඒවායේ සංදේශවල අර්ථය හැඩගස්වන ආකාරය අවබෝධ කරගැනීම (විකල්ප පර්යාලෝක අත්හැරීම, පෙරහන් කරන ලද හෝ ගම්‍යමාන මත, විශේෂිත අදහස් අවධාරණය යනාදිය)
- මිනිසුන්ට තම අදහස් නිදහසේ ප්‍රකාශ කිරීම සඳහා සහ තොරතුරු වෙත ප්‍රවේශයෙන් ප්‍රයෝජන ගැනීමට පෞද්ගලික රහස්‍යභාවය වැදගත් වීමට හේතුව විස්තර කිරීම
- ඔවුන්ගේ පෞද්ගලික, පරිස්ථානිය හා සමාජ සන්දර්භ තුළ මෙම ගැටලු ගවේෂණයට හා විමසීම
- පෞද්ගලික රහස්‍යභාවය ආරක්ෂා කිරීම තුළ වන ප්‍රධාන ක්‍රියාකාරුවන් හා ඔවුන්ගේ භූමිකා අඳුනා ගැනීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාව 7

ශිෂ්‍යයන්/ පුරවැසියන් අතර මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රවර්ධනය හා අවශ්‍ය වෙනස්කම් කළමනාකරණය

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව තුළ වන මෙම නිපුණතාවට සම්බන්ධිත මොඩියුල

1වන මොඩියුලය, පදනම් මොඩියුලය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ අනෙකුත් ප්‍රමුඛ සංකල්ප පිළිබඳ හැඳින්වීමක්, 9වන මොඩියුලය: අන්තර්ජාල අවස්ථා හා අභියෝග; 13වන මොඩියුලය : මාධ්‍ය, තාක්ෂණය හා තිරසර සංවර්ධන ඉලක්ක : මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්දර්භය; 14වන මොඩියුලය: සන්නිවේදනය සහ තොරතුරු, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ඉගෙනුම් - සංයුක්ත මොඩියුලය

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සතු ශික්ෂකයන්ට, ක්‍රියාකරුවන්ට හෝ ශිෂ්‍යයන්ට, ඔවුන්ගේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පුහුණුව තුළින් ලබාගත් දැනුම සහ කුසලතා, ශිෂ්‍යයන් අතර මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට සහ ඉගෙනුම් පරිසර/අධ්‍යාපන සැකසුම්වල අදාළ වෙනස්කම් කළමනාකරණය කිරීම සඳහා භාවිතා කිරීමට හැකි වේ.

ශික්ෂකයන් හා සමපදස්ථ-ශික්ෂකයන් තුළ පහත සඳහන් හැකියාවන් ගොඩනැගීම මෙම නිපුණතා ඵලවලට ඇතුළත් වේ.

- විවිධ ශිෂ්‍යයන් / පුරවැසියන්, මාධ්‍ය නිපැයුම් සහ විශේෂාංග අර්ථකථනය කරන ආකාරය හා තම ජීවිතවලට අදාළ කරගන්නා ආකාරය අවබෝධ කරගැනීම
- විවිධ ගැටලු නිරාකරණය කර ගැනීමේ අවස්ථා හා අභියෝගවලට මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව යොදා ගැනීමට ශිෂ්‍යයන්/පුරවැසියන්ට මග පෙන්වීම
- ශිෂ්‍යයන්/ පුරවැසියන් තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳව කුසලතා ඇති කිරීමට විවිධ උපදේශනාත්මක ක්‍රියාකාරකම් අවබෝධ කරගැනීම හා භාවිතා කිරීම
- අවශ්‍ය අන්තර්ගතයට ප්‍රවේශ වීම සඳහා වඩාත් සුදුසු ප්‍රවේශ (එනම් තොරතුරු සමුද්ධරණ පද්ධති) තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට/ පුරවැසියන්ට උපකාර වීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කිරීම
- අදාළ තොරතුරු ස්වකීය දැනුම් සමුදායට ඇතුළත් කර ගන්නා අතරම අන්තර්ගතය හා එහි මූලාශ්‍ර විචාරශීලීව ඇගයීමට ශිෂ්‍යයන්ට/ පුරවැසියන්ට උපකාර වීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කිරීම
- ශිෂ්‍යයන්/ පුරවැසියන් අතර ඵලදායී වාචික/අවාචික හා වෙනත් සන්නිවේදන ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම, සක්‍රීය විමසීම, සහයෝගිතාව, නිදහස් සහ විවෘත සන්නිවේදනය ඇති කරලීම සඳහා යොදා ගැනීම
- ශිෂ්‍යයන්/ පුරවැසියන් අතර විචාරශීලී කියවීම, දෘශ්‍ය මාධ්‍ය අවබෝධ කරගැනීම හා සවන්දීම සඳහා වන දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා විධිමත් හා අවිධිමත් ඇගයුම් උපාය මාර්ග අවබෝධ කර ගැනීම හා භාවිතා කිරීම
- ශිෂ්‍යයන්/ පුරවැසියන් සඳහා වඩාත් සහභාගි ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා මෙවලම් භාවිත කිරීම
- විශේෂයෙන්ම පාසල් තුළ හා ඉන් පිටත වන ශිෂ්‍යයන්/ පුරවැසියන් සඳහා පාසල් පාදක හා පාසලින් පරිබාහිර අධ්‍යාපනය සමග සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා සාම්ප්‍රදායික හෝ ඩිජිටල් තාක්ෂණයන් යොදා ගැනීම
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) සහ මාධ්‍ය හා තොරතුරු මූලාශ්‍ර සොයා ගැනීමට හා ඔවුන්ගේ ඉගෙනුම් සඳහා ඒවා භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳ ශිෂ්‍යයන්ට උපකාර කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පන්ති කාමර තුළ භාවිතය
- ඉගෙනුම් තුළ සහභාගිත්වය පුළුල් කිරීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යොදා ගැනීම
- ශිෂ්‍යයන්ගේ/ පුරවැසියන්ගේ ඉගෙනුම් සංවර්ධනය කිරීමට පුහුණු වැඩසටහන් මගින් ලබාගත් දැනුම හා කුසලතා භාවිත කිරීම
- පුහුණුව හරහා ඇති කරගත් දැනුම හා කුසලතා, මාධ්‍ය හා තොරතුරු ඇගයීමෙහි ලා සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හා බැඳි ආචාර ධාර්මික ගැටලු අවබෝධ කරගැනීමෙහි ලා ශිෂ්‍යයන්ගේ / පුරවැසියන්ගේ කුසලතා සංවර්ධනය කිරීමට භාවිත කිරීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි බහුවිධ පාර්ශ්වකරුවන්ගේ ගෝලීය ජාලයක් වූ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ යුනෙස්කෝ සන්ධානය (UNESCO MIL Alliance) හා සම්බන්ධව කටයුතු කිරීමට අභිප්‍රේරණය කිරීම සහ, මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නගර හරහා නගර අවකාශ හා නාගරික ජීවිතය තුළ නිර්මාණශීලී ඉගෙනුම වෙනුවෙන් පෙනී සිටීම[28]
- ශිෂ්‍යයන්/ පුරවැසියන් බල ගැන්වීමට හා සහභාගිත්වය දිරිමත් කිරීමට විවිධ ව්‍යාපෘති හා ප්‍රාරම්භ හඳුනා ගැනීම; (මොඩියුල තුළ වන ශික්ෂණවිද්‍යා ප්‍රවේශ හා ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රාරම්භ/ ව්‍යාපෘති රාශියක් හුවා දක්වා ඇත)

28 යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නගර (UNESCO MIL Cities) මගින් නගරය තුළ විවිධ නාගරික ක්‍රියාකාරීන් විසින් සිදු කෙරෙන, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නවෝත්පාදක හා නිර්මාණශීලී ඉගෙනුම ප්‍රවර්ධනය කෙරේ. MIL Cities (නගර සඳහා රූපයකයක්) ප්‍රාරම්භය පුරවැසියන් කේන්ද්‍ර කොට ගත්තකි. MIL Cities හි ප්‍රධාන අරමුණ වන්නේ, ලොව පුරා වෙනත් නගර හා සම්බන්ධ වෙමින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාවලින් යුත් තවත් පුරවැසියන් නවෝත්පාදනීය ලෙස සවිබලගැන්වීමේ මංපෙතකකට එම නගර යොමු කිරීම ය. මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නගර රාමුව (MIL Cities Framework) මෙතැනින් බලන්න, https://en'unesco.org/milcities.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් ඉගැන්වීම් ශික්ෂණවිද්‍යා විෂයමාලාව ඇසුරෙන්

පහත දක්වා ඇති ශික්ෂණවිද්‍යා ප්‍රවේශ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විෂයමාලාවෙහි මොඩියුල පුරාවට භාවිතා කර ඇති උපායමාර්ග සඳහා පාදක වේ.

I. ගැටලු - විමසුම් ඉගෙනුම

ගැටලු විමසුම් ඉගෙනුම, තත්කාලීන සමාජයෙහි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට සම්බන්ධ ගැටලු පිළිබඳ විමසීම් ඉලක්ක කර ගත් ශිෂ්‍ය / පුරවැසි කේන්ද්‍රීය ඉගෙනුම් ප්‍රවේශයක් වේ. පහත සඳහන් විමසීම් අදියර ඔස්සේ ශිෂ්‍යයන් විසින් නව දැනුම හා කුසලතා උපාර්ජනය කරගන්නා විමසුම් ඉගෙනුම, ගැටලු විසඳීම සහ තීරණ ගැනීම හා සම්බන්ධිත බොහෝ ලක්ෂණ ඊට ඇතුළත් වේ.

1. ගැටලුව හඳුනාගැනීම - (ඊට පාදක වූ ආකල්ප හා විශ්වාස හඳුනා ගැනීම).
2. ගැටලුවට පිටුපසින් ඇති කරුණු හා මූලධර්ම පැහැදිලි කිරීම
3. සාක්ෂි නිශ්චයනය, සංවිධානය හා විශ්ලේෂණය
4. ගැටලුව අර්ථකථනය හා නිරාකරණය
5. ක්‍රියාමාර්ග ගැනීම සහ එක් එක් අදියරෙහි ප්‍රතිඵල හා නිමැවුම් නැවත සලකා බැලීම

ශිෂ්‍යයන් හට/ පුරවැසියන් හට කිසියම් ගැටලුවක් ගැඹුරින් ගවේෂණය සඳහා අවස්ථා සපයන බැවින් එය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීම් සඳහා සුදුසු ක්‍රමවේදයක් වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ ගැටලු විමසීම් ප්‍රවේශය යොදා ගැනීම පිළිබඳ උදාහරණ තුළ : මාධ්‍ය විශ්ලේෂණය හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතා නිරූපණ ගවේෂණය කිරීම; ප්‍රාථමික හා ද්විතීය ලේඛන විශ්ලේෂණය හරහා පෞද්ගලිකත්වය සහ මාධ්‍ය හා ඩිජිටල් සමාගම් හා සම්බන්ධ ගැටලු ගවේෂණය කිරීම; සහ මානවවංශ විද්‍යාත්මක පර්යේෂණ හරහා සයිබර් හිංසනය ගවේෂණය කිරීම ඇතුළත් වේ.

II. ගැටලු පාදක ඉගෙනුම් (Problem Based Learning)

ගැටලු පාදක ඉගෙනුම යනු, සිසුන්ගේ විෂයාන්තර දැනුම් සමුදායන් හා කුසලතා මෙන්ම විචාරශීලී චින්තනය සහ ගැටලු විසඳුම් උපායමාර්ග සමගාමීව වැඩිදියුණු කරන විෂයමාලා සංවර්ධන හා උපදේශන ක්‍රමයකි. එය ශිෂ්‍යයන්/ පුරවැසියන්ගේ සැබෑ ජීවිත ගැටලු/ ප්‍රශ්න විචාරශීලීව හා ගැඹුරින් විමසීමට ශිෂ්‍යයන් /පුරවැසියන් යොමු කිරීම හරහා කේවල සහ සාමූහික දැනුම වැඩි කිරීම සඳහා වන අති ව්‍යුහගත, සහයෝගී ඉගෙනුම් විධියකි. සිසුන් විසින් ඉගෙනුම් අරමුණු, විමසුම්, ගැටලු හා ක්‍රම මෙන්ම ප්‍රතිඵල යන සියල්ල නිර්වචනය හා කළමනාකරණය කෙරෙනු ලබයි.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි එන ගැටලු පාදක ඉගෙනුම් උදාහරණ තුළ නිශ්චිත ග්‍රාහක පිරිසක් සඳහා සඵලදායි සමාජයීය අලෙවිකරණ ව්‍යාපාරයක් නිර්මාණය කිරීම වැනි අවස්ථා අන්තර්ගත වේ. උදාහරණයක් ලෙස තාරුණ්‍ය අතර තිරසර සංවර්ධනය ඉලක්ක ප්‍රවර්ධනය කිරීම දැක්විය හැකි ය.

III. ආනුභවික ප්‍රවේශය සහ විද්‍යාත්මක විමසුම

ආනුභවික ප්‍රවේශය යනු ස්වභාවික ලෝකය ගවේෂණය කිරීමට සහ තමන් විසින් සොයා ගනු ලබන සාක්ෂි මත පදනම්ව පැහැදිලි කිරීම් යෝජනා කිරීමට, විද්‍යාඥයන් විසින් භාවිත කරනු ලබන තාක්ෂණික ක්‍රම සමුදායකි. විමසුම් ක්‍රියාවලිය බොහෝ විට, නිරීක්ෂණ සිදු කිරීම, ප්‍රශ්න ඇසීම, දැනටමත් දන්නා කරුණු සොයාගැනීම, විමර්ශන සැලසුම් කිරීම, පර්යේෂණාත්මක සාක්ෂි මත පිහිටා පූර්ව දැනුම සමාලෝචනය කිරීම, දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා අර්ථකථනය කිරීමට මෙවලම් භාවිතය, පැහැදිලි කිරීම් යෝජනා කිරීම, ප්‍රතිඵල සන්නිවේදනය කිරීම ආදී ක්‍රියාකාරකම් සමන්විත සරලකෘත පියවර කට්ටලයක් ලෙස ප්‍රකාශ වේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීමේදී ද මෙම ක්‍රමය යොදා ගත හැකි ය.

යම් අන්තර්ගතයක විභවීය හානි හෝ ප්‍රතිලාභ භාවිතයේ දී කෙතරම් ප්‍රමාණයකට ලබාගත හැකි ද යන්න විමර්ශනය කිරීම; සමාජ මාධ්‍ය තුළ පිළිගැනීම හා ඩොපමයින් (Dopamine) මට්ටම් අතර පවතින සම්බන්ධතාව තක්සේරු කිරීම; මාර්ගගත ප්‍රජාවන්ගේ භූමිකා සහ නිර්දේශ ඇල්ගොරිදම මගින් මේවා ගොඩනැගී ඇති ආකාරය විමර්ශනය කිරීම ; පෞද්ගලික රහස්‍යභාවය උල්ලංඝනය වීමේ ස්වභාවය හා බලපෑම් හෝ වෙරි ප්‍රකාශන හඳුනාගැනීම සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීමේ ප්‍රයත්න විමර්ශනය කිරීම, යන දෑ විද්‍යාත්මක තුළ අන්තර්ගත වේ.

විද්‍යාත්මක විමසුම ඉහත සඳහන් තාක්ෂණික ක්‍රමවලින් සමන්විත වන නමුදු, එය පෙර පර්යේෂණ, මැදිහත් වීම්, පසු පර්යේෂණ, සම්පරීක්ෂණ කණ්ඩායම්/ අවස්ථා, පාලන කණ්ඩායම් හා අවස්ථා, දීර්ඝ හා කෙටි කාලීන බහුවිධ අත්හදාබැලීම් ආදිය හා යම් අවස්ථාවල විද්‍යාඥයන්ගේ කණ්ඩායම් කිහිපයකින් සම්බන්ධ කොට ගෙන ද ඉදිරියට ගෙනයා හැකි ය. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් ඉගැන්වීම් සඳහා විද්‍යාත්මක විමසුම් ප්‍රවේශය යොදාගැනීම අභියෝගයක් වන්නේ බොහෝ අන්තර්ජාල සන්නිවේදන සමාගම් ඔවුන්ගේ දැවැන්ත (මහා) දත්ත සම්භාර වෙත විවෘත ප්‍රවේශය පිරි ලබනු නොලැබීමයි. පිළිගත් පදනමක් මත හෝ මෙම තොරතුරුවලට මහජන ප්‍රවේශය වැඩි කළහොත් වඩා වැඩි දැනුමක් උත්පාදනය කිරීමේ හැකියාවට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මහත් සේ දායක වනු ඇත.

IV. සිද්ධි අධ්‍යයනය

සිද්ධි අධ්‍යයන ක්‍රමයේ දී කිසියම් ඒකල අවස්ථාවක් හෝ සිදුවීමක් පිළිබඳ ගැඹුරින් පරීක්ෂණයක් සිදු කෙරේ. විශ්වවිද්‍යාලවල පුළුල් ලෙස ක්‍රියාත්මක වන මෙම අධ්‍යයනය සඳහා, සත්‍ය සිද්ධිවලට න්‍යායාත්මක දැනුම යොදා ගනිමින් සැබෑ ජීවන සිදුවීම් භාවිතයට ගැනීම ශිෂ්‍යයන් විසින් සිදු කෙරේ. ශිෂ්‍යයන්/පුරවැසියන් විවිධ අන්තර්ගත සපයන්නන්ගෙන් ලැබෙන විවිධ ආකාරයේ සන්දේශවලට දිනපතා නිරාවරණය වන බැවින් (එමගින් පුළුල් පරාසයක 'සිද්ධින්' හමුවන හෙයින්) මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීමේ දී මෙම ප්‍රවේශය යෝග්‍ය වේ. සිද්ධි අධ්‍යයන ක්‍රමය මගින් සිදුවීම් සලකා බැලීම, දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම සහ, ප්‍රතිඵල වාර්තා කිරීමේ ක්‍රමානුකූල ක්‍රමයක් ඉදිරිපත් කරයි. අනෙක් අතට, ශිෂ්‍යයන්/පුරවැසියන් අතර විමර්ශන පාදක ඉගෙනුම සඳහා මෙය උපකාරී වේ. මෙම ක්‍රමය යෙදීමෙන්, ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට කිසියම් සිදුවීමක දී හෝ අවස්ථාවකදී එය එයාකාරයට සිදු වීමට හේතුව පිළිබඳ පුළුල් සහ වඩාත් පරිපූර්ණ අවබෝධයක් ලබා ගත හැකි ය. එසේම, උපන්‍යාස ගොඩනගා ගැනීමට සහ ඒවා පරීක්ෂා කරබැලීමට ද සිද්ධි අධ්‍යයනය දායකත්වය ලබා දෙයි.

නිදසුනක් වශයෙන්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් යම් නිශ්චිත ප්‍රජාවක් තුළ දුස්තොරතුරු සහ සාවද්‍ය තොරතුරුවලට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනගා ඇති ආකාරය; කෘත්‍රිම බුද්ධිය භාවිතයේ දී වන සදාචාරාත්මක උල්ලංඝනය වීමේ අවස්ථා පිළිබඳ; උසස් මට්ටමේ ඩිජිටල් හෝ මාධ්‍ය නිෂ්පාදනයක් සඳහා වන සාර්ථක අලෙවිකරණ ප්‍රචාරක උපායමාර්ග පිළිබඳ; එසේත් නැතහොත් නිෂ්පාදන ස්ථානගත කිරීම් (product placements) හෝ විශේෂිත නිෂ්පාදන සඳහා "බලපෑම්කරුවන්ගේ" (influencers) අනුමත කිරීම්වල (endorsement) 'සැඟවුණු' අනුග්‍රහය පිළිබඳ ශිෂ්‍යයන්ට /පුරවැසියන්ට සිද්ධි අධ්‍යයනයක් සිදු කළ හැකි ය.

V. සහයෝගී ඉගෙනුම

සහයෝගී ඉගෙනුම යන්නෙන් අදහස් වන්නේ සාමූහික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශිෂ්‍ය/ පුරවැසි කණ්ඩායම් විසින් ගනු ලබන උපදේශනාත්මක ප්‍රවේශයයි. සහයෝගී ඉගෙනුම සරලව යුගල කණ්ඩායමක ක්‍රියාකාරකම්වල සිට ව්‍යාපෘති උගැනුම, ජිග්සෝ උගැනුම, මාර්ගෝපදේශිත සමපදස්ථ ප්‍රශ්න කිරීම හා අන්‍යෝන්‍ය ඉගැන්වීම වැනි වඩාත් සංකීර්ණ මාදිලි දක්වා පුළුල් පරාසයක දිගහැරෙන අතර ඒ සියල්ලේ අරමුණ වන්නේ සංකල්පීය අවබෝධය සහ උසස් ගණයේ චින්තනය වර්ධනය කිරීම, වඩා හොඳ අන්තර් පුද්ගල කුසලතා ඇති කිරීම, පාසල සහ තමා පිළිබඳ වඩාත් ධනාත්මක ආකල්ප ඇති කිරීම, සහ පුළුල් පරාසයක් තුළ මූලික කුසලතා ප්‍රාප්තිය, ඉගෙනුම් අවකාශ තුළ ශාස්ත්‍රීය විෂමතාව කළමනාකරණය කරන්නේ කෙසේද යන්න විමසුම වැනි ඉගෙනුම් ඉලක්ක ළඟාකර ගැනීමයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදහස් හුවමාරු කර ගැනීම සහ එකිනෙකාගෙන් ඉගෙනීම අවශ්‍ය වන හෙයින් ඒ සඳහා මෙය උචිත ක්‍රමයක් වේ.

වීකි අවකාශකයක (wiki space) සහයෝගීව ක්‍රියා කිරීම හෝ UNESCO MIL CLICKS වැනි සමාජ මාධ්‍ය ප්‍රාරම්භ සහ අවස්ථාවලට ඒකාබද්ධ සහභාගීත්වය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළ සහයෝගී ඉගෙනුම් උදාහරණ ලෙස සැලකිය හැකිය.

VI. පඨිත විශ්ලේෂණය

විවිධ ශානරවල (දෘශ්‍ය, මුද්‍රිත, වාචික ආදි) කේත සහ සම්මුති හඳුනා ගැනීම මගින් පඨිත විශ්ලේෂණය සිදු කිරීමට ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට උගත හැකි ය. ඒ වනාහී, විමර්ශනය කෙරෙන සන්නිවේදන ශානරය තුළ ප්‍රධාන සංකල්ප තවදුරටත් අවබෝධ කර ගැනීම අරමුණු කරගත් සංඥාර්ථ විශ්ලේෂණයක් වේ. මෙම ක්‍රමය හරහා, එක් එක් ග්‍රාහක පිරිසට ගැළපෙන පරිදි විවිධ ආකාරයේ ඉදිරිපත් කිරීම් නිර්මාණය කිරීමට භාෂාව මෙන්ම වෙනත් දෘශ්‍ය කේත සහ සම්මුති භාවිත කරන ආකාරය හඳුනා ගැනීමට ශිෂ්‍යයෝ/පුරවැසියෝ දැනුම ලබා ගනිති. කවරහෝ ආකාරයක පෙළක, තාක්ෂණික, සංකේතාත්මක, සහ ආඛ්‍යානමය, කේත හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට/ පුරවැසියන්ට එහිදී උගන්වනු ලැබේ. මෙම ක්‍රියාවලියේ දී දෘෂ්‍ය/අනුරූ විශ්ලේෂණය වැනි ශිල්පීය ක්‍රමද ආවරණය කරනු ලැබේ. මෙම ආකාරයේ පාඨමය විශ්ලේෂණ සැබෑ ජීවිතයේ සන්දර්භවලට අදාළ කර ගත හැකි අතර, එය ශාස්ත්‍රීය අභ්‍යාසයෙන් ඔබ්බට ගිය තොරතුරු අරමුණක් ඉටු කරයි.

උදාහරණයක් ලෙස, ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට ඔවුන් කැමති අන්තර්ගතයක කොටසක් තෝරා ගැනීමට ඉල්ලා සිටිය හැකි අතර එය ප්‍රවෘත්ති ලිපියක්, යූටියුබ් වීඩියෝවක් හෝ මාර්ගගත ප්‍රවෘත්ති මූලාශ්‍රයකින් ලබා ගත් වීඩියෝ පටයක් විය හැකි ය. ඒ අනුව එහි කතෘ, තාක්ෂණික/පඨිත විශේෂාංග, ඉලක්කගත ග්‍රාහක පිරිස සහ සමස්ත සන්දර්භය පිළිබඳ තොරතුරු සැලකිල්ලට ගනිමින්, එකී අන්තර්ගතයේ අරමුණ, නිසි මග පෙන්වීම යටතේ විශ්ලේෂණය කිරීම සඳහා, ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට කණ්ඩායම් වශයෙන් ක්‍රියා කළ හැකි ය.

VII. සන්දර්භානුගත විශ්ලේෂණය

යම් සුවිශේෂී අන්තර්ගත, ගැටලු, තත්ත්ව සහ සිදුවීම් පිළිබඳ මූලික සන්දර්භානුගත විශ්ලේෂණයක් සිදු කරන ආකාරය මෙම ප්‍රවේශය හරහා ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට ඉගැන්වේ. උදාහරණයක් ලෙස එම අන්තර්ගත සපයන්නන් හෝ ආයතන සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීම සැලකිය හැකි ය. තවද, කිසියම් පාඨයක් (ඕනෑම ආකෘතියක) ඊට අදාළ ඓතිහාසික, සංස්කෘතිකමය, අවස්ථාබද්ධ හෝ සමාජයීය පසුබිම හෝ සන්දර්භය සැලකිල්ලට ගෙන විශ්ලේෂණය කරන්නේ කෙසේදැයි ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට උගත හැකි ය. තර්ක, සංහතභාවය (coherence), තර්කානුකූලභාවය හා සනාථක සාක්ෂි යනාදියට අදාළව සන්දර්භයෙහි/පෙළෙහි ගුණාත්මකභාවය පිළිබඳව ද සන්දර්භානුගත විශ්ලේෂණයේ දී අවධානය යොමු කෙරේ. මෙම ප්‍රවේශයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවී සබඳතා, දේශපාලන ආර්ථිකය හා සංස්කෘතික සලකා බැලීම් යනාදිය සම්බන්ධ මානයන් කැපී පෙනෙන ලෙස ඉස්මතු කළ හැකි ය.

ඇතැම් රටවල ක්‍රියාත්මක වන චිත්‍රපට, රූපවාහිනී සහ වීඩියෝ ක්‍රීඩා සඳහා වූ වර්ගීකරණ ක්‍රම පිළිබඳ දැනුම හෝ මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන හිමිකාරිත්වය සහ ඒකකේන්ද්‍රණය (concentration) යන දෑ, ප්‍රජාතන්ත්‍රවාදය සහ භාෂණයේ නිදහසට අදාළ ප්‍රශ්නවලට සම්බන්ධ වන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුම ලබා ගැනීමට ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට සහය වීම, සන්දර්භානුගත විශ්ලේෂණය සහ ශික්ෂණ විද්‍යාව පිළිබඳ උදාහරණ ලෙස සැලකිය හැකි ය.

VIII. පරිවර්තන

මෙම ශික්ෂණවිද්‍යා ප්‍රවේශය, විවිධාකාරී වන අතර විවිධ අන්තර්ගත පසුබිම්වල භාවිත කළ හැකි ය. උදාහරණ වශයෙන්, ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට තම ප්‍රජාව තුළ සිදු වූ සිදුවීමක් පිළිබඳ පුවත්පත් ලිපියක් තෝරා එය පොඩ්කාස්ට් වැඩසටහනක් (podcast) හෝ ගුවන් විදුලි ප්‍රවෘත්තියක් බවට හෝ සමාජ මාධ්‍යවල පළ කිරීමට සුදුසු ආකෘතියක් බවට පරිවර්තනය කළ හැකි ය.

ළමා චිත්‍රපටයක කෙටි අනුපෙළක් (sequence) නරඹා, අනතුරුව කුඩා කණ්ඩායම් වශයෙන් එක්ව, එහි විශේෂිත දර්ශන ඛණ්ඩ (shots), කෝණ සහ දර්ශන මාරුවීම් (transitions) හඳුනාගනිමින්, තෝරාගත් අනුපෙළෙහි කතන්දර පුවරුවක් ඇඳීමට කටයුතු කිරීම තවත් උදාහරණයකි.

තවද, රූගත කිරීම සඳහා සුරංගනා කතාවක් දර්ශන සැලසුම් සාරාංශයක් (storyboard) බවට පරිවර්තනය කිරීමට හෝ සුවිශේෂී පුද්ගලයෙකුගේ ජීවිතයට අදාළ දැනට දෘශ්‍ය මාධ්‍යයෙන් පවතින තොරතුරු ද්‍රව්‍ය පරාසයක් එක්රැස් කර, කෙටි වාර්තා වැඩසටහනක් සැලසුම් කිරීමට සහ නිර්මාණය කිරීමට එය ආරම්භයක් ලෙස භාවිතා කිරීමට ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට උපදෙස් දීම ආදිය වෙනත් උදාහරණවලට ඇතුළත් වේ.

IX. සමාකරණය

චිත්‍රපට, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන අධ්‍යාපන විෂයමාලාව ශික්ෂණවිද්‍යා ප්‍රවේශයක් ලෙස සමාකරණය (simulation) නිතර භාවිතා වේ. මෙහි දී ශික්ෂකයා ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට මාධ්‍ය සහ ඩිජිටල් ඉගෙනුම යන්න විදහා දැක්වීමට සමාකරණය භාවිත කරයි. එනම්, අවම වශයෙන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් හෝ, ශික්ෂකයා ශිෂ්‍යයන්ගේ/පුරවැසියන්ගේ භූමිකාව භාර ගන්නා අතර, පුහුණුලාභියෝ ශික්ෂකයන් ලෙස කටයුතු කරති. ශික්ෂණවිද්‍යා ක්‍රියාවලියේ වැදගත් කොටසක් ලෙස, මෙම උපායමාර්ගය පිළිබඳ පසුව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරනු ලැබේ.

ශිෂ්‍යයන්/පුරවැසියන්, තාරුණ්‍යය ඉලක්ක කරගත් රූපවාහිනී වැඩසටහනක් නිෂ්පාදනය කරන වාර්තා චිත්‍රපට කණ්ඩායමක හෝ, පොඩ්කාස්ට් වැඩසටහනක් සඳහා පුද්ගලයෙකු සමග සම්මුඛ සාකච්ඡාවක් පවත්වන ගුවන්විදුලිය/අන්තර්ජාලය පදනම් කරගත් මාධ්‍යවේදියකුගේ භූමිකාව භාරගැනීම, මෙම ප්‍රවේශයට උදාහරණ වේ. තිරසර සංවර්ධන ගැටලු පිළිබඳ ප්‍රවර්ධන වීඩියෝ රූගත කිරීමට සූදානම් වන ක්‍රියාකාරීන් කණ්ඩායමක් ලෙස ද ඔවුන්ට සමාකරණය විය හැකි ය.

X. සම්පාදනය

මෙම ප්‍රවේශයට විසි එක් වැනි සියවසේ දැනුම උපාර්ජනය කරගැනීමේ ප්‍රධාන ලක්ෂණයක් වන, ක්‍රියාවෙන් ඉගෙනුම ඇතුළත් වේ. ගැඹුරු සහ අර්ථාන්විත මට්ටමකින් ඉගෙනුම ගවේෂණය කිරීමට එමගින් ශිෂ්‍යයන්/පුරවැසියන් දිරිමත් කෙරේ. අන්තර්ගත සම්පාදනය කිරීම මගින් ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට ගවේෂණය කිරීම සහ ක්‍රියාවෙහි යෙදීම ඔස්සේ ඉගෙනුමෙහි නිමග්න වීමට අවස්ථාව ලබා දෙයි. විවිධ පෙළ (උදාහරණයක් ලෙස ශ්‍රව්‍ය, දෘශ්‍ය, විවිධ ලිවීමේ ආකෘති, සජීවිකරණය සඳහා) සම්පාදනය මගින්, සිය අදහස් සහ පර්යාලෝක ගොඩනැගීමට, ක්‍රමවත්ව දැක්වීමට සහ ප්‍රකාශ කිරීමට තමා සතු නිර්මාණශීලිත්වය සහ මතය හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට හැකියාව ලැබේ.

මෙම ප්‍රවේශයට උදාහරණයක් ලෙස, ශිෂ්‍යයන්ට/පුරවැසියන්ට පාරිසරික ගැටලුවක් හෝ වෙනත් උනන්දුවක් දක්වන විෂයක් ගැන විනාඩියක ඩිජිටල් කථාවක් සෑදීමට නිදහස් සහ විවෘත-මූලාශ්‍ර චිත්‍රපට නිර්මාණකරණ මෘදුකාංගයක් භාවිතා කළ හැකි ය.

XI. විචාරශීලී විමර්ශනය

අධ්‍යාපනයේ දී, විස්තීරණ, ක්‍රමානුකූල වූ තාර්කික අවබෝධයක් සහ විශ්ලේෂණයකට ළඟා වීම සඳහා සහ නව්‍ය පර්යේෂණ ප්‍රශ්න සඳහා නව දැනුම, අදහස්, යෙදවුම් සහ මංපෙත් උත්පාදනය කිරීමේ අරමුණ ඇතිව, බහු මූලාශ්‍රවලින් සහ පර්යාලෝකවලින් අන්තර්ගතය සෙවීම, එක්රැස් කිරීම හා ඇගයීම හෝ තක්සේරු කිරීමේ ඒකාබද්ධ සහ බොහෝ විට නිර්රේඛීය ක්‍රියාවලියක් සවිචාර න්‍යාය (critical theory)[29] මගින් නිර්දිෂ්ට කරයි. විචාරශීලී විමර්ශනය මගින් අන්තර්ගතය තුළ තර්කනය, සාක්ෂි, ව්‍යුහය, තහවුරු කිරීම සහ උපකල්පන වෙත අවධානය යොමු කෙරේ.

29 See Kari D. Weaver & Jane H. Tuten (2014) The Critical Inquiry Imperative: Information Literacy and Critical Inquiry as Complementary Concepts in Higher Education, College & Undergraduate Libraries, 21:2,136-144,DOI:10.1080/10691316.2014.906779. SeealsoPrayogi,Saiful&Yuanita,Leny&Wasis, Wasis.(2018).CriticalInquiryBasedLearning:AModelofLearningtoPromoteCriticalThinkingAmong Prospective Teachers of Physic. Journal of Turkish Science Education. 15. 10.12973/tused.10220a).SeealsoDouglas,Kellner&Share,Jeff.(2007).Criticalmedialiteracyisnotanoption.LearningInquiry. 1.59-69.10.1007/s11519-007-0004-2.

XII. සංවාද ක්‍රමය හෝ විමර්ශනය

සංවාද විමර්ශනය පිහිටා ඇත්තේ පුරවැසියන්ගේ, ශිෂ්‍යයන්ගේ සහ ශික්ෂකයන්ගේ සංස්කෘතිය, භාෂාව, දේශපාලනය සහ තේමා තුළ ය. වස්තූන්, අවස්ථා, සිදුවීම් හෝ අධ්‍යයන කරුණු සමග මිනිසුන්ගේ අත්දැකීම් සහ පරිචිතභාවයේ මට්ටම් භාවිතයට ගන්නා බැවින් එය යම්තාක් දුරට ප්‍රපංචවේදාත්මක වේ. නිදසුනක් වශයෙන්, ජනප්‍රිය ක්‍රීඩාවක්, චිත්‍රපටයක්, රූපවාහිනී වැඩසටහනක්, සමාජ මාධ්‍ය වීඩියෝ, පොතක්, සඟරාවක්, ප්‍රවෘත්ති වාර්තාවක් හෝ වෙනත් අන්තර්ගතයක් පුළුල් සංහතික සංස්කෘතියේ අංග සමග සම්බන්ධ වේ. මෙම ක්‍රමය යොදා ගැනීමේ දී, ශිෂ්‍යයන් සහ ශික්ෂකයන් විසින් මෙම සම්බන්ධතාව තක්සේරු කෙරෙන අතර, ඔවුන්ගේ දෛනික ජීවිතයෙන් පුද්ගලික අත්දැකීම් ලබා ගනිමින් මෙම පෙළ සහ/හෝ සිදුවීම් පිළිබඳ ලිවීම හෝ කතා කිරීම සිදු කරනු ලබයි. පුළුල් සමාජය, ඉතිහාසය සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ පර්යාවලෝක සැලකිල්ලට ගනිමින් මෙම ක්‍රියාවලිය පුද්ගලස්ථ පර්යාවලෝකවල සිට ගෝලීය විචාරශීලී මානයන් දක්වා විහිදී යයි. එය සමහර ප්‍රවීණයන් විසින් සහභාගී සංස්කෘතිය හෝ න්‍යාය මෙන්ම ගෝලීය පුරවැසිභාවී අධ්‍යාපනය සහ ඩිජිටල් පුරවැසිභාවය ලෙස හඳුන්වනු ලබන දෙයට අදාළ වේ. එසේ කිරීම තුළින් පුරවැසියන්ට, ශිෂ්‍යයන්ට හෝ ශික්ෂකයන්ට හුරුපුරුදු හා නුහුරු අය සමග සමාජ අන්තර්ක්‍රියා ක්‍රියාවලියක් හරහා දෙපාර්ශ්වය අතර සම්බන්ධය හඳුනා ගනිමින්, අනුක්‍රමිකව හෝ සමගාමීව අන්තර් ක්‍රියා කිරීමට ලැබේ.

පරිශිෂ්ටය: තෝරාගත් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සම්පත් සහ වෙනත් සම්පත්

මෙම විෂයමාලාවේ දක්වා ඇති අන්තර්ගතයට අදාළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි විවිධ සම්පත් 16ක් මෙම පරිශිෂ්ටය තුළ ලයිස්තුගත කර ඇත.

I. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා මාර්ගෝපදේශ සඳහා ප්‍රමිති කෙටුම්පත්

මෙම ලේඛනයේ "මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා මාර්ගෝපදේශ සඳහා කෙටුම්පත් ප්‍රමිති පිළිබඳ බෙල්ග්‍රේඩ් නිර්දේශ" පිළිබඳ විස්තරයක් අඩංගු වන අතර මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා මාර්ගෝපදේශ කෙටුම්පත් ප්‍රමිති පිළිබඳ බහු පාර්ශ්වකරුවන්ගේ වැඩිදුර උපදේශන සඳහා ක්‍රියාවලියක් දැක්වේ. ලොව පුරා රටවල වෙසෙන පාර්ශ්වකරුවන් හරහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම එහි අරමුණයි. සැමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා ඊට විධිමත්, අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනය සහ ඉගෙනුමෙහි සෑම තරාතිරමක්ම ඒකාබද්ධ වීම අවශ්‍ය වේ. මෙම ලේඛනය සඳහා මූලික ඉලක්කගත කණ්ඩායම් වනුයේ විෂයමාලා සංවර්ධනය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ආශ්‍රිත වැඩසටහන් සඳහා වගකිව යුතු ප්‍රතිපත්ති සම්පාදකයන්, විෂයමාලා සකසන්නන් සහ සැලසුම්කරුවන්, ගුරුවරුන්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විශේෂඥයන් සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ආශ්‍රිත විෂයමාලා ක්‍රියාත්මක කරන ව්‍යක්තිකයන් වේ.

https://en.unesco.org/sites/default/files/belgrade_recommendations_on_draft_global_standards_for_mil_curricula_guidelines_12_november.pdf

II. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව: ප්‍රතිපත්ති සහ උපායමාර්ගික මාර්ගෝපදේශ

වර්තමානයේ නිරන්තරයෙන් විකාශනය වෙමින් පවතින දැනුම් සමාජ තුළ, ඇතැම් පුද්ගලයෝ අන්තර්ගත අතිභාරයකට ලක්ව ඇති අතර සෙසු පිරිස විශ්වසනීය තොරතුරු ලබා ගැනීමේ දැඩි අවශ්‍යතාවකින් පෙළෙති. සෑම තැනකම, ජනතාව නිදහසේ සිය අදහස් ප්‍රකාශ කිරීමටත්, පාලන ක්‍රියාවලි සහ සංස්කෘතික නුවමාරුවලට ක්‍රියාකාරීව සහභාගී වීමටත් පුල පුලා බලා සිටිති. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින්, විශේෂයෙන්ම 21 වැනි සියවස් සන්දර්භය තුළ, ඒ සම්බන්ධයෙන් සාර්ථකව ඉදිරියට යාමට අත්‍යවශ්‍ය නිපුණතා සියලු පුරවැසියන්ට ලබා දේ.

සැමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්ති සමග එය ඒකාබද්ධ කිරීම අවශ්‍ය බව පිළිගනිමින්, යුනෙස්කෝ සංවිධානය විසින් 2013 දී මාධ්‍ය හා

තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්තිය සහ උපායමාර්ගික මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කරන ලදි.

මාධ්‍ය හා සන්නිවේදන පර්යේෂණ පිළිබඳ නෝර්ඩික් තොරතුරු මධ්‍යස්ථානයේ (Nordic Information Centre of Media and Communication Research) අධ්‍යක්ෂ, මහාචාර්ය උල්ලා කාල්සන් සිය පෙරවදනෙහි සඳහන් කරන පරිදි, "මෙම ප්‍රකාශනය, ජාතික සහ කලාපීය මට්ටමින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්න වැඩිදියුණු කිරීම සඳහා අතිශය වැදගත් වේ".

මෙම මාර්ගෝපදේශ කොටස් දෙකකට බෙදා ඇත. පළමුවැන්න මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ප්‍රතිපත්ති සංක්ෂිප්තයක් වන අතර එය ප්‍රතිපත්ති සම්පාදනයේ දී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයන් සහ තීරණ ගන්නන් දැනුවත් කිරීම සඳහා නිර්මාණය කරන ලද්දක් මෙන්ම, ප්‍රකාශනයේ සාරාංශයක් ලෙස ද දැක්විය හැකි ය. 2 වන කොටස සවිස්තරාත්මක පරිච්ඡේද කිහිපයකට බෙදා ඇති අතර එමගින්, 1) සංවර්ධන මෙවලමක් ලෙස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යොදාගන්නේ කෙසේ ද, 2) මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සඳහා සංකල්පීය රාමු සහ 3) ලොව පුරා රටවලට ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනයට අනුගත කරගත හැකි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පිළිබඳ ආදර්ශ ප්‍රතිපත්තිය සහ උපායමාර්ග දැක්වේ.

https://unesdoc.unesco.org/ark:/48223/pf0000225606

III. ගෝලීය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඇගයීම් රාමුව: රටෙහි සූදානම සහ නිපුණතා

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඇගයීම් තක්සේරු රාමුව අදියර හයක් සහ විවිධ ප්‍රායෝගික මෙවලම්වලින් යුත් අතර එය ජාතික අනුවර්තන ක්‍රියාවලිය සඳහා ක්‍රමවේදීය මාර්ගෝපදේශ සපයයි. සබල පරිසරයක් නිර්මාණය කිරීමෙන් සහ පුරවැසියන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීමෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තවදුරටත් සංවර්ධනය කිරීම අරමුණු කොටගෙන අවබෝධිත තීරණ ගැනීමට එම ඇගයීම් ප්‍රතිඵල හරහා රටවලට හැකියාව ලැබේ. ජාතික මට්ටමේ ඇගයීම් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඇගයීම් තක්සේරු රාමුව එහි ප්‍රධාන අරමුණු, ව්‍යුහය සහ අනෙකුත් පරාමිති අනුව විස්තර කෙරේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සාක්ෂාත් කර ගැනීම උදෙසා රට තුළ ඇති සූදානම දැක්වෙන පැතිකඩට, අධ්‍යාපනය තුළ මාධ්‍ය හා තොරතුරු, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්තිය, මාධ්‍ය හා තොරතුරු සැපයුම, සිවිල් සමාජය අතර ද ඇතුළුව මාධ්‍ය හා තොරතුරු ප්‍රවේශය සහ භාවිතය යනාදී ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දර්ශක ඇතුළත් වේ.

මෙමගින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා න්‍යාස සහ ඒවායේ සංයුතිය (මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සංරචක, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සම්බන්ධ කරුණු, නිපුණතා, කාර්ය සාධන නිර්ණායක සහ ප්‍රවීණතා මට්ටම්) තවදුරටත් ඉදිරිපත් කෙරේ. මීට අමතරව, එය පුද්ගල සහ ආයතනික නිපුණතා යන දෙඅංශයෙන්ම තක්සේරු කරයි, විශේෂයෙන්ම සේවස්ථ සහ අභ්‍යාසලාභී ගුරුවරුන් ඉලක්ක කරයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නිපුණතා මගින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා සබල සහ හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට පහසුකම් සපයන සන්දර්භානුගත ජාතික සාධක පිළිබිඹු කළ හැකි ය. අවසාන වශයෙන්, එය ජාතික මට්ටමින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඇගයීම් සිදු කිරීම සඳහා ක්‍රමවේදීය මාර්ගෝපදේශ සහ ප්‍රායෝගික නිර්දේශ සපයයි.

https://unesdoc.unesco.org/ark:/48223/pf0000224655

IV. පුවත්පත් කලාවේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව: ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ශික්ෂකයන් සඳහා අත්පොතක්

යුනෙස්කෝ සංවිධානය විසින්, ජනමාධ්‍යවේදීන් හා පුවත්පත් කලාවේ නියුතු ගුරුවරුන් උදෙසා " පුවත්පත් කලාවේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව" (Media and Information Literacy in Journalism) යන මැයෙන් අත්පොතක් භාෂා හතරකින් (ඉංග්‍රීසි, කරාකල්පැක්, රුසියානු හා උස්බෙක්) ප්‍රකාශයට පත් කරන ලදි.

එම ප්‍රකාශනය, විශේෂයෙන්ම එය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළ හෙයින්, ජනමාධ්‍යවේදීන්ට සිය වෘත්තියේදී ප්‍රායෝගික මෙවලමකි.

මෙම අත්පොතෙහි, න්‍යායාත්මක දැනුම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දීමට සහ එම න්‍යායන් භාවිතයට ගැනීමට උපකාරී වීම සඳහා, න්‍යායාත්මක කරුණු මෙන්ම අභ්‍යාස, සිද්ධි අධ්‍යයන හා ප්‍රායෝගික මෙවලම් අන්තර්ගත වේ. එය 'ව්‍යාජ ප්‍රවෘත්ති' (අන්තර්ගතය ව්‍යාජ නම් එය ප්‍රවෘත්තියක් නොවන හෙයින් මෙම යෙදුම භාවිතය අධෛර්යය කෙරේ) සහ සාවද්‍ය තොරතුරු යන සංකල්ප පිළිබඳ කරුණු දක්වන අතර පුවත්පත් කලාවේ දී එහි අදාළත්වය සහ වැදගත්කම අවධාරණය කරමින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා සංකල්පීය රාමුවක් සපයන අතර, මාධ්‍ය අධ්‍යාපනයේ දී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා මූලධර්ම සහ භූමිකා කවරේදැයි විමසයි. මීට අමතරව, මෙම අත්පොත තොරතුරු රැස් කිරීමේදී සහ සැකසීමේ දී අන්තර්ජාලයේ ආචාරධර්ම, මානව හිමිකම් සහ මූලාශ්‍ර සමග කටයුතු කිරීම, විශ්වසනීය තොරතුරු සත්‍යාපනය කිරීමේ සහ සැපයීමේ ක්‍රම, සහ ව්‍යාපී, අසත්‍ය හෝ හසුරුවන ලද පඨිත හෝ දෘශ්‍ය තොරතුරු හඳුනාගැනීම වැනි මාතෘකා ආවරණය කරයි.

අත්පොත ඉංග්‍රීසි, රුසියන්, උස්බෙක්, කරාකල්පැක් භාෂාවලින්

https://en.unesco.org/news/unesco-promotes-media-and-information-literacy-support-media-development-uzbekistan

V. පුවත්පත් කලාව, 'ව්‍යාජ ප්‍රවෘත්ති' සහ දුස්තොරතුරු: පුවත්පත් කලාවේදී අධ්‍යාපන සහ පුහුණු අත්පොත

දුස්තොරතුරුවලට එරෙහි සටනේ නිරත ප්‍රවීණයන් විසින් ලියන ලද මෙම අත්පොත, විශ්වාසය වැදගත් වන්නේ මන්දැයි යන්න දක්වන මොඩියුල සහිතව, ඩිජිටල් තාක්ෂණය සහ සමාජ වේදිකා අසත්‍ය සහ නොමග යවන සුළු අන්තර්ගතවල වාහකයන් වන්නේ කෙසේද යන්න ගැන විචාරශීලීව දක්වමින්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හරහා දුස්තොරතුරු සහ අසත්‍ය තොරතුරුවලට එරෙහිව සටන් කරමින්, කරුණුවල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම සම්බන්ධ මූලික දැනුම (101), සමාජ මාධ්‍ය සත්‍යාපනය සහ මාර්ගගත අපයෝජනයට එරෙහිව සටන් කරමින් පුවත්පත් කලාවේ සැබෑ ස්වරූපය ගවේෂණය කරයි.

මෙම ආදර්ශ විෂයමාලාව සියලුම පුවත්පත් කලාවේදී ශික්ෂකයන් සඳහා විෂයමාලා ඉගැන්වීමට මෙන්ම තොරතුරු ගැන උනන්දුවක් දක්වන මාධ්‍යවේදීන්ට සහ සංස්කාරකවරුන් හට, තොරතුරු බෙදාහදා ගන්නා ආකාරය සහ භාවිතා කරන ආකාරය පුහුණු කිරීමට අත්‍යවශ්‍ය එකතුවකි. පුවත්පත් කලාවේ නියැලෙන්නන් විශ්වසනීය තොරතුරු සඳහා වූ නව තර්ජන තේරුම් ගෙන වාර්තා කිරීම අතිශය වැදගත් ය. දේශපාලන පක්ෂ, සෞඛ්‍ය වෘත්තිකයන්, ව්‍යාපාරික ප්‍රජාව, විද්‍යාඥයන්, මැතිවරණ නිරීක්ෂකයන් සහ වෙනත් අයට ද එය ප්‍රයෝජනවත් වනු ඇත. එය භාෂා විසිතුනකින් පවතී. https://en.unesco.org/fightfakenews

VI. තුල්‍ය ක්‍රියාව : අදහස් ප්‍රකාශනයේ නිදහසට ගරු කරමින් ඩිජිටල් දුස්තොරතුරුවලට එරෙහිව ක්‍රියාකිරීම

2020 දී, යුනෙස්කෝ සංවිධානය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU- International Telecommunication Union) විසින් සමාරම්භ කරන ලද තිරසර සංවර්ධනය සඳහා වූ බ්‍රෝඩ්බෑන්ඩ් කොමිෂන් සභාව ලොව වඩාත්ම සංකීර්ණ අභියෝගයක් පිළිබඳව පුළුල් අධ්‍යයනයක් දියත් කරන ලදී: 'තුල්‍ය ක්‍රියාව (Balancing Act): අදහස් ප්‍රකාශනයේ නිදහසට ගරු කරමින් ඩිජිටල් දුස්තොරතුරුවලට එරෙහිව ක්‍රියාකිරීම'. එම අධ්‍යයනය එහි ගෝලීය පරිමාණයෙන් සහ විස්තීර්ණභාවයෙන් අනන්‍ය වන නමුත් ඒ ඒ අංශවලට විශේෂ වූ ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ කට්ටලයක් සහ දුස්තොරතුරු ප්‍රතිචාර පරීක්ෂා කිරීම සඳහා ලකුණු 23ක රාමුවක් සමගින් ඉදිරිපත් කර ඇති එය බොහෝ සෙයින් කාර්ය-පාදක වේ.

එහි ඉලක්කගත විශ්ලේෂණ සහ නිර්දේශ මගින් මාර්ගගත සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරුවල ජීවන චක්‍රය වූ උත්පාදනයේ සිට සම්ප්‍රේෂණය, පිළිගැනීම සහ ප්‍රතිසම්පාදනය දක්වා අවස්ථා වෙත අවධානය යොමු කෙරේ. පහත පරිදි විවිධ පාඨකයන්ට ඒ අතරින් තමා විශේෂ උනන්දුවක් දක්වන පරිච්ඡේද සමුදාය සොයාගත හැකිය:

- නීති සම්පාදකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් (දුස්තොරතුරු විරෝධී ව්‍යාපාර, ඡන්ද-විශේෂී ප්‍රතිචාර, අදහස් ප්‍රකාශනයේ නිදහස තක්සේරු කිරීමේ රාමුව)
- අන්තර්ජාල සමාගම්, නිෂ්පාදකයින් සහ බෙදාහරින්නන් (මාර්ගගත අනුගාමිකයන්ගේ රුචිකත්වයට අදාළ අන්තර්ගත සොයා ගෙන, ඒවා ඔවුන් හා බෙදාගැනීම (content curation), තාක්ෂණික සහ ඇල්ගොරිතම, වෙළෙඳ දැන්වීම් ප්‍රතිපත්තිය, මුදල් ඉපයීමේ අවස්ථාව අවලංගු කිරීමේ (demonitization) ප්‍රතිචාර)
- ජනමාධ්‍යවේදීන්, ගවේෂණාත්මක පර්යේෂකයන් සහ කරුණුවල සත්‍යාසත්‍යතාව පරීක්ෂකයන්
- විශ්වවිද්‍යාල සහ ව්‍යවහාරික සහ ආනුභවික (empirical) පර්යේෂකයන්
- වෙනත් ඉලක්කගත ග්‍රාහක පිරිස් (අධ්‍යාපනික, සදාචාරාත්මක සහ ප්‍රතිමානක, සවිබලගැන්වීම් සහ විශ්වසනීයත්වය සාවද්‍ය ලෙස සීමා සහිතව වර්ග කිරීම් සම්බන්ධ ප්‍රතිචාර).
- සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරුවලට ප්‍රතිචාර දැක්වීමේ අනාවරණ විවිධ කාණ්ඩ 11කට වර්ග කර ඇත. ඒවා හඳුනාගැනීම් සහ විමර්ශනාත්මක ප්‍රතිචාරවල සිට, ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාපිත පියවර, තාක්ෂණික පියවර සහ අධ්‍යාපනික ප්‍රවේශ වෙත විහිදී යයි. එක් එක් ප්‍රතිචාර කාණ්ඩය සඳහා, ලොව පුරා සිදු කෙරෙන කාර්යය, කුමන ආකාරයේ පුද්ගලයන් විසින් සිදුකරන්නේ ද, එයට අරමුදල් සපයන්නේ කෙසේ ද සහ කවුරුන් හෝ කුමක් ඉලක්ක කරන්නේ ද යන්න පිළිබඳ විස්තරයක් පාඨකයා සොයා ගනු ඇත. පවතින අභියෝග සහ අවස්ථාවන් තක්සේරු කරන අතරම, මෙම ප්‍රතිචාර පිටුපස ඇති වෙනස්වීම්වලට පාදක වන උපකල්පන සහ න්‍යායන් මෙම වාර්තාවේ තවදුරටත් විශ්ලේෂණය කර ඇත. මාධ්‍ය නිදහස සහ තොරතුරු වෙත ප්‍රවේශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, අදහස් ප්‍රකාශනයේ විශ්වීය මානව අයිතිය සමග එහි අන්තර්ඡේදන අනුව ප්‍රතිචාර දැක්වීමේ සෑම කාණ්ඩයක්ම තක්සේරු කෙරේ. අවසානයේ දී, කොවිඩ්-19 හා සම්බන්ධ සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු සඳහා ප්‍රතිචාර පිළිබඳ සිද්ධි අධ්‍යයන එක් එක් කාණ්ඩය තුළ ඉදිරිපත් කෙරේ. මූලිකවම මෙම ලේඛනයේ හරය වන්නේ ප්‍රකාශනයේ නිදහසට ගරු කරමින් දුස්තොරතුරුවලට ප්‍රතිචාර දැක්වීම් තුලනය කිරීමේ අවශ්‍යතාව සහ වටිනාකමයි. මෙය කළ හැකි බව පර්යේෂණය මගින් අපට පෙන්වා දෙයි.

https://www.broadbandcommission.org/Documents/working-groups/FoE_Disinfo_Report.pdf

VII. ඉගෙනුම් ඉගැන්වීම් පරිවර්තනීය නියැලීම

මෑත වසරවලදී, තරුණ ශිෂ්‍යයන්, පාසල් තුළ අවි ප්‍රචණ්ඩත්වයේ සිට දේශගුණික විපර්යාස දක්වා ගැටලු පරාසයක් සම්බන්ධයෙන් දේශීය, ජාතික හෝ ගෝලීය ප්‍රජාවන්ට බලපෑම් කිරීමට ක්‍රියා කරන ආකාරය, අපි දැක ඇත්තෙමු. ඒ අතරම, අනෙකුත් තරුණ ශිෂ්‍යයන් පරිවර්තනීය ක්‍රියාවලීන් සඳහා දායක වීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති නමුත් එසේ කිරීමට ඔවුන්ගේ දැනුම හා ප්‍රායෝගික දැනීම නොමැතිකම ප්‍රකාශ කර ඇත. විශේෂයෙන්ම අධ්‍යාපනයේ කාර්යභාරයට අදාළව තරුණ ශිෂ්‍යයන් විසින් සිදු කරනු ලබන පරිවර්තනීය නියැලීමේ විවිධ ආකාරයන් අවබෝධ කර ගැනීමේ කාලීන අවශ්‍යතාව මෙම තත්ත්වය මගින් අවධාරණය කෙරේ.

දේශීය, ජාතික සහ ගෝලීය මට්ටමින් අභියෝගවලට මුහුණ දීම සඳහා ක්‍රියාකාරී, වගවීමෙන් යුත් සහ ඵලදායී භූමිකාවන් භාර ගැනීමට ශිෂ්‍යයන් සවිබල ගැන්වීම උදෙසා, අධ්‍යාපනය පිළිබඳ තිරසර සංවර්ධන ඉලක්ක (SDG) අංක4හි 4.7 මත පදනම්ව, ගෝලීය පුරවැසි අධ්‍යාපනය (GCED) සහ තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය (ESD) ඉදිරියට ගෙන යාම සඳහා යුනෙස්කෝ සංවිධානය සිය සාමාජික රටවලට සහාය දක්වයි.

පුරවැසිභාවය සහ සිවිල් අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ ලිපි විශාල ප්‍රමාණයක් තිබෙන මුත්,තරුණ ශිෂ්‍යයන්හට 'වගකීම් සහගත පරිවර්තනීය නියැලීම' යන්නෙහි අර්ථය පිළිබඳ, විශේෂයෙන් ගෝලීය පුරවැසි අධ්‍යාපනය සහ තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය සම්බන්ධයෙන් පරිවර්තනීය නියැලීමේ වර්ග සහ 'වගකිවයුතු' යන්නෙහි අර්ථය පිළිබඳ අඩු පැහැදිලිකමක් ඇත. ශිෂ්‍යයන්ගේ නියැලීම් සහ

අධ්‍යාපනය අතර ඇති සම්බන්ධය තවදුරටත් අවබෝධ කර ගැනීම සඳහා, පාසල වෙතින් ලබා දිය හැකි දැනුම, කුසලතා සහ නිපුණතා මෙන්ම අධ්‍යාපනයේ කාර්යභාරය සන්දර්භය අනුව වෙනස් විය හැකි ආකාරය පැහැදිලි කිරීමට අපට උපකාර කළ හැකි ය.
https://unesdoc.unesco.org/ark:/48223/pf0000368961?locale=fr

VIII. ශික්ෂකයන් / ගුරුවරුන් සඳහා ගෝලීය පුරවැසි අධ්‍යාපනය පිළිබඳ මාර්ගගත පාඨමාලාව

ඔබ ඉගෙනුම් අවකාශයක සිටී නම්, සාමය සහ තිරසර සංවර්ධනය සඳහා යුනෙස්කෝ සංවිධානයේ මහත්මා ගාන්ධි අධ්‍යාපන ආයතනය විසින් සකස් කරන ලද මාර්ගගත පාඨමාලා සහ සම්පත් හරහා ඔබට සම්බන්ධ විය හැකි ය:
https://mgiep.unesco.org/citandhttps://mgiep.unesco.org/article/empowering-learners-through-unesco-mgiep-s-indigeneously-designed-learning-platform-framerspace

https://mgiep.unesco.org/global-citizenship.

මෙම මෙවලම් කට්ටලයේ ඇති මූලබීජ සම්පත්වලින් එකක් වන්නේ, අධ්‍යාපන පද්ධති සඳහා සමාජයීය හා චිත්තවේගීය ඉගෙනීම පිළිබඳ සමාලෝචනයක් වන ඉගෙනුම නැවත සිතා බැලීමයි (Rethinking Learning).
https://mgiep.unesco.org/

IX. මාධ්‍ය අධ්‍යාපනය: ගුරුවරුන්, සිසුන්, දෙමාපියන් සහ වෘත්තිකයන් සඳහා අධ්‍යාපන කට්ටලයක්

යුනෙස්කෝ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද සහ අරාබි, ඉංග්‍රීසි සහ ප්‍රංශ යන භාෂාවලින් ලබා ගත හැකි මෙම මාධ්‍ය අධ්‍යාපන කට්ටලය, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ක්ෂේත්‍රයේ පරිපූර්ණ මෙවලම් කට්ටලයක් සකස් කිරීමේ පළමු උත්සාහයක් ලෙස, යුරෝපා කොමිසමේ සහාය ඇතිව යුනෙස්කෝ සංවිධානය විසින් ආරම්භ කරන ලද උපදේශක ව්‍යාපෘතියේ නිෂ්පාදනයකි.

කට්ටලය මගින් අවධානය යොමු කෙරෙන ප්‍රශ්නවලට පහත දෑ ඇතුළත් වේ: මාධ්‍ය අධ්‍යාපනය සමන්විත විය යුත්තේ කුමකින් ද? එය සැපයිය යුත්තේ කවුරුන් විසින් ද? එය විෂයමාලාවකට ඇතුළත් කළ යුත්තේ කෙසේ ද? පාසල්වලින් ඔබ්බට, මේ කාරණය සම්බන්ධයෙන් පවුල්වලට වගකීමක් තිබේ ද? වෘත්තිකයන් සැමවිටම සම්බන්ධ විය යුතු ද සහ කෙසේ ද? මාධ්‍යවල ප්‍රතිලාභ සහ සීමාවන් සමග කටයුතු කිරීමට මහජනතාවට අනුගමනය කළ හැකි උපායමාර්ග කවරේ ද?

මෙම අධ්‍යාපන කට්ටලය තුළ මොඩියුල විෂයමාලාවක් සඳහා යෝජනාවක්, ගුරුවරුන් සඳහා අත්පොතක්, සිසුන් සඳහා අත්පොතක්, දෙමාපියන් සඳහා අත්පොතක්, වෘත්තිකයන් සමග සදාචාරාත්මක සබඳතා සඳහා අත්පොතක් සහ අන්තර්ජාල සාක්ෂරතා අත්පොතක් අඩංගු වේ.

http://unesdoc.unesco.org/images/0014/001492/149278e.pdf

X. යුනෙස්කෝ මාධ්‍ය සංවර්ධන දර්ශක

යුනෙස්කෝ මාධ්‍ය සංවර්ධන දර්ශක (MDIs - Media Development Indicators) යනු මාධ්‍ය සහ තොරතුරු සේවාවන්ට ඒවායෙහි මහජන සේවා කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි තක්සේරු කිරීම සඳහා වූ බොහෝ භාෂාවලට පරිවර්තනය කර ඇති ජාත්‍යන්තරව එකඟ වූ දර්ශක සමූහයකි. එම දර්ශක පහත අන්තර් සම්බන්ධිත කොන්දේසි පහ පරීක්ෂා කිරීමට උපකාරී වේ: නියාමන පද්ධතිය; මාධ්‍යයේ බහුවිධතාව සහ විවිධත්වය; ප්‍රජාතන්ත්‍රවාදී කතිකාව සඳහා වේදිකාවක් ලෙස මාධ්‍ය; වෘත්තීය ධාරිතාව ගොඩනැගීම; සහ යටිතල පහසුකම් ධාරිතාව.මෙය පොදුවේ මාධ්‍ය පරිසර පද්ධති අවබෝධ කර ගැනීම සඳහා රාමුවක් සපයයි. අද වන විට රටවල් 20ක් ඔවුන්ගේ ජාතික මාධ්‍ය අවකාශය තක්සේරු කරන සංයුක්ත වාර්තා ඉදිරිපත් කර ඇත

XI. මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර රැස්වීම - ග්‍රන්වෝල්ඩ් ප්‍රකාශනයේ සිට ප්‍රගතිය, බාධක, නව ප්‍රවණතා: නව තක්සේරු නිර්ණායක ගොඩනැගීම දක්වා?

මෙම ජාත්‍යන්තර සමුළුව, යුනෙස්කෝව වෙනුවෙන් ප්‍රංශ කොමිසම විසින් යුනෙස්කෝ සංවිධානයේ සහයෝගීතාවෙන් සහ ප්‍රංශ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ යුරෝපා කවුන්සිලයේ සහාය ඇතිව 2007 ජූනි මාසයේ දී පැරීසියේ දී සංවිධානය කරන ලදි.

http://www.unesco.org/new/fileadmin/MULTIMEDIA/HQ/CI/CI/pdf/theme_media_literacy_grunwald_declaration.pdf

XII. මාධ්‍ය අධ්‍යාපනය තුළින් සවිබලගැන්වීම

මෙම ප්‍රකාශනය යුනෙස්කෝ සංවිධානයෙහි සහාය ඇතිව NORDICOM" International Clearing House සහ ය'තබොරි (Göteborg) විශ්වවිද්‍යාලය විසින් සම්පාදනය කරන ලදි. 2007 මාර්තු මාසයේ දී රියාද් හි දී යුනෙස්කෝ සංවිධානයෙහි සහාය ඇතිව පැවති මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රථම ජාත්‍යන්තර සම්මේලනය සහ ඉහත සඳහන් කළ 2007 ජූනි මස පැරිසියේ දී පැවැති මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර රැස්වීම: ග්‍රන්වෝල්ඩ් ප්‍රකාශනයේ සිට ප්‍රගතිය, බාධක, නව ප්‍රවණතා: නව තක්සේරු නිර්ණායක ගොඩනැගීම දක්වා, යන්න මත මෙම පොත පදනම් වී ඇත. ප්‍රජාතන්ත්‍රවාදය සහ සංවර්ධනය පිළිබඳ ගැටලු පිළිබඳ සාකච්ඡා කරන විට, මාධ්‍ය සාක්ෂරතාව සහිත පුරවැසියන් යනු පූර්ව ප්‍රත්‍යයක් බව අපට බොහෝ විට අමතක වේ. අන්‍යාකාරයකින් කිවහොත්, මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමේ සාමූහික ප්‍රයත්නය පුරවැසියන් සවිබල ගැන්වීම සඳහා වැදගත් පූර්වාවශ්‍යතාවකි. සංවර්ධන ක්‍රියාවලි සහ සමාජ විපර්යාස පිළිබඳ ප්‍රකාශනය කිරීමෙන්, එදිනෙදා ජීවිතය වැඩිදියුණු කිරීමෙන්, තම ජීවිතවලට බලපෑමක් ඇති කරගත ආකාරයට ජනතාව සවිබලගැන්වීමෙන් මෙවලම් සහ මාර්ගයක් ලෙස මාධ්‍ය සහ සන්නිවේදනය භාවිත කිරීමට පුද්ගලයාට හැකියාව ලබා දෙන විචාරශීලි හැකියා සහ කුසලතා ශක්තිමත් කිරීමට එමගින් රුකුල් දෙයි.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සියලුම පුරවැසියන්ට අවශ්‍ය වන අතර විශේෂයෙන් තරුණ පරම්පරාවට පුරවැසියන් ලෙස සහ සමාජයේ සහභාගිවන්නන් ලෙස යන දෙයාකාරයෙන්ම ඔවුන්ගේ භූමිකාවට සහ ඔවුන්ගේ ඉගෙනීමට, සංස්කෘතික ප්‍රකාශනයට සහ පුද්ගලික අභිවෘද්ධියට එය තීරණාත්මක සාධකයක් වේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත සමාජයක් සාක්ෂාත් කර ගැනීමේ ප්‍රයත්නයන්හි මූලික අංගයක් වන්නේ මාධ්‍ය අධ්‍යාපනයයි. නමුත් මෙවැනි ගැටලු ගැන කතා කරන විට බොහෝ විට සමුද්දේශ රාමුව වන්නේ බටහිර ලෝකයේ මාධ්‍ය සංස්කෘතියයි.එහෙත් දැනට පවතිනවාට වඩා බොහෝ සෙයින් බටහිර නොවන අදහස් සහ අන්තර් සංස්කෘතික ප්‍රවේශයන් සඳහා කාර්යපටිපාටිය විවෘත කිරීම කාලීන අවශ්‍යතාවකි. පුළුල්ව අපගේ පොදු උනන්දුව බොහෝ සර්වග්‍රාහී සුසමාදර්ශයන් සම්බන්ධයෙන් ගත් කල ජාත්‍යන්තරකරණය යනු හරවත් මෙන්ම අත්‍යාවශ්‍ය වන්නකි.

https://www.nordicom.gu.se/en/publikationer/empowerment-through-media-education

XIII. තොරතුරු සාක්ෂරතාව අවබෝධ කර ගැනීම: මුල් පොත

යුනෙස්කෝ සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති සැමට තොරතුරු වැඩසටහන (IFAP) මගින් 2008 දී ප්‍රකාශයට පත් කරන ලද මෙම ප්‍රකාශනය, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි එක් මානයක් වන තොරතුරු සාක්ෂරතාවේ මූලික කොටස්, අවබෝධය පහසු සහ තාක්ෂණික නොවන ආකාරයෙන් ඉදිරිපත් කරයි.

මෙම ප්‍රකාශනය රාජ්‍ය නිලධාරීන්, අන්තර් රාජ්‍ය සිවිල් සේවකයන්, තොරතුරු වෘත්තිකයන් සහ ගුරුවරුන්ගේ සිට ලාභ ලබන මෙන්ම ලාභ නොලබන සංවිධානවල මානව සම්පත් කළමනාකරුවන් දක්වා විවිධ ග්‍රාහක පිරිස් ඉලක්ක කරයි. පහත දැක්වෙන්නේ එම ප්‍රකාශනයේ උපුටනයකි:

ඔබේ ජීවිත කාලය පුරාවටම, ඔබ වැඩි වැඩියෙන් ඉගෙන ගන්නා තරමට සහ එමගින් දේවල් දැන ගැනීමට ලැබෙන අතර, ඔබ දැනගත යුතු තොරතුරු සොයන්නේ කෙසේ ද, කොහෙන් ද, කාගෙන් ද සහ සොයා බලන්නේ හා ලබා ගන්නේ කුමන අවස්ථාවක ද යන්න සොයා බැලීම තුළින් විශේෂයෙන් ම නොපමාව ප්‍රවීණ ඉගෙනුම් කුසලතා, පුරුදු සහ ආකල්ප ප්‍රගුණ කර පිළිපදින තරමට, [...] ඔබ වඩාත් තොරතුරු සාක්ෂර වනු ඇත. එම කුසලතා, පුරුදු සහ ආකල්ප යොදා ගැනීමේ සහ භාවිත

කිරීමේ ඔබ සතු නිපුණතාව, ඔබේ පෞද්ගලික සහ පවුලේ සෞඛ්‍ය හා සුභසාධනය, අධ්‍යාපනය, රැකියාව, පුරවැසිභාවය ආශ්‍රිත සහ වෙනත් අභියෝග හමුවේ සාර්ථකව කටයුතු කිරීමට වඩා යහපත් සහ කාලෝචිත තීරණ ගැනීමට ඔබව සබල කරනු ඇත.

http://unesdoc.unesco.org/images/0015/001570/157020e.pdf

XIV. පුළුවන් නම් මම ලැජ්ජාවෙන් රතු වෙනවා: අධ්‍යාපනය හරහා ඩිජිටල් කුසලතා තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භේදයට තිත තැබීම

මෙම ප්‍රකාශනය, අධ්‍යාපනය හරහා ඩිජිටල් කුසලතා තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භේද නැති කිරීමට උපායමාර්ග ගෙනහැර දක්වයි (කෘත්‍රිම බුද්ධි සහායිකාවකට පරුෂ වචනයෙන් බැණ වැදුණු විට I would blush if I could යනුවෙන් ඇය ඊට ලබා දුන් පිළිතුර සයිබර් හිංසනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කතිකාවේ දී නිදසුනක් ලෙස ගන්නා සිද්ධියකි). ප්‍රතිපත්ති පත්‍රිකාවක් සහ කිසියම් විෂයයක් බැරෑරුම් හා කල්පනාකාරී ආකාරයකින් සාකච්ඡා කරන පුවත්පතක හෝ සඟරාවක ලිපි දෙකක් වශයෙන් කොටස් තුනක් ඊට ඇතුළත් වේ. මෙහි ඇති අදහස් සහ නිර්දේශ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමේ මෙවලමක් ලෙස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව කෙරෙහි පහසුවෙන් යොදා ගත හැකි ය.

එම ප්‍රතිපත්ති පත්‍රිකාව ඩිජිටල් කුසලතාවන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරතරය නොනැසී පැවතීම සහ එහි බරපතලකම ගෙනහැර දක්වන අතර ඊට මැදිහත්වීම් සඳහා තාර්කිකයක් . එමෙන්ම ඩිජිටල් කුසලතා වර්ධනය කිරීමට සහ ශක්තිමත් කිරීමට කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට සමාන අවස්ථා ලබා දීම සඳහා ද නිර්දේශ ඉදිරිපත් කරයි.

පළමු පසුබිම් විශ්ලේෂී ලිපියෙන්, "තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා විරුද්ධාභාසය" (ICT Gender Equality Paradox) මෙන්ම පරිගණක විද්‍යාව සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ උසස් උපාධි හදාරන කාන්තාවන්ගේ අඩුම අනුපාතයක් ඇත්තේ යුරෝපීය රටවල් ගණනාවක් වැනි ඉහළම ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා මට්ටමක් ඇති රටවලින් බවට යුනෙස්කෝ සංවිධානයෙන් කළ අනාවරණය ද විමර්ශනයට ලක් කරයි.

දෙවන පසුබිම් විශ්ලේෂී ලිපිය තුළින්, කෘත්‍රිම බුද්ධි හඬ සහායකයන් තරුණ කාන්තාවන් ලෙස හඬ ගැන්වීම තුළින් ප්‍රචාරණය කරන හානිකර ස්ත්‍රී පුරුෂ සමාජභාවී නැඹුරුතාව විමසුමට ලක් කරයි. ඩිජිටල් සහායකයන් දිගින් දිගටම පවත්වා ගෙන යාම හා භාවිත කිරීම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී භේද උත්සන්න නොකෙරෙන බවටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ඒකාකෘති ප්‍රචාරණය නොකෙරෙන බවටත් සහතික කිරීමට නිර්දේශ ඉදිරිපත් කෙරේ.

https://en.unesco.org/Id-blush-if-I-could

XV. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, මාධ්‍ය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ: පර්යේෂණ, අධ්‍යාපනය සහ පුහුණු සඳහා නව ප්‍රවේශ

මාධ්‍ය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව පිළිබඳ විවිධ පුහුණු සම්පත් සහ අවස්ථා හඳුනා ගැනීම සහ සංසන්දනය කිරීම බොහෝ විට දුෂ්කර ය. විවිධ විෂයමාලා සහ පුහුණු අදහස් පිළිගැනීම සහ ඊට අනුවර්තනය වීම මගින් මෙම ලියැවිල්ල එම අභියෝග යට ප්‍රතිචාර දක්වයි. මෙම ලියැවිල්ල මාධ්‍ය තුළ සහ ඒ ඔස්සේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ඉහළ නැංවීම සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය ක්ෂේත්‍ර, ප්‍රතිපත්ති ක්ෂේත්‍ර සමග සම්බන්ධ වේ. එය 2014 දී යුනෙස්කෝ සංවිධානය විසින් ප්‍රාරම්භ කරන ලද සන්ධානයක් වන මාධ්‍ය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගෝලීය සන්ධානය (GAMAG- Global Alliance on Media and Gender) රාමුව තුළ වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය, මාධ්‍ය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පිළිබඳ යුනෙස්කෝ යුනිට්වින් (UNESCO UNITWIN) ජාලය විසින් නිෂ්පාදනය කරන ලදී.

https://en.unesco.org/gamagandunitwin

XVI. ශික්ෂකයන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා ප්‍රමිති

ජාතික අධ්‍යාපන ක්ෂේත්‍රවලට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආධාර කරගැනීම පිණිස ප්‍රමිති අවශ්‍යතාවට ප්‍රතිචාර වශයෙන්, ගුරුවරුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා ප්‍රමිති

(CST) ව්‍යාපෘතිය පිහිටුවීම උදෙසා යුනෙස්කෝ සංවිධානය සිස්කෝ (Cisco), ඉන්ටෙල් (Intel) සහ මයික්‍රොසොෆ්ට් (Microsoft) ආයතන සමග මෙන්ම අධ්‍යාපනය පිළිබඳ තාක්ෂණ සඳහා වූ ජාත්‍යන්තර සංගමය (ISTE) සහ වර්ජිනියා පොලිටෙක්නික් ආයතනය (Virginia Polytechnic Institute) සහ වර්ජිනියා ටෙක් රාජ්‍ය විශ්වවිද්‍යාලය (State University - Virginia Tech) සමග එක් විය.

පන්තිකාමරය කොතැනක තිබුණ ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා ශික්ෂකයින්ගේ පරිචය වැඩිදියුණු කරන්නේ කෙසේ ද සහ ඔවුන්ගේ කුසලතාවන්ට මානයක් ලබා දෙන්නේ කෙසේ ද යන්න පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම ගුරුවරුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා ප්‍රමිති (CST) ව්‍යාපෘතියේ පරමාර්ථය වන අතර එහි ප්‍රතිඵලය වන්නේ වඩා හොඳ අධ්‍යාපනයක් සහ ඉහළ දක්ෂතා ඇති ශිෂ්‍යයන් පිරිසක් බිහිවීමයි.

ශික්ෂකයන් සඳහා වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා ප්‍රමිති ප්‍රකාශනය පුස්තිකා තුනකින් සමන්විත වේ:

- ගුරුවරුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා ප්‍රමිති ව්‍යාපෘතියේ තාර්කිකය, ව්‍යුහය සහ ප්‍රවේශය පැහැදිලි කරන ප්‍රතිපත්ති රාමුවක් http://unesdoc.unesco.org/images/0015/001562/156207e.pdf
- ශික්ෂකයින් සඳහා නිපුණතා න්‍යාසයක් නිර්මාණය කිරීම සඳහා අධ්‍යාපනික ප්‍රතිසංස්කරණවල සංරචක සහ විවිධ ප්‍රතිපත්ති ප්‍රවේශ ඒකාබද්ධ කරන නිපුණතා ප්‍රමිති මොඩියුල ව්‍යූහයක් http://unesdoc.unesco.org/images/0015/001562/156210E.pdf
- එක් එක් නිපුණතා කට්ටලය/මොඩියුලය තුළ ගුරුවරුන් විසින් ලබා ගත යුතු නිශ්චිත කුසලතා පිළිබඳ සවිස්තරාත්මක විෂයමාලාවක් සපයන ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ. http://unesdoc.unesco.org/images/0015/001562/156209E.pdf

XVII. අනාගතය සඳහා ඉගෙනුම - තිරසර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනයට අදාළ නිපුණතා

තිරසර සංවර්ධනයට දායක වන අන්දමින් මිනිසුන්ට එක්ව ජීවත් වීමට අවස්ථාව සැලසීම සඳහා අධ්‍යාපනය වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතු ය. ශිෂ්‍යයන්ට ඔවුන්ගේම ජීවන රටාවන් සහ එම ජීවන රටාවන් ප්‍රවර්ධනය කරන පද්ධති සහ ව්‍යුහයන් ප්‍රශ්න කිරීමට අවස්ථාවක් නොමැති විට තිරසර නොවන ජීවන රටාවකට අධ්‍යාපනයට දායක විය හැකිය.තිරසර නොවන ආකෘති සහ භාවිතයන් ප්‍රතිසම්පාදනය කිරීම හරහා ද එය සිදු වේ. එබැවින් සංවර්ධනය නව රූප නැංවීම, අධ්‍යාපනය තිරසර සංවර්ධනයක් කරා යළි දිශානත කිරීමේ අවශ්‍යතාව මතු කරයි.

සියලු ශික්ෂකයන් අපේක්ෂා කළ යුතු ඉලක්ක ලෙස නිපුණතා සමූහයක් මෙමගින් ආවරණය කරයි. එය චර්යාත්මක ප්‍රතිඵල නිර්දේශ නොකරන අතර, එය ශික්ෂකයින්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා රාමුවක් සපයන අතර ගුණක ආචරණයකින් යුත් පුද්ගලයන්, කණ්ඩායම් සහ ආයතන සඳහා විශේෂ වැදගත්කමක් දරයි.

https://unesdoc.unesco.org/ark:/48223/pf0000261802



2වන කොටස

මොඩියුල

හැඳින්වීම: මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව භාවිත කරන්නේ කෙසේ ද?

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව අපගේ පුද්ගලික ජීවිත තුළ, තිරසර සංවර්ධනයේ දී සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන්ගේ ක්‍රියාකාරිත්වයට අදාළ වේ. එය තොරතුරු සහ අදහස් සන්නිවේදනය කිරීමට හා ප්‍රකාශ කිරීමට සහ සෙවීමට, ලැබීමට හා සම්ප්‍රේෂණය කිරීමට පුද්ගලයා සතු අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරයි. එය අන්තර්ගත සපයන්නන් සහ ඔවුන්ගේ අන්තර්ගතය ඔවුන් සම්පාදනය කරන ආකාරය, සන්දේශ සහ අගයන් ගෙන යන ආකාරය සහ අභිප්‍රේත ග්‍රාහක පිරිස හෝ අරමුණු ඇගයීම දිරිමත් කරයි.

තොරතුරු සහ දැනුම මත පදනම් වූ සමාජයක:

- තිරසර සංවර්ධන ඉලක්ක සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලි සඳහා සන්නිවේදනය සහ තොරතුරු කේන්ද්‍රීය වේ
- සංජානන, විශ්වාස සහ ආකල්ප ගොඩනැගීමට අන්තර්ගත සපයන්නෝ දායක වෙති
- පරිශීලක විසින් ජනිත අන්තර්ගතවල, ඩිජිටල් අවකාශ භාවිතයේ, පුරවැසි පුවත්පත් කලාවේ සහ පුරවැසි මූලික තොරතුරුවල වැඩි වීමක් දක්නට ඇත
- සමාජය තුළ පුරවැසි සහභාගීත්වය සහ සාර්ථකත්වය සඳහා මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව වැදගත් වේ

අන්තර්ගත, අන්තර්ගත සපයන්නන් සහ අන්තර්ගත සම්පාදනය සහ ව්‍යාප්තිය සඳහා අවශ්‍ය තාක්ෂණ සම්බන්ධයෙන් අදාළ නිපුණතා එක්තැන් කිරීමෙන්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව වර්තමාන ජීවිතයට සහ වැඩකටයුතුවලට අවශ්‍ය සාක්ෂරතාව සඳහා සාකල්‍ය ප්‍රවේශයක් ඉදිරිපත් කරයි. මෙම විෂයමාලාව සාක්ෂරතාව පිළිබඳ පුළුල් අර්ථ දැක්වීමක අවශ්‍යතාවය හඳුනා ගනී. තවද, මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව මගින් මාධ්‍ය සහ අන්තර්ජාල සමාගම් වැනි ආයතනවලට අමතරව වැදගත් අන්තර්ගත සපයන්නන් ලෙස පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාරවල කාර්යභාරය ද පිළිගනු ලබයි.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සඳහා ඉලක්කගත ග්‍රාහක පිරිස

විෂය නිර්දේශය සඳහා ඉලක්කගත කණ්ඩායම් අත්‍යවශ්‍යයෙන්ම ශික්ෂකයින් සහ ශිෂ්‍යයන් වේ. ද්විතීයික සහ මූලික වශයෙන් තෘතීයික මට්ටම්වල ගුරුවරුන්, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන (CSO), ප්‍රජා මධ්‍යස්ථාන, මාධ්‍ය, පුස්තකාල, මාර්ගගත හෝ මාර්ගගත නොවන සියලු අංශයන්ගෙන් පුහුණුවලට හෝ ඉගැනුමට සම්බන්ධ පුද්ගලයන් සියලු දෙනා ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් ලෙස පුළුල් අර්ථයෙන් හඳුනා ගෙන ඇත. විෂයමාලාව සකස් කර ඇත්තේ අනුවර්තනය වීම සැලකිල්ලට ගෙන හෙයින්, එය මාධ්‍ය තොරතුරු සාක්ෂරතා ක්ෂේත්‍රයේ උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්වකරුවන්ට භාවිතා කළ හැකිය. වඩාත් අදාළ කිරීමට හෝ නිශ්චිත ඉලක්කගත කණ්ඩායම්වලට ප්‍රවේශ වීමට එහි පරිශීලකයින්ට අන්තර්ගතය අනුවර්තනය කිරීමට අවශ්‍ය විය හැකි ය. විෂයමාලාව රජයේ ආයතන සහ අමාත්‍යාංශ සහ අනෙකුත් සමාජ සහ ජාත්‍යන්තර සංවර්ධන සංවිධාන සඳහා ද අදාළ වේ.

මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ ප්‍රධාන ලක්ෂණ

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව උත්සාහ කරන්නේ කලක් වෙන් වූ සහ වෙනස් වූ අධ්‍යයන විෂයයන් නැවත එක්තැන් කිරීමට ය. ඩිජිටල් ප්‍රගතිය තොරතුරු සැකසීමේ අභිසාරීතාවට හේතු වී ඇති බව සහ වේදිකා සහ අන්තර්ගත සපයන්නන් හරහා විවිධ වර්ගයේ අන්තර්ගතයන් සමග විචාරශීලීව සම්බන්ධ වීමට අවශ්‍ය නිපුණතා එමගින් හඳුනා ගනී. මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාව පරිපූර්ණ සහ අන්තර්කරණීය වේ. එය නිර්දේශක නොවන (non-prescriptive) ප්‍රවේශයකින් සහ අනුවර්තනය වීම මනසේ තබාගෙන සකස් කර ඇත.එය මොඩියුල ආකාරයෙන් ඉදිරිපත් කෙරේ.

මෙම විෂයමාලා ලේඛනයේ ඇති මොඩියුලවලට පහත කොටස් සියල්ල හෝ සමහරක් ඇතුළත් වේ:

- පසුබිම සහ තාර්කිකය
- ප්‍රධාන මාතෘකා
- ඉගෙනුම් අරමුණු
- ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ නියැදි ක්‍රියාකාරකම්
- ඇගයීම සහ නිර්දේශ
- වැඩිදුර සලකා බැලීම සඳහා මාතෘකා
- සම්පත් සහ යොමු කිරීම්.

ඉගෙනුම් අරමුණුවලදී සාමාන්‍යයෙන් ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා එක් එක් මොඩියුලවල ප්‍රමුඛ ඉලක්ක හඳුනා ගැනේ. එමගින් එක් එක් මොඩියුලය/ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයින් සහ ශිෂ්‍යයන් ප්‍රදර්ශනය කළ යුතු නිපුණතා (දැනුම, කුසලතා, ආකල්ප සහ අගයන්) හඳුනා ගැනේ. ඕනෑම අනුවර්තන සැලැස්මක් තුළ, විෂයමාලා සමස්ත සන්දර්භය ලෙස මේවා සැලකිය යුතු අතර නිපුණතා රාමුව සහ මෙම පැකේජයේ කොටසක් වන ආදර්ශ මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලා මොඩියුල කොටසකි.

පසුබිම සහ තාර්කිකය යන කොටසින්, අන්තර්ගතය සහ සන්දර්භය ගෙනහැර දක්වමින් සහ විස්තර කරමින් මොඩියුලයේ මාතෘකාව ගවේෂණය කරයි. විවරණය තුළින් දීර්ඝ විස්තරයක් ලබා දීමට අදහස් නොකරන නමුත් පරිශීලකයන්ට ගවේෂණය කළ හැකි සලකාබැලීම් සහ දිශා නිරූපණය කිරීමට අදහස් කරන බව සැලකිල්ලට ගැනීම වැදගත් ය.

මෙහි ඇතුළත් යෝජිත ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ නියැදි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද එයම කිව හැකි ය. එක් එක් මොඩියුලය තුළ ලබාගත් කුසලතා සහ දැනුම ප්‍රදර්ශනය කළ හැකි බොහෝ ක්‍රම නිරූපණය කිරීම සඳහා මේවා සකස් කර ඇත.මෙම ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් දැකිය යුත්තේ උදාහරණ ලෙස පමණි. දේශීය හෝ සංස්කෘතික වශයෙන් වඩාත් ගැළපෙන ක්‍රියාකාරකම් සකස් කිරීම සඳහා මේවා පදනමක් ලෙස භාවිතා කිරීමට ශික්ෂකයින් දිරිමත් කරනු ලැබේ. පරිශීලකයින්ගේ ප්‍රයත්නවලට සහාය වීම සඳහා, යුනෙස්කෝ සංවිධානය විසින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ ගතික බහුමාධ්‍ය මාර්ගගත අනුවාදයක් යාවත්කාලීන කරනු ඇති අතර එයට මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව ආශ්‍රිත සම්පත්, පාඩම් සැලසුම්, ක්‍රියාකාරකම් යනාදී බහුමාධ්‍ය දත්ත බැංකුවක් ඇතුළත් වේ. යුනෙස්කෝ සංවිධානයවිසින් බහුමාධ්‍ය අනුවාදයේ මාර්ගගත නොවන පැකේජ විමර්ශනය කරනු ඇත. විවෘත අධ්‍යාපනික සම්පත් උත්තේජනය කරනු ඇත. වැඩි විස්තර සඳහා කරුණාකර යුනෙස්කෝ වෙබ් අඩවිය බලන්න.

ඇගයීම සහ නිර්දේශ පිළිබඳ කොටසෙහි ආකෘතික සහ සම්පිණ්ඩිත ඇගයීම සඳහා යෝජනා ඇතුළත් වේ. මෙම නිර්දේශ මගින් ඉගෙනීම සඳහා ඇගයුම, ඉගෙනීම ඇගයුම සහ ඉගෙනීම ලෙස ඇගයීම ඇතුළු ඇගයීම සඳහා ඇති හැකියාවන් ඉස්මතු කිරීමට අදහස් කෙරේ. තවදුරටත් මේ සම්බන්ධයෙන් අධ්‍යයනයට කැමති පරිශීලකයන් හට වැඩිදුර සලකා බැලීම සඳහා අමතර මාතෘකා ඇත.

අවසාන වශයෙන්, මෙම මොඩියුල සමග භාවිතා කිරීම සඳහා නිර්දේශ කර ඇති සම්පත් සහ යොමු දැක්වෙන කොටසකින් මොඩියුල අවසන් වේ. මෙම ලැයිස්තුවට එක් කිරීමට කැමති ඔවුන්ගේම දේශීය සම්පත් ඇති බව පරිශීලකයන්ට පෙනී යනු ඇත.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා අනුවර්තන ක්‍රියාවලිය: නිර්දේශ

මෙම සම්පත ක්‍රියාත්මක කිරීමේ දී සහ එය අනුවර්තනය කරගැනීමේ දී, විවිධ ඉගෙනුම් අවකාශ තුළ පවතින යථාර්ථයන් - මාර්ග අපගත, මාර්ගගත හෝ දුරස්ථ වේවා - පරිශීලකයන්ගේ හෝ ආයතනවල ප්‍රමුඛතා සහ ඉලක්ක, දැනට පවතින රුචිකත්වයන්, වැඩසටහන් අන්තර්ගතය සහ ප්‍රමුඛතා, කාල නියමයන්, සුලභතාව සහ කාල සීමාවන් වෙත අවධානය යොමු කළ යුතු ය. ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලබන්නේ විෂයමාලාව සියලු ආකාරයේ ඉගෙනීම්වලට සම්බන්ධ පරිශීලකයින්ගේ අවශ්‍යතා සපුරාලන බව සහතික කිරීමේ මාර්ගයක් ලෙස ය.

- ප්‍රධාන පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් හඳුනා ගැනීම සහ මෙහෙයුම් කමිටුවක් පිහිටුවීම.
- ආරම්භක අදියරේ දී, මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සහ විෂයමාලා සහ නිපුණතා රාමුව පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු විය යුතුය. මෙමගින් පරිශීලකයින්ට ඔවුන්ගේ අවශ්‍යතා වඩාත් හොඳින් සපුරාලිය හැකි විෂයමාලාවේ ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට හැකි වේ.
- මාධ්‍ය තොරතුරු සාක්ෂරතාවයෙහි දැක්වෙන කරුණු දැනටමත් පවතින විෂයමාලාවට ඇතුළත් කර තිබේද නැද්ද යන්න තහවුරු කර ගැනීම සඳහා ආයතන හෝ රටවලට අදාළ පුද්ගලයන් හා විෂයමාලා පිළිබඳ වත්මන් දැනුම පිළිබඳ ඇගයීමක් සිදු කළ යුතු ය. අනවශ්‍ය පුනරාවර්තන සහ අතිච්ඡාදනය වීම් වළක්වාගැනීමට මෙය පැහැදිලිවම උපකාරී වේ. මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලා මගින් සපුරාලිය හැකි දැනට පවතින විෂයමාලා සහ වැඩසටහන්වල කවර හෝ හිඩැසක් හඳුනා ගැනීමට ද එය උපකාර වනු ඇත.
- මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව ක්‍රියාත්මක කිරීම සඳහා වන හොඳම ප්‍රවේශය, පවතින කාලය සහ අවශ්‍ය සම්පත් (එනම් ද්‍රව්‍ය සහ පිරිස් යන දෙකම ඇතුළුව) පිළබඳ සලකා එක් එක් ආයතනයක් විසින් එය තීරණය කළ යුතු ය. මෙහි දී සලකා බැලිය යුතු ප්‍රධාන ප්‍රශ්නවලට ඇතුළත් වන්නේ: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්විය යුත්තේ කෙසේ ද? එය ඒකාබද්ධ කළ යුත්තේ කෙසේ ද? ආයතනය තුළ මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විශේෂඥතාව තිබේ ද? නොඑසේ නම්, එය සොයාගත හැක්කේ කොතැනින් ද? අවශ්‍ය ද්‍රව්‍ය හා සම්පත් සඳහා ප්‍රවේශයක් තිබේ ද? එසේ නොමැති නම්, මේවා ස්ථානගත කළ හැක්කේ කොතැනින් ද? මෙම හඳුනාගත් අවශ්‍යතා අපේක්ෂිත අනුවර්තන උපායෙමාර්ගයට බලපාන්නේ කෙසේ ද?
- මෙම මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාවට අනුවර්තනය වීමට සූදානම් විය යුතුය. මෙයින් අදහස් කරන්නේ ඉහත සඳහන් කර ඇති සලකා බැලීම් මත පදනම්ව මාධ්‍ය තොරතුරු සාක්ෂරතාවිෂයමාලාවේ ගැලපෙන අනුවාදයක් සකස් කිරීම අවශ්‍ය විය හැකි බවයි. සැබෑ අනුවර්තන ක්‍රියාවලියට යුනෙස්කෝ විවෘත අධ්‍යාපනික සම්පත්වල (OER) සහාය ලබා ගත හැක. විවෘත අධ්‍යාපන සම්පත් යනු ක්‍රියේටිව් කොමන්ස් (Creative Commons) වැනි බුද්ධිමය දේපල බලපත්‍රයක් යටතේ නිකුත් කර ඇති ඉගෙනුම් ද්‍රව්‍ය වන අතර ඒවා අන් අයට නොමිලේ භාවිතා කිරීමට ඉඩ සලසනු ලබයි. (මේ පිළිබඳ වැඩිදුර විස්තර මෙම කොටසේ අවසානයට ඇති කොටුවේ දක්වා ඇත).

- අනුවර්තනය කරන ලද විෂයමාලාව හෝ සුනිමි අනුවාදය (tailored version) සකස් කළ පසු, නියමු පරීක්ෂණයක් පැවැත්වීම වැදගත් වේ. මෙම පරීක්ෂණ අදියර නිරීක්ෂණය කළ යුතු අතර නියමු වැඩසටහනෙහි ප්‍රතිඵලය තක්සේරු කිරීමට අවශ්‍ය වනු ඇත.
- නියමු වැඩසටහනෙහි තක්සේරුව මත පදනම්ව, ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ඇතුළුව අනුවර්තනය කරන ලද විෂයමාලාවට අවශ්‍ය සංශෝධන සිදු කළ යුතු ය.
- මෙම අදියරේ දී, ආයතනය විසින් තෝරා ගන්නා ලද ඒකාබද්ධතා උපායමාර්ගය මත පදනම්ව, විෂයමාලාව ආයතන පුරා ඒකාබද්ධ කිරීම සූදානම්ව පවතිනු ඇත (පහත සඳහන් දෑ බලන්න).
- විෂයමාලාව ලේඛනගත කිරීම, අධීක්ෂණය සහ තක්සේරු කිරීම අවසන් කළ යුතු ය. සුදුසු අවස්ථාවල දී, හොඳම පරිචය බෙදාගැනීමේ මාර්ගයක් ලෙස සහ විවිධ ආයතනවල සිදු කෙරෙන කාර්යයන් පිළිබඳව අධ්‍යාපනික ප්‍රජාව දැනුවත් කිරීමේ මාර්ගයක් ලෙස සිද්ධි අධ්‍යයන සංවර්ධනය සහ ලේඛනගත කිරීම සම්පූර්ණ කළ යුතු ය.
- අනුවර්තනය වීමේ ප්‍රමාණය පරිශීලකයන්, කණ්ඩායම්/සංගම් හෝ ආයතනවලට අදාළ වන පරිදි ඉහත සඳහන් කළ විචල්‍යයන් බොහොමයක් මත රඳා පවතී.

සමෝධානය කිරීමේ උපායමාර්ග

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව සමෝධානය කිරීම සඳහා පහත සඳහන් උපායමාර්ග සලකා බැලීම සඳහා ඉදිරිපත් කෙරේ:

- ස්වාධීන පාඨමාලාව: මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාව ශාස්ත්‍රීය අගය (credits) සඳහා ස්වාධීන පාඨමාලාවක් ලෙස ඉදිරිපත් කළ හැකි ය. එය විවිධ ශිෂ්‍යයන් හෝ ශික්ෂකයන් සඳහා අනිවාර්ය හෝ විකල්ප පාඨමාලාවක් ලෙස ඉදිරිපත් කළ හැකි ය. සේවාස්ථ ශික්ෂකයන් සඳහා, විෂයමාලාව කුසලතා ඉහළ නැංවීම සඳහා වන සහතික පත්‍ර වැඩසටහනක් ලෙස සකස් කළ හැකි ය.
- ආයතන ප්‍රවේශය: මෙයට සති එකක හෝ දෙකක, පුද්ගලාභිමුඛ පුහුණු අත්දැකීමක් ඇතුළත් වන අතර, ශික්ෂකයන්ට සම්පූර්ණ කිරීමට මාස 2-3ක ව්‍යාපෘති පැවරුමක් ඇතුළත් වේ. මෙම පුහුණු වැඩසටහන සඳහා ද ශාස්ත්‍රීය අගයන් පිරිනැමිය හැකි ය.
- බහු සංරචක සමෝධනය කිරීම: ශිෂ්‍යයන් හෝ ශික්ෂකයන් සඳහා දැනටමත් පිරිනමනු ලබන විවිධ ආශ්‍රිත පාඨමාලාවලට මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂය මාලාවේ විවිධ සංරචක සමෝධානය කළ හැකි ය. උදාහරණ: අධ්‍යාපන තාක්ෂණය, සාක්ෂරතාව, සමාජ අධ්‍යයනය, සිවිල් අධ්‍යාපනය. මෙහි යෝජනා කර ඇති උපාය මාර්ග අතරින් සමහර විට මෙම කාර්යය වඩාත් සංකීර්ණ විය හැකි ය. මෙහි යෝජනා කර ඇති උපායමාර්ග අතරින් මෙය වඩාත් සංකීර්ණ වූ උපායමාර්ගය විය හැකි ය. මෙම සමෝධානය ඵලදායී වීමට නම්, සමස්ත වැඩසටහන් ඉලක්ක සහ ඇගයුම් සැලකිල්ලට ගනිමින් කල්පනාකාරීව සැලසුම් කිරීම අවශ්‍ය වේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අවශ්‍ය අවධානය යොමු කිරීම මෙම ප්‍රවේශය සමග නැති විය හැකි බව සිහි තබා ගන්න.
- මාර්ගගත පාඨමාලාව: විවිධ පරිශීලකයන් සඳහා පාඨමාලාව මාර්ගගතව ඉදිරිපත් කළ හැකි ය. අදාළ රට තුළ හෝ ඉන් පිටත වෙනත් ආයතනයක් සමග හවුල්කාරිත්වය මෙයට ඇතුළත් විය හැකි ය. පරිශීලකයන්, කණ්ඩායම්/සංගම් හෝ ආයතනවලට තමන්ගේම මාර්ගගත පාඨමාලාවක් පිහිටුවීමට සිදු නොවන නමුත් මාර්ගගත පාඨමාලා පිරිනැමීම සඳහා පහසුකම් ඇති වෙනත් ආයතනයක් සමග හවුල් විය හැකි බව සැලකිල්ලට ගැනීම වැදගත් ය. ආයතනයට සහතික පත්‍ර, ඩිප්ලෝමාවක් හෝ උපාධි වැඩසටහනක් ලෙස එම පාඨමාලාව පිරිනැමීම සලකා බැලිය හැකි ය. යුනෙස්කෝ සංවිධානය සහ අපගේ හවුල්කරුවන් විසින් පිරිනමනු ලබන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා MOOC (Massive Open Online Courses) හි දක්වා ඇති උදාහරණ මෙම සබැඳියෙන් බලන්න: https://en.unesco.org/themes/media-and-information-literacy/moocs.

දීර්ඝ කාලීනව, මෙම උපායමාර්ග දෙකක හෝ වැඩි ගණනක සංයෝගයක් පිළිබඳව ද සළකා බැලිය හැකි ය. සංකලිත ප්‍රවේශයකින් වැඩි බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇත. පැහැදිලිවම, එය නිර්වචනය කරනු ලබන සාධක ගණනාවක් මත පදනම්ව භාවිත කරන අනුවර්තන ක්‍රියාවලිය සහ සමෝධානය කිරීමේ උපායමාර්ග පරිශීලකයන්, කණ්ඩායම්/සංගම් හෝ ආයතන අතර වෙනස් වේ. උදාහරණ ලෙස එයට සූදානමේ මට්ටම, දැනුම, සම්පත් සහ ප්‍රවීණත්වය ලබා ගැනීමට සහ සමෝධානයේ ප්‍රමාණය සහ විෂය පථය දැක්විය හැකි ය.

යුනෙස්කෝ සංවිධානයෙහි නව විවෘත අධ්‍යාපනික සම්පත් හරහා මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලා යෝග්‍ය කර ගැනීම සහ බෙදාගැනීම: මාර්ගගත බහුමාධ්‍ය MIL ඉගෙනුම් සම්පත් මෙවලම් වේදිකාව

යුනෙස්කෝ විවෘත අධ්‍යාපනික සම්පත් (https://iite.unesco.org/theme/oer/) මගින් තෝරාගත් යුනෙස්කෝ ප්‍රකාශන, පූර්ණ බලපත්‍රලාභී විවෘත අධ්‍යාපනික සම්පත් (OERs) ලෙසින් පිරිනැමේ. විවෘත අධ්‍යාපනික සම්පත් යනු ක්‍රියේටිව් කොමන්ස්ෆ වැනි බුද්ධිමය දේපළ බලපත්‍රයක් යටතේ නිකුත් කර ඇති ඉගෙනුම් ද්‍රව්‍ය වන අතර එමගින් ඒවා අන් අයට නොමිලේ භාවිතා කිරීමට ඉඩ සලසා ඇත. මෙම සබැඳිය ද බලන්න: http://www.oerplatform.org/. ඔබගේ කලාපවල වෙනත් විවෘත අධ්‍යාපනික සම්පත් වේදිකා සහ විවෘත දත්ත සමුදායන් ද තිබිය හැකි ය.

යුනෙස්කෝ සංවිධානය සහ එහි දීමේ හවුල්කරුවන්, විවෘත අධ්‍යාපනික සම්පත් හරහා මෙහෙයවන මාර්ගගත බහුමාධ්‍ය MIL ඉගෙනුම් සම්පත් මෙවලම් වේදිකාවක් යාවත්කාලීන කරනු ඇත, http://unesco.mil-for-teachers.unaoc.org/ (අවශ්‍ය පරිදි මෙම සම්පත් වෙත යාවත්කාලීන සබැඳියක් සඳහා යුනෙස්කෝ වෙබ් අඩවියට පිවිසෙන්න) ශික්ෂකයන්, ශිෂ්‍යයන් සහ විවිධ ක්‍රියාකාරීන් ඇතුළු වෘත්තියේ නියැලෙන ගෝලීය ප්‍රජාවන්ට මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාව ඇතුළු ඉහත සම්පත් නිදහසේ පිටපත් කිරීමට, යෝග්‍ය කර ගැනීමට සහ බෙදා ගැනීමට මින් හැකි වනු ඇත.

මෙහිදී ඔවුන් විසින් යෝග්‍ය කර ගන්නා ලද මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාව පූර්ණ බලපත්‍රලාභී විවෘත අධ්‍යාපනික සම්පත් ලෙස බෙදා ගැනීමට පරිශීලකයන් සහ ආයතන පෙළඹවීමෙන් සහ ඔවුනට සහාය වීමෙන්, ඔවුන්ගේම විෂයමාලාව සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන වෙනත් පරිශීලකයන්, විෂයමාලා සම්පාදකයන් හෝ ගුණාත්මකබව තහවුරු කරන තක්සේරුකරුවන්, ඔවුන්ගේම භාෂාවෙන් ඔවුනට ආසන්න හෝ ජාත්‍යන්තර ආයතනවල විෂයමාලා සංසන්දනය කිරීමෙන් පහසුවෙන් සහ බුද්ධිමත්ව තෝරා ගැනීමට අසමසම අවස්ථාවක් අපි ලබා දෙන්නෙමු. එවිට ඔවුන්ට ඔවුන්ගේ දේශීය අවශ්‍යතාවලට යෝග්‍ය කර ගැනීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවලට සමීපතම අන්තර්ගතය පහසුවෙන්, නීත්‍යානුකූලව සහ නිදහසේ පිටපතී කිරීමට හැකි වේ.

මෙම වේදිකාව මගින් සමාන ආයතන අතර සහයෝගීතාව සහ හවුල්කාරිත්ව අවස්ථා දිරිමත් කෙරෙනු ඇති අතර මාධ්‍ය තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ අනාගත වැඩිදියුණු කිරීම් සඳහා එහි පරිශීලකයන් සහ ආයතන යුනෙස්කෝ සංවිධානය හා දැඩිව සම්බන්ධ කරයි. තවද, ක්‍රියේටිව් කොමන්ස්* බලපත්‍රය සම්බන්ධයෙන් ධාරිතා ගොඩනැගීමට සහාය වීම සහ විවෘත අධ්‍යාපනික සම්පත් හරහා එම තොරතුරු ඔවුන්ගේ අනුහුරු බෙදා ගැනීමට කැමති ආයතන වෙත පරිවර්තනය කිරීම සහ හුවමාරු කිරීම සඳහා උපකාර කිරීම සිදුවේ.

*ක්‍රියේටිව් කොමන්ස් බලපත්‍ර සාම්ප්‍රදායික ප්‍රකාශන හිමිකම් පිළිවෙත් මත ගොඩනගා ඇති අතර තමා වෙත රඳවා ගනු ලබන්නේ කුමන අයිතිවාසිකම්ද සහ ප්‍රතිග්‍රාහකයන්ගේ හෝ වෙනත් නිර්මාණකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා තමන් අත්හරිනු ලබන්නේ කුමන අයිතිවාසිකම්ද යන්න තීරණය කිරීමට නිර්මාණකරුවන් හට ඉඩ සලසයි. (http://creativecommons.org)

1වන මොඩියුලය

පදනම් මොඩියුලය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ අනෙකුත් ප්‍රමුඛ සංකල්ප පිළිබඳ හැඳින්වීමක්



'අධ්‍යාපනයේ මෙහෙවර පොදුවේ අර්ථ දැක්විය හැකි නම්, එහි මූලික අරමුණ වන්නේ සිසුන්ට පොදු, ප්‍රජා සහ ආර්ථික ජීවිතයට පූර්ණ ලෙස සහභාගී වීමට ඉඩ සලසන්නා වූ ආකාරවලින් ඉගෙනීමකින් ඔවුන් ප්‍රතිලාභ ලබා ගැනුම සහතික කිරීම බව කිව හැකි ය.'

- නව ලන්ඩන් කණ්ඩායම

පසුබිම සහ තාර්කිකය

ප්‍රවෘත්ති මාධ්‍ය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICTs) අතර සිදුවන අන්තර්ඡේදනය (intersection) සහ අන්තර්ගතය හා පද්ධතිවල සහගාමී අභිසාරිතාව යන්නෙන් අදහස් වන්නේ මිනිසුන් වැඩි වශයෙන් මාධ්‍යකරණයට ලක් වූ ලෝකයක ජීවත් වන බව ය. මෙය, පුද්ගලයාගෙන් පුද්ගලයාට සිදු වන සන්නිවේදනය සහ අන්තර්ගත සම්ප්‍රේෂණය තාක්ෂණික වේදිකා හරහා වැඩි වශයෙන් සිදු වන ලෝකයකි. මිනිසුන් සවිබල ගැන්වීමෙහි ලා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) අත්‍යවශ්‍ය බවට පත් කරමින්, මෙකී යථාර්ථය මගින් අභියෝග මෙන්ම බොහෝ අවස්ථා ද ගෙන එනු ලැබේ. අවස්ථාවන් අතරට තොරතුරු වෙත වැඩි වශයෙන් ප්‍රවේශය සහ ස්වයං ප්‍රකාශනය, යාවජීව ඉගෙනුම, සහභාගිත්වය, නිර්මාණශීලිත්වය, සංවාදය, සංස්කෘතික හුවමාරුව හා විනිවිදභාවය සඳහා වැඩි ඉඩ ප්‍රස්ථා ඇතුළත් වන අතර, ඒ සියල්ල එක්ව ගත් කල තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමෙහි ලා දායකත්වය සපයයි. අභියෝගයන් අතරට පෞද්ගලිකත්ව හා දත්ත උල්ලංඝනය සම්බන්ධ ප්‍රවේදිතා, ඉහළ යන සාවද්‍ය තොරතුරු, ආවේක්ෂණය, ඉහළ යන මාර්ගගත වෛර ප්‍රකාශ හා අවිචාර් අන්තවාදී අන්තර්ගත, කාන්තාවන්ට නිරන්තරයෙන් කරනු ලබන විවේචන, සහ ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් තවදුරටත් බැහැර කිරීම ඇතුළත් වේ.

කොවිඩ් 19 වසංගතයේ ආගමනය තොරතුරු ප්‍රවාහයේ, ඩිජිටල් තාක්ෂණයෙහි, මධ්‍යගාමී ආයතනික සපයන්නන්ගේ සහ මාධ්‍ය සංවර්ධනයෙහි පරිවර්තනයන් පෙන්නුම් කරයි. එක් අතකින්, සමස්ත පරිසරවිද්‍යාව තුළ පවතින වෛරස්වලට අභියෝග කිරීමේ බොහෝ අපේක්ෂාවන් සහ ප්‍රයත්න පවතී. එසේ වුවත් නිරන්තරයෙන් සාවද්‍ය තොරතුරුවලින් තොරතුරුවල අගය හීන කරන - සහ ඩිජිටල් සන්නිවේදන මඟින් ක්‍රියාත්මක කෙරෙන, ආකුලකාරී අන්තර්ගත මිශ්‍රණයක් වන 'දුස්තොරතුරු වසංගතය' (disinfodemic) මඟින් ද එකී ප්‍රයත්නයන්ට බාධා එල්ල වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යනු වර්තමාන තොරතුරු සහ සන්නිවේදන පරිසරය නැමති කුණාටු සහිත සාගරයේ යාත්‍රා කිරීමට පුද්ගලයන් සහ කණ්ඩායම්වලට හැකියාව ලබා දෙන විවිධ නිපුණතාවලින් පරිග්‍රහණීය ආවරණපදයකි. එය දැනුම, කුසලතා, ආකල්ප සහ වටිනාකම්හි විශාල පරාසයක් ආවරණය කරයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මඟින් තරුණයන් ඇතුළු පුරවැසියන්ට ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා අවබෝධ කර ගැනීමට, වඩා හොඳින් ගවේෂණය කිරීමට, සෙවීමට, විචාරශීලීව ඇගයීමට, භාවිත කිරීමට සහ තොරතුරු සහ මාධ්‍ය අන්තර්ගතය කෙරෙහි නැණවත් ආකාරයෙන් දායකවීමට නිපුණතා අත් කර ගැනීමට හැකියාව ලබා දේ. එමඟින්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විසින් ඩිජිටල් තාක්ෂණයේ අරමුණුවත් සහ නිර්මාණශීලි භාවිතයට මං සැලසෙන අතර තොරතුරු වෙත ප්‍රවේශය සහ භාවිතය සම්බන්ධයෙන් පවතින සදාචාරාත්මක කරුණු මෙන්ම පරිශීලකයන්ගේ මාර්ගගත හා ඩිජිටල් අයිතීන් පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම මඟින් ඔවුන්ව බල ගන්වනු ලැබේ. වඩා ඵලදායී අයුරින් සංවාදයේ නියැලීම, අදහස් ප්‍රකාශනයේ නිදහස, තොරතුරු වෙත ප්‍රවේශය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව, විවිධත්වය, සාමය සහ තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුරවැසියන් සන්නද්ධ කෙරේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යනු අන්තර්ගත සපයන්නන්ගේ බලය හමුවේ පුරවැසියන්ගේ බලය තුලනය කිරීම සඳහා ද, අධ්‍යාපනය වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යොදා ගැනීම සඳහා ද, තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ අදහස් ප්‍රකාශනයේ නිදහස සඳහා සාධාරණ ප්‍රවේශයක් අභිවර්ධනය කිරීම සඳහා ද වැදගත් පූර්ව අවශ්‍යතාවකි. මිනිසුන්ට ජීවිතයේ සෑම අදියරක්ම පුරා ඵලදායී අයුරින් සහභාගි වීමට සහ සාර්ථක වීමට හැකි වනු පිණිස, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සමාජයේ සෑම තරාතිරමකම සහ විධිමත්, නොවිධිමත් සහ අවිධිමත් අධ්‍යාපනය තුළ සමෝධානය කිරීම නොපමාව කළ යුත්තකි.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ (ITU World Telecommunication)/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක දත්ත සමුදායෙහි (ICT Indicators Database), 2019 වර්ෂයට අදාළ මෑත කාලීන සංඛ්‍යාලේඛන අනුව, බිලියන 4.9ක ජනතාවක් නියෝජනය කරන ලොව බිලියන 1.7ක කුටුම්භවලින් බිලියන 1.3 (3/4)කට රූපවාහිනියක් සතු වේ; සහ බිලියන 1.9ක ජනතාවක් නියෝජනය කරන සියලුම කුටුම්භවලින් බිලියන 0.6 (1/3)කට පරිගණකයකට ප්‍රවේශ වීමේ පහසුකම ඇත; 2021 ජනවාරි වන විට, ලෝක ජනගහනයෙන් සියයට

59.6ක් නැතහොත් බිලියන 4.66ක ජනතාවක් අන්තර්ජාලය භාවිතා කරති[30]; 2020 මැද භාගයේ දී, නිවැසියන් 100කට ජංගම-දුරකතන ජාලයකට දායකත්වයන් (subscriptions) 105ක් වූ බවට ඇස්තමේන්තුගතව පැවතුණි. මීට අමතරව බිලියන 2.5කට අධික රේඩියෝ ග්‍රාහක සංඛ්‍යාවක් ඇත. 2018 වර්ෂය තුළ සෑම දිනක දී ම ලොව පුරා මිලියන 640ක පරිශීලකයන් මුද්‍රිත සහ ඩිජිටල් පුවත් සඳහා ගෙවීම් කර ඇති බව ලෝක පුවත්පත් සංගමය (World Association of Newspapers) වාර්තා කරයි. සංඛ්‍යාලේඛන පිළිබඳ යුනෙස්කෝ ආයතනය (UNESCO Institute of Statistics) ඇස්තමේන්තු කරනුයේ වාර්ෂිකව ලොව පුරා නව පොත් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කෙරෙන බව යි. 2019 වර්ෂය අග භාගයේ දී, ලෝක තරුණ ජනගහනයෙන් සියයට 69කට වැඩි ප්‍රමාණයක් විසින් (වයස අවුරුදු 15 - 24) අන්තර්ජාලය භාවිත කරන ලදි. 2020 වර්ෂයේ පළ වූ යුනිසෙෆ් - ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (UNICEF-ITU) ඒකාබද්ධ වාර්තාවකට අනුව, බිලියන 1.1කට - නැතහොත් ළමුන් හෝ වයස අවුරුදු 25 හෝ ඊට අඩු තරුණයන් තිදෙනෙකුගෙන් එක් අයෙකුට - නිවසේ අන්තර්ජාලයට ප්‍රවේශවීමේ පහසුකම පැවතුණි. 2015 සහ 2019 අතර, කෘතිම බුද්ධිය යොදා ගනු ලබන ව්‍යාපාර සංඛ්‍යාව වසර හතරක් තුළ 270% කින් වර්ධනය විය (Gartner, 2019).

රූපවාහිනි සහ ගුවන්විදුලි මධ්‍යස්ථාන ප්‍රමාණය, පුවත්පත්, ජංගම දුරකථන, අන්තර්ජාලය වෙත ප්‍රවේශය සහ භාවිතය, පොත්පත්, පුස්තකාල, ප්‍රචාරණ පුවරු සහ වීඩියෝ ක්‍රීඩා යන සියල්ල එක්ව ගත් කළ ඒවා අප විසින්, අප ගැන, අපේ රට, අපේ සංස්කෘතීන් සහ අප ලොව ගැන ඉගෙන ගන්නා දෙයින් වැඩිමනත් දෑ තීරණය කරයි. මෙම සම්බන්ධිත ලෝකය තුළ, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් යුතු වීම යන්නෙන් අදහස් වනුයේ පුරවැසිභාවය සහ යාවජීව ඉගෙනීම යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද යන්න පිළිබඳ නැවත සිතා බැලීම සහ ගෝලීය පුරවැසි අධ්‍යාපනය, තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය සහ ඩිජිටල් පුරවැසිභාවය වැනි සංකල්ප පිළිබඳ සලකා බැලීමට හැකි ය යන්නයි.

පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන් ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවක් සඳහා වේදිකාවක් මෙන්ම ඩිජිටල් නිර්මාණශීලිත්වය සහ ව්‍යවසායකත්වය සක්‍රීය කරන්නන් වශයෙන් තිරසර සංවර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය සඳහා කේන්ද්‍රීය වේ. ප්‍රජාතන්ත්‍රවාදය සහ තිරසර සංවර්ධනය සඳහා අන්තර්ගත සපයන්නන් සහ ඩිජිටල් මෙවලම් අනුබල දෙන්නේ නම්, පුරවැසියන් විසින් ඒවා විචාරශීලීව භාවිත කරන්නේ කෙසේ ද යන්න තේරුම් ගැනීම, ඔවුන්ට ලැබෙන, නිර්මාණය කරන සහ බෙදා ගන්නා සන්දේශවල අර්ථය පහදන්නේ කෙසේ ද යන්න දැන සිටීම අවශ්‍ය කෙරේ. ඒ හා සමානව, පරිසර පද්ධති ඩිජිටල් නිර්මාණශීලිත්වය සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම කළ යුතු නම්, ඉහත සඳහන් කළ නිපුණතාවලට අමතරව, මිනිසුන් විසින් සාමාජීය පරිවර්තනයක් උදෙසා මෙම ක්ෂේත්‍රය තුළ පවතින ව්‍යවසායකත්වය සඳහා වන අවස්ථා හඳුනා ගන්නේ කෙසේ ද යන්න තේරුම් ගැනීම, සහ විචාරශීලී චින්තනය, නිර්මාණශීලිත්වය සහ සහයෝගිතාව යන සාධකවල අන්තර්ඡේදනය මගින් හට ගන්නා ප්‍රතිලාභ අත්කර ගැනීම සිදු කළ යුතු ය.

30. Statista, https://www.statista.com/statistics/617136/digital-population-world- wide/.

සංඛ්‍යා හැකියාව සහ සාක්ෂරතා කුසලතාවන්හි වැදගත්කම අවතක්සේරු කළ නොහැකි විටක දී විෂයමාලා සහ සංවර්ධන වැඩසටහන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඇතුළත් කිරීමෙන් අදහස් වන්නේ තරුණ ප්‍රජාව අන්තර්ගත සපයන්නන්ගේ කාර්යයන් අවබෝධ කර ගත යුතු අතර පුද්ගලික, සමාජීය, වෘත්තීය සහ අධ්‍යාපනික අරමුණු ළඟා කර ගැනීම සඳහා අන්තර්ගතය පරීක්ෂා කිරීමට, ඇගයීමට, භාවිත කිරීමට සහ නිර්මාණය කිරීමට කුසලතාවලින් සමන්විත විය යුතු බව යි. විචාරශීලී චින්තනය, ස්වයං ප්‍රකාශනය සඳහා ඒවා විශ්ලේෂණය කිරීම සහ භාවිත කිරීම, ස්වාධීන අභ්‍යාසලාභීන්, සම්පාදකයන්, අවබෝධිත පුරවැසියන්, වෘත්තිකයන් සහ ඔවුන්ගේ සමාජයන්හි පාලන ක්‍රමය සහ ප්‍රජාතන්ත්‍රවාදී හා ආර්ථික ක්‍රියාවලීන්හි සහභාගිවන්නන් බවට පත්වීම සඳහා වන මූලික කුසලතාවලින් ද ඔවුන් සමන්විත විය යුතු ය. (2005 වර්ෂයේ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ජාතික සංසදයේ [National Forum on Information Literacy] වාර්තාව සමග සංසන්දනය කරන්න).

මෙම මොඩියුලය කුළුණු හතරක් මත ගොඩ නැගේ: එනම්, විචාරශීලී චින්තනය, ස්වයං ප්‍රකාශනය, සහභාගිත්වය සහ නිර්මාණශීලිත්වය යනුවෙනි. අධ්‍යයන ක්ෂේත්‍රයන්/ විෂයන්හි මිශ්‍රණයකට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, අදාළ වන අතර ඒවා සමග අතිච්ඡාදනය වන බව සලකා බැලීමත්, පහත දැක්වෙන ආකාරයේ ප්‍රශ්න පිළිබඳ විපරම් කිරීමත් එමගින් සිදු වනු ඇත:

පුළුල් අන්තර්ගත මිශ්‍රණයක් තුළ තොරතුරු යනු කුමක් ද? මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් යනු මොනවා ද? ඩිජිටල් තාක්ෂණවිධි යනු මොනවා ද? මේ සියල්ල පිළිබඳ ඉගැන්විය යුත්තේ ඇයි? ඒවා වැදගත් වන්නේ ඇයි? මාධ්‍ය සාක්ෂරතාව යනු කුමක්ද? තොරතුරු සාක්ෂරතාව යනු කුමක් ද? ඩිජිටල් සාක්ෂරතාව යනු කුමක් ද? මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව අවශ්‍ය වන්නේ ඇයි?

මෙම මොඩියුලය මගින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හුදෙක් අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස නොව ඉගෙනුම්/ ඉගැන්වීම් සහ සමාජීය හා ආර්ථික ක්‍රියාවලි ලෙස ඉදිරිපත් කෙරේ. එබැවින්, අභ්‍යාසලාභීන්ට 'යමක් සම්බන්ධව ඉගැන්වීම් සහ 'යමක් අනුසාරයෙන් ඉගැන්වීම් අතර වෙනස පිළිබඳ අවබෝධ කර ගැනීමට, සහ මෙවලමක් වශයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිතව සමාජය තුළ නියැලීමට අවස්ථාව සලසමින්, අනෙකුත් මොඩියුලවල වඩාත් විස්තරාත්මකව සාකච්ඡා කෙරෙන ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටලු සහ සංකල්ප පිළිබඳව අභ්‍යාසලාභීන්ට පුළුල්ව හඳුන්වාදීම එමගින් සිදු කෙරේ.

මෙහි අරමුණ වන්නේ ශික්ෂකයන්, ශිෂ්‍යයන්, ප්‍රජා නායකයන් සහ සමපදස්ථ ශික්ෂකයන් තමන් විසින්ම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඇති අය බවට පත් වීම සහ සෑම මට්ටමකම සහ සියලු ආකාරයේ අධ්‍යාපනය සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සමෝධානය කිරීම සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය කර ගැනීමයි.

ඒකක

1වන ඒකකය
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව අවබෝධ කර ගැනීම: දිශානතියක්

2වන ඒකකය
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ පුරවැසි සහභාගිත්වය

3වන ඒකකය
පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන් සමග අන්තර්ක්‍රියා කිරීම

4වන ඒකකය
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා, ඩිජිටල් කුසලතා, සංස්කෘතික සහභාගිත්වය/නිර්මාණශීලිත්වය සහ ව්‍යවසායකත්වය

5වන ඒකකය
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, ඉගැන්වීම සහ යාවජීව ඉගෙනුම

1වන මොඩියුලය
1වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව අවබෝධ කර ගැනීම: දිශානතියක්

කාලසීමාව: පැය 2යි

ප්‍රධාන මාතෘකා

- 'තොරතුරු' සහ 'මාධ්‍ය' අතර සමානතා හා වෙනස්කම් අර්ථ දැක්වීම.
- අන්තර්ගත සපයන්නන්ගේ වැදගත්කම විමසුම.
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි ප්‍රධාන ඉගෙනුම් ඵල විස්තර කිරීම.

ඉගෙනුම් අරමුණු

මෙම මොඩියුලය අවසානයේ දී, ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- ප්‍රධාන ඉගෙනුම් ඵල/මූලිකාංග හඳුනා ගැනීම, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි සහ ඩිජිටල් කුසලතාවන්හි අභිසාරිතාව හඳුනා ගැනීම.
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, සහ වත්මන් ශිෂ්‍යයන්ගේ හා ශික්ෂකයන්ගේ ජීවිතවලට එහි වැදගත්කම හා අදාළත්වය අවබෝධ කර ගැනීම.
- පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන්ගේ ප්‍රතිමානක භූමිකා හඳුනාගැනීම හා ගවේෂණය කිරීම.
- විවිධාකාර පෙළ/පාඨ (texts) මගින් විද්‍යමානව (හෝ අවිද්‍යමානව) ඇති ආකාරයට මෙම භූමිකා විමසුම.

මෙම ඒකකයෙන් ඉලක්කගත නිපුණතා මට්ටම:

- මූලික / අන්තර්මධ්‍ය

මාධ්‍යයේ බහුවිධ භූමිකා

මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ අනෙකුත් අන්තර්ගත සපයන්නන් විසින් තොරතුරු සහ සන්නිවේදන ක්‍රියාවලියෙහි ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ස්වකීය කාර්යභාරය තවත් බොහෝ පුළුල් වුවද, ඔවුන් තොරතුරු සන්නිවේදනය කිරීමේ එක් මාර්ගයකි. එම මාධ්‍ය සෑම සමාජයකම සන්නිවේදන පද්ධතියෙහි වැදගත් කොටසක් වන්නේ යම්තාක් දුරටද ඒ හා සමානවම, ඒවායේ ආයතනික සැකැස්ම බොහෝ විට පුස්තකාල, කෞතුකාගාර, ලේඛනාගාර, අන්තර්ජාල සන්නිවේදන සමාගම් සහ තමන්ගේම අන්තර්ගතය සම්පාදනය කරනු ලබන අනෙකුත් තොරතුරු සංවිධාන හා පුරවැසියන් වැනි අනේකවිධ මාධ්‍ය-නොවන අන්තර්ගත සපයන්නන් හා සහසම්බන්ධිත වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ මෙම විෂයමාලාවෙහි අරමුණ සඳහා, ප්‍රවෘත්ති මාධ්‍ය යන්න සංස්කාරක වගවීම යම් නිශ්චිත සංවිධානයකට හෝ නෛතික පුද්ගලයෙකුට ආරෝපණය කරන්නා වූ ජනමාධ්‍ය වටිනාකම් මගින් නිර්ණය කරනු ලබන සංස්කාරක ක්‍රියාවලියක් හරහා නිර්මාණය කරන ලද විශ්වසනීය සහ වර්තමාන තොරතුරු මූලාශ්‍ර ලෙස ප්‍රතිමානකව (ස්වභාවය හා භාවිත කරන තාක්ෂණය නොසලකා) නිර්වචනය කර ඇත.

මාධ්‍ය හා අනෙකුත් අන්තර්ගත සපයන්නන් ඔවුන්ගේ ප්‍රතිමානක (normative) භූමිකාවන්ට අනුව කටයුතු කරන්නේ ද යන්න තක්සේරු කළ හැකි ය. ඔවුන්ගෙන් පහත සඳහන් දෑ බලාපොරොත්තු වේ.

- පුරවැසියන් එකිනෙකා සමඟ සන්නිවේදනය කරන්නා වූ සහ අවබෝධිත තීරණ ගන්නා වූ තොරතුරු හා දැනුම් නාලිකා ලෙස කටයුතු කිරීම.
- විවිධ සමාජ ක්‍රියාකාරීන් අතර අවබෝධිත විවාද සඳහා පහසුකම් සැලසීම.
- අපගේ ආසන්න අත්දැකීමෙන් ඔබ්බෙහි වූ ලෝකය පිළිබඳ අප ඉගෙන ගන්නා දෙයින් බහුතරය අපට ලබා දීම සහ සමාජයක් විසින් තමන් ගැන ඉගෙන ගන්නා හා ප්‍රජා හැඟීමක් ඇතිකර ගන්නා මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම.
- සෑම ආකාරයකින්ම ආණ්ඩුවේ අධීක්ෂකයෙකු (watch dog) ලෙස කටයුතු කිරීම, සහ දූෂණය, අයථා පරිපාලනය සහ ආයතනික වැරදි ක්‍රියාවන් හෙළිදරව් කිරීම මගින් පොදු ජීවිතයේ විනිවිදභාවය සහ බලයේ සිටින අය සම්බන්ධව පොදු සන්නිරීක්ෂණය (public scrutiny) ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් තුළ අත්‍යවශ්‍ය පහසුකම් සලසන්නන් වීම සහ නිදහස් හා සාධාරණ මැතිවරණ සහතික කරන්නෙකු වීම.
- ජාතීන් තුළ සහ ජාතීන් අතර සංස්කෘතික ප්‍රකාශනය සහ සංස්කෘතික ඒකාබද්ධතාව සඳහා වූ මාධ්‍යකයක් වීම.
- බහුත්වවාදී සාරධර්මවලට ගරු කරමින් ස්වාධීනව පෙනී සිටින නියෝජිතයෙකු මෙන්ම සමාජ ක්‍රියාකරුවෙකු ලෙස විනිවිදභාවයෙන් කටයුතු කිරීම[31].

අභිසාරිතාව

අන්තර්ගතය පරිහරණය, භාවිතය, නිර්මාණය සහ බෙදාගැනීම පිළිබඳ විචාර කුසලතා වර්ධනය කර ගැනීමට ශිෂ්‍යයන් සහ පුරවැසියන් සවිබල ගැන්වීම සඳහා එකම සමස්ත ඉගෙනුම් අරමුණක් ඇති අදාළ ක්ෂේත්‍ර එකට ගෙන එමින් යුනෙස්කෝ සහ විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් විසින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව නම් වූ ආවරණ සංකල්පය නිර්මාණය කර ඇත.

තොරතුරු මතු දැක්වෙන ආකාරයට කාණ්ඩගත කළ හැකි ය. ප්‍රාථමික මූලාශ්‍ර - උදා: පර්යේෂණ වාර්තා සහ නිබන්ධන; ද්විතීයික මූලාශ්‍ර - උදා: පොත්, සඟරා, පුවත්පත්; සහ ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රවලින් ලබාගත් තෘතීයික මූලාශ්‍ර - උදා: දත්ත සමුදායන්, සුරක්ෂිතාගාර (repositories) සහ ග්‍රන්ථ නාමාවලි ආදිය. එක් අතකින්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) මගින් සාමාන්‍යයෙන් සමපදස්ථ විමර්ශනයට (peer-review) හා දීර්ඝ සංස්කරණ ක්‍රියාවලීන්ට (විද්‍යුත් හෝ මුද්‍රිත ප්‍රකාශන) භාජනය වන පඨිත ප්‍රතිදානය (textual output) කෙරෙහි අවධානය යොමු කෙරේ. උපුටා දැක්වීම්, යොමු කිරීම් සහ ග්‍රන්ථ නාමාවලිය ලබා ගත හැකි මෙය බුද්ධිමය දේපළකි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව රූපවාහිනිය, සමාජ ජාල සහ චිත්‍රපට නිෂ්පාදන සමාගම් වැනි විවිධ අන්තර්ගත සපයන්නන් විසින් ලබා දෙන සන්දේශයන්හි අනුරූප, වර්ණ සහ ශබ්දයේ සියුම් බව සලකන ජනමාධ්‍ය සම්බන්ධයෙන් ද අදාළ වේ. ආයතන සෑම විටම ප්‍රතිමානක අපේක්ෂාවන්ට අනුව කටයුතු නොකළ ද, දැනුම් දීම, දැනුවත් කිරීම සහ විනෝදාස්වාදය ලබා දීම යන කරුණු සඳහා මාධ්‍ය පුළුල් වශයෙන් කටයුතු කළ යුතු ය. අන්තර්ගතයේ සම්බන්ධය හා අභිසාරිතාව, ගැටලු, ක්‍රමවේද, මෙවලම්, සහ තොරතුරුවල, මාධ්‍යයෙහි හා තාක්ෂණයෙහි සංරචක දැක්වෙන පහත වගුව (1.1) බලන්න.

31. UNESCO MDIs ඇසුරෙන් සකස් කරන ලදි.

1.1 වගුව මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා අභිසාරිතාව: සම්ප්‍රදායික මතයන්හි සිට නූතන මත දක්වා*

තොරතුරු (සාක්ෂරතාව)		ජනමාධ්‍ය / ඩිජිටල් නාක්ෂණ - මාධ්‍ය/ ඩිජිටල් (සාක්ෂරතාව)
පොත් රචනා සඟරා ප්‍රකාශන මාලාවන් පේටන්ට් ව්‍යාපාර අධ්‍යයන/පර්යේෂණ සොයා ගැනීම්	**අන්තර්ගත ආකෘති** අභිසාරිතාව	ප්‍රවෘත්ති පුවත්පත් රූපවාහිනී ගුවන්විදුලිය දර්ශන සමාජ ජාල පොප් සංස්කෘතික නිෂ්පාදන
විමර්ශනාත්මක පර්යේෂණ සමපදස්ථ විමර්ශිත (peer-reviewed) දීර්ඝ සංස්කරණ ක්‍රියාවලිය සංස්කාරක කර්මාන්ත වලංගුකරණය උපුටා දැක්වීම් තීරණාත්මකය	**අන්තර්ගත වලංගුකරණය** අභිසාරිතාව	ඇතැම් විමර්ශනාත්මක පර්යේෂණ. කර්මාන්ත වලංගුකරණය මන්දගාමී සංස්කරණ ක්‍රියාවලිය මාධ්‍ය ස්වභාවය අනුව ඇතැම් විට ක්ෂණික (impromptu) සකස් කිරීම පරිශීලක ප්‍රතිපෝෂණ/පිළිගත් ඇගයීම
කණ්ඩායම් - බොහෝ සැලකිලිමත් කියවීමේ කුසලතා අවශ්‍ය වේ. ඌන අවබෝධිත - වැඩි සංජානනයක් අවශ්‍යය.	**සංජානිත (perceived) ග්‍රාහක පිරිස** අභිසාරිතාව	බහුතර වශයෙන් පොදු සංහතික ග්‍රාහක පිරිස් (general mass audience) සහ නිතර ඉලක්කගත කණ්ඩායම්. ශ්‍රව්‍ය දෘශ්‍ය පණිවිඩ, කියවීමේ සහ දෘශ්‍ය මාධ්‍ය අවබෝධ කර ගැනීමේ කුසලතා. නාද බණ්ඩ (sound bite) හෝ නාට්‍යමය දර්ශන.
පරිශීලකයා විසින් සෙවීම සමුද්ධරණ - ඇගයීම් කුසලතා අවශ්‍ය වේ. ICT පිළිබඳ අපැහැදිලි සිමාවන්	**සංජානිත ප්‍රවේශය** අභිසාරිතාව	මාධ්‍ය පරිශීලකයා ලුහුබඳියි/ඉලක්ක කරයි. මාධ්‍ය සන්දේශ තෝරා බේරා ගැනීමට /ප්‍රතික්ෂේප කිරීමට සහ විශ්ලේෂණය කිරීමට ඇති කුසලතා. නිර්මාණ / සම්පාදන කුසලතා ද අවශ්‍ය වේ.
අධ්‍යාපනික භාවිතය /ව්‍යාපාර දිගු කාලීන තීරණ ගැනීම	**භාවිතය සඳහා සංජානිත ප්‍රධාන අරමුණ** අභිසාරිතාව	විනෝදාස්වාදය සහ අධ්‍යාපනය කෙරෙහි අවධානය. දෛනික හා දිගු කාලීන තීරණ ගැනීම.
අත්‍යවශ්‍යයෙන් මුද්‍රිත ලේඛන. සාමාන්‍යයෙන් අධ්‍යයන පරමාර්ථයෙන් සකස් කෙරේ.	**සංජානිත සෞන්දර්යය ආකෘති** අභිසාරිතාව	බොහෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය කර්මාන්ත/රජය විසින් නිෂ්පාදිත, විශාල හා කුඩා සමාගම් - ප්‍රධාන ධාරාව හා විකල්ප
පුස්තකාල. තොරතුරු-එකතු (info-collection) භාවිතය පිළිබඳ සැලකිලි (concerns) ශික්ෂකයන්. ගුණාත්මක තොරතුරු සඳහා වූ සැලකිලි	**සංජානිත කුසලතා ප්‍රවර්ධකයන්** අභිසාරිතාව	ජනමාධ්‍ය විශේෂඥයන්, සත්‍යයට එරෙහිව පක්ෂග්‍රාහී බව කෙරෙහි මාධ්‍ය නිෂ්පාදන සැලකිලිමත් බව, සෞන්දර්යය හා නිර්මාණ සැලසුම පිළිබඳ අවධානය

*Lau, J. and Grizzle, A, (2019). Evolution and History of Media and Information Literacy ඇසුරෙන් සකස් කරන ලදි.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව (1 කොටස) තුළ මින් ඉහත දී සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකි ය. 1 කොටසෙහි ලැයිස්තුව අධ්‍යයනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ සහ ශික්ෂකයන් සඳහා වන නිපුණතා රාමුවේ (1 කොටස) 1වන රූප සටහනෙහි විස්තර කර ඇති මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ ලක්ෂණ පිළිබඳ සලකා බලන්න. එක් එක් ලක්ෂණ සාකච්ඡා කරන්න. ඔබට අනුව මෙම එක් එක් කරුණු මගින් අදහස් කරන දේ ලියන්න. මෙම විස්තරය පරිපූර්ණ යැයි ඔබ සිතනවා ද? ඇතුළත් කළ යුතු යැයි ඔබ සිතන්නේ කුමක් ද?

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළ විවිධ දැනුම් හා සම්බන්ධව පවතින සහ ලොව පුරා විවිධ ක්‍රියාකාරීන් විසින් භාවිත කරනු ලබන පහත සඳහන් පාරිභාෂික පද පිළිබඳව අවධානය යොමු කරන්න.

- මාධ්‍ය සාක්ෂරතාව
- පුස්තකාල සාක්ෂරතාව
- පරිගණක සාක්ෂරතාව
- ප්‍රකාශනයේ නිදහස පිළිබඳ සාක්ෂරතාව
- අන්තර්ජාල සාක්ෂරතාව
- ඩිජිටල් සාක්ෂරතාව
- ප්‍රවෘත්ති සාක්ෂරතාව
- සිනමා සාක්ෂරතාව
- ක්‍රීඩා සාක්ෂරතාව
- සමාජ මාධ්‍ය සාක්ෂරතාව
- කෘත්‍රිම බුද්ධිය පිළිබඳ සාක්ෂරතාව
- දත්ත සාක්ෂරතාව
- සුරක්ෂිතබව පිළිබඳ සාක්ෂරතාව
- ආරක්ෂාව පිළිබඳ සාක්ෂරතාව
- පෞද්ගලිකත්ව සාක්ෂරතාව

අන්තර්ජාලය හෝ පුස්තකාලයක් භාවිත කරමින්, මෙම එක් එක් පාරිභාෂික පද සම්බන්ධ විවිධ නිර්වචන සෙවීමට පර්යේෂණය කරන්න. මෙම තනි පාරිභාෂික පද හෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සංකල්ප එකිනෙක අතර හෝ කිහිපයක් අතර සම්බන්ධතාව පිළිබඳ ඔබගේ නිරීක්ෂණය කුමක් ද? මාධ්‍ය සාක්ෂරතාව සහ තොරතුරු සාක්ෂරතාව, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වශයෙන් ඒකාබද්ධ කිරීමෙහි ලා ඔබගේ තාර්කිකය කුමක් වන්නේ ද යන්න විස්තර කෙරෙන එක් ඡේදයක් ලියන්න.

තොරතුරු මූලාශ්‍රයකරණය

විවිධ අන්තර්ගත සපයන්නන් විසින් අන්තර්ගතය සමග සපයන තොරතුරු නිසි ලෙස භාවිතය රඳා පවතිනුයේ ස්වකීය තොරතුරු අවශ්‍යතා තේරුම් ගැනීමට සහ තමන්ට ප්‍රවේශ විය හැකි අන්තර්ගතයේ ගුණාත්මකභාවය පිළිබඳ නිශ්චයනය කර ගැනීමට, සොයා ගැනීමට සහ ඇගයීමට මිනිසුන් සතු හැකියාවන් මතය. වර්තමානය වන විට, නිරවද්‍යතාව, විශ්වසනීයත්වය සහ වටිනාකම අනුව බෙහෙවින් වෙනස් වන අතිශය පුළුල් සහ අනේකවිධ අන්තර්ගත දක්නට ලැබේ. මීට අමතරව, මෙම තොරතුරු විවිධ ආකාරවලින් (පාඨ, අනුරූප හෝ සංඛ්‍යාලේඛන, ඉලෙක්ට්‍රොනික හෝ මුද්‍රිත ආකාරයෙන්) එනම්, මාර්ගගත සුරක්ෂිතාගාර සහ ද්වාර (portal), අතථ්‍ය සහ තථ්‍ය පුස්තකාල, වාර්තාමය සංග්‍රහ, දත්ත සමුදායන්, ලේඛනාගාර, කෞතුකාගාර යනාදිය මගින් එකී තොරතුරු ලබා ගත හැකි ය. කෙසේ වෙතත්, වඩාත්ම වැදගත් සාධකය වන්නේ අන්තර්ගතයේ ගුණාත්මකභාවය සැලකිය යුතු ලෙස වෙනස් විය හැකි බවයි.

අන්තර්ගතය සහ එහි මූලාශ්‍ර ඇගයීමට ලක් කිරීමට පෙර, උදාහරණ ලෙස විනෝදාස්වාදය සඳහා කරනු ලබන භාවිතයට සමගාමීව, අප තොරතුරු භාවිත කරන්නේ කුමක් සඳහා ද යන්න ගැන සිතා බැලීම වැදගත් වේ. මෙමගින් විශ්වසනීය තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීමට උපකාර වනු ඇත. මෙහි දී පහත සඳහන් දැ ප්‍රධාන ප්‍රශ්න විය හැකි ය: මෙම විශේෂිත අවස්ථාවෙහි තොරතුරු සැපයීම සඳහා වඩාත්ම විශ්වාසදායක වන්නේ කුමන මූලාශ්‍රය ද නොඑසේ නම් කුමන මූලාශ්‍ර වර්ගය ද? බොහෝ දුරට බලාපොරොත්තු විය හැකි පරිදි සත්‍යාපන ක්‍රම භාවිත කරනුයේ, සාධාරණ වනුයේ, සැඟවුණු චේතනා නොමැත්තේ, තත්ත්ව පාලනය පෙන්නුම් කරනුයේ සහ ප්‍රතිශෝධනය සහ වරද නිවැරදි කිරීම සඳහා විවෘත වනුයේ කවර මූලාශ්‍ර ද?

පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි විවිධ මිශ්‍රිත අන්තර්ගත සපයන්නන් තුළ තොරතුරු රඳවා ඇති බව අපට සිතිය හැකි ය. මෙම අන්තර්ගත සපයන්නන්ට පහත දැ ඇතුළත්ව භූමිකා රාශියක් ඇත.

- දැනුම් දීම
- අධ්‍යාපනය ලබා දීම
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලි සඳහා පහසුකම් සැලසීම
- සියලු ආකාරයේ තොරතුරු වෙත ප්‍රවේශය ලබා දීම (ඇතැම් විට නොමිලේ, බහුල වශයෙන්, විශ්වසනීය සහ සීමාවන් නොමැතිව)
- තොරතුරු ද්වාරයක් වශයෙන් කටයුතු කිරීම
- ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු ලබා ගැනීමේ නිදහස වැනි විශ්වීය වටිනාකම් සහ සිවිල් අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම
- සමාජයේ සාමූහික ස්මෘතිය වශයෙන් කටයුතු කිරීම
- තොරතුරු රැස් කිරීම
- සංස්කෘතික උරුමයන් සුරැකීම
- විනෝදාස්වාදය ලබා දීම

ඒ අතරම, මෙම සපයන්නන් විසින් ඇතැම් විට මුදල් ඉපැයීමේ මාර්ග ලෙස, දේශපාලන මෙවලමක් ලෙස, සංස්කෘතික අධිපතිත්වයක් ලෙස වෙනත් අතික්‍රමණ භූමිකාවන් ඉටු කරනු ලබයි.

ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව (1 කොටස) තුළ කලින් සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකි ය. 1 කොටසෙහි ලැයිස්තුව අධ්‍යයනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

- විවිධ වර්ගයේ අන්තර්ගත සපයන්නන් අතර පවතින අන්තර්ගත වෙනස්කම් සොයන්න. උදාහරණයක් වශයෙන් වෙළෙඳ ප්‍රචාරණය හෝ විනෝදාස්වාදය සපයනවාට වඩා තොරතුරු සපයන්නේ කුමකින් ද; වැරදි තොරතුරු හෝ ද්වේශ සහගත කථනය සඳහා අනුබල ලබා දෙන්නේ කුමකින් ද ආදී වශයෙන් කල්පනා කළ යුතු ය. අන්තර්ගත වර්ග ද හඳුනා ගන්න නිදසුනක් ලෙස, ඒකවිෂයක (monographic) හා මාලික ආකෘති (serial formats) සහ ඒවා එකිනෙකට වෙනස් වන ආකාරය පිළිබඳ අවබෝධ කර ගන්න. සුදුසු පරිදි එක් එක් ප්‍රකාශන වර්ග අතර වෙනස කුමක්ද යන්න පැහැදිලි කිරීම ශිෂ්‍යයන් විසින් සිදු කළ හැකි ය. එමෙන්ම, එක් එක් වර්ගයේ ප්‍රකාශන සඳහා උදාහරණ දෙකක් නම් කිරීම ද කළ හැකි ය.
- පුස්තකාල ග්‍රන්ථ නාමාවලි (catalogues) යනු ගුණාත්මක තොරතුරු මූලාශ්‍රයකි. මූලික සංලේඛ (entries) එනම් කර්තෘ, මාතෘකාව සහ විෂය පිළිබඳව හුරුපුරුදු වන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. මාතෘකාවක් තෝරා ගෙන ඒ සම්බන්ධයෙන් ඔවුන්ට සොයා ගත හැකි තොරතුරු සහ මාධ්‍ය එක් එක් වර්ගය සඳහා මූලාශ්‍ර දෙකක් සොයන ලෙස ඔවුන්ට පවසන්න.
- ඉහත ලැයිස්තුගත කර ඇති කාර්යයන් සඳහා උදාහරණ වශයෙන් ගත හැකි සම්පත් හෝ මාධ්‍ය පෙළ (text) සොයා ගැනීමට මාධ්‍ය සමීක්ෂණය සිදු කරන්න. දේශීය, ජාතික සහ ගෝලීය මට්ටමින් මෙම භූමිකාවන් නිරූපණය කරන පෙළ හඳුනා ගන්න.
- පුස්තකාල ග්‍රනථ නාමාවලින්හි ලක්ෂණ සසඳන්න. එමගින් ඔබට අඩු කාලයකින් හා කැපකිරීමකින් ඔබ සොයන තොරතුරු සොයා ගැනීමට ඒවා භාවිත කළ හැකි ය. අ) ඔබට හුරුපුරුදු පුස්තකාල ග්‍රන්ථ නාමාවලි සඳහන් කර තවත් හතරක් සොයන්න, විශ්වවිද්‍යාල ආයතනවලින් නම් වඩාත් සුදුසු වේ. ආ) පරිශීලනය කළ ග්‍රන්ථ නාමාවලි අතරින් වඩාත්ම සුදුසු යැයි ඔබ සලකන නාමාවලිවලින් ඔබ කැමති මාතෘකාවක් පිළිබඳ සෙවීමක් කරන්න. ඇ) වඩාත්ම සුදුසු යැයි ඔබ සලකන නාමාවලින්හි ඔබ සොයාගත් පොත් හෝ වෙනත් කරුණු පිළිබඳ යොමු පහක් ලැයිස්තුගත කරන්න. ඒවා වඩාත්ම සුදුසු යැයි ඔබ සිතන්නේ කුමක් නිසාද යන්න ප්‍රත්‍යවේක්ෂණය කරමින් ඊට තර්ක ගෙනහැර දක්වන්න.

- තිරසර සංවර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදය, ලෝකයේ වෙනත් භූගෝලීය ප්‍රදේශ, විවිධ සංස්කෘතීන්, සමාජීය සහ ආර්ථික ජීවිතය, හෝ ඔබ උනන්දුවක් දක්වන වෙනත් ගැටලු පිළිබඳ තොරතුරු සපයන පොත් හෝ වෙනත් සම්පත් සොයා ගැනීමට විද්‍යාල/විශ්වවිද්‍යාල පුස්තකාල හෝ මහජන පුස්තකාල සමීක්ෂණයට ලක් කරන්න. පුස්තකාල සඳහා වෙන් කළ යුතු සම්පත් මට්ටම තීරණය කරන්නේ කවුරුන් ද? පුස්තකාලයට ඇතුළත් කළ යුතු සහ පුස්තකාලයෙන් බැහැර කළ යුතු පොත් මොනවා ද යන්න තීරණය කරන්නේ කවුරුන් ද? අනෙක්වාට වඩා වැදගත් පොත් මොනවාද යන්න තීරණය කරන්නේ කවුරුන් ද ? අයවැය සහ ප්‍රකාශන හිමිකම යන දේ භූමිකාව සඳහා බලපාන්නේ කෙසේ ද? පුස්තකාල විසින් ඒවායේ අරමුණු ඉටු කරනු ලබන්නේ ද? (කෞතුකාගාර හෝ ලේඛනාගාර සඳහා සමාන ක්‍රියාකාරකම් සංවිධානය කළ හැකි ය).
- මාධ්‍ය විසින් ජාතියක සංවර්ධනය හා ගොඩනැගීම දිරිමත් කරනු ලබන නමුත් අනන්‍ය ජාතිකවාදය (exclusivist nationalism) පෝෂණය කළ හැකි ය. මාධ්‍යය මෙම කටයුතු සිදු කරන්නේ කෙසේ ද සහ ඇයි යන්න සාකච්ඡා කරන්න. ඔබේ රටේ මාධ්‍යයේ අන්තර්ගතය පිළිබඳ සිතන්න. සංවර්ධනය, ජාතිය ගොඩනැගීම සහ ජාතික අභිලාෂ පිළිබඳව ඔබට විවිධ දෘෂ්ටිකෝණ කොපමණ ප්‍රමාණයක් සොයාගත හැකි ද සහ ඒ කුමන පර්යාලෝකයකට අනුව ද?
- යුද්ධය, ගැටුම් ආදිය හේතුවෙන් පුස්තකාල, කෞතුකාගාර හෝ ලේඛනාගාර හෝ ඇතැම් පොත් සිතාමතා විනාශ කිරීම සම්බන්ධ කථා වෙබ් භාවිතයෙන් සොයන්න. යම් කථාවක් සත්‍ය බවට ඔබට තහවුරු කර ගත හැක්කේ කෙසේ ද? මෙය පළමු ඒකකය වන බැවින්, මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අවැසි කුසලතා ශික්ෂකයන් විසින් ලබා දී නොතිබිය හැකි ය. එබැවින්, මෙය ඉදිරි නිපුණතාවක් වශයෙන් තබාගෙන අනෙකුත් ප්‍රශ්න වෙත යොමු විය යුතු ය. මාධ්‍ය, පුස්තකාල, ලේඛනාගාර සහ ඩිජිටල් සන්නිවේදන සහ අනෙකුත් සම්පත් විනාශ කිරීම මිනිසුන්ට, ඔවුන්ගේ ඉතිහාසයට හෝ සංස්කෘතියට බලපාන්නේ කෙසේ ද?
- පොදු පරිමණ්ඩල (public domain) තොරතුරු යනු මොනවා ද? ඔබේ රටේ රාජ්‍ය ආයතන දෙකක් විසින් පොදු පරිමණ්ඩල තොරතුරු සලකනු ලබන ආකාරය පර්යේෂණ කරන්න. මෙම ආයතන විසින් සපයනු ලබන තොරතුරුවල ප්‍රමාණවත් බව පිළිබඳ විවාද කරන්න. තොරතුරු ප්‍රසිද්ධියට පත් කළ යුතු ආකාරය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති තිබේ ද? ඔබේ රට තුළ තොරතුරු වෙත ප්‍රවේශවීමේ නීති තිබේ ද? මේවා භාවිත කරනු ලබන්නේ ද? විනිවිදභාවය සඳහා පුරවැසි හිමිකම් මොනවා ද?
- ඉහත යෝජිත ක්‍රියාකාරකමෙන් සපයා ඇති පිළිතුරු මත පදනම්ව, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා වූ ඵල දක්වන්න (මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුද්ගලයෙකු විසින් කළ හැකි දේ කුමක් ද යන්න).
- වර්තමානයේ ශිෂ්‍යයන්ගේ සහ ශික්ෂකයන්ගේ දෛනික ජීවිතයේ පවතින මාධ්‍ය ලැයිස්තුවක් සාදන්න. මෙම සෑම මාධ්‍යයක්ම විසින් ඉටු කරනු ලබන ප්‍රධාන භූමිකාවන් සහ කාර්යයන් මොනවා ද? මෙම අන්තර්ගත සපයන්නන් භාවිත කිරීමේදී 'සාක්ෂර' යන්නෙන් අදහස් කරන්නේ යැයි ඔබ සිතන්නේ කුමක් ද? අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප මොනවා ද?
- පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන් සමග ඔබේ අන්තර්ක්‍රියාව හා ඔබ විසින් ඒවා දෛනික භාවිතය වාර්තා කිරීමට එක් දිනක් සඳහා සඟරාවක් තබා ගන්න. ඔබගේ පුද්ගලික භාවිතයේ දී දැකිය හැකි රටාවන් මොනවා ද? අන්තර්ජාලය, රූපවාහිනිය හෝ ගුවන්විදුලිය, ක්‍රීඩා උපාංග වැනි වේදිකාවල ඔබ කොපමණ පැය ගණනක් ගත කරනවා ද? මෙම අන්තර්ගත සපයන්නන් ඔබේ ජීවිතය තුළ ඉටු කරන භූමිකා මොනවා ද?
- ඔබේ පාසලේ හෝ අවට ප්‍රදේශයේ පයින් ගමන් කරන්න. මෙම වටපිටාවන්හි සිටින අන්තර්ගත සපයන්නන් සඳහා උදාහරණ ලැයිස්තුගත කරන්න. මෙම උදාහරණ මගින් නිරූපණය කෙරෙන ඉහත ලැයිස්තුගත කර ඇති භූමිකා මොනවා ද?
- දිනෙක ඔබ අවදි වන විට තවදුරටත් මාධ්‍ය, පුස්තකාල හෝ අන්තර්ජාල හා ජංගම දුරකථන සේවා සපයන ආයතන කිසිවක් නොමැති බව සිතන්න. ඊට අමතරව පුවත්පත්, සඟරා, ගුවන්විදුලි මාධ්‍යස්ථාන සහ රූපවාහිනී නාලිකා සියල්ල ද අතුරුදහන් වී ඇතැයි සිතන්න. පුරවැසියන්ට කුමක් සිදුවේ ද යන්න කුඩා කණ්ඩායම් වශයෙන් විශ්ලේෂණය කරන්න.

- දැන් ඔවුන්ව දැනුවත් කරන්නේ කෙසේ ද ?
- ඔවුන් කරුණු සහ සිදුවීම් පිළිබඳ තතු සන්නිවේදනය කරන්නේ කෙසේ ද?
- ඔබ සාමාන්‍යයෙන් ගන්නා තීරණවලට කුමක් සිදුවේ ද?
- එවැනි අවස්ථාවක දී ඔබට පෞද්ගලිකව වැඩිපුරම මග හැරෙන්නේ කුමක් ද?
- මෙවැනි ගැටලුවකින් සමාජයට අහිමි විය හැක්කේ කුමක් ද?

- අන්තර්ගත සපයන්නන් ස්වකීය ප්‍රතිමානක භූමිකාව අනුව කටයුතු කරන්නේ නම්, ප්‍රජාතාන්ත්‍රික සමාජයක ඔවුන්ගේ වටිනාකම පිළිබඳ ඔබේ නිගමන සහිතව "කර්තෘට ලිපියක්" ලියන්න.

පුරවැසියන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි වැදගත්කම

පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය හා අන්තර්ජාල සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන්ගේ වැදගත්කම පිළිබඳව පහත අරමුණු සඳහා ජනතාවට අවබෝධයක් ලබා දීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් සැලකිල්ල යොමු කෙරේ:

- තොරතුරු සහ අනෙකුත් අන්තර්ගත වෙන්කොට හඳුනා ගැනීම සහ අන්තර්ගත සපයන්නන් පිළිබඳ තක්සේරු කිරීම
- අවබෝධිත තීරණ ගැනීම
- පර්යේෂණ මගින් තොරතුරු සත්‍යාපනය පිළිබඳ ඉගෙනුම
- ආඛ්‍යානයන්ට ගරු කරමින්, බෙදාගත් කරුණු සහ අයිතීන් මත පදනම්ව ප්‍රජා හැඟීමක් ගොඩනගා ගැනීම
- ප්‍රජාතන්ත්‍රවාදයට සහ තිරසර සංවර්ධනයට හිතකර මහජන කතිකාවක් පවත්වා ගැනීම
- තොරතුරු සහ අනෙකුත් අන්තර්ගතයන්හි ජීවන චක්‍රයට විචාරශීලීව සහභාගි වීම
- යාවජීව ඉගෙනුමෙහි නිරත වීම

තවද, තොරතුරුවල සක්‍රීය සම්පාදකයන් බවට පත් වීමට සහ මාධ්‍ය හා තොරතුරු නිෂ්පාදනවල නවෝත්පාදකයන් බවට පත්වීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් පුරවැසියන්ව උනන්දු කළ යුතු ය. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් ස්වයං අවබෝධය, නිර්මාණශීලිත්වය සහ තම රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ගෝලීය තොරතුරු ජාලයේ වැඩි සහභාගිත්වය සඳහා නව සහ සම්ප්‍රදායික මාධ්‍ය භාවිත කිරීමට ඔවුන්ව පෙළඹවිය යුතු ය.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්.
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, විලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකා
- ගවේෂණාත්මක කථාව /වාර්තා

2වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, සිවිල් සහභාගිත්වය සහ තොරතුරු දැනගැනීමේ අයිතිය

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන්ගේ කාර්ය
- පුරවැසියන් අන්තර්ගත සපයන්නන්ගෙන් අපේක්ෂා කළ යුත්තේ කුමක් ද?
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය සඳහා එහි වැදගත්කම
- අදහස් ප්‍රකාශනයේ නිදහස, තොරතුරු දැනගැනීමේ අයිතිය, මාධ්‍යය තුළ සංස්කාරක ස්වාධීනත්වය, අන්තර්ගත සපයන්නන්ගේ බහුත්වය සහ විවිධත්වය.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කළ පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- තොරතුරු සහ දත්ත සඳහා ඇති අයිතිය හෝ තොරතුරු සහ දැනුම වෙත ප්‍රවේශය, ප්‍රකාශනයේ නිදහස, ස්වයං ප්‍රකාශනය සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලි සඳහා සහභාගීවීම යනාදියට සහසම්බන්ධිත වන්නා වූ, අන්තර්ගත සපයන්නන්ගේ ප්‍රතිමානක කාර්ය (normative functions) අවබෝධ කර ගැනීම සහ විස්තර කිරීම, සහ
- එම කාර්ය ඉටු කිරීමට විවිධ අන්තර්ගත සපයන්නන්ට අවශ්‍ය කොන්දේසි හඳුනා ගැනීම.

පුවත්පත් කලාවේ ප්‍රතිමානක භූමිකාව

පුවත්පත් කලාව සහ මාධ්‍ය මූලාශ්‍ර සෑම සමාජයකම වැදගත් වේ. ජනමාධ්‍යවේදීන් සහ ප්‍රවෘත්ති මාධ්‍ය නොමැති වූ විට, ලෝකය වෙත පිවිසුමක් (window on the world) නොමැත. අපගේ ක්ෂණික අත්දැකීමෙන් ඔබ්බට අපගේ ප්‍රජාවන් තුළ හෝ ලෝකයේ සිදුවන්නේ කුමක් ද යන්න දැන ගැනීමට අපට මගක් නොමැති තරම් වනු ඇත. ප්‍රවෘත්තිකරණ භාවිතාවන් මගින් ගරු කළ යුතු සහ ජනමාධ්‍යවේදීන්ගෙන් පුරවැසියන් අපේක්ෂා කිරීමට යොමු වන ප්‍රමුඛ සාධක කිහිපයක් පවතී.

- දැනුම සංවිධානය කිරීම ව්‍යාකුල තොරතුරු සංවිධිත කිරීම හා තේරුම් ගත හැකි මට්ටමට සකස් කිරීම සහ විශේෂ අභිලාෂ අනාවරණය කර ගැනීම සඳහා මහජන සම්බන්ධතා සහ නිල තනතුරු නොසලකා කටයුතු කිරීම.
- සත්‍යවාදී බව මාධ්‍ය තුළ තොරතුරු මූලාශ්‍ර පැහැදිලිව සඳහන් කළ යුතු ය. එවිට අදාළත්වය, විශ්වසනීයත්වය සහ විභවීය පක්ෂග්‍රාහීත්වය පුරවැසියන්ට විනිශ්චය කළ හැකි වේ. මතභේදයක් පවතී නම් පසු විපරමක් සිදු කිරීමේ අපේක්ෂාවෙන් පිළිතුරු නොදුන් වැදගත් ප්‍රශ්න සටහන් කළ යුතු ය.
- මහජන සුබසිද්ධිය පොදු කටයුතුවලට සහභාගී වීමට අවශ්‍ය තොරතුරු පුරවැසියන්ට ලබා දෙමින් ජනමාධ්‍යවේදීන්ට මහජන සුබසිද්ධිය වෙනුවෙන් බොහෝ දේ සිදු කළ හැකි ය.
- ස්වාධීනත්වය පුරවැසි කථිකාවතෙහි මහජන සුබසිද්ධිය යන්න පෞද්ගලික පක්ෂග්‍රාහීත්වයෙන් ඔබ්බට යා යුතු බව පැහැදිලි විය යුතු ය; විස්තර විචාරකයන් 'කාසියේ දෙපැත්තම්' පරීක්ෂා කළ යුතු ය (ඔවුන් එකඟ වන හා එකඟ නොවන දෙඅංශයම සාකච්ඡා කළ යුතු ය); ජනමාධ්‍යවේදීන් ස්වකීය කාර්යයේ දී ස්වාධීන චින්තනයක් ප්‍රකට කළ යුතු ය.

- මහජන විවේචන සහ ගැටලු නිරාකරණය සඳහා සංසදය ප්‍රවෘත්ති මාධ්‍ය විසින් මහජන අන්තර්ක්‍රියා සඳහා නාලිකා කිහිපයක් ඉදිරිපත් කළ යුතු ය (ලිපි, ඊමේල්, දුරකථන සම්බන්ධතා හෝ මහජන සංසද). තමන්ගේම භාෂාවෙන් තම සහෝදර පුරවැසියන් සමග සංවාද පැවැත්වීම සඳහා අවකාශය හා ගුවන් කාලය වෙත ප්‍රවේශය මාධ්‍ය විසින් තමන්ට ලබා දෙනු ඇතැයි ද පුරවැසියෝ අපේක්ෂා කරති. තවද, ප්‍රවෘත්ති ආවරණය තුළ මත හා වටිනාකම්වල පුළුල් නියෝජනයක් විද්‍යමාන වනු ඇතැයි ඔවුහු අපේක්ෂා කරති.
- වගවීම රජයන් පමණක් නොව වැදගත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන යනාදී බලය ක්‍රියාත්මක කරනු ලබන සියලු දෙනා මාධ්‍ය විසින් අධීක්ෂණය කළ යුතු ය. බලවතුන්ව වගවීමට ලක් කරමින් මාධ්‍ය මගින් ප්‍රජා චින්තනයට අත්‍යවශ්‍ය ගුණයක් ගෙන දිය හැකි ය. ජනමාධ්‍යවේදීන් හා ඔවුන්ගේ ප්‍රතිපත්ති වගවීමට ලක් කළ හැකි ක්‍රම ද මාධ්‍ය සතුව තිබිය යුතු ය.
- සමානුපාතික සහ අදාළ පුවත් වැදගත් ගැටලු සහ ප්‍රවණතා පිළිබඳ කාලෝචිත දැනුමක් පුරවැසියන්ට අවශ්‍ය වේ. වාර්තා මගින් තර්ජන සහ අවදානම්වල සැබෑ ස්වභාවය අධිතක්සේරු කිරීම හෝ අවතක්සේරු කිරීම නොකළ යුතු ය.
- පෞද්ගලිකත්වය සහ දැනගැනීමේ අයිතිය තුලනය කිරීම දැන ගැනීම සඳහා මහජන අයිතිය සහ පෞද්ගලිකත්වය සඳහා පුද්ගල අයිතිය සමග තුලනය කිරීම පුරවැසියෝ මාධ්‍ය වෘත්තිකයන්ගෙන් අපේක්ෂා කරති. (cf. Fackson Banda, UNESCO, 2009).

තොරතුරු දැනගැනීමේ අයිතිය හෝ තොරතුරු වෙත ප්‍රවේශය

තොරතුරු දැනගැනීමේ අයිතිය, තොරතුරු දැනගැනීමේ නිදහස සහ තොරතුරු වෙත ප්‍රවේශ වීම බොහෝ විට භාවිත වන්නේ එකම අර්ථයකිනි. සමහර උගතුන් තර්ක කරන්නේ තොරතුරු වෙත ප්‍රවේශ වීම අනෙක් ද්විත්වයට වඩා සාමාන්‍යකරණය වූ සහ පුළුල් සංකල්පයක් බවයි. තොරතුරු දැනගැනීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදය සහ සංවර්ධනය යන කාරණා ද්විත්වයටම අත්‍යවශ්‍ය වේ. මූලික මානව හිමිකම් ලෙස භාෂණයේ නිදහස පිළිබඳ අයිතිය සහ පොදු තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය පුරවැසියන් සතුය. යුනෙස්කෝ සංවිධානය තොරතුරු නිදහස අර්ථ දක්වනුයේ, රාජ්‍ය ආයතන හෝ පොදු කාර්ය ඉටු කරන හෝ මහජන සුබසිද්ධිය සඳහා වූ කාර්ය ඉටු කරන පෞද්ගලික ආයතන සතු තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ලෙසය. පොදු පරිමණ්ඩල තොරතුරු යනු පුරවැසියන්ට සමව හිමි දේපළකි. පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන් සෑම පුරවැසියෙකුටම තොරතුරු දැනගැනීමේ නිදහස තහවුරු කිරීමට උපකාර කළ යුතු ය.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT), සමාජ මාධ්‍ය සහ කෘතිම බුද්ධිය වැනි ඩිජිටල් තාක්ෂණයන්හි සීඝ්‍ර ව්‍යාප්තිය සමඟ අන්තර්ගත සපයන්නන්ගේ භූමිකාව වෙනස් වෙමින් පවතී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් තොරතුරු සහ දැනුම සඳහා බොහෝවිට ක්ෂණික ප්‍රවේශය ලබා දෙයි. නිල වාර්තා තබා ගන්නා රාජ්‍ය අධිකාරීන්ව ඇතුළත්ව, අන්තර්ගත සපයන්නන්ට නව සේවා සැලසිය හැකි ය. යාවජීව ඉගෙනුම, පර්යේෂණ සහ විනෝදාස්වාදය සඳහා සහ ප්‍රජාවන් සම්බන්ධ කිරීම සඳහා පුරවැසියන්ගේ අවශ්‍යතා ඵලදායීව හා කාර්යක්ෂමව සපුරාලීම සඳහා මෙමගින් නව අවස්ථා උදා කරයි. මෙම සන්දර්භය තුළ, දත්ත වෙත ප්‍රවේශය සහ දත්ත තොරතුරු බවට සංවිධානය කරන ඇල්ගොරිතම වැදගත් ගැටලුවක් බවට පත්වෙමින් තිබේ.

අන්තර්ගත සපයන්නන්ට ප්‍රධාන කාර්ය කිහිපයක් ඇත. ඒවාට පහත සඳහන් දේ ඇතුළත් වේ;

- කවරහෝ වාර්ගික, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සහ ආගමික සීමාවන්ගෙන් තොරව තොරතුරු සම්පත් වෙත විවෘත ප්‍රවේශය ලබා දීම. මහජන පුස්තකාල මගින් විශේෂයෙන්ම නොමිලේ ප්‍රවේශය ලබා දේ.
- භෞතිකව හෝ මාර්ගගත ආකාරයෙන් පරිශීලනය කරන ලද අන්තර්ගත සම්බන්ධයෙන් පාඨකයන්ගේ පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම.
- වෘත්තීයභාවය මත පදනම්ව සහ දේශපාලන, ආගමික හෝ සදාචාරාත්මක පක්ෂග්‍රාහීත්වයෙන් තොරව බහුවිධ සහ බහුත්ව තොරතුරු සම්පත් වෙත ප්‍රවේශය සැපයීම.
- අනාගත පරම්පරාවන් සඳහා තොරතුරු රැස් කිරීම සහ සංරක්ෂණය කිරීම
- තොරතුරුවල අව්‍යාජත්වය, විශ්වසනීයතාව සහ සත්‍යබව සහතික කිරීමට දායක වීම

- තොරතුරු සහ දත්ත සඳහා වන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම
- තොරතුරු දැනගැනීමේ අයිතිය හෝ තොරතුරු වෙත ප්‍රවේශය සඳහා වූ ප්‍රතිපත්ති සමග මිනිසුන්ගේ නියැලීම වර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සහතික කිරීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව (1 කොටස) තුළ මින් ඉහත දී සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකි ය. 1 කොටසෙහි ලැයිස්තුව අධ්‍යයනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

- ස්වකීය පදිංචි රට තුළ තොරතුරු දැනගැනීමේ අයිතියක් තිබේද නැතහොත් තොරතුරු ප්‍රතිපත්ති සඳහා ජාතික ප්‍රවේශයක් තිබේද යන්න විමර්ශනය කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. සෞඛ්‍ය, අධ්‍යාපනය, කෘෂිකර්මය, මැතිවරණ, රාජ්‍ය අස්ථිත්ව, පෞද්ගලික අංශය සහ අනෙකුත් සංවර්ධන ප්‍රමුඛතා වැනි ගැටලුවලට නීතිය හෝ ප්‍රතිපත්ති මගින් කෙතරම් දුරට විසඳුම් ලබා දෙනවාද යන්න විමසා බැලීම සඳහා නීතිය හෝ ප්‍රතිපත්ති වෙත ප්‍රවේශ වීම ඔවුන්ට මග පෙන්වන්න. තොරතුරුවලට ප්‍රවේශ වීම පිළිබඳ නීතියක් රට තුළ නොමැති නම්, එවැනි නීති සහ ප්‍රතිපත්ති වෙනුවෙන් සාමකාමීව පෙනී සිටීමට කළ හැකි දේ පිළිබඳ සාකච්ඡාවක් සංවිධානය කරන්න. රටේ තොරතුරු සම්බන්ධයෙන් කටයුතු කරන අමාත්‍යාංශ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් පාලන අධිකාරිය හෝ රටෙහි අදාළ අස්ථිත්ව සමඟ සම්බන්ධ විය හැකි ආකාරය පිළිබඳ විමසුම හොඳ ආරම්භයක් වනු ඇත.
- ස්වකීය රටවල පවතින තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීති තුළ, තොරතුරු වෙත ප්‍රවේශයට සම්බන්ධිත නීති හෝ ප්‍රතිපත්ති පිළිබඳ මහජන අධ්‍යාපනයට අදාළ වන්නා වූ වගන්ති තිබේ දැයි ගවේෂණය කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. මෙම මහජන අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ද? තොරතුරු වෙත ප්‍රවේශය හා සම්බන්ධ නීති භාවිත කරන්නේ කෙසේ ද සහ මෙම නීති ස්වකීය දෛනික ජීවිතයට අදාළ වන්නේ කෙසේ ද යන්න පිළිබඳව මිනිසුන්ට වැඩිදුර අවබෝධයක් ලබා ගැනීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම එක් මාර්ග යක් වේ.
- ශිෂ්‍යයන් කණ්ඩායම් තුනේ සිට පහ දක්වා සංඛ්‍යාවකට බෙදන්න. ඔවුන්ට ප්‍රමුඛ වැදගත්කමක් සහිත තිරසර සංවර්ධන ඉලක්කවලින් (SDGs) එකක් තෝරා ගැනීමට මග පෙන්වන්න. ඉන්පසු ඔවුන්ට එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක දත්ත ගබඩාව, https://unstats.un.org/sdgs/metadata/ භාවිතයට හුරු වීමට උදවු කරන්න. මෙම ඉලක්ක පිළිබඳ වාර්තා කිරීම සඳහා වූ දර්ශක සහ රැස් කරනු ලබන දත්ත පිළිබඳ නිල ලැයිස්තුව වෙත මොහොතක් අවධානය යොමු කරන ලෙස ඔවුන්ට පවසන්න. තොරතුරු දැනගැනීමේ අයිතිය හෝ මෙම අයිතිවාසිකම නොමැති වීම තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම වේගවත් කිරීමට හෝ බාධා කිරීමට හේතු විය හැක්කේ මන්දැයි ඔවුන්ට සාකච්ඡා කිරීමට ඉඩ සලස්වා කෙටියෙන් කරුණු 510ක් ලිවීමට ඔවුන්ව යොමු කරවන්න. මෙම දර්ශක හරහා එකතු කරන දත්ත මගින් පෙන්නුම් කරන පරිදි තිරසර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය සෙවීමට, අවබෝධ කර ගැනීමට සහ අධීක්ෂණය කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පුරවැසියන්ට උපකාරී වන්නේ කෙසේ ද වැනි ප්‍රශ්නවලට ද ඔවුන් පිළිතුරු දිය යුතු ය. තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව තම සමපදස්ථයන් දැනුවත් කිරීම සඳහා පුද්ගලයන්, කණ්ඩායම් සහ ප්‍රජාවන් වශයෙන් ඔවුන්ට කුමක් කළ හැකි ද සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඔවුන්ගේ ප්‍රයත්නයන්ට උපකාර වන්නේ කෙසේ ද?
- යම් ලේඛන වෙත ප්‍රවේශය ඉල්ලීමට මෙම ක්‍රියාවලිය තුළ සාකච්ඡාවක් සංවිධානය කරන්න. මෙම ක්‍රියාවලිය ඕස්ට්‍රේලියාවේ සත්‍ය උදාහරණයකින් සාමාන්‍යකරණය කර ඇත[32]. 1) ඉල්ලීම ලිඛිතව සිදු කරන්න 2) ඉල්ලීම සිදු කරන්නේ තොරතුරු දැනගැනීමේ පනතේ කුමන විධිවිධානය යටතේ ද යන්න සඳහන් කරන්න 3) හැකිතාක් තොරතුරු ලබා දෙමින් සොයන ලේඛනය පිළිබඳව ඉතා පැහැදිලිව සඳහන් කරන්න, 4) සම්බන්ධ විය හැකි දුරකථන අංකයක් සහ/හෝ ඊමේල් ලිපිනයක්

32. ACT Government, Education https://www.education.act.gov.au/about-us/freedom_of_information. Accessed on 18 January 2021.

සපයන්න, 5) ඉල්ලීමට ප්‍රතිචාරය යොමු කළ හැකි තැපැල් ලිපිනයක් සපයන්න. සමහර රටවල් හෝ බලධාරීන් හට සම්පූර්ණ කර යොමු කළ යුතු මාර්ගගත පෝරමයක් තිබිය හැකි ය.

- අදාළ පුස්තකාල සහ අන්තර්ජාල සම්පත් භාවිත කරමින්, පසුගිය වසරේ ජාතික හෝ ගෝලීය මට්ටමේ පුවත් කථා 5ත් 10ත් අතර ප්‍රමාණයක් සොයාගන්න. ඉහත ලැයිස්තුගත කර ඇති අපේක්ෂාවන් සපුරාලනු ලබන්නේ එක් එක් කථා තුළ කුමන ඒවා මගින් දැයි හඳුනා ගන්න. මෙම කථා ඵලදායි උදාහරණ බවට පත් කරන ඒවායෙහි ඇති ප්‍රධාන අංග මොනවා ද? මෙම අපේක්ෂාවන් ඉටු නොකළ ඕනෑම කථාවක් වැඩිදියුණු කිරීම සඳහා කළ හැකි වෙනස්කම් යෝජනා කරන්න.
- ප්‍රවෘත්ති මගින් පවතින මතයන් සවිබල ගන්වනු ලබන බවට වන අපේක්ෂාවෙන් පමණක් නොව විවෘත මනසකින් ප්‍රවෘත්ති වෙත ප්‍රවේශ වීමට පාඨකයන්ට බැඳීමක් ඇති බවට තර්ක කරමින් කෙටි රචනාවක් ලියන්න.
- ප්‍රාදේශීය ගැටලුවක් හෝ කතාවක ප්‍රවෘත්ති ආවරණයක් තෝරා එය හොඳින් පරීක්ෂා කරන්න. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවෙන් යුක්ත වීමේ එක් කොටසක් වන්නේ විවිධ ගැටලුවලට ලැබෙන ආවරණය සඳහා ඉහත නිර්ණායක යෙදීමට ඇති දැනුවත්භාවය සහ හැකියාවයි. ප්‍රාදේශීය උදාහරණය තුළ පුරවැසියන්ගේ අපේක්ෂාවන් කොතෙක් දුරට ඉටු වූයේ ද? ආවරණය මගින් ප්‍රාදේශීය ප්‍රජාවට ඇති කළ හැකි විභවීය බලපෑම කුමක් ද? පුරවැසියන්ගේ අපේක්ෂාවන් ඉටු නොවූ විට ගැටලු විසඳීමට පුරවැසියන්ට තිබූ පිහිට කුමක් ද? පුරවැසියන්ට උපකාර කිරීමේදී මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවට ඉටු කළ හැකි කාර්යභාරය කුමක් ද?
- මනාව අවබෝධිත පුරවැසියා තීරණ ගැනීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සහභාගී වීමට වඩා හොඳින් සුදානම්වී සිටින බවට ඔබ එකඟ ද? එසේ එකඟ වන්නේ ඇයි? ඔබේ අදහස ප්‍රකාශ කරමින් කතුවැකියක් ලියන්න.
- සාකච්ඡා කරන්න: ඔබේ සමාජය තුළ තොරතුරුවල කාර්යභාරය දකින්නේ හා ඇගයීමට ලක් කරන්නේ කෙසේ ද? ඔබ සිතන පරිදි තොරතුරු හා දැනුම අතර සහ තොරතුරු හා බලය අතර සම්බන්ධය කුමක් ද?

ප්‍රකාශනයේ නිදහස, සංස්කාරක ස්වාධීනත්වය, බහුත්වය සහ විවිධත්වය

තොරතුරු සහ අදහස් ප්‍රකාශනයේ නිදහස මගින් මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව ශක්තිමත් කරයි. මෙම සන්දර්භය තුළ, තොරතුරු නිදහස යන යෙදුම මගින් පොදු තොරතුරු වෙත ප්‍රවේශය අදහස් කෙරේ. අප වටා ඇති ලෝකය පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා, එහි අර්ථාන්විත භූමිකාවන් සොයා ගැනීමට අප සතු හැකියාව සඳහා මෙන්ම අප හට ලබා ගැනීමට ඇති සම්පත්වලින් වාසි අත්කර ගැනීමට අප සතු ශක්‍යතාව සඳහා තොරතුරු ප්‍රමුඛ වේ. කිහිප දෙනෙකු අතරේ පමණක් තොරතුරු කේන්ද්‍ර ගත වූ විට, මහජනතාවට තීරණ ගැනීමේ සහ තීරණ තක්සේරු කිරීමේ හැකියාව බෙහෙවින් අඩු වේ. සදාචාරාත්මක සහ බහුවිධ මාධ්‍යයකට විනිවිදභාවය, වගවීම සහ නීතියේ ආධිපත්‍යය සහතික කළ හැකි ය (UNESCO Freedom of Expression Tool Kit). තමා සේවය කරන ප්‍රජාවන් වෙත වෘත්තීය වශයෙන් වාර්තාකරණයෙහි නියැලෙමින් ස්වාධීන මාධ්‍ය විසින් ආකර්ෂණය දිනා ගනු ලැබේ.

අදහස් ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍ය නිදහස

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යන්නට තර්ජනවලට හෝ දණ්ඩන ක්‍රියාවන්ට ලක් වීමේ බියෙන් තොරව මත හා අදහස් ප්‍රකාශ කිරීමේ සහ හුවමාරු කර ගැනීමේ නිදහස ඇතුළත් වේ. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මූලික මානව අයිතිවාසිකමකි. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මගින් භාෂණයේ නිදහස පමණක් නොව, භාවිත කරන මාධ්‍යය කුමක් වුව ද තොරතුරු හෝ අදහස් සෙවීමේ, ලබා ගැනීමේ හා බෙදා හැරීමේ ඕනෑම ක්‍රියාවක් ආරක්ෂා කරනු ලබයි. මාධ්‍ය නිදහස යන්න මෙම අයිතිය තුළ අත්‍යවශ්‍ය පදනමක් වන්නේ එමගින් නිදහස් අදහස් ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීමටත් බෙදාහදා ගැනීමට අවකාශය සලසන අතර එසේ කිරීමෙන් ප්‍රජාවන් සහ සිවිල් සමාජය ගොඩනැගීමට සහ ඒවාට සහාය දැක්වීමට අත්‍යවශ්‍ය වන්නක් වන බැවිනි. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මගින් සමාන්‍ය තනි පුද්ගලයන්ට විවිධ සිතුවිලි සහ අදහස් පරීක්ෂා කිරීමට සහ ප්‍රකාශ කිරීමට ඉඩ ලබා දීමෙන් සමාජය තුළ සැබෑ හිමිකාරිත්වය

පිළිබඳ හැඟීමක් ඔවුන් තුළ ප්‍රවර්ධනය කළ හැකි ය. ප්‍රකාශනයේ නිදහස සිවිල් සහභාගීත්වයේ අනිවාර්ය අංගයක් වන අතර විචාරශීලී චින්තනය සඳහා අත්‍යවශ්‍ය වේ. අදහස් ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමට අවසර දෙනු ලබන්නේ අන්‍යයන්ගේ නිදහස ආරක්ෂා කිරීම සහ එකී සීමාවන් අත්‍යවශ්‍ය හා සමානුපාතික වන අවස්ථා වැනි සීමිත හේතූන් මත පමණි. වෛරී ප්‍රකාශ වැළැක්වීමේ නීති වැනි සීමාවන් අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සඳහා ඒවා සරලව අර්ථ දැක්විය යුතු ය (World Trends in Freedom of Expression and Media Development).

මාධ්‍ය බහුත්වය

මාධ්‍ය වේදිකා (මුද්‍රිත, විකාශන, මාර්ගගත), ප්‍රදේශ (ජාතික, පළාත් සහ ප්‍රජා) සහ දේශපාලන පර්යාලෝක හරහා ගමන් කරන බහුත්ව මාධ්‍ය ක්ෂේත්‍රයක් මගින් සමාජයට තමන් ගැන වඩා හොඳින් මෙනෙහි කිරීමට උපකාරී වේ. මාධ්‍ය මෙහෙයුම බොහෝ දෙනා අතට විසිරී ගිය විට, ජනප්‍රිය නොවන මතවලට ද පොදු වේදිකාවක් හිමි වේ. ජාත්‍යන්තර, ජාතික සහ ප්‍රාදේශීය මාධ්‍ය ආයතනයන්හි (media outlets) ඵලදායී සංකලනයක් මගින් ජනතාවට ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලීන්හි සහභාගී වීමට ඉඩ ප්‍රස්ථා සලසා දිය හැකි ය. බහුවිධ සහ ප්‍රතිවාදී මූලාශ්‍රවලින් තොරතුරු පුළුල් ලෙස බෙදා හැරීම ජනතාවගේ සුබසාධනයට ඉවහල් වේ. වෙන් වෙන් හිමිකාරිත්වය දරන පුවත්පත් සහ විකාශන ආයතන එකිනෙකාගේ අන්තර්ගත සමාන්‍යයෙන් විවේචනය කළ ද, පොදු හිමිකාරිත්වයක් යටතේ මාධ්‍ය සංකේන්ද්‍රණය වීම තුළ අන්‍යෝන්‍ය විවේචනය කිසි ලෙසකින්වත් සිදු නොවන අතර මාධ්‍ය අවනත කර ගැනීම (media capture) අනිසි හැසිරවීමේ හේතු සඳහා භාවිත වීමට හේතු විය හැකි ය. මාධ්‍ය බහුත්වය යන්නෙන් අදහස් වන්නේ මහජන, පෞද්ගලික සහ ප්‍රජා මාධ්‍ය අංශ පිළිගනු ලැබීමයි. මහජන මාධ්‍ය සඳහා සමබර පුවත් සහ අදහස් අවශ්‍ය වේ; පුද්ගලික මාධ්‍ය පක්ෂග්‍රාහී විය හැකි ය; ප්‍රජා මාධ්‍ය ජනතාව වෙනුවෙන් හඬක් නැගිය යුතු ය.

සංස්කාරක ස්වාධීනත්වය

සංස්කාරක ස්වාධීනත්වය යනු මාධ්‍ය හිමිකරුවන්ගෙන් හෝ වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගෙන් බාධාවක් නොමැතිව සංස්කාරක තීරණ ගැනීමට සංස්කාරකවරුන්ට ඇති වෘත්තීය නිදහසයි. නිදසුනක් වශයෙන්, මාධ්‍ය සංවිධානයක හිමිකරුවන් හෝ දැන්වීම්කරුවන් අතර ජනප්‍රිය නොවන ලිපි පළ කරන විට සංස්කාරක ස්වාධීනත්වය පරීක්ෂාවට ලක් කෙරේ. ස්වාධීනත්වය යනු ඕනෑම දෙයක් කිරීමට ඇති නිදහස් බලපත්‍රයක් නොවේ - එය වෘත්තීය පුවත්පත් කලාවේ ආචාරධර්ම සහ ප්‍රමිති මගින් ධනාත්මකව හැඩගැසිය යුතු ය. මෙයින් අදහස් කරන්නේ ප්‍රකාශනයට පෙර හරි වැරදි බව තහවුරු කිරීම, අභිලාෂය හෙළිදරව් කිරීම, හුදෙක් පෞද්ගලික හෝ නිර්මූල්‍ය අභිලාෂය නොව මහජන සුබසිද්ධය තහවුරු කිරීම යනාදියට එල්ලවන බලපෑම් වළක්වා ගැනීමයි.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව (1 කොටස) තුළ මින් ඉහත දී සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකි ය. 1 කොටසෙහි ලැයිස්තුව අධ්‍යයනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

- අන්තර්ජාලය සහ පුස්තකාල භාවිත කරමින්, බලධාරීන් විසින් විවිධ මාධ්‍ය ආයතන හරහා තම වෙළෙඳ ප්‍රචාරණ වියදම් වෙන් කරන ආකාරය ඇතුළුව, වර්තමාන ප්‍රධාන මාධ්‍ය සමාගම් සහ රජය සතු මාධ්‍ය මෙහෙයුම්වල හිමිකාරිත්වය සහ පාලනය පිළිබඳව පර්යේෂණ කරන්න. ඔවුන්ගේ ප්‍රධාන හිමිකාරත්වයන් ලැයිස්තුගත කරන්න. ප්‍රවේශය, තෝරා ගැනීම සහ ප්‍රකාශනයේ නිදහස කෙරෙහි මෙම හිමිකාරිත්වය සහ පාලනය කුමන බලපෑමක් ඇති කළ හැකි ද? මාධ්‍ය හිමිකාරිත්වය සහ පාලනය නියාමනය සඳහා ඔබේ රටේ හෝ ප්‍රජාව තුළ ක්‍රියාත්මක වන නීති මොනවාදැයි සොයන්න.

- කෘත්‍රිම බුද්ධිය, සමාජ මාධ්‍ය සහ අදාළ ආචාරධර්මවල හිමිකාරිත්වය සහ භාවිතය පිළිබඳ ක්‍රියාකාරකම් සඳහා 11වන සහ 13වන මොඩියුල බලන්න.
- ඔබේ ප්‍රජාව තුළ විකල්ප හෝ ස්වාධීන මාධ්‍යවල භූමිකාව තක්සේරු කරන්න. එක් උදාහරණයක් ගෙන, එය ස්වාධීන බවට පත් කරන ප්‍රධාන අංග විස්තර කරන්න. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියකට සහභාගි වීම සඳහා එමගින් මිනිසුන්ට ඉඩ සලසන්නේ කුමන ආකාරයෙන් ද? එය ප්‍රධාන ධාරාවේ මාධ්‍යවලට වඩා වෙනස් වන්නේ කෙසේ ද?
- රටේ ප්‍රජා මාධ්‍යවල තත්ත්වය තක්සේරු කරන්න. ප්‍රජාවන් සැබවින්ම පාලනයට සහ වැඩසටහන්කරණයට සම්බන්ධ ද? මාධ්‍ය ආයතනය භූගෝලීය ප්‍රජාව හෝ උනන්දුවක් දක්වන ප්‍රජාවන් සඳහා සංසදයක් වේ ද? මාධ්‍යය වාණිජ හෝ රජය සතු මාධ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනාගත නොහැකි ලෙස ක්‍රියාත්මක වන්නේ ද, නැතහොත් එය සුවිශේෂී දායකත්වයක් සපයන්නේ ද?
- 19වන වගන්තිය, ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම සඳහා වූ කමිටුව (Committee for the Protection of Journalist), සීමා මායිම් නොමැති වාර්තාකරුවන් (Reporters without Boarders) හෝ කලාපීය සහ ජාතික රාජ්‍ය නොවන සංවිධාන වැනි අදහස් ප්‍රකාශනයේ නිදහස ප්‍රවර්ධනය කරනු ලබන හා ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කරනු ලබන සංවිධානවල කාර්යය ගවේෂණය කරන්න. මෙම සංවිධාන මගින් සහාය දක්වන මාධ්‍යවේදීන්ගේ කටයුතු කෙරෙහි අවධානය යොමු කර සහ සහයෝගය ලැබීමට සුදුසු ඔවුන්ගේ කාර්යයේ ප්‍රධාන මූලිකාංග හඳුනා ගන්න.
- රජය සහ පෞද්ගලික මාධ්‍ය හිමිකරුවන් සංස්කාරක ස්වාධීනත්වය සඳහා මාධ්‍යයට ඇති අයිතියට ගරු කළ යුත්තේ ඇයි යන්න සාකච්ඡා කරන්න. විශේෂයෙන්ම, ඔවුන්ගේ ප්‍රවෘත්ති සහ කාලීන සිදුවීම් ආවරණය සම්බන්ධයෙන් මාධ්‍යයට බලපෑම් කිරීමෙන් වැළකී සිටිය යුත්තේ මන්දැයි සාකච්ඡා කරන්න.
- සංස්කාරක ස්වාධීනත්වය මත එල්ල විය හැකි වෙනත් විභවීය බලපෑම් පිළිබඳව සාකච්ඡා කරමින් එවැනි අනවශ්‍ය බලපෑම් වළක්වා ගත හැකි ආකාරය යෝජනා කරන්න.
- වරණාත්මක අර්ථ නිරූපණයට ඉඩ සලසන නොපැහැදිලි සහ පුළුල් නීතිවලට වඩා වෙනස් වන පරිදි, පුරවැසියන්ට ඔවුන් එම විෂය ක්ෂේත්‍රයට ගැනෙන විට පැහැදලිව අවබෝධ කර ගැනීමට හැකි වන පටු ආකාරයෙන් අර්ථ දක්වන ලද නීතියක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න සාකච්ඡා කරන්න.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්.
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකා
- ගවේෂණාත්මක කථාව/වාර්තා

3වන ඒකකය: පුස්තකාල, ලේඛනාගාර සහ අන්තර්ජාල සන්නිවේදන සමාගම් වැනි මාධ්‍ය හා අනෙකුත් අන්තර්ගත සපයන්නන් සමඟ අන්තර්ක්‍රියා කිරීම

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- අන්තර්ගතය සපයන ආයතන විසින් අර්ථය සන්නිවේදනය කරන ආකාරය
- නියෝජනය පිළිබඳ ගැටලුව : අන්තර්ගත සපයන්නන් විසින් තොරතුරු, පුද්ගලයන්, සංස්කෘතීන්, අනුරූප, ස්ථාන යනාදිය ඉදිරිපත් කරන ආකාරය.
- ශාස්ත්‍රීය හා විද්‍යාත්මක තොරතුරු
- පරිශීලකයන්ගේ, පුරවැසියන්ගේ සහ ප්‍රේක්ෂකයන්ගේ භූමිකා පරිශීලකයන් විසින් සාදන ලද අන්තර්ගතයන්හි සම්පාදනය තුළින් ඩිජිටල් සන්නිවේදන සමාගම් සමඟ සම්බන්ධ වීම.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කළ පසු ගුරුවරුන් පහත හැකියාවන් ලබා ගනු ඇත:

- මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් ඇතුළු අන්තර්ගත සපයන්නන් විසින් භාවිත කරනු ලබන ප්‍රධාන සංකල්ප තේරුම් ගෙන විස්තර කිරීම.
- පරිශීලකයන්/පුරවැසියන් හට සැපයුම්කරුවන් සමග සමඟ විචාරශීලීව කටයුතු කිරීමට මෙම සංකල්ප පිළිබඳ දැනුම උපකාර වනු ඇත්තේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම.

අන්තර්ගත පරිරක්ෂණය

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි මූලික අංගයක් වන්නේ මාධ්‍ය ඇතුළු අන්තර්ගත සපයන්නන් විසින් විවිධ වර්ගයේ ප්‍රවෘත්ති නිර්මාණය කරන ආකාරය, ඔවුන් එය ඉදිරිපත් කිරීමේදී අන්තර්ගතය හැඩගස්වන ආකාරය සහ සංවිධානය නොකළ කල්හි අවුල් සහගත සහ තේරුම් ගැනීමට අපහසු එම කරුණු සකස් කිරීමට ඔවුන් විසින් භාවිත කරනු ලබන ශිල්පීය ක්‍රම මොනවාද යන්න අවබෝධ කර ගැනීමයි.

පුස්තකාලවල සිට යූ ටියුබ් දක්වා වූ සියලුම අන්තර්ගත සපයන්නන්, ඔවුන් විසින් ඇතුළත් කරන හා බැහැර කරන දේ අනුව මෙන්ම අනෙක් ඒවාට වඩා වෙනස් විවිධ සංරචක වෙත ප්‍රවේශය ලබා දෙන සහ සංවිධානය කරන ආකාරය අනුව ඔවුන්ගේ අන්තර්ගත පරිරක්ෂණය කරයි.

මාධ්‍ය ඇතුළු විවිධ අන්තර්ගත සපයන්නන් විසින් භාවිත කරනු ලබන විවිධ ශිල්පීය ක්‍රම පිළිබඳ මූලික අවබෝධයක් තිබීම වැදගත් වේ. ඔවුන් භාවිත කරන 'කේත' සහ ඒවා අර්ථකථනය කරන ආකාරය ගැන අවධානය යොමු කරන්න. කරුණු සම්පාදනය කරන්නේ සහ සකස් කරන්නේ කවුරුන්ද යන්න සහ මාධ්‍ය හා තොරතුරු ඉදිරිපත් කරන ආකාරය කෙරෙහි මාධ්‍ය සහ තොරතුරු පාරිභෝගිකයන්ගේ සංජානනය බලපෑම් කරන්නේ වුව ද ඔවුන් කෙතරම් ක්‍රියාකාරී ද හෝ අන්තර්ක්‍රියාකාරී ද යන්න සලකා බැලීම ද අදාළ විය හැකි ය.

ඕනෑම ආකාරයක අන්තර්ගතයක් සම්බන්ධයෙන්, සත්‍යාපනය කළ සත්‍ය හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. මෙය ශාස්ත්‍රීය, විද්‍යාත්මක, නීල (රජයේ) සහ සංස්කෘතික, විද්‍යුත් හෝ මුද්‍රිත ආකාරයෙන් ප්‍රකාශයට

පත් කරන ලද පෙළ විය හැකි ය. මෙයින් අදහස් කරන්නේ පෙළ පරීක්ෂා කිරීම, අන්තර්ගතය, ප්‍රකාශිත දිනය සහ භූගෝලීය ආවරණය, විභවීය පක්ෂග්‍රාහීත්වය, දෝෂ හඳුනාගැනීම හෝ අනන්‍යාකාරයකින් පවසන්නේ නම් අන්තර්ගතය වලංගු ද නැද්ද යන්න තීරණය කිරීමට හැකිවීම යි. තොරතුරු අත්කර ගන්නා, සංවිධානය කරන සහ සපයන/ බෙදා හදා ගන්නා/ විසුරුවන ආයතන සමඟ පරිශීලකයන් අන්තර් ක්‍රියා කිරීම අවශ්‍ය කෙරේ. උදාහරණයක් වශයෙන් විවිධ පුස්තකාල වර්ග තිබිය හැකි ය: පාසල (බාලාංශයේ සිට උසස් පාසල දක්වා), මහජන පුස්තකාල (මහජනතාව වෙත නොමිලේ ප්‍රවේශය ලබා දෙන රටෙහි හෝ රාජ්‍යයෙහි සහ එමතු නොව ෆෙඩරල් විවෘත පුස්තකාල විය හැකි ය), ශාස්ත්‍රීය (විශ්ව විද්‍යාල, පර්යේෂණ මධ්‍යස්ථාන සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන), විශේෂ (ව්‍යාපාර, රජයන්, රාජ්‍ය නොවන සංවිධාන ආදිය) සහ ජාතික (මතු පරම්පරාව සඳහා සංරක්ෂණය කර ඇති දේශීය හෝ විදේශයන්හි ප්‍රකාශයට පත් කරන ලද සියලුම ජාතික ප්‍රකාශන) දැක්විය හැකි ය. මාධ්‍ය හා අන්තර්ජාල සමාගම් සම්බන්ධයෙන් ගත් කළ, උප-ආයතනික වර්ග පරාසය තවදුරටත් පුළුල් වේ.

සමීපව පරිරක්ෂිත අන්තර්ගත පුස්තකාල තුළ මෙන්ම කෞතුකාගාර සතු එකතුවලින් ද සොයා ගත හැකි අතර, එක් එක් කොටස දත්ත හෝ තොරතුරු මූලාශ්‍රයක් විය හැකි ය. ඒ පරිද්දෙන්ම, ලේඛනාගාර යනු ප්‍රාථමික තොරතුරු සඳහා විශිෂ්ට මූලාශ්‍ර වේ. විවෘත ප්‍රවේශය සහිත සුරක්ෂිතාගාර මගින් විවෘත ප්‍රවේශ සඟරා නාමාවලිය (Directory of Open Access Journals [DOAJ]) වැනි සඟරා, පොත් සහ ප්‍රාථමික මූලාශ්‍ර අසීමිත සංඛ්‍යාවක් සපයනු ලැබේ. DOAJ යනු සමපදස්ථයන් විසින් සමාලෝචනය කරන ලද සඟරා සූචිගත කර විවෘත ප්‍රවේශය සපයනු ලබන ප්‍රජාව විසින් පරිරක්ෂිත මාර්ගගත නාමාවලියකි. DOAJ වෙත අරමුදල් සැපයීම ආධාර මගින් සිදු වන අතර, එයින් 18% අනුග්‍රාහකයන්ගෙන් සහ 82% සාමාජිකයන් සහ ප්‍රකාශන සාමාජිකයන්ගෙන් (https(//doaj.org/) ලැබේ. විවෘත ප්‍රවේශය සහ නොමිලේ පූර්ණ පෙළ තොරතුරු (http://lareferencia.info/es) ප්‍රවර්ධනය කරමින්, ලතින් ඇමරිකාවේ උසස් අධ්‍යාපන ආයතන සහ පර්යේෂණ මධ්‍යස්ථානවල විද්‍යාත්මක සම්පාදනය සම්බන්ධයෙන් දෘශ්‍යමානතාව ලබා දෙන LA Referencia අනෙකුත් උදාහරණවලට ඇතුළත් වේ. තනි පුද්ගලයන් මෙන්ම විශ්ව විද්‍යාල, ආයතන, කෞතුකාගාර සහ වෙනත් ආයතන විසින් සපයනු ලබන, සහ පුස්තකාලවලට සාපේක්ෂව බොහෝ විට වෙනස් සහ බොහෝ ලිහිල් තත්ත්ව නිර්ණායක සහිතව එකතු කරන ලද විභව පාඨකයන්ට හෝ පරිශීලකයන්ට ලබා ගත හැකි පුළුල් පරාසයක පැතිරුණු තොරතුරු අන්තර්ජාලය සතු වේ.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව (1 කොටස) තුළ මින් ඉහත දී සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකි ය. 1 කොටසෙහි ලැයිස්තුව අධ්‍යයනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළව, අන්තර්ගත සපයන්නන් ක්‍රියා කරන ආකාරය, ඔවුන් අර්ථය ප්‍රකාශ කරන ආකාරය, ඒවා භාවිත කළ හැකි ආකාරය සහ ඉදිරිපත් කරන අන්තර්ගතය ඇගයීම කළ හැකි ආකාරය - එහි තොරතුරු ලබ්ධිය (information quotient) සහ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ද ඇතුළත්ව, අවබෝධ කර ගැනීම පිණිස පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර සමීපව පරීක්ෂා කළ යුතු ය. පහත සඳහන් ක්ෂේත්‍ර මගින් ද මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ විෂයමලා ලේඛනයෙහි පසුව දැක්වෙන මොඩියුල සඳහා පදනමක් සපයයි.

අන්තර්ගත සම්පාදනය සඳහා වන තාක්ෂණ

- අන්තර්ගත සම්පාදකයන් විවිධ තාක්ෂණික ක්‍රම හෝ තොරතුරු නියෝජනය කිරීමේ විවිධ ක්‍රම භාවිත කරන්නේ කෙසේ ද?
- සාමාන්‍ය ජනතාව විසින් මෙම භාවිතයන් හඳුනාගෙන පිළිගනු ලබන්නේ කෙසේ ද?
- යම් නිශ්චිත සපයන්නෙකුගේ කේත සහ සම්මුතීන් හෝ "ප්‍රධාන අංග" හෝ මූලික කරුණු මොනවා ද?
- මාධ්‍ය විචාරකයෙකු වන මෂල් මැක්ලුහන් විසින් "මාධ්‍යය යනු සන්දේශය වේ"[33] යන්නෙන් අදහස් වන්නේ මුද්‍රිත, ප්‍රචාරණ, අන්තර්ජාල යනා දී මාධ්‍ය මගින් අප විසින් ලෝකය අවබෝධ කර ගන්නා

33. McLuhan & Fiore 1967. The Medium is the Message: An Inventory of Effects. Penguin Modern Classics

ආකාරය කෙරෙහි බලපෑම් කෙරේ යන්න ලිඛිතව ප්‍රකාශ කර ඇත. තාක්ෂණික ක්‍රමවේදය තෝරා ගැනීම අපට ලැබෙන තොරතුරුවල වර්ගයට බලපෑම් කරන්නේ කෙසේ ද? එසේ වන්නේ නම් සම්ප්‍රේෂණය කරනු ලබන සන්දේශය මෙමගින් හැඩගස්වන්නේ කෙසේ ද?

මාධ්‍ය තුළ නිරූපණය සහ තොරතුරු

- නිරූපණයන්හි එක් ආකාරයක් ලෙස අනුරූප භාවිතය පිළිබඳ පරීක්ෂා කරන්න
- අකාරාදී පෙළ විශ්ලේෂණය කරන්න
- සන්දර්භය විශ්ලේෂණය කරන්න
- නිරූපණ පිළිගැනීමෙන් ප්‍රතිලාභ අත්වන්නේ කවුරුන්ට ද? අවාසි අත්වන්නේ කවුරුන්ට ද? මෙම අනුරූප අප පිළිබඳව හා අන් අය පිළිබඳව දකින ආකාරය කෙරෙහි බලපාන්නේ කෙසේ ද ?
- ඒවා අපගේ සමීප අත්දැකීම්වලින් ඔබ්බට ලෝකය පිළිබඳ අපගේ දැනුමට සහ අවබෝධයට බලපෑම් කරන්නේ කෙසේ ද?
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව, කාන්තා සවිබල ගැන්වීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කණ්ඩායම්, ආබාධ සහිත පුද්ගලයන්, ආදිවාසී ජනතාව සහ වාර්ගික සුළුතර කණ්ඩායම් පිළිබඳ අපගේ දැක්මට ඒවා බලපාන්නේ කෙසේ ද?
- සංස්කාරක ස්වාධීනත්වය මාධ්‍යය පෙළ තුළ කොතෙක් දුරට පිළිබිඹු වේ දැයි පරීක්ෂා කරන්න

සම්පාදනය /පරිශීලක විසින් ජනනය කරන ලද අන්තර්ගතය

- මානව කාරකත්වය හෝ ස්වාධීනත්වය පිළිබඳ සංකල්ප මෙහි දී වැදගත් වේ. පෙළ නිර්මාණය කරන්නේ කවුරුන් ද සහ කුමක් සඳහා ද? අවදානමට ලක්ව ඇති ආයතනික සහ පුද්ගල අභිලාෂ මොනවා ද?
- මෙය පුරවැසියාගේ සහ වෘත්තිකයාගේ සන්නිවේදන සහ ප්‍රකාශනයේ අයිතීන්වලට සම්බන්ධ වන්නේ කෙසේ ද?
- එය අදහස් ප්‍රකාශනයේ නිදහස, ක්‍රියාකාරී පුරවැසිභාවය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට සම්බන්ධ වන්නේ කෙසේ ද?
- සම්පත් (මානව, මුල්‍ය, තාක්ෂණික ආදිය) සහ රෙගුලාසි මෙහිදී සලකා බලනු ලැබේ .

පුරවැසියන් සහ පරිශීලකයන්/පාරිභෝගිකයන් වශයෙන් ග්‍රාහක පිරිස

- ඉලක්කගත සහ ක්‍රියාකාරී ග්‍රාහක පිරිස
- ක්‍රියාකාරී පුරවැසියන් සහ පරිශීලකයන්/ පාරිභෝගිකයන් ඔවුන් පෙළ සැකසීමට ගෙන එන දේ මත පදනම්ව ඔවුන්ගේම අර්ථ සාකච්ඡා කරයි.
- සපයන්නාගේ සන්නාමය සහ විශ්වාසනීයත්වය ශක්තිමත් කරන උපයෝගිතාව, විනිවිදභාවය, වගවීම සහ සාධාරණබව මත පදනම්ව ග්‍රාහක පිරිස් අන්තර්ගත සපයන්නන් කෙරෙහි අපේක්ෂා තබා ගනිති.
- පරිශීලකයන්/පාරිභෝගිකයන්හට තොරතුරු සඳහා පුද්ගලික, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අවශ්‍යතා පවතී.

සේවා සැපයුම්කරුවන්ගේ පරිශීලකයන්/ පාරිභෝගිකයන් වශයෙන් පුරවැසියන්

- අන්තර්ගත සපයන්නන් විසින් සම්පත් සහ ප්‍රධාන තේරීම් නිර්ණායක තෝරා ගනු ලබන්නේ සහ පරිරක්ෂණය කරනු ලබන්නේ කෙසේ ද ?
- පුස්තකාල වැනි අන්තර්ගත සපයන්නන් විසින් පොත්, චාර සඟරා සහ දත්ත සමුදායන් වැනි තොරතුරු සම්පත් ලබා ගන්නේ හෝ මිලදී ගන්නේ කෙසේ ද ? ඔවුන්ගේ සීමිත අයවැය තුළ ඔවුන් ප්‍රමුඛත්වය ලබා දෙන්නේ කුමකට ද සහ ඒ ඇයි?
- තොරතුරු සපයන රජයේ ආයතන සමග සම්බන්ධ වන්නේ කෙසේ ද?
- අන්තර්ගත සපයන්නන්ට අරමුදල් සපයන්නේ කෙසේ ද? මොඩියුලය 10 සහ 13 බලන්න.

- අන්තර්ගත සපයන්නන් ඔවුන්ගේ සේවාවලින් ආදායම් උපයන්නේ කෙසේ ද ? මොඩියුලය 10 බලන්න.
- සමාජ ජාල ඇතුළුව ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් සපයා ඇති ඔබ පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීම

ප්‍රධාන ප්‍රශ්න

- මෙම පෙළෙහි අරමුණ කුමක්ද ? මෙය සම්පාදනය කරන්න් කෙසේ ද ?
- එය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද ?
- අරමුණුගත ග්‍රාහක පිරිස කවුරුන් ද ? ඔබ දන්නේ කෙසේ ද? ප්‍රධාන සන්දේශය කුමක් ද?
- ප්‍රතිලාභ ලැබෙන්නේ කාටද සහ ඔවුන්ට ලැබෙන්නේ මොනවා ද? මගේ තොරතුරු අවශ්‍යතා මොනවා ද?
- මම මෙම අවශ්‍යතාව හඳුනාගෙන නිර්වචනය කරන්නේ කෙසේ ද ?
- මට අවශ්‍ය තොරතුරු මට එය අවශ්‍ය කරන ආකෘතිය තුළ පවතී ද? එසේ නොවේ නම්, මට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? සොයාගත් තොරතුරු අවබෝධ කර ගැනීම, සංවිධානය කිරීම සහ තක්සේරු කිරීම සිදු කරන්නේ කෙසේ ද?
- මට මෙම තොරතුරු භාවිත කළ හැකි ආකෘතිවලින් ඉදිරිපත් කළ හැක්කේ කෙසේ ද ?
- තොරතුරු සංරක්ෂණය කිරීම, ගබඩා කිරීම සහ නැවත භාවිත කිරීම, වාර්තා කිරීම සහ ලේඛනගත කිරීම මට කළ හැක්කේ කෙසේද ?
- මා මෙම අන්තර්ගතය බෙදා හදා ගැනීම කළ හැක්කේ හෝ කළ යුත්තේ කෙසේ ද ?

ක්‍රියාකාරකම්

- ඔබ කැමති දෘශ්‍ය හෝ වෙනත් පෙළක් තෝරා ඉහත ලැයිස්තුගත කර ඇති ප්‍රධාන ප්‍රශ්න යොදන්න. අරමුණුගත ග්‍රාහක පිරිස මෙන්ම ආයතන සහ සම්ප්‍රේෂණය කරනු ලබන සන්දේශය පිළිබඳ ඔබට දැනගැනීමට හැක්කේ මොනවා ද?
- ඔබ කිරීමට කැමති පුද්ගලික හෝ ආර්ථික කටයුත්තක් ගැන සිතන්න. එය සටහන් කරන්න. "ඔබේ තොරතුරු අවශ්‍යතා මොනවා ද?" යනුවෙන් පටන් ගෙන ඉහත ප්‍රධාන ප්‍රශ්න යොදන්න.
- ඔබ උදෑසන අවදි වූ මොහොතේ සිට රාත්‍රියේ නින්දට යන තෙක් ඔබ දිවා කාලයේ දී කරන සියලුම ක්‍රියාකාරකම් ලියන්න. කුඩා කණ්ඩායම් වශයෙන් විශ්ලේෂණය කරන්න: මෙම ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට ඔබට තොරතුරු අවශ්‍ය ද? එක් එක් ක්‍රියාකාරකමට ඉදිරියෙන් ඔබට අවශ්‍ය තොරතුරු ලියන්න. නිදසුනක් වශයෙන්, ඇඳුම් ඇඳීම සඳහා පිටත උෂ්ණත්වය පිළිබඳ දැන ගැනීමට ඔබට අවශ්‍යය වේ; ඔබ බස් රථයට යාමට පෙර වාහන තදබදය පිළිබඳ තත්ත්වය දැන ගැනීමට ඔබට අවශ්‍යය වේ; ඔබ ණයක් ලබා ගනු ඇත් දැයි දැන ගැනීමට ඔබට ආර්ථිකය ගැන දැන ගැනීමට අවශ්‍යය වේ. සාකච්ඡා කරන්න: ඔබගේ එදිනෙදා ජීවිතයේ දී තොරතුරු කොතරම් වැදගත් ද? තොරතුරු නොමැතිව ඔබට තීරණ කොපමණ ප්‍රමාණයක් ගැනීමට අපහසු වනු ඇති ද ?
- පුස්තකාලය හෝ අන්තර්ජාලය භාවිත කරමින්, පසුගිය වසරේ ප්‍රමුඛතම රූපවාහිනී හෝ ගුවන්විදුලි වැඩසටහන්, චිත්‍රපට හෝ වෙළෙඳ දැන්වීම් කිහිපයක් පර්යේෂණ කරන්න. ඉහත ලැයිස්තුවෙන් ඔවුන්ගේ සාර්ථකත්වයට පාදක වූ ප්‍රධාන මාතෘකා මොනවා ද? මෙම උදාහරණ මගින් ඉහත මාතෘකා එකක් හෝ කිහිපයක් අවධාරණය කරනු ලබන ආකාරය විස්තර කරන්න.
- පොත් සහ සඟරා ලිපිවල උපුටා දැක්වීම්, යොමු කිරීම් සහ ග්‍රන්ථ නාමාවලිවල වැදගත්කම ගැන ඡේදයක් ලියන්න. විද්‍යාඥයන් සහ ඉගෙනුම්ලාභීන් ඔවුන් භාවිත කළ තොරතුරු මූලාශ්‍ර පිළිබඳ තොරතුරු උපුටා දැක්වීම සහ සැපයීම සිදු කළ යුතු ය. ජනමාධ්‍යවේදීන් විසින් ද මෙසේ සිදු කරනු ලබන අතර, එසේ වුවත් ඇතැම් මූලාශ්‍ර (පුද්ගලයෙකු හෝ පොදුවේ අනාවරණය නොකරන ලේඛන විය හැකි ය) සහ ඇතැම් තොරතුරු කෙතරම් සංවේදී ද යන්න මත පදනම්ව, මහජනයාගේ සුභසිද්ධිය වෙනුවෙන් සහ ආචාරධර්ම සහ ව්‍යාත්තීය ප්‍රවෘත්තිකරණ පරිචයන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රවෘත්තිකරණ ප්‍රමිතවලට ගරු කිරීම පිණිස ඔවුන්ට සිය මූලාශ්‍ර ආරක්ෂා කිරීමට වෙනස් ආකාරයකින්

කටයුතු කිරීමට සිදු වනු ඇත. මෙසේ කිරීමේ දී, ජනමාධ්‍යවේදීන් විසින් සිය කරුණු සහ මූලාශ්‍ර සත්‍යාපනය කිරීම අවශය කෙරේ. (ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය, ජනමාධ්‍යවේදීන් සඳහා වන ආචාරධර්ම පිළිබඳ ගෝලීය ප්‍රඥප්තිය[34] [International Federation of Journalists Global Charter of Ethics for Journalists])

- ජනමාධ්‍යවේදීන්ට ඔවුන්ගේ සංස්කාරකවරුන්ට හැර ඔවුන්ගේ තොරතුරු මූලාශ්‍ර හෙළි නොකිරීමට අයිතියක් තිබිය යුත්තේ මන්දැයි තවදුරටත් පැහැදිලි කරන්න. මෙම යථාර්ථයේ වාසි සහ අවාසි පිළිබඳ සංවාදයක් සඳහා මග පෙන්වන්න.
- "ප්‍රවෘත්තිකරණය සත්‍යාපනය කිරීමේ විෂය ක්ෂේත්‍රයකි" -එනම් ජනමාධ්‍යවේදීන් කරුණු පරීක්ෂා කිරීමට සහ මූලාශ්‍ර සත්‍යාපනය කිරීමට යොදා ගන්නා ශිල්ප ක්‍රමයි. සාකච්ඡා කරන්න.
- OpenDOAR වෙබ් අඩවිය:
- අදාළ සුරක්ෂිතාගාර හඳුනා ගන්න. පුස්තකාලය හෝ අන්තර්ජාලය තුළ විවෘත සුරක්ෂිතාගාර වෙබ් අඩවිය වන OpenDOAR වෙබ් අඩවිය සොයන්න, සහ ඔබේ භාෂාවෙන් පවතින සුරක්ෂිතාගාර පිහිටි ස්ථාන සොයා ගන්න. ඔබගේ භාෂාවෙන් පවතින සුරක්ෂිතාගාර 10ක් සහ අනෙකුත් භාෂාවලින් පවතින ඔබට අදාළ වන සුරක්ෂිතාගාර 5ක් ලැයිස්තුගත කරන්න. මෙම නාමාවලියකට තිබිය හැකි අරමුණු මොනවා ද සහ එය නිර්මාණය කරනු ලැබුවේ මන්ද සහ එමගින් ඔබට සහ ඔබගේ ප්‍රජාවට ප්‍රතිලාභ අත්කර දිය හැකි වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ඡේදයක් ලියන්න.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්.
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, විලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකා
- ගවේෂණාත්මක කථාව/වාර්තා

4වන ඒකකය : මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, ඩිජිටල් කුසලතා, සංස්කෘතික සහභාගිත්වය/ නිර්මාණශීලිත්වය සහ ව්‍යවසායකත්වය

කාලසීමාව: පැය 2යි

ප්‍රධාන මාතෘකා

- අන්තර්ගත සපයන්නන් මගින් සංස්කෘතික සහභාගීත්වය
- ඩිජිටල් යුගයේ සංස්කෘතික සම්පාදනය
- සංස්කෘතික ව්‍යවසායකත්වය පිළිබඳ විචාරශීලී චින්තනය සහ පර්යේෂණ
- ඩිජිටල් නිර්මාණශීලිත්වය

34. https://www.ifj.org/who/rules-and-policy/global-charter-of-ethics-for-journalists.html. Accessed on 18 January 2021

ඉගෙනුම් අරමුණු

මෙම මොඩියුලය අවසානයේ දී, ශික්ෂකයන් පහත හැකියාවන් ලබා ගනු ඇත:

- විවිධ අන්තර්ගත සපයන්නන් සංස්කෘතික සහභාගීත්වයට මැදිහත් වන ආකාරය විස්තර කිරීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, විචාරශීලී චින්තනයක් ලෙස සදාචාරාත්මක සහ විවිධාකාර සංස්කෘතික සම්පාදන, පරිචයන් සහ කතිකාවන්ට දායක වන්නේ කෙසේදැයි තේරුම් ගැනීම.
- සංස්කෘතික හුවමාරුව සහ ව්‍යවසායකත්වය සඳහා ඩිජිටල් මාධ්‍ය සහ මෙවලම් වැනි අන්තර්ගත සපයන්නන් භාවිත කරන්නේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම.

සංස්කෘතික සාක්ෂරතාව

යුනෙස්කෝව සහ ලොව පුරා සිටින හවුල්කරුවන් විසින් සංස්කෘතික සාක්ෂරතාව සහ අන්තර් සංස්කෘතික නිපුණතා වැනි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළ සංකල්ප ප්‍රවර්ධනය කරයි.

සංස්කෘතික සාක්ෂරතාව පහත දෑ සඳහා දායක වේ.

- සමාජයක ඓතිහාසික යොමු, උරුමය සහ ප්‍රජා භාෂා පිළිබඳ දැනුවත් වීම, සහ දේශපාලනික හා ආර්ථික පර්යාලෝකවලට සැඟවී සහ ඉක්මවා ගොස් පවතින සංඝට්ට සන්දර්භ සම්බන්ධතා විකේත කිරීම ඇතුළුව සමාජයක වටිනාකම් සහ පර්යාලෝක වඩා හොඳින් අවබෝධ කර ගැනීම.
- අව්‍යෝජනීය කොටසක් වශයෙන් සංස්කෘතික ප්‍රකාශනයේ විවිධත්වයට ඇති අයිතිවාසිකම සහිතව, මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ ගෝලීය බැඳියාවට ප්‍රතිචාර දක්වන්නා වූ විවිධාකාර සංස්කෘතික අන්තර්ගත වෙත ප්‍රවේශය පුළුල් කිරීම. එතකුදු වුවත් මුද්‍රිත හා ප්‍රකාශන මාධ්‍ය තුළින් ප්‍රත්‍යක්ෂ වන්නා වූ ඩිජිටල් බෙදීම මෙන්ම, ලෝකයේ විවිධ ප්‍රදේශවල අන්තර්ගතයන්හි ගෝලීයකරණය වූ විභවයන් යන දෙඅංශයෙහිම අන්තර්ගතය තුළ, ඒ අනුව සංස්කෘතික සාක්ෂරතාව ප්‍රවර්ධනය වැඩි වශයෙන් සිදු කිරීම වහා කළ යුතු වන්නේ ය.
- තමාගේ සංස්කෘතිය බෙදා හදා ගැනීම දිරිමත් කිරීම සහ වෙනත් සංස්කෘතීන් පිළිබඳ ඉගෙන ගැනීමට විවෘතව සිටීම හා එමගින්, අන්‍යෝන්‍ය අවබෝධය සහ සංවාදය ප්‍රවර්ධනය කිරීම, ඒකාකෘතිකරණය, වෙනස්කොට සැලකීම, බැහැරිජන භීතිකාව (xenophobia) සහ වෙනත් සම්බන්ධිත නොඉවසීම්වලට එරෙහිව සටන් කිරීම සහ සංස්කෘතීන්හි සමගි සන්ධානයක් උදෙසා දායක වීම.
- ඉගෙනුම් ඵල ශක්තිමත් කිරීම සහ සංස්කෘතික හා කලාත්මක අන්තර්ගතයන්හි වැදගත්කම ඉස්මතු කරමින් සහ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිත (STEM) අධ්‍යාපනයට ඉහත දෑ අනුපූරක වන ආකාරය පෙන්වා දෙමින් සංවේදනය, විචාරශීලී චින්තනය සහ නිර්මාණශීලිත්වය වැනි නිපුණතා වර්ධනය කිරීම.

සාම්ප්‍රදායික මාධ්‍ය සහ ඩිජිටල් පරිසරය යන දෙඅංශයේම සංස්කෘතික භාණ්ඩ හා සේවාවන්හි නිර්මාණාත්මක සංවර්ධනය තුළ සංස්කෘතිය සහ කලාව සන්නද්ධ කිරීම මෙන්ම සංස්කෘතික විවිධත්වය (භාෂා විවිධත්වය ඇතුළුව) සඳහා වන සැලකිල්ල වැඩි දියුණු කිරීම සඳහා ජනතාවගේ විචාරශීලී මැදිහත්වීම වැඩි කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මිනිසුගේ වරණය ප්‍රසාරණය කිරීම, වර්ධිත සමාජ අන්තර්ග්‍රහණය, ස්වදේශික ජනතාව ඇතුළුව සුළුතර කණ්ඩායම් මෙන්ම, විශේෂයෙන් කාන්තාවන් සහ තරුණයන් වැනි, අවවරප්‍රසාදිත සහ අවදානමට ලක්විය හැකි ජනගහනයේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම සහ වර්තමානයේ බහු සංස්කෘතික වූ සමාජ තුළ එකට ජීවත්වීමේ හැඟීම වැඩි වැඩියෙන් වර්ධනය කිරීම කෙරෙහි මෙය පිළිවෙලින් මගපෙන්වනු ලැබිය හැකි ය.

සංස්කෘතික විවිධත්වයට සියලුදෙනා හට ප්‍රවේශයක් සඳහා දායකත්වය සපයන ආකාරයක් වශයෙන් ද, සහ කලා, විද්‍යාත්මක සහ තාක්ෂණික දැනුම සහ ඩිජිටල් ආකෘති සඳහා සමාන ප්‍රවේශයක් වශයෙන් ද, මාධ්‍ය බහුත්වය, ප්‍රකාශන සහ ප්‍රචාරණ මාධ්‍ය වෙත ප්‍රවේශය වෙනුවෙන් 2001 සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය[35] පෙනී සිටී (6වන වගන්තිය). මේවා මගින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධිත නිපුණතාව සඳහා සබල වටපිටාවන් ඇති කෙරේ. මෙම ප්‍රකාශනය, 'ඩිජිටල් සාක්ෂරතාව' සම්බන්ධයෙන් මෙන්ම අධ්‍යාපනික සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ හැකියාව සහිත අධ්‍යාපනික විෂය ක්ෂේත්‍ර සහ ශික්ෂණවිද්‍යා මෙවලම් යන දෙවර්ගයම වශයෙන් වටහා ගත යුතු නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන්හි වැඩි ප්‍රවීණත්වයක් සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද ඉල්ලා සිටී (ඇමුණුම II, ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන විෂය)

1.2 වගුව: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, අන්තර් සංස්කෘතික සංවාදය සහ සංස්කෘතික විවිධත්වය: සංකල්පීය සහක්‍රියාව (synergy)

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා රාමුව තුළ	අන්තර් සංස්කෘතික සංවාදය හා සංස්කෘතික විවිධත්වය ප්‍රවර්ධනය කිරීමේ රාමුව තුළ
මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුරවැසියන් සහ ඩිජිටල් පුරවැසිභාවය	අන්තර්ජාලයෙහි පවතින්නන් ඇතුළු අන්තර්ගත සපයන්නන් අන්තර් සංස්කෘතික සංවාදය සහ සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම අභිවර්ධනය කිරීමෙහි ලා මූලධර්ම ප්‍රවර්ධනයට සාක්ෂරතාව ලබා ගන්නේ සහ ඒ සඳහා උපකාරී වන්නේ කෙසේ ද යන්න.
තිරසර සංවර්ධන ඉලක්ක, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ සියලු දෙනා හට තොරතුරු වෙත ප්‍රවේශය යනාදියෙහි විචාරශීලීව නියැලීම	තමන්ගේම සංස්කෘතිය හුවමාරුව දිරිමත් කිරීම සහ අනෙකුත් සංස්කෘතීන් පිළිබඳ ඉගෙන ගැනීමට සුදානමින් සිටීම, බහුවිධ, විවිධ සහ ගතික සංස්කෘතික අනන්‍යතා හඳුනා ගැනීම සහ එමගින් සංස්කෘතික විවිධත්වය, මානව හිමිකම් සහ මූලික නිදහස සඳහා ගරුත්වය ඉහළ නැංවීම.
අන්තර්ගත සම්පාදනයේ පදනමක් ලෙස මානව හිමිකම්වල කේන්ද්‍රීයත්වය	අන්තර්ගත සම්පාදනවල පාරිභෝගිකයන් ලෙස පමණක් නොව, මිනිසුන් සහ පුරවැසියන් ලෙසට මෙන්ම සංස්කෘතික හා නිර්මාණාත්මක කර්මාන්තයන්හි සම්පාදකයන් හා ප්‍රමුඛ ක්‍රියාකාරීන් ලෙසට ග්‍රාහක පිරිසට ගරු කිරීම. මෙහිදී තීරණාත්මක වන්නේ සංස්කෘතික ජීවිතයට සහභාගී වීම සහ සංස්කෘතික අන්තර්ගතයට ප්‍රවේශය සහ ඒ සඳහා ඇති නිපුණතා සහ විධික්‍රම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් නඟා සිටුවිය හැක්කේ කෙසේ ද යන්නයි.
සාක්ෂරතාවෙහි මූලික ඉලක්කය ලෙස පුරවැසියන් සවිබල ගැන්වීම	පුරවැසියන් තමන්ගේම ජීවන අත්දැකීම් පාදක කර ගනිමින් පෙළෙහි (texts) අර්ථයන් සමඟ ක්‍රියාශීලීව සම්බන්ධ වී සාකච්ඡා කරන ආකාරය
දැනුම් සමාජවල විකාසනය වන සුසමාදර්ශයක් තුළ. සංවර්ධනය උදෙසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් යොදා ගැනීම.	පුරවැසියන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතයෙන් තමන්ගේම ලෝක දීෂ්ටීන් සන්නිවේදනය කරන ආකාරය, එමගින් අදහස් ප්‍රකාශනයේ නිදහස ප්‍රවර්ධනය කිරීම සහ මාධ්‍ය හා තොරතුරු ප්‍රතිදානයන්හි ආවේණික අගතීන් සහ ඒකාකෘති ප්‍රතික්ෂේප කිරීම හෝ තෝරා බේරා ගැනීම.
සංස්කෘතික හා භාෂා විවිධත්වය	පුරවැසියන් තමන්ගේම සංස්කෘතික සහ භාෂාමය අනන්‍යතා නිර්වචනය කරන්නේ කෙසේ ද, සහ මානව අයිතිවාසිකම් සහ නානාවිධ මූලික නිදහසට ගරු කරන අතරම ඔවුන් තෝරා ගන්නා මාධ්‍යයෙන් සහ භාෂාවෙන් ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමට ඔවුන්ට හැකි වනුයේ කෙසේ ද සහ නිදහස් හා විවෘත සන්නිවේදන ක්‍රියාවලියක දී අනෙකුත් සංස්කෘතික කණ්ඩායම් සමඟ අර්ථවත් ලෙස අන්තර් ක්‍රියා කිරීමට ඔවුන්ට හැකි වනුයේ කෙසේ ද යන්න.

මූලාශ්‍රය : යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ඇසුරෙන් සකසන ලදි.

35. 2001 Universal Declaration of Cultural Rights. https://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/ CulturalDiversity.aspx and http://portal.unesco.org/en/ev.php-URL_ID=13179&URL_DO=DO_TOP- IC&URL_SECTION=201.html

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව (1 කොටස) තුළ මින් ඉහත දී සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකි ය. 1 කොටසෙහි ලැයිස්තුව අධ්‍යයනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

- ඉගෙනුම, ගවේෂණය හා නියැලීම සඳහා යුනෙස්කෝ අන්තර් සංස්කෘතික සංවාද වේදිකාව ගවේෂණය කිරීමට සිසුන්ට මග පෙන්වන්න : https://en.unesco.org/interculturaldialogue/. මෙම වේදිකාව මගින් වෙනත් සංස්කෘතීන් පිළිබඳ ඉගෙන ගැනීමට සහ අභිප්‍රායසහිත සංවාදයකට සහභාගී වීමට විවිධ ඉගෙනුම් ක්‍රියාකාරකම් සහ අවස්ථා ලබා දෙයි.
- උරුමයන් ආරක්ෂා කිරීම සහ නිර්මාණශීලිත්වය අභිවර්ධනය කිරීම යුනෙස්කෝ විධිනියෝගයේ ප්‍රමුඛතම කාර්ය වන අතර එකී කාර්ය, සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම ප්‍රවර්ධනය පිළිබඳ යුනෙස්කෝ කර්තව්‍යයෙහි වැදගත් කොටසක් වේ. උරුමය, කලාවන් සහ නිර්මාණශීලිත්වය පිළිබඳ යුනෙස්කෝහි ප්‍රතිමානක ලේඛන පරිශීලනය කරන්න: https://en.unesco.org/themes/protecting-our-heritage-and-fostering-creativity. ඔබේ රටේ හෝ ප්‍රජාව තුළ මෙම නෛතික ලේඛන ක්‍රියාවට නංවන ආකාරය විමර්ශනය කර සාකච්ඡා කරන්න.
- හෙන්රි ජෙන්කින්ස් (Henry Jenkins) නිර්වචනය කරන ආකාරයට සහභාගීත්ව සංස්කෘතියක් යනු කලාත්මක ප්‍රකාශනයට සහ පුරවැසි නියැලීමට සාපේක්ෂව අඩු බාධාවන් ඇති කරන්නා වූ ද, කිසියම් කෙනෙකුගේ නිර්මාණ නිර්මාණය කිරීමට හා බෙදා ගැනීමට ප්‍රබල සහයෝගයක් ලබා දෙන්නා වූ ද, දැනුම බෙදා ගැනෙන, පුරවැසියන් තම දායකත්වය වැදගත් යැයි විශ්වාස කරන සහ එකිනෙකා සමග සමාජීය සම්බන්ධතා මට්ටමක් ඔවුන්ට හැඟෙන විධිමත් හෝ අවිධිමත් උපදේශනය පවතින්නා වූ ද සංස්කෘතියකි[36]. එකී සහභාගීත්ව සංස්කෘතිය පහත සඳහන් ලක්ෂණවලින් සමන්විත වේ:
    - අනුබද්ධතාව (affiliation)
    - ප්‍රකාශන (expressions)
    - සහයෝගී ගැටලු-නිරාකරණය
    - සංසරණය/බෙදා ගැනීම/බෙදා හැරීම

මෙම රාමුව 2000 ගණන්වල මුල් භාගයේ දී මාධ්‍ය අධ්‍යාපනය හා සම්බන්ධව සකස් කරන ලදි. (වර්තමානයේදී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ පුළුල් සංකල්පය තුළ අන්තර්ගත වේ). මෙමගින් සංස්කෘතික හුවමාරුව, ඉගෙනීම සහ සංවාදය සබල කරන ආකාරය ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

සාම්ප්‍රදායික සාක්ෂරතාව සහ විචාරශීලී විශ්ලේෂණය මත ගොඩනැගෙන පහත සඳහන් කුසලතා හෙන්රි ජෙන්කින්ස් විසින් යෝජනා කරනු ලබයි.

- **ක්‍රියා කිරීම** - ගැටලු නිරාකරණය කිරීමේ ආකාරයක් වශයෙන් කෙනෙකුගේ වටපිටාව සමඟ අත්හදා බැලීම් සිදු කිරීමේ හැකියාව.
- **කාර්යසාධනය** - ක්ෂණ නිර්මාණ (improvisation) සහ සොයාගැනීමේ (discovery) අරමුණ සඳහා විකල්ප අනන්‍යතා අනුගමනය කිරීමේ හැකියාව.
- **සමාකරණය** (simulation) - තථ්‍ය ලෝක ක්‍රියාවලීන්හි ගතික මොඩලයන් අර්ථකථනය කිරීමට සහ ගොඩනැගීමට ඇති හැකියාව.
- **අනුයෝජනය** (appropriation) - මාධ්‍ය අන්තර්ගත අර්ථවත් ආකාරයට නියැදි කිරීමට සහ නැවත සංකලනය කිරීමට ඇති හැකියාව.

36. Confronting the Challenges of Participatory Culture: Media Education for the 21st Century. https://www.macfound.org/media/article_pdfs/jenkins_white_paper.pdf. ඇසුරෙන් සකස් කරන ලදි.

- **බහු කාර්යකරණය** - යම් අයෙකුගේ පරිසරය පරිලෝකනය කිරීමේ හැකියාව සහ අවශ්‍ය පරිදි ප්‍රමුඛ තොරතුරු වෙත අවධානය විතැන් කිරීමේ හැකියාව.
- **විභාජිත ප්‍රජානනය** (distributed cognition) - මානසික ධාරිතාවන් පුළුල් කරන මෙවලම් සමඟ අර්ථවත් ලෙස අන්තර්ක්‍රියා කිරීමේ හැකියාව.
- **සාමූහික බුද්ධිය** - දැනුම රැස් කිරීමේ හැකියාව සහ පොදු අරමුණක් සඳහා අන් අය සමග සටහන් සංසන්දනය කිරීමේ හැකියාව.
- **විනිශ්චය** - විවිධ තොරතුරු මූලාශ්‍රවල විශ්වසනීයත්වය ඇගයීමට ඇති හැකියාව.
- **අන්තර්මාධ්‍ය සංචාලනය** (transmedia navigation) - බහුවිධ ප්‍රකාරතා හරහා ඇති අන්තර්ගත ප්‍රවාහය අවබෝධ කර ගැනීමේ හැකියාව.
- **ජාලකරණය** - තොරතුරු සෙවීමට, සංස්ලේෂණය කිරීමට සහ බෙදා හැරීමට ඇති හැකියාව.
- **සාකච්ඡාව** - බහුවිධ පර්යාලෝක තේරුම් ගනිමින් සහ ඒවාට ගරු කරමින්, සහ විකල්ප ප්‍රතිමාන වටහා ගනිමින් සහ අනුගමනය කරමින් විවිධ ප්‍රජාවන් හරහා ගමන් කිරීමේ හැකියාව.

මූලාශ්‍රය: Jenkins et al (2006) Confronting the Challenges of Participatory Culture: Media Education for the 21st Century ඇසුරෙන් සකස් කරන ලදි[37].

ශික්ෂකයන් විසින් මෙම එක් එක් යෝජිත කුසලතා වටා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සකස් කර ඒවා සංස්කෘතික සම්පාදනයට හා ව්‍යවසායකත්වයන්ට සම්බන්ධ කළ යුතු ය. ඒවා සංස්කෘතික හා නිර්මාණාත්මක කර්මාන්තයන්හි මාර්ගගත සහ මාර්ග අපගත දෙයාකාරයේම සම්ප්‍රේෂණයට අදාළ වන්නේ ද? සංස්කෘතික සහ කලාත්මක නිර්මාණ සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ඇතැම් මූලික ප්‍රශ්න අදාළ වන්නේ කෙසේ ද? සංස්කෘතික සන්දර්භය නිර්මාණය කළේ කවුරුන් ද? කුමන අරමුණක් සඳහා ද? සන්දේශ මොනවා ද? ලබා දී ඇති උපකාරක සාක්ෂි මොනවා ද? එයට ඇතුළත් වන්නේ කුමක් ද? කුමක් අත්හරිනු ලැබ තිබිය හැකි ද? ප්‍රතිලාභ අත්වන්නේ කවුරුන්ට ද? මෙම අන්තර්ගතයෙන් බලපෑමට ලක්විය හැක්කේ කවුරුන් ද?

- යුනෙස්කෝ සම්පත්, අන්තර් සංස්කෘතික නිපුණතා: සංකල්පීය සහ මෙහෙයුම් රාමුවෙහි https://en.unesco.org/ interculturaldialogue /resources/132 (p.10-27) ලැයිස්තුගත කර ඇති අන්තර් සංස්කෘතික නිපුණතාවලට අදාළ සංකල්ප, නිපුණතා සහ මූලධර්ම පිළිබඳ සලකා බලන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හා සම්බන්ධ ඉහත හෙන්රි ජෙන්කින්ස්ගේ සහභාගීත්ව සංස්කෘතික කුසලතාවලට මේවා සම්බන්ධ වන්නේ කෙසේදැයි විමසුමට ක්‍රියාකාරකම් සකස් කරන්න.
- ඩිජිටල් තාක්ෂණය පැරණි කථාඛ්‍යානයට (storytelling) නව ජවයක් ලබා දෙයි. උදාහරණයක් වශයෙන් සමාජ මාධ්‍ය ඉතා විශාල ඩිජිටල් දර්ශන සැලසුම් සාරාංශය මෙන්ම 'චක්‍රීය සන්නිවේදනයක්' වේ. යුනෙස්කෝ සහ Routledge Focus විසින් කථා කව[38] (Story Circles) නම් ඉගෙනුම් ක්‍රමය ප්‍රතිනිර්මාණය කර ඇත. කථා කව ශිල්ප ක්‍රමය මගින් ගරුත්වය, සවන්දීම, කුතුහලය, ස්වයං හා අන්‍ය අවබෝධය, අන්තරාවලෝකනය, බෙදා ගැනීම, සහකම්පනය, සහ සබඳතා ගොඩනැගීම ඇතුළු අන්තර් සංස්කෘතික නිපුණතා සංවර්ධනයෙහි මූලිකාංග කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. අන්තර් සංස්කෘතික නිපුණතා සංවර්ධනය සඳහා වූ අත්පොතෙහි සඳහන් අන්තර් සංස්කෘතික නිපුණතා සංවර්ධනය සඳහා කථා කව පිළිබඳව වැඩිදුර පරිශීලනය කරන්න https://unesdoc.unesco.org/ark:/48223/pf0000370336. මෙම ප්‍රවේශය භාවිත කරමින් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සකසන්න. තාක්ෂණික සහ ආයතනික සන්දර්භයට අනුවර්තනය කර ගත හැකි ප්‍රේරක (prompts) භාවිත කරන්න. නිදසුනක් වශයෙන්, කථා කව අදහස නිරූපණය කෙරෙන නිදහස් හා විවෘත වීඩියෝ සාකච්ඡා මෙවලමක් වන Flipgrid නිර්මාණාත්මක සම්පත පරිශීලනය කරන්න.

37. Confronting the Challenges of Participatory Culture: Media Education for the 21st Century https://www.macfound.org/media/article_pdfs/jenkins_white_paper.pdf. p. 56.
38. Manual for Developing Intercultural Competences, https://unesdoc.unesco.org/ark:/48223/ pf0000370336. Darla K. Deardorff (2020) ඇසුරෙන් සකස් කරන ලදි.

- ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් විසින් සංස්කෘතික නිර්මාණශීලීත්වය සහ ව්‍යවසායකත්වය තුළ පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන්ගේ භූමිකා සැලකිල්ලට ගත යුතු ය. එක් වර්ගයක අන්තර්ගත සපයන්නෙකු තෝරා ගැනීමට සහ සංස්කෘතික නිෂ්පාදන හා බෙදා හැරීමේ සිද්ධීන් විමර්ශනය කිරීමට ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදන්න. ඉහත මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රශ්න සහ 1 කොටසෙහි, එනම් ශික්ෂකයන් හා ශිෂ්‍යයන් සඳහා වන, මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ, විෂයමාලා හා නිපුණතා රාමුවෙහි ලැයිස්තුගත කර ඇති විවිධ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා යොදා ගන්න.
- මහජන සේවා මාධ්‍ය (Public Service Media) යනු ගුණාත්මක සංස්කෘතික අන්තර්ගතයන්හි ප්‍රධාන සම්පාදකයන්, බෙදාහරින්නන්, අධිකාරීවරුන්, ප්‍රචාරය කරන්නන් සහ අතරමැදියන් වේ. තම රටේ සහ/හෝ ප්‍රජාව තුළ මෙය කෙතරම් දුරට සිදු වේද යන්න විමර්ශනය කිරීමට ශික්ෂකයන්ට සහ ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. ඔවුන්ට පිළිතුරු දීමට ප්‍රශ්න මාලාවක් සූදානම් කරන්න. තෝරාගත් සංස්කෘතික අන්තර්ගතය තුළ විවිධ ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්, වයස් කාණ්ඩ සහ ජනවාර්ගික කණ්ඩායම් නියෝජනය වන ආකාරය කෙබඳු ද යන්න ඔවුන් විසින් සලකා බැලිය යුතු ය. ශික්ෂකයන්ට සහ ශිෂ්‍යයන්ට ඔවුන්ගේ සොයාගැනීම්වලට ප්‍රතිචාර වශයෙන් කුමන ක්‍රියාමාර්ග ගත හැකි ද? ඔවුන් ඉදිරිපත් කරන නිර්දේශ මොනවා ද? මෙම ක්‍රියාවලිය සඳහා ඇති පහත දැක්වෙන යුනෙස්කෝ සම්පත් සලකා බලන්න: 2018 ගෝලීය වාර්තාව, සංස්කෘතික ප්‍රතිපත්ති නැවත හැඩගැස්වීම: නිර්මාණශීලිත්වය සහ සංවර්ධනය අභිවර්ධනය කිරීම, https://en.unesco.org/creativity/global-report-2018.
- සංස්කෘතික ප්‍රතිපත්ති නැවත හැඩගැස්වීම: නිර්මාණශීලිත්වය සහ සංවර්ධනය පිළිබඳ 2018 ගෝලීය වාර්තාවේ https://en.unesco.org/creativity/global-report-2018., ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව: ක්‍රියාමාර්ග ගැනීමේ දී මගහැරීම් නමැති පරිච්ඡේදයේ, සංස්කෘතිය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා පරතරයක් පවතී යන කොටසෙහි දක්වා ඇති සංඛ්‍යාලේඛන/අනාවරණ පරීක්ෂා කර බලන්න. මාධ්‍ය කාර්යමණ්ඩල බඳවා ගැනීමේ දී සහ මාධ්‍ය අන්තර්ගතය තුළ කාන්තාවන් නියෝජනය වන ආකාරය පිළිබඳ සංඛ්‍යාලේඛන සොයන්න. ඔබට සොයාගත හැක්කේ කුමක් ද? මේවා සම්බන්ධ වන්නේ කෙසේ ද? සාකච්ඡා සඳහා මග පෙන්විය යුතු ය.
- කලාත්මක නිදහස යන්නට අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු වෙත ප්‍රවේශය සම්බන්ධ වේ. කලාත්මක නිදහස සංස්කෘතික සම්පාදකයන්ගේ සහ ග්‍රාහක පිරිස්වල අයිතිවාසිකම්වලට සම්බන්ධිතය. ඩිජිටල් පරිසරයන්හි දී ද එය ඉතා වැදගත් වේ. ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා ප්‍රාදේශීය, ජාතික හෝ ගෝලීය පරිසරයෙහි කලාත්මක නිදහස පිළිබඳ සාර්ථකත්වයන්, අභියෝග සහ නිර්දේශ සාකච්ඡා කිරීමට මඟ පෙන්වන්න.
- YouTube වැනි අන්තර්ගත සපයන්නන්ට, ඔවුන්ට සහ ඔවුන්ගේ සහදායකයන්ට ඇති වාණිජ තර්කන (commercial logics) කවරේ ද යන්න, තම අන්තර්ගත පිටුපස සැඟවුණු අනුග්‍රාහකයන් සිටිය හැකි 'බලපෑම්කරුවන්' පිළිබඳ සංස්කෘතික සංසිද්ධිය ද සමග සාකච්ඡා කරන්න. YouTube මගින් අන්තර්ගතය නිර්දේශ කරනු ලබන්නේ කෙසේ ද? එමෙන්ම YouTube ඇල්ගොරිතම මගින් එම වේදිකාවේ අන්තර්ගතයන්හි නියැලීම රඳවා ගැනීමට සහ දීර්ඝ කිරීමට උත්සාහ දරන්නේ කුමන හේතුවක් නිසා ද?

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්.
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, විලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකා
- ගවේෂණාත්මක කථාව/වාර්තා

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා සහභාගිත්වය
- තරුණ හා සංස්කෘතික ව්‍යවසායකත්වය
- කලා අධ්‍යාපනය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව
- සංස්කෘතිය, සංවාදය සහ තිරසර සංවර්ධන ඉලක්ක
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ආගමික සංවාදය.

5වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, ඉගැන්වීම සහ යාවජීව ඉගෙනුම

කාලසීමාව: පැය 4 යි

ප්‍රධාන මාතෘකා

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ මූලික අවබෝධය සහ උපදෙස් හා ඉගෙනුම් ක්‍රියාවලිය
- යාවජීව ඉගෙනුම සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා කුසලතා සඳහා පහසුකම් සැලසීම
- මාධ්‍ය හා තොරතුරු සක්ෂරතාව පිළිබඳ හා ඒ මගින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ශික්ෂකයන් සඳහා ශික්ෂණවිද්‍යා ප්‍රවේශ.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කළ පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩිදියුණු කළ හැකි ක්‍රම හඳුනා ගැනීම: ඉගෙනුමෙහි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා දැනුම සුසාධ්‍යකරණ උපායමාර්ග සකස් කිරීම.
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ආශ්‍රිත ශික්ෂණවිද්‍යා ප්‍රවේශ ගවේෂණය කිරීම.
- මෙම ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කරන විශේෂිත ක්‍රියාකාරකම් ගොඩනැගීම.

මෙම ඒකකය මගින් ඉලක්කගත නිපුණතා මට්ටම:

- මූලික /අන්තර්මධ්‍ය

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ හා ක්‍රියාකාරකම්

අධ්‍යාපන වටපිටාවන් තුළ තොරතුර මාධ්‍ය සහ ඩිජිටල් කුසලතා වැඩි දියුණු කිරීම සාමාන්‍යයෙන් අභිනිර්මාණවාදී න්‍යාය (constructivist theory) මත පදනම් වේ. එය වනාහී තීරණ ගැනීම සඳහා තොරතුරු තෝරා ගනිමින් සහ වෙනස් කරමින් අභ්‍යාසලාභීන් සක්‍රීය ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සහභාගි වන පරිපූර්ණ ප්‍රවේශයකි[39] (Lau, 2018), "සපයා ඇති තොරතුරුවලින් ඔබ්බට ගොස් අත්දැකීම්වලට අර්ථයක් සහ ක්‍රමික සකස් කිරීමක් ලබා දෙනු ලබන ඔහුගේ හෝ ඇයගේ ප්‍රජානන ආකෘතියක් කෙරෙහි එමඟින් විශ්වාසය තබනු ලබයි [Jerome Brunner, 12]." ඉගෙනුම් අවකාශය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළ විවිධ ඉගෙනුම් අරමුණු සහ ඊළඟ ඡේදවල සම්පිණ්ඩනය කර ඇති ඉගෙනුම් ප්‍රවේශ අනුව ශිෂ්‍යකයන්ට යොදා ගත හැකි අභිනිර්මාණවාදී න්‍යායන් කිහිපයක් පහත දැක්වේ (Bruner, 1960).

39. (Lau, 2018) http://www.ala.org/acrl/sites/ala.org.acrl/files/content/publications/whitepapers/GlobalPer- spectives_InfoLit.pdf]

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීම සඳහා ශික්ෂණවිද්‍යා ප්‍රවේශ

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව (1 කොටස) තුළ මින් ඉහත සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකි ය. 1 කොටසෙහි ලැයිස්තුව අධ්‍යයනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

ක්‍රියාකාරකම්

1. ඉහත ලැයිස්තුගත කර ඇති මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඉගැන්වීම සඳහා පවතින ශික්ෂණවිද්‍යා ප්‍රවේශ 10න් තමන්ට හුරුපුරුදු ඒවා හඳුනාගෙන විස්තර කරන ලෙසත්, කණ්ඩායම් වැඩ හරහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි තම සාර්ථකත්වයට හේතුවන ප්‍රධාන සංරචක හඳුනා ගන්නා ලෙසත් ශික්ෂකයන්ට පවසන්න. ඔවුන්ගේම කාර්යයෙහි මෙම උපායමාර්ග නිරූපණය කෙරෙන ක්‍රියාකාරකම් ගොඩනැගීම සඳහා ශික්ෂකයන්ට මග පෙන්වන්න.

2. විවෘත ප්‍රවේශ මහජන මාධ්‍ය තුළ ලිඛිත ලේඛනයක් සකස් කර ප්‍රකාශයට පත් කිරීමට සිසුන්ට හැකියාව වර්ධනය වන පරිදි විකිපීඩියාවේ ලිපියක් (සටහනක් (entry)) නිර්මාණය කිරීම සඳහා කණ්ඩායමක් වශයෙන් සිදු කරන ඉගෙනුම් ක්‍රියාකාරකමක් පවරන්න. සමාන මාතෘකාවක් සම්බන්ධයෙන් සහයෝග යෙන් කටයුතු කරන ලෙස ශිෂ්‍යයන්ට පැවසිය හැකි ය. උදාහරණයක් ලෙස, ඔවුන්ගේ ප්‍රජාවේ ඉතිහාසය ලේඛනගත කර එක් එක් කණ්ඩායමට කටයුතු කරගෙන යාමට නිශ්චිත උප මාතෘකාවක් ලබා දිය හැකි ය. මාතෘකාවක් තෝරාගෙන, ඒ පිළිබඳ විශ්වසනීය තොරතුරු මූලාශ්‍ර හඳුනා ගනිමින් ඒ පිළිබඳ පර්යේෂණය කරන ලෙසත්, අනතුරුව විකිපීඩියාහි ඇතුළත් කිරීමට සරල පාඨයක් ලිවීම අරඹන ලෙසත් ශිෂ්‍යයන්ට පවසන්න. එම පාඨය විකිපීඩියා අගයන් සහ සංස්කාරක මූලිකාංගයන්ට අනුකූල විය යුතු අතර අනන්‍ය විය යුතු ය. අන්‍යාකාරයකින් කිවහොත්, දැනටමත් විකිපීඩියා තුළ නොමැති දෙයක් වීම වැදගත් වේ. මෙම ක්‍රියාකාරකම ගොඩනැගීම සඳහා උපදෙස් පහත දැක්වේ.

   අ. විකිපීඩියා ප්‍රතිපත්ති අවශ්‍යතා පරිශීලනය කර "ලිපියක්" උඩුගත කරන්න, එය මුල් නිර්මාණයක් විය යුතු අතර උපුටා දැක්වීම් සහ භාවිත කළ යොමු සඳහන් කළ යුතු ය. එකම විෂය පිළිබඳ අන්තර්ජාල වීඩියෝ නරඹා, වෙනත් ලිපි ලියා ඇත්තේ කෙසේදැයි එම අදාළ සමාහාරය භාවිතයෙන් පරීක්ෂා කරන්න.

   ආ. සංස්කරණය කිරීම, පින්තූර උඩුගත කිරීම සහ හැඩතල ගැන්වීම පිළිබඳ ඉගෙන ගැනීමට https://es.wikipedia.org/wiki/Help:Tutorial යන සබැඳිය භාවිත කරමින් "Help: Wikipedia Tutorial" කොටස වෙත පිවිසෙන්න.

   ඇ https:// en.wikipedia.org/wiki/Wikipedia:Article_wizard යන සබැඳියෙන් "Wizard for creating Wikipedia articles" යන කොටස විස්තරාත්මකව කියවන්න .

   ඈ. https://en.wikipedia.org/wiki/ Wikipedia :About _the_sandbox සබැඳිය මගින් ඔබගේ විකිපීඩියා පිරික්සුම් ප්‍රදේශය (test area) සෑම විටම භාවිත කරන්න.

   ඉ. ඔබ අතරමං වී ඇතැයි හැඟේ නම් වෙබයෙහි විකිපීඩියා ලිපි සකස් කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ වීඩියෝ නිබන්ධන බලන්න.

3. ස්වකීය ඉගෙනුම් ක්‍රියාවලීන්හි අන්තර්ගත සපයන ආයතන වැදගත් වන්නේ මන්ද යන්න සහ මෝටර් රථයක් වැනි යමක් විකිණීමේ/මිලදී ගැනීමේ ක්‍රියාවලියේ දී භාවිත කිරීමට සුදුසුම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ මූලාශ්‍ර මොනවාද යන්න විශ්ලේෂණය කිරීමේ කාර්යය ශිෂ්‍යයන්ට පවරන්න. විකුණුම්කරුවන්, ගනුදෙනුකරුවන් සහ රථවාහන බලධාරීන් ලෙස ඔවුන්ගේ භූමිකාව ලේඛනගත කිරීම සඳහා තොරතුරු සහ මාධ්‍ය මූලාශ්‍ර හඳුනා ගැනීම පිණිස ශිෂ්‍යයන් කණ්ඩායම්ගත කළ හැකි ය.

4. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා කුසලතා, අභ්‍යාසලාභීන්ගේ ඉගෙනුම සඳහා උපකාරී වන්නේ කෙසේ ද යන්නට පිළිතුරු සැපයීම සඳහා ඉගෙනුම් ක්‍රියාවලිය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා කුසලතාවන්හි භූමිකාව පිළිබඳව ලේඛනගත (documentary) සෙවීමක් සිදු කරන්න. වඩා හොඳ තීරණ ගැනීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව අත්‍යවශ්‍ය වන්නේ ඇයි? එමෙන්ම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් නිපුණ පුද්ගලයන්ට යාවජීව ඉගෙනුම වඩාත් පහසු වන්නේ ඇයි? ඔබගේ ලේඛනගත සෙවීම පදනම් කරගෙන ඔබගේ සොයා ගැනීම් සාරාංශ කිරීමට ප්‍රශ්න හා පිළිතුරු සහිත වගුවක් නිර්මාණය කරන්න.
5. COVID-19 මුහුණු ආවරණ භාවිතයේ පාරිසරික බලපෑම පිළිබඳ තොරතුරු සොයන්න. ජනමාධ්‍ය (5) සහ පොත් හා සඟරා තුළ (5) සාදන ලද තොරතුරු අයිතම දහයක් සොයන්න. විස්තරාත්මක හා වාස්තවික දත්ත, උපුටා දැක්වීම් සහ යොමු කිරීම් සම්බන්ධයෙන් වඩාත්ම විශ්වාසදායක මූලාශ්‍ර මොනවාදැයි පරීක්ෂා කරන්න. ඒවායේ විශ්වසනීයත්වය සංසන්දනය කරමින් මූලාශ්‍ර 10 සඳහා තීරුවක් ද, සංඛ්‍යාලේඛන, උපුටා දැක්වීම සහ මූලාශ්‍ර දැක්වීම් සඳහා තීරු ද සහිතව වගුවක් නිර්මාණය කරන්න. එක් එක් මූලාශ්‍රයෙහි අදෘශ්‍ය මූලිකාංග සඳහා 0 වශයෙන් ද සොයාගත් මූලිකාංග සඳහා සංඛ්‍යාව වශයෙන් ද ශ්‍රේණිගත කරන්න. වඩා විශ්වසනීය වූයේ කුමන මූලාශ්‍ර දැ යි පැහැදිලි කරන්න.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්.
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකා
- ගවේෂණාත්මක කථාව/වාර්තා

මෙම මොඩියුලය සඳහා සම්පත්

Access to information resources from UNESCO https://en.unesco.org/themes/137455/publications/all

Art 1 African Commission on Human and Peoples' Rights Resolution on the Right to Freedom of Information and Expression on the Internet in Africa - ACHPR/Res 362(LIX) 2016, meeting at its 59th ordinary session, Banjul, The Gambia.

Article 19 'Freedom of expression unfiltered: How blocking and filtering affect free

speech' Policy Brief December 2016 7.

Civic Education for Media Professionals: A Training Manual, http://unesdoc.unesco. org/images/0018/001804/180402e.pdf

Committee of Concerned Journalists, www.concernedjournalists.org/tools/ principles/ rights

Directory of Open Access Journals. https://doaj.org/

Empowering students for just societies: A handbook for primary school teachers, UNESCO, https://unesdoc.unesco.org/ark:/48223/pf0000370902

Empowering students for just societies: A handbook for secondary school teachers, UNESCO, https://unesdoc.unesco.org/ark:/48223/pf0000370901

Evolution and History of Media and Information Literacy Lau, J. and Grizzle, A. (2019)

Freedom of Information around the Global UNESCO resources, http://www.unesco. org/new/en/

communication-and-information/freedom-of-expression/freedom-of information/

Flipgrid which is a free Intercultural Competences: Conceptual and open video discussion tool, Operational Framework, multiple languages https://info.fipgrid.com/ https://en.unesco.org/interculturaldialogue/resources/132

Journalism.org, http://www.journalism.org/resources/principles

Koltay, T. (2011). The media and the literacies: media literacy, information literacy, digital literacy. Sage Journals, 33(2), 211-221. Retrieved from https://doi. org/10.1177/0163443710393382

LA Referencia (Red de Repositorios Abiertos a la Ciencia). http://lareferencia.info/es

McLuhan & Fiore 1967. The Medium is the Message: An Inventory of Effects. Penguin Modern Classics

Media and Information Literacy: A practical guide for trainers,

https://www.dw.com/downloads/38871690/dwaeditionmilweb.pdf

Media Development Indicators: A framework for assessing media development, http:// unesdoc.unesco.org/images/0016/001631/163102e.pdf All references to Kosovo in this document should be understood to be in the context of United Nations Security Council resolution 1244 (1999)".

Media Education: A Kit for Teachers, Students, Parents and Professionals, http:// unesdoc.unesco.org/images/0014/001492/149278e.pdf

Media Legal Defence Initiative (MLDI). (2018). Mapping Digital Rights and Online Freedom of Expression in East, West and Southern Africa. Retrieved February 3, 2021, from https://10years.mediadefence.org/wp-content/uploads/2019/07/Mapping-digital-rights-litigation_Media Defence_Final.pdf

Nineteen Eighty-Four (film, 1984) https://www.imdb.com/title/tt0087803/?ref_=nv_sr_ srsg_0

"Region: Latin America." In: Association of College and Research Libraries. Working Group on Global Perspectives for Information Literacy, Student Learning and Information Literacy Committee. Lau, J. (2017). *Global Perspectives on Information Literacy: Fostering a Dialogue for International Understanding*. Chicago, IL: Association of College and Research Libraries. pp. 60-68.

Report of the Special Rapporteur on the Promotion and Protection of the Right to Freedom of Opinion and Expression, David Kaye, the regulation of online 'hate speech', 74th session, Agenda item 70(b), A/74/486 (9 October 2019) 7,

https://www.ohchr.org/Documents/Issues/Opinion/A_74_486.pdf (accessed 23 January 2020).

Right to Information – Good Law and Practice, an authoritative collection of information and resources on right to information, https://www.right2info.org/

Teaching and Learning with Twitter, co-authored by Twitter and UNESCO

https://about.twitter.com/content/dam/about-twitter/company/twitter-for-good/en/teaching-learning-with-twitter-unesco.pdf

Teaching Right to information for advance learners, https://www.right2info.org/ resources/teaching-rti

The Fifth Estate (film, 2013) https://www.imdb.com/title/tt1837703/

The Process of Education. Bruner, J. S. (1960). Cambridge, MA: Harvard University Press.

The Rapprochement of cultures: roadmap? https://unesdoc.unesco.org/ark:/48223pf0000244334

Towards Information Literacy Indicators: Conceptual Framework Paper, www.uis. unesco.org/template/pdf/cscl/InfoLit.pdf

Understanding Informational Literacy:A Primer,

http://unesdoc.unesco.org images/0015/001570/157020e.pdf

Big6, www.big6.com

Intercultural Competences: Conceptual and Operational Framework, multiple languages https://en.unesco.org/interculturaldialogue/resources/132

UNESCO Intercultural Dialogue Platform, Learn, Explore, Engage, https://en.unesco. org/interculturaldialogue/

World Trends in Freedom of Expression and Media Development, https://en.unesco. org/world-media-trends

Youth for Human Rights Information Kit free resource and self-instructional guide, https://www.youthforhumanrights.org/request-info/educators-kit.html

2වන මොඩියුලය

තොරතුරු හා තාක්ෂණය අවබෝධ කර ගැනීම

"උසස් තත්ත්වයේ තොරතුරු වෙත ප්‍රවේශවීමට සහ විවාද කිරීමට, සාකච්ඡා කිරීමට, විවේචනය කිරීමට , සහකම්පනයට, සහන දීමට පුරවැසියනට එකට එක්වීමේ හැකියාවක් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් උදෙසා අවශ්‍ය වේ."

- සමන්තා බ්‍රැඩ්ෂෝ සහ ෆිලිප් හොවාර්ඩ්,

2019 Global Inventory of Organized Social Media Manipulation

පසුබිම සහ තාර්කිකය

පසුගිය දශක දෙක තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ අතිශය සීඝ්‍ර වර්ධනයත් සමගම, සාම්ප්‍රදායික මාධ්‍ය (ගුවන්විදුලිය, රූපවාහිනිය සහ පුවත්පත්) ළඟාවන ග්‍රාහක ප්‍රමාණය සහ බලපෑම පුළුල් වීමක් හා පරිවර්තනයක් සිදුව ඇති අතර තොරතුරු සහ ප්‍රවෘත්ති අන් කවරදාටත් වඩා පුළුල් ලෙස ලබා ගත හැකි ය. මෙම තොරතුරු යුගයේ දී, ජනමාධ්‍යවේදීහු සහ තොරතුරු වෘත්තිකයෝ ඔවුන්ගේ ආසන්නතම ග්‍රාහක පිරිසෙන් ඔබ්බට ගොස් තොරතුරු වෙත ප්‍රවේශය ලබා දීමෙහි ලා සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජය, සාමය සහ තිරසර සංවර්ධනය සඳහා වන පාලනයෙහි පුරවැසි සහභාගීත්වය සුසාධ්‍ය කිරීමෙහි ලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරති.

සාම්ප්‍රදායික සහ මාර්ගගත පුවත් අන්තර්ගත සපයන්නන්ගේ භූමිකා සහ කාර්යයභාර මෙම මොඩියුලය මගින් සාකච්ඡා කෙරේ. ස්වකීය අදහස් ප්‍රකාශනයේ සහ තොරතුරු දැනගැනීමේ නිදහස ක්‍රියාත්මක කිරීමට පුද්ගලයන් සහ සමාජ සවිබලගැන්වීම, පුද්ගලයන්ට අසත්‍යය හඳුනා ගැනීමට, සිවිල් නියෝජිතායතන හා පුරවැසිභාවය ගොඩනැගීමට සහ විනිවිදභාවය සහ වගවීම ඉල්ලීමට, සහ තොරතුරු ආචාරධර්ම පුරුදු පුහුණු කිරීම වැනි භූමිකා සහ කාර්ය අතරට ඇතුළත් වේ. එමෙන්ම සමාජ තුළ සමාජ පරිවර්තනය සඳහා තාක්ෂණය දායක විය හැකි ආකාරය පිළිබඳව මෙමගින් සලකා බැලේ. මේ සියල්ල ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක

මූලික ප්‍රතිමානක කොන්දේසි වේ. ප්‍රවෘත්ති මාධ්‍යකරණය එදත් අදත්: සත්‍යය සෙවීමේ සහ කථා කිරීමේ, ගැටලු හා සිදුවීම් පිළිබඳ අවබෝධයක් ඇති කිරීමේ, අපයෝජනයන්ට එරෙහිව අධීක්ෂකයකු ලෙස සේවය කිරීමේ, මහජන විවාදය සබල කරන්නෙකු ලෙස කටයුතු කිරීමේ, පුරවැසි සහභාගීත්වය සඳහා සුසාධ්‍ය කිරීමේ සහ, මහජන මත විස්තෘත කිරීමේ කාර්යයභාරයක නියැලෙන අතර එකී භූමිකා පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම මොඩියුලය ඔස්සේ ලබා දෙයි.

තොරතුරු දැනගැනීමේ නිදහස සහ අදහස් ප්‍රකාශනයේ නිදහස (මාධ්‍ය නිදහස ද ඇතුළුව) වැනි ගැටලු මෙන්ම ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී උපයෝගීතාව, අන්තර්කරණය, නිරවද්‍යතාව, වගවීම සහ පාරදෘශ්‍යතාවෙහි ඇති වැදගත්කම පිළිබඳව තවදුරටත් ගවේෂණය කිරීමට මෙම මොඩියුලය මඟින් ශික්ෂකයන්ට හැකියාව ලබා දෙනු ලැබේ. අවසාන වශයෙන්, සමාජ ස්වාධිකාර සහ කාරකත්ව මානයන් ද පරීක්ෂා කරනු ලැබේ.

අද බොහෝ මිනිසුන් ජීවත් වන්නේ අසත්‍ය හෝ අනිසි ලෙස හසුරුවන ලද අන්තර්ගත පැතිරීම මඟින් අර්ධ වශයෙන් සංලක්ෂිත පශ්චාත්-සත්‍ය යුගයකය යන සංකල්පය පැන නැඟී ඇත. මෙම මොඩියුලය මඟින් මෙම සංසිද්ධිය සහ තතු-පිරික්සීමේ අධ්‍යයන ක්ෂේත්‍රය පිරික්සා බැලේ. සත්‍යාපනය, ස්වාධීනත්වය හා වගවීමේ ස්වභාවය සහ, අනෙකුත් තොරතුරු හුවමාරු ක්‍රමවලින් ජනමාධ්‍යවේදය වෙනස් වන්නේ කෙසේ ද යන්න ඉන් තවදුරටත් පැහැදිලි කරයි.

දැවැන්ත ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් ලබා දෙන නව තාක්ෂණ සමඟින් බොහෝ දුරට වාසි ලබා ගනී, එමෙන්ම පරිශීලක විසින් ජනිත අන්තර්ගතයේ සම්ප්‍රාප්තිය සහ පුරවැසි මාධ්‍යවේදයෙහි සහභාගීත්වය ද අපි අත් දකින්නෙමු. මෙම සංසිද්ධිය අපට බහුවිධ මත සහ පර්යාලෝක ඉදිරිපත් කරන අතරම, එය බොහෝ අන්තර්ගත මූලාශ්‍ර විචාරශීලී ඇගයීමට ලක් කිරීමේ අවශ්‍යතාව ද සවිගන්වයි. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂර පුද්ගලයන් වශයෙන්, විශේෂයෙන්ම තමන්ට ලැබෙන ප්‍රවෘත්ති විශ්ලේෂණය කිරීමේ සහ ඇගයීමේ හැකියාව, සාධාරණ හා නිවැරදි ප්‍රවෘත්ති වාර්තාකරණයක් ඉල්ලා සිටීමට විචාරශීලී පුරවැසි නියැලීම් ක්‍රියාවට නැංවීම සහ නිදහස් ස්වාධීන හා බහුත්ව මාධ්‍ය වෙනුවෙන් පෙනී සිටීමේ හැකියාවද ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සතු වේ.

ඒකක

1වන ඒකකය
තාක්ෂණය, මාධ්‍ය සහ සමාජය

2වන ඒකකය
නිදහස, ආචාරධර්ම හා සමාජ වගකීම

3වන ඒකකය
ප්‍රවෘත්තියක් බවට පත්වන්නේ කෙසේ ද: නිර්ණායක ගවේෂණය

4වන ඒකකය
ප්‍රවෘත්ති සැකසුම් ක්‍රියාවලිය: 5WS සහ 1H[40] න් ඔබ්බට යාම

40. The Right Questions: https://therightquestions.co/beyond-the-5ws-ask-questions-as-a-philosopher-answer-as-a-visionary/

Waisbord, Silvio. (2019). The 5Ws and 1H of Digital Journalism. Digital Journalism. 7. 351-358. 10.1080/21670811.2018.1545592 ද බලන්න

1වන ඒකකය: තාක්ෂණය, මාධ්‍ය සහ සමාජය

කාලසීමාව : පැය 02යි.

ප්‍රධාන මාතෘකා

- අදහස් ප්‍රකාශනයේ නිදහස හා මාධ්‍ය නිදහස පිළිබඳ සංකල්පයේ විකාසනය සහ භාවිතාව.
- ඩිජිටල් සන්නිවේදනය සහ මානව අයිතිවාසිකම්.
- සමාජය තුළ ජනමාධ්‍යයේ අරමුණ සහ ප්‍රජාතන්ත්‍රවාදී නිර්මිතය තුළ එහි භූමිකාව (උදා. නිදහස, පුරවැසි කාරකත්ව බලය, විනිවිදභාවය හා වගවීම.)
- සමාජය තුළ තාක්ෂණය
- ජාතික හා ගෝලීය කරළිය තුළ 21 වන සියවසේ ජනමාධ්‍යවේදීන්ගේ භූමිකාව සහ වගවීම. (නිදසුන්: කැඩපතක්, තොරතුරු පාලකයකු, අධීක්ෂකයෙකු, සබලකරුවකු හා පහසුකම් සපයන්නෙකු ලෙසින් කටයුතු කිරීමයි)
- මහජන සුබසිද්ධිය සඳහා වූ ජනමාධ්‍ය, සංස්කාරක ස්වාධීනත්වය හමුවේ හිමිකාරත්ව බලපෑම.
- තොරතුරු සාරධර්ම භූමිකාව.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- අදහස් ප්‍රකාශනයේ නිදහස හා මාධ්‍ය නිදහස පිළිබඳ සංකල්පයේ සහ භාවිතාවේ විකාසනය අනාවරණය කිරීම
- ජනමාධ්‍ය ප්‍රතිමානක අරමුණ සහ, යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය හා තිරසර සංවර්ධනය ශක්තිමත් කිරීමෙහි ලා මෙන්ම අනුගමනය කිරීමෙහි ලා එහි භූමිකාව නිරූපණය කිරීම
- තාක්ෂණය විකාසනය වන සන්දර්භය තුළ, ඩිජිටල් සන්නිවේදන සමාගම් සන්දර්භයෙහි හා මහජන සුබසිද්ධිය තුළ ජාතික හා ගෝලීය කරළි දෙකෙහිම ජනමාධ්‍යවේදීන්ගේ හා තොරතුරු වෘත්තිකයන්ගේ විකසනය වෙමින් පවතින භූමිකාව හා වගවීම ඇගයීමට ලක් කිරීම.

"ශිෂ්ටාචාරය විසින් අනෙක් මතයන් අභිබවමින් වඩාත් ප්‍රබල මතයක් ගොඩනගයි එනම්, මහජනයාට තමන් විසින්ම පාලනය විය හැකි ය. එකී මතය තහවුරුකිරීමට පුළුල් අසන්ධිත (unarticulated) තොරතුරු න්‍යායක් එම මතය විසින්ම නිර්මාණය කර ඇති අතර එය ජනමාධ්‍යවේදය ලෙස හඳුන්වනු ලැබේ. එම ද්විත්වයේ නැගී සිටීමත් කඩා වැටීමත් එකට සිදු වේ."

- බිල් කෝවැක් සහ ටොම් රොසන්ස්තියෙල්
The Elements of Journalism-

ඩිජිටල් සන්නිවේදන සමාගම් හා මානව අයිතිවාසිකම්

මානව සංහතියේ අපගේ පූර්ණ මානව විභවය පිළිබඳ අවබෝධය සාක්ෂාත් කරගැනීමට අත්‍යවශ්‍ය වන්නා වූ මූලික අයිතිවාසිකමක් ලෙස අදහස් ප්‍රකාශනයේ නිදහස දිගු කලක සිට සලකනු ලැබේ. එය සාමාජීය හා ආර්ථික සංවර්ධනය රුකුල් සපයමින්, අනෙකුත් අයිතීන්ට සහ නානා විධ නිදහසට පදනම සපයයි.

අදහස් ප්‍රකාශනයේ නිදහස ක්‍රියාවට නංවනු වස් තොරතුරු හා අදහස් හුවමාරුවට ඉඩ සලසන මහජන වේදිකා අවශ්‍ය කෙරේ. මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් මෙවැනි මහජන වේදිකාවන් සැපයීමේ දී සමාන නො වුවද වැදගත් භූමිකාවක් ඉටු කරයි. කෙසේ වෙතත් මාධ්‍ය මෙම කාර්යය සපුරාලීමේ දී, ප්‍රාන්ත, සංස්ථා හා රාජ්‍ය පාලනයෙන් මාධ්‍ය ස්වාධීන විය යුතුය. අනෙක් අතට, මෙම නිදහස මගින් සදාචාරාත්මකව හැසිරීම සඳහා ජනමාධ්‍යවේදීන්ට බැඳීමක් ඇති කරනු ලැබේ. එහෙයින් ජනමාධ්‍යවේදී ප්‍රමිති හා සම්බන්ධ වන සහ පුරවැසියන් වෙත වගවීම පදනම් කරගත් වෘත්තීය ආචාරධර්ම සංග්‍රහ සකස් කෙරේ. මානව හිමිකම්වලට අනුබල දීම සහ අපයෝජන වළක්වාලීම ඩිජිටල් සන්නිවේදන සමාගම් වෙතින් අපේක්ෂා කෙරෙන මුත්, සෙසු මාධ්‍ය මෙන් ඔවුහු ද බොහෝවිට ප්‍රතිමානක පරමාදර්ශ ළඟා කරගැනීමෙහි ලා අසමත් වෙති.

ඩිජිටල් තාක්ෂණයෙන් සමාජයට ලැබෙන ප්‍රතිලාභ මැනවින් ලේඛනගතකර ඇති අතර ගණනින් බොහෝ වේ. නිහඬ පුද්ගලයන්ට හඬක් නැගීමට අවස්ථාවක් උදාකරලීමෙන් සහ මහජනයාගේ තොරතුරු වෙත ප්‍රවේශයට සහ තිරසර සංවර්ධනයෙහි නියැලීමට අත්‍යවශ්‍ය පණිවිඩ හුවමාරු මාර්ගයක් ලෙස කටයුතු කිරීමෙන් ඔබ්බට මෙම ඩිජිටල් තාක්ෂණය ගමන් කරයි. හැකිවන පරිදි: තොරතුරු සැකසුම සහ සත්‍යාපනය, පර්යේෂණ, අධ්‍යාපනය සඳහා මහජනයාගේ ප්‍රවේශය, යහපත් සෞඛ්‍යය, පිරිසිදු ජලය, කෘෂිකර්මය, පිවිතුරු පරිසරයක්, වඩාත් සාධාරණ හා පාරදෘශ්‍යතාවෙන් යුතු ප්‍රජාත්‍රාන්තික ක්‍රියාවලි, තොරතුරු හා දැනුම සංරක්ෂණය, විවිධ සංස්කෘතිවලට අයත් ජනයා සමග මනා අන්තර්ක්‍රියාකාරිත්වයක් ඇතිකර ගැනීමෙන් සමාජ අන්තර්ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම, ඉවසීම හා අන්‍යයන්ට ගරුබුහුමන් අන්‍යෝන්‍ය ගරුත්වය, හා නව රැකියා හා ව්‍යවසායක්ව අවස්ථා උත්පදානය කිරීම යනාදිය සබල කිරීම තාක්ෂණියේ ප්‍රතිලාභ අතරට ඇතුළත් වේ. මේ හැර තවත් ප්‍රතිලාභ ගණනාවක් ද ඇත. පෙර නොවූ විරූ අත්දැකීමක් වූ කොවිඩ් 19 වසංගතය පැවති සමයේ දී, සමාජය පවත්වා ගෙන යාමට තාක්ෂණය උපකාරී වූ ආකාරය අපි දුටුවෙමු. වඩාත් මෑතකාලීන සංවර්ධනයක් වන කෘත්‍රිම බුද්ධි සහ බ්ලොක්චේන් (Block Chain) තාක්ෂණය තිරසර සංවර්ධනය හා ආර්ථික සංවර්ධනය උදෙසා වැඩි විභවයකින් යුත් වෙයි. ඒ මක්නිසාද යත්, තීරණ ගැනීම සඳහා තොරතුරු හා දත්ත ගබඩාකිරීම, පිරිසැකසුම, කළමනාකරණය හා ආරක්ෂණය සඳහා ඉඩ ලබාදෙන නවීන, කාර්යක්ෂම, ස්ථායී හා වඩාත් බලවත් මාර්ග නව තාක්ෂණ මගින් ලබාදෙන බැවිනි (කෘත්‍රිම බුද්ධිය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 11වන මොඩියුලය බලන්න). එමෙන්ම මෙම ප්‍රතිලාභවලට සමගාමීව හානිද දැකිය හැකි වේ. තාක්ෂණය මත යැපීම යනුවෙන් අදහස් කරනුයේ, අදහස් ප්‍රකාශනයෙහි පරිරක්ෂණය (curation) මගින් අනවශ්‍ය ලෙස සීමා කරන්නා වූ හෝ, අභිමානය සඳහා වන අයිතිය හෝ මහජන සෞඛ්‍යය සඳහා වන අයිතිය වැනි අයිතීන් අපවාදයට ලක්කිරීම සබල කරන්නා වූ ආයතන මත යැපීම ය. මෙම පරායත්ථතාව, පෞද්ගලිකත්වය ආක්‍රමණය කිරීම හා දත්ත පාදක ඉලක්ක කරගැනීම් හරහා අනිසි ලෙස හැසිරවීමට උත්සාහ කිරීම වෙත පරිශීලකයන්ව නිරාතුරුව නිරාවරණය කළ හැකි ය.

පොදුවේ ප්‍රවෘත්ති හා තොරතුරු සඳහා සමාජ මාධ්‍යවල වර්ධනය හා බලපෑමත්, ඒ මත මහජනයාගේ පරායත්ථතාවත් අද ප්‍රත්‍යක්ෂ කරුණකි. සාවද්‍ය තොරතුරු ඉහළ යාමේ ප්‍රවණතාවක් ද දක්නට ලැබෙන අතර, සමාගම්වල නොතැකීම, එවැනි අන්තර්ගතවලට ප්‍රමුඛතාව ලබා දෙන ඇල්ගොරිතම භාවිතය, මෙන්ම එවැනි සමාජ මාධ්‍ය විස්තාරණය වීම සහ පරිශීලකයන් අතර මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නිපුණතා නොමැති වීම ඊට හේතුපාදක කරුණු වශයෙන් දැක්විය හැකි ය.

අවසාන වශයෙන්, වෙනත් බොහෝ සංවර්ධන අතර වෙළෙඳ ප්‍රචාරණ ආදායම් සඳහා සාම්ප්‍රදායික මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් අතර පවත්නා තරගය ගැන බොහෝ විවාදයට තුඩු දී ඇත. මාධ්‍ය නියාමනය කරන පරිද්දෙන්ම ඩිජිටල් සන්නිවේදන සමාගම් ද නියාමනය කරන ලෙස ඇතැම්හු ඉල්ලා සිටිති. නිදසුනක් ලෙස, මාධ්‍ය සමාගම් අපහාසාත්මක අන්තර්ගත වෙනුවෙන් නීත්‍යනුකූලව උත්තරදීමට බැඳී සිටින නමුත් ඩිජිටල් සන්නිවේදන හෝ අන්තර්ජාල සමාගම් පවසනුයේ ඔවුන් වේදිකා මිස ප්‍රකාශකයන් නොවන බවත්, වගකීමෙන් බැඳිය යුත්තේ අපහාසය සිදු කරන තථ්‍ය පුද්ගලයා මිස

තමන් නොවන බවත් ය. මෙහි ප්‍රතිවිපාකයක් වන්නේ, ක්‍රියාමාර්ග ගන්නා ලෙස උසාවියෙන් නියෝග කරන ලද්දේ නම් මිස, එම අන්තර්ගතය සංසරණය වීම වළකා ලීම සඳහා ඔවුන්ට නෛතික අනුබලයක් නොමැති වීමයි. මෙය සංකීර්ණ ගැටලුවකි. එමෙන්ම පෞද්ගලිකත්වයට බලපෑම් ඇති වන හෙයින්, ඔවුන් විසින් සිදුකරනු ලබන දත්ත උද්ධරණය හා භාවිතය සම්බන්ධයෙන් අන්තර්ජාල සමාගම් වඩාත් දැඩිව නියාමනය කළ යුතු බවට ද ඉල්ලීම් පවතී. වෙනත් පාර්ශ්ව පවසන පරිදි, මෙම සමාගම් බල සම්පන්න හා අන්තර්සම්බන්ධිත බවට පත්ව ඇති අතර නියාමනය හරහා සමාගම් සංගත බිඳ දැමීමක් ඔවුහු අපේක්ෂා කරති. මෙම අස්ථිත්වයන්හි වඩාත් සාක්ෂි-පාදක පාලනයකට ඉඩ සලසමින් - පාරදෘශ්‍යභාවය සම්බන්ධයෙන් සමාගම් නියාමනය කරනු ලැබීම වැඩිදුර තර්කයක් ගෙන හැර දක්වා ඇත. එමගින් පහත සඳහන් දෑ, එනම්, ආයතනික තීරණවලට එරෙහි අභියාචනය සඳහා ඵලදායී අවස්ථා ලබා දීම වැනි පාරිභෝගික අයිතීන්වලට වඩා හොඳ ආරක්ෂාවක් සහ නිසි පිළිවෙතක් සහ; පරිශීලකයා ස්වකීය දත්තවලින් "ප්‍රාණ ඇපයට" ලක් වීම සහ සම්බන්ධතා "පිරිවට පිවිසුම" (walled garden) වෙනුවට තනි පුද්ගලයන්ට වැඩි තෝරාගැනීමක් කළ හැකි වන පරිදි විවිධ අස්ථිත්ව අතර අන්‍යෝන්‍ය කාර්යකාරිතාවක් අපේක්ෂා කෙරේ. මෙයින් අදහස් කරනුයේ දත්ත සුවහනීයතාවක් (නියාමනය තුළින් කෙනෙකුගේ ජංගම දුරකථන අංකය විවිධ සමාගම් හරහා සුවහනීය කිරීමේ හැකියාව ලබා දී ඇති අවස්ථාවල දී මෙන් නොව) නොමැති බවයි. ඩිජිටල් සන්නිවේදන සමාගම්වලින් වඩාත් ඵලදායී බදුකරණයක් මෙන්ම, ඩිජිටල් සේවාවල පළ වන සහ වේදිකා සඳහා මුදල් ඉපැයීමට උපකාරී වන අන්තර්ගත සඳහා මෙම අස්ථිත්ව වෙතින් මාධ්‍ය ආයතනවලට නිසි ගෙවීමක් සිදු කිරීම අවශ්‍ය කෙරෙන නියාමනයක් ද ඇතැම් බලපෑම් කරන්නන් (lobbies) විසින් අපේක්ෂා කෙරේ.

එකට සලකා බැලූ විට, මෙම විවිධ නියාමන භව්‍යතා තොරතුරු දැනගැනීමේ නිදහස, අදහස් ප්‍රකාශනයේ නිදහස, ප්‍රවෘත්ති සංසරණය සහ ආයතනික ආචාරධර්ම සඳහා විවිධ ගම්‍යාර්ථ ඇත (පහත UNESCO සම්පත පරිශීලනය කරන්න, අප සැම විසින් අන්තර්ජාලය පාලනය කරනු ලැබුවහොත් කුමක් සිදු වේද? අන්තර්ජාල පාලනයේ බහුපාර්ශ්වික සහභාගීත්වය අභිවර්ධනය කිරීම[41]).

මෙම ගැටලු සලකා බැලීමේ දී, පුහුණු සුසාධ්‍යකාරකට පහත දක්වා ඇති ප්‍රවේශ සහ ක්‍රියාකාරකම් අතුරින් තෝරා ගත හැකි ය.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්.

මෙම විෂයමාලාවේ (1 කොටසෙහි) ඉහත දී සාකච්ඡා කළ පරිදි, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් ඉගැන්වීම් සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතියි. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක් ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

ඩිජිටල් තාක්ෂණවල ඇති ප්‍රතිලාභ සහ අභියෝග පිළිබඳ පන්ති කාමරය තුළ විවාදයක් පැවැත්වීම ශික්ෂකයාට සංවිධානය කළ හැකි ය. මෙය, මාධ්‍ය නියාමනය සිදුකරන ආකාරයටම සමාජ මාධ්‍ය හෝ පිරික්සුම් සමාගම් නියාමනය කිරීම හා බැඳුණු (එසේම විශේෂිත අන්තර්ගත සොයන පුද්ගලයින් විසින් පිරික්සුම් යන්ත්‍ර ලෙස භාවිත කරන Baidu, Tieba මෙන්ම Youtube සහ VK වැනි සේවා ද සිහි තබා ගනිමින්) ඍණාත්මක ප්‍රතිඵල සහ අභියෝග පිළිබඳ සාකච්ඡාවක් විය හැකි ය.

තම රට තුළ පවත්නා අදහස් ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍ය නිදහසේ විකාශනය පිළිබඳ පර්යේෂණ සහ වාර්තා කිරීමේ වගකීම ශිෂ්‍යයන් වෙත පවරනු ලැබේ. පහත දක්වා ඇති සන්ධිස්ථාන සහිත දෘශ්‍ය කාලරාමුවක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

- අදහස් ප්‍රකාශනයේ නිදහස පිළිබඳ න්‍යාය සහ භාවිතයේ විකාසනයෙහි ඓතිහාසික සංවර්ධන සහ මාධ්‍ය නිදහස සමග එහි සහසම්බන්ධය
- මාධ්‍ය නිදහසට සහ ප්‍රජාතන්ත්‍රවාදයට නිශ්චිත දායකත්වයක් ලබා දී ඇති ජනමාධ්‍යවේදීන් සහ/හෝ මාධ්‍ය නියෝජිතායතන

41. What if we all governed the Internet? Advancing multi-stakeholder participation in Internet governance, https://unesdoc.unesco.org/ark:/48223/pf0000259717

- ප්‍රවෘත්ති මාධ්‍ය සහ ප්‍රවෘත්ති වාර්තාකරණයෙහි දී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ ප්‍රජාතාන්ත්‍රික ව්‍යාපාරවල සිදුවීම්

ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීමේ දී හෝ එය අනුගමනය කිරීමේ දී මාධ්‍යවේදයේ භූමිකාව පිළිබඳ මාධ්‍යවේදීන්ගේ අදහස් සම්බන්ධයෙන් ඔවුන් සම්මුඛව ප්‍රශ්න කිරීමට ශක්නුතාවක් පවතී නම් පුහුණු සුසාධ්‍යකාරක විසින් සහභාගිවන්නන්ට පැවරිය හැකි ය. මාධ්‍ය ආවරණය ජාතික හෝ ජාත්‍යන්තර පසුතල තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ විට මෙන්ම හිමිකාරිත්ව අභිලාෂ සහ මහජන සුබසිද්ධිය අතර විභවීය ආතති කළමනාකරණය කිරීමෙහි ලා විශේෂිත අවස්ථා උපුටා දැක්වීමට සම්මුඛ පරීක්ෂිතයන්ගෙන් ඉල්ලා සිටිනු ඇත. ඉන් අනතුරුව ශික්ෂකයන් විසින්, සම්මුඛ පරීක්ෂණය පදනම් කරගෙන, මාධ්‍යයේ නිශ්චිත කාර්යය, මාධ්‍ය ක්‍රියාත්මක වූ ආකාර සහ අවධානයට ලක් කරන ලද ප්‍රධාන ගැටලු දක්වමින් පිටු දෙකක ප්‍රත්‍යවේක්ෂණ පත්‍රිකාවක් ලියනු ලැබේ.

වෛරී ප්‍රකාශ හා සාවද්‍ය තොරතුරු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට ඩිජිටල් සමාගම්වල අක්ෂමතාව හෝ අසාමාර්ථ්‍යය මාධ්‍යවේදීන් විසින් හෙළිදරව් කරනු ලබන ආකාරය එක් නිදසුනක් විය හැකි ය. පහත යෝජිත ක්‍රියාකාරකම් තුළින් මෙම කරුණ තවදුරටත් විග්‍රහ කෙරේ.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සාමය, සෞඛ්‍ය, පාරිසරික ගැටලු, අධ්‍යාපනය සහ පොදුවේ තිරසර සංවර්ධන ඉලක්ක වැනි සමාජ ජීවිතයේ විවිධ පර්යාලෝක ඔස්සේ මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල කාර්යභාරය සලකා බලන්න. වාසි සහ අවාසි විමර්ශනය කර සාකච්ඡා කරන්න. මෙම මාතෘකා සහ අනෙකුත් යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ වැඩි විස්තර සඳහා 4, 5, 6, 11, 13, සහ 14 මොඩියුල බලන්න.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සඳහා ක්‍රියාකාරකම්වල දායකත්වය වර්ගීකරණය කිරීමට පහත යුනෙස්කෝ ලකුණුකාරක (markers) භාවිතකර ඇති ආකාරය සලකා බලන්න. මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන ක්ෂේත්‍ර ඇතුළුව පොදුවේ ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් සහ වැඩසටහන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හෝ නිරාකරණය කිරීමේ ප්‍රමාණය තක්සේරු කිරීමේ දී මේවා ප්‍රයෝජනවත් සහ අදාළ මෙවලමක් විය හැකි ය.
    - ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනවධානය: ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර පවත්නා වෙනස්කම් සහ විෂමතා පිළි නොගැනීම හෝ නොතැකීම (ස්ත්‍රී පුරුෂ භාවය-පිළිබඳ අනවබෝධය)
    - ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාව : ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර විෂමතා සහ අසමානතා හඳුනාගෙන ඒවා පිළිගැනීම, සහ ඒවා අවධානයට ලක් කළ යුතු කරුණු ලෙස ඉස්මතු කෙරෙන ක්‍රියාකාරකම්.
    - ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රතිචාර: ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර විෂමතා සහ අසමානතා හඳුනාගෙන ඒවා පිළිගැනීම, සහ ස්ත්‍රීන් සහ පුරුෂයන්ගේ අවශ්‍යතා, අපේක්ෂා, ධාරිතා සහ දායකත්ව පිළිබඳ ප්‍රතිපත්ති සහ ප්‍රාරම්භ විශද කෙරෙන ක්‍රියාකාරකම්
    - ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරිවර්තනීයත්වය: දැනට පවත්නා සහ පක්ෂග්‍රාහී/වෙනස්කොට සැලකීමේ ප්‍රතිපත්ති, පරිචය, වැඩටහන්වල මූල හේතු අභියෝගයට ලක් කරන්නා වූ සහ, සියලු දෙනාටම මනා දිවි පෙවෙතක් සඳහා වන වෙනසක් වෙනුවෙන් බලපෑම් කරන්නා වූ ක්‍රියාකාරකම්, ප්‍රතිපත්ති සහ ප්‍රාරම්භක වැඩසටහන්[42].

මෙම සංකල්ප සහ ඒවායෙහි සබැඳියාව කෙසේ ද යන්න සාකච්ඡා කරන්න. ප්‍රවෘත්ති බණ්ඩයක් හඳුනාගැනීමට හා තෝරාගැනීමට එක් එක් කණ්ඩායමෙන් ප්‍රශ්න කෙරෙන කණ්ඩායම් වැඩ සංවිධානය කරන්න. ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනවධානය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රතිචාර හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරිවර්තනීයත්වය ලෙස අන්තර්ගතය කෙතරම් දුරට, කවර හේතුවක් මත වර්ගීකරණය කළ යුතු ද යන්න තක්සේරු කිරීමට කණ්ඩායම්වලට මග පෙන්වන්න.

42. Women Make the News 2019, https://en.unesco.org/themes/media-pluralism-and-gender-equality/womenmakenews/2019/gender-sensitiveresources

ඇගයුම හා නිර්දේශ

- කියවීම් සහ /හෝ සම්මුඛ සාකච්ඡාවන් සම්බන්ධ ප්‍රත්‍යවේක්ෂණ පත්‍රිකා.
- මාධ්‍ය, ප්‍රජාතන්ත්‍රවාදය හා සාවද්‍ය තොරතුරු ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් වූ රචනා සහ බ්ලොග්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා සහභාගිත්වය (උදා: වැඩමුළු, පන්ති සාකච්ඡා)

වැඩිදුර සලකාබැලීම සඳහා මාතෘකා

- පාලනය කළ හෝ නතු කරගත්[43] මාධ්‍ය ආයතන පිළිබඳ සිද්ධි අධ්‍යයනය.
- ප්‍රචාරණයට එදිරිව ජනමාධ්‍යවේදය.

2වන ඒකකය - නිදහස, ආචාරධර්ම හා සමාජ වගවීම

කාලසීමාව: පැය 02යි.

ප්‍රධාන මාතෘකා

- අදහස් ප්‍රකාශනයේ නිදහස, මාධ්‍ය නිදහස, තොරතුරු ලබාගැනීමේ නිදහස සහ තොරතුරු ආචාරධර්ම
- ප්‍රවෘත්ති කාමරය තුළ, ආචාරධර්ම සංග්‍රහ චර්යාධර්ම සංග්‍රහ ගෝලීය සාරධර්ම: මාධ්‍ය සහ තොරතුරු වෘත්තියවේදීන් සඳහා මාර්ගෝපදේශ
- ප්‍රවෘත්ති එකතු කිරීමේ සහ පිරිසැකසීමේ ජනමාධ්‍යවේදී ආචාරධර්ම (ආචාරධර්ම කමිටු, ඔම්බුඩ්ස්මන්, ස්වාධීන පුවත්පත් කවුන්සිල /පුවත්පත් පැමිණිලි කොමිෂන් සභා)
- පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ සමාජයීය කාරකත්වය.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- මාධ්‍ය නිදහස, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු ලබාගැනීමේ නිදහස පිළිබඳ විශ්වීය මූලධර්ම සහ ප්‍රවෘත්ති වාර්තාකරණය සඳහා ඒවායේ ගම්‍යාර්ථ විස්තර කිරීම
- පුද්ගල, වෘත්තීය සහ ගෝලීය මට්ටම්වලින් ජනමාධ්‍ය භාවිතාවට සහ තොරතුරු වෘත්තිකයන්ට ආචාරධර්ම අදාළ වන ආකාරය විශ්ලේෂණය කිරීම
- මාධ්‍ය නිදහස හා වගකීම ළඟා කරගැනීමෙහි හා ආරක්ෂා කිරීමෙහි ලා, මාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටින්නන් සහ මාධ්‍ය අධීක්ෂකයන්ගේ භූමිකාව අගය කිරීම
- සමාජ සහ සංජානන යුක්තිය පිළිබඳ පැනවීමක් වශයෙන් පුරවැසියන්ගේ අනුරූපී අයිතිවාසිකම් සහ සහභාගීත්වය පැහැදිලි කිරීම
- මාධ්‍ය අන්තර්ගතය ජනනය කිරීමේ දී සහ මහජන විවාදය පිළිබඳ ප්‍රජාතන්ත්‍රික ක්‍රියාවලියේ දී ක්‍රියාකාරී සහභාගිකරුවන් වශයෙන් පුරවැසි වාර්තාකරණය හෝ, පුරවැසියන්ගේ හෝ වෘත්තීය නොවන මාධ්‍යවේදීන්ගේ විකාසනය වන භූමිකාව අවබෝධ කර ගැනීම සහ විශ්ලේෂණය කිරීම

43. Dragomir, M. 2020. Reporting facts: free from fear or favour. Paris: UNESCO. https://unesdoc.unesco.org/ark:/48223/pf0000375061

වගවීම

"යටත්වැසියා පුරවැසියකු බවට පත් කරනුයේ සහ ඔහුට හෝ ඇයට සිය අයිතීන් ඵලදායීව ක්‍රියාවට නැංවීමට ඉඩ හසර ලබා දෙන්නේ තොරතුරු ය."

- ලොයික් එර්වූල්
ජනමාධ්‍යවේදී සහ School of Journalism of Lille හි හිටපු සභාපති

රජය විසින් මාධ්‍ය අධි නියාමනය කරන්නේ නම්, එය ජනමාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වයට මෙන්ම වෘත්තීය වාර්තාකරණයේ ප්‍රමිතිවලට සහ මහජන සුබසිද්ධියට අනුගත වන පරිදි සිදුවීම් ආවරණය කිරීමට ඔවුන්ගේ හැකියාවට බාධාවක් වනු ඇත. මාධ්‍ය යනු සමාජය තුළ විශාල පිටුබලයක් යෙදිය හැකි සමාජ ක්‍රියාකාරීන් වන අතර, එබැවින් ඔවුන් ජනමාධ්‍යවේදයේ අපේක්ෂිත ප්‍රතිමාන වෙනුවෙන් කටයුතු කිරීම වැදගත් වේ. මේ අනුව, ආචාරධර්ම සංග්‍රහ පිළිපදිමින් හෝ වෘතාන්ත හෝ සිද්ධි ආවරණය කළ යුත්තේ කවරාකාරයෙන්ද යන්න පිළිබඳ වෘත්තිය මාර්ගෝපදේශ සංග්‍රහ නිශ්චිතව දක්වමින් මාධ්‍යවේදීන් ස්වයං-නියාමනයක් සිදු කිරීම අවශ්‍ය වන බව විශ්වාස කෙරේ. මේ සමගම විශ්වසනීය පර්යාලෝක විවිධත්වයක් නියෝජනය කෙරෙන සත්‍ය තොරතුරු බෙදා හැරීම සහතික කිරීමෙහි ලා ජනමාධ්‍යවේදීහු සහ පුරවැසියෝ බැඳී සිටිති.

යොදා ගැනීම: ජනමාධ්‍යවේදී ආචාරධර්ම සංග්‍රහය

ජාත්‍යන්තර මාධ්‍යවේදීන්ගේ සංගම් හෝ ජාතික මාධ්‍ය සංවිධාන විසින් ස්ථාපනය කරන ලද ආචාරධර්ම සංග්‍රහයක නිදසුනක් පරීක්ෂා කරන්න (ජාත්‍යන්තර මාධ්‍යවේදීන්ගේ සම්මේලනය විසින් ස්ථාපනය කරන ලද ආචාරධර්ම සංග්‍රහය එක් නිදසුනකි; අනෙක් නිදසුන වනුයේ බීබීසී වෘත්තීය ප්‍රමිතීන්ය). මේ ආචාරධර්ම සංග්‍රහයේ එක් එක් මූලිකාංග මගින් අපේක්ෂිත අරමුණ තක්සේරු කරන්න.

- ආචාරධර්ම සංග්‍රහයක් සකස් කළ යුත්තේ ඇයි ද යන්නත් එසේ කිරීමේදී බාහිර නියෝජිතයන් හෝ අධිකාරීන්ගේ බලපෑමකින් තොරව වෘත්තීය සාමාජිකයන්ගේ එකඟතාවෙන්ම එය සිදුවිය යුත්තේ ඇයිද යන්න සාකච්ඡා කරන්න.
- ආචාරධර්ම සංග්‍රහය බලාත්මක කිරීමට අවශ්‍ය යාන්ත්‍රණය සාකච්ඡා කරන්න.
- ආචාරධර්ම සංග්‍රහ සඳහා නිදසුන් සොයන්න. ජාත්‍යන්තර මාධ්‍යවේදී සංගම් හෝ ජාතික මාධ්‍ය සංවිධාන විසින් ස්ථාපිත කරන ලද 1) ආචාරධර්ම සංග්‍රහය සහ 2) චර්යාධර්ම සංග්‍රහය අතර වෙනස පරීක්ෂා කිරීම මීට නිදසුනකි.
- ස්වයංනියාමනය, සමනියාමනය සහ ව්‍යවස්ථාපිත නියාමනය සාකච්ඡාවට ලක් කරන්න. වෘත්තීය, ස්වාධීන ජනමාධ්‍යවේදය සඳහා වන ඉහත එක් එක් නියාමනයෙහි වාසි සහ අවාසි කවරේ ද යන්න සාකච්ඡාවට ලක් කරන්න.

නියැලුම: තොරතුරු වෘත්තිකයන් සඳහා වන වෘත්තීය ආචාරධර්ම සංග්‍රහය

ප්‍රධාන මූලධර්ම සහ සාරධර්ම ඇතුළුව පුස්තකාලයාධිපතිවරුන් හෝ ලේඛනාරක්ෂකයන් වැනි තොරතුරු වෘත්තිකයන් විසින් ස්ථාපිත කරන ලද ආචාරධර්ම පද්ධතියක් පරීක්ෂා කරන්න[44]. මෙම සංග්‍රහය ජාත්‍යන්තර මාධ්‍ය සංගම් හෝ ජාතික මාධ්‍ය සංවිධාන විසින් ස්ථාපිත කරන ලද ආචාරධර්ම පද්ධතියකට වඩා වෙනස් විය හැකි ආකාරය පිළිබඳව වටහාගන්න.

- නිර්දේශීය හා අභිලාෂීය ආචාරධර්ම අතර වෙනස්කම් සාකච්ඡා කරන්න
- චර්යාධර්ම සංග්‍රහ සහ ආචාරධර්ම සංග්‍රහ අතර වෙනස්කම් සාකච්ඡා කරන්න

44. නිදසුන් ලෙස (1) පුස්තකාල සංගම් හා ආයතන පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ පුස්තකාලයාධිපතිවරුන් සහ තොරතුරු ලබාගැනීම සම්බන්ධයෙන් සේවය කරන අනෙකුත් සේවකයින් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය සහ (2) ජාත්‍යන්තර ලේඛනාගාර කවුන්සිලය විසින් ලේඛනාරක්ෂකයින් සඳහා පිහිටුවන ලද ආචාරධර්ම සංග්‍රහයක් හෝ ඇමරිකානු පුස්තකාල සංගමය වැනි පුස්තකාලයාධිපතිවරුන් සඳහා එක් එක්/ස්වාධීන රටවල් විසින් සකස් කරන ලද වෘත්තීය ආචාරධර්ම සංග්‍රහය.

- තොරතුරුවල නිරවද්‍යතාව, පාරදෘශ්‍යතාව, හිමිකාරත්වය, ප්‍රවේශය, පෞද්ගලිකත්වය, ආරක්ෂාව සහ ප්‍රජාව ආශ්‍රිත තොරතුරු ආචාරධර්ම ගැටලු සාකච්ඡා කරන්න
- පෞද්ගලික තීරණ, ව්‍යක්තීය පරිචය හා රාජ්‍ය ප්‍රතිපත්ති කෙරෙහි තොරතුරු ආචාරධර්ම බලපාන ආකාරය සාකච්ඡා කරන්න.
- විකාසනය වන නව තොරතුරු ආකෘති සහ අවශ්‍යතා ආචාරධර්මීය මූලධර්ම කෙරෙහි බලපාන ආකාරය සහ මෙම ආචාරධර්ම සංග්‍රහ යොදා ගැනෙනුයේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න (උදා: සමාජ මාධ්‍ය ප්‍රතිපත්ති, ඩිජිටල් සංරක්ෂණය, පෞද්ගලිකත්වය, පොදු තොරතුරු වෙත ප්‍රවේශය).

නියැලුම: අපගේ සමාජ කාරකත්වය යනු කුමක්ද?

ඩිජිටල් පුරවැසිභාවය පිළිබඳ වෙබ් අඩවියට පිවිසෙන්න. ඩිජිටල් පුරවැසිභාවයේ මූලිකාංග නවය සමාලෝචනය කරන්න[45]. සක්‍රිය ඩිජිටල් පුරවැසියන් බවට පත් වීම, ක්‍රියාවන්හි ධනාත්මක සහ ඍණාත්මක ප්‍රතිවිපාක හඳුනා ගැනීම සහ මනා පුරුදු භාවිතාවේ යෙදවීම සඳහා තනි පුද්ගලයන් විසින් ප්‍රජාවෙහි අන් අයට නායකත්වය සැපයීම සහ සහය ලබා දීම මෙම මූලිකාංග නවය මගින් අවශ්‍ය කෙරේ. සුළුතර කණ්ඩායම් විසින් අන්තර්ගතය නියෝජනය කරනු ලැබීම, ප්‍රකට නොවන මුත් වලංගු සම්පත් භාවිත කිරීම සහ ස්වදේශික දැනුම ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම සංජානන යුක්තියෙන් පිළිගැනේ.

- එක් එක් මූලිකාංගයකට අදාළ වන සේ ඔබේ පුද්ගලික අත්දැකීම් මත පදනම්ව මූලිකාංග නවයටම අදාළ උදාහරණ සපයන්න.
- මෙම මූලිකාංගවලට අදාළව ඔබේම නිපුණතාව ඇගයීමට ලක් කර වැඩිදියුණු කළ යුතු අංශ මොනවාදැයි සලකා බලන්න.
- තොරතුරු සහ ඩිජිටල් ප්‍රවේශය ඔබගේ තොරතුරු ඇගයීමේ හැකියාවට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

5වන මොඩියුලයේ ග්‍රාහක පිරිස් සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ වැඩි විස්තර බලන්න.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂයමාලාවේ (1 කොටසෙහි) ඉහත දී සාකච්ඡා කළ පරිදි, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් ඉගැන්වීම් සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතියි. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක් ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

ෆ්‍රීඩම් හවුස් සංවිධානයේ මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය (Freedom of the Press Index of Freedom House)[46], සීමා මායිම් නැති වාර්තාකරුවෝ සංවිධානයේ දීපව්‍යාප්ත මාධ්‍ය නිදහස් දර්ශකය (Worldwide Press Freedom Index of Reporters Without Borders)[47] වැනි හෝ, මාධ්‍ය ඇෆ්‍රොබැරෝමීටර් (Afrobarometer) වැනි අදාළ කලාපීය මිනුම් වැනි දර්ශක සාකච්ඡාවට ලක් කිරීම සඳහා සහභාගිවන්නන්ට මග පෙන්වන්න. ශිෂ්‍යයන් විසින්: (1) එවැනි දර්ශක සංවර්ධනයට අදාළවන්නේ හෝ ප්‍රයෝජනවත් වන්නේ යැයි ඔවුන් සිතන්නේද යන්න පැහැදිලි කෙරෙනු ඇත; (2) මාධ්‍ය නිදහසට බලපා ඇති සාධක හෝ විචල්‍ය හඳුනාගෙන පැහැදිලි කෙරෙනු ඇත. මෙම දර්ශකවලින් ආවරණය වන නිර්ණායකවලට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- මුද්‍රිත, විකාශන සහ අන්තර්ජාල මාධ්‍ය නිදහසෙහි ප්‍රමාණය
- මාධ්‍ය සඳහා නෛතික වටපිටාව
- වාර්තාකරණයට බලපාන දේශපාලනික පීඩන

45. https://www.digitalcitizenship.net/nine-elements.html
46. FreedomHouse,https://freedomhouse.org/issues/media-freedom
47. Reporters Without Borders, https://rsf.org/en

- තොරතුරු වෙත ප්‍රවේශ වීමට බලපාන ආර්ථික සාධක
- මාධ්‍ය හිමිකාරිත්ව සංකේන්ද්‍රණය
- ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෙත එල්ල වන ඍජුව විවේචන

- ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම සඳහා සමාජ ව්‍යාපාරයක යෙදෙන සංවිධාන බොහොමයක් ලොව පුරා පවතී. ඩෙන්මාර්කයේ ජාත්‍යන්තර මාධ්‍ය සහාය (International Media Support in Denmark), මහා බ්‍රිතාන්‍ය සහ උතුරු අයර්ලන්ත එක්සත් රාජධානියෙහි ලන්ඩන් 19 වැනි වගන්තිය (Article 19 in London in the United Kingdom of Great Britain and Nothern Ireland), ඇමරිකා එක්සත් ජනපදයේ නිව් යෝර්ක් හි ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව (Committee to Protect Journalists in New York" United States of America), අදහස් ප්‍රකාශනයේ නිදහස පිළිබඳ දකුණු අප්‍රිකානු ආයතනය (Freedom of Expression Institue in South Africa -FXI) සහ යුනෙස්කෝ ආයතනය නිකුත්කරන ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ දණ්ඩමුක්තියෙහි අවදානම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ ද්විවාර්ෂික වාර්තාව වැනි ජාත්‍යන්තර සංවිධාන මින් සමහරකි. මාධ්‍ය නිදහස පිළිබඳ සංවිධාන ඔබේ රට තුළ ක්‍රියාකාරීව තිබේ ද යන්නත් ඒවා මාධ්‍ය නිදහස සහ අදහස් ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීමට දායක වී ඇත්තේ කවරාකාරයෙන් ද යන්න පිළිබඳව සලකා බලන්න.

- ඒකාකෘතිකරණය, මිථ්‍යා ප්‍රබන්ධකරණය, අසභ්‍ය සහ අප්‍රසන්න අනුරූප ආදී අගතීන් නිරූපණය කෙරෙන වාර්තාකරණ උදාහරණ පෙන්වාදීම මෙහි දී ශික්ෂකයන්ට කළ හැකි ය. ජනමාධ්‍යවේදීන් සඳහා ප්‍රමිතිවල සහ සාමාන්‍ය පොදු මාර්ගෝපදේශනයේ වැදගත්කම පිළිබඳ සාකච්ඡාවක් ඔස්සේ සහභාගිවන්නන්ව මෙහෙයවාලිය යුතු අතර, උදාහරණවල දක්වා ඇති ගැටලු පිළිබඳ වාර්තාවක් සහභාගිවන්නන් විසින් ඉදිරිපත් කෙරෙනු ඇත.

- ජනමාධ්‍යවේදීන්ගේ සහ/හෝ ප්‍රවෘත්ති සංවිධානවල වෘත්තීමය හෝ සදාචාරාත්මක අඩුපාඩු පිළිබඳ පොදු විවේචන හෝ පැමිණිලි පිළිබඳව විමසීමට මාධ්‍ය ඔම්බුඩ්ස්මන්වරයෙකු හෝ මාධ්‍ය අධීක්ෂණ සංවිධානයක (හෝ ඒ හා සමාන කණ්ඩායමක) නියෝජිතයෙකුට සම්මුඛ සාකච්ඡා කිරීමට හෝ ආරාධනා කිරීමට ශික්ෂකයාට හැකි ය. ශික්ෂකයා ආචාරධර්ම සංග්‍රහවල විධිවිධාන සමාලෝචනය කිරීමට ශිෂ්‍යයන් හට මග පෙන්වන අතර, ඉස්මතු කර ඇති ගැටලු දැනට පවතින වෘත්තීය සංග්‍රහ තුළින් ප්‍රමාණවත් ලෙස ආවරණය වී තිබේ ද යන්න පරීක්ෂා කරයි. ප්‍රාදේශීය මාධ්‍ය ආයතන තුළ ස්වකීය ජනමාධ්‍යවේදීන් සඳහා වන චර්යාධර්ම සංග්‍රහ ඇත්දැයි යන්න පරීක්ෂා කිරීමට සහභාගිවන්නෝ එකී මාධ්‍ය ආයතන අමතති. මෙම සංග්‍රහවල විධිවිධාන බලාත්මකවන ආකාරය හා ක්‍රියාත්මක වන ආකාරය ගැන ඔවුනට තවදුරටත් පරීක්ෂා කළ හැකි ය.

- ප්‍රධාන ධාරාවේ මාධ්‍ය විසින් කැපී පෙනෙන ලෙස ආවරණය කරන ලද සිදුවීමක් හෝ ගැටලුවක් සම්බන්ධයෙන් පුරවැසි වාර්තාකරණයෙහි ආවරණයේ නාමාවලියක් සැකසීමට ශිෂ්‍යයන් හට මග පෙන්වීමට ශික්ෂකයාට හැකි ය. සිද්ධිවාචක දෝෂ හෝ පක්ෂග්‍රාහිත්ව සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම ඔවුහු පසුව සිදු කරති.

- පාඨමාලාව අවසානයේ ඉදිරිපත්කරන සාරාංශය හෝ සංශ්ලේෂණය සඳහා, මාතෘකාවට අදාළ ගැටලු (මාධ්‍ය නිදහස/ අදහස් ප්‍රකාශනයේ නිදහස/ තොරතුරු ලබා ගැනීමේ නිදහස උල්ලංඝනය කිරීම්, ජනමාධ්‍යවේදයේ සදාචාර විරෝධී පරිචය පිළිබඳ නිදසුන්) පිළිබඳ දෛනික නිරීක්ෂණ සටහන් කරනු ලබන ජර්නලයක් හෝ ලොග් පොතක් පවත්වාගන්නා ලෙස ශික්ෂකයා ශිෂ්‍යයන්ට මග පෙන්විය යුතු ය.

ඇගයුම හා නිර්දේශ

- මාධ්‍ය ලොග් සටහන්
- පර්යේෂණ පත්‍රිකා (උදා. මාධ්‍ය නිදහස ශ්‍රේණිගත කිරීම, චර්යාධර්ම සංග්‍රහ, පුරවැසි වාර්තාකරණය)
- සම්මුඛ සාකච්ඡා, රූපවාහිනී/චිත්‍රපට නැරඹුම් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ පත්‍රිකා
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම (උදා. වැඩමුළු, පන්ති සාකච්ඡා)
- විවිධ ආචාරධර්ම සංග්‍රහවල සමාන අසමානතා අඩංගු සංසන්දනාත්මක වගු.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා .

- අන්තර්ජාල පාලන ගැටලු: ඩිජිටල් සන්නිවේදන සමාගම් ස්වයංනියාමනය, සමනියාමනය, හෝ රාජ්‍ය නියාමනයට යටත් විය යුතු ද, එසේ විය යුත්තේ කවර ගැටලු සම්බන්ධයෙන් ද?
- තොරතුරු දැනගැනීමේ මහජන අයිතිය සහ තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ මූලධර්ම: මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වැනි වගන්තිය
- තොරතුරු දැනගැනීමේ/ අදහස් ප්‍රකාශනයේ නිදහස: ජාත්‍යන්තර ගිවිසුම්, සම්මුතීන්, ප්‍රකාශන සහ ප්‍රඥප්ති, සහ ජාතික අණපනත් (ව්‍යවස්ථාපිත විධිවිධාන; ලිඛිත අපහාස පිළිබඳ නීති, ජාතික ආරක්ෂාව)
- තොරතුරු නීති සහ ක්‍රියා පටිපාටි මෙන්ම ප්‍රකාශන, ප්‍රඥප්ති සහ නිර්දේශ වෙත ප්‍රවේශය
- තොරතුරු නීතියේ සහ භාවිතයේ පරමාදර්ශී නිදහස සමන්විත වන්නේ කුමකින් ද?
- ස්වයංනියාමනය සහ මාධ්‍ය ඔම්බුඩ්ස්මන්
- වාර්තාකරුවන්ගේ අයිතිවාසිකම්.

3වන ඒකකය: ප්‍රවෘත්තියක් බවට පත්වන්නේ කෙසේ ද: නිර්ණායක ගවේෂණය

කාලසීමාව: පැය 3 යි

ප්‍රධාන මාතෘකා

- ජනමාධ්‍යවේදයේ සහ වෙනත් තොරතුරු වෘත්තිකයන්ගේ කාර්යයන්හි මූලික පදනම ලෙස කරුණු සහ සත්‍යාපනය
- ප්‍රවෘත්තිමය වටිනාකම සහ ප්‍රවෘත්ති යෝග්‍යතාව තක්සේරු කිරීමේ ප්‍රවෘත්ති සාධක හෝ ප්‍රවෘත්ති නිර්ණායක
- ප්‍රවෘත්ති විනිශ්චය කිරීමේ හෝ ප්‍රවෘත්ති හැඩගැස්වීමේ සලකාබැලීම්

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- තොරතුරුවල ප්‍රවෘත්තිමය වටිනාකම හෝ ප්‍රවෘත්ති යෝග්‍යතාව තක්සේරු කිරීමේදී භාවිත කරන නිර්ණායක විස්තර කිරීම
- ප්‍රවෘත්ති ගැන විනිශ්චය කිරීමේ හෝ ප්‍රවෘත්ති හැඩගැස්වීමේ මූලික මූලධර්ම විචාරශීලීව සාකච්ඡා කිරීම

ප්‍රවෘත්ති ශානරය

"විචාරශීලී චින්තනය යන්නෙන් අපි සියල්ල සුළු කොට තකන්නේ යැයි අදහස් නොවේ; ඉන් අදහස් කරනුයේ සාක්ෂි සහිත ප්‍රකාශ, සාක්ෂි රහිත ප්‍රකාශවලින් වෙන් කොට හඳුනා ගැනීමට අප උත්සාහ දරන බවයි."

– Weaponized Lies: How to Think Critically in the Post-Truth Era,
ඩැනියෙල් ජේ.ලෙවිටින්, 2016

ජනමාධ්‍යවේදීන්ට අති මහත් අන්තර්ගත ප්‍රමාණයක් තක්සේරු කිරීමට හා අරුත් ගැන්වීමට අවශ්‍ය වන අතර, ප්‍රශ්නගත සිද්ධීන් පිළිබඳ ඉතාමත් වෙනස් මට්ටම්වල අවබෝධයක් තිබිය හැකි ග්‍රාහක පිරිසකට අවබෝධ කරගත හැකි වන පරිදි වඩාත් වැදගත් ගැටලු ඉස්මතු කෙරෙන ආකාරයට එම අන්තර්ගත සංවිධානය කරන්නේ කෙසේදැයි සලකා බැලීම ඔවුන්ට අවශ්‍ය වේ. වැදගත් ලෙස සැලකෙන (ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති) වෘතාන්ත තෝරාගැනීම සහ තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකාරය තීරණය කිරීම අදාළ විනිශ්චයන්ට ඇතුළත් වේ. අනිවාර්ය ලෙසම, ඉදිරිපත් කිරීමේ හෝ "රාමු කිරීමේ" ස්වරූපය ජනමාධ්‍යවේදීන්ගේ සහ මාධ්‍ය ආයතනවල අතීත අත්දැකීම් සහ දෘෂ්ටිය පිළිඹිබු කරනු ඇත. වෘතාන්ත රාමුගත කෙරෙන ආකාරය අවබෝධ කරගැනීම සහ එම ක්‍රියාවලිය පිළිබඳ විචාරශීලීව සිතීම ග්‍රාහක පිරිසට වැදගත් වේ.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂයමාලාවේ (1 කොටසෙහි) ඉහත දී සාකච්ඡා කළ පරිදි, මාධ්‍ය හා තෙරතුරු සාක්ෂරතාව ඉගෙනුම් ඉගැන්වීම් සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතියි. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක් ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

පඨිත විශ්ලේෂණය

වෘතාන්තයක ප්‍රවෘත්ති වටිනාකම තක්සේරු කිරීමේ නිර්ණායක පදනම් කරගනිමින් ශික්ෂකයා, ප්‍රධාන පුවත්පතක (හෝ එහි මාර්ගගත සංස්කරණය) මුල් පිටුවල එක් එක් වෘතාන්තවල ප්‍රවෘත්තිමය වටිනාකම විශ්ලේෂණය කරයි. මෙයට සාමාන්‍යයෙන් පහත සාධක ඇතුළත් වේ

- කාලානුරූපී බව
- බලපෑම සහ වැදගත්කම
- ප්‍රමුඛත්වය
- ආසන්නතාව
- ගැටුම්
- මානව සුබසිද්ධිය
- අවශ්‍යතාව
- අසාමාන්‍ය බව/අමුතු බව

මෙම ප්‍රතිමානක ලක්ෂණ හැරුණු කොට, බොහෝ විට ප්‍රවෘත්ති ඒවායේ නාට්‍යමය සහ විනෝදාස්වාදනීය වටිනාකම මත ද තෝරා ගැනේ. එය තෝරා ගැනීම 'කා සඳහා කුමක් වැදගත් විය හැකිද' සහ 'කවුරුන් මත ඇති විය හැකි කවර බලපෑමක් ද' යන්න පිළිබඳව ව්‍යංග අදහස් මත පදනම් කරගෙන සිදුකරනු ලබයි.

ඔවුහු ප්‍රවෘත්ති විනිශ්චය කිරීමේදී හෝ ප්‍රවෘත්ති හැඩගැස්වීමේදී සලකා බැලිය යුතු සාධක මත පදනම් කරගෙන පසුව වෘතාන්ත විශ්ලේෂණය කරති. මෙම සාධක වනුයේ:

- සත්‍යවාදී බව: නිරවද්‍යතාවය (කරුණු නිවැරදිව ලබා ගැනීම) සහ සමෝධානය (කරුණු අරුත් ගැන්වීම)
- මහජන සුබසිද්ධිය උදෙසා කැපවීම
- මහජනතාව අනිසි ලෙස හැසිරවීමට වඩා දැනුවත් කිරීම
- සම්පූර්ණත්වය/විස්තීර්ණ බව
- බහුවිධත්වය (හුදෙක් ඉලක්කගත ග්‍රාහක පිරිස්හි පමණක් නොව සියලුම ප්‍රජාවන්ගේ ප්‍රවෘත්ති ඇතුළත් කිරීම).

ප්‍රවෘත්ති අයිතම ඒවායේ මූලාශ්‍ර හඳුනා ගන්නා වූ, භාවිත කරන ලද සත්‍යාපනය හෙළිදරව් කරන්නා වූ (උදා: මූලාශ්‍ර ත්‍රිකෝණීකරණය) ප්‍රමාණයට; ජනමාධ්‍යවේදීන් විසින් කරනු ලබන දෙයට බලපාන ඔවුන්ගේ අදහස්වල එනම්, ඔවුනට වඩාත්ම වැදගත් වන්නේ කුමන කරුණු සහ අදහස් ද සහ ඒ මන්ද යන්න වැනි දැහි පාරදෘශ්‍යතාව තුළ මෙම ප්‍රතිමානක සාධක දැකිය හැකි ය.

එමෙන්ම ලිපි ස්ථානගත කිරීම, භාවිත කරන සිරස්තල හා අකුරු තරම, සහ ඡායාරූප හා යටි ලියමන ඇතුළත් කිරීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය.

සන්දර්භීය විශ්ලේෂණය

ශික්ෂකයා විසින්, තමාට අභිමත හෝ අදාළ මාධ්‍ය සංවිධානයක් මගින්, නිශ්චිත මාතෘකාවක් සම්බන්ධයෙන් සහ නිශ්චිත දිනක සිදු කරන ලද ආවරණයක් පිළිබඳ විමර්ශනය කරනු ලැබෙන අතර, අවම වශයෙන් විකාශකයන් දෙදෙනෙකුගේ ආවරණයන්හි දෘෂ්ටිකෝණය (යම් නිශ්චිත දෘෂ්ටිකෝණයක් හෝ පර්යාලෝකයක් ව්‍යාප්ත කිරීම) සහ සැලකිල්ල (එනම් ඉදිරිපත් කළ තොරතුරු, සඳහන් කරනු ලැබූ මූලාශ්‍ර, පැවැත්වූ සම්මුඛ සාකච්ඡා, ප්‍රවෘත්ති වෘතාන්ත සඳහා යොදා ගත් කවර හෝ දෘශ්‍ය උපකාරක) සංසන්දනය හෝ විසංසන්දනය කරනු ලැබේ.

ප්‍රවෘත්ති විශ්ලේෂණය සහ ස්වයං ඇගයුම

ශිෂ්‍යයන් හට එකම විෂය සම්බන්ධයෙන් ලියැවුණු ප්‍රවෘත්ති දෙකක් ලබා දෙන අතර, කුමන ප්‍රවෘත්තිය වඩාත් ප්‍රබල ද, තොරතුරු වැඩි වශයෙන් සපයන්නේ ඉන් කවර ප්‍රවෘත්තිය ද සහ අනෙක් ප්‍රවෘත්ති ලිපිය තොරතුරු ගුණාත්මකභාවය සහ ප්‍රවෘත්ති ශානරයට අනුකූල වීම අනුව, වැඩිදියුණු කළ හැක්කේ කෙසේ ද යන්න ශිෂ්‍යයන් පැහැදිලි කළ යුතු ය (පරිශීලනය කළ යුතු නිර්ණායක සඳහා කරුණාකර ඉහත පඨිත විශ්ලේෂණය වෙත යොමු වන්න).

පහත ප්‍රශ්නය විමසා සිටින්න: ප්‍රසිද්ධ කෙරෙන ප්‍රවෘත්ති වෘතාන්ත තේරීමේ දී, ඊට සංස්කාරක විනිශ්චය සහ ග්‍රාහක පිරිසේ විනිශ්චය බලපාන්නේ කෙසේද? ඊට අමතරව, කිරීම සංස්කාරක විනිශ්චය මගින් වෘතාන්තයක ඉදිරිපත් කිරීම හැඩගස්වන්නේ කෙසේ ද?

ප්‍රවෘත්ති ආයතනයට සහය දක්වන ග්‍රාහක පිරිස සඳහා වූ එම ආයතනයේ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම ග්‍රාහක පිරිසෙහි විනිශ්චය මගින් හැඩගැස්වෙන නමුත්, ඇතැම් ප්‍රවෘත්ති වෙළෙඳ දැන්වීම්කරුවන් හෝ හිමිකරුවන්ගේ ග්‍රාහක පිරිස සඳහා විශේෂිතව සකස් කර ඇති අතර, එමගින් ජනමාධ්‍යවේදයේ ප්‍රතිමානක ප්‍රමිති කෙරෙන් බැහැර වේ.

කණ්ඩායම් අභ්‍යාස[48]

කණ්ඩායම් අභ්‍යාස 1: ඔබේ අදහස් බෙදා ගන්න:

- ප්‍රවෘත්ති වැදගත් වන්නේ ඇයි?
- මාධ්‍යවේදීන්ගේ හෝ මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති වාර්තාකරණය නවතා දැමූ විට අහිමි වන්නේ කුමක් ද?

48. මේවා 20202021 ආසියානු ජනමාධ්‍ය හා සන්නිවේදන පාඨමාලා වෙතින් ලබාගෙන ඇත, https://aijc.com.ph/

කණ්ඩායම් අභ්‍යාස 2: ප්‍රවෘත්ති සඳහා ප්‍රේරණයක් ලබා දෙන වටිනාකම් හඳුනා ගන්න

- මුද්‍රිත හෝ මාර්ගගත ප්‍රවෘත්ති වේදිකාවක යම් ගැටලුවක් සම්බන්ධයෙන් පළ කෙරෙන ප්‍රධාන ලිපිය හෝ ප්‍රධාන සිරස්තලය හඳුනා ගන්න
- ලිපිය සඳහා අභිප්‍රේරණයක් ලබා දී ඇති ප්‍රවෘත්ති වටිනාකම් හඳුනා ගන්න. ඒ එක් එක් දෑ ඔබ හඳුනා ගත් ආකාරය පැහැදිලි කරන්න.
- බහුවිධ වටිනාකම් තිබේ ද? අභිප්‍රේරක බොහෝ ගණනක් පැවතීම වෘතාන්තය වඩාත් වැදගත් හෝ වඩාත් රසවත් කරයි ද?
- ලිපියේ ප්‍රවෘත්ති යෝග්‍යතාව විශ්ලේෂණය කරන්න. එය ප්‍රසිද්ධියට පත් කළ යුතුව තිබූ බව ඔබ සිතනවා ද? එසේ කළ යුත්තේ හෝ නොකළ යුත්තේ ඇයි?

කණ්ඩායම් අභ්‍යාස 3: ඔබම ඔබේ සංස්කාරක වන්න

- ශික්ෂකයා සිරස්තල 1520 ලැයිස්තුවක් පෙන්වමින් සිසුන්ගෙන් පහත සඳහන් දේ විමසයි:
- වැදගත් වෘතාන්ත මොනවාද?
- වෘතාන්ත 5ක් සඳහා පමණක් ඉඩප්‍රස්ථා/ගුවන්කාලය ඔබට තිබේ නම්, ඔබ තෝරා ගන්නේ කුමන ඒවාද? කරුණාකර ඔබගේ තේරීමට හේතු දක්වන්න.
- ඔබ වෘතාන්තයක් තෝරාගනු ලබන්නේ (අ) රූපවාහිනී ප්‍රවෘත්ති නාලිකාවකින්, (ආ) බ්‍රෝඩ්ෂීට්, (ඇ) ටැබ්ලොයිඩ්, (ඩී) ගුවන් විදුලි ප්‍රවෘත්ති වැඩසටහනකින් හෝ (ඉ) ජාත්‍යන්තර ප්‍රවෘත්ති ඒජන්සියකින් නම් , ඔබ තෝරා ගන්නේ කුමන වෘතාන්තය ද? පහක් පමණක් තෝරා ගන්න.

කණ්ඩායම් අභ්‍යාස 4: ඩිජිටල් සන්නිවේදන සමාගමක් ඔස්සේ ප්‍රවෘත්ති යුගයෙහි

ඩිජිටල් සන්නිවේදන සමාගම්වලින් ප්‍රවෘත්ති අයිතම මාලාවකට ප්‍රවේශවීමටත් පහත සඳහන් කරුණු වටා අභ්‍යාස කිරීමටත් ශික්ෂකයා ශිෂ්‍යයන්ට මග පෙන්වයි.

- ප්‍රවෘත්ති ලැබෙන්නේ විශ්වසනීය මූලාශ්‍රයකින් නම් එය පවසන්නේ කෙසේ ද?
- ප්‍රවෘත්ති ලබාගන්නා විශ්වසනීය මූලාශ්‍ර කවරේ ද? ඒවා විශ්වසනීය වන්නේ ඇයි?
- ප්‍රවෘත්ති සත්‍ය හෝ ගොතන ලද ඒවා වුවත් ප්‍රවෘත්ති ශානරයක් ලෙස පෙනී සිටීමින් සත්‍ය වසන් කරන්නේ ද? ඔබ ඒ බව දැනගන්නේ කෙසේ ද?
- අසත්‍ය තොරතුරු මගින් සමාජ මාධ්‍ය වේදිකාවලට ප්‍රතිලාභ අත් වන්නේ ද?
- සිය වේදිකාවල පළ වන අසත්‍ය තොරතුරු කළමනාකරණය සඳහා ඩිජිටල් සන්නිවේදන සමාගම් කෙතරම් දුරට වගකිව යුතු ද?

ඇගයුම් හා නිර්දේශ

- පඨිත විශ්ලේෂණය/සන්දර්භීය විශ්ලේෂණය/ප්‍රවෘත්ති විශ්ලේෂණය මත පදනම් වූ ප්‍රත්‍යවේක්ෂණ පත්‍රිකාව
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම (උදා. වැඩමුළු, පන්ති සාකච්ඡා)

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- පුවත් පසුබිම (ප්‍රවෘත්ති සම්බන්ධයෙන් සමාජසංස්කෘතික, දේශපාලනික සහ ආර්ථික බලපෑම්)
- ප්‍රවෘත්ති වටිනාකම් (ප්‍රේරණ) සහ සංස්කාරක ක්‍රියාවලි මත ප්‍රවෘත්ති සැකසීමේ බලපෑම්.
- ගෝලීය තොරතුරු ප්‍රවාහ සහ ප්‍රවෘත්ති හැඩගැස්වීම.
- ගෝලීය පුවත් මාධ්‍ය සංවිධාන (උදා: CNN, Al Jazeera, BBC, Deutsche Welle යනාදිය.).

4වන ඒකකය: ප්‍රවෘත්ති සංවර්ධන ක්‍රියාවලිය: 5WS සහ 1H ක්‍රමවේදයෙන් ඔබ්බට යාම[49]

කාලසීමාව: පැය 3 යි

ප්‍රධාන මාතෘකා

- ප්‍රවෘත්ති හඳුනා ගැනීම සහ වෘතාන්ත පිළිගැනීම (ප්‍රවෘත්ති සංවර්ධන ක්‍රියාවලිය)
- ජනමාධ්‍යවේදයේ හරය ලෙස සත්‍යාපනය, ස්වාධීනත්වය සහ වගවීම
- ප්‍රවෘත්ති වෘතාන්තවල තතු පිරික්සීම.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- කතන්දර අදහසේ සිට ප්‍රවෘත්ති ලිවීමට දත්ත රැස්කිරීම දක්වා ප්‍රවෘත්ති කතාව වර්ධනය වන ආකාරය පිළිබඳ ක්‍රියාවලිය විස්තර කිරීම
- ජනමාධ්‍යවේදී අවධාරණය (assertion) වෙතින් වෙන් කර හඳුනාගත් පරිදි, සත්‍යාපන ක්ෂේත්‍රයේ හර මූලධර්ම අවබෝධ කරගැනීම සහ, සත්‍යවාදී හා නිරවද්‍ය ජනමාධ්‍යවේදී ප්‍රමිතියක් සපුරාලීමට සත්‍යාපන ශිල්පීය ක්‍රම යොදා ගන්නේ කෙසේ ද යන්න අවබෝධ කරගැනීම
- ජනමාධ්‍යයේ සුවිශේෂී මූලිකාංග ලෙස ස්වාධීනත්වය සහ වගවීම යන සංකල්ප පැහැදිලි කිරීම
- තතු පිරික්සීමේ ක්‍රමවේද සහ මෙවලම් විස්තර කිරීම

ප්‍රවෘත්ති මාධ්‍ය සංවිධානයකට අධ්‍යයන චාරිකාව/අථත්‍ය චාරිකාව

> "පුවත්පත් කාර්යාල වෙත ළඟා වන දවසේ පුවත් යනු, සිද්ධි, ප්‍රචාරණ, කටකතා, සැකය, ඉඟි, බලාපොරොත්තු සහ බිය පිළිබඳ ඇදහිය නොහැකි සංකලනයක් වන අතර, එම ප්‍රවෘත්ති තෝරාගෙන ඇණවුම් කිරීමේ කාර්යය ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ සැබවින්ම පූජනීය කර්තව්‍යයකි."
>
> - වෝල්ටර් ලිප්මාන්, *News Reporting and Writing, (1989-1974)*

ප්‍රධාන කර්තෘ හෝ ජ්‍යෙෂ්ඨ කර්තෘ සමග සංවාදයක් ද ඇතුළුව, මාධ්‍ය කාර්යාලයක් වෙත ක්ෂේත්‍ර චාරිකාවක් හෝ අතථ්‍ය චාරිකාවක් සංවිධානය කළ හැකි ය. මෙමගින් සහභාගිවන්නන්ට සංස්කාරක ධුරය මට්ටමින් පුවත් සැකසීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමට ඉඩ සැලසේ. සිය නිරීක්ෂණ සහ උගත් පාඩම් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ පත්‍රිකාවක් ලියන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ඇත.

පරීක්ෂණ ක්‍රියාවලිය (ප්‍රවෘත්ති වාර්තාකරුවෙකුගේ ජීවිතයේ දවසක්)

ප්‍රවෘත්ති වාර්තාකරුවෙකු සිය විෂය ආවරණය කරන අතරතුර ඒ කැටුව යන ශිෂ්‍යයෝ පහත සඳහන් දේ ලේඛනගත කරති: (අ) ක්ෂේත්‍රයේ සිදු වූ දේට සාපේක්ෂව ප්‍රවෘත්තියේ කුමන අංග හඳුනාගෙන ඇත් ද, ඒ පිළිබඳව ලියැවී තිබේ ද (හෝ රැස් කරගත් දත්ත තෝරා බේරා ගැනීමේ ක්‍රියාවලිය) ; සහ (ආ) වාර්තාකරු විසින් වෘතාන්තය පවසනු ලැබුවේ කෙසේ ද සහ වෘතාන්තය ඒ ආකාරයට පැවසූයේ මන්ද (දත්ත අරුත් ගැන්වීම) යන්න. ප්‍රවෘත්ති වාර්තාකරුවෙකු සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම විකල්ප ක්‍රියාකාරකමක් වේ.

49. The Right Questions https://therightquestions.co/beyond-the-5ws-ask-questions-as-a-philosopher- answer-as-a-visionary/ See also, Waisbord, Silvio. (2019). The 5Ws and 1H of Digital Journalism. Digital Journalism. 7. 351-358. 10.1080/21670811.2018.1545592.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂයමාලාවේ (1 කොටසෙහි) ඉහත දී සාකච්ඡා කළ පරිදි, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් ඉගැන්වීම් සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතියි. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක් ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

පඨිත විශ්ලේෂණය

- ශික්ෂකයා, ප්‍රධාන ගැටලුවක් හෝ සිද්ධියක් පිළිබඳ පුවත් විස්තර විශ්ලේෂණය කර, සපයා ඇති තොරතුරු විමර්ශනය කරයි. ඔවුහු "ප්‍රවෘත්ති හඳුනාගැනීමේ සහ වෘතාන්තය වටහාගැනීමේ" සාධක සහ ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් ඉහත තක්සේරුව පැහැදිලි කරති:

    - ප්‍රවෘත්තිවල මූලිකාංග (5Ws සහ 1H: කවුද? කුමක්ද? කවදාද? කොහේද? ඇයි? සහ කෙසේද?) සහ ඒවා යළි නිර්වචනය කිරීම: ප්‍රවෘත්ති යනු අර්ථාන්විත දත්ත වේ ('කවුද' යන්නෙන් චරිතය ද, 'කුමක් ද' යන්නෙන් කථා වස්තුව ද, 'කවදා ද' යන්නෙන් කාලය ද, 'කොතන ද' යන්නෙන් පසුබිම ද, 'ඇයි' යන්නෙන් අභිප්‍රේරණය හෝ හේතුව ද, 'කෙසේ ද' යන්නෙන් ආඛ්‍යානය ද විග්‍රහ කෙරේ).
    - කාලයත් සමග ප්‍රවෘත්ති පිළිබඳ සංකල්පය පහත ප්‍රශ්න ද ඇතුළත් වන පරිදි විකාසනය වී ඇත: "ඉතින් මොකද?", එනම් කතාවේ වැදගත්කම පැහැදිලි කළ යුතු ය: "විසඳුම කුමක්ද?" යන්නෙන් අදහස් කරනුයේ, ප්‍රශ්න හෙළිදරව් කිරීමේ වැදගත් කාර්යයෙන් ඔබ්බට ගොස් භව්‍ය විසඳුම් පරාසයට නිරාවරණයක් ප්‍රවෘත්ති මගින් ලබා දෙන බවයි.
    - ජනමාධ්‍යවේදය "අරමුණක් සහිත කථාඛ්‍යානය" ලෙස: මිනිසුන්ට යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය තොරතුරු සොයා ගැනීම සහ, එම තොරතුරු අර්ථවත්, අදාළ සහ සිත් ඇදගන්නා ආකාරයෙන් ඉදිරිපත් කිරීම
    - "ඉතින් මොකද?" සහ "ප්‍රශ්නයට විසඳුම වාර්තා කෙරෙන්නේ ද?"යන ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රවෘත්තියේ ඇතුළත් වන්නේදැයි තක්සේරු කළ හැකි ද? සෑම ප්‍රවෘත්තියකටම මෙම සිද්ධාන්ත ඇතුළත් කළ නොහැකි වනමුත්, නව වෘතාන්ත තුළින් ද එසේ සිදුවන බවට සහතික කිරීමට සාමාන්‍ය පෙළඹවීමක් ඇත.

ශික්ෂකයා සත්‍යාපනයේ හර මූලධර්ම මත පදනම්ව සත්‍යෝක්ෂණීයත්වය පරීක්ෂා කරනු ලබයි, එනම්: එකතු නොකරන්න; ග්‍රාහක පිරිස මුලා නොකරන්න; ක්‍රම සහ අරමුණු පිළිබඳව හැකි තරම් පාරදෘශ්‍යතාවෙන් කටයුතු කරන්න; තමන්ගේම මුල් වාර්තාකරණය මත විශ්වාසය තබන්න; සහ නිහතමානීව කටයුතු කරන්න[50].

ශික්ෂකයා අවම වශයෙන් සත්‍යාපනය කිරීමේ එක් ශිල්පීය ක්‍රමයක් හෝ යොදා ගනු ඇත: සංශයවාදී සංස්කරණය, නිරවද්‍යතා පිරික්සුම් ලැයිස්තුව, උපකල්පිත කරුණු සත්‍යාපනය කිරීමේ ක්‍රමය සහ නිර්නාමික මූලාශ්‍ර පිළිබඳ නීති (කෝවාච් සහ රොසෙන්ස්ටියෙල්ගේ 'ජනමාධ්‍යවේදයේ මූලිකාංග' (Elements of Journalism) ග්‍රන්ථය මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකි ය).

සම්පාදනය

පුහුණු සුසාධ්‍යාකාරක හෝ ශික්ෂකයා පාසල් ප්‍රකාශනයක (හෝ පාසල් විකාශන මධ්‍යස්ථානයක හෝ පුස්තකාලයක) උපදේශක සමග සම්බන්ධ වී, නිකුත් කිරීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීමට සහභාගිවන්නන්ට ඉඩ සලසයි.

නිකුත් කිරීමේ සැලැස්මකට, ලිවීමට හෝ සම්පාදනය කිරීමට ඇති ලිපි හෝ වෘතාන්ත පෙළගැස්ම සහ ඒවා ඇතුළත් කිරීම සඳහා පදනම, එක් එක් වෘතාන්තයේ විෂයෙපථය සහ එක් එක් වෘතාන්තයේ භව්‍ය කෝණය හෝ ඊට ලැබෙන සැලකිල්ල ඇතුළත් වේ.

50. Global Media Journal African Edition 2008 Vol 2 (2), https://globalmedia.journals.ac.za/pub/article/view-File/29/63

මාධ්‍ය ලොග් සටහන්

පාඨමාලාව අවසානයේ සාරාංශය සහ සංශ්ලේෂණය සඳහා සහභාගිවන්නන් විසින්, මාතෘකාව පිළිබඳ දෛනික නිරීක්ෂණ (උදා. ප්‍රවෘත්ති වටිනාකම්, ප්‍රවෘත්ති විනිශ්චයන්, සත්‍යාපනයේ නිර්ණායක, පුරවැසි වාර්තාකරණය) වාර්තා සටහන් කරන ජර්නලයක් හෝ ලොග් පොතක් පවත්වා ගත යුතු වේ.

කණ්ඩායම් අභ්‍යාස[51]

කණ්ඩායම් අභ්‍යාස 1: ප්‍රවෘත්ති සම්පාදනය කරන්නේ කෙසේද?

රූපවාහිනී ප්‍රවෘත්ති ආයතනයකට ගොස් පහත පිරිස් සමග අදාළ රාජකාරි සහ වගවීම පිළිබඳව සම්මුඛ සාකච්ඡා කරන්න:

- සංස්කාරකවරුන් මධ්‍යම සංස්කාරක අංශය (central desk) (ගුවන්විදුලිය, මාර්ගගත, රූපවාහිනිය)
- වාර්තාකරුවන් ආවරණය කරන විෂයට අනුව පවරන ලද
- ප්‍රවෘත්ති බණ්ඩ නිෂ්පාදකයින්
- කැමරා ශිල්පීන් ක්ෂේත්‍ර සහ චිත්‍රාගාර ආශ්‍රිත
- වීඩියෝ සංස්කාරකවරුන්
- විධායක නිෂ්පාදකයන්
- අධීක්ෂණ නිෂ්පාදකයන්
- ප්‍රවෘත්ති මෙහෙයුම්කරු ප්‍රොම්ටරය කියැවීම
- වෙනත් අය: අනුලක්ෂණ ජනක මෙහෙයුම්කරුවන්, පර්යේෂකයන්, ඉංජිනේරුවන් සහ කාර්ය මණ්ඩලය.

කණ්ඩායම් අභ්‍යාස 2: තොරතුරු මූලාශ්‍ර පිළිබඳ විශ්ලේෂණය

කණ්ඩායම මුද්‍රිත හෝ මාර්ගගතව මෙන්ම ප්‍රසිද්ධ සමාජ මාධ්‍ය පළ කිරීමක ද දක්නට ඇති විෂයක් හෝ වෘතාන්තයක් හඳුනාගත යුතු ය. පහත ප්‍රශ්න සලකා බලන්න:

- සත්‍යාපනය, ස්වාධීනත්වය සහ වගවීම යන මාධ්‍ය ක්‍රියාවලිය මත පදනම්ව, ඉහත ආකාර දෙක අතර වෙනසක් තිබේද? පැහැදිලි කරන්න.
- පුවත් ලිපිය සහ සමාජ මාධ්‍ය පළ කිරීම සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කළේ ද? ඔබ ඒ බව හඳුනාගන්නේ කෙසේද?
- මූලාශ්‍රය ස්වාධීන සහ/හෝ අධිකාරික වන්නේ ද? ඇයි?
- මූලාශ්‍ර වගවීමෙන් යුත් වේද?

කණ්ඩායම් අභ්‍යාස 3: සත්‍යාපනය, ස්වාධීනත්වය සහ වගකීම

පහත සඳහන් කරුණු සංසන්දනය සහ විසංසන්දනය කර බලන ලෙස සහභාගිවන්නන්ට උපදෙස් දෙන්න:

1. රජයේ ආයතනයකින් නිකුත් කළ මාධ්‍ය නිවේදනයක්.
2. එම මාධ්‍ය නිවේදනය මත පමණක් පදනම්ව ස්ථාපිත මාධ්‍ය ආයතනයක් විසින් පළ කරන ලද පුවත් ලිපියක්
3. රජයේ නියෝජිතායතනයකින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයක් පදනම් කරගනිමින් ස්ථාපිත

51. ජනමාධ්‍යවේදය හා සන්නිවේදනය පිළිබඳ ආසියානු ආයතනය (Asian Institute of Journalism and Communication) වෙතින් ලබා ගන්නා ලදී.

මාධ්‍ය ආයතනයක් විසින් පළ කරන ලද පුවත් ලිපියක් සමග, මාධ්‍ය නිවේදනයේ පෙන්වා දී ඇති තොරතුරු සත්‍යාපනය කෙරුණු බවට ජනමාධ්‍යවේදියාගෙන් පැහැදිලිව ලැබුණු ඇඟවීමක් සහ එම සත්‍යාපන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස ලැබුණු අතිරේක තොරතුරු

පුවත් ලිපි තුන විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, මෙහි දී විමසීමට ලක් කරන ලද මාධ්‍ය නිවේදනයෙන් ජනමාධ්‍යවේදය වෙනස්වන්නේ කෙසේ ද යන්න සහභාගිවන්නන්ගෙන් විමසන්න.

කණ්ඩායම් අභ්‍යාස 4: තතු පිරික්සීම

සමාජ මාධ්‍ය වේදිකාවක සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ පළ කිරීමක (viral post) තිර දසුනක් (screenshot) පෙන්වන්න.

1. එහි දක්වා ඇති කරුණු තතු පිරික්සීමට ලක් හැකිදැයි ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
   - එහි දක්වා ඇති කරුණු සත්‍යාපනයට/ තතු පිරික්සීමට ලක් කළ හැකිද? එසේ කළ යුත්තේ හෝ නොකළ යුත්තේ ඇයි ?
   - එහි දක්වා ඇති කරුණු සත්‍යාපනයට/ තතු පිරික්සීමට ලක් කළ හැකි නම්, එය කරන්නේ කෙසේ ද? (තතු පිරික්සීමේ දී ඔවුන් විසින් සොයා බැලිය යුතු දෑ යළි සිහිපත් කරගන්නා ලෙස ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටින්න.)
2. මීළඟට, හිමිකම් කියාපෑම් පිළිබඳව කරුණුවල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට කරගෙන යන ලෙස ශිෂ්‍යයනට පවසන්න. පියවරෙන් පියවර ක්‍රියාවලිය ලේඛනගත කිරීමට ඔවුන්ට උපදෙස් දෙන්න,පසුව ඔවුන් පර්යේෂණය කරගෙන යද්දී සාකච්ඡා කරමින් ඔවුනට ප්‍රතිචාර දක්වන්න.

ඇගයුම් හා නිර්දේශ

- මාධ්‍ය ලොග් සටහන් සම්පාදනය
- අධ්‍යයන චාරිකා, පයිත විශ්ලේෂණය පිළිබඳ වාර්තා
- තතු පිරික්සීමේ අභ්‍යාස
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම, උදා. වැඩමුළු, පන්ති සාකච්ඡා.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

ප්‍රවෘත්ති මූලාශ්‍ර සහ ප්‍රවෘත්ති එක්රැස් කිරීමේ ශිල්පීය ක්‍රම (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය ඇතුළුව), ප්‍රවෘත්ති ආවරණයේ සාධාරණත්වය සහ යෝග්‍යතාව.

මෙම මොඩියුලය සඳහා සම්පත්

Article 19. (1999, June). Right to Know: Principles on Freedom of Information Legis- lation. International Standards Series. Retrieved 27 May 2009 from https://www.arti- cle19.org/data/files/RTI_Principles_Updated_EN.pdf

Asian Institute of Journalism and Communication.(2020).*Developing champion teach- ers in news literacy: Training module* [forthcoming]. Asian Institute of Journalism and Communication.

ASLIB Training Suite. Freedom of Information.(2004) Retrieved 15 February 2004 from http://www.aslib.com/training

Bertrand, Claude-Jean. (2003). Media Ethics and Accountability Systems. New York: Hampton Press

Bradshaw,Samantha and P.Howard.(2019).Global Disinformation Order 2019. Global Inventory of Organized Social Media Manipulation. Working Paper 2019. 2, Oxford UK Project on Computational Propaganda.

Burgess,JTF.& Knox,EJM.(2019).Foundations of Information Ethics. Chicago:ALA Press. Committee to Protect Journalists, at http://www.cpj.org
Digital Citizenship, Nine Themes of Digital Citizenship, at: https://www.digitalcitizen- ship.net/nine-elements.html

Dominic Ayegba Okoliko, Martinus Petrus de Wit. (2020) From "Communicating" to "Engagement": Afro-Relationality as a Conceptual Framework for Climate Change Communication in Africa. Journal of Media Ethics 0:0, pages 1-15.

Dominick, J. R. (2007). The Dynamics of Mass Communications. 9th ed. Boston: McGraw-Hill

Humanext. Ethics Trainings. (2009). Ankerstar and Dalke's Balancing Personal and Professional Ethics (programme with Trainer's Guide, reproducible exercises, hand- outs, case studies); Dr. Louis V. Larimer's Seminar on Ethical Reasoning (with Ethical TypeIndicatorProfileandTrainingManual).Retrieved22April2009fromhttp://www.newtrainingideas.com/ethics-training.html

Gender Toolkit for Educators,
http://portal.unesco.org/en/files/47654/12737402501Gender_Toolkit_for_Educators.pdf Gender%2BToolkit%2Bfor%2BEducators.pdf

Ireton, C. & Posetti, J. (2018). *Journalism, 'fake news' & disinformation: Handbook for journalism education and training*. Paris: UNESCO.

Kovach, B. and Rosenstiel, T. (2014). The Elements of Journalism: What Newspeople Should Knowand the Public Should Expect. NewYork:Three Rivers Press of Random House

Learning English. (2018, May 22). *News literacy lesson2:Veriication,independence, accountability*.Retrieved from https://learningenglish.voanews.com/a/news-litera- cy-lesson-2-verification-independence-accountability/4388049.html

Levitin, D. J. (2017). *Weaponized lies: How to think critically in the post-truth era*. New York, NY: Dutton.

Mencher,Melvin.(2006).News Reporting and Writing(10thed.).Boston:McGraw-Hill

Mendel,Toby.(2008).Freedom of Information:A Comparative Legal Survey(2ndEd.). Paris: UNESCO, at http://unesdoc.unesco.org/images/0015/001584/158450e.pdf

MIL CLICKS. Retrieved from http://m.facebook.com/MILCLICKS/&ved=2ahUKE-j3KHxzITnAhXRyYsBHQ4fDXIQFjAAegQIAxAB&usg=AOvVaw0ne6UvMTMS9c3vTB-j4rNbi&cshid=1579056787784

Ong, Jonathan Corpus and Jason A. Cabanes (2017). Architects of Networked Disin- formation, Newton Tech4Dev Network http://newtontechfordev.com/wp-content/up-loads/2018/02/ARCHITECTS-OF-NETWORKED-DISINFORMATION-FULL-REPORT.pdf

Ordway,D.(2020).“Ratedfalse”:Here’s the most interesting new research on fake news and fact checking. Retrieved from https://www.niemanlab.org/2020/01/rated-false-her-es-the-most-interesting-new-research-on-fake-news-and-fact-checking/?fbclid=IwAR-2K6OPYxCwpU0m5IRkXJnoYPjww7u8h_UiHCZMoYOAk3ljiLTZIyb3wnso

Poynter Institute, at http://www.poynter.org Reporters Sans Frontières, at http://www.rsf.org
Rosenstiel, Tom and A. Mitchell (eds). (2003). Thinking Clearly: Cases in Journalistic Decision-Making. New York: Columbia University Press

Schudson, M. (2008). Why Democracies Love an Unlovable Press. In Ireton, C. & Po- setti, J. (2018). Journalism, ‘~~Fake News~~’ & Disinformation: Handbook for Journalism Education and Training. (pp. 40-41). Paris: UNESCO.

StateoftheNewsMedia,athttp://www.journalism.org

StonyBrookCenterforNewsLiteracyDigitalResourceCenter.(n.d.).*Lesson4:Whatis news and why?* Retrieved from https://digitalresource.center/content/lesson-4-what- news-and-why

StonyBrookCenterforNewsLiteracy.(n.d.).*V.I.A.*Retrievedfromhttps://digitalresource.center/content/via

TheBenefitsofTechnologyinEducation:SangmumLeeatTEDxYouth@BIS(videoresource),https://www.youtube.com/watch?v=G1YqGeVsXTU

Ward,S.J.A.(2005).PhilosophicalFoundationsofGlobalJournalismEthics.Journalof Mass Media Ethics 20:1, 3-21

Watching the Watchdogs: A gender and media literacy toolkit for Southern Africa., https://genderlinks.org.za/programme-web-menu/publications/watching-the-watchdogs-2009-05-28/

What if we all governed the Internet? Advancing multi-stakeholder participation in Internet governance, https://unesdoc.unesco.org/ark:/48223/pf0000259717

White,RobertA.(2010)TheMoralFoundationsofMediaEthicsinAfrica,EcquidNovi:African Journalism Studies, 31:1, 42-67, DOI: 10.1080/02560054.2010.9653411

UNESCO. (2009) Guidelines for Broadcasters on Promoting User Generated Content and Media and Information Literacy. Paris: UNESCO, at http://unesdoc.unesco.org/images/0018/001871/187160e.pdf
UNESCO (2018). World Trends on Freedom of Expression and Media Development 2017/2018. UNESCO https://en.unesco.org/world-media-trends

3වන මොඩියුලය:

පර්යේෂණ, තොරතුරු චක්‍රය, ඩිජිටල් තොරතුරු සැකසීම, බුද්ධිමය දේපළ



"අපගේ තොරතුරු සමාජයේ පුරවැසියෙකු වී ඉන් ප්‍රතිලාභ ලැබීමටත්, ඊට දායකත්වය ලබාදීමටත්, තොරතුරු වාචික වේවා ලිඛිත වේවා පුද්ගලයන් විසින් තොරතුරු චක්‍රය අවබෝධ කර ගත යුතු වේ."

- හෙසුස් ලාව්, 2021

පසුබිම සහ තාර්කිකය

පදනම් මොඩියුලය වන 1වන මොඩියුලයේ සහ ඉන් පසුව ඇති වීකක තුළින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ (MIL) මූලික කරුණු පිළිබඳ ශික්ෂකයන්ට අවබෝධයක් මේ වන විට ලැබී ඇත. අනෙකුත් වැදගත් පර්යේෂණ සහ තොරතුරු චක්‍ර ගැටලු මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ ද අත්‍යවශ්‍ය සංරචක වන බව පෙන්වීම මෙම මොඩියුලයේ අරමුණ වේ.

මෙම මොඩියුලය සාම්ප්‍රදායික තොරතුරු සාක්ෂරතාවට දායක වන මූලික කොටස් පිළිබඳ අවධාරණය කරයි. බොහෝ පාඨමාලාවලින් කෙරෙන්නේ ඉගෙනුම ලබන ආකාරය ඉගෙනීමට වඩා දැනුම ලබා දීම කෙරෙහි අවධානය යොමු කිරීමයි. කෙසේ වෙතත්, අධ්‍යාපන ක්ෂේත්‍රය සහ පුළුල් සමාජය තුළ ඉහළ යන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ වටිනාකම පිළිබඳ අවධාරණය සහ පරිශීලකයන් තොරතුරු චක්‍රයේ ස්වකීය භූමිකාව සහ විචල්‍ය ස්ථානය පිළිබඳව දැනුවත් දක්ෂ ශිෂ්‍යයන් වීමේ වැදගත්කම ඉස්මතු කරයි. "තොරතුරු චක්‍රය" යන සංකල්පය ඇතැම් විට ප්‍රවෘත්ති මාධ්‍ය සම්පාදන සහ පරිභෝජන ක්‍රියාවලීන්ට සීමා වන නමුදු, එම සංකල්පය විවිධ ආයතන සහ ක්‍රියාකාරීන් තුළ සහ ඒ හරහා අන්තර්ගතය ගලා යන සහ පරිවර්තනය විය හැකි ආකාරය ආවරණය කෙරෙන වඩා පුළුල් වූවක් විය හැකි ය. අගය ඇත්තේ තනි ජායාරූපයකට වඩා ප්‍රවාහ කෙරෙහි අවධානය යොමු කිරීම තුළ මෙන්ම අවකල්‍ය බලය, ග්‍රාහක ප්‍රමාණය සහ ග්‍රාහක පිරිස මත ඇති කරන බලපෑම සහිත විවිධ ස්ථිති මඟින් බලගන්වා ඇති සන්නිවේදනයේ අන්තර් පරායත්ත ස්වභාවයයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්දර්භය තුළ, විචල්‍ය අන්තර්ගත සමූහයකින් යුතු අස්ථිර විශ්වය තුළ තොරතුරු අවශ්‍යතාව කෙසේ හඳුනා ගන්නේ ද යන්න ඉගෙනීමේ අවශ්‍යතාව මේ සියල්ලෙන් ගම්‍ය වේ.

ඉන්පසුව, මෙම පදනම මත තොරතුරු නිශ්චයනය/නැවත ලබා ගැනීම; මෙම තොරතුරු විශ්ලේෂණය කිරීම, සංවිධානය කිරීම සහ ඇගයීම; සහ එම තොරතුරු විශේෂිත තීරණ ගැනීමේ සහ ගැටලු විසඳීමේ අරමුණු සඳහා භාවිත කිරීම, යොදා ගැනීම, පිටපත් කිරීම සහ සන්නිවේදනය කිරීම කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සිදු කරන ආකාරය ද ඉන් ගම්‍ය වේ (UNESCO, 2008). මූලික වශයෙන් ගත් කල, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට පුස්තකාල කුසලතා, අධ්‍යයන හා පර්යේෂණ කුසලතා සහ තාක්ෂණ කුසලතා ඇතුළත් වේ.

සෑම පර්යේෂණයක්ම ප්‍රශ්නයකින් ආරම්භ විය යුතු අතර, දත්ත සහ තොරතුරු රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම හරහා ඊට පිළිතුරු සැපයීම හෝ තොරතුරු අවශ්‍යතාව සපුරාලීම කළ යුතු ය.

විද්‍යාව යනු හුදෙක් දැනුම් සම්භාරයක් පමණක් නොව, දැනගැනීමේ සහ ඉගෙනීමේ මාර්ගයකි. විද්‍යාව ඉගෙනීම සහ අගය කිරීම සඳහා එක් වැදගත් පදනමක් වන්නේ විද්‍යාත්මක දැනුමේ ස්වභාවය සහ ව්‍යුහයත් තනිව ගත් කල අරමුණක් ලෙසත් ඇතුළුව එය වර්ධනය කරවන ක්‍රියාවලිය පිළිබඳ ශිෂ්‍යයන් අවබෝධ කරගැනීමයි. මීට අමතරව, අලුතින් අනාවරණය වන පර්යේෂණ සාක්ෂිවලින් පෙනී යන්නේ ස්වභාවික ලෝකය පිළිබඳ විද්‍යාත්මක පැහැදිලි කිරීම් ග්‍රහණය කර ගැනීමට සහ විද්‍යාත්මක විමර්ශනවල සාර්ථකව නිරත වීමට ශිෂ්‍යයන් සතු හැකියාව, විද්‍යාත්මක දැනුම ගොඩනගා ගන්නා ආකාරය අවබෝධ කරගත් විට වඩාත් උසස් වන බවයි.

ගැටලු විශ්ලේෂණය සහ තීරණ ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම, අවබෝධ කර ගැනීම, අනුවර්තනය කිරීම, උත්පාදනය කිරීම, ගබඩා කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා නිපුණතා මාලාවක් (දැනුම, කුසලතා සහ ආකල්ප) ශික්ෂකයන් තමන් විසින්ම උපාර්ජනය කර ගත යුතු අතර ශිෂ්‍යයන් තුළ ද ඒවා වර්ධනය කළ යුතු ය. මේවා අධ්‍යාපන පරිසරයේ හෝ, සාමාන්‍ය වැඩ/වෘත්තීය පරිසරයේ හෝ පුද්ගලික උන්නතියේ හෝ, ඕනෑම අධ්‍යාපනික සහ ඉගෙනුම් සන්දර්භයකට අදාළ වන නිපුණතා වේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයෙකුට විවිධ තොරතුරු මූලාශ්‍රවලින් ලැබෙන සන්දේශ අවබෝධ කර ගැනීමේ හැකියාව ඇති අතර එම අවබෝධය ආධාරයෙන් ඇගයීම් සිදු කිරීමට හා ගැටලු විසඳීමේ හැකියාව ඇත. ශික්ෂකයා මූලික පුස්තකාල කුසලතා ද උපාර්ජනය කරගෙන ඇති අතර, ඉගෙනුම සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ලේඛනමය සම්පත් උපරිම ලෙස භාවිත කළ හැකි ය. මාධ්‍ය හා තොරතුරු සාක්ෂර ශික්ෂකයෙක් පුස්තකාල, කෞතුකාගාර, ලේඛනාගාර, ඩිජිටල් සන්නිවේදන සමාගම්, සහ මෙම ක්ෂේත්‍රයේ අධ්‍යාපනික හා පර්යේෂණ ආයතන වැනි අනෙකුත් අන්තර්ගත සපයන්නන්ගේ සහ මාධ්‍ය සමාජවල ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධයෙන් පසුවන අතර, එය අගය කරයි.

අන්තර්ගත සපයන්නනෝ ස්වකීය තොරතුරු වෙත ප්‍රවේශ වීමට මිනිසුන්ට ඉඩ ලබා දෙමින් සහ ඇතැම් අවස්ථාවල දී ස්වකීය තොරතුරු ගබඩා කරමින් වැදගත් සේවාවක් සපයති. මාධ්‍ය හැරුණු කොට, මිනිසුන්

විසින් භාවිත කරනු ලබන වෙනත් තොරතුරු මූලාශ්‍ර තිබේ (උදා. සෞඛ්‍ය නිවේදන, රජයේ වාර්තා සහ අවිධිමත්ව මෙන්ම ප්‍රසිද්ධ විවාද හරහා ද වාචිකව සන්නිවේදනය කරනු ලබන තොරතුරු). මේවා ඉලෙක්ට්‍රොනිකව, (උදා: රූපවාහිනියේ මැතිවරණ විවාද ලෙස) හෝ මුහුණට මුහුණ සිදු කරනු ලබන සැසිවල දී (උදා. නගර සභා රැස්වීම්) සිදු කළ හැකි ය. මෙම සිදුවීම්වලට මාධ්‍ය හෝ පුද්ගලයන් විසින් මැදිහත් විය හැකි ය.

බුද්ධිමය දේපළ අයිතීන් යනු තොරතුරු ජීවන චක්‍රයේ කේන්ද්‍රීය සංකල්පයක් වන අතර සෑම කෙනෙකුටම ඒ පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතු වේ. "බුද්ධිමය දේපළ අයිතිවාසිකම් යනු පුද්ගලයන්ට ඔවුන්ගේ මනසෙහි නිර්මාණ සම්බන්ධයෙන් ලබා දී ඇති අයිතියයි. එමගින් සාමාන්‍යයෙන් නිර්මාපකයාට යම් කාල සීමාවක් සඳහා සිය නිර්මාණය භාවිත කිරීම පිළිබඳ තනි අයිතියක් ලබා දෙයි[52]." බුද්ධිමය දේපළ (IP), ප්‍රකාශන හිමිකම සහ ප්‍රකාශන හිමිකමට සම්බන්ධ අයිතිවාසිකම් ප්‍රධාන අංශ දෙකකින් යුත් වේ. මෙම සංකල්පය කෙතරම් වැදගත් ද කියතොත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සාමාජික රටවල් 193 කින් සමන්විත ලෝක බුද්ධිමය දේපළ හිමිකම් සංවිධානය (WIPO) පිහිටුවන ලදි. ලෝක බුද්ධිමය දේපළ හිමිකම් සංවිධානය බුද්ධිමය දේපළ සේවා, ප්‍රතිපත්ති, තොරතුරු සහ සහයෝගීතාව සඳහා ගෝලීය සංසදයක් ලෙස කටයුතු කරයි. බොහෝ රටවල පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන හිමිකම් සහ වෙළෙඳ ලකුණු වැනි බුද්ධිමය දේපළ ආරක්ෂා කරනු ලබන නීති පවතී.

මෙම මොඩියුලය ශාස්ත්‍රීය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, පුස්තකාල කුසලතා සහ ඩිජිටල් පරිසරවේදය යන සන්දර්භය තුළ තොරතුරු චක්‍රය, පර්යේෂණ කුසලතා සහ බුද්ධිමය දේපළවලට ගරු කිරීම පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. අධ්‍යාපනික සහ ප්‍රාදේශීය ප්‍රජා නියැලීම් සන්දර්භ තුළ ගැටලු විසඳීම සහ තීරණ ගැනීම කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරේ. වර්තමාන ලෝකයේ පුළුල් පරාසයක පවතින තොරතුරු සම්පත් වෙත ප්‍රවේශ වීමේ සහ භාවිත කිරීමේ කුසලතා ඉහළ නංවා ගැනීම සඳහා ඉහත සංකල්ප සහ ඒවා අතර ඇති සම්බන්ධය අවබෝධ කර ගැනීමට ශික්ෂකයන්ට සහ ශිෂ්‍යයන්ට හැකියාව ලබා දීම එහි අරමුණයි. මෙම කුසලතා ලබා ගැනීමෙන් යාව-ජීව ඉගෙනුමකට අවස්ථාව සැලසෙන අතර එමගින් ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සක්‍රීයව බුද්ධිමය ජීවිතයකට අඛණ්ඩව සහභාගී වන බවට සහතික කෙරේ.

52. World Trade Organization, https://www.wto.org/english/tratop_e/trips_e/intel1_e.htm#:~:text=Intellectu- al%20property%20rights%20are%20the,a%20certain%20period%20of%20time.

ඒකක

1වන ඒකකය
ශාස්ත්‍රීය හා විද්‍යාත්මක තොරතුරු ගොඩනගා ඇති ආකාරය

2වන ඒකකය
සෙවීම: උපායමාර්ගික තොරතුරු ගවේෂණය

3වන ඒකකය
ශාස්ත්‍රීය හා විද්‍යාත්මක තොරතුරු ඇගයීම

4වන ඒකකය
තොරතුරු සාක්ෂරතාවේ සංකල්ප සහ යෙදුම්

5වන ඒකකය
ඉගෙනුම් පරිසර සහ තොරතුරු සාක්ෂරතාව

6වන ඒකකය
ඩිජිටල් තොරතුරු සැකසීම

7වන ඒකකය
බුද්ධිමය දේපළ සහ කර්තෘත්වය පිළිගැනීම

1වන ඒකකය: ශාස්ත්‍රීය සහ විද්‍යාත්මක තොරතුරු ගොඩනගා ඇති ආකාරය

කාලසීමාව: පැය 4 යි

ප්‍රධාන මාතෘකා

- විද්‍යාව අර්ථ දැක්වීම
- විද්‍යාත්මක දැනුම අර්ථ දැක්වීම
- විද්‍යාවේ ස්වභාවය සහ ව්‍යුහය
- විද්‍යාත්මක දැනුමේ ස්වභාවය සහ ව්‍යුහය
- නව දැනුමේ මූලාශ්‍ර

ඉගෙනුම් අරමුණු

පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා.

- විද්‍යාවේ අර්ථය
- දැනුමේ අර්ථය
- විද්‍යාව සහ දැනුම අතර සම්බන්ධය
- විද්‍යාවේ ස්වභාවය
- දැනුමේ ස්වභාවය
- විවිධ දැනුම් මූලාශ්‍ර

මෙම ඒකකයේ ඉලක්ක කරගත් නිපුණතා මට්ටම

- මූලික / හඳුන්වාදීමේ

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- විද්‍යාත්මක දැනුම ගොඩනැගෙන ආකාරය ශිෂ්‍යයන් විසින් අවබෝධ කරගත යුතු බවට ශික්ෂකයන් දිගු කලක් තිස්සේ තර්ක කර ඇත. බොහෝ විට සඳහන් කරනු ලබන නමුත් ආනුභවිකව පරීක්ෂා නොකළ එක් තාර්කිකයක් නම්, විද්‍යාව අවබෝධ කර ගැනීම තුළින් වඩාත් දැනුවත් පුරවැසියෙකු ගොඩ නගන අතර ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වයට සහාය දෙන බවයි. එනම්, විද්‍යාත්මක දැනුම නිපදවන ආකාරය අවබෝධ කරගත් පුරවැසියන් ඡන්දයේ දී මෙන් සිය එදිනෙදා ජීවිතයේ දී ද මහජන උනන්දුව ඇති විද්‍යාත්මක ගැටලු (උදා. ගෝලීය උණුසුම, පරිසරවේදය, ජානමය වශයෙන් වෙනස් කරන ලද ආහාර, විකල්ප වෛද්‍ය විද්‍යාව, සනීපාරක්ෂක අර්බුද සහ වසංගත සහ එන්නත් වැනි ඒවායේ ප්‍රතික්‍රියා) සම්බන්ධ විද්‍යාත්මක ප්‍රකාශ ප්‍රවේසමෙන් පරිභෝජනය කරන්නන් වනු ඇත.

- ශික්ෂකයන් අතර මෙම ස්ථාවරය සාධාරණීකරණය කිරීමට ඇති දෙවන තර්කය නම්, විද්‍යාවේ ව්‍යුහය සහ ස්වභාවය අවබෝධ කර ගැනීම තුළින් යමෙකුට වඩාත් හොඳින් විද්‍යාවේ නියැලීමට සහ ඉගෙනීමට හැකි වන බවයි. එනම්, ශිෂ්‍යයන් විද්‍යාව දකින්නේ ස්වභාවික ලෝකයේ ඇති සාක්ෂි රටා සඳහා ආදර්ශ ගොඩනගන පරිචය සමූහයක් ලෙස නම් සහ, සාක්ෂි ලෙස සලකනු ලබන දෑ ගොඩනැගෙන්නේ අනිශ්චිත පරීක්ෂාකාරී නිරීක්ෂණ, සත්‍යාපන අධ්‍යයන සහ තර්ක මත නම්, එවිට දැනුම ගොඩනගා ගැනීමට ඔවුන් දරන උත්සාහය වඩාත් සාර්ථක විය හැකි ය. මෙම ක්‍රියාවලි මගින් හුදෙක් ක්‍රියාත්මක කිරීම තුළින් පමණක් නොව නිරීක්ෂණය කිරීමෙන් ද විද්‍යාව ප්‍රගුණ කිරීමට සිසුන් තුළ ඇති හැකියාව වැඩි දියුණු කෙරේ.
- සහජ ඥානය, අධිකාරිය, තාර්කික-ප්‍රේරක සහ විද්‍යාත්මක අනුභූතිවාදය යනුවෙන් විටෙක දැනුමේ මූලාශ්‍ර හතරක් හඳුනාගනු ලැබේ. මෙම හතරම පර්යේෂණ උපන්‍යාසයක් සඳහා සුදුසු මූලාශ්‍ර වන නමුත් නව විද්‍යාත්මක දැනුමේ එකම පිළිගත් මූලාශ්‍රය විද්‍යාත්මක අනුභූතිවාදයයි.
- ශාස්ත්‍රීය පර්යේෂණ සහ පුද්ගලික පර්යේෂණ ලෙස පර්යේෂණ වර්ග දෙකක් වෙන්කර හඳුනාගත හැකි වේ. ශාස්ත්‍රීය පර්යේෂණ යනු විශ්ව විද්‍යාල, විද්‍යායතන සහ විද්‍යාත්මක ආයතනවල සිදු කෙරෙන පර්යේෂණ වර්ගයකි. එය බොහෝ විට විද්වතුන් සහ මහාචාර්යවරුන් විසින් සිදු කරනු ලැබේ. පුද්ගලික පර්යේෂණ පුද්ගලික ව්‍යාපාර සහ සමාගම් විසින් සිදු කරන අතර ප්‍රධාන වශයෙන් වාණිජමය වශයෙන් අදාළ ගැටලු විසඳීම සඳහා භාවිතා වේ. වර්ග දෙක අතර වෙනස්කම් තිබුණ ද, ඒවා එකිනෙකට අනුපූරක විය හැකිය. පෞද්ගලික සමාගම් ඔවුන් සඳහා පර්යේෂණ සිදු කිරීම සඳහා විශ්ව විද්‍යාල විද්වතුන්ගේ උපකාරය බලාපොරොත්තු විය හැකි අතර ඔවුහු විශ්ව විද්‍යාල මගින් සිදු කරන ශාස්ත්‍රීය පර්යේෂණ ද ප්‍රයෝජනයට ගනිති. කෙසේ වෙතත්, ඒ හරහා, පුද්ගලික අභිරුචිය සහ ප්‍රතිලාභ සඳහා අන්‍යෝන්‍යව ශාස්ත්‍රීය භාවිතය සහ ශාස්ත්‍රීය විද්වතුන් සම්බන්ධ කර ගැනීම සම්බන්ධයෙන් පර්යේෂණ සඳහා වන රාජ්‍ය ආයෝජන පිළිබඳ ගැටලු මතු විය හැකි ය. පෞද්ගලික ආයතන ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා අරමුදල් සපයන විට සදාචාරාත්මක ගැටලු ද මතු විය හැකි ය.
- පර්යේෂණ සිදු කිරීමට අප සතු විය යුත්තේ කවරාකාරයේ කුසලතා ද යන්න අවබෝධ කර ගැනීම සඳහා අපට විද්‍යාත්මක පර්යේෂණවල ලක්ෂණවලින් ඉගෙන ගත හැකි ය. වැදගත් ලක්ෂණ හයක් මගින් විද්‍යාත්මක පර්යේෂණ බොහෝ විට අනෙකුත් පර්යේෂණ වර්ගවලින් ප්‍රාමාණික ලෙස වෙන්කර හඳුනා ගැනේ. ඒවා නම් පොදු, විෂයමූලික, ක්‍රමානුකූල, සමුච්චිත, ආනුභවික සහ පුරෝකථනය වේ.
- විද්‍යාත්මක පර්යේෂණ ප්‍රධාන කාණ්ඩ දෙකකින්, එනම් (1) ප්‍රමාණාත්මක පර්යේෂණ සහ (2) ගුණාත්මක පර්යේෂණ වෙන්කර හඳුනාගත හැකි වේ. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ යන දෙඅංශයෙන්ම සමීක්ෂණ, අන්තර්ගත විශ්ලේෂණය, කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා (ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත සහ විවෘත), නිරීක්ෂණ සහ සිද්ධි අධ්‍යයනය වැනි ක්‍රම භාවිත කළ හැකිය. එක් එක් ක්‍රමය දත්ත රැස් කිරීම සඳහා විවිධ මෙවලම් භාවිත කරයි. උදාහරණයක් ලෙස, ප්‍රශ්නාවලිය යනු සමීක්ෂණය සඳහා දත්ත රැස් කිරීමේ මෙවලම වන අතර අන්තර්ගත විශ්ලේෂණය සඳහා දත්ත රැස් කිරීමට අන්තර්ගත විශ්ලේෂණ පත්‍රය භාවිත කෙරේ.
- පර්යේෂණ ක්‍රියාවලිය සඳහා විශ්වසනීය තොරතුරු අවශ්‍ය වේ. අදාළ තොරතුරු මූලාශ්‍ර සොයා ගැනීම සඳහා ප්‍රමාණවත් කුසලතා මෙයට අවශ්‍ය වේ.
- විද්‍යාව දත්ත එක්රැස් කරයි, සංවිධානය කරයි සහ විශ්ලේෂණය කරයි, එමගින් අර්ථවත් තොරතුරු සැපයිය හැකි අතර දැනුම සඳහා පදනමක් ලෙස ක්‍රියා කළ හැකිය.

ශික්ෂකයන් මෙම ඒකකය යටතේ ක්‍රියාකාරකම් පරිපාලනය කිරීමේ දී ශිෂ්‍යයන් සමග අන්තර්ක්‍රියාකාරිත්වය සහතික කළ යුතු අතර, පහත අවස්ථා පිළිබඳ උදාහරණ දීම සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්විය යුතු ය.

- විද්‍යාවේ අර්ථය
- විද්‍යාත්මක දැනුමේ අර්ථය

- විද්‍යාව සහ දැනුම අතර සම්බන්ධය
- විද්‍යාවේ ස්වභාවය සහ ව්‍යුහය
- දැනුමේ ස්වභාවය සහ ව්‍යුහය
- නව දැනුමේ විවිධ මූලාශ්‍ර

ඇගයීම් හා නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපන-සන්නිවේදන ද්‍රව්‍ය නිෂ්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්තාර, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක වෘතාන්තය/වාර්තාව

වැඩිදුර සලකා බැලීම සඳහා මාතෘකා

- උපකල්පන, නීති හෝ ආකෘති ප්‍රකාශ කිරීම
- නිගාමී චින්තනය
- කතිකා විශ්ලේෂණය

2වන ඒකකය: සෙවීම: උපායමාර්ගික තොරතුරු ගවේෂණය

කාලසීමාව: පැය 4 යි

ප්‍රධාන මාතෘකා

- ඔබේ තොරතුරු සෙවීම පටු කිරීමට සහ අදාළ කරුණ වෙතම අවධානය යොමු කිරීම සඳහා සාධක
- ඔබේ සෙවුම් තොරතුරු අවශ්‍යතා නියෝජනය කිරීම සඳහා මූල පද
- බූලීය මෙහෙයවන සහ අනෙකුත් සීමාකාරී සෙවුම් විධාන
- කාලය ඉතිරි කර ගැනීම සඳහා සෙවුම් යන්ත්‍ර කෙටි මාර්ග

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂක සහ ශිෂ්‍ය යන දෙපාර්ශ්වයම පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- කාර්යක්ෂම තොරතුරු සෙවුම් උපාය මාර්ගයක් සංවර්ධනය කිරීමට
- දත්ත ගබඩාවෙහි සෙවුම් විධාන භාවිත කරන්නේ කෙසේදැයි ඉගෙන ගැනීමට
- සෙවුම් යන්ත්‍රවල තොරතුරු ප්‍රතිදාන තෝරාබේරා ගැනීමට

මෙම ඒකකය තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන නිපුණතා මට්ටම

- මූලික

සෙවීම සහ සොයාගැනීම

පවතින අන්තර්ගතයේ සුලභත්වය යන්නෙන් අදහස් වන්නේ, සොයන තොරතුරු වෙත ප්‍රවේශ වීම සැමවිටම පහසු නොවන බවයි. දත්ත ගබඩා, සුරක්ෂිතාගාර, ගබඩා/භාණ්ඩාගාර, පුස්තකාල, තොරතුරු මධ්‍යස්ථාන ආදියෙහි තොරතුරු විවිධ ආකාරවලින් සංවිධානය කර ඇති බැවින් සහ බොහෝ විට වෙන වෙනම වර්ග කර තිබීම මීට හේතුවයි. එබැවින්, තොරතුරු සෙවීමේ දී, අදාළ තොරතුරු හෝ දත්ත ගවේෂණය කිරීමට සහ සොයා ගැනීමට උපායමාර්ග සකස් කිරීම අවශ්‍ය වේ. පුස්තකාල වැනි ඇතැම් සම්පත් සපයන්නෝ, සෙවීම පහසු කරන තොරතුරු අයිතම වර්ගීකරණය කිරීමට සහ නාමාවලිගත කිරීමේ දී ප්‍රමිතිගත ක්‍රම භාවිත කරති. කෙසේ වෙතත්, වෙබ් අඩවි වැනි වෙනත් සපයන්නන් විසින් උත්පාදනය කරනු ලැබ ගබඩා කර ඇති තොරතුරු හා දත්තවලට, අදාළ දේ සෙවීම, නිශ්චයනය සහ සමුද්ධරණය අපහසු කරන තොරතුරු සංවිධාන ක්‍රම රාශියක් භාවිත කළ හැකිය.

අන්තර්ජාලයේ සාමාන්‍ය සෙවීම් ඇතුළුව, විශේෂ සෙවුම් යන්ත්‍රයක් මගින් හෝ සමාජ මාධ්‍ය හෝ ඊ-වාණිජ්‍ය සේවා හරහා අදාළ දත්ත ගබඩා ප්‍රතිදාන ලබා ගැනීම සඳහා වන ප්‍රධාන විධාන - බූලිය මෙහෙයවන: AND,OR,NOT භාවිත කරන්න. සෙවීමේ දී මෙම වචන භාවිත කිරීම මගින් අදාළ නොවන ප්‍රතිඵල ඉවත් කර කාලය හා ශ්‍රමය ඉතිරි කර දෙනු ඇත. අදාළ නොවන සම්පත් අවම කිරීම මගින් අවශ්‍ය දේ සොයා ගැනීමට ඔබට සහය වීම සඳහා සෙවුම් යන්ත්‍ර සෙවුම් පරිසීමක භාවිත කරනු ලැබේ. මීට උදාහරණ කිහිපයක් පහත ක්‍රියාකාරකමක දක්වා ඇත.

බූලිය මෙහෙයවන ඉගෙන ගැනීම සඳහා හොඳ ක්‍රමයක් නම් ඒවා පුහුණු කිරීමයි. අදාළ මාතෘකා දෙකක් (ඓතිහාසික හෝ වර්තමාන) තෝරා ගන්නා ලෙස ශිෂ්‍යයන් හට පවසන්න. උදාහරණයක් ලෙස වෛරසයක් සහ එන්නත්, සහ ඒවා ඔවුන්ගේ රටට ධනාත්මකව සහ සෘණාත්මකව බලපෑ ආකාරය ගන්න. අනතුරුව, මැසචුසෙට්ස් තාක්ෂණික ආයතනික පුස්තකාල (Massachusetts Institute of Technology (MIT) Libraries) හි "Database Tips" වෙතින් අනුවර්තනය කරන ලද පහත මාර්ගෝපදේශ භාවිත කරමින්, වෙනත් සෙවුම් ක්‍රියාකරුවන්ගේ භාවිතය පිළිබඳ තොරතුරු ද සොයාගත හැකි සෙවුම් යන්ත්‍රයක හෝ පුස්තකාල දත්ත ගබඩාවක මෙම මාතෘකා පිළිබඳ තොරතුරු සෙවීම සඳහා ශිෂ්‍යයෝ බූලිය මෙහෙයවන යොදා ගනිති.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

1. මාතෘකාව, රට සහ දිනය සම්බන්ධ කිරීමට AND බූලිය මෙහෙයවනය භාවිත කිරීම.

පහත ප්‍රතිඵල සඳහා ඔබගේ සෙවුමේ AND භාවිත කරන්න.

- ඔබේ ප්‍රතිඵල පටු කිරීමට
- ඇතුළත් කළ සියලුම සෙවුම් පද ප්‍රතිඵල වාර්තාවල තිබිය යුතු බව දත්ත ගබඩාවට ඇතුළත් කිරීමට
- උදා: cloning AND humans AND ethics

පහත වෙන් රූපසටහනේ මැද ඇති දම් පැහැති ත්‍රිකෝණය මෙම සෙවුම සඳහා සකසා ඇති ප්‍රතිඵල සමූහය නියෝජනය කරයි. එය සෙවුම් වචන තුනේම එකතුවක් වන AND භාවිත කරන කුඩා සමූහයකි.



සෑම දත්ත ගබඩාවකම නොවුව ද බොහෝ දත්ත ගබඩාවල AND යන්න නිරායාසයෙන්ම ගම්‍ය වී ඇති බව සැලකිල්ලට ගත යුතු ය.

- උදාහරණයක් ලෙස, Google සෙවුම් යන්ත්‍රය ඔබගේ සෙවුම් පද අතරට ස්වයංක්‍රියවම AND යොදයි. ලද ප්‍රතිඵලය තුළ ඔබගේ සියලුම සෙවුම් පද ඇතුළත් වුව ද, ඒවා අතර ඔබට අවශ්‍ය ආකාරයේ සබඳතාවක් නොතිබිය හැකි ය.
- උදාහරණයක් ලෙස, මෙම සෙවුම: *college students test anxiety hkak college AND students* AND test AND anxiety බවට පරිවර්තනය කර කර ගැනේ. ප්‍රතිඵල වාර්තාවල මෙම වචන තනි තනිව දිස්විය හැකි ය.
- ප්‍රතිඵල වඩාත් නිශ්චිත කරගැනීම සඳහා ඔබට වාක්‍ය ඛණ්ඩ භාවිතයෙන් සෙවීම සිදු කළ හැකි ය. උදා: "college students" AND "test anxiety'. එවිට ලැබෙන ප්‍රතිඵලය ඔබ සොයන තොරතුරුවලට වඩා හොඳින් අනුරූප වනු ඇත.

2. ඔබේ මාතෘකාව රට සහ දිනය වැනි වෙනත් තොරතුරු හා සම්බන්ධ කිරීමට OR භාවිතා කිරීම.

පහත ප්‍රතිඵල සඳහා OR සෙවීමක් භාවිත කරන්න:

- සමාන සංකල්ප දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කිරීමට (සමාන පද).
- ප්‍රතිඵල වාර්තාවල ඔබ ඇතුළත් කළ ඕනෑම සෙවුම් පදයක් තිබීම ප්‍රමාණවත් බව දත්ත ගබඩාවට ඇතුළත් කර ඔබේ ප්‍රතිඵල පුළුල් කරන්න.
- උදා: cloning OR genetics OR reproduction.

මෙම රවුම් ත්‍රිත්වයම මෙම සෙවුම සඳහා වන ප්‍රතිඵල සමූහය නියෝජනය කරයි. OR මෙහෙයවනය භාවිතයේ දී ඉහත වචනවලින් එම ඕනෑම එකක් වලංගු බැවින් එය විශාල සමූහයකි.



3. ඔබගේ මාතෘකාව, රට සහ දිනය සම්බන්ධ කිරීමට NOT භාවිත කිරීම.

පහත ප්‍රතිඵල සඳහා ඔබගේ සෙවුමේ NOT භාවිත කරන්න:

- ඔබගේ සෙවුමෙන් වචන බැහැර කිරීමට
- ඔබගේ සෙවුම් පද මගින් ගම්‍ය විය හැකි ඇතැම් සංකල්ප නොසලකා හරින ලෙස දත්ත ගබඩාවට ඇතුළත් කරමින් ඔබගේ සෙවුම පටු කිරීමට
- උදා: "cloning NOT sheep"

4. සෙවුම් නියෝගය

දත්ත ගබඩා ඔබ ඇතුළත් කරනු ලබන විධාන අනුගමනය කරන අතර ප්‍රතිඵල ලබා දීම එම විධාන මත පදනම්ව සිදු කෙරේ. බූලීය මෙහෙයවන භාවිත කරන විට වචන සම්බන්ධ කර ඇති තාර්කික අනුපිළිවෙල ගැන දැනුවත් වන්න:

- දත්ත ගබඩා මගින් ප්‍රාථමික මෙහෙයවනය ලෙස සාමාන්‍යයෙන් AND හඳුනා ගනු ලබන අතර පළමුව සංකල්ප AND සමගින් සම්බන්ධ කරයි.
- ඔබ සෙවුමක AND සහ OR මෙහෙයවනවල සංකලනයක් භාවිත කරන්නේ නම්, වරහන් තුළ " ORed" කළ යුතු වචන එක් කරන්න.

උදා:

- ආචාරධර්ම AND (cloning OR reproductive techniques)
- (Ethics* OR moral*) AND (bioengineering OR cloning)

5. Google සෙවුම් මෙහෙයවන (DuckDuckGo, Baidu, Yandex, Ecosia වැනි වෙනත් සෙවුම් යන්ත්‍ර සලකා බලන්න).

Google Search Operators (2020) වඩාත් දියුණු මෙවලමකි. ශිෂ්‍යයන් කණ්ඩායම් කර ඉහත මෙහෙයවන භාවිත කරමින් විශේෂිත මාතෘකා පිළිබඳ පර්යේෂණ කිරීමට යොමු කිරීමට ඔබට හැකි ය. පහත වගුවේ ලැයිස්තුගත කර ඇති ප්‍රවර්ග හයෙන් සෑම එකක්ම භාවිත කර මාතෘකාව පිළිබඳ සොයන්න. ඊට අනුරූපීව, මෙම සෙවුම් මෙහෙයවන භාවිතයෙන් සෙවුම් ප්‍රතිඵල පටු කිරීමේ සහ වඩාත් ඵලදායී සමුද්ධරණයක් ලබා ගැනීමේ වාසි ඉදිරිපත් කිරීමේ කාර්යය සෑම කණ්ඩායමකටම පැවරිය හැකිය. පහත වගුවේ එම ප්‍රවර්ග හය ලැයිස්තුගත කර ඇත. මෙහි ඇතුළත් කර ඇති අධිසන්ධාන මගින්, මෙම සෙවුම් මෙහෙයවන භාවිත කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබා ගත හැකි වෙබ් පිටු වෙත යොමු කෙරේ.

3.1 වගුව: GOOGLE සෙවුම් මෙහෙයවන

සෙවුම් සේවා	සෙවුම් මෙහෙයවන
වෙබ් අඩවි සෙවීම	allinanchor:, allintext:, allintitle:, allinurl:, cache:, define:, filetype:, id:, inanchor:, info:, intext:, intitle:, inurl:, link:, related:, site:
අනුරූප සෙවීම	allintitle:, allinurl:, filetype:, inurl:, intitle:, site:
කණ්ඩායම්	allintext:, allintitle:, author:, group:, insubject:, intext:, intitle:
නාමාවලිය	allintext:, allintitle:, allinurl:, ext:, filetype:, intext:, intitle:, inurl:
ප්‍රවෘත්ති	allintext:, allintitle:, allinurl:, intext:, intitle:, inurl:, location:, source:
නිෂ්පාදන සෙවීම	allintext:, allintitle:

6. සිද්ධි අධ්‍යයනය

විවිධ රටවල විවිධ වෙළෙඳ ප්‍රචාරණ නියාමන රෙගුලාසි තිබිය හැකි ය. විවිධ රටවල ක්‍රියාත්මක වන සමාජ මාධ්‍ය සමාගමක් හෝ සෙවුම් යන්ත්‍ර සමාගමක් සොයාගෙන අදාළ රටේ ප්‍රචාරණ නියාමන රෙගුලාසි පිළිබඳ පර්යේෂණ කරන්න. එම සමාජ මාධ්‍ය හෝ සෙවුම් යන්ත්‍ර සමාගම අදාළ රටවල විවිධ නියාමන රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න විමර්ශනය කරන්න. අ)ආදායම් සහ මහජන සුබසිද්ධිය අතර සංවේදනය ආ) ආදායම් සහ පෞද්ගලිකත්වය අතර සදාචාරාත්මක ගැටලු සහ ඇ) ඉහත අ) සහ ආ) පිළිබඳ විවිධ රටවල මහජන ප්‍රතිචාරය වැනි කරුණු සාකච්ඡා කරන්න.

7. සෙවුම් සීමා කිරීමේ වෙනත් මෙවලම් භාවිත කිරීම පිළිබඳ පර්යේෂණ කිරීම

අන්තර්ජාලය සහ සෙවුම් මෙහෙයවන භාවිත කරමින්, වෙළෙඳ ප්‍රචාරණ කර්මාන්තය සඳහා ඔබේ කලාපයේ පවතින නියාමන රෙගුලාසි විමර්ශනය කරන්න. නියාමන රෙගුලාසි දක්වා ඇති ස්ථානය සහ මෙම තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය පුරවැසියන්ට තොරතුරු කෙතරම් දුරට ප්‍රවේශ්‍ය වන්නේදැයි හඳුනා ගන්න. මෙම නියාමන රෙගුලාසි නිර්මාණය කර ඇත්තේ කුමන පුද්ගලයන් හෝ කණ්ඩායම් විසින් ද යන්න හඳුනා ගන්න. නියාමන රෙගුලාසි මගින් ආවරණය වන ප්‍රධාන ක්ෂේත්‍ර සාරාංශ කර ඒවායේ අරමුණ පැහැදිලි කරන්න. නියාමනය කරන ලද සේවාවන්හි පුරවැසියන්ගේ සහ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සඳහා නියාමන රෙගුලාසි සහාය වන ආකාරය පැහැදිලි කරන්න. මෙම

නියාමන රෙගුලාසිවලින් කර්මාන්තයට ඇති විය හැකි බලපෑම පැහැදිලි කරන්න. වෙළෙඳ දැන්වීමක් මගින් නියාමන රෙගුලාසි උල්ලංඝනයවන අවස්ථාවල දී, පාරිභෝගිකයන්ට ඒ සම්බන්ධයෙන් ඇති පිහිට පිළිබඳ විමර්ශනය කරන්න. වැඩි විස්තර සඳහා වෙළෙඳ දැන්වීම් පිළිබඳ 10වන මොඩියුලය බලන්න.

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්තාර, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක වෘතාන්ත/වාර්තාව

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- උපන්‍යාස, නීති හෝ ආකෘති ප්‍රකාශ කිරීම
- නිගාමී චින්තනය
- වෙබ් අඩවිවල විශ්වසනීයත්වය තක්සේරු කිරීම

3 වන ඒකකය: සෙවීම: අධ්‍යයන හා විද්‍යාත්මක තොරතුරු ඇගයීම

කාලසීමාව: පැය 4 යි

ප්‍රධාන මාතෘකා

- ශාස්ත්‍රීය හා විද්‍යාත්මක තොරතුරු ඇගයීමේ මූලධර්ම
- ප්‍රධාන තොරතුරු මූලාශ්‍ර සඳහා ඇගයීම් නිර්ණායක

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- තොරතුරු සහ දැනුම උත්පාදනය කරන විවිධ පර්යේෂණ වර්ග අවබෝධ කරගැනීම
- තොරතුරු අදාළත්වය සහ විශ්වසනීයත්වය තක්සේරු කිරීම
- ප්‍රධාන තොරතුරු මූලාශ්‍ර ඇගයීම
- මූලාශ්‍ර වර්ග

මෙම ඒකකයේ ඉලක්කගත නිපුණතා මට්ටම

- මූලික

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- සාමාන්‍යයෙන් තොරතුරු ප්‍රාථමික, ද්විතියික සහ තෘතීයික මූලාශ්‍ර ලෙස බෙදනු ලැබේ. විද්‍යාත්මක සඟරා ලිපියක්, නිබන්ධනයක්, පර්යේෂණ වාර්තාවක් සහ ප්‍රථම ප්‍රතිදානය වැනි ඕනෑම පර්යේෂණ නිර්මාණයක් මූල දත්ත (සංඛ්‍යාලේඛන, පේටන්ට් බලපත්‍ර ආදිය ඇතුළුව) ඉදිරිපත් කරන තාක් ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සැලකේ. ද්විතීයික මූලාශ්‍ර යනු සාමාන්‍යයෙන් පොතක්, සඟරා පමණක් නොව විද්‍යාත්මක හෝ පුවත්පත් ලිපි වැනි ප්‍රාථමික තොරතුරු සාරාංශගත කරන, උපුටා දක්වන හෝ සාරාංශ කරන අන්තර්ගත සහිත ප්‍රකාශන වේ. තෘතීයික මූලාශ්‍රයක් යනු සාමාන්‍යයෙන් ග්‍රන්ථ නාමාවලියක්, දත්ත ගබඩාවක්, විශ්වකෝෂයක් වැනි මූලාශ්‍රවල සම්පාදනයකි. කුමන මූලාශ්‍රයක් භාවිත කළත්, ඔබේ පර්යේෂණයේ පරමාර්ථය තීරණ ගැනීම වුවද, එසේත් නැතහොත් විවේචය පිණිස කියැවීමක් වුවද, ඔබ විචාරශීලී තක්සේරුවක නියැලිය යුතුය.
- තොරතුරු ඇගයීමට තොරතුරුවල ප්‍රභවය, විශ්වසනීයත්වය සහ අදාළත්වය හඳුනා ගැනීම සඳහා තීරණාත්මක ක්‍රියාවලියක් අවශ්‍ය වේ. මෙයට තොරතුරු කෙතරම් යාවත්කාලීන/මෑතකාලීන ද යන්න මෙන්ම භූගෝලීය සහ විෂය ආවරණය ද ඇතුළත් වේ. තොරතුරු විශ්වසනීයත්වය යනු පහත සඳහන් මූලිකාංග තක්සේරු කිරීමයි: කර්තෘ, මාතෘකාව, ප්‍රකාශකයා, ස්ථානය, දිනය, පටුන සමාලෝචනය කිරීම සහ ග්‍රන්ථ නාමාවලිය. මෙම මූලිකාංග, මොනොග්‍රාෆ් (පොත්, නිබන්ධන, වාර්තා, පත්‍රිකා) හැඳින්වෙන විවිධ නම් යටතේ මෙන්ම, අනුක්‍රමික (ජර්නල, සඟරා, වාර්ෂික සඟරා, ක්‍රියාදාම), වෙබ් මූලාශ්‍ර (වෙබ් අඩවි, ජන මාධ්‍ය, සාකච්ඡා, ට්විට්, ආදිය) සහ පේටන්ට් බලපත්‍ර, ප්‍රමිති සහ ජන මාධ්‍ය සන්දේශ වැනි වෙනත් ආකාරයේ ප්‍රභව සමග ද පවතී. ඉගෙනුම් පරිසරවලල සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ ප්‍රධාන ශාස්ත්‍රීය මූලාශ්‍ර වන්නේ සාමාන්‍යයෙන් සඟරා සහ පොත් ය.

නිශ්චිත තොරතුරු සොයන විට මූලාශ්‍රවල අදාළත්වය තක්සේරු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ උදාහරණ පහත දැක්වේ:

1. *මාතෘකාව:* පරීක්ෂා කළ යුතු පළමු මූලිකාංගය මාතෘකාවයි. එය ඔබගේ තොරතුරු අවශ්‍යතාවලට අදාළ බව පෙන්නුම් කරනවා ද? කියවීම සඳහා එය ඔබව පොලඹවන්නේ ද? හොඳ මාතෘකාවක් ප්‍රකාශනයේ අන්තර්ගතය පිළිබිඹු කරයි.
2. *කර්තෘ:* කර්තෘගේ (හෝ කතුවරුන්ගේ) ප්‍රාමාණික වැදගත්කම, එනම් ඔවුන් පෙර ප්‍රකාශනවල හෝ පර්යේෂණ ප්‍රතිදාන තුළින් කොපමණ දැනුමක් සහ ප්‍රවීණත්වයක් පෙන්නුම් කර තිබේ ද යන්න සමාලෝචනය කරන්න., කර්තෘ අනුබද්ධතාව යනු, කතුවරයාට අවසාන පක්ෂග්‍රාහීත්වයක් ඇත්නම්, ඔබට ඒ පිළිබඳ අවබෝධයක් ලබා දිය හැකි, සලකා බැලිය යුතු තවත් සාධකයකි.
3. *ප්‍රකාශක:* ප්‍රකාශනය මුද්‍රණය කර ඇති ප්‍රකාශකයා පරීක්ෂා කරන්න. ප්‍රකාශකයා හොඳින් ස්ථාපිත සමාගමක් හෝ සංවිධානයක් (උදාහරණයක් ලෙස වාණිජ එකක්, පර්යේෂණ මධ්‍යස්ථානයක්, විශ්ව විද්‍යාලයක් හෝ රජයේ ආයතනයක්) නම්, එම ප්‍රකාශනය සමපදස්ථ සමාලෝචනයක්, අන්තර්ගත හා විලාස ඇගයීමක් ඇතුළු දීර්ඝ සංස්කරණ ක්‍රියාවලියකට භාජනය වී ඇත. උදාහරණයක් ලෙස ස්වයං ප්‍රකාශිත පොතක් විශ්වසනීයත්වයෙන් අඩු මූලාශ්‍රයක් වනු ඇත.
4. *ද්විතීයික අදියර* - මූලික කරුණු පිරික්සන්න. කතුවරයා සහ මාතෘකාව තක්සේරු කළ පසු, නිබන්ධන සහ අනුක්‍රමිකවල, දිනය පරීක්ෂා කරන්න. එසේම පටුන සහ ග්‍රන්ථ නාමාවලිය වැනි එම ප්‍රකාශනයේ මූලික කොටස් පිරික්සන්න. මෙම මූලිකාංග මගින් ඔබේ කාර්යයට මෙම නිර්මාණයේ අදාළත්වය පිළිබඳ වඩා හොඳ අදහසක් ලබා දෙනු ඇත.

5. *නෙවන අදියර* - අන්තර්ගතය පිරික්සන්න. ලිපියේ හැඳින්වීම සහ නිගමන, පිරික්සනු ලබන පරිච්ඡේද හෝ ලිපි කොටස් කියවන්න. පර්යේෂණ නිමැවුම් කියවන විට, අනෙකුත් පර්යේෂණ ක්‍රමවේද අංග අතර, ක්‍රමවේදය සුදුසු ද, නියැදිය ප්‍රමාණවත් ද යන්න පරීක්ෂා කිරීම වැදගත් වේ.

- සෙවුම් යන්ත්‍රයක් භාවිතයෙන් ඉහත සඳහන් කළ සියලුම අංග තක්සේරු කිරීම මාර්ගගතව පරීක්ෂා කළ හැකි ය. විශේෂයෙන්ම ඔබේ පර්යේෂණයට හෝ තීරණයට පදනම් වන ප්‍රකාශන සඳහා එවැනි හරස් පරීක්ෂණ ඇගයීමක් අවශ්‍ය විය හැකි ය. ඔබ විෂයකට හුරු වන විට, මූලාශ්‍රවල අදාළත්වය සහ විශ්වසනීයත්වය ඇගයීමට පහසු වනු ඇත.
- නිසි සම්පත් සොයා ගැනීම සඳහා ඉහත සඳහන් කළ පරිදි අනෙකුත් සාධක අතර විෂය වලංගුභාවය, භූගෝලීය ආවරණය සහ එහි සමකාලීන අදාළත්වය හඳුනා ගැනීම සඳහා ඇගයීමට ලක් කළ යුතු තොරතුරු සොයා ගැනීමට සහ නැවත ලබා ගැනීමට කුසලතා අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් තොරතුරු ජනනය වන්නේ දිගු ක්‍රියාවලියකින් පසුව ය. ශාස්ත්‍රීය සහ විද්‍යාත්මක ආයතන විසින් නිකුත් කරන ලද තොරතුරු හෝ රජයේ දත්ත, පොත් සම්බන්ධයෙන් සංස්කරණය කිරීම සහ සඟරා ලිපි සම්බන්ධයෙන් සම සමාලෝචන වැනි වලංගුකරණ ක්‍රියාවලීන්ට භාජනය වේ. දායකත්ව සියලුම ආකාරයේ නිබන්ධන සහ අනුක්‍රමික ප්‍රකාශනවල ප්‍රකාශයට පත් කෙරේ. උසස් තත්ත්වයේ ප්‍රකාශන බොහෝ විට දායකත්ව සඟරාවල කොටසක් වන අතර ඒවා සාමාන්‍යයෙන් සුවිගත කර සාමාන්‍යයෙන් ඉහළ දායකත්ව පිරිවැයක් ඇති දත්ත සමුදායන් හරහා බෙදා හරිනු ලැබේ. පේටන්ට් බලපත්‍ර සහ ප්‍රමිති වැනි ව්‍යාපාරික තොරතුරු ඇතුළුව ජර්නල්, විද්‍යුත් පොත් සහ අනෙකුත් නිර්මාණ සඳහා ප්‍රවේශය සහිත ගෙවුම්-දායකත්ව දත්ත ගබඩාවලට අමතරව ප්‍රමුඛත්වය ගන්නා විවෘත ප්‍රවේශ ප්‍රකාශන තිබේ.
- විශ්වවිද්‍යාල, දැනුම් සංවිධාන සහ රජයන් විසින් විවෘත ප්‍රවේශ සුරක්ෂිතාගාර සම්පාදනය කරනු ලැබේ. ජාත්‍යන්තර අනුකූලතා ප්‍රමිති යටතේ ගොඩනගා ඇති ආයතනික, කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර සුරක්ෂිතාගාර පවා ඇත. අනෙක් අතට ශාස්ත්‍රීය, පොදු, පාසල්, විශේෂ සහ ජාතික පුස්තකාල තොරතුරු උපාර්ජනය කර, සංවිධානය කර, එම තොරතුරු සිය ප්‍රජාවන් අතර බෙදාහරින හෙයින් ද, බොහෝ විට පරිශීලකයන්ට තොරතුරු මාර්ගෝපදේශ සහ සහාය සපයන විමර්ශන සේවා ඔවුන් සතු වන බැවින් අන්තර්ජාලයේ පවතින විශ්වාසදායක විවෘත ප්‍රවේශ තොරතුරු සඳහා දොරටු ලෙස ක්‍රියා කරන හෙයින් ද, ඒවා ගුණාත්මක තොරතුරු සඳහා හොඳම මූලාශ්‍ර ලෙස සැලකිය හැකි ය.

ඉගෙනුම් අභ්‍යාස

විවිධ මූලාශ්‍රවලින් අන්තර්ගතය විචාරශීලීව ඇගයීමට සිසුන්ට හැකි වන පරිදි ඉගෙනුම් ක්‍රියාකාරකම් සිදු කරන ලෙස ශික්ෂකයන්ට ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටිය හැක:

1. **පොත්:** තමන් කැමති මාතෘකාවක් පිළිබඳ පොත් තුනක් තෝරා ගෙන, විස්තර කර ඇති නිර්ණායක භාවිතයෙන් ඒවා ඇගයීමට සහභාගිවන්නන් හට පවසන්න.
2. **සඟරා ලිපි:** සහභාගිවන්නන් කණ්ඩායම්වලට බෙදා, සිය ප්‍රජාවේ ගැටලුවක් හඳුනා ගැනීමට ඔවුන්ට මග පෙන්වන්න. විස්තර කර ඇති විශ්වසනීයත්ව නිර්ණායක සපුරාලන ශාස්ත්‍රීය ලිපි තුනක් ඔවුන් සොයා ගත යුතු ය. ලිපි මගින් ප්‍රජා ගැටලුවට අර්ධ හෝ සම්පූර්ණ විසඳුම් යෝජනා කළ හැකිය. තෝරාගත් ලිපි විශ්වාසදායක වන්නේ මන්දැයි ලියන ලෙස ශිෂ්‍යයන් හට පවසන්න.
3. **කතුවරුන්ට** තම ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් වශයෙන් සාමාන්‍යයෙන් ප්‍රකාශන ගණනාවක් තිබේ. උදාහරණයක් ලෙස නොබෙල් ත්‍යාගලාභියෙකු හඳුනා ගෙන, ඔවුන්ගේ ප්‍රකාශන සෙවීමට සහ ප්‍රකාශකයා, සංස්කාරක සහ අනුබද්ධ ආයතනය කවුරුන්ද යන්න අනුව වඩාත්ම කීර්තිමත් ඒවා මොනවාදැයි තක්සේරු කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
4. **ප්‍රකාශකයන්:** තමන් කැමති සාමාන්‍ය ක්ෂේත්‍රයක වඩාත් ප්‍රසිද්ධ ප්‍රකාශකයන් හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. විෂය වඩාත් නිශ්චිත වන තරමට, විශේෂිත ප්‍රකාශකයන් අඩු විය හැකි ය.

5. මාධ්‍ය සහ තොරතුරු ස්ථල විද්‍යාව: ප්‍රාථමික, ද්විතියික සහ තෘතීයික කාණ්ඩ සහ මාධ්‍ය වර්ග සහ තොරතුරු කොපමණ ප්‍රමාණයක් තිබිය හැකි ද යන්න හඳුනා ගැනීමට සෙවීමක් සිදු කරන්න. එක් එක් තොරතුරු සහ මාධ්‍ය ප්‍රවර්ගය හෝ වර්ගය, විශ්වසනීයත්වය අනුව, උදාහරණයක් ලෙස, ඔවුන් සිදු කරන සමපදස්ථ සමාලෝචනයට හෝ සංස්කරණ ක්‍රියාවලියට අනුව 1 සිට 10 දක්වා ශ්‍රේණිගත කරන්න.

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්තාර, සමාජ මාධ්‍ය කාඩ්පත්, විලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක වෘතාන්ත/වාර්තාව

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- සාහිත්‍ය විචාරයක් සිදු කිරීම
- දත්ත විශ්ලේෂණ ශිල්පීය ක්‍රම
- පර්යේෂණ සොයාගැනීම්වල රටා සහ ප්‍රවණතා හඳුනා ගැනීම

4 වන ඒකකය: තොරතුරු සාක්ෂරතාවේ සංකල්ප සහ යෙදුම්

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- තොරතුරු සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ හැඳින්වීම
- තොරතුරු සාක්ෂරතාවේ මූලික සංකල්ප
- සමාජ සහ නව කුසලතා පිළිබඳ තොරතුරුවල බලපෑම
- තොරතුරු සාක්ෂරතාවේ ප්‍රමිති සහ යෙදුම්
- තොරතුරු සාක්ෂරතාවේ අදියර

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- තොරතුරු සහ දැනුම් සමාජවල තොරතුරුවල කාර්යභාරය සහ වැදගත්කම සහ තොරතුරු සාක්ෂරතා කුසලතාවල අවශ්‍යතාව විස්තර කිරීම
- සියලුම විෂයපථ සඳහා අදාළ වන තොරතුරු සාක්ෂරතාවේ අදියර/ප්‍රධාන අංග පිළිබඳ අවබෝධය නිරූපණය කිරීම
- සාමාන්‍ය තොරතුරු මූලාශ්‍ර (මුද්‍රණය සහ විද්‍යුත්) හඳුනාගෙන ගවේෂණය කිරීම
- තොරතුරු සාක්ෂරතා ප්‍රමිති විශ්ලේෂණය කිරීම
- තොරතුරු මෙවලම් සහ සම්පත්වල සදාචාරාත්මක සහ වගකීම්සහගත භාවිත හඳුනාගෙන සාකච්ඡා කිරීම

සංකල්ප

21 වැනි සියවස සඳහා 'තොරතුරු, 'තොරතුරු සාක්ෂරතාව, 'තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ' සහ 'ප්‍රධාන කුසලතා' යන යෙදුම් තොරතුරු සහ දැනුම් සමාජය පිළිබඳ සාකච්ඡාවල දී නිතර භාවිත වේ. සහභාගී වීම සඳහා පුරවැසියන්ට නව නිපුණතා (දැනුම, කුසලතා සහ ආකල්ප) අවශ්‍ය වේ. පුහුණුවෙහි යෙදීමට පෙර මෙම නියමයන් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වන අතර පළමුව තොරතුරු පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයකින් ආරම්භ කළ යුතු ය. මාධ්‍ය සාක්ෂරතාව, ඩිජිටල් සාක්ෂරතාව, සමාජ මාධ්‍ය සාක්ෂරතාව, පුස්තකාල කුසලතා සහ යුනෙස්කෝ සංවිධානය විසින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ආවරණය යටතට ගැනෙන පද, ඉහත පදවලට අදාළ වන්නේ කෙසේ ද යන්න පිළිබඳ වැඩි විස්තර සඳහා මෙම විෂයමාලාවේ 1 කොටස, විෂයමාලාව සහ නිපුණතා රාමුව සහ 1වන මොඩියුල බලන්න.

තොරතුරු අර්ථ දැක්වීම

පහත තොරතුරු අර්ථ දැක්වීම් සාකච්ඡාවට ලක් කරන්න:

- තොරතුරු යනු භාවිත කළ හැකි ආකාරයෙන් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි එකතු කර, සකස් කර, අර්ථකථනය කරන ලද තොරතුරු වේ.
- තොරතුරු යනු "අපව වෙනස් කරන" දේය (ස්ටැෆර්ඩ් බියර්, 1979).
- තොරතුරු යනු මිනිසුන්ගේ විඥානයට ළඟා වන ඔවුන්ගේ දැනුමට දායක වන දේ ය. (බ්ලොක්ඩිජික් සහ බ්ලොක්ඩිජික්, 1987)
- 'තොරතුරු යනු ලබන්නාට අර්ථාන්විත සහ වර්තමාන හෝ අනාගත ක්‍රියාවන් හෝ තීරණවල දී සැබෑ හෝ වටහාගත් වටිනාකමක් ඇති ආකෘතියක් බවට සැකසුණු දත්ත වේ. (ඩේවිස් සහ ඔල්සන්, 1984).

මෙම අර්ථ දැක්වීම්වල පොදු සාධකය කුමක් ද? 21 වැනි සියවසට ඒවා අදාළ යැයි ඔබ සිතන්නේ ද? තොරතුරු පිළිබඳ වෙනත් නිර්වචන පිළිබඳ පර්යේෂණ කරන්න. යෙදුම පිළිබඳ පුළුල් විස්තරයක් ලබා දෙන අර්ථ දැක්වීම් ඔබට සොයාගත හැකි ද? තොරතුරු ම දත්ත ලෙස ක්‍රියා කළ හැකි බවත්, ඒවා වැඩිදුර තොරතුරු බවට සැකසිය හැකි බවත්, ඒවා භාවිතයට ගතහොත් දැනුම බවට පත්වන බවත් සලකන්න.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂයමාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- විචාරශීලී චින්තනය නිර්වචනය කරන්න. විචාරශීලී චින්තනයේ තොරතුරු විශ්ලේෂණය, සංශ්ලේෂණය සහ ඇගයීමේ කාර්යභාරය සාකච්ඡා කරන්න. ශිෂ්‍යයන්ගේ දෛනික ජීවිතයේ සන්දර්භය තුළ අර්ථවත් සහ වටිනා සිද්ධි ඉදිරිපත් කරන්න.
- "තොරතුරු අධිභාරය (Information Overload)" යන යෙදුම නිර්වචනය කර, මිනිසුන් සාවද්‍ය තොරතුරු අන්තර්ගතයෙන් තොරතුරු වෙන්කර හඳුනා ගැනීමට වෙහෙස දරන "තොරතුරු වසංගතය (Infodemic)" යන සංකල්පයට සම්බන්ධ කරන්න.

තොරතුරු සාක්ෂරතාවේ අවධි/මූලිකාංගවලට පහත දෑ ඇතුළත් වේ:

- තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීම/පිළිගැනීම.
- තොරතුරු මූලාශ්‍ර නිර්ණය කිරීම.
- තොරතුරු සොයා ගැනීම හෝ සෙවීම.
- තොරතුරුවල ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීම සහ ඇගයීම.
- තොරතුරු සංවිධානය කිරීම, ගබඩා කිරීම හෝ සංරක්ෂණය කිරීම.
- සදාචාරාත්මක, කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් තොරතුරු භාවිත කිරීම.
- නව දැනුම නිර්මාණය කිරීම සහ සන්නිවේදනය කිරීම.

- තොරතුරු සාක්ෂරතාවේ අවධි/මූලිකාංග පිළිබඳ සාමාන්‍ය ලෙස සාකච්ඡා කරන්න. (Woody Horton Jr., 2007 Understanding Information Literacy - a Primer. Paris, UNESCO, පිටු 9 - 13 සහ ඇමුණුම B බලන්න).
- තොරතුරු සාක්ෂරතා ක්‍රියාවලියේ එක් එක් අවධියේ දී/අංගවල දී අවශ්‍ය ප්‍රධාන කුසලතා පිරික්සුම් ලැයිස්තුවක් සහාගීවන්නන් ලවා සූදානම් කරවන්න. විවිධ ගැටලු විසඳීමේ සන්දර්භ තුළ මෙය යොදවන්නේ කෙසේ ද? ගැටලුවක් විසඳීමට හෝ නිශ්චිත තීරණයක් ගැනීමට අවශ්‍ය තොරතුරු හඳුනාගෙන නිවැරදිව නිර්වචනය කරන්නේ කෙසේ ද? (උදා. "මූල්‍ය ගැටලුවක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට මුල්‍ය උපදෙස් තොරතුරු")?
- තොරතුරු මූලාශ්‍ර ප්‍රාථමික, ද්විතියික සහ තෘතීයික මූලාශ්‍ර වශයෙන් පුළුල් කණ්ඩායම් තුනකට වර්ග කළ හැකි ය. මෙම තොරතුරු මූලාශ්‍ර පිළිබඳ ශික්ෂකයන්ට විස්තර කර එවැනි මූලාශ්‍ර සඳහා උදාහරණ ලබා දීමට ඔවුන්ට මග පෙන්වන්න.

තොරතුරු සමාජය - සහ දැනුම් සමාජ

- වත්මන් ලෝකය ක්‍රියා කරන ආකාරයෙහි සැලකිය යුතු වෙනසක් ඇත. සීඝ්‍ර තාක්ෂණික වර්ධනය මගින්, තොරතුරු සහ දැනුම යනු ආර්ථික, සමාජීය, දේශපාලනික සහ සංස්කෘතික ජීවිතය බලගන්වන යාන්ත්‍රණයක් බවට පත් කරනු ලැබීමට සමත් වී ඇත. "දැනුම් සමාජ" බවට පත්වීමේ අරමුණ සාක්ෂාත් කරගනිමින් මෙම සංසිද්ධියෙන් මතුවීම තොරතුරු සමාජය ලෙස හඳුන්වනු ලැබේ.

    - ඔබේ පුස්තකාලයේ හෝ අන්තර්ජාලයේ "තොරතුරු සමාජය" යන යෙදුම ගැන සෙවීමක් කරන්න. තොරතුරු සමාජය තුළ පවතින ප්‍රධාන උපකල්පන විස්තර කරන්න. වර්තමාන සමාජයේ ජීවිතයට සහ ඉගෙනීමට මෙම උපකල්පනවල අදාළත්වය සාකච්ඡා කරන්න. "දැනුම් සමාජ" යන යෙදුම භාවිත කරමින් ද එයම කරන්න. බහුවිධත්වය පිළිබිඹු කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය මෙම

යෙදුම බහු වචනයෙන් භාවිත කරන ආකාරය සැලකිල්ලට ගන්න. සංකල්ප දෙක අතර පවතින සමානකම් සහ වෙනස්කම් තිබේ නම්, ඒවා මොනවා ද?

- ඔවුන්ගේම දැනුම මත පදනම්ව පුස්තකාල කුසලතා ඇතුළු තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ඔවුන් සිතන දේ ලිවීමට ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් හට පවසන්න. වර්තමාන තොරතුරු සමාජයේ සැරිසැරීමට මෙම කුසලතා තිබීම අදාළ වීමට හේතු පහක් ද ඔවුන් ලැයිස්තුගත කළ යුතු ය.
- තොරතුරු, තොරතුරු සමාජය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, තොරතුරු අධිභාර සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) අතර සම්බන්ධය විස්තර කරන අවශ්‍ය විවරණ සහිත රූපසටහනක් ඇඳීමට ශික්ෂකයන් හට පවසන්න. භාවිත කරන ලද රූපසටහන තෝරා ගැනීම සහ ඔවුන් විසින් විවිධ සංකල්ප කිසියම් ස්ථානයක ස්ථානගත කිරීමට තීරණය කළ ආකාරය සාකච්ඡා කරන්න.
- අපගේ ජීවිත කාලය තුළ, විශේෂයෙන් උපාධි අපේක්ෂකයාගේ සිට උපාධිධාරී සහ වෘත්තීය මට්ටම් දක්වා (යාවජීව ඉගෙනුම් සන්දර්භය තුළ) තොරතුරු සාක්ෂරතාවේ මට්ටම වෙනස් වන / වැඩි වන ආකාරය ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. තොරතුරු සහ දැනුම් නිෂ්පාදන චක්‍රය පිළිබඳ සාකච්ඡා කරන්න. සමාජයේ අන්තර්ගත සපයන්නන්ගේ කාර්යභාරය, කාර්යයන් සහ වගවීම විශ්ලේෂණය කරන්න. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතයෙන් තොරතුරු සාක්ෂරතා කුසලතා වර්ධනය කරන ආකාරය සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයෙකු තොරතුරු සාක්ෂර පුද්ගලයෙකු බවට පත් කරන්නේ කුමක් මගින්දැයි විස්තර කරන්න.
- සිවිල් සමාජයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහ රැකියා සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා විවිධ ආකාරයේ තොරතුරු ජනනය වන ආකාරය, ඒවායේ පොදු ලක්ෂණ සහ සෞඛ්‍ය සහ යහපැවැත්ම සඳහා ඒවායේ භාවිතය සහ වටිනාකම සංසන්දනය හා විසංසන්දනය කරන්න.

- පහත මාතෘකා වලින් එකක් හෝ කිහිපයක් පර්යේෂණ කර විවාද කරන්න:

  - තොරතුරු යනු ක්‍රියාවට හෝ තීරණ ගැනීමට ආදානයක් මිස නුදු වාණිජ භාණ්ඩයක් නොවේ. (ආශ්‍රිත ග්‍රන්ථ සඳහා, *Towards Literacy Indicators, UNESCO*, 2008, 14 වන පිටුව බලන්න)
  - තොරතුරු සැපයීම සහ ප්‍රවේශය සමාජය තුළ බලය සහ පාලනය පිළිබඳ මූලාශ්‍රයකි.
  - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (එනම් ඩිජිටල් සාක්ෂරතාවට සම්බන්ධ කුසලතා) භාවිත කිරීමට තොරතුරු සාක්ෂරතාව සඳහා වෙනම කුසලතා අවශ්‍ය ද? නිදසුන් වශයෙන්, ඩිජිටල් සාක්ෂරතාවෙන් තොර මිනිසුන්ට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවක් තිබිය හැකි ද, නැතහොත් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් තොර වූ මිනිසුන්ට ඩිජිටල් සාක්ෂරතාවක් තිබිය හැකිද?
  - තොරතුරු පිළිබඳ සංස්කෘතික ආකල්ප සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න. ඔබේ සමාජය තුළ තොරතුරුවලට ප්‍රවේශ වන්නේ සහ ඒවා අගය කරන්නේ කෙසේ ද? මුද්‍රිත තොරතුරුවලට ප්‍රවේශවීම (උදා: ප්‍රධාන පුවත්පත්වලින්) තිරවල දිස්වන තොරතුරුවලට ප්‍රවේශවීම සමග සැසඳෙන්නේ කෙසේ ද? තොරතුරු සහ බලය අතරත්, මුද්‍රිත මාධ්‍ය සහ ඩිජිටල් මාධ්‍ය අතරත් ඇති සම්බන්ධය කුමක් ද? ජනනය කරන ලද තොරතුරු පිටුපස සිටින පුද්ගලයින්ගේ අනන්‍යතාව කුමක් ද? මෙම තොරතුරු පිළිබඳ දැනුම වැදගත් ද සහ ඒ ඇයි? ශික්ෂ්‍යයන්ට පහත ක්‍රියාකාරකම් යෝජනා කරන්න:
  - මුද්‍රිත මාධ්‍යයෙන් ලැබෙන තොරතුරුවල වටිනාකම (උදා. පුවත්පත්, සඟරා, ආදිය) සහ ඒවා ගබඩා කිරීම, ලබා ගැනීම සහ භාවිතය සම්බන්ධ පිරිවැය තක්සේරු කරන්න. විමර්ශනය මගින් පහත සඳහන් ගැටලු ද විසඳිය යුතු ය: එමගින් ජනනය කරන ප්‍රතිලාභ මත පදනම්ව තොරතුරුවල වටිනාකම, තොරතුරු පැවතීම හෝ නොමැතිවීම මත පදනම්ව එහි යථාර්ථවාදී වටිනාකම සහ තොරතුරු නොපවතී නම් පරිශීලකයන් හට මුහුණ දීමට වන ප්‍රතිවිපාක.
  - රෝගවලට එරෙහිව සටන් කිරීම, රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම හෝ ගුරුවරයෙකුගේ පන්තිකාමර තුළ ශික්ෂණවිද්‍යා පරිචය වැඩිදියුණු කිරීම සඳහා මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා කුසලතා අදාළ වන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න.
  - අන්තර්ජාලය හෝ පුස්තකාලයක් හෝ දෙකම භාවිත කරමින්, පහත සඳහන් ක්ෂේත්‍රවලින් එකක් විමර්ශනය කිරීමට ප්‍රශ්නයක් හෝ ගැටලුවක් හඳුනා ගන්න: පුරවැසි අධ්‍යාපනය, විද්‍යාව,

සමාජ අධ්‍යයනය, ඉතිහාසය, හෝ භූගෝල විද්‍යාව. ඉදිරිපත් කිරීමේ මෘදුකාංග භාවිතයෙන් ඔබේ පර්යේෂණයේ ප්‍රතිඵල ඉදිරිපත් කරන්න. ඉදිරිපත් කිරීමෙන් පසු, පහත සඳහන් දේ ගැන සිතන්න: මාතෘකාව පිළිබඳ පවතින විවිධ තොරතුරුවලින් ඔබට ඉදිරිපත් කිරීමට අවශ්‍ය දේ තෝරා ගත්තේ කෙසේ ද? ඔබට ප්‍රවේශ විය නොහැකි වූ එහෙත් ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය කළ මාතෘකාව කුමක් ද? මෙය ඔබගේ ඉදිරිපත් කිරීමට බලපෑවේ කෙසේ ද? අවසාන වශයෙන්, ඔබ රැස් කරගත් තොරතුරු ඔබේ විශේෂිත සන්දර්භයට අදාළ වන පරිදි පරිවර්තනය කළේ ද? ඒ කෙසේ ද සහ ඇයි?

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්තාර, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක වෘතාන්ත/වාර්තාව

5වන ඒකකය: සෙවීම: ඉගෙනුම් පරිසර සහ තොරතුරු සාක්ෂරතාව

කාලසීමාව: පැය 3 යි

ප්‍රධාන මාතෘකා

- Big 6 සංකල්පය - අදියර හයකින් තොරතුරු ගැටලු විසඳීම සඳහා මාර්ගෝපදේශය.
- පුස්තකාල භාවිත කිරීම.
- ඉගෙනුම් පරිසර සහ අන්තර්ගත සපයන්නන්.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- තොරතුරු සම්ප්‍රේෂණය සහ ඉගෙනුම සඳහා තොරතුරු අතර වෙනස්කම් අවබෝධ කරගැනීම
- තොරතුරු සංවිධානය කිරීමේ ප්‍රධාන අංග පිළිබඳ අවබෝධය විස්තර කිරීම සහ නිරූපණය කිරීම, එනම් තොරතුරු සහ දැනුම සොයා ගැනීම සඳහා වර්ගීකරණ ක්‍රම භාවිත කිරීම (උදා: පුස්තකාල සමූහ වර්ගීකරණය, දර්ශක, සාරාංශ, ග්‍රන්ථ නාමාවලිය, දත්ත ගබඩා, ආදිය)
- ඉගෙනීම සඳහා ඵලදායී ලෙස පුස්තකාලයක් භාවිත කරන්න - විශේෂිත මාතෘකාවක් හෝ ගැටලුවක් පර්යේෂණ කිරීම සඳහා පුස්තකාලයක් ඉදිරිපත් කරන අවස්ථා ඇගයීම
- තොරතුරු ගැටලු විසඳීම සඳහා Big 6 සංකල්පයෙහි අදියර යෙදීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- තොරතුරු සාක්ෂරතාව සහ තොරතුරු ගැටලු විසඳීම සඳහා පහත සඳහන් සය-අදියර රාමුව සලකා බලන ලෙස ශික්ෂකයන් හට පවසන්න. (රාමුව පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විස්තරයක් සඳහා මෙම ඒකකයේ අවසානයේ ඇති වගුව බලන්න):
    - කාර්ය නිර්වචනය: තොරතුරු ගැටලුව නිර්වචනය කිරීම සහ අවශ්‍ය තොරතුරු හඳුනා ගැනීම.
    - තොරතුරු සෙවීමේ උපායමාර්ග: සියලු විභවීය මූලාශ්‍ර තීරණය කිරීම සහ හොඳම මූලාශ්‍ර තෝරා ගැනීම.
    - සොයා ගැනීම සහ ප්‍රවේශ වීම: මූලාශ්‍ර සොයා ගැනීම සහ මූලාශ්‍ර තුළ තොරතුරු සොයා ගන්න.
    - තොරතුරු භාවිතය: නියැලීම (උදා: කියවීම, ඇසීම, බැලීම, ස්පර්ශ කිරීම) සහ අදාළ තොරතුරු උපුටා ගැනීම.
    - සංශ්ලේෂණය: බහු මූලාශ්‍රවලින් ලබාගන්නා තොරතුරු සංවිධානය කිරීම සහ තොරතුරු ඉදිරිපත් කිරීම.
    - ඇගයීම: නිෂ්පාදිතයේ (ඵලදායීතාව) සහ ක්‍රියාවලියේ (කාර්යක්ෂමතාව) විනිශ්චය කිරීම.
- තොරතුරු සාක්ෂරතාව සඳහා කණිෂ්ට වුඩී හෝටින් (2007) හෝ බ්ලූම්ගේ සංශෝධිත වර්ගීකරණය (Bloomzs Revised Taxonomy for information literacy) මගින් සපයා ඇති ක්‍රියාවලිය වැනි අනෙකුත් තොරතුරු චක්‍ර වර්ගීකරණ සමග මෙය සසඳන්න. Big 6 සංකල්පයෙහි අදියර හය තොරතුරු සාක්ෂරතාවයේ මූලිකාංග වන බවට ඔබ එකඟ ද? එසේ නොවේ නම්, ඔබ එකතු කරන්නේ කුමක්ද සහ ඇයි? මෙම අදියර හය ඉදිරිපත් කර ඇති පරිදි ආකාරයට අනුක්‍රමික අනුපිළිවෙලකට සිදුවන බව ඔබ සිතනවා ද?
- අනතුරුව, ඒකකයේ අවසානයට දක්වා ඇති වගුවේ සඳහන්, තොරතුරු ගැටලු විසඳීමේ ක්‍රියාවලියේ එක් එක් අදියර ඔස්සේ ශික්ෂකයන්ට මග පෙන්වමින්, ඔවුන් වගුවේ දක්වා ඇති සියලුම මාතෘකා/ප්‍රශ්න විසඳීමට ප්‍රමාණවත් කාලයක් වැය කරන බවට සහතික වන්න.
    - අධ්‍යාපන මාතෘකාවට අදාළව (උදා: ශික්ෂක අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය, තුලනාත්මක අධ්‍යාපනය ආදිය) ඔබේ ඉගෙනුම් අවකාශයේ පුස්තකාලයෙන් (හෝ ඔබේ නගරයේ ප්‍රධාන පුස්තකාලයෙන්) මුද්‍රිත හෝ විද්‍යුත් ආකෘතියෙන් යුත් සඟරාවකට ප්‍රවේශ වන්න. සඟරාවේ සඳහන්, ඔබට වැඩිදුර ඉගෙන ගැනීමට අවශ්‍ය ගැටලුවක් හඳුනා ගන්න. ලිපිවල ප්‍රධාන අධිගමන හෝ තර්ක සාරාංශගත කරන්න. ශික්ෂකයෙකු ලෙස ඔබේ වෘත්තීය පරිචය සඳහා තොරතුරු කෙතරම් ප්‍රයෝජනවත් ද? ඔබේ රටේ සන්දර්භයට තොරතුරු යොදා ගත හැකි ද? එසේ නම්, ඔබ මෙම තොරතුරු භාවිත කරන්නේ කෙසේ ද?
    - සහභාගිවන්නන් සිය ඉගෙනුම් අවකාශයේ දී පුස්තකාලයාධිපතිවරයකු හමු වී, පුස්තකාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට ඔවුන් සන්නද්ධ බව සහතික කිරීමට අවශ්‍ය තොරතුරු කුසලතා පිළිබඳ සාකච්ඡාවට ලක් කරන්න. පුස්තකාලයේ ඇති සම්පූර්ණ පරාසයක සම්පත් භාවිත කිරීමට අවශ්‍ය වන කාර්යයන් ශිෂ්‍යයන් හට පවරන්න,
    - පුස්තකාලයෙන් ඔවුන් උපාර්ජනය කරගත් තොරතුරු වෙනත් මූලාශ්‍ර (උදා. අන්තර්ජාලය) සමග සංසන්දනය කිරීමට ඔවුන්ව යොමුකර කාර්යය පිරිවිතර අනුව ඒවායේ ප්‍රයෝජනවත් බව තක්සේරු කරන්න.
    - පාසල් පරිසරයක් එහි තොරතුරු සාක්ෂරතා අවශ්‍යතා සඳහා ඇගයීමට ලක් කර, ශිෂ්‍යයන්ගේ තොරතුරු සාක්ෂරතාව වැඩි දියුණු කරන විශේෂිත නිර්දේශ ඉදිරිපත් කරන්න.

- Big 6 සංකල්පය සහ තොරතුරු ගැටලු විසඳීම: කාලීන හෝ දැනට පවතින කරුණක් ගවේෂණය කිරීමට පුස්තකාලයේ තොරතුරු සම්පත් භාවිත කරන්න (උදා. ඡන්ද අයිතිය, ප්‍රජාතන්ත්‍රවාදය, එච්.අයි.වී/ ඒඩ්ස් ආදිය). මෙම මාතෘකාව ගවේෂණය කිරීමට Big 6 අදියර යොදා ගන්න.
- පුස්තකාලයක ගුවන් විදුලියක් පිහිටුවීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කරන්න. එය මාර්ගගත ගුවන් විදුලියක් හෝ අවකාශයක් තුළ විකාශනය කරන්නක් විය හැකිය. මෙම විභවීය ව්‍යාපෘතිය පිළිබඳ සාමූහිකව ගැටලු විසඳීමේ සාකච්ඡා වාරයක් මෙහෙයවන්න. නිසි බලධාරීන් සමග සාකච්ඡාවක් සැලසුම් කර ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන්න. පුස්තකාලයක ඇති ගුවන් විදුලියක් තොරතුරු සහ ඉගෙනුම වෙත ප්‍රවේශය උත්තේජනය කිරීම සඳහා නිර්මාණාත්මකව භාවිත කළ හැක්කේ කෙසේ ද? එහි වාසි සහ අවාසි මොනවා ද?
- අන්තර්ජාලය භාවිත කර තමන් උනන්දුවක් දක්වන මාතෘකාවක් පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශ වී තොරතුරු (පඨිත හෝ සංඛ්‍යාත්මක) වගුවක හෝ චිත්‍රක ආකෘතියකින් ඉදිරිපත් කරන්න. ඔබගේ පුස්තකාල සම්පත්වලින් ලැබෙන තොරතුරුවල ප්‍රමාණය, ගුණාත්මකභාවය සහ ප්‍රයෝජනවත්බව අන්තර්ජාලයෙන් ලැබෙන තොරතුරු සමග සසඳන්න.
- ගුවන්විදුලි හෝ ජංගම දුරකථන තාක්ෂණය භාවිතය ඔබේ රටේ තොරතුරු උත්පාදනය සහ භාවිතයේ මුහුණුවර වෙනස් කරන ආකාරය ගැන රචනයක් ලියන්න. ඔබේ අධිගමන ඉදිරිපත්කිරීමක් ලෙස ලබා දෙන්න, නොඑසේනම් ඔබේ සම වයසේ මිතුරන් හෝ ප්‍රවීණයන් සමග පරීක්ෂාකාරීව වලංගු කරුණුබවට තහවුරු කර ගැනීමෙන් පසු ඒවා මාර්ගගතව බෙදා ගන්න.

3.2 වගුව: තොරතුරු සාක්ෂරතාව සහ තොරතුරු ගැටලු විසඳීම සඳහා සය අදියර රාමුව

අදියර	මාතෘකා/ප්‍රශ්න
1වන අදියර තොරතුරු අවශ්‍යතා හෝ ප්‍රශ්න නිර්වචනය කිරීම	මට සොයා ගැනීමට අවශ්‍ය කුමක් ද? මම විසඳීමට උත්සාහ කරන ගැටලුව කුමක් ද? ගැටලුවේ ස්වභාවය හෝ පර්යේෂණ කරනු ලබන මාතෘකාව මට වැටහෙනවා ද? මට මගේ තොරතුරු අවශ්‍යතා හෝ ගැටලුව පැහැදිලිව නිර්වචනය කළ හැකි ද? විෂය පිළිබඳව මා සතුව ඇති පූර්ව දැනුම කුමක් ද? විෂය පිළිබඳව මට කොපමණ තොරතුරු අවශ්‍ය ද?
2වන අදියර තොරතුරු සෙවීමේ උපායමාර්ග	මෙම තොරතුරු සොයා ගැනීමට මට කොපමණ කාලයක් තිබේ ද? මම තොරතුරු සෙවිය යුත්තේ කොතැනින් ද? ඇතැම් තොරතුරු වර්ග සඳහා හොඳම මූලාශ්‍ර මොනවා ද සහ එසේ වන්නේ ඇයිදැයි යන්න පිළිබඳ ශික්ෂකයන්ට මග පෙන්විය යුතු ය. සන්දර්භය අනුව, මේවාට (i) පර්යේෂණ වාර්තා, විකුණුම් ලදුපත්, කථා, විද්‍යුත් තැපෑල, මුල් කලා කෘති, අත්පිටපත්, ඡායාරූප, දිනපොත්, පුද්ගලික ලිපි, කථාඛ්‍යාන/ සම්මුඛ සාකච්ඡා හෝ රාජ්‍යතාන්ත්‍රික වාර්තා වැනි තොරතුරු අර්ථකථනය නොකළ මුල් මූලාශ්‍ර වන ප්‍රාථමික මූලාශ්‍ර; (ii) තොරතුරු අර්ථකථනය, විශ්ලේෂණය හෝ සාරංශ කරන ලදුව අන්තර්ගත සපයන්නන් මගින් සපයනු ලබන ද්විතියික මූලාශ්‍ර (උදා. විද්වත් පොත්, ජර්නල, සඟරා, විවේචන හෝ අර්ථකථන); සහ (iii) සම්පාදන, දර්ශක හෝ වෙනත් සංවිධානාත්මක මූලාශ්‍ර ඇතුළත් තෘතීයික මූලාශ්‍ර (උදා. සාරාංශ, ග්‍රන්ථ නාමාවලිය, අත්පොත්, විශ්වකෝෂ, දර්ශක, කාල නිර්ණ, දත්ත ගබඩා ආදිය) ඇතුළත් විය හැකිය. මම භෞතික පුස්තකාලය, අන්තර්ජාලය (ඩිජිටල් පුස්තකාල ඇතුළුව) කෞතුකාගාර, ලේඛනාගාර ආදියේ සෙවීම් සිදු කරනවා ද? මට උදව් ඉල්ලා සිටිය හැක්කේ කාගෙන් ද?

3වන අදියර සොයා ගැනීම සහ ප්‍රවේශය	2වන අදියරෙහි සඳහන් මූලාශ්‍රවල තොරතුරු ඵලදායී ලෙස සෙවිය යුතු ආකාරය පිළිබඳව මෙහිදී ශික්ෂකයන් හට මග පෙන්විය යුතු ය. මෙයට: 1) සාමාන්‍ය සෙවීම් සහ විශේෂිත ක්ෂේත්‍රයක විශේෂිත සෙවීම් ඇතුළුව අන්තර්ජාලයෙන් සෙවීම සඳහා උපදෙස් (උදා: ශිෂ්‍යයන්ගේ රට); වසම් නාම අවබෝධ කරගැනීම (උදා: edu, gov, org ආදිය), වෙබ් අඩවි තුළ පින්තූර සහ ශබ්ද සෙවීම (හඬ පට සහ වීඩියෝ පට), සහ අධ්‍යාපනික වෙබ් අඩවි සෙවීම (උදා: GoogleScholar හරහා); 2) පොතක දර්ශක සහ පටුන ඵලදායී ලෙස භාවිත කිරීම සහ PDF ගොනු වැනි විවිධ ඉලෙක්ට්‍රොනික ආකෘති තුළ සෙවීම; 3) පුස්තකාල පරිහරණය කිරීම (පුස්තකාල නාමාවලි, වාර සඟරා, දර්ශක සහ සාරාංශ සහ විමර්ශන පොත් සෙවීම); 4) දත්ත ගබඩා සෙවීම (AGRICOLA, AGRIS/CARIS, EBSCO හෝ Expanded Academic ASAP වැනි ජනප්‍රිය දත්ත ගබඩා සහ ශිෂ්‍යයන්ගේ රටෙහි හෝ කලාපයේ අනෙකුත් දත්ත ගබඩා වැනි උදාහරණ); දත්ත ගබඩා සෙවුම් උපදෙස් (මූල පද සෙවීම්, සමාන පද සහ අක්ෂර වින්‍යාසය හඳුනා ගැනීම, විෂය හෝ කර්තෘ අනුව සෙවීම, "and", "or" සහ "not" වැනි මූලපද ඒකාබද්ධ කිරීම, ලෝපනය සහ ආදේශක භාවිත කිරීම, සහ දිනය, භාෂාව, ප්‍රකාශන වර්ගය සහ සමපදස්ථ සමාලෝචනය කරන ලද කෘති වැනි සීමා අනුව සෙවීම); සහ 5) ඔබට අවශ්‍ය තොරතුරු ස්වයංක්‍රීයව ලබා ගැනීමට RSS පෝෂක භාවිත කිරීම, ඇතුළත් විය යුතුය.
4වන අදියර විචාරශීලී ඇගයීම	පොත්පත්, වෙබ් අඩවි, වෙනත් මාර්ගගත මූලාශ්‍ර ආදියෙන් ලැබෙන තොරතුරුවල විශ්වසනීයත්වය, සත්‍යතාව හෝ ගුණාත්මකබව තක්සේරු කිරීමට/තහවුරු කිරීමට අවශ්‍ය ඇගයුම් නිර්ණායක.
5වන අදියර සංශ්ලේෂණය	සංශ්ලේෂණය යනු කුමක් ද? රැස් කරගත් තොරතුරුවල මගේ සංශ්ලේෂණය කුමක් ද? මට විසඳීමට අවශ්‍ය ගැටලුවට මෙය අදාළ වන්නේ කෙසේ ද? බහු මූලාශ්‍රවලින් අදාළ තොරතුරු ඵලදායී ලෙස සංවිධානය කරන්නේ කෙසේ ද? මම තොරතුරු ඉදිරිපත් කරන්නේ කෙසේ ද? ඇති මෙවලම් මොනවා ද? මට අවශ්‍ය මෙවලම් මොනවා ද?
6වන අදියර තොරතුරු භාවිතය, බෙදාගැනීම සහ බෙදා හැරීම	තොරතුරු යෙදීමෙන් මගේ ගැටලුව විසඳීමට අවශ්‍ය දේ නිශ්චයනය කරගෙන තිබේ. Zotex, refwork වැනි පවතින ග්‍රන්ථ නාමාවලිය/ආශ්‍රිත ග්‍රන්ථ මෙවලම් භාවිත කරමින් මූලාශ්‍ර යොමුගත කිරීම/සොයා ගැනීම. සමාන තොරතුරු අවශ්‍යතා හෝ ගැටලු ඇති (උදා. Google Documents, wikis, Slash, ආදිය) වෙනත් අය සමග ඒවා බෙදාගැනීම, අතර බෙදාහැරීම සහ සහයෝගීතාවෙන් කටයුතු කිරීම සඳහා ඇති මෙවලම්. ප්‍රකාශන හිමිකම් සහ බුද්ධි චෞර්යය (plagiarism) පිළිබඳ අවබෝධ කර ගැනීම.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදන (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්තාර, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක වෘතාන්ත/වාර්තාව

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- Big 6 සංකල්පය මාධ්‍ය සහ ඩිජිටල් පරිසරයට සම්බන්ධ කිරීම.
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ e-ARTISTS[53] ආකෘතිය සමාලෝචනය කරන්න.
- වෙනත් තොරතුරු සැකසුම් ආකෘති.

53. http://krmedia.org/pages/download.php?sn=701&fname=m238/2001/07/20200107_ed7810b04db- c1ef7f56f5488f9f471f2

6වන ඒකකය: ඩිජිටල් තොරතුරු සැකසීම පිළිබඳ වැඩිදුරටත්

කාලසීමාව: පැය 3 යි

ප්‍රධාන මාතෘකා

- මාර්ගගත තොරතුරුවල ස්වභාවය
- පරිගණක දෘඪාංග සහ මෘදුකාංග ගවේෂණය කිරීම
- ඩිජිටල් තොරතුරු යුගයේ ප්‍රකාශන හිමිකම් නීති
- පරිගණක මෘදුකාංග සහ ඉලෙක්ට්‍රොනික දත්ත ආරක්ෂා කිරීම
- යාන්ත්‍රික පරිවර්තනය, කථනයෙන් පෙළවලට ශ්‍රව්‍ය පිටපත් කිරීම ඇතුළු ඩිජිටල් සේවා; අන්තර්ජාලය හරහා ඉගෙනීම (එනම් ඉ-ඉගෙනීම)
- ඩිජිටල් සංරක්ෂණය සහ ඩිජිටල් ආකෘති

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- ඩිජිටල් තොරතුරුවලට එදිරිව ප්‍රතිසම තොරතුරු නිර්මාණය, ගබඩා කිරීම, ප්‍රවාහනය, බෙදා හැරීම සහ සංරක්ෂණය කිරීමේ අදියර ඇතුළුව ඩිජිටල් තොරතුරුවලට එදිරිව ප්‍රතිසම තොරතුරු විස්තර කිරීම
- වචන සැකසීම, ගොනු ගබඩා කිරීම, දුරස්ථ තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශය, සහ අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා ඵලදායිතා මෙවලම්වල මූලික ලක්ෂණ භාවිත කිරීමට
- අධ්‍යයන සහ පුද්ගලික අත්දැකීම්වල බොහෝ අංශ නැවත අර්ථ දැක්වීමට තොරතුරු තාක්ෂණය භාවිත කිරීමට
- නිර්මාණාත්මක පොදු සහ ප්‍රකාශන හිමිකම් බලපත්‍ර ඇතුළු ප්‍රකාශන හිමිකම් නීති තේරුම් ගෙන භාවිත කිරීමට
- අදාළ ශිල්පීය ක්‍රම භාවිත කරමින් මාර්ගගතව සෙවීමට (සෙවුම් යන්ත්‍ර, විෂය නාමාවලි සහ ද්වාර)
- ඩිජිටල් තොරතුරු සංරක්ෂණය කිරීමේ දී අන්තර්ගත සපයන්නන්ගේ (උදා. පුස්තකාල, කෞතුකාගාර සහ ලේඛනාගාර ලෙස) භූමිකාව සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් සමග සංරක්ෂණය සඳහා ඇති අභියෝග තේරුම් ගැනීමට

හැකි වනු ඇත.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ඩිජිටල් ආකෘතියකින් තොරතුරු ගබඩා කිරීම මගින් ප්‍රතිසම තොරතුරු ආකෘති බොහොමයක මෙන් නොව, පුළුල් පරාසයක උපාංග භාවිතයෙන් ප්‍රවේශ වීමට හැකියාව ඇති කරයි. ප්‍රවේශ්‍යතාව වැඩි වීම හේතුවෙන් තොරතුරු ඩිජිටල්කරණය කිරීම විශේෂයෙන් වැදගත් බවට පත් කරන අතර තොරතුරු කුසලතා සමග ඩිජිටල් කුසලතා ඉගෙන ගැනීමේ අවශ්‍යතාව ද අවධාරණය කෙරේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට මූලික වශයෙන් ඩිජිටල් තාක්ෂණය හරහා තොරතුරු විශ්ලේෂණය කිරීම, සොයා ගැනීම, සංවිධානය කිරීම, ඇගයීම, නිර්මාණය කිරීම සහ භාවිත කිරීම ඇතුළත් වේ. ඩිජිටල් ආකෘතියකින් තොරතුරුවල වාසි සහ අවාසි සාකච්ඡා කරන්න (ඵලදායී සම්ප්‍රේෂණය, ගබඩා කිරීම, සෙවීම, හැසිරවීම, හරස් ගැළපුම ආදිය).

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ

මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- ශික්ෂකයන්ට හෝ ශිෂ්‍යයන්ට පරිගණක සහ මෘදුකාංග පිළිබඳ සීමිත හෝ දැනුමක් නොමැති නම්, පරිගණක විද්‍යාගාර සැසි මාලාවක් (භෞතික හෝ අතථ්‍ය) සැලසුම් කරන්න. දෘඩාංග, මෘදුකාංග, ජාල සහ සේවාදායක පිළිබඳ මූලික දැනුමක් අත්පත් කරගැනීමට සහභාගිවන්නන්ට මග පෙන්වන්න. මෙයට මූලික යතුරුපුවරු සහ මූසික කුසලතා, ගොනු වර්ග සහ ගොනු කිරීම ඇතුළත් විය හැකිය. විවෘත මූලාශ්‍ර මෘදුකාංග සහ අඩු වියදම් තාක්ෂණය පිළිබඳ මූලික දැනුම කෙරෙහි ද සහභාගිවන්නන් නිරාවරණය විය යුතු ය. හිමිකාර මෘදුකාංග සහ ජනප්‍රිය පරිගණක දෘඩාංග උපාංග ලැයිස්තුවක් ශික්ෂකයන්ට ලබා දෙන්න. අන්තර්ජාලයේ සෙවීමට සහ තෝරාගත් එක් එක් හිමිකාර මෙවලම්වලට සමාන ක්‍රියාකාරීත්වයක් ඇති නොමිලේ විවෘත මූලාශ්‍ර මෘදුකාංග සහ අඩු වියදම් පරිගණක දෘඩාංග උපාංග සඳහා අවම වශයෙන් උදාහරණ දෙකක් ලැයිස්තුගත කිරීමට ශික්ෂකයන්ගෙන් ඉල්ලා සිටින්න. එක් එක් ඒවායේ ඇති විය හැකි වාසි සහ අවාසි විචාරශීලීව තක්සේරු කරන්න.
- ජංගම දුරකථන මගින් තොරතුරු සෙවීමේ දී, බැලීමේ දී, සංවිධානය කිරීමේ දී සහ තොරතුරු ගබඩා කිරීමේ දී ඒවායේ භාවිතය පිළිබඳව සුවිශේෂී ගැටලු මතු වේ.

කෘත්‍රිම බුද්ධිය සහ යන්ත්‍ර ඉගෙනීම යනු තොරතුරු ගබඩා කිරීමට සහ සැකසීමට සහ තීරණ ගැනීමේ දී හෝ තීරණ ගැනීමට ආධාර කිරීමේ දී වඩාත් දියුණු ක්‍රම දෙකක් බව සලකන්න. මෙම මාතෘකා පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 11 වන මොඩියුලය බලන්න.

ක්‍රියාකාරකම්

- නිශ්චිත පර්යේෂණ මාතෘකාවක් පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා අන්තර්ජාලය සහ දත්ත ගබඩාවන් සහ විද්‍යුත් පුස්තකාල වැනි වෙනත් මාර්ගගත සම්පත් සොයන්න. ඔබගේ සෙවුමේ අරමුණට ගැළපෙන පරිදි තොරතුරු මූලාශ්‍ර අඩු කරන්න. මූලපද, තාර්කික මෙහෙයුම් (උදා. "and", "or", "and") සොයා වඩාත් හොඳින් ක්‍රියාත්මක වන්නේ කුමක් ද ඒ ඇයි යන්න නිර්ණය කරන්න.
- ව්‍යාපෘතියක්, තක්සේරුවක්, හෝ ගෙදර වැඩ පැවරුමක් සකස් කිරීමට විවිධ ඩිජිටල් මාධ්‍ය සම්පත් භාවිත කිරීමට සහභාගිවන්නන්ට ඉඩ සලස්වන ක්‍රියාකාරකම් සැලැස්මක් හෝ ක්‍රියාකාරකම් මාලාවක් නිර්මාණය කරන්න. ආබාධ සහිත පුද්ගලයන් සඳහා ඩිජිටල් තොරතුරු (උදා. වෙබ් ප්‍රවේශ්‍යතාව සහ ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් ඩිජිටල් ලේඛන නිර්මාණය කිරීම) වෙත ප්‍රවේශ වීම සඳහා නව තාක්ෂණ මගින් සපයනු ලබන විශේෂාංග පිළිබඳ සාකච්ඡා කරන්න.
- ගුරු අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාවක් හෝ වෙනත් අධ්‍යාපනික වැඩසටහනක් ලබාදීමට භාවිත කරන අන්තර්ජාල වෙබ් අඩවියක් අධ්‍යයනය කරන්න. මෙම තොරතුරු සංවිධානය කර ඇති ආකාරය සහ ඒ සඳහා වෙබ් අඩවියට පිවිසෙන ආකාරය සමාලෝචනය කරන්න. එහි දී භාවිත වන්නේ කුමන මාර්ගගත ඩිජිටල් තොරතුරු සම්පත් ද? ඩිජිටල් සම්පත් පාඨමාලා ද්‍රව්‍ය සමග ඒකාබද්ධ වන්නේ කෙසේ ද? මෙම වෙබ් අඩවිය භාවිත කිරීමට පුරුදු වී එය ඉගෙනීමට කොතරම් ප්‍රයෝජනවත් විය හැකි ද සහ සීමාවන් මොනවා ද යන්න සාකච්ඡා කරන්න. වාසි සහ අවාසි සාකච්ඡා කරන්න.
- පුද්ගලයන් විසින් හෝ පුද්ගලයන්ගේ සහයෝගීතාවයකින් එකතු කරන ලද විවිධ "බ්ලොග්" සහ "විකි" අඩවි වෙත පිවිසෙන්න. මෙම මාර්ගගත මාධ්‍යවල සිදු වන්නේ කුමන ආකාරයේ තොරතුරු හුවමාරුවක් ද? තොරතුරු අදාළ වන්නේ කුමන අරමුණකට ද? තොරතුරු සපයන්නේ කවු ද? ඔවුන්ගේ අභිප්‍රේරණ සහ චේතනා මොනවාදැයි ඔබ සිතන්නේ ද?

- අධ්‍යාපනික විකි වෙබ් අඩවියකට පිවිස එහි පාඨමාලා හෝ විෂයමාලාව ලබා දෙන ආකාරය විශ්ලේෂණය කරන්න. අධ්‍යාපනයේ මාතෘකා ගැටලුවක් මත විකි වෙබ් අඩවියක් සකසන්න (උදා: මුල් ප්‍රාථමික පාසලේ කියවීම සහ මූලික සංඛ්‍යා කුසලතා වැඩි දියුණු කිරීම). විකි වෙබ් අඩවියේ අධ්‍යාපනික ප්‍රහුණු පැවරුමක් සඳහා සාකච්ඡා සංසදයක් සංවිධානය කරන්න. මෙම වේදිකාව භාවිතයෙන් තොරතුරු බෙදාගැනීමේ ප්‍රතිලාභ සහ සීමාවන් සමාලෝචනය කරන්න.
- ඔබේ රටේ අධ්‍යාපනයට අදාළ මාතෘකාවක් පිළිබඳ බ්ලොගයක් ලිවීම අත්හදා බලන්න. තෝරාගත් මාතෘකාව උනන්දුව සහ ප්‍රතිචාරය ආකර්ෂණය කර ගත හැකි කාලීන කරුණක් විය යුතුය. (උදා: සමාජයේ දුප්පත්ම අයට ප්‍රාථමික හෝ ද්විතීයික මට්ටමින් ශික්ෂණවිද්‍යා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, ඉගෙනීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට ශිෂ්‍යයන් සඳහා තොරතුරු වෙත ප්‍රවේශය විවිධාංගීකරණය කිරීම, දැනුම හා තොරතුරු වැඩිවන යුගයක දුප්පතුන් වඩාත් දුප්පත් වන්නේ මන්ද ආදී.)
- කුමන ඩිජිටල් තොරතුරු සංරක්ෂණය කළ යුතු ද යන්න ශිෂ්‍යයන්ගේ දෘෂ්ටි කෝණයෙන් සාකච්ඡා කරන්න. ප්‍රධාන තේරීම් නිර්ණායක සහ පවතින තාක්ෂණික විසඳුම් මොනවා ද සහ තිරසර බව සහතික කළ හැක්කේ කෙසේ ද? මෙම සංරක්ෂණ ගැටලුවේ වෙනත් පැති මොනවා ද?
- ඩිජිටල් තොරතුරු සංරක්ෂණය සඳහා ජාත්‍යන්තර ආයතන සහ වැඩසටහන් හඳුනා ගන්න. (උදා. ඩිජිටල් උරුම සංරක්ෂණය කිරීම පිළිබඳ යුනෙස්කෝ ප්‍රඥප්තිය, ඩිජිටල් සංරක්ෂණය සහ සංරක්ෂණ මාර්ගෝපදේශ; UNESCO හි PERSIST ව්‍යාපෘතිය, UNESCO හි IFAP වැඩසටහන.)
- World Heritage Library වෙබ් අඩවියට සහ the Memory of the World Programme වෙබ් අඩවියට පිවිසෙන්න. http://(en.unesco.org/programme/mow. විවේචනාත්මක චින්තනය, තොරතුරු සත්‍යාපනය, පක්ෂග්‍රාහීත්වය, නියෝජනය සහ සාමාන්‍යයෙන් මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවට වාර්තාමය උරුමය අදාළ වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.
- රටක භූමිකම්පාවක් වැනි ස්වභාවික ව්‍යසනයක සන්දර්භය තුළ ලේඛන උරුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම සාකච්ඡා කර එම රටේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේඛනාරක්ෂකයන් විසින් කළ යුතු කාර්යයන් සාකච්ඡා කරන්න. එම ස්වභාවික ව්‍යසනයෙන් පසු රට තුළ ඇති වූ තත්ත්වයක් පෙන්නුම් කරන ලිපියක් සොයන්න.
- වෙබ් සංරක්ෂණය අවශ්‍ය වන්නේ මන්දැයි සහ එය කරන්නේ කෙසේදැයි ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- සමාජ මාධ්‍යවල පළ කරන ලද කෙනෙකුගේ අන්තර්ගතය ලබා ගැනීමට, ගබඩා කිරීමට සහ නැවත භාවිත කිරීමට ඇති හැකියාව සහ විවිධ සේවාවන් අතර අන්තර්-ක්‍රියාකාරී අතුරු මුහුණත් තිබීමෙන් සිදු වන දේ සහ කෙනෙකු තෝරන එවැනි සේවාවන් අතර කෙනෙකුගේ සියලු පුද්ගලික දත්ත ඉවත් කර ගැනීමට සහ මාරු කිරීමට හැකි වීම වැනි දත්ත සුවහනීයත්වයට ඇති අභියෝග සාකච්ඡා කරන්න.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්තාර, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක වෘතාන්ත/වාර්තාව

7 වන ඒකකය: බුද්ධිමය දේපළ සහ කර්තෘත්වය පිළිගැනීම

කාලසීමාව: පැය 4 යි

ප්‍රධාන මාතෘකා

- බුද්ධිමය දේපළ අර්ථ දැක්වීම.
- විවිධ වර්ගයේ බුද්ධිමය දේපළ.
- විවිධ වර්ගයේ බුද්ධිමය දේපළ ආරක්ෂා කරන විවිධ නීති වර්ග.

ඉගෙනුම් අරමුණු

- බුද්ධිමය දේපළ යන්නෙහි අර්ථය තේරුම් ගැනීමට
- කර්තෘත්වය සහ හිමිකාරිත්වය අතර වෙනස තේරුම් ගැනීමට
- විවිධ වර්ගයේ බුද්ධිමය දේපළ තේරුම් ගැනීමට හැකි වීම

ප්‍රකාශන හිමිකම් ගැටලු

- තොරතුරු මූලාශ්‍ර, ඒවා විවෘත ප්‍රවේශයක් සහිත වුව ද, බුද්ධිමය දේපළවලට යටත් වේ. පරිශීලකයන් විසින් කර්තෘත්වය පිළිගත යුතු අතර එක් එක් විෂය අනුව සහ ආයතන අනුව පවා වෙනස්වන ග්‍රන්ථවිද්‍යාත්මක ප්‍රමිති අනුගමනය කළ යුතු ය. බුද්ධිමය දේපළවලට ගරු නොකිරීම බොහෝ විට ප්‍රකාශන සොරකමක් ලෙස සැලකේ. ලිවීමේ දී කෙනෙකුට ශාස්ත්‍රීය විශ්වසනීයතාව පවත්වා ගැනීමට උපකාරී වන මෘදුකාංගයක් භාවිත කළ හැකි ය. මේ සඳහා භාවිත කළ හැකි ගෙවුම්-දායකත්ව පරිගණක වැඩසටහන් බොහොමයකි. ඇතැම් ඒවා නොමිලේ ද ලබා ගත හැකි ය.
- බුද්ධිමය දේපළ සම්බන්ධ ගැටලු බොහෝ විට ඉතා සංකීර්ණ වන අතර වර්තමානයේ වඩාත්ම විවාදාත්මක ගැටලු අතර වේ. බහුලව භාවිතවන ඩිජිටල් මාධ්‍ය හේතුවෙන් තත්ත්වය වැඩිදුරටත් සංකීර්ණ වේ. බුද්ධිමය දේපළ සංවිධානය කරන තත්ත්වයන් සහ නීති රටින් රටට වෙනස් වේ. බොහෝ සම්ප්‍රදායන් තුළ, ගිවිසුම්ගත ගිවිසුම් තත්ත්වයට බලපෑ හැකි වුව ද, කෘතියක බුද්ධිමය දේපළ එහි කතුවරයාට හිමි වේ. මෙයින් අදහස් කරන්නේ කෘති ස්වයංක්‍රීයව ආරක්ෂා වන අතර එම නිසා මෙම කෘතිවල කර්තෘත්වය හඳුනා ගැනීමට සහ ගරු කිරීමට විධිමත් ලියාපදිංචියක් අවශ්‍ය නොවන බවයි. සාමාන්‍යයෙන්, බුද්ධිමය දේපළ යනු අන්‍යයන් විසින් අනවසරයෙන් භාවිත කිරීමෙන් නීතිය ආරක්ෂා කරන මානව බුද්ධියේ ඕනෑම නිර්මාණයකි. බුද්ධිමය දේපළවල හිමිකාරිත්වය සහජයෙන්ම ආරක්ෂිත දේපළෙහි සීමිත ඒකාධිකාරයක් නිර්මාණය කරයි.
- මේ සම්බන්ධයෙන් බහුලව භාවිත වන පද දෙකක් අතර වෙනස හඳුනා ගැනීම ද වැදගත් ය; අයිතිය සහ කර්තෘත්වය. කතුවරයා අත්පිටපතක් ලියා ප්‍රකාශන සමාගමකට හිමිකාරිත්වයේ අයිතිය විකුණයි (එනම් "පවරයි"). එමගින් කතුවරයා එම අත්පිටපතට අවම වශයෙන් යම් දේපළ අයිතියක් ලබා දී ඇත.
- පහත දැක්වෙන්නේ බොහෝ විට හඳුනාගත් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ ආරක්ෂණ වර්ග හතරකි. බුද්ධිමය දේපළ සඳහා නිවැරදි ආරක්ෂාවක් ලබා ගැනීම වැදගත් වේ, එබැවින් නීති විශේෂඥයෙකුගෙන් උපදෙස් ලබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ආරක්ෂා කිරීමේ කාල සීමාව ඇතුළුව ආයතනික ප්‍රකාශන හිමිකම අභිබවා මහජන අවශ්‍යතා යා යුතු ද යන්න පිළිබඳව බොහෝ විවාදයක් පවතී. බුද්ධිමය දේපළ ආරක්ෂණයේ පොදු කාණ්ඩ හතරට ඇතුළත් වන්නේ:

වෙළෙඳ රහස්

වෙළෙඳ රහස් යනු ව්‍යාපාරයකට වැදගත් වන විශේෂිත, පෞද්ගලික තොරතුරු වන අතර ඒවායින් ව්‍යාපාරයට වෙළෙඳපල තුළ තරගකාරී වාසියක් ලබා දෙනු ලැබේ. වෙළෙඳ රහසක් වෙනත් සමාග මක් විසින් අත්පත් කර ගන්නේ නම්, එයින් මුල් හිමියාට හානියක් කළ හැකි ය. වෙළෙඳ රහස් සඳහා උදාහරණ ලෙස ඇතැම් ආහාර සහ පාන වර්ග සඳහා වට්ටෝරු, නව නිපැයුම්, මෘදුකාංග, ක්‍රියාවලි සහ විවිධ අලෙවිකරණ උපායමාර්ග පවා ඇතුළත් වේ. යම් පුද්ගලයෙක් හෝ ව්‍යාපාරයක් සතුව වෙළෙඳ රහස් ආරක්ෂණයක් ඇති විට, එම අදහස පිටපත් කිරීමට හෝ සොරකම් කිරීමට අන් අයට අයිතියක් නැත. තොරතුරු වෙළෙඳ රහසක් ලෙස ස්ථාපිත කිරීම සඳහා සහ වෙළෙඳ රහස් හා සම්බන්ධ නීතිමය ආරක්ෂාවන් ලබා ගැනීම සඳහා, තොරතුරු ආරක්ෂා කිරීමට ඔවුන්ගේ ඇති කැමැත්ත පෙන්නුම් කරන ආකාරයෙන් ව්‍යාපාර ක්‍රියාකාරීව හැසිරිය යුතු ය.

නිල ලියාපදිංචියකින් තොරවම වෙළෙඳ රහස්වලට ව හිමි වේ; කෙසේ වෙතත්, වෙළෙඳ රහසක හිමිකරුවෙකුගේ අයිතිවාසිකම් කඩ වූයේ - එනම් යමෙක් තම වෙළෙඳ රහස සොරකම් කරයි - නම් එම පුද්ගලයාට හෝ ව්‍යාපාරයට එරෙහිව ක්‍රියා කරන ලෙස සහ ඔවුන් වෙළෙඳ රහස භාවිත කිරීමෙන් වළක්වන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි ය.

පේටන්ට් බලපත්‍ර

එක්සත් ජනපද පේටන්ට් සහ වෙළෙඳ ලකුණු කාර්යාලය (USPTO) විසින් අර්ථ දක්වා ඇති පරිදි, පේටන්ට් බලපත්‍රයක් යනු නව ක්‍රියාවලියක්, යන්ත්‍ර, නිෂ්පාදන ද්‍රව්‍ය, හෝ එවැනි වෙනත් සංයුතියකින් යුත් වන නව, පැහැදිලි නොවන සහ ප්‍රයෝජනවත් වන නව නිපැයුම් (හෝ සොයාගැනීම්) ආරක්ෂා කිරීමට භාවිත කළ හැකි, සීමිත කාලයක් සඳහා වන ආරක්ෂණ වර්ගයකි. දේපළ හිමියෙකුට පේටන්ට් බලපත්‍රයක් ඇති විට, වෙනත් අය විසින් අනවසරයෙන් එම භාණ්ඩය විකිණීම, සෑදීම හෝ භාවිත කිරීම සඳහා ඉදිරිපත් කිරීම නීතිය යටතේ වළක්වනු ලැබේ.

ප්‍රකාශන හිමිකම්

ප්‍රකාශන හිමිකම් සහ පේටන්ට් බලපත්‍ර බොහෝ විට ව්‍යාකුල වුවත්, එමගින් අදහස් වන්නේ එකම දෙය නොවේ. ප්‍රකාශන හිමිකම යනු සාහිත්‍ය කෘති, සංගීතය, කලාව සහ තවත් බොහෝ දේ ඇතුළත් විය හැකි කර්තෘත්වයේ මුල් කෘති ආරක්ෂා කරන බුද්ධිමය දේපළ ආරක්ෂණ වර්ගයකි. වර්තමානයේ දී, ප්‍රකාශන හිමිකම් මගින් පරිගණක මෘදුකාංග සහ නිර්මාණ ශිල්පය ද ආරක්ෂා කෙරේ. ප්‍රකාශන හිමිකම් ආරක්ෂණ නිරුත්සාහක වේ; ඔබ යම් දෙයක් නිර්මාණය කළ පසු, ඔබ එහි ඇති අයිතිය හෝ යම් යම් අංග සඳහා වන අයිතිය අත්හැරීමක් හෝ වෙනකෙකුට පැවරීමක් නොකරන තාක් කල් එහි හිමිකාරීත්වය ඔබ සතු වේ. ප්‍රකාශන හිමිකම බොහෝ විට නීතියෙන් බලාත්මක කළ හැකි දෙයක් වුවද, අද වන විට ක්‍රියේටිව් කොමන්ස් නම් වූ අන්තර්ගත භාවිතයේ සහ යළි-භාවිතය සම්බන්ධ කොන්දේසි සඳහා බලවත් ස්වේච්ඡා ප්‍රතිමාන මාලාවක් ද පැන නැඟී තිබේ. කෙසේ වෙතත්, ප්‍රකාශන හිමිකම් ආරක්ෂණ යටතේ ඇති අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත්නම් සහ නඩුවක් ගොනු කිරීමට ප්‍රකාශන හිමිකරු බලාපොරොත්තු වේ නම්, ප්‍රකාශන හිමිකම ලියාපදිංචි කර තිබීම අවශ්‍ය වේ.

වෙළෙඳ ලකුණු

සිව්වන ආකාරයේ බුද්ධිමය දේපළ ආරක්ෂණය වෙළෙඳ ලකුණු ආරක්ෂණයකි. නව නිපැයුම් සහ සොයාගැනීම් ආරක්ෂා කිරීමට පේටන්ට් බලපත්‍ර භාවිත කරන අතර කලාව සහ ලිවීම වැනි අදහස් සහ නිර්මාණවල ප්‍රකාශන ආරක්ෂා කිරීමට ප්‍රකාශන හිමිකම් භාවිත කෙරේ. වෙළෙඳ ලකුණු, එසේ නම්, එක් පාර්ශ්වයක නිෂ්පාදනයක් හෝ සේවාවක මූලාශ්‍රය තවත් පාර්ශ්වයකින් වෙන්කර හඳුනා ගන්නා වාක්‍ය ඛණ්ඩ, වචන හෝ සංකේත වෙත අවධානය යොමු කරන්න. නිදසුනක් වශයෙන්, නයිකි සංකේතය - සියල්ලන්ටම පාහේ පහසුවෙන් හඳුනාගත හැකි සහ හඳුනා ගත හැකි - වෙළෙඳ ලකුණකි. පේටන්ට් බලපත්‍ර සහ ප්‍රකාශන හිමිකම් කල් ඉකුත් විය හැකි අතර වෙළෙඳ ලකුණු අයිතිය වෙළෙඳ ලකුණ භාවිත

කිරීමෙන් ලැබෙන බැවින් දින නියමයක් නොමැතිව භාවිත කළ හැකි ය. ප්‍රකාශන හිමිකමක් මෙන්, වෙළෙඳ ලකුණක් ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවන නමුත් ලියාපදිංචි කිරීමෙන් අමතර වාසි ලැබිය හැකි ය.

- මෙම ඒකක ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය මතය. පහත සඳහන් කරුණු අනුව නිදසුන් පිළිබඳ පර්යේෂණ කිරීමට, ඉදිරිපත් කිරීමට සහ සාකච්ඡා කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න:
  - බුද්ධිමය දේපළ යන්නෙහි අර්ථය
  - කර්තෘත්වය සහ හිමිකාරිත්වය අතර වෙනස්කම්
  - විවිධ වර්ගයේ බුද්ධිමය දේපළ
  - විවිධ වර්ගයේ බුද්ධිමය දේපළ සඳහා උදාහරණ
  - බුද්ධිමය දේපළ අයිතිවාසිකම් කඩකිරීමේ උදාහරණය
  - බුද්ධිමය දේපළ සාධාරණ ලෙස භාවිත කිරීම
  - ලෝක බුද්ධිමය දේපළ සංවිධානය සහ අනෙකුත් අදාළ ආයතන/සංවිධාන

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදන (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්තාර, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක වෘතාන්ත/වාර්තාව

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- බුද්ධිමය දේපළ අයිතිවාසිකම් නීති සඳහා ජාත්‍යන්තර ප්‍රමිති
- තාක්ෂණය මාරු කිරීම.
- සදාචාරාත්මක අයිතිවාසිකම්.
- සාම්ප්‍රදායික බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ විවෘත ප්‍රවේශ මූලපිරීම්වල සමතුලිතතාව අවබෝධ කර ගැනීම.

මෙම මොඩියුලය සඳහා සම්පත් :

Anderson, R. (2018). Scholarly Communication: What Everyone Needs to Know. Oxford: Oxford University Press.

Arevik Avedian (2014). Survey Design, Harvard Law School, 1-34 http://hnmcp. law.harvard.edu/wp-content/uploads/2012/02/Arevik-Avedian-Survey-Design- PowerPoint.pdf

Association of College & Research Libraries, (2016). Framework for Information Literacy, http://www.ala.org/acrl/sites/ala.org.acrl/files/content/issues/infolit/framework1.pdf

Badke, W. (2017). Research Strategies. Bloomington: iUniverse.

Bruce B. F. (2018). The Sage Encyclopedia of Educational Research, Measurement, and Evaluation.

Bitange Ndemo & Tim Weiss (2017). Making Sense of Africa's Emerging Digital Transformation and its Many Futures, Africa Journal of Management, 3:3-4, 328-347, DOI: 10.1080/23322373.2017.1400260

Check, J. and Schutt, R. K. (2011). Research Methods in Education, SAGE Publications, 1-27, https://www.sagepub.com/sites/default/files/upm-binaries/43589_8.pdf

Dainik, S. (2019), "Questionnaire Surveys in Media Research", https://www.academia.edu/40048140/QUESTIONNAIRE_SURVEYS_IN_MEDIA_RESEARCH

Gaunt, J., Morgan, N., Somers, R., Soper, R., and Swain, E. (2007). Handbook for Teaching Information Literacy. Cardiff, Cardiff University.

Google (2020). Google Search Operators. (http://www.googleguide.com/advanced_ operators_ reference.html).

Information and Digital Literacy Tutorials: https://www.sheffeld.ac.uk/library/idlt This site discusses features for information and digital literacy. It also provides links to other websites and various resources.

Kebede, G. (2004). The information needs of end-users of sub-Saharan Africa in the digital information environment. International Information & Library Review, 36(3), 273- 279. doi:10.1080/10572317.2004.10762644

MIT (Massachusetts Institute of Technology) Libraries (2020). Database Tips. https:// libguides.mit.edu/c.php?g=175963&p=1158594

Myers, G. (2017). Principles of Intellectual Property Law. USA: West Academic Publishing.

Owens, L. (2002), Introduction to Survey Research Designer, 1-19 https://www. researchgate.net/publication/253282490_INTRODUCTION_TO_SURVEY_

RESEARCH_DESIGN

The Social Dilemma (film, 2020), https://www.imdb.com/title/tt11464826/?ref_=nv_sr_ srsg_0

Tayie, S. (2013), Media Research Methods. Cairo: Cairo University Press.

Tayie, S. (2005). Research Methods and Writing Research. Center for Advancement of Post-Graduate Studies and Research in Engineering Sciences, Faculty of Engineering, Cairo University. (pp1-136). http://www.pathways.cu.edu.eg/subpages/training_ courses/C3-Research-EN.pdf

UNESCO. (2008). Towards Information Literacy Indicators – conceptual framework paper. Paris, UNESCO.

http://www.big6.com. This website features a wealth of resources relating to the stages of information literacy.

Wimmer, R.D., Dominick, J.R. (2014). Mass Media Research: An Introduction. Boston, Mass: Wadsworth, Cengage Learning.

4 වන මොඩියුලය:

සාවද්‍ය තොරතුරු, දුස්තොරතුරු සහ වෛර ප්‍රකාශ හමුවේ කටයුතු කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා: සත්‍යය සෙවීම සහ සාමය ආරක්ෂා කිරීම සඳහා

"අසත්‍යය පියාසර කරයි, සත්‍යය එය පසුපස හඹා යයි, එනම් මිනිසා රැවටීමෙන් මිදෙන විට ප්‍රමාද වැඩි ය; හාස්‍ය අවසාන වුව ද කතාවෙන් බලපෑමක් ඇති වී අවසානය: එය, කතිකාව වෙනස් වූ විට යමකට හොඳ ප්‍රත්‍යුත්තරයක් හෝ සමාගමය විසිර ගිය විට පිරිස පිළිබඳ සිතූ මිනිසෙකු මෙන්ය; නැතහොත් රෝගියා මිය ගිය පසු නොවරදින ඖෂධයක් සොයාගත් වෛද්‍යවරයකු මෙන්ය."

- ජොනතන් ස්විෆ්ට් (16 වන සියවස)

පසුබිම සහ තාර්කිකය

මානව වර්ගයා සත්‍යය සෙවීම සිදු කරයි. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන්හි (ICTS) පෙර නොවූ විරූ නවෝත්පාදන පසුගිය දශක කිහිපය තුළ අපි දුටුවෙමු. නමුත් එවැනි නව නිපැයුම් සහ නවෝත්පාදන සෑම විටම සත්‍යය සෙවීම ඉදිරියට ගෙන ගියේ නැත. ඇත්ත වශයෙන්ම, 16 වන සියවසේ ඇන්ග්ලෝ-අයර්ලන්ත ලේඛක ජොනතන් ස්විෆ්ට් "අසත්‍යය පියාසර කරයි, සත්‍යය එය පසුපස හඹා යයි." යනුවෙන් පැවසූ දේ අදටත් අදාළ වේ. "සියලුම තොරතුරු වර්ගීකරණයන්හි දී සත්‍යයට වඩා අසත්‍යය බොහෝ දුරකට, වේගවත්ව, ගැඹුරු ලෙස සහ පුළුල් ලෙස ව්‍යාප්ත වේ[54]"

54. Vosoughi, Soroush & Roy, Deb & Aral, Sinan. (2018). The spread of true and false news online. Science. 359. 1146-1151. 10.1126/science.aap9559.

යන්න Twitter පිළිබඳ 2018 Massachusetts Institute of Technology (MIT) මාධ්‍ය විද්‍යාගාර අධ්‍යයනය නිගමනය කරන අතර එය ස්විෆ්ට් ගේ උපහාසය තහවුරු කරයි.

මෙම මොඩියුලය සාවද්‍ය තොරතුරු සහ වෛරී ප්‍රකාශ මැඩලීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා භාවිත කරන අතර එය ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. පළමුව, එය ඊනියා පශ්චාත්-සත්‍ය යුගයේ පැතිරී ඇති විවිධ ආකාරයේ සාවද්‍ය තොරතුරු විමර්ශනය කරයි. දෙවනුව, සාවද්‍ය තොරතුරු මඟින් අවිශ්වාසය, භේදය සහ නොඉවසීම ඇති කළ හැකි ආකාරය නිරූපණය කරයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා සහ මෙවලම් සත්‍යය සෙවීම සහ ආරක්ෂා කිරීම, අසත්‍ය තොරතුරු පැතිරීම වැළැක්වීම සහ අන්තර්කරණීය, සහභාගී සහ විවෘත සමාජයක් නිර්මාණය කිරීම සඳහා යොදා ගත හැකි ආකාරය පිළිබඳව පාඨකයන්ගේ අවධානය යොමු කරමින් පූර්ව මොඩියුල කිහිපයක් ද නැවත තහවුරු කරයි.

මොඩියුලය 'සාවද්‍ය තොරතුරු' යන්න ආවරණ යෙදුමක් ලෙස භාවිතා කරයි. නමුදු එය වෙනත් මට්ටමකින්, දුස්තොරතුරු, සාවද්‍ය තොරතුරු සහ කුමන්ත්‍රණ න්‍යායන් ඇතුළු හානි පැමිණවීමේ අදහසින් ලබා දෙන අසත්‍ය තොරතුරු අතර වෙනස හඳුනා ගනී. එය ජනප්‍රිය "ව්‍යාජ ප්‍රවෘත්ති" යන යෙදුම නිෂ්ප්‍රභ කරන අතර ඇත්ත වශයෙන්ම අසත්‍ය හෝ නොමඟ යවනසුළු අන්තර්ගත යන නිවැරදි යෙදුමම භාවිත කරයි. අන්තර්ගතය ව්‍යාජ නම් එය ප්‍රවෘත්ති නොවේ යන පදනම මත යුනෙස්කෝව ව්‍යාජ ප්‍රවෘත්ති යන යෙදුම අධෛර්යමත් කරයි. තනි පුද්ගලයන්ට සහ සමාජයට ඇති කර ඇති සහ තවදුරටත් කර ගෙන යනු ලබන බොහෝ පීඩාවන් නිසා සාවද්‍ය තොරතුරු යන්න ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් හොඳින් පරීක්ෂා කර බැලිය යුතු ය. සත්‍ය ප්‍රවෘත්ති මාධ්‍ය, විද්‍යාව සහ ස්ථාපිත ආයතන කෙරෙහි ඇති අවිශ්වාසය, වෛරී ප්‍රකාශ ඉහළ යාම, නොඉවසීම සහ බෙදීම් ඇති කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් කඩාකප්පල් කිරීම (විශේෂයෙන් නිදහස් මැතිවරණ), තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට තර්ජනයක් වීම සහ මෑතකදී, මෙම ලිපිය ලියන අවස්ථාව වන විට ලෝකයම ගිලගෙන ඇති කොරෝනා වෛරස් අර්බුදයට අදාළව 'දුස්තොරතුරු වසංගතය' (කිසියම් ගැටලුවක් පිළිබඳ සීඝ්‍රයෙන් පැතිරෙන අධික දුස්තොරතුරු ප්‍රමාණයක් පැවතීම ද එම දුස්තොරතුරු අවිශ්වාස්‍ය වීම හේතුවෙන් එකී ගැටලුවට විසඳුමක් සෙවීමට අපහසු වීම) මතුවීම මීට ඇතුළත් වේ. මේවා සාවද්‍ය තොරතුරු නිසා ඇති වන හානිවලින් කිහිපයක් පමණි.

දෙවනුව, පුද්ගලයන් සහ සමාජයන් අතර අවිශ්වාසය, භේදය, නොඉවසීම සහ අගතිය ඇති කිරීම සඳහා ප්‍රවෘත්ති සහ තොරතුරු දූෂ්‍ය කළ හැකි ආකාරය තේරුම් ගැනීමේ හැකියාව මෙම මොඩියුලය අපට ලබා දෙයි. වෛරී ප්‍රකාශ, වෙනස්කොට සැලකීම, කුමන්ත්‍රණ න්‍යායන් හෝ මිථ්‍යාවන්, රැඩිකල්කරණය සහ ප්‍රචණ්ඩ අන්තවාදය ප්‍රචාරණය කිරීමේදී ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය "තෝරා ගැනීමේ වේදිකා" බවට වන අවබෝධය එය විමර්ශනය කරයි.

සාවද්‍ය තොරතුරු තවදුරටත් පැතිරීම වැළැක්වීමට සහ වංචා හා නොඉවසීම් ඇති කරන්නන් සහ එවැනි අන්තර්ගත සහ සම්බන්ධතා ඒවා සපයන්නන් අතර විස්තාරණය කරන ඩිජිටල් ව්‍යාපාර ආකෘතීන් පසුපසට තල්ලු කිරීමට හැකි වන නිපුණතා සහ මෙවලම් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මඟින් සපයනු ලැබේ. ශිෂ්‍යයන්ට (1) සාවද්‍ය තොරතුරු සහ හානිකර අන්තර්ගත හඳුනා ගැනීමට, (2) කරුණු පරීක්ෂාව මඟින් ඒවා ඉවත් කිරීමට, (3) අවශ්‍ය විටදී, වාර්තා කිරීම සහ/හෝ ප්‍රතිපණිවිඩ යැවීමෙන් ඒවා තවදුරටත් විස්තාරණය නොකර ඒවාට විරෙහිවීමට අවශ්‍ය හැකියාව මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ලබා දෙයි. මෙම මොඩියුලය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා (MIL) මෙවලම් කට්ටලයකට ඇතුළත් කළ හැකි කරුණු පරීක්ෂා කිරීමේ මෙවලම් සහ යෙදුම් ඉදිරිපත් කරයි. වෛර ප්‍රකාශ පිළිබඳ එක්සත් ජාතීන්ගේ උපාය මාර්ගය සහ ක්‍රියාකාරී සැලැස්මේ[55], බැඳීම 7, ක්‍රියාමාර්ගය 20, (United Nations Strategy and Plan of Action on Hate Speech, commitment 7, Action 20) ගෝලීය පුරවැසි අධ්‍යාපනයේ සාරධර්ම සහ කුසලතා ප්‍රවර්ධනය කිරීම මඟින් සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වැඩි දියුණු කිරීම මඟින් වෛර ප්‍රකාශ පිළිබඳ කටයුතු කිරීමට සහ විරෝධය දැක්වීම සඳහා මෙවලමක් ලෙස අධ්‍යාපනය භාවිත කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. COVID-19 ආශ්‍රිත වෛර ප්‍රකාශ පිළිබඳ කටයුතු කිරීම සහ විරෝධය දැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ සටහන[56] (Unite Nations Guiding Note on Addressing and Countering COVID-19 related Hate Speech), ගෝලීය පුරවැසිභාවය සහ මානව හිමිකම් අධ්‍යාපනය හරහා විචාරශීලී චින්තනය, සමාජීය සහ චිත්තවේගීය කුසලතා සහ වගකීම් සහගත ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරන ප්‍රතිචාර දිරිමත් කරන අතරම, වෛර ප්‍රකාශ දුස්තොරතුරු සමග සම්බන්ධ කරයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සාවද්‍ය තොරතුරුවලට ප්‍රතිවිරුද්ධ ලෙස විචාරශීලී චින්තනය සහ ගෝලීය පුරවැසිභාවය සහ මානව හිමිකම් සම්බන්ධයෙන් දැනුවත්භාවය සක්‍රීය කිරීම පිළිබඳ වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා වැඩසටහන් මඟින් අන්තර්කරණය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, විවිධත්වය සහ බහුත්වය ප්‍රවර්ධනය කරන ආකාරය ද සාවද්‍ය තොරතුරුවලට විරෙහිව සටන් කිරීමට මූලික වේ. ලෝකයේ විවිධ සමාජ වර්ධනයන්හි කාන්තා භූමිකාවන් පිළිබඳ සත්‍යය තත්ත්වය පෝෂණය කිරීම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) සිදු කරයි. නිදසුනක් වශයෙන්, අන්තර් සංස්කෘතික (අන්තර් - වාර්ගික) සන්නිවේදනයට සහ අන්තර් ආගමික (අන්තර් විශ්වාස) සංවාදවලට ධූලක පුරුෂභාවය, වෙනස්කොට සැලකීම, ඒකාකෘතික නිරූපණයන් සහ අගතියට විරෙහිව ක්‍රියා කිරීමේ හැකියාව ඇත. බහුවිධ පර්යාලෝකවලින් සහ ඓතිහාසික සාක්ෂරතාවෙන් අදහස් ශක්තිමත් කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට දායක විය හැකි ය. පසුගිය දශක කිහිපය තුළ අප විසින් තාක්ෂණික ජයග්‍රහණ දැක ඇති අතර, සමහර අවස්ථාවල දී ඒවා විසඳිය නොහැකි තාක්ෂණික ගැටලු, නිවේදනාත්මක සයිලෝ සහ සදාචාරාත්මක බිඳවැටීම්වලට පවා හේතු වී ඇත.

55. United Nations Strategy and Plan of Action on Hate Speech., https://www.un.org/en/genocideprevention/documents/advising-and-mobilizing/Action_plan_on_hate_speech_EN.pdf Accessed on 4 January 2021.

56. United Nations Guiding Note on Addressing and Countering COVID-19 related Hate Speech https://www.un.org/en/genocideprevention/documents/Guidance%20on%20COVID-19%20related%20Hate%20Speech.pdf. Accessed on 4 January 2021.

ඒකක:

1 වන ඒකකය:
සත්‍යය වැදගත් වේ

2 වන ඒකකය:
සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු
පාරිසරික පද්ධතිය

3 වන ඒකකය:
මාධ්‍ය සහ සාවද්‍ය තොරතුරු

4 වන ඒකකය
සාවද්‍ය තොරතුරු ප්‍රචාරණයෙන් තනි
පුද්ගලයන්ට සහ සමාජයට වන බලපෑම්

5 වන ඒකකය:
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ
තොරතුරු ප්‍රවේශය

1 වන ඒකකය : සත්‍යය වැදගත් වේ

කාලසීමාව: පැය 3

ප්‍රධාන මාතෘකා

- සත්‍යය පිළිබඳ න්‍යායන් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය
- ඊනියා 'පශ්චාත් සත්‍ය යුගය'
- ජනමාධ්‍යවේදයේ සහ පුස්තකාලයාධිපතිත්වයෙහි හරය ලෙස සත්‍යය.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් විසින් පහත හැකියාවන් ලබා ගනු ඇත.

- සත්‍යය පිළිබඳ න්‍යායන් පැහැදිලි කිරීම
- නිදසුනක් ලෙස පශ්චාත් සත්‍ය යුගය වැනි උදාහරණ දක්වන අවස්ථා විශ්ලේෂණය කිරීම
- සත්‍යය පැවසීම පුවත්පත් කලාවේ සහ පුස්තකාලයාධිපතිත්වයෙහි හරය වන්නේ මන්දැයි යන්න වෙනුවෙන් පෙනී සිටීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ පවතී. කරුණාකර 1 කොටසෙහි ලැයිස්තුව සමාලෝචනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ. වෙනත් සහ ඒ පිළිබඳ වඩාත් සවිස්තරාත්මක මග පෙන්වීම් සඳහා 1 කොටස බලන්න.

- ගැටලු-විමසුම: ඉහත ලැයිස්තුගත කර ඇති මාතෘකා සන්දර්භය තුළ සත්‍යය පිළිබඳ විමර්ශනය කරන හෝ පර්යේෂණ කරන ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.
- සිද්ධි අධ්‍යයනය/සිද්ධි උදාහරණ: සත්‍යය සෙවීම සහ ඒ හා ගැටෙන පර්යාලෝක පිළිබඳ සැබෑ ජීවිතයේ විවිධ උදාහරණ හඳුනාගෙන සාකච්ඡා කරන්න. ඇතැම් සුප්‍රසිද්ධ සිදුවීම්වල ඓතිහාසික වාර්තා ගැන සිතන්න. එසේම ඉතිහාසයේ කාන්තාවන්ගේ භූමිකාව සහ/හෝ තෝරා ගන්නා විවිධ රටවල ස්වාධීනත්වය සඳහා ඔවුන්ගේ දායකත්වය සලකා බලන්න.
- ක්‍රීඩා: සත්‍යය සෙවීම, තර්කනය සහ තර්ක, විචාරශීලී චින්තනය හෝ මාධ්‍ය හා තොරතුරු ප්‍රවර්ධනය කරන ක්‍රීඩා (ඩිජිටල්/ ඉලෙක්ට්‍රොනික හෝ වෙනත්) පිළිබඳ අන්තර්ජාලයේ සොයන්න. පන්ති කාමර ක්‍රියාකාරකම්වලදී මෙම ක්‍රීඩා භාවිතා කිරීම. උදාහරණයක් ලෙස කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ සමාජ තීරණ ගැනීමේ විද්‍යාගාරය විසින් සකසන ලද Go Viral සම්මානලාභී ක්‍රීඩාව බලන්න! https://www.goviralgame.com/books/go-viral/.Searchforsimilargamesinyourregionandcountry ඔබගේ කලාපය සහ රට තුළ ඒ හා සමාන ක්‍රීඩා සොයන්න.
- පඨිත/සන්දර්භීය විශ්ලේෂණය: විශේෂිත සමාජ ගැටලු පිළිබඳ පර්යේෂණ සොයා ගැනීම් ඉදිරිපත් කරන හෝ ඉතිහාසය පිළිබ විස්තර ලබා දෙන ප්‍රබන්ධ නොවන පොත්, සඟරා ලිපි, වීඩියෝ හඳුනා ගන්න. ඉදිරිපත් කර ඇති තර්ක සහ සාක්ෂි සාකච්ඡා කර විශ්ලේෂණය කරන්න. මෙම කෙටි වීඩියෝව නරඹන්න, 5 Tips to improve your critical thinking, https://www.youtube.com/results?search_query=Critical+thinking+ සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු යන යෙදුමට වඩා නිතර නිතර "ව්‍යාජ ප්‍රවෘත්ති" යන යෙදුම අසන හෝ හමුවන ශිෂ්‍යයන් පිළිබඳ ඉක්මන් සංගණනයක් (අත් ඔසවා

පෙන්වීමෙන්) ශික්ෂකයන් විසින් සිදු කළ යුතු ය. මෙම සංගණනය නැවත සිදු කරන්න, නමුත් මෙවර අවධානය යොමු කරන්නේ සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරුවලට වඩා "ව්‍යාජ ප්‍රවෘත්ති" යන යෙදුම නිතර භාවිතා කරන පුද්ගලයන් වෙතය. ඔවුන් එක් එක් යෙදුම් භාවිතා කරන්නේ මන්දැයි සිතා බැලීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. "ව්‍යාජ ප්‍රවෘත්ති" යන යෙදුමේ ගැටලුවක් ඔවුන් දකින්නේ දැයි සිතා බැලීමට ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න. ප්‍රවෘත්ති සහ සමාජයට එහි වැදගත්කම කුමක්දැයි ඔවුන්ට පැහැදිලි කරන්න. සංවර්ධනයට අදාළ පුවත් සහ මාධ්‍ය පිළිබඳ වැඩි විස්තර සඳහා මොඩියුල 1, 2 සහ 13 බලන්න. වෘත්තිමය ප්‍රවෘත්ති සත්‍යාපනය කළ යුතු තොරතුරු විය යුතුය යන්න තේරුම් ගැනීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. ඒ නිසා එහි අන්තර්ගතය ව්‍යාජ නම් එය ප්‍රවෘත්තියක් විය නොහැක. නීත්‍යානුකූල පුවත් යටපත් කිරීමට ව්‍යාජ පුවත් යන යෙදුම උපයෝගී කර ගත හැකි බව ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න. මෙම පර්යාලෝකය වටා සාකච්ඡාවක් මෙහෙයවන්න. "ව්‍යාජ ප්‍රවෘත්ති" යන යෙදුම භාවිතය නවතා අසත්‍ය හෝ නොමග යවනසුළු අන්තර්ගත සහ සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු වැනි ප්‍රකාශ භාවිතා කිරීමට කොපමණ පුද්ගලයන් ප්‍රමාණයක් සූදානම් දැයි බැලීමට තවත් සංගණනයක් කරන්න. සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු පිළිබඳ නිර්වචන සඳහා පාරිභාෂික පදමාලාව බලන්න.

- එක් කණ්ඩායමකට සාමාජිකයන් 5 සිට 7 සිටින සේ කණ්ඩායම කණ්ඩායම් දෙකකට හෝ වැඩි ගණනකට සංවිධානය කරන්න. සෑම කණ්ඩායමකටම රවුමක් ආකාරයට සකස් වන ලෙස පවසන්න. තමන් පිළිබඳ ප්‍රකාශ තුනක් ගැන සිතීමට එක් එක් කණ්ඩායමේ සාමාජිකයන්ට උපදෙස් දෙන්න. ඉන් දෙකක් සත්‍ය ප්‍රකාශ විය යුතු අතර එකක් අසත්‍ය විය යුතුය. ප්‍රකාශ රසවත් විය යුතු අතර සාමාන්‍ය හෝ පොදු නොවිය යුතු ය. එක් වටයක් ක්‍රීඩා කිරීමට, එක් එක් පුද්ගලයා තම කණ්ඩායම හා ප්‍රකාශ තුන බෙදා ගනී (ඕනෑම අනුපිළිවෙලකට). ක්‍රීඩාවේ පරමාර්ථය වන්නේ සාමාජිකයන් විසින් කුමන ප්‍රකාශය අසත්‍ය ද යන්න තීරණය කිරීමයි. සෑම සාමාජිකයෙකුම ඇය/ඔහු සිතන්නේ කුමන ප්‍රකාශය අසත්‍ය ද යන්න තෝරා ගනී. සෑම වටයක්ම අවසානයේදීම, අසත්‍ය කුමක් දැයි සෑම සාමාජිකයෙක්ම හෙළි කරයි adopted from icebreakers.ws - https://www.icebreakers.ws/small-group/two-truths-and-a-lie.html). ක්‍රීඩාව සජීවී කිරීමට, එක් එක් කණ්ඩායමට හෝ මුළු කණ්ඩායමටම පහත ප්‍රශ්නවලට පිළිතුරු දීමට සහ අනෙක්වා සිතීමට ඉඩ ලබා දෙන්න. සත්‍ය සහ අසත්‍ය ප්‍රකාශ ගැන සිතීම ඔබට අපහසු වූවා ද? ඇයි හෝ නොහැකි ඇයි? කුමන ප්‍රකාශය සත්‍ය හෝ අසත්‍ය දැයි හඳුනා ගැනීමට ඔබ භාවිත කළ උපාය මාර්ගය කුමක් ද? බොහෝ සාවද්‍ය ප්‍රකාශයන් පැමිණි මාතෘකා/විෂයයන් සම්බන්ධයෙන් ඔබ කිසියම් රටාවක් නිරීක්ෂණය කළේ ද?
- එකම ප්‍රවෘත්ති ආයතනයක ප්‍රවෘත්ති වාර්තාකරුවෙකු සහ සංස්කාරකවරයෙකු සමග ශික්ෂකයන්ට සම්මුඛ සාකච්ඡා කිරීමට හෝ ශිෂ්‍යයන්ට සම්මුඛ සාකච්ඡා කිරීමට මග පෙන්වීමට හැකි ය. වාර්තාකරුගෙන් පහත ප්‍රශ්න අසන්න සහ වෙනත් ඒවා ගැන සිතන්න: වාර්තා කිරීමේ දී නිරවද්‍යතාව සහතික කිරීම සඳහා දත්ත හෝ තොරතුරු තෝරාගැනීමේ දී ඔබ භාවිත කරන නිර්ණායක මොනවා ද? සත්‍ය දත්ත සහ තොරතුරු රැස් කිරීමට ඔබ භාවිතා කරන තොරතුරු රැස් කිරීමේ ක්‍රම මොනවා ද? ඔබේ ප්‍රකාශිතවල සිද්ධි වාචක දෝෂ නිවැරදි කරන්නේ කෙසේ ද? සංස්කාරකවරයාගෙන්, පහත ප්‍රශ්න අසන්න: ඔබේ වාර්තාකරුවන් විසින් සපයන ලද දත්ත හෝ තොරතුරු නිවැරදි හෝ සත්‍ය බව ඔබ සත්‍යාපනය කරන්නේ කෙසේද? ඔබේ ප්‍රවෘත්ති ආයතනයට නිරවද්‍යතාවට අදාළ ප්‍රමිතීන් තිබේ ද? ඔව් නම්, කරුණාකර ඒවා විස්තර කරන්න. ඔබේ පළ කරන ලද කථාවල සිද්ධි වාචක වැරදීම් නිවැරදි කිරීමට ඔබේ ප්‍රවෘත්ති සංවිධානය කරන්නේ කුමක් ද? තොරතුරු සත්‍යාපනය කිරීමට සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ගේ පර්යාලෝක සහතික කරන අභ්‍යන්තර නීති තිබේ ද? තොරතුරු සත්‍යාපන ක්‍රියාවලීන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පර්යාලෝක අදහස් සලකා බලන්නේ ද?
- තම තමන්ගේ ප්‍රජාවන්හි පුස්තකාලයාධිපතිවරුන්, අධිලේඛනාරක්ෂකවරුන් හෝ කෞතුකාගාර භාරකරුවන් සමග ශික්ෂකයන්ට සම්මුඛ සාකච්ඡා කිරීමට හෝ ශිෂ්‍යයන්ට සම්මුඛ සාකච්ඡා කිරීමට මග පෙන්විය හැකි ය. පහත ප්‍රශ්න අසන්න (තවත් එකතු කළ හැකි ය.) : පුස්තකාල/ලේඛනාගාර/කෞතුකාගාර සඳහා ප්‍රබන්ධ නොවන පොත්, මුල් ලේඛන හෝ මානවකෘති තෝරාගැනීමේදී නිරවද්‍යතාව සහ සත්‍යතාව සහතික කිරීම සඳහා ඔබ භාවිතා කරන නිර්ණායක මොනවා ද? පොත්, මුල් ලේඛන හෝ මානවකෘති තෝරා ගැනීම පිළිබඳ දත්ත සහ තොරතුරු රැස්

කිරීමට ඔබ භාවිතා කරන තොරතුරු රැස් කිරීමේ ක්‍රම මොනවා ද? නව වර්ධනයන් සහ පර්යේෂණ කිරීමෙන් පසුව, ඇතැම් පොත්, මුල් ලේඛන හෝ මානවකෘති තවදුරටත් සත්‍ය හෝ සම්පූර්ණ සත්‍ය නොවන බව ඔබ සොයා ගත් විට ඔබ දෝෂ නිවැරදි කරන්නේ කෙසේ ද? ප්‍රධාන පුස්තකාලයාධිපති / අධිලේඛනාරක්ෂක / කෞතුකාගාර අධ්‍යක්ෂගෙන් පහත ප්‍රශ්න අසන්න: ඔබේ කාර්ය මණ්ඩලය / වෘත්තීය සගයන් විසින් සපයන ලද පොත් හෝ වෙනත් පුස්තකාල සම්පත්, මුල් ලේඛන හෝ මානවකෘති පිළිබඳ දත්ත හෝ තොරතුරු නිවැරදි හෝ සත්‍ය බව ඔබ සත්‍යාපනය කරන්නේ කෙසේ ද? ඔබේ ආයතනයට නිරවද්‍යතාවට අදාළ ප්‍රමිතීන් තිබේද? ඔව් නම්, කරුණාකර ඒවා විස්තර කරන්න. පොත් හෝ වෙනත් පුස්තකාල සම්පත්, මුල් ලේඛන හෝ මානවකෘති එකතු කිරීමේදී කර්තෘත්වයේ හෝ ඒකාකෘතික නොවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය නියෝජනය කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමතුලිතතාව සහතික කිරීම සඳහා නීති රීති තිබේද?

- ඓතිහාසික සංශෝධනවාදය (Revisionism) සහ නිෂේධතාවාදය (Negationism) හෝ ප්‍රතිෂේදනවාදය (Denialism) පිළිබඳ ගැටලු පැහැදිලි කිරීමට සහ සාකච්ඡා කිරීමට ඉතිහාසඥයෙකුට ඉගෙනුම් අවකාශයට ආරාධනා කරන්න. සාකච්ඡාව සඳහා වන ගැටලුවලට පහත සඳහන් දෑ ඇතුළත් විය හැකි ය: ඓතිහාසික සංශෝධනවාදය සහ ප්‍රතිෂේදනවාදය අතර ඇති වෙනස්කම් මොනවා ද? විකෘති කිරීම සහ සුළුකොට සැලකීම ඇතුළු සංශෝධනවාදයේ සහ ප්‍රතිෂේදනවාදයේ විවිධ මට්ටම් ද සලකා බලන්න; නිදසුනක් වශයෙන්, යුදෙව් ජනයාගේ සමූලඝාතනය/ජන සංහාරය සම්බන්ධයෙන් ගත හැකි ය. සමූලඝාතනය විකෘති කිරීම, අදාළ චේතනාවන් සහ එහි හානිකර බලපෑම් පිළිබඳව දැනුවත් කරන ජාත්‍යන්තර සමූලඝාතන අනුස්මරණ සන්ධානය (IHR) සහ යුනෙස්කෝ වෙබ් අඩවිය වෙනත් විස්තර සඳහා බලන්න www.AgainstHolocaustDistortion.org. සංශෝධනවාදය හෝ නිෂේධතාවාදය සඳහා දැන් ඉලක්ක වී ඇති සමහර ගෝලීය සහ/හෝ ජාතික ගැටලු සහ සිදුවීම් මොනවා ද? ඓතිහාසික සංශෝධනවාදය සහ නිෂේධතාවාදය සත්‍යය සෙවීමට අනුකූල ද? මෙම සංකල්ප දෙක අනුගමනය කිරීමට සමහර පුද්ගලයන් පොළඹවන්නේ කුමක් ද? ඕනෑම ඉදිරිපත් කිරීමේ මෘදුකාංගයක් භාවිතයෙන් ඔබේ සම්මුඛ පරීක්ෂණයේ විශේෂ අවස්ථා පිළිබඳව කණ්ඩායම ඉදිරියේ ඉදිරිපත් කිරීමක් සහ මග පෙන්වීමක් ලබා දෙන්න.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන සඳහා ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ නිදහස
- ජනමාධ්‍යවේදීන්ගේ සහ තොරතුරු වෘත්තිකයන්ගේ ආචාර රීති සහ ආචාරධර්ම සංග්‍රහය
- ඓතිහාසික සාක්ෂරතාව
- ඓතිහාසික සංශෝධනවාදය සහ ඓතිහාසික නිෂේධතාවාදය
- දත්ත කැණීම, දත්ත විශ්ලේෂණ, සහ සත්‍ය පැවසීම.

2 වන ඒකකය : සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු පාරිසරික පද්ධතිය (සම්භවය, නිර්වචනය, වෙනස් ලක්ෂණ, පෙළඹවීම්, ආදිය)

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- අසත්‍ය සහ නොමඟ යවනසුළු අන්තර්ගත මූලිකාංග - දුස්තොරතුරු, සාවද්‍ය තොරතුරු සහ කුමන්ත්‍රණ න්‍යායන් ඇතුළු හානි පැමිණවීමේ අදහසින් ලබා දෙන අසත්‍ය තොරතුරු
- පොදු ප්‍රවර්ග (උදා. නොමඟ යවනසුළු අන්තර්ගතය, ව්‍යාජ අන්තර්ගතය, ගොතන ලද අන්තර්ගතය, ව්‍යාජ සම්බන්ධතා, ව්‍යාජ සන්දර්භය සහ හසුරුවන ලද අන්තර්ගතය)
- සාවද්‍ය තොරතුරු සහ වෛරී ප්‍රකාශ.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් විසින් පහත හැකියාවන් ලබා ගනු ඇත.

- විවිධ ආකාරයේ අසත්‍ය සහ නොමඟ යවනසුලු අන්තර්ගත, එනම්, දුස්තොරතුරු, සාවද්‍ය තොරතුරු සහ ලක්ෂණ, අභිප්‍රේරණ ආදිය අනුව කුමන්ත්‍රණ න්‍යාය/මිථ්‍යා ඇතුළු හානි පැමිණවීමේ අදහසින් ලබා දෙන අසත්‍ය තොරතුරු වෙන්කර හඳුනා ගැනීම.
- විවිධ මාධ්‍ය වේදිකාවල හමු වන අසත්‍ය සහ නොමඟ යවනසුලු අන්තර්ගතයන්ගේ පොදු ප්‍රවර්ගයන්ට උදාහරණ පැහැදිලි කිරීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ පවතී. කරුණාකර 1 කොටසෙහි ලැයිස්තුව සමාලෝචනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ. වෙනත් සහ ඒ පිළිබඳ වඩාත් සවිස්තරාත්මක මග පෙන්වීම සඳහා 1 කොටස බලන්න.

- සිද්ධි අධ්‍යයනය/අසත්‍ය සහ නොමඟ යවනසුලු අන්තර්ගතයේ පොදු ආකෘතිවල සිද්ධි උදාහරණ
- ගැටලු-විමසුම් ප්‍රවේශය
- පර්යේෂණ
- සම්පාදනය
- අන්තර්ගත/සන්දර්භීය විශ්ලේෂණය
- සාවද්‍ය තොරතුරු සහ දුස් තොරතුරුවල පොදු ප්‍රවර්ගයන්ට පහත සඳහන් දෑ ඇතුළත් වේ.
    - නොමඟ යවනසුලු අන්තර්ගතය,
    - වංචාකාර අන්තර්ගතය,
    - ගොතන ලද අන්තර්ගතය,

- වැරදි සම්බන්ධතාව,
- වැරදි සන්දර්භය,
- අනිසි ලෙස හසුරුවන ලද අන්තර්ගතය
- කුමන්ත්‍රණ න්‍යාය
- මිථ්‍යාව

වෛරී අන්තර්ගතය අනිවාර්යයෙන්ම අසත්‍ය අන්තර්ගතයට සමාන නොවන බව සලකන්න. නිදසුනක් වශයෙන්, එන්නත්-විරෝධී අසත්‍යයන් ද්වේෂය සමග සංයෝජනය වන්නේ කලාතුරකිනි. කෙසේ වෙතත්, දුරස්ථ වුවද, වෛරයේ සහ සතුරුකමේ සිද්ධි ප්‍රකාශනයන් බොහෝ විට අසත්‍ය සහ නොමඟ යවනසුළු අන්තර්ගතයන්ගෙන් බල සම්පන්න වේ.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ අවසානයේ ඇති පාරිභාෂික පද මාලාවේ එක් එක් පදයේ නිර්වචන බලන්න. නැතහොත් යුනෙස්කෝව සහ පහත හවුල්කරුවන්ගේ සම්පත්වලින් මේ පිළිබඳ වැඩිදුර කියවන්න. ඔබට ඔබේ දේශීය භාෂාවෙන් මාර්ගගත ලෙස සමාන සම්පත් සෙවිය හැකි ය. විවිධ පාරිභාෂික පදවල සමානකම් සහ අසමානකම් සංසන්දනය කිරීමට පන්තිකාමර සාකච්ඡා මෙහෙයවන්න. පැහැදිලි අවබෝධයක් ඇති වූ පසු, ශිෂ්‍යයන් කණ්ඩායම්වලට වෙන් කර, තම තමන්ගේ සමාජ මාධ්‍ය පිටුවල ඔවුන්ට හමු වූ එක් එක් සාවද්‍ය තොරතුරු ප්‍රවර්ග පිළිබඳව පර්යේෂණ කර උදාහරණ ඉදිරිපත් කිරීමට සලස්වන්න.

- පුවත්පත් කලාව, ව්‍යාජ පුවත් සහ දුස්තොරතුරු: ජනමාධ්‍ය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා අත්පොතක්, https://en.unesco.org/fightfakenews
- නව්‍ය පරීක්ෂණය දුස්තොරතුරුවල මූලික කරුණු උගන්වයි: https://en.unesco.org/news/innovative-test-teaches-abcs-disinformation
- තුලනය කිරීමේ පනත: ප්‍රකාශනයේ නිදහසට ගරු කරමින් ඩිජිටල් දුස්තොරතුරුවලට ප්‍රතිරෝධය දැක්වීම, https://en.unesco.org/publications/balanceact
- පුවත්පත් කලාවේ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව: ජන මාධ්‍යවේදීන් සහ ජන මාධ්‍ය ශික්ෂකයන් සඳහා අත්පොතක්, https://en.unesco.org/sites/default/files/mil_eng.pdf
- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව ක්ෂුද්‍ර ඉගෙනුම් සම්පත්, https://en.unesco.org/ covid19/communicationinformationresponse/visualresources
- කුමන්ත්‍රණ න්‍යායන් සඳහා මාර්ගෝපදේශය, https://conspiracytheories.eu/_wpx/wp-content/uploads/2020/03/COMPACT_Guide-2.pdf
- කුමන්ත්‍රණ න්‍යාය පිළිබඳ අත්පොත, https://www.climatechangecommunication. org/wp-content/uploads/2020/03/ConspiracyTheoryHandbook.pdf
- යුනෙස්කෝ සහ හවුල්කරුවන් : කුමන්ත්‍රණ න්‍යායන් පැතිරීම වැළැක්වීම සඳහා වූ ThinkBeforeSharing ව්‍යාපාරය, https://en.unesco.org/themes/gced/thinkbeforesharing.

- පන්තිය යුගලවලට හෝ කුඩා කණ්ඩායම්වලට බෙදන්න. විවිධ වේදිකාවල (මහජන මාධ්‍ය, මාර්ගගත මාධ්‍ය, සමාජ මාධ්‍ය, පොත්) සමීක්ෂණ අන්තර්ගත සහ ව්‍යාජ සහ නොමඟ යවන අන්තර්ගත යන කාණ්ඩවලට ගැළපෙන උදාහරණ ලබා ගැනීමට අන්තර්ජාලයේ සහ මාර්ග අපගතව පොදුවේ සෙවීමට සෑම කණ්ඩායමකටම පවසන්න. සියලුම ඉදිරිපත් කිරීම් සිදු කළ පසු, මෙම ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් සාකච්ඡාව වැඩි දියුණු කරන්න (තවත් එකතු කළ හැකි ය): බොහෝ උදාහරණ පැමිණියේ කුමන වේදිකාවෙන් ද? සමස්තයක් ලෙස සහ එක් අසත්‍ය සහ නොමඟ යවනසුලු අන්තර්ගත ප්‍රවර්ගයකට අනුව වඩාත් පොදු මාතෘකා මොනවා ද?
- මෙය සම්පාදනය කරන අවස්ථාව වන විට, දුස්/සාවද්‍ය තොරතුරු සඳහා වඩාත් පොදු මාතෘකා අතර දේශගුණික විපර්යාස, එන්නත්, සහ COVID-19 වසංගතය (සහ අනෙකුත් වසංගත) වේ. මෙම ක්ෂේත්‍රවල පොදු විශේෂිත දුස්/සාවද්‍ය තොරතුරු පිළිබඳ මාර්ගගත/ මාර්ග අපගත පර්යේෂණයක්

පවත්වන්න. ඒවා ලැයිස්තුගත කිරීමෙන් පසු, අසත්‍ය තොරතුරු නිෂ්ප්‍රභ කරමින් සාක්ෂි මත පදනම් වූ තොරතුරු පිළිබඳ පසු විපරම් පර්යේෂණ කරන්න. සත්‍ය සහ විශ්වාසදායක තොරතුරු මූලාශ්‍ර අතර, ලෝක සෞඛ්‍ය සංවිධානය, ඔබේ ප්‍රාදේශීය සෞඛ්‍ය අධිකාරිය, යුනෙස්කෝව සහ දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ තොරතුරු සලකා බලන්න. අසත්‍ය තොරතුරු හෙළිදරව් කිරීමට ඔබ භාවිත කළ විශ්වාසනීය ආයතන හඳුනා ගන්න. ඔබ ඒවා විශ්වසනීය තොරතුරු මූලාශ්‍ර ලෙස සලකන්නේ ඇයි?

- ශිෂ්‍යයන් අතර සාකච්ඡාවක් සංවිධානය කරන්න. ඔවුන් කුමන්ත්‍රණ න්‍යායයන්වලට මුහුණ දී ඇත්දැයි සොයා බලන්න. ඔව් නම්, කුමන ඒවා ද? ඔවුන්ට මේවා හමු වූයේ කොහෙන්ද? මාර්ගගත ආකාරයට ද?/ මාර්ග අපගත ආකාරයට ද? ඔවුන්ට ලැබුණු තොරතුරු කුමන්ත්‍රණ න්‍යායන් බව අනාවරණය කර ගැනීමට හැකි වුණා ද? ඔව් නම්, කෙසේ ද? සැබෑ කුමන්ත්‍රණ පවතින බව ඔවුන් සිතනවා ද? ඔවුන්ට මේවායින් සමහරක් බෙදා ගත හැකි ද? පුළුල් ලෙස දන්නා කුමන්ත්‍රණ න්‍යායන් කිහිපයක් සෙවීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. දැන් යුනෙස්කෝව, යුරෝපීය කොමිසම සහ ට්විටර් විසින් සංවර්ධනය කරන ලද කුමන්ත්‍රණ න්‍යායන් හඳුනාගැනීම, පූර්ව හෙළිදරව්ව (pre-bunk) සහ හෙළිදරව් කිරීම පිළිබඳ #ThinkBeforeSharing ව්‍යාපාරය හා සම්බන්ධ ඉගෙනුම් සම්පත් කට්ටලය සලකා බලන්න. https://en.unesco.org/themes/ gced/thinkbeforesharing, මෙම සම්පත් වටා විවිධ කුඩා කණ්ඩායම් සාකච්ඡා, ක්‍රියාකාරකම් සහ ඉදිරිපත් කිරීම්/ප්‍රතිපෝෂණ සංවිධානය කරන්න.
    - කුමන්ත්‍රණ න්‍යායන් බොහෝ විට ගවේෂණාත්මක පුවත්පත් කලාව ලෙස ඉදිරිපත් කෙරේ. යුනෙස්කෝව විසින් සංවර්ධනය කරන ලද ගුණාත්මක සහ වෘත්තීය පුවත්පත් කලාව හඳුනා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ද සම්පත් බලන්න https://en.unesco.org/covid19/communicationinformationresponse/visualresources ඉහත ආකාරයට සමාන ක්‍රියාකාරකම් සංවිධානය කරන්න. UNESCO MIL CLICK සමාජ මාධ්‍ය පිටුවල තවත් යුනෙස්කෝව ආශ්‍රිත සම්පත් බලන්න, https://en.unesco. org/milclicks.
- වෛරී ප්‍රකාශ යන්නට ජාත්‍යන්තරව සියලු දෙනා පිළිගන්නා නිර්වචනයක් නොමැත. පිළිගත් ජාත්‍යන්තර, කලාපීය සහ ජාතික සංවිධාන විසින් පිරිනමනු ලබන විවිධ විස්තර කිරීම් සඳහා අන්තර්ජාලය සොයන්න. ඉදිරිපත් කර ඇති විවිධ නිර්වචනවල වෙනස්කම් තීරණය කිරීමට ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදා ඔවුන්ට මග පෙන්වන්න. එක් නිර්වචනයක් හැර තවත් අර්ථ දැක්වීමක් කෙරෙහි අවධානය යොමු කිරීමේ අවදානම කුමක්දැයි ඔවුන් අවබෝධ කර ගත යුතු ය. මගහැරී ඇත්තේ කුමක් ද? තබා ගෙන ඇත්තේ කුමක් ද? තීරණය කළ යුත්තේ කවු ද? ගම්‍යාර්ථ මොනවා ද?
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීම, වර්ගවාදය, යුදෙව් විරෝධීත්වය, LGBTQI+ ප්‍රජාව ඉලක්ක කරගත් වෛරය යනාදිය ඇතුළුව අප්‍රකට පක්ෂග්‍රාහීත්වය, අගතීන් සහ චේතනාවන් හඳුනා ගැනීම වැනි විවිධ ආකාරයේ වෛරී ප්‍රකාශ ඉදිරිපත් කරන නියැදි පළ කිරීම් (Posts) සොයන්න හෝ තෝරන්න. ඉහත යෝජිත ක්‍රියාකාරකම් දෙක නැවත සිදු කරන්න සහ කුමන ආකාරයේ අසත්‍ය සහ නොමග යවනසුලු අන්තර්ගතයක් භාවිතා කළේ ද යන්න විස්තර කරන්න. මෙවර වෛරී ප්‍රකාශ වර්ග කෙරෙහි අවධානය යොමු කරන්න. වෛරයේ හෝ නොඉවසීමේ පෙර අත්දැකීම් බෙදා ගැනීමට ශිෂ්‍යයන් කැමති නම් ඔවුන්ට එම අවස්ථාව ලබා දෙන්න, නැතහොත් මෙම අත්දැකීම් සමග ජීවත් වූ අයෙකු මාර්ගගත ආකාරයට හෝ මාර්ග අපගත ආකාරයට දුටුවේ නම් එය බෙදා ගැනීමට ද අවස්ථාව ලබා දෙන්න. ඔවුන් ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද? ඔවුන් ප්‍රතිචාර දැක්වූවේ ඇයි? හෝ ඔවුන් ප්‍රතිචාර නොදැක්වූවේ ඇයි? පහත යුනෙස්කෝ සහ හවුල්කරුවන්ගේ සම්පත් සලකා බලන්න:

- මාර්ගගත වෛරී ප්‍රකාශවලට එරෙහිවීම https://unesdoc.unesco.org/ark:/48223/pf0000233231
- නැවත සිතීම ඉගෙනීම: අධ්‍යාපන පද්ධති සඳහා සමාජ සහ චිත්තවේගීය ඉගෙනීම පිළිබඳ සමාලෝචනයක්, https://unesdoc.unesco.org/ark:/48223/pf0000373890?locale=en
- අධ්‍යාපනය හරහා යුදෙව් විරෝධය ආමන්ත්‍රණය කිරීම: ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා මාර්ගෝපදේශ https://unesdoc.unesco.org/ark:/48223/pf0000263702

- වෛරී ප්‍රකාශ පිළිබඳ ඔහ උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්මේ[57], බැඳීම 7 හි: වෛරී ප්‍රකාශ පිළිබඳ කටයුතු කිරීම සහ ඊට විරෝධය දැක්වීම සඳහා මෙවලමක් ලෙස අධ්‍යාපනය භාවිතා කිරීම යන්නෙන් තිරසාර සංවර්ධන ඉලක්ක 4 ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආයතන විධිමත් හා අවිධිමත් අධ්‍යාපනයේ ක්‍රියාමාර්ග ගත යුතු බව, ගෝලීය පුරවැසි අධ්‍යාපනයේ සාරධර්ම සහ කුසලතා ප්‍රවර්ධනය කළ යුතු බව සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වැඩි දියුණු කළ යුතු බව නියම කරයි. මිනිසුන්ගේ විචාරශීලී චින්තනය සහ විචාරශීලී නිපුණතා දිරිමත් කරන සහ වෙනත් දේ අතර ප්‍රවර්ධනය කරන ඩිජිටල් හෝ තාක්ෂණික සාක්ෂරතාව ඇතුළු මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ආධාරක වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් ද මෙම ලේඛනය යෝජනා කරයි. පහත පාදක සටහන්වල ඇති සබැඳි හරහා මෙම ලේඛන වෙත ප්‍රවේශ වන්න. සම්පත් වල අන්තර්ගතය වටා විවිධ ඉගෙනුම් ක්‍රියාකාරකම් සැලසුම් කරන්න. නිදසුනක් වශයෙන්, ශිෂ්‍යයන් කණ්ඩායම් වශයෙන් තබා ඔවුන්ගේ ප්‍රජාවන් හෝ කලාපය තුළ මෙම ආකාරයේ ක්‍රියාවන් කෙතරම් දුරට ක්‍රියාත්මක වේද යන්න පර්යේෂණ කිරීමට සලස්වන්න.

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන සඳහා ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, විලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- ගවේෂණාත්මක කතාව/වාර්තාව.

වැඩිදුර සලකා බැලීම සඳහා මාතෘකා

- ප්‍රචාරණ සහ සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු
- ගණනය කිරීමේ ප්‍රචාරක ශිල්පීය ක්‍රම
- සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු සඳහා AI බලපෑම
- දුර්බෝධ ප්‍රයෝග (Deepfake) සහ වෙනත් ආකාරයේ කෘත්‍රිම මාධ්‍ය (ශ්‍රව්‍ය දෘශ්‍ය අභිමතානුසාරී පරිහරණ තාක්ෂණ ඇතුළුව).

57. United Nations Strategy and Plan of Action on Hate Speech., https://www.un.org/en/genocideprevention/documents/advising-and-mobilizing/Action_plan_on_hate_speech_EN.pdf Accessed on 4 January 2021. See also United Nations Guiding Note on Addressing and Countering COVID-19 related Hate Speech https://www.un.org/en/genocideprevention/documents/Guidance%20on%20COVID-19%20related%20Hate%20Speech.pdf. Accessed on 4 January 2021.

3 වන ඒකකය : මාධ්‍ය සහ සාවද්‍ය තොරතුරු

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- දුස්තොරතුරු සහ මාධ්‍ය අභිමතානුසාරී හැසිරවීම
- දුස්තොරතුරු සඳහා තෝරා ගැනීමේ වේදිකාවක් ලෙස සමාජ මාධ්‍ය
- දුස්තොරතුරු සහ ට්‍රොලිං/ක්ලික්බේට් අන්තර්ගතයේ නිර්මාණ ශිල්පය

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් විසින් පහත හැකියාවන් ලබා ගනු ඇත.

- යම් සන්දර්භයක් තුළ දුස්තොරතුරු සඳහා සමාජ මාධ්‍ය තෝරා ගැනීමේ වේදිකාවක් බවට පත් කරන ගුණාංග හෝ ලක්ෂණ පැහැදිලි කිරීම
- දුස්තොරතුරු සම්බන්ධයෙන් ට්‍රොලිං/ක්ලික්බේට් ක්‍රියාත්මක වන ආකාරය විස්තර කිරීම
- වැරදි තොරතුරු සහ වෛරය පිළිබඳ කටයුතු කිරීමේ දී පවතින යාන්ත්‍රණ සහ අන්තර්ජාල අතරමැදියන්ගේ සළුලතාව ඇගයීම
- ඉගෙනුම් අවකාශය සැකසීමක් තුළ අසත්‍ය සහ නොමග යවනසුලු අන්තර්ගත පිළිබඳ කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ සරල වැඩ සැලැස්මක් සකස් කිරීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ පවතී. කරුණාකර 1 කොටසෙහි ලැයිස්තුව සමාලෝචනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ. වෙනත් සහ ඒ පිළිබඳ වඩාත් සවිස්තරාත්මක මග පෙන්වීම සඳහා 1 කොටස බලන්න.

- සිද්ධි අධ්‍යයනය/අසත්‍ය සහ නොමග යවනසුලු අන්තර්ගතයේ පොදු ආකෘතිවල සිද්ධි උදාහරණ
- ගැටලු-විමසුම් ප්‍රවේශය
- පර්යේෂණ
- අන්තර්ගත/සන්දර්භීය විශ්ලේෂණය
- සම්පාදනය
- පන්තිය කණ්ඩායම්වලට බෙදා සෑම කණ්ඩායමකින්ම ඉගෙනුම් අවකාශයක දී සාවද්‍ය තොරතුරු පිළිබඳ කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව සරල වැඩ සැලැස්මක් සකස් කරන ලෙස ඉල්ලා සිටින්න. වැඩ සැලැස්මට පහත සඳහන් මූලිකාංග ඇතුළත් විය හැකි ය: ග්‍රාහක පිරිස, අරමුණු, සන්දේශ, උපාය මාර්ග සහ ක්‍රියාකාරකම්. ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ප්‍රධාන සන්දේශ මුද්‍රිත, විකාශන සහ ඩිජිටල් යන ඔවුන් කැමති වේදිකා භාවිත කරමින් ප්‍රචාරක ද්‍රව්‍ය (පෝස්ටර, ඉන්ෆොග්‍රැෆික්, රාජ්‍ය සේවා නිවේදන, සමාජ මාධ්‍ය කාඩ්පත්, මීම්) බවට පරිවර්තනය කරන ලෙස ඉල්ලා සිටින්න.
- "බොට්" යනු කුමක් ද සහ එය හඳුනා ගන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න. https://firstdraftnews.org/latest/how-to-spot-a-bot-or-not-the-main-indicators-of-online-automation-co- ordination-and-inauthentic-activity බලන්න.

- කුඩා කණ්ඩායම් සැකසුමක (සහභාගිවන්නන් 4 සිට 5 දක්වා), සමාජ මාධ්‍ය වේදිකාවක් භාවිතයෙන් අසත්‍ය අන්තර්ගතයන් පිළිබඳ සෑම සහභාගිවන්නෙකුගෙන්ම ඇයගේ හෝ ඔහුගේ අත්දැකීම් ගැන විමසන්න. ශික්ෂකයන්ට පහත ප්‍රශ්න සමඟින් ශිෂ්‍යයන්ට මග පෙන්විය හැක: ඔබ අතීතයේ අන්තර්ජාලය හරහා අසත්‍ය අන්තර්ගත බෙදාගෙන තිබේ ද? අසත්‍ය අන්තර්ගතයට කැමති වීමට හෝ බෙදා ගැනීමට ඔබව පෙළඹවූයේ කුමක් ද? ඔබ එයට කැමතිවීමට/බෙදා ගැනීමට පෙර එය අසත්‍ය අන්තර්ගතයක් බව ඔබ දැන සිටියා ද? එය අසත්‍ය අන්තර්ගතයක් බව දැනගත් විට (අන්තර්ගතයට කැමතිවීමට/බෙදා ගැනීමට පෙර ඔබ නොදැන සිටි බව උපකල්පනය කළ විට) ඔබේ මූලික ප්‍රතිචාරය කුමක් ද? සමාජ මාධ්‍ය ගිණුම් භාවිතා කිරීමේ දී වඩාත් විචක්ෂණශීලී වන්නේ කෙසේද යන්න පිළිබඳව අනෙකුත් තරුණ තරුණියන්ට ඔබ විසින් කරන නිර්දේශ මොනවා ද? (සටහන: සහභාගිවන්නන්ට අසත්‍ය අන්තර්ගත පිළිබඳ අත්දැකීම් නොමැති නම්, ඔවුන්ට අසත්‍ය අන්තර්ගතයට කැමති වීමේ හෝ බෙදාගැනීමේ අත්දැකීම් ඇති වෙනත් තරුණයන් සමග සම්මුඛ සාකච්ඡා කළ හැකි ය).
- ඇල්ගොරිතම, වෛරය සහ/හෝ දුස්තොරතුරු අනුමත කරන අන්තර්ගත සහ කණ්ඩායම් විස්තාරණය සහ නිර්දේශ කරන ආකාරය සාකච්ඡා කරන්න. මේ සම්බන්ධයෙන් සමාගම්වල බැඳීම් මොනවාද? පරිශීලකයන් එවැනි අන්තර්ගතයට නිරාවරණය වී ඇත්නම් ඔවුන්ට එය දැනුම් දිය යුතු ද?
- සමහර ප්‍රවෘත්ති මාධ්‍ය ආයතන දුස්තොරතුරු හෝ නොමග යවනසුලු කථා ඉදිරිපත් කරනවා ද? මාධ්‍ය බහුත්වවාදය අවසන් වන්නේ කොතැනින්ද, දුස්තොරතුරු සපයන්නන් ආරම්භ වන්නේ කොතැනින්ද? සමහර ප්‍රවෘත්ති මාධ්‍ය අසත්‍ය සහ/හෝ වෛරය සම්පාදනය කිරීමට, නීත්‍යානුකූල කිරීමට සහ පතුරුවා හැරීමට පමණක්ම ස්ථාපිත ආයතන වන්නේ ඇයි?
- දුස්තොරතුරු, සාවද්‍ය තොරතුරු ප්‍රචාරණය කරන පොත්, ලේඛන, හෝ ඓතිහාසික මානව කෘති හෝ මේවායේ සම්පූර්ණ සත්‍යතාව පිළිබඳ පරස්පර සාක්ෂි හෝ ඉදිරි පර්යාලෝක තිබේ නම් ඒවා සහ අනෙකුත් අදාළ සම්පත් හඳුනා ගත හැක්කේ කෙසේ ද සහ හඳුනා ගත හැකි ද යන්න ගැන කතා කිරීමට පුස්තකාලයාධිපතිවරුන්, අධිලේඛනාරක්ෂකවරුන් හෝ කෞතුකාගාර භාරකරුවන් සමග සම්මුඛ සාකච්ඡා සිදු කරන්න හෝ සංචාරයක් සංවිධානය කරන්න. උදාහරණයක් ලෙස, යම් ජාතියක/සම්භවයක් ඇති කාන්තාවන් ඉතිහාසගත වාර්තාවලින් ඉවත් කර ඇති හෝ සූක්ෂම ලෙස ආවරණය නොකළ අවස්ථා සලකා බලන්න. මෙවැනි කාරණා සලකා බලන්නේ කෙසේ ද?

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන සඳහා ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- ගවේෂණාත්මක කතාව/වාර්තාව.

වැඩිදුර සලකා බැලීම සඳහා මාතෘකා

- කුමන්ත්‍රණ න්‍යාය
- සාවද්‍ය තොරතුරු සඳහා මෘදුකාංග සක්‍රීය කරන්නන්, උදා. කෘතිම බුද්ධිය, ඇල්ගොරිතම සහ බොට්ස්.

4 වන ඒකකය: අසත්‍ය සහ නොමග යවන සුළු අන්තර්ගතයෙන් පුද්ගලයන්ට සහ සමාජයට ඇති බලපෑම්

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- පුවත්පත් කලාව (මාධ්‍ය) කෙරෙහි ඇති විශ්වාසය මත සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරුවල බලපෑම
- දුස්තොරතුරු වසංගතය සහ COVID-19 වසංගතය පුද්ගල සහ මහජන සෞඛ්‍ය සහ ආරක්ෂාව කෙරෙහි බලපෑම (https://en.unesco.org/covid19/disinfodemic)
- දුස්තොරතුරු සහ ප්‍රජාතන්ත්‍රවාදය (මැතිවරණ ඇතුළුව. "ඩිජිටල් අවධියක මැතිවරණ සහ මාධ්‍ය" බලන්න, යුනෙස්කෝ ලෝක ප්‍රවණතා වාර්තාව: (https://unesdoc.unesco.org/ ark:/48223/ pf0000371486)
- සාවද්‍ය තොරතුරු සහ ආර්ථිකය.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් විසින් පහත හැකියාවන් ලබා ගනු ඇත.

- ප්‍රවෘත්ති මාධ්‍ය ආයතන පිළිබඳ මහජන විශ්වාසයට සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරුවල බලපෑම විශ්ලේෂණය කිරීම
- සෞඛ්‍ය සෙවීමේ හැසිරීම්වලට සහ විශේෂයෙන්ම දෙමාපියන්ගේ සහ යෞවනයන්ගේ පුරුදුවලට දුස්තොරතුරු වසංගතය (disinfodemic) බලපා ඇති ආකාරය විස්තර කිරීම
- මැතිවරණ ඇතුළු පාලනයෙහිලා පුරවැසියන්ගේ සහභාගීත්වයට දුස්තොරතුරු තාක්ෂණයන් බලපා ඇති ආකාරය විස්තර කිරීම
- විවිධ ආකාරයේ සාවද්‍ය තොරතුරු ආර්ථිකයට බලපාන ආකාරය පැහැදිලි කිරීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ පවතී. කරුණාකර 1 කොටසෙහි ලැයිස්තුව සමාලෝචනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ. වෙනත් සහ ඒ පිළිබඳ වඩාත් සවිස්තරාත්මක මග පෙන්වීම සඳහා 1 කොටස බලන්න.

- සිද්ධි අධ්‍යයනය/අසත්‍ය සහ නොමග යවනසුලු අන්තර්ගතයේ පොදු ආකෘතිවල සිද්ධි උදාහරණ
- ගැටලු-විමසුම් ප්‍රවේශය
- පර්යේෂණ
- සම්පාදනය
- අන්තර්ගත/සන්දර්භීය විශ්ලේෂණය

- පන්තිය යුගල හෝ කුඩා කණ්ඩායම්වලට බෙදන්න. පුද්ගලයන්ගේ විශේෂයෙන් දෙමාපියන්ගේ සෞඛ්‍ය සෙවීමේ හැසිරීම් සහ සෞඛ්‍ය පුරුදු ප්‍රධාන වශයෙන් කඩඉෆ19 වසංගත වැළැක්වීම, ප්‍රතිශක්තිකරණය (එන්නත්) සහ අනෙකුත් ප්‍රමුඛතා සෞඛ්‍ය ගැටලුවලට දුස්තොරතුරු වසංගතයෙහි බලපෑම පිළිබඳව මහජන සෞඛ්‍ය වෛද්‍යවරුන්/සේවකයන් සමග සම්මුඛ සාකච්ඡා කිරීමට සෑම යුගලයකටම හෝ කණ්ඩායමකටම පවසන්න. සෞඛ්‍ය ගැටලු සඳහා පොදු සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු සහ දුස්තොරතුරු වසංගතය පිළිබඳ කටයුතු කිරීමේ උපාය මාර්ග යන දෑ සම්මුඛ සාකච්ඡා මාතෘකා තුළ ඇතුළත් විය හැකි ය.
- ජාලගත දුස්තොරතුරුවල නිර්මාණ ශිල්පීන් පිළිබඳ කාර්ය සාරාංශය කියවන්න (http://newtontechfordev.com/wp-content/uploads/2018/02/Architects-of-Networked-Disinformation-Executive-Summary-Final.pdf බලන්න). දේශපාලකයන්ගේ න්‍යාය පත්‍රවලට පක්ෂව ජනතාවාදී හැඟීම් බලමුලු ගැන්වීම සඳහා "ජාලගත දුස්තොරතුරුවල නිර්මාණ ශිල්පීන්" භාවිතා කරන ඒත්තු ගැන්වීමේ සන්නිවේදන ශිල්පීය ක්‍රම පිළිබඳ රචනයක්/බ්ලොගයක් ලියන්න හෝ විලොගයක් නිර්මාණය කරන්න. ඔබේ රචනය/බ්ලොගය හෝ විලොගය තුළ දේශීය සන්දර්භය සමග සැසඳීම සඳහා ඔබට දේශීය විශේෂඥයන් සමග සම්මුඛ සාකච්ඡා කළ හැකි ය. (සටහන : සම්පූර්ණ වාර්තාව https://newtontechfordev.com/wp-content/uploads/2018/02/ARCHITECTS-OF-NETWORKED-DISINFORMATION-FULL-REPORT.pdf හි මාර්ගගතව ද ඇත.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන සඳහා ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, කියවීම්
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, විලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- ගවේෂණාත්මක කතාව/වාර්තාව.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- සාවද්‍ය තොරතුරු සහ තිරසර සංවර්ධන ඉලක්ක
- පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය
- සංජානන පක්ෂග්‍රාහී න්‍යායන්
- ප්‍රචාරණය සහ මහජන සම්බන්ධතාවල සත්‍යය.

5 වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ සාවද්‍ය තොරතුරු

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- කරුණු පරීක්ෂා කිරීම සහ වෙනත් මෙවලම්
- තොරතුරු අක්‍රමිකතාවලට මුහුණ දීමේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා
- සාවද්‍ය තොරතුරු හා කටයුතු කිරීමේ ආදර්ශ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා වැඩසටහන් සහ ව්‍යාපෘති.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් විසින් පහත හැකියාවන් ලබා ගනු ඇත.

- සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරුවලට එරෙහිව ක්‍රියා කිරීම සඳහා කරුණු පරීක්ෂා කිරීම සහ අදාළ ශිල්පීය ක්‍රම සහ මෙවලම් පවත්වන ආකාරය නිදර්ශනය කිරීම
- දැනුම, ආකල්ප සහ කුසලතා යන අකාරයෙන් දක්වා ඇති මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා නිශ්චිත කාර්ය සාධන දර්ශක බවට පරිවර්තනය කිරීම
- සාවද්‍ය තොරතුරු පිළිබඳ කටයුතු කිරීම සඳහා ක්‍රියාකාරී වැඩසටහනක්/ව්‍යාපෘතියක් සකස් කිරීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ පවතී. කරුණාකර 1 කොටසෙහි ලැයිස්තුව සමාලෝචනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ. වෙනත් සහ ඒ පිළිබඳ වඩාත් සවිස්තරාත්මක මග පෙන්වීම සඳහා 1 කොටස බලන්න.

- සිද්ධි අධ්‍යයනය/සිද්ධි උදාහරණ
- ගැටලු-විමසුම් ප්‍රවේශය
- පර්යේෂණ
- අන්තර්ගත/සන්දර්භීය විශ්ලේෂණය
- සම්පාදනය.

කරුණු පරීක්ෂා කිරීම පිළිබඳ කණ්ඩායම් අභ්‍යාස: ඉගෙනුම් පරිසරය තුළ රජයේ නිලධරයකුගේ කථාවක් හෝ ප්‍රකාශයක් විශ්ලේෂණය කරන්න. කථාවෙන් හෝ ප්‍රකාශයෙන් උපුටා දැක්වීම් සඳහන් කරන්න. එක් එක් උද්ධෘතයක්ම කරුණු පරීක්ෂා කළ හැකි ප්‍රකාශයක් ද නැතහොත් මතයක් පමණක් දැයි ඉගෙන ගන්නන්ගෙන් විමසන්න. මෙම ප්‍රකාශය සත්‍යාපනය කළ හැකි ද?/සත්‍ය පරීක්ෂා කළ හැකි ද? ඇයි හෝ නොහැකි ඇයි? ප්‍රකාශය සත්‍යාපනය කළ හැකි නම්/සත්‍ය පරීක්ෂා කළ හැකි නම්, ඔබ එය කරන්නේ කෙසේ ද? ඊළඟට, ප්‍රකාශයේ සත්‍ය පරීක්ෂා කිරීමේ සත්‍ය ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන ලෙස ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටින්න. පියවරෙන් පියවර ක්‍රියාවලිය ලේඛනගත කිරීමට ඔවුන්ට උපදෙස් දෙන්න, ඉන්පසු ඔවුන් පර්යේෂණ කරන ආකාරය සාකච්ඡා කර විචාරන්න.

සාකච්ඡාව පෝෂණය කිරීම සඳහා, මෙම අන්තර්ගතය පුරවැසියන්ට බලපෑවේ කෙසේද? ව්‍යාජ ප්‍රකාශවල බලපෑම්/ප්‍රතිවිපාක සාකච්ඡා කිරීමට වඩාකිව යුත්තේ කවු ද? අසත්‍ය ප්‍රකාශවල ඵලවිපාක/ප්‍රතිවිපාක සාකච්ඡා කිරීමට යමක් කරන්නේ ද? යන ව්‍යාජ ප්‍රකාශවල ගම්‍යාර්ථ විශ්ලේෂණය කරන්න.

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන සඳහා ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, කියවීම්, ශ්‍රව්‍ය දෘශ්‍ය නැරඹුම්
- තොරතුරු-අධ්‍යාපන-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, ඉන්ෆෝග්‍රැෆික්, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- පර්යේෂණ පත්‍රිකාව
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- ගවේෂණාත්මක කතාව/වාර්තාව.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- ව්‍යාජ පුවත් සහ මාර්ගගත දුස්තොරතුරු පිළිබඳ යුරෝපීය කොමිසමේ ඉහළ මට්ටමේ විශේෂඥ කණ්ඩායමේ (HLEG) නිර්දේශ[58]

මෙම මොඩියුලය සඳහා සම්පත් සහ යොමු

Article 19. (2015). Hate Speech Explained https://www.article19.org/resources/hate-speech-explained-a-toolkit/

Balancing Act: Countering Digital Disinformation While Respecting Freedom of Expression. Broadband Commission for Sustainable Development, International Telecommunications Union, and UNESCO (2020).

https://www.broadbandcommission.org/Documents/working-groups/FoE_Disinfo_Report.pdf

Bradshaw, Samantha and P. Howard. (2019). Global Disinformation Order 2019. Global Inventory of Organized Social Media Manipulation. Working Paper 2019. 2, Oxford UK Project on Computational Propaganda.

Cyberbully (film, 2011) https://www.imdb.com/title/tt1930315/?ref_=nv_sr_srsg_0

David, Marian. (2004). Theories of Truth in Handbook of Epistemology edited by Ilkka Niiniluoto, Matti Sintonen and Jan Woleński. Springer Science+Business Media Dodrecht.

European Commission Directorate -General for Communication Networks, Content and Technology. (2018). A multi-dimensional approach to disinformation. Report of the independent High-Level Group on fake news and online disinformation. Belgium: European Union.

Ireton, C. & Posetti, J. (2018). *Journalism, 'fake news' & disinformation: Handbook for journalism education and training*. Paris: UNESCO.

58. EC Directorate -General for Communication Networks, Content and Technology. (2018). A multi- dimensional approach to disinformation. Report of the independent High-Level Group on fake news and online disinformation. Belgium: European Union.

Jackson. Dean. 17 October 2017. Issue Brief: Distinguishing Disinformation from Propaganda, Misinformation, and “Fake News.”

Kovach, Bill and Tom Rosenstiel. (2014). The Elements of Journalism. What Newspeople Should Know and the Public Should Expect (Revised and Updated). New York: Three Rivers Press.

Learning English. (2018, May 22). *News literacy lesson 2: Verification, independence, accountability*. Retrieved from https://learningenglish.voanews.com/a/news-literacy-lesson-2-verification-independence-accountability/4388049.html

Levitin, D. J. (2017). *Weaponized lies: How to think critically in the post-truth era*. New York, NY: Dutton.

Nery, J. (2019). “Democratic decay and disinformation in the digital age,” Friedrich Nauman Foundation for Freedom, 1-36. Retrieved from https://asia.fnst.org/sites/default/files/uploads/2019/04/26/democracydecayanddisinformationinthedigitalage.pdf.

Ong, Jonathan Corpus and Jason A. Cabanes (2017). Architects of Networked Disinformation, Newton Tech4Dev Network

http://newtontechfordev.com/wp-content/uploads/2018/02/ARCHITECTS-OF-NETWORKED-DISINFORMATION-FULL-REPORT.pdf

Ordway, D. (2020). “Rated false”: Here’s the most interesting new research on fake news and fact checking. Retrieved from https://www.niemanlab.org/2020/01/rated-false-heres-the-most-interesting-new-research-on-fake-news-and-fact-checking/?fbclid=IwAR2K6OPYxCwpU0m5IRkXJnoYPjww7u8h_UiHCZMoYOAk3ljiLTZIyb3wns

Silverman, Craig. (2020) Verification Handbook for Disinformation and Media Manipulation. European Journalism Centre. Retrieved from

https://s3.eu-central-1.amazonaws.com/datajournalismcom/handbooks/Verification-Handbook-3.pdf

Silverman, Craig. (2014) Verification Handbook for Investigative Reporting. European Journalism Centre. Retrieved from http://verificationhandbook.com/downloads/verification.handbook.2.pdf

UNESCO Think Before Clicking, Think Before Sharing https://en.unesco.org/covid19/communicationinformationresponse/visualresources

UNESCO #ThinkingBeforeSharing, https://en.unesco.org/themes/gced/thinkbeforesharing

Zuboff, S. (2019). The Age of Surveillance Capitalism: The Fight for a Human Future at the New Frontier of Power. New York: Public Affairs (see also YouTube videos).

5 වන මොඩියුලය

පුරවැසියන් වන ග්‍රාහක පිරිස



පසුබිම සහ තාර්කිකය

අප සියලු දෙනාහටම මාර්ගගත හෝ මාර්ග අපගත අන්තර්ගතවල ග්‍රාහක පිරිස් වශයෙන් අත්දැකීම් තිබේ. වැඩි වශයෙන්ම මෙය සිදුවන්නේ සමාජ මාධ්‍ය මෙන්ම ජංගම දුරකථන සහ යෙදවුම් ආදි ඩිජිටල් තාක්ෂණයෙන් උත්තේජිත ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ මාර්ගගත ඩිජිටල් ව්‍යවසායකයන් හරහා ය. බොහෝ ප්‍රදේශවල දරුවෝ මෙන්ම වැඩිහිටියෝ ද දිනපතා තම දවසින් සැලකිය යුතු කාලයක් මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන ක්‍රියාකාරකම්වල නිරත වෙති. විසිවන සියවසයේ අවසන් භාගයේ දී පොදු උපකල්පනයක් වූයේ තෝරාගත් ග්‍රාහක පිරිසක් යනු කිසියම් පෙළක් හෝ කිසියම් මාධ්‍ය ආකෘතියක් එකම ආකාරයකට හෝ සමාන ආකාරයකින් අර්ථකථනය කරනු ලබන නිෂ්ක්‍රීය හෝ ග්‍රාහක පුද්ගලයන්ගෙන් සමන්විත සමජාතීය කණ්ඩායමක් විය හැකි බවයි. විශේෂයෙන්ම රූපවාහිනිය බිහි වූ මුල් අවධියේ දී, මෙය රූපවාහිනිය හා සම්බන්ධව නිතරම සිදු විය. එනම්, එහි සන්නිවේදනය පොදුවේ ප්‍රතිපෝෂණ ලූප් රාශියක් සහිත බහුමාන ස්වභාවයක නොවීය. වර්තමානයේ දී, අන්තර්ජාලය පදනම් වූ සන්දර්භය මගින් සන්නිවේදනය කරන ක්‍රම පමණක් නොව අප සන්නිවේදනය කරන්නෙ කවුරුන් සමග ද යන්න ද මහත් ලෙස සංකීර්ණ කොට තිබේ. මේ වන විට අප සමගාමීව පාරිභෝගිකයන් ලෙස (දත්ත මත පාදක වූ වෙළඳ දැන්වීම් සහ තෝරගත් අන්තර්ගත අයිතම සඳහා ඉලක්කගත වූවන් ද ඇතුළුව ඇතැම් විට "ඉලක්කගත ග්‍රාහක පිරිස්" යනුවෙන් ද හඳුන්වනු ලබන) මෙන්ම සක්‍රීය සහභාගීවන්නන් ලෙස ද සැලකිය හැකි අතර එයින් අදහස් වන්නේ අප අන්තර්ගතයේ සම්පාදකයන් මෙන්ම නිර්මාතෘවරුවන් ද වන බවයි.

ඉලක්කගත ග්‍රාහක පිරිස් යනු පාඨකයන්, නරඹන්නන් හෝ සවන්දෙන්නන් මෙන්ම වර්තමානය වන විට වැඩි වශයෙන් වයස, ජනවාර්ගික සංස්කෘතික පසුබිම, සමාජ ආර්ථික තත්ත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, අනන්‍යතාව හෝ අභිරුචිය ආදි නිශ්චිත ජනවිකාශ සහ වෙනත් ලක්ෂණ මගින් අර්ථකථනය වූ පරිශීලකයන්ගෙන් ද සමන්විත කණ්ඩායම් වේ. ඒවා විවිධ ක්‍රියාකාරීන් විසින් සන්දේශ නිර්මාණය කරන්නා වූ සහ හැඩගස්වනු ලබන්නා වූ නිශ්චිත කණ්ඩායම් විය හැකි ය. උදාහරණයක් ලෙස, සාම්ප්‍රදායිකව, දැන්වීම්කරුවන් විසින් තමන්හට නිශ්චිත ජනවිකාශ හෝ ඉලක්කගත ග්‍රාහක පිරිසකට ප්‍රවේශය ලබා දෙන කාලයක් හෝ අවකාශයක් මිලදී ගැනීම ගැන සැල්කිල්ලක් දක්වනු ලැබේ. රූපවාහිනී ක්ෂේත්‍රය තුළ, කිසියම් වැඩසටහනක් වෙළඳ දැන්වීම්කරුවන්හට ළඟා වීමට අවශ්‍ය ග්‍රාහකයන් ආකර්ෂණය කරන්නේ නම්, ඔවුන් එම වැඩසටහනේ ධාවන කාලය තුළ එම ජාලයෙන් වාණිජ කාල පරාසයන් මිලදී ගනු ඇත. බොහෝ වැඩසටහන් ආරම්භයේ සිටම සැලසුම් කරනු ලබන්නේ වෙළඳ ප්‍රචාරණ වර්ග ආකර්ෂණය කර ගැනීම සඳහා ය. වර්තමානයේ දී, විශේෂයෙන්ම නව මාධ්‍ය සහ සමාජ මාධ්‍ය සන්දර්භය තුළ, පරිශීලකයන් රහසිගතව හඳුනා ගැනීමට හෝ වෙන්කර හඳුනා ගැනීමට හැකි ඇල්ගොරිතම, ලුහුබැඳීමේ ක්‍රියාමාර්ග සහ ඩිජිටල් පියසටහන් පවතියි. ඒ අනුව, ග්‍රාහක පිරිසගේ ඉල්ලීමකින් තොරව හෝ ඔවුන්ගේ පරිභෝජනය හා සම්මිශ්‍රිත දැන්වීම් පිළිබඳව ඔවුන් නොදැනුවත්වම, ග්‍රාහක පිරිස් වෙත වෙළඳ දැන්වීම් සහ වෙනත් අන්තර්ගතයන් ඉදිරිපත් කිරීමට සූක්ෂම අලෙවිකරණ සැලසුම් සංවර්ධනය කළ හැකි ය. උදාහරණයක් ලෙස, කිසියම් ගමනාන්තයකට සංචාරය කිරීමට උනන්දුවක් ඇති අයෙකු වෙබ් බ්‍රවුසරයක් භාවිතයෙන් ඒ පිළිබඳ තොරතුරු සොයනු ඇති අතර, ඉන් අනතුරුව ඔවුන් භාවිත කරන සමාජ මාධ්‍ය හරහා සූක්ෂම ලෙස ඒ හා සම්බන්ධ වෙළඳ දැන්වීම් මතුවනු ඇත. ප්‍රවේශය, භාවිතය සහ ඉලක්කගත තොරතුරු සහ සන්දේශ සීඝ්‍රයෙන් සම්මිශ්‍රණය කළ හැකි ආකාරය මෙයින් පිළිඹිබු වෙයි. වෙළඳ ප්‍රචාරණය පිළිබඳ වැඩි විස්තර සඳහා මොඩියුල 10 බලන්න.

කෙසේ වුව ද, පුද්ගලයෝ හුදෙක් ග්‍රාහක පිරිස්ම නොව පුරවැසියෝ ද වෙති. අන්තර්ගත පරිභෝජනය හා සම්බන්ධව ඔවුන්ට ඇති වටිනාකම අත්‍යන්තයෙන් ඉක්මවා යන වටිනාකමක් පුද්ගලයන් සතු වේ. අප සන්දේශ සහ අන්තර්ක්‍රියා අර්ථකථනය කරන ආකාරය අපගේ සමාජ-මනෝවිද්‍යාත්මක සහ ජීවමාන අත්දැකීම් මෙන්ම අපගේ වටිනාකම්, ආකල්ප සහ චර්යාවලට ද අපගේ සංස්කෘතික, ආර්ථික, වාර්ගික සහ වෙනත් අනන්‍යතා යන සාධක සමග ද බැඳී තිබිය හැකි ය. සමාජ සම්බන්ධතාවලට

බාධා කළ හැකි සහ වීවා හීන කළ හැකි අසමානතා, බාධක, අවහිර සහ බෙදීම් තවමත් ලොව පුරා පැවතිය ද, භාෂාමය, භූගෝලීය, සංස්කෘතික සහ දේශපාලන සීමාවන් හරහා අන් අය සමග සම්බන්ධ වීමට සහ සන්නිවේදනය කිරීමට භව්‍යතා සහ ඉඩ ප්‍රස්තා ද අතිමහත් සංඛ්‍යාවක් ඇත. පරිසරය, සංක්‍රමණය, වර්ගවාදය, ගැටුම්, දරිද්‍රතාව සහ ආර්ථික ප්‍රතිපත්ති වැනි ජාතික සහ දේශීය අවශ්‍යතා ඉක්මවා යන බරපතල ගැටලු සමග වීකාබද්ධ වූ මෙම යථාර්ථය ගෝලීය පුරවැසිභාවයට සෘජුවම සම්බන්ධ වේ. මිනිසුන්ගේ සංචලතාවය වැඩි වීමත් සමග (ලියන අවස්ථාව වන විට COVID-19 අර්බුදයෙන් තර්ජනයට ලක්ව තිබේ), අන්තර්ජාලය පදනම් කරගත් සන්නිවේදනයන්ට ප්‍රවේශ සහ අදහස්, සංස්කෘතිය සහ අධ්‍යාපනය සංසරණය වීමත් සමග, දිගුකාලීන ගැටලුවලට මුහුණ දීම මෙන්ම විශේෂයෙන්ම ආන්තික කරනු ලැබූ කණ්ඩායම් සහ ආදිවාසී ජනතාව සඳහා සාමය, සමාජ සමානාත්මතාව සහ සංස්කෘතික පැවැත්ම උදෙසා පරිශ්‍රම දැරීම සඳහා ගෝලීය පුරවැසිභාවය වැඩි වැඩියෙන් අත්‍යවශ්‍ය වෙමින් පවතියි. ගෝලීය පුරවැසිභාවය සඳහා IDEAS (සහ Tlaia*Ei) සංවිධානයට අනුව:

ගෝලීය පුරවැසියෙකු යනු :

- පුළුල් ලෝකය ගැන දැනුවත් වූ ද ලෝක පුරවැසියෙකු ලෙස ඔවුන්ගේම භූමිකාව පිළිබඳ දැනීමක් ඇත්තා වූ ද
- විවිධත්වයට ගරු කරන්නා වූ සහ විවිධත්වය අගය කරන්නා වූ ද
- ලෝකය ක්‍රියා කරන ආකාරය ගැන අවබෝධයක් ඇත්තා වූ ද
- සමාජ අසාධාරණය පිළිබඳ කෝපයට පත් වන්නා වූ ද
- ප්‍රාදේශීය මට්ටමේ සිට ගෝලීය මට්ටම දක්වා තල ගණනාවක දී ප්‍රජා කටයුතුවල සහභාගී වන්නා වූ ද
- ලෝකය වඩාත් සාධාරණ සහ තිරසර ස්ථානයක් බවට පත් කිරීමට ක්‍රියා කිරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද
- ඔහුගේ/ඇයගේ ක්‍රියා සඳහා වගකීම භාර ගන්නා වූ ද පුද්ගලයෙකි.

යුනෙස්කෝව මෙම විෂයට ප්‍රවේශ වන්නේ මෙසේ ය: "පුරවැසිභාවයේ නිර්වචනය පිළිබඳව සාකච්ඡා පවතින අතර ගෝලීය පුරවැසිභාවය පිළිබඳ පුළුල් ලෙස එකඟ වූ නිර්වචනයක් නොමැත. ගෝලීය පුරවැසිභාවය සෑම අවස්ථාවකදීම නෛතික තත්ත්වයක නොපවතී. එයින් වැඩිමනක් ලෙස අර්ථවත් වන්නේ ගෝලීය ප්‍රජාවට අයත් වීමේ හැඟීමක් සහ මනුෂ්‍යත්වය පිළිබඳ පොදු හැඟීමක් ද සමග එහි අනුමිත සාමාජිකයන් එකිනෙකා අතර සහයෝගිතාව සහ සාමූහික අනන්‍යතාව අත්විඳිනු ලැබීම සහ ගෝලීය මට්ටමින් සාමූහික වගකීමක් දැරීමයි. ගෝලීය පුරවැසිභාවය විධිමත් සාමාජිකත්වයක් ලෙස නොව ආචාරධර්මයක් හෝ රූපකයක් ලෙස දැකිය හැකි ය. සාමූහික ක්‍රියාකාරකම් සඳහා රාමුවක් වන ගෝලීය පුරවැසිභාවය මගින් වඩාත් යහපත් ලෝකයක් සහ අනාගතයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා ක්‍රියාකාරකම් හරහා එහි සාමාජිකයන් අතර සහ ඔවුන් සඳහා ක්‍රියාකාරකම් සහ නියැලීම උත්පාදනය කළ හැකි අතර එසේ සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ[59]."

59. UNESCO. 2017. The ABCs of global citizenship education https://unesdoc.unesco.org/ark:/48223/pf0000248232.locale=en

ඵලදායී ගෝලීය පුරවැසියන් වීම සඳහා තරුණ පුද්ගලයන් මෙන්ම වැඩිහිටියන් ද සම ලෙස නම්‍යශීලී, නිර්මාණශීලී සහ ප්‍රගාමී විය යුතු ය. ඔවුන්ට ගැටලු විසඳීමට, තීරණ ගැනීමට, විචාරශීලීව සිතීමට, අදහස් සාර්ථක ලෙස සන්නිවේදනය කිරීමට මෙන්ම කණ්ඩායම් සහ සමූහ තුළ හොඳින් වැඩ කිරීමට හැකි විය යුතු ය. බොහෝ සේවා ස්ථාන ඇතුළුව 21 වන සියවසයේ ජීවිතය හා සබැඳි අනෙකුත් ක්ෂේත්‍රවල ද සාර්ථකත්වය ලබා ගැනීමට මෙම කුසලතා සහ ගුණාංග අත්‍යවශ්‍ය බව වැඩි වැඩියෙන් හඳුනාගෙන ඇත. සිසුන් අන් අය සමග සහයෝගයෙන් කටයුතු කරමින් ඉගෙන ගනු ලබන ක්‍රියාශීලි ඉගෙනුම් ක්‍රම භාවිත කිරීමකින් තොරව මෙම කුසලතා සහ ගුණාංග වර්ධනය කර ගත නොහැකි ය.

අධ්‍යාපනයට, විමෙන්ම මෙහි අපගේ අරමුණු සඳහා, ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනයට (GCED), මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා (MIL) සමීකරණය විශාල වශයෙන් අදාළ වේ. පහත දැක්වෙන පරිදි, MIL සහ GCED අතර පොදු අරමුණු කිහිපයක් ඇත.

මම මොඩියුලය තුළ ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් සාකච්ඡා කරනු ඇත:

1. අප විසින් අන්තර්ගතය, ආයතන සහ තාක්ෂණය යන සන්දර්භ තුළ ග්‍රාහක පිරිස් යන සංකල්පය සලකා බලන ආකාරය කෙරෙහි ගෝලීය පුරවැසිභාවය බලපාන්නේ කෙසේ ද?

2. ඕනෑම ස්වරූපයක පෙළක් අවබෝධ කර ගැනීමේ දී නිර්මාණකරුවෙකුගේ / කර්තෘවරයෙකුගේ පසුබිම සහ පළපුරුද්ද බලපාන්නේ කෙසේ ද?

3. සංස්කෘතික, අධ්‍යාපනික සහ අනන්‍යතා විචල්‍යයන් ඇතුළුව, අන්තර්ගතයක් අර්ථ නිරූපණය කරන ආකාරය හැඩගස්වනු ලබන, අනෙකුත් සාධක මොනවා ද?

4. මාර්ගෝපදේශ පෙළක් හෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ආකෘතියක් ගොඩනැගීම මගින් විචාරශීලී අර්ථකථන ක්‍රියාවලියක් ශක්තිමත් කළ හැක්කේ කෙසේ ද?

5. ග්‍රාහක පිරිස් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී සන්නිවේදන පරිසර පද්ධතිය භාවිතා කරන්නේ කෙසේද, සහ එහි බලපෑම කුමක් ද?

ඒකක:

1 වන ඒකකය
ගෝලීය පුරවැසිභාවය අවබෝධ කර ගැනීම

2 වන ඒකකය
ග්‍රාහක පිරිස්

3 වන ඒකකය
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව,
අන්තර්ගත සපයන්නන් සහ ප්‍රජා නියැලීම

4 වන ඒකකය
පුරවැසි-පාදක තොරතුරු සහ පුරවැසි
මාධ්‍යවේදය

1 වන ඒකකය : ගෝලීය පුරවැසිභාවය අවබෝධ කර ගැනීම

කාලසීමාව පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- සැබෑ ජීවිතයේ අභියෝග විශ්ලේෂණය කිරීම සහ ඒවා විසඳීම සඳහා අවශ්‍ය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා (MIL) නිපුණතා
- ගෝලීය පුරවැසිභාවයට අදාළව මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ ඇති වැදගත්කම
- ඉගෙනුම් අවකාශය තුළ සහ ඉන් පිටත බහුවිධ පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවක් සඳහා වන අවශ්‍යතාව
- අපගේ උපකල්පන, අත්දැකීම්, පසුබිම් සහ විශ්වාසයන් සහ ඒවා අපගේ ලෝක දෘෂ්ටියට බලපාන ආකාරය පිළිගැනීම
- තොරතුරු සහ සන්නිවේදනය ගෝලීයකරණය කිරීම මගින් ගෝලීය පුරවැසිභාවය මෙහෙය විය හැකි ආකාරය. මෙම මාතෘකාව පිළිබඳ වැඩි විස්තර සඳහා මොඩියුල 13 සහ 14 බලන්න.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසුව, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත.

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා (MIL) සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය (GCED) අතර ඇති සම්බන්ධය සහ ඉගෙනීමට එය අදාළ වන ආකාරය විස්තර කිරීම,
- ගෝලීය, ප්‍රාදේශීය, ජාතික සහ දේශීය ගැටලු සම්බන්ධයෙන් විචාරශීලීව සිතීම සහ ඒ සම්බන්ධයෙන් ගෞරවයෙන් හා ආචාරධර්ම සහිතව ක්‍රියා කිරීමේ වැදගත්කම අවබෝධ කර ගැනීම මෙන්ම විවිධ රටවල් සහ ජනගහනය අතර අන්තර් සම්බන්ධිතභාවය සහ අන්‍යෝන්‍ය පරායත්තභාවය හඳුනා ගැනීම,
- හවුල් වටිනාකම් සහ කාරකත්වය, සහකම්පනය, සහයෝගීතාව සහ වෙනස්කම්වලට හා විවිධත්වයට ගරු කිරීම සමග පොදු මනුෂ්‍යත්වයකට අයත් වීමේ ප්‍රතිලාභ ලැයිස්තුගත කිරීම.

ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය (GCED) සම්බන්ධව සමාලෝචනය

මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා (MIL) විෂයමාලාවෙන් ආවරණය වන සියලුම අංශ පාහේ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය (GCED) හා සම්බන්ධ වේ. යුනෙස්කෝව විසින් ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය (GCED) සම්බන්ධයෙන් බොහෝ ඉගැන්වීම් සහ ඇගයීම් සම්පත් නිර්මාණය කර ඇත. මේවායින් බොහොමයක් පහත සඳහන් "සම්පත්" අංශය යටතේ ලැයිස්තුගත කර ඇත. එබැවින්, මෙම ඒකකයේ අවධානය යොමු වන්නේ, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය (GCED) හා සම්බන්ධ වන ආකාරය පිළිබඳව පරිශීලකයන්ට අවබෝධයක් ලබා දීම, සහ යුනෙස්කෝව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සතු ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය (GCED) හා සම්බන්ධ සම්පත් වෙත ඔවුන් යොමු කිරීමයි.

යුනෙස්කෝව විසින් ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය (GCED) පහත පරිදි නිර්වචනය කර ඇත:

ශිෂ්‍යයන්ට වඩාත් අන්තර්කරණීය, සාධාරණ සහ සාමකාමී ලෝකයකට දායක වීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා, සාරධර්ම සහ ආකල්ප ගොඩනගමින් පරිණාමනීය බවට පත්වීම ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනයේ අරමුණ වේ. ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය මානව හිමිකම් අධ්‍යාපනය, සාම අධ්‍යාපනය, තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය සහ ජාත්‍යන්තර අවබෝධතා සඳහා අධ්‍යාපනය ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවල දැනටමත් යෙදී ඇති සංකල්ප සහ ක්‍රමවේදයන් භාවිත කරමින් බහුවිධ ප්‍රවේශයකී යොදා ගනිමින් ඒවායෙහි පොදු අරමුණු ඉදිරියට ගෙන යාමට අරමුණු කරයි. ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය මුල් ළමාවියේ සිට ආරම්භ වී සියලුම අධ්‍යාපන මට්ටම් හරහා සහ වැඩිහිටිභාවය දක්වා අඛණ්ඩව සිදුවන, විධිමත් සහ අවිධිමත් ප්‍රවේශයන් ද විෂයමාලා සහ විෂය බාහිර මැදිහත්වීම් ද සහභාගීත්වය සඳහා සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන මාර්ග ද අවශ්‍ය වන යාවජීව ඉගෙනුම් පර්යාලෝකයක් භාවිත කරයි.[60]

අප "ග්‍රාහක පිරිස්" පිළිබඳ සලකා බලන විට, ගෝලීය පුරවැසිභාවය යන සන්දර්භය තුළ ද සිතිය යුතු ය. ග්‍රාහකයන් පමණක් නොව, අන්තර්ගත සම්පාදකයන් සහ බෙදාහරින්නන් ලෙස ද පහසුවෙන් සෑදිය හැකි සහ දැනුවත් කළ හැකි, අපසාරී, අතිච්ඡාදනය වන මහජනතාවක් සහ "කුඩා මහජනතාවක්" (mini-public) සිටින බැවින් ග්‍රාහක පිරිස් තනි තනිව හුදෙකලා වූ කොට්ඨාසයක් ලෙස නොදැකීම වැදගත් වේ. ප්‍රධාන ධාරාවේ සහ නිල මාධ්‍ය ආයතන, තවමත් වැදගත් වුවද, ඒවාට අභියෝග කිරීමට, ඒවා හැඩ ගැස්වීමට සහ අප්‍රකට කිරීමට හැකි විකල්ප අන්තර්ගත සපයන්නන්, ජාල, යෙදුම් සහ පද්ධති රාශියකින් දැන් පවතියි. කිසියම් නිශ්චිත වේලාවක් තුළ අන්තර්ගත කියවන්නේ, බලන්නේ, සවන් දෙන්නේ කවුරුන් ද යන්න පිළිබඳ අපට නිසැකවම අදහසක් නොමැති විය හැකි ය. මෙය වැදගත් වන්නේ අපගේ ඇතැම් සන්දේශ, වීඩියෝ, පොඩ්කාස්ට්, ප්‍රකාශ, අනුරූප යනාදිය "වෛරල්" (viral) වීමට හෝ ඒවා නොසලකා හරිනු ලැබීමට, හෝ ඒවා වැරදි ලෙස අර්ථකථනය කරනු ලැබීමට හෝ එසේ නොමැතිනම් නව සම්බන්ධතා ගොඩනගා ගත හැකි නව, මින් පෙර නොදත් ග්‍රාහක පිරිස් වෙත ළඟා වීමට හැකියාව ඇති බැවිනි. ඒවා මිශ්‍ර කිරීම, විවිධ සන්දර්භවලට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම සහ වෙනත් මූලිකාංග (උදා: විවිධ දෘශ්‍ය හෝ ශ්‍රව්‍ය අංශ) සමග මුසු කිරීම සිදු කළ හැකි ය. මෙම යථාර්ථයට ගම්‍යමාන කිහිපයක් තිබේ. එමගින් ඉහත සඳහන් කළ ගෝලීය පුරවැසිභාවයේ ප්‍රකාශිත අරමුණුවලට හානි පමුණුවීමට හෝ ඒවා ශක්තිමත් කිරීමට හැකි ය. මෙයින් අන්තර්ගත සම්පාදකයන් / සපයන්නන් සහ පාරිභෝගිකයන් සඳහා එක ලෙස ප්‍රතිවිපාක ඇති කරයි. මෙය පුළුල් අර්ථයකින් අන්තර්ගත නිෂ්පාදන භාවිතය, අර්ථකථනය සහ නියැලීම සම්බන්ධයෙන් මැදිහත් වීමට සිදු වන අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇති අභියෝගවලට අමතරව පවතින අභියෝගයකි. ඒ හා සමගම, තොරතුරු සහ සන්නිවේදන පරිසර පද්ධතිය තුළ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ සලකාබැලීම් විහිදී ඇත. විශේෂයෙන්ම තාරුණ්‍යය, ඔවුන් දකින, දායක වන සහ ඔවුන්ට උරුම වන ආකාරයේ ලෝකය පිළිබඳව කල්පනාවේ නිමග්නව සිටියි.

ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව

යුනෙස්කෝව සහ ලොව පුරා බොහෝ පාර්ශ්වකරුවන් විසින් ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය පිළිබඳ සංකල්පය ප්‍රවර්ධනය කරනු ලැබේ. යුනෙස්කෝ රාමුවට අනුව, ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනයේ සුවිශේෂී මාන කිහිපයක් තිබේ. මෙම මොඩියුලය හැදින්වීමේ දී, සමාජ අධ්‍යාපනයේ සහ සමාජ චිත්තවේගීය අධ්‍යාපනයේ වැදගත්කම අපි අවධාරණය කළෙමු. ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය තුළ සමාජ අධ්‍යාපනයට සහ ක්‍රියාකාරී ඩිජිටල් පුරවැසියෙකු වීමට අදාළ වන ප්‍රධාන මූලිකාංග දෙකක් තිබේ. ගෝලීය පුරවැසි අධ්‍යාපනයේ අරමුණු පිළිබඳ සවිස්තර ලැයිස්තුවක් වන Global citizenship education : Topics and learning objectives යුනෙස්කෝ මූලාශ්‍රය බලන්න: https://unesdoc.unesco.org/ark:/48223/pf0000232993

60. Global citizenship education: topics and learning objectives (UNESCO, 2015). https://unesdoc.unesco.org/ark:/48223/pf0000232993

පහත 5.1 වගුව මෙම සම්බන්ධතාව සහ නිර්මාණාත්මක ඉගෙනීම සඳහා සමාජ මාධ්‍ය භාවිතා කළ හැකි ආකාරය ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනයේ අරමුණු හා සම්බන්ධ යෝජිත ක්‍රියාකාරකම් ද සහිතව නිදර්ශනය කරයි.

ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනයේ අභිප්‍රාය[61]	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ අභිප්‍රාය	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය සම්බන්ධ කිරීමේ අභිප්‍රාය	ක්‍රියාකාරකම්: නිර්මාණශීලී ලෙස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා අධ්‍යාපනය සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීම
සැබෑ ජීවිතයේ ගැටලු විචාරශීලීව විශ්ලේෂණය කිරීමට සහ හැකි විසඳුම් නිර්මාණාත්මක ලෙස සහ නව්‍ය ලෙස හඳුනා ගැනීමට ශිෂ්‍යයන් දිරිමත් කිරීම.	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) යනු විවිධ තාක්ෂණික වේදිකාවල තනි පුද්ගල හෝ ආයතනික අන්තර්ගත සපයන්නන් විසින් පෙන්වා දෙනු ලබන සහ ඇතැම් විට ප්‍රසාරණය කරනු ලබන සැබෑ ජීවිතයේ ගැටලු විචාරශීලීව විශ්ලේෂණය කිරීමට සහ ඒවා පිළිබඳ කටයුතු කිරීමට නිපුණතා ලබා ගැනීමයි.	පුද්ගලයන්ගේ විචාරශීලී චින්තනය උත්තේජනය කිරීමේ එක් මාර්ගයක් වන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) අන්තර් සංස්කෘතික නිපුණතා හෝ සංස්කෘතික සාක්ෂරතාව වැනි අනෙකුත් සමාජ නිපුණතා සමග ඒකාබද්ධ වූ විට වැඩි බලපෑමක් පවතියි.	සමාජ මාධ්‍ය යනු අප රටෙහි හෝ ලෝකයේ සිදු වන සාකච්ඡා හෝ ගැටලු ගවේෂණය කිරීමට, ඇගයීමට සහ විශ්ලේෂණය කිරීමට අපට ඉඩ සලසන ඇල්ගොරිදම් හා අනුකූලව සංවිධානය කරන ලද, වාණිජමය වශයෙන් මෙහෙයවනු ලබන සම්පත් වේ. සමාජ මාධ්‍යවලට මාර්ගගත මහජන චතුරශ්‍ර පණගැන්විය හැකි අතර, බණ්ඩනය වූ ප්‍රජාවන් ද බලගැන්විය හැකි ය. ශික්ෂකයන්ට සහ ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ඉගෙනුම් අරමුණු සඳහා ඔවුන් විශේෂිත උනන්දුවක් දක්වන තේමාවන් හෝ මාතෘකා හඳුනා ගත හැකි ය. ඉන් අනතුරුව, එකී මාතෘකාව පිළිබඳ සමාජ මාධ්‍යවල සිදුවන විවාදයේ අංග ඔවුන්ට විචාරශීලීව විශ්ලේෂණය කර සාකච්ඡා කළ හැකි ය - සාකච්ඡාවේ සන්දර්භය, නියමුවන්, ගැටලු හෝ පර්යාලෝක; වඩා ප්‍රමුඛ ආඛ්‍යානය කුමක් ද, විවාදයට සියලුම ක්‍රියාකාරීන්ට සමාන ප්‍රවේශයක් තිබේ ද, එයින් සියලු දෙනා නියෝජනය වෙයි ද, මෙය ප්‍රතිපත්ති සැකසීමට බලපාන්නේ කෙසේ ද? පුද්ගලයන්ට සැබෑ ලෝකයේ විවාද අධ්‍යනය කිරීමට ඉඩ සලසන විචාරශීලී චින්තන ක්‍රියාකාරකම් සැලසුම් කළ හැකි විවිධ ක්‍රම තිබේ. තම පර්යේෂණ ශිල්පීය ක්‍රම ප්‍රගුණ කළ හැකි ආකාරය සහ සමාජ මාධ්‍යවල බහු මූලාශ්‍ර හරහා තොරතුරු සත්‍යාපනය කළ හැකි ආකාරය ශිෂ්‍යයන්ට ඉගැන්වීම සඳහා ශික්ෂකයන්ට ක්‍රියාකාරකම් නිර්මාණය කළ හැකි ය. මෙම මූලාශ්‍ර හරස්-යොමු (cross-reference) කළ හැකි අතර විශ්වාසදායක ප්‍රවෘත්ති වෙබ් අඩවි හෝ වාර්තාකරුවන් වැනි වෙනත් විශ්වාසදායක තොරතුරු මූලාශ්‍ර සමග කරුණු පරීක්ෂා කළ හැකි ය. (වැඩිදුර උදාහරණ සඳහා පහත 2 වන ඒකකයෙහි ක්‍රියාකාරකම් සහිත කොටස බලන්න).
ප්‍රධාන ධාරාවේ කතිකාවල උපකල්පන, ලෝක දෘෂ්ටිය සහ බල සම්බන්ධතා පිළිබඳ නැවත පිරික්සීමට සහ අඩුවෙන් නියෝජනය වන/ නොවැදගත් කොට සලකනු ලබන පුද්ගලයන්/ කණ්ඩායම් පිළිබඳ සලකා බැලීමට ශිෂ්‍යයන්ට සහාය වීම.	අන්තර්ගත සපයන්නන් තම බලය තහවුරු කරගන්නා ආකාරය, යම් අන්තර්ගතයකට මූලිකත්වය ලබා දෙන ආකාරය හෝ විවිධත්වයෙන් යුත් මත සහ ප්‍රකාශනයේ අයිතිය, යථාර්ථය, තොරතුරු, දේශපාලනය, සමාජ කණ්ඩායම්, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය ආදිය නියෝජනය කරන ආකාරය පිළිබඳව විචාරශීලීව ඇගයීමට පුද්ගලයන්ට හැකියාව ලබා දීම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි (MIL) වැදගත්ම කොටසක් වන්නේ ය. අන්තර්ගත සපයන්නන් විසින් පුද්ගලයන්ගේ අයිතීන් අපයෝජනයට අනුබල දීමක් හෝ ඉඩ දීමක් හෝ අයිතීන් අපයෝජනය කිරීමක් සිදු කරන්නේ ද යන්න තක්සේරු කිරීම ද මෙම අවබෝධයට ඇතුළත් වේ. "ස්වයං කළමනාකරණය මෙන්ම නියැලීම[62]" යන්නෙන් ෆ්‍රෑමෙයිග ්ස් (2013) අදහස් කරනු ලබන පුද්ගලයාගේ භූමිකාව හා මෙය සම්බන්ධ වේ. (පිටුව 183 හි පෙර සඳහන් ස්ථානයෙහිම දක්වා ඇත).	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) යනු ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීමේ මාර්ගය මෙන්ම ගමනාන්තය ද වෙයි.	ඉහත උදාහරණ බලන්න. (වැඩිදුර උදාහරණ සඳහා පහත 2වන ඒකකයෙහි ක්‍රියාකාරකම් සහිත කොටස බලන්න)

අපේක්ෂිත වෙනස්කම් ගෙන ඒම සඳහා තනි පුද්ගල සහ සාමූහික ක්‍රියාවල නිරත වීම කෙරෙහි අවධානය යොමු කිරීම.	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) පුද්ගලයන්ට තම සමාජ ව්‍යූහ සහ පරිසර සලකා බැලීමට ඉඩ සලසයි. ධනාත්මක බලපෑම්, වෙනස්කම්, වාද විවාද හෝ අපේක්ෂිත ඉලක්ක කරා ගෙන යා හැකි ක්‍රියාමාර්ග ගනිමින් ඔවුන්ගේ සන්නිවේදන පරිසර පද්ධතිය තුළ තනි තනිව, සහයෝගීව සහ ස්වායත්තව ක්‍රියා කිරීමට, එය ඔවුන්ට බලය ලබා දෙයි.	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) යනු ප්‍රජා නියැලීමේ ස්වරූපයකි.	ඉහත පරිදි, එක් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් සමාජ කතිකා තුළ හෝ පොදුගලික අංශයේ හෝ රාජ්‍ය ප්‍රතිපත්ති තුළ වෙනස්කම් ඇති කළේ කෙසේ දැයි ශිෂ්‍යයන් සමග ගවේෂණය කිරීම සඳහා ශික්ෂකයන්හට එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක වටා ක්‍රියාකාරකම් නිර්මාණය කළ හැකි ය. මෙම ආකාරයේ ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී, සාර්ථක වූ සහ සාර්ථක නොවූ ව්‍යාපාර හෝ ක්‍රියා සම ලෙස නිසැකවම යොදා ගන්න - ඒවා එසේ සිදුවූයේ මන්දැයි ගවේෂණය කරන්න.
ඉගෙනුම් පරිසරයෙන් පිටත සිටින පුද්ගලයන් ඇතුළුව ප්‍රජාව සහ පුළුල් සමාජය තුළ සිටින බහු පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීම.	පන්ති කාමරයේ ඉගෙනීම සහ පන්ති කාමරයෙන් පිටත සිදු වන ඉගෙනීම යන අංශ දෙකෙහිම විහිදෙන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL), එම දෙඅංශයට එකිනෙකා පොහොසත් කිරීමේ අවස්ථාව ලබා දෙයි.	විධිමත් ඉගෙනුම් පරිසර තුළ අන්තර්ගතය, ආයතන සහ පාර්ශ්වකරුවන් අතර තිරණාත්මක සම්බන්ධතා ඇති කර ගැනීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) අවස්ථාව ලබා දෙයි.	සමාජ මාධ්‍ය පන්ති කාමරයෙන් පිටත මෙන්ම පන්ති කාමරය තුළ ද ඉගෙනීමට භාවිත කළ හැකි මෙවලම් වේ. ශික්ෂකයන්ට පන්ති කාමරයෙන් පිටත පුද්ගලයන්ගේ /පුරවැසියන්ගේ ඉගෙනුම් අත්දැකීම් උකහා ගන්නා ක්‍රියාකාරකම් සැලසුම් කළ හැකි අතර ඒවා විධිමත් ඉගෙනුම් පරිසරවලට ඒකාබද්ධ කළ හැකි ය. මෙම සන්දර්භය තුළ, ඉගෙනීම කිනම් අංගවලින් සමන්විත වුණි ද, ඉගෙනීමට හේතු වූ අන්තර්ගත මොනවාද, උදාහරණයක් ලෙස අන්තර්ජාලයෙන් ඉගෙන ගත් දේ සහ යථාර්ථය අතර පරස්පරතාවයක් තිබේද; අන්තර්ගතයට බලපෑම් කළේ කුමන පාර්ශ්වකරුවන් ද, කුමන අරමුණක් සඳහා ද, එමෙන්ම ඔවුන්ගේ ආදානවල ප්‍රතිඵලයක් ලෙස ඉගෙනීමට ප්‍රතිලාභ ලැබුණේ ද නැද්ද යන්න ගවේෂණය කරන්න (වැඩිදුර උදාහරණ සඳහා පහත 2 වන ඒකකයේ ක්‍රියාකාරකම් සහිත කොටස බලන්න).

61. UNESCO (2014) Global Citizenship Education Preparing learners for the challenges of the twenty-first century. UNESCO, Paris, France, https://unesdoc.unesco.org/ark:/48223/pf0000227729?posInSet=1&queryId=36c-ccc9a-72ad-4fae-86f8.

62. Frau-Meigs 2013, p. 183 in Carlsson and Culver (2013), Media and Information Literacy and Intercultural Dialogue. Yearbook 2013, The International Clearinghouse on Children, Youth and Media, Nordicom, University of Gothenburg, Sweden.

ඇගයීම් සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන සඳහා ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් කටයුතුවලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපන-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය කිරීම (උදා. පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්ථාර (infographics), සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්)
- පර්යේෂණ පත්‍රිකා
- ගවේෂණාත්මක කථාව / වාර්තා

2 වන ඒකකය : ග්‍රාහක පිරිස් : ජාතික සහ ගෝලීය සන්දර්භය

කාලසීමාව : පැය 4 යි

ප්‍රධාන මාතෘකා

- ග්‍රාහක පිරිස් වර්ධනය කිරීම සහ ඉලක්ක කිරීම
- ග්‍රාහක පිරිස් විසින් අර්ථය කතිකා කරගනු ලබන ආකාරය
- ගෝලීය පුරවැසිභාවය පිළිබඳ සංකල්පය ග්‍රාහක පිරිස්වලට බලපාන ආකාරය
- මාධ්‍ය භාවිත කරන්නන් සක්‍රීය පාරිභෝගිකයන් මෙන්ම සම්පාදකයන් සහ පරිශීලකයන් ලෙස ද සලකනු ලබන ආකාරය

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසුව, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත.

- තනි පුද්ගලයන් සහ ග්‍රාහක පිරිස් අන්තර්ගතය වෙනස් අයුරින් අර්ථකථනය කරන ආකාරය කෙරෙහි බලපාන සාධක ඇතුළුව ග්‍රාහක පිරිස් නම් වූ සංකල්පය ගවේෂණය කිරීම.
- ග්‍රාහක පිරිස් හඳුනාගන්නා සහ ඉලක්ක කරනා ආකාරය සවිස්තරාත්මකව සහ ගම්‍ය ලෙස විශ්ලේෂණය කිරීම.
- නිශ්චිත වර්ගවල තොරතුරු, මුද්‍රිත මාධ්‍ය ආදිය පරිභෝජනය කිරීමට සහ ඒ හා අන්තර්ක්‍රියා කිරීමට ග්‍රාහක පිරිස් තෝරා ගන්නා ආකාරය සහ මෙය අඛණ්ඩව වෙනස් වන තත්ත්වයක් වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කිරීම.
- තොරතුරු, මුද්‍රිත මාධ්‍ය සහ ඩිජිටල් කෘතිවලට ග්‍රාහක පිරිස් ප්‍රතිචාර දක්වන ආකාරය විශ්ලේෂණය කිරීම සහ විශේෂයෙන්ම ගෝලීය පුරවැසිභාවය යන සන්දර්භය තුළ එහි තීරණාත්මක සාධක පැහැදිලි කිරීම.
- සම්පාදනය, සන්දේශය, නියැලීම සහ ග්‍රාහක පිරිස් අතර පවතින ගතික, අන්තර් සම්බන්ධිත සහ විභවීය පරිණාමන සම්බන්ධතා පරීක්ෂා කිරීම.

ග්‍රාහක පිරිස් සහ ව්‍යාවර්තනය

පෙළ (අනුරූප, වීඩියෝ සහ ඉලෙක්ට්‍රොනික ක්‍රීඩා වැනි අන්තර්ක්‍රියාකාරී මාධ්‍ය ඇතුළුව) මගින් ලබා දෙන අර්ථය කතිකා කරගැනීමේ දී, සාමාන්‍යයෙන්, සම්පාදන සහ ග්‍රාහක පිරිස් යන අර්ථකථන මට්ටම්වල දී සාධක ගණනාවක් මගින් බලපෑම් කළ හැකි ය. ග්‍රාහක පිරිස කවුරුන් ද යන්න මත පදනම්ව එකම අන්තර්ගතය බොහෝ දුරට වෙනස් ලෙස තේරුම් ගනු ලැබිය හැකි ය. නිදසුනක් වශයෙන්, ගැහැණු ළමයින් මාධ්‍යවල පෙනී සිටීම හෝ නොසිටීම හෝ මගින් ප්‍රතිග්‍රාහකයන් වෙත පැහැදිලි සහ ව්‍යංග සන්දේශ සහ අර්ථයන් යැවිය හැකි ය. අපගේ සැබෑ ජීවිතයේ අත්දැකීම් හේතුවෙන් අප සියල්ලන්ටම නැඹුරුතා ඇති බැවින්, පුද්ගලයන් ඔවුන් දකින දෙයින් අර්ථය උපකල්පනය කරන ආකාරයෙහි කිසිදු මධ්‍යස්ථභාවයක් නොමැත. නිදසුනක් වශයෙන්, මෙම ප්‍රශ්නය උදාහරණයක් ලෙස සලකන්න: කිසියම් ආඛ්‍යානයක් හෝ කතිකා සමූහයක් තුළ වර්ගවාදී හෝ වෙනස් කොට සැලකීමක් ලෙස සලකන්නේ කුමක් ද? අදහස් විමසන්නේ කාගෙන් ද යන්න මත පදනම්ව පිළිතුර පුළුල් ලෙස වෙනස් විය හැකි ය. පුද්ගලයන්ට අනුකම්පාව සහ අවබෝධය වර්ධනය කර ගැනීමටත්, සහයෝගීතාවෙන් එක්ව සමගි සන්ධාන ඇති කර ගැනීමටත් සමාජ මාධ්‍ය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන නමුදු වෙනස් කොට සැලකීම්, ඒකාකෘතික කිරීම් සහ ආන්තිකකරණය පෝෂණය කළ හැකි විවර සහ අවකාශය ද සමාජ මාධ්‍යවලට සැපයිය හැකි ය.

ෆන්ක්, කෙල්නර් සහ ෂෙයාර් (2016) විසින් විචාරක මාධ්‍ය සාක්ෂරතාව (CML) පිළිබඳ ඔවුන්ගේ රාමුව තුළ ග්‍රාහක පිරිසෙහි මානයන් සහ අනෙකුත් ප්‍රධාන ප්‍රශ්න ඉස්මතු කර ඇත. අපට පුළුල් අර්ථයක් ලබා ගැනීම සඳහා එය විචාරාත්මක මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යනුවෙන් සැලකිය හැකි අතර පහත වගුවේ ඔවුන්ගේ අදහස් උපයෝජනය කළ හැකි ය.

CML **ප්‍රශ්න**	CML **සංකල්ප**
1. මෙම පෙළ නිර්මාණය කිරීමට උපකාරී වූ තෝරාගැනීම් සිදු කළා යැයි අනුමානය කළ හැකි සියලුම පුද්ගලයන් කවුරුන් ද?	සමාජ නිර්මාණවාදය: සියලුම තොරතුරු සමනිර්මාණය කර ඇත්තේ බලය සහ බලපෑම් යන සමාජ සන්දර්භයන් තුළ තෝරාගැනීම් සිදු කරන පුද්ගලයන් සහ/හෝ පුද්ගල කණ්ඩායම් විසිනි.
2. මෙම පෙළ ගොඩනැගීම සහ බෙදා හැරීම / පරිශීලනය කිරීම සිදු කළේ කෙසේ ද?	භාෂා / සංඥාර්ථවේදය : එක් එක් ආයතනික අන්තර්ගත සපයන්නන් විසින් දෘශ්‍ය සහ ශ්‍රව්‍ය ප්‍රභේද ඇතුළුව නිශ්චිත ව්‍යාකරණ සහ ශබ්දාර්ථ සහිතව භාෂාව භාවිත කරනු ලැබේ. මෙම මාතෘකාව පිළිබඳ වැඩි විස්තර සඳහා මොඩියුල 7 බලන්න.
3. මෙම පෙළ වෙනස් අයුරකින් තේරුම් ගත හැක්කේ කෙසේ ද?	ග්‍රාහක පිරිස / ස්ථානීයතාව: පුද්ගලයන් සහ කණ්ඩායම් විසින් බහුවිධ සන්දර්භීය සාධක මත පදනම්ව මාධ්‍ය සන්දේශ සමාන ලෙස සහ/හෝ වෙනස් ලෙස තේරුම් ගනු ලැබේ.
4. මෙම පෙළ මගින් නියෝජනය වන හෝ නියෝජනය නොවන හෝ සැපයුම්කරු විසින් බලපෑම් කරන ලද වටිනාකම්, දෘෂ්ටිකෝණ සහ මතවාද මොනවා ද?	නියෝජනය හා බැඳි දේශපාලනය: සන්දේශ සහ ඒවා ප්‍රවාහනය කරනු ලබන ආයතන සෑම විටම නැඹුරුතාවකින් යුක්ත වේ; එනම් ඔවුන් බලය, වරප්‍රසාද සහ සතුට යන ප්‍රමුඛ ධුරාවලියට සහාය සහ/හෝ අභියෝග කරයි.
5. මෙම පෙළ නිර්මාණය කරන ලද්දේ සහ/හෝ බෙදා හරිනු ලද්දේ කුමන හේතුවක් නිසා ද?	නිෂ්පාදනය කිරීම / ආයතන: සියලුම පෙළ සඳහා නිර්මාපකයන් සහ/හෝ ඒවා ක්‍රියාත්මක වන පද්ධති විසින් හැඩගස්වන ලද අරමුණක් (බොහෝ විට වාණිජ හෝ රාජ්‍යමය) ඇත.
6. මෙම පෙළ වාසියක් සහ/හෝ අවාසියක් වන්නෙ කවුරුන් සඳහා ද?	සමාජ සාධාරණත්වය : අන්තර්ගතය යනු පුද්ගලයන්, කණ්ඩායම් සහ ගැටලු පිළිබඳ ධනාත්මක සහ/හෝ සෘණාත්මක අදහස් ස්ථිර කරන හෝ අභියෝග කරන අරගල භූමියකි; එය කිසි විටෙක මධ්‍යස්ථ නොවේ.

මෙම ආකෘතිය, ගෝලීය පුරවැසිභාවයේ (සහ GCED) සන්දර්භය සහ සීඝ්‍රයෙන් විකාශනය වන මාධ්‍ය පරිසරයේ පසුබිමට අමතරව, තොරතුරු සහ සන්නිවේදන පරිසර පද්ධතියේ නියැලීම (engagement) කෙතරම් ගතික, විස්තීර්ණ සහ ප්‍රතිඵල සහිත ද යන්න අවධාරණය කරයි. අප මාධ්‍ය සමග නියැලෙන්නෙ නැති විට පවා, දේශීය කතිකාවන් සහ තොරතුරු ව්‍යාප්තිය තුළ ඇතැම් සංස්කෘතික ආකෘති සහ ගෝලීය සිදුවීම් විශාල වශයෙන් ඇතුළත් විය හැකි බැවින්, අප බොහෝ විට එහි බලපෑමට ලක් වන අතර එයින් අප හැඩගස්වනු ලැබේ. මෙම හේතුව නිසා, තොරතුරු සහ සන්නිවේදන පරිසර පද්ධතිය භාවිත කරමින් කණ්ඩායම් සහ සමාජයන් හෝ ප්‍රදේශ පවා විෂමානුපාතික ලෙස අවාසිදායක තත්ත්වයට පත් කිරීම සහ ආන්තිකකරණය කළ හැකි ආධිපත්‍යවාදී පාලනය සහ බලපෑම් පිළිබඳ අප සැලකිලිමත් විය යුතු ය.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

- සාරාංශය : මෙම විෂය මාලාවේ (1 වන කොටස) කලින් සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ ක්‍රියාත්මක කළ හැකි ය. කරුණාකර 1 වන කොටසෙහි ලැයිස්තුව සමාලෝචනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කරනු ලබන අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න.
- පුද්ගලයන් තම එදිනෙදා ජීවිතයේ දී විවිධ අන්තර්ගත සපයන්නන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ භාවිත කරන ආකාරය පිළිබඳ උදාහරණ එකතු කර විස්තර කරන්න. විනෝදාස්වාදන ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධ පුද්ලයන්ගේ අවධානය යොමු වී ඇති විෂය වස්තු ගවේෂණය කර පරීක්ෂා කරන්න, එමෙන්ම ඔවුන්ගේ ඉලක්කගත ග්‍රාහක පිරිස් කවුරුන් ද යන්න සාකච්ඡා කරන්න. එහි ඇතුළත් වන්නේ කවුරුන් ද, ඇතුළත් නොකර ඇත්තේ කවුරුන් ද, එමෙන්ම එහි අනන්‍යතාව සහ ග්‍රාහක පිරිස් තහවුරු කරනු ලැබිය හැකි කේන්ද්‍රීය තේමා සහ දර්ශක මොනවා ද? ග්‍රාහක පිරිස් අන්තර්ගතය භාවිත කරන ආකාරය පිළිබඳව මෙම මූලාශ්‍ර ඔබට අඟවන්නේ කුමක් ද? මෙහි භාවිතයන් සම්පාදකයන් අදහස් කළ භාවිතයන් සමග සැසඳීමේ දී වෙනස් විය හැක්කේ කෙසේ ද?
- රියැලිටි වැඩසටහන්, විනෝදාස්වාද රංගන, ප්‍රවෘත්ති යනාදියේ පෙන්වන පවුල් හා හාත්පසින්ම වෙනස් පසුබිමක පවුලක් විසින් වර්තමාන රූපවාහිනී වැඩසටහන් හෝ වෙළඳ දැන්වීම් අර්ථකථනය කරනු ලබන්නේ කෙසේ දැයි සිතන්න. අද අන්තර්ගත සපයන්නන් සහ ග්‍රාහක පිරිස් ගැන මෙයින් කුමක් පිළිඹිබු වන්නේ ද? සමාජයට ඇතිවන බලපෑම් මොනවා ද?
- මාධ්‍ය නියෝජනයන් සහ ග්‍රාහක පිරිස් ප්‍රතිචාර මත පදනම්ව, ආදිවාසීන්, වාර්ගික කණ්ඩායම්, අඩු සමාජ-ආර්ථික තත්ත්වයක සිටින කණ්ඩායම් හෝ දරිද්‍රතාවයෙන් පෙළෙන, වාර්ගික සහ ආගමික සුළුතරයන්, කාන්තාවන්, LGBTQI+ ප්‍රජාවේ සාමාජිකයන් (සන්දර්භය අනුව කණ්ඩායම් වෙනස් විය හැකි ය) ඇතුළු ආන්තික කරන ලද කණ්ඩායම් ප්‍රධාන ධාරාවේ මාධ්‍ය හා සමීපවන්නෙ කෙසේදැයි සලකා බලන්න.
- ප්‍රධාන ධාරාවේ පුවත්පත්, රූපවාහිනිය සහ ගුවන්විදුලිය ඇතුළු ප්‍රධාන ධාරාවේ සම්ප්‍රදායික මාධ්‍ය සහ විකල්ප මාධ්‍ය ජාල මෙන්ම මාර්ගගතව පිහිටුවා ඇති ක්‍රියාකාරී කණ්ඩායම් වැනි නව විකල්ප අන්තර්ගත සපයන්නන් අතර වෙනස්කම් පරීක්ෂා කරන්න.
- පුද්ගලයන්, විශේෂයෙන්ම සිසුන්, සමාජ මාධ්‍යවල නියැලෙන ආකාරය සහ ඒවා සමග නියැලීම මගින් ඔවුන්ගේ ආකල්ප, චර්යා සහ ක්‍රියාවන් ආදිය ඇතුළුව ඔවුන්ගේ දෛනික ජීවිතයට බලපෑම් සිදුවන ආකාරය සාකච්ඡා කරන්න. මෙයින් ඇඟවෙන්නේ කුමක් ද? ඔවුන්ගේ සමාජ මාධ්‍ය නියැලීම වැඩි පුරවැසි සහභාගීත්වයක් කෙරෙහි බලපාන්නේ ද බලපාන්නේ නැති ද? "Like" බොත්තම් එබීම හෝ පළ කිරීම් බෙදා ගැනීම යන කාර්යයන්ට පමණක් ප්‍රජා ක්‍රියාකාරකම් සීමා වී ඇති බව අදහස් කරන "ස්ලැක්ටිවිසම්" හි ("slack-tivism" - දේශපාලනික හෝ සමාජීය ගැටලු පිළිබඳ සමාජ මාධ්‍ය හරහා ඉතා සුළු පරිශ්‍රමයක් දරමින් ක්‍රියා කිරීම) වැඩි වීමක් තිබේ ද? ඔවුන්ගේ ප්‍රධාන ප්‍රවේදිතා සහ අභිලාෂ (concerns and interests) මොනවා ද? ශික්ෂකයන් විසින් පර්යේෂණ සිදු කර ගෝලීය පුරවැසිභාවය සහ සමාජ මාධ්‍ය අතර සම්බන්ධය හා බැඳුණු වෙනත් ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කළ යුතු ය.

- අපගේ භාවිතය, අර්ථ නිරූපණය සහ අන්තර්ගත සපයන්නන් සහ අන්තර්ගතය පිළිබඳ අවබෝධය කෙරෙහි වෙළඳ ප්‍රචාරණ බලපාන ආකාරය සලකා බලන්න. චිත්‍රපට, රූපවාහිනිය, මුද්‍රිත ප්‍රකාශන, ගුවන්විදුලිය සහ අන්තර්ජාලය පුරා රහසිගත ලෙස ස්ථානගත කරනු ලබන දැන්වීම් පිළිබඳව අප දැනුවත් ද? අප ලෝකය දකින ආකාරය සහ අපගේ මාධ්‍ය භාවිතයට අප ඩිජිටල් පියසටහන් මත හෝ තීරණ ගන්නන් විසින් අප තනි තනිව උනන්දුවක් දක්වනු ඇතැයි විශ්වාස කරන යමක් මත පදනම්ව ක්‍රමලේඛනය කරන ලද වෙළඳ ප්‍රචාරණ මුසු කරන ඇල්ගොරිතම අප විසින් අවබෝධ කරගන්නේ කෙසේ ද? අප ඉලක්ක කර ඇත්තේ කෙසේ ද යන්න තීරණය කිරීම සඳහා සමාජ මාධ්‍ය ප්‍රචාරණ විශ්ලේෂණය කිරීම ආරම්භක ලක්ෂයක් විය හැකි ය. වෙළඳ ප්‍රචාරණවල ආර්ථික මානයන් පිළිබඳව ප්‍රශ්න කිරීමට සිසුන් යොමු කරවන්න, එමෙන්ම නියැලීමට අපව උනන්දු කරනු ලබන්නේ කෙසේ ද යන්න ඇතුළුව අප තුළ දැනට පවතින දැනුමට වෙළඳ ප්‍රචාරණ බලපාන්නේ කෙසේ ද යන කරුණු පිළිබඳ ප්‍රශ්න කිරීමට සිසුන් යොමු කරවන්න. වෙළඳ ප්‍රචාරණ නොමැතිව හෝ අවම වශයෙන් පුද්ගල චර්යා හැසිරවිය හැකි, දත්ත මත පදනම් වූ, ක්ෂුද්‍ර-ඉලක්කගත වෙළඳ ප්‍රචාරණවලින් තොරව මාධ්‍ය සහ ඩිජිටල් වේදිකා පැවතිය හැකි ද? මෙයට විකල්ප ව්‍යාපාර ආකෘති මොනවා ද? වෙළඳ ප්‍රචාරණය පිළිබඳ වැඩි විස්තර සඳහා 10වන මොඩියුලය බලන්න.
- අන්තර්ජාල සෙවුම් යන්ත්‍ර විසින් දත්ත ඉදිරිපත් කරනු ලබන ආකාරය පරීක්ෂා කරන්න. අන්තර්ජාල සෙවුම්වල ඇතැම් තොරතුරු අනෙක් තොරතුරුවලට වැඩියෙන් ඇතුළත් වන ආකාරයෙන්ම දැන්වීම්කරුවන් හෝ සම්පාදකයන්හට ඉහළ ශ්‍රේණිගත කිරීම් (rankings) මිලදී ගැනීමට හැකියාව ඇත්තේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. අන්තර්ජාලය භාවිත කිරීමේ දී දේශීය සන්දර්භය කෙසේ සලකා බලනු ලබන්නේ ද? අවධාරණය නොකර ඇත්තේ හෝ ඉවත් කර ඇත්තේ කුමන තොරතුරු, අනුරූප, අදහස්, සහ ප්‍රවේදිතා ද? එමෙන්ම වඩාත් ප්‍රමුඛ කොට ප්‍රදර්ශනය කර ඇත්තේ මොනවා ද? යන්න වැදගත් වේ. අන්තර්ගත පරිභෝජනය, සම්පාදනය සහ ගෝලීය පුරවැසිභාවය සඳහා ගම්‍යමාන මොනවා ද?
- රූපවාහිනී වැඩසටහනක් සහ සමාජ මාධ්‍ය වැනි ජනප්‍රිය මාධ්‍ය කලා කෘතියක් හරහා ලබා දෙන සන්දේශ සහ වටිනාකම් විශ්ලේෂණය කරන්න. වෙනස් සමාජ කණ්ඩායමක පුද්ගලයන් (උදා. වයස, වාර්ගික පසුබිම) ඇතුළත් කළහොත් හෝ පිරිමි සහ කාන්තා චරිත භූමිකාවන් මාරු කළහොත් සන්දේශය වෙනස් විය හැක්කේ කෙසේ ද? මෙය ග්‍රාහක පිරිසට කෙසේ බලපෑ හැකි ද? මෙම වෙනස්කම් සිදු වුවහොත් වෙනස් වන්නේ කුමක් ද, කුමන හේතු නිසා ද සහ එයින් සිදු වන ප්‍රතිවිපාක කුමක් විය හැකි ද?
- කුමන අන්තර්ගතයක්, කෙසේ, කොතෙක් දුරකට ඉදිරිපත් කරන්නේ ද යන්න තීරණය කිරීමේ දී භාෂාව ප්‍රධාන සාධකයක් වන්නේ කෙසේ ද, එමෙන්ම එය දැනට අප සතු දැනුම සහ අප ක්‍රියා කරන ආකාරය කෙරෙහි බලපානු ඇත්තේ කෙසේ දැයි විශ්ලේෂණය කරන්න. වෙනත් ඇතැම් භාෂා මෙන් ප්‍රාදේශීය භාෂා ද පහසුවෙන් ළඟා විය හැකි, ඉදිරිපත් කරනු ලබන සහ බලපෑමක් සිදු කළ හැකි භාෂා වේ ද? ඇතැම් භාෂා අනෙක් භාෂාවලට වඩා ප්‍රමුඛ වීමේ බලපෑම කුමක් ද? එමගින් අපගේ දේශීය සංස්කෘතික වටිනාකම් සමග නොගැලපෙන සාරධර්ම, ආකල්ප සහ හැසිරීම වෙත ප්‍රසාදය පළ කිරීමට අපගේ දැනුම් පදනම හැඩගස්වනු ලබයි ද? ආධිපත්‍යවාදය විවිධත්වය බවට පරිවර්තනය කළ හැකි ද?
- සමාජ මාධ්‍ය පුරා විසිරී ඇති "මීම්" (memes) බලා, ඒවා සාකච්ඡා කරන්න, ඒවායෙහි ග්‍රාහක පිරිස කවුරුන් ද යන්න අවබෝධ කර ගැනීමට උත්සාහ කරන්න. "මීම්" කිහිපයක් තෝරන්න, ඒවා තේරුම් ගැනීමට අවශ්‍ය වන්නෙ මොනවාද සහ ඒවා අවබෝධ කර ගන්නා ආකාරය එක් එක් ග්‍රාහක පිරිස අනුව වෙනස් වන්නේ දැයි විශ්ලේෂණය කරන්න. තම සමාජය තුළ ඇති ගැටලු සහ ප්‍රශ්න සන්දර්භගත කිරීමට සහ පැහැදිලි කිරීමට "මීම්" නිර්මාණය කිරීමට සිසුන් යොදවන්න. "මීම්" භාවිත වන, ව්‍යාප්ත වන (ඇතැම් විට "වෛරල්" වෙමින්) සහ අර්ථකථනය කරන ආකාරය පිළිබඳ ගම්‍යාර්ථ සාකච්ඡා කරන්න. ගෝලීය පුරවැසිභාවයට "මීම්" මගින් සිදු වන බලපෑම තක්සේරු කිරීමේ මාධ්‍යයක් ලෙස හාස්‍යය, උත්ප්‍රාසය, නිර්මාණශීලිත්වය, සංස්කෘතික දැනුම සහ ග්‍රාහක පිරිස් අර්ථ නිරූපණය යන විචල්‍යයන් විශ්ලේෂණයට ඇතුළත් කරන්න.

- මාධ්‍ය තුළ සහ ඒවා හරහා පැවසිය හැක්කේ කුමක් ද? එහි දී අවහිර කර ඇත්තේ හෝ නිවාරණය කර ඇත්තේ මොනවා ද? සහ ඊට හේතු මොනවා ද? සන්දේශ යැවීමට අනුරූප භාවිත කරනු ලබන්නේ කෙසේ ද? ඇතැම් මාතෘකාවලට තහංචි දමා ඇති බවක් දක්නට ඇත්තේ සහ අනෙක් මාතෘකා හා ගත් කල අඩුවෙන් නිරූපණය වන්නේ මන්දැයි සාකච්ඡා කරන්න. අන්තර්ගත සපයන්නන්ගේ සන්දර්භය තුළ ග්‍රාහක පිරිස සහ බල සම්බන්ධතා පිළිබඳ මෙමගින් ඇඟවෙන්නේ කුමක් ද?
- ඔබගේ ප්‍රදේශයේ උසස් අධ්‍යාපන ආයතන සහ විශ්වවිද්‍යාල සඳහා පවතින ප්‍රවර්ධන ද්‍රව්‍ය පරීක්ෂා කරන්න. ඒවායෙහි සිසුන් ප්‍රදර්ශනය කර ඇති නම්, ඔවුන්ගේ ස්වරූපය කෙසේ ද? ඔවුන් කුමක් කරමින් සිටින්නේ ද? මෙම ද්‍රව්‍ය මගින් විද්‍යාලයේ කුමන ප්‍රතිරූපයක් පෙන්වනු ලබයි ද? ඔවුන් නියෝජනය කරන පාසල ගැන ඔවුන් කුමන හැඟීමක් පිළිඹිබු කරයි ද? ඔවුන් සැබෑ සිසුන් ද නිරූපණ ශිල්පීන් ද? ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත අගතියක් ඇති බවක් පෙනෙන්නට තිබේ ද? එම ප්‍රවර්ධන ද්‍රව්‍යවල සිසුන් ප්‍රදර්ශනය කොට නොමැති නම්, තෝරාගෙන ඇති අනුරූප මොනවා ද සහ ඒවා මගින් ආයතනය පිළිබඳ ඇඟවෙන්නෙ කුමක් ද? මෙම ප්‍රවර්ධන ද්‍රව්‍ය පිළිබඳ ඔබේ විශ්ලේෂණය අනුව එහි ඉලක්කගත ග්‍රාහක පිරිස කවුද? එමගින් ලබා දෙන සන්දේශය කුමක්ද ? තොරාගෙන ඇති රාමුගත කිරීම ප්‍රවර්ධන ද්‍රව්‍යයේ ප්‍රතිග්‍රහණයට බලපාන්නේ කෙසේ ද?

ඇගයීම සහ නිර්දේශ

- නිශ්චිත අන්තර්ගත වර්ගවල ග්‍රාහක පිරිස් කවුරුන් ද යන්න නිර්ණය කිරීම සඳහා ආකෘතියක්, වගුවක් හෝ ඇගයීම් උපකරණයක් සංවර්ධනය කිරීම.
- ප්‍රධාන බලපෑම් මෙන්ම ග්‍රාහක පිරිස් විස්තර කරන වදන්-සිතියමක් (word-map) හෝ වර්ඩ්ල් (Wordle) ප්‍රහේලිකාවක් සහිතව මාධ්‍ය හා සබැඳි සන්දේශවලින් සමන්විත කොලොප් චිත්‍රයක් (collage) නිර්මාණය කිරීම.
- ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සහ ඩිජිටල් වේදිකාවල පඨිත විශ්ලේෂණයක් කිරීම (දිශානතිය, අවධානය, විභව බලපෑම, ග්‍රාහක පිරිස් ආදිය).
- ප්‍රධාන සාධක (දිශානතිය, අවධානය, විභව බලපෑම, ග්‍රාහක පිරිස් යනාදිය) නිර්ණය කිරීම සඳහා සමාජ මාධ්‍යවල (එනම්, Facebook, WeChat, VK, Twitter, Instagram, TikTok, Taringa, YouTube, ආදිය) පඨිත විශ්ලේෂණයක් කිරීම.
- ග්‍රාහක පිරිස්, අන්තර්ගතය සහ අන්තර්ගතය සපයන ආයතන යන සන්දර්භය තුළ ගෝලීය පුරවැසිභාවයේ වැදගත්කම පිළිබඳ ජනතාවගේ අවබෝධය සම්බන්ධයෙන් කුඩා සමීක්ෂණයක් සැලසුම් කර දියත් කිරීම.

3 වන ඒකකය : මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL), ඩිජිටල් මාධ්‍ය සහ ප්‍රජා නියැලීම

කාලසීමාව: පැය 2 යි

අප මින් පෙර කිසි දිනෙක දැක නොමැති පරිමාණයකින් සහයෝගීතාව, සන්නිවේදනය සහ සහභාගීත්වය සඳහා ඉඩ සලසනු ලබන, අද මිනිසුන් සතුව ඇති අන්තර්ගත සපයන්නන් වෙත සහ ඩිජිටල් මෙවලම් වෙත පෙර නොවූ විරූ ප්‍රවේශය අර්ධ වශයෙන් හෝ හේතු කොට ගෙන, අද වන විට "ගෝලීය පුරවැසිභාවය" සහ "ප්‍රජා නියැලීම්" සඳහා වන අවශ්‍යතාව සහ ඒ පිළිබඳ ඇති උනන්දුව වටා නව හදිසිභාවයක් හටගෙන ඇති බව පෙනෙන්නට ඇත.

අඩ සියවසකට පෙර, සන්නිවේදන විශේෂඥ මාෂල් මැක්ලුහාන් අප විසින් අපගේ "ගෝලීය විඥානය" නිර්වචනය කරන ආකාරය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කිරීමට හේතුවන බොහෝ අදහස් වර්ධනය කළේ ය. අපගේ අනන්‍යතාවය, අපගේ සබඳතා සහ අපගේ ප්‍රජාවන් මෙන්ම අප ඒවායෙහි සහභාගි වන ආකාරය කෙරෙහි ද තාක්ෂණයේ ප්‍රබල බලපෑම පිළිබඳ මැක්ලුහාන් දැන සිටියේ ය. අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය භාවිතයට බොහෝ කලකට පෙර, අන්තර්ගත සපයන්නන් විසින් ග්‍රාහක පිරිස් සහ පරිශීලකයන් සම්බන්ධ කරන ආකාරය විස්තර කිරීමට ඔහු "ගෝලීය ගම්මානය" යන වාක්‍ය ඛණ්ඩය නිර්මාණය කළේ ය. සැබවින්ම, අප ලෝකය සහ අප ගැන සිතන ආකාරය ඇතුළුව අපගේ ක්‍රියා, ආකල්ප සහ චර්යා කෙරෙහි අන්තර්ගත සපයන්නන් බලපෑම් කරනු ඇති බව ඔහු විශ්වාස කළේ ය. "අපි අපේ මෙවලම් හැඩගස්වන්නෙමු, ඉන් පසුව අපගේ මෙවලම් අපව හැඩගස්වනු ඇත" යනුවෙන් මැක්ලුහාන් (1964) පැවසුවේ ය.

වර්තමානයේ තවත් ඉදිරියට යමින්, විද්වත්හු එකී "අපි" කවුදැයි වඩාත් සමීපව විමසා බලති. මෙවලම් නිර්මාණය කරන්නේ කුමන අස්තිත්වයක් විසින් ද සහ කුමන හේතුවක් සඳහා ද, ඒවායෙහි ව්‍යාපාර ආකෘතිය කුමක්ද සහ හානිකර විය හැකි අභ්‍යන්තර හා බාහිර සාධක තිබේද යන්න ඔවුහු විමසති. මෙමගින් වත්මන් ලෝකයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වර්ධනය වීමේ දී ප්‍රතිලාභ ලබන්නේ කවුරුන් ද සහ නොලබන්නේ කවුරුන් ද යන්න තක්සේරු කිරීම සඳහා උපකාරී වෙයි.

සමාජ මාධ්‍ය භාවිතය, පරිභෝජනය, සම්පාදනය, නියැලීම සහ නිර්මාණශීලිත්වය අපගේ පෞද්ගලික, සමාජීය, වෘත්තීය සහ ප්‍රජා මූලික ජීවිතයේ සෑම අංශයකටම මුහුවීම පුරවැසිභාවය, ප්‍රජාතන්ත්‍රවාදය සහ පුරවැසි සහභාගීත්වය පිළිබඳව අප සිතන ආකාරය වෙනස් කර ඇත. මේ අනුව, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (එෂබ) හා බැඳි ප්‍රශ්නය මෙම නව සන්නිවේදන සහ තොරතුරු පරිසර පද්ධතියට කේන්ද්‍රීය වන අතර, අප අන් අය සමග සහ ග්‍රාහක පිරිස්, එනම් දන්නා සහ නොදන්නා, දෘශ්‍යමාන සහ නොපෙනෙන, නියැලුණු සහ ආගන්තුක ආදී, සමග නියැලෙන ආකාරය සහ මෙම නියැලීමේ විභව බලපෑම කුමක්ද යන්න පිළිබඳව ප්‍රශ්න කිරීමක් විවෘත කරයි.

ප්‍රධාන මාතෘකා

- ගෝලීය පුරවැසිභාවය සහ ප්‍රජා නියැලීම සඳහා නව තාක්ෂණයන්හි ගම්‍යාර්ථ
- ප්‍රජා නියැලීමේදී හඬ සහ සාමූහික හා තනි පුද්ගල "කාරකත්වයේ" භූමිකාව
- සමාජ මාධ්‍ය සමග ක්‍රියාකාරීව මැදිහත්වීම අවධාරණය කරන සහ එය ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්, ක්‍රියාකාරී පුරවැසිභාවය සහ නිපුණතා හා සම්බන්ධ කරන ශික්ෂණවිද්‍යා උපායමාර්ග
- අනේකවිධ පරිශීලකයන්, ඩිජිටල් සන්නිවේදන සමාගම් මෙන්ම ප්‍රජා සහභාගීත්වය සඳහා වන අවස්ථා හඳුනාගෙන ප්‍රවර්ධනය කරන උපායමාර්ග සඳහා උදාහරණ
- පන්ති කාමරය තුළ, ප්‍රජාව තුළ සහ ප්‍රජා ආයතන තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ප්‍රජා නියැලීම සඳහා ඇති විභවතාව

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසුව, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත.

- විවිධ මාර්ගගත අවකාශයන් වෙත ග්‍රාහක පිරිස් ආකර්ෂණය කර ගැනීමට භාවිත කරන උපාය මාර්ග පිරික්සීම.
- මාර්ගගත අවකාශයන්හි සහභාගිවන්නන්ට ආරෝපණය කරගත හැකි භූමිකා හඳුනා ගැනීම.

- විවිධ සමාජ ජාල සහ අනෙකුත් අන්තර්ගත සපයන්නන් හරහා අනන්‍යතාව, අභිප්‍රාය සහ අපේක්ෂිත ග්‍රාහක පිරිස් නිර්මාණය කර සන්නිවේදනය කරන ක්‍රම විශ්ලේෂණය කිරීම.
- ඩිජිටල් සන්නිවේදන සමාගම් හරහා ග්‍රාහක පිරිස්වලට ප්‍රජා නියැලීම් හෝ සමාජ ක්‍රියාකාරකම් හා සම්බන්ධ විය හැකි ක්‍රම හඳුනා ගැනීම.

ඉගෙනුම් අරමුණු ප්‍රජා නියැලීම සහ පන්ති කාමර පරිසරය

ප්‍රජා නියැලීම් සඳහා ඇති අවස්ථා ගවේෂණය කිරීමේදී, බොහෝ ශික්ෂකයෝ සහ ශිෂ්‍යයෝ සමාජ ජාල සහ ඒවා සමාජ ක්‍රියා සඳහා යොදා ගත හැකි ආකාරය විශ්ලේෂණය කරන විමර්ශන ක්‍රියාවලියක නිමග්න වෙති. සමාන ගැටලුවක් ගැන උනන්දුවක් හෝ "සබැඳියාවක්" දක්වන පුද්ගලයන්ට එකට එකතු විය හැකි මාර්ගගත අවකාශ ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් නිර්මාණය කරන ආකාරය සහ පවතින සමාජ ජාල හරහා තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි සහ පුළුල් ලෙස බෙදා හැරිය හැකි ආකාරය ගැන ඔවුහු සාකච්ඡා කරති. (ජෝන්ස්) හැෆ්නර්, 2012).

මෙම පන්තිකාමර අත්දැකීම් මගින් තාක්ෂණය සහ එහි භාවිතය කෙරෙහි අවධානය යොමු කරන විචාරශීලී ශික්ෂණයක අවශ්‍යතාව ඉස්මතු කරයි. පවුලෝ ෆ්‍රෙයිරේ විසින් ගොඩනගන ලද සහ වෙනත් බොහෝ විද්වතුන් සහ ක්‍රියාකාරීන් විසින් භාවිත කරනු ලැබූ විචාරශීලී ශික්ෂණයෙහි අරමුණ වන්නේ අසමාන බල සම්බන්ධතා ද සමාජ සම්බන්ධතාවල පවතින පරපීඩනයේ අර්ථය ද පිරික්සීම සහ ඒවා ගැටලු බවට පත් කිරීම මගින් විමුක්තිය සහ හෘදසාක්ෂිකතාව කරා ළඟා වීමට උත්සාහ කිරීමයි. වඩාත් සරලව කිවහොත්, විචාරශීලී ශික්ෂණය යනු ක්‍රමවේදයක් නොව, සමාජයේ සියලුම සිසුන් සහ සාමාජිකයන් සඳහා අර්ථවත්, විචාරශීලීව නියැලෙනු ලබන පරිවර්තනීය අධ්‍යාපනයක් වර්ධනය කරන්නේ කෙසේ ද සහ සාක්ෂාත් කර ගන්නේ කෙසේ ද යන්න සලකා බැලීමේ නිමක් නැති ක්‍රියාවලියකි.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි (MIL) ඇතුළත් විචාරශීලී ශික්ෂණය මගින් ප්‍රජා නියැලීම් සහ පරිවර්තනය සඳහා ඇති අවස්ථා වැඩි දියුණු කිරීමට හෝ යටපත් කිරීමට තාක්ෂණය භාවිතා කරන්නේ කෙසේදැයි සලකා බැලීමට ශිෂ්‍යයන්ට ආරාධනා කරයි. ශික්ෂකයන් විසින් අවස්ථා නිර්මාණය කළ යුත්තේ ශිෂ්‍යයන්හට තම පන්ති කාමරවලට අදාළ මාතෘකා සහ ගැටලු ගවේෂණය කිරීම සඳහා (එනම්, විවිධ තාක්ෂණ හරහා ඉගැන්වීමට) නව තාක්ෂණ භාවිත කිරීමට පමණක් නොව, තාක්ෂණය පිළිබඳව විචාරශීලීව ඉගැන්වීමට ද මෙම අවස්ථා භාවිත කිරීම කළ යුතු ය යන්න මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි (MIL) අවශ්‍යතාව වේ. මාර්ගගත අවකාශ, මාර්ගගත අන්තර්ගත, ග්‍රාහක පිරිස් ආකර්ෂණය කර ගැනීමේ ක්‍රමශිල්ප, ස්වකීය මාර්ගගත චර්යා, මෙන්ම නියැලීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අංග පිළිබඳව ද විචාරශීලීව සිතීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම මෙයට ඇතුළත් වේ. ශිෂ්‍යයන් විසින් පුද්ගලිකව සමාජ ජාල වෙබ් අඩවි, සමාජ මාධ්‍ය, යෙදුම් භාවිත කරන ආකාරය සහ අදාළ භාවිතාවන් ඕනෑම පන්ති කාමරයක් සඳහා වැදගත් මාතෘකා වේ.

මාර්ගගත අවකාශයක සමාජීය සහ දේශපාලනික ගම්‍යතාර්ථ ද ඇතුළුව මාර්ගගත අවකාශයක් විශ්ලේෂණය කිරීම සහ ඇගයීම ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් මත පදනම් වේ: 1) එකී අවකාශයේ අභිප්‍රාය හඳුනා ගැනීම සහ අවකාශයේ පදනම වන සහ එහි නියෝජනය වන දෘෂ්ටිවාදය සහ වටිනාකම් පරීක්ෂා කිරීම; 2) අවකාශය නිර්මාණය කරන ලද්දේ සහ පාලනය කරනු ලබන්නේ කවුරුන් විසින් ද යන්න හඳුනා ගැනීම සහ එය එම ආකාරයට නිර්මාණය කර ඇත්තේ කුමන හේතුවක් නිසා දැයි විශ්ලේෂණය කිරීම; 3) අවකාශයෙහි ඉලක්කගත ග්‍රාහක පිරිස් කවුරුන් ද, පුද්ගලයන් එය භාවිතා කරන්නේ කෙසේ ද සහ එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිලාභ ලබන්නේ කවුරුන් ද යන්න හඳුනා ගැනීම.

ශික්ෂකයන් සහ ශිෂ්‍යයන්හට මෙම විමර්ශන තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා පහත සඳහන් ප්‍රශ්න භාවිත කළ හැකි ය. මෙවැනි ප්‍රශ්න මගින් ඩිජිටල් සන්නිවේදන සමාගම් යනු යම් යම් මතවාද සහ වටිනාකම් නියෝජනය කරනු ලබන, විවිධ ග්‍රාහක පිරිස් විසින් විවිධ ආකාරවලින් භාවිත කළ හැකි නිර්මිත "අවකාශ" බව විචාරශීලීව විශ්ලේෂණය කිරීම සහ අවබෝධ කර ගැනීම සඳහා රාමුවක් වර්ධනය කිරීමට උපකාරී වේ.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශය : මෙම විෂය මාලාවේ (1 වන කොටස) කලින් සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ ක්‍රියාත්මක කළ හැකි ය. කරුණාකර 1 කොටසෙහි ලැයිස්තුව සමාලෝචනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කරනු ලබන අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න.

- මෙම අවකාශ මගින් පුද්ගලයන් ඒකරාශි කරන්නේ කෙසේද නැතහොත් ඔවුන්ව තමන්ට සමාන විශ්වාස සහ වටිනාකම් පමණක් ඇති පුද්ගලයන් ගෙන් සමන්විත ප්‍රතිරාවී කුටීර (echo-chambers) වෙත සහ විභවයෙන් අනන්‍ය විය හැකි (potentially exclusivist) ප්‍රජාවන් වෙත යොමු කරවන්නෙ කෙසේ ද? මේවා ඔබ සැබෑ ජීවිතයේ දී පුද්ගලයන් සමග එකරැස් වන ආකාර හා වෙනස් වේ ද? වෙබ් අඩවිය හරහා නිර්මාණය වන්නේ කුමන ආකාරයේ සමාජ සම්බන්ධතා ද?

- කුමන ආකාරයේ සන්නිවේදන හෝ අන්තර්ක්‍රියා සිදු කිරීමේ හැකියාව පවතින්නේ ද? එක් පුද්ගල එක් පුද්ගල, එක් පුද්ගල බහු පුද්ගල, බහු පුද්ගල බහු පුද්ගල? මෙම ආකාරයේ සන්නිවේදනයේ බලපෑම කුමක් ද? අන්තර්ක්‍රියා සඳහා වන රීති හෝ ප්‍රතිමාන මොනවාද? මෙම රීති ඔබ ඉගෙන ගන්නේ කෙසේ ද?

- ජාලයේ සිටින පුද්ගලයන් ගැන ඔබ දන්නේ මොනවා ද? ඔවුන් ඔබ ගැන දන්නේ මොනවාද? අනාවරණය කරනු ලබන තොරතුරු සහ සඟවනු ලබන තොරතුරු මොනවා ද? එසේ වීමට හේතු මොනවා ද?

- මෙම අවකාශය තුළ ප්‍රවර්ධනය කරනු ලබන වටිනාකම් මොනවා ද? මෙම වටිනාකම් පිළිඹිබු කරන්නේ කෙසේ ද? අවකාශයේ අයිතිය දරන්නේ සහ පාලනය කරන්නේ තනි පුද්ගලයෙක් ද, ආයතනයක් ද නැතිනම් සංස්ථාවක් ද? ඔබ මෙම තොරතුර දන්නේ කෙසේ ද?

- මෙම වෙබ් අඩවියට ප්‍රවේශය ඇත්තේ කාටද? මෙම අවකාශයේ කොටසක් වීම සඳහා හෝ එහි සන්නිවේදනය කිරීම සඳහා වන "පිරිවැය" හෝ ක්‍රමය කුමක් ද? එහි සහභාගී වීම සඳහා ඇති වෙනත් අවස්ථා මොනවා ද? ඒවා කෙතරම් සාර්ථක / ප්‍රවේශ්‍ය ද?

- අන් අයගේ අවධානය දිනා ගැනීමට හෝ තොරතුරු හුවමාරු කර ගැනීමට වෙබ් අඩවිය භාවිතා කරන මෙවලම් මොනවා ද? සහභාගිවන්නන් සම්බන්ධ කර ගැනීමට සහ ඔවුන් කිසියම් ආකාරයක ක්‍රියාවකට සම්බන්ධ කර ගැනීමට භාවිත කරන උපායමාර්ග මොනවා ද?

- අර්ථයක් නිර්මාණය කිරීමට සහ ප්‍රකාශ කිරීමට මෙම අවකාශය විසින් පෙළ සහ දෘශ්‍ය අංග භාවිත කරනු ලබන්නේ කෙසේ ද? මෙම අවකාශය නිර්වචනය වන්නේ හෝ ගොඩනැගී ඇත්තේ කුමන ප්‍රධාන මූලිකාංග මත ද? එහි ප්‍රතිඵලයක් ලෙස කුමන ආකාරයේ "යථාර්ථයක්" හෝ ප්‍රජාවක් නිර්මාණය වේ ද? (ජෝන්ස්) හැෆ්නර්, 2012)

- ප්‍රජා නියැලීම් දිරිමත් කිරීම සඳහා සංවර්ධන නියෝජන ආයතන සහ/හෝ රාජ්‍ය නොවන සංවිධාන විසින් භාවිත කරනු ලබන ඩිජිටල් සන්නිවේදන සමාගම් පිළිබඳ පරීක්ෂා කරන්න. ඔබේ මතය අනුව ඔවුන්ගේ සාර්ථකත්වයට බලපාන සාධක මොනවා ද?[63]

ඇගයීම් සහ නිර්දේශ

- වත්මන් ගෝලීය ගැටලුවක් තරුණ ග්‍රාහක පිරිස් වෙත ප්‍රවර්ධනය කිරීමට මාර්ගගත අවකාශයක් නිර්මාණය කිරීම සඳහා සැලැස්මක් සකස් කරන්න. තොරතුරු පිටතට "තල්ලු කර" තරුණ ග්‍රාහක පිරිස් අවකාශයට "ඇදගන්නා" උපායමාර්ග කෙරෙහි සැලකිල්ල යොමු කළ යුතු ය.

- මාර්ගගත අවකාශ ඒවායෙහි සැලසුම් අංග, සන්දේශ සහ වටිනාකම්, නියැලීම සඳහා අවස්ථා, ග්‍රාහක පිරිස් කෙරෙහි ඇති විය හැකි බලපෑම යනාදිය මත අවධානය යොමු කරමින් විශ්ලේෂණය කරන්න.

- පවතින ඩිජිටල් සන්නිවේදන සමාගම් සඳහා ග්‍රාහක පිරිස් චරිත සටහනක් (profiles) සාදන්න. ඉලක්කගත ග්‍රාහක පිරිස් තීරණය කිරීමේදී ප්‍රධාන වන්නේ වෙබ් අඩවිවල කුමන විශේෂාංගද යන්න එකී චරිත පැතිකඩ තුළින් ඉස්මතු විය යුතු ය.
- ගෝලීය ගැටලු පිළිබඳ පුද්ගලයන්ගේ අවබෝධය සහ සමාජ ක්‍රියාකාරකම්වල නියැලීමට ඔවුන් තුළ ඇති කැමැත්ත කෙරෙහි මාර්ගගත අවකාශ සිදු කරන බලපෑම තීරණය කිරීම සඳහා කුඩා සමීක්ෂණයක් සැලසුම් කර දියත් කරන්න.
- හිමිකාරිත්වය සහ පාලනය පිළිබඳ ගැටලු, අවකාශය සඳහා මුදල් සපයාගන්නා ආකාරය සහ එය විශාල මාර්ගගත ජාලයකට හෝ ප්‍රජාවකට සම්බන්ධ වී තිබේද නැති ද යන්න නිර්ණය කිරීම සඳහා මාර්ගගත අවකාශයක් විශ්ලේෂණය කරන්න.

4 වන ඒකකය : පුරවැසි පාදක තොරතුරු සහ පුරවැසි මාධ්‍යවේදය

කාලසීමාව : පැය 4 යි

ප්‍රධාන මාතෘකා

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) පර්යාලෝක තුළින් මහජන යහපත සඳහා පුරවැසි පාදක තොරතුරු පිළිබඳ සංකල්පය අවබෝධ කර ගැනීම
- පුරවැසි පාදක තොරතුරු යන සන්දර්භය තුළ පුරවැසි මාධ්‍යවේදය
- පුරවැසි පාදක තොරතුරු සඳහා බුද්ධිමය පදනමක් වශයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත පුරවැසියන්
- විවෘත සමාජය සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තුළ පුරවැසි මාධ්‍යවේදයේ භූමිකාව
- ප්‍රජා නියැලීම සහ අන්තර් සංස්කෘතික සංවාදය සඳහා පුරවැසි පාදක තොරතුරු
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මත පදනම් වූ පුරවැසි මාධ්‍යවේදය

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසුව, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත් සඳහන් හැකියාවන් ලබා ගනු ඇත.

- පුරවැසි පාදක තොරතුරු සහ පුරවැසි මාධ්‍යවේදය අතර සම්බන්ධතාව විස්තර කිරීම.
- පුරවැසි පාදක සත්‍යාපනීය තොරතුරු භාවිත වන ප්‍රජා නියැලීම් සහ අර්ථාන්විත අන්තර් සංස්කෘතික සංවාද තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි වැදගත්කම අවබෝධ කර ගැනීම.
- විවෘත හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් වෙනුවෙන් පෙනී සිටීමේ දී සහ පොදු යහපත සඳහා තොරතුරු බෙදාගැනීමේ දී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත පුරවැසි මාධ්‍යවේදීන්ගේ කාර්යභාරය අවබෝධ කර ගැනීම.
- වර්තමාන මහජන කක්ෂයේ තොරතුරු සහ සන්නිවේදන පාරිසරික පද්ධතිය තුළ බලපෑම්කරුවන් (influencers) ලෙස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහිත පුරවැසි මාධ්‍යවේදීන්ගේ ඵලප්‍රයෝජනය විස්තර කිරීම.

පුරවැසියන් සහ තොරතුරු

තිරසර සංවර්ධනය සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය සඳහා අධ්‍යාපනය දියුණු කිරීම මගින්: 1) පුරවැසියන් විසින් තීරණ ගැනීම සහ දැනුවත් ක්‍රියාමාර්ග (උදාහරණයක් ලෙස පුරවැසියන්ගේ උපදේශන සහ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා යෙදවුම් හෝ විවාදය මත පදනම් වූ ඡන්ද රටාවන්), 2) මහජන යහපත සඳහා තොරතුරු සම්බන්ධයෙන් පුරවැසි නියැලීම සහ මහජන සහභාගීත්වය; පාලනය, ව්‍යාපාර පැවැත්වීම, ප්‍රාදේශීය ප්‍රජා නායකයන්, රාජ්‍ය නිලධාරීන් සහ බලයේ සිටින පුද්ගලයන්, වගවීම සහ විනිවිදභාවය; සන්නිවේදන නාලිකාවල හිමිකාරිත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය; ප්‍රජා සහභාගීත්වය, තොරතුරු වෙත මහජන ප්‍රවේශය සහ සම සාධාරණ ප්‍රවේශය සහතික කිරීම; මහජන විවාදය සහ මහජන කක්ෂයේ අදහස් ප්‍රජාතන්ත්‍රීකරණය යනාදී ගැටලු මතු කරයි.

සංවර්ධන සහ ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනය තුළ ප්‍රජා නියැලීමේ මූලධර්ම මත පදනම්ව, ආයතන පාදක ජනමාධ්‍යවේදය විසින් විවිධ බහුභාෂා ජනගහන නියෝජනය කරන ආකාරය අනුව ආයතන පාදක ජනමාධ්‍යවේදය ප්‍රශ්න කළ හැකි ය. යුනෙස්කෝව සහ හවුල්කරුවන් ප්‍රජා ගුවන්විදුලිය ආරක්ෂා කරන්නෙ එබැවිනි. https://en.unesco.org/themes/community-media-sustainability. ඒ අතරම, සාම්ප්‍රදායික මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් වඩාත් නියැලුණු, විවිධත්වය සපිරි අදහස් උදෙසා ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රජාතන්ත්‍රීයකරණය කළ යුතු ය. මෙම සලකා බැලීම මාධ්‍ය සහ ඩිජිටල් වේදිකාවල බහුවිධතාව සඳහා පදනම සකස් කළ යුතු අතර, එමගින් පුරවැසියන්ට ඔවුන්ගේම මාධ්‍ය හිමිකර ගැනීමට, වැඩි තොරතුරු මූලාශ්‍ර සඳහා තරඟ කිරීමට සහ මාධ්‍ය හිමිකාරිත්වය සංකේන්ද්‍රණය කිරීම සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් සීමිත 'බලපෑම්කරුවන්' සංඛ්‍යාවකගේ ඇල්ගොරිතම වර්ධනය කිරීම හේතුවෙන් ඇතැම් සමාජ ගැටලු සම්බන්ධයෙන් වසර ගණනාවක සිට පවතින හිඩැස්, පැහැරහැරීම් හෝ ආන්තික වාර්තාකරණයේ බලපෑම් නිෂේධනය කිරීමට උත්සාහ ගැනීමට වැඩි අවස්ථා සලසා දිය යුතු ය.

නව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවල සහාය ඇතිව නව මාධ්‍ය සහ සමාජ මාධ්‍ය පැමිණීමත් සමග පුරවැසියන් වර්තමානයේ අධික අන්තර්ගත ප්‍රමාණයක ග්‍රහණයට මැදි වී සිටින අතර එය දැන් අභියෝගයක් බවට පත්ව ඇත. වර්තමාන මහජන කක්ෂයේ බොහෝ රටවල අභියෝගය වී ඇත්තේ තවදුරටත් තොරතුරු දුලබ වීම හෝ හිඟයක් පැවතීම නොව, සාවද්‍ය තොරතුරු, දුස්තොරතුරු, වෛරී ප්‍රකාශ සහ "දුර්බෝධ ප්‍රයෝග" (කිසියම් අයෙකුගේ වීඩියෝවක් තාක්ෂණය යොදා ගනිමින් වෙනත් අයෙකු ලෙස පෙනෙන පරිදි සූක්ෂම ලෙස වෙනස් කිරීම) ආදිය එකට මුසුවී තොරතුරු අධිභාරයක් ඇති වීමයි. මහජන යහපත සඳහා තොරතුරු සාක්ෂාත් කර ගැනීම උදෙසා පුරවැසියන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ලබා ගත යුතු ය.

වෙනත් අයුරකින් පැවසුවහොත්, අද 21 වන සියවසේ පුරවැසියන්හට විවිධ අන්තර්ගත තක්සේරු කිරීම සහ මහජන යහපත සඳහා තොරතුරු සැපයීම කෙරෙහි දායක වීම සහ අවබෝධිත තීරණ ගැනීමේදී "තොරතුරු වසංගතය" (infodemic - කිසියම් ගැටලුවක් පිළිබඳ සීඝ්‍රයෙන් පැතිරෙන අධික තොරතුරු ප්‍රමාණයක් පැවතීම ද එම තොරතුරු බොහෝවිට අවිශ්වාස්‍ය වීම ද හේතුවෙන් එකී ගැටලුවට විසඳුමක් සෙවීමට අපහසු වීම) සාර්ථකව තරණය කිරීම සඳහා විචාරශීලී චින්තන කුසලතා අවශ්‍ය වේ. මේ අර්ථයෙන් ගත් කල මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මහජන යහපතකි. පුරවැසියන් විසින් තොරතුරු සැපයීම විවිධ ස්වරූප ගත හැකි ය - සමාජ මාධ්‍යවල පළ කරනු ලබන නිවැරදි කිරීම්වල සිට විකිපීඩියා පිටුවල ඇතුළත් කිරීම් දක්වා මෙන්ම වාර්තාකරණය සහ වෘත්තීය ආචාරධර්ම ඇතුළු පුරවැසි මාධ්‍යවේදය මගින් පවා මෙය සිදුවේ.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශය: මෙම විෂයමාලාවේ (1 වන කොටස) කලින් සාකච්ඡා කළ පරිදි විවිධ ශීක්ෂණවිද්‍යා ප්‍රවේශ ක්‍රියාත්මක කළ හැකිය. කරුණාකර 1 වන කොටසෙහි ලැයිස්තුව සමාලෝචනය කර පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කරනු ලබන අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න.

- පුරවැසි මාධ්‍යවේදය පිළිබඳ ඔබේ අවබෝධය කුමක් ද? පුරවැසි මාධ්‍යවේදය පිළිබඳ පුද්ගලයන්ගේ (විවිධ සමාජ හා ආර්ථික තත්ත්වවල සිටින) අවබෝධය පිළිබඳ විවිධ පර්යාලෝක සාකච්ඡා කර, සම්මුඛ සාකච්ඡා සිදු කර, විශ්ලේෂණය කරන්න. ඔවුන්ගේ විවිධ පර්යාලෝක සාරාංශ කරන්න. ඒවයෙහි විචක්ෂණශීලී ප්‍රවණතා දක්නට තිබේ ද?

- පුරවැසි මාධ්‍යවේදය යන සංකල්පය සාම්ප්‍රදායික මාධ්‍ය විසින් දකින්නේ කෙසේ ද? පුරවැසි පුවත්පත් මාධ්‍යවේදය පිළිබඳ ඔවුන්ගේ හැඟීම දැන ගැනීමට සාම්ප්‍රදායික මාධ්‍ය ආයතනවල විවිධ පුද්ගලයන් සමග සම්මුඛ සාකච්ඡා සිදු කිරීමට විචාරවත් ප්‍රයත්නයක් දරා, එම තොරතුරු ඉහත අභ්‍යාසයේ ප්‍රතිඵල සමග සංසන්දනය කරන්න. මෙහි දී ඔවුන්ගේ සංජානනයෙහි යම් වෙනසක් ඔබ දකිනවා ද?

- ප්‍රජා මාධ්‍ය තුළ පුරවැසියන්ගේ සහභාගීවීම යන්නට තොරතුරු සම්පාදනය සහ ජනමාධ්‍යවේදය ඇතුළත් විය හැකි අතරම සංවාදවල සමානව නියැලීම, සංස්කෘතිය නියෝජනය කිරීම යනාදිය ද ඇතුළත් විය හැකි ය. "ස්වාධීන සහ ප්‍රජාව විසින් ප්‍රජාව සඳහා මෙහෙයවනු ලබන ප්‍රජා මාධ්‍ය යුනෙස්කෝව විසින් තරයේ නිර්දේශ කරනු ලැබේ.... ග්‍රාමීය සහ ළඟා වීමට දුෂ්කර ජනගහනය අතර අධ්‍යාපනය, ස්වයං ප්‍රකාශනය සහ සන්නිවේදනය සඳහා වැඩි ප්‍රවේශයක් ලබා දීම සඳහා ළඟා වීමේ යාන්ත්‍රණයක් වශයෙන් ප්‍රජා ගුවන් විදුලිය ඉතා වැදගත් වේ. එවැනි නාළිකා මගින් ප්‍රජාවන්ට තම ප්‍රජාවේ සංවර්ධන න්‍යාය පත්‍රය පිළිබඳ හිමිකමක් වැනි හැඟීමක් ලබා දෙන අතර, ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කිරීමට, ගැටලු විවාද කිරීමට සහ ඔවුන්ගේ ප්‍රජාවේ සංස්කෘතිය, ඉතිහාසය සහ භාෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන් විසින්ම ඔවුන් බල ගැන්වීමට ඉඩ සලස්වයි." මෙම ප්‍රකාශය වටා පන්තිකාමරය තුළ විවාදයක් සංවිධානය කරන්න. විවාදයේ ප්‍රතිඵල ලේඛනගත කර වාර්තාවක් සකස් කිරීමට ශිෂ්‍ය කණ්ඩායමක් පත් කරන්න. ඔබේ රටේ හෝ කලාපයේ ප්‍රජා මාධ්‍ය ප්‍රවර්ධනය කරනු ලබන්නෙ කුමන සංවිධාන විසින් ද? ඔබේ ප්‍රජාව තුළ ප්‍රජා මාධ්‍ය තිබේද? එසේ නොවේ නම්, එයට හේතු සාකච්ඡා කරන්න. ප්‍රජා මාධ්‍ය පවතියි නම්, ඒවා තිරසරද? ප්‍රජා ගුවන්විදුලිය කළමනාකරණය කිරීමට කාන්තාවන් සහ ගැහැණු ළමයින් සම්බන්ධ වී තිබේ ද? අන්තර්ගතය තුළින් ඔවුන් ද පිරිමින් සහ පිරිමි දරුවන් හා සමානව පරාවර්තනය වී තිබේද? වෙනත් ප්‍රශ්න සකස් කර විවාදය හරහා පිළිතුරු සපයන්න. ඔබේ ප්‍රජාවේ හෝ රටේ අදාළ බලධාරීන් සමග එම වාර්තාව බෙදා ගන්න.

- වැඩිදුර සාකච්ඡා, පර්යේෂණ සහ ක්‍රියාවල පදනම ලෙස යුනෙස්කෝ ප්‍රජා මාධ්‍ය තිරසර ප්‍රතිපත්ති මාලාව භාවිත කරන්න. . https://en.unesco.org/community- media-sustainability/policy-series

- විවිධ සමාජ මාධ්‍ය වේදිකාවල පුද්ගලයන් තොරතුරු (පෙළ, වීඩියෝ, ග්‍රැෆික් ආදිය) බෙදා ගන්නා ආකාරය සලකා බලන්න. මෙම වේදිකාවල පුරවැසිපාදක තොරතුරු මහජන කක්ෂයට ධනාත්මක ලෙස දායක වී ඇති ද? එය සක්‍රීය තොරතුරු සහ ඩිජිටල් සන්නිවේදන පරිසර පද්ධතියක් යැයි ඔබට පැවසිය හැකි ද?

- ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සමාජ මාධ්‍ය සමග නියැලෙන ආකාරය සහ පුරවැසි මාධ්‍යවේදීන් සමාජ මාධ්‍ය හරහා ඔවුන්ගේ ප්‍රවෘත්ති අන්තර්ගතයට බලපෑම් කරන ආකාරය සාකච්ඡා කරන්න. පුරවැසි පාදක තොරතුරු සඳහා මෙම නියැලීම්වල ගම්‍යාර්ථ මොනවාද? සමාජ මාධ්‍ය නියැලීම මගින් ප්‍රජා මහජන කක්ෂයේ කතිකාව තුළ වැඩි පුරවැසි සහභාගීත්වයක් ඇති කිරීමට හේතුවේ ද? ප්‍රධාන සැලකිලි සහ ප්‍රවේදිතා ලෙස ඔබ සලකනු ලබන්නෙ මොනවා ද?

- මාධ්‍ය සහ ඩිජිටල් තාක්ෂණ 'බලපෑම්කරුවන්' පුරවැසි මාධ්‍යවේදයට සම්බන්ධ වන ආකාරය සලකා බලන්න. මෙම නිරීක්ෂණය සැලකිල්ලට ගනිමින්, අන්තර්ජාලයේ ඇල්ගොරිදම්පාදක තොරතුරු පුරවැසිපාදක තොරතුරු කෙරෙහි බලපා ඇති විවිධ ආකාර සාකච්ඡා කරන්න. අනාගත දේශපාලනික නියැලීම් සහ අන්තර් සංස්කෘතික සංවාද සඳහා තොරතුරු වෙත පුරවැසියන් සතු පොදු ප්‍රවේශය තුළ පවතින මෙම බලපෑම් කරන ලද ආඛ්‍යානවල ගම්‍යාර්ථ මොනවාද? කෘතිම බුද්ධිය සහ ඇල්ගොරිදම පිළිබඳ වැඩි විස්තර සඳහා මොඩියුල 11 බලන්න.

- පුරවැසි මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා අධ්‍යාපන පුහුණුවේ අත්‍යවශ්‍යභාවය සහ එම පුහුණුව පුරවැසිපාදක තොරතුරු කෙරෙහි ඇති කරන බලපෑම වඩාත් පුළුල් ලෙස සාකච්ඡා කරන්න. මේ සඳහා සහ මෙම කොටසේ වෙනත් ක්‍රියාකාරකම් සඳහා වන සාකච්ඡාවලදී, MIL in

Journalism(A handbook for journalists and journalism educators යන UNESCO අධ්‍යාපනික මූලාශ්‍රය සලකා බලන්න: https://en.unesco.org/sites/default/files/ mil_eng.pdf.

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා අධ්‍යාපනය මගින් පුරවැසියන් අන්තර්ජාල සෙවුම් යන්ත්‍ර හරහා ප්‍රවේශ වන තොරතුරුවල ගුණාත්මක භාවයට බලපෑම් කළ හැකි ආකාරය සහ ප්‍රජා නියැලීම් සඳහා පුරවැසියන් සවිබල ගැන්වීම කෙරෙහි එවැනි සාක්ෂරතාවේ බලපෑම විශ්ලේෂණය කරන්න. මෙම ක්‍රියාවලියේදී මාර්ගගත ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංවිධානය කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදන්න. විවිධ විවෘත දත්ත සමුදායන් මෙන්ම ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි නිබන්ධන පිළිබඳ දත්ත සමුදායන් පර්යේෂණ කිරීමට ඔවුන්ට මග පෙන්වන්න. පුරවැසිපාදක තොරතුරු යනුවෙන් මෙම ගබඩාවන් වටා සාකච්ඡාවක් මෙහෙයවන්න. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, ප්‍රජා සංවර්ධනය, හෝ උනන්දුවක් දක්වන වෙනත් මාතෘකා සම්බන්ධ පර්යේෂණ වාර්තා සොයන්න. පහත ප්‍රශ්න සාකච්ඡා කර අමතර ප්‍රශ්න ලියන්න. මෙම තොරතුරු මූලාශ්‍ර ප්‍රාදේශීය සහ ජාතික වාද විවාදවලදී භාවිත කරනු ලැබේ ද? නොකරන්නේ නම් ඊට හේතු මොනවා ද? මෙම සොයාගැනීම් පිළිබඳ ඇතැම් ප්‍රාදේශීය ප්‍රජාව, ජාතික ආණ්ඩු සහ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානවල දැනුවත්බව වැඩි කිරීමට කුමක් කළ හැකි ද? ඔබ උනන්දුවක් දක්වන මාතෘකා සම්බන්ධයෙන් ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි මට්ටමින් පර්යේෂණ වාර්තා අඩු හෝ නොමැති බවක් ඔබට පෙනී යන්නේ ද? ඒ පිළිබඳ සිදු කළ හැක්කේ කුමක් ද? එම ක්‍රියාවලිය පිළිබඳ කෙටි වාර්තාවක් සකස් කරන්න. පාසල, ප්‍රජා මධ්‍යස්ථාන ආදියෙහි පසු විපරම් කටයුතු සැලසුම් කරන්න. තොරතුරු ජීවන චක්‍රය සහ අධ්‍යයන තොරතුරු ගොඩනගන සහ තහවුරු කරන ආකාරය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා මොඩියුල 3 බලන්න.

ඇගයීම සහ නිර්දේශ

- සාම්ප්‍රදායික මාධ්‍ය සහ සමාජ මාධ්‍ය යන දෙඅංශය තුළම මාධ්‍ය "බලපෑම්කරුවන්" සහ පුරවැසියන්ගේ ආඛ්‍යාන පිළිබඳ මත නිර්මාණය කරන්නන් හඳුනාගැනීම සඳහා ඇගයීම් උපකරණ හෝ සංසන්දනාත්මක විශ්ලේෂණ වගුවක් සකස් කරන්න.
- යම් සමාජ හෝ දේශපාලන ගැටලුවක සමාජ මාධ්‍ය ආඛ්‍යාන පිළිබඳ පර්‍යේෂණයක් සිදු කර එහි පුරවැසි තොරතුරු මත පදනම් වූ ප්‍රධාන සාධක (මනෝ විහිතිය, මනෝභාවය, විභව නැඹුරුතා, මාධ්‍ය දිශානතිය ආදිය) නිර්ණය කරන්න.
- පුරවැසි මාධ්‍යවේදය යන සංකල්පය පිළිබඳ ජනතාවගේ අවබෝධය පිළිබඳ කුඩා සමීක්ෂණයක් සැලසුම් කර දියත් කරන්න.
- මාර්ගගත හෝ මාර්ග අපගත සන්දර්භවල, වර්තමානයේ සාම්ප්‍රදායික මාධ්‍ය අන්තර්ගතයට පුරවැසි මාධ්‍යවේදියාගේ බලපෑම පිළිබඳ කේන්ද්‍රීය කණ්ඩායම් (focus group) සාකච්ඡාවක් සහ සම්මුඛ සාකච්ඡාවක් සිදු කරන්න.
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ පුරවැසියන්ගේ අවබෝධය සම්බන්ධයෙන් කුඩා නමුත් විස්තීර්ණ සමීක්ෂණයක් සැලසුම් කර දියත් කරන්න.

මෙම මොඩියුලය සඳහා සම්පත් සහ යොමු

Addressing anti-Semitism through Education. Guidelines for Policymakers, UNESCO, https://unesdoc.unesco.org/ark:/48223/pf0000263702

Addressing anti-Semitism in Schools: Training curricula, UNESCO? https://unesdoc.unesco.org/ark:/48223/pf0000374864?posInSet=1&queryId=dbd05bbf-952c-4111-b584-1a2a009d923a

DEEEP. (2015). *Transformational Communications for Global Justice Reframing Toolkit*. DEEEP: United Kingdom. https://www.bridge47.org/sites/default/files/2018-12/17_transformational_communications_toolkit.pdf

DiMaggio, P., E. Hargittai, W.R. Neuman and J.P. Robinson (2001) `Social implications of the Internet', Annual Review of Sociology 27: 307±36.

Elementary Teachers' Federation of Ontario (ETFO), (2010). *Education for global citizenship: An ETFO Curriculum Development Inquiry Initiative.* Toronto: ETFO. http://etfo.net/globaled/HTML5/

Empowering Students for Just Societies: Handbooks for primary and secondary school teachers, UNESCO and UNDOC, https://unesdoc.unesco.org/ark:/48223/pf0000370902?posInSet=2&queryId=301e5abc-edd0-462c-8433-5600c64490ee

Funk, S., Kellner, D. &Share, J. (2016). Critical Media Literacy as Transformative Pedagogy. https://www.researchgate.net/publication/342214960_Critical_Media_Literacy_as_Transformative_Pedagogy

Global citizenship education: Topics and learning objectives, UNESCO https://unesdoc.unesco.org/ark:/48223/pf0000232993

Jones, R. H. and Hafner, C. A. (2012). Understanding Digital Literacies: A Practical Introduction. New York: Routledge.

Maguth, B. M. (2013). The use of social networks in the social studies for global citizenship education: Reflecting on the March 11, 2011 disaster in Japan. The Georgia Social Studies Journal, 3(2), 80-93.

Share, J., Mamikonyan, T. & Lopez, E. (2019). Critical Media Literacy in Teacher Education, Theory, and Practice. In *Journalism and Ethics: Breakthroughs in Research and Practice* (pp. 318-348). Hershey, Pennsylvania: ICI Global. https://www.researchgate.net/publication/339675387_Critical_Media_Literacy_in_Teacher_Education_Theory_and_Practice

UNESCO (Deardorff, D et al.) (2018). *Global citizenship education: taking it local.* Paris: UNESCO. https://unesdoc.unesco.org/ark:/48223/pf0000265456?posInSet=1&queryId=4087efd2-0912-4a83-ae0e-b1ddcae1f637

UNESCO (Office Bangkok and Regional Bureau for Education in Asia and the Pacific). (2018). *Preparing teachers for global citizenship education: a template.* Bangkok: UNESCO. https://unesdoc.unesco.org/ark:/48223/pf0000265452

UNESCO (Santiago Office). (2017). *GLOBAL CITIZENSHIP EDUCATION IN LATIN AMERICA AND THE CARIBBEAN: "Towards a world without walls: global citizenship education in the SDG 4 – E2030 Agenda".* Santiago: UNESCO. https://www.bridge47.org/sites/default/files/2018-12/22_gce_in_latin_america_and_the_carribean.pdf

UNESCO. (2014). *Global Citizenship Education Preparing learners for the challenges of the 21st century.* Paris: UNESCO. https://www.bridge47.org/sites/default/files/2018-12/20_unesco_gce_2.pdf

වෙබ් අඩවි / දත්ත සමුදායන්

Asia-Pacific Centre of Education for International Understanding (APCEIU)

ජාත්‍යාන්තර අවබෝධය සඳහා ආසියානු ශාන්තිකර අධ්‍යාපන මධ්‍යස්ථානය

යුනෙස්කෝව සහ කොරියානු ජනරජයේ රජය අතර ගිවිසුමක් හරහා 2000 වර්ෂයේ දී එය පිහිටුවන ලද දා සිට, *APCEIU* එවැනි වටිනාකම් සහිත ශිෂ්‍යයන් සවිබල ගැන්වීමේ පියවර සෙවීම සඳහා උපරිම උත්සාහයක් දරයි. *APCEIU* පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් ක්ෂේත්‍ර හරහා *GCED* හි ප්‍රබල උත්ප්‍රේරකයක් බවට පත්වීමට උත්සාහ කර ඇත: ශික්ෂකයන්ගේ ධාරිතාව ගොඩනැගීම, පර්යේෂණ සහ ප්‍රතිපත්ති සංවර්ධනය, තොරතුරු ව්‍යාප්ත කිරීම, ඉගෙනුම්/ඉගැන්වීම් ද්‍රව්‍ය සංවර්ධනය කිරීම සහ ජාත්‍යන්තර ගුරු හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. *APCEIU* ජාත්‍යන්තර අවබෝධය සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය සඳහා විවිධ අධ්‍යාපන වැඩසටහන් හරහා යුනෙස්කෝවේ විධිනියෝගය ඉටු කරයි. http://www.unescoapceiu.org/en/index.php

Bridge 47

Bridge 47 නිර්මාණය කරන ලද්දේ එකිනෙකා හා බෙදාහදා ගැනීමට සහ ඉගෙන ගැනීමට මිනිසුන් එක් කිරීමට ය. එය ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය හරහා ගෝලීය යුක්තිය සඳහා පරිවර්තනය වීමට සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා දායක වීමට ලොව පුරා සිටින සිවිල් සමාජය බලමුලු ගන්වයි. https://www.bridge47.org/about

GGENE Global Education Network Europe

ගෝලීය අධ්‍යාපන ජාලය යුරෝපය

GENE - Global Education Network Europe යනු යුරෝපීය රටවල ගෝලීය අධ්‍යාපනය සඳහා ජාතික වගකීමක් සහිත අමාත්‍යාංශ සහ නියෝජිතායතන ජාලයයි. *GENE* විසින් ජාතික ප්‍රතිපත්ති සංවර්ධනය කරන සහ යුරෝපීය රටවල ගෝලීය අධ්‍යාපනය සඳහා අරමුදල් සපයන අමාත්‍යාංශ, නියෝජිතායතන සහ අනෙකුත් ආයතන ඒකරාශී කරයි. *GENE*හි සහභාගී වන අමාත්‍යාංශ සහ නියෝජිතායතන ව්‍යුහගත ජාලකරණය, බෙදාගැනීමේ උපායමාර්ග සහ ජාතික වශයෙන් වැඩිදියුණු කරන ලද ප්‍රතිඵලවලට තුඩු දෙන සමස්ථ ඉගෙනුම් ප්‍රවේශයක් හරහා ඔවුන්ගේ විශේෂඥතාව ඒකාබද්ධ කරයි. https://gene.eu/

Global Citizenship Education Clearinghouse

ගෝලීය පුරවැසි අධ්‍යාපන නිෂ්කාශනාගාරය

GCED Clearinghouse යනු තොරතුරු හුවමාරු කර ගැනීමට සහ GCED පිළිබඳ දැනුම සහ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා යුනෙස්කෝ සහ APCEIU එක්ව පිහිටුවා ඇති GCED පිළිබඳ ගෝලීය දත්ත ගබඩාවකි. https://www.gcedclearinghouse.org

IDEAS for global citizenship

ගෝලීය පුරවැසිභාවය සඳහා IDEAS

ජාත්‍යන්තර සංවර්ධන අධ්‍යාපන සංගමය ස්කොට්ලන්තය (International Development Education Association Scotland - IDEAS) යනු සංවර්ධන අධ්‍යාපනය සහ ගෝලීය පුරවැසිභාවය සඳහා අධ්‍යාපනය උදෙසා සක්‍රියව සහාය දක්වන සහ ප්‍රවර්ධනය කරන ස්කොට්ලන්තය (එක්සත් රාජධානිය) පුරා සිටින සංවිධාන සහ තනි පුද්ගලයන්ගේ ජාලයකි. http://www.ideas-forum.org.uk/

Media Smarts (Canada's Centre for Digital and Media Literacy)

මීඩියා ස්මාර්ට්ස් (ඩිජිටල් සහ මාධ්‍ය සාක්ෂරතාව සඳහා කැනඩාවේ මධ්‍යස්ථානය)

Media Smarts යනු ඩිජිටල් සහ මාධ්‍ය සාක්ෂරතාව සඳහා වන කැනේඩියානු ලාභ නොලබන පුණ්‍යායතනයකි. එහි දැක්ම වන්නේ ළමයින්ට සහ තරුණයන්ට ක්‍රියාකාරී සහ අවබෝධිත ඩිජිටල් පුරවැසියන් ලෙස මාධ්‍ය සමග සම්බන්ධ වීමට විචාරශීලී චින්තන කුසලතා ඇති කිරීමයි. මෙම ඉලක්කය

සපුරා ගැනීම සඳහා, එය කැනේඩියානු පාසල්, නිවාස සහ ප්‍රජාවන්හි ඩිජිටල් සහ මාධ්‍ය සාක්ෂරතාව දියුණු කිරීමට නායකත්වය සපයයි; උසස් තත්ත්වයේ කැනේඩියානු-පාදක ඩිජිටල් සහ මාධ්‍ය සාක්ෂරතා සම්පත් සංවර්ධනය කිරීම මෙන්ම බෙදා හැරීම සිදු කරයි; එමෙන්ම මාධ්‍ය සම්බන්ධ ගැටලු පිළිබඳව අවබෝධිත රාජ්‍ය ප්‍රතිපත්තියක් වර්ධනය කිරීමට දායක වන පර්යේෂණ පැවැත්වීම සහ බෙදා හැරීම සිදු කරයි. https://www.mediasmarts.ca/?gclid=CjwKCAjwnK36BRBVEiwAsMT8WEBH51ws5Rb6k7iQ_cFukbkNjFs8nIOoneVhyQfIqzoZZNwX09In_hoCOpMQAvD_BwE

McLuhan Foundation for Digital Media Literacy

ඩිජිටල් මාධ්‍ය සාක්ෂරතාවය සඳහා මැක්ලුහාන් පදනම

මැක්ලුහාන් පදනම ඩිජිටල් මාධ්‍ය සාක්ෂරතාවය සඳහා කැපවී සිටින අතර සැබෑ සහ අතථ්‍ය ගෝලීය ගම් චතුරශ්‍රයක් පිහිටුවීමට කැපවී සිටියි. ලොව පුරා ඩිජිටල් මාධ්‍ය සාක්ෂරතාවයට සම්බන්ධ දහස් ගණන් මූලාරම්භ, රාජ්‍ය නොවන සංවිධාන, සංගම් සහ නියෝජිතායතන අතර පවතින හොඳම ව්‍යවහාර බෙදා ගැනීමට පදනම පහසුකම් සපයයි. චතුරශ්‍රය යනු ශික්ෂකයන්, වෘත්තිකයන්, කර්මාන්ත නියෝජිතයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා අතථ්‍ය සහ සැබෑ රැස්වීම් ස්ථානයකි. සහයෝගීතාව, ගවේෂණ සහ මහජනයා ප්‍රවේශ වීම හරහා ගෝලීය ගම් චතුරශ්‍රය (Global Village Square) ඩිජිටල් මාධ්‍ය සාක්ෂරතාවෙහි නවෝත්පාදන සහ හවුල්කාරිත්වයන් සඳහා ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානයකි. www.mcluhanfoundation.org

UNESCO – Global Citizenship Education

යුනෙස්කෝ - ගෝලීය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය

යුනෙස්කෝව GCED ක්‍රියාවට නැංවීම සඳහා සාමාජික රටවලට ඔවුන්ගේ ප්‍රයත්නයන්ට සහාය දෙමින් ක්‍රියාත්මක වේ. මෙයට GCED පිළිබඳ දැනුවත් කිරීම, එය ක්‍රියාත්මක කිරීම සඳහා පෙනී සිටීම සහ මාර්ගෝපදේශ සහ ධාරිතා ගොඩනැගීමේ මෙවලම් සංවර්ධනය කිරීම ඇතුළත් වේ.

GCED සඳහා UNESCO හි ප්‍රවේශය වන්නේ:

- සාකල්‍ය: විධිමත්, නොවිධිමත් සහ අවිධිමත් ඉගෙනුම් සැකසුම් තුළ ඉගෙනීමේ අන්තර්ගතය සහ ප්‍රතිඵල, අධ්‍යාපනය සහ ඉගෙනුම් පරිසරය පිළිබඳ අවධානය යොමු කිරීම
- පරිවර්තනීය: ශිෂ්‍යයන්ට තමන්ව සහ සමාජය පරිවර්තනය කිරීමට හැකියාව ලබා දීම
- සන්දර්භගත: දේශීය අවශ්‍යතා සහ සංස්කෘතික යථාර්ථයන්ට අනුගත වීම
- වටිනාකම්පාදක: වෙනස් කොට නොසැලකීම, සමානාත්මතාව, ගෞරවය සහ සංවාදය වැනි විශ්වීය වශයෙන් බෙදාගත් වටිනාකම් ප්‍රවර්ධනය කිරීම
- අන්තර්කරණීය, සමානාත්මතාවයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා විශාල කැපවීමක නිරත වීම https://en.unesco.org/themes/gced

6 වන මොඩියුලය

මාධ්‍ය හා තොරතුරු තුළ නිරූපණය: ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව අවධානයට ලක් කිරීම

අපට සලකනු ලබන ආකාරය තීරණය වන්නේ ඔවුන් අපව දකින ආකාරය අනුව ය:

අපි අනෙකාට සලකන ආකාරය තීරණය වන්නේ අප ඔවුන් දකින ආකාරය අනුව ය; එවැනි දැකීමක් සිදු වනුයේ නියෝජනය තුළින රිචර්ඩ් ඩයර්, The Matter of Images

පසුබිම සහ තාර්කිකය

අන්තර්ගත හෝ නිෂ්පාදන තුළ දක්නට ලැබෙන නිරූපණ විවිධාකාරී වේ. අප බොහෝ දෙනෙක් ජීවත් වන්නේ රූප පිරුණු සංස්කෘතියක් තුළ වන අතර, දෛනිකව මාර්ගගතව හෝ මාර්ග අපගතව රූපවාහිනියේ, විශේෂාංග චිත්‍රපටවල, ප්‍රවෘත්ති වාර්තාකරණයේ සහ පොත්වල පවතින නියෝජනය කීරිම් දෛනිකව අප වටා සැරිසරයි.

වාර්තාකරුවෝ, කතුවරු, වීඩියෝ ශිල්පියෝ, වෙළෙඳ ප්‍රචාරකයෝ, ප්‍රකාශකයෝ සහ චිත්‍රපට නිෂ්පාදකයෝ, බ්ලොග්කරුවෝ (blogger), ව්ලොග්වරු (vlogger), පරිශීලක විසින් ජනිත අන්තර්ගතවල සම්පාදකයෝ සහ සාමාන්‍ය ජනයා අන්තර්ගත සැල කිරීම සඳහා රූප, ශ්‍රව්‍ය සහ ලිඛිත වදන් භාවිත කරති. මහජනයා සඳහා වෘතාන්ත සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී ඔවුහු සාමාන්‍යයෙන් කාලය, අවකාශය, සම්පත් සහ වෙනත් සංස්කරණය සම්බන්ධ සීමාවන්ට මුහුණ දෙති. ජාතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය, වයස හෝ පන්තිය යනාදී අදාළ හෝ අදාළ නොවන්නේ යැයි ඔවුන් විසින් සැලකෙන ලක්ෂණ හැඟවීම මගින්, මෙහිදී ඔවුහු අවිකල්පයෙන්ම ජනතාව, ගැටලු හෝ සිද්ධි නියෝජනය කරති. ඇතැම් අවස්ථාවල දී තනි පුද්ගලයන් හෝ කණ්ඩායම් වැරදි සහගත ලෙස ලේබල් කිරීමට සහ, පටු විශ්වාස සහ ආකල්ප සාධාරණීයකරණය කිරීමට භාවිත කළ හැකි චිකාකෘතික හෝ අතිශය සරල කළ නියෝජන මෙවැනි තෝරාගැනීම්වලට ඇතුළත් විය හැකි ය. කතුවරයාගේ, නිෂ්පාදකයාගේ හෝ මාධ්‍යවේදියාගේ/ වාර්තාකරුවාගේ මුල් අභිප්‍රාය එවැන්නක් නොවන්නට ඉඩ තිබේ. ඇතැම්විට එය ප්‍රතිග්‍රාහකයාගේ (නරඹන්නා, පාඨකයා හෝ ශ්‍රාවකයා) අර්ථකථනය

කරගන්නා ආකාරය විය හැකි ය. කථකයන් ගැටුම්, වෛර ප්‍රකාශ සහ වෙනස්කොට සැලකීම සම්බන්ධ උපකරණයක් ලෙස ක්‍රියාකරන්නේ නම්, ඔවුන් සිය ක්‍රියා සඳහා වගකිව යුතු බව තාර්කික වේ. එමෙන්ම, අදහස්වල හා අන්තර්ගතයේ විවිධත්වය සහ බහුත්වය අන්තර්ජාතික මට්ටමින් පිළිගනු ලැබූවකි. නියෝජනය පිළිබඳ සැලකිලිමත් මගින් විවිධත්වය අධෛර්යමත් නොවීමටත්, ආරක්ෂිත භාෂණයේ පරාමිති තුළ බහුත්වයක් ක්‍රියාත්මක වීමටත් ඒ අතර සමතුලිතතාවක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

අන්තර්ගත සපයන්නන් ක්‍රියාත්මක වන්නේ සමාජ සන්දර්භයක් තුළ බවත් ඔවුන් වීම සමාජ සන්දර්භය තුළ සමාජ ක්‍රියාකාරීන් බවත් අප විසින් ද අවබෝධ කර ගත යුතු ය. සමාජය විසින් ඔවුන් මත බලපෑමක් ඇති කරනු ලබන අතර ඔවුහු ද පෙරළා සමාජයට බලපෑම් කරති. විශේෂිත පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් ක්‍රියාත්මක වන විශේෂිත ජාතික සන්දර්භය පිළිබඳව ගැඹුරින් විමසා බැලීමක් අවශ්‍ය වේ.

අප තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඇති කර ගැනීමට නම්, අනුරූප හෝ නියෝජන අධ්‍යනය කිරීමත්, අනුරූප හා චීවායේ අඩංගු පෙළ පමණක් නොව චීවායේ ආඛ්‍යාන සන්දර්භය මෙන්ම, එවැනි අන්තර්ගත මැදිකරගත්, ඇතැම් විට අපගේ ඇසට හසු නොවන බල සබඳතා ද විශ්ලේෂණය කිරීමත් අවශ්‍ය වේ. මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාරවලට සමාජයට අභියෝග කිරීමට විශාල බලයක් පවතින අතරම, අප විසින් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමකින් තොරව සාමාන්‍යයෙන් පිළිගනු ලබන විවිධ වෘතාන්ත සහ නියෝජන ඉදිරිපත් කිරීම මගින්, ඔවුන් හරහා සමාජයත්, එහි බල සබඳතාත් පිළිබිඹු කරන බව හඳුනා ගැනීම බොහෝ සෙයින් වැදගත් වේ.

විවිධ කලාපවල සිටින බොහෝ අන්තර්ගත සපයන්නන් අන්තර්ග්‍රහණීය සහ විවිධත්වයෙන් යුතු අන්තර්ගත සහ ප්‍රාරම්භ වෙනුවෙන් තමන් බැඳි සිටින බව පෙන්නුම් කිරීම තහවුරු කරනු පිණිස ස්වේච්ඡා විවිධත්ව සංග්‍රහ (voluntary diversity codes) වැඩි දියුණු කර තිබේ. ජාතිය, වාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව, ලිංගික අනුස්ථාපනය, ශාරීරික හැකියාව හෝ වෛවාහක තත්ත්වය මත පදනම් වූ අපවාදාත්මක හෝ වෙනස් කොට සැලකීමේ අන්තර්ගත භාවිතය තහනම් කෙරෙන ආචාරධර්ම සංග්‍රහයක් ද බොහෝ දෙනෙක් අනුගමනය කරති.

මෙම මොඩියුලයේ ඇති ප්‍රධාන ගැටලුවලට පහත දෑ ඇතුළත් වේ: වෙනස් කොට සැලකීමේ නියෝජන පිළිගැනීම මගින් ප්‍රතිලාභ ලබන්නේ කවුරුන් ද සහ අලාභ ලබන්නේ කවුරුන් ද? අප විසින් අපව දකින ආකාරය සහ අනන්‍යයන් අපව දකින ආකාරය කෙරෙහි මෙම අනුරූප කවරාකාරයේ බලපෑමක් ඇති කරයි ද? අත්‍යාසන්න අත්දැකීමෙන් එපිට ලෝකය පිළිබඳ අපගේ දැනුමට හා අවබෝධයට එමගින් කවරාකාරයේ බලපෑමක් ඇති කරයි ද? ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ වෙනත් ආකාරයේ විෂමතා සඳහා වන ගම්‍යාර්ථ කවරේ ද?

ඒකක

1 වන ඒකකය:
නිරූපණය යන සංකල්පය

2 වන ඒකකය:
ප්‍රවෘත්ති වාර්තාකරණය සහ අනුරූපවල බලය

3 වන ඒකකය:
විවිධත්වය සහ නිරූපණය පිළිබඳ කර්මාන්ත ආචාර්ධර්ම

4 වන ඒකකය:
රූපවාහිනිය, චිත්‍රපට හා වීඩියෝ, මුද්‍රිත ප්‍රකාශන, ප්‍රවෘත්ති මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ නව තාක්ෂණ

5 වන ඒකකය:
සංගීත වීඩියෝ සහ නිරූපණය

1 වන ඒකකය: නිරූපණය යන සංකල්පය

මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව (MIL) යන්නෙන් අදහස් වන්නේ මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාර ආදිය මගින් ලබා ගන්නා නියෝජන පිළිබඳ විචාරශීලී විශ්ලේෂණයකි: එනම්, පුද්ගලයන්, කණ්ඩායම්, ස්ථාන/ ප්‍රජාවන් හෝ දවසේ ප්‍රවෘත්ති අයිතම පවා විවිධ මාධ්‍ය තුළ සහ තොරතුරු මූලාශ්‍රවල "නැවත-ඉදිරිපත්" කරන හෝ නිරූපණය කෙරෙන ආකාරය යි.

ගැටලු, පුද්ගලයන් සහ ප්‍රජාවන් නිරූපණය තුළ ඇති බලය - සහ දවසේ කතිකාව කෙරෙහි මෙම නිරූපණ ඇති කරවන බලපෑම මෙන්ම අප විසින් අපව දකිනු ලබන්නේ සහ අන්‍යයන්ව දකිනු ලබන්නේ කවරාකාරයට ද යන්න පිළිබඳ විචාරශීලී විශ්ලේෂණයක් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන්නට ඇතුළත් වේ. වසංගත තත්ත්වයකට හෝ සෞඛ්‍ය අර්බුදයකට අප ප්‍රතිචාර දක්වන ආකාරය, මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කරන විට අප විසින් කරනු ලබන වරණය හෝ අපගේ අනන්‍යතා, ප්‍රජාවන් සහ සංස්කෘතිය ගැන අප සිතන ආකාරය හැඩගැස්සවීම ආදිය කෙරෙහි අන්තර්ගත සපයන්නන් සතු බලය අවබෝධ කර ගැනීම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන්නෙන් හැඟවේ.

විවිධ අන්තර්ගත සපයන්නන්ව විශ්ලේෂණයට ලක් කිරීමේ සහ, සියලුම සියලුම අන්තර්ගත සපයන්නන් නිරූපණාත්මක පද්ධති (representational systems) බව හඳුනා ගැනීමේ වැදගත්කම ලෙන් මාස්ටර්මන් ශික්ෂකයන්ට සිහිපත් කරවයි. මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් නිරූපණාත්මක පද්ධති වශයෙන් අප සලකන්නේ නම්, මෙම නිරූපණ නිර්මාණය කරන්නේ කවුරුන් ද යන ප්‍රශ්නය අනවරතයෙන්ම පැන නැගේ. නිරූපණය කිරීම සිදු කරන්නේ කවුද? ලෝකය මේ ආකාර වන්නේ යැයි අපට පවසන්නේ කවුද? ප්‍රකෘති ස්වභාවය වන්නේ ඔවුන් දකින ආකාරය ද? මෙහිදී නිරූපණය කරනු ලබන ලෝකයේ ප්‍රකෘති ස්වභාවය කුමක් ද? එහි ගුණධර්ම සහ ප්‍රධාන උපකල්පන කවරේ ද? එහි 'තථ්‍යතාව' (authenticity) ඇති කිරීමට භාවිතා කරන ශිල්පීය ක්‍රම මොනවාද...? මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල නිරූපණ ඔවුන්ගේ ග්‍රාහක පිරිස් විසින් කියවා ගනු ලබන්නේ, අවබෝධ කර ගනු ලබන්නේ කෙසේ ද? අදාළ පෙළ අනුව, ග්‍රාහක පිරිස ලෙස අපි ස්ථානගත වන්නේ කෙසේ ද? පවතින විවිධ අර්ථකථන මොනවාද...? ආදී වෙනත් ප්‍රශ්නද අනිවාර්‍යයෙන්ම පැන නැගේ. (උපුටාගැනීම Masterman, 2010)

සෑම විටම මෙන්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ විචාරශීලී විශ්ලේෂණයක දී අපගේ ක්‍රියා සහ චර්යා, අපගේ දැනුම සහ අවබෝධය, අපගේ සිතිවිලි සහ හැඟීම්, තමා පිළිබඳ හැඟීම, සහ අන්‍යයන් සමග වන අපගේ සම්බන්ධතාව කෙරෙහි සියලුම ආකාරයේ නිරූපණ බලපාන්නේ කෙසේ ද යන්න ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් විසින් විමසුමට ලක් කර සිටීම අවශ්‍ය කෙරේ. නිරන්තරයෙන්ම ප්‍රධාන ධාරාවේ අන්තර්ගතයේ කොටසක් නොවන වෘතාන්ත සහ පර්යාවලෝක නිර්මාණය කිරීමට සහ හඳුනාගැනීමට පුරවැසියන්ට හැකියාව ලබා දීමෙන්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සංවාදය, විවිධත්වය, සමානාත්මතාව සහ අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනය කිරීමෙහි ලා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

බොහෝ අවස්ථාවන්හි දී, විවිධ අන්තර්ගත සපයන්නන් මගින් පෙන්නුම් කෙරෙන නිරූපණ විවිධත්වය, අවධාරණය කරනු ලබන ඒකාකෘති සහ අතිශයින් සරල කළ නිරූපණ මත පදනම් වේ. මෙම අතිශය සරල කිරීම කරණ කොට ගෙන, ගැටලුවක්, පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් නිවැරදිව හෝ පූර්ණ වශයෙන් නිරූපණය නොවන ලක්ෂණ කිහිපයක් පමණක් ප්‍රේක්ෂකයන්ට ඇතැම් අවස්ථාවල දී පෙන්වනු ලැබේ. මෙවැනි ආකාරයේ පටු යොමුවීමක් නිරන්තරයෙන්ම නිරූපණයන්ට එපිට පවතින සාරවත්භාවය හෝ සංකීර්ණත්වය හඳුනා ගැනීමෙන් හෝ අවබෝධ කර ගැනීමෙන් අපව වළක්වනු ලැබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් පක්ෂපාතී වීම් ඒකාකෘතිවල බොහෝ සුලභ ආකාරයන් අතර දක්නට ලැබේ. එවැනි නිරූපණයක් ලෝක ජනගහනයෙන් අඩක් පමණ මාධ්‍ය තුළ අදර්ශනය කිරීමට මග පාදන බැවින් මෙය අනර්ථදායක බලපෑමකින් යුතු වේ. මෙම මාතෘකාව පිළිබඳ සිදු කළ දීර්ඝතම පර්යේෂණයක් වන ගෝලීය මාධ්‍ය අධීක්ෂණ ව්‍යාපෘතිය (Global Media Monitoring Project) විසින් සොයාගනු ලැබුවේ, "2010 වර්ෂයේ දී සිදු වූ ආකාරයටම, 2015 වර්ෂයේ දී ත් පුවත්පත්, රූපවාහිනී සහ ගුවන්විදුලි ප්‍රවෘත්තිවල ඇසුණු, කියවීමට ලක් වූ හෝ දකිනා ලද පුද්ගලයන් අතරින් කාන්තා නියෝජනය 24%ක් පමණක්" බවයි[64]. දේශපාලනය සහ රජය සම්බන්ධ ප්‍රවෘත්ති සම්බන්ධයෙන් ගත් විට

මෙකී පරතරය වඩා සැළකිය යුතු අගයක් ගන්නා අතර එහිදී මෙම වෘත්තාන්තවල සිටින පුද්ගලයන්ගෙන් 16% ක් පමණක් වන ප්‍රමාණයක් කාන්තාවන් මගින් නියෝජනය කරනු ලැබේ.

අපගේ ගෝලීය ගම්මානය වන බහු සංස්කෘතික භූ දර්ශනය තුළ, අපගේ ලෝකයේ සමාජ හා සංස්කෘතික නිර්මිතිය සකස් කරනු ලබන පුද්ගලයන්, කණ්ඩායම් සහ ප්‍රජාවන්ගේ විවිධත්වය විවිධ අන්තර්ගත සපයන්නන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ සවිඥානිකව සිටීම මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවයේ කොටසක් බවට පත් වේ.

ප්‍රධාන මාතෘකා

- මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම්වල පවතින ඒකාකෘති
- අන්තර්ගත සපයන්නන්ගේ නිරූපණ තුළ විවිධත්වය, සමසාධාරණත්වය සහ අන්තර්ග්‍රහණය ඇතුළත්ව තිබීමේ වැදගත්කම
- අන්තර්ගත සපයන්නන්ගේ නිරූපණ මගින් සන්දේශ සහ වටිනාකම් සැල කළ හැක්කේ කෙසේ ද
- ප්‍රේක්ෂකයන් කෙරෙහි නිරූපණ මගින් ඇති කරන බලපෑම
- නිරූපණය තුළ නියෝජ්‍යත්වයේ භූමිකාව
- විවිධත්වය, සමසාධාරණත්වය සහ අන්තර්ග්‍රහණය සහතික කරනු වස් ප්‍රතිපත්තිවල කාර්යභාරය

ඉගෙනුම් අරමුණු

- සංස්ථාන ලෙස අන්තර්ගත සපයන්නන්ගේ නිරූපණ විශ්ලේෂණය කිරීම
- අන්තර්ගත සපයන්නන්ගේ නිරූපණ ප්‍රේක්ෂකයන් කෙරෙහි ඇති කරන බලපෑම තක්සේරු කිරීම
- විවිධත්වය, සමසාධාරණත්වය සහ අන්තර්කරණය කෙරෙහි ප්‍රතිපත්තිමය තීරණවල බලපෑම තක්සේරු කිරීම
- මාධ්‍ය තුළ විවිධත්වයට දායක වන අන්තර්ගත සපයන්නන්ගේ නිරූපණවල ලක්ෂණ හඳුනා ගැනීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- ඔබ භාවිත කරන අන්තර්ගතයේ හෝ ඔබ පිවිසෙන පුළුල් මාර්ගගත අවකාශ තුළ පවතින ජාතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ පන්තිවල කවරාකාරයේ නිරූපණ දැක්වෙන්නේ ද? ඔබ මේවා දකින්නේ ඒකාකෘතික නිරූපණයක් ලෙසද නැතහොත් විවිධත්වයෙන් යුත් නිරූපණ ලෙස ද? භාවිත කර ඇති දර්ශන හෝ භාෂාව මගින් ඒකාකෘති ශක්තිමත් කිරීම හෝ බිඳ දැමීම සිදුවන්නේ කෙසේ ද?
- මාධ්‍ය තුළ (උපස්ථිති / අදෘශමාන) ඔබට දක්නට ලැබෙන්නේ කවරාකාරයේ ලිංග සමාජභාවිත ද, සහ ඒ කවර භූමිකා (ඒකාකෘති) තුළ ද?
- පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, ප්‍රකාශන සමාගම් ආදියෙහි සේවය කරන වෘත්තිකයන් සම්මුඛ සාකච්ඡාවට ලක් කරන්න. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ අන්තර්ගතයේ විවිධත්වය පිළිබඳ ප්‍රතිපත්ති එම ආයතන තුළ පවතින්නේ දැයි සොයා බලන්න. ආරක්ෂිතව තබා ගත යුත්තේ, ප්‍රමුඛත්වය ලබා දිය යුත්තේ, ප්‍රවර්ධනය කළ යුත්තේ සහ ප්‍රකාශයට පත් කළ යුත්තේ කවර තොරතුරුදැයි ඔවුන් තීරණය කරන්නේ කෙසේ ද? තිරසර සංවර්ධන අරමුණක් (SDG 5) වශයෙන් ඔවුන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්නේ ද?

64. Global Media Monitoring Project, https://whomakesthenews.org/wp-content/uploads/who-makes-the-news/Imported/reports_2015/highlights/highlights_en.pdf.

- අන්තර්ගතයේ "අනෙකා" පිළිබඳ ආකෘතික නිරූපණ බොහෝ විට; ලිංගිකත්වය, විදේශීය, භයානක, හාස්‍යජනක සහ අනුකම්පා සහගත යනා දී විශේෂිත කාණ්ඩවලට අයත් වේ. මෙකී නිරූපණ අද කෙතරම් සුලභ ද? මෙහි ලැයිස්තුගත කර නොමැති, එහෙත් අන්තර්ගත තුළ දක්නට ලැබෙන වෙනත් කාණ්ඩ තිබේ ද? මෙම නිරූපණ යම් විශේෂිත ලිංග සමාජභාවිත කණ්ඩායම් (කාන්තා, පිරිමි සහ LGBTQI+ ඇතුළුව) සමග සම්බන්ධයක් පවතින්නේ ද?
- මෙම නිරූපණ ගොඩනගා ඇත්තේ කෙසේද? තෝරාගෙන ඇති තාක්ෂණික අංග මොනවාද? ඔවුන් අන්තර්ගතය සවිමත් කරන්නේ කෙසේද?
- මෙම නිරූපණ මගින් ලබා දෙනු ලබන සන්දේශය කුමක්ද? මෙම සන්දේශය පිළිගනු ලබන්නේ නම් ප්‍රතිලාභ ලබන්නේ කවුරුන් ද? අලාභ ලබන්නේ කවුරුන් ද?
- ඒකාකෘති බිඳ දමන හෝ ඒවාට එරෙහිවන සහ පුද්ගලයකු හෝ කණ්ඩායමක වඩාත් සංකීර්ණ නිරූපණයක් ලබා දෙන ප්‍රධාන ධාරාවේ මාධ්‍ය හෝ විකල්ප මාධ්‍යවලින් උදාහරණ සොයා ගැනීම කොතරම් පහසු ද? ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය, සුළුතර කණ්ඩායම්, සහ ඔබ විසින් උනන්දුවක් දක්වන වෙනත් මාතෘකා සම්බන්ධයෙන් විමසීම. ඔබ සොයා ගන්නේ මොනවා ද?
- ඔබ භාවිත කරන හෝ නිර්මාණය කරනු ලබන අන්තර්ගතයේ අදහස්වල විවිධත්වයක් කොතරම් දුරට පවතින්නේ ද? මෙය එසේ විය හැක්කේ ඇයි? පවතින අදහස් විශේෂිත ප්‍රේක්ෂකයන් කෙරෙහි කුමන බලපෑමක් ඇති කරයි ද? විශේෂ අදහස් නොමැතිවීමෙන් ඇති වන බලපෑම කුමක්ද?
- මාර්ගගතව හෝ ඔබගේම මාධ්‍යයක සහ ඩිජිටල් අන්තර්ගත නිර්මාණ තුළ ඔබව "නිරූපණය" කෙරෙන්නේ කෙසේ ද යන්න තීරණය කිරීමේ දී ඔබ සලකා බලන සාධක කවරේ ද? කුමන සාධක වැදගත් වන්නේ ද යන්න ඔබ තීරණය කරන්නේ කෙසේ ද?
- අපගේ විශ්ව ගම්මානයේ විවිධත්වය, සමසාධරණත්වය, අන්තර්ග්‍රහණය සහ සාධාරණ නියෝජනය යන මූලධර්ම ඇතුළත් මාධ්‍ය වේදිකාවක ලක්ෂණ විස්තර කරන්න. එවැනි වේදිකාවක විභව භාවිත සහ බලපෑම් කවරේ ද?

ඇගයීම සහ නිර්දේශ

- රචනා, දේශන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් / නැරඹුම්
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- තොරතුරු-අධ්‍යාපන-සන්නිවේදන ද්‍රව්‍ය සම්පාදනය (උදා: පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු ප්‍රස්තාර, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්ස්)
- නිරූපණ සඳහා උදාහරණ වශයෙන් අන්තර්ගත සපයන්නන්ගේ පඨිත විශ්ලේෂණය
- නිශ්චිත මාධ්‍ය නිරූපණ සඳහා වන ග්‍රාහක පිරිස කවුරුන් ද යන්න නිර්ණය කිරීම පිණිස ආකෘතියක්, වගුවක් හෝ ඇගයුම් මෙවලමක් වැඩි දියුණු කිරීම
- ග්‍රාහක පිරිස කෙරෙහි ඇති වන ප්‍රධාන බලපෑම් මෙන්ම වර්තමානයේ ප්‍රමුඛ මාධ්‍ය නිරූපණ විස්තර කෙරෙන වදන්-සිතියමක් (word-map) හෝ වර්ඩ්ල් ක්‍රීඩාව (Wordle) සමගින් වන මාධ්‍ය සන්දේශ සහිත කොලාජ් පුවරුවක්
- අපගේ විශ්ව ගම්මානයේ විවිධත්වය, සම සාධරණත්වය, අන්තර්ග්‍රහණය සහ සාධාරණ නිරූපණය යන මූලධර්ම ඇතුළත් කරන ලද අන්තර්ගත සපයන්නකු සඳහා වූ දළ සැලැස්මක් වැඩි දියුණු කිරීම. සැලැස්ම මගින් එවැනි වේදිකාවක පවත්නා විභව භාවිත සහ බලපෑම ද ගෙනහැර දැක්වීමට පුළුවන.

2 වන ඒකකය: ප්‍රවෘත්ති වාර්තාකරණය සහ අනුරූපවල බලය

කාලසීමාව: පැය 3යි

ප්‍රධාන මාතෘකා

- සිද්ධි අධ්‍යයනය: ප්‍රවෘත්ති වාර්තාකරණය සහ අනුරූපවල බලය
- ආපදා නිරූපණය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී නිරූපණය

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- විශේෂිත සිදුවීම් ආශ්‍රිත ප්‍රවෘත්ති ආවරණය කිරීම්වල නිරූපණ විශ්ලේෂණය කිරීම
- ප්‍රධාන ධාරාවේ මාධ්‍යවල දක්නට ඇති නිරූපණවලට විකල්ප නිරූපණ සපයනු ලබන ප්‍රවෘත්ති වාර්තාකරණ පරීක්ෂා කිරීම
- ග්‍රාහක පිරිස් සහ නිරූපණය වන විෂය කෙරෙහි නිරූපණවල බලපෑම තක්සේරු කිරීම
- මාධ්‍ය හා ඩිජිටල් වේදිකා සහ අනෙකුත් තොරතුරු පද්ධතිවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ නිරූපණ විශ්ලේෂණය කිරීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- විශේෂ ආපදා හෝ ඛේදවාචකයන් හි දී ඇතැම් සිදුවීම් මාධ්‍ය තුළ ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඇතැම් මාධ්‍ය විචාරකයන් සිය ප්‍රවේදිතා පළ කර ඇත

    - වර්තමාන සිදුවීම් සහ ගැටලු පිළිබඳ මාධ්‍ය ආවරණය පරීක්ෂා කර, මෙම ප්‍රවේදිතා කෙතරම් දුරට වලංගු දැයි තක්සේරු කරන්න.

- ඛේදවාචකයකින් හෝ ආපදාවකින් පෞද්ගලිකව පීඩාවට පත් වූ පුද්ගලයන්ගේ අනුරූපවලට දක්වන ප්‍රතිචාර සාකච්ඡා කරන්න. මිනිසුන්ගේ පෞද්ගලිකත්වය සහ අභිමානය ආරක්ෂා කරගනිමින් සිද්ධිවල චිත්තවේගීය බලපෑම විස්තර කිරීමට ප්‍රධාන ධාරාවේ සහ විකල්ප මාධ්‍යවල සේවය කරන මාධ්‍යවේදීන් විසින් භාවිත කරනු ලබන උපායමාර්ග පිළිබඳව පර්යේෂණ කර ප්‍රත්‍යවේක්ෂණය කරන්න.
- මිනිසා විසින් සිදු කරනු ලබන්නා වූ හෝ ස්වභාවික ආපදා වැනි ප්‍රධාන සිද්ධියක ප්‍රවෘත්ති ආවරණය පිළිබඳ පර්යේෂණ කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදු කරන්න. මෙම සිද්ධි අධ්‍යයනය ප්‍රවෘත්ති ආවරණයෙන් ලබා ගන්නා අනුරූප සහ මෙම සිදුවීම් හා සම්බන්ධිත පුද්ගලයන් සහ ගැටලුවල නිරූපණය කිරීම් කේන්ද්‍ර කරගත යුතුය. මෙම සිදුවීම්වල ප්‍රධාන ධාරාවේ මාධ්‍ය ආවරණය තුළ හෝ

සමාජ මාධ්‍යය තුළ පළ වූ අනුරූප සොයා ගැනීමට ශික්ෂකයන්ට අන්තර්ජාලය සෝදිසි කළ හැකි ය. මාධ්‍ය ආවරණය සහ රූප විස්තරාත්මකව විශ්ලේෂණය කිරීමට පහත ප්‍රශ්න භාවිත කළ හැක:

- මාර්ගගත ප්‍රවෘත්ති අඩවිවල, රූපවාහිනියේ සහ පුවත්පත්වල ආවරණය කිරීම් තුළ නිරූපණය කර ඇත්තේ කවරක් ද යන්න විස්තර කරන්න. වඩාත් බහුලව භාවිතා කරන ලද අනුරූප හඳුනා ගන්න. කැමරා කෝණ භාවිතය, ඡායාරූපයක සංයුතිය, රූගත කිරීමේ ආකාරයන්, දර්ශනවල/ඡායාරූපවල පෙන්වනු ලබන්නේ කවුරුන් ද හෝ කවරක් ද යන්න සහ කවුරුන් හෝ කවරක් බැහැර කර තිබේද යන්න සැලකිල්ලට ගනිමින් මෙම ඉදිරිපත් කිරීම් ගොඩනගා ඇති ආකාරය පරීක්ෂා කරන්න.
- මෙම අනුරූප භාවිතයෙන් ලබා දෙන්නා වූ සන්දේශය කුමක්ද? මෙම අනුරූප මගින් කියැවෙන්නේ කවරාකාරයේ වෘත්තාන්තයක් ද? මෙම රූප සුවිශේෂී වීමට ඇති විභවතාව තක්සේරු කරන්න. මෙම අනුරූප මගින් ග්‍රාහක පිරිස කෙරෙහි ඇති කරන්නේ කවාරාකාරයේ බලපෑමක් ද? විෂය පිළිබඳ නරඹන්නාගේ අවබෝධය හෝ නරඹන්නාට විෂය හා ඇති සම්බන්ධය කෙරෙහි අනුරූපවල බලපෑම සලකා බලන්න.
- අනුරූපවල අඩංගු නොවන සිද්ධි පිළිබඳ තොරතුරු මතකයේ රැකෙනු ඇත්ද නොරැකෙනු ඇත්ද යන්න සාකච්ඡාවට බඳුන් කරන්න. දෘශ්‍ය ස්වරූපය නොගන්නා වෙනත් තොරතුරු 'මකා දැමීමට' අනුරූප සතු බලය විමසන්න. අවබෝධිත පුරවැසිභාවය උදෙසා මෙහි ඇති ගම්‍යාර්ථ කවරේ ද?

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම

ජාත්‍යන්තර සංවර්ධන ආයතන (එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි), සිවිල් සිවිල් සමාජ සංවිධාන මෙන්ම ජාතික සහ කලාපීය රාජ්‍ය පද්ධතිවල න්‍යාය පත්‍ර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගැටලු වැඩි වැදගත්කමක් ගෙන තිබේ. තිරසර සංවර්ධන අරමුණ අංක 05 මගින් "ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ළඟා කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම" අපේක්ෂා කෙරෙන අතර කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට බලපාන විවිධ ගැටලු ආවරණය කෙරෙන පරිදි ඉලක්ක නවයක්[65] ඊට ඇතුළත් වේ. 1995 තරම් ඈත කාලයකට දිව යද්දී, කාන්තාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සිව්වන ලෝක සමුළුවේදී සම්මත කර ගන්නා ලද බීජිං ප්‍රකාශනය සහ ක්‍රියාකාරී වේදිකාව (The Beijing Declaration and Platform for Action) මගින් සෑම අවකාශයක් තුළ දී ම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සතු ප්‍රධාන කාර්යභාර්ය ඉස්මතු කර දක්වන ලදි. විශේෂයෙන්ම "මාධ්‍ය තුළ කාන්තා ඒකාකෘතිකරණයට සහ සියලුම සන්නිවේදන පද්ධතිවලට ඔවුන්ගේ ප්‍රවේශයේ සහ සහභාගී වීමේ විෂමතාවට" එරෙහිව සටන් කිරීමට එක්ව කටයුතු කරන ලෙස සියලුම පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබිණි.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2010 ජූලි මාසයේ දී එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN Women) පිහිටුවන ලදි. මෙය එවැනි අභියෝගවලට මුහුණ දීම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනයයි. මෙම ඓතිහාසික පියවර ගැනීම තුළින් එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍ය විසින් ඉතා ප්‍රබල ගෝලීය සන්දේශයක් නිකුත් කරන ලදි. සන්දේශය වූයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ සංවිධානයේ අරමුණු අභ්‍යන්තරික වශයෙන් සහ සංවිධානයේ සාමාජික රාජ්‍ය තුළ ළඟා කර ගැනීම කඩිනම් කළ යුතු බවයි[66]. යුනෙස්කෝව (UNESCO) සිය සියලුම කාර්යයන් හි දී ප්‍රමුඛත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවට (Priority Gender Equality) සංකල්පය (ප්‍රමුඛත්වය අප්‍රිකාවට (Priority Africa) සංකල්පය ද ඇතුළුව) හඳුනාගනියි.

65. SDG 5, Achieve gender equality and empower all women and girls https://sdgs.un.org/goals/goal5. Accessed on 10 December 2020.

66. UN Women, https://www.unwomen.org/en

- බීජිං ප්‍රකාශනයේ අරමුණු, තිරසර සංවර්ධන අරමුණු සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාර වැනි අන්තර්ගත සපයන්නන්ගේ කාර්යභාර්ය අවධාරණය කිරීමේ පැහැදිලි අවශ්‍යතාවක් පවතී. අන්තර්ගත සපයන්නන්ට ඔවුන් සතු වන ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදී ප්‍රතිචාර දැක්වීම් (gender sensitive responsiveness) කාර්යක්ෂමව තක්සේරු කළ හැක්කේ කෙසේ ද, සහ සිවිල් සමාජයට පෙරළා මෙම ප්‍රතිචාර දැක්වීම් ඇගයුමට ලක් කළ හැක්කේ කෙසේ ද? අන්තර්ගත සපයන ආයතන පාලනය කරනු ලබන්නේ කවුරුන් විසින් ද? අන්තර්ගත සපයන්නන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී අන්තර්කරණීය ආකාරයෙන් ක්‍රියාත්මක විය යුත්තේ ඇයි? ඒකාකෘතිමය ආකාරයෙන් කාන්තාවන්, පිරිමින් සහ සුළුතර කණ්ඩායම් දැක්වෙන කරන නිරූපණවලට ආමන්ත්‍රණය කිරීම ඒවා නිරාකරණය කිරීම සඳහා අන්තර්ගත සපයන්නන් කටයුතු කළ යුත්තේ කෙසේ ද? අන්තර්ගත සපයන්නන් යනු හුදෙක්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතාව සම්බන්ධ අර්ථය සම්ප්‍රේෂණය කරන්නන් ද නැතහොත් තොරතුරු සහ දැනුම නිර්මාණයට සබල කරන්නා වූ ද, එහි ප්‍රතිඵල ගුණනය කරන්නා වූ ද, බීජිං ප්‍රකාශනය සහ ඉහත සඳහන් කළ අනෙකුත් අරමුණු මෙහෙයුම්කරණය කිරීමේ ඒකාබද්ධ හවුල්කරුවන් ද? ඔවුන් සැබවින්ම ඊට හවුල්කරුවෙකු වන්නේ නම්, මෙම සැපයුම්කරුවන්ට මෙකී භූමිකාව කාර්යක්ෂමව ඉටු කළ හැක්කේ කෙසේද? වැනි ප්‍රශ්න පන්ති සාකච්ඡාවක දී විමසන්න.

වසර ගණනාවක් පුරා පාර්ශ්වකරුවන් ගෝලීය වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම ආමන්ත්‍රණය කිරීම සඳහා මාධ්‍ය සංවර්ධනය සහ ඩිජිටල් වේදිකා පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබෙන නමුදු ප්‍රගතිය ඉතා මන්දගාමී ය. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාවකින් යුත් චර්යා ප්‍රවර්ධනය කළ හැකි ය. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් අන්තර්ගත පරිසර පද්ධතියේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදිතාවකින් යුතු කාර්යඵල තක්සේරු කිරීමට සහ ඒවාට සහභාගී වීමට අවශ්‍ය නිපුණතාවලින් (දැනුම, කුසලතා සහ ආකල්ප) ග්‍රාහක පිරිස් (පාඨකයන්, නරඹන්නන්, ශ්‍රාවකයන් සහ අන්තර්ගත නිර්මාණකරුවන්) සන්නද්ධ කරනු ලැබේ.

- පහත සඳහන් ප්‍රශ්නවලින් කිහිපයකට පිළිතුරු සැපයීම සඳහා කුඩා සමීක්ෂණයක් සිදු කරන ලෙස ශික්ෂකයන්ගෙන් ඉල්ලා සිටින්න: මාධ්‍ය ආයතන ඔබේ රට තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කරන්නේ ද? ඔවුන් මෙය සිදු කරමින් සිටින්නේ කෙසේ ද? ඔවුන් එසේ සිදු කරන බව දැක්වීමට ඇති සාක්ෂි මොනවාද? හැකි නම් නිශ්චිත උදාහරණ සපයන්න. ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති ආමන්ත්‍රණය කිරීමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවට දායක වීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් ලබා ගත හැකි සහය කවරාකාර වේ ද? ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගැටලු සම්බන්ධයෙන් ඔබගේ රට සහ ප්‍රජාවන් තුළ පවතින දේශීය සංවර්ධන වැඩසටහන් කවරේ ද? මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පවතින අභියෝගවලින් කිහිපයක් දක්වන්න? විවිධ ස්ත්‍රී පුරුෂ සමාජභාවී කණ්ඩායම්වලින් - කාන්තාවන්, පිරිමින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතර කණ්ඩායම් (LGBTQI+) අදහස් විමසීම , නියෝජනය කිරීම කොතෙක් දුරට සිදු කෙරේ ද? ඔවුන්ව නිරූපණය කරනු ලබන්නේ කවර නම් වූ අකාරයකින් ද? මෙම ව්‍යාපෘති සඳහා විවිධ අන්තර්ගත සපයන්නන් කෙතරම් දුරට සම්බන්ධ වී සිටින්නේ ද? මාධ්‍ය සහ තොරතුරු තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගැටලු එක් කිරීමට සහ කාන්තා නියෝජනය ඉහළ නැංවීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව භාවිත කළ හැකි යැයි ඔබ සිතන නිර්මාණාත්මක ක්‍රම කවරේ ද? මෙම ප්‍රශ්නද ඇතුළුව වෙනත් ප්‍රශ්න, පර්යේෂණ අත්දැකීම්, මනා පරිචයන් ඇසුරින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව, සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සැලකිල්ලට ගැනීමේ දී නිර්දේශ ඉදිරිපත් කරන්න. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව පිළිබඳ ඔබගේ පුද්ගලික අදහස් කවරේ ද? මාධ්‍ය සහ අනෙකුත් තොරතුරු මූලාශ්‍ර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී නිරූපණ පිළිබඳ ඔබේ අර්ථකථනයට ඔබේම අදහස් සහ අත්දැකීම් කෙසේ බලපාන්නේ ද?

කාන්තාවන් සහ මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාර වැනි අන්තර්ගත සපයන්නන් සම්බන්ධයෙන් ප්‍රධාන පර්යාලෝක දෙකක් පවතී. මින් එකක් මෙම ආයතනවල සේවය කරන කාන්තාවන්ගේ තත්ත්වය සම්බන්ධයෙන් වන අතර අන්තර්ගතයෙන් දැක්වෙන කාන්තාවන්, ගැහැණු ළමයින් සහ අනෙකුත් ලිංග සමාජභාවිත කණ්ඩායම් හෝ ඒවා මගින් ආවරණය කෙරෙන ඔවුන්ගේ ප්‍රතිරූප අනෙක් පර්යාලෝකය වේ.

- 2015 ගෝලීය මාධ්‍ය අධීක්ෂණ ව්‍යාපෘතිය (Global Media Monitoring Project 2015) සහ ප්‍රවෘත්ති මැදිරිය (Newsroom) තුළ කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ ගෝලීය වාර්තාවේ අනාවරණ (මෙම ඒකකයේ අවසානයේ ඇති මූලාශ්‍ර ලැයිස්තුව බලන්න) හෝ කාන්තාවන් සහ අන්තර්ගත සපයන්නන් සම්බන්ධ වෙනත් අදාළ පර්යේෂණ සලකා බලන්න. පහත ප්‍රශ්න ඕනෑම ගණනක් සාකච්ඡාවට බඳුන් කරන්න: තනිව සහ සාමූහිකව ගත් කළ මෙම අනාවරණවල ගම්‍යාර්ථ කවරේ ද? බහුලව දක්නට ලැබෙන කාන්තා ප්‍රතිරූප කවාරාකාර ද? මෙම ප්‍රතිරූප කුමන සමාජ, ආර්ථික, සංස්කෘතික සහ දේශපාලනික සාධක භාවිතය කෙරෙහි පවතින පෙළඹවීම විය හැකි ද? මෙය සැලකිල්ලක් දැක්වීමට හේතුවක් (cause of concern) විය යුතු ද? ඔබගේ රජය මෙම ඍණාත්මක ප්‍රතිරූප ආමන්ත්‍රණය කිරීමට පියවර ගත යුතුද? එසේ කළ යුතු බව ඔබේ අදහස නම්, වැඩි දුර පැහැදිලි කරන්න. මෙම කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා සිවිල් සමාජය විසින් ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද? ආණ්ඩු හෝ වෙනත් බාහිර ආයතනවලින් නීති පැනවීම් වෙනුවට අන්තර්ගත සපයන්නන් ස්වයං-නියාමනය හරහා ක්‍රියාත්මක වීම වඩා යෝග්‍ය වන්නේ යැයි ඔබ සිතන්නේ ද? යම් ආකාරයක රජයේ නියාමනයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් පවතී ද? පැහැදිලි කරන්න. රජයේ නියාමන සහ බාහිර අධීක්ෂණය අවශ්‍ය වන්නා වූ අන්තර්ගත ගැටලු සම්බන්ධ සිද්ධි පවතී. මෙම සිද්ධි මොනවාද? පෞද්ගලික අන්තර්ගත සපයන්නන්ට වඩා රජයෙන් අරමුදල් සැපයෙන අන්තර්ගත සපයන්නන් (publicly funded content provider) සඳහා මෙම නියාමන වෙනස් විය යුතු ද? මාධ්‍ය ඇතුළුව රජයෙන් අරමුදල් සැපයෙන අන්තර්ගත සපයන්නන් හට ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම සහතික කිරීමට විශේෂ වගකීමක් ඇතැයි ඔබ සිතනවා ද? ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඔබව සවිබලගන්වා තිබේ ද? කෙසේ ද? ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව පිළිබඳ ඔබේ පෞද්ගලික අදහස් මොනවාද? මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාර ඇතුළු අන්තර්ගත සපයන්නන් ලෙස වැඩි වශයෙන් කාන්තාවන් සේවය කරන්නේ නම්, පිරිමි සමග සසඳා බැලූ විට කාන්තාවන්ගේ ප්‍රතිරූපය වෙනස් වේ දැයි ඔබ සිතන්නේ ද? ඔබ එසේ සිතන්නේ ඇයි? මේ සම්බන්ධයෙන් පර්යේෂණ මගින් කුමක් ප්‍රකාශ කෙරේ ද?

ස්ත්‍රී විරෝධය, මාර්ගගත හිංසනය සහ කාන්තා මාධ්‍යවේදිනියන්ට හිරිහැර කිරීම්වල ඉහළ යාමක් දක්නට ලැබේ. පහත දැක්වෙන මාධ්‍යවේදීන්ගේ අන්තර්ජාතික සන්ධානයේ (International Federation of Journalist) ගෝලීය සමීක්ෂණයේ[67] 2018 වර්ෂයේ අනාවරණ සලකා බලන්න:

- අනාවරණවලින් පෙනී යන්නේ ප්‍රතිචාර දැක්වූ කාන්තාවන්ගෙන් 64% ක් මාර්ගගතව සිදු කරන අපයෝජනවලට මුහුණ පා ඇති බවයි.
- මරණ තර්ජන හෝ ස්ත්‍රී දූෂණ තර්ජන, අපහාස, කාර්යයේ අවතක්සේරු කිරීම, ස්ත්‍රීරෝෂාත්මක ප්‍රකාශ, අසභ්‍ය රූප යැවීම, සයිබර් හිංසනය, සයිබර් අවකාශය හරහා කිසිවකු ලුහුබැඳීම (cyber stalking) සහ ගිණුම් පරපුද්ගලායනය (account impersonation) ආදී වශයෙන් මාර්ගගත හිංසනය විවිධාකාර වේ.
- මාර්ගගතව සිදු කරන හිරිහැර කිරීම්වලට ලක් වූ අය අතුරින්, කාන්තාවන්ගෙන් 47%ක් ප්‍රකාශ කර සිටියේ ඔවුන් එම අපයෝජන වාර්තා නොකළ බවත්, එසේ කළද වාර්තා කළේ ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ මාධ්‍ය කළමනාකාරිත්වයට (40%) බවත් ය.
- තවත් කණගාටුදායක ප්‍රතිඵලයක් වූයේ, අපයෝජනයට ලක් වූ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (63%) මෙවැනි විවේචන මගින් කාංසාව හෝ ආතතිය වැනි මානසික බලපෑම් ඇති වූ බවත්, 38% ක් ස්වයං-වාරණයක් පනවා ගත් බවත් පවසා සිටි අතර 8%ක් සිය රැකියා අහිමි කර ගෙන තිබුණු බවට ප්‍රකාශ කිරීමයි.

කාන්තා මාධ්‍යවේදීන්ට මාර්ගගතව සිදු කරනු ලබන හිංසන සම්බන්ධයෙන් යුනෙස්කෝ සංවිධානය මගින් සිදු කළ ගෝලීය සමීක්ෂණයේ 2020 වර්ෂයේ සොයාගැනීම්[68] සමග මේවා සංසන්දනය කරන්න.

67. https://www.ifj.org/media-centre/reports/detail/ifj-survey-one-in-two-women-journalists-suffer-gender-based-violence-at-work/category/press-releases.html

68. Online violence Against Women Journalists: A Global Snapshot of Incidence and Impacts. United Nations Educational, Scientific and Cultural Organization Authors: Julie Posetti, Nermine Aboulez, Kalina Bontcheva, Jackie Harrison, and Silvio Waisbord (2020). https://unesdoc.unesco.org/ark:/48223/pf0000375136

- සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ කාන්තා මාධ්‍යවේදිනියන්ගෙන් 73%ක් සිය සේවය අතරතුර දී මාර්ගගතව සිදු කරනු ලබන හිංසනයන්ට මුහුණ දී තිබුණි.
- 25%කට ශාරීරික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ තර්ජන එල්ල විය.
- 18%කට ලිංගික ප්‍රචණ්ඩත්වය සිදු කෙරෙන බවට තර්ජනය කිරීම් සිදු කර ඇත.
- 20%ක් මාර්ගගත ප්‍රචණ්ඩත්වය සම්බන්ධව මාර්ග අපගත ආකාරයෙන් විවේචනවලට ලක් වී ඇති බව වාර්තා විය.

- දත්ත තුළ කවරාකාරයේ සමානතා සහ විෂමතා දක්නට ලැබෙන්නේ ද? ශික්ෂකයන්ට අනුව කාන්තා මාධ්‍යවේදිනියන් කෙරෙහි වන එදිරිවාදිකම මෙසේ ඉහළ යාම සඳහා වන හේතු කවරේ ද? සමීක්ෂණ දෙකෙහිම නිර්දේශ විමසා බලා, මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේ ද, කවුරුන් විසින් ද, සහ කුමන අධීක්ෂණ යාන්ත්‍රණයක් සමග ද යන්න පිළිබඳ පෝස්ටර් හෝ දර්ශන සැලසුම් සාරාංශ (storyboards) නිර්මාණය කිරීමට ශික්ෂකයන්ට මග පෙන්වන්න. අධ්‍යයන දෙකම සිදු කිරීමට භාවිත කළ ක්‍රමවේදය විමසීමට ශික්ෂකයන්ට මග පෙන්වන්න. විශ්වසනීයත්වය සහ වලංගුභාවය අත්කර ගැනීම සඳහා දැඩිව ක්‍රියාත්මක කර ඇති නීතිරීති පිළිබඳ ඔවුන් තෘප්තිමත් ද? මෙම පදවල අර්ථය සොයන්න. ශාස්ත්‍රීය පර්යේෂණ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 3 වන මොඩියුලය බලන්න. එම ගෝලීය සමීක්ෂණ දෙකෙහිම සීමා සාකච්ඡාවට බඳුන් කරන්න.

  - "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම යනුවෙන් අදහස් වන්නේ මනුෂ්‍යත්වය පිළිබඳ සැලකිල්ලක් දක්වන විෂයක් ආමන්ත්‍රණය කිරීමයි. පක්ෂග්‍රාහී නිරූපණ, ඒකාකෘති, අගතීන් සහ ගැහැණු ළමුන්ට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය යන්නෙන් පරිවර්තනයක් සිදු කිරීම අදහස් කෙරෙන අතර, එමගින්, අවසන් වශයෙන් අපගේ සමාජයන්හි ප්‍රවේදිතා පූර්ණ ලෙස පිළිබිඹු වන ආකාරයෙන් මෙම ප්‍රචණ්ඩත්වය මාධ්‍ය මගින් ආවරණය කෙරෙනු ඇත. [...] මෙම ගැටලුව තවදුරටත් නිරන්තරයෙන්ම පහත් තත්ත්වයකට ඇද හෙළා ඇති තත්ත්වයක් තුළ, මෙම නිහඬතාව බිඳ හෙළීමට මෙන්ම එය පෞද්ගලික අවකාශයෙන් ඉහළට ඔසවා තැබීමට උපකාර කිරීමේ හැකියාව ජනමාධ්‍යවේදීන් සතු වේ.[69]"
  - ඉහත ප්‍රකාශය පිළිබඳව ශික්ෂකයන් විසින් ශිෂ්‍යයන් සමග සාකච්ඡා හසුරුවීම සිදු කළ යුතු ය. කායික හා ලිංගික ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇති කාන්තාවන්, පූර්ව ප්‍රසව අවධියේ දී දරුවාගේ ස්ත්‍රී පුරුෂ භාවය තේරීම හේතුවෙන් අහිමි වූ ගැහැණු දරුවන්, ස්ත්‍රී ජනනේන්ද්‍රී චර්මඡේදනය අත්විඳී කාන්තාවන් පිළිබඳ යුනෙස්කෝ මූලාශ්‍රය වන කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාකරණය: ජනමාධ්‍යවේදීන් සඳහා අත්පොතෙහි (https://unesdoc.unesco.org/ ark:/48223/pf0000371524) 08 වන පිටුවේ දැක්වෙන සංඛ්‍යාලේඛන බලන්න. ශික්ෂකයන් විසින් පහත ප්‍රශ්න විමර්ශනය කිරීම සහ විමසීම සිදු කළ යුතු ය. ඔවුන්ගේ දේශීය මාධ්‍ය විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා කරන්නේ ද? ඔවුන්ගේ දේශීය මාධ්‍ය සතුව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා කිරීම සම්බන්ධ අභ්‍යන්තර ප්‍රතිපත්ති පවතී ද? ඒ පිළිබඳව සොයා දැනගැනීමට ශිෂ්‍යයන්ට හෝ ශික්ෂකයන්ට සිය දේශීය මාධ්‍ය සම්බන්ධ කර ගැනීමට හැකි ද? ඩිජිටල් සන්නිවේදන සමාගම් සම්බන්ධයෙන් ශික්ෂකයන් සහ ශිෂ්‍යයන්ට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?
  - ක්‍රියාවලිය විමර්ශනය කිරීමේ දී ශික්ෂකයන්ට සිය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ නිපුණතා භාවිත කිරීමට මග පෙන්වන්න. ඔවුන් සිය අනාවරණ මාර්ගගත ප්‍රජාවද ඇතුළත්ව, තම ප්‍රජාවන් තුළ අනෙකුත් අය සමග බෙදා ගත යුතු ය. මාධ්‍ය ප්‍රතිපත්ති සහ අන්තර්ගතය පිළිබඳ වැඩි විස්තර සඳහා පහත මූලාශ්‍ර බලන්න. සන්නිවේදන ප්‍රතිපත්ති සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවී න්‍යායපත්‍රය සැකසීම: මාධ්‍ය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගෝලීය සන්ධානයෙන් නව යෝජනා, https://unesdoc.unesco.org/ark:/48223/ pf0000368962.locale =en

ආබාධ සහිත පුද්ගලයන්, ස්වදේශීය ජනයා, සුළුතර ජනවාර්ගික කණ්ඩායම් සහ අභ්‍යන්තරිකව පිහිටි දිළිඳු නගර හෝ ග්‍රාමීය ප්‍රජාවන් වැනි ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් වෙනුවෙන් ද, ඉහත ස්ත්‍රී

69. Extract from "Reporting on Violence against Women and Girls: A Handbook for Journalists. Impe, AM.(2019). https://unesdoc.unesco.org/ark:/48223/pf0000371524. (Ed. Mirta Lourenco). UNESCO, Paris.

පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ක්‍රියාකාරකම්වලට සමාන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට ශික්ෂකයන් සැලකිල්ලක් දැක්විය යුතු ය. මෙම නිරූපණ නිර්මාණය කරනුයේ කෙසේ ද සහ කා සඳහා ද යන්න අවබෝධ කර ගැනීම පිණිස, සහ මෙවැනි නිරූපණ පිළිගනු ලබන්නේ නම් කවුරුන් ප්‍රතිලාභ ලබන්නේ ද යන්න, සහ ප්‍රතිඵලයක් වශයෙන් කවුරුන් හට අනර්ථයක් සිදු වේ ද යන්න ප්‍රශ්න කිරීම සඳහා මාධ්‍ය තුළ මෙකී කණ්ඩායම් පිළිබඳ නිරූපණ විමසීමට ලක් කිරීම අරමුණ බවට පත් විය යුතු ය.

ඇගයීම සහ නිර්දේශ

ප්‍රවෘත්ති වාර්තාකරණයේ දර්ශන විශ්ලේෂණය සහ ඇගයීම - තාක්ෂණික/සැලසුම් සංරචක ඇතුළුව

- මාතෘකාව පිළිබඳ වෙනත් මෑත කාලීන අධ්‍යයන සහ වාර්තා විමසීමට ලක් කර ඒවා පිළිබඳව සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සිදු කළ හැකි කටයුත්තක් සැලසුම් කරන්න. ඔබේ කටයුත්තේ බලපෑම මැන බැලිය හැක්කේ කෙසේ ද යන්න නිරවුල්ව දැක්වීමට වගබලා ගන්න.
- අවබෝධිත පුරවැසිභාවය වැඩි දියුණු කිරීම සඳහා මනාව දායක වන වාර්තාකරණ ක්‍රියාපටිපාටි හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම
- දර්ශන මගින් ග්‍රාහක පිරිස මත ඇති කෙරෙන බලපෑම තක්සේරු කිරීම.

3වන ඒකකය: විවිධත්වය සහ නියෝජනය පිළිබඳ ආයතනික සංග්‍රහ

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාර වැනි අන්තර්ගත සපයන්නන් සඳහා වන සංග්‍රහ (codes) සහ ආචාරධර්ම (ethics)
- සංග්‍රහ සහ රෙගුලාසිවලට අදාළ විවිධ මාධ්‍ය තක්සේරු කිරීම් සඳහා සංග්‍රහ යොදා ගැනීම්

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- විවිධ අන්තර්ගත ආයතන සඳහා වන විවිධත්වය සහ ආචාරධර්ම සංග්‍රහ පරීක්ෂා කිරීම
- මාධ්‍ය අනුරූප සහ පෙළ ගණනාවකට සංග්‍රහ සහ ආචාරධර්ම ආදේශ කර බැලීම; ස්ථාපිත සංග්‍රහ සහ ආචාරධර්ම මත පදනම්ව මාර්ගගත සහ මාර්ග අපගත ආකාරයෙන් පෙළ තක්සේරු කිරීම
- මෙම සංග්‍රහවල අරමුණ සහ ඵලදායීත්වය තක්සේරු කරන්න
- විවිධ අන්තර්ගත සපයන්නන් සඳහා වන සංග්‍රහ සහ ආචාරධර්ම සඳහා යෝජනා/ වෙනස් කිරීම් නිර්දේශ කරන්න

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව

සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

රජය විසින් මාධ්‍ය නියාමනය කරනු ලැබීම වැළැක්වීමේ අවශ්‍යතාව මගින්, විවිධ කලාපවල පවතින මාධ්‍ය කර්මාන්ත තුළ ස්වේච්ඡා විවිධත්ව සංග්‍රහ (voluntary diversity code) වැඩි දියුණු කිරීමට මග පාදා ඇති අතර, එමගින් මෙම කර්මාන්ත විසින් අන්තර්ග්‍රහණීය සහ විවිධත්වයෙන් යුතු අන්තර්ගත සහ මුල් පිරීම් කෙරෙහි බැඳියාවක් දක්වනු ලබන සහතික කිරීම අදහස් වේ. ජාතිය, ජනවර්ගය, වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ශාරීරික හැකියාව හෝ වෛවාහක තත්ත්වය මත පදනම් වූ අපවාදාත්මක හෝ වෙනස් කොට සැලකීමේ ද්‍රව්‍ය භාවිතය තහනම් කෙරෙන ආචාරධර්ම පද්ධතියක් බොහෝ කර්මාන්ත විසින් ද අනුගමනය කෙරේ. ඇතැම් ඩිජිටල් සන්නිවේදන සමාගම් සතුව ප්‍රජා ප්‍රමිති පැවතියේ වුවද, ඒවා බල ගැන්වීමට ප්‍රමාණවත් ලෙස වියදම් නොකිරීම සම්බන්ධයෙන් ඔවුන්ට නිරන්තර විවේචන එල්ල වේ. සංස්කෘතික අනුයෝජනය (cultural appropriation) සහ නිරූපණය පිළිබඳ කරුණු මෙන්ම අන්තර්ග්‍රහණය සහ සමානාත්මතාව පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ද පුස්තකාල හෝ කෞතුකාගාර සිය ප්‍රතිපත්ති ක්‍රමයෙන් දියුණු කරමින් පවති.

- ඔබගේ කලාපයේ පවතින ව්‍යවහාර සංග්‍රහය/ආචාරධර්ම මාර්ගෝපදේශ විමසා බලන්න. ඒවා මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාරවලට අදාළ කරගත හැකි ය. මෙම ව්‍යවහාර සංග්‍රහ නිර්මාණය සඳහා වගකිව යුතු වන්නේ කවුරුන් දැ යි හඳුනාගන්න. එහි අන්තර්ගත කර ඇති ප්‍රධාන ක්ෂේත්‍ර සාරාංශ ගත කර ඒවායේ අරමුණ පැහැදිලි කරන්න. පුරවැසියන්ගේ සහ පාරිභෝගිකයන්ගේ උනන්දුවට ඉන් ලැබෙන රුකුල කවරාකාර ද? මෙම රෙගුලාසි සම්බන්ධිත ආයතන මත කුමන ආකාරයේ බලපෑමක් ඇති කරයි ද?
- ප්‍රවෘත්ති වාර්තාකරණය, අන්තර්ගත සංවර්ධනය සහ පූර්ව අභ්‍යාසවලින් සිදු කෙරෙන ප්‍රචාරණ (disseminations from previous exercise) තුළ නිරූපණ සඳහා ව්‍යවහාර සංග්‍රහ යොදා ගන්න. රෙගුලාසි අනුගමනය කෙතරම් දුරට කෙරෙන්න්දැයි යන්න තක්සේරු කරන්න. ඔබගේ පැවරුම තුළ පෙළ සහ සන්දර්භය යන දෙකම සලකා බැලීමට වග බලා ගන්න. ඔබගේ පිළිතුරට සහාය දැක්වීම පිණිස මාධ්‍ය ආවරණය තුළින් නිශ්චිත උදාහරණ දෙන්න. අන්තර්ගතය රෙගුලාසි උල්ලංඝනය කරන අවස්ථා වල දී, පුද්ගලයන්ට ඒ සම්බන්ධයෙන් ගත හැක්කේ කුමන ආකාරයේ ක්‍රියාමාර්ග යක් ද?
- මෙම සංග්‍රහ මගින් ආවරණය වන විවිධ අන්තර්ගත සපයන්නන්ගේ අනෙකුත් ක්ෂේත්‍ර පරීක්ෂා කරන්න (උදා: වෙළෙඳ ප්‍රචාරණය තුළ ඒකාකෘති සහ ලිංගිකත්වය ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවී නිරූපණය). රෙගුලාසි කෙතරම් දුරට අනුගමනය කරන්නේද යන්න තක්සේරු කරන්න. ඔබ විසින් මෙම පෙළට අදාළ ආයතන සහ/හෝ නිෂ්පාදකයන් වෙත ලබා දිය හැකි ප්‍රතිපෝෂණ ගෙනහැර දක්වන්න.

ඇගයීම් සහ නිර්දේශ

- මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාරය වැනි විවිධ අන්තර්ගත සපයන්නන් විසින් මෙම විවිධත්ව සංග්‍රහ/ ආචාරධර්ම යොදා ගැනීම් ආශ්‍රිත ප්‍රධාන ක්ෂේත්‍රවල සාරාංශයක්. ඒ සම්බන්ධ සමාජ මාධ්‍යජාල කටයුත්තක් හෝ මාර්ග අපගත ප්‍රජා කටයුත්තක් සැලසුම් කරන්න. ඔබේ කටයුත්තේ බලපෑම මැන බැලිය හැක්කේ කෙසේ ද යන්න නිරවුල්ව දැක්වීමට වගබලා ගන්න.
- සංග්‍රහ සහ ආචාරධර්මවලට කළ හැකි වෙනස් කිරීම්/ එකතු කිරීම් සඳහා වන නිර්දේශ.

4වන ඒකකය: රූපවාහිනිය, චිත්‍රපටය සහ මුද්‍රිත ප්‍රකාශන

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- විශේෂාංග චිත්‍රපටි සහ නියෝජනය
- මුද්‍රිත ප්‍රකාශනවල නියෝජනය
- චිත්‍රපට සහ රූපවාහනි කර්මාන්තය, ප්‍රජාව සහ ස්වදේශික වෘතාන්ත

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- වත්මන් රූපවාහිනි වැඩසටහන් සහ විශේෂාංග චිත්‍රපටවල සාර්ථකත්වය පරීක්ෂා කිරීම
- චිත්‍රපට, රූපවාහිනිය සහ මුද්‍රිත ප්‍රකාශනවල (පොත් ඇතුළුව) නියෝජනයන් තක්සේරු කිරීම
- චිත්‍රපට සහ/හෝ රූපවාහිනිය සඳහා කථාවස්තුවක් දැක්වෙන ලේඛනයක් (treatment) වැඩි දියුණු කිරීම
- ජාල කාලසටහනක (network schedule) රූපවාහිනී වැඩසටහන් ස්ථානගත කිරීම පරීක්ෂා කිරීම
- වෙළඳ ප්‍රචාරණයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවී නිරූපණය විශ්ලේෂණය කරන්න
- නිරූපණ තුළ භාවිත වන තාක්ෂණික උපායමාර්ග විශ්ලේෂණය කරන්න
- රූපවාහිනියේ සහ චිත්‍රපටිවල විකල්ප, දේශීය වෘතාන්ත අධ්‍යයනය කරන්න

වෙනත් අන්තර්ගත ආකාර අතර චිත්‍රපට

පසුගිය වසර සියයක කාලය තුළ චිත්‍රපටය යනු ලොව පුරා විශාල ප්‍රේක්ෂක සමූහයක් සහිත, ප්‍රබලතම මාධ්‍යයන්ගෙන් එකකි. මෑත කාලයේ දී, රූපවාහිනිය සහ ඉන් අනතුරුව මාර්ගගත ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණ ද ලෝකයේ බොහෝ ප්‍රදේශවල විශාල ජනතාවක් වෙත පැතිර ගොස් ඇත. ඒ අතරම, පොත් මාර්ගගත හා මාර්ගගත නොවන දෙයාකාරයෙන්ම අදහස් සහ තොරතුරුවල සැලකිය යුතු මූලාශ්‍රයක් ලෙස පවතී. කතන්දර කීමෙන් සහ ජාතික ඉතිහාසයේ විශේෂිත අනුවාදයන් ප්‍රවර්ධනය කිරීමෙන් සමාජයක් විසින් එකී සමාජය තේරුම් ගන්නා ආකාරය හැඩගැස්වීමේ දී සියලු දෙනාටම සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකිය. මේවා මගින් අප ජීවත් වන ලෝකය පිළිබඳ අපගේ අවබෝධය හැඩගස්වනු ලබන්නේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවයේ වැදගත් කොටසක් බවට පත් වේ.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- මෑත කාලීන ප්‍රධාන චලන චිත්‍රවල සාර්ථකත්වය පිළිබඳ පර්යේෂණ කිරීමට අන්තර්ජාලය භාවිත කරන්න. දේශීයව හෝ ජාත්‍යන්තරව බොක්ස් ඔෆිස් අතිසාර්ථකත්වයක් අත්කරගත් චිත්‍රපට පහක ලැයිස්තුවක් සාදන්න. හැකි නම්, මෙම සෑම චිත්‍රපටයකම පූර්ව ප්‍රචාරක පටය මාර්ගගතව නරඹන්න,

නැතහොත් එක් චිත්‍රපටයක් තෝරා එය සම්පූර්ණයෙන්ම නරඹන්න. කථා සන්දර්භයේ කේන්ද්‍රීය නිරූපණය කවුරුන් ද හෝ කුමක් ද යන්න විස්තර කරන්න. මෙම නිරූපණය ප්‍රේක්ෂකයන්ගේ සිත් ඇද ගන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

- එකම ඓතිහාසික සිදුවීම් නිරූපණය කෙරෙන විවිධ අනුවාද හඳුනා ගන්නා ලෙස ශික්ෂකයන්ගෙන් ඉල්ලා සිටින්න., සැලකිල්ලට ගන්නා කාලසීමාව තුළ සහ ඒ ආශ්‍රිතව ප්‍රකාශයට පත් කළ පොත්; විවිධ ශානරවලින් නිර්මාණය කරන ලද චිත්‍රපට; කලා කෘති හෝ පින්තූර; ඡායාරූප සහ සංගීත වීඩියෝ වැනි වෙනත් ඕනෑම දර්ශනයක් උදාහරණ ලෙස සැලකිය හැකි ය. කෞතුකාගාරයක් හෝ ලේඛනාගාරයක් (ඔබගේ කලාපයේ මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ආයතනයක් තිබේ නම්) වෙත පිවිස මෙම කාරණය මත පදනම්ව සහ ඔබගේ නිරීක්ෂණ පිළිබඳ රචනයක් සැලසුම් කිරීමට කරුණු එක් රැස් කරන්න.
- ඔබේ රට පිළිබඳ ලියැවුණු ඕනෑම පොතක් හෝ ලිපියක් තෝරා ගන්න. එය ඔබේ ප්‍රජාව, සංස්කෘතිය හෝ විශේෂිත සිදුවීමක් ගැන විය හැකි ය. තෝරාගත් විෂයේ විවිධ පැතිකඩ නිරූපණය කෙරෙන ආකාරය හඳුනා ගන්න. ඔබ මෙකී නිරූපණ සමග එකඟ වන්නේ ද? එසේ වන්නේ හෝ නොවන්නේ මන්ද? සාකච්ඡාවට බඳුන් කරන්න.
- ඔබගේ රටෙහි අන්තර්ජාලය හෝ රූපවාහිනී මාධ්‍ය තුළ පවතින ශ්‍රව්‍ය දෘශ්‍ය වෙළඳ දැන්වීම්වල එකතුවක් ලබාගන්න. මෙම වෙළඳ දැන්වීම්වල කාන්තාවන් සහ පිරිමින් යන දෙපාර්ශ්වයම දැක්වෙන වන බව සහතික කරගන්න. කුඩා කණ්ඩායම් වශයෙන්, වෙළඳ දැන්වීම්වල පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන් නිරූපණය කර ඇත්තේ කෙසේ ද යන්න සාකච්ඡාවට බඳුන් කරන්න. ඔබේ නිරීක්ෂණ කිහිපයක් ලියන්න. මෙම නිරූපණවලින් කිහිපයක විභවීය ගම්‍යාර්ථ සාකච්ඡාවට බඳුන් කරන්න. කණ්ඩායමේ ඇතැම් සාමාජිකයන් විසින් ඇතැම් නිරූපණ වෙනස් අකාරයකට දකින්නේ ද? මෙය එසේ වන්නේ යැයි ඔබ සිතන්නේ මන්ද?
- ජනප්‍රිය විශේෂාංග චිත්‍රපටයක සැකැස්ම 'වීර සංචාරයක්' පිළිබඳ පුරාකෘතික මිථ්‍යා ප්‍රබන්ධයක් කේන්ද්‍රීය කරගත්තකි. සංස්කෘතියක බිය, ආශාවන් සහ අභිලාෂයන් ප්‍රකාශ කෙරෙන ගම්‍ය විශ්වාස පද්ධති මිථ්‍යා ප්‍රබන්ධ මගින් නිරූපණය කෙරේ. මෙම වෘතාන්තවල දී, සිය දෛවය ගැන දැනීමක් නොමැති වීරයාගෙන් (සාමාන්‍යයෙන් පුරුෂයකු වන) වැදගත් ගවේෂණයක යෙදීම අපේක්ෂා කෙරේ. ඔහුගේ 'උපත' හෝ ආරම්භය, ඔහුට කරන 'ඉල්ලීම' හෝ දෛවය ගැන දැනුවත් වීම, ප්‍රේමය අත්විඳීම, සතුරන් මුණගැසීම, ප්‍රඥාවන්ත වැඩිහිටියෙකුගෙන් උපදෙස් ලබා ගැනීම සහ අවසානයේ පෙරළා නිවසට පැමිණීම ඇතුළු අදියර කිහිපයක් වීරයා සාමාන්‍යයෙන් ගවේෂණයේ කොටසක් ලෙස පසු කරයි.

    - මෙම ප්‍රධාන අන්තර්ගතය මත පදනම් වූ චිත්‍රපට ලැයිස්තුවක් නිර්මාණය කරන්න. ඒවාට ඇති ආකර්ෂණය සඳහා හේතු දක්වන්න. සමාජය තුළ පුද්ගලයකුගේ ආශාවන් සහ වටිනාකම් කෙතරම් දුරට වීරයා විසින් නිරූපණය කෙරෙන්නේ ද යන්න පැහැදිලි කරමින් වීරයාව විස්තර කරන්න.
    - කැමරා කාර්යය මෙන්ම ශබ්දය සහ සංගීතය භාවිතය විස්තර කරන්න. මෙම තාක්ෂණික අංග මගින් වෘත්තාන්තයට කේන්ද්‍රීය වන නිරූපණ තහවුරු කරන්නේ කෙසේද යන්න තක්සේරු කරන්න. (උදා: එනම් දුෂ්ටයෙකු හෝ ප්‍රේමණීය වීරයෙකු පිළිබඳ ඇතිකරවන හැඟීම). උදාහරණයක් ලෙස, සිනමා පටයේ ශබ්දපථය වෙනස් වූයේ නම්, චිත්‍රපටයේ විශේෂිත දර්ශනවල අර්ථය කෙසේ වෙනස් වේ දැයි පහදන්න.

- වාණිජමය අතින් අති සාර්ථක වූ චිත්‍රපටවලට විකල්ප නිරූපණය කෙරෙන ප්‍රධාන ධාරාවේ, ස්වදේශීය හෝ ප්‍රජා මාධ්‍ය වෙබ් අඩවි වෙත පිවිසෙන්න. මෙම සමාගම් හෝ සංවිධාන මගින් කියාපාන තෝරාගත් වෘතාන්ත පිරික්සා බලන්න. ප්‍රධාන චිත්‍රාගාර විසින් සම්පාදනය කරනු ලබන වෘතාන්ත සමග මෙම වෘතාන්ත සංසන්දනය කරන්න. නිරූපණ සිදු කිරීමේ දී හෝ විකල්ප, ස්වදේශීය වෘතාන්ත සම්බන්ධයෙන් අදහස් පළ කිරීමේ දී මෙම 'ස්වාධීන' සංවිධානවල වටිනාකම තක්සේරු කරන්න.

අපගේ අරමුණ වන්නේ චිත්‍රපට සහ රූපවාහිනිය තුළ නිරූපණය කෙරෙන විවිධ පර්යාලෝකවල විවිධත්වයක් ලබා ගැනීමයි. තිරයේ දක්නට ලැබෙන දෘෂ්ටි කෝණ සංඛ්‍යාව වැඩි වීම තුළින් කිසිවකුගෙන් කිසිවක් ඉවත් කිරීමක් සිදු නොවේ. ඇත්ත වශයෙන්ම, එමගින් වඩා හොඳ වැඩසටහන්කරණයකට, තිරය මත නව දර්ශනවලට මග පාදනු ලබයි.

-ජොආන් පෙනිෆාදර්, ප්‍රථම කාන්තා සභාපතිනිය - ජාතික චිත්‍රපට මණ්ඩලය, කැනඩාව
1993 මාර්තු 29 දින, මැක්ලීන් හි දී

- සිය නරඹන්නන්ට සහ මානව ප්‍රගතියට ඇති සම්බන්ධතාව කෙරේ චිත්‍රපට සහ රූපවාහිනි කර්මාන්තයේ වන වගවීම සාකච්ඡාවට බඳුන් කරන්න. සියලුම නරඹන්නන් හට තිරය මත ඔවුන්ව සහ ඔවුන්ගේ වෘතාන්ත දැකගැනීමට හැකි විය යුත්තේ ඇයි? ප්‍රධාන ධාරාවේ වෘතාන්ත සහ විවිධ ග්‍රාහක පිරිස් සඳහා වන නිරූපණය ගම්‍යාර්ථ සාකච්ඡාවට බඳුන් කරන්න. විශේෂ වූ නාලිකා, විවිධ අන්තර්ජාල වෙබ් අඩවි, බ්ලොග් සහ නව තාක්ෂණික ශිල්පක්‍රම වෘතාන්ත කලාවට සහ ග්‍රාහක පිරිසට විකල්ප නිරූපණ ඉදිරිපත් කිරීමේ දී බලපෑම් කරන්නේ කෙසේ ද යන්න විමසන්න.

ඇගයීම් සහ නිර්දේශ

- රූපවාහිනි වැඩසටහන් සහ විශේෂාංග චිත්‍රපට පිළිබඳ වත්මන් උදාහරණ විශ්ලේෂණය කිරීම
- තාක්ෂණික උපායමාර්ගවල සහ අන්තර්ගතය හා නිරූපණය පිළිබඳ වූ ආකෘතියේ බලපෑම තක්සේරු කිරීම
- විකල්ප, ස්වදේශීය වෘත්තාන්ත සැපයීම පිණිස ජාතික චිත්‍රපට සංවිධාන සහ ස්වාධීන නිෂ්පාදන සමාගම් පරීක්ෂා කිරීම සහ තක්සේරු කිරීම.

5 වන ඒකකය: නිරූපණය සහ සංගීත වීඩියෝ

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- සංගීත වීඩියෝ සහ නියෝජනය විශ්ලේෂණය කිරීම
- සංගීතය සහ සමාජයීය වෙනස

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- සංගීත වීඩියෝවක් සඳහා දර්ශන සැලසුම් සාරාංශයක් සහ කථාවස්තුවක් දැක්වෙන ලේඛනයක් (treatment) නිර්මාණය කරන්න
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය සහ ලිංගිකත්වය පිළිබඳ නිරූපණ අවධාරණය කරමින් සංගීත වීඩියෝවක් විශ්ලේෂණය කරන්න
- විකල්ප සංගීතයේ නිරූපණය පරීක්ෂා කරන්න
- විකල්ප මාධ්‍ය තුළ නිරූපණ ප්‍රධාන ධාරාවේ ඒවා සමග සංසන්දනය කරන්න.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

- සංගීතය මිනිස් සමාජය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සංගීතය සාමාන්‍යයෙන් විනෝදාස්වාදයක් ගෙන දෙන්නක් ලෙස සලකනු ලැබෙන නමුදු එය බොහෝ ආගමික හා සංස්කෘතික භාවිත තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර නිරන්තරයෙන්ම දේශපාලන ව්‍යාපාර තුළ ද භාවිත කෙරේ. සංගීතය ප්‍රේක්ෂකයන්ට බලපාන ආකාරය අවබෝධ කර ගැනීම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි කොටසකි.
- අන්තර්ජාලය භාවිතා කරමින්, ඔබගේ රටෙහි සහ ජාත්‍යන්තර මට්ටමින් වර්තමානයේ ඉහළින්ම වැජඹෙන නාද සැටහුම් කලාකරුවන්ගේ (recording artists) වීඩියෝ පරීක්ෂා කරන්න. තෝරාගත් සංගීත වීඩියෝවක සන්දේශ සහ වටිනාකම් විශ්ලේෂණය කරන්න (ගීතය සඳහා වීඩියෝව මෙන්ම ගීතයේ පද රචනය ද ලබා ගැනීම මත පදනම්ව). විශ්ලේෂණයට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය:
    - වීඩියෝවේ ඇති රූප ගීතයේ පද රචනයට සහ තනුවට සම්බන්ධ වන ආකාරය සහ පද රචනය පිළිබඳ ශික්ෂකයාගේ අර්ථ නිරූපණයට සම්බන්ධ වන ආකාරය පිළිබඳ විස්තරයක් ඇතුළුව, පදවල අන්තර්ගතය පරීක්ෂා කරන්න.
    - වර්ණ භාවිතය, ආලෝකය, සංස්කරණය (වේග චලිත අනුපාතය, සන්නිධානය, රිද්මය මත සෑම රූප රාමුවක්ම සංස්කරණය කිරීම (cutting on the beat), විශේෂ ප්‍රයෝග සහ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සංරචක අතර සම්බන්ධතාවය සැලකිල්ලට ගනිමින් වීඩියෝවේ තාක්ෂණික සංරචක පරීක්ෂා කරන්න.
    - වෙනත් සමාජ පන්තියක හෝ ජාතියක පුද්ගලයින් ඇතුළත් කෙරුණේ නම්, හෝ පිරිමි සහ ගැහැණු චරිත සිය භූමිකා හුවමාරු කර ගත්තේ නම් එම සන්දේශ කෙසේ වෙනස් විය හැකි වූවා ද යන්න සැලකිල්ලට ගනිමින්, වීඩියෝව හා සම්බන්ධිත සමාජීය ගැටලු පරීක්ෂා කරන්න.
- පහත ප්‍රශ්න මාර්ගෝපදේශකයක් ලෙස භාවිත කරමින් වීඩියෝවක ඉදිරිපත් කෙරෙන දෘෂ්ටිවාදී සහ වටිනා සන්දේශ අර්ථකථනය කරන්න:
    - වීඩියෝව එක් විශේෂිත කණ්ඩායමක විශ්වාස ඉදිරිපත් කරයි ද?
    - වීඩියෝවේ පිරිමි සහ කාන්තාවන්ගේ නිරූපණය විස්තර කරන්න. කිසියම් ඒකාකෘතියක් භාවිත කෙරේ ද? එසේ නම්, ඉන් කොපමණ බලපෑමක් අත් වේ ද?
    - බලය සහිත තනතුරක සිටින්නේ කවුද? බලයක් සතු නොවන්නේ කවුරුන් ද? එහි ප්‍රතිඵලයක් ලෙස කවරෙකු ප්‍රතිලාභ ලබයි ද?
    - වීඩියෝව කිසියම් පුද්ගල කණ්ඩායමක් හෝ ඔවුන්ගේ විශ්වාස බැහැර කරන්නේ ද?
    - සතුට, සාර්ථකත්වය, සදාචාරය පිළිබඳ කුමන නිර්වචන ගම්‍ය වේ ද?
- ඉලක්කගත ග්‍රාහක පිරිස තීරණය කරන්න. මෙම ඉලක්කගත ග්‍රාහක පිරිසෙන් ඔබ්බට වීඩියෝවට කෙතරම් දුරකට ආකර්ෂණයක් සතු වේ දැයි යන්න තක්සේරු කරන්න.
- පරිවර්තනීය වෙනසක් සඳහා මෙවලම් ලෙස ජනප්‍රිය සංස්කෘතියේ සහ සංගීතයේ බලය තක්සේරු කරන්න. දේශපාලන හා සමාජ විවරණ සැපයීමේ දී සහ සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීමේදී සංගීතඥයින්ට සහ කලාකරුවන්ට කෙතරම් දුරකට කිසියම් කාර්යභාර්යක් ඉටු කිරීමට පවතී ද? සමාජීය හා දේශපාලනික අභිප්‍රායන් සමග සම්බන්ධ වූ සංගීතඥයින්ට සහාය දක්වන ඩෙන්මාර්කය පදනම් කරගත් ෆ්‍රීමියුස් සංවිධානයේ (Freemuse Organization) කාර්යභාර්ය පරීක්ෂා කරන්න. ඔවුන්ගේ සංගීතය තුළ කවරාකාරයේ ගැටලු සහ සිද්ධි නිරූපණය කර තිබේ ද? ඉන් කොපමණ බලපෑමක් වේ ද?
- ගීතයක පද රචනය තෝරාගෙන එකී පද රචනයේ සන්දේශය ගෙන යනු ලබන සංගීත වීඩියෝවක් සඳහා මූලික දර්ශන සැලසුම් සාරාංශයක් (storyboard) පිළියෙල කරන්න. පද රචනය නිරූපණය කෙරෙන පින්තූර සැලකිලිමත්ව සලකා බලන්න. මෙම නිරූපණය වැඩි දියුණු කෙරෙන තාක්ෂණික අංග හඳුනාගැනීම සහ තෝරාගැනීම සිදු කරන්න.
- මෙම ගීතය සඳහා වීඩියෝවක් දැනටමත් පවතී නම්, රූපරාමුවල (imagery) සහ ශිල්පීය ක්‍රමවල වෙනස්කම් සහ සමානකම් අවධානයට ලක් කරමින්, සම්පාදිත වීඩියෝව සමග දර්ශනය සංසන්දනය කරන්න.

- අධ්‍යාපනය සහ ක්‍රියාමාර්ග තුළින් මාධ්‍ය තුළ ජාතිවාදය, ලිංගිකත්වවාදය (sexism) සහ ප්‍රචණ්ඩත්වයට අභියෝග කිරීමට කැපවී සිටින මීඩියාවොච් (MediaWatch) (www.mediawatch.org) වැනි සංවිධානයක අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසෙන්න. මෙම සංවිධානයේ සහ ඊට සමාන සංවිධානවල අරමුණු සහ කටයුතු විමර්ශනය කරන්න.

ඇගයුම් සහ නිර්දේශ

- නිරූපණ, තාක්ෂණික අංග, දෘෂ්ටිවාදය සහ වටිනාකම් සහිත සන්දේශ මත පදනම්ව සංගීත වීඩියෝවල වත්මන් උදාහරණ විශ්ලේෂණය කිරීම හා තක්සේරු කිරීම
- තෝරාගත් ගීත පදරචනා සඳහා දර්ශන සැලසුම් සාරාංශ (storyboard) නිර්මාණය කිරීම

මෙම මොඩියුලය සඳහා සම්පත්

මෙහි සඳහන් ඇතැම් මූලාශ්‍ර යෝග්‍ය නොවිය හැකි බැවින් ප්‍රහුණුකරුවන් ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ කලාපය මත පදනම්ව ඔවුන්ගේම මූලාශ්‍ර වැඩි දියුණු කිරීම සිදු කර ඒවා පිළිබඳ පර්යේෂණ කළ යුතුය.

BIRTH, the historical archives of European television: http://www.birth-of-tv.org/birth Cynopsis, free daily news aimed at the television industry – a number of editions are available: www.cynopsis.com

Box Office Guru, American and International box office figures, both current and past, are listed here: http://boxofficeguru.com

Equality in Journalism: Brussels, Belgium at, G., S. (2018). Promoting gender equality through education in India. Gender Parity and Women Empowerment–Challenges and Way Forward, 31-34. doi:10.9756/bp2018.1012/06

Hidden Figures (film, 2016), https://www.imdb.com/title/tt4846340/?ref_=nv_sr_srsg_0

http://portal.unesco.org/ci/en/files/28397/12435929903gender_booklet_en.pdf/gen-der_booklet_en.pdf

Imob, wide range of links to music: recordings, films, technology, production courses: www.imob.com

International Federation of Journalists. (2009). Getting the balance right: Gender

International Women's Media Foundation. (2011). Global Report on Status of Women in the News Media: Washington, DC, USA AT, http://www.iwmf.org/pdfs/IWMF-Global-Report.pdf

Masterman, L. (2010). Voices of Media Literacy with Len Masterman/Interviewer: Dee Morgenthaler. Center for Media Literacy. Retrieved from http //www.medialit.org/ reading-room/voices-media-literacy-international-pioneers-speak-len-mastermaninter view-transcript

Reconstructions, a site launched by members of the MIT Comparative Media Studies community in the days following the events of 11 September 2001: http://web.mit.edu/cms/reconstructions

Sidahmed, A., 2012. The Plight of Female Journalists [online] Doha Center for Media Freedom. Available at: http://www.dc4mf.org/en/content/plight-female-journalists

The Internet Movie Data Base, the most comprehensive site for researching film and television. There is a wealth of information on individual titles, reviews, chat, actors, directors, and genres: www.imdb.com

United Nations Fourth World Conference on Women, Beijing Declaration and Platform for Action (1995) at, http://www.un.org/womenwatch/daw/beijing/platform/

World Association of Christian Communication. (2010). Who Makes the News? Global Media Monitoring Project: Toronto, Canada at, www.whomakesthenews.org

7වන මොඩියුලය:

මාධ්‍ය සහ තාක්ෂණය අන්තර්ගතයට බලපාන්නේ කෙසේ ද?



'භාෂාව වැරදි වැටහීම්වල ප්‍රභවය වේ'

- ඔන්තුවන් ද සැන්-එක්සුපෙරි :1900 - 44)

පසුබිම සහ තාර්කිකය

"මාධ්‍යය සන්දේශය වේ" යන්න 1964 දී මාර්ෂල් මැක්ලුහන් විසින් ලියන ලද්දකී මැක්ලුහන් යනු වර්තමානයේ දී අප විසින් හඳුන්වනු ලබන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව නමැති සංකල්පයෙහි පුරෝගාමියෙකු වේසන්දේශ ලැබෙන ආකාරය කෙරෙහි එහි මාධ්‍යයේ බලපෑම ඇති විය හැකි අතර, ඒ ඒ පරිශීලකයන්/ ග්‍රාහක පිරිස්වලට අදාළ ස්වකීය පසුබිම/ පළපුරුද්ද යන කරුණු ද සන්දේශවල අර්ථ නිරූපණයට බලපානු ලැබිය හැකි ය. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඇති කරගැනීමේ පළමු වැදගත් පියවර වන්නේ මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, පුස්තකාල, ලේඛනාගාර හා කෞතුකාගාර යනා දී විවිධ අන්තර්ගත සපයන්නන් හරහා තොරතුරු, අදහස් සහ අර්ථ ඇතැම් අවස්ථාවල එකිනෙකට වෙනස් අයුරින් සන්නිවේදනය වන ආකාරය අවබෝධ කර ගැනීමයි.

බිත්ති මත හෝ ගල් මත කැටයම් කිරීම, සිප්පි කටු භාවිතය, බෙර හෝ සීනු හෝ මගින් සන්නිවේදනය කිරීම, පත්‍ර හෝ කඩදාසි මත ලිවීම ආදී සන්නිවේදන හෝ තොරතුරු සම්ප්‍රේෂණ ක්‍රම ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැවත එන ලදී. 1455 වර්ෂයේ දී ජොහැන්නස් ගූටන්බර්ග් විසින් මුල්වරට මුද්‍රණ යන්ත්‍රය නිපදවීමත් සමඟ පුවත්පත් සහ පොත් සම්පාදනය සඳහා දොරගුළු විවර වියී ටෙලිග්‍රාෆ් සහ දුරකථනය භාවිතයට පැමිණීම හාඉන් පසු 1901 වර්ෂයේ දී ගුවන් විදුලිය නිපදවීමත් සමඟ එළැඹී ඊළඟ දශක දෙක තුළ මෙකී ක්ෂේත්‍රය තුළ වඩා පරිණත ආකාරයේ සංවර්ධනයක් ඇතවිය. අනතුරුව මෙහි ප්‍රගමනය කෙරෙහි තව දුරටත් හේතු වුයේ, 1927 වසරේ දී රූපවාහිනිය මගින් ශබ්ද සහ රූප යන ද්වීත්වය එකම මාධ්‍යයක් තුළට එක් කිරීම තුළිනි. 1937 දී පරිගණක සංවර්ධනය ආරම්භ විය. එමෙන්ම, 20 වැනි සියවසේ දෙවන අර්ධය තුළ තොරතුරු සහ ඩිජිටල් සන්නිවේදන ක්ෂේත්‍රයේ පරිවර්තන රාශියක් සිදුව ඇත. මෙකී පරිණාමයන් හි පිබිදීමක් සිදු වූයේ දෙවන ලෝක යුද්ධයෙන් පසුව විශාල හෙවත් මේන්ෆ්‍රේම් පරිගණකය (1946) හඳුන්වා දීමත් සමඟ ය. ඒ වූ කල, 1960 දශකයේ අග භාගයේ දී, එකිනෙකට සම්බන්ධිත ජාල (අන්තර්ජාල) බිහිවීමට තුඩු දුන් ප්‍රධානතම සොයා ගැනීම යි. 1990 දශකය වන විට, අන්තර්ජාලය වාණිජමය වශයෙන් භාවිතා කරන ලද අතර එයට පිවිසීමට මාර්ග හෙවත් ක්‍රම ඇති සියලුම පුද්ගලයින් වෙත ප්‍රවේශය විවෘත විය (වෙබ් 2.0). 21 වන ශතවර්ෂයේ ආරම්භය වන විට, අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි වීම මෙන් ම අතුරු මුහුණත් (interfaces) වඩාත් පරිශීලක-හිතකාමී බවට පත් වීම සිදු වූ අතර, ජනතාව අතර සමාජ මාධ්‍ය පුළුල් ලෙස ව්‍යාප්ත විය. ඒ අනුව, නවතම තාක්ෂණික පරිණාමයට අයත් වන්නේ කෘත්‍රිම බුද්ධිය (AI) සහ බ්ලොක්චේන් (blockchain) තාක්ෂණයේ භාවිතය යි.

සෑම මාධ්‍යයක්ම විවිධ ආකාරයේ අන්තර්ගතයන් හි ශීෂ්‍ර වැඩි වීම කෙරෙහි මග පාදා තිබේ. ඒ ඒ සෑම මාධ්‍යයකටම අනන්‍ය වන අයුරින් අර්ථය ප්‍රකාශ කිරීමට ක්‍රියා කරනු ලබන 'භාෂාව' හෝ 'ව්‍යාකරණ' එකිනෙකට වෙනස් වේ. මෙම අර්ථයෙන් ගත් කළ, 'භාෂාව' යන්නෙන් අදහස් කරන්නේ අදහස්, තොරතුරු සහ දැනුම සන්නිවේදනය කිරීම පිණිස තොරතුරු, මාධ්‍ය හා ඩිජිටල් ක්ෂේත්‍රයන්හි වෘත්තිකයන් විසින් තෝරාගෙන භාවිත කරනු ලබන තාක්ෂණික හා සංකේතමයඅංග හෝ කේත හා සම්මුතීන් ය. තාක්ෂණික කේතවලට ශබ්ද, කැමරා කෝණ, රූපරාමු ආකාරයන්, ආලෝකය, වර්ණ, ග්‍රැෆික්ස්, අයිකන, මෙනු, ක්‍රමලේඛන කේත, ඇල්ගොරිදම, ග්‍රැෆික් අන්තර් හුවමාරු ආකෘතීන් (GIFs), මීම් (memes), ඉමෝජි (emojis), ආදිය ඇතුළත් වේ. උදාහරණයක් ලෙස, වෘත්තාන්ත චිත්‍රපටියක් තුළ අනතුරක් සන්නිවේදනය කිරීම සඳහා අසුබ හැඟීම් දනවන සංගීතය ඇතුළත් කළ හැකි අතර, ඡායාරූපයක් තුළ බලය පිළිබඳ හැඟීමක් ඇති කිරීම සඳහා ඉහළ-කෝණගත කැමරා දර්ශන, ඇතැම් ග්‍රැෆික ප්‍රදර්ශනය කිරීමට හෝ අන්තර්ගතය සමඟ අන්තර් ක්‍රියා නිෂ්පාදනය කිරීමට ක්‍රමලේඛන කේත, නොඑසේ නම් හැඟීම් වේගවත්ව හා අතථ්‍යව සන්නිවේදනය කිරීමට ඉමෝජි ද භාවිතා කළ හැකි ය. සංකේතමය කේතවලට භාෂාව, ඇඳුම් පැළඳුම් හෝ චරිතවල ක්‍රියා, හෝ පහසුවෙන් තේරුම් ගත හැකි සංකේතාත්මක කේත ඇතුළත් වේ. නිදසුනක් වශයෙන්, ආදරය ප්‍රකාශ කිරීම සඳහා රතු රෝස මලක් සංකේතාත්මකව භාවිතා කළ හැකි අතර එසේත් නැති නම්, කෝපය සන්නිවේදනය කිරීමට මිට මොළවන ලද හස්තයක් භාවිතා කළ හැකි ය. කෘත්‍රිම බුද්ධි (AI) පද්ධතිවල කෘත්‍රිම කටහඬ සඳහා භාවිත කරන හඬ සහ ස්වර වැනි ඇතැම් කේත ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අසමානතා බලවත් කිරීමට හෝ ඊට ප්‍රතිරෝධය දැක්වීමට ද භාවිත කළ හැකි ය. විවිධ මාධ්‍ය විසින් භාවිත කරන භාෂාවන් තුළ හැඳින්වෙන විශේෂිත වචන, වාක්‍ය ඛණ්ඩ සහ අනුරූප නැවත නැවත භාවිතා කිරීම ද ඇතුළත් විය හැකි අතර, මෙය වාචික හෝ දෘශ්‍ය භාෂාව ලෙස ද හැඳින්වේ. අප විසින් මාධ්‍ය භාෂා අධ්‍යයනය කරන විට, ප්‍රධාන ප්‍රශ්න තුනක් සලකා බැලිය යුතු වේ: එනම්, වර්තමානයේ දී අන්තර්ගත සැපයීමෙහි නිරත පුද්ගලයන් භාවිත කරන ප්‍රධාන කේත සහ සම්මුතීන් මොනවා ද? මෙම භාෂා, ග්‍රාහක පිරිස් හෝ පුරවැසියන් විසින් වටහා ගනු ලබන්නේ කෙසේ ද? විවිධ පුද්ගලයන්ට එකම පෙළ හෝ තොරතුරු බණ්ඩයකින් අසමාන අර්ථයන් ලබා ගත හැකි ද? මෙහි "මාධ්‍ය" යන්නෙන් අදහස් කරන්නේ ආයතන (ස්වකීය සූක්ෂ්මතාවන් එක් කරන්නා වූ) නොව සන්නිවේදනය සඳහා භාවිත කරන තාක්ෂණික වාහකයන් බව සැලකිය යුතු ය.

පරිශීලකයන්ට - පුද්ගලයන්ට සහ සංවිධානවලට - එකිනෙකා වෙත සම්බන්ධ විය හැකි වේදිකාවන්හි ඩිජිටල් සන්නිවේදනය සිදු වේ. සමාජ මාධ්‍යවල පවතින මෙම ගතික පරිසරයට මුහුණුපොත (Facebook) සහ වීකේ (VK) වැනි සමාජ ජාල වෙබ් අඩවි, යූ ටියුබ් (YouTube) සහ විමියෝ (Vimeo) වැනි වීඩියෝ බෙදාගැනීමේ වේදිකා, ටික්ටොක් (TikTok), ඉන්ස්ටග්‍රෑම් (Instagram)" ස්නැප්චැට් (Snapchat) සහ පින්ටරෙස්ට් (Pinterest) වැනි දෘශ්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය බෙදාගැනීමේ වේදිකා, සීනා (Sina) වැනි මයික්‍රොබ්ලොග් සහ වෙයිබෝ (Weibo) සහ ට්විටර් (Twitter) මෙන්ම බ්ලොග් (blogs) සහ විකි (wikis) ද ඇතුළත් වේ.

ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් වර්තමානයේ දී තොරතුරු බෙදා ගැනීමට සහ තොරතුරු සෙවීමට, අදහස් හා නිපැයුම් ප්‍රවර්ධනය කිරීමට, ඉගෙනීමට සහ අන්‍යෝන්‍ය ක්‍රියා සිදු කිරීමට මෙවලම් භාවිතා කරනු ලබයි. ශික්ෂක සහ ශිෂ්‍ය යන දෙපාර්ශ්වයම වෙනස් වීම් පිළිබඳව යාවත්කාලීනව සිටීම, ඒවා අවබෝධ කර ගැනීම මෙන්ම විනෝදාස්වාදය, ඉගෙනීම, සමාජ නියැලීම සහ තීරණ ගැනීම සඳහා මෙවලම් භාවිත කිරීමට හොඳම ක්‍රම නිර්ණය කිරීමේ අභියෝගයට මුහුණ දෙයි.

මෙම මොඩියුලය මගින් විවිධ වර්ගයේ මාධ්‍ය තාක්ෂණික ආකෘති (ඩිජිටල් ඇතුළුව) සන්දේශ සමර්පණය කරන ආකාරය අනුව වෙනස් වන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරනු ඇත. මෙකී මාධ්‍ය විසින් භාවිත කරන භාෂා විලාසයන් පිළිබඳව ද කරුණු ඉන් නිරීක්ෂණය කරනු ඇත. උදාහරණයක් ලෙස, ශ්‍රව්‍ය - දෘශ්‍යය චාලක කැමරාවකට දුවන අශ්වයෙකු සමඟ ඉදිරියට යාමට ඉඩ සලසන නමුත් චිත්‍රපට නිෂ්පාදකයන් මෙම හැකියාව හඳුනාගෙන භාවිත කිරීමට යම් කාලයක් ගත විය. ප්‍රහසන, වාර්තා වැඩසටහන්, “රියැලිටි ටීවී”, කැමරාව ඉදිරිපස සිටගෙන සිටිමින් කරනු ලබන ප්‍රවෘත්ති වාර්තාකරණය (stand-up news), මීම්ස්, නවරැල්ලේ (avant-garde) සහ භාවවාචක (abstract) චිත්‍රපට යනා දී ශානරයන් සංවර්ධනය කිරීමට ද කලක් ගත විය.

තොරතුරු සහ සන්දේශ සමර්පණය කළ හැකි ක්‍රම මෙන්ම, එකී සන්දේශවල තොරතුරු හෝ අදහස් පිළිබඳ අන්තර්ගත සපයන්නන්ගේ ලැබෙන අර්ථ නිරූපණය පුද්ගලයන් විසින් භාවිත කරන භාෂා වර්ගය සමඟ අන්තර් ක්‍රියා කරන ආකාරය පිළිබඳව වඩාත් කල්පනාකාරී විය හැක්කේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීමට හැකියාව ලබා දෙන විවිධ භාෂාවන් සහ ශානරයන් පිළිබඳ දැනුම ලබා ගැනීමට ශික්ෂකයන් පුහුණු කිරීම මෙම මොඩියුලය මගින් අපේක්ෂා කරනු ලැබේ.

ඒකක

1වන ඒකකය :
තොරතුරු සහ මාධ්‍ය පෙළ කියවීම

2වන ඒකකය :
මුද්‍රණ, විකාශන සහ ඩිජිටල් පුවත්

3වන ඒකකය :
ශ්‍රව්‍ය-දෘෂ්‍ය ශානර සහ වෘත්තාන්ත කථනය

4වන ඒකකය :
සමාජ මාධ්‍යවල ඩිජිටල් වේදිකා පිළිබඳ සන්නිවේදනය

1වන ඒකකය: මාධ්‍ය සහ තොරතුරු පෙළ කියවීම

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- මාධ්‍ය සහ තොරතුරු පෙළෙහි කේත සහ සම්මුති පරීක්ෂා කිරීම.
- අර්ථ විශ්ලේෂණය සංකේත සහ දෘශ්‍ය භාෂාව
- මාධ්‍ය සහ තාක්ෂණික භාෂා ගවේෂණය ඡායාරූප සහ වීඩියෝ කොලාජ්

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂක සහ ශිෂ්‍ය යන දෙපාර්ශ්වයටම පහත හැකියාවන් ලබා ගනු ඇත:

- විවිධ මාධ්‍ය සහ තොරතුරු පෙළෙහි අර්ථය ප්‍රකාශ කිරීමට භාවිත කරන කේත සහ සම්මුතීන් හඳුනා ගැනීම
- දේශීය සහ ගෝලීය ප්‍රජාවන් තුළ විවිධ අරමුණු සඳහා භාවිත කරන සංඥා සහ සංකේත හඳුනා ගැනීම්

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාව තුළ (1 කොටසෙහි) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකිය. 1 කොටසෙහි දක්වා ඇති ලැයිස්තුව අධ්‍යයනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යොදා ගත යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

පහත දැක්වෙන ශානරයන්හි භාවිත කෙරෙන තාක්ෂණික සහ සංකේතාත්මක කේත සහ සම්මුතීන් කිහිපයක් ලැයිස්තුගත කරන්න: රූපවාහිනී සෝප් ඔපෙරා, සංචාරක අත් පත්‍රිකා, වාර්තා චිත්‍රපට, පවුල් ප්‍රහසන සහ දේශපාලන වෙළඳ දැන්වීම් මෙම කේත හරහා සමර්පණය කෙරෙන සන්දේශ සහ තොරතුරු මොනවා ද?

- ඔබගේ ප්‍රජාව තුළ, තොරතුරු ප්‍රකාශ කිරීම පිණිස විවිධ අරමුණු සඳහා භාවිත කරන සලකුණු සහ සංකේත හඳුනා ගන්න (උදා: දිශානති, ආකර්ෂණ ස්ථාන ආදිය සඳහා.) ඔබ අයත් ප්‍රජාව තුළ සිටින පුද්ගලයන්ට පොදුවේ තේරුම් ගත හැකි පරිදි මෙම සංඥා සහ සංකේතවල භාවිත වන වාචික සහ දෘශ්‍ය 'භාෂා' විස්තර කරන්න. අකුරු භාවිතය, ශෛලීගත අනුරූප සහ නිර්මාණ සැලැස්ම ආදිය සැලකිල්ලට ගන්න.
- ඔබේ රට හෝ ප්‍රජාව තුළ නිකුත් කෙරෙන විවිධ තැපැල්පත් පරීක්ෂා කරන්න. එක් එක් තැපැල්පතෙහි භාවිත කරනු ලබන ප්‍රධාන සංකේතාත්මක සහ තාක්ෂණික කේත හඳුනා ගන්න. මෙම කේත භාවිතයෙන් ඔබේ රට ගැන සන්නිවේදනය කරනු ලබන තොරතුරු මොනවා ද? අත්හැරී ඇති තොරතුරු මොනවා ද? ඔබ කැමති ස්ථානයක් හෝ සංවිධානයක් සඳහා තැපැල්පතක් නිර්මාණය කරන්නී වැදගත් තොරතුරු ලබා දීමට සහ අපේක්ෂිත හැඟීම ඇති කිරීමට ඔබ භාවිත කරන ප්‍රධාන තාක්ෂණික සහ සංකේතාත්මක කේත මොනවා ද?
- නිශ්චල හෝ වීඩියෝ අනුරූප භාවිත කරමින්, ඔබේ අධ්‍යාපන ආයතනයේ වැදගත්කම විශේෂිත ග්‍රාහක පිරිසකට ප්‍රකාශ කිරීමට අනුරූප කොලාජයක් සාදන්න. මෙම ග්‍රාහක පිරිස සමඟ සම්බන්ධ වීමට සහ කතා කිරීමට සුදුසු අයිකන, සංකේත, දෘශ්‍ය/වාචික භාෂාව, සංගීතය, වර්ණ, කැමරා දර්ශන සහ කෝණ ආදිය භාවිතා කරන ආකාරය සැලකිල්ලට ගන්න. ඉදිරියේ දී ඇතුළත් විය හැකි

සිසුන්, දෙමාපියන්, භාරකරුවන්, දේශපාලනඥයෙකු වැනි අය මෙම කොලාජ් සඳහා ග්‍රාහක පිරිස් ලෙස සැලකිය හැකි ය.

- සමාජ මාධ්‍ය යනු සාමාන්‍යයෙන් ව්‍යාපාරික අරමුණු සඳහා නිර්මාණය කර ඇති ඇල්ගොරිදම මගින් බල ගැන්වෙන, සංවාදය සහ බෙදාගැනීම සඳහා වූ වේදිකාවකි. සමාජ මාධ්‍යවල ප්‍රධාන භාවිතයන්ගෙන් එකක් වන්නේ ලොව පුරා සිටින මිතුරන් සහ නෑදෑයන් සමඟ සබඳතා නොකඩවා පවත්වාගැනීම වන අතර, එය පාරිභෝගිකයන්ට, ආයෝජකයන්ට සහ සේවකයන්ට එකිනෙකා සමග සන්නිවේදනය කිරීමට වේදිකාවක් ද වේ. දැවැන්ත ලෙස හා නිරන්තරව වර්ධනය වන සමාජ මාධ්‍ය අලෙවිකරණ කර්මාන්තය කේන්ද්‍රගත වන්නේ මෙහිදීය. ශිෂ්‍යයන් කුඩා කණ්ඩායම්වලට බෙදන්න. සෑම කණ්ඩායමකටම සමාජ මාධ්‍ය වේදිකාවක් තෝරා ගැනීමට සලස්වන්න. සන්දේශ සන්නිවේදනය කිරීමට සහ සකස් කිරීමට එක් එක් වේදිකාව විසින් භාවිත කරන තාක්ෂණික කේත සහ සම්මුතීන් හඳුනා ගැනීමට එකී වේදිකාව අධ්‍යයනය කිරීමට ඔවුන්ට මග පෙන්වන්න. උදාහරණයක් ලෙස, ට්විටර් (Twitter) හි ට්වීට් (Tweet) එකක් අක්ෂර 240 ඉක්මවිය නොහැකි බව සිතන්න. පහත ප්‍රශ්නවලට සහ ශික්ෂක විසින් නැගිය හැකි වෙනත් ප්‍රශ්නවලට එක් එක් කණ්ඩායම විසින් පිළිතුරු දීම සඳහා, ඉදිරිපත්කිරීම් සහ සාකච්ඡා සංවිධානය කරන්න. එක් සමාජ මාධ්‍ය වේදිකාවක් අනෙක් ඒවාට වඩා වෙනස් වන්නේ කුමකින් ද? සමාන වන්නේ කුමකින් ද? එකී එක් එක් වේදිකාව සම්බන්ධයෙන් අනන්‍ය වන්නේ කුමක් ද? භාවිත කරන මෙම තාක්ෂණික කේත සහ සම්මුතීන්, ශිෂ්‍යයන් තොරතුරු සහ ඩිජිටල් මෙවලම් සමග ක්‍රියා කරන ආකාරයටත් අත්දැකීම් මත පදනම්ව අර්ථය ව්‍යුත්පන්න කර ගන්නා ආකාරයටත් බලපාන්නේ ද? ඒවා ශිෂ්‍යයන්ට බලපාන්නේ කෙසේද? මෙම කේත සහ සම්මුතිය සැමවිටම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදීද නැතහොත් ඇතැම් විට ඒවා ස්ත්‍රී හා පුරුෂ යන එක් පාර්ශ්වයක් වෙත පක්ෂග්‍රාහී ද? වර්තමානයේ දී ශික්ෂකයන් හා ශිෂ්‍යයන් සන්දේශනය සහ අරුත් සම්බන්ධයෙන් මෙම කේතවල පැවැත්ම සහ විභව්‍ය බලපෑම පිළිබඳව වඩාත් දැනුවත් බැවින්, අනාගතයේදී වඩාත් විචාර බුද්ධියෙන් ක්‍රියා කිරීමට ඔවුන් ගත යුතු තීරණාත්මක පියවර මොනවා ද? විවිධ වේදිකා විවිධ විශේෂ ලක්ෂණ දියුණු කරන බව සැලකිල්ලට ගන්න (උදා: නර්තන රූප රාමු සඳහා TikTok). වේදිකා යනු මග පෙන්වීමකින් තොරව පරිශීලකයන් ක්‍රියා කරන්නා වූ නිෂ්ක්‍රීය අඩවි නොවන බව සලකන්න. ඒවා, කුමන අන්තර්ගතය සාර්ථක වන්නේ ද යන්න තීරණය කරන ඇල්ගොරිතම මගින් නිර්මාණය කරන ලද පද්ධතීන් වේ. මිතුරන් සහ පවුලේ අය සමඟ උගත් දේ සමාජ මාධ්‍යවල බෙදා ගැනීමට ශික්ෂකයන් හා ශිෂ්‍යයන් දිරිමත් කරන්න.
- ගතික තොරතුරු සහ ඩිජිටල් සන්නිවේදන පරිසරය මන්දගාමීව නොපවතින බැවින්, අපේක්ෂිත අනාගතය තුළ තරගකාරී ඉල්ලීම් සපුරා ලීමට ශික්ෂකයන් හා ශිෂ්‍යයන්ට සිදු වනු ඇත. ශික්ෂකයන් හා ශිෂ්‍යයන් අතර අදහස් උත්පාදන සහ විවාද සැසියක් සංවිධානය කරන්න. අනාගතයේ දී දියුණු කළ හැකි නව තාක්ෂණයන් සහ මාධ්‍ය මෙන් ම භාවිත කළ හැකි නව කේත සහ තාක්ෂණික සම්මුතීන් පිළිබඳව අදහස් බෙදා ගැනීමට ඔවුන්ට මග පෙන්වන්න. උදාහරණයක් ලෙස, අප දන්නා පරිදි අතථ්‍ය සහ ත්‍රිමාන භෞතික පරිගණක මොනිටරයක් පිළිබඳව සිතන්න. එමගින් සිදු කළ හැකි වෙනස්කම් මොනවාද? පන්ති කාමර සඳහා මෙන්ම "පන්ති කාමර" ලෙස ප්‍රජා අවකාශයන් සඳහා ඇති වර්තමාන සහ අනාගත තාක්ෂණික මෙවලම් ගැනද සිතන්න. ඇතැම් තාක්ෂණික කේත සහ සම්මුතීන් භාවිතය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් සක්‍රීය කළ හැකි හෝ එයට බාධාවක් විය හැකි ආකාරය පිළිබඳ විවාදයක් සංවිධානය කරන්න.
- නව මාධ්‍ය සහ සුහුරු ජංගම දුරකථනවල (smart phone) සහයෝගිත්ව විභවය; කුසලතා සහ නිර්මාණශීලිත්වය ප්‍රකාශ කිරීම සඳහා නව අවස්ථා ලබා දෙයි. වර්තමානයේ නව මාධ්‍ය වේදිකා සාමාන්‍ය ජනතාවට සුපුරුදු බාධාවන්ගෙන් තොරව තම අදහස් ප්‍රකාශ කිරීමට සහ ස්වකීය අන්තර්ගතයන් සම්පාදනය කිරීමට හැකියාව ලබා දෙයි. තම හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට සහ ලොව පුරා සිටින නරඹන්නන් වෙත ළඟා වීමට අවශ්‍ය වූ විශාල මූල්‍ය අයවැය, උපකරණ සහ මානව සම්පත් පෙර මෙන් ඔවුන්ට තවදුරටත් බාධාවක් නොවේ. එසේම, කලාව සහ නිර්මාණශීලිත්වය යනු විශේෂිත වූ සමාජයන්හි ඇතැම් පුද්ගල කාණ්ඩවලට සීමා වූවක් නොවේ යන අදහස ව්‍යාප්ත

කිරීම සහ වැඩිදියුණු කිරීමට ඉන් උදව් වේ. ශිෂයාන් කුඩා කණ්ඩායම්වලට බෙදන්න. මාධ්‍ය සහ ඩිජිටල් නිමැවුම් වැඩිදියුණු කිරීම සඳහා සාමාන්‍ය පුද්ගලයන් විසින් සකස් කරන ලද සුවිශේෂී මාධ්‍ය සහ තාක්ෂණික කේත සහ සම්මුතීන් හඳුනා ගැනීම පිණිස පර්යේෂණ කිරීමට ඔවුන්ට ඉඩ සලස්වන්න. එකී කේත හා සම්මුතීන්, විශාල මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් භාවිත කරන තාක්ෂණික කේත සහ සම්මුතීන්ට වඩා වෙනස් ද? ඉහළ ජනප්‍රියත්වයට පත්වන්නේ හා ආදායම් උත්පාදනය කරන්නේ කුමන නිර්මාණාත්මක අන්තර්ගතය දැයි යන කරුණ සඳහා ව්‍යාපාර ආකෘති බලපාන්නේ කෙසේ ද? මේ සම්බන්ධව ඉදිරිපත්කිරීම් සහ සාකච්ඡා සංවිධානය කරන්න.

ඇගයීම් සහ නිර්දේශ

- විවිධ පෙළෙහි කේත සහ සම්මුතීන් විශ්ලේෂණය කිරීම
- ප්‍රජාව තුළ සංඥා සහ සංකේත විශ්ලේෂණය කිරීම
- දේශීය හෝ ජාතික තැපැල්පත්වල භාවිතා වන කේත විශ්ලේෂණය සහ තක්සේරු කිරීම
- කොලාජ් නිර්මාණය

2වන ඒකකය: මාධ්‍ය සහ සන්දේශය: මුද්‍රණය සහ විකාශන පුවත්

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- ප්‍රවෘත්ති මාධ්‍යවල කේත සහ සම්මුති විශ්ලේෂණය
- පුවත් කතාවකට කේත සහ සම්මුති යෙදීම
- මාධ්‍ය භාෂා සහ අර්ථය; ප්‍රවෘත්ති සහ තොරතුරු ඇගයීම සහ විශ්ලේෂණය

ඉගෙනීමේ අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- රූපවාහිනිය, ගුවන්විදුලිය සහ පුවත්පත් භාවිත කරන කේත සහ සම්මුතීන් විශ්ලේෂණය කිරීම, මාර්ගගත හෝ මාර්ග අපගත නොවන ආකාරයෙන්, සිදුවීමක් ආවරණය කිරීම
- මෙම කේත සහ සම්මුතීන් විශේෂිත පුවත් කතාවකට යෙදීම
- මාධ්‍යයක් සහ එහි විශේෂිත කේත හා සම්මුතීන් මගින්, සමර්පණය වන සන්දේශය හැඩගස්වා ගත හැකි ආකාරය ඇගයීමට ලක් කිරීම.
- යම් නිශ්චිත මාධ්‍යයක් භාවිතයෙන් ප්‍රකාශ කළ හැකි තොරතුරු පිළිබඳ ඇගයීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

පරිසර ආරක්ෂණයට හෝ තිරසාර සංවර්ධනයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවට අහිතකර ලෙස බලපාන නීති වෙනසකට රජයක් සැලසුම් කරමින් සිටින බව පරිකල්පනය කරන්න. රාජ්‍ය නිලධාරියෙකු රජයෙහි ස්ථාවරය සාධාරණීකරණය කිරීමේ අරමුණින් කතාවක් කර ඇත. සාමකාමීව උද්ඝෝෂණය කිරීමට විශාල තරුණ පිරිසක් පැමිණ සිටිති. ඇතැම් ප්‍රචණ්ඩකාරී පුද්ගලයන් ඊට එක්

වීම නිසා විරෝධතාකරුවන් සහ ආරක්ෂක අංශ අතර ගැටුමක් ඇති වේ. මාධ්‍ය විසින් මෙම තත්ත්වය ආවරණය කළ හැකි ආකාරය විශ්ලේෂණය කිරීමට, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත සඳහන් ප්‍රශ්නවලට යොමු විය යුතු ය : මෙම තරුණ පිරිස කවුරුන් විය හැකි ද? ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව කුමන කණ්ඩායම් මේ සඳහා පෙනී සිටී ද? ඔවුන් පෙනී සිටින්නේ කෙසේ ද? මාධ්‍ය මගින් කරන ඉදිරිපත් කිරීම කෙරෙහි මෙය බලපානු ඇති අතර විශේෂිත ඒකාකෘති පිළිබඳව දැනුවත් වීමට සහ හඳුනා ගැනීමට පුද්ගලයන්ට මෙය උපකාර විය යුතු ය.

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාව තුළ (1 කොටසෙහි) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශයන් භාවිත කළ හැකිය. 1 කොටසෙහි දක්වා ඇති ලැයිස්තුව අධ්‍යයනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යොදා ගත යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

- මෙම සිදුවීම පුවත්පතක්, ගුවන්විදුලි නාලිකාවක් සහ රූපවාහිනී නාලිකාවක් මගින් ආවරණය වන ආකාරය පුරෝකථනය කරන්න. ආවරණ විධි කෙසේ වෙනස් වනු ඇතැයි ඔබ සිතන්නේ කෙසේ ද, එමෙන්ම ඒ මන්ද? ඉහත කී වෙනස්කම් කෙතරම් දුරට එක් එක් මාධ්‍යයට අනන්‍ය ලක්ෂණ මත පදනම් වනු ඇත්ද?
- තරුණ විරැකියාව, දූෂණ අපචාරයක් හෝ පරිසර දූෂණ ව්‍යසනයක් වැනි අදාළ සිදුවීමක් හෝ අවධානයට ලක්ව ඇති ගැටලුවක් රුචිකත්වය මත තෝරාගන්න. කණ්ඩායම් වශයෙන් වැඩ කරමින්, ගුවන් විදුලියේ, පුවත්පතක සහ රූපවාහිනී ප්‍රවෘත්ති වැඩසටහනක ඉදිරිපත් කිරීමට මෙම සිදුවීම පිළිබඳ ප්‍රවෘත්තියක් ගොඩ නගන්න. ගුවන්විදුලිය සඳහා, කතාව තත්පර 20 කට වඩා වැඩි විය නොහැකි අතර; පුවත්පත සඳහා වචන 210; රූපවාහිනිය සඳහා විනාඩි 1-2කි. කතාව සම්පූර්ණ කිරීමෙන් පසු, මාර්ගෝපදේශයක් ලෙස පහත ප්‍රශ්න භාවිත කර ප්‍රතිඵල සාකච්ඡා කරන්න:
    - විවිධ මාධ්‍යයන් ආවරණ විධිය හා තොරතුරු දිය හැකි ආකාරය කෙරෙහි බලපාන්නේ කෙසේ ද?
    - එක් එක් කථාව ගොඩ නැගීමේදී භාවිත කර ඇති කේත සහ සම්මුතීන් මොනවා ද?
- ඉලක්කගත ග්‍රාහක පිරිස සහ සමර්පණය කෙරෙන තොරතුරු සැලකිල්ලට ගනිමින් පාසලක් හෝ වෙනත් ආයතනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිත කළ හැකි අනුරූප හෝ සංකේත ඇසුරෙන් කොලාජයක් සාදන්න.

ඇගයීම සහ නිර්දේශ

- විවිධ මාධ්‍ය තුළ සිදු කළ හැකි පුවත් ආවරණය පිළිබඳ විස්තර කිරීම සහ ඇගයීම
- ගුවන්විදුලිය, රූපවාහිනිය සහ පුවත්පත් සඳහා ප්‍රවෘත්තියක් ගොඩ නැගීම සහ විශ්ලේෂණය කිරීම.

3 වන ඒකකය: චිත්‍රපට ශානර සහ වෘත්තාන්ත කථනය

කාලසීමාව: පැය 2 යි

ප්‍රධාන මාතෘකා

- චිත්‍රපට ශානර
- චිත්‍රපටයේ තාක්ෂණික සහ සංකේතාත්මක කේත
- චිත්‍රපට දර්ශන සැලසුම් සාරාංශ (storyboard) සකස් කිරීම

ඉගෙනීමේ අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ගුරුවරුන් පහත සඳහන් හැකියාවන් ලබනු ඇත:

- විවිධ චිත්‍රපට ශානර සහ ඒවාට සම්බන්ධ කේත සහ සම්මුතීන් හඳුනා ගැනීම (චිත්‍රපට ශිල්පීය ක්‍රම, විෂය කරුණු, තේමාව, චරිත, සාම්ප්‍රදායික කථා වස්තු, තත්වයන් සහ පසුතල භාවිතය)
- චිත්‍රපටයේ අර්ථය ප්‍රකාශ කිරීමට භාවිත කරන තාක්ෂණික සහ සංකේතාත්මක කේත හඳුනා ගැනීම
- යම් නිශ්චිත ශානරයක කේත සහ සම්මුතීන් ඇතුළත් චිත්‍රපට දර්ශනයක් සඳහා රූප මාලා පෙළ ගැස්වීම සඳහා දර්ශන සැලසුම් සාරාංශ සකස් කිරීම
- වෙනත් රටක ජනප්‍රිය චිත්‍රපට ශානරයක භාවිත කේත සහ සම්මුතීන් හඳුනා ගැනීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව තුළ (1 කොටසෙහි) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශයන් භාවිත කළ හැකිය. 1 කොටසෙහි දක්වා ඇති ලැයිස්තුව අධ්‍යයනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යොදා ගත යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

- ඔබ රසවිඳින චිත්‍රපට ශානර ලැයිස්තුවක් සකසන්න. එක් එක් ශානරය නිර්වචනය කරන ප්‍රධාන මූලිකාංග හඳුනා ගන්න. මෙම චිත්‍රපටවලින් එකක දර්ශනයක් නරඹන්න. පහත සඳහන් දේ නිරීක්ෂණය කරන්න: කථාවේ සිදුවීම් පෙළ, පසුතල, චරිත වර්ග, සංගීතය, ආලෝකය, විශේෂ ප්‍රයෝග, සංස්කරණය සහ කැමරාකරණය. චිත්‍රපටිය තුළ මෙම මූලිකාංග භාවිත කිරීම තුළින් ලබා දෙන සන්දේශ සහ වටිනාකම් මොනවා ද? විවිධ මූලිකාංග වෙනස් කිරීමෙන් දර්ශනයේ අර්ථය වෙනස් කළ හැකි ආකාරය පැහැදිලි කරන්න (උදා: පසුතල, හඬ පටය, ආදිය)
- කණ්ඩායම් වශයෙන්, තෝරා ගත් චිත්‍රපට ශානරයක දර්ශනයක් සඳහා සැලසුම් සාරාංශ සකස් කරන්න. එක් එක් දර්ශනය තුළ ශානරයේ 'භාෂාව' ග්‍රහණය කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- ශික්ෂකයන්ට විදේශ රටක ජනප්‍රිය චිත්‍රපටයක රූප රාමු පෙළ නැරඹීමට සලස්වන්න. තම රටේ නිෂ්පාදනය කරන ලද චිත්‍රපටයක් සමග භාවිත කරන චිත්‍රපට 'භාෂා' සංසන්දනය කර වෙනස දක්වන්න. භාවිත කරන විවිධ ශිල්පීය ක්‍රමවල බලපෑම සාකච්ඡා කරන්න. මෙම ශිල්පීය ක්‍රම හරහා සන්නිවේදනය කරන්නේ කුමක් ද? එක් එක් චිත්‍රපටයේ ඉලක්කගත ග්‍රාහක පිරිස කවුරුන් දැයි ඔබ සිතන්නේ ද?
- අන්තර්ජාලය හෝ දේශීය පුස්තකාලය භාවිත කරමින්, විවිධ රටවල ප්‍රදර්ශනය කෙරෙන එකම චිත්‍රපටයේ පෝස්ටර් දෙකක් සොයාගෙන පහත ප්‍රශ්න පිළිබඳව සලකා බලන්න:
    - පෝස්ටරය හරහා චිත්‍රපටය පිළිබඳ ගෙන එන හැඟීම කුමක්ද?
    - භාවිත කර ඇති තාක්ෂණික සහ සංකේතාත්මක කේත මොනවා ද? ඒ කුමන ප්‍රතිඵලයක් ඇති කිරීම සඳහා ද?
    - පෝස්ටර් මත පදනම්ව එක් එක් චිත්‍රපට සඳහා ඉලක්කගත ග්‍රාහක පිරිස ඔබට හඳුනා ගත හැකි ද?
    - පෝස්ටර් හරහා එක් එක් චිත්‍රපටය පිළිබඳ රැගෙන යන තොරතුරු මොනවා ද?

ඇගයීම සහ නිර්දේශ

- චිත්‍රපට දර්ශනයක් විශ්ලේෂණය කිරීම
- චිත්‍රපට දර්ශනයක් සඳහා සැලසුම් සාරාංශ නිර්මාණය කිරීම

- චිත්‍රපට පෝස්ටර් විශ්ලේෂණය
- චිත්‍රපට සංසන්දනය.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- චිත්‍රපටයේ ශබ්ද පථ භාවිතය
- ශබ්ද ප්‍රයෝග නිර්මාණය කරන කලාකරුවන්ගේ කාර්යය
- වාර්තා චිත්‍රපටකරණයේ සම්මුතීන්.

ඒකකය 4: සමාජ මාධ්‍යවල ඩිජිටල් වේදිකා පිළිබඳ සන්නිවේදනය

කාලසීමාව: පැය 2 ය

ප්‍රධාන මාතෘකා

- සමාජ මාධ්‍ය
- වේදිකාගත සම්පාදනය, මුදල්කරණය (monetization) සහ දත්තකරණය
- සමාජ මාධ්‍යවල කලාත්මක නිරූපණය, ශානර සහ සන්නිවේදන මාර්ග.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත සඳහන් හැකියාවන් ලබනු ඇත:

- සන්නිවේදන පරිසරයක් ලෙස සමාජ මාධ්‍යවල සුවිශේෂිත්වය තේරුම් ගැනීම
- ඩිජිටල් වේදිකාවල සන්නිවේදනය ක්‍රියා කරන ආකාරය සහ සාමාන්‍ය පුද්ගලයන් ඊට සම්බන්ධ වන ආකාරය තේරුම් ගැනීම
- සමාජ මාධ්‍ය තුළ සන්නිවේදන රටා හඳුනා ගැනීම

සමාජ මාධ්‍යවල ලක්ෂණ

- සාම්ප්‍රදායික ජන මාධ්‍ය සමග සම්බන්ධ වන විට, මාර්ගගතව පවා, අප සාමාන්‍යයෙන් ස්ථානගත වන්නේ සන්දේශ ලබන හා විසංයෝජනය කරන ග්‍රාහක පිරිස්වල සාමාජිකයන් ලෙස ය. අපි සමාජ මාධ්‍ය සහ අනෙකුත් ඩිජිටල් සන්නිවේදනවල සන්දේශ කියවීමේ උදාසීන ස්වරූපයක පසු වන අතර, අනෙකුත් පරිශීලකයන්ට බලපාන සන්දේශ සහ ක්‍රියා සම්පාදනය කිරීමට හැකි මහජන නියෝජිතයන් ද වෙමු. සමාජ මාධ්‍ය යනු සන්දේශ ලබා ගැනීම සහ අර්ථ නිරූපණය කිරීම පමණක් නොව ඒවාට ප්‍රතිචාර දැක්වීම මෙන්ම ඒවා බෙදාගැනීම සහ වෙනස් කිරීම සහ නව අර්ථවත් සන්නිවේදනයන් ඇති කිරීම යි. පරිශීලකයන් අතර අන්තර්ක්‍රියා සක්‍රීය කරන ඩිජිටල් තාක්ෂණයන් සහිත සියලුම සේවාවන් ඇතුළත් සමාජ මාධ්‍ය, සන්නිවේදනය සිදුවන, එමෙන්ම, අවසානයේ එකී සන්නිවේදනයන් පුද්ගල කණ්ඩායම්වලට නිරීක්ෂණය කළ හැකි පරිසරයන් අප වෙත සපයයි. සමාජ මාධ්‍ය, 21 වැනි ශත වර්ෂය තුළ බිහි වූ වේදිකා ලෙසින් හැඳින්වෙන කෙටි පණිවුඩ යෙදුම්, අනුරූප සහ වීඩියෝ බෙදාගැනීමේ වේදිකා, අන්තර්ගත ප්‍රවාහ සේවා (streaming services), පොඩ්කාස්ට් (Podcasts), බ්ලොග් (blogs) සහ මයික්‍රොබ්ලොග් (Microblogs), විකි (Wikis) ආදි විවිධාකාර සේවාවන් ආවරණය කරන අතර, බහුවිධ සන්නිවේදනය (multimodal communication) ලෙස හැඳින්වෙන ලිඛිත, ශ්‍රව්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනය වැනි විවිධ

සන්නිවේදන ක්‍රම ඒකාබද්ධ කිරීම බොහෝ විට එමගින් සිදුවේ. අන්තර්ගතය වේදිකා හරහා ද සංසරණය වන අතර විවිධ උපාංග මගින් ඊට ප්‍රවේශ විය හැකි ය. වැඩි වශයෙන් අනුගමනය කෙරන, ග්‍රාහකත්වය ලබා ගත් (subscribed) හෝ කැමති පරිශීලකයන් වැඩි සංඛ්‍යාවක අවධානයක් ලබන එමෙන්ම සන්නිවේදනය තුළින් මුදල් ඉපයීමේ හැකියාව ඉහළ, වඩාත්ම ජනප්‍රිය අන්තර්ගත සම්පාදකයන් ඇල්ගොරිදම විසින් තීරණය කරයි. අන්‍යයන් කෙරෙහි බලපෑමක් ඇතිකරවීමට සමත් අරුත් සම්පාදකයන් (meaning-makers), චින්තන නියමුවන් (opinion leaders) සහ රුචි නිර්මාපකයන් (tastemakers) බවට පත්වීමට ඔවුන්ට හැකි ය. සියලුම සමාජ මාධ්‍ය පොදු මාධ්‍ය නොවන බව සඳහන් කිරීම මෙහි දී වැදගත් ය. බොහොමයක් සංවෘත කණ්ඩායම්වලට හෝ සීමිත ප්‍රමාණයේ සමාජ සන්දේශන ජාලවලට සීමා වේ. සෑම අවස්ථාවකදීම, ආයතනික හෝ වෙනත් අවශ්‍යතා අනුව දත්ත කැණීම (mining) සහ චරිත විග්‍රහයන් (Profile) සැකසීමේ දී සමාජ මාධ්‍යවල දායකත්වය පිළිබඳව සිහි තබා ගන්න.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂයමාලාව තුළ (1 කොටසෙහි) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශයන් භාවිත කළ හැකිය. 1 කොටසෙහි දක්වා ඇති ලැයිස්තුව අධ්‍යයනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යොදා ගත යුත්තේ කුමන ප්‍රවේශය දැයි තීරණය කරන්න.

ඩිජිටල් සන්නිවේදන සමාගම්වල ක්‍රියාව තේරුම් ගැනීමට, පහත කණ්ඩායම් සාකච්ඡා සහ පැවරුම් ප්‍රයෝජනවත් විය හැක:

- ගෝලීය වශයෙන් සහ/හෝ ඔබේ රටෙහි වැඩියෙන්ම භාවිත වන සේවාවන් එකක් හෝ දෙකක් පහත සඳහන් කාණ්ඩවලට ඇතුළත් කිරීමෙන් ජනප්‍රිය සමාජ මාධ්‍ය යෙදුම්වල අනුචිත්‍රණයක් (map) අඳින්න. පහත කරුණු සොයන්න : a) ගෝලීය වශයෙන් සහ/හෝ ඔබේ රටෙහි කොපමණ පරිශීලකයින් සිටීද?, b) සේවා ආරම්භ කරන ලද්දේ කවදා ද?, සහ c) එකී සේවා අයත් වන්නේ කාටද?: අ) අන්තර්ගත ප්‍රජාවන් (උදා: YouTube, Blog); ආ) සමාජ ජාල අඩවි (උදා: VK සහ Facebook); ඇ) සහයෝගී ප්‍රජාවන් (උදා.Wikipedia); ඈ) අතථ්‍ය ක්‍රීඩා ලෝක (උදා: World of Warcraft); ඉ) වෙනත්. කුඩා කණ්ඩායම් වශයෙන් ඔබගේ අනුචිත්‍රණය ඉදිරිපත් කර සාකච්ඡා කරන්න: පරිශීලකයෙකුට වේදිකාව තුළ සන්නිවේදනය කළ හැක්කේ කෙසේද? අනෙක් අයට අන්තර්ගතයට ප්‍රතිචාර දැක්විය හැක්කේ කෙසේද සහ ප්‍රධාන සන්නිවේදන ක්‍රම මොනවාද? සාමාන්‍ය ග්‍රාහක පිරිස් කෙතරම් සීමිත ද?, එනම් අනුගාමික කණ්ඩායම්, සහ එම කණ්ඩායම්වල විශාලත්වයට බලපාන්නේ කුමක් ද? ඔබේ අත්දැකීමට අනුව, පරිශීලකයන් විසින් තිරසර සංවර්ධනයට සහ මානව හිමිකම් සඳහා සහාය වීම පිණිස භාවිත කළ හැකි සන්දේශ ක්‍රියාකාරකම් පරිශීලකයන් විසින් භාවිත කරන්නේත් අවභාවිත කරන්නේත් කෙසේ ද? සහ ඒ කුමක් නිසා ද? මෙහි දී වැඩිදුර සාකච්ඡාව සඳහා, පරිශීලකයින් අන්තර්ගත සම්පාදනයෙන් ආදායමක් ලබා ගන්නේ කෙසේ ද යන්න මාතෘකාවක් වශයෙන් ගත හැකි ය. එනම්, එකී වේදිකාව තුළ ප්‍රමුඛ මුදල්කරණ මූලධර්ම (monetizing principles) මොනවා ද යන්නයි.
- විවිධ වේදිකා විසින් විවිධ භාෂා සහ සන්නිවේදන පුරුදු/භාවිතාවන් දියුණු කරයි. බ්ලොගයක, මයික්‍රොබ්ලොගයක (උදා. Sina Weibo), ජාල අඩවි යාවත්කාලීනයක (උදා. Facebook), අනුරූප පදනම් වූ යෙදුමක (උදා. Instagram& සහ වීඩියෝ යෙදුමක (උදා. TikTok) යොදා ගෙන ඇති භාෂාවන් සසඳන්න. ඔබ යම් ග්‍රාහක පිරිසකට ලබා දීමට කැමති සන්දේශයක් තෝරාගන්න (උදා: ළමුන් සඳහා නිර්මාණය කර ඇති නව නර්තන පාඨමාලාවක් ගැන පාසල් දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කරන්න) එමෙන්ම, වේදිකා ආකෘතික භාෂාවක් භාවිතයෙන් මෙම විවිධ වේදිකා සඳහා සන්දේශයක් පිළියෙල කරන්න. වේදිකා ක්‍රියාකාරීත්වයේ හැකියාවන් සහ සීමාවන් ('විශේෂාංග' යැයි කියනු ලබන) සන්දේශයට බලපාන්නේ කෙසේ ද?
- සමාජ මාධ්‍ය සන්නිවේදනය සැලකිය යුතු ලෙස ස්වයංකේන්ද්‍රීය වන අතර, ප්‍රකාශන ක්‍රම තුළින් ද, පුද්ගල පළ කිරීම් සඳහා අනුගාමිකයන්, දායකත්වයන් හා ප්‍රතිචාර රැස් කිරීම හරහා, පුද්ගල කේන්ද්‍රීය ජාලයන් තුළින් ද එය පිළිබිඹු වේ. මාර්ගගත සන්නිවේදන සංස්කෘතීන් තුළ සෙල්ෆි

(ස්වයං ඡායාරූප) කලාත්මක නිරූපණය (aesthetic) සහ එහි කාර්යයන් පිලිබඳව සාකච්ඡා කරන්න. සෙල්ෆි භාවිතය සිදු වන්නේ කුමන වේදිකාවල සහ කුමන සන්දර්භවල ද? ඔබට හඳුනාගත හැක්කේ කුමන ආකාරයේ විවිධ සෙල්ෆි ශෛලීන් ද? සෙල්ෆිවල සමාජීය කාර්යයන් මොනවා ද? පුද්ගලයන් සෙල්ෆි (නො) ගන්නේ ඇයි? සෙල්ෆි සංස්කෘතිය තුළ කුමන ආකාරයේ ධනාත්මක සහ ඍණාත්මක ප්‍රතිවිපාක තිබේ ද? අන්තර්ජාල සන්නිවේදන සංස්කෘතිය කෙබඳු වේ ද සහ සෙල්ෆි තහනම් කළහොත් අපට අහිමි වන්නේ කුමක් ද? පෞද්ගලිකත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මුහුණු හඳුනාගැනීමේ මෘදුකාංග පිළිබඳ කරුණු සලකා බලන්න.

- විවිධ වේදිකාවල පොත් පිළිබඳව සාකච්ඡා කරන්නේ කෙසේ ද? පොත් ඉදිරිපත් කිරීම වේදිකාවල සන්නිවේදන ක්‍රම මත රඳා පවතින ආකාරය සාකච්ඡා කරන්න. බ්ලොග් (blog), විලොග් (vlog), අනුරූප බෙදාගැනීමේ වේදිකාවල මෙන්ම සමාජ කියවීම, පිටු සලකුණු කිරීම සහ සමාලෝචනය සිදු කරන විශේෂිත වේදිකාවල පොත් ප්‍රජාවන් පිළිබඳව :සමාජ මාධ්‍යවල විශේෂාංග භාවිතා කරන ගුඩ්රීඩ්ස් (Goodreads) සහ ජාතික/ප්‍රාදේශීය පුස්තකාල වැනි) උදාහරණ සොයන්න.
- පහත දැක්වෙන කාණ්ඩයන් අනුව සමාජ මාධ්‍ය අන්තර්ගතයන් වර්ග කරන්න: තොරතුරුලබා දෙන, අනාවරණමය, අධ්‍යාපනික, විනෝදාස්වාදක ආදී වශයෙන්. මෙම අන්තර්ගතය ග්‍රාහක පිරිස් ආකර්ෂණය කර ගැනීම සඳහා නිර්මාණය කර ඇත්තේ කෙසේ ද? පරිශීලකයන් මෙවැනි අන්තර්ගත ගැන උනන්දු වන්නේ කුමන හේතු නිසා ද? මෙම අන්තර්ගත නරඹන්නේ ඇයි? මෙම අන්තර්ගත කාණ්ඩවල ජනප්‍රියත්වය වැඩි කරන අන්තර්ගතයේ ඇති විශේෂාංග මොනවා ද? අන්තර්ගත නිර්මාණකරුවන් අවධානය ග්‍රහණය කර ගැනීමට උත්සාහ කරන්නේ කෙසේ ද?
- පොඩ්කාස්ට් වෘතාන්ත කථනය ලෙස සලකා මෙකී ආකෘතිය තුළ ඵලදායි වන්නේ මොනවා දැයි අගයන්න
- සමාජ මාධ්‍ය තුළ, ශානරයන් බොහෝ විට දෙමුහුන් වේ.එනම්, විවිධ ශානරයන්හි විශේෂාංග ඒකාබද්ධ කිරීම සහ මිශ්‍ර කිරීම මෙහි දී සිදු වේ. යූටියුබ්හි කොතරම් විවිධාකාර වූ 'මෑෂප් (mashup)' ශානර තිබේ ද? වීඩියෝ සම්බන්ධ උදාහරණ කිහිපයක් තෝරා, යූටියුබයට (YouTube) විශේෂිත වන බෙදාගත් සහ පොදු සන්නිවේදන උපාය මාර්ග මොනවාදැයි හඳුනා ගනිමින් එහි භාවිතා කරන ශානරය හැකිතාක් කරුණු සහිතව විස්තර කිරීමට උත්සාහ කරන්න. උදාහරණයක් ලෙස, ඔබට වීඩියෝ විලොග් සටහනක් (vlog) ගෙන එය එහි ප්‍රේක්ෂකයන්ට සන්නිවේදනය කරන ආකාරය විස්තර කළ හැකි ය. බොහෝ ශානර හරහා සොයා ගත හැකි ශානර හෝ සන්නිවේදන ආකෘති වන්නේ, උදාහරණයක් ලෙස, නිබන්ධන, භාණ්ඩ පිළිබඳ විවරණ (haul), මගේ දවස (my day), මුක්බන්ග් (කැමරාව ඉදිරිපිට ආහාර ගැනීම), පෙන්වා විස්තර කිරීම, අභියෝග කිරීම සහ භාණ්ඩ ඇසුරුම්වලින් ඉවත් කර එහි විශේෂාංග පරීක්ෂා කිරීම (unboxing).
- සමාජ මාධ්‍ය සන්නිවේදනයේ භාවිතයන් යම් දුරකට ඉතා ස්ත්‍රීපුරුෂ සමාජභාවීය පක්ෂපාතීත්වයෙන් යුක්ත වේ. කුඩා කණ්ඩායම් ලෙස සැදී, විවිධ වේදිකාවල පවත්නා සාමාන්‍ය කාන්තා සහ පිරිමි සන්නිවේදන සංස්කෘතීන් සහ භාවිතාවන් හඳුනා ගන්න. නිදසුනක් වශයෙන්, රූපලාවන්‍ය සම්බන්ධ බ්ලොග් සහ විලොග්වල දී සාමාන්‍යයෙන් කාන්තා අන්තර්ගත සම්පාදිකාවන් ආධිපත්‍යය දරන අතර ක්‍රීඩා සහ තාක්ෂණ සංස්කෘතීන් තුළ බොහෝ විට පුරුෂ පක්ෂය ආධිපත්‍යය දරයි. මේවා කාන්තා නියෝජනය සවි ගැන්වීම සඳහා අවස්ථා උදා කර දෙන්නේ ද නැතහොත් ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඒකාකෘති තව දුරටත් ශක්තිමත් කරන්නේ ද? එසේවන්නේ කුමක් නිසා ද? නොඑසේ නම් ඒ මන් ද? හඳුනාගත් සංස්කෘතීන් තුළ සුළුතර ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ උදාහරණ හඳුනා ගැනීමට උත්සාහ කරන්න. මෙම සුළුතර සිද්ධීන් මගින් සන්නිවේදන භාවිතයන් සහ සම්මතයන් වෙනස් කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න. ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සමතුලිතතාවයක් පවතින මාර්ගගත සංස්කෘතීන් තිබේ ද? සන්නිවේදනයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඉටු කරන කාර්යභාරය සහ ස්ත්‍රී හෝ පුරුෂ ආධිපත්‍යයට ඇතිකරවන ප්‍රතිවිපාක මොනවා ද?

- සමාජ මාධ්‍ය භාවිත කරන විට එක් එක් ශිෂ්‍යයාට හමුවන පුද්ගලාරෝපිත වෙළඳ ප්‍රචාරණ (tailored advertising) ඒවා ඔවුන් අත්දැක ඇති අන්තර්ගත පිළිබඳ නිර්දේශයන් සහ පර්යේෂණවලට අදාළ වේ නම් ඇගයීමට ලක් කරන්න. ඔවුන්ගේ දත්ත ඉඟි (data trails) නිසා මෙම බලපෑම් ඇති වී ඇති බව ඔවුන් දැනුවත් ද? මෙම තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස, විවිධාකාර අන්තර්ගතයන්ට පරිශීලකයන් නිරාවරණය කරනවා වෙනුවට කිසියම් වපසරියකට සීමා කිරීමක් එමගින් සිදුවේ ද?

ඇගයීම් සහ නිර්දේශ

- සමාජ මාධ්‍ය භූ දර්ශනය සිතියම්ගත කිරීම; ඩිජිටල් සන්නිවේදන සමාගම්වල බහුකාර්ය හැකියාව හඳුනා ගැනීම
- සමාජ මාධ්‍යවල ක්‍රියාකාරකම් සහ වේදිකාවල කලාත්මක නිරූපණය සහ සන්නිවේදන තේරීම්වල ප්‍රතිවිපාක පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණය
- විවිධ වේදිකාවලින් එදිනෙදා ලබාගන්නා පරිශීලක අත්දැකීම් පිළිබඳ විචාරශීලී පරීක්ෂාව

මෙම මොඩියුලය සඳහා සම්පත්

Beckman, K. (2016). The Tortoise, the Hare, and the Constitutive Outsiders: Reframing Fast and Slow Cinemas. Cinema Journal, 55(2).

Bone, Jan and Johnson, Ron. (2001). Understanding the Film: An Introduction to Film Appreciation. US: Glencoe McGraw Hill.

Bordwell, David and Thompson, Kristin. (1998). Film Art: An introduction. 6th edition. US: McGraw Hill.

Burgess, Jean & Green, Joshua (2009). YouTube: Online Video and Participatory Culture. New York: Polity Press.

Dzandza, P. & Kolan, B. (2018). Effect of Social Media on Academic Performance of Students in Ghanaian Universities: A Case Study of University of Ghana, Legon. Library Philosophy and Practice (e-Journal). Retrieved from https://digitalcommons.unl.edu/cgi/viewcontent.cgi?article=4687&context=libphilprac
Film Education, 91 Berwick Street, London UK W1F 0BP . This includes a variety of free teaching materials and outstanding study guides, many of which can be downloaded from the web site, www.filmeducation.org.

Film Study Guides for High School. Written for Pacific Cinematheque and distributed by Open Learning Agency of BC, Canada, these include study guides for individual films www.cinematheque.bc.ca

Ghani, M., Habes, M., Salloum, S. & Alghizzawi, M. (2019).The effect of social media usage on Students' e-learning acceptance in higher education: A case study from UAE. International Journal of Information Technology and Language Studies. Retrieved from https://www.researchgate.net/publication/338225144_The_effect_of_social_media_usage_on_sudents'_e_learning_acceptance_in_higher_education_A_case_study_from_the_United_Arab_Emirates

Goodman, Steve. (2003). Teaching Youth Media: A Critical Guide to Literacy, Video Production, and Social Change. NY: Teacher's College Press.

Hitchcock, Peter. (1992). Videography: A Guide to Making Videos. Ontario, Canada: Peter Hitchcock Productions.

Howard, Sue ed. (1998). Wired-Up: Young People and the Electronic Media. UK: Routledge. This anthology is designed as an accessible introduction to important research regarding new communication technologies. Jenkins, Henry. (2006). Convergence Culture: Where Old Media and New Media Collide. US: New York University.

Leaver, Tama, Highfield, Tim & Abidin, Crystal (2020). Instagram: Visual Social Media Cultures. New York: Polity Press.

Lindgren, Simon (2017). Digital Media & Society. London: Sage.

Lipschultz, Jeremy Harris (2018). Social Media Communication: Concepts, Practices, Data, Law and Ethics. 2nd. ed. New York: Routledge.

Luttrell, Regina (2016). Social Media: How to Engage, Share, and Connect. 2nd ed.

Lanham: Rowman & Littlefield.

Mandiberg, Michael (ed.) (2012). The Social Media Reader. New York: New York University Press.

Manovich, Lev (2019). AI Aesthetics. Moscow: Strelka Press.

McLuhan, Eric and Zingrone, Frank. (1995). Essential McLuhan. Canada: Anansi. National Film Board of Canada. www.nfb.ca The NFB works with schools, public

libraries and museums to unite documentary films and education.

Reporting Africa: The role of the media in (Un)Shaping democratic agenda. (n.d.). ResearchGate.https://www.researchgate.net/publication/313731941_Reporting_Africa_The_Role_of_the_Media_in_UnShaping_Democratic_Agenda

Saied, S., ElSabagh, H., & El-Afandy,A. (2016) Internet and Facebook addiction among Egyptian and Malaysian medical students: A comparative study, Tanta University, Egypt. International Journal of Community Medicine and Public Health, 3(5).

https://www.semanticscholar.org/paper/Role-of-social-media-in-retail-network-operations Ramanathan-Subramanian/7fb6085d7da22250510e487f7b7a1d374702fd7f

The Fifth Estate (film, 2013) https://www.imdb.com/title/tt1837703/

van Dijck, José (2013). The Culture of Connectivity: A Critical History of Social Media. Oxford: Oxford University Press.

Wang, Y. & Yang Y. (2020). Dialogic communication on social media: How organizations use Twitter to build dialogic relationships with their publics. Computers in Human Behaviour, 104, Article no 106183.

8වන මොඩියුලය:

පෞද්ගලිකත්වය, දත්ත ආරක්ෂණය සහ ඔබ

"පරිශීලකයින්ගේ පෞද්ගලිකත්වය සඳහා වන අයිතියට බලපෑ හැකි ඔවුන්ගේ දත්ත එකතු කිරීම, භාවිත කිරීම, බෙදාගැනීම සහ රඳවා ගැනීම පිළිබඳ පැහැදිලි සහ ප්‍රවේශාත්මක ආකාරයකට පරිශීලකයින් දැනුවත් කිරීමට හා සුදුසු පරිදි විනිවිදභාවය පිළිබඳ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීමට"

කටයුතු කරන ලෙස එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය වෙළෙඳ ව්‍යාපාර වෙතින් ඉල්ලා සිටියි.

යෝජනාව: ඩිජිටල් යුගයේ පෞද්ගලිකත්වය සඳහා වන අයිතිය. **A/RE//73/179**

පසුබිම සහ තාර්කිකය

පෞද්ගලිකත්වය යනු මේ යුගයේ පවතින වඩාත්ම වැදගත් සහ විවාදයට ලක් වූ ගැටලුවලින් එකකි. බොහෝ සංකල්ප සඳහා මෙන්, පෞද්ගලිකත්වය පිළිබඳ සම්පූර්ණ නිර්වචනයක් වාක්‍ය එකකින් හෝ දෙකකින් ලබා දීම අපහසුය. එබැවින් ඒ සඳහා පොදු නිර්වචනයක් නොමැත. පෞද්ගලිකත්වය යන පදයෙන් අදහස් කරන්නේ කෙනෙකුගේ පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සහ ඒවා වෙත අන්‍යයන් විසින් ප්‍රවේශ වීම සීමා කිරීම අවශ්‍ය වන බවයි[70]. පුද්ගලයන් සහ කණ්ඩායම් වශයෙන් අප සියල්ලන්ටම පෞද්ගලිකත්වය අදාළ වේ. අප විසින් දැනුවත්ව හෝ නොදැනුවත්ව නිර්මාණය කෙරුනු අප පිළිබඳ තොරතුරු ඊට අදාළ වේ. පුද්ගලික, රාජ්‍ය සහ ප්‍රජා පාදක ආයතන විසින් එකතු කරනු ලබන හෝ බෙදා හරිනු ලබන තොරතුරු සඳහාද ඒ හා සමානවම පෞද්ගලිකත්වය යන්න අදාළ වේ.

පෞද්ගලිකත්වය සඳහා වන අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු, ජෝසප් කැනාටාසි (Joseph Cannataci) සහ ඔහුගේ සමපදස්ථයන් විසින් ඉදිරිපත් කරනු ලබන අදහසට අනුව පෞද්ගලිකත්වය සම්බන්ධ කාරණා පුළුල් කාණ්ඩ තුනකට වෙන් කළ හැකි ය. අනවසරයෙන් පිවිසීම, අයුතු ලෙස මැදිහත් වීම සහ බලහත්කාරයෙන් ඇතුළුවීම යන කරුණුවලින් පුද්ගලයන් සහ කණ්ඩායම් තම අවකාශ ආරක්ෂා කර ගැනීම සම්බන්ධ භෞතික අවකාශයන් පිළිබඳව ඉන් පළමු කාණ්ඩයෙන් කියැවේ. පෞද්ගලිකත්වය පිළිබඳ දෙවන කාණ්ඩගත කිරීමෙන් සෑම පුද්ගලයෙකුම තනි පුද්ගලයෙකු වශයෙන් සැලකීම පිළිබඳ කියැවේ - එනම්, බාහිර මැදිහත්වීම්වලට බිය නොවී නිදහසේ සිතීම, තමන්ගේම තෝරාගැනීම් සිදු කිරීම සහ නිදහසේ තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා පුද්ගලයන් සතු කාරකත්වය හෝ ස්වාධිකාරය කුමක්ද යන්නය.

70. Global Survey on Privacy in Media and Information Literacy, With Youth Perspectives. UNESCO Series on Internet Freedom' UNESCO, Paris.

අවසාන වශයෙන්, තුන්වන කණ්ඩායම මගින්ද තනි පුද්ගලයකු කෙනෙකු ලෙස සලකන නමුත් මූලික අවධානය ලබා දෙන්නේ පෞද්ගලික තොරතුරු ගලායාම කෙරෙහිය. මෙය තොරතුරු පෞද්ගලිකත්වය යනුවෙන් හැඳින්වේ[71]. සමාජය තුළ තොරතුරු ගලායාමට පෞද්ගලිකත්වය බලපාන අන්දමත්, පුරවැසියන් ලෙස තනි පුද්ගලයන්ගේ සංවර්ධනයට එය බලපාන අන්දමත් දක්වාම සැලකිලිමත් වෙමින්, මේ ආකාරයේ පෞද්ගලිකත්වය තනි පුද්ගලයාගෙන් ඔබ්බට යන සමස්ත සමාජය දක්වාම විහිදෙ යයි[72].

තොරතුරුවල පෞද්ගලිකත්වය යන්න දත්ත රහස්‍යතාව හා බැඳී පවතී. ඩිජිටල් යුගයේ දී, කෙනෙකුගේ භෞතික අවකාශය, පුද්ගල ස්වාධිකාරය සහ පුද්ගලයෙකු දත්ත නිර්මාණය කරන හා භාවිත කරන ආකාරය යන සියල්ල නව තාක්ෂණය මගින් එකට කැටි කොට අතථ්‍ය අවකාශ සහ අතථ්‍ය දත්ත බවට පරිවර්තනය කෙරේ. උදාහරණයක් ලෙස, තාක්ෂණය භාවිතවීමට පෙර, කෙනෙකුට තම සිතැඟි පරිදි නිතර පුස්තකාලයේ තොරතුරු වෙත ප්‍රවේශ විය හැකි වූ අතර, ඔහු හෝ ඇය ප්‍රවේශ වූ තොරතුරු ඉතිහාසය හෝ තොරතුරු වර්ගය වෙත ප්‍රවේශ වීමේ හැකියාව සතු වූයේ ඒ සඳහා බලය පැවරී තිබූ පුස්තකාල නිලධාරීන්ට පමණි. ඔබ වෙළෙඳසැලකට යන විට ඔබ මිලදී ගන්නා දේ දැනගත්තේ වෙළෙඳසැල් හිමියා පමණි. වර්තමානයේ පවතින මාර්ගගත පරිසරය තුළ මෙය සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත. යමෙක් වෙළෙඳසැලක හෝ අන්තර්ජාලය තුළ යම් යම් දෑ අලෙවි කරන ස්ථානයකින් යමක් මිල දී ගැනීම, රජයේ වෙබ් අඩවියක් හරහා ගනුදෙනුවක් සිදු කිරීම, වෛද්‍යවරයා හෝ රෝහල වෙත යාම, සෙවුම් යන්ත්‍රයක් භාවිතයෙන් අන්තර්ජාලය හරහා යමක් සෙවීම හෝ සමාජ මාධ්‍යවල ඕනෑම ආකාරයක ක්‍රියාකාරකම්වල නිරත වීම යනාදිය සිදු කරන සෑම විටෙකම දත්ත නිර්මාණය කෙරෙමින්, එකතු කෙරෙමින් සහ ගබඩා කෙරෙමින් පවතී. මෙම දත්ත සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ඇත්තේ කාටද, ඒවා භාවිතා කරන්නේ කුමක් සඳහාද සහ එය භාවිතා කිරීමට යමෙකු ලබා දෙන හෝ නොදෙන අවසරය කුමක්ද යන්න සියලුම පුද්ගලයින්ට වැදගත් වේ.

පෞද්ගලිකත්වය මානව අයිතිවාසිකමක් වන අතර මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 12 වැනි වගන්තිය යටතේ මෙන්ම සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 17 වැනි වගන්තිය යටතේද එය ආරක්ෂා කෙරේ. එක් එක් රටවල් සහ කලාපීයව භූගෝලීය වශයෙන් වෙන්වූ ප්‍රදේශ තුළ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම ශක්තිමත් කරන දත්ත ආරක්ෂණ නීති පවතී[73]. ලොව පුරා රටවල් 132 කට අධික සංඛ්‍යාවක් ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම්ව දත්ත ආරක්ෂණය සඳහා නීති සකස් කර සම්මත කර ඇත[74].

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සමග පෞද්ගලිකත්වයට ඇති සම්බන්ධය කුමක්දැයි ඔබ ඔබගෙන්ම විමසන්නේ නම්, එයින් අදහස් වන්නේ ඔබ විචාරශීලී චින්තනයෙන් යුක්ත බවයි. මන්ද යත්, මෙය වලංගු ප්‍රශ්නයක්

71. Cannataci, J., Zhoa, B. et al. 2016. Privacy, Free Expression and Transparency: Redefining their new boundaries in the digital age. Paris, UNESCO.
72. Ibid at 1

73. Ibid at 55
74. United Nations Conference on Trade and Development' Data Protection and Privacy Legislation Worldwide, https(//unctad.org/en/Pages/DTL/STI_and_ICTs/ICT4D-Legislation/eCom-Data-Protection-Laws.aspxAccessed on 19 August 2020

වන බැවිනි. මෙහි 1වන මොඩියුලයෙන් සහ අනෙකුත් අදාළ මොඩියුල තුළින්, පුළුල් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා ගෙනහැර දක්වා පැහැදිලි කර ඇත. සියලු ආකාරයේ තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් තාක්ෂණය සමග විචාරශීලීව සහ ප්‍රයෝජනවත් අරමුණු සහිතව අන්තර්ක්‍රියා කිරීම සඳහා පුද්ගලයෙකුට අවශ්‍ය වන දැනුම, කුසලතා සහ ආකල්ප මෙම නිපුණතා අතරට ඇතුළත් වේ. තමාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරගැනීම සඳහා අවශ්‍ය වන නිපුණතා යනු නෛසර්ගිකවම අන්තර්ගතය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ අදාළ අන්තර්ගතය සපයන ආයතන සමග සම්බන්ධව කටයුතු කිරීම පිළිබඳ නිපුණතා වේ. "තමාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරගැනීම සහ අනෙකාගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම යනු මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා ක්‍රියාවෙහි යෙදවෙන අවස්ථාවක් සඳහා උදාහරණයකි[75]." මෙහිදී පාඨකයා සඳහා නිදර්ශන දෙකක් ලබා දී ඇත. තොරතුරු නිශ්චයනය කිරීම හා වීම තොරතුරු වෙත ප්‍රවේශ වීම මෙන්ම තොරතුරු සදාචාරාත්මකව හා වගවීමෙන් යුතුව භාවිතය හා සම්බන්ධ මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නිපුණතාව මින් පළමුවැන්නයි. තම පෞද්ගලික තොරතුරු නිශ්චයනය කළ හැක්කේ කාටද, වීය සිදු කරන්නේ කෙසේද, ඔවුන් වීවා භාවිත කරන්නේ කවර අරමුණක් උදෙසාද සහ සිය පෞද්ගලික දත්ත ආරක්ෂා කරගැනීමට පුද්ගලයකු කුමක් කළ යුතුද යන්න පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට වීය පුද්ගලයන්ට උපකාර් වනු ඇත. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ දෙවන නිදසුනකින් කියැවෙන්නේ, පෞද්ගලිකත්ව පිළිබඳ සමාජ, ආර්ථික සහ දේශපාලන සන්දර්භය අවබෝධ කර ගැනීම සඳහා මාර්ගගත හෝ මාර්ග අපගත අන්තර්ගත සපයන්නන්ගේ භූමිකාව සහ ක්‍රියාකාරිත්වය අවබෝධ කර ගැනීම පුද්ගලයන් හට උපකාර වන ආකාරයයි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ආයතන පිළිබඳ අවබෝධය මගින්, සංවේදක සහ ඇල්ගොරිතම අපගේ හැසිරීම් හඹා යාම සහ සුපරීක්ෂාවට යටත් කිරීම සිදු කරන ආකාරය පිළිබඳ දැනුමට රුකුල් දෙන අතර, නිසි ආරක්ෂණයකින් තොර වූ කල, අපගේ අනාගත තීරණ -ගැනීමේ හැකියාව තුළ අපගේ කාරකත්වය සහ ස්වාධිකාරය අඩපණ බළ හැකි ආකාරවලින් නිරත්තර අපව ඉලක්ක කරගැනීමට භාවිත කරන දත්ත සම්පාදනය ද සිදු කරයි.

පෞද්ගලිකත්වය තිරසර සංවර්ධන ඉලක්ක හා බැඳී පවතී. තිරසර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත සංවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් වූ ජනතාවගේ නියැලීම් අන්තර්ගත සපයන්නන්ගේ මැදිහත්වීමෙන් සිදු වන අතර, ඔවුන්ගේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා මට්ටම අනුව හැඩගැසී ඇත. මේ අනුව ගත් කල, පෞද්ගලිකත්වයට අයුතු ලෙස මැදිහත්වීම මගින් සමාජය තුළ තොරතුරු ගලායාම වෙනස් කළ හැකිය. උදාහරණයක් ලෙස 5වන තිරසර සංවර්ධන ඉලක්කය වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම යන්න සලකා බලන කල, අන්තර්ජාලය තුළ ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින ස්ත්‍රී විරෝධී අදහස් මෙන්ම කාන්තා මාධ්‍යවේදීන්ට සහ කාන්තා බ්ලොග්කරුවන්ට එරෙහිව අන්තර්ජාලය ඔස්සේ සිදුකරන ප්‍රහාරවලදී ඔවුන්ගේ අදහස් ප්‍රකාශනය වැළැක්වීම සඳහා බිය ගැන්වීම යනාදී දේවලට පෞද්ගලික තොරතුරු භාවිතා කරනු ලබයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ පෞද්ගලිකත්වය අවබෝධ කර ගැනීම මගින්, පුද්ගලයෙකුගේ පෞද්ගලික තොරතුරු සමග තිරසර සංවර්ධන ඉලක්කයන්හි ආර්ථික, සමාජයීය සහ පාරිසරික මානයන් හා සම්බන්ධ සංවර්ධනය පිළිබඳ තොරතුරු මෙන්ම පොදු තොරතුරුද සම්බන්ධ කෙරේ.

මෙම මොඩියුලය, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ පෞද්ගලිකත්වයේ මූලික කරුණු, දත්ත නිර්මාණය සහ භාවිතය, පෞද්ගලිකත්වය හා සංවර්ධනය අතර පවතින සම්බන්ධතාව සහ පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය හා දත්ත ආරක්ෂා කිරීම සඳහා වන ආචාරධර්ම හා ආයතනික බැඳීම් යනාදිය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්, ශික්ෂණවිද්‍යා උදාහරණ සහ සම්පත්සපයන චීකක හතරකින් සමන්විත වේ.

75. Ibid at 54

ඒකක

1වන ඒකකය :
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ
පෞද්ගලිකත්වය අවබෝධ කර ගැනීම

2වන ඒකකය :
පෞද්ගලිකත්වය, දත්ත සහ සංවර්ධනය

3වන ඒකකය :
පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය
සඳහා ආයතනික බැඳීම් පිළිබඳ
දැනුවත්භාවය

1වන ඒකකය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ පෞද්ගලිකත්වය අවබෝධ කරගැනීම

කාලසීමාව: පැය 2

ප්‍රධාන මාතෘකා

- පෞද්ගලිකත්වය පිළිබඳ නිපුණතා හැඳින්වීම
- මාර්ගගත පෞද්ගලිකත්වය කළමනාකරණය
- පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම
- මාර්ගගත දත්ත සදාචාරාත්මක අයුරින් භාවිතා කිරීම
- මාර්ගගත දත්ත නිර්මාණය හා භාවිතය.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා තිබිය යුතුය:

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ මාර්ගගත පෞද්ගලිකත්වය හා සම්බන්ධ කාරණා සහ ගම්‍යාර්ථ විස්තර කිරීම
- මාර්ගගතව පවතින පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා උපායමාර්ග හඳුනාගැනීම
- මාර්ගගත ක්‍රියාකාරකම් මගින් දත්ත නිර්මාණය කෙරෙන බව සහ මාර්ගගත පෞද්ගලික තොරතුරු සහ කීර්තිනාමය කළමනාකරණය කරන ආකාරය අවබෝධ කර ගැනීම.

මෙම ඒකකය තුළින් ඉලක්ක කෙරෙන නිපුණතා මට්ටම

- මූලික.

පෞද්ගලිකත්වය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි අන්තර්ඡේදන

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා යනු තම පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීම සඳහා පවතින නිපුණතා වේ.

පෞද්ගලිකත්වය වැනි මානව හිමිකම්වලට ගරු කිරීමේ සහ ආරක්ෂා කිරීමේ වගකීම දරන්නා මූලිකවම රාජ්‍යය වුවද, පුද්ගලයන්ට තම පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමට උපකාරී වීම සඳහා අවශ්‍ය වන නිපුණතා නෛසර්ගිකවම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා වේ. පහත දැක්වෙන්නේ යුනෙස්කෝ සංවිධානය විසින් යෝවන පර්යාලෝක සමග මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ පෞද්ගලිකත්වය පිළිබඳ සිදු කළ සමීක්ෂණයෙන් ලබා ගත් වගු දෙකකි. එමගින් පෞද්ගලිකත්වය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව අතර පැහැදිලි සම්බන්ධයක් ඇති කෙරෙන අතර ශික්ෂකයන් සඳහා සම්පත් කට්ටලයක් පිරිනමයි. ශික්ෂකයන් හට පහත ලැයිස්තුගත කර ඇති එක් එක් නිපුණතා මූලික කොටගත් පාඩම් සැලසුම් සහ කණ්ඩායම් සාකච්ඡා/විවාද වැනි ක්‍රියාකාරකම් සකස් කර ගත හැකි ය.

8.1 වගුව පෞද්ගලිකත්වය පුද්ගලයාට අදාළ වන ආකාරය[76] සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සමග එහි ඇති සම්බන්ධතාව

පෞද්ගලිකත්වය හා සම්බන්ධ ප්‍රස්තුත නිපුණතාව	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ ගැඹිවූ/ සංකලිත පෞද්ගලිකත්වය
සයිබර් අවකාශය තුළ ස්වකීය පෞද්ගලිකත්ව අයිතිවාසිකම්වල අවශ්‍යතාව සහ වටිනාකම අවබෝධ කර ගැනීම →	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ, පුද්ගලයාගේ පෞද්ගලිකත්ව අයිතිවාසිකම් මාර්ගගත සහ මාර්ග අපගත මානව හිමිකම් සමග අන්තර් සම්බන්ධිත විය යුතුය. මෙයට අන්තර්ජාලය වෙත ප්‍රවේශ වීමේ හැකියාව හා වෙනස් කොට සැලකීමට ලක් නොවීම, අදහස් ප්‍රකාශනයේ සහ තොරතුරු දැනගැනීමේ නිදහස, ඒකරාශී වීමේ, සංවිධානය වීමේ හා සහභාගීත්වයේ නිදහස, අධ්‍යාපනය සහ සාක්ෂරතාව, ළමුන් සහ තරුණ ජනතාව සඳහා විශේෂ ආරක්ෂාව, සහ 'ඔබේ මානව හිමිකම් සහ මූලික නිදහස සීමා කරන විට හෝ උල්ලංඝනය වන විට ඵලදායී පිළියමක් යෙදීම සඳහා ඇති අයිතිය යනාදිය ඇතුළත් වේ[77].
පෞද්ගලික චරිත සටහන් සහ තොරතුරු, විශේෂයෙන්ම මාර්ගගතව, වෙළෙඳ භාණ්ඩකරණයට ලක්වීම සහ ඒවායින් මුදල් ඉපැයීම පිළිබඳ දැනුවත්භාවය →	අන්තර්ජාල/තාක්ෂණික අතරමැදිකරුවන් මෙන්ම මාධ්‍ය හට ද සිය පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති සඳහා වගකිව යුතු බවට බලකර සිටින අතරම අන්තර්ජාල යෙදුම් සහ සේවා සඳහා සහාය වීමට නිර්නාමික දත්තවලට හැකියාව ඇති බව ද අගය කොට සැලකීම. අන්තර්ජාලය තුළ 'නොමිලේ' සැපයෙන සේවා වෙත සහ ස්වාධීන සහ බහුත්වවාදී 'නිදහස්' මාධ්‍ය වෙත ප්‍රවේශ වීම සඳහා පෞද්ගලිකත්වයෙන් පිරිවැයක් දැරීමට සිදු වේ. කෙසේ වෙතත්, මෙම පිරිවැය කිසි විටෙකත් අවභාවිතයට ලක් නොවිය යුතු අතර එයට විනිවිදභාවයෙන් යුත් පරිශීලක අනුමතිය අවශ්‍ය විය යුතුය.
පෞද්ගලිකත්වය සහ නිර්නාමිකත්වය ඉල්ලා සිටිය යුත්තේ කුමන අවස්ථාවලදීද හා කෙසේද යන්න සහ අන් අයගේ පෞද්ගලිකත්වයට සහ නිර්නාමිකත්වයට ගරු කළ යුත්තේ කුමන අවස්ථාවලදීද යන්න වටහාගැනීම →	තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ඇතුළුව අදහස් ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීම සඳහා පෞද්ගලිකත්වය හා නිර්නාමිකත්වය අවශ්‍ය වන බව සහ, ගුප්ත කේතන පද්ධති මෙයට රුකුලක් විය හැකි බව වටහා ගැනීම සහ අගය කොට සැලකීම.
පෞද්ගලික තොරතුරු **මාර්ගගත හෝ මාර්ග අපගත ආකාරයට** බෙදාගැනීමේදී වෙනස නිවැරදිව හඳුනාගැනීමේ විචාර බුද්ධියක් ඇති කර ගැනීම →	අදහස් ප්‍රකාශනයේ නිදහසට බාධාවක් විය හැකි ස්වයං-වාරණයෙන් වැළකී සිටීමින්, තමන් සචේතනිකව බෙදා ගන්නා දේ හෝ බෙදා නොගන්නා දේ පිළිබඳ පුරවැසියන් පෞද්ගලික සහ අවබෝධිත තීරණ ගත යුතුය.
මාර්ගගත වේදිකා ඇතුළු ආයතන ඇගයීමට හා ඒවා සමග සම්බන්ධ වී කටයුතු කිරීමට ඇති හැකියාව සහ පෞද්ගලිකත්වය හා ඒවායේ දත්ත කළමනාකරණ පරිචය අර්ථ දැක්වීමට ඇති හැකියාව →	රාජ්‍ය බලය විසින් අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබීමේ අවදානම් පහත හෙළීමේ පියවරක් ලෙස, රජයේ නියාමනයට වඩා ස්වයං-නියාමනය හෝ සම-නියාමනයට පක්ෂව කටයුතු කිරීම සහ සමතුලිත කිරීම සිදු කරන අතරම, ප්‍රතිපත්ති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේ අතරමැදිකරුවන සහ මාධ්‍ය සමග සම්බන්ධව කටයුතු කිරීම.
ඩිජිටල් පරිසර තුළ පවතින පෞද්ගලිකත්වය හා සම්බන්ධ අවදානම් සහ ප්‍රතිලාභ වටහාගැනීම සහ ඒ අනුව පෞද්ගලිකත්ව සිටුවම් /මට්ටම් සකස් කර ගැනීමට හැකියාව ලබා ගැනීම →	පෞද්ගලික ආරක්ෂාව, අන්‍යයන්ගේ ආරක්ෂාව සහ ජාතික ආරක්ෂාව හමුවේ පෞද්ගලිකත්ව අවදානම් සහ ප්‍රතිලාභ සලකා බැලීම. නීත්‍යානුකූලභාවය, අවශ්‍යතාව, සමානුපාතිකත්වය සහ නීත්‍යානුකූල අරමුණ අනුව ජාත්‍යන්තර ප්‍රමිතීන් ආරක්ෂා කර ඇති තාක් කල්, පෞද්ගලිකත්වයේ ඇතැම් මට්ටම් වෙනත් අයිතිවාසිකම් :ආරක්ෂාව සඳහා ඇති අයිතිය හෝ කීර්තිය සඳහා ඇති අයිතිය ඇතුළුව) ආරක්ෂා කිරීම සඳහා පමණක් සීමා විය හැකි බව වටහා ගැනීම.
අන්‍යයන්ගේ පෞද්ගලික තොරතුරු සදාචාරාත්මක අයුරින් භාවිතා කිරීම සහ අන්‍යයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම →	තොරතුරු සහ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ පුළුල් අවබෝධය.

මූලාශ්‍රය: යුනෙස්කෝ, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ පෞද්ගලිකත්වය පිළිබඳ ගෝලීය සමීක්ෂණය සමග යාවන පර්යාලෝක. අන්තර්ජාල නිදහස පිළිබඳ යුනෙස්කෝ ග්‍රන්ථ මාලාව. යුනෙස්කෝ,පැරිසිය.

76. මෙම නිපුණතා Privacy Piece, Media Awareness Network" 2011 වෙතින් උපුටා ගන්නා ලදි.
77. Council of Europe, 2014 බලන්න.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශය: විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- ශොෂානා සුබොෆ් (2019) විසින් 'සුපරික්ෂා ධනවාදය' ලෙස හඳුන්වනු ලබන, පෞද්ගලිකත්වය, පුද්ගලික තොරතුරු, ඩිජිටල් පියසටහන, මාර්ගගත කීර්තිනාමය ආදිය මෙන්ම, පෞද්ගලිකත්ව සිටුවම් වැනි පෞද්ගලිකත්වය පිළිබඳ සංකල්ප (අර්ථ දැක්වීම් සහ වචන මාලාව) හඳුන්වා දෙන්න. ඉහත සංකල්ප සහ මෙම විෂයමාලාව තුළ ඇතුළත් තවත් බොහෝ සංකල්ප පිළිබඳ ඉදිරිපත් කර ඇති අර්ථ දැක්වීම් සඳහා පාරිභාෂික පදමාලාව බලන්න. පෞද්ගලිකත්වය හා සම්බන්ධ මූලික සංකල්පවල පදනම අවබෝධ කරගැනීමෙන් අනතුරුව, ඩිජිටල් තාක්ෂණය සහ එහි යෙදවුම් භාවිතා කිරීමෙන් පුද්ගලයකු කෙරෙහි ඇති විය හැකි පෞද්ගලිකත්ව ගම්‍යාර්ථ, ආරක්ෂිතව බෙදාගත හැකි තොරතුරු වර්ග, පෞද්ගලිකව පැවතිය යුතු වන්නේ කුමන ආකාරයේ තොරතුරුද යන්න හා තොරතුරු එසේ පුද්ගලිකව පැවතිය යුත්තේ කුමන අවස්ථාවලදීද යන්න, පෞද්ගලිකත්ව හා මාර්ගගත සිටුවම් කළමනාකරණය, මාර්ගගත ආකාරයට බෙදාගත් තොරතුරුවල ස්ථිරභාවය පිළිබඳ අවබෝධය සහ අපගේ මාර්ගගත සහ මාර්ග අපගත ජීවිතයට ඩිජිටල් තාක්ෂණ මගින් ඇති කරනු ලබන බලපෑම වැනි මෙම සංකල්ප ආශ්‍රිත නිපුණතා හඳුන්වාදෙන්න.
- සෑම කෙනෙකුගේම ඩිජිටල් පියසටහනෙහි වැදගත්කම අවධාරණය කරන්න. නිදසුනක් වශයෙන්, ලාබාල පිරිමි සහ ගැහැණු ළමයින්ට ඔවුන් විසින්ම නිර්මාණය කරන ලද සමාජ මාධ්‍ය ගිණුම් නොමැති විටෙක වුවද, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් යම් අවස්ථාවක දී ඔවුන් පිළිබඳ තොරතුරු අන්තර්ජාලයට ඇතුළත් කර තිබිය හැකිය. අපගේ ඩිජිටල් පියසටහන් යනු මාර්ගගතව අපව නියෝජනය කරනු ලබන දෑය. පුද්ගලයෙකු වශයෙන් අපගේ හැසිරීම අපගේ මාර්ගගත හැසිරීම තුළින් පිළිබිඹු වන අතර අපගේ මාර්ගගත හැසිරීම පුද්ගලයෙකු වශයෙන් අපගේ හැසිරීම තුළින් පිළිබිඹු වේ[78]. සන්දේශ, ඡායාරූප, සබැඳි,'අදහස් දැක්වීම්' සහ "කැමැත්ත පළකිරීම්" (likes) ප්‍රවේශමෙන් පළ කළ යුතුය. තොරතුරු මාර්ගගතව පළ කළ පසු, එය පාලනය කිරීමට අපහසු වන අතර එහි මුල් පළ කිරීමට වඩා වැඩි කාලයක් මාර්ගගතව පවතී. ඔබට කිසිදා හමු නොවූ පුද්ගලයන් විසින් ඔබේ ඩිජිටල් පියසටහන දකිනු ලැබිය හැකිය. ඔවුන් හරහා ප්‍රවේශ වන අන්තර්ජාල සේවා සපයන්නෝ මෙන්ම යෙදවුම් සැපයුම්කරුවෝ 'රාශිය' ද , ඔබගේ සෙවුම් සහ පිරික්සුම් ඇතුළු ඩිජිටල් අන්තර්ගතය රඳවා ගැනීමේ සහ විශ්ලේෂණය කිරීමේ නැඹුරුවක් පෙන්නුම් කරති.
- පහත සඳහන් කරුණු කිහිපයක් භාවිත කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න: (1) වෙනත් පුද්ගලයෙකුගේ තොරතුරු, වීඩියෝ, ඡායාරූප ආදිය බෙදාගැනීම සුදුසු වන්නේ කුමන අවස්ථාවලදී ද? (2) ඔබ රහස් බෙදාගන්නේ කා සමගද? (3) ඔබ එම තොරතුරු වෙනත් පුද්ගලයින් සමග බෙදා නොගන්නේ මන්ද? (4) ආරක්ෂා කිරීම වැදගත් වන්නේ කුමන ආකාරයේ තොරතුරුද? (උදා. මුරපද, ඊමේල්, ජංගම දුරකතන අංක ආදිය). පුද්ගලයකු විසින් මාර්ගගතව පළ නොකළ යුතු හෝ නාඳුනන අයට ලබා දීම අනවශ්‍ය වන පෞද්ගලික තොරතුරු වර්ග සම්බන්ධයෙන් සාකච්ඡාවකට යොමුවීම සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- ඔබ ශික්ෂකයෙක් නම්, Baidu, Google, Yandex, DuckDuckgo, Yahoo, Bing, Apple වැනි විවිධ සෙවුම් යන්ත්‍ර භාවිතයෙන් ඔවුන් ගැනම සෙවීමක යෙදීම සඳහා ශිෂ්‍යයන් කණ්ඩායමට මග පෙන්වන්න. ඔවුන් සොයා ගන්නා තොරතුරු කිහිපයක් කණ්ඩායමට ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට පවසන්න. ඇතැම් තොරතුරු ඔවුන්ව පුදුමයට පත් කළේද යන්න පිළිබඳ ඔවුන් අදහස් දැක්විය යුතුය. විවිධ සෙවුම් යන්ත්‍රවලින් තමන් ගැන සොයා ගත් තොරතුරු සංසන්දනය කරන ලෙසද ඔවුන්ට පවසන්න. වෙනස් වන්නේ සහ සමාන වන්නේ කුමන තොරතුරුද? එම තොරතුරු අන්තර්ජාලයට පැමිණියේ කෙසේද? ඔවුන් ඒවා පළ කළාද? විවිධ සෙවුම් යන්ත්‍ර තුළ ඔවුන් ගැන ඇති දත්ත වර්ගවල ගම්‍යාර්ථ විචාරශීලීව සාකච්ඡා කිරීමට ශිෂ්‍යයන් හට මග පෙන්වන්න. Line,

78. Carlsson, U. (Ed.). (2019). Understanding Media and Information Literacy (MIL) in the Digital Age: A Question of Democracy. UNESCO, Göteborg Sweden

WeChat, Instagram, VK, Snapchat, Facebook, LinkedIn, TikTok, Twitter,Telegram හෝ Signal වැනි ජනප්‍රිය සමාජ මාධ්‍ය වේදිකාවක පවතින පෞද්ගලිකත්ව සිටුවම් සමාලෝචනය කරන්න. සමාජ මාධ්‍ය තුළ පළ කරන ඡායාරූප සහ අනෙකුත් අන්තර්ගත සැමවිටම ආරක්ෂිත නොවේ. ඇතැම් විට ඔබ විසින් 'බෙදා ගන්නා' ලද ඡායාරූපවල වේලාව සහ ස්ථානය පිළිබඳ සැඟවුණු ලකුණු ඇති අතර එය ඔබේ ලිපිනය විය හැකිය. ඔබගේ සමාජ මාධ්‍ය ගිණුම් මගින් පිරිනමනු ලබන පෞද්ගලිකත්වය සුරැකීම සඳහා වන විශේෂාංග පිළිබඳ දැන ගැනීම වැදගත් වේ. ඔබගේ සමාජ මාධ්‍ය ගිණුම් සියල්ලටම 'පෞද්ගලිකත්ව සිටුවම්' හෙවත් 'Privacy Settings' නම් අංගයක් ඇති අතර, එය ගවේෂණය කරන්න. එවිට ඔබ මාර්ගගතව පළ කරන තොරතුරු වෙත ප්‍රවේශ විය හැක්කේ කාහටද, අන් අයට ඔබව ඔවුන්ගේ මාර්ගගත පළ කිරීම්වල සලකුණු (tag) කළ හැකිද සහ, ඔබගේ මාර්ගගත චරිත සටහන තුළින් ඔබගේ ජීවිතය පිළිබඳ කවරාකාරයේ තොරතුරු දෘශ්‍යමාන වේද යන කාරණා ඔබට දැන ගත හැකි වේ.

- වඩාත් සුලභව භාවිතා වන ගිණුම් මුරපද ලැයිස්තුගත කරන ලිපි රාශියක් අන්තර්ජාලයේ ඇත. මෙම ලිපිවලින් එකක් ලබාගෙන එය ශිෂ්‍යයන් සමග බෙදා ගන්න. ඔවුන් මෙම මුරපද වලින් එකක් භාවිතා කරනවාද? එම මුරපද භාවිතා කරන ඔවුන් දන්නා වෙනත් කෙනෙක් සිටීද? ඔවුන්ගේ තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා ශක්තිමත් මුරපදයක් භාවිතා කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.
- "එක් අතකින්, මාධ්‍යනිර්මිත පරිසර තුළ දත්ත කළමනාකරණ කුසලතාව තුළින්, අන්තර්ජාල තාක්ෂණිකත්වයන්ට අදාළ විවිධ පෞද්ගලිකත්ව කාර්යයන් : එනම්, දත්ත ආරක්ෂාව සම්බන්ධ තාක්ෂණික හැසිරීම්) කෙරෙහි වඩා වැඩි නිපුණත්වයක් දැක්විය හැකි පිරිමි පරිශීලකයින්ට වැඩි වාසියක් අත්වීමේ විභවයක් පවතී. අනෙක් අතට, අධ්‍යස්ත දත්ත නිරාවරණය සම්බන්ධයෙන් නෛසර්ගිකව පවතින පෞද්ගලිකත්වය පිළිබඳ සැලකිල්ල තුළින්, පෞද්ගලිකපොදු සීමා සැකසුමක් : එනම්, දත්ත ආරක්ෂණය තුළ සමාජ හැසිරීම්) සඳහා සමාජයීය වශයෙන් වඩාත් යෝග්‍ය වන පෞද්ගලිකත්ව කුසලතා පුහුණු කිරීමට කාන්තාවට වැඩි ඉඩක් ලබා දීම හෝ ලබා නොදීම සිදු විය හැකි ය.අන්තර්ජාල පෞද්ගලිකත්වය හා සම්බන්ධව කටයුතු කිරීමේ කුසලතා අඩු මට්ටමක පවතින අය විෂමතා චක්‍රයක සිර වනු ඇති අතර, පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමේ කුසලතා මට්ටම් වැඩි දියුණු කර ගැනීම අවශ්‍ය කෙරෙන මාර්ගගත පරිසරයක් තුළ සාර්ථකත්වය ලබා ගත හැකි තත්ත්වයක පසු නොවීමට ඉඩ ඇත (Park,2015;p.253)." මෙම ප්‍රකාශ මූලික කරගෙන කණ්ඩායම් විවාදයක් සංවිධානය කරන්න. අදාළ ප්‍රකාශයට සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසකට ඔවුන් එකඟ වන්නේද නැතහොත් එකඟ නොවන්නේද යන්න සහ එයට හේතුව පිළිබඳ තොරතුරු ගවේෂණය කොට එය සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයින් හට මග පෙන්වන්න.
- Kaspersky, Norton, Avira iy Avast යනු ඉතා ජනප්‍රිය ප්‍රතිවයිරස සහ දත්ත ආරක්ෂණ සමාගම් වේ. ඊට අමතරව තවත් සමාගම්ද පවතී. හදරුඑදබ සමාගම විසින් ඉදිරිපත් කරන ලද පහත උපදෙස් සලකා බලන්න. එම උපදෙස් ශිෂ්‍යයින් සමග සාකච්ඡා කරන්න. ඔවුන් සත්‍ය වශයෙන්ම මෙම උපදෙස් කොතරම් දුරට අනුගමනය කරන්නේද යන්න ගවේෂණය කරන්න. ඔවුන් ඒවා සියල්ලටම එකඟද? එකඟ වීමට හේතුව හෝ එකඟ නොවීමට හේතුව කුමක්ද?
    - ඔබ සමාජ මාධ්‍ය තුළ බෙදාගන්නා පුද්ගලික තොරතුරු සීමා කරන්න
- අප්‍රකට ප්‍රකාරය (incognito) ප්‍රකාරය හෝ පෞද්ගලික ප්‍රකාරය භාවිතයෙන් පිරික්සීම (browse) කරන්න
    - වෙනස් සෙවුම් යන්ත්‍රයක් භාවිතා කරන්න
    - අතථ්‍ය පෞද්ගලික ජාලයක් භාවිතා කරන්න
    - ඔබ ක්ලික් කරන ස්ථාන පිළිබඳ ප්‍රවේශම් වන්න
    - ඔබගේ ජංගම උපාංග සුරක්ෂිත කරන්න
    - ගුණාත්මක බවින් ඉහළ ප්‍රතිවයිරස මෘදුකාංගයක් භාවිතා කරන්න
- මාර්ගගතව පවතින පෞද්ගලිකත්ව මෙවලම් ලැයිස්තුව සලකා බලන්න.

- www.haveibeenpwned.com : ඔබගේ මුරපදය, පරිශීලක නාමය සහ විද්‍යුත් තැපෑල අවසරයක් නොමැති පාර්ශ්ව වෙත නිරාවරණය වී ඇත්දැයි පරීක්ෂා කිරීමට
- Tor, www.torproject.org: වඩාත්ම බහුලව භාවිතා වනු ලබන නොමිලේ පිරිනැමෙන VPN සේවාවකි : අතථ්‍ය පෞද්ගලික ජාලයකි)
- Anonymizer, https://ntrepidcorp.com/: ඔබට වඩාත් නිර්නාමිකව පිරික්සීමට උපකාර වන වෙබ් අඩවියකි. මෙවැනි ඇතැම් සේවා ඔබගේ තොරතුරු ගබඩා කර තබා ගන්නා බැවින් ප්‍රවේශම් වන්න. පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති ප්‍රවේශමෙන් කියවා ඔබගේ ජාලයේ වඩාත් පළපුරුදු පුද්ගලයන්ගෙන් උපකාර ලබා ගන්න
- Privacy Badger, https://privacybadger.org/:do-not-track-me විශේෂාංග හෙවත් අන්තර්ජාලය තුළ ඔබගේ හැසිරීම් සලකුණු නොවී පැවතීම ක්‍රියාත්මක කිරීමට ඔබට උපකාරී වන බ්‍රවුසර දිගුවකි
- පුද්ගලයකුගේ මාර්ගගත පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා, ප්‍රකට විෂය ප්‍රවීණයෙක් සහ පෞද්ගලිකත්වය වෙනුවෙන් පෙනී සිටින්නකු වන Paul Bischoff[10] විසින් සම්පාදිත, නොමිලේ ලබාගත හැකි මෙවලම් 73කට අධික ප්‍රමාණයක්[79] මෙහි දක්වා ඇත.

- මෙම මෙවලම් පිළිබඳව කොපමණ පිරිසක් දැනුවත් දැයි සමීක්ෂණය කිරීමට ඉක්මණින් අත් ඔසවා පෙන්වන්න යැයි ශිෂ්‍යයින්ට පවසන්න. කොපමණ දෙනෙක් සත්‍ය වශයෙන්ම ඒවා භාවිත කරනවාද? ශිෂ්‍යයින් කුඩා කණ්ඩායම්වලට වෙන් කර, තෝරාගත් මෙවලම් කිහිපයක ශක්තීන් සහ දුර්වලතා විමර්ශනය කිරීමට ඔවුන්ට මග පෙන්වන්න. මාර්ගගතව කෙනෙකුගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා පවතින වෙනත් ප්‍රයෝජනවත් මෙවලම් නම් කිරීමට හෝ ලැයිස්තුගත කිරීමට ඔවුන්ට හැකිද? ඇතැම් මෙවලම් සඳහා විශේෂඥ සහාය අවශ්‍ය වන බැවින් ප්‍රවේශම් වන්න.
- යෙදුම් මගින් ඔබ පිළිබඳ දත්ත ලක්ෂ්‍ය කොපමණ ප්‍රමාණයක් එකතු කරගන්නේද යන්න සහ අන්තර්ගත පෝෂණ, නිර්දේශ සහ වෙළෙඳ ප්‍රචාරණය ඉදිරිපත් කිරීම සහ පාලනය කිරීම සඳහා මේවා භාවිත කරන්නේ කෙසේද යන්න පිළිබඳ මාර්ගගත සෙවීමක් කරන්න. "The Social Dilemma" චිත්‍රපටය වැනි මෙම ගැටලු පිළිබඳ සාකච්ඡා කෙරෙන වාර්තා චිත්‍රපට නැරඹීම සහ තොරතුරු ගවේෂණය කිරීම සිදු කොට ස්වයං ආරක්ෂාවෙන් ඔබ්බට මේ සඳහා ගත හැකි විසඳුම් පිළිබඳ විවාදයක් පවත්වන්න.

ඇගයීම සහ නිර්දේශ

- nordpass.com සහ password.kaspersky.com වැනි වෙබ් අඩවියක් භාවිතා කර මුරපදවල ශක්තිමත්භාවය පරීක්ෂා කරන්න. ශිෂ්‍යයන් හට මෙහිදී යොදා ගත හැකි නව මුරපද සාකච්ඡා කර එම මුරපදවල ශක්තිමත් භාවය පරීක්ෂා කරගත හැකි අතර ඔවුන්ගේ මුරපදවල ශක්තිමත්භාවය වැඩි කළ හැකි අංග පිළිබඳ ප්‍රතිපෝෂණද ලබා ගත හැකි ය. ඒ හා සමානවම, මෙම වෙබ් අඩවිවල ආරක්ෂිත මුරපද උත්පාදකද නිතර දක්වන බැවින් මෙය ශිෂ්‍යයන්හට ඔවුන්ගේම මුරපද සඳහා ආභාෂයක් ලබා ගැනීමට උදාහරණ සොයා ගැනීම සඳහා සහාය විය හැකිය.
- මාර්ගගත උපස්ථිතිය පිළිබඳ විශ්ලේෂණය සමාජ මාධ්‍ය තුළ සිය උපස්ථිතිය විශ්ලේෂණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න. මාර්ගගත සෙවීමක් සිදු කිරීම තුළින් ඔවුන්ට ඔවුන්වම සොයා ගත හැකිද? ශිෂ්‍යයෙකුගේ තෝරාගත් සමාජ මාධ්‍ය චරිත සටහනෙහි අන්තර්ගතය අදාළ වේදිකාවේ අරමුණ (උදා. සමාජ, වෘත්තීය, ආදිය) සමග ගැළපෙන්නේද? ඔවුන්ගේ සමාජ මාධ්‍ය වේදිකාවේ අන්තර්ගතය ඔවුන්ව නිවැරදිව නිරූපණය කරන්නේද?
- විවිධ ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ, ශිෂ්‍යයන් විසින් සිදු කරනු ලබන ඒවායේ මූලික භාවිතය සංවර්ධනය සහ විශ්ලේෂණය. වේදිකාවේ අන්තර්ගතය ඔවුන්ව නිවැරදිව නිරූපණය කරන්නේද?

79. Paul Bischoof, https://www.comparitech.com/blog/vpn-privacy/75-free-tools-to-protect-your-privacy- online/.

2වන ඒකකය: පෞද්ගලිකත්වය, දත්ත සහ සංවර්ධනය

කාලසීමාව: පැය 3

ප්‍රධාන මාතෘකා

- දත්ත මත පදනම් වූ සංවර්ධනය
- තිරසර සංවර්ධන ඉලක්ක
- පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය
- පුද්ගල සංවර්ධනය සහ සමාජ සංවර්ධනය කෙරෙහි පෞද්ගලිකත්වයේ බලපෑම
- පෞද්ගලිකත්වය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, තොරතුරු වෙත ප්‍රවේශය
- පෞද්ගලිකත්වය සහ විනිවිදභාවය.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- දත්ත මගින් අන්තර්ගතය සහ ව්‍යාපාර ආකෘතීන් මෙන්ම සමාජ හා ආර්ථික සංවර්ධනය ද මෙහෙයවිය හැකි ආකාරය පිළිබඳ මූලික කරුණු අවබෝධ කරගෙන විස්තර කිරීම
- පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය අතර වෙනස හඳුනාගැනීම
- පෞද්ගලිකත්වය, පුද්ගලික සංවර්ධනය සහ සමාජ සංවර්ධනය අතර අන්තර්ක්‍රියා ගවේෂණය කිරීම
- තම අදහස් නිදහසේ ප්‍රකාශ කිරීම සහ තොරතුරු වෙත ප්‍රවේශ වීම තුළින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මිනිසුන්ට
- පෞද්ගලිකත්වය ඉතා වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කිරීම
- ඔවුන්ගේ පුද්ගලික, ප්‍රාදේශීය සහ සාමාජීය සන්දර්භයන් තුළ මෙම ගැටලු ගවේෂණය කර ප්‍රශ්න කිරීම.

මෙම ඒකකය තුළින් ඉලක්ක කෙරෙන නිපුණතා මට්ටම්

- මූලික මට්ටමේ සිට අතරමැදි මට්ටම දක්වා.

දත්ත සහ සමාජය

දත්ත සහ පෞද්ගලිකත්වය: තිරසර සංවර්ධන ඉලක්කවල ගම්‍යාර්ථ

වඩාත් අන්තර්ග්‍රහණීය සමාජයන් බිහි කිරීමට සහ තිරසර සංවර්ධනය සඳහා පුළුල් නියැලීමක් පවතින බව හා අවබෝධයක් ඇති බව සහතික කිරීමට නම්, වඩාත් ඵලදායී අරමුණු සහිත සැලසුම් මෙන්ම පද්ධතිමය සහ නිවැරදි අධීක්ෂණය සහ ඇගයීම සඳහා හැකියාව ලබාදෙන ආකාරයේ දත්ත තිබීම අවශ්‍ය වේ. 2030 තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහි ලා පදනම වශයෙන් දත්ත විප්ලවයක් ඇති කිරීම සැලකිය හැකි ය. තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුව සහ ඩිජිටල් ආචයන ධාරිතාවල හා වේගයේ සීඝ්‍ර වර්ධනය මගින්, අති විශාල දත්ත ප්‍රමාණයක් රැස් කිරීමට සහ භාවිත කිරීමට අවස්ථාව විවර කෙරේ. සංවර්ධනය හා සම්බන්ධ දත්ත විප්ලවය දෙයාකාරයක් ගනී. ඉන් පළමුවැන්න වඩාත් නිවැරදි සහ මැනිය හැකි කාර්යසාධන සහතික කිරීම සඳහා වන සංවර්ධනය (රජයේ සහ පෞද්ගලික අංශය) පිළිබඳ දත්ත වන අතර, දෙවැන්න පුද්ගලයන්, කණ්ඩායම් සහ ආයතන පිළිබඳ දත්ත වේ.

තිරසර සංවර්ධන ඉලක්ක සහ, මෙම පාලන ක්‍රියාවලි වෙත පුද්ගල සහභාගීත්වය සඳහා පෞද්ගලිකත්වය යන කාරණය වඩාත් අදාළ වන්නේ ඉහත දෙවැන්න සලකා බලන කලදී ය. තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ වැඩිදුර තොරතුරු 13වන මොඩියුලය තුළින් ඔබට කියවීමට හැකි ය. තිරසර සංවර්ධන ඉලක්ක මනිනු ලබන්නේ සහ අධීක්ෂණය කරනු ලබන්නේ කෙසේද යන්න සහ මේවා ඔවුන්ගේ තනි පුද්ගල සහ සාමූහික ජීවිතයට[80] - එනම්, පෞද්ගලික සහ පොදු ජීවිතයට, සම්බන්ධ වන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා උපකාරී විය හැකි ය.

8.1 රූප සටහන: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ තිරසර සංවර්ධනය හා ප්‍රජාතන්ත්‍රවාදය (අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, පෞද්ගලිකත්වය ආදිය) කෙරෙහි එහි වැදගත්කම



එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ ඔවුන් විසින් විශේෂ වාර්තාකරුවන් ලෙස හඳුන්වනු ලබන පිරිසක් ඇත. මොවුහු විවිධ සංවර්ධන විෂයයන් පිළිබඳ පුළුල් අත්දැකීම් සහ ඉහළ ප්‍රවීණත්වයක් ඇති පුද්ගලයෝ වෙති. විවිධ සංවර්ධන ගැටලු පිළිබඳ පුළුල් පර්යේෂණ සිදු කිරීමට සහ ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතීන් වෙත වාර්තා ඉදිරිපත් කිරීමට මෙම විශේෂ වාර්තාකරුවන්ට බලය පැවරී ඇත. මෙම වාර්තා එක්සත් ජාතීන්ගේ විවාද සහ තීරණ සඳහා යොදාගන්නා නිල ලේඛනවල කොටසක් වේ. මෙම මොඩියුලය සකසන අවස්ථාවේදී පෞද්ගලිකත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු වූයේ ජෝසප් කැනටාසි ය. මෙසේ පත් කරනු ලබන පුද්ගලයින් නිශ්චිත කාලසීමාවකින් පසු වෙනස් කරනු ලැබේ. ඔහුගේ එක් වාර්තාවක, බාධාවකින් තොරව පෞරුෂ වර්ධනය සිදු වීම සඳහා හේතු වන උපකාරක ස්ථම්භ තුනක් ඔහු යෝජනා කරයි. ඒවා නම්:

1. පෞද්ගලිකත්වය
2. අදහස් ප්‍රකාශනයේ නිදහස
3. තොරතුරු දැන ගැනීමේ නිදහස.

80. Measuring Media and Information Literacy: Implications for the Sustainable Development Goals (Grizzle,A. 2015). UNESCO and NORDICOM. Media and Information Literacy for the Sustainable Development Goals. (Eds. Jagtar Singh, Alton Grizzle, Sin Joan Yee and Sherri Hope Culver)

මෙම කොටසේදී, අපි පෞද්ගලිකත්වය යන උපකාරක ස්ථම්භය කෙරෙහි අවධානය යොමු කරන අතර ඊළඟ කොටසින්, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ නිදහස වෙත පෞද්ගලිකත්වයේ ඇති සබඳතා පිළිබඳ සාකච්ඡා කරමු.

මෙම මොඩියුලයේ පසුබිමේ දක්වා ඇති පරිදි, අපගේ පෞද්ගලික තොරතුරුවල පැතිකඩ, සංවර්ධන තොරතුරු මෙන්ම, ඇතැම් අවස්ථාවලදී, පොදු තොරතුරු ද අවබෝධ කරගැනීමට සහ ඒ වෙත දායක වීමට උපකාරී වේ. උදාහරණයක් ලෙස, පාරිභෝගිකයින්ගේ පුරුදු පිළිබඳ තොරතුරු ගන්න. මෙම සාමූහික පෞද්ගලික තොරතුරු, ආර්ථික ක්‍රියාකාරීන් විසින් පිරිනමනු ලබන නිෂ්පාදන හෝ සේවා වර්ගය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට උපකාරී වේ. ඒ හා සමානව, අපගේ සමුච්චිත පුද්ගලික සෞඛ්‍ය තොරතුරු, උදාහරණයක් වශයෙන්, ජීවන රටාව හේතුවෙන් ඇතිවන රෝග, කොවිඩ්-19, දියවැඩියාව, අධි රුධිර පීඩනය, හෘද රෝග, පිළිකා වැනි නිදන්ගත රෝග හෝ වසංගත යනාදිය ඉහළ යාමේ අනුපාතික වැනි මහජනයා වෙත ලබාදීමට අවශ්‍ය තොරතුරු සැපයීමේ ලා රජයට සහාය වේ. එසේ නොමැති නම්, දේශපාලන කටයුතුවල නියැලීම හෝ සිවිල් සහභාගීත්වය වැනි සන්දර්භය තුළ, ජනගහනයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට පැමිණෙන තරුණ තරුණියන්ගේ ප්‍රතිශතය වැනි තොරතුරු සම්බන්ධයෙන්ද මෙය අදාළ වේ. ඒ හා සමානව, සමාජයේ සාමාජිකයන් හට බලපෑම් කිරීම සඳහා මෙකී සියලු දත්ත වෙත ප්‍රවේශය භාවිත කරන්නේ කෙසේදැයි කෙනෙකුට පහසුවෙන් සිතාගත හැකි ය.

පෞද්ගලිකත්වය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, තොරතුරු වෙත ප්‍රවේශය සහ විනිවිදභාවය

පෞද්ගලිකත්වය යන්න අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ නිදහස සමග ඒකාබද්ධ වී ඇති අතර ඒවා සියල්ල එක්ව අපගේ පෞද්ගලික වර්ධනයට බලපාන්නේය යන කරුණ ඉහත කොටසින් අවධානයට ලක් කෙරිණි. වඩාත් පුළුල් ලෙස කල්පනා කර බලන විට, මේවා සියල්ල එක්ව තනි පුද්ගලයන් වශයෙන් පමණක් නොව අපගේ පවුල්, ප්‍රජාවන්, ජාතීන් සහ ලෝකය සමග වෙන්කර හඳුනාගත නොහැකි ලෙස සම්බන්ධ වූ පුද්ගලයින් ලෙස ද අප කෙරෙහි බලපායි. සමීපයෙන් හෝ දුරස්ථව අප වටා සිටින අය කෙරෙහි අප සතු සමාජ වගකීම පැහැදිලි කිරීම සඳහා යුනෙස්කෝව විසින් ගෝලීය පුරවැසියන් යන සංකල්පය භාවිතා කරනු ලබයි. අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ වැඩි විස්තර සඳහා 1වන සහ 2වන මොඩියුල බලන්න. ගෝලීය පුරවැසිභාවය පිළිබඳ වැඩි විස්තර සඳහා 5වන මොඩියුලය ද බලන්න. මෙම කොටස මගින් වැඩි අවධානයක් යොමු කෙරෙන්නේ පෞද්ගලිකත්වයට කෙනෙකුගේ අදහස් ප්‍රකාශනයේ හෝ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ නිදහස සඳහා බලය ලබා දීමට හෝ ඒවා අන්තරායට පමුණුවීමට හැකි වන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීමටයි.

වසර 20 කට පමණ පෙර, ඇතැම් කතුවරු, තාක්ෂණයේ ශීඝ්‍ර හා ඝාතීය දියුණුව යන්නෙන්, තමන් සහ තම පවුල පිළිබඳ තොරතුරුවල පාලනය මිනිසුන් වෙතින් වඩ වඩාත් හීන වෙමින් යාම අදහස් වන බවට තර්ක කරමින් 'පෞද්ගලිකත්වයේ මරණය'[81] යන්න සාකච්ඡාවට බඳුන් කළහ. අදහස් ප්‍රකාශනයේ නිදහසට ඒ සමග ඇති සම්බන්ධය කුමක්දැයි කෙනෙක් විමසන්නට පුළුවන. කිසියම් සමාජ ප්‍රශ්නයක් ගැන ඔබේ අදහස් අන්තර්ජාලය තුළ නිදහසේ ප්‍රකාශ කිරීමට ඔබ කැමති නමුත් එසේ අදහස් දැක්වීම හේතුවෙන් ඔබට යම්කිසි තාඩන පීඩනයක් එල්ලවීම වලක්වා ගැනීම සඳහා නිර්නාමිකව එය කිරීමට ඔබ කැමති බව මොහොතකට සිතන්න. දත්ත ආරක්ෂණ යාන්ත්‍රණවල අවංකභාවය වෙතින් ආරක්ෂාවක් නොසැලසෙන්නේ නම්, එවැනි අවස්ථාවක ඔබ ස්වයං-වාරණය වෙත යොමුවීම තෝරා ගැනීමට ඉඩ ඇත. එනම්, කෙනෙකුට මෙම තොරතුරු හඹා විත් එහි මූලය ඔබ බව හෙළිදරවු කර ගත හැකි බවට ප්‍රවේදිතාවක් ඇති වන හෙයින් මෙම කාරණය සම්බන්ධයෙන් කිසිවක් ප්‍රකාශ නොකිරීමට අදහස් කිරීමයි. මෙය වනාහී, නිර්නාමිකව සිටීම අවශ්‍ය අවස්ථාවන්හිදී ගවේෂණාත්මක මාධ්‍යවේදීන් හෝ තොරතුරු හෙළිදරව් කරන්නන් ඇතුළු බොහෝ පුද්ගලයින් මුහුණ දෙන යථාර්ථයකි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් වැනි ආයතන පවතින්නේ වගවීම ප්‍රවර්ධනය කිරීම සහ රජයේ, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල සහ අනෙකුත් ආයතනවල දූෂණය තුරන් කිරීම සඳහා ය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් යනු රටවල් 100කට අධික සංඛ්‍යාවක ශාඛා සහිත ගෝලීය ජාලයකට එක් උදාහරණයකි. මීට අදාළ වෙනත් ජාලද පවතී. සැමට සාධාරණත්වය, යුක්තිය සහ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සඳහා විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ. මේ සඳහා

81. Privacy, free expression and transparency: Redefining their new boundaries in the digital age. UNESO series on Internet Freedom' Cannataci, Joseph A., Bo Zhao, Torres Vives, Gemma, Monteleone, Shara, Bonnici, Jeanne Mifsud, Moyakine" Evgeni (2016).

මහජනයා සමග බෙදා ගන්නා තොරතුරු සම්බන්ධයෙන් යම් මට්ටමක විවෘත භාවයක් ද අවශ්‍ය වේ. විවිධ සංවිධානවල, රජයේ සහ පෞද්ගලික ආයතනවල කටයුතු කරන්නන් බොහෝ විට පෞද්ගලිකත්වයේ කඩතුරාවෙන් සැඟවී කටයුතු කළ හැකි ය. අන්‍යයන්හට ධනාත්මකව හෝ ඍණාත්මකව බලපාන ක්‍රියාවන්හි යෙදෙන්නන් සහ පොදුවේ මහජනතාව සම්බන්ධයෙන් පෞද්ගලිකත්වය ආරම්භ වන්නේ හෝ අවසන් වන්නේ කොතැනින්ද යන සීමාව ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නීති මගින් දක්වනු ලැබේ. විනිවිදභාවය ආයතනවලට පමණක් අදාළ වූවක් නොවන අතර 'පෞද්ගලික විනිවිදභාවය' හෙවත් ආචාරධර්ම යන සංකල්පය ද මෙහිදී යෝජනා කෙරේ.

සත්‍යය හා විශ්වාසය පළමුවෙන්ම පුද්ගලයා තුළ පැවතිය යුතු බව මින් අදහස් වේ. එවීට පුළුල් පරිමාණයේ සදාචාරාත්මක හැසිරීම මගින් ආයතනික ප්‍රමිති සහ දූෂිත පරිචය නොඉවසීම කෙරෙහි බලපෑමක් ඇති කෙරෙනු ඇත. ඒ සමගම, බල රහිත අය සඳහා පෞද්ගලිකත්වයද බලවතුන් සඳහා විනිවිදභාවයද අවධාරණය කරන තර්කයක්ද පවතී.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශය: විෂය මාලාවේ :1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- තිරසර සංවර්ධන ඉලක්ක 17 සාකච්ඡාවට ලක් කරන්න. පහත ආකාරයේ ප්‍රශ්න විමසීමට ශිෂ්‍යයන් හට මග පෙන්වන්න. විශේෂයෙන්ම මාගේ පෞද්ගලිකත්වය සහ ස්වාධිකාරය සම්බන්ධයෙන් මේවා මට පුද්ගලිකව අදාළ වන්නේ කෙසේද? ඒවා ඔබගේ පවුලේ අයට සහ මිතුරන්ට අදාළ වන්නේ කෙසේදැයි ඔබ සිතන්නේද? මෙම ඉලක්ක සැබවින්ම සාක්ෂාත් කරගත හැකි යැයි ඔබ සිතන්නේද? ඇතැම් තිරසර සංවර්ධන ඉලක්කවල ප්‍රගතියක් අත් කර ගැනීම සඳහා ඔබට දැක්විය හැකි පෞද්ගලික දායකත්වය කෙබඳුද? කණ්ඩායම් හරහා ඔබට කෙබඳු දායකත්වයක් දැක්විය හැකි යැයි ඔබ සිතන්නේද? මෙම ප්‍රශ්න ඔබ ඔබෙන්ම විමසන්න. දායකත්වයක් දැක්වීම සඳහා ඔබට කිසිවක් කළ නොහැකි යැයි ඔබ සිතන්නේ කුමන තිරසර සංවර්ධන ඉලක්කයටද? එය එසේ වන්නේ යැයි ඔබ සිතන්නේ මන්ද? මෙය පුද්ගලිකව ඔවුන්ගේ පෞද්ගලිකත්වයට අදාළ වුවත් නැතත්, ඔවුන්ට ඊට දායක විය හැකි සහ ක්‍රියා කළ හැකි විවිධ ක්‍රම වෙත ශික්ෂකයන් විසින් ශිෂ්‍යයන්ට මග පෙන්විය යුතු ය.
- තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ තොරතුරු සහ තිරසර සංවර්ධන ඉලක්ක අධීක්ෂණය කිරීම සඳහා වන දත්ත ඇතුළත් එක්සත් ජාතීන්ගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න ගෝලීය තිරසර සංවර්ධන ඉලක්ක දර්ශක පිළිබඳ දත්ත පද්ධතිය https://unstats.un.org/sdgs/indicators/database/. මෙම වේදිකාව මගින් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය පිළිබඳ සම්පාදනය කරන ලද දත්ත වෙත ප්‍රවේශය සැපයේ. විවිධ ඉලක්ක වලට සම්බන්ධ වී පවතින දර්ශක පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගැනීම සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. දත්ත පද්ධතිය හරහා තොරතුරු සොයන ආකාරය ඔවුන්ට උගන්වන්න. ශිෂ්‍යයන් විසින් අවම වශයෙන් තමාට පෞද්ගලික සබඳතාවක් ඇතැයි හැඟෙන එක් ඉලක්කයක් සහ ඔවුන්ගේ ප්‍රජාවට සම්බන්ධ වන්නේ යැයි හැඟෙන එක් ඉලක්කයක් බැගින් තෝරාගත යුතුය. ඔවුන් විසින් මෙම ඉලක්ක දෙකට සම්බන්ධ දර්ශක වෙන් කර ගෙන, තෝරාගත් එම තිරසර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය අත් කර ගැනීම සඳහා තම ප්‍රජාව තුළ හෝ රට තුළ සිටින අදාළ පාර්ශ්වකරුවන් විසින් සිදු කරනු ලබන දෑ පිළිබඳව ඔවුන්ගේ රට තුළ හෝ ප්‍රජාව තුළ පවතින්නේ කුමන ආකාරයේ දත්තද යන්න පිළිබඳ මූලික පර්යේෂණයක් සිදු කළ යුතුය. පහත ප්‍රශ්න ඔවුන් වෙත යොමු කරන්න: මගේ පුද්ගලික දත්ත මෙම තිරසර සංවර්ධන ඉලක්කයන්හි දර්ශක හා සම්බන්ධ වී ඇත්තේ කෙසේද? මගේ ප්‍රජාවේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු මෙම තිරසර සංවර්ධන ඉලක්ක දර්ශක හා සම්බන්ධ වී ඇත්තේ කෙසේද? මගේ ප්‍රජාවෙහි හෝ රටෙහි රජය හෝ පුද්ගලික අස්ථිත්ව වෙතින් සොයා ගන්නා ලද, මෙම තෝරාගත් තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දත්ත ඔස්සේ ආපස්සට ගොස් කිසියම් පුද්ගල කණ්ඩායම් සොයා ගත හැකිද? මෙම දත්තවල ප්‍රතිඵලයක් ලෙස මෙම පුද්ගල කණ්ඩායම් ප්‍රතිලාභ ලබන්නේද නැතහොත් වින්දිතයන් බවට පත්වන්නේද? පුද්ගල හෝ කණ්ඩායම් අනන්‍යතාවය සහ ස්වාධිකාරය ආරක්ෂා කිරීමට උපකාර වන අන්දමින් දත්ත නිර්නාමික කළ හැකි ආකාරය සහ ඒවාට 'බාධක'(noise) එකතු කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න.

- Google, Yandex, Baidu, DuckDuckGo, Bing, වැනි විවිධ සෙවුම් යන්ත්‍ර භාවිතයෙන් තමන් ගැනම සෙවීමක යෙදීම සඳහා ශිෂ්‍යයින් කණ්ඩායමට මග පෙන්වන්න. ඔවුන් සොයා ගන්නා තොරතුරු කිහිපයක් කණ්ඩායමට ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට පවසන්න. සමහර තොරතුරු ගැන ඔවුන් පුදුමයට පත් වූවාද යන්න පිළිබඳ ඔවුන් අදහස් දැක්විය යුතුය. විවිධ සෙවුම් යන්ත්‍රවලින් තමන් ගැන සොයා ගන්නා තොරතුරු සංසන්දනය කරන ලෙසද ඔවුන්ට පවසන්න. වෙනස් වන්නේ සහ සමාන වන්නේ කුමන තොරතුරුද? විවිධ සෙවුම් යන්ත්‍ර තුළ ඔවුන් ගැන ඇති දත්ත වර්ගවල ගම්‍යාර්ථ සහ මෙය විවිධ සෙවුම්වල ප්‍රතිඵලවලට බලපාන ආකාරය විචාරශීලීව සාකච්ඡා කිරීම සඳහා ශිෂ්‍යයින්ට මග පෙන්වන්න.
- ඔබ ගැන එක්රැස් කරන ලද දත්ත අයිති කාටද යන්න, සහ ඔබ භාවිතා කරන මාර්ගගත සේවා මගින් 'දත්ත සුවහනීයතාව' සබල කර තිබේද නැතහොත් වළක්වා තිබේද එනම් ඔබට ඔබගේ දත්ත වාර්තා ඉවත් කරගෙන ඒවා දැනට පවතින 'පිරිවට පිවිසුම්වලින්' පිටත වෙනත් ස්ථානයකට ගෙන යා හැකිද යන්න විවාදයට ගන්න.
- "සංතුලනය කිරීමේ කාර්යය: වාණිජ අස්ථිත්ව හා අපගේ පෞද්ගලිකත්වයට එදිරිව පෞද්ගලිකත්වය හා සංවර්ධනය" යන්න පිළිබඳ විවාදයක් සංවිධානය කරන්න. විවාදයේ පදනමක් ලෙස, මාධ්‍ය, අන්තර්ජාලය සහ තාක්ෂණික දෘඩාංග හා මෘදුකාංග සමාගම් වාණිජ අරමුණු සඳහා පමණක් පවතින්නේද නැතහොත් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන, පුරවැසියන් උදෙසා ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික ප්‍රතිලාභ ද ඒවායේ පවතීද යනාදී ප්‍රශ්න යොදා ගන්න.
- ඔබගේ ප්‍රජාව තුළ හෝ ජාත්‍යන්තරව විනිවිදභාවය ප්‍රවර්ධනය කරන හෝ දූෂණයට එරෙහිව සටන් කරන සංගමයක් හඳුනා ගන්න. ඔවුන් මෙම සංවිධානය පිළිබඳ මීන් පෙර දැන සිටියේ දැයි ශිෂ්‍යයන්ගෙන් විමසන්න. මෙම සංවිධානය සිදු කරන කාර්‍යය කුමක්ද යන්න පිළිබඳ කෙටි සාකච්ඡාවක් පවත්වන්න. එහි උපායමාර්ගවල සහයෝගී ස්වභාවය කෙරෙහි අවධානය යොමු කරන්න. එමෙන්ම, ඔවුනට හැඟෙන ආකාරයට, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් සංවිධානයෙහි ක්‍රියාවන් එක් එක් ඉගෙනුම ලබන්නා වෙසෙන ප්‍රදේශයේ පවතින යථාර්ථ හා සම්බන්ධ වන්නේ කවරාකාරයටද වැනි ප්‍රශ්න විමසන්න. 'රජයට සහ රාජ්‍ය නිලධාරීන්ට ඔවුන්ගේ පෞද්ගලිකත්වය සඳහා අයිතියක් ඇත.' යන ප්‍රකාශය සාකච්ඡාවට බඳුන් කරන්න.
- මෙම ප්‍රශ්නය සාකච්ඡා කරන්න: මහජනතාවට භාණ්ඩ සහ සේවා අලෙවි කරන පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රියාකාරීන් පෞද්ගලිකත්ව නීති යටතේ කෙතරම් දුරට ආරක්ෂා කරනු ලැබිය යුතුද?
- පෞද්ගලිකත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුගේ නවතම වාර්තා තුන සොයාගන්න. ශිෂ්‍යයන් කණ්ඩායම් තුනකට වෙන් කරන්න. එක් එක් වාර්තාවේ නිර්දේශ ඉදිරිපත් කෙරෙන කොටස වෙත යොමු වීමට එක් එක් කණ්ඩායමට මග පෙන්වන්න. මෙම තෝරාගත් නිර්දේශ ඔවුන්ගේ රටවල ක්‍රියාත්මක වන්නේද යන්න විමර්ශනය කිරීමේ ක්‍රම පිළිබඳව ඔවුන්ට මග පෙන්වන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හෝ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් පුරවැසියන්ගේ ධාරිතා වැඩි දියුණු කිරීම ආශ්‍රිත නිර්දේශ එහි පවතීද? එම නිර්දේශ, පුද්ගලයින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාවන්ගෙන් සවිබල ගැන්වීම හා සම්බන්ධ වන්නේ කෙසේද? ඒ පිළිබඳ සාකච්ඡාවක් සංවිධානය කරන්න. එක් එක් වාර්තාවේ සෑම නිර්දේශ මාලාව තුළම නිරීක්ෂණය වූ ඇතැම් ප්‍රවණතා කවරේද? මා සහ මාගේ ප්‍රජාව කෙරෙහි එහි පවතින ගම්‍යාර්ථ කවරේද?
- පෞද්ගලිකත්වය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු වෙත ප්‍රවේශය අතර පවතින සම්බන්ධතාව පිළිබඳ පෝස්ටර් හෝ තොරතුරු ප්‍රස්තාර, කණ්ඩායම් වශයෙන් නිර්මාණය කිරීමට ශිෂ්‍යයන් හට මග පෙන්වන්න. සෑම කණ්ඩායමක්ම පෝස්ටරය භාවිතයෙන් විනාඩි 10ක ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. පුද්ගලයන්, කණ්ඩායම්, ආයතන, පුද්ගලික අංශය සහ රජයන් කෙරෙහි එහි පවතින ගම්‍යාර්ථ පිළිබඳ අවධානය යොමු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පෞද්ගලිකත්වය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාව පිළිබඳ ඉගෙනුම් සම්පත් YouTube හෝ මාර්ගගත වීඩියෝ සුරක්ෂිතාගාර තුළින් සොයාගැනීම සඳහා ශිෂ්‍යයින්ට මග පෙන්වන්න. වීඩියෝ අන්තර්ගතයෙහි විශ්වසනීයත්වය තහවුරු කර ගැනීම සඳහා සොයා බැලිය යුතු දේ පිළිබඳ ඔවුන්ට මග පෙන්වන්න. එසේ තහවුරු කරගත් වීඩියෝ සමාජ මාධ්‍යවල ඔවුන්ගේ ජාල තුළ පල කිරීමට ශිෂ්‍යයන් දිරිමත් කරන්න.
- සමාජ මාධ්‍ය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඉගෙනුම් ප්‍රාරම්භය UNESCO MIL CLICKS භාවිතයෙන් ඉගෙනුම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන්න (https://en.unesco.org/MILCLICKS). MIL CLICKS තුළින් පෞද්ගලිකත්වය පිළිබඳ ක්ෂුද්‍ර ඉගෙනුම් අන්තර්ගතය සොයන්න. ඉගැන්වීමේදී සහ ඉගෙනීමේදී මෙය භාවිත කරන්න.

ඇගයීම සහ නිර්දේශ

- කණ්ඩායම් වශයෙන්, තම පාසල, ප්‍රජාව හෝ පූජනීය ස්ථානය තුළ කුඩා සමීක්ෂණයක් නිර්මාණය කිරීම, සැලසුම් කිරීම සහ සූදානම් කිරීම සඳහා ශිෂ්‍යයන් හට මග පෙන්වන්න. එම සමීක්ෂණය මගින් අන්තර්ගත සපයන්නන්, තිරසර සංවර්ධනය සහ පෞද්ගලිකත්වය පිළිබඳ නිපුණතා ඇතුළුව මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා හා සම්බන්ධයෙන් තෝරාගත් ඉලක්ක කණ්ඩායම සතු දැනුම, ආකල්ප සහ පරිචය ගවේෂණය කළ යුතුය.
- "මාගේ පෞද්ගලිකත්වය, ඔවුන්ගේ විනිවිදභාවය, අපගේ සංවර්ධනය" යන මැයෙන් වචන 1,000 ක රචනාවක් සකස් කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න

වැඩිදුර විමර්ශනය කිරීම සඳහා මාතෘකා

- පෞද්ගලිකත්වය පිළිබඳ ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර නෛතික රාමු
- පෞද්ගලිකත්වය සඳහා නීත්‍යානුකූල ව්‍යතිරේක
- කෘත්‍රිම බුද්ධිය වැනි නව තාක්ෂණය සහ පෞද්ගලිකත්වය කෙරෙහි නව තර්ජන
- පෞද්ගලිකත්වය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ඉගැන්වීම් සහ ඉගෙනුම් සම්පත්
- ත්‍රස්ත විරෝධී සහ පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති හෝ නීති.

3වන ඒකකය: ඔබගේ පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂා කිරීම සඳහා වන ආයතනික බැඳීම් පිළිබඳ දැනුවත්භාවයම

කාලසීමාව: පැය 3

ප්‍රධාන මාතෘකා

- පෞද්ගලිකත්ව ආරක්ෂණයේ ප්‍රධාන ක්‍රියාකාරීන්
- ආයතනික බැඳීම් වර්ග
- පෞද්ගලිකත්වය උල්ලංඝනය වීම වෙනුවෙන් සැලසෙන සහනය
- පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමක් ලෙස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කරන ආයතන
- පෞද්ගලිකත්වය උල්ලංඝනය වීමේ ආකාර.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමෙහි නිරත ප්‍රධාන ක්‍රියාකාරීන් සහ ඔවුන්ගේ භූමිකා හඳුනාගැනීම
- පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමෙහි ලා පෞද්ගලික බැඳීම් සහ ආයතනික බැඳීම් අතර වෙනස හඳුනාගැනීම
- තම පෞද්ගලිකත්වය උල්ලංඝණය වන අවස්ථාවකදී එයට සහනයක් ලබා ගැනීම සඳහා ඔවුන්ට යා හැක්කේ කොතැනටද යන්න සහ ඔවුන්ට ගත හැකි පියවර මොනවාද යන්න අවබෝධ කර ගැනීම
- පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල පෞද්ගලිකත්වය ශක්තිමත් කිරීම සඳහා වන ආයතනික යාන්ත්‍රණවලට සම්බන්ධ වීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය සඳහා කටයුතු කරන ආකාරය අවබෝධ කර ගැනීම සහ දැනුවත් වීම.

- මෙම ඒකකය තුළින් ඉලක්ක කෙරෙන නිපුණතා මට්ටම්
- මූලික.

පෞද්ගලිකත්වය කෙරෙහි වගකීම් ඇත්තේ කා සතුවද?

පෞද්ගලිකත්ව ආරක්ෂණ ක්ෂේත්‍රය තුළ බහුවිධ ක්‍රියාකාරීහු සිටිති. ඉන් ප්‍රධාන ක්‍රියාකාරීන් අතරට ව්‍යවස්ථාදායකය හා අධිකරණය, නියාමන අස්ථිත්ව, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් අන්තර් රාජ්‍ය හා බහුපාර්ශ්වික අස්ථිත්ව ඇතුළත් වේ. ජාත්‍යන්තර ප්‍රමිතීන් යටතේ, පුද්ගලයන් සහ ආයතන ද අයිතිවාසිකම් අවභාවිත කිරීමෙන් වැළකිය යුතු අතර, මානව හිමිකම්වලට ගරු කරන ලෙස විශේෂයෙන්ම ව්‍යාපාර වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

8.2 වගුව පෞද්ගලිකත්ව ආරක්ෂණ ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරීන්

ක්‍රියාකාරීන්	භූමිකා
රජය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය	දත්ත ආරක්ෂණය ඇතුළුව පෞද්ගලිකත්ව ආරක්ෂණ නීති පැහැදිලිව ප්‍රකාශ කිරීම සහ බලාත්මක කිරීම.
තොරතුරු හා සන්නිවේදන විෂයයන් භාර අමාත්‍යාංශ, සයිබර් ආරක්ෂණ සංවිධාන, පෞද්ගලිකත්ව හා දත්ත ආරක්ෂණ කොමිෂන් සභා වැනි නියාමන අස්ථිත්ව.	රට තුළ පවතින පෞද්ගලිකත්ව හා දත්ත ආරක්ෂණ නීති හෝ ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම්ව වඩාත් ක්ෂුද්‍ර මට්ටමේ ක්‍රියාවන් සහතික කිරීම සඳහා රෙගුලාසි හා ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.
සමස්තයක් වශයෙන්, පුද්ගලයන්ගේ පෞද්ගලික තොරතුරු රඳවා තබා ගන්නා පෞද්ගලික සහ පොදු අස්ථිත්ව. මේවාට සමාජ සේවා සපයන රාජ්‍ය අස්ථිත්ව, රෝහල්, විවිධ මාර්ගගත හෝ අන්තර්ජාල සේවා ආදිය ඇතුළත් වේ.	තම පරිශීලකයන්ගේ, පුරවැසියන්ගේ හා සේවාදායකයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා විවිධ ආයතනික යාන්ත්‍රණ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම. පෞද්ගලිකත්වයට බාධා කිරීම් සම්බන්ධයෙන් සහන සලසන ලෙසට මහජනයා සිදු කරන ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීම මෙයට ඇතුළත් වේ.
රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා මූලික සංවිධාන, අධ්‍යාපනික ආයතන.	පෞද්ගලිකත්වය පිළිබඳ දැනුවත්භාවය හා සම්බන්ධව මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සහ පෞද්ගලිකත්ව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම සඳහා ක්‍රියාවන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, බහුපාර්ශ්වික සංවිධාන සහ අනෙකුත් අන්තර්රාජ්‍ය-අස්ථිත්ව	ජාත්‍යන්තර සහයෝගීතාව, සංවාදය, ජාත්‍යන්තර ප්‍රමිති සැකසීම සහ පෞද්ගලිකත්ව නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති හා මූලාරම්භයන් අධීක්ෂණය සඳහා පිහිටාධාර වීම. තම කාර්ය භාරයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සියලුම වගකීම් දරන්නන්ගේ සහ හිමිකම් දරන්නන්ගේ ධාරිතාව ශක්තිමත් කිරීමට සහාය වීම.
පුද්ගලයින් සහ කණ්ඩායම්	පෞද්ගලිකත්ව ආරක්ෂණය වෙනුවෙන් කටයුතු කිරීමේ සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමේ ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීව නිරත වීම; ස්වකීය පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීම සහ අන් අයගේ පෞද්ගලිකත්ව අයිතිවාසිකම්වලට ගරු කිරීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා ලබා ගැනීම.
පර්යේෂකයන් හෝ ශාස්ත්‍රීය කටයුතුවල නිරත ප්‍රජාව	පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම්වල ස්වභාවය, බලපෑම සහ පෞද්ගලිකත්වය උල්ලංඝණය කිරීම අවම කිරීම සඳහා වන යාන්ත්‍රණවල සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය සම්බන්ධයෙන් පර්යේෂණ හරහා සාක්ෂි සම්පාදනය කිරීම සහ සනාථ කිරීම මෙහි ප්‍රධාන අරමුණක් වන්නේ පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති දැනුම් දීම සහ අධීක්ෂණය කිරීමයි.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශය: විෂය මාලාවේ :1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- ඉහත 8.2 වගුවේ දක්වා ඇති ක්‍රියාකාරීන් අනුව ශිෂ්‍යයන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න. ඉහත විස්තර කර ඇති පරිදි භූමිකා ඉටු කරන, ඔවුන්ගේ රටවල හෝ ප්‍රජාවන්හි නිශ්චිත සංවිධාන/

ක්‍රියාකාරීන් පිළිබඳ පර්යේෂණ කරන ලෙස සෑම කණ්ඩායමකටම පවසන්න. පහත ආකාරයේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔවුන්ට මග පෙන්වන්න: එම භූමිකා ඉටු කිරීම සඳහා සිටින්නේ සහ තම භූමිකා ඉටු කිරීමෙහි ලා ක්‍රියාශීලීව කටයුතු කරන්නේ කුමන ක්‍රියාකාරීන් ද? මෙම සංවිධාන සහ පෞද්ගලිකත්වය හා සම්බන්ධ ඒවායේ ක්‍රියාවන් පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් තිබේද? ප්‍රමාණවත් ලෙස පෞද්ගලිකත්ව ක්‍රියාමාර්ග නොගන්නේ කුමන ක්‍රියාකාරීන්ද? මෙයට හේතුව විය හැක්කේ කුමක්ද? මෙම තත්ත්වය වෙනස් කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා කුමක් කළ හැකිද? සෑම කණ්ඩායමක්ම සිය සොයාගැනීම් මාර්ගෝපදේශිත සාකච්ඡාවක් සහිත සැසියකදී ඉදිරිපත් කරයි.

ආයතන සහ පෞද්ගලිකත්වය

8.3 වගුව පෞද්ගලිකත්වය ආයතනවලට අදාළ වන ආකාරය

පෞද්ගලිකත්වය හා සම්බන්ධ ප්‍රස්තුත නිපුණතා	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ ගැබිවූ/ සංකලිත පෞද්ගලිකත්වය :ආයතනික සන්දර්භය)
සයිබර් අවකාශය තුළ ආයතනවල බැඳීම් අවබෝධ කර ගැනීම →	යාවජීව උගැනුමක් සහ ආයතනික තිරසරභාවය සඳහා අවශ්‍ය කරන්නක් වශයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධයෙන් සියලුම ආයතනික කාර්යමණ්ඩලය පුහුණු කෙරෙන බව සහතික කරන අභ්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
පෞද්ගලිකත්වය හා විනිවිදභාවය, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු වෙත ප්‍රවේශය අතර සමතුලිතතාව පිළිබඳ අවධානය යොමු කිරීම →	දත්ත පදනම් කරගත් ව්‍යාපාර ආකෘති පිළිබඳ විනිවිදභාවයෙන් යුත් බලපෑම් තක්සේරුවක් සිදු කිරීම තුළින් සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳව පරිශීලකයන්/පුරවැසියන් පුහුණු කිරීම සඳහා වන ආයතනික සමාජ සහභාගිත්ව වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම තුළින් අන්තපරිශීලකයින්ගේ: ආයතනයට අභ්‍යන්තර සහ බාහිර) පෞද්ගලිකත්වයට ගරු කිරීමට කැප වීම. එය මහජන සුබසිද්ධිය සඳහා වනුයේ කවර විටද සහ පෞද්ගලිකත්ව තත්ත්ව මත ඉන් ඇති කරන බලපෑම කවරාකාරද යන්න. ඇතැම් ආයතනික තොරතුරු වෙත ප්‍රවේශය සහ ඒ පිළිබඳ දැනුම අන්තපරිශීලකයින්ගේ ප්‍රතිලාභ හෝ අයිතිවාසිකම්වලට බලපෑ හැකි අවස්ථාවන්වලදීද එවැනි පුහුණුවක් අවශ්‍ය කෙරේ.
මාර්ගගත පෞද්ගලිකත්වයේ නීත්‍යානුකූල සීමාවන: ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව) ඇගයීම →	අන්තපරිශීලකයින් සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්ති මගින් මාර්ගගත සහ මාර්ග අපගත පෞද්ගලිකත්වය අවභාවිතයට ලක් නොවන බවටත්, ඒවාට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සලකා බැලීම් ඇතුළත් වන බවටත් අදාළ දැනුවත් කිරීමේ පුහුණුව එමගින් ලබාදෙන බවටත් සහතික වීම.
පෞද්ගලිකත්වය, නිර්නාමිකත්වය සහ සංකේතනය අතර සබඳතා අවබෝධ කර ගැනීම →	පෞද්ගලිකත්වය, නිර්නාමිකත්වය සහ සංකේතනය පිළිබඳ සමාජයීය ගම්‍යාර්ථවල වැදගත්කම අවධාරණය කෙරෙන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධයෙන් අන්තපරිශීලකයින් වෙත පුහුණුව ලබා දීම සහතික වීම.
පෞද්ගලිකත්වය උල්ලංඝනය වන අවස්ථා හඳුනාගැනීම හා එසේ සිදුවන බව පිළිගැනීම →	ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම් වූ ප්‍රතිපත්ති, රෙගුලාසි සහ නීති මගින් අවසර ලැබෙන තාක් දුරට මහජනයාගේ තොරතුරුවල සම්පූර්ණ ආරක්ෂාව සහ සුරක්ෂිතතාව පැවතීම සඳහා හැකියාවක් නොතිබිය හැකි: හෝ නොතිබූ) අවස්ථා පිළිබඳව මහජනයා සමඟ: සංවිධානවලට අභ්‍යන්තර හා බාහිර) විනිවිදභාවය ඇතිව කටයුතු කිරීම.
අන්‍යයන්ගේ පුද්ගලික තොරතුරු සදාචාරාත්මක ආකාරයට භාවිතා කිරීම සහ අන්‍යයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම →	විශේෂයෙන්ම අන්ත පරිශීලකයින්ගේ පුද්ගලික තොරතුරු සම්බන්ධ වන අවස්ථාවලදී, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ පරිශීලකයින්/පුරවැසියන් පුහුණු කිරීම සඳහා වන ආයතනික සමාජ සහභාගිත්ව වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම තුළින් අන්ත පරිශීලකයින්ගේ: ආයතනයට අභ්‍යන්තර සහ බාහිර) පෞද්ගලිකත්වයට ගරු කිරීමට කැපවීම. අධික ලෙස නීතියට බැඳී සිටින හෝ අධික ලෙස තාක්ෂණික ස්වරූපයක් ගත් සහ කියවා තේරුම් ගැනීමට දුෂ්කර වන පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීමෙන් ඔබ්බට ගොස් කටයුතු කිරීම.

මූලාශ්‍රය: යුනෙස්කෝ, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ පෞද්ගලිකත්වය පිළිබඳ ගෝලීය සමීක්ෂණය යෞවන පර්යාලෝක සමග. අන්තර්ජාල නිදහස පිළිබඳ යුනෙස්කෝ ග්‍රන්ථ මාලාව. යුනෙස්කෝ,පැරිසිය

- ඉහත 8.3 වගුවෙහි එක් එක් පේළියේ අන්තර්ගතය මුල් කොට සාකච්ඡාවකට මග පෙන්වීම හෝ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සිදු කරන්න. මෙයට පෝස්ටර් ඉදිරිපත් කිරීම්, විවෘත ග්‍රන්ථ: අන්තර්ජාල සෙවුම්) ප්‍රශ්නාවලි, අදාළ ආයතන වෙත යෑම් යනාදිය සහ අදාළ ක්ෂේත්‍රය තුළ කටයුතු කරන බාහිර වෘත්තිකයන්ගේ හෝ ප්‍රවීණයන්ගේ පැමිණීම් සහ ඔවුන් විසින් සිදු කරනු ලබන ඉදිරිපත් කිරීම් ඇතුළත් විය හැකිය. එමෙන්ම එයට සිද්ධි අධ්‍යයන හඳුනා ගැනීම සහ බෙදාගැනීම ද ඇතුළත් විය හැකිය: උදා. සිය පෞද්ගලිකත්වය උල්ලංඝනය වීමේ අත්දැකීමට මුහුණදෙන පුද්ගලයින්). තවද, ඩිජිටල් සන්නිවේදන සමාගම්, රාජ්‍ය ආයතන සහ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානවල පෞද්ගලිකත්ව ප්‍රතිපත්තිවල ප්‍රවේශ්‍යතාව සහ ඒවා අවබෝධ කර ගත හැකි බව හඳුනා ගෙන සාකච්ඡා කරන ලෙස සහභාගිවන්නන්ට පැවසිය හැකිය.

පෞද්ගලිකත්වය උල්ලංඝනය වීම වෙනුවෙන් සහනයක් ලබාගැනීම

පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් කෙනෙකුගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් පිහිට ලබා ගැනීම සරල කාර්යයක් නොවේ. කෙසේ වුවද, බොහෝ රටවලට සහ ආයතනවලට පිළිවෙලින් සිය පුරවැසියන්ට හා ඔවුන්ගේ පරිශීලකයින්ට පිහිටාධාර දීම සඳහා යාන්ත්‍රණ තිබීම හෝ තිබිය යුතු වීම නිසා මෙවන් අවස්ථාවකදී අසරණ හැඟීමක් ඇති නොකරගැනීම වැදගත් වේ.

ඔබගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය වන්නේ නම් ගත යුතු බවට යෝජිත පියවර කිහිපයක් පහත දැක්වේ.

1. පළමුව, පැමිණිල්ලක් ගොනු කිරීම සඳහා, ඔබේ පෞද්ගලිකත්වය උල්ලංඝනය කරන සංවිධානය හෝ ආයතනය සමග සම්බන්ධ වන්න.
2. ජාතික රෙගුලාසි/ප්‍රතිපත්ති හෝ අදාළ සංවිධානයේම අභ්‍යන්තර ප්‍රතිපත්ති මත පදනම්ව, පිළිතුරු දීම සඳහා නියමිත කාල සීමාවක් අදාළ සංවිධානයට තිබේදැයි සොයා බලන්න.
3. මෙම මාර්ගය අසාර්ථක වුවහොත්, *ස්වාධීන පෞද්ගලිකත්ව උපකාර යාන්ත්‍රණයක්*[82] සහාය ලබා ගැනීම පිළිබඳ සලකා බලන්න.
4. ඔවුන් පහත සඳහන් දෑ ප්‍රකාශ කර තිබේද යන්න පරීක්ෂා කිරීම හෝ සත්‍යාපනය කිරීමට උපකාර ලබා ගැනීම මගින් එම පෞද්ගලිකත්ව උපකාර යාන්ත්‍රණය සැබවින්ම ස්වාධීන සහ විශ්වසනීය වන්නේද යන්න තහවුරු කර ගැනීමට වග බලා ගන්න:
   a. අපක්ෂපාතීත්වය
   b. විනිවිදභාවයෙන් යුතු සංයුතිය සහ මුදල් යෙදවීම
   c. අතීත කාර්‍යසාධනය පිළිබඳ සනාථ කරන ලද වාර්තා
   d. ඒ පිළිබඳ දැනුවත් පුද්ගලයින් හඳුනාගෙන ඔවුන් සඳහා උපකාර ලබා ගැනීම
5. අදාළ ආයතනයේ පෞද්ගලිකත්ව ප්‍රතිපත්තිය පිළිබඳ නීතිය මගින් නියම කර ඇති දේ මත පදනම්ව ඔබට ලැබුණු ප්‍රතිචාරයේ ගුණාත්මකභාවය තක්සේරු කරන්න. අවශ්‍ය මොහොතක උපකාර ලබාගන්න. ඔබගේ අත්දැකීම් බෙදාගන්න. කීර්තියක් උසුලන පෞද්ගලිකත්ව ජාලයකට හෝ සංගමයකට සම්බන්ධ වන්න. කුඩා පරිමාණ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සහ පෞද්ගලිකත්ව සංගමයක් ආරම්භ කිරීම පිළිබඳ සලකා බලන්න.
6. ඩිජිටල් සන්නිවේදන සමාගම්වල විනිවිදභාවය ඇති කිරීම වෙනුවෙන් පෙනී සිටීම සහ පුද්ගලික දත්ත භාවිතය සහ අවභාවිතය සම්බන්ධයෙන් නියාමනය හෝ සම-නියාමනය වෙනුවෙන් පෙනී සිටීම.

82. Privacy Shield Framework, www.privacyshield.gov/article?id=11-Dispute-Resolution-and-Enforcement-a-c Accessed on 5 November 2020

ඇගයීම සහ නිර්දේශ

ගැටලු සහගත සහ ඵලදායක සංරචක ඉස්මතු කරමින් තෝරාගත් සමාගම්වල පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති සරල කිරීම සඳහා කණ්ඩායම් ව්‍යාපෘති සැලසුම් කරන්න. සොයාගැනීම් මාර්ගගතව ආකර්ෂණීය අන්දමින් ඉදිරිපත් කර ප්‍රවර්ධනය කරන්න. ව්‍යාපෘතිවලට ලකුණු ලබා දෙන්න.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- ආයතනික පෞද්ගලිකත්ව ප්‍රතිපත්තියේ විනිවිදභාවය
- මූල්‍ය පෞද්ගලිකත්වය
- පෞද්ගලිකත්වය සඳහා මහජන ඉල්ලුම උත්තේජනය කිරීම
- හංවඩු ගැසීම සහ පෞද්ගලිකත්වය

මෙම මොඩියුලය සඳහා සම්පත්

1. මාර්ගෝපදේශ

- Cannataci, J. 2016. Getting things done in privacy protection Part 2: Another dimension of privacy: communal privacy, privacy of the community and personal privacy. ud¾..; ,smsh' https://www.privacyandpersonality.org/2016/06/getting-things-done-in-privacy-protection-part-2-another-dimension-of-privacy-communal-privacy-privacy-of-the-community-and-personality/
- UNESCO Survey on Privacy in Media and Information Literacy with Youth Perspectives,https://unesdoc.unesco.org/ark:/48223/pf0000258993 PDF/258993eng.pdf.multi

2. වෙබ් අඩවි

- Privacy Shield Framework Programme, US-EU-Swiss, https://www.privacyshield.gov/welcome
- The International Association of Privacy Professionals (IAPP), www.iapp.org

3. වීඩියෝ, ක්‍රීඩා, ජංගම දුරකථන යෙදවුම් ආදී මාර්ගගත සම්පත්.

- My Data and Privacy Online: A toolkit for young people https://www.lse.ac.uk/my-privacy-uk
- Privacy (film, 2012) https://www.imdb.com/title/tt2008602/?ref_=ttpl_pl_tt
- VIDEO: “Why the Web Is Such A Mess" by Tom Scott, Youtube. Website: https://youtu.be/OFRjZtYs3wY
- See a full list of resources in UNESCO, Global Survey on Privacy in Media and Information Literacy, With Youth Perspectives. UNESCO Series on Internet Freedom. UNESCO, Paris. (2017). https://unesdoc.unesco.org/ark:/48223/pf0000258993.

ග්‍රන්ථ/ලිපි

“AI and the Future of Privacy," Michael Deane, Towards Data Science, Posted on 5 September, 2018. Website: https://towardsdatascience.com/ai-and-the-future-of-privacy-3d5f6552a7c4

"California Consumer Privacy Act Basics," Data Brokers. Privacy Rights Clearinghouse. Posted on 6 January, 2020. Website:

"How Much Data Do We Create Every Day? The Mind-Blowing Stats Everyone Should Read," Bernard Marr, Forbes, 21 May 2018. A quintillion is a 1 followed by 30 zeroes.

Cannataci, J., Zhoa, B. et al. 2016. Privacy, Free Expression and Transparency: Redefining their new boundaries in the digital age. Paris, UNESCO.

Gunby, M. 2012. Changes to Facebook Privacy Settings: An Information Literacy Perspective. Syracuse University iSchool.

http://infospace.ischool.syr.edu/2012/12/19/changes-to-facebook-privacy-settings-an-information-literacy-perspective/

https://privacyrights.org/resources/california-consumer-privacy-act-basics.

https://publish.illinois.edu/illinoisblj/2008/11/08/international-personal-data protection-and-its-redress/

https://www.tandfonline.com/absdoi/10.108017577632.2016.1183283?journal Code=rjml20

https://www.tandfonline.com/doi/full/10.1080/13642987.2020.1783532

"International Personal Data Protection and Its Redress," Doyle Slifer. *Illinois Business Law Journal*. Nov 8, 2008.

"Other legal remedies to prevent and redress serious invasions of privacy," Serious Invasions of Privacy in The Digital Era (IP 43). Australian Government: Australian Law Reform Commission. Posted on Mar 10, 2013. Website: alrc.gov.au/publication/serious-invasions-of-privacy-in-the-digital-era-ip-43/issues-paper-2/other-legal-remedies-to-prevent-and-redress-serious-invasions-of-privacy

- "Right to Privacy: Constitutional Rights & Privacy Laws," Tim Sharp. Live Science. Posted on 12 June 2013. Website: https://www.livescience.com/37398-right-to-privacy.html
- The African Union's data protection convention 2014: A possible cause for celebration of human rights in Africa? (2016, 13). Taylor & Francis.
- The long arm of GDPR in Africa: Reflection on data privacy law reform and practice in Mauritius. (2020, 6). Taylor & Francis.
- "The Next Big Privacy Hurdle? Teaching AI to Forget," Darren Shou. Wired. Posted on 12 June 2019. Website: https://www.wired.com/story/the-next-big-privacy-hurdle-teaching-ai-to-forget/

9වන මොඩියුලය:

අන්තර්ජාල අවස්ථා හා අභියෝග

"තාක්ෂණයේ සිදුවන ශීඝ්‍ර වෙනස්වීම රාජ්‍යයන්ට විවිධාකාරයෙන් බලපෑම් සිදු කරන බවත්, මෙම වෙනස මගින් උත්ගත නව අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමත් අභියෝගවලට මුහුණ දීමත් ඩිජිටල්කරණයේ බෙදීම් එක් කිරීමත් පිණිස, එම රාජ්‍යවල ජාතික යථාර්ථ, හැකියා සහ සංවර්ධන මට්ටම් මත රඳා පවතින මෙම බලපෑම් ආමන්ත්‍රණය කිරීමට ජාත්‍යන්තර හා බහුවිධ පාර්ශ්වකරුවන්ගේ සහයෝගය අවශ්‍ය බවත්" එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් පිළිගනු ලබයි.

යෝජනාව: නවීන හා නැගී එන **(emerging)** තාක්ෂණය සහ මානව අයිතිවාසිකම්.
A/HRC/RES/41/11

පසුබිම සහ තාර්කිකය

අතථ්‍ය ලෝකයේ කොටස්කරුවකු වෙමින් එයට ප්‍රවේශ වීම සියලුම වයස් කාණ්ඩවල පුරවැසියන්ගේ අවශ්‍යතාව වී ඇත. සියලුම පරිශීලකයන් සඳහා ඔවුන්ගේ ජීවිත අභිමතාර්ථ වැඩිදියුණු කර ගැනීමට හා තිරසර සංවර්ධන අරමුණු කරා අවතීරණය වීමේ ප්‍රගතිය වේගවත් කිරීමට අන්තර්ජාලය සැලකිය යුතු අවස්ථා නිර්මාණය කරයි. එයට අධ්‍යාපනය, සමාජය, සක්‍රීය ලෝකය සහ ආර්ථික වර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි ය. තරුණ අවධිය ආරම්භයේ සිටම තොරතුරු වෙත විශ්වීය ප්‍රවේශයක් ලබා දීම සඳහා පුළුල් වූ අන්තර්ජාල ප්‍රවේශය පුරවැසියන්ට වැඩි අවස්ථාවන් සලසා දෙයි. ළමුන් සහ තරුණයන් වැඩි වශයෙන් තාක්ෂණික දැනුමින් සන්නද්ධ වන අතර අන්තර්ජාල ප්‍රවේශය තුළින් විශාල ලෙස ප්‍රයෝජන ගැනීමට හැකියාවක් ඇත. නමුත්, අන්තර්ජාල ප්‍රවේශය තුළින් නිර්මාණය කරන ලද අවස්ථා සමග සදාචාරාත්මක බැඳීම් සහ පෙර පරම්පරාවන් විසින් මුහුණ නොදුන් අභියෝග සම්බන්ධ ගැටලු නිර්මාණය වී ඇත. මෙම නව පරිසර වපසරිය සමඟින් අන්තර්ජාලයේ දැකිය හැකි නිර්නාමිකභාවය වටා අවදානම් සහ තර්ජන අර්ධ වශයෙන් භ්‍රමණය වේ. ඩිජිටල් පියසටහන් යනු යමෙකු අන්තර්ජාලය භාවිත කරන විට එම භාවිතයන් නැවත පිරික්සා බැලිය හැකි වාර්තා සහ සලකුණු වේ. මිනිසුන්ට තම අතපසුවීම් අමතක වීමේ ප්‍රවණතාවක් තිබුණ ද, අන්තර්ජාලයට එය එසේ නොවේ - අපගේ සියලුම මාර්ගගත අවස්ථා හා ක්‍රියාකාරකම් පිළිබඳ සලකුණු අපි අන්තර්ජාලය තුළ ඉතිරි කර තබන්නෙමු. බොහෝ වාණිජ මෙන්ම රාජ්‍ය අභිලාෂයන් විසින් මෙම වාර්තා සලකුණු කර තබා ගනිමින් අප බොහෝ විට නොදන්නා අරමුණු සඳහා භාවිත කරනු ලබයි.

අතීතයේ දී බාලවයස්කරුවන් ආරක්ෂා කිරීමට විවිධ මට්ටම්වල පියවර ගෙන තිබුණි. නමුත්, තරුණ තරුණියන්ට හා සාමාන්‍ය මිනිසුන්ට අන්තර්ජාලය පරිස්සමින් හා ආරක්ෂා සහිතව භාවිත කිරීම සඳහා එම ආරක්ෂක උපාය මාර්ග මත සම්පූර්ණ විශ්වාසය තැබීම අසාර්ථක ප්‍රයත්නයක් විය. එමෙන්ම රජයන් සහ සමාගම්වලට එම ආරක්ෂක උපාය මාර්ගයන් පිළිබඳ විමසා බැලීමේ රාජකාරීන් ඉටු කිරීම ද ඵලදායී නොවන මට්ටමක පැවතිණි. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවයේ නිපුණතා මට්ටම් තුළින් තරුණයන් ද ඇතුළත්ව සියලුම පුරවැසියන් තොරතුරු පරිසර පද්ධතිය අවබෝධ කර ගැනීම සඳහා බල ගන්වමින් නිවැරදි මනසකින් යුතුව සදාචාරාත්මකව මාර්ගගත ක්‍රියාකාරකම්වල නිරත වීමේ ප්‍රතිලාභ උපරිමයෙන් අත්විඳීමට ඔවුන්ට අවකාශය සලසා දෙන අතර

ඒ හා සම්බන්ධ අවදානම් තත්ත්ව ප්‍රවේශමෙන් හැසිරවීමටත් ඔවුන්ට උපකාර කරනු ඇත.

මෙම මොඩියුලය තුළින් තරුණයන් ඔවුන් ඉගෙන ගන්නා හා අධ්‍යයනය කරන සහ සමාජගත කරන හා ක්‍රීඩා කරන මෙන්ම මාධ්‍ය හා තොරතුරු නිර්මාණය සහ බෙදා හරින වපසරිය තුළ ඔවුන්ට අතථ්‍ය ලෝකයේ තිබෙන අවස්ථා සහ අභියෝග පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ. ඉතා කුඩා වයසේ සිටම තරුණයන්ට අතථ්‍ය ලෝකය සමග සම්බන්ධ වීමේ අවස්ථාවන් වර්ධනය වී ඇත. බොහෝ රටවල වර්තමාන තරුණ පරම්පරාව මෙම අතථ්‍ය ලෝකය තුළ සක්‍රිය හැසිරීම් රටාවක් පෙන්නුම් කරයි. දේශීය හා ගෝලීය වශයෙන් අධ්‍යාපනයට, සමාජයට සහ ආර්ථිකයට වඩා යහපත් දායකත්වයක් ලබා දීමට ඔවුන්ගේ හැකියාවන් උපයෝගී කර ගැනීම අවශ්‍ය වේ. තාක්ෂණයේ අභිවර්ධනයට සමගාමීව තරුණ අවධියේ සිට ම අන්තර්ජාලයට ප්‍රවේශ වීම වැඩි වශයෙන් වර්ධනය වීමත් සමග ම තරුණයින්ට ඔවුන් පෙර විවර නොවූ අදහස්, මත සහ අවකාශ වෙත ප්‍රවේශ වීමට වැඩි අවස්ථාවක් ලැබී ඇත. මෙමගින් සමාජීය සහ ගෝලීය ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රධාන ගැටලුවලදී තාරුණ්‍යයට වඩාත් ක්‍රියාකාරීවීමට හැකි භූමිකාවක් විවර කර දෙන නමුත් ඔවුන් සහ ඔවුන්ගේ දෘෂ්ටිකෝණ තවමත් වර්ධනය වෙමින් පවතින බැවින් එසේ ක්‍රියාකාර්ව අන්තර්ජාලය තුළ හැසිරීමේ දී, ඔවුන් භාවිත කරනු ලබන වචන සහ ඔවුන්ගේ ක්‍රියාවන් වාර්තා ගත වන බැවින්, ඔවුන්ගේ දැනුම්වත්භාවයෙන් තොරව ඔවුන්ව පුරෝකථනය කිරීමට සහ හැසිරවීමට වීම දත්ත භාවිත කළ හැකි බව ද අවධාරණය කළ යුතු ය. මෙය තාරුණ්‍යයට ඔවුන්ගේ ඩිජිටල් පියසටහන් සහ අන්තර්ජාලයේ ඔවුන්ගේ හැසිරීම පිළිබඳව තබා ගන්නා දත්තවල නිත්‍යභාවය සහ චිම දත්ත අනිසි ලෙස භාවිත කිරීමේ විභවතාව අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාව මැනවින් අවබෝධ කරවීමට සමත් වේ. සමාජ මාධ්‍ය තුළ, පාරිභෝගිකයන් වශයෙන් පමණක් නොව දැනුම සම්පාදනය කරන්නන් වශයෙන් ද, සෑම වයස් කාණ්ඩයකට ම ඇතුළත් වන පුද්ගලයෝ විවාද, සංවාද සහ විවිධ අන්තර් ක්‍රියාකාරකම්වල නිරත වෙති. මේ සියල්ල නිරීක්ෂණය කරනු ලබන සේවා සපයන්නන්ගේ පරාසයන් තුළ සිට අන්තර්ජාලය භාවිත කරන්නන් විසින් හුවමාරු කර ගනු ලබන සංදේශ, වීඩියෝ, මීම්ස් :පැජැ), අදහස් සහ වෙනත් යෙදවුම් බෙදා ගන්නා විට මහජනයා කවුරුන් ද යන්න අයෙකුට සෑම විටක දීම සහතිකවම කිව හැකි නොවේ. මෙම යථාර්ථයට විවාදය හා විචාරණය සමාජගත කළ හැකි නමුත් විශේෂයෙන් ම, දේශසීමා, භාෂා සහ සංස්කෘතීන් සමග අන්තර් ක්‍රියා කිරීමේ දී ප්‍රවේදිතාවන්ට, ආතතියට සහ වැරදි අර්ථකථනයන්ට මූලාශ්‍රයක් වීමට ද හැකියාවක් පවතී. සාවද්‍ය තොරතුරු නිර්මාණය කිරීම, බෙදා හැරීම සහ විශ්වාස කිරීම වෙත අවතීරණය වීම මෙම නව සන්දර්භය සඳහා එක් උදාහරණයක් වන අතර එහි ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම ද ඩිජිටල් සන්නිවේදන සමාගම්වල කාර්යභාරය වේ.

අන්තර්ජාලය තුළ මාධ්‍ය සහ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ දී, භාවිත කිරීමේ දී සහ නිර්මාණය කිරීමේ දී එහි ආධුනිකයන්ට ඩිජිටල් පියසටහන් පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා, සැබෑ ලෝකයේ ගම්‍යාර්ථ අතථ්‍ය ලෝකයේ අන්තර් ක්‍රියාකාරකම් සමග සම්බන්ධ වන ආකාරය මෙන්ම ගෝලීය කතිකාවට සහභාගී වන ඩිජිටල් පුරවැසියන් වශයෙන් ඔවුන්ගේ භූමිකාව, නියෝජනය සහ සදාචාරාත්මක බැඳීම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා මග පෙන්වන ඉගෙනුම් අත්දැකීම්වල නිරත වීමට ද ඔවුන්ව යොමු කිරීමට මෙම මොඩියුලය මගින් ශික්ෂකන්ට ඉඩ ප්‍රස්ථාව ලබා දෙනු ඇත.

තිරසර සංවර්ධනය සඳහා ගුණාත්මක අධ්‍යාපනය පදනම් සපයන අතර රැකියා අවස්ථා සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කරයි. අධ්‍යාපනය සහ පුහුණුව සඳහා වැඩි දියුණු වූ ගුණාත්මක සම්පත් භාවිත කිරීමේ ප්‍රවේශය තුළින් තාරුණ්‍යය සඳහා ආර්ථික වර්ධනය සහ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කරනු ලබන සම්පතක් වශයෙන් විවෘත අධ්‍යාපනික සම්පත් (OERs) හඳුන්වා දිය හැකි ය. අන්තර්ජාල ප්‍රවේශය සහ විවෘත අධ්‍යාපනික සම්පත් තුළින් සලසා දෙනු ලබන අධ්‍යාපන අවස්ථා වඩාත් අන්තර්කරණීය හා සාධාරණ අධ්‍යාපනයකට මෙන්ම ඉගෙනුම් අවකාශයන්ගෙන් ඔබ්බට විහිදි ගිය යාවජ්ජීව අධ්‍යාපනය ප්‍රවර්ධනයට දායකත්වය ලබා දෙනු ඇත.

ඒකක

1වන ඒකකය :
අතථ්‍ය ලෝකයේ තාරුණ්‍යය

2වන ඒකකය :
අතථ්‍ය ලෝකයේ අභියෝග හා අවදානම්

3වන ඒකකය :
ඉගෙනුම, ජාලකරණය හා මාර්ගගත සමාජීය නියැලීම

4වන ඒකකය :
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි පියසටහන්: ඔබගේ මාර්ගගත අභිමුඛයන් පාලනය කිරීම පිළිබඳ තවදුරටත්

1වන ඒකකය : අතථ්‍ය ලෝකයේ තාරුණ්‍යය

කාලසීමාව: පැය 3යි

ප්‍රධාන මාතෘකා

- වෙබ් 2.0 සහ අතථ්‍ය ලෝකය
- ළමුන්ගේ සහ තරුණයන්ගේ අන්තර්ජාල භාවිතය සහ මාර්ගගත පුරුදු
- ළමා අයිතිවාසිකම් සඳහා අදාළ ජාත්‍යන්තර සම්මුතීන් සහ නෛතික ලේඛන

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් හා ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා ගනු ඇත:

- තරුණයන්ගේ අන්තර්ජාල භාවිත රටාවන් සහ රුචිකත්ව අවබෝධ කර ගැනීම.
- ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් අන්තර්ජාල භාවිතය සහ නිරීක්ෂණ සම්බන්ධව භාවිත කරනු ලබන පොදු නියම සහ කොන්දේසි, ආචාරධර්ම සංග්‍රහ සහ පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලු විස්තර කිරීම.
- තරුණයන්ට අන්තර්ජාලය ප්‍රවේසමෙන් භාවිත කිරීමට, ඔවුන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා සහ ඔවුන්ට අදාළ අවස්ථා, අභියෝග සහ අවදානම් පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා අධ්‍යාපනික ක්‍රමවේද සහ මූලික මෙවලම් භාවිත කිරීමේ හැකියාව වර්ධනය කිරීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් වශයෙන්: පෙර සාකච්ඡා කළ පරිදි මෙම විෂය මාලාව (1වන කොටස) තුළින් විවිධ අධ්‍යාපනික ප්‍රවේශ වෙත අවතීරණය විය හැකි ය. කරුණාකර 1වන කොටසෙන් ඉදිරිපත් කර තිබෙන ලැයිස්තුව සමාලෝචනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා භාවිත කළ යුතු ප්‍රවේශය තීරණය කරන්න.

පහසු ඩිජිටල්කරණය සහ තොරතුරු ගබඩා කිරීම මෙන්ම පුළුල් පරාසයක උපාංග හරහා ප්‍රවේශ වීමේ හැකියාව සමගින්, පුරවැසියන්ට ලබා ගත හැකි තොරතුරු සම්පත් ප්‍රමාණය අන්තර්ජාලය විසින් විශාල ලෙස වර්ධනය කර ඇත. වෙබ් 2.0 යනු ජංගම දුරකථන යෙදුම් හරහා අන්තර්ක්‍රියා සහ පරිශීලක විසින් ජනිත අන්තර්ගතයන්ට පහසුකම් සපයනු ලබන අන්තර්ජාල අංගයන් සඳහා භාවිත වන කෙටි යෙදුමකි. අන්තර්ජාලය පිළිබඳ හිමිකම්-නිදහස් වීඩියෝ පට (Right-Free video) හා එහි පුළුල්වන විශේෂාංග සහ සමාජයට ඇති බලපෑම වැනි ඔබට මාර්ගගතව සොයා ගත හැකි සම්පත් භාවිතයෙන් මෙම ඒකකයට උපදෙස් ලබා දිය හැකි ය.

ඔබට ශික්ෂකයන් හා ශිෂ්‍යයන් සම්බන්ධ කර ගත හැකි මූලික ක්‍රමවලට පහත සඳහන් ක්‍රමවේද ඇතුළත් වේ:

- අතථ්‍ය ලෝකයේ ප්‍රධාන මූලිකාංග හැකිතාක් ඇතුළත් කෙටි ඉදිරිපත් කිරීමක් සූදානම් කරන්න. මෙම ප්‍රධාන මූලිකාංග පිළිබඳව කුඩා කණ්ඩායම් වශයෙන් සාකච්ඡා සංවිධානය කරන්න. වෙබ් 2.0හි ප්‍රතිලාභ මෙන්ම පරිශීලකයින්ට සහ සේවා සපයන්නන්ට එක හා සමානව ඇති විය හැකි විභවීය හානි පිළිබඳව කෙටි ඉදිරිපත් කිරීමක් සකස් කර ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකටම අවස්ථාව සලසන්න.
- සහභාගිවන්නන් සමාජ ජාල භාවිත කරන්නේද සහ/හෝ වෙබ් අඩවිය භාවිත කරන්නේ ද යන්න සහ එසේ නම්, කොපමණ වාර ගණනක් භාවිත කරන්නේ ද යන්න විමසන්න. වෙබ් අඩවියේ සැරිසැරීමට, ප්‍රොෆයිල සැකසීමට, අන් අයගේ චරිත සටහන් විග්‍රහ බැලීමට, අන්තර්ජාල වේදිකාවලින්

(උදා. විකිපීඩියා) අන්තර්ගත උඩුගත කිරීමට හා බාගත කිරීමට මෙන්ම චැට් රූම්ස් (chat rooms) භාවිත කිරීම, මාර්ගගත සහයෝගීතාව, බ්ලොග්කරණය සහ ට්වීට් කිරීම (tweeting) සඳහා ඔවුන්ව යොමු කරන්න. වෙබ් අඩවි භාවිත කිරීමේ අධ්‍යාපනික ප්‍රතිලාභ සහ එහි සදාචාරාත්මක භාවිතය මෙන්ම එහි අභියෝග සහ අවදානම් පිළිබඳව අවධානය යොමු කරමින් මෙම ක්‍රියාකාරකමෙන් පසු ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් සිදු කරන්න. වෙබ් අඩවි භාවිත කරන විට ඔබගේ පෞද්ගලික ප්‍රවේදිතා කිහිපයක් ලියා ඔවුන් සමග සාකච්ඡා කිරීම වැදගත් වේ.

- විකි භාවිත කරමින් අධ්‍යාපන භාවිතාවන්හි අංගයක් හෝ ප්‍රතිපත්තියක් පිළිබඳ තොරතුරු සැලසුම් කර බෙදා ගැනීමට කණ්ඩායම් වශයෙන් වැඩ කරන්න. මෙම කාර්යයට ප්‍රමාණවත් නියැලීමක් සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කරන්න (උදා. එක් වාරයක් සඳහා වෙන් කරන ලද කාලසීමාව තුළ). ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් විසින් විකි වෙබ් අඩවියේ සඵලතාව, යෝග්‍යතාව සහ සහභාගී වන අභ්‍යාසලාභීන්ට එයින් සිදු වන බලපෑම තක්සේරු කිරීම සඳහා නිර්ණායක සකස් කළ යුතු වේ.
- කුඩා කණ්ඩායම් ලෙස බෙදී ක්‍රියාකාරකම්වල නිරත වීමට සහභාගිවන්නන් යොමු කරන්න. සෑම කණ්ඩායමක් විසින් ම තරුණ තරුණියන් අන්තර්ජාලයේ නිරත වන බව සිතිය හැකි ප්‍රධාන ක්‍රියාකාරකම් අවම වශයෙන් පහක් වන සේ සාකච්ඡා කර ලැයිස්තුගත කරන්න. මෙම ක්‍රියාකාරකම්වල වැදගත්කම 1 සිට 5 දක්වා පරිමාණයෙන් ශ්‍රේණිගත කිරීමට පවසන්න. සෑම කණ්ඩායමක් ම තම සාකච්ඡාවල සොයාගැනීම් ඉදිරිපත් කරමින්, ඔවුන් විසින් එම තොරතුරු සංවිධානය කරන ලද ආකාරය සහ ඔවුන් ගත් තීරණවලට බලපෑම් සිදු කරනු ලැබූ කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කළ යුතු වේ. එවැනි අවස්ථා පිළිබඳව දත්ත තිබේ නම්, ළමුන් විසින් අන්තර්ජාලය භාවිත කිරීම පිළිබඳ සත්‍ය සංඛ්‍යාලේඛන (මෙම සැසියට පෙර සකස් කරන ලද සහ පවතින සම්පත් මත පදනම්ව) ශික්ෂකයා විසින් ඉදිරිපත් කළ යුතු වේ. කණ්ඩායම් විසින් සොයා ගනු ලැබූ දත්ත සැබෑ සංඛ්‍යාලේඛන සමග සසඳන්න. සාකච්ඡා කරන්න. එම සැසඳීමේ දී සොයා ගත් විශේෂ කරුණු මොනවා ද? ඔබගේ කලාපයට හෝ රටට විශේෂිත වූ අන්තර්ජාල භාවිතය පිළිබඳ සංඛ්‍යාලේඛන තිබේ ද? එසේ නොවේ නම්, එහි ගම්‍යාර්ථ මොනවාද? එවැනි සංඛ්‍යාලේඛන නොමැති වීම සම්බන්ධයෙන් කළ හැකි දේ සාකච්ඡා කරන්න.
- අධ්‍යාපනික අරමුණු සඳහා, ප්‍රවෘත්ති නැරඹීම සඳහා, තම රටේ දේශපාලන ක්‍රියාවලියට සහභාගී වීම සඳහා, විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයන් පිළිබඳ වැඩි විස්තර දැනගැනීම සඳහා සහ ඔවුන් සමග අන්තර් ක්‍රියා කිරීම යනාදිය සඳහා තරුණ තරුණියන් විසින් වෙබ් අඩවිය භාවිත කරනු ලබන ප්‍රමාණයන් පිළිබඳව සාකච්ඡා කිරීම. එවැනි භාවිතයන් ඉහළ මට්ටම්වල පවතින බවට සාධක තිබේ ද? අන්තර්ජාලය ධනාත්මකව භාවිත කිරීමට යෞවනයන් පෙළඹවීම සඳහා කුමක් කළ හැකි ද? ශික්ෂකයන්ට හෝ ශිෂ්‍යයන්ට (කුඩා කණ්ඩායම් වශයෙන් හෝ ඒකල වශයෙන්) ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ කෙටි පාඩමක් සකස් කර එයට අන්තර්ජාලය භාවිත කිරීම ඒකාබද්ධ කරන ලෙස උපදෙස් ලබා දෙන්න. අන්තර්ජාලය භාවිතයෙන් පාඩමේ අරමුණු සාක්ෂාත් කරගත හැක්කේ කෙසේ ද යන්න පමණක් නොව, ශික්ෂකයන්ට ශිෂ්‍යයන්ව මේ සම්බන්ධයෙන් පෙළඹවිය හැකි ආකාරය ද එමගින් පෙන්නුම් කිරීමට සලස්වන්න.
- විවිධ අන්තර්ජාල යෙදවුම්වල පොදු නියමයන් සහ කොන්දේසි, ආචාරධර්ම සංග්‍රහ සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමට අදාළ රෙගුලාසි පිළිබඳව සහභාගිවන්නන් සමග සාකච්ඡා කිරීම. අනතුරුව, ළමුන් සහ තරුණයන් අන්තර්ජාලය භාවිත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ආදර්ශ ආචාරධර්ම සංග්‍රහයක් සකස් කිරීමට ඔවුන්ව දිරිමත් කරන්න.
- ළමුන්ගේ මාර්ගගත හැසිරීම් සහ ඔවුන්ගේ චරිත සටහන විශ්ලේෂණය කිරීම: කණ්ඩායම් වශයෙන් බෙදී ක්‍රියාකාරකම්වල නිරත වන ශිෂ්‍යයන් විසින් වයස අවුරුදු 6 සිට 17 දක්වා ළමුන්ගේ අන්තර්ජාල භාවිතය විමර්ශනය කරන්න. කණ්ඩායම් වාර්තා තුළින් අන්තර්ජාල භාවිතයේ ප්‍රමාණය සහ ළමුන් විසින් එය භාවිත කරනු ලබන්නේ කුමක් සඳහා ද යන්න ඉස්මතු කළ යුතු අතර මෙය දෙමාපියන්ගේ අන්තර්ජාල දැනුම සහ එහි භාවිතය සමග සංසන්දනය කරන්න. ළමුන්ට සහ දෙමාපියන්ට අන්තර්ජාලය මගින් නිර්මාණය කරනු ලබන අවස්ථා සහ අභියෝග මොනවා ද?
- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ වගන්තියක්, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය, යෞවනය, සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 2250 හෝ ඔබේ රටේ හෝ කලාපයේ වෙනත් අදාළ ජාත්‍යන්තර හෝ නෛතික ලේඛන පිළිබඳව සාකච්ඡාවක් සංවිධානය කරන්න. සාකච්ඡාව අන්තර්ජාලය භාවිතය හා යෞවනයන් යන

මාතෘකාවට අදාළ විය යුතු ය. තොරතුරු දැන ගැනීමේ අයිතිය, අදහස් ප්‍රකාශනයේ නිදහස, සහභාගීත්වය, බාලවයස්කරුවන් ආරක්ෂා කිරීම සහ මෙම සන්දර්භයන් තුළ දෙමාපියන්, රජයන් සහ සිවිල් සමාජයේ කාර්යභාරය එම සාකච්ඡාවට ඇතුළත් විය යුතු ය. මෙම ගැටලු තනි තනිව සාකච්ඡා කර ඒවා සම්බන්ධ වන්නේ කෙසේදැයි සලකා බලන්න. අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ආරක්ෂාව සම්බන්ධ කරුණුවලට පටහැනි නොවිය යුතු ය. ආරක්ෂාව සඳහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ අයිතිය ආරක්ෂාව වෙනුවෙන් කැප නොකළ යුතු ය. ඒ සඳහා හේතු සාධක විමසා බලන්න. ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ට තොරතුරු, අන්තර්ජාලය සහ නව තාක්ෂණය සඳහා සමාන ප්‍රවේශයක් තිබිය යුතු ද? ඔබේ කලාපයේ සිදුවන්නේ කුමක් ද? මෙම තත්ත්වයන් වෙත අවධානය යොමු කළ යුත්තේ කෙසේ ද? නිදහස, අයිතිවාසිකම් සහ බාලවයස්කරුවන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ කෙටි කවියක් සකස් කරන ලෙස ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටින්න.

- අන්තර්ජාලය හරහා 'නොමිලේ' සපයනු ලබන සේවාවන් සැබවින් ම නොමිලේ සපයන්නේ ද යන්න හා ඒ සඳහා හේතු මොනවා ද යන්න ශිෂ්‍යයන්ගෙන් විමසන්න. ඔවුන් සිතන පරිදි එම ගෙවීම් සිදු කරනු ලබන්නේ කුමන පාර්ශ්වයක් විසින් ද සහ කුමක් උපයෝගි කර ගනිමින් ද? නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලබන ව්‍යාපාරික ආකෘතීන් විසින් විවිධ සේවාවන් හරහා පරිශීලකයන් ලුහුබඳින ආකාරය හා එම දත්ත භාවිත කරමින් ඉලක්කගත ආකාරයෙන් සියුම් ලෙස පාරිභෝගිකයාට බලපෑම් කිරීමට උත්සාහ කරනු ලබන ගනුදෙනුකරුවන් මෙම සංවාදයේ දී හඳුනා ගැනීමට අවකාශය සලස්වන්න.

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- රචනා, දේශන සඳහා ප්‍රත්‍යවේක්ෂණ සහ ප්‍රතිචාර පත්‍රිකා, සිද්ධි අධ්‍යයනය, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්/ නැරඹුම්
- ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා කණ්ඩායම් සහභාගීත්වය
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන මෙවලම් භාවිතය: උදා. පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු චිත්‍රක, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක කථාව/වාර්තාව.

2වන ඒකකය: අතථ්‍ය ලෝකයේ අභියෝග සහ අවදානම්

කාලසීමාව: පැය 3යි

ප්‍රධාන මාතෘකා

- අන්තර්ජාල භාවිතයේ අභියෝග සහ අවදානම් අවබෝධ කර ගැනීම
- අන්තර්ජාලය භාවිත කිරීම බලගැන්වීම සහ එය භාවිතයේ සදාචාරාත්මක බැඳීම්
- පෞද්ගලිකත්වය සහ ආරක්ෂණය.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- අන්තර්ජාල භාවිතයේ අභියෝග/අවදානම් සහ ඒවා බොහෝ විට සිදු විය හැකි අවස්ථා ලැයිස්තුගත කර විස්තර කිරීම.

- අලුතින් වැඩි දියුණු කරන ලද අන්තර්ජාල යෙදුම් සමග ඇති විය හැකි අවදානම් සහ තර්ජන පිළිබඳ දැනුම වර්ධනය කිරීම.
- පරිශීලකයන්ගේ හැසිරීම හා ඔවුන් වින්දිතයන් හෝ අපයෝජනයට ලක්වන්නන් බවට පත් වීමේ සම්භාවිතාව අතර අන්තර් සම්බන්ධිත පැවැත්ම හෝ යම් වටිනාකම් හෝ හැසිරීම් පිළිබඳව බොහෝ පරිශීලකයන් නිශ්චිතව වෙනස් කිරීමට අවස්ථාවන් ලබා දීම සඳහා වන අභිලාෂයන්හි අවිඥානික බලපෑම අවබෝධ කර ගැනීම.
- අන්තර්ජාලය තුළ පරිසරය හා එහි ඇති ව්‍යාපාර පිළිබඳව දැඩි අවධානයකින් යුතුව අන්තර්ජාලය භාවිත කිරීමට මෙන්ම තම අයිතිවාසිකම් පිළිබඳ පුළුල් පරීක්ෂාකාරී බවකින් සහ අන් අයගේ අයිතිවාසිකම් පිළිබඳව ද දැනුවත්භාවයෙන් අන්තර්ජාලය භාවිත කිරීමට ශික්ෂකයන්ට හා ශිෂ්‍යයන්ට හැකි වන සේ මෙම දැනුම භාවිත කිරීම.
- මාර්ගගත පෞද්ගලිකත්වය සහ ආරක්ෂණය අතර වෙනස නිර්වචනය කිරීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් වශයෙන්: පෙර සාකච්ඡා කළ පරිදි මෙම විෂය මාලාව :1වන කොටස) තුළින් විවිධ අධ්‍යාපනික ප්‍රවේශ වෙත අවතීරණය විය හැකි ය. කරුණාකර 1වන කොටසෙන් ඉදිරිපත් කර තිබෙන ලැයිස්තුව සමාලෝචනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා භාවිත කළ යුතු ප්‍රවේශය තීරණය කරන්න.

මාර්ගගත අන්තර්ගතයට අදාළ අභියෝග සහ අවදානම්

Youth Protection Roundtable Toolkit - Stiftung Digitale Chancen 2009 ඇසුරෙන් සකස් කරන ලදී.

මෙම මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා විෂය මාලාවේ පරිශීලකයා පහත සඳහන් කර තිබෙන මාර්ගගත අභියෝග සහ අවදානම් ලැයිස්තුව සමග කටයුතු කිරීමට එහි පාර්ශ්වකරුවන් සමග උත්සාහ කළ යුතු ආකාරය පිළිබඳ සිතීමේ දී, සුදුසු මානව හිමිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සම්මත පිළිබඳ සම්පූර්ණ නොවන ලැයිස්තුවක් මත සිතා කටයුතු කිරීම සුදුසු වේ. පරිශීලකයා විසින් යෝග්‍ය වෙනත් ජාත්‍යන්තර සම්මත රාමුවක් පර්යේෂණය කර සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

i.සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR),https://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/CCPR.aspx

ii. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19වන වගන්තිය, https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights

iii. "අන්තර්ජාලය තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය, ආරක්ෂාව සහ භුක්ති විඳීම" පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව A/HRC/32/L.20, https://undocs.org/A/HRC/32/L.20

iv. "සයිබර් ආරක්ෂාව පිළිබඳ ගෝලීය සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් ආරක්ෂා කිරීම සඳහා ජාතික ප්‍රයත්න ගැනීම" පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව A/RES/64/211, https://www.un.org/en/ga/search/view_doc. asp@symbol}

v. "මත දැරීමේ හා ප්‍රකාශනයේ නිදහස ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව" පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව A/74/486, https://undocs.org/A/74/486

vi. එක්සත් ජාතීන්ගේ "ඩිජිටල් යුගයේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය" පිළිබඳ "මානව හිමිකම් සඳහා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් වාර්තාව" A/HRC/39/29, https://undocs.org/A/HRC/39/29

vii. එක්සත් ජාතීන්ගේ සංවර්ධන කණ්ඩායම් දත්ත පෞද්ගලිකත්වය, ආචාරධර්ම සහ ආරක්ෂාව: 2030 න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල දත්ත පිළිබඳ මාර්ගෝපදේශ සටහන, https://unsdg.un.org/sites/default/files/ UNDG_BigData_final_web.pdf

වයසට නුසුදුසු අන්තර්ගතය: අන්තර්ජාලය මගින් සියලුම පරිශීලක කණ්ඩායම් සඳහා අන්තර්ගත සම්භාරයක් සපයනු ලබයි. ප්‍රධාන ධාරාවේ අභිරුචි මෙන්ම විශේෂ උනන්දුවක් දක්වන කණ්ඩායම් සඳහා ද අන්තර්ජාලය විසින් සේවාවන් සපයනු ලබයි. නමුත්, සියලුම අන්තර්ගත ළමයින්ට සහ තරුණයන්ට ප්‍රවේශ වීමට සුදුසු අන්තර්ගත නොවේ. එබැවින්, කුමන වයස් කාණ්ඩයක් සඳහා කුමන අන්තර්ගතයක් සුදුසු වේද යන්න ප්‍රවේසමෙන් තීරණය කළ යුතු වේ. සාමාන්‍යයෙන් භාවිතය සඳහා නීති විරෝධී නොවන නමුත් තරුණ පරිශීලකයන්ට හානි කළ හැකි අන්තර්ගත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. කාමුක දර්ශන වැනි වයසට නුසුදුසු අන්තර්ගතයකට නොදැනුවත්ව නිරාවරණය වීමක දී, විශේෂයෙන් වයසින් බාල ළමයින්ට හානිදායක විය හැකි ය. පරිශීලකයාගේ ම අභිමතයෙන් ඒ පිළිබඳව සොයන අවස්ථාවක දී මෙන්ම, කිසිඳු අභිමතයකින් තොරව එවැනි අන්තර්ගතයක් වෙත ඇතුළත් වීමක දී හා අවධානයට ලක්වන ඇල්ගොරිදමයක් මගින් ඔවුන්ට නිර්දේශ කිරීමක දී මෙන්ම දත්ත විශ්ලේෂණය මත පදනම්ව සොයා ගන්නා ලද ඉලක්කගත පුද්ගලයන් ලෙස හඳුනා ගැනීමක දී ද වයසට නුසුදුසු අන්තර්ගත කෙරෙහි යොමු වීමේ අවදානම පවතී.

සියලුම වයස් කාණ්ඩ සඳහා සුදුසු නොවන අන්තර්ගත වාණිජ හේතූන් මත සපයනු ලබන අන්තර්ගත වේ. නමුත්, පරිශීලකයන් විසින් ම එවැනි අන්තර්ගත වෙත පිවිසීම නිර්මාණය කරනු ලබන අවස්ථාවන් ද ඇත. පරිශීලකයන් විසින් තම අභිමතයන් පරිදි භාවිත කරනු ලබන වයසට නුසුදුසු අන්තර්ගත බොහෝ අවස්ථාවන්වල දී පොදුවේ අවතීරණය විය හැකි අන්තර්ගත වන බැවින් ඒ සඳහා විශේෂ අවධානයක් අවශ්‍ය වන අතර, පළමුව සඳහන් කරන ලද ප්‍රවේශය සංවෘත පරිශීලක කණ්ඩායම්වලට පමණක් සීමා විය හැකි ය. වර්තමානයේදී බොහෝ ළමයින්ට සහ තරුණයන්ට බහු මාධ්‍ය ක්‍රියාකාරීත්ව සහිත ජංගම දුරකථන ඇති අතර එවැනි පසුබිමක අන්තර්ජාලයට ප්‍රවේශය ඔවුන්ගේ ඇඟිලි තුඩු අග රැඳී ඇති බැවින්, ඔවුන් තනිව ම සහ ඔවුන්ට මග පෙන්වීම සඳහා වැඩිහිටියෙකු නොමැතිව සිටින අවස්ථාවන්වල දී වයසට නුසුදුසු අන්තර්ගතයකට ප්‍රවේශ වීමේ හැකියාව ඔවුන්ට පවතී. ජංගම උපාංග මගින් ළමුන්ට ඕනෑම අවස්ථාවක දී තමන්ගේම ඩිජිටල් අන්තර්ගත නිර්මාණය කිරීමට අවකාශය පවතින අතර එමගින් පරිශීලකයන් විසින් ජනනය කරන ලද අන්තර්ගතවලට වැඩි වශයෙන් දායක වීමේ අවකාශ සැලසෙනු ඇත.

නීතිවිරෝධී අන්තර්ගතය: ළමා අපචාර අන්තර්ගත වැනි): බොහෝ රටවල සමහර අන්තර්ගත නීති මගින් ඉවත් කර තිබුණ ද, යම්කිසි අන්තර්ගතයක් නීති විරෝධී අන්තර්ගතයක් වශයෙන් හඳුනා ගනිමින් වර්ගීකරණය කරීම බොහෝ රටවල ජාතික නීති මත රඳා පවතී. එසේ වුවද, නීති විරෝධී අන්තර්ගත අන්තර්ජාලය තුළ ඇතුළත් වන අතර ළමයින්ට සහ තරුණයන්ට තම අභිමතයෙන් හෝ තම අභිමතයෙන් තොරව එම අන්තර්ගත සඳහා ප්‍රවේශ විය හැකි ය. නීතිවිරෝධී අන්තර්ගතයන්හී වින්දිතයන් ලෙස ළමුන් සහ තරුණයන් පත් වීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. උදාහරණයක් වශයෙන් ළමා ලිංගික අපයෝජනවල පින්තූර හෝ වීඩියෝ ලබා ගනිමින් ඒවා ප්‍රසිද්ධ කිරීම වැනි අවස්ථා පෙන්වා දිය හැකි ය.

සත්‍යාපනයක් නොමැති අන්තර්ගතය: අන්තර්ජාලය මගින් ලබා ගත හැකි අන්තර්ගත බොහෝ අවස්ථාවල දී ස්වාධීන මූලාශ්‍රයකින් සත්‍යාපනය නොකෙරෙන බැවින්, යෞවනයන් විවේචනාත්මක ඇසකින් එම අන්තර්ගත ඉගෙන ගැනීම හෝ කියවීම වැදගත් වන අතර එමගින් පවසනු ලබන සෑම දෙයක්ම එලෙසින්ම ප්‍රත්‍යක්ෂ සත්‍ය නොවන බව අවබෝධ කර ගැනීම වැදගත් වේ. වෙබ් 2.0හි ලක්ෂණයක් වන පරිශීලක විසින් ජනිත අන්තර්ගතය, බොහෝ විට පක්ෂක්ග්‍රාහී හෝ සාවද්‍ය විය හැකි ය. තරුණ පරිශීලකයන් විසින් අන්තර්ජාලය තුළින් කියවනු ලබන ඕනෑම කරුණක් සරලව එලෙසින් ම විශ්වාස කිරීමේ අන්තරා තත්ත්ව පිළිබඳව දැනුම්වත් විම අවශ්‍ය වේ.

හානිකර අවස්ථා සඳහා පෙළඹවීම: පරිශීලකයන් තමන්ට ම හානි කර ගැනීමට පොළඹවන බොහෝ වෙබ් අඩවි ඇත (උදා: සියදිවි නසාගැනීම් හෝ ආහාර අරුචිය ප්‍රවර්ධනය කරන වෙබ් අඩවි). වෙබ් 2.0 සමග සහ පරිශීලකයන්ට ඔවුන්ගේම අන්තර්ගත ප්‍රකාශ කිරීමට ඇති අවස්ථා වැඩි වීමත් සමග ම, හානි කිරීමේ අවදානමකට පෙළඹවන අන්තර්ගතයන්ට නිරාවරණය වීමේ අවදානම ද වර්ධනය වී ඇත. විශේෂයෙන්ම, ළමයින්ට සහ තරුණයන්ට එවැනි වෙබ් අඩවිවල දක්වා ඇති උපදෙස් පිළිපැදීමෙන් ඇතිවන අවදානම් තත්ත්ව පිළිබඳ යථාර්ථවාදී තක්සේරුවක් කිරීමට බොහෝ අවස්ථාවල දී හැකියාවක් නොමැත. ඇල්ගොරිදම ඔවුන්ව එම අන්තර්ගත කෙරෙහි නැඹුරුව තබා ගැනීමට සහ දත්ත ලබා දීමට මෙන්ම වෙළඳ ප්‍රචාරණ සහ වෙනත් ගෙවීම් සහිත අන්තර්ගත අවශෝෂණය කර ගැනීම සඳහා (උදා: රහසිගතව අනුග්‍රහකත්වය ලත් බලපෑම්කරුවන් විසින්) නිරන්තරයෙන් විශාල හානිකර අන්තර්ගත නිර්දේශ කරන බව යෞවනයන් සහ වැඩිහිටියන් එකසේ දැන සිටිය යුතු වේ.

මානව හිමිකම් උල්ලංඝනය කිරීම/අපහාස කිරීම: වෙබ් අඩවියේ නිර්නාමිකභාවය තුළ, ඇතැම් ජන කණ්ඩායම් හෝ පුද්ගලයන්ට එරෙහිව වෛරය පහසුවෙන් පැතිර වීමට අවස්ථාව ඇත. මීට අමතරව, පුද්ගලයන්ට ඔවුන්ගේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්වලට හෝ චින්දිතයන්ට සෘජුවම මුහුණ දීමට සිදු නොවන බැවින් හා ඔවුන්ගේ හැසිරීම් රටාවල ප්‍රතිවිපාකවලට ක්ෂණිකව මුහුණ දීමට සිදු නොවන බැවින් ඔවුන් බොහෝ විට අන්තර්ජාලය තුළ සබෑ ප්‍රතිරූපයට වෙනස් ආකාරයකින් ක්‍රියා කරන බව කෙනෙකුට උපකල්පනය කළ හැකි ය. මේ අනුව, මානව හිමිකම් උල්ලංඝනය වීමේ අවදානම සහ අපකීර්තියට ගොදුරු වීමේ අවදානම සැබෑ සමාජයේ දී සිදුවනවාට වඩා අන්තර්ජාලය තුළින් සිදුවිය හැකි ය. නොමග යවන සුළු තොරතුරු මගින් අදහස්වලට බලපෑම් ඇති කිරීමට වැඩි අවකාශයක් නිර්මාණය වන බැවින් දරුවන්ට සහ තරුණයන්ට එවැනි අන්තර්ගත හානිකර විය හැකි ය.

ළමුන් සඳහා නුසුදුසු වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණය: නුසුදුසු වෙළඳ දැන්වීම් යනුවෙන් අදහස් කරනු ලබන්නේ ළමයින්ට නුසුදුසු නිෂ්පාදන සහ/හෝ සේවාවන් සඳහා වෙළඳ දැන්වීම් ලැබීමේ හෝ ඒ සඳහා නිරාවරණය වීමේ අවදානම් තත්ත්වයයි. පරිශීලකයන් විසින් වැඩි වැඩියෙන් ඔවුන්ගේ පුද්ගලික තොරතුරු: එනම් නම, වයස හෝ ස්ත්‍රී පුරුෂභාවය) නිරාවරණය කරනු ලබන මට්ටමින්, ඔවුන්ට වෙළඳ දැන්වීම් ලැබීමට හෝ ලොතරැයි තරග සඳහා සහභාගී වීමට ලැබෙන විමසීම් ප්‍රමාණය වැඩි වේ. අන්තර්ජාලයේ වෙබ් අඩවිවල ඇති පෝරම සහ බොක්ස්වලට තම නම් යතුරුලියනය කිරීමේ ප්‍රතිවිපාක පිළිබඳව ළමුන් බොහෝ අවස්ථාවල දී නොදැනුවත් බැවින්, ඔවුන් අවදානමට ලක් වේ. ළමුන් සහ තරුණයන් අතර ජංගම දුරකථන භාවිතය ඉහළ යාමේ විනිවිද අනුපාතය සැලකිල්ලට ගනිමින්, වෙළඳ දැන්වීම් බෙදා හැරීම සඳහා වූ මෙම අතිරේක නාලිකාව කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. කුඩා ළමුන් ඕනෑම මට්ටමේ ප්‍රචාරණවලට ගොදුරු වීමේ වඩාත්ම අවදානම් තත්ත්වයකට ලක්වන අතර ඔවුන් ඉලක්ක කරගත් මෙම අන්තර්ගත පිළිබඳව විශේෂ සූදානමක් අවශ්‍ය වේ.

පෞද්ගලිකත්වය: සන්නිවේදනශාලයක යම් අන්තර්ගතයක් ප්‍රකාශනයට පත් කළ පසු, එම අන්තර්ගතය ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත විය හැකි අතර දින නියමයක් නොමැතිව එම අන්තර්ගතය සන්නිවේදනශාලයෙහි තිබෙනු ඇත. පරිශීලකයන්, විශේෂයෙන්ම ළමුයි සහ තරුණයෝ, පසුව ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීමට ඔවුන්ට අවශ්‍ය නොවන පෙළ සහ පින්තූර ප්‍රකාශනයේ කෙටි හා දිගු කාලීන ප්‍රතිවිපාක පිළිබඳව බොහෝ විට නොදනිති. සර්වරයක හෝ වේදිකාවක ගබඩා කර ඇති දත්තවලට අන් අයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි අතර මිනිසුන් තම පුද්ගලික දත්ත කෙතරම් අනාරක්ෂිත විය හැකි දැයි නොදැන සිටිය හැකි ය. අන්තර්ජාලය භාවිත කරන විට මිනිසුන් තමන් ක්‍රියාකාරී වී සිටින පරිසර තත්ත්ව සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීම වැදගත් වේ. වැඩි විස්තර සඳහා 8වන මොඩියුලයෙහි "පෞද්ගලිකත්වය" කියවීම සුදුසු වේ. පැහැදිලිව ඇතුළත් නොකරන ලද දත්තවලින් එකතු කරන දත්ත වුව ද දත්ත රැස් කරන්නන් විසින් ම හෝ පද්ධති අපහාරකයන් (Hackers) විසින් අහිතකර ලෙස භාවිත කළ හැකි වේ.

ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය කිරීම: ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය කිරීම යනු බොහෝ විට පරිශීලකයන්ගේ හැසිරීම හා සම්බන්ධ අවදානමකි. ප්‍රකාශන හිමිකමක් හිතාමතා හෝ අහඹු ලෙස උල්ලංඝනය කර තිබේද යන්න නොසලකා, උල්ලංඝනයට ලක් වූ තැනැත්තා විසින් එය වංචාවක් ලෙස සලකනු ලබන අතර උල්ලංඝනය කරන්නාට දඬුවම් කිරීමේ අවදානමක් ඇත. ඒ අතරම, අන්තර්ගතය නැවත භාවිත කිරීම හෝ ඔවුන්ගේ ම අන්තර්ගතයන් සංසරණය කිරීම සඳහා වන 'සාධාරණ භාවිතය' ගැන නිර්මාණාත්මක පොදු හැකියාවන් මෙන්ම ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් පුද්ගලික දත්ත සඳහා හිමිකාරිත්වය ඉල්ලා සිටීමින් ඔවුන්ගේ ව්‍යාපාරික යෝජනා ලෙස සමාජ මාධ්‍ය වේදිකා සැපයීම පිළිබඳව තරුණයන් සහ වැඩිහිටියන් එකසේ දැන සිටිය යුතු ය.

මාර්ගගත සම්බන්ධතා ආශ්‍රිත අවදානම්

Youth Protection Roundtable Toolkit - Stiftung Digital eChancen 2009 ඇසුරෙන් සකස් කරන ලදී.

හානිදායක උපදෙස්: ෆෝරම්, බ්ලොග් සහ වෙනත් සම්බන්ධතා මගින්, අන්තර්ජාලය භාවිත කරන්නන් අතර තොරතුරු සහ උපදෙස් හුවමාරු කර ගැනීමට වේදිකාවක් සපයනු ලබයි. මෙය වටිනා සහයක් විය හැකි නමුත්, උදාහරණයක් වශයෙන්, ආයතනික ඇල්ගොරිදම විසින් පරමාදර්ශික ශරීර ප්‍රතිරූපාදර්ශන සහ මුහුණේ අංග ලක්ෂණ සලකා බැලීම වැනි සමාජ විරෝධී හේතු මත නිර්මාණය වූ කණ්ඩායම්වලට සම්බන්ධ වීමට නිර්දේශ කිරීම ඇතුළුව, නුසුදුසු හෝ එයටත් වඩා හානිකර උපදේශකයන් සමග සම්බන්ධතා සඳහා ද පහසුකම් සලසා දෙනු ඇත. හානිකර උපදෙස් ලබා ගැනීමේ අවදානම, විශේෂයෙන්ම ළමුන් සහ තරුණයන් සඳහා, අනෙකුත් සාමාන්‍ය වෙබ් අඩවිවලට වඩා සමාජ ප්‍රජා වේදිකාවල හෝ වෙබ් 2.0 වැනි වෙනත් යෙදවුම්වල වැඩි වේ.

අනන්‍යතා සොරකම: වාණිජ හෝ වෙනත් වංචාවක් සිදු කිරීමේ චේතනාවෙන් සහ එයින් ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් වෙනත් පුද්ගලයන්ගේ ඉලෙක්ට්‍රොනික අනන්‍යතාව :උදා: පරිශීලක නාමය සහ මුරපදය) අනවසරයෙන් රඳවා තබා ගනිමින් එය භාවිත කිරීම අනන්‍යතා සොරකමට අයත් වේ. මාර්ගගතවන පුද්ගලයන් සංඛ්‍යාවේ වර්ධනයත් සහ විශේෂයෙන් පුද්ගලාරෝපිත සේවා භාවිත කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාවේ වර්ධනයත් සමග ම අතථ්‍ය අනන්‍යතා සංඛ්‍යාව වැඩි වන බැවින් අනන්‍යතා සොරකම වර්ධනය වෙමින් පවතින අවදානම් තත්ත්වයක් වශයෙන් සැලකිය හැකි ය. එය දුර්වල මුරපද ආරක්ෂාවක් හෝ අපහාරකයන් සම්බන්ධයෙන් සමාගම්වල දුර්වල ආරක්ෂාව නිසා ඇති විය හැකි අවදානමකි.

මුදල් සොරකම/තතුබෑම (Phishing): තතුබෑම යනු වෙනත් පුද්ගලයන්ගේ බැංකු ගිණුම් කොල්ලකෑමේ අරමුණින්, විශේෂයෙන් ම පුද්ගලික හැඳුනුම් අංක (PINs) සහ ගනුදෙනු සහතික කිරීමේ අංක (TANs) සොරකම් කිරීමේ ක්‍රියාවලියයි. තරුණයන් ව්‍යාජ වෙබ් අඩවි හඳුනා නොගෙන ඔවුන්ගේ බැංකු තොරතුරු එම ව්‍යාජ වෙබ් අඩවි වෙත ලබා දීමට ඉඩ ඇත.

වාණිජ වංචාව: විකුණුම්කරුවන් භාණ්ඩ හෝ සේවා විකිණීම සඳහා පෙනී සිටින විට, ගෙවීමෙන් පසු, පොරොන්දු වූ ගුණාංග නොපෙන්වන විට හෝ කිසිසේත් ලබා නොදෙන විට වාණිජ වංචා සිදු වේ. මෙම තත්ත්වය අනන්‍යතා සොරකම් සහ තතුබෑම්වලින් ද ඇති විය හැකි ය. වාණිජ වංචාවේ තවත් මූලාශ්‍රයක් වනුයේ අයුක්ති සහගත සහ අසාධාරණ මිලකට ඩිජිටල් සේවා : උදා: රින්ග් ටෝන්) විකිණීමයි. එය බොහෝ විට ගැනුම්කරු විසින් බලාපොරොත්තු නොවූ, සේවාව සඳහා වූ ස්ථිර අනුසන්කරණයකට ඔවුන් බැඳී සිටීම වෙනුවෙන් සිදු කරනු ලබන වාණිජ වංචාවකි. බොහෝ අවස්ථාවන්හි දී, අන්තර්ජාලය හරහා මාර්ගගතව අවසන් කරන ලද එවැනි ගිවිසුම්වල ප්‍රතිඵල පිළිබඳව පරිශීලකයන්: විශේෂයෙන් තරුණයන් සහ ළමුන්) කිසිසේත් ම දැනුම්වත් වී නොමැත.

වංචාසහගත ලෙස බාලවයස්කරුවන් පොළඹවා ගැනීම/ගෘමීන් (Grooming): ළමා ලිංගික අපචාරකයන් විසින් සිය වැඩිහිටි අනන්‍යතාව සඟවා ගනිමින් ළමුන් සහ තරුණයින් හා සම්බන්ධ වීමට ගැනීමේ මාධ්‍යයක් ලෙස අන්තර්ජාලය භාවිත කිරීම මෙයින් අදහස් කරනු ලැබේ. ඔවුන් බොහෝ විට ඔවුන්ගේ උපාය මාර්ග ගොඩනගාගනු ලබන්නේ මිත්‍රත්වය සහ හුරුපුරුදුකම සඳහා ළමුන් තුළ පවතින ආශාව පදනම් කර ගනිමිනි. පුද්ගලික සම්බන්ධතා සහ තොරතුරු හුවමාරුව සඳහා වේදිකා නිර්මාණය කරනු ලබන අන්තර්ජාලයේ සියලුම ක්ෂේත්‍ර වංචාසහගතව බාලවයස්කරුවන් පොළඹවාගැනීම (Grooming) සඳහා පදනමක් සපයනු ඇත. පෙර සඳහන් කළ පරිදි, ජංගම දුරකථනය : අන් අයව සම්බන්ධ කර ගැනීමට සහ සමාජ ජාල වෙත ප්‍රවේශ වීමට අමතර උපාංගයක් ලෙස) මෙහිදී දැඩි ලෙස සැලකිල්ලට ගත යුතු ය. විශේෂයෙන් ළමයින් තම ජංගම දුරකථනය ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයේ විශේෂිත කොටසක් ලෙස සලකමින් කටයුතු කරනු ලබන අවස්ථාවන්වල දී හා එය තනිව භාවිත කරනු ලබන අවස්ථාවන්වල දී දැඩි අවධානයක් ඔවුන් වෙත යොමු කළ යුතු වේ. මේ අනුව, ජංගම සන්නිවේදන තාක්ෂණයේ වැඩි දියුණුව සහ සමාජ ජාලවල වැඩි වීමත් සමග ම, බාලවයස්වකරුවන් පොළඹවා ගැනීමේ ප්‍රහාරයකට ගොදුරු වීමේ අවදානම සහ අනතුරුදායක ආරාධනා පිළිගැනීමේ අවදානම බෙහෙවින් වැඩි වී තිබේ.

සයිබර් හිංසනය (Bullying): මාධ්‍යය විසින් සපයනු ලබන නිර්නාමිකභාවයේ නිදහස හේතුවෙන් විවිධ ආකාරයේ සයිබර් හිංසන සිදු කිරීම් අන්තර්ජාලය මගින් සරල කර පෙන්වා දිය හැකි ය. විශේෂයෙන්ම ළමයින් සහ යෞවනයන්, සයිබර් හිංසන වින්දිතයන් වීම සහ වැරදිකරුවන් වීම යන ඛාණ්ඩයන් දෙවර්ග යට ම ගොදුරු වීමේ අවදානමක් ඇත. එබැවින් සයිබර් හිංසන සිදු කිරීම, තම හැසිරීම සමග මෙන්ම අන් අයගේ හැසිරීම සමග ද සම්බන්ධ වේ. අපහාසාත්මක පින්තූර වැනි අන්තර්ගත ප්‍රසිද්ධ කිරීම සයිබර් හිංසනයේ එක් පැතිකඩක් විය හැකි වුව ද, මෙම සංසිද්ධිය ප්‍රධාන වශයෙන් මාර්ගගත සම්බන්ධතාවලට සම්බන්ධ වේ. බොහෝ ළමයින් සහ තරුණයන් ඩිජිටල් කැමරාවක් සහිත ජංගම දුරකථනයකට හිමිකම් කියන බැවින්, සයිබර් හිංසන සිදු කිරීම පහසු වෙමින් පවතී.

පෞද්ගලික තොරතුරු අනාවරණය කිරීම: සමාජ ප්‍රජා වේදිකාවක චරිත සටහනක් (profile) සැකසීමේ දී, ප්‍රජාවට ඉදිරිපත් කිරීම සඳහා පෞද්ගලික තොරතුරු හෙළි කිරීමට පරිශීලකයන්ට ආරාධනා කෙරේ. එසේම, සංවාද කුටි (chat rooms) සහ ෆෝරම්වල දී පරිශීලකයන්ට ඔවුන්ගේ ලිපිනය හෝ දුරකථන අංකය වැනි පුද්ගලික දත්ත අන් අයට අනාවරණය කිරීමට සිදු විය හැකි ය. විශේෂයෙන්ම තරුණ තරුණියන්ට තම පෞද්ගලික දත්ත ප්‍රකාශනය කිරීමේ ප්‍රතිවිපාක පිළිබඳව පෙර අවධානමක් නොදැනේ. සංවාද කුටි (chat rooms) යනු පුද්ගලික ස්ථානයක් නොව පොදු වපසරියක් බව ඔවුන් බොහෝ විට නොදනී.

චරිත සටහන් විග්‍රහය (Profiling): පුද්ගලයෙකුට විවිධ වේදිකාවල ප්‍රසිද්ධ කළ හැකි චරිත සටහන් සංඛ්‍යාව වැඩි වීමත් සමගම, එක් වේදිකාවක ප්‍රසිද්ධ කරන ලද පුද්ගලික දත්ත වෙනත් වේදිකාවල ප්‍රසිද්ධ කරන ලද දත්ත සමග ඒකාබද්ධ වීමේ හා දත්ත තැරැව්කරුවන්ට විකිණීමේ හෝ වෙනත් ස්ථානයකට : උදා. ඡන්ද විමසීමේදී හෝ ලොතරැයි ඇදීමේදී) එම දත්ත ලබා දීමේ වැඩි අවදානමක් ඇත. මේ අනුව, අනවශ්‍ය අන්තර්ගත, සේවා සහ වෙළඳ දැන්වීම් තුළින් පුද්ගලයෙකු සෘජුවම සම්බන්ධ කර ගැනීමට හැකි වන පරිදි චරිත සටහන් නිර්මාණය කර ඇත.

වෙබ් අඩවියකට හෝ සේවාවකට පිවිසෙන විටදී 'කුකීස් පිළිගන්න' යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි එහි පරිශීලකයන් විසින් නිවැරදිව ම දැනසිටින්නේ ද? පුද්ගලික දත්ත ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය වන විට වෙබ් අඩවිය තුළින් චරිත සටහන් සැකසීම සිදු කළ හැකි ය. නමුත්, වඩාත් භයානක ක්‍රියාවක් ලෙස සැලකිය හැකි වනුයේ පරිශීලකයන්ගේ චරිත සටහන් : හෝ ඔවුන්ගේ අර්ධ චරිත සටහන්) වෙබ් අඩවිය දැනුම්වත් කිරීමකින් තොරව එහි ඇති දත්ත සමුදායෙන් සොරකම් කර වේදිකා නිර්මාණය කරන්නන් විසින් තෙවන පාර්ශවයන්ට විකිණීමයි. සමහර මාර්ගගත වේදිකා පරිශීලකයන් විසින් ඔවුන්ගේ වේදිකාව (හෝ එහි අනුබද්ධිතයන්) භාවිත නොකරන අවස්ථාවන්වලදී ද, පරිශීලකයන්ගේ දත්ත වෙත ප්‍රවේශය ලබා ගැනීමට වෙනත් මාර්ගගත සේවා සමග එක්ව කටයුතු කරනු ලැබේ.

- ශික්ෂකයන් විසින් පහත ලැයිස්තුගත කර ඇති පරිදි වෙනත් ජාත්‍යන්තර සම්මුති සහිත රාමුවක් අධ්‍යයනය කිරීමට සහ එම සම්මුති වෙත අවධානය යොමු කරමින් ඒවා ඉගෙන ගැනීමට තම ශිෂ්‍යයන්ට මග පෙන්වීමට කටයුතු කළ යුතු වේ. මෙම එක් එක් ලේඛනයේ ඇති ප්‍රධාන නිර්දේශ සහ සක්‍රීය කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. ඔබේ රට පහත සඳහන් ගිවිසුමට සහ ඊට අදාළ අනෙකුත් සම්මුතීන්ට අත්සන් කර තිබේ ද? එක්සත් ජාතීන්ගේ යෝජනාව, වාර්තා සහ මාර්ගෝපදේශ ඔබේ රටට අදාළ වේද? එම නිර්දේශ සහ ක්‍රියාමාර්ග ඔබේ රටේ ක්‍රියාත්මක වන්නේ ද? මේවා අධ්‍යයනය කර, ඒවා එසේ ක්‍රියාත්මක වීමට හෝ නොවීමට හේතු විමසීම යෝග්‍ය වේ. එමගින් කුමන බලපෑමක් ඇතිවේ ද යන්න විමසා බැලීම ද වැදගත් වේ. ඔබේ රටේ මෙම ප්‍රශ්නවල ප්‍රධාන පාර්ශ්වකරුවන් කවුරුන් ද? එවැනි ප්‍රශ්න රටේ තිබෙනවා ද? සිවිල් සමාජය මෙම ක්‍රියාවලීන්හි නිරත වන්නේ කෙසේ ද? ඔවුන්ගෙන් උපදෙස් ලබා ගන්නවා ද? ඔවුන් ක්‍රියාත්මක කිරීම්, අධීක්ෂණය සහ තීරණ ගැනීම්වලට සම්බන්ධ වනවා ද? තරුණයන්, කාන්තාවන් සහ විවිධ ආන්තික කණ්ඩායම් මෙම ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ ද? නැත්නම් එසේ සම්බන්ධ නොවීමට හේතු මොනවා ද? ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මොනවා ද?

  - සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR), https://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/CCPR.aspx
  - මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19වන වගන්තිය, https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights
  - "අන්තර්ජාලය තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය, ආරක්ෂාව සහ භුක්ති විඳීම" පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව A/HRC/32/L.20,https://undocs.org/A/HRC/32/L.20
  - "සයිබර් ආරක්ෂාව පිළිබඳ ගෝලීය සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් ආරක්ෂා කිරීම සඳහා ජාතික ප්‍රයත්නයන් ගැනීම" පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව A/RES/64/211, https://www.un.org/en/ga/search/view_doc.asp?symbol=A RES/64/211
  - "මත දැරීමේ හා ප්‍රකාශනයේ නිදහස ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව" පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව A/74/486,https://undocs.org/A/74/486
  - එක්සත් ජාතීන්ගේ "ඩිජිටල් යුගයේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය" පිළිබඳ "මානව හිමිකම් සඳහා එක්සත්ජාතීන්ගේ මහ කොමසාරිස්ගේ වාර්තාව" A/HRC/39/29, https://undocs.org/A/HRC/39/29
  - එක්සත් ජාතීන්ගේ සංවර්ධන කණ්ඩායම් දත්ත පෞද්ගලිකත්වය, ආචාරධර්ම සහ ආරක්ෂාව: 2030 න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල දත්ත පිළිබඳ මාර්ගෝපදේශ සටහන, https://unsdg.un.org/sites/default/files/ UNDG_BigData_final_web.pdf

- හානිකර මාර්ගගත අන්තර්ගතය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න අවබෝධ කර ගැනීම වැදගත් වේ. ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය තුළින් ප්‍රකාශනයේ නිදහසට පිළිගත හැකි සීමාවන්

ගණනාවක් නියම කර ඇත - විශේෂයෙන්ම භාෂණයේ නිදහස වෙනත් අයිතිවාසිකම් සමග ගැටෙන විට දී මෙම සීමාවන් බලාත්මක වේ. සීමා කළ හැකි කරුණු සඳහා උදාහරණ වශයෙන් ප්‍රචණ්ඩත්වය හෝ වාර්ගික වෛරය ඇති කිරීම සඳහා පෙළඹවීම, ළමා සහ ලිංගික පිත්තුර සඳහා වන පෙළඹවීම ඉදිරිපත් කළ හැකි ය. සෑම අවස්ථාවකදීම, එම අදාළ සීමා කිරීම් නිවැරදි ලෙස සවිස්තරාත්මකව ප්‍රකාශ කරන ලෙසට සහ අධිකරණය විසින් අධීක්ෂණය කළ යුතු බවට ජාත්‍යන්තර නීතිය මගින් නියම කරනු ලැබ ඇත. නමුත්, මානව හිමිකම් නිති තුළින් අවබෝධ කිරීමට අපොහොසත් සංවේදීතා අවබෝධ කර ගනිමින් කටයුතු කිරීම හානියක් ලෙස නොසැලකිය යුතු වේ. එසේ වූයේ නම්, සංගීත ශෛලියකට එරෙහි ප්‍රකාශන එහි රසිකයන්ට සිදු කරනු ලබන හානියක් වශයෙන් සැලකීමට සිදු වේ. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව, එවැනි ක්‍රියාවක් ආරම්භ කිරීම හානියක් සිදු කිරීමක් වශයෙන් සැලකීමට ප්‍රමාණවත් සාධකයක් බවට හැඳින්වීම සුදුසු නොවේ. මෙම පසුබිමට එරෙහිව, මෙම ජාත්‍යන්තර ප්‍රමිතී පිළිබඳව ඉගෙනුම් අවස්ථා විවිර කර දෙමින් විවාදයක් ඉදිරිපත් කිරීම සහ එවැනි හානිකර තත්ත්ව ඇතුළුව විවිධ වර්ගයේ අන්තර්ගත සඳහා උදාහරණ උද්දීපනය කිරීම සුදුසු වේ.

- විභවීය හානිකර තත්ත්ව සැබෑ හානියක් යැයි උපකල්පනය කිරීමෙන් වැළකී සිටීම වැදගත් වේ. සමාජයට අන්තර්ගතවලින් සිදු වන බලපෑම පොදුවේ පවතින උත්තේජක ප්‍රතිචාර ආකෘතිය (Commonly held stimulus response model) විසින් යෝජනා කරනු ලබන බලපෑමට වඩා බෙහෙවින් සංකීර්ණ වේ. පළමුව, න්‍යායාචාර්ය ස්ටුවර්ට් හෝල් පෙන්වා දුන් පරිදි, විවිධ පුද්ගලයන් විසින් විවිධ ආකාරයෙන් ප්‍රතිචාර දක්වනු ලබයි - එනම්, ඔවුන් විසින් පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම හෝ සාකච්ඡා කිරීම සහ සංජානන ක්‍රියාමාර්ග, බලපෑම් සහ ප්‍රායෝගික මට්ටමේ ක්‍රියාකාරකම් සඳහා විවිධකාරයෙන් ප්‍රතිචාර දක්වනු ලබයි. දෙවනුව, නීත්‍යානුකූල කිරීම සහ බලාත්මක කිරීම මෙන්ම රාමුගත කිරීම සහ න්‍යාය පත්‍ර සැකසීම වැනි අවස්ථාවලදී, පුළුල් පරාසයක බලපෑම් ඇති කරනු ලබන අතර, එම බලපෑම් මගින් බිය, බලාපොරොත්තුව හෝ කෝපය වැනි හානිකර හැඟීම් ජනනය කරවන අන්තර්ගත අවස්ථාවලට සියුම් ප්‍රවේශයක් ලබා ගනී. මෙම සන්දර්භය තුළ නෛසර්ගික උපද්‍රවය (intrinsic harm) පෙන්නුම් කරනු ලබන ප්‍රමාණයට වඩා වැඩි යමක් අවබෝධ කර ගැනීමට සහ ප්‍රතික්‍රියා කිරීමට සියුම් වූ වෙනස්කම් (nuance) අවශ්‍ය වේ. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව (MIL) යනු සිදු විය හැකි යැයි සිතනු ලබන හානිය සැබෑ හානියක් විය හැකි විට හඳුනා ගැනීමේ එක් මාර්ග යකි. උදාහරණයක් වශයෙන්, වෙනත් සන්දර්භ හා සසඳන විටදී, කථනය තුළින් සැබවින්ම භයානක බලපෑමක් ඇති කළ හැකි බවට සිතන අවස්ථාවක දී සහ එම බලපෑම් සඳහා ක්ෂණිකව ක්‍රියා කළ යුතු අවස්ථාවකදී ක්‍රියා කළ යුතු කොන්දේසි පිළිබඳව ද මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව මගින් අවබෝධයක් ලබා ගත හැකි ය. කථිකයාගේ තත්ත්වය සහ බලපෑම, කථාවේ ව්‍යාප්තිය, සන්දර්භයේ අස්ථාවරත්වය යනාදී ප්‍රධාන අංග දෙස අවධානය යොමු කරන රබාත් සැලැස්මෙන් වෛරී කථනයට විරුද්ධව ක්‍රියාත්මක වීම සඳහා එවැනි කුසලතා ලබා ගනු ඇත. මතුපිටින් විමසා බැලීමේ දී නීත්‍යානුකූල ලෙස සැලකිය හැකි නමුත් යථාර්ථයේ දී හානිකර ක්‍රියාවක් සඳහා සංකේතාත්මක ඇමතුමක් වන අන්තර්ගතයක් සෑදිය හැකි "ඩෝග් විස්ල්ස් (Dog Whistle)" සංකල්පය ඇතුළු අන්තර්ගත විස්තාරණය කිරීම සහ පුනරාවර්තනය කිරීමේදී ඩිජිටල් සන්නිවේදන සමාගම්වල කාර්යභාරය සඳහා මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව උපකාරී වනු ඇත.

  - මතුපිටින් හෝ සැබවින්ම හානිකර අන්තර්ගත සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති අභියෝගවලින් ඕනෑම අයෙකු සමග ඔවුන් හෝ මිතුරෙකුට ඇති ඕනෑම අත්දැකීමක් බෙදා ගැනීමට ශික්ෂකයන්ගෙන් ඉල්ලා සිටින්න. ඔවුන් එම අවස්ථාව සමග කටයුතු කළේ කෙසේ ද? අවසාන ප්‍රතිඵලය කුමක් ද? ඔවුන් ඉගෙනගත් පාඩම් මොනවා ද?

- උදාහරණයක් වශයෙන්, අනන්‍යතා සොරකම්, මුදල් සොරකම්/තතුබෑම්, මානව හිමිකම් උල්ලංඝනය කිරීම හෝ අන්තර්ජාලයේ සිදුවන වෙනත් අපයෝජන පිළිබඳව සලකා බලන්න. අධ්‍යයනයන් තුළින් හෝ මෙම මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා විෂය මාලාවේ සපයා ඇති සම්පත් භාවිත කරමින්, තොරතුරු, වංචනික වෙබ් අඩවි සහ මානව හිමිකම් උල්ලංඝනය කරනු ලබන අන්තර්ගත සඳහා වංචනික මාර්ගගත ඉල්ලීම් හඳුනා ගැනීමට ශික්ෂකයන් හා ශිෂ්‍යයන් විසින් සොයා බැලිය යුතු පියවරයන් සහ නිශ්චිත ලක්ෂණයන් හඳුනාගෙන ලැයිස්තුගත කරන්න. මෙම ක්‍රියාකාරකම සඳහා භාවිත කරනු ලබන සම්පත් ප්‍රායෝගික විය යුතු අතර නිරන්තරයෙන් ම යථාර්ථවාදී අවස්ථා නියෝජනය කළ යුතු ය. ඉහත ලැයිස්තුගත කර ඇති සියලුම අවදානම් සඳහා ශික්ෂකයන්ට මෙම ක්‍රියාකාරකම සිදු කළ හැකි ය.
- COVID-19 වසංගත සන්දර්භය තුළ, අන්තර්ජාලයේ ඇති වෛද්‍ය ඃ හෝ වෙනත් ඛාණ්ඩයේ) තොරතුරු පිළිබඳ මාර්ගගත සෙවීමක් සිදු කරන්න. ඔබට පවතින සෞඛ්‍ය ගැටලු හඳුනා ගැනීමට

වෛද්‍ය වෙබ් අඩවිවලට උපකාර කළ හැකි ද? වෙබ් අඩවියෙන් ලැබෙන උපදෙස් මත පදනම්ව ඔබේ සෞඛ්‍යය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම ආරක්ෂිත ද? වෛද්‍ය වෙබ් අඩවියක සත්‍යතාව සහ අධිකාරය නිර්ණය කිරීම සඳහා ඒවා ලැයිස්තුගත කර සාකච්ඡා කරන්න.

- ඔබ සමාජ ජාලයක කොටසක්කරුවෙක් නම්, ඩක් ඩක් ගෝ (DuckDuckGo), ගූගල් (Google), යන්ඩෙක්ස් (Yandex), බයිඩු (Baidu) හෝ වෙනත් සෙවුම් යන්ත්‍ර භාවිතයෙන් ඔබේ නම සෙවීම සිදු කරන්න. පොදු වසම (public domain) තුළ ඔබ පිළිබඳ පුද්ගලික තොරතුරු කොපමණ ප්‍රමාණයක් නිරාවරණය වී තිබේ ද? ඔබ විසින් ඔබේ සමාජ ජාලයෙන් ඉවත් කරන ලද ඔබ පිළිබඳ තොරතුරු ඔබට තවමත් සොයාගත හැකි වේ ද? ඉහත සඳහන් කළ අවදානම්වලින් මෙය සම්බන්ධ වන්නේ කුමන අවධානමකට ද?
- මුහුණු පොතේ හිමිකම් සහ වගකීම් ප්‍රකාශය, 2වන වගන්තිය යටතේ දක්වා ඇති, 'ඔබේ අන්තර්ගතය සහ තොරතුරු අන් පාර්ශ්වයන් සමග බෙදාගැනීම' (හෝ වෙනත් ඕනෑම සමාජ ජාලයකින් හෝ ඔබේ පරිගණකයේ මෘදුකාංගයකින්) ප්‍රකාශනයෙන් කොටසක් උපුටා ගන්න. කුඩා කණ්ඩායම් වශයෙන්, ඔබ විසින් තෝරා ගන්නා ලද උපුටා ගැනීම කෙනෙකුගේ පෞද්ගලිකත්වයට සහ ආරක්ෂණයට බලපෑමක් ඇති කිරීමට හේතු වන්නේ ද යන්න විශ්ලේෂණය කරන්න. පරිශීලකයන්ට ඔවුන් පිළිබඳව අන්තර්ජාලයේ පළ කර ඇති අන්තර්ගතය පාලනය කළ හැකි වන්නේ කෙසේ ද? සමාජ ජාලවල හෝ වෙබයේ ඉදිරිපත් කර ඇති ඇතැම් අන්තර්ගත (ඡායාරූප, වීඩියෝ, ආදිය) සඳහා ප්‍රකාශන හිමිකම අයත් වන්නේ කුමන පාර්ශ්වයකට ද යන්න විශ්ලේෂණය කර සාකච්ඡා කරන්න. 8වන මොඩියුලයෙහි "පෞද්ගලිකත්වය" පිළිබඳ වැඩි විස්තර බලන්න.
- පරිශීලකයන්ට තමන් පිළිබඳව, ඔවුන්ගේ ඉතිහාසය හා භූගෝලය පිළිබඳව මතක තබා ගත හැකි දේ සහ අන්තර්ජාල සමාගම් ඔවුන් පිළිබඳව දන්නා දේ අතර අසමමිතිය සාකච්ඡා කරන්න.
- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය පරීක්ෂා කරන්න. එම සම්මුතිය මගින් සෑම තැනකම සිටින ළමුන්ට හිමිවන මූලික මානව හිමිකම් ඉදිරිපත් කර ඇත: පැවැත්මේ අයිතිය; පූර්ණ ලෙස සංවර්ධනය වීමේ අයිතිය; හානිකර බලපෑම්, අපයෝජන හා සමූපයෝජනයෙන් ආරක්ෂා වීමේ අයිතිය; සහ පවුල්, සංස්කෘතික හා සමාජීය ජීවිතයට සම්පූර්ණයෙන්ම බැඳී සිටීමේ අයිතිය එම අයිතීන් අතරට ඇතුළත් වේ. ළමුන්ගේ යහපැවැත්මට හානි කළ හැකි තොරතුරු සහ ද්‍රව්‍යයන්ගෙන් ළමුන් ආරක්ෂා කිරීම සඳහා සුදුසු මාර්ගෝපදේශ සකස් කිරීමට අවශ්‍ය කරන සම්මුති ලිපි තිබේද?
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ තාක්ෂණ නිරීක්ෂණ වාර්තාව 10 මගින් තර්ක කර ඇත්තේ ඩිජිටල් ලෝකයේ සහ අන්තර්ජාලයේ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලිකත්වය සහ ආරක්ෂණය පිළිබඳ ගැටලු විසඳීමේ අවශ්‍යතාව අංක 1 ප්‍රමුඛතාව විය යුතු බවයි (ITU2009). ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය මත රඳා පවතින සියලුම පද්ධති සහ ක්‍රියාවලි සඳහා ශක්තිමත් ආරක්ෂාවක් නොමැතිකම වශයෙන් නියතයෙන් ම අවදානම් තත්ත්වයක් ඇති කරයි (ITU2006). දුර්වල ආරක්ෂා පද්ධතියකින් සමන්විත වීම හෝ ආරක්ෂාවක් කිසිසේත් නොමැති වීම සයිබර් අපරාධ වර්ධනය වීමට හේතු වේ. 'අන්තර්ජාලය හරහා සාමය සහ ආරක්ෂාව සහතික කළ නොහැකි නම් සන්නිවේදනයට ප්‍රවේශය නිෂ්ඵල වන බව ඇතමුන් විසින් තර්ක කර ඇති අතර, අප විසින් ඩිජිටල් ලෝකය 'ද්වාර සහිත ප්‍රජාවක් ලෙස දැකිය යුතු බවත්, එහි පරිශීලකයන් විසින් ඔවුන්ගේ නිදහස හා නිර්නාමිකභාවය එය තුළ කැප කරනු ලබන්නේ යහපත් ආරක්ෂාවක් පෙරලා ඔවුන් වෙත ලැබෙනු ඇත යන විශ්වාසයෙන් බවත්' ඇතමුන් විසින් යෝජනා කර ඇත. (*ITU ප්‍රවෘත්ති*)

කෙසේ වෙතත්, අන්තර්ජාලය තුළ නිදහසේ සැරිසැරීම වෙනුවෙන් කටයුතු කරන බොහෝ ක්‍රියාකාරීන් ඒ පිළිබඳව රජයේ මැදිහත්වීම් සහ පාලනය ගැන වඩාත් සැලකිලිමත් ය. අන්තර්ජාලය විවෘත මහජන යහපත සඳහා වන අවකාශයක් වෙනුවට සංවෘත පාලිත අවකාශයක් බවට පත්වෙමින් පවතින අතර එය රජය සහ සමාගම් විසින් වැඩි ආධිපත්‍යයක් දරමින් පාලනය කරන බවට වර්තමානයේ මතයක් දළුලමින් පවතී. සමහර රජයන් සහ ව්‍යාපාර සඳහා ආරක්ෂාව ප්‍රධානත ම සැලකිල්ල විය හැකි නමුත් බොහෝ පුරවැසියන්ට එම කරුණ එසේ නොවේ. නිර්නාමිකභාවය සහ ගුප්තකේතනය (encryption) මගින් අනුග්‍රහය දක්වන පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය, ඇතැම් අදහස් සඳහා තාඩන පීඩන වැළැක්වීමට, නිරීක්ෂණ ව්‍යාපාර ආකෘති අධ්‍යයනය කෙරෙහි වැඩි වශයෙන් යොමු වීමට සහ සයිබර් අපරාධකරුවන්ට අවකාශ විවර නොකිරීමට වැදගත් වේ.

- ඉහත උපුටා දැක්වීම්වල ප්‍රකාශ පිළිබඳව සාකච්ඡා කරන්න. අතථ්‍ය ලෝකය වඩාත් ආරක්ෂිත කිරීමට රජයයන් පියවර ගත යුතු යැයි ඔබ සිතනවා ද? එසේ සිතීමට හෝ නොසිතීමට හේතු මොනවා ද?

- සමහර අවස්ථාවලදී පෞද්ගලිකත්වය යම් ප්‍රමාණයකට කැප කිරීමට සිදු වන බවට ඔබ එකඟ ද? එවැනි අවස්ථා මොනවා ද? අන්තර්ජාලය ලෝකයේ කිසියම් රටක් හෝ කලාපයක් විසින් පාලනය කළහොත් කුමක් සිදුවේ ද?

- අන්තර්ජාල ආරක්ෂාව සඳහා භාවිත කරනු ලබන මෙවලම් වර්ග කිහිපයක් පිළිබඳව පර්යේෂණයක් සිදු කරන්න - සංකේතනය; මුරපද ආරක්ෂාව; අපහාරකයන්ට (Hackers) ගොදුරු වූ රජයන් සහ සමාගම් විසින් අනාවරණය කරන ලද ආරක්ෂා පද්ධති බිඳ හෙලීම් පිළිබඳව නිරීක්ෂණය කර එහි වාසි සහ අවාසි සාකච්ඡා කරන්න.
- ඔබ විසින් භාවිත කරනු ලබන ඕනෑම සමාජ ජාල වෙබ් අඩවියක් හෝ මෘදුකාංගයක් තෝරා ගන්න. පෞද්ගලිකත්ව සිටුවම (privacy setting) සමග අත්හදා බැලීම් සිදු කර බලන්න. 'පෞද්ගලිකත්වය සහ ආරක්ෂණය' යන පද 'භාවිතයේ නියමයන්' (terms of use) තුළ සොයන්න. මෙම කොටසේ විස්තර කර ඇති අවදානම් තත්ත්වයන් මගහරවා ගැනීමට ඔබට උපකාර කිරීමට පෞද්ගලික නිරාපද ප්‍රමාණවත් යැයි ඔබ සිතනවා ද? (අන්තර්ජාල අන්තර්ගතය සහ සම්බන්ධතාවලට අදාළ අවදානම් පිළිබඳ විස්තර ඇතුළත් බොක්ස් බලන්න) ඔබ පෞද්ගලික සිටුවම (privacy setting) උපරිම මට්ටම වන සේ සැකසූ විට එමගින් ලැබෙන ප්‍රතිඵල මොනවා ද? 8වන මොඩියුලයෙහි "පෞද්ගලිකත්වය" සහ 7වන සහ 11වන මොඩියුල තුළ "සමාජ මාධ්‍ය" පිළිබඳ වැඩි විස්තර බලන්න.

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- දේශන, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්/ නැරඹුම් සඳහා රචනා, අතුරු ප්‍රත්‍යවේක්ෂණ පත්‍රිකා හා ප්‍රතිචාර පත්‍රිකා
- ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා කණ්ඩායම් සහභාගීත්වය
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන මෙවලම් භාවිතය :උදා. පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු චිත්‍රක, සමාජ මාධ්‍ය කාඩ්පත්, ව්ලොග්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක කථාව/වාර්තාව.

3වන ඒකකය: ඉගෙනුම, ජාලකරණය හා මාර්ගගත සමාජීය නියැලීම

කාලසීමාව: පැය 8යි

ප්‍රධාන මාතෘකා

- ජාලගත ඉගෙනුම
- සමාජීය නියැලීම
- විචාරශීලී මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව
- සමාජ මාධ්‍ය භාවිතය, පරිභෝජනය, නිෂ්පාදනය සහ නියැලීම.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- සමාජ මාධ්‍යවල ක්‍රියාකාරී වීමට ශිෂ්‍යයන් තුළ පවතින අභිප්‍රේරණ අවබෝධ කර ගැනීම සහ ඔවුන් සමාජ මාධ්‍ය භාවිත කරන ක්‍රම, ශිල්පීය ක්‍රම සහ වෙනත් ක්‍රම කිහිපයක් ද සලකා බැලීම.

- ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ජාලකරණය පිළිබඳ පූර්ණ අවබෝධයක් තිබේ නම්, ඔවුන් ජාලකරණය සිදු කරන ආකාරය හා ඔවුන් ජාලකරණය මත තබන වටිනාකම විශ්ලේෂණය කිරීම.
- සමාජ මාධ්‍ය වෙත අවධානය යොමු කිරීම සහ මාර්ගගත ජාලකරණය තුළින් ඉගෙනුම සිදු විය හැකි ආකාරය පරීක්ෂා කිරීම.
- සමාජ මාධ්‍යයේ නියැලීම සම්බන්ධ සමහර ඉගෙනුම් ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම.
- සමාජ මාධ්‍ය සහ මාර්ගගත ජාලකරණය හරහා සමාජීය නියැලීම සිදු වන ආකාරය සහ මෙම සමාජ නියැලීම අභ්‍යාසලාභීන්ට, ඔවුන්ගේ ඉගෙනීමට සහ ඔවුන්ගේ ජීවිතයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබන්නේ නම්, ඒ පිළිබඳව ඇගයීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් වශයෙන්: පෙර සාකච්ඡා කළ පරිදි මෙම විෂයමාලාවේ (1වන කොටස) තුළින් විවිධ අධ්‍යාපනික ප්‍රවේශ වෙත අවතීරණය විය හැකි ය. කරුණාකර 1වන කොටසෙන් ඉදිරිපත් කර තිබෙන ලැයිස්තුව සමාලෝචනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා භාවිත කළ යුතු ප්‍රවේශය තීරණය කරන්න.

- සමාජ මාධ්‍ය ලොව පුරා බහුලව භාවිත වේ. සමාජ මාධ්‍ය අවුට්ලට්ස් (social media outlets), යෙදුම් සුවහන ප්‍රොෆයිල (APP) සහ සේවා බහුලව පැතිරී ඇති අතර, ඒවායින් බොහෝමයක් පරිශීලකයන්ට දායකත්ව පිරිවැයකින් තොරව, ඔවුන්ගේ දත්ත භාවිතය, විකිණීම සහ මිලදී ගැනීම තෙරැවිකරුවන් විසින් සහ ගෙවීම් සිදු කර සේවා ලබා ගන්නා දැන්වීම්කරුවන් විසින් සිදු කරනු ලබයි. මෙමඟින් අධ්‍යාපන අංශය සඳහා සැලකිය යුතු ජාලකරණ විභවතාවක් පවතී[83]. ඒ සමගම, එවැනි අවස්ථා සඳහා පෞද්ගලිකත්ව ආරක්ෂණයට පිරිවැයක් දැරීමට ඔවුන්ට සිදුවන බව පරිශීලකයන් විසින් අවබෝධ කරගෙන සිටිය යුතු ය. එයට හේතුව වන්නේ එසේ ලැබෙන අන්තර්ගතය පාලනය කරනු ලබන ස්වාධීන පුද්ගලයන් වශයෙන් ඔවුන්ගේ නියෝජිතායතනයන් ක්‍රියා කරන බැවිනි. එවැනි භාවිත නොතකා සාමාන්‍ය මට්ටමින් ජාලගත කිරීම, සම වයසේ මිතුරන්ගේ බලපෑම් සහ ප්‍රජා ගොඩනැගීම හරහා මෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සැපයුම්කරුවන් හරහා ද සමාජ සහ ඉගෙනුම් ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම සිදු විය යුතු ය. සමාජ මාධ්‍යවල වැඩි විස්තර සඳහා 7වන සහ 11වන මොඩියුල බලන්න. **මෙම ඒකකය සමාජ මාධ්‍ය තුළින් සමාජ වෙනසක් සඳහා ඉගෙනුම සහ ජාලකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.**
- මිරා (2017) සම්බන්ධිත ඉගෙනුම් සහ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් අංග අවධාරණය කරයි:
    - සහයෝගීතාව: සම්බන්ධිත ශික්ෂකයන් සහයෝගීව වැඩ කරයි.
    - කුතුහලය: සම්බන්ධිත ශික්ෂකයන් පුහුණු අවකාශය තුළ ඉගෙනීම සඳහා විමර්ශන මානසිකත්වයක් නිර්මාණය කරයි.
    - ධෛර්යය: සම්බන්ධිත ශික්ෂකයන් තම ඉගෙනුම් අත්දැකීම මත ඔවුන්ගේ යම් පාලන අත්හැර දැමීමට ක්‍රියා කරයි.
    - ප්‍රජා නියැලීම: සම්බන්ධිත ශික්ෂකයන් ශිෂ්‍යයන්ව පොදු ජීවිතයට සම්බන්ධ කර ගනී.
    - රූකවරණය: සම්බන්ධිත ශික්ෂකයන් ඔවුන්ගේ රුචිකත්ව සහ ඉගෙනුම් අභ්‍යාසලාභීන් සමග බෙදා ගනී.
- ඉගෙනීම වැඩිදියුණු කිරීම සඳහා සමාජ මාධ්‍ය විවිධ ආකාරවලින් භාවිත කළ හැකිය. වෙස්ට් (2019) අන්තර්ක්‍රියා සහ ඉගෙනීම වැඩි දියුණු කිරීම සඳහා ශිෂ්‍යයන් හා අන් අය සමග සම්බන්ධ වීමට උපකාරී වන ක්‍රියාකාරකම් කිහිපයක් ලේඛනගත කරයි.
    - යාවත්කාලීන කිරීම් සහ විවිධ දැනුම් දීම් ප්‍රකාශනය කිරීම සඳහා මුහුණු පොතේ පිටුවක් භාවිත කරන්න

83. See https://www.commonsense.org/education/top-picks/social-networks-for-students- and teachersand https://www.techlearning.com/tl-advisor-blog/25-social- n,kak

- සජීවී දේශන සහ සත්කාරක සාකච්ඡා ප්‍රවාහ කිරීමට මුහුණු පොතේ කණ්ඩායම් විකල්පය භාවිත කරන්න
- පන්ති කාමරයේ සංදේශ පුවරුව ලෙස ට්විටර් භාවිත කරන්න
- ඡායාරූප ඇතුළත් රචනා සඳහා ඉන්ස්ටර්ග්‍රෑම් භාවිත කරන්න
- සාකච්ඡා සඳහා ඉගෙනුම් බ්ලොගයක් නිර්මාණය කරන්න
- රචනා පැවරුම් බ්ලොග් සටහන් ලෙස ලිවීමටසලස්වන්න
- පන්ති කාමරයට විශේෂිත වූ පින්ටරෙස්ට් (Pinterest) පුවරුවක් නිර්මාණය කරන්න
- රුචිකත්වය මත පදනම් වූ මුහුණුපොත් කණ්ඩායම් නිර්මාණය කරන්න
- සමාජ මාධ්‍ය අර්බුද උපාය මාර්ගයක් (Social media crisis strategy) නිර්මාණය කරන්න (හදිසි අවස්ථාවන් සඳහා)

ඔබ විසින් ආමන්ත්‍රණය කරනු ලබන්නේ පරිශීලකයන්ට නොව ඩිජිටල් වේදිකාවලට බව මතක තබා ගන්න.

- පහත දැක්වෙන තර්ක දෙකෙන් එකක් හෝ දෙකම පිළිබඳව ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සමග විවාදයක් සංවිධානය කරන්න. කණ්ඩායම් වශයෙන් පත් කරන ලද සිසුන්ට එම විවාදයේ ප්‍රතිඵල පිළිබඳ කෙටි වාර්තාවක් ලේඛනගත කිරීමට හා සකස් කිරීමට පවරන්න. එම වාර්තා අධ්‍යාපන බලධාරීන්ට ඉදිරිපත් කිරීම සඳහා සුදුසු මට්ටම්වල පවතීද යන්න තීරණය කරන්න.

    - සමකාලීන සන්දර්භයට සමාජ මාධ්‍ය සහ ජාලගත අවස්ථා සහ එම අවස්ථාවල ක්‍රියාකාරීව නියැලීම ඇතුළත් වන අතර, ඒවා උපදෙස් ලබා දීම සහ ඉගෙනුම් කටයුතු සඳහා ප්‍රයෝජනවත් සහ තීරණාත්මක විය හැකි ය. නමුත්, නව සහ ජාලගත ඉගෙනීමේ ක්‍රමවේදවල පැවැත්ම තුළින් අධ්‍යාපනය වෙහෙසකින් තොරව වැඩිදියුණු කිරීමට හැකි යැයි හෝ දත්ත සෙවීමෙන් සහ අලෙවිකරණයෙන් නිදහස් වනු ඇතැයි අනුමාන කිරීමට නොහැකි ය. අධ්‍යාපන ක්‍රියාවලිය පුරා සමාජයේ සක්‍රීය ක්‍රියාකාරීත්වයේ ගැටලු පිළිබඳව දැඩි ආමන්ත්‍රණයක් සහ සහායක් අවශ්‍ය වන බව පෙන්නුම් කරයි.
    - සමාජ මාධ්‍යවල විනෝදාස්වාදය සහ විවේකය යන අංශවලින් ඔබ්බට, සමාජ සම්බන්ධතාවලට සම්බන්ධ සමාජ මාධ්‍ය සහ ඉගෙනුම පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම වර්ධනය වෙමින් පවතී. ප්‍රශ්නය වන්නේ එය කුමන ආකාරයේ ක්‍රියාකාරී නියැලීමක්ද යන්න සහ එහි බලපෑම කුමක්ද යන්නයි (Jenkins, Shresthova, Gamber-Thompson, Kligler-Velenchik & Zimmerman,2016). පුරවැසි සහභාගීත්වය සහ ඉගෙනුම විචාරශීලී ආකාරයකින් වැඩි දියුණු කිරීමට සමාජ මාධ්‍ය ජාලකරණය හේතුවක් වන්නේ ද යන ප්‍රශ්නය උදාහරණයක් වශයෙන් ඉදිරිපත් කළ හැකි ය. [ග්‍රාහක පිරිස් සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ මොඩියුල 5ද බලන්න]

- මෙම ක්‍රියාකාරකම මෙම අංශය පිළිබඳව අභිවර්ධනය වූ පසුබිමක් ඇති ශික්ෂකයන් හා ශිෂ්‍යයන් සඳහා වේ. පහත තර්ක මත පදනම්ව, ඔවුන්ගේ ප්‍රජාවේ, රටෙහි හෝ කලාපයේ අනෙකුත් ශික්ෂකයන් සඳහා මූලික වීඩියෝකරණය පිළිබඳ පොදු හෝ මාර්ගගත දේශන මාලාවක් වැඩි දියුණු කරමින් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න:

    - සමාජ මාධ්‍ය භාවිතය, සම්පාදනය සහ එහි ක්‍රියාකාරීව නියැලීම සම්බන්ධ සමහර විවාද සාවද්‍ය තොරතුරු සහ කුමන්ත්‍රණ න්‍යායන් සහ ලෝකය පිළිබඳ අවබෝධයක් ඇති කිරීම සඳහා විචාරශීලී මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවෙහි අවශ්‍යතාව මතකේන්ද්‍රගත වේ[84]. මේ අනුව, ශික්ෂකයන් විසින් මාර්ගගත ජාලකරණය තුළින් සමාජ මාධ්‍ය සහ සමාජයේ නියැලීම ඉගෙන ගත් ආකාරය මෙන්ම ඔවුන් කරන්නේ කුමක් ද, ඔවුන් නිරාවරණය වන්නේ කුමකට ද සහ ඔවුන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය කුමක් විය හැකි ද යන්න අවබෝධ කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව සැලකිලිමත් වීම වැදගත් වේ. සමාජ මාධ්‍ය යම් ප්‍රමාණයකට සන්නිවේදනය ප්‍රජාතන්ත්‍රීකරණය කර ඇති අතර, එමගින් නිරීක්ෂණ, පෞද්ගලිකත්වය සහ බලය සම්බන්ධ ගැටලු රාශියක් ඉදිරිපත් කිරීමට සමත් වී ඇත.

84. Carr Cuervo & Daros, 2019; Carr" Daros, Cuervo & Thesee, 2020 බලන්න

- චිකාගෝ එල්එක්ස් (2019) අධ්‍යයනයෙන් සොයා ගන්නා ලද "සම්බන්ධිත ඉගෙනුම් අත්දැකීම් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනික මානසිකත්ව හා පැවැත්ම සඳහා වන ආකල්ප වර්ධනය කිරීම, පුනරාවර්තනය කිරීම සඳහා විවෘතභාවය මෙන්ම විචාරශීලී චින්තනය වර්ධනය කිරීම සිදු කළ අතර එය අත්හදා බැලීම්වලදී වැඩි වාසිදායී ලකුණු මට්ටම් පෙන්නුම් කරන්නට විය" යන සාධකය හා සම්බන්ධ තොරතුරු සෙවීමට හා අධ්‍යයනය කිරීමට ශික්ෂකයන්ව යොමු කරන්න. ඉගෙනීම වැඩි දියුණු කිරීම සඳහා රුචිකත්ව, සබඳතා සහ අවස්ථා සම්බන්ධ කිරීම එම අධ්‍යයනය මගින් නිර්දේශ කර ඇත:

    - පාසල්, ප්‍රජා මධ්‍යස්ථාන/එවැනි පසුබිමක් තුළ හෝ මාර්ගගතව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කිරීමට ඉගෙනුම් අවකාශයක් සංවිධානය කරන්න. මෙම සාකච්ඡාව මිත්‍රශීලී ආකාරයකින් හසුරුවමින්, කණ්ඩායම් න්‍යාය පදනම් කර ගනිමින් සිදු කළ යුතු අතර, ඔවුන්ගේ සොයා ගැනීම් ඔවුන් විසින් ම හඳුනා ගන්නේද නැද්ද යන කරුණ හා එම සොයා ගැනීම් ඔවුන්ගේ ම අත්දැකීම් සමග ගැළපේ ද යන්න සහ ඉගෙනීම සඳහා සමාජ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් කළ යුතු යැයි ඔවුන් සිතන දේ පිළිබඳව එම ශිෂ්‍යයන්ගෙන් ප්‍රතිපෝෂණ ලබා ගත යුතුය.

- ඉගෙනුම් අවකාශයන්හි සමාජ මාධ්‍ය භාවිතය ප්‍රවර්ධනය කරනු ලබන 'ට්විටර් සමග අධ්‍යාපනය සහ ඉගෙනුම' වැනි සමාජ මාධ්‍ය මාර්ගෝපදේශ ගවේෂණය කරන්න.

ඔවුන් විසින් කෙදිනක හෝ මෙම මාර්ගෝපදේශ භාවිත කර තිබේද යන්න ශික්ෂකයන් සමග සාකච්ඡා කරන්න. ඔවුන්ගේ අත්දැකීම් මොනවා ද? එහි වාසි සහ අවාසි මොනවා ද? අවශ්‍යතාවයක් ඇති වන විට දී අධ්‍යාපන බලධාරීන්ගෙන් හෝ සමාජ මාධ්‍ය සමාගම්වලින් ඔවුන්ට අවශ්‍ය වන්නේ කුමන ආකාරයේ සහයෝගයක් ද? තම මුදල් උපයන ආකාරය පිළිබඳව ඔවුන්ගේ සේවාවන් සහ උපදෙස් ලබා දීමට සමාගම්වලට ඇති අභිලාෂයන් මොනවා ද?

- ඔබේ පන්තිකාමරය/පාසල/ප්‍රජාව කෙතරම් ජාලගත වී ඇත්ද යන්න දැක්වෙන පෝස්ටරයක් නිර්මාණය කරන්න. පහත සබැඳියේ ඇති "මීඩියා ස්මාර්ට්" ලේඛනය ඔබට මෙම ක්‍රියාකාරකම සකස් කිරීමට සහ ක්‍රියාවට නැංවීමට උපකාරයක් වශයෙන් ප්‍රයෝජනවත් විය හැකි ය. (https://mediasmarts.ca/sites/default/files/publicationreport/summary/ycwwiii_connected_to_learn.pdf)
- පෝස්ටරය නිර්මාණය කිරීම සඳහා යම් උපදේශනයක් සහ අධ්‍යයනයක් අවශ්‍ය වේ. ඔබේ නියැදියේ සාමාජිකයන් :ඉගෙනුම් අවකාශය/ප්‍රජාව) සමීක්ෂණය කර පහත සඳහන් සාධකයන් තීරණය කිරීමට ක්‍රමවේදයක් සකස් කරන්න:

    - සහභාගිවන්නන් කවුරුන් ද සහ ඔවුන්ගේ අනන්‍යතා මොනවා ද? :එනම් වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වෙනත් අදාළ අනන්‍යතා සලකුණු)
    - සන්දර්භය කුමක් ද? (එනම් කුමන ස්ථානයේ පිහිටි කුමන ආකාරයේ පාසලක් ද, කුමන කොන්දේසි, කුමන භාෂාවක් භාවිත කරන්නේ ද යනාදිය)
    - කුමන ආකාරයේ සමාජ මාධ්‍ය භාවිත කරන්නේ ද, කොපමණ ප්‍රමාණයක්, කුමන අවස්ථාවේ දී, කුමන හේතූන් මත එම සමාජ මාධ්‍ය භාවිත කරනු ලබන්නේ ද?
    - ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ශික්ෂකකයන්ගෙන් සහ/හෝ දෙමාපියන්ගෙන් කුමන ආකාරයේ සහයක් සහ මගපෙන්වීමක් ලැබෙන්නේ ද?
    - සමාජ මාධ්‍ය වෙත පිවිසීමේ අභියෝග මොනවා ද?
    - සමාජ මාධ්‍ය සපයනු ලබන්නන් භාවිත කිරීමේ අවස්ථා මොනවා ද?
    - සමාජ මාධ්‍ය භාවිතය හරහා සංවර්ධනය වූ ජාල මොනවා ද? මෙම ජාල ඉගෙනීම, ක්‍රියාකාරීව එහි නියැලීම, සමාජ සහයෝගීතාව, සමාජගත කිරීම යනාදිය සඳහා ප්‍රයෝජනවත් වන්නේ ද? යනාදිය විස්තර කරන්න.

- සමාජ මාධ්‍ය තුළින් ජාලගතකරණය'ස්මාර්ට්' ඉගෙනීම් ක්‍රමවේදයකට මග පාදනු ලබන්නේ ද? එසේ මග පාදන්නේ නම් ඒ කෙසේ ද?
- සමාජ මාධ්‍ය තුළින් ඉගෙනීමට සහ ජාලකරණයට අධ්‍යාපනය බලපාන්නේ කෙසේ ද?

- මෙය කුඩා අධ්‍යයන ව්‍යාපෘතියක් විය හැකි ය. පෝස්ටරය වැඩි දියුණු කිරීමට අමතරව, අවධානය යොමු කළ යුතු ප්‍රශ්න වැඩි ප්‍රමාණයක් නිර්මාණය කිරීම සඳහා සහ විශ්ලේෂණය සංවිධානය කිරීම සඳහා යම් යම් ප්‍රත්‍යවේක්ෂණ අවශ්‍ය වනු ඇත. මෙම අභ්‍යාසයේ වැදගත් අංගයක් වනුයේ සමාජ මාධ්‍ය භාවිතය, එහි නියැලීම සහ සම්පාදනය සහ ඉගෙනීම අතර සම්බන්ධය ඇතුළු සමාජ මාධ්‍ය ජාලකරණ අර්ථයේ ගැටලු සහගත ස්ථාන මතු කිරීම සහ ප්‍රශ්න කිරීමයි.
- පරිරක්ෂණ විකල්ප කෙරෙහි අවධානය යොමු කරමින් ශිෂ්‍යයන් සඳහා සමාජ මාධ්‍ය සංදේශ පුවරුවක් නිර්මාණය කරන්න. සංදේශ සහ විවාද වෙත අවධානය යොමු කරවමින් සිසුන්ගේ සක්‍රීය සහභාගීත්වය නිරන්තරයෙන් ම පවත්වා ගැනීමට උත්සාහ කරන්න. භාවිතය, ගෞරවය ආරක්ෂා කිරීම, රහස්‍යභාවය, පෞද්ගලිකත්වය, මධ්‍යස්ථතාව, දත්ත සංරක්ෂණය කිරීම සහ විවාදයට සහභාගිවන්නන්ගේ ගුණාත්මකභාවය සහ උනන්දුව තීරණය කිරීමට හැකිවන පරිදි මාර්ගෝපදේශ වැඩි දියුණු කරන්න. අධ්‍යාපනික, සමාජීය, ආර්ථික, සෞඛ්‍ය සහ ප්‍රජා මට්ටම්වලදී ශිෂ්‍යයන් හට කොවිඩ්-19 බලපෑම කෙසේද යන්න විමසා බැලීම නිශ්චිත මාතෘකාවක් තෝරා ගැනීමට උදාහරණයක් වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.

සතියක් තුළ සමාජ මාධ්‍යවල කොපමණ කාලයක්, කවුරුන් සමග සහ කුමන අරමුණක් සඳහා ගත කරන්නේ ද යන්න ලේඛනගත කරන්න. මාර්ගගත නියැලීම පිළිබඳව වැදගත් යැයි සොයා ගන්නා ලද කරුණු ශිෂ්‍යයන් විසින් සාකච්ඡා කර තිබේ ද? ඔවුන් හොඳින් හඳුනන පුද්ගලයන් සමග හෝ ඔවුන්ගේ ආසන්න කවයෙන් පිටත පුද්ගලයන් සමග සම්බන්ධ වන්නේ ද? ඔවුන් අන් අය සමග සංවාදයේ යෙදෙන්නේ ද? එසේ සංවාදයේ යෙදෙන්නේ කුමන විෂයයන් පිළිබඳවද සහ එසේ සංවාදයේ යෙදෙන්නේ කෙසේ ද? ඔවුන් තමන් හා සමාන අදහස් ඇති පුද්ගලයන් සමග පමණක් සම්බන්ධ වීමට කැමති වන්නේ ද නැත්නම් විවිධ පරාසයන් සහිත පුද්ගලයන් සමග සම්බන්ධ වීමට කැමති වන්නේ ද? ඔවුන් නිරාවරණය වන විවිධ පර්යාලෝක හේතුවෙන් ඔවුන්ගේ අදහස් වෙනස් වන බව ඔවුන්ට හැඟෙන්නේ ද? වෙනත් ස්ථානයකදී ඔවුන් වෙත ලැබුණු අන්තර්ගත සහ වෙළඳ දැන්වීම් කෙරෙහි යම් බලපෑමක් ඔවුන් විසින් නිරීක්ෂණය කරනු ලැබුවේ ද?

ඇගයීම සහ නිර්දේශ

- සමාජ මාධ්‍ය තුළ නියැලීමේ බලපෑම සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ව ස්වයං-ඇගයීමක නියැලීමට සලස්වන්න (එසේ කිරීමට ප්‍රශ්නාවලියක් සකස් කිරීමට හෝ මාතෘකාව පිළිබඳ කෙටි ආඛ්‍යානයක් ලිවීමට සලස්වන්න)
- ශිෂ්‍යයන් සමාජ මාධ්‍යවල කොපමණ කාලයක් කුමන පැතිකඩ කෙරෙහි අවධානය යොමු කරමින් කාලය ගත කරන්නේ ද යන්න මැන බැලීමට ප්‍රමාණාත්මක මෙවලමක් ගොඩ නගන්න
- සහයෝගීතාව සහ එකමුතුභාවය අවධාරණය කරමින් ජාලකරණය ප්‍රධාන අංගයක් වන පරිදි ව්‍යාපෘති ඉදිරිපත් කරන්න
- ආසන්නතම ප්‍රජාවෙන් පිටත ජාලකරණය සිදු කිරීමට දිරිමත් කරන්න (නිසි පෞද්ගලිකත්වය සහ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක බව සහතික කිරීමට සුපරීක්ෂාකාරී වන්න). 8වන මොඩියුලයේ "පෞද්ගලිකත්වය" පිළිබඳ වැඩි විස්තර බලන්න
- විවිධ සමාජ මාධ්‍ය ආයතන කැමති සහ අකමැති දේ, ඔවුන් වෙනස් කිරීමට සිතන දේ, ඒවා භාවිත කිරීමේ අවස්ථාවන් මොනවාද යනාදිය පිළිබඳ විචාරශීලී විශ්ලේෂණයක් සිදු කිරීමට ශිෂ්‍යයන්ට අවකාශය සලස්වන්න.

4වන ඒකකය : මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි පියසටහන්: ඔබගේ මාර්ගගත අභිමුඛයන් පාලනය කිරීම පිළිබඳ තවදුරටත්

කාලසීමාව: පැය 2යි

ප්‍රධාන මාතෘකා

- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන යනු කුමක් ද?
- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන ඩිජිටල් පියසටහනට සම්බන්ධ වන්නේ කෙසේ ද?
- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් ප්‍රවර්ධනය කළ යුත්තේ ඇයි?

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහනක් යනු කුමක්දැයි විස්තර කිරීම සහ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් මාර්ගගතව තැබීමේ අදාළත්වය අවබෝධ කර ගැනීම
- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් මාර්ගගතව නිර්මාණය කිරීම සහ අධීක්ෂණය කිරීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක් දැයි ලැයිස්තුගත කර පැහැදිලි කිරීම.

මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව සිදුවන ආකාරය නිරූපණය කිරීම

ඔබේ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන්වල (MIL පියසටහන්වල) වැදගත්කම අවබෝධ කර ගැනීමට, ඩිජිටල් පියසටහන් මොනවාද යන්න හැඳින්වීම උපකාරී වේ. ඩිජිටල් පියසටහන් යනු පරිශීලකයන් විසින් ඩිජිටල් උපාංගවල ඉතිරි කර ඇති දත්ත වේ. ඒවා ක්‍රියාකාරී හෝ නිෂ්ක්‍රීය ආකාරයෙන් නිර්මාණය කළ හැකි අතර සාමාන්‍යයෙන් අන්තර්ජාල සේවා සහ සමාගම් විසින් විවිධ සහ බොහෝ විට වාණිජමය භාවිත සඳහා එම පියසටහන් ක්‍රමානුකූලව එකතු කරනු ලබන අතර, එමගින් පරිශීලකයන්ගේ සංචාලන අත්දැකීම්, මාර්ගගත චරිත සටහන්, සෙවුම් ප්‍රතිඵල, පෞද්ගලිකත්වයට සහ ආරක්ෂාවට පවා බලපෑම් ඇති කරයි. එබැවින්, අන්තර්ජාල සේවා සහ සමාගම් විසින් එහි පරිශීලකයන්ගෙන් රැස් කර ගනු ලබන තොරතුරු මොනවා ද, ධනාත්මක පුද්ගලික සහ සමාජීය වෙනස්කම් සක්‍රීය කළ හැකි අපේක්ෂිත පියසටහන් මොනවා ද, වළක්වා ගත යුතු අනවශ්‍ය ඩිජිටල් පියසටහන් සහ එය කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් වීමට අන්තර්ජාල පරිශීලකයන් මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා නිපුණතාවලින් සන්නද්ධ විය යුතු ය. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවෙන් සන්නද්ධ පරිශීලකයන් විසින් ඔවුන් විචාරශීලී අයුරින් මාර්ගගතව සම්බන්ධ වන ආකාරය පැහැදිලි කර අන් අය සමග එම දැනුම බෙදා ගන්නා විට එය "මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන්" වශයෙන් හැඳින්වීමට හැකි වේ.

මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් වර්ග මොනවාද?

- ඔබ ඔබේ සමාජ මාධ්‍ය ජාලවල ඉදිරිපත් කරන මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් හා සම්බන්ධ අන්තර්ගතය
- ඔබේ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා ඔබ විසින් භාවිත කරනු ලබන මාර්ගගත මෙවලම්
- ඔබේ/ඔබේ සංවිධානයේ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් ක්‍රියාකාරකම් ආවරණය

කරනු ලබන මාර්ගගත පුවත් ලිපි හෝ වීඩියෝ පට

- ඔබේ ඉලක්ක වෙනුවෙන් පෙනී සිටීමට ඔබ විසින් භාවිත කරනු ලබන විවිධ ආකාරයේ මාර්ගගත මාධ්‍ය
- ඔබ හෝ ඔබේ සංවිධානයේ ක්‍රියාකාරකම් පිළිබඳව ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන අපේක්ෂිත තොරතුරු.

මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් නිර්මාණය කිරීම සඳහා භාවිත වන ක්‍රමවේද මොනවා ද?

- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් හා සම්බන්ධ අන්තර්ගතය සෙවීම සහ බැලීම/ඇසීම
- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවය හා සම්බන්ධ අන්තර්ගතය අන් අය සමග බෙදා ගැනීම

ඔබේ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් වැඩි දියුණු කිරීමට මෙම පළ කිරීම් (posts) භාවිත කරන්න. සමාජ වේදිකාවල ඇල්ගොරිදම ඔබ පෙර අන්තර්ක්‍රියා කර ඇති ක්‍රියාකරකම් සඳහා අදාළ කරුණුවලට සමාන අන්තර්ගතයක් ලබා දීමට එම දත්ත භාවිත කරන අතර ඔබගේ රුචිකත්වයට සමාන අදහස් දරන සංවිධාන සහ පුද්ගලයන් පිළිබඳව ද ඔබට යෝජනා කරයි. ඔබට අවශ්‍ය අන්තර්ගත වැඩි වශයෙන් ලබා ගැනීමට මෙම ඇල්ගොරිදම පුහුණු කරන ආකාරය සොයා බලන්න. එසේ වුවද, පද්ධතිය විසින් නිර්දේශ කරනු ලබන කරුණු පිළිගැනීමට වඩා ක්‍රියාශීලීව ඔබට අවශ්‍ය තොරතුරු ඔබ විසින්ම ගවේෂණය කිරීමට යොමු වන්න.

මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් ඉතිරි කර තබා යෑම පහත සඳහන් තීරණ වෙත යොමු වීමෙන් පසු සිදු කරන්න:

- සන්නිවේදන පරිසර විද්‍යාවත් සමග අවබෝධිත නියැලීමක් සඳහා සමාජ මාධ්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම
- පුරවැසියන්ට තම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා සහ සමාජයේ ක්‍රියාකාරී සහභාගිවන්නන් වශයෙන් ක්‍රියා කිරීමේ නිදහස සඳහා සමාජ මාධ්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම
- ඔවුන්ගේ අභියෝග පිළිබඳ දැනුම සහ එම අභියෝගයන් සඳහා භාවිත කළ හැකි හෝ ක්‍රියාත්මක කළ හැකි විසඳුම් පිළිබඳ විචාරශීලී දැනුම බෙදා ගැනීමට සමාජ මාධ්‍ය භාවිත කිරීම
- සාවද්‍ය තොරතුරු හෙළි කිරීමට සහ වාර්තා කිරීමට සමාජ මාධ්‍ය භාවිත කිරීම. ඔබේ සම වයසේ මිතුරන්ට ද එසේ කිරීමට උපකාරී කිරීම සඳහා කරුණු පරීක්ෂා කිරීමේ වෙබ් අඩවි හුවමාරු කර ගැනීම. මේ ආකාරයෙන් ඔබ විශ්වාසදායක මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියා කරන අතර අන් අයට සොයා ගැනීම සඳහා ද මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් ඉතිරි කරනු ඇත.

- ඇතැම් සමාජ ගැටලුවලට අදාළ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා සම්බන්ධ සාකච්ඡා මාර්ගගතව ආරම්භ කරන්න. උදාහරණයක් වශයෙන්, මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව මගින් තොරතුරු සහ මාර්ගගත අන්තර්ගතයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඒකාකෘති හඳුනා ගැනීමට සහ ප්‍රති ආඛ්‍යාන අන්තර්ගත වැඩි දියුණු කිරීමට මිනිසුන්ව බලාත්මක කරවනු ලබන්නේ කෙසේ ද?

ඉඟි:

- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ පුවත් ඔබේ ප්‍රොෆයිලයෙහි හෝ නිශ්චිත කණ්ඩායමක පළ කිරීම
- සේවා සපයන්නන්ගේ ඇල්ගොරිදම ඔබට ඉදිරිපත් කරන තොරතුරු අනුව ඔබේ අන්තර්ගතය වඩා හොඳින් අවබෝධ කර ගැනීමට මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව තුළින් ඔබට හැකි වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ඔබගේ දෘෂ්ටිකෝණය අන් මිනිසුන්ට ප්‍රකාශ කිරීම.
- ඔවුන්ගේ දෘෂ්ටිකෝණ ඔබ සමග පැවසීමට මිනිසුන්ට ආරාධනා කිරීම
- පොදු සාකච්ඡාවලට උනන්දුවක් නොදක්වන පිරිස් නොසලකා හරිමින්, ඔබ අන් අයගේ අදහස් සමග එකඟ වුවත් නැතත් ඔවුන්ගේ අදහස්වලට පිළිතුරු සැපයීමට කටයුතු කිරීම
- සාකච්ඡාව ඔබේ දෘෂ්ටිකෝණයට බලපානු ලැබුයේ කෙසේ ද යන්න ඔවුන් සමග පැවසීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකරකම්

ශාරාංශයක් වශයෙන්: පෙර සාකච්ඡා කළ පරිදි මෙම විෂය මාලාවේ :1වන කොටස) තුළින් විවිධ අධ්‍යාපනික ප්‍රවේශ වෙත අවතීරණය විය හැකි ය. කරුණාකර 1වන කොටසෙන් ඉදිරිපත් කර තිබෙන ලැයිස්තුව සමාලෝචනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා භාවිත කළ යුතු ප්‍රවේශය තීරණය කරන්න.

- වත්මන් මාතෘකාවක් මත මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා කෙටි වීඩියෝවක් නිර්මාණය කර අන් අයට එය ඉදිරිපත් කර ඒ පිළිබඳව ඔවුන් සිතන්නේ කුමක්දැයි විමසන්න.
- සමාජ මාධ්‍ය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඉගෙනුම් මුලපිරීමක් සඳහා https://en.unesco.org/milclicks යන "UNESCO MIL CLICKS" වෙත පිවිසෙන්න. අදාළ සම්පත් සොයා ගැනීමට "මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන්" සොයා බලන්න. ඔබ උනන්දුවක් දක්වන වෙනත් තේමා පිළිබඳව සොයන්න. "MILCLICKS" වශයෙන් ටැග් (tag) කරමින් උපදේශන සහ ඉගෙනුම් අත්දැකීම් තුළ මෙම සම්පත් භාවිත කර ඔබගේ අත්දැකීම් මාර්ගගතව බෙදා ගැනීමට කටයුතු කරන්න.
- ඔබේ ඉගෙනුම් අවකාශය, පුස්තකාලය හෝ ප්‍රජාව තුළ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා සමාජයක් පිහිටුවීමට කටයුතු කරන්න. සංවර්ධන අරමුණු ප්‍රකාශ කිරීම, අපේක්ෂිත ප්‍රතිඵල, යෙදවුම්, ප්‍රතිදාන, ක්‍රියාකාරකම්/උපාය මාර්ග, තිරසර උපාය මාර්ග, අවශ්‍ය සම්පත් යනාදිය ඇතුළත් මූලික ව්‍යාපෘති ලේඛනයක් සකස් කරන්න. එම කටයුතු සඳහා අදාළ වන්නේ නම් අවශ්‍ය අවසරයන් ලබා ගැනීමට වග බලා ගන්න. සමාජයේ සාමාජිකයන් "MIL ක්ලිකර්ස්" වශයෙන් ක්‍රියා කිරීමට අනුබල දී ඔවුන්ව ඒ සඳහා පොළඹවන්න -https://en.unesco.org/feedback/commitment-be-mil-clicker. එමෙන්ම ඔවුන්ගේ ම පවුල/සමාජ කණ්ඩායම/ප්‍රජාව තුළ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පියසටහන් "තානාපති" බවට පත්වීමට ඔබ සමාජයේ සාමාජිකයන් දිරිමත් කරන්න.

මුහුණු පොත: යෙදුම් සුවහන පැතිකඩ (APP) සහ වෙබ් අඩවිය යටතේ තිබෙන කාලරේඛා සිටුවම වෙත පිවිස පරීක්ෂා කරන්න:

- ඔබ ෆේස්බුක් භාවිතයෙන් ලොග් වූයේ කුමන වෙබ් අඩවිවලට ද?
- ඔබගේ දත්තවල සක්‍රිය ප්‍රවේශය ඇති යෙදුම් සුවහන පැතිකඩ (APP) මොනවා ද?
- ඔවුන් විසින් භාවිත කරනු ලබන දත්ත මොනවා ද?
- ඔවුන්ට ප්‍රවේශ විය හැකි තොරතුරු වර්ග සංස්කරණය කරන්න
- කල් ඉකුත් වන යෙදුම් සුවහන පැතිකඩවල (APP) හෝ ඔබ විසින් ඉවත් කරන ලද යෙදුම් සුවහන පැතිකඩවල (APP) තිබෙන ඔබේ දත්තවලට සිදුවන්නේ කුමක් ද?
- ඔබ ගැන මුහුණු පොතින් ලබා ගත් ඔවුන් සතුව තිබෙන තොරතුරු ඉවත් කරන ලෙසට ඔබ ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නේ කෙසේ ද?

ඇගයීම සහ නිර්දේශ

- ලිඛිත විභාග
- දේශන, සිද්ධි අධ්‍යයන, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්/ නැරඹුම් සඳහා රචනා, අතුරු කියවීම් හා ප්‍රතිචාර පත්‍රිකා
- ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා කණ්ඩායම් සහභාගීත්වය
- තොරතුරු-අධ්‍යාපනය-සන්නිවේදන මෙවලම් භාවිතය :උදා. පෝස්ටර්, අත් පත්‍රිකා, තොරතුරු චිත්‍රක, සමාජ මාධ්‍ය කාඩ්පත්, විලොග්)
- පර්යේෂණ පත්‍රිකාව
- ගවේෂණාත්මක කථාව/වාර්තාව.

මෙම මොඩියුලය සඳහා සම්පත්

Carr, Paul R, Cuervo, Sandra & Daros, Michelli. (2019). Citizen engagement in the contemporary era of fake news: Hegemonic distraction or control of the social media context? Postdigital Science and Education, 1-22. https://link.springer.comarticle/10.1007/s42438-019-00052-z#citeas

Carr, Paul R, Daros, Michelli, Cuervo, Sandra, & Thésée, Gina. (2020). Social media and the quest for democracy: Faking the re-awakening?. In Trifonis, Peter (ed.), Handbook of Theory and Research in Cultural Studies and Education (1-24). New York: Springer. https://link.springer.com/referenceworkentry/10.1007%2F978-3-030-01426-1_31-1#citeas

Chen, Joyce Chao-chen (2013) Opportunities and challenges of MOOCs: perspectives from Asia. Paper presented at: IFLA WLIC 2013 - Singapore - Future Libraries: Infinite Possibilities in Session 98 - Knowledge Management with Academic and Research Libraries.

ChicagoLX. (2019). Connected Learning Guide: A Field-Tested Resource for Practitioners. https://resources.chicagolx.org/clguide/clx-connected-learning-guide-compact-4-29-19.pdf

Dalberg. (2013). Impact of the Internet in Africa: establishing conditions for success and catalysing inclusive growth in Ghana, Kenya, Nigeria and Senegal. Accessed online 10/22/2013 at http://www.impactoftheinternet.com/pdf/Dalberg_Impact_of_Internet_Africa_Full_Report_April2013_vENG_Final

Jenkins, H., Shresthova, S., Gamber-Thompson, L., Kligler-Velenchik, N., & Zimmerman, A.(Eds.). (2016). By any means necessary: The new youth activism. New York: New York University Press.

Johnson, M., Riel, R. & Froese-Germain, B. (2016). Connected to learn: Teachers' experiences with networked technologies in the classroom. Ottawa: MediaSmarts/Canadian Teachers' Federation. https://mediasmarts.ca/sites/default/files/publication-report/full/ycwwiii_connected_to_learn.pdf

Mira, N. (2017). From Connected Learning to Connected Teaching: A Necessary Step Forward. Connected Learning Alliance (website). https://clalliance.org/blog/connected-learning connected-teaching-necessary-step-forward/

(PDF) Internet of things for Africa: Challenges and opportunities https://www.researchgate.net/publication/287997186_Internet_of_Things_for_Africa_Challenges_and_Opportunities

Seidler, N. (2013). An open Internet in Africa: challenges shifting beyond. Accessed online 10/25/2013 at http://www.internetsociety.org/blog/2013/03/open-internet-africa-challenges-shifting-beyond-access

West, C. (2019). 12 Ways to use social media for education. sproutsocial.com https://sproutsocial.com/insights/social-media-for-education/

වෙබ් අඩවි

මාධ්‍ය සාක්ෂරතා සංගමය : කැනඩාව) - Association for Media Literarcy (Canada)

මාධ්‍ය සාක්ෂරතා සංගමය :කැනඩාව) යනු ලාභ නොලබන, ශික්ෂකයන්, පුස්තකාලයාධිපතිවරුන්, උපදේශකයින්, දෙමාපියන්, සංස්කෘතික සේවකයන් සහ මාධ්‍ය වෘත්තිකයන්ගෙන් සමන්විත පුණ්‍ය සංගමයක් වන අතර එමගින් මාධ්‍යවල ස්වභාවය, ඒවායේ ශිල්පීය ක්‍රම සහ ඒවායේ බලපෑම පිළිබඳව දැනුම්වත් කිරීමට සහ විචාරශීලි අවබෝධයක් වර්ධනය කිරීමට මිනිසුන්ට උපකාරී වේ. 1989 දී සංවර්ධනය

කරන ලද මාධ්‍ය සාක්ෂරතාව සඳහා වන ප්‍රධාන සංකල්ප, ලොව පුරා බොහෝ සංවිධාන සඳහා පදනම් වන මූලික මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා සංකල්ප වේ. https://aml.ca/

මාධ්‍ය සාක්ෂරතා මධ්‍යස්ථානය :ගෝලීය) - Center for Media Literacy (Global)

මාධ්‍ය සාක්ෂරතා මධ්‍යස්ථානයෙහි ඇතුළත් මූලික රාමුව අනුගමනය කිරීම තුළින් පොදු වචන මාලාවක් නිර්මාණය කිරීම සහ පොදු අවබෝධයක් ජනනය කිරීම සිදු කරනු ලබයි. එමෙන්ම විවිධ අධ්‍යයන විෂයයන් හරහා, ශ්‍රේණි මට්ටම් හරහා, පාසල් සහ දිස්ත්‍රික්ක හරහා, ප්‍රාන්ත සහ ජාතීන් හරහා ස්ථාවර උපදේශන ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කරනු ලබයි. https://www.medialit.org/global

සම්බන්ධිත ඉගෙනුම් සන්ධානය :ඇමරිකා එක්සත් ජනපදය) - Connected Learning Alliance (USA)

සම්බන්ධිත ඉගෙනුම් සන්ධානය සියලු තරුණ තරුණියන් සඳහා සාධාරණත්වය, ප්‍රවේශය සහ අවස්ථා සඳහා නව තාක්ෂණය බලමුළු ගන්වන ශික්ෂකයන්, විශේෂඥයන් සහ තරුණ සේවා සංවිධාන ජාලයක ව්‍යාප්තියට සහ බලපෑමට සහාය දක්වයි. https://clalliance.org/

මීඩියා ස්මාර්ට්ස් :කැනඩාව) - Media Smarts (Canada)

මීඩියා ස්මාර්ට්ස් යනු ඩිජිටල් සහ මාධ්‍ය සාක්ෂරතාව සඳහා ලාභ නොලබන කැනේඩියානු පුණ්‍යායතනයකි. එහි දැක්ම වන්නේ ළමයින්ට සහ තරුණයන්ට ක්‍රියාකාරී සහ අවබෝධිත ඩිජිටල් පුරවැසියන් ලෙස මාධ්‍ය සමග සම්බන්ධ වීමට විචාරශීලී චින්තන කුසලතා ඇති බවයි. https://mediasmarts.ca/

වගකීම් සහිත මාධ්‍යකරණයක් සඳහා උතුරු බටහිර සන්ධානය :ඇමරිකා එක්සත් ජනපදය) - North West Allaince for Responsible Media (USA)

මෙමගින් අප සමාජයට ප්‍රවෘත්ති සහ විනෝදාස්වාද මාධ්‍යවල බලපෑම නිරීක්ෂණය කිරීමටත්, මෙම බලපෑම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමටත්, සැමට සමෘද්ධිමත් සංස්කෘතික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වගකීමෙන් ක්‍රියා කිරීමට, කර්මාන්තයට බලපෑම් කිරීමට මාධ්‍ය වෘත්තිකයන් සමග කටයුතු කිරීමටත් කැපවී සිටී. https://nwaresponsiblemedia.org/

10/22/2013 දින http://www.impactoftheinternet.com/pdf/Dalberg_Impact_of_Internet_Africa_Full_Report_April2013_vENG_Final හිදී මාර්ගගතව ප්‍රවේශ විය.

10වන මොඩියුලය:

වෙළෙඳ ප්‍රචාරණය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව



පසුබිම සහ තාර්කිකය

වෙළෙඳ ප්‍රචාරණය, කවර ආකාරයේ හෝ වේවා, මෙම පෘථිවි ගෝලයේ සෑම අස්සක් මුල්ලක් කරා ම ළඟා වේ. තොරතුරු, ඇදහිලි හා සාරධර්ම ප්‍රචලිත කිරීම සඳහා සිය නිෂ්පාදන, සේවාවන් සහ අදහස් ප්‍රවර්ධනය කිරීමෙහි ලා සමාගම්, සංවිධාන, පුරවැසියන් සහ රජයන් විසින් වෙළෙඳ ප්‍රචාරණය යොදා ගනු ලැබේ. එය සෑම තැනකම පාහේ විවිධ ස්වරූපයෙන් දක්නට ලැබේ. වෙළෙඳ ප්‍රචාරණය පුවත්පත්, රූපවාහිනී සහ ගුවන්විදුලි ආදී සාම්ප්‍රදායික මාධ්‍ය තුළ මෙන් ම සුහුරු දුරකතන, ජංගම යෙදුවුම් හා උපාංග ඔස්සේ සමාජ ජාල, බ්ලොග් හා වෙබ් අඩවි වැනි නව මාධ්‍යයන් තුළ ද චිත්‍රපට විකාශයන් අතරතුර නිශ්පාදන පෙන්වීමට සැලැස්වීම මගින් ද වෙළෙඳ ප්‍රචාරණය සිදු කෙරේ. මාර්ගගත පරිශීලකයන් විසින් ඉතිරි කොට ගොස් ඇති පුද්ගලික දත්ත හා ඩිජිටල් පියසටහන් සහ විකුණුම් ලක්ෂ්‍යයන් විශාල ලෙස ගබඩා කිරීමේ හැකියාවන් හා සබැඳි කෘත්‍රිම බුද්ධිය (AI), පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා, අභිරුචීන්, කැමති අකැමති දෑ පිළිබඳව පුරෝකථනය කිරීම සහ හැසිරවීම සඳහා පාරිභෝගිකයන්ගේ හැසිරීම විශ්ලේෂණය කිරීම පිණිස යොදා ගනු ලැබේ. දත්ත කැණීම සහ පුද්ගලාරෝපිත වෙළෙඳ දැන්වීම් ජනනය කිරීම සිදු කරනු ලබන්නේ ඇල්ගොරිදම භාවිතයෙනි. කෘත්‍රිම බුද්ධිය මගින් වෙළෙඳ ප්‍රචාරකයන් හට ඇතැම් විට ඉතා සියුම් ලෙස; ශානරය, වයස, සමාජ ස්ථරය, ලිංගික අනුස්ථාපනය සහ පුද්ගලික රුචිකත්වයන් ආදිය මත පදනම් ව විශේෂිතව සකසන ලද වෙළෙඳ දැන්වීම් හරහා පාරිභෝගිකයා වෙත ළඟා වෙමින්, තනි පුද්ගලයන් ක්ෂුද්‍ර-ඉලක්කගත කිරීමේ හැකියාව ලැබේ. ඩිජිටල් සමාගම් හා යෙදවුම් විසින් නොමිලේ පිරිනමනු ලබන සේවාවන් භුක්ති විඳීමට ජනතාව දැනුවත්ව හෝ නොදැනුවත්ව සිය දත්ත බාර දීමෙන් හෝ ගනුදෙනු කිරීමෙන් මෙම යථාර්ථය විශාලනය කොට දැක්වේ.

ආකාරයේ ඉල්ලුම හෝ හැසිරීම් රටාවේ වෙනස්කම් ඇති කිරීම සඳහා ඔවුනට සිය වෙළෙඳපල හෝ ඉලක්කගත ජනයා වෙත ළඟා වීම කෙරේ වෙළෙඳ ප්‍රචාරණය ඉවහල් වේ. වෙළෙඳ ප්‍රචාරණ ක්‍රියාවලිය බොහෝ දුරතාර්කික චින්තනයට වඩා පෙළඹවීම සහ අවිඥානික ආශාවන් මත රඳා පවතියි. කෙසේ වෙතත්, වෙළෙඳ ප්‍රචාරණය හා කටයුතු කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ජනතාවගේ ගැනීමේ නිපුණතා උද්දීපනය කිරීමෙහි ලා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) ඉවහල් වේ.

පොදුවේ ගත් කල, වෙළෙඳ ප්‍රචාරණ දෙවර්ගයකි: එනම්, වාණිජමය වෙළෙඳ ප්‍රචාරණය; සහ ඇතැම් විට සමාජයීය අලෙවිකරණය යනුවෙන් හඳුන්වනු ලබන මහජන සේවා නිවේදනයි. සාමාන්‍යයෙන්, වාණිජමය වෙළෙඳ ප්‍රචාරණය යන්නට විකුණුම් උත්පාදනය කිරීමේ අරමුණින් කිසියම් පුද්ගලයෙකු, නිශ්පාදනයක්, සේවාවක් හෝ සමාගමක් ලය: වෙළඳ ප්‍රචාරණය හා මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව

දැන යන්නට මහ ජනතාව වෙත ප්‍රතිලාභ සලසන සන්දේශ හා සේවාවන් ප්‍රවර්ධනය කිරීම ඇතුළත් වේ :උදා: සෞඛ්‍යය හා ආරක්ෂාව හා සම්බන්ධ පණිවිඩ, සාක්ෂරතා ප්‍රවර්ධනය ආදිය). මෙම වෙළෙඳ ප්‍රචාරණ දෙවර්ගයම මගින් සාම්ප්‍රදායික හා ඩිජිටල් සන්නිවේදන සමාගම් වෙත මුඛ්‍ය ආදායම් මූලාශ්‍රයක් සැලසේ. වෙළෙඳ ප්‍රචාරණය තුළින් අන්තර්ගත සපයන්නන් වෙත ලැබෙන ආදායම මෙහෙයුම් පිරිවැය

ගෙවීම් සහ අන්තර්ගත සංවර්ධනය සඳහා යොදා ගැනේ :උදා; රූපවාහිනී වැඩසටහන්, වෙබ් අඩවි කරුණු, වැඩි දියුණු කරන ලද ඩිජිටල් සේවාවන්, සඟරා ලිපි, ගුවන්විදුලි වැඩසටහන් ආදිය). මෙම ආදායම හැරුණු කොට තිරසර සංවර්ධනය, සංවාද, විවිධත්වය සහ අප විසින් භුක්ති විඳිනු ලබන ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස වෙනුවෙන් පක්ෂව පෙනී සිටින කේන්ද්‍රීය යාන්ත්‍රණයක කොටසක් වන පුද්ගලික මාධ්‍ය හා ඩිජිටල් සමාගම් බොහොමයකට පැවැත්මක් නොමැත. ඒ අතරම, අපගේ තාර්කිකත්වය සහ සවිඥානික හා තාර්කික තීරණ ගැනීමේ හැකියාව හීන කරමින් ගැටලුකාරී වටිනාකම් ලබා දීම තුළින් පරිභෝජනවාදය උත්තේජනය කිරීමෙහි ලා වෙළෙඳ ප්‍රචාරණය ඉවහල් වේ. මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව (MIL) යන විෂය මාලාව තුළ අඩංගු ඒකක කිහිපයකම, මාධ්‍ය ආයතන සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල විනිවිදභාවය පිළිබඳව ප්‍රශ්න කිරීමට හැකි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් යුතු පුරවැසියන් පිරිසක් සිටීමේ වැදගත්කම ඉස්මතු කොට දක්වයි. මාධ්‍යය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව මගින් ශක්‍යතාවයෙන් පිරි අන්තර්ගත සම්පාදනය කිරීමේ සහ සැපයීමේ අවශ්‍යතාව, වෙසෙසින්ම වෙළෙඳ ප්‍රචාරකගේ අභිරුචිය හෝ එවැනි තොරතුරු සඳහා ග්‍රාහක මුදල් ගෙවීම, ග්‍රහක පිරිස් හි ප්‍රමාණය කුඩා වීම හෝ දිළිඳු බව වැනි සාධක මගින් යටපත් කරනු ලබන ස්වභාෂක ජනමාධ්‍යකරණය පිළිබඳධ කරගැනීමට ද හැකියාව ලැබේ.

වෙළෙඳ ප්‍රචාරණය ඔස්සේ ලබා දෙන තොරතුරු හෝ සන්දේශ මගින් සමාජයීය හා සංස්කෘතික සාරධර්ම, විවිධත්වය හා සමානාත්මතාවය කෙරේ බලපෑම් ඇති විය හැකි ය. උදාහරණයක් ලෙස, වෙළෙඳ ප්‍රචාරණයේ දී පුරුෂ හා ස්ත්‍රී ප්‍රතිරූපය පිළිබඳව දැනුම් සමුදායක් පවතියි. සමකාලීන ස්ත්‍රීභාවය හා ස්ත්‍රීත්වය මූලිකවම වෙළෙඳ ප්‍රචාරණයේදී නිරූපණය වන්නේ, භාර්යාවන් හා මව්වරුන් වශයෙන් නිවස හෝ සමාජය තුළ ස්ත්‍රීන්ගේ කාර්යභාරය ඇසුරෙන[85]. ඇතැම් රටවල, වෙළෙඳ ප්‍රචාරණය තුළ ස්ත්‍රීන් ලිංගිකත්ව කෝණයෙන් සැලකේ. අනෙක් අතට, වෙළෙඳ ප්‍රචාරණයේදී පුරුෂත්වය යන්න නිරූපණය වන්නේ, ප්‍රබල පුරුෂරූපී, නායකත්ව භූමිකාවන් තුළ, බලවත්, බලපෑම් කළ හැකි පුද්ගලයන් ආදී ගුණයෙනි. එවැනි අන්තර්ගත මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති සවිගැන්වෙන අතර එමගින් ස්ත්‍රී පුරුෂ අසමානතා චිරස්ථායීව පැවතේ. මෙම උපමිතිය වාර්ගික වෙනස්කම් සහ වෙනත් සමාජයීය ගැටලු සම්බන්ධයෙන් ද අදාළ කරගත හැකි ය. මාධ්‍ය හා තාක්ෂණය පිළිබඳ වැඩිදුර විස්තර දැක්වීම් සඳහා 6 වැනි ඒකකය බලන්න.

වර්තමානයේ රණය සතු ප්‍රධානතම කාර්යභාරය සලකා බැලීමේ දී, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් ඵලදායී වෙළෙඳ ප්‍රචාරණයක් නිර්මාණය කිරීමෙහි ලා කුමක් බලපාන්නේ ද යන්න පිළිබඳව අවබෝධ කරගත යුතු අතර වෙළෙඳ ප්‍රචාරණය තොරතුරු මූලාශ්‍ර ලෙස ඇගැයීමට හැකි විය යුතු ය. තවද, පුරවැසියන් හට කර්මාන්ත හා රාජ්‍ය නිළධාරීන් වෙත කෙරෙන වෙළෙඳ දැන්වීම් පිළිබඳ ප්‍රතිචාර දැක්වීමට අවකාශය ලබා දෙන යාන්ත්‍රණයන් පිළිබඳව ජනතාව දැනුවත් වීම වැදගත් ය.

වෙළෙඳ ප්‍රචාරණය මගින් මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම්වල ස්වාධීනත්වය කෙරේ ඍණාත්මක බලපෑමක් ඇති විය හැකි ය. වෙළෙඳ ප්‍රචාරකයන් විසින් ඇති කරනු ලබන පීඩනය තුළින් ජනමාධ්‍යකරුවන් හා

85. Chiochhetto, L. (2008). Images of Women in Advertising Both Consumer and Object of Consumption' In Media Asia 35(4)(241-249DOI: 10.1080/01296612.2008.11771964

තොරතුරු හෝ ඩිජිටල් වෘත්තිකයන් විවාදාත්මක මාතෘකා පිළිබඳව ලිවීමෙන් හෝ පළ කිරීමෙන් වැළකීමට තුඩු දිය හැකි ය. එමගින් යම් විශේෂිත ග්‍රාහක පිරිසකගේ ආකර්ෂණය දිනාගත් විනෝදාස්වාදය වෙනුවෙන් මහජන සුබසිද්ධිය සහ හා මහජන යහපත පිණිස පවතින අන්තර්ගත පසෙකට තල්ලු වී යාමේ හැකියාවක් ඇත. ඉතාමත් අඩුවශයෙන් සිදු වන ප්‍රස්තුතයක් වන මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්හි සංස්කරණය සහ ව්‍යාපාරික අංශ අතර පැහැදිලි බාධකයක් නොමැතිවන විටක දී, ව්‍යාපාරික බැඳියාවන් මෙය ප්‍රකට නොවන පරිද්දෙන් අන්තර්ගතය සහ පුවත් ආවරණය කෙරේ බලපෑම් ඇති කිරීමට පුළුවන.

මාධ්‍ය සහ ඩිජිටල් තාක්ෂණයේ ශීඝ්‍ර වර්ධනයත් සමගින් වෙළෙඳ ප්‍රචාරණය සඳහා ඇති අවස්ථා පුළුල් වී ඇති අතර මහජන විශ්වාසය පවත්වා ගැනීමට උපකාරී වනු ඇතැයි අදහස් කරන විශේෂී ව්‍යවස්ථා සංග්‍රහ මගින් මෙම කර්මාන්තය අබණ්ඩව නියාමනය වේ. පොදුවේ ගත් කල, මෙම ව්‍යවස්ථා සංග්‍රහ ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන අතර ආණ්ඩු සහ වෙළෙඳ ප්‍රචාරණ කර්මාන්තය විසින් සකස් කරනු ලැබේ. මෙම සංග්‍රහ සකස් කිරීමේ අරමුණ වන්නේ, වෙළෙඳ ප්‍රචාරණය සත්‍යවාදී, සාධාරණ හා නිරවද්‍ය වන බවට සහතික වීමට උපකාරී වීමයි. බොහොමයක් රටවල පාරිභෝගිකයන් හට කර්මාන්තයේ ක්‍රියාවන් පිළිබඳ ගැටලු හෝ අදාළ කාරණා ඇතොත් වෙළෙඳ ප්‍රචාරණ සභාවන් සහ පාරිභෝගික කටයුතු කණ්ඩායම් සම්බන්ධ කරගැනීමේ හැකියාව ඇත.

බොහෝ රටවල, දේශීය පුද්ගලික වෙළෙඳ ප්‍රචාරණ පදනම වීරට පවත්නා සියලුම මාධ්‍ය ආයතනවල පැවැත්ම සඳහා ප්‍රමාණවත් නොවේ. එහෙයින්, ඇතැම් විට, සහනාධාර, අනුග්‍රාහකත්ව සහ අන්තර්ගත විකිණීම් වැනි වෙනත් ආදායම් මූලාශ්‍ර මත යැපීමට මාධ්‍ය සමාගම්වලට සිදු වේ. තොරතුරු යනු පොදු භාණ්ඩයක් ලෙස අප විසින් අවබෝධ කරගනු ලැබුවහොත්, එහිදී පුවත් මාධ්‍ය ආයතන කරා මහජන ප්‍රතිපත්ති හරහා ලැබෙන සෘජු හා වක්‍ර සහයෝගය පිළිබඳ කාරණාවක් මතු වේ. ඇතැම් රටවල, විකාශන සංඥා සම්ප්‍රේෂණ පිරිවැය ආවරණය කරගැනීම සඳහා ප්‍රජා මාධ්‍ය වෙත උපකාරී වීම පිණිස බදු සහන ඇති අතර වෙනත් රටවල සහනාධාර ලබා දේ.

මහජනයාගෙන් කොටසකට ප්‍රවෘත්ති සේවා සැපයීමේ දී ඇති වන වෙළෙඳපොල අසාර්ථකවීම් මධ්‍යයේ මනාව පැවතීමට අවශ්‍ය වන්නා වූ සෘජු රාජ්‍ය අරමුදල්කරණය විසින් මාධ්‍ය යටතට ගැනීමට හැකියාව ලබා දීමේ අවදානමක් නිරන්තරයෙන් පවතී. එවැනි යටතට ගැනීමක් තුළ අධ්‍යාහාරයෙන්ම සංස්කාරක ස්වාධීනත්වයට හානි සිදු විය හැකි අතර එය වැළැක්වීම සඳහා ශක්තිමත් ක්‍රමවේද අවශ්‍ය වේ. එමෙන්ම, රාජ්‍ය වෙළෙඳ ප්‍රචාරණය සඳහා කරනු ලබන වෙන්කිරීම් අන්තර්ගතය හේතු කොට ගෙන ප්‍රදානය හෝ දඬුවම් කිරීමේ මෙවලමක් බවට පත්වීමෙන් වැළැක්විය යුතු ය. විනිවිදභාවය සහ ස්වාධීන අධීක්ෂණය අවශ්‍ය වේ.

පුරවැසියන්ගේ, විශේෂයෙන්ම ළමුන්ගේ සහ තරුණ පරපුරෙහි හැඟීම්වලට ගැළපෙන පරිදි නිර්මාණය කොට ඇති වෙළෙඳ දැන්වීම් හා එම වෙළෙඳ දැන්වීම්වලින් අපේක්ෂිත පරිදි ක්‍රියාකිරීමට සිදු කරනු ලබන පෙළඹවීම් විචාරශීලීව දැකීම, සවන් දීම, දැනීම සහ කියවීම සඳහා ඔවුන් සවිබලගැන්වීම පිණිස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විෂයමාලාව ඉතා වැදගත්ය.

ඒකක

1වන ඒකකය :
වෙළෙඳ ප්‍රචාරණය, ආදායම් හා නියාමනය

2වන ඒකකය :
ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණය සහ දේශපාලනික කරලිය :සමාජ ජාල සහ විකුණුම්කරුවන් විසින් අලෙවිකරණය)

3වන ඒකකය :
මහජන සේවා නිවේදන

4වන ඒකකය :
වෙළෙඳ ප්‍රචාරණය: නිර්මාණාත්මක ක්‍රියාවලිය

5වන ඒකකය :

අන්තර්ජාතික වෙළෙඳ ප්‍රචාරණය සහ 'සුපිරි වෙළෙඳ සන්නාම'

1වන ඒකකය: වෙළෙඳ ප්‍රචාරණය, ආදායම් හා නියාමනය

කාලසීමාව: පැය 2යි

ප්‍රධාන මාතෘකා

- වෙළෙඳ ප්‍රචාරණ කටයුතු නියාමනය විශ්ලේෂණය කිරීම.
- වත්මන් වෙළෙඳ දැන්වීම් සඳහා නියාමනයන් අදාළ කරගැනීම.
- විවිධ වර්ගයේ මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම්වලට අදාළ වෙළෙඳ ප්‍රචාරණ ආදායම.
- විවිධ ආණ්ඩු විසින් පනවන ලද පහත දැක්වෙන නියාමනයන්හි පවතින සදාචාරාත්මක ගැටලු.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් හා ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා ගනු ඇත.

- විවධාකාර අන්තර්ගත නිෂ්පාදනය සඳහා ආදායම් මූලාශ්‍රයක් ලෙස වෙළෙඳ ප්‍රචාරණය පිළිබඳව විමර්ශනය කිරීමට
- වෙළෙඳ ප්‍රචාරණ කර්මාන්තය තුළ නියාමනයන් පැවතීමේ අරමුණ හා ඵලදායීතාවය සහ විවිධ ආණ්ඩු විසින් පනවන ලද පහත දැක්වෙන නියාමනයන්ට අදාළ සදාචාරාත්මක ගැටළු පරීක්ෂා කිරීම හා තක්සේරු කිරීමට
- වත්මන් වෙළෙඳ ප්‍රචාරණ උදාහරණ සඳහා දැනට පවතින නියාමන අදාළ කරගැනීමට
- වැඩසටහන් සම්පාදනය සහ මාධ්‍ය හා ඩිජිටල් අන්තර්ගතය කෙරේ ඇති වන බලපෑම ඇගැයීමට හැකිවනු ඇත.

වෙළෙඳ ප්‍රචාරණය ඔස්සේ ආදායම් උත්පාදනය

බොහෝ අන්තර්ගත සපයන්නන් හට ලාභ ඉපැයීම ප්‍රධාන කාර්යයක් බවත්, ආදායම් ලැබීමේ එක් ප්‍රධාන මාර්ගයක් වනුයේ වෙළෙඳ ප්‍රචාරණය බවත් අපි දනිමු. විවිධ ආණ්ඩු මගින් මාධ්‍ය කර්මාන්තය විසින් අනුගමනය කළ යුතු නොයෙක් ආකාරයේ වෙළෙඳ ප්‍රචාරණ රෙගුලාසි පනවා ඇත. සමාජ මාධ්‍ය ඉදිරියෙන් සිටින මෙවැනි යුගයක තනි පුද්ගලයන් හා ව්‍යාපාර යන දෙපිරිසම විසින් සිය වෙබ් අඩවි, නාලිකා හෝ ඔවුන්ගේ අන්තර්ජාල-පාදක අන්තර්ගතයන් ආශ්‍රය කරගන්නා වෙනත් වේදිකා තුළ වෙළෙඳ ප්‍රචාරණ ආදායම් උපයා ගනු ලැබේ.

වසර ගණනාවක් මුළුල්ලේ වෙළෙඳ ප්‍රචාරණ ස්වරූපය වෙනස් කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිත වී ඇත. වෙළෙඳ ප්‍රචාරණය, මීන් පෙර විශේෂිත අන්තර්ගතයන්ට ප්‍රතිබද්ධව තිබිණි. විලාසිතා පිළිබඳ කතාන්දරවල ප්‍රේක්ෂකයින්, තම භාණ්ඩ විකුණාගැනීමට අපේක්ෂා කරන ඇඟලුම් සමාගම්වලින් ලැබෙන පණිවිඩ කෙරෙහි උනන්දු වනු ඇතැයි තර්කානුකූලව උපකල්පනය කිරීම මෙයට නිදසුනකි. වර්තමානයේ, ඩිජිටල් දත්ත රැස් කිරීම මත පදනම්ව පුද්ගල පැතිකඩ හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, ඕනෑම අන්තර්ගත සන්දර්භයක් තුළ වෙළෙඳ දැන්වීම් දිස්විය හැකිය. මන්ද, පාරිභෝගිකයින් ඉලක්ක කර ගැනීමේ අවස්ථාව, ඔවුන් විසින්

භාවිත කර තිබිය හැකි තනි අන්තර්ගත ගමනාන්තයකට වඩා ඔවුන් පිළිබඳව වටහාගන්නා කරුණු මත පදනම් වන බැවිනි. බොහෝ වෙබ් අඩවි සිය පරිශීලකයන්ගෙන් ලුහුබැඳීමේ තාක්ෂණයක් වන 'කුකීස්' සඳහා අවසර ලබා දෙන්නේ දැයි විමසන්නේ මේ හේතුවෙනි. මෙම තාක්ෂණය මගින් ඔවුන් මාර්ගගතව සිටිය හැකි ඕනෑම විටෙක "අදාළ" වෙළෙඳ ප්‍රචාරණ ලැබීමේ හැකියාව පවතියි. බොහෝ දුරට ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන මෙම ක්‍රමය මගින් නොයෙක් විට වෙළෙඳ දැන්වීම් තුළින් ලබා දෙන සන්දේශ සහ අන්තර්ගතවල අඩංගු සන්දේශ අතර ගැටුමකට මග පෑදෙන අතර, එමගින් තම සන්නාමය

විශේෂාංගී වන අන්තර්ගත සහිත පරිසරය තෝරා ගැනීමට වැඩි කැමැත්තක් දක්වන වෙළෙඳ ප්‍රචාරණ සන්නාමයන් අපහසුතාවයට පත් විය හැකි ය.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ හා ක්‍රියාකාරකම්

සාරාංශය: මෙම විෂයමාලාව (1 කොටස) තුළ පූර්වයෙන් සාකච්ඡා කළ පරිදි, විවිධාකාර ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදා ගත හැකි ය. කරුණාකර, 1 කොටසෙහි දැක්වෙන ලැයිස්තුව සමාලෝචනය කර පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකසනු ලැබිය හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යොදා ගත යුතු ප්‍රවේශය තීරණය කරන්න.

පහත සඳහන් ශික්ෂණවිද්‍යා ක්‍රියාකාරකම් ඉහත විස්තර කොට දක්වා ඇති ගැටලු පිළිබඳව සොයා බැලීම සඳහා භාවිතා කෙරේ:

- සාකච්ඡාව: වෙළෙඳ ප්‍රචාරණය යනු බොහෝ මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම්වල මුඛ්‍ය ආදායම් මූලාශ්‍රයක් බව සැලකිල්ලට ගත් කල; දැන්වීම්කරුවන්, දැවැන්ත සමාගම් හෝ රජය සංතෘප්ත කිරීම පිණිස අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, මාධ්‍ය නිදහස හෝ තොරතුරු වෙත නිදහස් ප්‍රවේශය ආදියට හානි සිදු විය හැක්කේ කෙසේ ද? මෙයින් ගම්‍යමාන වන්නේ කුමක් ද? රජය විසින් මාධ්‍ය හා වෙනත් තොරතුරු සපයන්නන් වෙත ලබා දෙන ලද මුදල් ආධාර විනිවිදභාවයෙන් යුතු විය යුතු ද? රජයෙන් හෝ පෞද්ගලිකව අරමුදල් සපයන ලද අන්තර්ගත සපයන්නන් වෙළෙඳ ප්‍රචාරණ ආදායම ලැබීමෙන් පසු රජයට වගකිව යුතු ද?
- නිබන්ධනය: 'මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි බොහෝ අන්තර්ගත සපයන්නන්ගේ මුඛ්‍ය අරමුණ වන්නේ, ලාභ ඉපැයීමයි.' මෙම ප්‍රකාශය විමසන්න. ඊට පක්ෂව හා විපක්ෂව තර්ක ඉදිරිපත් කරන්න. විකිපීඩියා වැනි අන්තර්ගත සපයන්නන් වෙළෙඳ දැන්වීම්වලින් තොරව මෙහෙයුම් කටයුතු සිදු කරන්නේ කෙසේ ද? අන්තර්ගත සපයන්නන් වෙළෙඳ ප්‍රචාරණ ආදායම වෙනුවෙන් මහජන යහපත කැප කරන බවට අනාවරණය වුවහොත් පුරවැසියන් විසින් කුමක් කළ යුතු ද? මේ සඳහා කුමන පියවර ගත හැකි ද? වෙළෙඳ ප්‍රචාරණය සිය මෙහෙයුම් කටයුතු සහන මිලට සැපයීමේ ක්‍රමයක් ලෙස යොදා ගන්නා රාජ්‍ය විකාශකයෙකු සහ සිය කොටස්කරුවන් සඳහා මුදල් ඉපැයීමේ මාර්ගයක් ලෙස වෙළෙඳ ප්‍රචාරණය යොදා ගන්නා වාණිජමය විකාශකයෙකු අතර වෙනසක් තිබේ ද? සංස්ථායික තර්කන තුළ මුදල් ඉපැයීම සඳහා විකාශය කිරීම හෝ විකාශය කිරීම සඳහා මුදල් ඉපැයීම අතර වෙනසක් තිබේ ද, එසේත් නැතිනම්, මේවා එකිනෙක මත සේයාගත වීමට පටන් ගන්නේ ද?
- සිද්ධි අධ්‍යයනය: විවිධ ආණ්ඩු විසින් විවිධ වෙළෙඳ ප්‍රචාරණ රෙගුලාසි පැනවිය හැකි ය. විවිධ රටවල පවතින සමාජ මාධ්‍ය සමාගමක් (WeChat වැනි) හෝ සෙවුම් යන්ත්‍රයක් (Yandex වැනි) හඳුනාගෙන එම රටවල් විසින් පනවන ලද වෙළෙඳ ප්‍රචාරණ රෙගුලාසි පිළිබඳව සොයා බලන්න. එම සමාජ මාධ්‍යය/සෙවුම් යන්ත්‍රය විවිධ රටවල පනවා තිබිය හැකි නොයෙක් රෙගුලාසි අනුගමනය කරන්නේ ද යන්න පිළිබඳව විමර්ශනය කරමින්, ආදායම් හා මහජන සුබසිද්ධිය අතර පවතින ගැටුම්, ආ) ක්ෂුද්‍ර ඉලක්කකරණය සඳහා පුද්ගලික දත්ත යොදා ගැනීමේදී ආදායම් හා පෞද්ගලිකත්වය අතර ඇති වන සදාචාරාත්මක ගැටලු සහ, ඇ) විවිධ රටවල අ) සහ ආ) මගින් දක්වා ඇති කරුණු කෙරේ මහජනයා දක්වන ප්‍රතිචාර ආදී ගැටලු පිළිබඳව සාකච්ඡා කරන්න.
- පර්යේෂණ: අන්තර්ජාලය ඇසුරෙන්, ඔබ ජීවත් වන කලාපය තුළ වෙළෙඳ ප්‍රචාරණ කර්මාන්තය සඳහා පවත්නා රෙගුලාසි පිළිබඳව විමර්ශනය කරන්න. මෙම තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවැසි පුරවැසියන් හට එම රෙගුලාසි පවතින්නේ කොහේද යන්න හඳුනාගන්න. මෙම රෙගුලාසි කුමන පුද්ගලයන් හෝ කණ්ඩායම් විසින් සකස් කර ඇත්ද යන්න හඳුනාගන්න. එම රෙගුලාසි මගින් ආවරණය වන ප්‍රධාන ක්ෂේත්‍ර සාරාංශගත කර ඒවායේ අරමුණු විස්තර කරන්න. එමගින්, පුරවැසියන්ගේ සහ පාරිභෝගිකයන්ගේ අභිරුචීන් සඳහා කෙතරම් හොඳින් සහයෝගයක් ලැබේ ද නොලැබේ ද යන්න පිළිබඳව පැහැදිලි කරන්න. මෙම රෙගුලාසිවල විභවීය බලපෑම පිළිබඳව පැහැදිලි කරන්න.
- දේශීය මාධ්‍ය තුළ දැකිය හැකි විවිධාකාර වෙළෙඳ දැන්වීම් සඳහා මෙම රෙගුලාසි අදාළ කරගන්න. එම රෙගුලාසි කෙතරම් දුරට අනුගමනය කරන්නේ ද යන්න තක්සේරු කරන්න. ඔබේ පිළිතුර

තහවුරු කිරීම සඳහා සෑම වෙළෙඳ දැන්වීමකින්ම නිශ්චිත උදාහරණ ලබා දෙන්න. වෙළෙඳ දැන්වීමක් මගින් රෙගුලාසි කඩ වන අවස්ථාවන්හි දී, පාරිභෝගිකයන් හට ලබා ගත හැකි සහනය පිළිබඳව විමර්ශනය කරන්න.

- දැන්වීම්කරුවන්ගේ අවශ්‍යතා මගින් වැඩසටහන් සම්පාදන වර්ගය හෝ එහි ගුණාත්මකභාවය හෝ මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ආවරණය මෙන්ම සෙවීම් බලපෑමට ලක් වී ඇත්ද යන්න විමර්ශනය කරන්න. ඩිජිටල් උපාංග හා වේදිකාවල ප්‍රමුඛතා ස්ථාපනය (Priority Placements) කිරීම කෙරේ බලපෑමක් තිබේ ද? වෙළෙඳ ප්‍රචාරණය යම් විශේෂිත මාධ්‍යයක් සඳහා වන ආදායම් ආකෘතියක් සේ සලකා විමර්ශනය කරන්න. උදාහරණයක් ලෙස, ඔබේ කලාපයේ වැඩිම ග්‍රාහක පිරිසක් ආකර්ෂණය වන කාලසීමාව තුළ විකාශය වන රූපවාහිනී හෝ ගුවන් විදුලි වැඩසටහන් සම්පාදන කාලසටහන මෙන් ම ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් ඇතැම් අන්තර්ගත සඳහා ලබා දී ඇති ප්‍රමුඛතාව පරීක්ෂා කර බලන්න.
- තුලනාත්මක අධ්‍යයනය: ඉහත පර්යේෂණවලින් අනාවරණය කරගත් කරුණු ඔබේ රුචිකත්වය අනුව තෝරාගත් රටක්/කලාපයක් සමඟ සංසන්දනය කිරීම සඳහා භාවිත කරමින් ඒවා අතර සමානකම් හා වෙනස්කම් සහ ඊට හේතු පාදක වූ කරුණු මොනවාදැයි හඳුනාගන්න.
- විමර්ශනය: විවිධ වෙළෙඳ ප්‍රචාරණ ශිල්ප ක්‍රම පිළිබඳව මූලික පර්යේෂණයක් සිදු කරන්න. ඇතැම් ශිල්ප ක්‍රමවල සුවිශේෂීභාවය, සමානකම් සහ ඵලදායිතාව සසඳා විමසන්න. උදාහරණයක් ලෙස පහත ශිල්ප ක්‍රම (වෙනත් ශිල්ප ක්‍රම ද ඇත) සලකා බලන්න:
    - භාව විෂයක ආකර්ෂණය
    - ප්‍රවර්ධක වෙළෙඳ ප්‍රචාරණය
    - බෑන්ඩ්වැගන් (Bandwagon) වෙළෙඳ ප්‍රචාරණය (භාණ්ඩ මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයන් අවිචාරවත් ලෙස ආකර්ෂණය වීම)
    - කරුණු හා සංඛ්‍යාලේඛන
    - නොනිමි වෙළෙඳ දැන්වීම් (unfinished ads)
    - ගණුදෙනුකරුවන් අගය කිරීම
    - ජන ආකර්ෂණය (Folk appeal)
    - ජාත්‍යාලය
    - 'බලපෑම්කරු' වෙත හිමිකම් ලබා දීමට සහාය වන මුදල් ගෙවා සිදු කරන නිෂ්පාදන ස්ථානගත කිරීම හෝ අනාවරණය නොකළ අනුග්‍රාහකත්ව වැනි සැඟවුණු වෙළෙඳ ප්‍රචාරණයන්
- ශික්ෂකයන් විසින් සංස්කෘතිකමය වශයෙන් උරුමලත් ඒකාකෘති සහ අනතර්ගත තුළ චිත්‍රපට හා රූපවාහිනිය, ජනප්‍රිය (පොප්) සංගීතය, වීඩියෝ දර්ශන හා රූප බෙදාගැනීමේ වේදිකා, පුවත්පත් හා සඟරා ආදියෙහි ස්ත්‍රීන් හා පුරුෂයන් සහ ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් පිළිබඳව නිරූපණය කර ඇති ප්‍රතිරූපය සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ගේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා කුසලතා සහ සිය විචාර බුද්ධිය යොදා ගැනීමට මඟ පෙන්විය යුතු ය. සියලු වයස් කාණ්ඩවල පිරිමින් හා කාන්තාවන් ආශ්‍රිත ඒකාකෘති සහ ඒවායේ මූලාශ්‍ර ලෙස සැලකිය හැකි කරුණු පිළිබඳ සමාලෝචනයකින් මෙය ආරම්භ කරන්න. ස්ත්‍රීපුරුෂ සමාජභාවී නිරූපණය මත පදනම් වූ වෙළෙඳ දැන්වීම් මාලාවක් විසංයෝජනය කිරීමට හා ශිෂ්‍යයන් කියවා ඇති පුවත්පත් ලිපිවල ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ ඒකාකෘතිකරණය පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා ඔවුන්ට මඟ පෙන්වන්න. (eGirls ව්‍යාපෘතිය ඇසුරෙන් සකස් කරන ලද්දකි. පාඩම් සැලසුම්වල වෙනත් විභව්‍ය ක්‍රියාකාරකම් https://egirlsproject.ca outreach/mediasmarts/media-and-gender/ ඔස්සේ බලන්න.)
- සිද්ධි අධ්‍යයනය : එක් විශේෂ රූපවාහිනී හෝ ගුවන්විදුලි මධ්‍යස්ථානයක් සහ එම කලාපයේම මධ්‍යස්ථානයක් අන්තර්ජාලය ඔස්සේ තොරාගන්න. පැයක කාල සීමාවක් ඇතුළත විකාශය වන වැඩසටහනක් නරඹන හෝ සවන් දෙන අතරවාරයේම එම කාලය තුළ ප්‍රචාරණය වන වෙළෙඳ දැන්වීම්වලට සවන් දෙන්න. එම නිශ්චිත වැඩසටහන් අතරතුර වෙළෙඳ දැන්වීම් යොදාගැනීමේ තර්කනය පැහැදිලි කරන්න. එමෙන්ම, වැඩසටහන් තුළම දැක්වෙන කිසියම් වෙළෙඳ ප්‍රචාරණයක් හෝ නිෂ්පාදනයක් ඇතොත් එය ද සිහි තබාගන්න. ඉලක්කගත ග්‍රාහක පිරිස් වෙත ළඟා වීම සඳහා මෙම කාල සීමාව තුළ යොදා ගන්නා ලද වෙළෙඳ ප්‍රචාරණ උපායමාර්ගවල ඵලදායීතාව තක්සේරු කරන්න.

- වැඩසටහන: එක් රූපවාහිනී සහ සමාජ මාධ්‍ය ජාලයක් තෝරා ගෙන යම් විශේෂිත වැඩසටහනක් හෝ වෙන් කළ කාල සීමාවක් ඇතුළත ඔබ විසින් වෙළෙඳ ප්‍රචාරණයට යොදා ගනු ලබන නිශ්පාදන හෝ සේවාවන් පිළිබඳව තීරණය කරන්න. එම කාලය අතරතුර ඔබට ළඟා විය හැකි ඉලක්කගත ග්‍රාහක පිරිස හඳුනාගනිමින් ඔබේ තෝරාගැනීම් පැහැදිලි කරන්න.
- YouTube නාලිකා නිර්මාණකරුවන් පිළිබඳ සිද්ධි අධ්‍යයනය :

  අ. පර්යේෂණය: ජනප්‍රියතම YouTube නාලිකා නිර්මාණකරුවන් 10 දෙනා ශේණිගත කර ඔවුන් කොපමණ ආදායමක් උපයන්නේ දැයි සොයා බලන්න. YouTube වෙබ්අඩවිය විසින් එම YouTube නිර්මාණකරුවන් වෙත වීඩියෝපට උඩුගත කිරීම වෙනුවෙන් ගෙවීමක් සිදු කරනු ලබන්නේ ද? එම වෙබ් අඩවිය ඔවුන් සමඟ වෙළෙඳ දැන්වීම් ආදායම බෙදා ගන්නේද? සන්නාම ස්ථාපනය කිරීම සඳහා සමාගම් විසින් ඔවුන් වෙත ගෙවීම් සිදු කරනු ලබන්නේද? ඔවුන්ගේ පැවැත්ම පරිත්‍යාග හෝ අනුග්‍රාහකයන් මත රඳා පවතින්නේ ද? ආදී ප්‍රශ්න යොදා ගනිමින් ඔවුන් විසින් ආදායම් උත්පාදනය කරනු ලබන ආකාරය පිළිබඳව විමර්ශනය කරන්න.

  ආ. අර්ථ දැක්වීම්: යූටියුබ් නාලිකා නිර්මාණකරුවන්ගෙන් වෙළෙඳ ප්‍රචාරණ ආදායම් ලැබීම් පහත ස්වරූපවලින් දැකිය හැකි ය:

  - සන්නාම හා නිෂ්පාදන ස්ථාපනය
  - සන්නාම හා නිෂ්පාදන අනුකලනය
  - නිෂ්පාදන පිළිබඳ සමාලෝචන
  - ඉන්-වීඩියෝ ෂවුට්අවුට් (Shout-out) යනු බලපෑම්කරුවෙකු ඔහුගේ/ඇයගේ එක් වීඩියෝවක් තුළ තවත් බලපෑම්කරුවකු, සන්නම් නාමයක් හෝ නිෂ්පාදනයක් සඳහන් කරනු ලබන හෝ ප්‍රවර්ධනය කරනු ලබන වීඩියෝ වර්ගයකි.) / වෙළෙඳ දැන්වීම්
  - අනුබද්ධ අලෙවිකරණය
  - සුපර් චැට් විශේෂාංගය
  - පේට්‍රියොන් වේදිකාව (Patreon).

මේවායින් අදහස් වන්නේ කුමක්දැයි සොයා බලන්න. ඔබේ පිළිතුරු තහවුරු කරගැනීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන විෂයමාලාව අවසානයේ දැක්වෙන පාරිභාෂික පද වෙත යොමුවන්න.

සටහන

මෙම අභ්‍යාසය පුවත්පත්, සඟරා, වෙබ් අඩවි ආදිය සමඟ භාවිත කිරීම සඳහා ද අනුවර්තනය කළ හැකිය.

ඇගයීම් හා නිර්දේශ

- රෙගුලාසි මත පදනම්ව වෙළෙඳ දැන්වීම් විශ්ලේෂණය කිරීම සහ ඇගැයීම.
- රූපවාහිනී වැඩසටහන් සම්පාදනය, වෙළෙඳ ප්‍රචාරණය හා ආදායම් පිළිබඳ විමර්ශනය හා ඇගැයීම.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- ගතික හා ජංගම වෙළෙඳ ප්‍රචාරණය
- සමාජ මාධ්‍ය වෙළෙඳ ප්‍රචාරණය
- චර්යා ඉලක්කකරණය
- නවීන සහ ඩිජිටල් වෙළෙඳ ප්‍රචාරණ ශිල්පක්‍රම පිළිබඳ වැඩි විස්තර

2වන ඒකකය: ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණය හා දේශපාලන වේදිකාව

කාලසීමාව: පැය 3 යි

ප්‍රධාන මාතෘකා

- දේශපාලනික හා මැතිවරණ ප්‍රචාරණ කටයුතු විශ්ලේෂණය කිරීම.
- දේශපාලනික වෙළෙඳ ප්‍රචාරණය සඳහා මාර්ගෝපදේශ ඇගැයීම.
- ජාතික මැතිවරණ පවත්වනු ලබන කාල සීමාව තුළ අදාළ වන නිශ්චිතවම මැතිවරණ ප්‍රචාරණ මාධ්‍ය රෙගුලාසි පනවනු ලබන නියාමන ආයතන පිළිබඳව ඇගැයීම.
- ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණයේදී සමාජ මාධ්‍යවල කාර්යභාරය.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් හා ශිෂ්‍යයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත.

- දේශපාලනික හා මැතිවරණ ප්‍රචාරණ කටයුතු ඇගැයීම
- දේශපාලනික හා මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල භාවාත්මක අයැදුම් විශ්ලේෂණය කිරීම
- දේශපාලනික ප්‍රචාරණ කටයුතුවල දී භාවාත්මක අයැදුම් භාවිත කිරීම සැලකිල්ලට ගෙන අවබෝධිත පුරවැසිභාවයක් පවත්වා ගැනීම සඳහා උපායමාර්ග නිර්දේශ කිරීම
- සමාජ මාධ්‍ය ජාල මගින් සිදු කරනු ලබන ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණය ඇගැයීම
- අලෙවිකරණය තුළින් පාරිභෝගිකයන්ගේ තීරණ සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සමානාත්මතාව හා වාර්ගික වෙනස්කම් විරෝධී බව වැනි සාරධර්ම කෙරේ ඇති බලපෑම ඇගැයීම.

මෙම ඒකකය මගින් ඉලක්කගත නිපුණතා මට්ටම:

- මූලික

දේශපාලනික වෙළෙඳ දැන්වීම්වල පවතින ගැටලු

මැතිවරණ ප්‍රතිඵල සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන දේශපාලන පක්ෂ, අපේක්ෂකයන් සහ සංවිධාන සහ පුද්ගලයන් විසින් නිර්මාණය කරනු ලබන ප්‍රසිද්ධ නිවේදන, දේශපාලනික වෙළෙඳ දැන්වීම් ලෙස දැක්විය හැකි ය. මෙම නිවේදන සාමාන්‍යයෙන් අලෙවිකරණ මූලධර්ම මත රඳා පවතින අතර එමගින් වැඩි වශයෙන් ඡන්දදායකයන්ගේ චිත්තවේග අරමුණු කෙරෙන අතර, ඔවුන්ගේ බුද්ධිය හෝ විචාරශීලී චින්තනය කෙරෙහි අඩුවෙන් අවධානය යොමු කරනු ලැබේ. යම් නිශ්චිත ස්ථාවරයකට ඇතැම් ඡන්දදායකයන්ගේ සහය ලබා ගැනීම සඳහා ඔවුන්ව පෙළඹවීමට මෙන්ම ප්‍රතිවාදීන්ගේ සහභාගිත්වය අධෛර්යමත් කිරීමට මෙම වෙළෙඳ දැන්වීම් මගින් උත්සාහ කරන අතර එය "ඡන්දදායකයන් මර්දනය කිරීමේ" උපක්‍රම ලෙස හැඳින්වේ.

විකිපීඩියා (2020) අනුව, ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණය යනු, ප්‍රචාරකයා විසින් ප්‍රවර්ධනය කරනු ලබන භාණ්ඩය හෝ පුද්ගලයා මත පදනම් වෙමින්, යම් නිශ්චිත ගතිලක්ෂණ සහිත ග්‍රාහක පිරිස් අරමුණු කර ගනිමින් මාර්ගගතව ද සිදු කෙරෙන වෙළෙඳ ප්‍රචාරණ ක්‍රමවේදයකි. මෙම ගතිලක්ෂණ ජනවිකාශනමය එනම් ජාතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආර්ථික තත්ත්වය, ලිංගිකත්වය, වයස, පරම්පරාව, අධ්‍යාපන මට්ටම, ආදායම් මට්ටම සහ රැකියාව හෝ එසේත් නැතිනම් මනෝවිකාශනමය එනම් පාරිභෝගිකයාගේ වටිනාකම්, පෞරුෂය, ආකල්ප, අදහස්, ජීවන රටාව සහ රුචිකත්වයන් විය හැකි ය. ඒවා අන්තර්ජාලයේ සෙවුම් ඉතිහාසය, මිලදී ගැනීමේ ඉතිහාසය සහ අනෙකුත් මෑතකාලීන ක්‍රියාකාරකම්

වැනි චර්යාත්මක විචල්‍යයන් ද විය හැකි ය. ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණය මගින් යම් යම් ගතිලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන අතර, අදාළ නිෂ්පාදනය පිළිබඳ උනන්දුවක් නොමැති සහ එයට නොග ැළපෙන මනාපයන් සහිත පාරිභෝගිකයන් වෙනුවට ඒ පිළිබඳ දැඩි මනාපයක් දක්වන පාරිභෝගිකයන්ට එම සන්දේශය ලැබෙනු ඇත. මෙය නාස්තිය අවම කර ගැනීමට උපකාරී වේ. (https://en.wikipedia.org/wiki/Targeted_advertising). ඉලක්කගත දේශපාලනික ප්‍රචාරණය මගින් පුද්ගලයන්ට විවිධ නොගැළපෙන සංදේශ පවා යැවීමට පක්ෂවලට ඉඩ සැලසෙන අතර, (සමස්තය වෙනුවෙන් තීරණ ගැනීම වෙනුවට) ඡන්දදායකයන් පොළඹවා ගත හැකි ගැටලු තනි වශයෙන් හඳුනා ගැනීමට එයින් ඉඩ සැලසේ.

සමාජ ජාල යනු ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණ සිදු කරන ප්‍රමුඛ ව්‍යවසායන් වන අතර සිය පරිශීලකයන්ගේ භූගෝලීය පිහිටීම, හැසිරීම, සමාජ-මනෝවිකාශනමය දත්ත සහ ඩිජිටල් සන්නිවේදන වේදිකා තුළදී පරිශීලකයන් සපයන තොරතුරු වැනි ගුණාංග ඔවුන් ඒ සඳහා භාවිතා කරති. සෑම පරිශීලක ක්‍රියාකාරකමක දී ම, පරිශීලකයෝ සිය රුචිකත්වයන් පිළිබඳ අන්තර්ජාල ඉතිහාසය මගින් හෙළිදරවු වන "ඩිජිටල් පියසටහන්" (උදා: මනාපය පළ කිරීම් හෝ අන්තර්ජාලය තුළ තොරතුරු සෙවීම්) සලකුණු ඉතිරි කරති. ඒ අනුව, පසුව මෙම චරිත සටහන් විකුණුම්කරුවන් විසින් අලෙවි ප්‍රචාරණ දැන්වීම් සඳහා භාවිතා කරනු ලැබේ. පාරිභෝගිකයන්ගේ රුචිකත්වයන් අනුව යමින් ඔවුන්ව ඉලක්ක කර ගැනීමට වෙළෙඳ දැන්වීම්කරුවන්ට/ වෙළෙන්දන්ට ඉඩ සලසමින්, මුහුණුපොත, ට්විටර්, සීනා වෙයිබෝ (Sina Weibo), ඉන්ස්ටග්‍රෑම් සහ වෙනත් සමාජ මාධ්‍ය පරිශීලකයන්ට, උදාහරණයක් ලෙස, ඔවුන්ට මනාපය පළ කරන පිටු අනුව වෙළෙඳ දැන්වීම් ලැබෙනු ඇති අතර, එම ස්ථානයන්ට ඔවුන්ව යොමු කරනු ලැබේ. පාරිභෝගිකවාදය පිළිබඳ හෝ වේවා දේශපාලන තීරණ පිළිබඳ හෝ වේවා ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණය පාරිභෝගිකයන්ගේ හෝ පරිශීලකයන්ගේ තීරණ කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව ඔවුන් දැනුවත්ව සිටිය යුතු ය.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශය: මෙම විෂයමාලාව (1 කොටස) තුළින් පූර්වයෙන් සාකච්ඡා කළ පරිදි, විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ තිබේ. කරුණාකර 1 කොටසෙහි දක්වා ඇති ලැයිස්තුව සමාලෝචනය කර පහතින් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ හට සම්පාදනය කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න.

- ඔබගේ රට හෝ ප්‍රදේශය ඇසුරින් දේශපාලන වෙළෙඳ ප්‍රචාරණ කටයුතු සඳහා උදාහරණ එක් රැස් කරන්න. අවශ්‍ය වන්නේ නම්, ඔබගේ ප්‍රාදේශීය පුස්තකාලයෙහි පර්යේෂණ සිදු කරන්න. පහත දක්වා ඇති 3වන ඒකකයෙහි මාර්ගෝපදේශ භාවිත කරමින් මෙම දැන්වීම් විශ්ලේෂණය කරන්න. අරමුණ, ප්‍රකාශ කෙරෙන තොරතුරු සහ සන්දේශය මෙන් ම ඉලක්කගත ග්‍රාහක පිරිස සැලකිල්ලට ගනිමින් එක් එක් දැන්වීමෙහි සඵලතාව තක්සේරු කරන්න. අන්තර්ගතය වඩා ශක්තිමත් කිරීම සඳහා දැන්වීම්වල සැලසුම / ආකෘතිය භාවිතා කර ඇති ආකාරය පැහැදිලි කරන්න.
- එක ම දේශපාලන ව්‍යාපාරයේ දැන්වීම් කිහිපයක් පරීක්ෂාවට ලක් කරන්න. ඒකීකෘත චිත්‍රක (unified graphics), අනුරූප (images), උද්‍යෝග පාඨ සහ සන්දේශ භාවිත කිරීමේදී සමස්තයක් ලෙස ව්‍යාපාරයේ සඵලතාවය තක්සේරු කරන්න.
- අන්තර්ජාලය සහ/හෝ පුස්තකාල සම්පත් භාවිතා කරමින්, දේශපාලන ප්‍රචාරණය අධීක්ෂණය කිරීම සඳහා පිහිටුවා ඇති නියාමන ආයතන විමර්ශනය කරන්න. මැතිවරණ අතරතුර දී දේශපාලන අපේක්ෂකයන් විසින් භාවිත කරනු ලබන වෙළෙඳ දැන්වීම් අධීක්ෂණය කිරීම සඳහා ස්ථාපනය කරන ලද මාර්ගෝපදේශ පරීක්ෂා කරන්න. තෝරා ගන්නා ලද දැන්වීම් මෙම මාර්ගෝපදේශවලට කොපමණ දුරට අනුගත වේ ද යන්න තක්සේරු කරන්න.
- අන්තර්ගත සපයන්නන් විසින් ක්ෂුද්‍ර ඉලක්කගත දැන්වීම් (micro-targeted ads) ඇතුළු සියලු ම දේශපාලන දැන්වීම්වල පොදු දත්ත ගබඩාවක් තබා ගන්නේ ද යන්න විමර්ශනය කර බලන්න. එසේ කිරීමෙන් මේවා සසඳා බැලිය හැකි ය.
- මෙම නියාමන ආයතන මගින් පුරවැසියන්ගේ අවශ්‍යතා නියෝජනය කරන්නේ කෙසේදැයි විමර්ශනය කරන්න. දේශපාලන ප්‍රචාරණය සත්‍යවාදී, සාධාරණ සහ නිවැරදි බව සහතික කිරීම සඳහා පුරවැසියන් විසින් ඉටු කළ හැකි කාර්යභාරය පරීක්ෂා කරන්න. දේශපාලන ප්‍රචාරණය

සම්බන්ධයෙන් ඔබ නියාමන ආයතනයක් වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනා ගෙන හැර දක්වන්න.

- පැහැදිලි විධිමත් සාකච්ඡාවක් සම්බන්ධයෙන් වන උත්සුකතාවයන් හි දී දේශපාලනික ප්‍රචාරණය සැමට විවෘත විය යුතු ද, හෝ කරුණු සනාථ කළ දැන්වීම් පමණක් ප්‍රචාරය කළ යුතු ද යන්න සාකච්ඡා කරන්න.
- මැතිවරණ වාර්තා කිරීම සම්බන්ධ මාධ්‍ය රෙගුලාසි :ජාතික මැතිවරණ කොමිසම විසින් පනවන ලද) ලැයිස්තුගත කරන්න. මත විමසුම් වාර්තා කිරීම, ජාතික විකාශකයන් විසින් විවිධ දේශපාලන පක්ෂවලට ගුවන් කාලය වෙන් කිරීම, මැතිවරණ ප්‍රතිඵල විකාශනය කිරීම යනාදිය සඳහා මාර්ගෝපදේශ තිබේදැයි බලන්න. මේවා දේශපාලන දැන්වීම් කෙරෙහි බලපෑම් ඇති කරන්නෙහි ද?
- දේශපාලන උපදේශක ෆෑන්ක් ලන්ට්ස් සිය දේශපාලනික සේවාදායකයන් හට 'අපගේ ජීවිතයෙන් සියයට 80ක් භාව විෂයක වන අතර සියයට 20ක් බුද්ධිමය වේ. ඔබ සිතන ආකාරයට වඩා ඔබට හැඟෙන ආකාරය පිළිබඳ ව මම උනන්දු වෙමි'. යනුවෙන් පවසයි. මෙම අර්ථ කථනය සලකා බලමින් දේශපාලන වෙළෙඳ දැන්වීම් පරීක්ෂාවට ලක් කරන්න. දේශපාලන වෙළෙඳ ප්‍රචාරණ දැන්වීම් කෙතරම් දුරට භාව විෂයක ආකර්ෂණය මත පදනම් වේ ද යන්න පැහැදිලි කරන්න. අපේක්ෂකයෙකු සහ ඔහුගේ හෝ ඇයගේ අදහස් හෝ ප්‍රතිපත්ති "අලෙවිය සඳහා" භාවිතා කෙරෙන භාෂාව පිරික්සා බලන්න. භාවිත කරන ලද භාෂාව නිවැරදි ද නැතහොත් නොමග යවන සුළු ද යන්න තක්සේරු කර බලන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදා වෙන් කර සමාජීය සහ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර සංවර්ධන සංවිධාන විසින් සිදු කරනු ලබන සමාජ අලෙවිකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ මූලික පර්යේෂණ සිදු කිරීමට ඔවුන්ට මග පෙන්වන්න. එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ අනෙකුත් බහුපාර්ශ්වික හවුල්කරුවන්, ජාත්‍යන්තර සංවර්ධන සංස්ථා ආයතන ආදිය සලකා බලන්න. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව, ඉවසීම, කොවිඩ්-19 ආශ්‍රිත අතථ්‍ය තොරතුරු සහ සාවද්‍ය තොරතුරුවලට එරෙහිව සටන් කිරීම, දේශගුණික ගැටළු සහ ජාතික සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා තරුණ සහභාගීත්වය ඇති කිරීම වැනි කරුණු ද සලකා බලන්න. රුචිකත්වයක් දක්වන වෙනත් මාතෘකා පිළිබඳව මෙනෙහි කරන්න. මෙම සමාජ අලෙවිකරණ ප්‍රයත්නයන් පිළිබඳ ප්‍රවේශය, බලපෑම, වාසි සහ අවාසි තක්සේරු කිරීම සඳහා ශිෂ්‍යයන් හට මග පෙන්වන්න. අදාළ සංවර්ධන සන්දේශයන් ද සමඟ වැඩි පිරිසක් වෙත ළඟා වීම සඳහා මෙම සංවර්ධන සංවිධානවලට වෙනස් ආකාරවලින් කළ හැකි යැයි තමන් සිතන දේ කණ්ඩායම් විසින් ලේඛනගත කළ යුතු ය.
- දේශපාලන වෙළෙඳ ප්‍රචාරණ කටයුතු සඳහා විශේෂයෙන් භාව විෂයක ආකර්ෂණය භාවිතා කිරීම සැලකිල්ලට ගනිමින්, අවබෝධිත සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී සංවේදිතාවෙන් යුත් පුරවැසිභාවයක් පවත්වා ගැනීම සඳහා උපාය මාර්ග නිර්දේශ කරන්න.
- සෙවුම් යන්ත්‍රයක් මගින් විශේෂිත දෙයක්, හැකි නම්, තමන් මිල දී නොගන්නා දෙයක් පිළිබඳ සෙවීම් සිදු කරන ලෙස ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටින්න. නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ යන්ත්‍රය එවැනි ඩිජිටල් මෙහෙයුම් මඟ සෑදීම (digital tracking) භාවිත කරන ආකාරය පිළිබඳ ව විශ්ලේෂණය කරන්න.
- වඩාත් ජනප්‍රිය සමාජ මාධ්‍ය මගින් විවිධ නිෂ්පාදන සහ සේවා අලෙවි කරන ආකාරය පිළිබඳ තක්සේරු කරන්න. ඔවුන්ගේ හැසිරීම, භූ පිහිටීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා වයස, ආදිය මත මෙම දැන්වීම් පදනම් වී තිබේ ද?
- සමාජ ජාල මගින් ඔවුන්ගේ රුචි අරුචිකම්, වටිනාකම් සහ අභිරුචීන් සවිමත් කරන්නේ කෙසේ ද යන්න ඇගයීම සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- අලෙවිකරු විසින් භාවිත කරනු ලබන ඉලක්කගත විකල්ප මොනවා ද යන්න හඳුනා ගැනීම සඳහා ඔවුන්ගේ සමාජ ජාල තුළ පවතින විවිධ දැන්වීම් තුනක් තක්සේරු කරන ලෙස ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටින්න: වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සම්බන්ධතා තත්ත්වය, ස්ථානය, ජනවාර්ගිකත්වය, රැකියාව සහ අධ්‍යාපනය ඔවුන්ගේ පෞද්ගලිකත්වය කෙරෙහි කරන බලපෑම කෙබඳු ද? ඔවුන් සමාජ මාධ්‍ය අලෙවිකරණයට එරෙහි වන්නේ කෙසේ ද? එක් එක් පරිශීලකයා ක්ෂුද්‍ර ඉලක්ක කර ගැනීම සඳහා දැන්වීම්කරු විසින් කොපමණ දත්ත ලකුණු ප්‍රමාණයක් ලබා තිබේ ද?

ඇගයීම සහ නිර්දේශ

- රචනය
- මාධ්‍ය සහ ඩිජිටල් වේදිකා තුළ හඳුනා ගන්නා ලද ඇතැම් ඒකාකෘතිවලට එරෙහි පෝස්ටර් තරගය
- ස්ත්‍රීපුරුෂ සමාජභාවී සංවේදි වන දැන්වීම් සඳහා විවිධ දර්ශන සැලසුම් සාරාංශ නිර්මාණය කිරීම.

වැඩිදුර සලකා බැලීම සඳහා මාතෘකා

- ආයතනික සහ ප්‍රජා අනුග්‍රහය (ඉගෙනුම් අවකාශයන්හි අනුග්‍රහය සහ ප්‍රචාරණය ඇතුළුව)
- ප්‍රචාරණයේ දී කීර්තිමත් පුද්ගලයන්ගේ අනුමැතිය
- සානුරෝධ ධනවාදය (Caring capitalism) විවිධ සංස්ථාවන් හි අලෙවිකරණය සහ උපායමාර්ගික පරාර්ථචර්යාව ප්‍රවර්ධනය කෙරෙහි අවධානය පැවතිය ද, සුප්‍රකට පුද්ගලයන් වෙත හිමිකම් ලබා දීම හා සම්බන්ධිත
- සනෝගති විද්‍යාව සහ ග්‍රාහක පිරිස් පර්යේෂණ

3වන ඒකකය: මහජන සේවා දැන්වීම් (PSAS)

කාලසීමාව: පැය 3 කි.

ප්‍රධාන මාතෘකා

- මහජන සේවා දැන්වීම් විශ්ලේෂණය
- මහජන සේවා දැන්වීම් (PSAS) නිර්මාණාත්මක ක්‍රියාවලිය සහ සැලසුම් කිරීම.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත.

- විවිධ ගැටලු පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමේ මාධ්‍යයක් ලෙස මහජන සේවා දැන්වීම් ගණනාවක් විශ්ලේෂණය කිරීම
- අරමුණු ප්‍රකාශය, සන්දේශය , ඉලක්කගත ග්‍රාහක පිරිස සහ තාක්ෂණික සහ නිර්මාණාත්මක උපාය මාර්ග ඇතුළු තෝරා ගත් නිකුතුවක් සඳහා උත්පාදක මහජන සේවා දැන්වීම් සඳහා සැලැස්මක් සකස් කිරීම
- සන්නිවේදන උපාය මාර්ග සහ මහජන සේවා දැන්වීම්වල සඵලතාව ඇගයීම
- මහජන සේවා දැන්වීම් නිර්මාණය කිරීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මහජන සේවා දැන්වීම් යනු සාමාන්‍යයෙන් රජයන් සහ සංවර්ධන සංවිධානයන් විසින් නිර්මාණය කරන ලද සන්දේශයක් වන අතර, නිශ්චිත හැසිරීමක් සාක්ෂාත් කර ගැනීම සඳහා සහ සමාජමය ගැටලුවක් සම්බන්ධයෙන් දැනුවත් කිරීම හෝ මහජන ආකල්ප වෙනස් කිරීම සඳහා මහජන සුබසිද්ධිය සඳහා ප්‍රචලිත කරන ලද්දකි. මහජන ව්‍යාපාර සඳහා උදාහරණ ලෙස සුළි කුණාටු, භූමිකම්පා සහ ගංවතුර වැනි ස්වභාවික විපත්වලදී ගත යුතු ආරක්ෂක පියවර ඉගැන්වීම; හෝ COVID-19 වෛරසය, දුම්පානය, මැලේරියාව, HIV සහ AIDS ආසාදනය පැතිරීම සීමා කිරීම ආදිය සඳහා වන මහජන සෞඛ්‍ය ව්‍යාපාර, හෝ මුහුණු ආවරණ භාවිතය, දෑත් සනීපාරක්ෂාව, සමාජ දුරස්ථභාවය, මදුරු දැල් භාවිතය සහ ආරක්ෂිත ලිංගිකත්වය දිරිමත් කිරීම යනාදිය දැක්විය හැකි ය. රජයේ සහ සංවර්ධන සංවිධානවල භූමිකාවන් අනුව තේමාවන් විවිධ වන අතර සාක්ෂරතාව, ප්‍රශස්ත රිය ධාවනය හෝ පරිසර විද්‍යා

ව්‍යාපාර ඇතුළු තවත් බොහෝ දේ ඒ අතර වේ. වාණිජ ප්‍රචාරණයට සාපේක්ෂව දේශීය සහ ජාතික මහජන සේවා දැන්වීම්වල අන්තර්ගතය, අරමුණ සහ බලපෑම විශ්ලේෂණය කිරීම සහ සාකච්ඡා කිරීම ශික්ෂණවිද්‍යා ප්‍රවේශ විය හැකි ය.

- ඉහත සඳහන් කරන ලද උදාහරණ මත පදනම්ව, මහජන සේවා දැන්වීම්වල අර්ථය සහ අරමුණ සාකච්ඡා කරන්න. මහජන සේවා දැන්වීම් වාණිජ ප්‍රචාරණයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. ඔබ දැක ඇති මහජන සේවා දැන්වීම් හි ආමන්ත්‍රණය කර ඇති ගැටලු ලැයිස්තුවක් පිළියෙල කරන්න. ඔබගේ කලාපය තුළ මහජන සේවා දැන්වීම් සඳහා වන විවිධ භාවිතයන් හඳුනා ගන්න.
- පහත සඳහන් මහජන සේවා අඩවි අතුරින් එක් අඩවියකට පිවිසෙන්න : (මෙහි විස්තර කර ඇති ක්‍රියාකාරකම් නිදර්ශනය කිරීමට නියැදි සම්පත් ලෙස පමණක් මේවා ඇතුළත් කර ඇත. ඒ වෙනුවට විවිධ කලාප සඳහා සුදුසු වන පරිද්දෙන් වෙනත් සම්පත් භාවිතා කළ හැකි ය.)
  - http://www.un.org.za/public-service-announcement-on-the-effects-of-drugs
  - http://www.unodc.org/unodc/en/human-trafficking/human-trafficking-public-service-announcements.html
  - http://saloproductions.com/public-service-announcements/psa-samples.php
- මහජන සේවා දැන්වීම් ගණනාවක මුද්‍රිත පිටපත් සහ වීඩියෝ පරීක්ෂා කර එකිනෙකෙහි ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න. ප්‍රකාශ කරනු ලබන ප්‍රමුඛ තොරතුරු සහ ප්‍රධාන සන්දේශය හඳුනා ගෙන ඒවා ඉදිරිපත් කරන ආකාරය විශ්ලේෂණය කරන්න. භාවිත කරන ලද තාක්ෂණික සහ නිර්මාණාත්මක උපාය මාර්ග යන දෙවර්ගය ම සලකා බලන්න.
- විවිධ මහජන සේවා දැන්වීම්වල භාව විෂයක ආකර්ෂණය භාවිත කෙරෙන ආකාරය විශ්ලේෂණය කරන්න. මෙම මහජන සේවා දැන්වීම් මගින් කෙරෙන ඕනෑම හිමිකම් පෑමක් හඳුනා ගෙන ඒවාට කරුණු මගින් සහය දක්වන්නේ ද නැද්ද යන්න හඳුනා ගන්න. මහජන සේවා දැන්වීම්හි තාක්ෂණික අංග මගින් එහි අර්ථය හෝ සන්දේශය සවිමත් කෙරෙන ආකාරය විශ්ලේෂණය කරන්න. විවිධ කැමරා දර්ශන සහ කෝණ භාවිතයෙන් ඇති කරන ලද බලපෑම් පැහැදිලි කරන්න. අර්ථය ප්‍රකාශ කිරීම සඳහා ශබ්දය භාවිතා කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.
- ශික්ෂකයන් සිය ආලෝචන මත පදනම්ව කථා පුවරුවක් නිර්මාණය කිරීම මගින්, නියැදිවලින් වඩාත් විස්තරාත්මකව මහජන සේවා දැන්වීමක් 'විසංයෝජනය' කිරීමට පුළුවන. ඔවුන්ට මහජන සේවා දැන්වීමක් එක වරකට වඩා බැලීමට අවශ්‍ය වනු ඇති අතර, සෑම රාමුවකම ඇති මහජන සේවා දැන්වීමකම විරාමයක් තැබීමට පහසුකම් සපයන්නාට සිදු වනු ඇත. එවිට ශික්ෂකයන් හට ඔවුන් දකින සහ අසන දේ ඔවුන්ගේ කතා පුවරුවේ ලේඛනගත කළ හැකි ය. දර්ශන සාරාංශ පුවරු වෙත www.storyboardsinc.com මගින් පිවිසිය හැකි ය:
- වැදගත් සමාජ හෝ සංස්කෘතික ගැටලුවක් පිළිබඳ මහජන සේවා දැන්වීමක් සඳහා මුල් සැලැස්ම සකස් කරන්න. මහජන සේවා දැන්වීම සඳහා පදනම ලෙස භාවිතා කළ හැකි ගැටලු ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න. අරමුණ සහ ග්‍රාහක පිරිස පිළිබඳව සාකච්ඡා කරන්න. තව ද, මෙම සාකච්ඡාව මගින්, ප්‍රකාශ කෙරෙන සන්දේශය හැඩ ගස්වා ගැනීමට උපකාරී වනු ඇත. ඔබට ප්‍රකාශ කළ යුතු ප්‍රමුඛ තොරතුරු සහ ප්‍රධාන සන්දේශය සලකා බලන්න.
- ඒ අනුව, ඔබගේ තොරතුරු සහ සන්දේශය වෙත ළඟා විය යුත්තේ කවුරුන් ද සහ කෙසේ ද යන්න සලකා බලන්න. තොරතුරු සහ සන්දේශය නිශ්චිත ව ඉලක්කගත ග්‍රාහක පිරිස වෙත යොමු කළ යුතු ය.
- කඩදාසිය මත සංකල්පය විස්තර කර මහජන සේවා දැන්වීමක් නිර්මාණය කිරීමට භාවිතා කළ හැකි උපාය මාර්ග ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න. මෙයට නිර්මාණාත්මක උපාය මාර්ග :මහජන සේවා දැන්වීමක් සඳහා අන්තර්ගත අදහස්) සහ තාක්ෂණික උපාය මාර්ග : නිෂ්පාදන සංරචකය) ඇතුළත් විය හැකි ය.
- සංකල්පය, තාක්ෂණික සහ නිර්මාණාත්මක උපාය මාර්ග සහ ග්‍රාහක පිරිස විස්තර කෙරෙන ප්‍රකාශයක් ඇතුළුව මහජන සේවා දැන්වීමක් සඳහා දළ සටහනක් සම්පූර්ණ කරන්න.

4වන ඒකකය: ප්‍රචාරණය: නිර්මාණාත්මක ක්‍රියාවලිය

කාලසීමාව: පැය 3 කි.

ප්‍රධාන මාතෘකා

- ප්‍රචාරණය සහ අනුග්‍රහය ස්ථානය, සන්දේශය සහ ග්‍රාහක පිරිස
- ප්‍රචාරණය තුළ වගකීම (claim) සහ ආකර්ෂණය (appeal) ඇගයීම
- වෙළෙඳ දැන්වීම් නිර්මාණය සහ සම්පාදනය පරීක්ෂා කිරීම
- වැඩසටහන්වල දී නිෂ්පාදන ස්ථානගත කිරීම.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත.

- තොරතුරු සන්නිවේදනය කිරීමේ මාධ්‍යයක් ලෙස වෙළෙඳ ප්‍රචාරණ ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීම
- තාක්ෂණික සහ නිර්මාණාත්මක උපායමාර්ග ඇතුළුව වෙළෙඳ ප්‍රචාරණයේ සංකල්ප සංවර්ධනය ගවේෂණය කිරීම
- වෙළෙඳ දැන්වීමක ප්‍රධාන සංඝටක සහ එහි භාවාත්මක අයැදුම විසංයෝජනය කිරීම
- නිශ්චිතව ඉලක්කගත ග්‍රාහක පිරිස කෙරෙහි ප්‍රචාරණ සන්දේශවල බලපෑම තක්සේරු කිරීම
- 'ක්‍රියාකාරී' ග්‍රාහක පිරිස යන සංකල්පය වෙළෙඳ ප්‍රචාරණයට අදාළ වන ආකාරය හෝ වඩාත් නිශ්චිතව, ග්‍රාහක පිරිස විසින් අර්ථය සාකච්ඡා කරන ආකාරය (එනම්, ඇතැම් වෙළෙඳ දැන්වීම්වල සාර්ථකත්වයත් අනෙක් ඒවා එසේ නොවීමත් අප විසින් පැහැදිලි කරන්නේ කෙසේ ද?) පැහැදිලි කිරීම
- වෙළෙඳ ප්‍රචාරණයේ නවතම ප්‍රවණතා හඳුනා ගැනීම
- චක්‍ර වෙළෙඳ ප්‍රචාරණයක් ලෙස වැඩසටහන්වල නිෂ්පාදන ස්ථානගත කිරීම් හඳුනා ගැනීමට (සංස්කාරක සහ වාණිජ අන්තර්ගත මිශ්‍ර කිරීම) හැකි වනු ඇත

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශය: මෙම විෂයමාලාව 1 කොටස තුළින් පූර්වයෙන් සාකච්ඡා කළ පරිදි විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ තිබේ. කරුණාකර 1 කොටසෙහි දක්වා ඇති ලැයිස්තුව සමාලෝචනය කර පහතින් යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ හට සකස් කළ හැකි අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය තීරණය කරන්න.

- ඔබේ ඉගෙනුම් අවකාශය හෝ අවට වටපිටාවෙහි සැරිසරන්න.

    අ. එහි පවතින වෙළෙඳ දැන්වීම් වර්ග, මහජන සේවා දැන්වීම (PSAs), ප්‍රවර්ධන හෝ අනුග්‍රාහකත්ව හඳුනා ගන්න

    ආ. එක් එක් වෙළෙඳ ප්‍රචාරණ/ මහජන සේවා දැන්වීම / අනුග්‍රාහක උදාහරණ පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න

    ඇ. එක් එක් උදාහරණය හරහා නිර්මාණය කරන ලද සන්දේශය සහ අනුරූප විස්තර කර අවශ්‍ය තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ දී ඒවායේ ඵලදායිත්වය තක්සේරු කරන්න

    ඈ. එක් එක් උදාහරණය සඳහා මූලාශ්‍රය හඳුනා ගන්න : එනම් එය නිර්මාණය කළේ කවුරුන් ද හෝ එයින් ප්‍රතිලාභ/ ලාභ ලබන්නේ කවුරුන් ද යන වග)

ඉ. ව්‍යාපාර සහ ආයතන විසින් ඔවුන්ගේ නාම, නිෂ්පාදන හෝ ලාංඡන මෙහි ස්ථානගත කිරීමට තෝරා ගත හැක්කේ මන්දැ යි පැහැදිලි කරන්න. මෙම අනුග්‍රාහකත්වයන්/ ප්‍රවර්ධනයන් 'සාම්ප්‍රදායික' ප්‍රචාරණයෙන් වෙනස් වන්නේ කුමන ආකාරයෙන් ද යන්න පැහැදිලි කරන්න.

- සඟරා එකතුවක් සමාලෝචනය කරන්න, රූපවාහිනියේ දැන්වීම් නරඹන්න. එමෙන් ම, ප්‍රධාන සමාගම්වල වෙබ් අඩවි ගණනාවකට පිවිසෙන්න.

  අ. වත්මන් උදාහරණවල භාවිත කරන වෙළෙඳ ප්‍රචාරණ උපායමාර්ග විස්තර කරන්න

  ආ. සමීපව පරීක්ෂා කිරීම සඳහා දැන්වීම් කිහිපයක් තෝරා ගන්න.

  ඇ. එක් එක් වෙළෙඳ දැන්වීම තුළ අන්තර්ගත සම්පාදනය් 'විශේෂ ලක්ෂණ' විස්තර කරන්න.

  ඈ. වෙළෙඳ දැන්වීම හෝ මහජන සේවා දැන්වීම් මගින් ලබා දෙනු ලබන පොරොන්දු හෝ විසඳුම් මොනවා ද? මේවා කෙතරම් යථාර්ථවාදී ද? සන්තුෂ්ටිය හෝ සාර්ථකත්වය පිළිබඳ කුමන ආකරයේ අදහස් සන්නිවේදනය කරනු ලැබේ ද?

  ඉ. එක් එක් දැන්වීම තුළින් ඉදිරිපත් කර ඇති තොරතුරු, සන්දේශ සහ අගයන් හඳුනා ගන්න

  ඊ. සංස්කාරක සහ වෙළෙඳ ප්‍රචාරණ අන්තර්ගතය අතර පැහැදිලි වෙනසක අවශ්‍යතාව සාකච්ඡා කරන්න. එසේ ම, මෙම දැන්වීම්වල යම් නිශ්චිත වගකීමක් ඉදිරිපත් කර තිබේ ද? මෙම වගකීම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති කරුණු මොනවාද? නොමඟ යවන සුලු හෝ අපැහැදිලි කිසියම් තොරතුරක් මෙහි අන්තර්ගත වේද? ඔබේ විශ්ලේෂණය මත පදනම් ව, මෙම දැන්වීම සම්බන්ධයෙන් ඔබ ග්‍රාහක පිරිසට ඉදිරිපත් කරන නිර්දේශ මොනවා ද? වෙනත් ආකාරයකින් කිවහොත්, මෙම දැන්වීම මගින් ඉදිරිපත් කෙරෙන තොරතුරු ඔබ පිළිගන්නෙහි ද? නැත්නම් ඒ මන්ද? තොරතුරු හෝ සන්දේශය වඩාත් නිවැරදි හෝ සම්පූර්ණ කිරීමට ඔබ විසින් යම් වෙනසක් යෝජනා කරන්නෙහි ද? උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

- සමීපව පරීක්ෂා කිරීම සඳහා මුද්‍රිත දැන්වීමක් තෝරා ගන්න. මෙමගින් දැන්වීමෙහි භාවිත වන සැලසුම් අංග, ප්‍රකාශ කරන තොරතුරු සහ සන්දේශය මෙන් ම ඉලක්කගත ග්‍රාහක පිරිස පිළිබඳ සලකා බැලීම අවශ්‍ය වේ. සැලසුම් අංග : සංයුතිය, කෝණය, ආලෝකය, වර්ණය, වචන භාවිතය ආදිය) මගින් සන්දේශය සහ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට සහාය වන්නේ කෙසේ ද? වෙනත් ආකාරයකින් ප්‍රකාශ කරන්නේ නම්, එමගින් අන්තර්ගතය ශක්තිමත් කෙරෙන්නේ කෙසේ ද?
- නිෂ්පාදන ස්ථාපනය කිරීම යනු යම් වාණිජ නිෂ්පාදනයක් වෙළෙඳ දැන්වීමක් ලෙස හඳුනා ගැනීමකින් තොර ව, වැඩසටහනට අනුග්‍රහය දැක්වූ නිෂ්පාදකයා තෘප්තිමත් කිරීම සඳහා: එනම් ඒ සඳහා සම්පූර්ණයෙන්ම ගෙවීම් සිදු කර හෝ ඒ ආශ්‍රිත වියදම් කිහිපයක් සපුරාලමින්) එය විශේෂිත ගුවන් විදුලි හෝ රූපවාහිනී වැඩසටහනක හෝ පොතක ප්‍රමුඛව තැබීම හෝ වැඩි වශයෙන් අන්තර්ජාලයේ ස්ථානගත කිරීමයි. ඇතැම් නියාමකයින් විසින් නිෂ්පාදන ස්ථාපනය කිරීම සඳහා අවසර ලබා දෙන්නේ වැඩසටහන ආරම්භයේ සහ අවසානයේ නිෂ්පාදන ස්ථාපනය කිරීම පිළිබඳ ව නරඹන්නන්ට පැහැදිලිව දැනුම් දීමේ කොන්දේසිය මත ය. නමුත් ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් මෙය කලාතුරකින් ක්‍රියාත්මක කරනු ලබයි. නිෂ්පාදන ස්ථාපනය කිරීම සඳහා උදාහරණ තෝරා ගන්න: ඒවා එසේ හඳුනා ගෙන තිබේ ද? නිෂ්පාදන ස්ථාපනය කිරීම සම්බන්ධ රෙගුලාසි ඔබගේ රට තුළ තිබේ නම්, පුරවැසියන්ට ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? සන්දර්භය අනුව නිෂ්පාදිතය පිළිබඳව ලබා දෙන සන්දේශය කුමක් ද? නිෂ්පාදනය තුළින්ම මෙන්ම එහි සන්දර්භය තුළින් ලබා දෙන සන්දේශ මොනවා ද? වෙනත් සන්දර්භයක් හෝ ස්ථාපනය කිරීමක් හමුවේ නිෂ්පාදනයේ අනුරුව සහ එහි සන්දේශය වෙනස් වීමක් සිදු කෙරේ ද?
- වෙළෙඳ ප්‍රචාරණ ක්ෂේත්‍රයට සම්බන්ධ පිරිස්වල ලැයිස්තුවක් සකස් කරන්න. මේ සඳහා පුද්ගලයන් සහ ආයතන/ සංවිධාන සම්බන්ධ විය යුතු ය. ඔවුන්ගේ අදාළ භූමිකාවන් විස්තර කරන්න. ඕනෑම ශ්‍රව්‍ය දෘශ්‍ය වෙළඳ ප්‍රචාරණයක් සලකා බලන්න. ඔබ ලැයිස්තුගත කළ එක් එක් ප්‍රධාන පිරිසගේ භූමිකාවන් දැන්වීම තුළ පැහැදිලිවම පිළිබිඹු වී ඇතැයි ඔබ සිතන්නෙහි ද? ඒ සමඟ වඩා හොඳින් අන්තර් ක්‍රියා කිරීමේදී හෝ ඔබට අවශ්‍ය තොරතුරු සැපයීමේ දී එහි ප්‍රයෝජනය තක්සේරු කිරීම සඳහා, මෙම දැන්වීම නිර්මාණය කර බෙදා හැරීමට සම්බන්ධ පිරිස සම්බන්ධව ඔබගේ දැනුම

කෙසේ උපකාරී වනු ඇතැ යි ඔබ සිතන්නේ ද? සටහන : මේ සම්බන්ධයෙන්, 'The Persuaders' නම් වාර්තා චිත්‍රපට මාලාව ප්‍රයෝජනවත් විය හැකි ය මෙම මොඩියුලය අවසානයේ ඇති යොමු ලැයිස්තුවේ මෙම වැඩසටහන පිළිබඳ ව දැක්වෙන විස්තරය බලන්න.

- පර්යේෂණ: පහත වෙබ් අඩවියට පිවිසෙන්න. https://clios.com/awards/winners. විවිධ වෙළෙඳ දැන්වීම් සම්බන්ධයෙන් විවිධ රටවලට පිරිනැමෙන විවිධ සම්මාන දෙස අවධානය යොමු කරන්න. විවිධ නිෂ්පාදනවල තාක්ෂණික සහ නිර්මාණාත්මක උපායමාර්ග ඇතුළුව වෙළෙඳ දැන්වීම් ශිල්පීය ක්‍රමවල යම් සමානකම් සහ වෙනස්කම් හඳුනා ගන්න.
- වෙළෙඳ දැන්වීම් ස්ථානගත කළ හැකි ප්‍රධාන සමාජ මාධ්‍ය නාලිකා අතර Facebook, Instagram,Twitter, WeChat, Pinterest, LinkedIn, TikTok, YouTube සහ Snapchat හෝ වෙනත් දෑ ඇතුළත් වේ. ඔවුන්ගේ විවිධ ප්‍රවේශ සාකච්ඡා කරන්න.
- ප්‍රචාරණ ස්ථාපනය කිරීමේ ස්වයංක්‍රියකරණය සහ විශාල දත්ත සහ තථ්‍ය කාලීන වෙන්දේසි මත විශ්වාසය තබන තැරැව්කාර සමාගම්වල කාර්යභාරය සම්බන්ධව පර්යේෂණ කරන්න. "ක්‍රීඩා කිරීම" (gaming) මගින් ඔවුන්ගේ අන්තර්ගතයට සමීපව ම ප්‍රචාරණය ලබා ගැනීම සඳහා වෛරයට පාත්‍රවන නළුවන්ට දෙනු ලබන දිරිදීමනා නිම කිරීමට ඩිජිටල් සන්නිවේදන සමාගම් කෙරේ බලපෑම් කරනු ලබන #StopHateForProfit වැනි ව්‍යාපාර අධ්‍යයනය කරන්න. මාර්ගගතව සම්බන්ධ වන ඉලක්කගත ග්‍රාහක පිරිසෙහි උපකල්පනය කරන ලද අවස්ථාවන් මත පදනම්ව, වෙළෙඳ දැන්වීම් ස්වයංක්‍රියව සෘජුව ස්ථානගත වීමෙන් මෙම දිරිදීමනා ක්‍රියාත්මක වන අතර, මේවා නතර කිරීම සඳහා ක්‍රියාත්මක වීමට සමාගම් කෙරෙහි මහජන බලපෑමක් නොමැත්තේ නම් සමාගම් විසින් දක්වනු ලබන නිසි සැලකිල්ලකින් තොරව මෙය සිදු වේ.

ඇගයීම සහ නිර්දේශ

- සමාජ මාධ්‍ය හරහා වෙළෙඳ ප්‍රචාරණය කිරීමේ වාසි සහ අවාසි පිළිබඳව රචනයක් ලියන්න

5වන ඒකකය: අන්තර්ජාතික වෙළෙඳ ප්‍රචාරණය සහ 'සුපිරි සන්නාම'

කාලසීමාව: පැය 2 යි.

ප්‍රධාන මාතෘකා

- අන්තර්ජාතික වෙළෙඳ ප්‍රචාරණ උපායමාර්ග තුළ නව තාක්ෂණයන් භාවිතය
- 'සුපිරි සන්නාමයන් හි' අයැදුම
- සුපිරි සන්නාම නිර්මාණයේ දී භාවිත කරන උපායමාර්ග
- ගෝලීය වෙළෙඳ දැන්වීම් ව්‍යාපාර හරහා ප්‍රකාශ කරන ප්‍රධාන තේමා සහ සන්දේශ
- සුපිරි සන්නාම සහ ප්‍රකාශන හිමිකම් නීතිගත් කිරීම

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත.

- සන්නාමකරණ උපායමාර්ග සහ ඒවායේ සඵලතාවය විශ්ලේෂණය කිරීම සහ ඇගයීම
- දේශීය සහ ගෝලීය ප්‍රජාවන් කෙරෙහි වෙළෙඳ සන්නාමකරණයේ බලපෑම සහ ගෝලීයකරණය කෙරෙහි එහි බලපෑම තක්සේරු කිරීම

- නිශ්චිත සන්නාම උපායමාර්ග හරහා ලබා දෙන සන්දේශ සහ අගයන් විශ්ලේෂණය කිරීම
- දේශීයව සහ ගෝලීය වශයෙන් සන්නාමකරණයේදී නව තාක්ෂණයන්හි කාර්යභාරය තක්සේරු කිරීම
- 'සුපිරි සන්නාමයන්ගේ' ප්‍රකාශන හිමිකම් සම්බන්ධ ඇතැම් සදාචාර විරෝධී ගැටලු විශ්ලේෂණය කිරීම

අන්තර්ජාතික වෙළෙඳ ප්‍රචාරණය

'අන්තර්ජාතික වෙළෙඳ ප්‍රචාරණ උපායමාර්ගය' සමග ව්‍යාපාර ලොව පුරා තම පැවැත්ම ප්‍රකාශ කිරීම සඳහා ලෝකයේ සෑම කොනකටම ළඟා වෙමින් වැඩි වශයෙන් ගෝලීයකරණය වෙමින් පවතී. ගෝලීය සන්නාම දේශීය රුචි අරුචිකම්වලට ගැළපෙන පරිදි අලෙවිකරණය හරහා අලෙවි කිරීම ද ඔවුන්ගේ අරමුණකි. ගෝලීයකරණය හරහා ව්‍යාපාර ලෝකයේ බොහෝ ප්‍රදේශ කරා ළඟා වෙමින් පවතින බැවින්,'සුපිරි වෙළෙඳ සන්නාම' ඇතිවීම නොවැළැක්විය හැකි දෙයක් වන අතර ඒවාගේ වටිනාකම්, එයින් කියැවෙන පණිවිඩ සහ විවිධ සංස්කෘතීන් කෙරෙහි ඒවායේ බලපෑම අවබෝධ කර ගැනීම සහ විශ්ලේෂණය කිරීම වැදගත් වේ.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ හා ක්‍රියාකාරකම්

සාරාංශය: මෙම විෂයමාලාවේ (1 කොටසේ) කලින් සාකච්ඡා කළ පරිදි, විවිධ අධ්‍යාපනික ප්‍රවේශ භාවිත කළ හැකි ය. කරුණාකර 1 කොටසෙහි දැක්වෙන ලැයිස්තුව සමාලෝචනය කර, පහත යෝජිත ක්‍රියාකාරකම් සහ ඔබ විසින් සකස් කරන අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා යෙදිය යුතු ප්‍රවේශය කුමක්දැයි තීරණය කරන්න.

අන්තර්ජාතික සමාගම් විසින් භාවිතා කරන අලෙවිකරණ උපාය මාර්ග තීරණය කිරීම සඳහා මාර්ගගත අධ්‍යනයන් සිදු කරන්න. කර්මාන්ත ප්‍රකාශනයක් වන ඇඩ්වර්ටයිසින් ඒජ් (Advertising Age) හි වෙබ් අඩවිය - www.adage.com වෙත පිවිසීමට සලකා බලන්න. ප්‍රධාන සමාගම් තම නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට සහ සංස්කෘතියක් 'අලෙවි කිරීමට' භාවිත කරන විවිධ උපායමාර්ග හඳුනා ගන්න. 'සාම්ප්‍රදායික' සංස්කෘතියට ප්‍රතිපක්ෂව 'සමකාලීන' සංස්කෘතිය පිළිබඳ සෘජුව හෝ වක්‍රව ඔවුන් අදහස් කරනුයේ කුමක් ද යන්න සාකච්ඡාවට බඳුන් කරන්න.

- අන්තර්ජාතික සමාගමක වෙබ් අඩවියට පිවිස සමීපව පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ වෙළෙඳ දැන්වීමක් තෝරන්න. මෙම දැන්වීම තුළ ඇති සිත් ඇදගන්නා අංග මොනවාදැයි හඳුනා ගන්න. එහි ප්‍රකාශනය සහ චිත්තවේගීය ආයාචනා භාවිතා කොට ඇත්තේ කෙසේ දැයි විමසන්න. හැකි නම්, වෙනත් කලාපයක් හෝ වෙළෙඳපොළක් ඉලක්ක කර ගනිමින්, එම නිෂ්පාදනය සඳහාම සකස් කළ වෙනත් වෙළෙඳ දැන්වීමක් සමඟ මෙම වෙළෙඳ දැන්වීම සසඳා බලන්න. එක් එක් දැන්වීම එහි ඉලක්කගත වෙළෙඳපොළ සඳහා ගොඩනගා ඇති ආකාරය හඳුනා ගන්න.
- කිසියම් ප්‍රජාවකට හෝ කලාපයකට ආවේණික නිෂ්පාදනයක් හෝ සේවාවක් අරමුණු කරගත් දැන්වීමක් සඳහා දළ සටහනක් නිර්මාණය කරන්න. ලෝකයේ විවිධ ප්‍රදේශවල හා විවිධ වෙළෙඳපලවල සිටින ග්‍රාහක පිරිස වෙත ළඟා වීමට වඩාත් ඵලදායී වන තාක්ෂණික සහ නිර්මාණාත්මක උපායමාර්ග හඳුනා ගෙන පැහැදිලි කරන්න. එමෙන්ම ඒ සඳහා තාක්ෂණය භාවිතා කරන ආකාරය සහ කුමන බලපෑමක් සිදු කිරීමට එය භාවිත කරන්නේ ද යන්න පැහැදිලි කරන්න.
- උපකල්පනය කරන ලද නිෂ්පාදනයක් ජාත්‍යන්තර වෙළෙඳපොළකට අලෙවි කිරීම සඳහා සැලැස්මක් සකස් කරන්න. ඉලක්කගත ග්‍රාහක පිරිස හඳුනා ගන්න. මෙම ග්‍රාහක පිරිස් වෙත ළඟා වීමට වඩාත් ඵලදායී වන උපායමාර්ග පැහැදිලි කරන්න. ඩිජිටල් තාක්ෂණය හරහා මෙය කළ හැකි වන්නේ කෙසේ ද සහ එහිදී විය හැකි අවාසි මොනවාද යන්න සලකා බලන්න.
- ඔබේ ප්‍රාදේශීය ප්‍රජාව තුළ වෙළෙඳ සන්නාමකරණය පිළිබඳ පවතින උදාහරණ පරීක්ෂා කරන්න. ඵලදායී සන්නාමයක් සංවර්ධනය කිරීමට දායක වන අංග පැහැදිලි කරන්න. ඉහළ වෙළෙඳ සන්නාම ගැන පිළිගැනීමක් ඇති කිරීමට, එම සන්නාමයේ අර්ථය සන්නිවේදනය කිරීමට සහ ඉලක්කගත ග්‍රාහක පිරිස් වෙත ළඟා වීමට එසේ තෝරාගත් උදාහරණය කොතරම් දුරට සමත් වී තිබේද යන්න තක්සේරු කරන්න.

- ඔබ කැමති සුපිරි වෙළෙඳ සන්නාමයක් හෝ ගෝලීය සන්නාමයක් පිළිබඳ අධ්‍යනය කරන්න. ජනප්‍රිය ආහාර සමාගම්වල මෙනුව තීරණය කිරීමට අර්ධ වශයෙන් බලපානු ලබන්නේ එම සමාගම ක්‍රියාත්මක වන රට, එම රටේ සංස්කෘතිය, මිනිසුන්ගේ රුචි අරුචිකම් සහ මනාපයන් ය. අවම වශයෙන් රටවල් 5ක් ආවරණය වන පරිදි පහත කරුණු පරීක්ෂා කරන්න:

  අ. ඇතැම් ආහාර සමාගම් අලෙවිසල්වල සමස්තයක් වශයෙන් ලබා දෙන හැඟීම සහ ඒවායේ පෙනුම සහ

  ආ. ඒවායේ මෙනුව, සහ

  ඇ. අලෙවි කරන ආහාර පානවල සමානකම් සහ වෙනස්කම් හඳුනාගෙන, ඉහත අ) සහ ආ) පිළිබඳ ඔබේ සොයාගැනීම් සඳහා හේතු විය හැකි කරුණු තක්සේරු කරන්න.

- ඇතැම් සුපිරි සන්නාමවල නිෂ්පාදන ජනප්‍රිය වූ විට, අනෙකුත් වෙළෙන්දෝ ඒවාට ඉතා සමාන ලාංඡනයක් සහ මෝස්තරයක් සහිත නිෂ්පාදන නිෂ්පාදනය කිරීමට පෙළඹෙන අතර එහිදී පාරිභෝගිකයන් මිලදී ගන්නේ සුපිරි වෙළෙඳ සන්නාමවල සත්‍ය නිෂ්පාදන යැයි නොමඟ යැවීමට ඉඩ පවතී. මෙවැනි අවස්ථා හඳුනාගෙන ඒවායේ ප්‍රකාශන හිමිකම් සහ ඊට සම්බන්ධ අනෙකුත් සදාචාරාත්මක ගැටලු සාකච්ඡා කරන්න.

ඇගයීම සහ නිර්දේශ

- වත්මන් වෙළෙඳ ප්‍රචාරණ සඳහා උදාහරණ සහ මාර්ගගත පර්යේෂණ සඳහා උපායමාර්ග විශ්ලේෂණය කිරීම
- වෙළෙඳ දැන්වීම් ව්‍යාපාර සඳහා දළ සැකසුම් නිර්මාණය කිරීම

වැඩිදුර සලකා බැලීම් සඳහා මාතෘකා

- අන්තර්ජාතික වෙළෙඳ ප්‍රචාරණය සහ සුපිරි වෙළෙඳ සන්නාම කටයුතු සඳහා, ක්‍රීඩා සහ විනෝදාස්වාද ක්ෂේත්‍රවල සුපිරි තරු චරිත සමඟ ගිවිසුම්වලට එලැඹීම
- අන්තර්ජාතික වෙළෙඳ ප්‍රචාරණය සහ සුපිරි වෙළෙඳ සන්නාම මගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, අන් ආගමික මත ඉවසීම, සෞඛ්‍ය පිළිවෙත් යනාදී දේශීය සංස්කෘතික සහ සමාජ භාවිතයන් කෙරෙහි ඇති කරන බලපෑම.

සම්පත් සහ ආශ්‍රිත ගන්ථ

මෙම සම්පත් බහුතරය උතුරු ඇමරිකාව වෙතින් ලබා ගන්නා ලද ඒවා වන අතර, ලොව පුරා භාවිතයට නුසුදුසු විය හැකි ය. ශික්ෂකයකයන් විසින්, ශිෂ්‍යයන් හට වඩාත් අදාළ වන විකල්ප දේශීය හෝ කලාපීය ඉගෙනුම් ද්‍රව්‍ය හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය.

Adbusters – www.adbusters.org – Offers a critique of advertising and popular culture; famous for its ‘spoof’ ads

Ads of the World – http://adsoftheworld.com/ – An advertising archive and forum discussing advertising work worldwide

Advertising Age – www.adage.com – An industry publication, with advertising costs, reports on strategies, etc.

Bernstein, D., & Bruce, K. (2020). The Law of Advertising, Marketing and Promotions.

USA: Law Journal Press.

Christopher A. Summers, Robert W. Smith, Rebecca Walker Reczek (2016). An Audience of One: Behaviourally Targeted Ads as Implied Social Labels. Journal of Consumer Research,

Volume 43, Issue 1, June. Pages 156–178, https://doi.org/10.1093/jcr/ucw012

Fowler, E., Franz, M., & Ridout, T. (2016). Political Advertising in the United States. Boulder: Westview Press.

Fueroghne, D. (2017). Law & Advertising: A Guide to Current Legal Issues. Maryland:

Rowman & Littlefield Publishers.

Hughes, A. (2018). Market Driven Political Advertising

Kleebpung, Nonthasruang (2010) Advertising and media literacy: young people and their understanding of the world of advertising in Australia and Thailand. PhD thesis, Victoria University.

Media and Information Literacy (video resource) https://www.youtube.com watch?v=lxSYtwaXo2M

Rejected Online – http://bestrejectedadvertising.com/html – Ads rejected by clients on aesthetic, commercial or strategic grounds. Also includes rejected, banned, spoof and most criticized ads

Social, Digital and Mobile Marketing. London: Palgrave McMillan.

The Merchants of Cool – Frontline – www.pbs.org – A document available online that explores how advertisers target youth

The Persuaders – Frontline – www.pbs.org – අලෙවිකරණ හා වෙළෙඳ ප්‍රචාරණ උපායමාර්ග, මිනිසුන් මිලදී ගන්නා දෙය කෙරෙහි පමණක් නොව, ඔවුන් තමන්ව මෙන්ම තමා වටා වූ ලොව දකින ආකාරය කෙරෙහිත් බලපෑම් ඇති කරන අයුරු මෙම වැඩසටහනින් ගවේෂණය කෙරේ. විනාඩි 90ක ධාවන කාලයකින් යුත් මෙම වාර්තා චිත්‍රපටයෙන් වෙළෙඳ ප්‍රචාරණ/අලෙවිකරණ ලෝකයේ ප්‍රවීණයන් සහ නිරීක්ෂකයන් පරාසයකගේ අදහස් විමසනු ලැබේ. සමස්ත වැඩසටහනම PBS වෙබ් අඩවිය ඔස්සේ කොටස් 6කින් මාර්ගගතව නැරඹිය හැකි ය. මෙම මොඩියුලය සඳහා, හැකිනම් High Concept Campaign and Emotional Branding වැඩසටහනෙහි 1වන හා 2වන පරිච්ඡේද බලන්න.

Think Literacy, Media, Grades 7–10 (2005) – A resource for creating public service announcements.
http://www.edu.gov.on.ca/eng/studentsuccess/thinkliteracy/library.html

http://saloproductions.com/public-service-announcements/psa-samples.php

http://www.un.org.za/public-service-announcement-on-the-effects-of-drugs

http://www.unodc.org/unodc/en/human-trafficking/human-trafficking-public-service-announcements.html

11වන මොඩියුලය:

කෘත්‍රිම බුද්ධිය, සමාජ මාධ්‍ය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා





"කෙනෙකුට යමක් ගැන නොසිතා සිතීම ගැන සිතිය නොහැකිය."

– Seymour Papert,
Mindstorms: Children, Computers, And Powerful Ideas, 2005

පසුබිම සහ තාර්කිකය

තීරණ ගැනීමේදී මානවයා තොරතුරු මත විශ්වාසය තබයි. අප සතුව සර්ව සම්පූර්ණ තොරතුරු ඇත්තේ නම්, එනම්, නිවැරදි මොහොතේ තීරණ ගැනීමට අවශ්‍ය සියලුම නිවැරදි තොරතුරු අප සතු වන්නේ නම්? සංකීර්ණ තීරණ-ගැනීමක් සඳහා අවශ්‍ය කරන තොරතුරු සියල්ලම අපට අවශ්‍ය කරන මොහොතේම ලබා ගැනීම බොහෝ විට කළ නොහැක්කක් මෙන්ම, සංකීර්ණ තීරණ-ගැනීමක් සඳහා අවශ්‍ය කරන සියලුම තොරතුරු එකවිට සකසා ගැනීමට අපගේ මොළයද අසමත්ය. කෘත්‍රිම බුද්ධිය (AI) වැනි පරිගණක තාක්ෂණය ඔස්සේ අපට පරිපූර්ණ තොරතුරු ලබා ගත හැකි බවට ඇතැම් ක්‍රියාකාරීහු විශ්වාස කරති. කෙසේ වුවද, මේ දක්වා එය මානුෂීය හෝ තාක්ෂණික හෝ වශයෙන් කළ හැක්කක් නොවේ.

කෙසේ වෙතත්, දත්ත රැස් කිරීම, ගබඩා කිරීම, සැකසීම සහ විශ්ලේෂණය කිරීම සහ තීරණ ගැනීම හෝ තීරණ ගැනීමට මිනිසුන්ට උපකාර කිරීම මගින් කෘත්‍රිම බුද්ධිය අපගේ ජනප්‍රිය තාක්ෂණික භාවිතයන් බොහොමයක් මෙහෙයවයි. කෘත්‍රිම බුද්ධිය වනාහී තනි මෙවලමක් නොව, මෘදුකාංග, දෘඩාංග, ඇල්ගොරිතම, ජාල ආදියෙන් සමන්විත සාමූහික පද්ධතියකි. කෘත්‍රිම බුද්ධි පද්ධති මෙහෙයවන ප්‍රධානතම අංගයක් වන්නේ ඇල්ගොරිතමයි. වදනේ සරලතම අරුතින් ගත් කල, ඇල්ගොරිතමක් යනු කිසියම් කාර්යයක් සම්පූර්ණ කිරීම සඳහා හෝ ගැටලුවක් විසඳීම සඳහා වන නීති හෝ උපදෙස් මාලාවක් ලෙස සැලකිය හැකි ය. එසේ බලන කල, ආහාර වට්ටෝරුවක්ද ඇල්ගොරිතමක් ලෙස සැලකිය හැකි ය.ඩිජිටල් තාක්ෂණ සන්දර්භය තුළ, ඇල්ගොරිතමක් පූර්ව-නිශ්චිත කාර්යයන් ඉටු කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර හෝ දත්ත සැකසිය යුතු ආකාරය පරිගණකයට දැනුම් දෙන අතරම, ලබා දී ඇති දත්ත පදනම් කරගනිමින් තීරණ ගැනීමද සිදු කරයි. පරිගණක ක්‍රමලේඛකයන් විසින් ඇල්ගොරිතම ක්‍රමලේඛනය කරනු ලැබේ. ඇල්ගොරිතම ගණනාවක් එක් රැස් කළ පද්ධතියකට වඩාත් සංකීර්ණ කාර්යයන් ඉටු කිරීමේ හෝ ගැටලු විසඳීමේ හැකියාව ඇත.

කෘත්‍රිම බුද්ධිය, සෞඛ්‍ය විනිශ්චයේ සිට සන්නිවේදන පද්ධති දක්වා විවිධ ක්ෂේත්‍ර සඳහා යොදා ගත හැක. යම් ස්ථානයක් නිශ්චයනය කරගන්නේ කෙසේ ද, නැතහොත් කිසිවක් භාෂා ගණනාවකින් පවසන්නේ කෙසේ ද ඇතුළු අපගේ බොහෝ ප්‍රශ්නවලට තෝරාගත් පිළිතුරු ලබා දීමට සමත් අතථ්‍ය සහායකයින් මාර්ගගතව පවතින අතර තාක්ෂණික මෙවලම් ඒ තුළට අන්තර්ගත කර ඇත.

රොබෝවරු සෑම තන්හිම පවතින්නක් බවට පත්වෙමින් තිබේ. ආපදා තත්ත්වයන්හි දී, හදිසි සැපයුම් වීවා කඩිනමින් අවශ්‍ය කරන අය වෙත ලබා දීම සඳහා කෘත්‍රිම බුද්ධි යෙදවුම් මානුෂීය ආධාර සලසන ආයතන හට උපකාරී වේ. සංකීර්ණ ගැටලු ආමන්ත්‍රණය කිරීම මෙන්ම ජීනෝම අනුක්‍රම නිර්ණය වැනි නව සොයාගැනීම පෙරට වඩා අඩු කාලයකින් සිදුකිරීම සඳහා

විද්‍යාඥයෝ කෘත්‍රිම බුද්ධිය මගින් දත්ත තොරතුරු බවට පරිවර්තනය කරන වේගය උපයෝගී කර ගනිති. ඉහළ යන තාක්ෂණික විසඳුම් ගණනාවක් තුළට කෘත්‍රිම බුද්ධිය අන්තර්ගත වත්ම, එය පොදු-අරමුණැති තාක්ෂණයක් ලෙස, එනම් අපගේ ජීවන රටාවේ සෑම පැතිකඩක් කෙරෙහිම දැඩි බලපෑමක් ඇති කරන බලවත් මෙවලමක් ලෙස සැලකේ. මෙහි දී පැන නැගෙන ප්‍රධාන පැනය වන්නේ එහි සංවර්ධනය හා මෙහෙයවීම පාලනය කෙරෙන්නේ කවුරුන් විසින් ද, කවර අරමුණක් සඳහා ද යන්න යි. මේ තාක් දුරට, එය සිදු කරනු ලබන්නේ බලවත් රටවල් හා කර්මාන්ත විසින් වන අතර, නොවැළැක්විය හැකි ලෙසටම, ඔවුන්ගේ අරමුණ වන්නේ තමන්ගේම යහපත සහ දෘෂ්ටි කෝණ ප්‍රවර්ධනය කිරීම වන අතර ඒවා සෑම විටම සෙස්සන්ගේ සුභසිද්ධිය හෝ දෘෂ්ටි කෝණය හා සම නොවේ. එමෙන්ම කෘත්‍රිම බුද්ධිය කිසිසේත්ම අපක්ෂාතී නොවේ - එය නිර්මාණය කර ඇත්තේ විශේෂිත ජන කොට්ඨාසවලට අයත්, විශේෂිත රැකියා නියුක්ති සබඳතාවලින් යුත් මිනිසුන් විසින් වන අතර, ඇල්ගොරිතම හා දත්ත කට්ටල නිරතුරුවම ඒ මේ අතට නැඹුරු වෙමින් පවතී. අතථ්‍ය සහායකයන් අතරින් බහුතරයකට වක්තරා ස්ත්‍රී පුරුෂ සමාජභාවයක් ආදේශ කර ඇති අතර, ඔවුන් ලබා දෙන ක්‍රමලේඛිත පිළිතුරුවලින් යම් යම් මතවාද හා පක්ෂග්‍රාහිතා පෙන්නුම් කරයි. භාෂා පරිවර්තන හැකියාවෙන් නිරූපණය වන්නේ ප්‍රධාන වූත්, තුරන්ව යාමේ තර්ජනයට ලක් නොවන්නා වූත් භාෂා පමණක් වන අතර, රොබෝවරුද නිර්මාණය වී ඇත්තේ පොදු පරිහරණයට වඩා පුද්ගලික පරිහරණය උදෙසා ය.

කෘත්‍රිම බුද්ධි පද්ධති තුළින් සැලසුම්කරණය, ඉගෙනුම, තර්කන හැකියාව, ගැටලු විසඳීමේ හැකියාව, දැනුම් නිරූපණය, අවබෝධය, චලනය, මෙහෙයවීම හා, අඩු මට්ටමක සමාජ බුද්ධියක් හා නිර්මාණශීලීත්වයක් වැනි මානව බුද්ධිය ආශ්‍රිත හැසිරීම්වලින් කිහිපයක් හෝ සාමාන්‍යයෙන් පෙන්නුම් කරයි.[86] විවිධාකාර වූ කෘත්‍රිම බුද්ධි ඇති හෙයින් ඊට තනි නිර්වචනයක් දීම අසීරු වේ. මෙම මොඩියුලය තුළින් යාන්ත්‍රික ඉගෙනුම, විශාල දත්ත විශ්ලේෂක, රටා හඳුනාගැනීම සහ සංජානන පද්ධති මෙන්ම එක් අරමුණැති කෘත්‍රිම බුද්ධිය. හා පොදු අරමුණැති 'කෘත්‍රිම බුද්ධිය' අතර වෙනස ඇතුළුව කෘත්‍රිම බුද්ධියේ විවිධ මාන පිළිබඳ විග්‍රහයක් ලබා දෙයි.

එහෙත්, "බුද්ධිමත් හැසිරීම්" අනුකරණය කිරීමටත්, ස්වාධීන තීරණ ගැනීමටත් හැකි වන පරිදි පරිගණක ක්‍රමලේඛනය කිරීමට ඇති හැකියාව දැඩි අවධානයෙන් සැලකිය යුතු කරුණකි. එහි දී පාලනය පිළිබඳ ගැටලු මතු වේ. අනෙක් අතට, මෙහිදී මානව අනුයාතත්වය සහ අදහස් ප්‍රකාශනයේ අයිතිය, පොදු අරමුණු සඳහා ඒකරාශී වීමේ අයිතිය සහ රැකියාව සඳහා වන අයිතිය ඇතුළු මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම පිළිබඳ ගැටලු පැන නගී. තමන්ට දැකීමට අවශ්‍ය කවරාකාරයේ අන්තර්ගතයක්ද යන්න තෝරා ගැනීමේ නිදහස තමන්ට තවදුරටත් අහිමි වේ දැයි, කෘත්‍රිම බුද්ධිය විසින් පෙරහන් බුබුලු (filter bubbles) හා තොරතුරු සයිලෝ (information silos) තව තවත් ගැඹුරු කරමින්, අවසානයේ නිර්මාණකරුවන්ගේ හඬ හා අන්තර්ගතවල ඇති විවිධත්වය හා බහුත්වය අවම කරනු ලබන්නේ දැයි පරිශීලකයෝ තැවෙති.

පුළුවන්නම් මම ලැජ්ජාවෙන් රතු වෙනවා: අධ්‍යාපනය තුළින් ඩිජිටල් කුසලතා තුළ ඇති ස්ත්‍රී-පුරුෂ සමාජභාවී භේද දුරු කරලීම (I'd Blush If I could

86. නික් හීත් ආයතනය තුළ කෘත්‍රිම බුද්ධිය හා යාන්ත්‍රික ඉගෙනුම කලමනාකරණය කිරීම (Managing AI and ML in the Enterprise)

(Closing the Gender Divides in Digital Skills through Education)[87] නම් යුනෙස්කෝ මූලාශ්‍රය මෙම ගැටලු සමහරක් කෙරෙහි අවධානය යොමු කරයි. මෙම මූලාශ්‍රය මගින්, ඩිජිටල් කුසලතා තුළ ඇති ස්ත්‍රී-පුරුෂ සමාජභාවී පරතරයේ අබණ්ඩ පැවැත්ම හා දැඩිබව නිරාකරණය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැලසීම මෙන්ම, "තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව පිළිබඳ විරුද්ධාභාසය" ගැන විමසිලිමත් වීමද සිදු කරයි. මෙම විරුද්ධාභාසයෙන් කියැවෙන්නේ පරිගණක විද්‍යාව හෝ එවැනි විෂයයන් සම්බන්ධයෙන් උසස් අධ්‍යාපනයට යොමු වන කාන්තාවන්ගේ අවම නියෝජනයක් ඇත්තේ ඉතා ඉහළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී සමානාත්මතාවක් ඇති රටවල් තුළ බවට යුනෙස්කෝව විසින් කරගත් අනාවරණයයි. තවද, නිෂ්පාදන සංවර්ධකයන් විසින් කෘත්‍රිම බුද්ධි හඬ සහායකයන් සඳහා තරුණ කාන්තාවන්ගේ කටහඬ යොදා ගනු ලැබීම තුළින් හානිදායක ස්ත්‍රී පුරුෂ සමාජභාවී පක්ෂග්‍රාහීතා අබණ්ඩව පවත්වා ගෙන යාම වැනි උදාහරණ මෙම ප්‍රකාශනය තුළින් පෙන්වා දෙන අතර, කෘත්‍රිම බුද්ධිය හරහා මෙන්ම එතුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී භේද තවදුරටත් පුළුල් වීම වළකා, ආපස්සට හැරවීම සඳහා නිර්දේශ ද ලබා දෙයි. එවැනි ඇතැම් හඬ සහායකයින් ක්‍රමයෙන් ඒකාකෘතිකව ස්ත්‍රී පුරුෂ සමාජභාවීකරණය වීම අවම වෙමින් පවතින නමුත්, එම සේවා ලබා දීම තවමත් වාචික භාෂා කිහිපයකට පමණක් සීමා වී ඇත.

කේම්බ්‍රිජ් ඇනලිටිකා (Cambridge Analytica) සිද්ධියෙන් කෘත්‍රිම බුද්ධිය විසින් මෙහෙයවනු ලබන අන්තර්ගතය සීමාකරණය කිරීම සහ ආරක්ෂණය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතියට කවරාකාරයෙන් බලපාන්නේදැයි පෙන්නුම් කරයි. අපකීර්තිමත් කේම්බ්‍රිජ් ඇනලිටිකා සිද්ධිය යනු ඡන්දදායකයන්ගේ අනුදැනුමකින් තොරව ඔවුන්ට බලපෑම් කිරීමට විශාල දත්ත භාවිත කළ අවස්ථාවකි. ඇතැම් සන්දර්භ තුළ, කෘත්‍රිම බුද්ධිය යනු ජනයා සුපරීක්ෂාව යටතේ තබා ගැනීම සඳහා වන මෙවලමක් ලෙස සැලකේ. සමාජ මාධ්‍ය සහ වෙනත් ඩිජිටල් සන්නිවේදන සමාගම් කෘත්‍රිම බුද්ධිය ඉතා විස්තීර්ණ ලෙස භාවිත කරති. උසස් යාන්ත්‍රික ඉගෙනුම පරිශීලක විසින් ජනිත අන්තර්ගත නිර්මාණය මත කවරාකාරයෙන් බලපාන්නේදැයි යන්න පිළිබඳව මෙන්ම, අලෙවිකරණය හා මිලදී ගැනීම පිළිබඳ තීරණවල අයහපත් හා යහපත් අනුමිතීන් පිළිබඳවද සමාජ මාධ්‍ය භාවිත සිද්ධි අධ්‍යයනයක් සපයයි. අධ්‍යාපනයේ දී, ශිෂ්‍යයන්ගේ චර්යා විග්‍රහ කිරීම සඳහා දත්ත විශ්ලේෂ භාවිත කිරීම ද අයහපත් හා යහපත් ගම්‍යාර්ථ තිබීමක් ලෙස සැලකේ.

මීට සමගාමීව, ඇල්ගොරිතම සහ ඔවුන් ප්‍රවේශ වන දත්ත සැලසුම් කිරීමේ දී සාමාන්‍යයෙන් පාරදෘශ්‍යතාවකින් තොර වීම දිගින් දිගටම සැලකිල්ලට ගත යුතු කරුණකි.

සදාචාරාත්මක සැලසුම්කරණය (Ethical by Design) සඳහා වූ ව්‍යාපාරය මගින් ඇල්ගොරිතමීය පක්ෂග්‍රාහීතාවට එරෙහි වන අන්දමින් කෘත්‍රිම බුද්ධියේ සැලසුම වර්ධනය කිරීමට උත්සාහ දරනු ලැබේ. අතීතයේ දී, මෙහි ප්‍රතිඵලයක් ලෙස පරිශීලකයෝ ජාතිය/ජන වර්ගය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ භාෂාව වැනි සාධක පදනම් කරගනිමින් චර්යා විග්‍රහයට හා ඒකාකෘතිකකරණයට ලක් වූහ. "මගේ දත්ත අයිති මටයි" (My Data belongs to me) යනු පාරිභෝගිකයන්ට හිමිකම්-දරන්නන් හට සිය පුද්ගලික දත්ත පිළිබඳ පාලනය සහ අයිතිය යළි අත්කර ගැනීමටත් සහාය වීම සඳහා වන තවත් සන්ධානයකි.

කෘත්‍රිම බුද්ධිය විසින් සපයනු ලබන අවස්ථා මෙන්ම සංකීර්ණ සදාචාරාත්මක හා සමාජයීය සැලකිලිමත් විය කරුණු එක්ව ගත් කල, කෘත්‍රිම බුද්ධියේ නවෝත්පාදනය පැහැදිලි සදාචාරාත්මක ප්‍රමිති සහ සමාජයීය ඉලක්ක තුළ මුල් බැසගත් මානව කේන්ද්‍රීය ප්‍රවේශය හා තුලනය කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කර පෙන්වයි. තව ද, පැහැදිලි අරමුණුගත්ව, විචාරශීලී ලෙස කෘත්‍රිම බුද්ධි පද්ධති හා සම්බන්ධ වීමට පරිශීලකයා සතුව තිබිය යුත්තේ කවරාකාරයේ දැනුමක්, කුසලතා හා ආකල්ප දැයි එහි දී ප්‍රශ්න කෙරේ. මෙකී නිපුණතා අතරට ක්‍රමලේඛනය/කේතනය වැනි ඩිජිටල් කුසලතා මෙන්ම විචාරාත්මක චින්තනය හා පුරවැසි සබඳතා වැනි මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව හා සෘජුව සම්බන්ධ මෘදු නිපුණතාද අයත් වේ. තාක්ෂණික මෙහෙයුම් සහ කෘත්‍රිම බුද්ධි පද්ධතිවල යෙදවුම් පිළිබඳ මෙන්ම ආර්ථික හා සමාජයීය සන්දර්භය පිළිබඳවද මූලික අවබෝධයක් ලබා ගැනීමට මෙම මොඩියුලය තුළින් පාඨකයාට හැකි වේ. මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා තුළින් සමාජ තුළ කෘත්‍රිම බුද්ධිය වඩාත් ප්‍රශස්ත අන්දමින් භාවිත කිරීමේ හැකියාව ලබා දෙන අයුරු වියින් පෙන්වා දෙයි.

87. I'd Blush If I could: Closing the Gender Divides in Digital Skills through Education. https://en.unesco. org/Id-blush-if-I-could

ඒකක

1වන ඒකකය :
කෘත්‍රිම බුද්ධිය පිළිබඳ මූලික තොරතුරු සහ සමාජ මාධ්‍ය තුළ කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීම පිළිබඳ අවබෝධ කරගැනීම

2වන ඒකකය :
කෘත්‍රිම බුද්ධිය සහ සමාජ මාධ්‍ය පිළිබඳ යුගය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා

3 වන ඒකකය
පුද්ගල හා සමාජ අයිතිවාසිකම්, තෝරා ගැනීම් සහ තාක්ෂණය

4 වන ඒකකය
සංවර්ධනය සඳහා කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය භාවිතය

1වන ඒකකය: කෘත්‍රිම බුද්ධිය පිළිබඳ මූලික තොරතුරු සහ සමාජ මාධ්‍ය තුළ කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීම පිළිබඳ අවබෝධ කරගැනීම

කාලසීමාව: පැය 3

ප්‍රධාන මාතෘකා:

- ඇල්ගොරිතම පිළිබඳ මූලික කරුණු
- විවිධාකාරයේ කෘත්‍රිම බුද්ධි ස්වයංකරණය, පොදු අරමුණැති කෘත්‍රිම බුද්ධි (General Purpose Ai), යාන්ත්‍රික ඉගෙනුම, ස්නායුක ජාල
- විශාල දත්ත, රටා හඳුනාගැනීම
- සමාජ මාධ්‍ය හා දත්ත මත දිවෙන ව්‍යාපාර ආකෘති

ඉගෙනුම් අරමුණු

1. ඇල්ගොරිතම නිර්මාණය වන අයුරු සහ ඒවායේ ක්‍රියාකාරීත්වය අවබෝධ කරගැනීම
2. විවිධාකාරයේ කෘත්‍රිම බුද්ධි හඳුනා ගැනීම සහ ඒවායේ ක්‍රියාකාරීත්වය අවබෝධ කරගැනීම
3. එදිනෙදා ජීවිතයේදී කෘත්‍රිම බුද්ධි වර්ගවලට අදාළ ඩිජිටල් විසඳුම් ලැයිස්තුගත කිරීම හා සිතියම් ගත කිරීම
4. අධ්‍යාපනය සඳහා කෘත්‍රිම බුද්ධිය උපයෝගී කරගත හැකි අවස්ථා සාකච්ඡාවට ලක් කිරීම
5. විවිධාකාරයේ සමාජ මාධ්‍ය හඳුනාගෙන ඒවායේ ව්‍යාපාර ආකෘති විග්‍රහ කිරීම
6. ඡායාරූප ටැග් කිරීම, හඬ හැඳුනුම් පහසුකම, චර්යා සංශෝධනය සහ චරිත විග්‍රහය ආදී කෘත්‍රිම බුද්ධියේ සමාජයීය බලපෑම පිළිබඳ ගවේෂණය.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

1. Kids Code Jeunesse සංවිධානය සහ යුනෙස්කෝව සඳහා වන කැනේඩියානු කොමිසමේ ඒකාබද්ධ ප්‍රාරම්භයක් වන ඇල්ගොරිතම සාක්ෂරතා ව්‍යාපෘතිය ශික්ෂකයන් හා ශිෂ්‍ය ප්‍රජාව විසින් නිරීක්ෂණය කරනු ලැබීම සුදුසු වේ. "ඇල්ගොරිතම යනු කිසියම් කාර්යයක් ඉටු කිරීම සඳහා හෝ ගැටලුවක් විසඳීම සඳහා පියවරින් පියවර ලබා දෙන සැලසුම් හෝ උපදෙස් මාලාවකි - එය තොරතුරු ලබා ගැනීමට හා අපට යම් ප්‍රතිඵල අත්කර දීමට උපකාරී වන දෑ සම්පාදනය කිරීමට කේතනය කරන්නන් විසින් භාවිත කරන වට්ටෝරු ලෙස සැලකිය හැකි ය." යන ඇල්ගොරිතම පිළිබඳ සරල නිර්වචනය පිළිබඳ අවධානය යොමු කරන්න. අනතුරුව, ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://algorithmliteracy.org/ සබැඳියෙන් දක්වා ඇති වීඩියෝ පටය නරඹන්න. ඉන්පසුව, ආවර්ජනය කිරීම, වැඩිදුර කියැවීම, ක්‍රියාමාර්ග ගැනීම හා ඇල්ගොරිතම හා සබැඳි ලෝකය හා සම්බන්ධ වී කටයුතු කිරීම සඳහා ව්‍යාපෘතියෙන් ලබා දී මාර්ගෝපදේශ අනුගමනය කරන්න.

2. ඔබ මාර්ගගතව සිදු කරන දෙයින් බොහෝමයක් මෙන්ම, ඩිජිටල් තාක්ෂණය භාවිත කරන අවස්ථා ද යම් කිසි ආකාරයකට වාර්තාගත වන අතර එම දත්ත එක්රැස් කරගනු ලැබේ. පෞද්ගලිකත්වය, දත්ත ආරක්ෂණය සහ ඔබ යන 8වන මොඩියුලය බලන්න. ඇත්ත වශයෙන්ම කියතොත්, ඇතැම් ඇල්ගොරිතම හෝ පරිගණක ක්‍රමලේඛ ලියැවී ඇත්තේ ඔබ පිළිබඳ දත්ත එක්රැස් කරගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන ය. එසේ එක්රැස් කරගත් දත්ත, ඔබ වෙත කවරාකාරයේ අන්තර්ගතයක් හෝ වෙළෙඳ දැන්වීම් යොමු කළ යුතු ද යන්න ඇතුළුව විවිධ අරමුණු සඳහා ඔබගේ චරිත සටහන් විග්‍රහයක් (profile) නිර්මාණය කිරීමට, මෙම ඇල්ගොරිතම හා පරිගණක ක්‍රමලේඛ හෝ එවැනි

වෙනත් ඇල්ගොරිතම හා ක්‍රමලේඛ තුළ භාවිතයට ගැනේ. විශේෂඥ මතයට අනුව ඇල්ගොරිතම වර්ග බොහෝ ගණනක් තිබුණද, මූලික වර්ග හයක් දක්වා තිබේ.

a. සමාවර්ත ඇල්ගොරිතම (Recursive algorithms)
b. බණ්ඩිත ඇල්ගොරිතම (Divide and conquer algorithms)
c. ගතික ක්‍රමලේඛන ඇල්ගොරිතම (Dynamic programming algorithms)
d. අවස්ථාගෝචර ඇල්ගොරිතම (Greedy algorithms)
e. සැඩ බල ඇල්ගොරිතම (Brute force algorithms)
f. සර්ව-භව්‍යතා ඇල්ගොරිතම (Backtracking algorithms)

මෙම ඇල්ගොරිතම පිළිබඳ විස්තර සහ ලක්ෂණ සොයා බැලීම සඳහා ශිෂ්‍යයන්ට මගපෙන්වන්න. මෙම ලක්ෂණ පිළිබඳ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා මාලාවක් පැවැත්වීමට මගපෙන්වන්න. මෙම ඇල්ගොරිතම භාවිතයට ගන්නා ජනප්‍රිය ඩිජිටල් මෙවලම් කිහිපයක් නම් කරන්න. එයින් ඇති ප්‍රතිලාභ කිහිපයක් නම් කරන්න. ඉන් ඇති විය හැකි අනපේක්ෂිත බලපෑම් කිහිපයක් නම් කරන්න. එහි පාලනය ඇත්තේ කවුරුන් අත ද, එහි ගම්‍යාර්ථ මොනවාද?

3. ඇල්ගොරිතම යනු මොනවාද සහ ඒවා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ මූලික අදහසක් මේ වන විට ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් අතර තිබිය යුතුය. ඇල්ගොරිතම විනිවිදභාවයක් පවත්වා ගැනීම සහ ඇල්ගොරිතම අධීක්ෂණයට ලක් කිරීම අවශ්‍ය වීමට හේතු පිළිබඳව වඩාත් ගැඹුරුන් අධ්‍යයනය කිරීමට ඔවුනට මග පෙන්විය යුතුය. කෘත්‍රිම බුද්ධිය හෝ ඇල්ගොරිතම අතර සබඳතා සහ මතයක් දැරීමේ අයිතිය හා අදහස් ප්‍රකාශනයේ අයිතිය ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුගේ වාර්තාව (United Nations Special Rapporteur report on the relationships between AI or algorithms and the promotion and protection of the right to freedom of opinion and expression) කියවා, උධෘත උපුටනය කරන්න. https://www.undocs.org/A/73/348. පහත දක්වා ඇති ආකාරයේ ප්‍රශ්න නගන්න: කවර තොරතුරකට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ද, ලබා නොදිය යුතු ද, එමෙන්ම කවර තොරතුරක් ඇතුළත් කළ යුතු ද, බැහැර කළ යුතු ද යන්න කෙරෙහි ඇල්ගොරිතම තුළින් ඇති කරන්නේ කවරාකාරයේ බලපෑමක් ද? එමගින් පරිශීලකයාගේ නිදහස සීමා කළ හැකිද? කෘත්‍රිම බුද්ධි හෝ ඇල්ගොරිතම මානව හිමිකම් ප්‍රතිපත්ති මත පදනම්ව නිර්මාණය වී ඇති බවට ජනතාව තහවුරු කරගන්නේ කෙසේ ද?රාජ්‍ය ක්‍රියාකාරීන්, පුද්ගලික අංශය හා සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් ගෙන ආ යුතු ප්‍රධාන යාන්ත්‍රණ කිහිපයක් නම් කරන්න.

4. තමන් පරිගණක ක්‍රමලේඛනයේ යෙදීමට උගත්තේ නම් තමන් විසින් සංවර්ධනය කෙරෙනු ඇත්තේ හෝ නොකෙරෙනු ඇත්තේ කවර වර්ගයට අයත් ඇල්ගොරිතම ද යන්න ශිෂ්‍යයන්ට යෝජනා කිරීමට මගපෙන්වන්න. මෙම ඇල්ගොරිතම භාවිතයෙන් වඩාත්ම ප්‍රතිලාභ අත්වන්නේ කා හටද, ඒ ඇයි යන පැනයට ඔවුන්ගෙන් පිළිතුරු ලබාගන්න. අනතුරුව එවැනි ඇල්ගොරිතම දැනටමත් ඇත්දැයි මෙන්ම ඇත්නම් ඒ කොහේදැයි යන්න සොයා බලන ලෙස ඔවුනට මග පෙන්වන්න. එහි දී ඔවුන් විසින් කිසියම් ක්‍රියාමාර්ගයක් ගත යුතු නම් ඒ මොනවාද?

5. කණ්ඩායම් ක්‍රියාකාරකම් හෝ කේවල ක්‍රියාකාරකම්. කෘත්‍රිම බුද්ධිය භාවිතයට ගන්නා බවට හඳුනා ගනු ලබන විවිධ යෙදවුම් ලයිස්තුවක් කණ්ඩායම විසින් සැකසිය යුතු ය. සරල ස්වයංක්‍රියකරණය සහ කෘත්‍රිම බුද්ධිය අතර වෙනස හඳුනාගැනීමට ඔවුන්ව දිරිමත් කළ යුතු ය.

6. කණ්ඩායම් සාකච්ඡා: මෙම යෙදවුම් ක්‍රියාකරන ආකාරය නිර්ණය කිරීම සඳහා හඬ හැඳිනුම හා මුහුණු හැඳිනුම, ජායාරූප ටැග් කිරීම, ස්වයංක්‍රීය මෝටර්රථ, චැට්බොට්, රොබෝවරු සහ වර්තමාන ජීවිතයේ දී කෘත්‍රිම බුද්ධියේ වෙනත් පොදු භාවිත පිළිබඳ සාකච්ඡා කරන්න. මෙම අභ්‍යාසයට කෘත්‍රිම බුද්ධිය අධ්‍යාපනය සඳහා යොදාගැනීම පිළිබඳ සාකච්ඡාවක්ද ඇතුළත් කළ හැකි ය. එක් එක් කෘත්‍රිම බුද්ධි වර්ගයට වර්ණවත් කාඩ්පත් භාවිත කරන්න. සම්පූර්ණ ලයිස්තුව පෝස්ටර් මත ගොනු/පොකුරු ලෙස දැක්විය හැකි ය.

7. තමන් භාවිත කරන්නේ කවර කෘත්‍රිම බුද්ධි යෙදවුමදැයි යන්න මෙන්ම තමන්ට වඩාත් ප්‍රයෝජනවත් වන්නේ ඉන් කවරක්ද සහ ඊට හේතුව එකිනෙකාට විස්තර කරන ශිෂ්‍යයෝ යුගල කරන්න. මෙම අභ්‍යාසයට කෘත්‍රිම බුද්ධිය අධ්‍යාපනය සඳහා යොදාගැනීම පිළිබඳ සාකච්ඡාවක්ද ඇතුළත් විය යුතු ය.ඒ අනුව, කණ්ඩායමේ සෑම සාමාජිකයෙක්ම සිය අදහස මිනිත්තුවක කාලයක් තුළ කණ්ඩායමට ඉදිරිපත් කළ යුතු ය. හොඳම අදහස තෝරා එය අගය කළ යුතුය. විවිධාකාර වූ න්‍යාය පත්‍ර ඇති ආයතනික සැපයුම්කරුවන් මත යැපීම මෙන්ම, ප්‍රත්‍යෝයිකීකෘත හා සමාජයීය ඉගෙනුම අතර වෙනස පිළිබඳ ගැටලුව වැනි සාධක සාකච්ඡාවට බඳුන් විය යුතු ය.

8. සමාජ මාධ්‍ය භාවිත සිද්ධියක් ලෙස ගෙන, සමාජ මාධ්‍ය තුළ කෘත්‍රිම බුද්ධි කරන ආකාරය, සමාජ මාධ්‍ය තුළ භාවිත වන කෘත්‍රිම බුද්ධි වර්ග මෙන්ම, සමාජ මාධ්‍ය තුළ කෘත්‍රිම බුද්ධි භාවිත කිරීමට හේතු පැහැදිලි කරමින් ශිෂ්‍යයන් විසින් රචනාවක් ලිවීම හෝ කරුණු පහක් දක්වා සිටීම හෝ කළ යුතු ය.

9. සමාජ මාධ්‍ය අඩවියකට වැඩිදුර දත්ත ලබා ගන්නේ කෙසේද? එය වැදගත් වන්නේ ඇයි? සමාජ මාධ්‍ය ආශ්‍රිත ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පරිකල්පනය කිරීමට ශිෂ්‍යයන් හට යෝජනා කළ හැකි ය. අනතුරුව ඔවුනට කණ්ඩායම් වශයෙන්, ඔවුන්ගේ 'නව්' සමාජ මාධ්‍ය ආශ්‍රිත ව්‍යාපාරයට වැඩිදුර දත්ත ලබා ගැනීමට ඉඩ සැලසෙන ආකාරයේ කල්පිත ව්‍යාපාර උපායමාර්ග සංවර්ධනය කළ හැකි ය.

10. කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත විවිධ විසඳුම් ඔවුන්ගේ ජීවිතය කෙරෙහි ඇති කර ඇති බලපෑම පිළිබඳ කණ්ඩායම් සාකච්ඡා පවත්වන්න. මූලික ප්‍රශ්න : එය අවශ්‍ය දෙයක් ද, ප්‍රයෝජනවත් දෙයක් ද, නැතහොත් මගහැර සිටිය යුතු දෙයක් ද? ශික්ෂකයන් හට තමන්ගේම ප්‍රශ්නද මෙහිදී ඉදිරිපත් කළ හැකි ය.

2වන ඒකකය: කෘත්‍රිම බුද්ධිය සහ සමාජ මාධ්‍ය පිළිබඳ යුගය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා

කාල සීමාව: පැය 03

ප්‍රධාන මාතෘකා

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය සඳහා අදාළ වන්නේ ඇයි?
- කෘත්‍රිම බුද්ධිය සහ සමාජ මාධ්‍ය සඳහා අවශ්‍ය යැයි යෝජනා කෙරෙන නිපුණතා මොනවාද?
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා සහ කෘත්‍රිම බුද්ධිය සහ සමාජ මාධ්‍ය සඳහා අවශ්‍ය නිපුණතා එක හා සමානද?
- කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය පරිසරයක් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා යොදා ගැනීම.

ඉගෙනුම් අරමුණු

මෙම මොඩියුලය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව අත්කර ගැනීම මගින් කෘත්‍රිම බුද්ධියේ සමාජයීය සන්දර්භය සහ කෘත්‍රිම බුද්ධි පද්ධති හා විචාරාත්මක ලෙස සබඳතා පවත්වා ගන්නා අයුරු පිළිබඳ ශිෂ්‍යයන්ට වඩාත් හොඳ අවබෝධයක් ලබා ගත හැක්කේ කෙසේද යන්න විග්‍රහ කරන්න.
- කෘත්‍රිම බුද්ධිය සහ සමාජ මාධ්‍ය සඳහා අවශ්‍ය නිපුණතා සහ ඒවා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළ වන ආකාරය හඳුනාගෙන ඒවා විග්‍රහ කරන්න.
- කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය පරිසර සඳහා මාධ්‍ය තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිපුණතා යොදා ගත හැක්කේ කෙසේද යන්න අවබෝධ කර ගැනීම

මෙම ඒකකයෙන් කෙරෙන නිපුණතා මට්ටම

මූලික

සැලකිලිමත් විය යුතු කරුණු සහ සබැඳුම්

1930 සහ 1960 දශකවල මාධ්‍ය සාක්ෂරතාව සහ තොරතුරු සාක්ෂරතාව යන සංකල්ප බිහි වූ අවධියේදී, අද අපගේ සන්නිවේදන මාධ්‍ය තුළ පුළුල් ලෙස ආධිපත්‍යය දරන සමාජ මාධ්‍ය සහ කෘත්‍රිම බුද්ධි පද්ධති බිහිව නොතිබුණි.

ඇත්ත වශයෙන්ම කියතොත්, අප අද හඳුනන පරිගණකය පවා එවක බිහිව නොතිබුණි. එවක අවධානය යොමුව තිබුණේ ගුවන්විදුලිය සහ රූපවාහිනිය වැනි සාම්ප්‍රදායික මාධ්‍ය හරහා සම්ප්‍රේෂණය වන

තොරතුරු සත්‍යාපනය කිරීම සහ දේශපාලන ප්‍රචාරක පණිවුඩ කෙරෙහි ය. මාධ්‍ය තුළ නිරූපණ ගැටලු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම (6වන මොඩියුලය බලන්න), වෙළෙඳ ප්‍රචාරණ දැන්වීම් සහ ප්‍රවෘත්ති හා සබඳතා පවත්වන්නේ කෙසේද මෙන්ම, යථාර්ථය නිරූපණය වන ආකාරයෙන් මාධ්‍ය සන්දේශ ගොඩනගා ඇත්තේ කෙසේද (10වන මොඩියුලය බලන්න) ආදිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ද ඒ හා සමානවම වැදගත් වේ. අන්තර්ජාලය, සමාජ මාධ්‍ය හා කෘත්‍රිම බුද්ධියේ ආගමනයත් සමග වුවද අවධානයට පාත්‍ර විය යුතු එකී මූලික කරුණු නොවෙනස්ව පවතී.කෙසේ වෙතත්, ඇතැම් ව්‍යාපාර ආකෘති තුළ නව තාක්ෂණය භාවිත ගැනෙන ආකාරය ඔස්සේ මිනිසුන් එකිනෙකා හා සම්බන්ධ වන ආකාරය, සමාජයීය වශයෙන් අන්තර් ක්‍රියා කරන ආකාරය සහ අවට ලෝකය ඉගෙන ගන්නා සහ තේරුම් ගන්නා ආකාරය දැඩි විපර්යසායකට ලක් කර තිබීම හේතුවෙන් මෙම කරුණු වඩාත් විශාලනය වී වඩාත් සංකීර්ණ බවට පත් වී ඇත. නිදසුනක් ලෙස සමාජ මාධ්‍ය හරහා කෙරෙන සමාජ අන්තර්ක්‍රියා සියල්ලම : ලිඛිත සන්දේශ, අනුරූප, හඬපට, වීඩියෝ පට, චිත්‍ර, ඉමෝජි, කැමැත්ත පලකිරීම්, බෙදාගැනීම් ආදී) පෙළ ලෙස ආකේතනය වේ. තවද, එවැනි සංකේත මුළුමනින්ම අලුත් ඒවා නොවන නමුත්, සාමාන්‍යයෙන් භෞතිකව විවිධ ස්ථානවල සිට එකිනෙකා හා සම්බන්ධ විය යුතු, එහෙත් වර්තමානයේ පොදු අතථ්‍ය ස්ථානවල සිට සම්බන්ධ විය හැකි ආකාරයේ සාම්ප්‍රදායික සම්මුඛ සන්නිවේදන මාදිලියට සමගාමීව සමාජ මාධ්‍ය විසින් මේවාද ලබා දේ. සංස්කෘතික හා සමාජයීය අත්දැකීම්වල බලපෑම මත නිරන්තරයෙන් වෙනස් වන්නා වූ දෑ පවසන හා බෙදා ගන්නා එකිනෙකා හඳුනන සහභාගිවන්නෝ මෙන්ම නාඳුනන්නෝද මීට සහභාගී වෙති.[88] සමාජ මාධ්‍ය හා තාක්ෂණික උපාංග මෙන්ම වේදිකා මතට තවත් ස්තරයක් ලෙස කෘත්‍රිම බුද්ධිය එක් කිරීම මගින් ඉහත සඳහන් කළ අවධානයට ලක් කළ යුතු කරුණු තව දුරටත් විස්තාරණය වන අතර නව සැලකිය යුතු කරුණු බිහි කරයි. දත්ත විශාල ප්‍රමාණයක් එක්රැස් කිරීමේ කටයුත්ත කෘත්‍රිම බුද්ධි පද්ධති මගින් පහසු කර ඇති අතර, එම දත්ත සකස් කර ඉන් ඉගෙනුම ලැබීමේ හැකියාව ද එම පද්ධතිවලට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය පුරවැසියන් සඳහා ධනාත්මක හෝ ඍණාත්මක ප්‍රතිඵල ඇති කළ හැකි තීරණ ගැනීම පිළිබඳ බලය ලබා දීම හෝ නිර්ණය කිරීම එමගින් සිදු කරයි.

11.1 රූපසටහන: කෘත්‍රිම බුද්ධි පද්ධතිවල මූලික ලක්ෂණ



මූලාශ්‍රය: Long, B. and Magerko, D. (2020)[89]වෙතින් අන්තර්ගතය ලබා ගන්නා ලදි

88. Livingstone, S. (2014) Developing social media literacy: How children learn to interpret risky opportunities on social network sites. Communications. The European Journal of Communication Research, 39(3): 283–303.
89. CHI '20, April 25–30, 2020, Honolulu, HI, USA © 2020 Copyright is held by the owner/author(s). Publication rights licensed to ACM. ACM 978-1-4503-6708-0/20/04…$15.00 https://doi. org/10.1145/3313831.3376727

සමාජ මාධ්‍ය හා කෘත්‍රිම බුද්ධි පද්ධති සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු කරුණු සහ එම කරුණුවල බරපතල බව සැහැල්ලු කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව උපකාර වන අයුරු පහත 11.1 වගුවෙන් විග්‍රහ කෙරේ. මීළඟ ඡේදයෙන් කෘත්‍රිම බුද්ධියේ ඇති ප්‍රතිලාභ ගණනින් කිහිපයක් පිළිබඳව අවධානය යොමු කෙරෙනු ඇත.

11.1 වගුව: කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් හට ගත් සැලකිය යුතු කරුණු ආමන්ත්‍රණය කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව භාවිත කිරීම

කෘත්‍රිම බුද්ධිය සහ සමාජ මාධ්‍ය පිළිබඳ සැලකිය යුතු කරුණුවලින් තෝරාගත් කිහිපයක්	**මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඊට සහය වන්නේ කෙසේද?**	**සබැඳුම්**
1. ඔබගේ දත්ත එක් රැස් කෙරෙන්නේ කවර අන්දමකටද, ඒවා භාවිත කෙරෙන්නේ කවරාකාරයටද?	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි මධ්‍යගත, පුළුල් නිපුණතාවක් යනු කාර්යක්ෂම ලෙස තොරතුරු වෙත ප්‍රවේශ වීම සහ ඒවා භාවිත කරන ආකාරයයි. දත්ත සදාචාරාත්මක ලෙස භාවිත කිරීම, ප්‍රකාශන අයිතිය හා බුද්ධිමය දේපළ පිළිබඳ අයිතිය මෙන්ම තොරතුරු භාවිතය ආශ්‍රිත පෞද්ගලිකත්ව අයිතීන් ආදිය මෙයින් ආවරණය වේ.	පෞද්ගලිකත්ව අයිතීන්: තොරතුරු භාවිතය පිළිබඳ සාකච්ඡා කළ යුතු අදාළ කරුණු අතර සාමාන්‍යයෙන් එකිනෙකා ඇසුරු කිරීමට හා සම්බන්ධ වීමට ඇති අයිතිය, තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඇති අයිතිය, අදහස් ප්‍රකාශනයේ නිදහස මෙන්ම වෙනත් මානව හිමිකම් ද මීට අයත් වේ.
2. අනුමතිය හා පෞද්ගලිකත්වය උල්ලංඝනය වීම් පිළිබඳ ගැටලු	ඉහත අංක 1 හි දක්වා ඇති පරිදි (මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පුද්ගලයකුගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරන්නා වූ ද, අන්‍යයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කරන්නා වූ ද ආරක්ෂක මෙවලමක් ලෙස මෙන්ම දත්ත ආරක්ෂණය තහවුරු කිරීමට රාජ්‍ය වෙත උපදෙස් දෙන මෙවලමක් ලෙස ක්‍රියාකරන ආකාරය 8වන මොඩියුලයේ දක්වා ඇත)	ඉහත අංක 1 හි දක්වා ඇති පරිදි වේ.
3. අඥාතභාවය	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් හෙබි පුද්ගලයෝ අඥාතභාවයේ වැදගත්කමත්, අඥාතභාවය ආරක්ෂා කළ යුතු හෝ නොකළ යුතු සිද්ධි පිළිබඳවත්, එසේ කළ යුතු හේතුවත් පිළිබඳ විටහා ගෙන සිටිති.	පෞද්ගලිකත්වයට අඥාතභාවය අදාළ වන අතර එහෙයින්ම ඉහත තර්ක මෙහිදී ද අදාළ වේ. ජනතාවට නිදහසේ සිය අදහස් ප්‍රකාශ කිරීමටත්, රහස් හෙළි කරන්නන් හා ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමටත් අඥාතභාවය අතිශය වැදගත් වන බව ඕනෑම ශික්ෂකයකු/ශිෂ්‍යයකු ගැඹුරින් සැලකිල්ලට ගත යුතු කරුණකි. රජයේ නිලධරයන් හා මහා පරිමාණ ව්‍යාපාර විනිවිදභාවයෙන් හා වගවීමෙන් කටයුතු කිරීමට එය රුකුලක් වේ.
4. පරිගණක ක්‍රමලේඛ හෝ ඇල්ගොරිතම තුළ පක්ෂග්‍රාහිතා ඇති වන්නේ කේතක පක්ෂග්‍රාහිතාව හෝ දත්ත පක්ෂග්‍රාහිතාව හේතුවෙනි.	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ තවත් ප්‍රධාන නිපුණතාවක් වන්නේ තොරතුරු හා සන්දේශවල ඇති පක්ෂග්‍රාහිතා විශ්ලේෂණය කිරීමේ හැකියාවයි. තොරතුර කවුරුන් විසින්, කවර අරමුණක් සඳහා නිර්මාණය කරන ලද්දක් ද, එහි අඩංගු නොකළ දේ මොනවාද, එම තොරතුර පතුරුවා ලීමෙන් වැඩිම ප්‍රතිලාභයක් අත්වන්නේ කා හටද, එයින් පාඩුවක් සිදුවන්නේ හෝ එය අවාසිදායක වන්නේ කා හටද යන්න මෙම සන්දර්භයට අදාළ වේ. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 1වන සහ 6වන මොඩියුල බලන්න	සාම්ප්‍රදායික ප්‍රවෘත්ති හා මාර්ගගත මෙන්ම මාර්ග අපගත පරිසර තුළ දී පක්ෂග්‍රාහිතාව පිළිබඳ ගැටලුව විසඳීමේ දී යොදා ගන්නා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා ඩිජිටල් තොරතුරු, පරිගණක කේතනය හා ඇල්ගොරිතම කෙරෙහි ද අදාළ වේ.
5.සාමාන්‍ය වශයෙන් ගත් කල විවිධත්වයෙන් හා බහුත්වයෙන් යුත් පරිසරයක් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ තවත් නිපුණතාවක් වන්නේ නියෝජනය වටහා ගැනීම ය.	මේ පිළිබඳව සහ මාධ්‍ය හිමිකාරිත්වය හා බහුත්වය සම්බන්ධ වැඩිදුර තොරතුරු සඳහා 2වන සහ 13වන මොඩියුල බලන්න. විවිධ ජනවාර්ගික, සංස්කෘතික හෝ සමාජ කණ්ඩායම්වල හඬ නිරූපණය වන බවට අවබෝධ කරගැනීම, විශ්ලේෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව උපකාරී වේ. අපට තොරතුරු ලැබෙන්නේ එකම මූලාශ්‍රයකින් ද නැතහොත් කිහිපයකින් පමණක් ද?	තොරතුරු ප්‍රවාහය පාලනය කිරීමට යම් මාධ්‍ය සංවිධානයක හෝ ප්‍රවෘත්ති ආයතනයක හෝ රාජ්‍ය ආයතනයක සංස්කාරකවරකු හට ඇති හැකියාව පරිද්දෙන්ම, අපට අසන්නට දකින්නට හා කියවන්නට ලැබෙන දේට බලපෑම් කිරීමට කෘත්‍රිම බුද්ධියට හා ඇල්ගොරිතමට හැකියාව ඇති බවත්, එය එසේ සිදුවන බවත් මෙහිදී සැලකිලිමත් විය යුතු කරුණ වේ. කෘත්‍රිම බුද්ධිය පුහුණු කර ඇත්තේ එක් ජනවිකාසයක අත්දැකීම් පමණක් පිළිඹිබු කරමින් පටු පදනමක සිට නම්, ප්‍රතිඵලය ලෙස එවැනිම පටු යෙදවුම් බිහි වනු ඇත.

6. සමාජ හා ආර්ථික විෂමතා	ඉහත අංක 5 දක්වා ඇති පරිදි වේ. තවත් අදාළ කරුණක් වනුයේ - විශේෂිත සමාජ-ආර්ථික තත්ත්ව සහ සමාජය තුළ සිටින යම් පුද්ගල කණ්ඩායම් වත්මන් තොරතුරු හා සන්නිවේදන පරිසර විද්‍යාත්මක තත්ත්වය යටතේ වඩා වැඩි ප්‍රතිලාභ අත් කරගන්නේ ද, එසේ නම් ඊට හේතුව කුමක් ද? තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ නැඹුරුතා හඳුනාගැනීමට සහාය වීමෙන් මෙන්ම ප්‍රති ආඛ්‍යාන හා වඩාත් සමතුලිත හා සත්‍යාපනය කළ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ආන්තිකරණයට ලක් වූ විශේෂ කණ්ඩායම් සහ වෙනත් පිරිස් සවිබලගැන්වීමෙන් ද, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සහ ජනවාර්ගික වෙනස්කොට සැලකීම පිළිබඳ ගැටලුව ආමන්ත්‍රණය කිරීමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව උපයෝගී කරගත හැකි ය.	තොරතුරු වෙත ප්‍රවේශය සමාජ හා ආර්ථික සමානාත්මතාව කෙරෙහි බලපෑමක් ඇති කරයි (1වන මොඩියුලය බලන්න). නිදසුනක් ලෙස, තොරතුරු, ඩිජිටල් තාක්ෂණය හා මාධ්‍ය වෙත කාන්තාවන්ට ප්‍රවේශයක් නොමැති වීම, ඔවුන්ට සිය අදහස් ප්‍රකාශ කිරීමට සහ සමාජ හා ආර්ථික සංවර්ධනයට සම්පූර්ණයෙන්ම සහ අර්ථවත් ලෙස සහභාගී වීමට ඇති ප්‍රවේශය හා අවස්ථා අහුරාලයි.
7. ආරක්ෂාව සහ සුරක්ෂිතතාව	මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුද්ගලයන් හට සාවද්‍ය තොරතුරු, නුසුදුසු අන්තර්ගත, කිසිවකුට හානි පැමිණවිය හැකි හෝ අන්‍යයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයේ තොරතුරු හෝ අන්තර්ගත මෙන්ම, නුසුදුසු වෙළෙඳ ප්‍රචාරණ, විශේෂයෙන්ම දරුවන් ඉලක්ක කරගනිමින් සිදු කෙරෙන ප්‍රචාරණ හඳුනා ගැනීමේ වඩාත් හොඳ හැකියාවක් ඇත. මාර්ගගත අන්තර්ක්‍රියා තුළින් පුද්ගලයන් කරා පැමිණිය හැකි මානව හිමිකම්වලට සිදුවන හානි පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 9වන මොඩියුලය බලන්න.	ඩිජිටල් යුගයේ දී, සුරක්ෂිතභාවය හා ආරක්ෂාව භෞතික සබඳතා ඉක්මවන්නකි. එය හානිදායක මාර්ගගත තොරතුරු මෙන්ම අතථ්‍ය අන්තර්ක්‍රියා ද සැලකිල්ලට ගනී. වැඩිදුර තොරතුරු සඳහා 9වන මොඩියුලය බලන්න.
8. දුර්බෝධ ප්‍රයෝග හෙවත් 'ඩීප්ෆෙක්' හා සාමාන්‍ය දුස්තොරතුරු	ඉහත අංක 4 හි හා අංක 7 හි දක්වා ඇති පරිදි වේ. සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු නිරාකරණය කිරීම බහුවිධාකාර අභියෝග යකි. ඒ සඳහා මූලාශ්‍රය පමණක් නොව, සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරුවලට ඇති ඉල්ලුම සහ ඒවායින් මුදල් ඉපැයීම ආමන්ත්‍රණය කිරීමට ද මැදිහත්වීමක් අවශ්‍ය වේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා උපාර්ජනය කරගැනීම මගින් පුද්ගලයන්ට හැකිතාක් දුරට ස්වයං-ආරක්ෂණය වීමට හැකි වීම තිරසරත්ව ප්‍රහේලිකාවේ කොටසක් වේ. (නිදසුනක් වශයෙන් 9වන මොඩියුලය බලන්න)	ඉතාමත්ම ඉහළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවක් ඇති පුද්ගලයකුට පවා 'ඩීප්ෆෙක්'. හඳුනා ගැනීම අභියෝගයක් වනු ඇත. බහුතරයක් සිද්ධිවල, එවැනි වැරදි තොරතුරු හඳුනා ගැනීමට අවශ්‍යතා නිපුණතා අතරට වෝහාරික විද්‍යා කුසලතා ද අයත් වේ. ස්වයංක්‍රිය බොට්ස් වැනි මෙවලම් හරහා කෘත්‍රිම බුද්ධිය අවභාවිත කිරීම හරහා ඩීප්ෆෙක් ඇතුළුව, දුස්තොරතුරු නිර්මාණය කිරීම හා පැතිරවීම උත්සන්න කරවන ආකාරයත් ඊට හේතුවත් පිළිබඳ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂර ශිෂ්‍යයෝ අවබෝධ කර ගනිති. මෙවැනි ව්‍යාජෝක්ති සලකුණු කර පරීශීලකයන් හට දැනුම් දීමට අන්තර්ජාල සන්නිවේදන සමාගම්වලට පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් විශ්වසනීය යුතුකමක් ඇති බව බොහෝ දෙනෙක් තර්ක කරති. නව දැනුම නිර්මාණය කිරීමට සහ ඉලක්කගත බෙදා හැරීම් සඳහා පහසුකම් සැලසීමට ගබඩා කර ඇති තොරතුරු නිර්මාණය කිරීමට, සංවිධානය කිරීමට, ගබඩා කිරීමට, බෙදා හැරීමට සහ ඉගෙන ගැනීමට යන්ත්‍ර ස්වාධීනව ක්‍රමලේඛනය කළ හැකි තත්ත්වයක් යටතේ, සාවද්‍ය තොරතුරු සන්දර්භය තුළ මෙම හැකියාවන් අවභාවිතයට ලක් වීම පාලනය කිරීමට අපහසු කටයුත්තකි.
9. මානව හිමිකම් ප්‍රතිපත්ති කෙරෙහි ඇති ගරුත්වය	ඉහත අංක 1 සහ 1වන මොඩියුලය බලන්න. සියලු ආකාරයේ සංවර්ධන කටයුතු සඳහා කෘත්‍රිම බුද්ධිය ධනාත්මක ලෙස භාවිත වන නමුත්, එය අවභාවිත කිරීම තුළින් සෑම ආකාරයකටම මානව හිමිකම්වලට බලපෑම් ඇති විය හැකි ය. උදාහරණයක් ලෙස, ගුණාත්මක අධ්‍යාපනයක් හා තොරතුරු වෙත ප්‍රවේශය උසස් කිරීමහි ලා කෘත්‍රිම බුද්ධිය සතු විභවය සලකා බලමු. එය අවභාවිත කිරීමෙන් ජනතාව ඉගෙන ගන්නා දෙයත්, ඔවුන් එය ඉගෙන ගන්නා ආකාරයත් කෙරෙහි බලපෑම් ඇති කළ හැකි අතර එය තොරතුරු අනිසි ලෙස හැසිරවීම දක්වා දුරදිග යන්නකි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුද්ගලයා සදාචාරාත්මක කෘත්‍රිම බුද්ධිය නිසා ඇති විය හැකි සමාජ ප්‍රතියමාන කලමනාකරණය කිරීමේ වැදගත්කම වටහා ගන්නා අතර ඒ වෙනුවෙන් පෙනී සිටීමට උත්සුක වේ.	මේ සන්දර්භය තුළ, අධ්‍යාපනයට ඇති අයිතිය, සාමය හා ආරක්ෂාව සඳහා වන අයිතිය, සංස්කෘතික හා ආගමික ප්‍රකාශනය සඳහා වන අයිතිය ආදී අනෙකුත් මානව හිමිකම් පිළිබඳව ශික්ෂකයා විසින් සැලකිල්ලට ගත යුතු වේ.

10.තනි පුද්ගලයන් මත ඇති වන අහිතකර මානව හිමිකම් බලපෑම් සඳහා විසඳුම් වෙත ප්‍රවේශය	ඉහත අංක 1 සහ අංක 10 බලන්න. කෘත්‍රිම බුද්ධිය විසින් තමන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වේ යැයි හැඟෙන්නේ නම් එය නිවැරදි කළ හැක්කේ කොතැන ද, කවරාකාරයට ද යන්න ජනතාව දැන සිටීම අවශ්‍ය වේ. කෘත්‍රිම බුද්ධි පද්ධති භාවිත කිරීම සම්බන්ධ පාලනය හා නියාමන රෙගුලාසි, සාමාන්‍යයෙන් මාධ්‍ය හා අන්තර්ජාල පාලනය හා නියාමන රෙගුලාසි හා බැඳී පවතී ։13වන මොඩියුලය සහ මෙම මොඩියුලයේ පහතින් දක්වා ඇති දෑ බලන්න). මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළින් පුද්ගලයන්ට සන්නිවේදන පරිසරවේදය සඳහා වන නියාමන, සම-නියාමන හා ස්වයං-නියාමන යාන්ත්‍රණ පිළිබඳ අවබෝධයක් ලබා දෙයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුද්ගලයන් විවිධ නියාමන වර්ග අතර වෙනසත්, ඒවා සාමාන්‍ය වශයෙන් මානව හිමිකම් සමග එකෙලි වීමේ අවශ්‍යතාවත් අවබෝධ කරගත යුතු ය.	ඉහත අංක 1 සහ අංක 10 බලන්න.
11. කෘත්‍රිම බුද්ධියේ හිමිකාරිත්වය, පාලනය සහ ආධිපත්‍යය සමාගම් කිහිපයක් සතු වීම	ඉහත අංක 11 බලන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මඟින් මිනිසුන්ගේ අදහස් ප්‍රකාශනයේ නිදහස, තොරතුරු වෙත ප්‍රවේශය, හඬ සහ අන්තර්ගතවල බහුත්වය ආදියට බලපාන තීරණාත්මක තේමාවක් ලෙස ඩිජිටල් තාක්ෂණයේ හිමිකාරිත්වය සහ පාලනය ආමන්ත්‍රණය කෙරේ. විශේෂයෙන්ම 1වන මොඩියුලය, 2වන මොඩියුලය, 6වන මොඩියුලය සහ 13වන මොඩියුලය බලන්න.	මෙහි නිර්දේශිත මොඩියුලවල දක්වා ඇති සංකල්ප කෘත්‍රිම බුද්ධි පද්ධති, භාවිතය, හිමිකම සහ පාලනය කෙරෙහි අදාළ කරගත හැකි ය.
12. කෘත්‍රිම බුද්ධි පද්ධති සඳහා විනිවිදභාවයක, සදාචාරාත්මකභාවයක සහ බහු-පාර්ශ්වීය පාලනයක අවශ්‍යතාව.	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යනු තොරතුරු, මාධ්‍ය, හා කෘත්‍රිම බුද්ධිය ඇතුළු ඩිජිටල් තාක්ෂණ සදාචාරාත්මක හා සවිචාරාත්මක ඇගයීමකට ලක් කිරීම සහ භාවිතයට ගැනීම ය. 2030 සඳහා න්‍යාය පත්‍රය, තිරසර සංවර්ධන ඉලක්ක වැනි ප්‍රතිමානක අරමුණු සඳහා අන්තර්ගත සපයන සියලුම ආයතනවල භූමිකා සහ කාර්යයන් මෙන්ම එම කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාවට නැංවිය හැක්කේ කවර තත්ත්ව යටතේ ද යන්න අවබෝධ කරගැනීම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාවක් වේ. විශේෂයෙන්ම ඉහත 1, 2, 7, 13වන මොඩියුල සහ ඉහත අංක 1 සිට 12 දක්වා බලන්න.	ඉහත අංක 1 සිට 12 දක්වා සහ මෙහි අංක 13ට අදාළ වේ.
13. කෘත්‍රිම බුද්ධි පද්ධති සඳහා විනිවිදභාවයක, සදාචාරාත්මකභාවයක සහ බහු-පාර්ශ්වීය පාලනයක අවශ්‍යතාව.	මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යනු තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් තාක්ෂණ සදාචාරාත්මක හා සවිචාරාත්මක ඇගයීමකට ලක් කිරීම සහ භාවිතයට ගැනීම ය. මාධ්‍ය, තාක්ෂණික අතරමැදිකරුවන් සහ අන්තර්ජාල සන්නිවේදන සමාගම්වල භූමිකා හා කාර්යයන් ද, එම කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාවට නැංවිය හැක්කේ කවර තත්ත්ව යටතේ ද යන්න ද අවබෝධ කරගැනීම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාවක් වේ. 1,2,7, 13 මොඩියුල සහ ඉහත විවිධ අංක 1 සිට 12 දක්වා සහ අංක 13 ට අදාළ දෑ බලන්න.	ඉහත අංක 1 සිට 12 දක්වා සහ මෙහි අංක 13ට අදාළ වේ.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂය මාලාවේ ։1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ **ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.**

- 11.1 වගුවේ දක්වා ඇති කරුණු 13 හා සම්බන්ධව සමාජ මාධ්‍ය භාවිතය මෙන්ම සාකච්ඡා, විවාද, වෙනත් කණ්ඩායම් ක්‍රියාකාරකම්, විනෝද ක්‍රීඩා සංවිධානය කරන්න. වගුවේ සඳහන් විවිධ මොඩියුලවල අදාළ ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් කටයුතු කිරීමට වග බලා ගන්න. එමෙන්ම කෘත්‍රිම බුද්ධිය වෙත අවධානය යොමු කළ හැකි වන පරිදි මෙම ක්‍රියාකාරකම් පරිවර්තනය කරන්න.
- බොට්ස් යනු කෘත්‍රිම බුද්ධි පද්ධති මගින් පණගැන්වුණු පරිගණක ක්‍රමලේඛ වේ. අන්තර්ජාල පරිශීලකයෝ මාර්ගගතව විවිධ ලිඛිත හෝ වාචික භාෂාවලින් බොට්ස් හා ගනුදෙනු කරති. ශිෂ්‍යයන් සමග පහත යූ ටියුබ් වීඩියෝව නරඹන්න. https://www.youtube.com/watch?v=fEbzk4vTHsQ. වීඩියෝවේ සඳහන් වන ජනප්‍රිය බොට්ස් අතරින් ඔවුන් නිතර භාවිත කරන බොට්ස් කවරේදැයි ශිෂ්‍යයාගෙන් විමසන්න. ඔවුන්ගේ අත්දැකීම් හා ඔවුනට අනුව සැලකිලිමත් විය කරුණු පිළිබඳව ඔවුන්ගෙන් විමසන්න.
    - බොට්ස් භාවිතයේ ධනාත්මකභාවය පිළිබඳ මූලින් අවධානය යොමු කර අනතුරුව විභවීය ඍණාත්මකභාවය පිළිබඳව සාකච්ඡා කරන්න.
- සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු නිරාකණය කිරීමට කෘත්‍රිම බුද්ධිය භාවිත කළ හැකි අන්දමට ම, එයසාවද්‍ය තොරතුරු හා දුස්තොරතුර ප්‍රචාරණයට ද භාවිත කළ හැකි ය. විපක්ෂයට ප්‍රහාර එල්ල කිරීම, අවධානය වෙනතකට හරවන සන්දේශ පළ කිරීම, හෝ සිත්තැවුල් ඇති වන දේ සිතාමතා ප්‍රකාශ කිරීම (trolling) හා හිංසනයේ යෙදීම ආදී සමාජ මාධ්‍ය හැසිරවීමේ උපායමාර්ග සඳහා ව්‍යාජ ගිණුම් සහ බොට්ස් පුළුල්ව භාවිත කිරීම සිදුවන බව යුරෝපා පාර්ලිමේන්තුව විසින් කරන ලද "දුස්තොරතුරු ස්වයංක්‍රීයව නිරාකරණය කිරීම" (විර්ෂය මෙහි සඳහන් කරන්න) නම් අධ්‍යයනය මගින් (සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු පිළිබඳ වැඩි විස්තර සඳහා 4වන මොඩියුලය බලන්න) පෙන්වා දෙයි. තමන්ගේ ප්‍රදේශය හෝ රට තුළ ඊට සමාන වෙනත් පර්යේෂණ සිදු කර ඇත්දැයි සොයාබැලීමට ශික්ෂකයෝ ශිෂ්‍යයන්ට මගපෙන්විය යුතු ය. මෙම අධ්‍යයන සත්‍ය වශයෙන් ම පවතීද? එයින් අනාවරණය වූ සොයාගැනීම් මොනවාද? මෙම සොයාගැනීම් ආමන්ත්‍රණය කිරීමට ප්‍රතිපත්තිවලට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් තිබෙන්නේ ද? මෙම සොයාගැනීම් සමහරක් සම්බන්ධයෙන් ගනිමින් පවතින දැඩි ජාතික හා පොදු මට්ටමේ ක්‍රියාමාර්ග මොනවා ද?
    - ඉඩ ලැබෙන පරිදි, අදාළ අධිකාරිය වෙත (මෙම ගැටලු සම්බන්ධයෙන් වගකියන රාජ්‍ය අමාත්‍යාංශයක්/ අමාත්‍යාංශ ආදී) අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරන්න.
    - විකල්පයක් ලෙස මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හට ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා කෙටි දේශන පැවැත්වීම සඳහා ඉගෙනුම් පරිසරය වෙත අධ්‍යයන චාරිකා මාලාවක් සැලසුම් කරන්න.
- සාමාන්‍යයෙන් විද්‍යා හා තාක්ෂණවේද ක්ෂේත්‍ර තුළත්, විශේෂයෙන්ම කෘත්‍රිම බුද්ධි ක්ෂේත්‍රය තුළත් කාන්තා දායකත්වය වෙනුවෙන් පෙනී සිටීමේ වැදගත්කම ශික්ෂකයන් විසින් ඉස්මතු කර පෙන්වා දිය යුතු ය. Women in AI (WAI&, https://www.womeninai.co/. වැනි සංවිධාන පිළිබඳ වැඩිදුර කියවන්න. ඒෂ යනු කෘත්‍රිම බුද්ධි ක්ෂේත්‍රය තුළ කාන්තා නියෝජනය හා සහභාගිත්වය ඉහළ නැංවීමේ න්‍යාය පත්‍රයක් සහිත, රාජ්‍ය නොවන, ක්‍රියාකාරී කණ්ඩායම් සංවිධානයකි. එවැනි වෙනත් සංවිධාන පිළිබඳ විස්තර සොයන්න.
- කිම් නෙල්සන් විසින් රචිත, උයහ AI needs more women, යන ෆෝබ්ස් බ්ලොගය කියවා සාකච්ඡා කරන්න. https://www.forbes.com/sites/kimnilsson/2019/03/08/why-ai-needs-more women/. නෙල්සන් යනු ව්‍යවසායකයකු වන අතර යුරෝපයේ විශාලතම දත්ත විද්‍යා මධ්‍යස්ථානය වන ප්‍රිවිගෝ (Pivig) හි ප්‍රධාන විධායක නිලධාරිනිය ද (CEO) වේ. දේශීය විශේෂඥයන් හෝ ඔබගේ රට හා ප්‍රදේශයට අදාළ අධිකාරීන් විසින් රචිත වෙනත් අදාළ බ්ලොග හෝ ලිපි පිළිබඳ සොයා බලන්න. තෝරාගත් ලිපි විංසයෝජනය කරන්න. ඒවා මතවාදාත්මක වේ ද නැතහොත් සිද්ධිවාචක වේ ද? ඒවා සාධාරණ වේ ද නැතහොත් කෘත්‍රිම බුද්ධි පිළිබඳව ඒක පාර්ශ්විකව සර්වසුබවාදී හෝ

සර්වඅසුබවාදී ආකල්පයක් දරන්නේ ද? ඉදිරිපත් කර ඇති තර්ක සාක්ෂි ආධාරයෙන් තහවුරු කර තිබේ ද? ඔබ එකඟ වන්නේ ඉන් කවර කරුණු සමග ද, එකඟ නොවන්නේ කවර කරුණු සමග ද? ඒ ඇයි? ක්‍රියාත්මක වීමට සහ වෙනසක් වෙනුවෙන් ඔබට කටයුතු කළ හැක්කේ කවරාකාරයට ද? එම ක්‍රියාවන් අභිප්‍රේරණය කිරීමට ඔබට සම්බන්ධ විය හැකි දේශීය ආයතන ඇත් ද?

- සමාජ මාධ්‍ය තුළ ඔවුන් ගැන පැතිර වූ සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු හේතුවෙන් පහර කෑමට ලක් වූ මෙන්ම මරණයට පත් වූ පුද්ගලයන් පිළිබඳ සිද්ධි වාර්තා වේ.

  - සහභාගිවන්නෝ පුහුණුකරු විසින් තෝරා දෙන ලද පරිදි, කෘත්‍රිම බුද්ධි පද්ධති ගැන දේශීය හෝ අන්තර්ජාතික කතන්දර කියවා, ඒවා සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු කෙරෙහි අදාළ වන්නේ කෙසේදැයි සාකච්ඡා කරති. කියවන අතරතුර ඔවුනට ඒ ගැන ඇති වූ හැඟීම් කවරේදැයි පන්තිය හා බෙදාගන්නා ලෙස ශිෂ්‍යයන්ගෙන් ඉල්ලන්න. ඔවුනට හැඟුණේ කෙසේ ද? ඔවුන් ඒ කතන්දරය විශ්වාස කරනවා ද? ඔවුන් ඒ කතන්දරය විශ්වාස කිරීමට හෝ නොකිරීමට හේතු කවරේද; කතන්දරය විශ්වාස කටයුතු එකක් බවට පත් කරන ලක්ෂණ මොනවා ද? සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු නිර්මාණය හා බෙදා හැරීම සඳහා කෘත්‍රිම බුද්ධිය යොදාගන්නා විට සිදුවන්නේ කුමක් ද? කෘත්‍රිම බුද්ධිය හා ඇල්ගොරිතම හරහා සාවද්‍ය තොරතුරු හා දුස්තොරතුරු ව්‍යාප්ත වීම වළක්වාලීමට කළ හැක්කේ කුමක් ද? ඉහත අවසන් ප්‍රශ්නයට පිළිතුරු වශයෙන්, ශිෂ්‍යයෝ ඔවුන්ට ගත හැකි පුද්ගලික/තනි ක්‍රියාමාර්ග පිළිබඳව මෙන්ම, වෙනත් පාර්ශ්වකාර කණ්ඩායම් (රජයන්, ඩිජිටල් සන්නිවේදන සමාගම් ආදී) විසින් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ද සිතා බැලිය යුතු වේ. යෝජිත සෑම ක්‍රියාමාර්ගයක් සඳහා ම, විවිධ පාර්ශ්වකරුවන්ගේ පර්යාලෝකවල විභවීය ගම්‍යාර්ථ සාකච්ඡා කරන්න.
  - පුද්ගලයන්ට මානසික හෝ ශාරීරික හානි පැමිණවීමට තුඩු දුන්, කෘත්‍රිම බුද්ධි පද්ධති හෝ බොට්ස් විසින් නිර්මිත වැරදි සහගත හෝ නොමග යවන සුලු අන්තර්ගත සම්බන්ධ සිද්ධි දෙකක් ගැන පර්යේෂණ කරන්න. ශිෂ්‍යයන් සමග ඒ පිළිබඳව හා ඒ හා සමාන දේ ගැන සාකච්ඡා කරන්න.

- සාවද්‍ය තොරතුරු හේතුවෙන් මිනිසුන් මත ඇති කරනා බලපෑම පිළිබඳව පර්යේෂකයා අත්හදා බැලීම් සිදු කර ඇත. එක් අධ්‍යයනක දී පර්යේෂණ කණ්ඩායම[90]"සහභාගීවන්නන්ට මෝටර් රථ අනතුරක රූප එලක පෙන්වා, ඉන්පසු ඔවුනට අනතුර පිළිබඳ වැරදි සහගත හෝ නොමග යවන සුලු තොරතුරු කියවීමට ලබා දුන්නේ ය. සහභාගීවන්නන් ඉතාමත්ම පහසුවෙන් මෙම අඩුපාඩු සහිත තොරතුරු අවශෝෂණය කරගත් අතර, අනතුරේ දී සිදුව ඇත්තේ කුමක්දැයි පසුව විමසා සිටි විට අතපසු වීම් සිදු කළ බවට අත්හදා බැලීමෙන් පෙන්වා දුන්නේ ය.[91] වැරදි තොරතුරු අවශෝෂණය කරගැනීමට තුඩු දෙන්නේ කවරාකාරයේ සාධකදැයි ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. මතක, පෙර අත්දැකීම්, හැඟීම් (බිය, ශාංකාව, සැකමුසු බිය, සැකය), පක්ෂග්‍රාහිතා, අපේක්ෂා ආදිය මීට ඇතුළත් වේ. ශිෂ්‍යයන්ට ඒ ගැන සිතා බලා සිය අත්දැකීම් බෙදාහදා ගන්නා ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.
- ශිෂ්‍යයන්ව කණ්ඩායම්වලට වෙන් කරන්න. ඔවුන්ට කැමති ආකාරයකින් (ප්‍රවෘත්ති, කතන්දර, ව්‍යාජ ඇසින්දුටු සාක්ෂි විස්තරයක්, අනුරූප, වීඩියෝ) දුස්තොරතුරක් නිර්මාණය කරන ලෙස පවසන්න. එම තොරතුර අනෙක් කණ්ඩායම් වෙත ඉදිරිපත් කරන ලෙස සෑම කණ්ඩායමකටම පවසන්න. එම තොරතුර විශ්වාස කටයුතු වේ ද, නොවේ ද යන්න සාකච්ඡා කරන්න. එය විශ්වාස කළ හැකි හෝ නොහැකි වන්නේ ඇයි? එවැනි වැරදි තොරතුරු ව්‍යාප්ත කිරීමේ විභවීය ප්‍රතිඵල මොනවා ද? මෙම සිද්ධිය හසුවන්නේ කවරාකාරයේ ඇල්ගොරිතම විසින් ද, එය විස්තාරණය කෙරෙන්නේ කුමක් මගින් ද?
- ඉහත 11.1 වගුවේ දක්වා ඇති කෘත්‍රිම බුද්ධිය පිළිබඳ සැලකිය යුතු, තෝරාගත් කරුණු 13 අධ්‍යයනය කරන්න. ඔබගේ රටට ඒවායේ ඇති අදාළත්වය සහ ඔබ කටයුතු කරන ශිෂ්‍ය කණ්ඩායමට ආකර්ෂණීය වීමේ ස්වභාවය මත පදනම්ව මෙම ගැටලු වටා ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර, වැඩිදුර තොරතුරු හා ඩීප්ෆෙක් හඳුනාගැනීම සඳහා වන පහත උපදෙස් යොදා ගත හැකි උදාහරණ එක්රැස් කිරීම සඳහා ද්විතීයික පර්යේෂණයක් සිදු කිරීම ඔවුන්ට පවරන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පර්යේෂණාගාර ව්‍යාපෘති සහ එමගින් ඉදිරිපත් කරන පහත දක්වා

90. Loftus, E. F., Miller, D. G., & Burns, H. J. (1978). Semantic integration of verbal information into a visual memory. Journal of Experimental Psychology: Human Learning and Memory, 4(1), 19–31. https://doi.org/10.1037/0278-7393.4.1.19
91. Reboot Foundation, Elevating Critical Thinking, https://reboot-foundation.org/misinformation effect/.

ඇති උපදෙස් බලන්න. https://www.media.mit.edu/projects/detect-fakes/overview/.සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 4වන මොඩියුලය බලන්න.

- මුහුණු වෙනස්වීම් හෝ විකෘත වීම් පිළිබඳ අවධානය යොමු කරන්න. එමෙන්ම, රැවුල සැබෑ එකක් ලෙස දිස්වන්නේ ද නැතහොත් එය තිබිය යුතු තැන්වල නොමැතිව වෙනත් තැන්වල දිස්වන්නේ ද? මුහුණේ ඇති ඉන්නන් සහ ලප සැබෑ ඒවා ලෙස දිස්වන්නේ ද? ඒවායේ ප්‍රමාණය හා පැහැය පුද්ගලයාගේ මුහුණ හා ගැලපෙන්නේ ද?
- කම්මුල් හා නළලේ සම ඉතාමත් සුමට හෝ අධික රැළි ගැසුණු ස්වභාවයක් පෙන්නුම් කරන්නේ ද? හිසකෙස්වලින් පෙනෙන වියපත් වීම සම හා ඇස්වලට ගැලපෙන්නේ ද?
- සෙවණැලි නොතිබිය යුතු තැන්වල මුහුණ, ඇස් හා ඇහිබැම මත සෙවණැලි දක්නට ලැබේ ද? පුද්ගලයකු පැළැඳ ඇති ඇස්කණ්ණාඩිවල දීප්තියක් දිස්වන්නේ ද, එම දීප්ති පුද්ගලයාගේ චලනයත් සමග වෙනස් වන්නේ ද? පුද්ගලයන් ඇසිපිය සලන්නේ ඉතා අධිකව ද නැතහොත් ඉතා සුළු වශයෙන් ද? "කිසියම් දර්ශනයක ස්වභාවික භෞතිකත්වය... ආලෝකරණයේ ස්වභාවික භෞතිකත්වය මුළුමනින්ම නිරූපණය කරන්නට ඩීප්ෆෙක් බොහෝ විට අසමත් වෙයි.[92]"

ඉහත සඳහන් කර ඇති පරිදි, ඩීප්ෆෙක් නිරීක්ෂණය කිරීමට ඇතැම් විට වෝහාරික විද්‍යාවේ දී භාවිත කරන නිපුණතා හා සමාන ප්‍රවීණතාවක් හා සුවිශේෂී නිපුණතා අවශ්‍ය වේ. එහෙයින්, ශික්ෂකයන් හා ශිෂ්‍යයන් එකට එක්ව සාකච්ඡා කරමින් සිය පරිචය දියුණු කරගනිමින්, කාලයත් සමග ප්‍රවීණත්වය ඇති කරගැනීමට කටයුතු කළ යුතු ය.එැවනි අන්තර්ගත හඳුනාගෙන, ඒවා හඳුනාගැනීමේ සලකුණු යෙදීම, එවැනි සලකුණු යෙදීමට තුඩු දුන් තත්ත්ව හා ඒවා යොදාගැනීමට එරෙහිව අභියාචනා කිරීමේ හැකියාව පිළිබඳ විග්‍රහ කිරීම ආදී ප්‍රමිතකරණයකට යටත් කිරීම සඳහා සම්පත් යෙදවීම කෙරෙහි සමාගම් යොමු කිරීම වෙනුවෙන් පෙනී සිටීම එක් විකල්පයක් බව දැනුවත්ව සිටීම ද ඒ සමානවම වැදගත් වේ.

- කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය හා සම්බන්ධ නිපුණතා මාලාවක් විවිධ මූලාශ්‍රවලින් ලබා ගනු ලදුව 11.1 වගුවේ දක්වා ඇත. මෙම එක් එක් නිපුණතාව මැදි කරගත් විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කරන්න. එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා ඊට අදාළ වන්නේ කෙසේද යන්න හෝ ඊට යොදා ගන්නේ කෙසේද යන්න විශේෂයෙන් දක්වන්න. ඉහත 11.1 වගුවේ තුන්වන කොලමේ දක්වා ඇති ආකාරයට, අනෙකුත් ගැටලුවලට අදාළව තර්ක ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න. ඔබ විසින් සම්පූර්ණ කරන ලද වගුව හෝ එහි කොටස් සමාජ මාධ්‍ය තුළ @MILCLICKS හි ටැග් කරන්න, නැතහොත් මූලාශ්‍ර සමග milclicks@ unesco.org වෙත ඉතැපෑලෙන් යොමු කරන්න.

92. MIT Media Lab project and the tips they offer below, https://www.media.mit.edu/projects/detect-fakes/overview/

11.2 වගුව කෘත්‍රිම බුද්ධි සබඳතා සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා

කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය සඳහා අවශ්‍ය නිපුණතාවලට උදාහරණ[93]	පවතින මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාවලට ඇති සම්බන්ධය	අදහස් දැක්වීම් සම්බන්ධ කිරීම
1වන නිපුණතාව (කෘත්‍රිම බුද්ධිය හඳුනාගැනීම) කෘත්‍රිම බුද්ධිය භාවිත කරන සහ භාවිත නොකරන තාක්ෂණික මෙවලම් අතර වෙනස හඳුනාගැනීම සහ එසේ කිරීමේ දුෂ්කරතාව අවබෝධ කරගැනීම.		
2වන නිපුණතාව (බුද්ධිමත්බව හඳුනාගැනීම) මානව, සත්ත්ව සහ යාන්ත්‍රික බුද්ධිය අතර වෙනස්කම් සාකච්ඡා කිරීම ඇතුළුව, ස්ථිතයක් "බුද්ධිමත්" කරන විශේෂාංග විචාරශීලීව විශ්ලේෂණය කර සාකච්ඡා කිරීම.		
3වන නිපුණතාව (විෂයාන්තරබව)"බුද්ධිමත්" යන්ත්‍ර ගැන සිතීමට සහ ගොඩනැගීමට විවිධ ක්‍රම ඇති බවට අවබෝධ කරගැනීම. සංජානන පද්ධති, රොබෝ ශාස්ත්‍රය, සහ යාන්ත්‍රික ඉගෙනුම දක්වා විහිද යන තාක්ෂණය ද ඇතුළු කෘත්‍රිම බුද්ධිය භාවිත කරන තාක්ෂණ වර්ග ගණනාවක් හඳුනාගැනීම.		
4වන නිපුණතාව (පොදු අරමුණැති[94]හා එක් අරමුණැති) පොදු අරමුණැති[95] හා එක් අරමුණැති කෘත්‍රිම බුද්ධි එකිනෙකින් වෙන් කර හඳුනාගැනීම.		
5වන නිපුණතාව :කෘත්‍රිම බද්ධියේ ප්‍රබලතා හා දුබලතා) විසඳීමට කෘත්‍රිම බුද්ධියට විශිෂ්ට හැකියාවක් ඇති ගැටලු වර්ග සහ කෘත්‍රිම බුද්ධියට වැඩි අභියෝගයක් එල්ල කරන ගැටලු හඳුනා ගැනීම. ආයතන සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිත කළ යුතු අවස්ථා සහ මානව කුසලතා භාවිතයට රුකුල් දීමට සුදුසු වන අවස්ථා නිර්ණය කිරීම සඳහා මෙම තොරතුරු භාවිත කිරීම.		
6වන නිපුණතාව (අනාගත කෘත්‍රිම බුද්ධිය පරිකල්පනය කිරීම) කෘත්‍රිම බුද්ධි පද්ධතිවල සංවර්ධනය සහ යෙදවීම හැඩගස්වන්නේ කවුරුන්ද යන්න අනුව කෘත්‍රිම බුද්ධියේ අනාගත යෙදවුම් ගැන පරිකල්පනය කිරීම සහ එවැනි යෙදවුම්වලින් ලෝකයට ඇති කරවන බලපෑම් සලකා බැලීම. ශික්ෂකයෝ සහ ශිෂ්‍යයෝ කෘත්‍රිම බුද්ධිය හා සම්බන්ධව දත්තවල භූමිකාවේ සමාජයීය සහ සන්දර්භීය ගම්‍යතාවන් මෙන්ම එහි ලක්ෂණ ද ඇතුළුව, මූලික කරුණු පිළිබඳ දැනුවත්ව සිටිති[96]. ශික්ෂකයෝ සහ ශිෂ්‍යයෝ සම්භාවිතාමය තර්කනයේ මූලික කරුණු අවබෝධ කරගැනීමට සමත් වෙති. ප්‍රවේශය - පරිගණකමය චින්තනය හරහා මූලික ගැටලු විසඳීම ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් හට අවබෝධ කරගත හැකි අතර, දෘශ්‍ය ක්‍රමලේඛන භාෂා භාවිතයෙන් කේතනය කිරීමේ මූලික මූලධර්ම යොදවා ගත හැකි ය. ශික්ෂයන්ට සහ ශිෂ්‍යයන්ට ඩිජිටල් අවදානම් තක්සේරු කිරීමට, අන්තර්ගතය සහ අන්තර්ගත මූලාශ්‍ර විචාරශීලීව ඇගයීමට හැකි විය යුතු අතර, කෘත්‍රිම බුද්ධි "කළු පෙට්ටිය"(තීරණ පැහැදිලි කිරීමේ මූලධර්මය අනුග මනය කරමින්) පිළිබඳ ගැටලුව හා සම්බන්ධ වීමේ අවශ්‍යතාව අවබෝධ කර ගැනීමට ද හැකි විය යුතුය. ප්‍රබල ක්‍රියාකාරිකයන්ගේ පාලනය යටතේ පවතින තාක්ෂණය මගින් සමාජය සහ සාරධර්ම, සමාජ, කණ්ඩාම් හා ස්වයංක්‍රීය තීරණ :කෘත්‍රිම බුද්ධිය ආධාරයෙන් ගනු ලැබූ තීරණ) ගන්නා පුද්ගලයන් කෙරෙහි වන සදාචාරාත්මක හා මානව හිමිකම් ගම්‍යතාවන් වෙනස් කෙරෙමින් පවතින බවට ශික්ෂකයෝ සහ ශිෂ්‍යයෝ දැනුවත්ව සිටිති.		

93. තොරතුරු ප්‍රවේශ පර්යාලෝකයකින් කෘත්‍රිම බුද්ධිය සඳහා ඉගැන්වීමේ සහ ඉගෙනීමේ නිපුණතා පිළිබඳ යුනෙස්කෝ වැඩමුළුවේ කෙටුම්පත් ප්‍රතිඵල - Draft Outcomes of the UNESCO Workshop on Teaching and Learning Competencies for AI from an Information Access Perspective (UNESCO Headquarters Paris, 7 November 2019) වෙතින් ලබා ගත්තකි.
94. පොදු අරමුණැති කෘත්‍රිම බුද්ධිය (AGI) වනාහී මානවයකු විසින් කළ හැකි ඕනෑම බුද්ධිමත් කාර්යයක් අවබෝධ කරගැනීමට හෝ ඉගෙන ගැනීමට බුද්ධිමත් කාරකයකු සතු උපන්‍යාසීය (1) හැකියාවයි. එය ඇතැම් කෘත්‍රිම බුද්ධි පර්යේෂණයක මූඛ්‍ය පරමාර්ථය වන අතර, විද්‍යා ප්‍රබන්ධ හා අනාගත පිළිබඳ අධ්‍යයනවල පොදු මාතෘකාවක් වෙයි. https://en.wikipedia.org/wiki/Artificial_gener- al_intelligence
95. Artificial Narrow Intelligence (ANI)& also known as ˜Weak˜ AI is the AI that exists in our world today. Narrow AI is AI that is programmed to perform a single task — whether it's checking the weather, being able to play chess, or analysing raw data to write journalistic reports. https://medium'com$mapping-out-2050/ distinguishing-between-narrow-ai-general-ai-and-super-ai-a4bc44172e22
96. This would be at the Knowledge Acquisition Level of the ICT CFT Version 3 (https://unesdoc.unesco.org/ ark:/48223/ pf0000265721)

3වන ඒකකය: පුද්ගල හා සමාජ අයිතිවාසිකම්, තෝරා ගැනීම් සහ තාක්ෂණය

කාලසීමාව: පැය 04

ප්‍රධාන මාතෘකා

- අයිතිවාසිකම් පිළිබඳ සංකල්ප වටහා ගැනීම: සමාජ අයිතිවාසිකම් හා තනි පුද්ගල අයිතිවාසිකම්
- සමාජ හා තනි පුද්ගල අයිතිවාසිකම්, හා තෝරාගැනීම්වලට ප්‍රමුඛත්වය දීමේ දී තාක්ෂණයේ භූමිකාව.
- සමාජ අයිතිවාසිකම්, සමාජ සාධාරණත්වය, හා සමාජ ව්‍යාපාර සඳහා අන්තර් සංස්කෘතික සංවාද සඳහා විභවීය වේදිකා ලෙස මෙන්ම විභවීය සුපරික්ෂාව යටතේ තබාගැනීම, පාලනය කිරීම සහ අනිසි ලෙස හැසිරවීම සඳහා තාක්ෂණය භාවිත කිරීම
- තනි පුද්ගල අයිතිවාසිකම් හා සමාජයීය අයිතිවාසිකම් හා තෝරාගැනීම් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා සහ ඩිජිටල් කුසලතා
- සමාජ අයිතිවාසිකම් හා තනි පුද්ගල තෝරාගැනීම්වල නිර්ණායක ලෙස තාක්ෂණ නියතිවාදය සහ න්‍යාය පත්‍ර සැකසුම් සිද්ධාන්ත.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා ගනු ඇත:

- සමාජ අයිතිවාසිකම්, ඒක පුද්ගල අයිතිවාසිකම් හා තෝරාගැනීම්වලට ප්‍රමුඛත්වය ලබා දීමේ දී තාක්ෂණයේ භූමිකාව අවබෝධ කරගැනීම
- අයිතිවාසිකම් හා තෝරාගැනීම් සම්බන්ධ කතිකාව සඳහා තාක්ෂණයේ සහ එහි හිමිකරුවන්ගේ වැදගත්කම අවබෝධ කරගැනීම.
- තීරණ ගැනීම සඳහා අවශ්‍ය කරන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා විග්‍රහ කිරීම.
- ආගමික හැඟීම්, මූල්‍ය වාසි, සංස්කෘතික අනුබද්ධතා, ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතා සහ දේශපාලන අනුබද්ධතා මත පදනම්ව පුරවැසියන් සංවේදී කිරීමට හෝ ධ්‍රැවීකරණය කිරීමට, පාලකයන්ගේ සන්දර්භය තුළ තාක්ෂණය සමත් වන ආකාරය අවබෝධ කරගැනීම.
- විශේෂයෙන්ම දේශපාලන ආයතන, දේශපාලන තෝරාගැනීම්, මැතිවරණ ක්‍රියාවලි, ඡන්දය ප්‍රකාශ කිරීම, පාලනයේ වගවීම සහ සමාජය තුළ විනිවිදභාවය සම්බන්ධයෙන් ප්‍රජාතන්ත්‍රවාදය තුළ තාක්ෂණයේ සහ එහි පාලකයන්ගේ භූමිකාව අවබෝධ කර ගැනීම.'

කෘත්‍රිම බුද්ධිය සහ අන්තර්ගත බෙදාගැනීම

තාක්ෂණික නියතිවාදය පිළිබඳ සංකල්පයෙන් ගම්‍ය වන්නේ ඩිජිටල් සන්නිවේදන මාධ්‍ය වේදිකාවල ප්‍රමුඛව දිස්වන්නේ කවුරුන්ද කුමන අන්තර්ගතයද යන්න කෙරෙහි බලපෑමක් ඇති කරන බවයි. එහෙත් මෙම සංකල්පය තාක්ෂණය යනු තනිව ගත යුත්තක් ලෙස ආදේහනය කරන අතර සියලුම තාක්ෂණ පැවතෙන්නේ සමාජ මූලයන්ගෙන් බව ද නොතකා හරියි. තවද, වෙනත් කරුණු අතර, විශේෂ ව්‍යාපාර අරමුණු මගින් තාක්ෂණ සංවර්ධනය හා යොදවා ගැනීම හැඩගැසෙන අදිසි ස්ථානයක් ඇති බවට එයින් ගම්‍යමාන වේ. නිර්මිත සැලසුම හා ඉංජිනේරු කටයුතු පිළිබඳ තීරණ මගින්, සීමිත පිවිසුම් වේදිකාවක් (walled garden platform) තුළ හෝ ඉන් පිටත බෙදාගත හැක්කේ මොනවා ද, ක්‍රියාකාරී වන්නේ කවර දත්ත එක්රැස් කිරීමේ, ගබඩා කිරීමේ හා භාවිත සිද්ධි ද ආදියෙන් තාක්ෂණික සැලසුම දැනුවත් කරනු ලැබේ.

වේදිකා මත අන්තර්ගත හුවමාරු කරගන්නේ කවුරුන් ද, කුමන අන්තර්ගත ද යන්න අවබෝධ කරගැනීමටත්, එහෙයින්, විශේෂිත පරිරක්ෂණ අරමුණු සහ අන්තර්ගත ප්‍රමිත කිරීමේ උපායමාර්ග හා පරිචය ඉහළ

නැංවීමට වේදිකාවලට ඇති අවශ්‍යතාව අවබෝධ කරගැනීම අවශ්‍ය වේ. කෘත්‍රිම බුද්ධිය මගින් බලගන්වන ලද පරිගණක ඇල්ගොරිතමවලට මේවා රුකුල් දෙන අතර, අන්තර්ගත ශ්‍රේණිගත කිරීමට හා වෙනත් ආකාරයේ සැලකිල්ලට ලක්කරන (උදා: අවහිර කළ උඩුගත කිරීම, මකාදැමීම, සලකුණු කිරීම, මානව ප්‍රමිතිකරුවන් වෙත යොමු කිරීම, සත්‍යාපනය කරන්නන් වෙත යවනු ලැබීම ආදිය) බලයක් ඒවා සතු වෙයි. න්‍යාය පත්‍රයේ අයිතම ලෙස ජනතාව දකින දෙය කෙරෙහි බලපෑමක් ඇති කිරීමටත්, ඔවුන්ගේ තනි පුද්ගල තෝරාගැනීම්වලට බලපෑම් කිරීමටත්, මහජන මතය හැඩගස්වා ගැනීමටත් එම ප්‍රතිඵල සමත් වේ. කාලයාගේ ඇවෑමෙන් පුරවැසියන්ගේ මාර්ගගත අත්දැකීම සහ ඔවුන්ගේ තීරණවලට තුඩු දෙන සාධක වෙනස් කරමින්, ඒ හරහා යම්කිසි කාලයක් තුළ මහජන මතය සහ සංජානනය වෙනස් කරලීමට පරිගණක ඇල්ගොරිතම ක්‍රියාකරන බව නොරහසකි. එම බලපෑම තමා පිළිබඳ ඔවුන් තුළ ඇති හැඟීම සහ අගය මෙන්ම, තමා කවුරුන් ද කවුරුන් බවට පත් විය යුතු ද ආදී තනි පුද්ගල අනන්‍යතා මත ද බලපැවැත්විය හැකි ය. සිය ස්ථාවරය තහවුරු කරගනිමින් සිටින තරුණ ජනතාවට මෙය විශේෂයෙන්ම අදාළ වේ.

"පෙරහන් බුබුල" (filter bubble) ලෙස හැඳින්වෙන මෙම සංසිද්ධිය මාර්ගගත අත්දැකීම්වලට යම් පරිඥානයක් ලබා දී තිබේ. ඇල්ගොරිතමීය නිර්මාණයේ ප්‍රතිඵලයක් ලෙස, දැනට පවතින රුචි අරුචිකම්, රසඥතා හා තොරතුරු පුරුදු බලනොගන්වන අන්තර්ගත පෙරහන් කර ඉවත දැමීමට කටයුතු කිරීමට ඇල්ගොරිතම සතු හැකියාව එමගින් ඉස්මතු කර පෙන්වයි. එහි ප්‍රතිඵලය වන්නේ, පද්ධතිය විසින් වෙනත් ආඛ්‍යාන අවුරාලීම හේතුවෙන් තනි පුද්ගල පක්ෂග්‍රාහිතා අභියෝගයට ලක් නොවන සංවෘත විශ්වයකි. පුවත්පත් කලාවේද අධ්‍යයනය සඳහා වන රොයිටර් ආයතනය[97] (Reuters Institute for the Study of Journalism) විසින් කළ පර්යේෂණ වැනි ඇතැම් පර්යේෂණවලින් පෙනී යන්නේ "පෙරහන් බුබුල" ආදර්ශයෙන් යෝජනා කරනවාට වඩා විශාල අන්තර්ගත විවිධත්වයකට බොහෝ පුද්ගලයන් ඇත්ත වශයෙන්ම නිරාවරණය වී සිටින බවයි. ඒ සමගම, තවත් සංකල්පයක් වන ප්‍රතිරාව කුටි (echo chamber) සංකල්පයට අනුව විවිධත්වයෙන් යුත් අන්තර්ගත හමුවේ වුවද, පුද්ගලයන් තවදුරටත් පටු අර්ථදැක්වීමකින් යුත් ප්‍රජාවක එල්බ ගෙන සිටීමේ ඉඩකඩක් ඇත. මෙම සංකල්පය යටතේ, ඇත්ත වශයෙන්ම තනි පුද්ගලයන් ඔවුන්ගේ විශ්වාස හා උපකල්පන තනිව ගත් කල එකිනෙකට පරස්පර තොරතුරු වෙත නිරාවරණය විය හැකි නමුත්, තොරතුරේ වැදගත්කම අනුව සලකා බලා එය නොතකා හැරීමට ඉඩ ඇත. ඊට පෙර පැවැති සමුච්චිත පුනරාවර්තී සමාජ "ප්‍රතිරාව" සන්දර්භය තුළ එය ස්ථානගත කර ඇති නිසාත්, එමගින් හුරුපුරුදු රාමු සහ අර්ථ නොනැසී පවතින බවට සුරක්ෂිත හැඟීමක් ලබා දීමත් මෙයට හේතු වේ. "ප්‍රතිරාව කුටිවලට" තනිව පැවැතිය හැකි වුව ද, ඇල්ගොරිතමීය පෙරහන් බුබුලුවලට ඒවා වඩා සවිමත් කිරීමේ හැකියාව ඇත. සීමාන්තික අවස්ථාවල දී, එකිනෙකට මුළුමනින්ම වෙනස් හා සමාන්තර වූ විශ්වයනට අයත් අභිප්‍රායන් පහළ වීමට ඉඩ ඇති අතර, එ තුළ විවිධ (සහ සාපේක්ෂව සංවෘත වූ) ප්‍රජා කොටස් සමූහ දේශපාලනය, සෞඛ්‍යය, දේශගුණ විපර්යාස ආදී විවිධ කරුණු හා ව්‍යාජ කරුණු සහ වඩාත් පුළුල් ලෙස යථාර්ථය පිළිබඳ විවිධ ආඛ්‍යාන සමග කටයුතු කරති.

ශික්ෂණ විද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂයමාලාවේ : 1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1වන කොටසේ දැක්වෙන ලැයිස්තුව විමසා බලා පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා මෙන්ම ඔබ විසින් සැලසුම් කරන්නා වූ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහාත් යොදා ගත හැක්කේ කවර ප්‍රවේශයකදැයි තීරණය කරන්න.

- *Beware online "filter bubbles" | Eli Pariser,* https://www.youtube.com/watch?v=B8ofWFx525s. යන ජනප්‍රිය TED Talk වීඩියෝව නරඹන්න. මෙම වීඩියෝව වසර 10කට පෙර සැකසුණකි. සාකච්ඡාවට මගපෙන්වන්න: මෙම වීඩියෝව අදට කෙතරම් අදාළ ද? පැන නැගුණු ගැටලුවල ලේඛනයක් පිළියෙල කරන ලෙස ශික්ෂකයන්ට පවසන්න. මෙම ගැටලු සම්බන්ධයෙන් ආසන්නතම කාලයේ සිදු කෙරුණු කතිකා දැකගැනීමට කුඩා කණ්ඩායම්වලට පර්යේෂණ කළ හැකි ය. සමාජ අයිතිවාසිකම්වට ප්‍රමුඛත්වය දීම, තනි පුද්ගල තෝරාගැනීම් සිදු කිරීම හා මහජන මතය ගොඩනැගීම සිදුවන ආකාරය කෙරෙහි මෙම සංසිද්ධිය බලපාන්නේ ද? කෘත්‍රිම බුද්ධියෙන් පණගැන්වුණු ඇල්ගොරිතමට ආඛ්‍යාන වෙනස් කරලීමටත්, එමගින් සමාජයීය, සංවර්ධන හා දේශපාලනික න්‍යාය පත්‍රය සැකසීමටත් හැකිවේ ද?

97. https://reutersinstitute.politics.ox.ac.uk/

- සාම්ප්‍රදායික මාධ්‍ය (‘විකාශන සමාජය’) වලංගුකරණය සඳහා වන සංස්කරණ ක්‍රියාවලි සහ ඩිජිටල් සන්නිවේදනයේ ඇල්ගොරිතමීය පාලනයට යටත් වූ තොරතුරු ප්‍රවාහය අතර ඊලයි පැරිසර්ගේ (Eli Pariser) සංසන්දනය සඳහා සාකච්ඡා කරන්න. ඔහුගේ ස්ථාවරය හා ඔබ එකඟ වන්නේ ද? එසේ වීමට හෝ නොවීමට හේතු කවරේ ද? ශික්ෂකයන් හා ශිෂ්‍යයන්ට එක් කළ හැකි නව තර්ක හා සාක්ෂි මොනවාද? ඔබගේ තර්ක හා අදහස්වලට රුකුල් දීමට පර්යේෂණ පවත්වන්න.
- ඩිජිටල් සන්නිවේදනයේ විරුද්ධාභාසය වනුයේ එක් අයෙකුට හානිදායක ලෙස පෙනෙන දෙයක් තවත් අයෙකුට වාසියක් ගෙන දෙන්නක් හෝ කෙනකුට වාසියක් ගෙන දෙන්නක් තවකෙකුට හානිදායක දෙයක් වීමත් ය. අන්තර්ගත ශ්‍රේණිගත කිරීම හා ඉලක්කගත කිරීම කෙරෙහි බලපෑම් ඇති කරන ඇල්ගොරිතම මගින් මානව හිමිකම්වලට වෛෂයික හානියක් සිදු කළ හැකි ය. ඒ සමගම, නිර්මාණය හරහා, හෝ අරමුණු නොකළ බලපෑමක් හරහා, සාමාන්‍යයෙන් නිහඬ කරවනු ලැබූ හෝ යටපත් කරනු ලැබූ හඬවල් කරළියට ගෙන ඒමේ හැකියාව ඒවා සතු ය. නිදසුන් වශයෙන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතා, අඩු කාන්තා නියෝජනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, මිනිස් ජාවාරම සහ වර්ගය අනුව වෙනස් කොට සැලකීම වැනි කලෙක සිට අඩුවෙන් වාර්තා කෙරුණු, අදෘශ්‍යමානව පැවැති ගැටලු රැසක් වත්මන් ගෝලීය කතිකාවේ වඩාත් වැදගත් තැනක් උසුලයි. වෙනත් සංස්කෘතීන් හා නව තොරතුරු සඳහා සම්බන්ධවීමට තාක්ෂණය මැදිහත් කරගැනීම මගින් ඇතැම් පුද්ගලයෝ කාන්තා ජර්මඡේදනය වැනි අදාළ පාර්ශ්වයට හානි ගෙන දෙන, සම්ප්‍රදාය තුළ මුල් බැසගත් ඇතැම් සිරිත් පිළිබඳ සිය ස්ථාවරය වෙනස් කරගෙන සිටිති. මේ සම්බන්ධ තාක්ෂණික සේවා මැදිහත් කරගැනීම මගින් සමාජ අයිතිවාසිකම්වලට ප්‍රගාමකයක් අත් වී ඇතැයි, සමාජ මත හා විශ්වාසවල වෙනසක් සිදු වී ඇතැයි ඔබ විශ්වාස කරන්නේ ද? තාක්ෂණ හැරුණු කොට මෙහි දී ක්‍රියාත්මක වන අනෙකුත් සාධක කවරේ ද?මෙම සාකච්ඡාව තුළ ඔබගේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා ප්‍රයෝජනයට ගත හැක්කේ කෙසේද?
- එක්රැස් වීමේ අයිතිය, ආගමික නිදහස, මත දැරීමේ නිදහස සහ භාෂණයේ නිදහස ආදිය නැංවීමට හෝ අවහිර කිරීමට තාක්ෂණය ධනාත්මකව හෝ ඍණාත්මකව භාවිත කිරීම සම්බන්ධ දැනට පවතින සිද්ධි අධ්‍යයන පිළිබඳ පරීක්ෂණාත්මකව සොයාබැලීම සඳහා ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් කණ්ඩායම් ලෙස වෙන් කරන්න. ඉදිරිපත් කිරීම් හා සාකච්ඡා මාලාවක් සංවිධානය කරන්න. තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස වඩාත් ප්‍රායෝගික වෙමින් පවතින්නා වූ, ඓතිහාසික මූලික උපකල්පන පිළිබඳ ප්‍රශ්න කිරීම, ප්‍රශ්නකාරී විශ්වාස පද්ධති ප්‍රතික්ෂේප කිරීම, ස්වභාවික අනන්‍යතාව තහවුරු කිරීම, සම්මුතිකගත සංස්කෘතික හරයන් සහ හර පද්ධති යළි එකෙලි කිරීම ආදී තනි පුද්ගල තෝරාගැනීම් කෙරෙහි පර්යේෂණ විශ්ලේෂණයේ සහ සාකච්ඡාවේ අවධානය යොමු කරන්න.
- කෘත්‍රිම බුද්ධියෙන් පණ ගැන්වුණු ඇල්ගොරිතමීය වේදිකාවක දෙපසම තුලනය කිරීමට අවශ්‍ය කුසලතා ලෙස අන්තර්සංස්කෘතික සංවාදය කෙරෙහි අවධානය යොමු කෙරෙන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා අධ්‍යාපනයක් වෙනුවෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වෙනුවෙන් පෙනී සිටින්නෝ හඬ නගා ඇත. පුරවැසියාගේ තේරීම සහ බලගැන්වුම් තාක්ෂණය සැලකිල්ලට ගනිමින් තනි පුද්ගල හා සමාජ අයිතිවාසිකම් සන්දර්භය තුළ පහත ප්‍රශ්න විමසා බලන්න:

    - පුද්ගලයකුගේ අයිතිවාසිකම් යන්න පිළිබඳ ඔබ තුළ ඇති අවබෝධය කවරාකාරද? විවිධ අයිතිවාසිකම් :තනි පුද්ගල හා සමාජ) පිළිබඳ පුද්ගලයන්ගේ එකිනෙකට වෙනස් අදහස් මෙන්ම මහජන මතය පිළිබඳ ඔවුන්ගේ සංජානනය කෙරෙහි මෙම අයිතිවාසිකම් බලපෑම් ඇති කරන ආකාරය පිළිබඳ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, සාකච්ඡාවට ලක් කිරීම සහ සැසඳීම. මාතෘකාව පිළිබඳ හොඳම සහ කෙටිම වීඩියෝ පට ග්‍රහණය කරගෙන, පරිරක්ෂණය කර බෙදාහරින්න.
    - 21වන සියවසේ දී ජනතාව හමුවේ ඇති විවිධාකාර වූ සමාජ අයිතිවාසිකම් මොනවා ද? එවැනි සමාජ අයිතිවාසිකම් පිළිබඳ ඔවුන් දැනුවත් කරන අන්තර්ගත සපයන්නන් කවරේ ද? වර්තමාන ඩිජිටල් පරිසරය තුළ පවතින පරස්පර විරෝධී සමාජ අයිතිවාසිකම් සලකා බලන්න.
    - සමාජය හැඩගැන්වීමට ආයතන ක්‍රියාකරන ආකාරය සලකා බැලූ විට, සමාජ අයිතිවාසිකම් හා තනි පුද්ගල තෝරාගැනීම් බලගැන්වීමට එහි ප්‍රතිඵලය සමත් වී ඇත්දැයි ඔබ සිතන්නේ

ද? තාක්ෂණයෙන් බලගැන්වූ සමාජ අයිතිවාසිකම් හා තනි පුද්ගල තෝරාගැනීම්වල ගම්‍යාර්ථ පිළිබඳ ඔවුන්ගේ සංජානනය දැනගැනීම සඳහා විවිධ පුද්ගලයන් සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීමට සචේතනිකව උත්සාහ කරන්න.

- පුද්ගලික මත හා තනි පුද්ගල තෝරාගැනීම් සමකාලීන සමාජ අයිතිවාසිකම් සමග තුලනය කිරීමට සාමකාමී සහජීවනයක් හා ඉවසීමක් සඳහා අවශ්‍ය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා සලකා බලන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පරිචය පිළිබඳ නවෝත්පාදන අදහස් ලබා ගැනීමට විවිධ පුද්ගල කණ්ඩායම් සමග කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා පැවැත්විය හැකි ය.
- පුරවැසියන්ගේ මාර්ගගත අත්දැකීම වැඩිදියුණු කිරීමේ හා පෙරහන් බුබුලු වැනි කෘත්‍රිම බුද්ධියෙන් පණගැන්වුණු ඇල්ගොරිතමීය වේදිකා ආශ්‍රිත අභියෝග ආමන්ත්‍රණ කිරීමෙත් අරමුණුතිව මාර්ගගත තොරතුරු හා ආඛ්‍යාන වෙත අපක්ෂපාතී ප්‍රවේශයක් ලබා දීමට, ඩිජිටල් සන්නිවේදන සමාගම් බලගැන්වීමේ ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව සාකච්ඡාවට ලක් කරන්න.
- ඇතැම් අන්තර්ජාල සමාගම් සිය සේවා ඉංජිනේරු සැලසුම හා නිර්මිතය පදනම් කරගනිමින් තනි පුද්ගල අයිතිවාසිකම් හා තෝරාගැනීම් පීඩාවට පත් කරන ආකාරය පිළිබඳ අවධානය යොමු කරන්න. ඔබට අනුව මෙම ගැටලු විසඳාගත හැක්කේ කෙසේ දැයි සාකච්ඡා කර ප්‍රායෝගික විසඳුම් ඉදිරිපත් කරන්න.
- මාර්ගගත සෙවුම් යන්ත්‍ර තුළින් පුරවැසියා පිවිසෙන තොරතුරුවල ගුණාත්මකභාවය කෙරෙහි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව බලපාන අන්දමත්, එකී සාක්ෂරතාවෙන් පුරවැසියාගේ අයිතිවාසිකම් හා තෝරාගැනීම් මත ඇති කරන බලපෑමත් සාකච්ඡාවට ලක් කරන්න.

ඇගයීම හා නිර්දේශ

- ඩිජිටල් පරිසරයක් තුළ තනි පුද්ගල අයිතිවාසිකම් හා තෝරගැනීම් සමතුලිතව පවත්වා ගෙන යාමට අවශ්‍ය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා කුසලතා නිර්ණය කිරීමට කුසලතා න්‍යාසයක් සහ නිපුණතා ඇගයීම් මාර්ගෝපදේශයක් ගොඩනගන්න.
- ඩිජිටල් සන්දර්භ තුළ මානව හිමිකම් සම්බන්ධයෙන් ඔබගේ දේශපාලන නියෝජිතයන් හට සලකා බැලීමට නෛතික පනතක් කෙටුම්පත් කරන්න.
- ප්‍රජාතන්ත්‍රවාදී පරිස්ථිතියක් තුළ විවිධ ආකාරයේ අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් ජනතාවගේ ඇති අවබෝධය සහ, මෙම අයිතිවාසිකම් කෙරෙහි වත්මන් අන්තර්ජාල සන්නිවේදන සමාගම්වල බලපෑම පිළිබඳ කුඩා සමීක්ෂණයක් සැලසුම් කර, දියත් කරන්න.
- වත්මන් ඩිජිටල් පරිසරය තුළ පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා හා සම්මුඛ සාකච්ඡා පවත්වන්න

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- පුද්ගලික තෝරාගැනීම්වල ප්‍රතිපත්ති
- පුද්ගලික තෝරගැනීම් හා සාමූහික තෝරාගැනීම් අතර සංසන්දනය
- තාක්ෂණයේ සදාචාරාත්මක භාවිතය
- ඩිජිටල් මැතිවරණවල අනාගතය

4 වන ඒකකය: සංවර්ධනය සඳහා කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍ය භාවිතය

කාලසීමාව:පැය 03

ප්‍රධාන මාතෘකා

- සංවර්ධනය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය
- සංවර්ධනය සඳහා සමාජ මාධ්‍ය භාවිතය
- කෘත්‍රිම බුද්ධිය භාවිතයේ ප්‍රධාන කාරක
- කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ ප්‍රධාන පරිපාලන/රෙගුලාසිමය ගැටලු

ඉගෙනුම් අරමුණු

මෙම මොඩියුලය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා ගනු ඇත:

- සංවර්ධනය සඳහා කෘත්‍රිම බුද්ධිය හා සමාජ මාධ්‍යවල පොදු භාවිත හඳුනාගෙන ඒවා ලැයිස්තුගත කිරීම.
- කෘත්‍රිම බුද්ධි භාවිතයේ ප්‍රධාන කාරක කිහිපයක් හඳුනාගැනීම.
- කෘත්‍රිම බුද්ධි පාලනයේ මූලික කරුණු :ප්‍රතිමාන සිට සදාචාරය දක්වාත් අනතුරුව රෙගුලාසි දක්වාත් විහිද යන) අවබෝධ කරගෙන විග්‍රහ කිරීම

මෙම ඒකකය තුළ සම්පූර්ණ කිරීමට ඉලක්කගත කරන නිපුණතා මට්ටම

- මූලික මට්ටමේ සිට අන්තර්මධ්‍යම මට්ටම දක්වා.

කෘත්‍රිම බුද්ධියේ ආංශික යෙදවුම්

බොහෝ ශාස්ත්‍රීය, පුද්ගලික අංශයේ හා අන්තර්ජාතික සංවර්ධන සංවිධාන සමාජ යහපත පිණිස කෘත්‍රිම බුද්ධිය ව්‍යාප්තගත කර ඇත. එහි ඇතැම් ධනාත්මක භාවිත පුළුල් පරිමාණයේ ඒවා වන අතර, තවත් ඒවා කුඩා පරිමාණයේ පිරික්සුම් වන අතර සෙසු ඒවා අත්හදා බැලීමේ අදියරවල පවතී. පහත දැක්වෙන්නේ විවිධ මූලාශ්‍රවලින් උකහා ගත් කෘත්‍රිම බුද්ධියේ සංවර්ධන භාවිතවල සාරාංශයකි. සෑම නිදසුනක් සමගම ශික්ෂකයන් හා ශිෂ්‍යයන් හට සහභාගී විය හැකි ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන යෝජිත ප්‍රශ්න කිහිපයක් දක්වා ඇත.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මෙම විෂයමාලාවේ (1වන කොටස) සාකච්ඡා කර ඇති පරිදි, විවිධාකාර ශික්ෂණවිද්‍යා ප්‍රවේශ භාවිත කළ හැකි ය. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- **රාජ්‍ය සේවය තුළ කෘත්‍රිම බුද්ධිය:** රජයන් විසින් කෘත්‍රිම බුද්ධිය භාවිතයට ගැනීම දිනෙන් දින ඉහළ යමින් පවතී. කෘත්‍රිම බුද්ධියට රාජ්‍ය අංශයේ විවිධාකාර වූ ක්‍රියාපටිපාටිවල කාර්යක්ෂමතාව හා ප්‍රමාණය ඉහළ නැංවිය හැකි ය. නිදසුන් වශයෙන්, රාජ්‍ය අංශ ප්‍රතිසංස්කරණය, ප්‍රතිපත්ති නිර්මාණය, අදාළ සේවා ක්‍රියාපටිපාටි තේරුම් ගැනීමට සහය වීම මෙන්ම රාජ්‍ය අංශයේ ඵලදායීත්වය ඉහළ නැංවීම ආදිය සම්බන්ධයෙන් රජය හා වඩාත් එක්ව කටයුතු කිරීමට පුරවැසියන්ට සහය වීමේ හැකියාව කෘත්‍රිම බුද්ධිය සතු ය.

    - පුරවැසි සහභාගීත්වය හා රජයේ ආයතන හා අන්තර්ක්‍රියා කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීමට පිළිබඳ පර්යේෂණ පැවැත්වීමට ශික්ෂකයන් ශිෂ්‍යයන්ට කණ්ඩායම් වශයෙන් මග පෙන්විය යුතු ය. මෙම කෘත්‍රිම බුද්ධි යෙදවුම් ඔබට අදාළ වේ ද?පළ පිළිබඳව බලධරයන් විසින්

හෙළිදරව් කරනු ලැබුවේ ද, ඒවා පාලනය කිරීමට ප්‍රතිපත්තියක් තිබේ ද? ඒවා තුළින් මින් පෙර නොතිබූ වෙනසක් ඇති වන්නේ ද? පොදු වාර්තා තුළ මෙම පද්ධතිවල විනිවිදභාවයෙන් යුත් විගණන/විශ්ලේෂණ පවතින්නේ ද? කිසියම් පුද්ගල කණ්ඩායමකට හෝ අවස්ථාවකට වෙනස් කොට සැලකීමේ හැකියාවක් කෘත්‍රිම බුද්ධිය සතු වේ ද? කෘත්‍රිම බුද්ධියෙන් පණගැන්වුණු පද්ධති වෙත යොමු වන සියලු පරිශීලකයන්ගේ පැමිණිලි හා ඉල්ලීම්වලට අප්‍රමාදව ප්‍රතිචාර දැක්වීමට ප්‍රතිකර්මයක් ලෙස යාන්ත්‍රණයක් පිහිටුවා තිබේ ද? මෙම පද්ධති හා යාන්ත්‍රණ තුළ කාන්තාවන් හා පිරිමින් සඳහා එකිනෙකට වෙනස් වූ පර්යාලෝක හෝ ගම්‍යාර්ථ තිබේ ද? එසේ නම් ඒ ඇයි? ස්ත්‍රී පුරුෂ සමාජභාවී පර්යාලෝක සැලකිල්ලට ගැනීම වැදගත් වන්නේ ඇයි? සොයාගැනීම් වාර්තාගත කර සාකච්ඡා කරන්න. අන්‍යයන් සමග ප්‍රතිඵල මාර්ගගතව හෝ මාර්ග අපගතව බෙදාගන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සහ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ක්ෂුද්‍ර ඉගෙනුම් සම්පත් සඳහා වන UNESCO MILCLICKS සමාජ මාධ්‍ය ප්‍රාරම්භය සොයා බලන්න. https://en.unesco.org/MILCLICKS. එමෙන්ම, සාකච්ඡාව සඳහා උපකාරී කරගැනීමට කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ වෘතාන්ත හා අදහස් රැගත් යුනෙස්කෝ වීඩියෝ පට කිහිපයක් නරඹන්න. https://en.unesco.org/artificial-intelligence/stories-ideas. වෙනත් සංවිධානවල වීඩියෝ සඳහා මාර්ගගතව සොයාබලන්න.

- **වෘද්ධිත හා අතථ්‍ය යථාර්ථය භාවිතයට ගන්නා විවිධ ක්ෂේත්‍ර තුළ කෘත්‍රිම බුද්ධිය:** වෘද්ධිත හා අතථ්‍ය යථාර්ථ සඳහා දෘඪාංග හා මෘදුකාංග සංවර්ධනය කිරීමේ දී කෘත්‍රිම බුද්ධි තාක්ෂණය උපයෝගී කර ගැනේ. මෙහි යහපත් ප්‍රතිඵල විනෝදාස්වාදය සැපයීමේ සිට ආබාධවලට ලක්වූවන්ට උපකාර කිරීම දක්වා පරාසයක විහිදී යයි. එක් යෙදවුමක, මාධ්‍ය සංවර්ධනය හා ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳ ජනතා සහභාගීත්වය සඳහා අතථ්‍ය යථාර්ථය යොදා ගෙන තිබේ. අතථ්‍ය යථාර්ථ ඉස් බණුවක් (headset) පැළඳ ගැනීම මගින්, යුධ කලාපයක සිටින ජනමාධ්‍යවේදියකුගේ අත්දැකීම විඳගන්නට සාමාන්‍ය පුරවැසියකුට හැකි වේ. එතුළින්, අප වෙත ප්‍රවෘත්ති ගෙන ඒම සඳහා ජනමාධ්‍යවේදියකු මුහුණ දෙන අනතුරු පිළිබඳ මනා අගය කිරීමක් අප තුළ ඇති වේ. යම්කිසි ගෘහ භාණ්ඩයක්, යන්ත්‍රයක් වැනි දෙයක් ලබා දී ඇති ඉඩකඩ තුළ රැඳවිය හැකි ආකාරය නිවැරදිව දක්වන ජංගම දුරකථන යෙදවුමක් සමාගම් ගණනාවක් විසින් පාරිභෝගිකයන් හට ලබා දීම මෙම තාක්ෂණය භාවිතයේ තවත් නිදසුනකි.

  - කෘත්‍රිම බුද්ධි හා අතථ්‍ය යථාර්ථ මෙවලම් සෙවීමට හා අත්හදා බැලීමට ශිෂ්‍යයන්ට මගපෙන්වන්න. ප්‍රදර්ශන සඳහා ඉගෙනුම් පරිසරයක් වෙත පැමිණෙන ලෙස අදාළ සංවර්ධන හෝ පුද්ගලික සංවිධානයට ආරාධනා කිරීම මගින් මෙම මෙවලම් වෙත භෞතිකව ප්‍රවේශ විය නොහැකි නම්, මාර්ගගත ප්‍රවේශය පිරික්සා බලන්න. අතථ්‍ය යථාර්ථ උපාංග හා යෙදවුම් භාවිතයේ දී ඔවුන් ලද අත්දැකීම් බෙදාහදා ගන්නා ලෙස ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටින්න. කෘත්‍රිම බුද්ධියෙන් පණ ගැන්වූ අතථ්‍ය තථ්‍යතා අධ්‍යාපනය සඳහා භාවිත කිරීම පිළිබඳ සාකච්ඡා කරන්න. ජනතාවට ඉගෙනුම සඳහා උපකාරී වීමට මේවා ඵලදායී වේ ද? ඒවායේ මානසික බලපෑම සම්බන්ධ ආචාරධර්ම හා විවිධ මට්ටම් පිළිබඳ සැලකිලිමත් විය යුතු කරුණු තිබේ ද? විමර්ශනය කර සාකච්ඡා කරන්න. වැඩිදුර සාකච්ඡා සඳහා කෘත්‍රිම බුද්ධිය හා බැඳුණු කතන්දර හා අදහස් පිළිබඳ පහත වීඩියෝ සමහරක් නරඹන්න. https://en.unesco.org/artificial-intelligence/stories-ideas

- **විද්‍යා හා සෞඛ්‍ය ක්ෂේත්‍ර තුළ කෘත්‍රිම බුද්ධිය:** තාක්ෂණයේ දියුණු වීම්, නව විද්‍යාත්මක උපකරණ භාවිතය ද ඇතුළුව, බුද්ධිය භාවිතය අතිශය වැදගත් වේ. නිදසුනක් ලෙස, ජාන විද්‍යාවේ සංකීර්ණ ගණනය කිරීම්, ප්‍රසාදිත රූපන ගුණාත්මකභාවය හා ගනුදෙනු කිරීමට මෙන්ම විද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිනිර්මාණය කිරීමේ හැකියාව වර්ධනය කිරීමටත් කෘත්‍රිම බුද්ධිය යොදා ගෙන තිබේ. උපන්‍යාස ජනනය කිරීම, දත්ත එක්රැස් කිරීම, විශාල දත්ත කට්ටල විශ්ලේෂණය කිරීම සහ සම්පරීක්ෂණාත්මක සැලසුම ක්‍රියාත්මක කිරීම ආදී පුළුල් පරාසයක විහිදෙන කාර්යයන් සඳහා ද කෘත්‍රිම බුද්ධිය භාවිතයට ගනු ලැබේ. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ කෘත්‍රිම බුද්ධිය භාවිතය තුළින් සෞඛ්‍ය පර්යේෂණ සඳහා උපකාරී වීම, ජනගහණය අවබෝධ කරගැනීම සහ පාලනය කිරීම, සෞඛ්‍ය තත්ත්ව පිළිබඳ කල්තබා අනාවැකි කීමට සහය වීම, රෝගී සත්කාරය වැඩි දියුණු කිරීම, පුද්ගලානුබද්ධ සෞඛ්‍ය සේවා සහ සෞඛ්‍ය සේවයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කරමින් පිරිවැය අවම කිරීම වැනි යහපත් ප්‍රතිලාභ රැසක් අත් වේ. ඒ අතරම, වඩා පුළුල් ජනතාවකට සේවය සැලසීමට වඩා, ප්‍රභූවරු හට ප්‍රතිලාභ

අත්වන වඩාත් වාණිජකාරණය වූ සෞඛ්‍ය සේවාවක් සඳහාකෘත්‍රිම බුද්ධිය යොදා ගැනෙනු ඇතැයි මේ වන විට ද සැලකිල්ලට භාජනය වී තිබේ.

- ඉහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් නැවත නැවතත් සිදු කිරීම හෝ පිළිගැනීම සිදු කරන්න. Built in, https://builtin.com/artificial-intelligence/artificial- intelligence-healthcare හි විස්තර කර ඇති මෙම උදාහරණ 32 විමසා බලන්න. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ කෘත්‍රිම බුද්ධිය භාවිතයේ දී ඇති වන ප්‍රධාන සදාචාරාත්මක අභියෝග මොනවා ද?

- **ආරක්ෂක හා අපරාධ යුක්තිය ක්ෂේත්‍ර තුළ කෘත්‍රිම බුද්ධිය:** ඩිජිටල් හා භෞතික ආරක්ෂණ අභියෝග අවම කිරීමට කෘත්‍රිම බුද්ධිය සතුව මනා විභවයක් ඇති නමුත්, ඒ සමගම යුක්ති අවගමනය වීමේ සහ මහා පරිමාණයෙන් සුපරීක්ෂාවට යටත් වීමේ අවදානම ද පවතී.

  - ජාල ආරක්ෂණය, විෂමතා හඳුනාගැනීම හා තර්ජන හෝ විභවීය අන්තරායන් අනාවරණය වැනි ඩිජිටල් ආරක්ෂණ යෙදවුම් තුළ කෘත්‍රිම බුද්ධිය පුළුල්ව භාවිත වේ (ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂය (OECD, 2017).
  - ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, වරින් වර අවට පරිසරයත්, සාමාන්‍ය චලන හා පැවැත්මත්, නිතර අවකාශයේ රැඳෙන පුද්ගලයන් හා භාණ්ඩත් කෘත්‍රිම බුද්ධි විසින් විශ්ලේෂණය කෙරෙන අතර, එනිසා අසාමාන්‍ය ජීවන රටාවක් නිරීක්ෂණය වුවහොත් ඇති වන තර්ජන හඳුනාගැනීමේ හැකියාවෙන් යුතු වේ.
  - අපරාධ නිරාකරණය කිරීමට හා සිද්ධිවල ප්‍රතිඵල පිළිබඳ අනාවැකි කීමට අධිකරණ පද්ධති විසින් ඉහත විස්තර කරන්නට යෙදුනු යෙදවුම් හා සමාන යෙදවුම් භාවිත කෙරේ. එසේ වුව ද, ඇතැම් ප්‍රජා කොටස් ඒකාකෘතිකකරණයට ලක් කරන දත්ත නැඹුරුතා මත පදනම්ව චරිත විග්‍රහ කිරීම සිදු වනු ඇතැයි ඇතැමෙක් කනස්සල්ල පල කරති.
  - වීඩියෝ සුපරීක්ෂාවට යටත් කිරීම මහජන ආරක්ෂාව තහවුරු කරන ජනප්‍රිය ක්‍රමයක් බවට ක්‍රමයෙන් පත්වෙමින් පවතී. දිනෙන් දින ඉහළ යන ආරක්ෂක කැමරා සංඛ්‍යාවෙන් (2014 දී ලොව වටා මිලියන 245 ක්) පෙනී යන්නේ රැස් කෙරෙන හා විශ්ලේෂණය කෙරෙන දත්ත ප්‍රමාණයේ ඉහළ යාමකි. මෙම සියලුම දත්ත සැකසීම මිනිස් මොළයට කිසිසේත් කළ නොහැක්කකි. ඒ වෙනුවට, දත්ත විශාල ප්‍රමාණයක් කලමනාකරණය කිරීමට හා හඳුනාගැනීම් හා අධීක්ෂණ යාන්ත්‍රික ක්‍රියාවලි ස්වයංක්‍රීය කිරීමට කෘත්‍රිම බුද්ධි භාවිත කරනු ලැබේ. එසේ වුවද, මුහුණු හඳුනාගැනීමේ තාක්ෂණ සම්බන්ධයෙන් දැඩි තර්ක විතර්ක ඉදිරිපත් වී තිබෙන අතර, ඒකාධිපතිත්ව විභවයන් ලෙස පෙනිය හැකි බැවින් ඇතැම් සිද්ධි සම්බන්ධයෙන් එම තාක්ෂණ භාවිතය තහනම් කර ඇත.
  - එවැනි අධීක්ෂණයට/සුපරීක්ෂාවට යටත්වීම සහ පුරෝකථන පොලිස් පාලනය හා දඬුවම් නියම කිරීම තුළින් පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය හා අනුමතිය පිළිබඳවත්, තමාගේ අනුමතියකින් තොරව වෙනත් අය තම ක්‍රියාකාරකම් පිළිබඳව විමසිලිමත් වීම සහ ඒවා වාර්තාගත කිරීම සම්බන්ධයෙන් මෙන්ම, පක්ෂග්‍රාහීත්වය හා චරිත විග්‍රහ සම්බන්ධයෙන් ද සදාචාරාත්මක ගැටලු මතු කර තිබේ.
  - මෙහි ප්‍රතිලාභ හා අඩුපාඩු කවරේ ද, මෙහි දී ගත යුතු ආරක්ෂක උපක්‍රම කවරේ ද?මෙය ඔබ රට තුළද සිදුවන්නේදැයි විමර්ශනය කරන්න. සාකච්ඡා කරන්න.

- **සමාජ මාධ්‍ය, අලෙවිකරණය හා වෙළෙඳ ප්‍රචාරණ ක්ෂේත්‍ර තුළ කෘත්‍රිම බුද්ධිය:** කෘත්‍රිම බුද්ධිය භාවිතය මගින් මාර්ගගත අත්දැකීම පුද්ගලානුබද්ධ කර ඇත. නිදසුන් වශයෙන්, පෙන්වනු ලබන අන්තර්ගතය යම් පුද්ගලයකුගේ අවධානය දිනා ගැනීමට සමත් වේ යැයි තහවුරු කරගැනීමට කෘත්‍රිම බුද්ධිය භාවිතා කෙරේ. මෙමගින් වඩාත් ඉලක්කගත වැඩසටහන් දියත් කිරීමට වෙළෙඳ ප්‍රචාරකයන්ට ඉඩ සැලසේ. "පාරිභෝගිකයන් වෙත පුද්ගලාරෝපිත හා ගතික වෙළෙඳ දැන්වීම් පෙර නොදුටු විරූ පරිමාණයකින් ලබා දීමට ඒවාට හැකි ය." (Chow, 2017). සමාගම්වල විකිණුම්වල ඉහළ යාමක් සහ අලෙවිකරණ ව්‍යාපාර සඳහා කළ ආයෝජනයේ ඵලවල ඉහළ යාමක් දක්නට ලැබිය හැකි වනු ඇති බව මින් අදහස් වේ. අනෙක් අතට, පර්යේෂණ පිරිවැයේ පැහැදිලි ඌනනයකින් පාරිභෝගිකයාට ප්‍රතිලාභයක් අත් විය හැකි ය. එසේ වුව ද, ක්ෂුද්‍රඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණයේ ප්‍රතිඵලයක් ලෙස, ඌනනය වූ මානව ස්වාධිකාරය හා කාරකත්වයත්, පරිශීලකයා හැසිරවීමේ බලය ක්‍රමයෙන් ඉහළ යාමත් පිළිබඳ ප්‍රශ්න මතු වේ.

- මාර්ගගත වෙළෙඳ දැන්වීම් පිළිබඳ සිය අදහස් සාකච්ඡා කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. එක් එක් පරිශීලකයා වෙනුවෙන් වෙළෙඳ දැන්වීම් ස්ථානගත කිරීමට කෘත්‍රිම බුද්ධිය උපයෝගී කරගන්නා බවට ඔවුන් දැනුවත් ද? ඒ සම්බන්ධයෙන් ඔවුන්ට යම් අපහසුතාවක් වේ ද? එසේ වීමට හෝ නොවීමට හේතු කවරේ ද? තමන්ට දකින්නට ලැබෙන වෙළෙඳ දැන්වීම් පිළිබඳ යම්කිසි පාලනයක් ඇති බවක් ශිෂ්‍යයෝ පෙන්නුම් කරත් ද? ඇතැම් විට තිරය මත පැන නගින "මට මේ වෙළෙඳ දැන්වීම පෙන්වන්නේ ඇයි?" යන නිවේදනය කෙරෙහි අවධානය යොමු කරන්න. වෙළෙඳ ප්‍රචාරණය පිළබඳ වැඩිදුර විස්තර දැනගැනීම සඳහා 10වන මොඩියුලය බලන්න.

    - වාණිජ ක්‍රියාකාරීන් සඳහා මෙම සන්දර්භය තුළ කෘත්‍රිම බුද්ධියට පහසුවෙන් හඳුනාගත හැකි ප්‍රතිලාභ තිබුණ ද, එය භාවිතය තුළින්, වෙනස් කොට සැලකීම සහ සාවද්‍යතාව පිළිබඳ සැලකිලිමත් විය යුතු කරුණු ද මතු කරයි. කෘත්‍රිම බුද්ධිය භාවිතයෙන් ස්වයංක්‍රීය වෙළෙඳාමේ නිරත වීම පිළිබඳව ද සැලකිලිමත් විය යුත්තේ එමගින් අස්ථාවරත්වය සහ කොටස් වෙළෙඳපොලේ කෙටි-කාලීනත්වය යළි තහවුරු කෙරෙන හෙයිනි.

- පහත වාර්තා දෙක අධ්‍යයනය කර සාකච්ඡා කරන්න:

1. යුරෝපා කොමිසම වෙතින්, Advisory Committee on Equal Opportunities for Women and Men" Opinion on Artificial Intelligence - opportunities and challenges for gender equality https://ec.europa.eu/info/sites/info/files/aid_development_cooperation_fundamental_rights/opinion_artificial_intelligence_ gender_equality_2020_en.pdf

2. යුනෙස්කෝව වෙතින්, ArtificialIntelligenceandGenderEquality (KeyfindingsofUNESCO's Global Dialogue" https://en.unesco.org/system/files/artificial_intelligence_and_ gender equality.pdf

    - ශිෂ්‍යයන් හට වඩාත් වැදගත් වන්නේ කවර ප්‍රධාන ගැටලු හෝ නිර්දේශ ද? ඒ ඇයි? මෙම මාතෘකාව සම්බන්ධයෙන් වන ගෝලීය කතිකාව සමාජ මාධ්‍ය හරහා සොයා බලන ලෙස ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. මාර්ගගත සාකච්ඡාවල යෙදීමට ශිෂ්‍යයන් දිරිගන්වන්න. එහෙත් පෙර සූදානම්ව සිටින බවට තහවුරු කරගන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා යොදාගන්න, සාක්ෂි බෙදාහදා ගන්න, එමෙන්ම ඔබේ මතයක් කරුණක් ලෙස පැන නැගෙන අවස්ථාවල ඒ බව හෙළිකරන්න. පුරවැසියන් ලෙස ශිෂ්‍යයන්ට ගත හැකි වෙනත් ක්‍රියාමාර්ග මොනවා ද?
    - සන්නිවේදන මාධ්‍ය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ විශේෂ උනන්දුවක් ඇති කරවන ගැටලු සහ නිර්දේශ තෝරාගන්න. ජාත්‍යන්තර කාන්තා දිනය (මාර්තු 8) ට අදාළව හෝ වෙනත් ඕනෑම අවස්ථාවකට ගැලපෙන මාර්ගගත ව්‍යාපාරයක් සැලසුම් කරන්න, නැතහොත් මහජන සේවා නිවේදනයක් සැලසුම් කර සකස් කරන්න.

ඇගයුම හා නිර්දේශ

- රචනා තරග
- කණ්ඩායම් වශයෙන් මහජන සේවා නිවේදන සම්පාදනය කිරීම
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
- විවෘත ග්‍රන්ථ පරීක්ෂණය
- කෘත්‍රිම බුද්ධිය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළව අදහස් උත්පාදනය කිරීමේ තරග

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- කෘත්‍රිම බුද්ධිය විගණනය කිරීම
- යාන්ත්‍රික ඉගෙනුම

- ගැඹුරු ඉගෙනුම
- බොට්ස්
- මුහුණු හා හැඟීම් හඳුනාගැනීම සහ අනාවරණය

සම්පත් හා යොමු

A.I. Artificial Intelligence (film, 2001) https://www.imdb.com/title/tt0212720/?ref_=nv_sr_srsg_0

අධ්‍යාපනය තුල කෘත්‍රිම බුද්ධිය

https://www.edweek.org/ew/articles/2020/05/20/artificial-intelligence-in-k-12-the-right-mix.html

Algorithm Literacy 101: A study by Project Information Literacy? https://www.minitex.umn.edu/news/2020-07/algorithm-literacy-101-study-project-information-literacy

AI in Society, OCED, https://ec.europa.eu/jrc/communities/sites/jrccties/files/eedfee77-en.pdf

Artificial Intelligence and Gender Equality: Key findings of UNESCO's Global Dialogue, UNESCO resource, https://en.unesco.org/system/files/artificial_intelligence_and_gender_equality.pdf

Artificial Intelligence and Life In 2030 One Hundred Year Study On Artificial Intelligence | Report Of The 2015 Study Panel | September 2016, Stanford University, https://ai100.stanford.edu

Steering AI and Advanced ICTs for Knowledge Societies – A rights, Openness, Access and Multi-stakeholder Perspective, UNESCO resource, https://www.unesco.de/sites/default/files/2019-11/372132eng.pdf

United Nations Activities on Artificial Intelligence (AI), https://www.itu.int/dms_pub/itu-s/opb/gen/S-GEN-UNACT-2018-1-PDF-E.pdf

Using AI for social good: This guide helps nonprofits and social enterprises learn how to apply artificial intelligence and machine learning to social, humanitarian and environmental challenges. https://ai.google/education/social-good-guide?category=examples

විවිධ ආකාරයේ කෘත්‍රිම බුද්ධි

Teacher-created Lesson Plans: Introduction to Algorithms, https://www.commonsense.org/education/lesson-plans/introduction-to-algorithms

http://content.educate.ericsson.net.s3.eu-north-1.amazonaws.com/learning-about-ai/what-is-ai.html

https://www.youtube.com/watch?v=im0XTC91qMI&feature=emb_logo

යන්ත්‍ර ඉගෙනුම ලබන ආකාරය

https://www.youtube.com/watch?v=R9OHn5ZF4Uo

https://course.elementsofai.com/1/3

https://theappsolutions.com/blog/development/pattern-recognition-guide/

http://teachingaifork12.org/

සමාජ මාධ්‍ය

https://www.smartinsights.com/social-media-marketing/social-media-strategy/new-global-social-media-research/

https://www.statista.com/statistics/489230/number-of-social-network-users-in-thailand/

https://www.marketingaiinstitute.com/blog/what-is-artificial-intelligence-for-social-media

පොදු මූලාශ්‍ර

https://medium.com/humansforai/the-impact-of-artificial-intelligence-on-social-media-579345b6f751

https://sproutsocial.com/insights/social-media-algorithms/

අතිරේක - ක්‍රීඩාවක් හා මාර්ගගත පාඨමාලාවක්

Machine Learning for Kids " https://machinelearningforkids.co.uk/

General Resources - The state of AI - November 2020: https://www.mckinsey.com/ business-functions/mckinsey-analytics/our-insights/global-survey-the-state-of-ai-in-2020?cid=podcast-eml-alt-mip-mck&hdpid=edff6cd6-3b1f-4ffc-b0f7-e73691cf1abe&hctky=9411114&hlkid=87ecdb8c23534606bd5cb92d3ccd9166

International Programming Classes for Children 4.5 to 17 Years, https://mah.alg.academy/

12වන මොඩියුලය:

ඩිජිටල් මාධ්‍ය, ක්‍රීඩා සහ සාම්ප්‍රදායික මාධ්‍ය

"සමාජයීය, ආර්ථික හා පාරිසරික අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සහ අපගේ සමාජ තුළ සක්‍රීයව සහභාගීවීම සඳහා පුරවැසියන් සවිබල ගැන්වීමට අප සැවොම අපේක්ෂාවෙන් පසුවන යුගයක, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වනාහී ජීවිතය සඳහා සාක්ෂරතාව බවට පත් වේ."

ගරු ටමාරා රස්තොවැක් සියාමශ්විලි මෙය,
මහකොමසාරිස් සහ යුනෙස්කෝ සංවිධානය සඳහා සර්බියා ජනරජයේ නිත්‍ය නියෝජිත

පසුබිම සහ තාර්කිකය

සමාජ, ආර්ථික හා දේශපාලනමය වෙනස්වීම් සඳහා පුරවැසියන්ගේ සහභාගිත්වය පුළුල් කිරීම සඳහා නව ආයතන සහ අභිසරණය වන තාක්ෂණ විසින් සිදු කරන භූමිකාව මෙම මොඩියුලය ඔස්සේ ශික්ෂකයා හා ශිෂ්‍යයා වෙත හඳුන්වා දෙනු ලැබේ. මාධ්‍යවල නව ඩිජිටල් හා ඉලෙක්ට්‍රොනික් ආකාර : මාර්ගගත ප්‍රවෘත්ති, බ්ලොග් අඩවි, විකිපීඩියා, යු ටියුබ්, සමාජ ජාලකරණ යෙදුම්, වීඩියෝ ක්‍රීඩා ආදී) සාම්ප්‍රදායික මාධ්‍යවල සිට විකාසනය වී ඇති ආකාරය සහ තොරතුරු හා දැනුම, තිරසර සංවර්ධනය, අදහස් ප්‍රකාශනයේ නිදහස, ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලි තුළ යහපාලනය හා සහභාගිත්වය සඳහා වූ පුළුල් ප්‍රවේශයකට එම නව මාධ්‍ය ආකාරවලින් හැකියාව ලබා දෙන්නේ කෙසේ ද යන්න මෙමගින් පැහැදිලි කෙරේ.

මුද්‍රිත මාධ්‍ය, විකාශන මාධ්‍ය (ගුවන් විදුලිය හා රූපවාහිනිය)" අන්තර්ජාය" ජංගම දුරකථන හා සමාජ මාධ්‍යවල සහජීවනය මගින් විවිධ වේදිකා ඔස්සේ අනතර්ගත ගලායෑම සඳහා ඉඩකඩ සැලසීම, තොරතුරු සඳහා වන ප්‍රවේශය පුළුල් කිරීම හා පුරවැසියන් හුදු නිෂ්ක්‍රීය ආකාරයකින් තොරතුරු භාවිත කිරීම පමණක් නොව එකී තොරතුරු වෙනස් කිරීම, සම්පාදනය කිරීම හා බෙදාහැරීම වැනි කාර්යන්හි සක්‍රීයව සහභාගී වන සහභාගිත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම ද සිදුකරයි. මේ අතර පරිහරණය කිරීම හා සම්පාදනය යන කාර්යය දෙකම සිදු කරන්නන් සඳහා ඉංග්‍රීසි භාෂාවේ දී භාවිතා වන 'සම්පාදක-පාරිභෝගික (prosumers)' වැනි අලුත් වදන් නිර්මාණය වීමක් ද සිදුවී ඇත. නිදසුනක් ලෙස නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICTs) ඔස්සේ තොරතුරු හා දැනුම බෙදා ගැනීම සඳහා වැඩි ග්‍රාහක පිරිස් සහභාගිත්වයක් සඳහා අවස්ථා විවෘත කර ඇති අතර, එමගින් සමාජ හා තිරසර සංවර්ධනය සඳහා සක්‍රීයව නියැලීම සඳහා පුද්ගලයන් දිරිමත් කරනු ලැබේ. වැදගත් විවාදය වනුයේ එවැනි සාධනීය කරුණු තවදුරටත් වැඩි දියුණු කරන්නේ කෙසේ ද යන්න හා සෘණාත්මක කරුණු ඵලදායි අයුරින් අවම කරන්නේ කෙසේ ද යන්න ය.

මේ සම්බන්ධයෙන් සැලකිමේ දී, විවිධ ආකාරවලින් පවතින ක්‍රීඩා මෙන්ම, කෘත්‍රිම බුද්ධිය (AI) තොරතුරු හා අනෙකුත් ඉදිරිපෙළ තාක්ෂණ සමග සම්බන්ධිත විභව්‍ය අවස්ථා සහ චිල්ල කර ඇති අභියෝග කෙරෙහිද මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව (MIL) ඔස්සේ අවධානය යොමු කෙරේ. ඩිජිටල් ලෝකය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ක්‍රීඩා මැයෙන් වූ

පළමු ජාත්‍යන්තර සමුළුව සහ ආශ්‍රිත සම්පත් වැඩිදියුණු කිරීම ඔස්සේ යුනෙස්කෝ සංවිධානය විසින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හා ක්‍රීඩා අතර පවතින දැඩි සම්බන්ධතාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර සංවාදය ඉදිරියට ගෙන ගොස් තිබේ[98]. බහුතරයක් වන තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රීඩා-පාදක ඉගෙනුම් සිදු වනුයේ පාලිත ඉගෙනුම් අවකාශයක නොවන බව පිළිගත යුතු ය. බොහෝවිට පුද්ගලයන් ස්වාධීනව අන්තර්ජාලයේ ක්‍රීඩාවල නිරතවන අතර, ඩිජිටල් ජංගම උපාංග ඔස්සේ මෙම ක්‍රියාවල නිරත වේ. එවැනි පරිසරවල දී, ක්‍රීඩා නිර්මාණ සැලසුම (game design) සහ ක්‍රීඩාවල නිරතවන කාලය අනුව ඒ සඳහා ඇබ්බැහිවීමකට අනුබල සපයයි. සංවාදය, සාමකාමී සහජීවනය හා ඉවසීම වෙනුවට වෛරීත්වය, ප්‍රචණ්ඩත්වය හා කේන්තිය වෙරගන්වන ක්‍රීඩා සම්බන්ධයෙන් ද ගැටලු මතු වී තිබේ. සියලුම වයස් කාණ්ඩවල කාන්තාවන් හා පුරුෂයන්ගේ චිකාකෘතිකම නියෝජන හෝ ඇතැම් ජාතීන්, සංස්කෘතීන්, හෝ පුද්ගල කණ්ඩායම් මතු කර දැක්වීමේ ක්‍රීඩාවන් තිබේ. ඇතැම් ක්‍රීඩාවල බොහෝවිට කාන්තාවන් සරාගී ආකාරයෙන්, අඩ නිරුවතින් සිටින ආකාරයෙන් නිරූපණය වේ[99]. පිරිමින් ශක්තිමත් හා ප්‍රචණ්ඩ ආකාරයෙන් ඉදිරිපත් කෙරේ. කළු ජාතික පුද්ගලයන් හා අනෙකුත් ජාතීන් ක්‍රීඩාවල දී අඩු වශයෙන් නියෝජනය වේ[100]. ඇමරිකා එක්සත් ජනපදයේ Pew පර්යේෂණ මධ්‍යස්ථානය මගින් 2015 වර්ෂයේ දී සිදු කළ පර්යේෂණයක දී, වී සඳහා තෝරාගත් නියැදියේ (ගෝලීය නියෝජනයක් නොවන නමුදු) 35%ක ප්‍රතිශතයකින් කළු ජාතිකයන්ගේ, 36%ක ප්‍රතිශතයකින් හිස්පැනික් ජාතිකයන්ගේ හා 24%ක ප්‍රතිශතයකින් සුදු ජාතිකයන්ගේ මතය වූයේ වීඩියෝ ක්‍රීඩාවල දී සුළු ජාතික කණ්ඩායම් අල්ප වශයෙන් නියෝජනය වන බවයි[101]. ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා[102] සහ ඔවුන්ගේ ජනවාර්ගික අනන්‍යතාව පිළිබඳ, ගැහැණු ළමුන්ගේ හා පිරිමි ළමුන්ගේ සංජානනය සඳහා මෙවැනි ආකාරයේ නියෝජනවලින් බලපෑමක් ඇති කෙරේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඔස්සේ පුද්ගලයන් සඳහා, විශේෂයෙන් තරුණතරුණියන් වෙත ස්වකීය මනස ආරක්ෂා කරගැනීමට සහ ක්‍රීඩා හා සියලුම ආකාරවල ඩිජිටල් තාක්ෂණවල දී මෙම චිකාකෘති වර්ග මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනවධානය[70] හඳුනාගැනීමට සහාය විය හැකි ය.

තවදුරටත් පවතින ගැටලුවක් වනුයේ ඩිජිටල් ක්‍රීඩාවල දී වරප්‍රසාද තරගය, කණ්ඩායම්වල සහයෝගිතාවය අභිභවා යෑම කොපමණ දුරකට පවතීද යන්න සහ ක්‍රීඩකයන්ගේ දත්ත රැස්කිරීම හා වීවා භාවිත කරනුයේ කවුරුන් විසින් ද යන්න හා වීවා උපයෝගී කරගනුයේ කෙසේ ද යන්න යි. ක්‍රීඩාව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් දත්ත උපයෝගී කර ගැනේ ද, නොඑසේ නම් තෙවන පාර්ශ්වවලට අලෙවි කරන වෙනමම විකිණිය හැකි වන්නා වූ ද්‍රව්‍යයක් වශයෙන් වීවා මූලිකවම කටයුතු කෙරේ ද හෝ ක්ෂුද්‍ර අලෙවිකරණ අවස්ථා ඉලක්ක කරගෙන අලෙවි කිරීමට යොදා ගැනේ ද?

98. Media and Information Literacy and Games in the Digital World, https://en.unes- co.org/news/journeying-world-games-media-and-information-literacy.
99. David Griner (January 10, 2012). "Videogame Ad Sets New Low for Objectifying Women".AdWeek. Retrieved7May20Everett,Anna;Watkins,Craig(2008),"The Power of Play: The Portrayal and Performance of Race in Video Games"14. Wikipedia.
100. Everett,Anna;Watkins,Craig(2008),"ThePowerofPlay:ThePortrayaland Performance of Race in Video Games"
101. "Viewsongamingdifferbyrace,ethnicity".PewResearchCenter.2015-12-17. Retrieved 2018-03-09.
102. Dietz,Tracy(1998)."AnExaminationofViolenceandGenderRolePortrayalsin VideoGames:ImplicationsforGenderSocializationandAggressiveBehaviour".Sex Roles. 38 (5/6): 425–442. doi:10.1023/A:1018709905920

සාම්ප්‍රදායික මාධ්‍යයේ සිට නව මාධ්‍ය තාක්ෂණ දක්වා වූ ගමන් මග සමගින් මෙම මොඩියුලය ආරම්භ වේ. නිශ්චිත කාල පරිච්ඡේදයක් මුළුල්ලේ විවිධ වර්ගයේ මාධ්‍ය තුළ වෙනස්වීම සහ අඛණ්ඩතාව පිළිබඳව ශික්ෂකයන් හා ශිෂ්‍යයන් වෙත හඳුන්වා දෙනු ලැබේ. මූලික අවබෝධයක් සඳහා හරයාත්මක අවශ්‍යතා නිශ්චය කිරීම සඳහා ශිෂ්‍යයන් වෙත අවස්ථාව ලබා දෙමින් ද, එසේම පැරණි හා නව මාධ්‍ය යන ද්විත්වයෙහිම පවතින ග්‍රහණය කරගත් නව්‍ය විභවය වටහා ගැනීමට අවස්ථාව සලසමින්, සමානතා හා අසමානතා සම්බන්ධයෙන් මෙමගින් අවධානය යොමු කරනු ලැබේ.

මෙම මොඩියුලය ඔස්සේ කාලාවකාශ වෙනස්වීම කෙරෙහි පමණක් නොව, සමාජය තුළ මාධ්‍ය, ඩිජිටල් තාක්ෂණ හා මෙවලම්වල විවිධ ආකාරවල භාවිතයන් පිළිබඳව ද අවධානය යොමු කෙරේ. විධිමත් සන්නිවේදනය, පුද්ගලික සන්නිවේදනය, අලෙවිකරණය, ඉගෙනීම හා පුරවැසි නියැලීම් ආදිය මීට ඇතුළත් විය හැකි ය. අනෙන්‍ය ක්‍රියාකාරී මාධ්‍ය මෙවලම් හා ක්‍රීඩා මගින් ඉගෙනීම්වල නියැලීමට මෙන්ම මහජන කතිකා සඳහා සිත් ගන්නා සුළු අවස්ථා සැපයේ - මෙවැනි ශක්‍යතාවන්ගේ නිමක් නොමැත. ඉගෙනුම් සඳහා පහසුකම් සැපයීමේ මාධ්‍යයක් ලෙස පැරණි මාධ්‍ය, නව මාධ්‍ය හා ක්‍රීඩා අතර අවකාශ තුළ සංසරණය වීම සඳහා ද මෙම මොඩියුලයේ දී ශික්ෂකයන් හා ශිෂ්‍යයන් සඳහා මගපෙන්වීමක් ලබා දේ. ක්‍රීඩා පිළිබඳ ස්වකීය අත්දැකීම් සම්බන්ධයෙන් විචාරශීලීව ප්‍රත්‍යවේක්ෂණය කළ හැකි නම් පුද්ගලයන්ට ක්‍රීඩා හරහා සිය ඉගෙනුම් අත්දැකීම් වැඩිදියුණු කරගත හැකි ය. සමාජයීය හා චිත්තවේගී සාක්ෂරතාව සමගින් මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව යන සියල්ල වැදගත් වේ. සාමය හා තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය පිළිබඳ යුනෙස්කෝ මහත්මා ගාන්ධි ආයතනය විසින් සමාජයීය හා චිත්තවේග ඉගෙනුම් සඳහා සම්පත් සපයනු ලැබේ[103].

ඩිජිටල් මාධ්‍යයේ වර්ධනයත් සමග සිදු වූ වැදගත් ප්‍රවණතාවක් වනුයේ මුද්‍රිත හා විකාශන මාධ්‍යවල ලක්ෂණයක් වන "එක් අයකුගේ සිට බොහෝ පිරිසක්" වන සාම්ප්‍රදායික සන්නිවේදන ආකෘතියකින් සාමූහික නිර්මාණකරණය හා අන්තර්ගත බෙදා ගන්නා "සමපදස්ථයකුගේ සිට සමපදස්ථයකු වෙත" යන ආකෘතියකට මාරු වීම යි. අන්තර්ගතය ඩිජිටල්කරණය වීමේ දී ගුවන් විදුලිය, රූපවාහිනිය, හා පුද්ගලික පරිගණක සහ ඇතැම්විට වඩාත්ම වැදගත්වන සියලුම ආකාරවල අන්තර්ගත බෙදා හැරීම සඳහා ප්‍රධානතම වේදිකාව වන ජංගම දුරකතනය ඔස්සේ ඒ වෙත ප්‍රවේශ විය හැකි ය. අභිසාරිතාව ලෙසින් හැඳින්වෙන හඬ, අනුරූප, ශබ්ද හා දත්ත ඩිජිටල්කරණය ඔස්සේ අනෙන්‍ය ක්‍රියාකාරිත්වය සඳහා නව ඉඩ ප්‍රස්ථා නිර්මාණය කෙරේ.

103. Resources on social and emotional literacy, https://mgiep.unesco.org/reports-and-guides

මාධ්‍යවල සිට ඩිජිටල් මාධ්‍ය කරා

1වන ඒකකය :
සාම්ප්‍රදායික මාධ්‍යවල සිට ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය

2වන ඒකකය :
සමාජය තුළ නව මාධ්‍ය තාක්ෂණ භාවිතය - සමාජ පරිවර්තනය

3 වන ඒකකය
ඉගෙනුම් අවකාශ තුළ ඩිජිටල් ක්‍රීඩා ද ඇතුළුව අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්වල භාවිත

සාම්ප්‍රදායික මාධ්‍යවල සිට ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය දක්වා

කාලසීමාව:පැය 2

ප්‍රධාන මාතෘකා

- වෙනස් වීම සහ අඛණ්ඩතාව-මාධ්‍ය පිළිබඳ කෙටි ඉතිහාසයක්
- මාධ්‍ය අභිසාරිතාව යනු කුමක් ද?
- නව මාධ්‍ය වශයෙන් ඩිජිටල් මාධ්‍ය
- සාම්ප්‍රදායික මාධ්‍ය හා නව මාධ්‍ය අතර ප්‍රමුඛ වෙනස්කම්

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂක හා ශිෂ්‍ය යන දෙපාර්ශ්වයම පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- මාධ්‍යයේ සංවර්ධනය පිළිබඳ කෙටි ඉතිහාසයක් හා ඒ ආශ්‍රිතව පැන නැඟී ඇති විවිධ ගැටලු පැහැදිලි කිරීම
- සාම්ප්‍රදායික මාධ්‍ය හා නව මාධ්‍යවල අපසාරිතාව හා අභිසාරිතාව නව තාක්ෂණයන් කෙසේ දායක වී ඇත් ද යන්න පැහැදිලි කිරීම
- සාම්ප්‍රදායික මාධ්‍ය හා නව මාධ්‍ය අතර වෙනස්කම් සහ නව මාධ්‍ය විසින් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය
- කෙසේ වැඩිදියුණු කර ඇත් ද යන්න පැහැදිලි කිරීම
- විධිමත්, නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපනයේ දී ක්‍රීඩාවල භාවිතය අනාවරණය කර ගැනීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ හා ක්‍රියාකාරකම්

මෙම විෂයමාලාවේ (1 වන කොටස) ඉහත සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදාගත හැකි ය. කරුණාකර 1වන කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක් ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- පර්යේෂණය: කණ්ඩායම් වශයෙන් කටයුතු කරන ශිෂ්‍යයන්ට මාධ්‍යවල විකාසනය සම්බන්ධයෙන් පර්යේෂණය කිරීම සහ විවිධ ආකාරවල මාධ්‍යවල ප්‍රගමනය ආශ්‍රිතව ඇති ගැටලු හඳුනාගැනීමේ කාර්යය පවරනු ලැබේ.
- සමීක්ෂණය: ශිෂ්‍යයන් විසින් වෙනස් ආකාර දෙකක පුද්ගලයන්ට අදාළව, එනම් ඩිජිටල් සංක්‍රමණිකයන් : වයස අවුරුදු 30 හෝ ඊට ඉහළ) සහ උපතේ සිටම ඩිජිටල් උපාංග සමීපව භාවිත කරන : වයස අවුරුදු 30 හෝ ඊට අඩු) පුද්ගලයන් අළලා සමීක්ෂණයක් දියත් කරනු ලැබේ. ඔවුන්ගේ එම සමීක්ෂණයේ දී, ඉහත පුද්ගල කාණ්ඩ දෙක විසින් සාම්ප්‍රදායික මාධ්‍ය හා නව මාධ්‍ය කුමන ආකාරයෙන් භාවිත කරන්නේ ද යන්න හා ඔවුන්ගේ සමාජය තුළ දී සාම්ප්‍රදායික මාධ්‍ය : ප්‍රවෘත්ති පත්‍ර, ගුවන් විදුලිය හා රූපවාහිනිය) නව මාධ්‍ය : බහුමාධ්‍ය ප්‍රවේශය සහිත ජංගම දුරකතන තාක්ෂණය, ක්‍රීඩා, මාර්ගගත ප්‍රවෘත්ති වෙබ් අඩවි) සමග අභිසාරී වන්නේ කෙසේ ද යන්න නිරීක්ෂණය කර විශ්ලේෂණය කරනු ලැබේ. කාන්තාවන් හා පිරිමින් හා යෞවන යෞවනියන් ක්‍රීඩා තුළ හා ඔවුන් භාවිත කරන අනෙකුත් ආකාරවල මාධ්‍ය තුළ නියෝජනය වනුයේ කෙසේ ද

යන්න නිරීක්ෂණය කරන ආකාර සමීක්ෂණය තුළ ඇතුළත් විය යුතු ය. අදාළ පාර්ශ්වකරුවන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ඔවුන්ට මග පෙන්වන්න.

- පර්යේෂණය:ශිෂ්‍යයන් විසින් ඔවුන්ගේ සමාජයේ නව මාධ්‍ය විසින් සාම්ප්‍රදායික ප්‍රවෘත්ති මාධ්‍ය වෙත කොතරම් දුරකට අභියෝග කරන්නේ ද, වැදගත් ප්‍රවෘත්ති අයිතම සම්බන්ධයෙන් ස්වකීය මතය ඉදිරිපත් කිරීම සඳහා ඔවුන්ගේ සමාජයේ වෙසෙන පුද්ගලයන් විසින් භාවිත කරනු ලබන විවිධ වෙනස් ආකාරවල මාධ්‍ය, ඔවුන් විසින් සාකච්ඡා කරන ගැටලු/ මාතෘකා සමගින් වෙනස් මාධ්‍ය වේදිකාවල පරිශීලකයන් සම්බන්ධයෙන් පර්යේෂණ කරනු ඇත. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල කණ්ඩායම් සාකච්ඡාව හා විවාදය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

- සිද්ධි අධ්‍යයනය: සත්‍ය වශයෙන් සිදුවන සිද්ධි සඳහා න්‍යායාත්මක දැනුම උපයෝගී කරගනුයේ කෙසේ ද යන්න අවබෝධ කරගැනීම සඳහා සැබෑ ජීවිතයේ සිදුවීමක් උපයෝගී කරගනිමින් තනි අවස්ථාවක් හෝ සංසිද්ධියක් පිළිබඳව ගැඹුරු විභාගයක් සිදුකිරීම සිද්ධි අධ්‍යයන ක්‍රමයේ දී සිදු වේ. මාධ්‍ය සහ අනෙකුත් අන්තර්ගත සැපයුම්කරුවන්ගේ විවිධ ආකාරවල සන්දේශ සඳහා දෛනිකව ශිෂ්‍යයන් නිරාවරණය වන බැවින් මෙම ප්‍රවේශය වනාහි මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීම සඳහා යෝග්‍ය ප්‍රවේශයකි. සිද්ධි මත බැලීම, දත්ත රැස්කිරීම, අන්තර්ගතය විශ්ලේෂණය කිරීම, හා ප්‍රතිඵල වාර්තාකරණය සඳහා මෙමගින් ක්‍රමානුකූල මාර්ගයක් සැපයෙන අතර, අභ්‍යාසලාභීන් අතර විමසුම් ඉගෙනුම සඳහා මෙය පෙරළා රුකුලක් වේ.

- පර්යේෂණය හා කණ්ඩායම් ඉදිරිපත් කිරීම: විවිධ මාධ්‍ය ආකාරවල ඓතිහාසික විකාසනය හා ඒවායේ සමානතා හා අසමානතා සම්බන්ධයෙන් පර්යේෂණ දියත් කිරීම සඳහා ශිෂ්‍යයන් විසින් කණ්ඩායම් සාදාගනු ලබන අතර කණ්ඩායම සඳහා ඉදිරිපත් කිරීමක් (presentation) සිදු කරනු ඇත.

- සම්මුඛ පරීක්ෂණය: සාම්ප්‍රදායික මාධ්‍යවල එක් ලක්ෂණයක් වනුයේ ප්‍රවෘත්තිවල සත්‍යතාව තහවුරු කිරීමට හා තනි පුද්ගලයෙකුට වඩා මාධ්‍ය ආයතනය වෙත එකී ප්‍රවෘත්ති පැවරීම සඳහා වන පරිද්දෙන් සකස්කළ සංවිධිත සංස්කරණ ක්‍රියාවලියකට මාධ්‍ය අන්තර්ගතය යටත් වීමයි. මාර්ගගත ක්‍රමයට අනුගත පුරවැසි ජනමාධ්‍යවේදියෙක් මෙම ක්‍රියාවලිය ඔස්සේ කටයුතු කරනු නොකරයි. මෙම සන්දර්භය තුළ, ප්‍රවෘත්ති පත්‍ර සංස්කාරකවරු හා මාර්ගගත ජනමාධ්‍යවේදීන් සමග සම්මුඛ සාකච්ඡාවක් සිදුකර ප්‍රවෘත්ති අයිතමයක් තෝරාගැනීම හා එයට සලකන ආකාරයෙහි සමානතා හා විෂමතා සාකච්ඡා කරන්න.

- වාර්තාව: ඔබගේ සමාජය තුළ නව මාධ්‍ය හා නව මාධ්‍ය තාක්ෂණයන් මතු වීමේ දී දැනුම හා තොරතුරු වෙනස්වීම හෝ පැවති ආකාරයෙන්ම පැවතීම කොතරම් දුරකට සිදුව ඇත් ද යන්න විමර්ශනය කර වාර්තාවක් ඉදිරිපත් කරන්න.

- රචනාව: පුද්ගලයන් අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වන ආකාරය සඳහා නව මාධ්‍ය බිහිවීම බලපා ඇත්තේ කෙසේ ද යන්න හා එයින් ඔවුන්ට කවර ප්‍රතිලාභ අත් වූයේ ද යන්න පිළිබඳව රචනාවක් පිළියෙල කරන්න. ශික්ෂකයන් හා ශිෂ්‍යන්ගේ සමාජ හා අධ්‍යයන ජීවිත කෙරෙහි නව මාධ්‍ය කෙසේ බලපාන්නේ ද යන්න හා ඩිජිටල් මාධ්‍ය වෙත විශ්වීය ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා අභියෝග හා අවස්ථාවන් මොනවාද යන්න විමසන්න.

- ප්‍රධාන ප්‍රවෘත්ති අයිතමයක් තෝරාගෙන එය විවිධ ආකාරවල මාධ්‍ය විසින් වාර්තා කරනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් සිදුකර එම සිද්ධිය විශ්ලේෂණය කරන්න. නිදසුනක් ලෙස, 2020 වර්ෂයේ කොවිඩ් -19 වසංගත තත්ත්වය ගෝලීය වශයෙන් බලපෑ අවස්ථාවේ දී, විවිධ ආකාරවල මාධ්‍ය විසින් එකී සිදුවීම එහි ගැඹුරටම වාර්තා කිරීම, විශ්ලේෂණය කිරීම හා කරුණු පවා වෙනස් ආකාරවලින් වාර්තා කිරීමට පෙළඹිනි. විවිධ රටවල වෙනස් සාම්ප්‍රදායික හා නව මාධ්‍ය පිළිබඳව අධ්‍යයනය කර ඔවුන් විසින් මූලාරම්භය, හේතු හා නිවාරණ ක්‍රියාමාර්ග ආදිය වාර්තා කරනු ලබන ආකාරය විමසා බලා එකම ආකාරයේ සහ විවිධ ආකාරවල මාධ්‍යවල මාධ්‍ය වාර්තා අතර පවතින සමානතා හා විෂමතා නිරීක්ෂණය කර ඒ සඳහා හේතු පැහැදිලි කරන්න. කොරෝනා වසංගත අර්බුදය වාර්තා කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ජාතිකත්ව ගැටලු සාකච්ඡාවට ගනු ලැබ ඇත් ද?

2වන ඒකකය: සමාජය තුළ නව මාධ්‍ය තාක්ෂණ භාවිතය - සමාජ පරිවර්තනය

කාලසීමාව:පැය 02 යි

ප්‍රධාන මාතෘකා

- සන්නිවේදන තාක්ෂණය හා සංවර්ධනය මෙන්ම සමාජය කෙරෙහි ඒවායේ බලපෑම්
- අන්තර්ගත නිර්මාණය, පරිශීලක අන්තර්ක්‍රියාව හා සමාජ ජාලකරණය සම්බන්ධිත නව්‍ය ආකාර ඇතුළුව, නව මාධ්‍ය පරිසරයන් සඳහා ජනතාවගේ ප්‍රවේශය හා භාවිතයන්
- ප්‍රජාතාන්ත්‍රවාදී ආයතන හා ක්‍රියාවලිවල වෙනස්වීම් සඳහා නව තාක්ෂණවල සහභාගිත්ව කාර්යයන්හි බලපෑම

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂක හා ශිෂ්‍ය යන දෙපාර්ශ්වයම පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- සමාජයක සමාජයීය හා දේශපාලන ජීවිතය කෙරෙහි ඩිජිටල් සන්නිවේදනයේ බලපෑම් විශ්ලේෂණය කිරීම හා අවබෝධ කරගැනීම.
- නව මාධ්‍ය පරිසර හා පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම්, අන්තර්ක්‍රියා, මාර්ගගත පෙනී සිටීම හා ඩිජිටල් වේදිකාවල ස්වයං-ඉදිරිපත් කිරීම් ආකාරවල අරමුණු විස්තර කිරීම.
- සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන හා ක්‍රියාවලි සඳහා නව තාක්ෂණ දායක වන්නේ කෙසේද :සහ නොවන්නේ කෙසේ ද) යන්න ඇගයීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ හා ක්‍රියාකාරකම්

මෙම විෂයමාලාවේ (1 වන කොටස) ඉහත සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදාගත හැකි ය. කරුණාකර 1වන කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක් ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- පර්යේෂණ හා කණ්ඩායම් ඉදිරිපත් කිරීම: සමාජයීය සංවර්ධනය සඳහා ඩිජිටල් සන්නිවේදන තාක්ෂණයන්ගේ බලපෑම ඇගයීම සඳහා නව තාක්ෂණයන්හි භාවිතය පිළිබඳව තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් විසින් කුඩා පරිමාණයේ පර්යේෂණ දියත් කරනු ලැබේ. මෙම සන්දර්භය තුළ නව තාක්ෂණ යන්නෙන් අදහස් කරනුයේ අන්තර්ජාලය, පරිගණක හා ජංගම උපාංග වන අතර, මේ සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් රැස්කරන සංඛ්‍යාලේඛන දත්ත අතරට ප්‍රවේශය : අයිතිය හා උපාංග භාවිතය), භාවිතයන් : භාවිත කරන වාර ගණන, ගතවන කාලය, භාවිත කිරීමේ අරමුණ), සහ නිපුණතා : ස්වයං ඇගයීම) ඇතුළත් වේ. තාක්ෂණයන්ගේ භාවිතය හා එම තාක්ෂණවල දියුණුවට අදාළව ගෝලීය, ජාතික හා ප්‍රාදේශීය සංඛ්‍යාලේඛන ලබා ගනුයේ කෙසේ ද හා කොතැනින් ද යන්න ශිෂ්‍යයන් විසින් උගත යුතු අතර, ඔවුන්ගේ අනාවරණය කරගැනීම් සංසන්දනය කර වෙනස්කම් සම්බන්ධයෙන් කරුණු : සමාජ ආර්ථික, පාරම්පරික, කලාපීය හා කාලය අනුව) ප්‍රත්‍යවේක්ෂණය යුතු ය. මෙම උපාංග මගින් සැපයෙන සේවාවල අයිතිය හා පාලනය කවුරුන් සතු වේද යන්න සම්බන්ධයෙන් අවධානය යොමුකිරීම වැදගත් ය.
- පන්ති කාමර සාකච්ඡා: ඉ-පාලනයෙහි දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරන නව හා ක්‍රමයෙන් විකාසනය වන පාලන ක්‍රම අදාළ වේ. නව තාක්ෂණවල ශක්‍යතා උපයෝගී කර ගනිමින් පුරවැසියන් සඳහා ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලි සඳහා පහසුකම් සැපයීමට රජය

විසින් කෙසේ ප්‍රයත්න දරා ඇත් ද සහ එය කෙතරම් දුරට කර නොමැත්තේ ද යන්න සම්බන්ධයෙන් සාමාන්‍ය පන්තිකාමර සාකච්ඡාවක් සඳහා ශික්ෂකයා විසින් මූලිකත්වය ගෙන කටයුතු කළ යුතු ය. ඉ-පාලනය යන්නෙන් අදහස් වනුයේ (1) ඉ-ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් අදහස් වනුයේ තීරණ ගැනීමේ පදනම නිර්මාණය කරන්නා වූ තොරතුරු හා දැනුම වෙත වර්ධිත ප්‍රවේශයක් හරහා සහභාගිත්වයට පහසුකම් සැලසීම ය; (2) ඉ-සේවා හෙවත් බදු පෝරම ගොනු කිරීම, අයදුම්පත්වල තත්ත්වය පරීක්ෂා කර බැලීම වැනි කටයුතු ස්වයංක්‍රියකරණය කිරීම මෙයින් අදහස් වේ; සහ (3) ඉ-පරිපාලනය යනු නවතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මගින් ක්‍රියාත්මක තොරතුරු ක්‍රියාවලි සමග රජයේ ක්‍රියාවලි හා රාජ්‍ය අංශයේ අභ්‍යන්තර කටයුතු වැඩිදියුණු කිරීම යි. නිදසුනක් ලෙස, ප්‍රජාතාන්ත්‍රික දේශපාලනික ක්‍රියාකාරකම් : මැතිවරණ, රජයේ හා ප්‍රාදේශීය දේශපාලනයේ විනිවිදබව, දේශපාලනික විවාද), පාසල් කටයුතු, සෞඛ්‍ය, සේවා-නියුක්ති සේවා, නිර්මිත පරිසර, නගර සැලසුම්කරණය හා නඩත්තු, සේම කාර්මාන්ත හා වාණිජ කටයුතු යන ක්ෂේත්‍රයන්හි කුමන ආකාරයේ ප්‍රජාතාන්ත්‍රික සන්නිවේදන සහ නියැලීමක් මාර්ගගත ප්‍රවර්ධනය කර, සබල කළ හැකි ද යන්න පිළිබඳව නුවණින් කල්පනා කරන ලෙස ශිෂ්‍යයන්ව දිරිමත් කෙරේ. ඉන් අනතුරුව, උසස් ඉ-පාලන වැඩසටහන් න්‍යාය පත්‍රයක් සහිත රටවල්වල නිදසුන් විමසා බැලිය හැකි ය. රටක ඉ-පාලනය වර්ධනය නොවීමට තුඩු දෙන ප්‍රධාන බාධක මොනවා ද සහ මෙම බාධක මගහරවා ගත හැක්කේ කෙසේ ද?

- කණ්ඩායම් ක්‍රියා: සාමාන්‍ය පුරවැසියන්ට ඔවුන් විසින් නිර්මාණය කරන අන්තර්ගත සම්පාදනය හා බෙදාගැනීම සඳහා නව තාක්ෂණ ඔස්සේ හැකියාව ලබාදී ඇත. පැරණි මාධ්‍ය හෝ රජයේ ආයතන විසින් මීට පෙර ආවරණය නොකරන ලද යම් දෙයක් පරිශීලකයන් විසින් ගොඩනැගූ අන්තර්ගතයෙන් ඉස්මතු කර ඇති විට, තම රටෙහි හෝ අසල්වැසි රටක සාකච්ඡා හා ක්‍රියාවලි අනාවරණය කර ගැනීම සඳහා ශිෂ්‍යයන් විසින් කුඩා පරිමාණයේ සිද්ධි අධ්‍යයනයක් සිදු කළ යුතු ය. ගෝලීය වශයෙන් දෘශ්‍යමාන වන හා ප්‍රතිඵල සහිත, නිදසුනකට අරාබි වසන්තය :2010 හි මුල් භාගයේ දී) සහ එූ එදද ව්‍යාපාරය (2017 වර්ෂයේ සිට ඉදිරියට) ඇතුළත් වේ. නමුත් දේශීය සංසිද්ධි හා ඇතැම්විට තමාගේම ප්‍රජාවන් වෙත බලපෑමක් ඇති කරන ක්‍රියාවලි හඳුනාගන්නා ලෙස ශිෂ්‍යයන්ට පැවසිය යුතු ය. මාර්ගගත ක්‍රියාකාරිත්වයට ඇතුළත් තවත් නිදසුන් වනුයේ දේශීය පුරවැසි ක්‍රියාකාරිත්වය, සත්ත්ව අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරිත්වය හා ශරීර ධනාත්මකතා ව්‍යාපාරය (body positivity movement) වැනි ක්‍රියාකාරිත්ව වේ. මෙම සිද්ධි අධ්‍යයන මත පදනම්ව, ශික්ෂකයා විසින් නව තාක්ෂණවල ප්‍රජාතාන්ත්‍රික විභවය නැවත ශක්තිමත් කිරීම අලලා සාකච්ඡාවක් දියත් කිරීමට ප්‍රධානත්වය ගත යුතු ය. පරිශීලකයන් විසින් ගොඩ නංවන ලද අන්තර්ගත මත පදනම්ව, වෙනස් ඩිජිටල් වේදිකා විසින් වෙනස් වූ සන්දේශ ව්‍යාප්ත කිරීමට දායක වනුයේ කෙසේ ද? පරිශීලකයන්ට සිය මත පළ කිරීමට හා ඊට අන් අය විසින් ඇහුම්කන් දෙනු ලැබීමට ඩිජිටල් තාක්ෂණ මගින් හැකියාව ලබාදෙන්නේ කෙසේ ද? WeChat" Twitter" VK" Facebook" Instagram සහ TikTok වැනි විවිධ සමාජ මාධ්‍යවල විවිධ ක්‍රියාකාරිත්ව තුළින් වැදගත් ප්‍රජාතාන්ත්‍රික ගැටලු ප්‍රචාරණයට හා නීතියේ සහ සමානාත්මතාවේ ප්‍රගමනයට රුකුලක් වනුයේ කෙසේ ද? ශිෂ්‍යයන් විසින් මාර්ගගත ක්‍රියාකාරිත්වයේ බලය ඇගයීම සිදු කරන්නේ කෙසේ ද සහ හඳුනාගත් දේශීය නිදර්ශනවලදී මෙය වටහා ගන්නේ කෙසේ ද? මෙම අස්ථිත්වයන් වෙතින්ම මානව අයිතිවාසිකම් සඳහා ඉහළ ගරුත්වයක් ඉල්ලා සිටීමට මෙම සේවා භාවිත කරන්නා වූ ක්‍රියාකාරිත්වය පිළිබඳ ඔවුන්ගේ අදහස කුමක් ද?

- ප්‍රවේශය පරීක්ෂා කිරීම: පිරිමින්, කාන්තාවන්, වෙනස් වයස් කණ්ඩායම් : බාල වයස් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්), ආබාධ සහිත පුද්ගලයන් හා වාර්ගික හා ස්වදේශික ජනගහනය වැනි ආන්තීකරණයට ලක් වූ වෙනත් කණ්ඩායම් සේම දුර බැහැර ප්‍රදේශවල වාසය කරන ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ නව තාක්ෂණ වැදගත් වේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ නව තාක්ෂණ වෙත පුද්ගලයන්ගේ ප්‍රවේශය සම්බන්ධයෙන් මූලික පර්යේෂණ සිදු කිරීම සඳහා දේශීය හෝ ජාත්‍යන්තර මූලාශ්‍ර භාවිතා කරන්න: කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයන් හා දුරබැහැර ප්‍රදේශවල ප්‍රජාවන් තුළ වාසය කරන පුද්ගලයන් අන්තර්ජාලය වෙත ප්‍රවේශ වනුයේ කෙසේ ද? කාන්තාවන් සඳහා පිරිමින් හා සමානවම සමාන ප්‍රවේශයක් තිබේ ද? ආබාධ සහිත පුද්ගලයන් හා දුරබැහැර ප්‍රදේශවල ප්‍රජාවන් තුළ වාසය කරන පුද්ගලයන් සඳහා ප්‍රවේශය පවතින්නේ කොපමණ ප්‍රමාණයකට ද? විවිධ රටවල අන්තර්ජාලය භාවිතය ආරම්භ වනුයේ කුමන වයසක දී ද? ගම්‍යාර්ථ මොනවා ද? ප්‍රවේශයේ විෂමතාව සඳහා හේතුපාදක වන දේශපාලන තීරණ හා සමාජ විෂමතා කුමන ආකාරයේ ද? නව තාක්ෂණ සඳහා වන ප්‍රවේශයන්හි දී ඇතැම් කණ්ඩායම්

ආන්තීකරණයට ලක් වේ නම් කුමක් කළ යුතු ද? ශිෂ්‍යයන්ට එක් රටක් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට හෝ රටවල් කිහිපයක් අතර සංසන්දනයක් සිදුකිරීමට සේම එක් නිශ්චිත පරිශීලක කණ්ඩායමක් තෝරා ගත හැකි ය. ඔබගේ රට හෝ කලාපය පිළිබඳ අදාළ දත්ත නොපවතී නම්, එසේ නොමැතිවීමට හේතු සොයා බැලීමට උත්සහ කරන්න. එවැනි දත්ත නොපැවතීම සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කළ යුත්තේ කුමන ආයතන ද? ඒ සම්බන්ධයෙන් කළ හැක්කේ කුමක් ද?

- රාජ්‍ය ආයතනවල වෙබ් අඩවිවල මුල් පිටු (homepages) සම්බන්ධ සිද්ධි අධ්‍යයන: නගර, නගර සභා, කලාප හා එවැනි සමාන ආකාර අධිකාරීන් විසින් පුරවැසියන්ගේ ක්‍රියාකාරකම් හා අන්තර්ක්‍රියා සබල කරන්නේ කුමන ආකාරවලින් ද, එනම් ඉ-පාලනය? නිදසුනක් වශයෙන් රටෙහි ප්‍රධාන නගරය, විශාල නගරයක් හා කුඩා නගරයක් තෝරා ගෙන ඔවුන්ගේ ඉ-පාලන ක්‍රමවේද සංසන්දනය කරන්න. එහි වැසියන් සඳහා මනා මාර්ගගත සේවාවක් සැපයීමට සහ සිය ප්‍රාදේශීය පරිසරය සමග කටයුතු කිරීමට රුකුලක් වීමට වඩා හොඳින් හෝ තව දුරටත් සිදු කළ හැක්කේ කුමක් ද යන්න සිතන්න. තවත් සිදු කළ හැකි දෙයක් වනුයේ රාජ්‍ය ආයතනයක් එනම් නිදසුනක් ලෙස, පාසලක්, ආරෝග්‍යශාලාවක් හෝ සාත්තු නිවාසයක් සලකා ඒ තුළින් බාහිර පුද්ගල කණ්ඩායම් (පාර්ශ්වකරුවන්) වෙත හා සමග සන්නිවේදනය සඳහා ඒවායේ මුල් පිටුව මගින් අවස්ථාව සලසන්නේ කෙසේද යන්න විමසා බැලීම යි. විවිධ ක්‍රියාකාරකම්වලට ඉඩ සලසන වෙනස් කාර්යයන්ට අදාළව වගුවක් සාදා භාවිතාවෙහි දී එක් එක් ක්‍රියාකාරකම සක්‍රීයව ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න ඇගයීමට ලක් කරන්න. එම වෙබ් අඩවියේ සහභාගිත්ව කාර්යය වැඩිදියුණු කළ හැක්කේ කෙසේ ද?

- සහභාගිත්ව ක්‍රියාවලි අනුරූපණය කිරීම: ඔබ රට තුළ පවතින්නේ කුමන ආකාරවල මහජන සහභාගිත්ව ක්‍රියාවලි ද? මහජනතාව වෙත අදාළ වන්නා වූ ක්‍රියාවලි සැලසුම්කරණය, අයවැය සැකසීම, ක්‍රියාත්මක කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා පුරවැසියන් සම්බන්ධ වන්නේ කෙසේ ද? පොදු ජන ජීවිතයේ එක් ක්ෂේත්‍රයක් (දේශපාලනයේ යම් ක්ෂේත්‍රයක් වැනි, උදා. තරුණ දේශපාලනය) තෝරාගෙන දේශීය පුරවැසියෙකුට එම පොදු ජන ජීවිතයේ විශේෂිත වූ ක්ෂේත්‍රය සඳහා ඔහු/ඇය සම්බන්ධ වන්නේ හා දායක වන්නේ කෙසේ ද යන්න දැක්වීම සඳහා අනුරූපණයක් සකස් කරන්න.

- ඩිජිටල්කරණය මත පදනම් ප්‍රත්‍යක්ෂ වෙනස්වීම්: දශක ගණනාවක් පුරා නව තාක්ෂණ හා ආයතනික සේවා විසින් පාසැලේ දී ලබන ශික්ෂණය වෙනස් කර ඇත්තේ කෙසේ ද? ඔබගේ අත්දැකීම පෙර පරම්පරාවේ අත්දැකීම් හා සංසන්දනය කරන්න. නිදසුනක් ලෙස, වයස අවුරුදු 60ක් වන පුද්ගලයෙකුගේ සන්නිවේදනය නිතිපතා පාසැල් යන සිසුවෙකුගේ සන්නිවේදනයෙන් වෙනස් වන්නේ කෙසේ ද? අන්තර්ක්‍රියාකාරිත්වය වෙනස් වී තිබෙන්නේ කෙසේ ද සහ ගුරුවරුන් හා සිසුවා/සිසුන් අතර, ගුරුවරයා හා සිසුන්ගේ දෙමාපියන් අතර, ගුරුවරයා හා බාහිර සහායකයන් අතර, ගුරුවරයා, සිසුවා හා පුරවැසියන් අතර සන්නිවේදනය හා සහයෝගීතාව සඳහා හඳුන්වා දී ඇති නව ඩිජිටල් ක්‍රම මොනවා ද? (1) සිසුවාට සහ ඔහුගේ/ඇයගේ ඉගෙනුමට, (2) ගුරුවරයාට සහ ඉගැන්වීම් කටයුතු ඉටු කිරීමෙහි ලා ඔහුගේ/ඇයගේ ශක්‍යතාවන්ට මෙම වෙනස්වීම් මගින් අත්වන වාසි අවාසි මොනවා ද?

- තෝරාගත් සමාජ මාධ්‍ය නාලිකාවක SWOT විශ්ලේෂණය (ජනප්‍රිය හා ප්‍රසිද්ධ ජංගම දුරකතන යෙදුමක් තෝරා ගෙන තනිව හෝ යුගල වශයෙන් හෝ කුඩා කණ්ඩායම් වශයෙන් එක් වී එකී තෝරාගත් ජංගම දුරකතන යෙදුමෙහි භාවිතවල විවිධ මානයන්ට අදාළව SWOT විශ්ලේෂණයක් සිදු කරන්න (එකී යෙදුම භාවිතා කරන පුද්ගලයෙකු සඳහා එහි ශක්තීන්'), දුර්වලතා (උ), අවස්ථා (ධ) සහ තර්ජන (ඔ) ලැයිස්තුගත කරන්න. ඔබගේ අත්දැකීම් හෝ ඔබ විසින් අසා ඇති ඔබගේ සමපදස්ථ කණ්ඩායමේ සාමාජිකයන්ගේ අත්දැකීම් ඔබට මේ සඳහා භාවිත කිරීම හෝ මෙම යෙදුම ඉහළ වාර ගණනකින් භාවිතා කරන පරිශීලකයන් සමග සම්මුඛ සාකච්ඡා මේ සඳහා යොදාගත හැකි ය. ඒ අනුව, එම යෙදුම පරිශීලකයාගේ එදිනෙදා ජීවිතය සඳහා කෙසේ බලපායි ද යන්න ඇගයීමට උත්සාහ දරන්න. පොදුවේ එහි බලපෑම ධනාත්මක හෝ ඍණාත්මක වේ ද ? හෝ එහි වාසි සහ අවාසි ඔබ විසින් ඇගයීමට ලක් කරන්නේ කෙසේ ද?

- සමාජ මාධ්‍ය තුළ වෙනසක් සිදු කිරීම: සමාජ මාධ්‍ය සඳහා, නිදසුනක් ලෙස යූ ටියුබ් (You Tube), විමියෝ (Vimeo), ටික් ටොක් (ඔසන ඔදන) හෝ ඉන්ස්ටග්‍රෑම් (Instagram) සඳහා ශ්‍රව්‍යදෘශ්‍ය අන්තර්ගත සම්පාදනය කිරීමේ නියැලෙන තැනැත්තෙකු සමග සම්මුඛ සාකච්ඡා සිදු කරන්න. වඩා යෝග්‍යතරව, සුපැහැදිලි ප්‍රකාශයනයක් සහිත අන්තර්ගත නිර්මාණ ශිල්පියෙකු තෝරාගන්න. එම පුද්ගලයාගේ සමාජ මාධ්‍ය උපායමාර්ග පැහැදිලි කර ඔහුට/ඇයට ප්‍රජාතන්ත්‍රවාදය සඳහා යම් දායකත්වයක් ලබා දිය හැකි ද හෝ දැනටමත් ලබා දී ඇත් ද යන්න ඇගයීමට ලක් කරන්න. ඔහුගේ

හෝ ඇයගේ සන්නිවේදනය කුමන ආකාර වේ ද ? ඔහුගේ හෝ ඇයගේ සුවිශේෂී මෙහෙවර සම්පූර්ණ කරන්නේ කෙසේ ද? අනුගාමිකයන් විසින් ඔහුගේ හෝ ඇයගේ අන්තර්ගතය කෙසේ පිළිගෙන ඇත් ද? පුද්ගලයන් හෝ ආයතන සිතන ආකාරය හෝ ක්‍රියාකරන ආකාරය වෙනස් කිරීම සඳහා ඔහුගේ හෝ ඇයගේ අන්තර්ගතය මගින් හැකිවී තිබේ ද? ඒ කෙසේ ද? කුමන ආකාරයේ කෙටිකාලීන සහ දිගු කාලීන ප්‍රතිඵල ඇති වේද?

ඇගයීම හා නිර්දේශ

- ඍජු ප්‍රායෝගික කණ්ඩායම් ව්‍යාපෘති ගොඩනැගීම සහ තක්සේරුව
- අධීක්ෂණය කෙරෙන මාර්ගගත නියැලීම
- ක්ෂේත්‍ර චාරිකා හා ජර්නල්ගත කිරීම
- සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය.

වැඩිදුර සලකාබැලීම සඳහා මාතෘකා

- ඩිජිටල් නවෝත්පාදන
- සංවර්ධනය සඳහා ප්‍රලේඛ උරුමයන් රැකගැනීම
- අධ්‍යාපනයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ.

3වන ඒකකය: පන්ති කාමර තුළ ඩිජිටල් ක්‍රීඩා ද ඇතුළුව අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්වල භාවිත

කාල සීමාව: පැය 03 යි

ප්‍රධාන මාතෘකා

- අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්, විවෘත අධ්‍යාපනික සම්පත් හා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා මෘදුකාංග විසඳුම් වර්ග
- ශිෂ්‍ය-හිතකාමී පරිසර නිර්මාණය කිරීම සඳහා අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්/ ඩිජිටල් ක්‍රීඩා
- ගෝලීය ගැටලු පිළිබඳ දැනුවත්බව ඉහළ නැංවීම සහ ප්‍රවර්ධනය සඳහා මෙවලමක් වශයෙන් මාධ්‍ය ක්‍රීඩා
- අධ්‍යාපනික ක්‍රීඩාවලට එදිරිව විනෝදාස්වාද ක්‍රීඩා

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂක හා ශිෂ්‍ය යන දෙපාර්ශ්වයම පහත සඳහන් හැකියාවන් ලබා ගනු ඇත:

- උපදෙස් ලබාදීමේ දී හා ඉගෙනුම් කටයුතුවල දී අන්තර්ක්‍රියාකාරී වෙබ් අඩවි, ඉදිරිපත්කිරීම්, මාර්ගගත සාකච්ඡා, බ්ලොග්, විකි, විකි බුක්ස්, ඉ-ග්‍රන්ථ, ශ්‍රව්‍ය විකාශනය (podcasting), විඩියෝ විකාශනය (videocasting), ඉල්ලුම සඳහා විඩියෝ විකාශනය (vodcasting) හා පරිගණක ක්‍රීඩා ඇතුළු අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්වල අගය හඳුනාගැනීම.
- අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්, විශේෂයෙන් පරිගණක ක්‍රීඩා භාවිතයෙන් සමාජයීය, බුද්ධිමය හා කාලාවකාශ නිපුණතා ගොඩනගා ගැනීම.

- උපදෙස් ලබාදීමේ දී හා ඉගෙනුම් කටයුතුවල දී අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්, විශේෂයෙන් ඩිජිටල් ක්‍රීඩා උපයෝගී කරගැනීම. අධ්‍යයන විෂයයන්වල :නිදසුන්. ගණිතය, විද්‍යාව, සමාජ අධ්‍යයනය ආදී) සංකල්ප හඳුන්වාදීම සඳහා පහළ/ඉහළ තාක්ෂණයන්ගෙන් සමන්විත බහුමාධ්‍ය මෙවලම්/ ක්‍රීඩා භාවිත කිරීම.
- නිදහස් හා විවෘත මූලාශ්‍ර හෝ හිමිකම් අයිතිය සහිත මෘදුකාංග භාවිතයෙන් වැඩිදියුණු කළ විවිධ අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම් විශ්ලේෂණය කිරීම හා උපදෙස් ලබාදීමේ දී හා ඉගෙනුම් කටයුතුවල දී ඒවායේ ගම්‍යාර්ථ හා බලපෑම් ඇගයීම.
- උපදෙස් ලබාදීමේ හා ඉගෙනුම් ක්‍රියාවලිවල දී විවෘත අධ්‍යාපනික සම්පත් මගින් ඇතිකරන බලපෑම හා අවස්ථා ඇගයීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ හා ක්‍රියාකාරකම්

"අප විසින් ඩිජිටල් ඉගෙනුම් විසඳුම් නිර්මාණය කරනු ලැබීම ඇත්ත වශයෙන්ම වර්තමානයේ දී අත්‍යවශ්‍ය වේ... මේ සඳහා , සියලුම ශිෂ්‍යයන් 21 වන ශතවර්ෂය සඳහා අදාළ නිපුණතාවන්ට අමතරව, සමාජ හා චිත්තවේගී නිපුණතා සම්බන්ධයෙන් සමත්බවක් දැක්වීම ඉතා වැදගත් වේ."

-අතිගරු ශ්‍රී රමේෂ් පෝක්‍රියාල් කමහතා,
ඉන්දියාවේ මානව සම්පත් සංවර්ධන ගරු අමාත්‍ය

මෙම විෂයමාලාවේ (1වන කොටස) ඉහත සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශ යොදාගත හැකි ය. කරුණාකර 1වන කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක් ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම්: ඔබ උපදෙස් ලබාදෙන විෂය ක්ෂේත්‍රය සිතන්න. ඕනෑම සෙවුම් යන්ත්‍රයක් භාවිතයෙන්, ශික්ෂකයන් හා ශිෂ්‍යයන් කණ්ඩායමක් සඳහා නිශ්චිත පාඩමක් :හෝ පාඩම්) ඉගැන්වීමේදී යොදාගත හැකි ඩිජිටල් ක්‍රීඩා ද ඇතුළුව අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම් හඳුනාගෙන ලැයිස්තු ගත කරන්න. මෙවැනි මෙවලම් රාශියක් හඳුනාගැනීමට ඔබට හැකි විය යුතු ය. විවිධාකාර ක්‍රීඩා වර්ග තෝරාගැනීම තහවුරු කරගැනීම සඳහා, කාන්තාවන් විසින් නිර්මාණය කළ ක්‍රීඩා සෙවීම සිදුකරන්න, එනම් ක්‍රීඩාව නිර්මාණය කළ කණ්ඩායමේ කාන්තාවන්ද ඒ සඳහා දායක වී තිබීම, එසේ නැතහොත් සුළු ජාතිකයන් හෝ ආන්තීකරණයට ලක් වූ පුද්ගල කණ්ඩායමක් විසින් නිර්මාණය කළ ක්‍රීඩා සෙවීම සිදු කරන්න. ඔබගේ විශේෂිත අවශ්‍යතා සඳහා ප්‍රයෝජනවත් වන පරිද්දෙන් මෙම මෙවලම් ප්‍රමුඛතාගත කරන්න. ඔබ විසින් භාවිත කළ වෙනත් නිර්ණායක මොනවා ද? අධ්‍යාපනයේ දී අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම් භාවිතය සම්බන්ධයෙන් විශේෂඥයන් විසින් යොදාගෙන ඇති නිර්ණායක පිළිබඳව පර්යේෂණ සිදුකරන්න. දැන් ඔබගේ නිර්ණායක එකී විශේෂඥයන්ගේ නිර්ණායක සමග සංසන්දනය කරන්න. ඔබගේ නිරීක්ෂණ මොනවා ද? ඔබ විශේෂඥයන්ගේ නිර්ණායක සමග එකඟ වන්නේ ද?
- ඔබගේ අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම් ලැයිස්තුවේ, උපදෙස් ලබාදීමේ/ ඉගෙනුම් ක්‍රියාවලියේ දී සහයෝගීතාව හා සාකච්ඡාව සුවිශේෂී ආකාරයෙන් වෙනස් කරන හා ඒ සඳහා පහසුකම් සපයන මෙවලම් ඔබට හඳුනාගත හැකි ද? ඔබ විසින් එම මෙවලම් තෝරාගත්තේ ඇයි? තොරතුරු සමග නව ආකාරවලින් අන්තර්ක්‍රියා කිරීම සඳහා, අන්තර්ගතය වෙනස් කිරීම හා ඔවුන්ට ආවේණික දැනුම නිර්මාණය කිරීම සඳහා බහුමාධ්‍ය තාක්ෂණය මගින් ශිෂ්‍යයන් හා ශික්ෂකයන් හට අවකාශය සලසන්නේ ඔබ සිතන පරිදි කෙසේ ද?
- මාර්ගගත ක්‍රීඩා[104]: මානුෂීය සමාකරණයක් වන කවරහෝ නොමිලේ ලබාදෙන මාර්ගගත ක්‍රීඩාවක නිරත වන්න. ගෝලීය ගැටලු සම්බන්ධයෙන් නිර්මාණාත්මක ආකාරයෙන් සිතීම සඳහා ඔබට පරිගණක ක්‍රීඩාවක් උපකාරී වන්නේ කෙසේ ද? මෙම ක්‍රීඩාවල ඉගෙනුම් ඵල මොනවා ද? මෙම ක්‍රීඩාවල කාන්තාවන් හා පිරිමින් සමාන ආකාරයෙන් නිරූපණය වේ ද? එහි ගම්‍යාර්ථ මොනවා

104. https://en.wikipedia.org/wiki/Food_Force_2 https://papersplea.se http://paxwarrior.com/home

ද? වෙනස සඳහා පක්ෂව ඔබ කතා කරන්නේ කෙසේ ද? අධ්‍යාපනික ආයතනයෙහි අන්තර්ජාල ප්‍රවේශය සීමාසහිත වන විට හෝ ප්‍රවේශය රහිත වන විට, අනෙකුත් පොදු අන්තර්ජාල මූලාශ්‍රවලින් අදාළ කරුණු සඳහා ප්‍රවේශ වීමට ශික්ෂකයන් හා ශිෂ්‍යයන් දිරිමත් කළ යුතු ය. අන්තර්ජාල ප්‍රවේශය ඉතා ප්‍රබල ආකාරයෙන් සීමා වී ඇති අවස්ථාවන්හි දී මාර්ගගත/ඉලෙක්ට්‍රොනික් ආකෘතියකින් පවතින ක්‍රීඩා ලබාගැනීමට හෝ පරිගණකගත කර ඇති ක්‍රීඩා භාවිත කිරීමට ශික්ෂකයන්ට ප්‍රයත්න දැරිය හැකි ය. පහත සඳහන් දෑ සඳහා ශිෂ්‍යයන් ද දිරිමත් කළ යුතු ය:

- නිශ්චිත විෂයන්හි : නිදසුන් භාෂාව, ගණිතය, භූගෝල විද්‍යාව ආදී) ඉලෙක්ට්‍රොනික ක්‍රීඩා සඳහා සිද්ධි අධ්‍යයන සිදු කර, නිශ්චිත ඉගෙනුම් සන්දර්භයක දී ක්‍රීඩා එකක් හෝ ද්විත්වයක් භාවිතා කිරීම සඳහා මග පෙන්වන්න. ක්‍රීඩාව භාවිත කළ ආකාරය හා පාඩමේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා එය උපකාරී වූ ආකාරය පිළිබඳ වාර්තාවක් ලියන්න.
- සාගින්න, ගැටුම් හා සාමය වැනි ගෝලීය ගැටලු සම්බන්ධ දැනුවත්බව ඉහළ නැංවීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් අංගයක් ලෙස ඉලෙක්ට්‍රොනික ක්‍රීඩාවක් භාවිත කර පාඩම් සැලසුමක් සකස් කරන්න. මෙම පාඩම උගන්වා, ඔවුන් විසින් මතුකළ ප්‍රශ්න සහ එම ප්‍රශ්න විසඳීම සඳහා ක්‍රීඩාව උපයෝගී වූ අකාරය දක්වමින් ගැටලු සඳහා ශික්ෂකයන්ගේ හා ශිෂ්‍යයන්ගේ ප්‍රතිචාර සම්බන්ධයෙන් කෙටි වාර්තාවක් ලියන්න.
- විවෘත අධ්‍යාපනික සම්පත් (OERs) විවෘත අධ්‍යාපනික සම්පත් (OERs) යනු දැනුම වෙත ප්‍රවේශය සඳහා උපකාරී වන විවෘත ලේඛන ආකෘතියෙන් පවතින නොමිලේ භාවිතය, නැවත භාවිතය, යම්කිසි පරිශීලකයන් කණ්ඩායමකගේ (ශිෂ්‍යයන්, පුහුණුකරුවන්ගේ පුහුණුකරුවන්, පහසුකම් සලසන්නන් යනාදී) ඔවුන්ට විශේෂිත වූ අවශ්‍යතා සඳහා සරිලන ආකාරයට සැකසීම සඳහා ඉඩ සලසමින් විවෘත බලපත්‍රයක් සහිතව නිකුත් කළ පූර්ණ පාඨමාලා, මොඩියුල, පාඨමාලා ද්‍රව්‍ය, පෙළ පොත්, මාර්ගගත සම්ප්‍රේෂණ වීඩියෝ (streaming videos), පරීක්ෂණ, මෘදුකාංග, සහ අනෙකුත් ඕනෑම ද්‍රව්‍යයක් (අන්තර්ක්‍රියාකාරී හෝ අන්තර්ක්‍රියාකාරී-නොවන) හෝ ශිල්පීය ක්‍රම ඇතුළුව ඉගෙනුම් ද්‍රව්‍ය හා මෙවලම් වේ. අභ්‍යාසලාභීන් පහත සඳහන් දේ සඳහා දිරිමත් කළ යුතු වේ:
    - විවෘත අධ්‍යාපනික සම්පත් සඳහා ප්‍රවේශය සලසන වෙබ් අඩවි කිහිපයක් හඳුනාගෙන විවෘත අධ්‍යාපනික සම්පත් ලෙස භාවිත කළ යුතු අධ්‍යාපනික සම්පත් සඳහා අවශ්‍යතා/ නිර්ණායක හඳුනාගැනීම.
    - විවෘත අධ්‍යාපනික සම්පත් නිර්මාණය කෙරෙන, භාවිත කරන, බෙදා හැරෙන හා නිශ්චිත උපදෙස් හා ඉගෙනුම් පරිසර හා අවශ්‍යතා සඳහා යෝග්‍ය පරිදි සකසා ගැනෙන ආකාරය පිළිබඳව විශ්ලේෂණය කිරීම.
    - නිදසුනක් ලෙස ඩිජිටල් ක්‍රීඩා විවෘත අධ්‍යාපනික සම්පත් ලෙස සකස් කරන්නේ කෙසේ ද යන්න විශ්ලේෂණය කර ප්‍රකාශන හිමිකම් නීති ද ඇතුළුව විවෘත අධ්‍යාපනික සම්පත්වල අවශ්‍යතාවලට අනුකූල වීමට කුමක් සිදු කළ යුතු ද යන්න අවබෝධ කරගැනීම.
    - පුස්තකාල පර්යේෂණ හා පංති කාමර සාකච්ඡා (ශිෂ්‍යයන් විසින් තමාට හුරු ඉලෙක්ට්‍රොනික ක්‍රීඩාවල භාවිත වන විවිධ ශිල්පීය ක්‍රම හඳුනාගැනීම, විශ්ලේෂණය කිරීම හා විචාරශීලීව සාකච්ඡා කිරීම සිදු කළ යුතු ය. ඉලෙක්ට්‍රොනික ක්‍රීඩා සමග සාම්ප්‍රදායික හෝ සංස්කෘතිකමය වශයෙන් සුවිශේෂී ක්‍රීඩා ඒවායේ අධ්‍යාපනික අගය හා සීමා සම්බන්ධයෙන් සසඳා වෙනස දක්වන්න. ශිෂ්‍යයන් තමන් විසින් අනාවරණය කරගත් දෑ ඉදිරිපත්කිරීම් ආකාරයෙන් ඉදිරිපත් කිරීම හෝ ඔවුන්ගේ අනාවරණ නිරූපණය සඳහා වගු භාවිත කළ යුතු ය.
    - පන්ති කාමර සාකච්ඡා: ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සරල අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය මෙවලම් හෝ ඩිජිටල් ක්‍රීඩා ඇතුළුව පාඩම් සැලසුමක් හා උපදෙස් ක්‍රියාකාරකම් මාලාවක් ඉදිරිපත් කරන්න. ඉගැන්වීම් කටයුතු සඳහා ඩිජිටල් ක්‍රීඩා ඒකාබද්ධ කිරීමේ වාසි හා අවාසි ශිෂ්‍යයන් විසින් පරීක්ෂා කළ යුතු ය. උපදෙස් හා ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ඩිජිටල් ක්‍රීඩා භාවිතා කිරීම සම්බන්ධයෙන් එක් කණ්ඩායමක් විසින් වාසි ද අනෙක් කණ්ඩායම විසින් අභියෝග හා අවාසි ද ඉදිරිපත් කළ යුතු ය[105].
    - තවදුරටත් ගැඹුරට යන්න: ගුරුවරුන් සඳහා යුනෙස්කෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා රාමුව, විවෘත අධ්‍යාපනික සම්පත් වේදිකාව ය ttps://www.oercommons.org/hubs/unesco ගවේෂණය කරන්න. මෙම වේදිකාව තුළ ඉදිරියට කටයුතු කිරීමට හා ඉගෙනුම් අවකාශය

105. See Chapter 3 of http://ames.eun.org/2009/09/teachers_handbook_on_how_to_us.html for more details.

තුළට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ප්‍රවීණත්වය ලබාග න්නේ කෙසේ ද යන්න පිළිබඳ වඩාත් දැනුවත් වීමටත් ශික්ෂකයන් සඳහා මඟ පෙන්විය යුතු ය. කණ්ඩායම් සාකච්ඡා සඳහා මඟ පෙන්විය යුතු ය. ශික්ෂකයන් මෙවැනි ආකාර පුහුණුවීම් සඳහා නිරාවරණය වී තිබේ ද? ශික්ෂකයන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ පුහුණු සඳහා නිරාවරණය වී තිබේ ද? ශික්ෂකයන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා වර්ධනය කිරීමට මෙන්ම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ පුහුණු ඒකාබද්ධ කිරීම සඳහා ඔවුන්ගේ රටවල හා ප්‍රජාවල කුමන පියවර ගෙන ඇත් ද යන්න විමර්ශනය කිරීමට ඔවුන්ට අවස්ථාව දිය යුතු ය.

ඇගයීම් හා නිර්දේශ

- ඉහත මෘතෘකාවලට අදාළ අධ්‍යාපනික සැලසුම් පාඩම් සහ මෙම පාඩම් අධීක්ෂණය යටතේ සම්පාදනය කර දීම. ලේඛනගත කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- රචනාව
- ඇගයීම් කාර්යය සඳහා අනෙකුත් යෝජිත ක්‍රියාකාරකම් හා ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සකස් කළ හැකි ය.

මෙම මොඩියුලය සඳහා සම්පත්

Chun, Wendy Hui Kyong. (2015). *New Media, Old Media: A History and Theory Reader, 2nd edition* (co-edited with Anna Watkins Fisher and Thomas Keenan, Routledge)

Digital Media: New Learners of the 21st Century (film, 2011) https://www.imdb.com/title/tt2056555/?ref_=nv_sr_srsg_0

Games for Learning, various resources from UNESCO's Mahatma Gandhi Institute of Education for Peace and Sustainable Development, https://mgiep.unesco.org/games-for-learning and https://mgiep.unesco.org/games-for-learning-old-page

Hjorth, L. (2011). Games and Gaming: An Introduction to New Media. Oxford: Berg.

Lenhart, A. 2009. It's Personal: Similarities and Differences in Online Social Network Use between Teens and Adults. Teens, Social Networking, Generations presentation at the International Communications Association Annual Meeting. (May 2009). www.pewInternet.org/Presentations/2009/19-Similarities-and-Differences-in-Online-Social-Network-Use.aspx

Madden, M. 2009. Eating, Thinking and Staying Active with New Media. Health, Education, Teens, Families, Web 2.0 presentation at the National Institute of Child Health and Human Development. (June 2009). www.pewInternet.org/Presentations/2009/15-Eating-Thinking-and-Staying-Active-with-New-Media.aspx

Strasburger, V.V. & Donnerstein, E. (2013) The New Media of Violent Video Games: Yet Same Old Media Problems? Clinical paediatrics, 2013 53:8, 721-725. Available: https://doi.org/10.1177/0009922813500340

UNESCO's Mahatma Gandhi Institute of Education for Peace and Sustainable Development (n.d.)., The Draft Industry Guidelines for Digital Learning. Available: https://mgiep.unesco.org/reports-and-guides

UNESCO's Mahatma Gandhi Institute of Education for Peace, (n.d.)., A Global Review of Digital Education Media and Resources. Available: https://mgiep.unesco.org/reports-and-guides

Youth Protection Toolkit, www.yprt.eu

REC

13වන මොඩියුලය:

මාධ්‍ය, තාක්ෂණය සහ තිරසර සංවර්ධන ඉලක්ක: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සන්දර්භය



"මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුරවැසියෝ තොරතුරු සෙවීමේ, ඒ වෙත ප්‍රවේශ වීමේ සහ තොරතුරු විචාරශීලීව තක්සේරු කිරීමේ හැකියාව ඇත්තෝ වෙති. ඒ අනුව, අන්තර්-සංස්කෘතික සංවාදය, තිරසර සංවර්ධනය සහ, වර්තමානයේ වඩාත් හදිසි අභියෝග සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා තොරතුරු සතු විභවය උපයෝගී කර ගැනීමට ඔවුහු සවිබලගැන්වී සිටිති.

UNESCO සංවිධානයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ෂින් කූ, 2019

පසුබිම සහ තාර්කිකය

තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) යනු "සියලු දෙනාටම වඩා තිරසර අනාගතයක් සාක්ෂාත් කර ගැනීම සඳහා[106] සහ ගෝලීය වශයෙන් සියල්ලන් විසින් මුහුණ පාන අභියෝග සහ තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා වූ සැලසුමකි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් ප්‍රවර්ධනය කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතීන්, ඉහත කී තිරසර සංවර්ධන ඉලක්ක වටා පැතිර පවතින අතර එමගින් ගෝලීය පුරවැසි අධ්‍යාපනය සබල කෙරේ.[107] විවෘත සහ තිරසර සංවර්ධනය සඳහා මෙවලමක් ලෙස මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව යොදාගැනීම පිළිබඳ මෙම මොඩියුලය ඒ පිළිබඳ අනෙකුත් මොඩියුලවලට ද අනුපූරක වේ. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සන්දර්භය (MIL) තිරසර සංවර්ධන ඉලක්ක 17ටම අදාළ වන අතර, පහත දැක්වෙන තිරසර සංවර්ධන ඉලක්ක තුළින් එම සන්දර්භය විශේෂයෙන් පිළිබිඹු කෙරේ: ගුණාත්මක අධ්‍යාපනයක් (ති.සං.ඉ. 4); ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව (ති.සං.ඉ. 5); සුනිසි මෙහෙවර සහ රැකියා අවස්ථා (ති.සං.ඉ. 8); අව අසමානාත්මතා(ති.සං.ඉ. 10); තිරසර නගර සහ ප්‍රජාවන් (ති.සං.ඉ. 11); සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන ප්‍රවර්ධනය (ති.සං.ඉ.16) (and Revitalizing Partnerships (SDG 17).

මෙහිදී නිදර්ශන තුනක් යෝජනා කර ඇත. සැමට ගුණාත්මක අධ්‍යාපනය පිළිබඳ වූ තිරසර සංවර්ධන ඉලක්ක අංක - 4 සලකා බලන කල, ගෝලීය පුරවැසිභාවය සහ සාමය ඇති කිරීමට ඉවහල් වන තීරණාත්මක තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් නිපුණතා තරුණයින් සහ

106. United Nations. (2020). About the Sustainable Development Goals, Available: https://www.un.org/ sustainabledevelopment/ sustainable-development-goals/
107. Singh" J'" Grizzle" A'" Joan S'" and Culver" S' (Eds'& (2015&' Media and Information Literacy for the Sustainable Development Goals' International Clearinghouse on Children" Youth and Media" NORDICOM" University of Gothenburg, Sweden. Published in cooperation with UNESCO

වැඩිහිටියන් හට පිරිනැමීම තුළින් "සැමට ගුණාත්මක අධ්‍යාපනයක්" යන තිරසර සංවර්ධන ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්දර්භය දායක වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්ව සහ කාන්තා සවිබල ගැන්වීම අවධාරණය කරනු ලබන තිරසර සංවර්ධන ඉලක්ක අංක - 5 දෙවැනි උදාහරණයකි. සියලු ආකාරයේ මාධ්‍ය සහ ඩිජිටල් වේදිකා තුළින් ප්‍රකාශනය වනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ චිකාකෘති, වෛරය සහ වාර්ගික වෙනස් කොට සැලකීම්, හඳුනා ගැනීමමේ, ඊට ප්‍රතිරෝධය දැක්වීමේ සහ පරිශීලක-විසින්-ජනිත අන්තර්ගත හරහා ප්‍රතිඅාඛ්‍යාන ඉදිරිපත් කිරීමේ හැකියාව ඉහළ නංවාගැනීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සෑම වයස් කාණ්ඩයකම ස්ත්‍රී / පුරුෂයන්ට සහාය වේ. අවසාන වශයෙන්, තොරතුරු සහ මූලික නිදහස සඳහා මහජන ප්‍රවේශය සහතික කරන තිරසර සංවර්ධන ඉලක්ක අංක 16ට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ සහය ලැබේ. මෙය තොරතුරු වෙත ප්‍රවේශ වීමේ දී පුරවැසියාගේ විචාරශීලී අවබෝධය ඉහළ නැංවීම මගින් මහජනයාගේ තොරතුරු වෙත ප්‍රවේශ වීම හා මූලික නිදහස; ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ සන්නිවේදන බලය හා ඩිජිටල් ස්වාධිකාරය, ඔවුන්ගේ මූලික නිදහස සහතික කිරීම මෙන්ම, නගර අන්තර්කරණීය, ආරක්ෂිත, දරා ගැනීමේ හැකියාවෙන් යුත් හා තිරසරභාවයෙන් යුත් බවට පත් කරන්නා වූ තොරතුරු සමග විචාරශීලීව කටයුතු කිරීම සහතික කිරීම ද අරමුණු කොට ගත්තකි.

විවිධ අන්තර්ගත සපයන්නන් විසින් ලබා දෙනු ලබන සංවර්ධන සන්දේශ සහ තොරතුරු, විචාරශීලි චින්තනය සහ ඉගෙනීම තුළින් විකේතනය කිරීම සඳහා අවශ්‍ය දැනුවත්භාවය සහ අවබෝධය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විසින් ප්‍රවර්ධනය කරනු ලැබේ. එමෙන්ම තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ දී තොරතුරු වෙත ප්‍රවේශ වීමේ භූමිකාව සහ තාක්ෂණය භාවිතා කිරීමේ සමාජ කතිකාවත පිළිබඳ උසස් අවබෝධයක් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් ලබා දේ. තිරසර සංවර්ධන ඉලක්ක සඳහා වූ ඉහළ සහභාගීත්වයක් උදෙසා අවබෝධිත පුරවැසියෙකු වීම අවශ්‍ය සාධකයක් වන අතර මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අංශය යන ක්ෂේත්‍ර හරහා සැරිසැරීමට උපකාරී වන ජීවන කුසලතාවකි. තිරසර සංවර්ධන ඉලක්කවලට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙහි අදාළත්වය හේතුවෙන් යුනෙස්කෝ සංවිධානයෙහි සාමාජික රාජ්‍ය මෙන්ම ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ආයතන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සිය ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ වැඩසටහන් තුළට වැඩි වශයෙන් ඇතුළත් කරගනිමින් සිටිති.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂර පුරවැසිභාවය යනු තිරසර සංවර්ධන ඉලක්ක අත්පත් කරගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. එමෙන්ම, ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ මාධ්‍යවල ව්‍යුහය සහ සංවිධානය මෙහි තවත් වැදගත් උපකාරක ස්ථම්භයක් වේ. ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ මාධ්‍යවල ව්‍යුහය සහ සංවිධානය ඒවායෙහි නිදහස, ස්වාධීනත්වය සහ බහුත්වයේ (pluralism) මට්ටම් හා සම්බන්ධ වේ (මෙම සංකල්ප පිළිබඳ වැඩි තොරතුරු සඳහා 1වන සහ 2වන මොඩියුල සහ පාරිභාෂික පදමාලාවෙහි චින අර්ථ දැක්වීම් බලන්න.) අන්තර්ගතයට සහ ක්‍රියාවලීන්ට බලපාන බැවින් ඩිජිටල් සන්නිවේදනයේ සහ මාධ්‍යවල හිමිකාරිත්වය සහ පාලනය යන සාධක ඉතා වැදගත් වේ. මාධ්‍යවේදීන්

සහ අනෙකුත් තොරතුරු වෘත්තිකයන් විසින් භාෂණයෙහි නිදහස සහ නිදහස් මාධ්‍ය ක්‍රියාවට නැංවීම තුළ තිරසර සංවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කෙරුණ ද, ඇතැම් විචාරකයන්ට අනුව, මෙම නිදහස සහ ස්වාධීනත්වය - විටෙක සියුම් ලෙස ද තවත් විටෙක වඩාත් නිර්ලජ්ජී ආකාරයෙන් ද - ඩිජිටල් සන්නිවේදන සහ මාධ්‍ය අයිතිකරුවන්ගේ, සේවා යෝජකයන්ගේ හෝ වෙළෙඳ දැන්වීම්කරුවන්ගේ මූල්‍ය හෝ දේශපාලනික මතවාද, හේතුවෙන් බලපෑමට යටත් වේ. ව්‍යාප්ත වන්නා වූ සමාජයීය, ආර්ථික, පාරිසරික, දේශපාලනික :සහ භූ-දේශපාලනික) යථාර්ථ සහ, හිමිකාරිත්ව සංකේන්ද්‍රණය සඳහා විභවය මගින්, එවැනි පාලනයක් සහ රටාව හා ව්‍යුහයද ප්‍රධාන වශයෙන් හැඩ ගස්වනු ලැබ ඇත.

එබැවින්, මාධ්‍ය, ඩිජිටල් වේදිකා සහ තොරතුරු සුරක්ෂිතාගාරවල සංස්කාරක ස්වාධීනත්වය සහ බහුත්වය යන දෙකම දේශීය හා ගෝලීය මට්ටමින් වැදගත් වේ. ගෝලීය සම්බන්ධතා ඉහළ යෑම හේතුවෙන්, තොරතුරු ප්‍රවාහ දැන් දකුණේ සිට උතුරට, උතුරේ සිට දකුණට මෙන්ම දකුණේ සිට දකුණට ගලා යාම සිදු විය හැකිය. ඇතැම් බලවත් කලාපීය මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් ජාත්‍යන්තර මාධ්‍ය සහ තාක්ෂණික පද්ධතිවල වින්‍යාසය සීඝ්‍රයෙන් වෙනස් කරමින් සිටියි.

ලොව පුරා රටවල් බහුතරය ගත් කල, ඒවායේ පිහිටි ඇතැම් ජන මාධ්‍ය සංවිධාන සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් පෞද්ගලික වාණිජ සමාගම් වේ. අනෙක් සංවිධාන පෞද්ගලික හිමිකාරිත්වයෙන් යුතු වුවද, රාජ නොවන සංවිධාන මගින් මෙහෙයවනු ලබන ඒවා මෙන් වාණිජ-නොවන සමාගම් වන අතර, තවත් සමහර සමාගම් රජය සතු හෝ රජය විසින් පාලනය කෙරෙන ඒවා වේ. විකාශනය කිරීමේ දී, පොදු සේවා විකාශන ආකෘතිය මගින් වාණිජ මාධ්‍ය ආයතන සහ රජය සතු මාධ්‍ය ආයතන යන දෙවර්ගයටම විකල්පයක් සපයනු ලැබේ. අදාළ ප්‍රදේශයෙහි වැසියන් සම්බන්ධ කර ගනිමින් අන්තර්ගත නිර්මාණය කරන, එමෙන්ම සමාජයේ ආන්තීකරණයට ලක් වූවන්ට හඬක් ලබා දීම සිදුකරන, ජනසතු මාධ්‍යවල ජනප්‍රියත්වය ඉහළ යෑම ධනාත්මක ප්‍රවණතාවකි. මාධ්‍ය වර්ග සහ අන්තර්ගතය පිළිබඳ මෙම බහුත්ව ස්වරූපය මගින් තිරසර සංවර්ධනය සඳහා වැඩි විභවයක් සැලසේ. සුදු ජාතිකයන් නොවන පුද්ගලයන් සහ සියලුම වයස් කාණ්ඩවල කාන්තාවන් සහ පිරිමින් වැනි ආන්තීකරණයටලක් වූ පුද්ගලයන්ගේ මත ප්‍රවර්ධනය කිරීම සඳහා විකල්ප මාධ්‍ය උපකාරී වේ. මෙකී ප්‍රජා මාධ්‍ය (විකල්ප මාධ්‍ය වශයෙන් හඳුන්වනු ලබන) පාසැල්, ප්‍රජාවන්, සේවා ස්ථාන ආදිය තුළ ස්ථාපිත කළ හැකි අතර, මහා පරිමාණ මාධ්‍ය ආයතන සඳහා විකල්ප ලෙස කටයුතු කළ හැකි ය. මෙම 'කුඩා පරිමාණ' මාධ්‍ය නාලිකා මගින් තොරතුරු සඳහා අයිතිය ප්‍රවර්ධනය කෙරෙන අතර ප්‍රජාවන්ට සිය මත විකාශනය කිරීමට සහ ශ්‍රවණය කරනු ලැබීමට වේදිකාවක් සකසා දෙයි.

මෙම මොඩියුලය, "මාධ්‍ය හා තොරුතුරු සාක්ෂරතාව සහ අන්තර්-සංස්කෘතික සංවාදය පිළිබඳ විශ්වවිද්‍යාලයීය ජාල (MILID) වාර්ෂික සංග්‍රහය - 2015" (UNESCO Media and Information Literacy and Intercultural Dialogue University Network (MILID Network) Yearbook 2015)" "තිරසර සංවර්ධන ඉලක්ක සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව" (Media and Information Literacy for the Sustainable Development Goals[108] නම් ලේඛන ඇසුරින් සකස්කොට ඇත.

108. https://milunesco.unaoc.org/wp content/uploads/2015/07/milid_yearbook_20151/pdf

ඒකක

1වන ඒකකය :
තිරසර සංවර්ධන ඉලක්ක තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ භූමිකාව

2වන ඒකකය :
මාධ්‍ය තුළ සමාජයීය, සංස්කෘතික, හා දේශපාලනික මාන

3වන ඒකකය :
මාධ්‍ය හිමිකාරිත්වය සහ තොරතුරු වෙළෙඳභාණ්ඩකරණය

4වන ඒකකය :
ඩිජිටල් තාක්ෂණය හරහා විකල්ප මාධ්‍ය ප්‍රවර්ධනය

5වන ඒකකය :

සමාජය තුළ නව මාධ්‍ය තාක්ෂණවල භාවිත - සමාජ විපර්යාසය

1වන ඒකකය: තිරසර සංවර්ධන ඉලක්ක තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ භූමිකාව.

කාලසීමාව : පැය 02

ප්‍රධාන මාතෘකා

- තිරසර සංවර්ධනය සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා උපදෙස් ලබා දීම සහ ඉගෙනුම.
- තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය
- අධ්‍යාපනික විෂයමාලා තුළ "මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා" ආකෘතිය ගවේෂණය, නියැලීම සහ සවිබලගැන්වීම
- සංවර්ධනය සඳහා දත්ත සහ පුස්තකාල
- සැමට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා ගෝලීය හවුල්කාරිත්වය: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ යුනෙස්කෝ සන්ධානය (UNESCO MIL Alliance)
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නගර
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, භාෂාමය විවිධත්වය, සහ අන්තර්සංස්කෘතික සංවාදය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව
- දැනුම් සමාජ වැඩිදියුණු කිරීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව: පරිසරය, දේශගුණික විපර්යාස, සෞඛ්‍ය සහ කෘෂි කර්මය

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා තිබිය යුතුය :

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ තිරසර සංවර්ධන ඉලක්ක අතර සම්බන්ධතාවය වටහා ගැනීම ; විවිධ සංවර්ධන ගැටලු සම්බන්ධයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යොදා ගැනීම පිළිබඳව විස්තර කිරීම
- දත්ත සහ පුස්තකාලවල වැදගත්කම වටහා ගැනීමට සහ විස්තර කිරීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ යුනෙස්කෝ සන්ධානය සම්බන්ධයෙන් අභිප්‍රේරණය වීම හා එහි නියැලීම සහ, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නගර හරහා, නාගරික අවකාශ සහ ජීවිතය තුළ නිර්මාණාශීලි ඉගෙනුම් වෙනුවෙන් පෙනී සිටීම

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ "E 03" සංකල්පය

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා, Explore (ගවේෂණය), Engage (නියැලීම) , Empower (සවිබලගැන්වීම) ආදර්ශය[109] (මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ E 3 සංකල්පය) ආදර්ශය වන බව අලගරන් II. (2015) යෝජනා කරයි:

1. ගවේෂණය කිරීම වනාහී තොරතුරු, මාධ්‍ය සහ ඩිජිටල් අන්තර්ගත නිපුණ ලෙස හඳුනාගැනීම, ඒ වෙත ප්‍රවේශ වීම සහ සමුද්ධරණයයි.
2. නියැලීම වනාහී මාධ්‍ය, තොරතුරු හා ඩිජිටල් සන්නිවේදන විචාරශීලීව විශ්ලේෂණය කිරීම හා තක්සේරු කිරීමයි.

109. Alagaran II, R. J. Q;, (2015). Explore, Engage, Empower Model: Integrating Media and Information Literacy (MIL) for Sustainable Development in Communication Education Curriculum. In Singh, J., Grizzle, A., Joan S., and Culver, S. (Eds.) (2015). Media and Information Literacy for the Sustainable Development Goals. International Clearinghouse on Children, Youth and Media, NORDICOM, University of Gothenburg, Sweden. Published in cooperation with UNESCO

3. සවිබල ගැන්වීම වනාහී, තීරණ ගැනීම හා සංවර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගැනීම පිණිස තොරතුරු හා මාධ්‍ය අන්තර්ගත සදාචාරාත්මක ලෙස, ආරක්ෂිතව, සහ වගකීමෙන් යුතුව නිර්මාණය කිරීම හෝ සම්පාදනය කිරීම, බෙදාගැනීම හෝ සන්නිවේදනය කිරීම සහ, භාවිත කිරීමයි.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ E3 සංකල්පය, තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපනය පිළිබඳ යුනෙස්කෝ රාමුවට සමගාමී වේ. තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපන රාමුව (ESD) යනු සමාජ පරිවර්තනය උදෙසා පරිසරය හා සම්බන්ධව අවබෝධිත තීරණ ගැනීමට සහ සංස්කෘතිවල විවිධත්වයට ගරු කිරීමට ශිෂ්‍යයන් සවිබල ගන්වන යාවජීව අධ්‍යාපන ක්‍රමයකි. ඉගෙනුම උත්තේජනය කිරීම මෙන්ම, විචාරශීලී සහ ක්‍රමවත් චින්තනය, සාමූහික තීරණ ගැනීම සහ, වර්තමාන සහ අනාගත පරපුර සඳහා වගකීම භාර ගැනීම වැනි හර නිපුණතා ප්‍රවර්ධනය කිරීම තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපනයේ (ESD) ඉගෙනුම් අරමුණු ලෙස යුනෙස්කෝ සංවිධානය විසින් දක්වා ඇත. තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපනය පිළිබඳ වැඩිදුරු තොරතුරු පහත සබැඳිය ඔස්සේ කියවිය හැකි ය. #ESDfor2030Toolbox, https://en.unesco.org/themes/education- sustainable-development/toolbox

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සාරාංශයක් ලෙස: මෙම විෂය මාලාවේ (1 කොටස) ඉහත දී සාකච්ඡාවට ලක් කළ පරිදි, මේ සඳහා විවිධ ශික්ෂණ විද්‍යා ප්‍රවේශ යොදා ගැනීමේ හැකියාව පවතී. කරුණාකර 1 කොටසේ දක්වා ඇති ලැයිස්තුව සලකා බලා, පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා වඩාත් සුදුසු වන්නේ කවර ප්‍රවේශයක්ද යන්නත්, ඔබ විසින් සකස් කරන ලද වෙනත් ප්‍රවේශ ඇත්නම් ඒ පිළිබඳවත් තීරණය කරන්න.

- #ESDfor2030Toolbox සංකල්පය තුළට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ E3 සංකල්පය අදාළ කරගැනීම සඳහා ශික්ෂකයන් විසින් ශිෂ්‍යයන්ට මග පෙන්විය යුතු ය. තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපනයේ ප්‍රමුඛතා ක්ෂේත්‍ර 05 කවරේද? එය දැනට ක්‍රියාවට නැංවෙන ක්ෂේත්‍ර 6 මොනවාද? ඉහත කී ප්‍රමුඛතා ක්ෂේත්‍ර 05 න් කිසිවක් තම රට හෝ ප්‍රජාව තුළ ක්‍රියාත්මක වන්නේදැයි හඳුනාගැනීමට සහ එම තොරතුරු වෙත ප්‍රවේශ වීමට ශිෂ්‍යයන්ට හැකි වනුයේ කවර ස්ථානයකදී ද? කණ්ඩායම් වශයෙන් ඉහත ක්ෂේත්‍ර වලින් එකක් හෝ දෙකක් වෙත අවධානය යොමු කිරීමත්, සිය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා ඇසුරින් සොයගනු ලැබූ තොරතුරු විචාරශීලීව ඇගයීමට ලක් කිරීමටත් ශිෂ්‍යයන් හට මග පෙන්වන්න. මෙහිදී ශිෂ්‍යයන්ට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද ?
- තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපන රාමුවෙහි 4වන ප්‍රමුඛතා ක්‍රියාකාරී ක්ෂේත්‍රය වන්නේ වන්නේ තරුණයන් සවිබල ගැන්වීම සහ මෙහෙයවීමයි. ශිෂ්‍යයන් තරුණ පිරිසක් හෝ තරුණයන් සමග කටයුතු කරන ශික්ෂකයන් වේ නම් —Top Tips for Youth Action to help you move from an idea to an actionable project plan˜ නම් යුනෙස්කෝ ව්‍යාපෘති සැලසුමේ අන්තර්ගතයෙහි පරිපූර්ණත්වය ගවේෂණය කිරීමට හා විශ්ලේෂණය කිරීම සඳහා ඔවුන්ට මග පෙන්වන්න.
- https://en.unesco.org/youth/toptips. මෙම ව්‍යාපෘති සැලසුමේ කුමක් ඔවුන් වෙනස් කරනු ඇත්ද? ගැහැණු ළමුන් සහ ඔවුනගේ පර්යාලෝක හා දායකත්වය මෙම සැලසුම තුළ පැහැදිලිව දක්වා තිබේද? ගැහැණු ළමුන් හා පිරිමි ළමුන්, නැතහොත් තරුණ තරුණියන් පිළිබඳව පැහැදිලිව සඳහන් කර ඇති බව තහවුරු කරගැනීම සඳහා, ශිෂ්‍යයන් තමන් විසින් උපයෝගී කරගත් ව්‍යාපෘති සැලසුමට ඇතුළත් කළ හැකි නව අදහස් ගොඩනගා ගන්නේ කෙසේද? ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් විසින් මාධ්‍ය හා තොරතුරු, සාක්ෂරතාව ව්‍යාපෘති සැලසුම තුළට ඒකාබද්ධ කරගනු ලබන්නේ කෙසේද? තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපනයෙහි තෝරාගත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාවට නැංවිය හැකි කුඩා, මධ්‍යම හෝ මහා පරිමාණ ව්‍යාපෘති සැලසුම් වැඩි දියුණු කිරීමට ශිෂ්‍ය කණ්ඩායම්වලට මග පෙන්වන්න. මෙම සෑම සැලසුමකටම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් වන බව තහවුරු කරගන්න. මහා පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් අවශ්‍ය අවස්තාවල දී, අවශ්‍යතාව අනුව බලධාරීන් හා සාකච්ඡා කොට අදාළ මූල්‍ය සම්පත් ඒ වෙත යොමු කරවා ගැනීමට උත්සහ කරන්න. මෙම ක්‍රියාවලිය තුළදී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ E 03 සංකල්පය ක්‍රියාවට නැංවෙන අයුරු ශික්ෂකයාට හෝ ශිෂ්‍යයාට දැකගත හැකි වනු ඇති ද?
- ශිෂ්‍යයන් කණ්ඩායම්වලට වෙන්කර, තෝරාගත් දේශීය හෝ විදේශීය මාධ්‍ය, ප්‍රවෘත්ති ජාල හෝ මාර්ගගත ඩිජිටල් සන්නිවේදන සඳහා මග පෙන්වන්න. "තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය" සම්බන්ධ ගැටලු පිළිබඳ ප්‍රවෘත්ති වාර්තා හෝ වාර්තා වැඩසටහන්, දරුවන් හෝ තරුණයන් සඳහා

වූ සජීවීකරණ අන්තර්ගත හෝ වෙනත් ඕනෑම ආකාරයක නිල චාර්තාකරණ හෝ මාධ්‍ය අන්තර්ගත හඳුනාගන්න. එම අන්තර්ගතවල අව්‍යාජත්වය පරීක්ෂා කිරීම සඳහා විශ්ලේෂණය කරන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට අදාළ ප්‍රශ්න විමසා සිටින්න. එම අන්තර්ගත නිර්මාණය කළේ කවුරුන්ද? කුමන අරමුණක් සඳහා ද? ඉන් ලබාදෙන සන්දේශ මොනවාද? ඒ සඳහා ලබා දී ඇති ආධාරක සාක්ෂි මොනවාද? එහි ඇතුළත් වන්නේ මොනවාද? ඉන් ඉවත් කරන්නට ඇත්තේ මොනවාද? එයින් ප්‍රතිලාභ ලබන්නේ කවුද? මෙම තොරතුරුවලින් බලපෑමට ලක්විය හැක්කේ කවුද? සත්‍යාපිත අන්තර්ගත සිය මාර්ගගත හෝ මාර්ග අපගත ජාල ඔස්සේ බෙදාහැරීමට ශිෂ්‍යයන් දිරිගන්වන්න.

- ලොවපුරා ඇති විවිධ ජංගම ඉගෙනුම් ක්‍රමලේඛ සහ ජංගම දුරකථන යෙදවුම් පිළිබඳව විමසා බලන්න. UNESCO YouthMobile ප්‍රාරම්භය, https://en.unesco. org/youthmobile මීට නිදසුනකි. තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපනය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ජංගම දුරකථන මගින් භාවිත කළ හැකි ජංගම යෙදවුම් නිර්මාණය කිරීම සඳහා අදහස් උත්පාදනය කිරීමටත්, ඒ පිළිබඳ සැලසුම් සකස් කිරීමටත් ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. ඒ වෙනුවෙන් මේ වන විට ද ඇති යෙදවුම් කවරේදැයි පළමුව පරීක්ෂා කර බලන්න.
- තිරසර සංවර්ධන ඉලක්ක සුපරීක්ෂාවට යටත් කිරීමේ දී මූලික වන්නේ දත්ත ය. පුස්තකාලය හෝ වෙනත් ඉගෙනුම් පරිසරයක් තුළ කියවීම් වාරයක් සංවිධානය කරන්න. තිරසර සංවර්ධන ඉලක්ක උදෙසා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව https://milunesco.unaoc.org/wp content/uploads/2015//07/milid_yearbook_20151.pdf නම් යුනෙස්කෝ මූලාශ්‍රයේ පහත දැක්වෙන පරිච්ඡේද දෙක කියවා ඒ පිළිබඳව සාකච්ඡා කරන්න.

1. *දත්ත සාක්ෂරතාව : පුස්තකාල සඳහා නැගී එන වගකීමක් (Data Literacy(AnEmerging Responsibility for Libraries,TiborKoltay,page131)*
2. *මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රමාණනය කිරීමට: තිරසර සංවර්ධන ඉලක්ක සඳහා ගම්‍යාර්ථ: Measuring Media and Information Literacy (Implications for the Sustainable Development Goals, Alton Grizzle, page107)*

ඉහත පරිච්ඡේදවල අන්තර්ගතය විසංයෝජනය කර බලන්න. විචාරශීලී ප්‍රශ්න අසන්න. ඉහත පරිච්ඡේදවල දක්වා ඇති යොමු දැක්වීම් (reference) නැවත විශ්ලේෂණය කොට ඉදිරිපත් කර ඇති තර්කවලට සහාය වන තවත් සාක්ෂි ඇත්දැයි සොයා බලන්න. ශිෂ්‍යයන් එම ප්‍රස්තුතයන්ට එකඟ වන්නේද? එකඟ වන්නේ නම් හෝ එකඟ නොවන්නේ නම් ඊට හේතු කවරේද? ඉගෙනුම ලබන්නනට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද? තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දර්ශකවලට අදාළ ක්‍රියාකාරකම් සඳහා 7වන මොඩියුලය බලන්න.

පුස්තකාල සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංසදය (The International Federation of Library Associations-IFLA) සහ වෙනත් ආයතන පුස්තකාල හා තොරතුරු සේවා හා ඒවා භාවිත කරන්නන් ප්‍රවර්ධනය කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීමට කටයුතු කරයි. එම සංසදය පිළිබඳ වැඩිදුර තොරතුරු https://www.ifa.org/about සැබඳිය ඔස්සේ කියවන්න. 2015 වසරේ දී තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් එකඟවීමට හා ඒවා ක්‍රියාවට නැංවීමට පෙර, එක්සත් ජාතීන්ගේ සංවිධාන සාමාජික රටවල් ඇතුළුව වෙනත් පාර්ශ්වකරුවෝ ගණනාවක් ඒ සම්බන්ධයෙන් පුස්තකාල සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංසදයේ අදහස් විමසා සිටියහ.

- පුස්තකාල සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංසදයේ රාමුව හෙවත්, පුස්තකාල, සංවර්ධනය සහ 2030 සඳහා එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රය පිළිබඳව https://www.ifa.org/libraries-development සබැඳිය ඔස්සේ කියවන්න. වැඩිදුර සංවර්ධනය සඳහා පුස්තකාලවලට කළ හැක්කේ කුමක් ද? තම ප්‍රදේශය, ප්‍රජාව හෝ පාසල තුළ ඇති පුස්තකාල ක්‍රියාකරනු ලබන්නේ මෙම පදනම තුළ පිහිටා සිටිමින්දැයි පරීක්ෂා කර බැලීම සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. පුස්තකාල සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංසදයේ අන්තර්ජාතික උද්දේශන වැඩසටහන (International Advocacy Programme) ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන්ට සහාය විය හැක්කේ කෙසේද? තිරසර සංවර්ධන ඉලක්ක උදෙසා වන මෙම පුස්තකාල සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංසද රාමුව, පුස්තකාල සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංසදයේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නිර්දේශවලට අදාළ වන්නේ කෙසේද? https://www.ifa.org/publications/ifa-media-and-information-literacyrecommendations

පුස්තකාලය තුළ හෝ වෙනත් ඉගෙනුම් පරිසරයක් තුළ කියවීම් සැසියක් සංවිධානය කොට "තිරසර සංවර්ධන ඉලක්ක සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව" **(Media and Information Literacy**

for the Sustainable Development Goals) නම් යුනෙස්කෝ මූලාශ්‍රයේ, පිටු අංක 257-287 හි දක්වා ඇති, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන කොටසෙහි කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න. https://milunesco.unaoc.org/wp-content/uploads/2015/07/ milid_yearbook_20151.pdf මෙම මාතෘකා යටතේ සපයා ඇති තර්ක සහ සාක්ෂි විචාරශීලීව විශ්ලේෂණය කර බැලීම සඳහා ශිෂ්‍යයන් හට මග පෙන්වන්න. මෙහි දී ශිෂ්‍යයන්ට ගතහැකි ක්‍රියාමාර්ග කවරේද? තිරසර සංවර්ධනය ඉලක්කවලට අදාළව කාන්තාවන් සහ ගැහැණු ළමුන්, පිරිමි ළමුන් සඳහා මෙන්ම ආබාධ සහිත පුද්ගලයන් සඳහා ද පවතින වැඩසටහන් සහ ව්‍යාපෘති පිළිබඳව විමසා බැලීම සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. මෙම සාකච්ඡා එක්සත් ජාතීන්ගේ **"ආබාධ සහිත වූවන් පිළිබඳ අන්තර්ජාතික දිනය"**[110] වන දෙසැම්බර් 03වන දින සහ **ජාත්‍යන්තර කාන්තා දිනය** වන **මාර්තු** 08වන දිනට අදාළව සිදු කරන්න. https://www.un.org/en/observances/womens-day/background|

- ඉහත මූලාශ්‍රයේ, පිටු අංක 299327 හි දක්වා ඇති දැනුම් සමාජ අභිවර්ධනය සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, පරිසරය, දේශගුණික විපර්යාසය, සෞඛ්‍යය සහ කෘෂි කර්මාන්තය යන කොටසට අදාළව ද ඉහත ක්‍රියාකාරකම සිදුකරන්න. තිරසර සංවර්ධන ඉලක්ක 17 මගින්, තිරසර සංවර්ධනයක් සඳහා වන ගෝලීය පාර්ශ්වකරණයන් යළි පුබුදුවාලීමට ප්‍රයත්න දරනු ලැබේ. එනම් මූල්‍යය, තාක්ෂණය, ධාරිතා ගොඩනැගීම, වෙළඳාම, පද්ධති ගැටලු, සහ බහු පාර්ශ්වීය හවුල්කාරිත්ව, දත්ත, අධීක්ෂණය සහ වගවීම ඇතුළු දැයින් මෙම ඉලක්ක සමන්විත වේ. ඉහතින් සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ මෙම විෂයමාලාවේ අනෙකුත් මොඩියුලවලින් තහවුරු කළ පරිදි, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළින් ඊට සහය දිය හැකි ය. යුනෙස්කෝ සංවිධානය සහ එහි හවුල්කාර පාර්ශ්ව විසින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පිළිබඳ යුනෙස්කෝ සන්ධානය UNESCO MIL ALLIANCE (ඉහත දී "the Global Alliance for Partnerships on MIL" ලෙස හඳුන්වනු ලැබූ) සන්ධානය පිහිටුවා ගෙන ඇත. https://en.unesco.org/themes/media- and-information-literacy/gapmil. තවද, මේ සම්බන්ධයෙන්, තිරසර සංවර්ධන ඉලක්ක 11 මගින් නගර සහ අනෙකුත් මානව ජනාවාස අන්තර්කරණීය, ආරක්ෂිත, දරාගත හැකි සහ තිරසර ස්ථාන බවට පත්කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, යුනෙස්කෝ සංවිධානය සහ හවුල්කාර පාර්ශ්ව විසින් ගෝලීය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නගර රාමුව ද දියත් කොට ඇත. එම රාමුව https://en.unesco.org/milcities ඔස්සේ බාගත කර ගන්න. මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නගර පිළිබඳ ප්‍රාරම්භය සිය පුරවැසියන් වෙත පූර්ණ අවධානය යොමු කරයි. "මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නගර " පිළිබඳ ප්‍රාරම්භයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ලෝකයෙහි අනෙකුත් නගර හා සම්බන්ධ වෙමින්, නාගරික අවකාශ සහ නාගරික ජීවිතය තුළ පුරවැසියන් වැඩි පිරිසක් වඩාත් නව්‍ය සහ නිර්මාණශීලී ලෙස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවෙන් සවිබල ගැන්වීමේ මාවතකට එම නගර අවතීර්ණ කරවීම ය. මෙහි දී "නගර" යන යෙදුම විවිධ ප්‍රජා අවකාශ හැඳින්වීම සඳහා පොදු යෙදුමක් ලෙස යොදාගැනේ.

- තිරසර සංවර්ධන ඉලක්ක 11 සහ 17 සඳහා වන ඉලක්ක ගවේෂණයට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවට එහි ඇති සම්බන්ධතාව සහ එයින් ලැබිය හැකි සහාය හඳුනාගැනීමට ඔවුනට හැකි ද? මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ යුනෙස්කෝ සන්ධානය සහ මාධ්‍ය හා තොරතුරු නගර රාමුව පිළිබඳව විමසා බලන්න. අදාළ ලේඛන බාගතකොට ගෙන අධ්‍යයනය කරන්න.
- සාමාන්‍යයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් පෙරමුණ නොගන්නා සංවිධාන අතරට ඇතුළත් පහත සංවිධාන සලකා බලන්න: එනම් නගර සභා සහ නගරාධිපතිවරුන්ගේ ජාල, මැතිවරණ කොමිෂන් සභා සහ අදාළ ජාල, ප්‍රවාහන පද්ධති, චිත්‍රපට කවුන්සිල, මාධ්‍ය නියාමකයින්, විනෝදාස්වාදය හා සෞඛ්‍ය හා වෙනත් සමාජ අංශ, කලා පාසල් සහ වෙනත් සංස්කෘතික කණ්ඩායම්, නාගරික කෞතුකාගාර, නිර්මාණශීලී නාගරික ජාල, පරිසර සංරක්ෂණ සහ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරීන්, ව්‍යාත්තීය සංගම්, පර්යේෂණ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රාදේශීය ප්‍රජාවන් සහ වෙනත් සමාජ මධ්‍යස්ථාන ආදිය. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට මෙම නාගරික ක්‍රියාකරුවන් හට කළ හැකි දේ පිළිබඳව සාකච්ඡා කිරීමට සහ ඒ සම්බන්ධයෙන් යෝජනා කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න. මාර්ගගතව හෝ මාර්ග අපගත ලෙස ප්‍රවර්ධනය කළ හැකි පෝස්ටර් හෝ තොරතුරු රූපසටහන් සකස් කිරීමට ඔවුහු සිය අදහස් භාවිතා කළ යුතු ය. ඉහත සඳහන් කර ඇති නගර හෝ ඊට අදාළ ක්‍රියාකාරීන්

110. https://www.un.org/en/observances/day-of-persons-with-disabilities#:~:text=UNESCO%20will%20mark%20the%20International,and%20with%20persons%20with%20disabilities%22.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂර නගර පිළිබඳ ප්‍රාරම්භයට දායක කරවීමට ශිෂ්‍යයන් හට හැකියාව තිබේ ද?

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ තිරසර සංවර්ධන ඉලක්ක හා සබැඳි හවුල්කාරිත්ව ප්‍රවර්ධනය කිරීම සඳහා ශිෂ්‍යයන්ට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ යුනෙස්කෝ සන්ධානය හා සම්බන්ධ විය හැක්කේ කෙසේද? ඔවුන්ට සිය රටවල් තුළ ප්‍රාදේශීය හෝ ජාතික මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ජාලා මෙන්ම, ඔවුන්ගේ ඉගෙනුම් අවකාශ සහ ප්‍රජාවන් තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සහ තිරසර සංවර්ධන ඉලක්ක සමාජ පිහිටුවීම, ඊට සම්බන්ධ වීම හෝ ඒවා ප්‍රවර්ධනය කිරීම සිදු කළ හැකිද? ආයතනයක් ලෙස හෝ තනි පුද්ගලයකු ලෙස මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ යුනෙස්කෝ සන්ධානය හා එක් වීමට ශිෂ්‍යයන්ව දිරි ගන්වන්න.

ඇගයීම සහ නිර්දේශ

- ඉහත ක්‍රියාකාරකම් පදනම් කරගත් පර්යේෂණ ව්‍යාපෘති
- සන්දර්භයානුකූල විශ්ලේෂණ අභ්‍යාස මත පදනම් වූ ලිඛිත අදහස්.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළව මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීම.
- ජාතික මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා ඇගයීම
- ඩිජිටල් යුගය තුළ තිරසර සංවර්ධන ඉලක්ක සහ සංවාදය තුළ ආගමික නායකයන්ගේ මැදිහත් වීම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ තිරසර සංවර්ධන ඉලක්ක

2වන ඒකකය: මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල සමාජ, සංස්කෘතික සහ දේශපාලනික මාන

කාලසීමාව : පැය 02

ප්‍රධාන මාතෘකා

- මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ රටෙහි සමාජ ආකෘතිය
- මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ රටෙහි සංස්කෘතිය
- මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ දේශපාලනික තත්ත්වය

ඉගෙනුම් අරමුණු

- මාධ්‍ය සංවිධාන, ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ සමාජ ආකෘතිය අතර සම්බන්ධතාව තේරුම් ගැනීම
- මාධ්‍ය සංවිධාන සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්, සහ රටෙහි සංස්කෘතික තත්ත්වය අතර සම්බන්ධතාව
- වටහා ගැනීමට හැකිවීම.

- මාධ්‍ය සංවිධාන සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල කාර්යයන් කෙරෙහි දේශපාලනික සහ සමාජයීය වාතාවරණය බලපාන අන්දම වටහා ගැනීම සහ, එකී සාධක ඉහත වාතාවරණය කෙරෙහි බලපෑ හැකි අන්දම වටහා ගැනීම.

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් ක්‍රියාත්මක වන්නේ සමාජ රික්තකයක් තුළ නොව විවිධාකාරයේ සමාජයීය සංවිධාන සහිත සමාජයක් තුළ ය. අන්තර්ගත-සපයන සංවිධාන සහ වෙනත් දේශපාලනික, සමාජයීය සහ ආර්ථික ආදී සමාජ සංවිධාන අතර ශක්තිමත් සබඳතා පවතින බව නිශ්චිතය. මෙම සංවිධානවල බලපෑමට ලක්වන අන්තර්ගත සපයන්නෝ ඒ අතරම, එම විවිධ සංවිධාන මත ද සිය බලපෑම ඇති කරති. මෙම අන්‍යෝන්‍ය බලපෑම්වවල මට්ටම රටින් රටට වෙනස් වේ. උදාහරණයක් ලෙස කිසියම් සමාජයක දේශපාලන රෙජීමය එම සමාජයේ මාධ්‍ය සංවිධානවල තත්ත්වය මත බලපෑමක් ඇති කිරීමට සමත් වේ.

එමෙන්ම, රටක ආර්ථික පද්ධතිය එරටෙහි මාධ්‍ය සංවිධාන සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් මත බලපෑමක් ඇති කිරීමට සමත් වේ. උදාහරණයක් ලෙස පෞද්ගලික අංශයෙහි වැඩි බලපෑමක් සහිත සමාජ තුළ මාධ්‍ය සංවිධාන සිය ප්‍රධාන අරමුදල් උපයා ගැනීමට වෙළෙඳ දැන්වීම් වෙනත් අරමුදල් මූලාශ්‍ර මත වැඩි වශයෙන් යැපෙනු ඇති අතර, වඩාත් හොඳින් නියාමනය කෙරෙන පද්ධති තුළ මාධ්‍ය සංවිධාන සඳහා ආධාර සැපයීම බලධාරීන් විසින්ම සිදුකෙරෙන්නට ඉඩ ඇත අතර, ඇතැම් අවස්ථාවල මෙම මාධ්‍ය ආයතන එම රජයේ හඬ ලෙස ද භාවිත කරනු ලැබීමටද ඉඩ ඇත. මෙය රටක සංස්කෘතික තත්ත්වයට ද අදාළ වේ. සමාජයක සංස්කෘතිය සහ සම්ප්‍රදායන් මාධ්‍ය සංවිධාන සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වලට මත බලපෑමක් එල්ල කරයි.

මෙම ඒකකය ප්‍රධාන වශයෙන්ම ශිෂ්‍යයන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය මත රඳා පවතී. පහත දැක්වෙන ගැටලුවලට අනුව ඔවුන් තම තමන්ගේ සමාජ තුළින් උදාහරණ ලබාදිය යුතු ය. (වැඩි විස්තර සහ අදාළ යෝජිත ක්‍රියාකාරකම් සඳහා මොඩියුල 1වන, 2වන, 12වන සහ අනෙකුත් මොඩියුල බලන්න)

- සමාජ තුළ මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල තත්ත්වය, ඒවා අඩු වැඩි වශයෙන් නියාමනයෙන් නිදහස්ව පවතින්නේ ද? තම සමාජ සම්ප්‍රදායන් සහ සංස්කෘතිය කවරක් වුවද, පුරවැසියන් හට තමන්ට පැවසීමට අවශ්‍ය ඕනෑම දෙයක් පැවසීමේ නිදහස ඇත් ද? වාර්තාකරණයේ දී සත්‍යාපනය කිරීමේ වෘත්තීය ප්‍රමිතිවලට අනුගත වීමටත් ප්‍රකාශයට පත් කිරීමේ දී මහජන සුබසිද්ධියට අනුව කටයුතු කිරීමටත් ජනමාධ්‍යවේදීන්ට නිදහස තිබේ ද?
- මාධ්‍ය සහ ඩිජිටල් සමාගම් විසින් පිළිබිඹු කළයුතු ආචාරධර්ම පද්ධතියක් ඇත. මාධ්‍ය සහ ඩිජිටල් සමාගම් ඊට අනුකූලව කටයුතු කරන්නේද?
- ආර්ථික තත්ත්වය මාධ්‍ය වෘත්තිකයන්ගේ පරිචය කෙරෙහි කවරාකාරයකින් බලපාන්නේ ද? මාධ්‍ය සංවිධාන සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් සඳහා අරමුදල් සැපයෙන්නේ කෙසේද? ඔවුනගේ ප්‍රධාන අරමුදල් මූලාශ්‍ර මොනවාද, වෙළෙඳ දැන්වීම් සහ /හෝ වෙනත් මූලාශ්‍රයන් ද?
- එමෙන්ම මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වල හිමිකාරිත්වය පිළිබඳව ද අවධානය යොමු කිරීම වැදගත් වේ. ඒවායේ හිමිකාරීත්වය දරන්නේ කවුද? එහි ඇති වැදගත්කම කුමක්ද?
- මාධ්‍ය හිමිකාරීත්වය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා පහත 3වන ඒකකය බලන්න.

03 වන ඒකකය: මාධ්‍ය හිමිකාරීත්වය සහ තොරතුරු වෙළෙඳාණ්ඩකරණය

කාලසීමාව : පැය 2

ප්‍රධාන මාතෘකා

- ගෝලීය ආර්ථිකය විද්‍යුත් වාණිජ්‍යය

- ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ මාධ්‍ය හිමිකාරීත්වය
- සන්නිවේදනයේ රටා, මාධ්‍ය හිමිකාරීත්වය සහ පාලනය
- පුද්ගලික (වාණිජ) මාධ්‍ය, රජය සතු හෝ රජය මගින් පාලනය කරනු ලබන මාධ්‍ය සහ, පොදු මාධ්‍ය සංවිධාන, උදා පොදු විකාශන පද්ධති
- ප්‍රජා මාධ්‍ය සහ ඩිජිටල් ව්‍යාපෘති
- තාක්ෂණික අභිසාරිතාව (ජනමාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම්, විදුලි සන්දේශනය සහ පරිගණක) සහ මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් සංගතයේ ඉස්මතුවීම.
- පාරජාතිකකරණය (ගෝලීය මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සංස්ථා)
- මාධ්‍ය හිමිකාරීත්වය හා ප්‍රතිහාර නීති (antitrust laws) පිළිබඳ අන්තර්ජාතික සහ ජාත්‍යන්තර සම්මුති
- මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් හිමිකාරීත්වය, අන්තර්ගත සංවර්ධනය සහ වැඩසටහන් සකස් කිරීම
- විදේශීය අන්තර්ගතවලට එදිරිව දේශීය අන්තර්ගත
- සමාජ (පොදු) නිපැයුමක් ලෙස යන්නට එදිරිව ගෙවාලබා ගත හැකි වෙළෙඳ භාණ්ඩයක් ලෙස තොරතුරු
- මාධ්‍ය නිෂ්පාදන හා සේවා පිළිබඳ මිනුමක් ලෙස ශ්‍රේණිගත කිරීම් සහ සංසරණ සංඛ්‍යාංක
- පාරිභෝජනවාදී සංස්කෘතිය (ග්‍රාහක පිරිසේ අවශ්‍යතාවලට එදිරිව උවමනා සහ අභිරුචි)
- තොරතුරු වෙළෙඳභාණ්ඩකරණය සඳහා උපායමාර්ග සහ ප්‍රවේශ
- බුද්ධිමය දේපළ අයිතීන් සහ පොදු පරිමණ්ඩලයේ තොරතුරු (3 වන මොඩියුලය බලන්න)
- ප්‍රකාශන හිමිකම සහ අනෙකුත් හිමිකාරීත්ව තොරතුරු අයිතිවාසිකම් (3වන මොඩියුලය බලන්න)
- පොදු පරිමණ්ඩලයේ තොරතුරු
- නොමිලයේ පිරිනමන පොදු විවෘත මෘදුකාංග (සහ Creative Commons බලපත්‍රය)

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- මාධ්‍ය හිමිකාරීත්වයේ සහ පාලනයෙහි විවිධ රටා විස්තර කිරීම
- මාධ්‍ය හිමිකාරීත්වය සහ පාලනය මාධ්‍ය ප්‍රතිපත්ති, සැකසුම් ක්‍රියාවලි, අන්තර්ගත සහ සම්ප්‍රේෂණය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි තක්සේරු කිරීම
- මාධ්‍ය අභිසාරිතාව තුළින් අන්තර්ගත (සංස්කරණ) සංවර්ධනය පිණිස වන නව ප්‍රවේශ (උදා: බහිස්සේවාර්පණය (Outsourcing), එතෙර-සේවාර්පණය (offshoring) සහ ගෘහස්ථ-සේවාර්ණය (home sourcing) සඳහා පහසුකම් සැලසෙන්නේ කෙසේ දැයි පෙන්වා දීම
- අන්තර්ගත (සංස්කරණ) සංවර්ධනය පිළිබඳ නව ප්‍රවේශ සඳහා පහසුකම් සලසන්නේ කෙසේදැයි දැක්වීමට
- පවතින අන්තර්ජාතික සම්මුති සහ ජාතික නීති/ප්‍රතිපත්ති මගින් මාධ්‍ය හිමිකාරීත්ව ආකෘතිය හැඩගස්වනු ලබන්නේ සහ නියාමනය කරනු ලබන්නේ කෙසේදැයි අවබෝධ කර ගැනීම
- තොරතුරු වෙළෙඳභාණ්ඩකරණය අර්ථ දැක්වීම
- තොරතුරු වෙළෙඳභාණ්ඩකරණය කිරීමේ විවිධ උපායමාර්ග සහ ප්‍රවේශ හඳුනාගැනීම
- තොරතුරු හිමිකාරීත්ව අයිතිවාසිකම් සහ පොදු පරිමණ්ඩලයේ තොරතුරු අතර වෙනස වටහාගැනීම, සහ තොරතුරු වෙත සාර්ව ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සහ පොදු යහපත උදෙසා කටයුතු කිරීම සඳහා පොදු පරිමණ්ඩලයේ තොරතුරු භාවිතය අගය කිරීම

පසුබිම සහ ගැටලු

පාරජාතික මාධ්‍ය හෝ ඩිජිටල් සමාගම් සංගත ලෙස හැඳින්වෙන, ගෝලීය මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම්වල වර්ධනය ලිහිල් නියාමනයක් මගින් දිරිගන්වා ඇත. ඒවායේ බලය සහ බලපෑම භූගෝලීය, ආර්ථික සහ දේශපාලනික බාධක අභිබවා යයි. ගෝලීය මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම්වලට කලාපීය මට්ටමින් ක්‍රියාත්මක වන ඒවා ද ඇතුළත් වේ. ප්‍රතිහාර නියාමන රෙගුලාසි පැවතිය ද, අභිසාරිතාව තුළින් ජාතික හා අන්තර්ජාතික මට්ටමින් මාධ්‍ය ඒකාබද්ධ කර ගැනීම සහ අත්පත් කර ගැනීම සඳහා ද පහසුකම් සපයා ඇත. මේ වන විට බොහෝ ජන මාධ්‍ය ආයතන විදුලි සංදේශ, වෙබ් යෙදවුම් සහ විනෝදාස්වාදය (චිත්‍රපට සහ වීඩියෝ ක්‍රීඩා) ආදී ව්‍යාපාරවල නියුතු සමාගම් සමග සන්ධානගත වෙමින් සිටියි. සන්දේශ, අනුරූප සහ හඬ දැන් ගෝලීය වශයෙන් සම්ප්‍රේෂණය කළ හැකි බැවින් සහ, මුද්‍රණ, විකාශන සහ ඩිජිටල් මාධ්‍ය වැනි විවිධ වේදිකා හරහා ඉතා දුරස්ථ ගම්මානවලට පවා ළඟා විය හැකි බැවින්, මෙම සන්ධාන විසින් නිර්මාණය කරන ලද නව සමාගම් දැන් වඩාත් බලවත් වී ඇත.

ගෝලීය මාධ්‍ය සහ ඩිජිටල් සමාගම්වල ඉස්මතු වීම තුළින් අභියෝග මෙන්ම අවස්ථා පැන නැඟී ඇත. එමගින් සංස්කෘතික සමජාතීත්වයක් ඇති විය හැකි බවට ඇතැම් සන්නිවේදන විශාරදයින් අනතුරු අඟවා ඇතත්, එකී මාධ්‍ය මෙවලම් තුළින්ම සංස්කෘතික විවිධත්වය සහ බහුත්වය සඳහා අවස්ථාව සලසා ඇත (එනම්, දේශීය මාධ්‍ය අන්තර්ගත සම්පාදනය, බෙදාගැනීම සහ හුවමාරු කිරීම දැන් වඩා පහසු වී ඇත.) එමෙන්ම, වෘත්තීයභාවය පිළිබඳ වඩා ඉහළ ප්‍රමිති සකස්කිරීමේ හැකියාව සහ සම්පත් ද ගෝලීය මාධ්‍ය සතුවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බොහෝ ප්‍රාදේශීය මාධ්‍ය ආයතනවලට සිය වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම මගින් වඩාත් තරගකාරී වීමට සිදුව ඇත. එපමණක් නොව, ලොව පුරා බලපෑමක් ඇති කරන්නා වූ දේශගුණික විපර්යාස, ගෝලීය වසංගත හෝ ජෛව විවිධත්වයට ඇති තර්ජන වැනි සංවර්ධන ගැටලු පිළිබඳව ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ගෝලීය මාධ්‍ය සතු වේ. එමෙන්ම, දේශපාලන-ආර්ථික සීමා හේතුවෙන් දේශීය හා ජාතික ග්‍රාහක පිරිසෙන් සැඟවී ඇති බොහෝ වෘතාන්ත ස්වාධීන ගෝලීය මාධ්‍ය ඔස්සේ ලොව පුරා ග්‍රාහක පිරිස් හට අනාවරණය කරනු ලබන බව ද පිළිගෙන ඇති කරුණකි. මහා පරිමාණ අභියෝග මධ්‍යයේ වුවද, මාධ්‍ය අන්තර්ගත ප්‍රමිතකරණය සඳහා සහ ජාල ආරක්ෂණය වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ගෝලීය ඩිජිටල් සමාගම්වලට සතුව පවතී (අනෙක් අතට එය සමාගම්වල විශාලත්වයට සහ ප්‍රතිලාභී විස්තාරණයටම අයත් කාර්යයකි).

දේශපාලන පසුබිම මත මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන කර්මාන්තවල බලපෑම ද වෙනස් වෙමින් පවතී. නව මාධ්‍ය තාක්ෂණ හේතුවෙන්, දැන් ජාතික සීමා තුළ සහ ඉන් පිටත වශයෙන් වඩා විශාල වූ ද්විත්ව-ආකාර තොරතුරු ප්‍රවාහයක් මෙන්ම මහජන කතිකා සඳහා වඩා පුළුල් වේදිකා ද තිබේ. මේ සියල්ල මගින් ඉවසා දරා ගැනීම සහ අවබෝධය යන සංකල්ප ප්‍රර්ධනය කරන අතර දේශ සීමා හරහා ජාත්‍යන්තර ක්‍රියාකාරකම් සඳහා ද එමගින් ඉඩ සැලසේ. එහෙත් මූලික ගැටලුව වනුයේ (පුළුල් පරාසයක විකල්ප, තේරීම් සහ නිදහස ප්‍රවර්ධනය කිරීමට මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදනය උපකාර කරන්නේ කෙසේද? වාණිජ මාධ්‍ය සහ ඩිජිටල් පද්ධතිවල ප්‍රධාන ආදායම් මාර්ගය වෙළඳ ප්‍රචාරණය වන බැවින්, ඒවා කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය යුතු ය. සිය ජීව්‍යතාවත් (ප්‍රතිලාභී) තිරසාරත්වයත් (මෙහෙයුම් සම්බන්ධයෙන්) පවත්වා ගෙන අතරතුර මාධ්‍ය සංවිධාන සිය ස්වාධීනත්වයත් මහජන විශ්වාසයත් රැක ගන්නේ කෙසේද? එමෙන්ම එම සාධක දෙකෙන් එකක් හෝ අධි අවධාරණයට ලක්කිරීමේ ප්‍රතිඵලය පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

රාජ්‍ය පාලනය වැනි මාධ්‍යවල ඒකාධිකාරී හිමිකාරිත්වය මාධ්‍ය විවිධත්වයට සහ බහුත්වයට සැලකිය යුතු තර්ජනයක් එල්ල කළ හැකි අතර, එමගින් අදහස් ප්‍රකාශනයේ නිදහසට ද තර්ජනයක් ද ඇති විය හැකිය.

තරගකාරීත්වය නියාමනය කිරීම, මෙන්ම ජනමාධ්‍යවේදයේ වෘත්තීභාවය හා ස්වාධීනත්වය මෙන්ම ඒකාධිකාරය සීමා කිරීමේ වැදගත් කොටසකි. විවිධාකාරයේ හිමිකාරිත්ව (පොදු, පෞද්ගලික හා ලාභ නොලබන) මගින් සහ, විවිධාකාරයේ මාධ්‍යවල පැවැත්ම මගින් ද දෘෂ්ටිකෝණවල විවිධත්වයට රුකුල් දෙයි.

මාධ්‍ය හිමිකාරිත්වයෙහි විවිධත්වය (පොදු, පුද්ගලික සහ ලාභ නොලබන) මෙන්ම විවිධ වර්ගයේ මාධ්‍ය පැවතීම (මුද්‍රණ, ගුවන්විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය, ආදිය) ආදිය ද මාධ්‍ය සහ සන්නිවේදනය පිළිබඳ දෘෂ්ඨිකෝණයෙහි විවිධත්වයට හේතු වේ. ප්‍රවෘත්ති මාධ්‍ය ඇපයට තබා කුඩා පරිමාණයේ තරගකරුවන්ට එරෙහිව කරන්නා වූ ඩිජිටල් සන්නිවේදන සමාගම් සම්බන්ධයෙන් ද එම මූලධර්මයම අදාළ වේ.

සාකච්ඡා කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය සහ සංවර්ධන තේරීම් සඳහා විවිධ සහ බහුත්ව මූලාශ්‍ර වෙතින් ලැබෙන තොරතුරු හැකි තරම් පුළුල් ලෙස බෙදාහැරීම අත්‍යවශ්‍ය කෙරේ. එකිනෙකට වෙනස්

හිමිකාරිත්වයක් සහිත පුවත්පත් සහ විකාශකයින් එකිනෙකාගේ අන්තර්ගතය සාමාන්‍යයෙන් විවේචනය කළ ද, පොදු අයිතිය යටතේ සංකේන්ද්‍රණය වීම මගින් මාධ්‍ය අන්‍යෝන්‍ය විවේචනයෙන් වැළකී, ඒ වෙනුවට ස්වයං-ප්‍රවර්ධනයේ නිරත වේ.

සිද්ධි අධ්‍යයනය

- සුවිශේෂී ගැටලු සම්බන්ධ ප්‍රවෘත්ති ආවරණයේ දී මාධ්‍ය හිමිකරුවන්ගේ දේශපාලනික හා ආර්ථික සුබසිද්ධිය බලපා ඇති ආකාරය පිළිබඳ පළ වී ඇති වෘතාන්ත භාවිතයට ගන්න. (ප්‍රවෘත්ති වටිනාකම් සහ ප්‍රවෘත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පසුබිම සඳහා 2වන මොඩියුලයේ 2වන සහ 3වන ඒකක විමසා බලන්න). බලපෑමෙහි හෝ පාලනයෙහි තරම නිර්ණය කෙරෙන සාධක හඳුනාගැනීමට ශිෂ්‍යයන්ට හැකි වනු ඇත.
- ඩිජිටල් සමාගම්වල ද්වාරපාලක භූමිකාව පුවත්වල ප්‍රමුඛත්වය සහ ආර්ථික ජීව්‍යතාව කෙරෙහි බලපා ඇත්තේ කෙසේද පිළිබඳව පර්යේෂණ කරන්න.

සන්දර්භයානුකූල විශ්ලේෂණය

- විවිධ ප්‍රධාන රූපවාහිනී මධ්‍යස්ථාන (පෞද්ගලික හිමිකාරිත්වය සහිත, රජය සතු සහ මහජනයා සතු) මගින් පුළුල් ලෙස ආවරණය කෙරෙන ජාතික ගැටලුවක් හඳුනාගෙන, ඒවායේ ප්‍රවෘත්ති වෘතාන්තවල විවිධ කෝණ (එනම්, විවිධ දෘෂ්ටිකෝණ සහ පර්යාලෝක වැනි) සහ ඒවා හසුරුවන ආකාරය (වාර්තාකරණය සහ අනිසි ලෙස හැසිරවීම වැනි) එකිනෙක හා සසඳන්න, වෙනස අධ්‍යයනය කරන්න. (ප්‍රවෘත්ති සැකසුම් ක්‍රියාවලියෙහි පසුබිම සහ නව ප්‍රවණතා සම්බන්ධයෙන් 2වන මොඩියුලයේ 2 සහ 3වන ඒකක විමසා බලන්න).
- විවිධ පසුබිම් තුළ (නිකායික පාසල්වලට එදිරිව නිකායික නොවන පාසල්, පෞද්ගලික පාසල්වලට එදිරිව රජය සතු පාසල්, සහ රාජ්‍ය පාසල්වලට එදිරිව දේශීය පාසල් වැනි) පාසල් ප්‍රකාශනවල සංස්කරණ ප්‍රතිපත්ති පිළිබඳව විමසා බලා, හිමිකාරිත්වය යන සාධකය ප්‍රකාශන කළමනාකරණය, කතුවැකි අන්තර්ගතය ආදිය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි අනාවරණය කරගන්න.
- භව්‍ය ලෙස ලෝකයේ කලාප දෙකකට අයත් මාධ්‍ය ආයතන දෙකක් තෝරාගෙන තෝරාගත් දිනක් තුළ, තෝරාගත් විශේෂිත මාතෘකාවක් සම්බන්ධයෙන් ඔවුන්ගේ වාර්තාකරණය විශ්ලේෂණය කර, එම ප්‍රවෘත්ති වෘතාන්ත වාර්තා කෙරෙන විවිධ කෝණ සහ හැසිරවීම සසඳා බලන්න, වෙනස්කම් අධ්‍යයනය කරන්න.
- අන්තර්ගත සඳහා මාධ්‍ය ආයතන වෙත ගෙවීම් සිදුකිරීමට ඩිජිටල් සන්නිවේදන සමාගම්වලට බලකරනු ලබන "2021 ඔස්ට්‍රේලියානු ප්‍රාරම්භය" (2021 Australian initiative) ආදී ක්‍රියාමාර්ග පිළිබඳව විමසා බලන්න.
- ප්‍රධාන පුවත්පතක හෝ ප්‍රවෘත්ති නාලිකාවක ව්‍යාපාරික අංශය තුළ ආවරණය වන ගැටලු අවම වශයෙන් දින දෙක තුනක් අධ්‍යයනය කරන්න. දෛනිකව, එම අංශය සඳහා වන මුළු ප්‍රවෘත්ති වෘතාන්ත සංඛ්‍යාව ඉදිරියේ පෞද්ගලික සංස්ථා පිළිබඳ ප්‍රවෘත්ති වෘතාන්ත ගණන කොපමණක් වේ දැයි නිරීක්ෂණය කරන්න. එමෙන්ම, සංස්ථා පිළිබඳ මෙම ප්‍රවෘත්ති වෘතාන්ත 'හොඳ' ප්‍රවෘත්ති, 'නරක' ප්‍රවෘත්ති හෝ 'විශේෂත්වයක් නොමැති' ලෙස වර්ග කළ හැකි ය.
- මෙම තත්ත්වය ෆේස්බුක් සහ "Sina Weibo" වැනි සමාජ මාධ්‍ය වේදිකා තුළ මෙවැනි ප්‍රවෘත්ති පළ කිරීම් සමග සසඳා බලන්න.

ගැටලුව - විමසීම් ප්‍රවේශය / පර්යේෂණ

- ශික්ෂකයන් අවම වශයෙන් ප්‍රාථමික පාසල් ළමුන් දස දෙනෙකු සහභාගී කරගනිමින් සම්මුඛ සාකච්ඡාවක් පවත්වා යම් නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ඔවුන් කිසියම් විශේෂිත සන්නාමයකට කැමති වීමට හේතුව ඔවුන්ගෙන් අසා සිටිය යුතු ය. ඉන්පසු ශිෂ්‍යයන් විසින් එම ළමුන්ගේ පිළිතුරු එක්රැස් කොට හොඳම පිළිතුරු ඊට අදාළ නිෂ්පාදනවල වෙළඳ දැන්වීම් සමග සංසන්දනය කළ යුතු ය.

බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව

- තොරතුරු වෙත සාර්ව ප්‍රවේශය සඳහා බුද්ධිමය දේපළ අයිතීන්හි (IPR) විවිධ මාන සහ ඒවායේ ගම්‍යාර්ථ ශික්ෂකයන් විසින් ගවේෂණය කරනු ලැබේ. බුද්ධිමය දේපළ අයිතියෙහි ඓතිහාසික පසුබිම, බුද්ධිමය දේපළ අයිතියෙහි වාසි සහ අවාසි, බුද්ධිමය දේපළ අයිතිය හේතුවෙන් හට ගන්නා සුවිශේෂී ගැටලුකාරී තත්ත්ව සහ බුද්ධිමය දේපළ අයිතියට එරෙහිව සංවර්ධනය වෙමින් පවතින රටවල ගැටලු ආදි කරුණු මෙම පත්‍රිකාව මගින් ආවරණය කරනු ලැබේ. සෙවුම් යන්ත්‍ර සහ සමාජ මාධ්‍ය සමාගම් විසින් සිය ව්‍යාපාර ආකෘතියේ කොටසක් ලෙස සඳහන් කර ඇති අන්තර්ගත සඳහා අදාළ ප්‍රකාශකයන්ට වන්දි ගෙවීමේ ක්‍රමවේදයක් ලෙස යුරෝපීය සංගමය විසින් ඉදිරිපත් කර ඇති "the link tax" නම් සංකල්පය පිළිබඳව විවාදය පරීක්ෂා කර බලන්න.

ප්‍රත්‍යවේක්ෂණය

- ශික්ෂකයන් විසින් පුවත්පත් සංසරණය පිළිබඳ හෝ ජාතික මට්ටමේ රූපවාහිනී මධ්‍යස්ථානවල ශ්‍රේණිගත කිරීම් පිළිබඳව විගණනය කරන ලද දත්තවල නවතම පිටපත ලබා ගත යුතු ය. අනතුරුව, ශිෂ්‍යයන් විසින් වැඩි වශයෙන්ම සංසරණය වන පුවත්පතේ හෝ ඉහළම ශ්‍රේණිගත රූපවාහිනී මධ්‍යස්ථානයක කතුවැකි අන්තර්ගතය සකස්කිරීමේ විලාසය ප්‍රත්‍යවේක්ෂණය කර එම අභ්‍යාසය ඇසුරින් ඔවුන් ඉගෙන ගත් දේ පිළිබඳ රචනයක් ලිවිය යුතු ය.
- තමාට ළඟා විය හැකි ග්‍රාහක පිරිසෙහි ප්‍රමාණය සහ ගුණාත්මකභාවය පිළිබඳ කියාපාමින් ඩිජිටල් සමාගම් විසින් ඉදිරිපත් කෙරෙන වෙළෙඳ දැන්වීම් විමසා බලන්න.

පර්යේෂණ ව්‍යාපෘතිය

- ප්‍රධානතම මාධ්‍ය ආයතනවල (අදාළ රාජ්‍ය නියෝජිතායතනයෙන් පිළිබිඹු වන පරිදි) ලියාපදිංචි හිමිකරුවන් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් සිදුකර, වෙනත් ව්‍යාපාරික සහ දේශපාලන අරමුණු හා යම් සබඳතාවක් ඇත්නම් ඒ පිළිබඳ විමර්ශනය කරන්න. මෙහි ප්‍රතිඵල ප්‍රස්ථාරයකින් නිරූපණය කළ හැකිය.
- Wikipedia එදිරිව Facebook සහ Taringa! වැනි සමාගම්වල අයිතිය සහ පාලනය කවුරුන් සතු ද යන්න අධ්‍යයනය කරන්න

ඇගයීම් සහ නිර්දේශ

- මාධ්‍ය හිමිකාරිත්වය සහ පාලනය සහ, අන්තර්ජාල සමාගම් හිමිකාරීත්වය සහ පාලනය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව.
- සිද්ධි අධ්‍යයනය විශ්ලේෂණය සඳහා සහභාගී වීම.

සන්දර්භයානුකූල අභ්‍යාස මත පදනම් වූ ලිඛිත අදහස්

- අභ්‍යාසය සහ පර්යේෂණ විශ්ලේෂණය
- සිද්ධි අධ්‍යයනය /පර්යේෂණ පත්‍රිකාව
- පන්ති කාමර සාකච්ඡා සහ අනෙකුත් කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම.
- තොරතුරු /දැනුම් සමාජය
- ඩිජිටල් /දැනුම විභේදනය
- තොරතුරු වෙත ප්‍රවේශවීම පිළිබඳ සාර්ව ගැටලු: බුද්ධිමය දේපළ අයිතිය සහ පොදු පරිමණ්ඩලයේ තොරතුරු.

වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා මාතෘකා

- මාධ්‍ය ආශ්‍රිත නිර්මාණාත්මක කර්මාන්තවල ඉස්මතු වීම :
- ක්‍රීඩා සංවර්ධනය (අන්තර්ක්‍රියාකාරී විනෝදාස්වාද මෘදුකාංග)

- විද්‍යුත් ප්‍රකාශන
- චිත්‍රපටි, වීඩියෝ සහ ඡායාරූපකරණය
- මෘදුකාංග සහ පරිගණක සේවා
- වෙනත්.

4 වන ඒකකය: ඩිජිටල් තාක්ෂණය හරහා විකල්ප මාධ්‍ය ප්‍රවර්ධනය

කාලසීමාව: පැය 2.5

ප්‍රධාන මාතෘකා

- විකල්ප මාධ්‍ය (ඒවා ඉස්මතු වී ඇත්තේ ඇයි?
- ප්‍රධාන ධාරාවේ මාධ්‍ය පිළිබඳ මහජන විශ්වාසය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ ආගමනය
- වෙනස් වන මාධ්‍ය පුරුදු සහ පාරිභෝගික රුචිකත්ව
- විකල්ප මාධ්‍ය අර්ථ දැක්වීම (ප්‍රධාන ධාරාවේ මාධ්‍ය හා සසඳන විට)
- විකල්ප මාධ්‍යවල හිමිකාරීත්වය සහ පාලනය (පොදු අයිතිය සහ පාලනය වැනි). විකල්ප මාධ්‍යවල ග්‍රාහක පිරිස: විවිධ ජන කොටස් (කාන්තාවන්, තරුණ පිරිස්, ළමුන්, කම්කරුවන්/සේවකයන් ආදී), ආන්තීකරණයට ලක් වූ ජන කොටස් (සංස්කෘතික ප්‍රජාවන්, සංක්‍රමණිකයන් ආදී).
- විකල්ප මාධ්‍යවල අන්තර්ගතය (ප්‍රජා හෝ ආංශික සංවර්ධන ගැටලු සහ ප්‍රවේදිතා ආදී)
- විකල්ප මාධ්‍ය තුළ ජනමාධ්‍යවේදී ක්‍රියාවලි (ප්‍රජා පර්යාලෝක, සහභාගීත්ව සහ අන්තර්ක්‍රියාකාරීත්ව ප්‍රවේශ)
- සමාජය තුළ විකල්ප මාධ්‍යවල භූමිකාව (විනිවිදභාවය, විවිධත්වය සහ අදහස් ප්‍රකාශනයේ නිදහස වැනි)
- විවිධ පසුබිම් තුළ විකල්ප මාධ්‍ය සැලසුම්කිරීම, කළමනාකරණය සහ පවත්වාගැනීම
- පාසල් පරිසරය තුළ විකල්ප මාධ්‍ය
- ප්‍රජාවක් තුළ විකල්ප මාධ්‍ය
- විකල්ප මාධ්‍යවල ආදායම් මාදිලි

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- විකල්ප මාධ්‍ය ඒවායේ තාර්කිකය, විශේෂාංග සහ යෙදවුම් අර්ථ දැක්වීම
- විවිධ ආකෘති (මුද්‍රිත, විකාශන සහ විද්‍යුත්) භාවිත කරමින් විකල්ප මාධ්‍ය සඳහා උදාහරණ විශ්ලේෂණය කිරීම
- විකල්ප මාධ්‍ය ප්‍රධාන ධාරාවේ මාධ්‍ය වෙතින් වෙන් කිරීම සඳහා භාවිත කරනු ලබන සංස්කරණ ක්‍රියාවලි (සැලසුම්කිරීම, නිෂ්පාදනය සහ බෙදාහැරීම ඇතුළුව) විස්තර කිරීම

- ආන්තීකරණයට ලක් වූ ග්‍රාහක පිරිසේ ගැටලු හා ප්‍රවේදිතා ආවරණය කරමින්, ඔවුන් වෙනුවෙන් හඬක් ලබා දෙමින්, විශේෂිත ප්‍රජාවන් (අතථ්‍ය ප්‍රජාවද ඇතුළුව) කෙරෙහි විකල්ප මාධ්‍යවල බලපෑම තක්සේරු කිරීම
- ප්‍රජාවක් හෝ පාසල් සන්දර්භයක් සඳහා විකල්ප මාධ්‍ය නිර්මාණය කිරීම සැලසුම් කිරීම

ශික්ෂණවිද්‍යා ප්‍රවේශ සහ ක්‍රියාකාරකම්

සිද්ධි අධ්‍යයන

ශික්ෂකයෝ ප්‍රමුඛ පෙළේ විකල්ප මාධ්‍ය පිළිබඳ සිද්ධි අධ්‍යයනයන් (මින් ඇතැම් අධ්‍යයනවලට මාර්ගගතව පිවිසිය හැකි ය) පිළිබඳව කියවා විකල්ප මාධ්‍ය කළමනාකරණය කිරීම සහ සැලසුම් කිරීම පිළිබඳ හොඳම පරිචය ලැයිස්තුගත කරති. එහිදී ඔවුහු පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරති :

- ගැටලු පිළිබඳ සැලසුම්කරණය (වෘතාන්ත අදහස් හඳුනාගැනීම ආදී)
- මූලාශ දත්ත ජනනය කිරීම
- දත්ත / තොරතුරු සැකසීම සහ සංවිධානය කිරීම
- සංස්කරණ ක්‍රියාවලියට පාර්ශ්වකරුවන් (ග්‍රාහක පිරිස) සහභාගිකර ගැනීම
- මෙහෙයුම් කළමනාකරණය (සංස්කරණ කටයුතු)
- ආදායම් උත්පාදනය කරගනිමින් ග්‍රාහක පිරිස පුළුල් කර ගැනීම සහ පවත්වා ගෙන යාම
- මනා පරිචය දැක්වීමේ දර්ශක පිරික්සුම් ලැයිස්තුවක් ලෙස පහත දැක්වෙන ලක්ෂණ ශිෂ්‍යයන් හට යොදා ගත හැකිය :
    - නිර්මාණශීලී
    - ස්වදේශීය
    - ඵලදායක
    - කාර්යක්ෂම
    - සහභාගීත්වය සහිත.

විකල්ප මාධ්‍ය සංවිධාන / ප්‍රජා නිමග්නත්වය පිළිබඳ අධ්‍යයන චාරිකාව

ශිෂ්‍යයන් විකල්ප මාධ්‍ය සංවිධාන ක්ෂේත්‍ර චාරිකාවක යෙදිය යුතු ය; සංස්කාරකවරු, මාධ්‍ය කළමනාකරුවන් සහ ජනමාධ්‍යවේදීන් සම්මුඛ පරීක්ෂණයට ලක් කළ යුතු ය; එමෙන්ම ඔවුනට ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සමාගම්වලට හා එකී විකල්ප මාධ්‍ය සමාගම්වල සංස්කරණ හා කළමනාකරණ ප්‍රතිපත්ති සහ පරිචය නිරීක්ෂණය කළ හැකි ය.

- විකල්ප මාධ්‍ය සමාගම් පහත සඳහන් කාර්යයන් සිදු කරන්නේ කෙසේද යන්න ද ඔවුන්ගේ වාර්තාවට ඇතුළත් විය යුතු ය.
- වෘතාන්ත තෝරාගැනීම
- තොරතුරු මූලාශ්‍ර තෝරාගැනීම
- කෝණ තෝරාගැනීම :එනම් යම් විශේෂිත දෘෂ්ටිකෝණයක් ප්‍රවර්ධනය කිරීම)
- සහ වෘතාන්ත හසුරුවන ආකාරය :වෘතාන්ත වාර්තා කිරීම හෝ අනිසි ලෙස හැසිරවීම ආදී)
- ග්‍රාහක පිරිස වෙතින් ප්‍රතිපෝෂණ උත්පාදනය කිරීම
- ආදායම් උත්පාදනය කිරීම
- ශ්‍රේණිගත කිරීම සහ සංසරණය යන මානවලින් සාර්ථකත්වය මැන බැලීම

මාධ්‍ය නිෂ්පාදනය

ශික්ෂකයන් ආන්තීකරණයට ලක් වී ඇති ප්‍රජාවක නායකයින් සහ සාමාජිකයන් හමුවට ගොස් ඔවුනගේ තොරතුරු වුවමනා සහ අවශ්‍යතා නිර්ණය කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්විය යුතු ය. ඉන්පසු කණ්ඩායම විසින් YouTube වීඩියෝවක් හෝ ශ්‍රව්‍ය විකාශනයක් (podcast) සම්පාදනය කර අන්තර්ජාලයට උඩුගත කළ යුතු ය. වඩා හොඳ ප්‍රතිඵලයක් සඳහා ඔවුනට ඊට සංගීතය හෝ වෙනත් සුදුසු අංගයක් එක් කළ හැකි ය.

ඇගයීම සහ නිර්දේශ

- සිද්ධි අධ්‍යයන
- විකල්ප මාධ්‍ය නිෂ්පාදන
- විකල්ප මාධ්‍ය සංවිධාන වෙත සිදුකළ ක්ෂේත්‍ර චාරිකාව පිළිබඳ ලිඛිත පත්‍රිකාව.
- පන්ති කාමර සාකච්ඡා සහ අනෙකුත් කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- ප්‍රජා වාර්තාකරුවන් සහ ප්‍රජා විකාශනය
- ගැටුම් සංවේදී වාර්තාකරණය / සාම පුවත්පත් කලාව

5වන ඒකකය : සමාජය තුළ නව මාධ්‍ය තාක්ෂණවල භාවිත - සමාජ විපර්යාසය

විස්තර සඳහා 12වන මොඩියුලයේ 2 වන ඒකකය බලන්න.

මෙම මොඩියුලය සඳහා සම්පත් සහ යොමු

Birdsall, W. F. (N.D.), The Internet and the Ideology of Information Technology. (Accessed2 September 2009.) http://www.isoc.org/inet96/proceedings/e3/e3_2.htm

Educational content up close: Examining the learning dimensions of Education for Sustainable Development and Global Citizenship Education https://unesdoc.unesco. org/ark:/48223/pf0000372327

Education for Sustainable Development Goals: Learning Objectives (UNESCO, 2017), https://unesdoc.unesco.org/ark:/48223/pf0000247444

Education for Sustainable Development 2030 Roadmap: https://unesdoc.unesco.org/ark:/48223/pf0000374802

ESD for 2030 video -- https://youtu.be/0XTlP_PsEos

Fidler, R. 1997. Media Morphosis: Understanding New Media. California. Pine Forge Press.
Green, L. 2002. Communication, Technology, and Society. London, Sage Publications.

Habermas, J. 1989. The Structural Transformation of the Public Sphere, trans. Thomas MacCarthy. Cambridge, Polity Press.

Habermas, J. 1994. Citizenship and National Identity. Steenbergen, B.V. (Ed.). The Condition of Citizenship. London, Sage Publications.

Littlejohn, S. W. and Foss, K.A., 2008. Theories of Human Communication (9th ed).

Belmont, California; Thomson Wadsworth.

Marris, P. and Thornham S. (Eds.). 2002. Media Studies: A Reader (2nd ed.). New York,New York University Press.

MIL Index Study: An assessment of MIL in six African Countries, https://www.dw.com/en/dw-akademie/mil-index/s-54253270

Pavlik, J. V. 1998. New Media Technology: Cultural and Commercial Perspectives (2nd ed.). Boston, MA; Allyn and Bacon.Servaes, J. 2003. Approaches to Development. Studies on Communication for Development. Paris, Communication and Information Sector – UNESCO.

Stevenson, N. 1995. Understanding Media Cultures: Social Theory and Mass Communication. London, Sage Publications.

Sussman, G. and Lent, J. (Eds.). 1991. Transnational Communications Wiring the Third

World. Newbury Park, California; Sage Publications.

Sustainable Development Goals -Resources for educators https://en.unesco.org/themes/education/sdgs/material

The Boy Who Harnessed the Wind (film, 2019) https://www.imdb.com/title/tt7533152/

Women of Fukushima (film, 2012) https://simaclassroom.com/films/women-of-

fukushima

14වන මොඩියුලය

සන්නිවේදනය හා තොරතුරු, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ඉගෙනුම - සංයුක්ත මොඩියුලය



පසුබිම සහ තාර්කිකය

මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ මෙම විෂයමාලාව , නවීන ඉගෙනුම් සිද්ධාන්ත තුළින් පෝෂණය වූ, පුළුල් සන්නිවේදන සහ තොරතුරු ක්ෂේත්‍රයක සිට සලකා බැලිය යුතු ය. ඉගැන්වීම හා ඉගෙනුම එකිනෙක හා සමීපව බැඳී ඇති අතර, සන්නිවේදන හා තොරතුරු ක්‍රියාවලීන්හි අනුකල කොටස් ලෙස සැලකේ. සත්‍ය වශයෙන්ම කියතොත් ඒකකින් තොරව අනෙක ඵලදායී නොවේ (න්ඩොන්කො, 1985). ඉගෙනුම් අවකාශ තුළ, මූලික සහ විටෙක සංකීර්ණ සන්නිවේදන සහ තොරතුරු ක්‍රියාවලිවල අංග ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් විසින් සවේතනිකව හෝ අවේතනිකව ද උපයෝගී කර ගැනේ.

උපදේශනය සහ ඉගෙනුම යනු සාරගර්භ ක්‍රියාවලි වේ. එමෙන්ම, ඒවාට ඉගෙනුම් අවකාශය තුළට තුළට ජන මාධ්‍ය (ගුවන්විදුලිය, රූපවාහිනිය සහ පුවත්පත්) සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන්ගේ සම්පත් හා ඒකාබද්ධ කළ විට තවත් අභියෝග ද ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් විසින් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා උපාර්ජනය කර ගනු ලැබීම මගින්, අධ්‍යාපනික පරිසරය පොහොසත් කිරීම සහ වඩාත් ගතික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කිරීම සඳහා වන අවස්ථා විවර කරනු ලබයි.

අනුක්‍රමික පරම්පරාවල දැනුම හා සම්බන්ධ වීම, පවත්වාගෙන යාම සහ අලුත් කිරීම යන බොහෝ වෙනස්කම්වල දී ශික්ෂකයෝ ඉදිරියෙන්ම සිටිති. වර්තමාන ලෝකයේ දැනුම මිනිසුන්, යන්ත්‍ර සහ ඩිජිටල් ජාල හරහා බෙදා හරිනු ලැබේ. පන්ති කාමරය තුළ සහ ඉන් පිටත ඔවුන්ගේ ඉගෙනුම් අත්දැකීම් ශක්තිමත් කළ හැක්කේ මෙසේ බෙදා හැරෙන දැනුම වෙත මිනිසුන්ගේ ප්‍රවේශයත් ඒ සමග ඔවුන්ගේ ඵලදායී අන්තර් ක්‍රියාකාරිත්වයත් තුළිනි.

CVID-19 ගෝලීය වසංගතය හේතුවෙන් මාර්ගගත ප්‍රවේශය ඇති පුද්ගලයින් බහුතරයක් සඳහා මාර්ගගත නියැලීමේ සැලකිය යුතු වැඩි වීමක් දැකගත හැකි විය. නිදසුනක් වශයෙන්, ශිෂ්‍යයන් බොහෝ ගණනාවකට සිය විධිමත් අධ්‍යාපනයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා තාක්ෂණය යොදාගෙන සිදුකරනු ලබන මාර්ගගත ඉගෙනීම හෝ දුරස්ථ ඉගෙනුම් ක්‍රම මත යැපීමට සිදු විය. කොරෝනා වෛරස අර්බුදයෙන්

ඔබ්බට ඔවුන්ගේ මාර්ගගත උපස්ථිතියේ ප්‍රතිලාභ උපරිම කරනු වස් ජනතාවට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා අවශ්‍ය වනු ඇත. මාර්ගගත වේදිකා සහ දුරස්ථ ඉගෙනුම් අන්තර්ගත සංවර්ධනය කිරීම සහ භාවිත කිරීම සඳහා, අධ්‍යාපනය කෙරෙහි තමන්ට ඇති අයිතිය සහතික කරන අතරම, මාර්ගගත අවදානම් සහ වික්ෂේප පැහැදිලිව වටහා ගනු පිණිස ශික්ෂකයන් හා ශිෂ්‍යයන් තුළින් සැලකිය යුතු මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාවක් අවශ්‍ය කෙරේ. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ආයතන තුළට ව්‍යාප්ත කිරීම සහ සියලුම පුරවැසියන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වෙනුවෙන් ඇති පර්යේෂණ සහ ප්‍රතිපත්තිමය ගම්‍යාර්ථ කවරේ ද?

පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන් සමග ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය මඟින් තිරසර සංවර්ධනයක් උදෙසා අධ්‍යාපනය ඉස්මතු කර දක්වන, බහුත්ව සහ ප්‍රජාතන්ත්‍රවාදී වන්නා වූ ද, විවෘත දැනුම නිර්මාණය පෝෂණය කරන්නා වූ ද ඉගෙනුම් පරිසරයක් බිහිකිරීමට උපකාර වේ.

ඉගෙනුම් අවකාශ තුළ ක්‍රියාත්මක වන මෙම ගතික බලවේග පිළිබඳ දැනුවත්භාවය, ඉගෙනුම් සිද්ධාන්ත සහ මූලික සන්නිවේදනය සහ තොරතුරු සිද්ධාන්ත තුළ හඳුනාගෙන ඇති සංජානන සහ පාර-සංජානන ක්‍රියාවලීන් කෙරෙහි අවධානය යොමු කරයි. සංජානන යන පදය ව්‍යුත්පන්න වී ඇත්තේ සංජානනය යන වචනයෙන් වන අතර, එය සිතුවිලි, අත්දැකීම් සහ වෙනත් සංවේදන තුළින් තොරතුරු සහ දැනුම අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය ලෙස හැඳින්විය හැකිය.

මෙම මොඩියුලය පෙර මොඩියුලවලින් ආවරණය කර ඇති අන්තර්ගත එකට එක්කරන සංයුක්තයක් ලෙස ක්‍රියා කරයි. සන්නිවේදනය, තොරතුරු සහ ඉගෙනුම (ඉගෙනුම් සිද්ධාන්ත ඇතුළුව) අතර සම්බන්ධතා ගවේෂණය කරමින්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මඟින් මෙම සම්බන්ධතාව වැඩිදියුණු කළ හැකි ආකාරය යෝජනා කරයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව කෙරෙහි සබල කරවන පරිසරයක් පෝෂණය කිරීම සඳහා විපර්යාස කළමනාකරණය කිරීම පිළිබඳ සාකච්ඡාවකින් එය අවසන් කෙරේ.

ඒකක

1වන ඒකකය:
සන්නිවේදනය සහ තොරතුරු, ඉගෙනුම්, ඉගැන්වීම්

2වන ඒකකය:
ඉගෙනුම් න්‍යාය සහ, මාධය හා තොරතුරු සාක්ෂරතාව

3වන ඒකකය:
පාසල් තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා සබල පරිසරයක් පෝෂණය කිරීම වෙනුවෙන් විපර්යාස කළමනාකරණය කිරීම

1වන ඒකකය: සන්නිවේදනය සහ තොරතුරු, ඉගෙනුම්, ඉගැන්වීම්

කාලසීමාව - පැය 2 යි.

ප්‍රධාන මාතෘකා

- සන්නිවේදනය අර්ථ දැක්වීම
- සන්නිවේදනය හා තොරතුරු සම්බන්ධ මූලික සිද්ධාන්ත
- සන්නිවේදන සහ තොරතුරු ක්‍රියාවලීන් ලෙස උපදේශනය සහ ඉගෙනුම ගවේෂණය කිරීම සහ, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා දැනුම මගින් මෙම ක්‍රියාවලිය වැඩිදියුණු කළ හැකි ආකාරය
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හරහා සහ ඒ පිළිබඳ උපදෙස් ලබාදීමේ උපායමාර්ග.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු යැ:

- සන්නිවේදනය සහ තොරතුරු පිළිබඳ මූලික අවබෝධයක් විදහා දැක්වීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා යොදා ගැනීම සැලකිල්ලට ගනිමින්, සන්නිවේදනයේ සහ තොරතුරුවල මූලික සිද්ධාන්ත සහ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලීන්ට ඒවායේ අදාළත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම්

ක්‍රියාකාරකම්

අප ඉගෙනුම් අවකාශ තුළ පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන් භාවිතා කරන්නේ නම්, අපගේ අධ්‍යාපන ක්‍රම පිළිබඳව විශේෂයෙන් සලකා බැලිය යුතු යැ: අප ඒවා භාවිත කරන්නේ කෙසේද? ශිෂ්‍යයන් වෙත තොරතුරු සන්නිවේදනය කරන ආකාරය, ශිෂ්‍යයන් තම තමන් අතර සන්නිවේදනය කරගන්නා ආකාරය, සහ ශිෂ්‍යයන්, ශික්ෂකයන් සමග සන්නිවේදනය කරන ආකාරය කෙරෙහි ඒවා බලපාන්නේ කෙසේද? මෙම ක්‍රියාවලිය පිළිබඳව සපයන්නන් රැස් කරන දත්ත මොනවාද, සහ එහි ගම්‍යාර්ථ මොනවාද?

ඉගෙනුම් ඉගැන්වීම් අත්දැකීම් තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ ස්ථානය සංකල්පගත කිරීම සඳහා රාමුවක් සැපයීමට සන්නිවේදන සහ තොරතුරු ආකෘතිවලට හැකියාව ඇත. මෙම ආකෘති මගින් ඉගෙනුම් අවකාශ තුළ ශික්ෂකයන්, ශිෂ්‍යයන් සහ තොරතුරු සපයන්නන්ගේ භූමිකා සමීපව පරීක්ෂා කිරීමට අවස්ථාව සලසා දෙනු ලබයි.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ඉංජිනේරු සුසමාදර්ශයක් භාවිතා කරමින් සරල ආකෘතියක් යෝජනා කරන ලදි. (ෂැනන් සහ වීවර්, 1948; Schramm, 1954; Berlo, 1960). මෙම ආකෘතිය මගින් අදාළ ක්‍රියාවලිය රේඛීය වන බවටත් සන්දේශයක් යවන්නකුගෙන් ආරම්භ වන බවටත් උපකල්පනය කරන නමුත්,

වැඩි දෙනෙක් නාලිකාවල ව්‍යුහාත්මක කාරකත්වය සහ ඒවායේ ධාවක බලය මෙන්ම ශානර හා සන්දේශ ආකෘති හැඩගැස්වීම ද ඉස්මතු කර දක්වනු ඇත.

එමෙන්ම ප්‍රජාව, සංස්කෘතිය, බලය සහ අර්ථාන්විතව නියැලීම ආදියෙහි ප්‍රධාන ගැටලු මෙම ආකෘතියට මග හැරෙන නමුදු, සීමිත අවබෝධයක් ලබා දිය හැකි අංග හඳුනා ගනී.

- යවන්නා (ප්‍රභව කරන්නා/මූලාශ්‍රය)

- සන්දේශය (අන්තර්ගතය)
- නාලිකාව (මධ්‍යම)
- ලබන්නා (ප්‍රතිචාර දක්වන්නා/විකේතකය)
- ප්‍රතිපෝෂණය (ලබන්නා වෙත යවන්නාට, යවන්නා වෙතින් ලබන්නා ලෙස ලූපය අඛණ්ඩව ක්‍රියාත්මක වන විට).

වෙනත් ආකෘති කිහිපයක් පහතින් යෝජනා කර ඇත. එසේ වුවද මෙම මූලික නිරූපිතය භාවිතයෙන් පහත ක්‍රියාකාරකම් සැලකිල්ලට ගත හැකි ය:

- ශික්ෂකයන්ට සහ ශිෂ්‍යයන්ට තම ඉගෙනුම් ඉගැන්වීම් හෝ අවකාශ තුළ ඉගෙනුම් අත්දැකීම් සඳහා මෙම ආකෘතිය යොදා ගත හැකි ආකාරය හඳුනා ගත හැකි ය. මෙම ආකෘතිය තුළ ශික්ෂකයන් සඳහා යැයි උපකල්පනය කරනු ලබන භූමිකා මොනවාද? ශිෂ්‍යයන් සඳහා ඇත්තේ කවර නම් භූමිකාවක් ද? මෙම භූමිකා මගින් ඉගෙනුම් අත්දැකීම හැඩගස්වා ඇත්තේ කෙසේද? ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලි තුළ ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය කළමනාකරණය කරන්නේ කෙසේද? මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ දැනුම මෙම ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට උපකාරී වන්නේ කෙසේද?
- තමන්ට අන්තර්ගතය ලබාදෙන සහ ඉගෙනීම සඳහා සන්නිවේදනය කරන වේදිකා විචාරශීලීව පරීක්ෂා කිරීමට ශිෂ්‍යයන් හට ඇති අවස්ථා සලකා බලන්න. පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය හා ඩිජිටල් සන්නිවේදන සමාගම් පිළිබඳ සහ ඒවා හරහා ඉගැන්වීමේ සංකල්ප මීට අදාළ වේ. ශිෂ්‍යයන් අන්තර්ගතය ලබා ගන්නේ, ඉගෙනුම් අවකාශ තුළ සන්නිවේදනය කරන්නේ මින් කුමන සැපයුම්කරුවෙක් හරහා ද? ඉගෙනුම් ඉගැන්වීම් අත්දැකීම් කෙරෙහි මෙම සපයන්නන්ගේ බලපෑම කුමක්ද? විධිමත් ඉගෙනුම් ඉගැන්වීම් අවකාශ තුළ භාවිතයට අවසර ඇත්තේ ඒ අතරින් කවර ඒවාටද? එලෙස අවසරයක් නොමැත්තේ මොනවාටද? ඊට හේතුව කුමක්ද? මේවා විෂයමාලාවට ඇතුළත් කිරීමේ තාර්කිකය සහ තෝරාගැනීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මෙහි දී උපකාර කර ගන්නේ කෙසේද?
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ ඉගැන්වීම සඳහා සියලුම ආකාරයේ අන්තර්ගත සැපයුම්කරුවන් පිළිබඳ දැනුවත්භාවය සහ විශ්ලේෂණයත්, යාවජීව ඉගෙනුම තුළ ඒවායේ භූමිකාවත්, තොරතුරු, සන්දේශ සහ සන්නිවේදනය සම්ප්‍රේෂණය කිරීම සහ හැඩගැස්වීමත් (උදා: පුස්තකාල, ලේඛනාගාර, මාධ්‍ය හා ඩිජිටල් තාක්ෂණය ආදියම පන්ති කාමරය තුළ දී අධ්‍යයනයේ වස්තු විෂය බවට පත් වේ) අවශ්‍ය වේ. අන්තර්ගත සපයන්නන්ගෙන් ප්‍රයෝජන ගන්නා ඉගැන්වීම සඳහා ශික්ෂක ශිෂ්‍ය දෙපාර්ශ්වයෙන්ම ස්වකීය භූමිකා පිළිබඳව මෙන්ම,මෙම සපයන්නන්ගේ භූමිකා සහ ඔවුන්ගේ සුවිශේෂී න්‍යායපත්‍ර සහ අභිලාෂ පිළිබඳ ද දැනුවත්භාවයක් සහ විශ්ලේෂණයක් අවශ්‍ය කෙරේ. උගන්වනු ලබන්නේ කුමක්ද, කවර සපයන්නන් හරහා කවර මෙවලම් ආධාරයෙන් ද යන්න කරුණු සම්බන්ධයෙන් මේවායින් බලපෑමක් ඇති කරයි. පුස්තකාල, ඩිජිටල් සන්නිවේදන සමාගම් හෝ මාධ්‍ය භාවිතයෙන් උගන්වනු ලබන යම්කිසි විශේෂිත මාතෘකාවක් හෝ විෂයයක් තිබේ ද? තමන් උගන්වන දෙයට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා කුසලතා ශික්ෂකයින්ට යොදා ගත හැක්කේ කෙසේ ද?
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ඩිජිටල් තාක්ෂණය, මාධ්‍ය, පුස්තකාල, ලේඛනාගාර සහ වෙනත් තොරතුරු සපයන්නන් හරහා ඉගැන්වීම සඳහා පොදු උදාහරණ හඳුනා ගන්න. ඔබේ ඉගෙනුම් අවකාශ තුළ මෙම ප්‍රවේශ දෙකම භාවිත වන නිශ්චිත ක්‍රියාකාරකම්/ උදාහරණ විස්තර කරන්න. මෙම ප්‍රවේශ තුළින් ශිෂ්‍යයන්ට ලබා දෙන ඉගෙනුම් අත්දැකීම් මොනවාද?
- සන්නිවේදනයට අදාළ පහත දැක්වෙන සන්නිවේදන සහ තොරතුරු ආකෘති විමර්ශනය කිරීම සඳහා ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් කුඩා කණ්ඩායම් වශයෙන් කටයුතු සංවිධානය කළ යුතු ය:

ආදර්ශ සන්නිවේදන න්‍යාය

- ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය (Laswell's Model of Communication)
- චින්තනය පිළිබඳ අනුවර්තනීය සංකල්පය (Adaptive Concept of Thought)

- න්‍යායපත්‍ර සැකසීමේ න්‍යාය (Agenda Setting Theory)
- AIDA (අවධාන සාධකය, අභිලාෂ අංගය, ආශා අංගය, සහ ක්‍රියා අංගය) ආකෘතිය
- ආරෝපණ න්‍යාය (Attribution Theory)
- සංජානන විසංවාද න්‍යාය (Cognitive Dissonance Theory)
- සමාජ අලෙවිකරණ න්‍යාය (Social Marketing Theory)

ආදර්ශ තොරතුරු න්‍යාය

- සන්දර්භ නිර්මාණය
- තොරතුරු න්‍යාය
- තොරතුරු සංස්කෘතිය
- සමාජ තොරතුරු සැකසුම.

ආදර්ශ න්‍යාය ඩිජිටල් තාක්ෂණ පර්යේෂණ සහ නියැලීම[111]

- තාක්ෂණ පිළිගැනුම් ආකෘතිය (Technology Acceptance Model)
- පාලන න්‍යාය (Control Theory)
- සමාජ ගිවිසුම් න්‍යාය (Social Contract Theory)
- නාලිකා න්‍යාය (Channel Theory)
- තොරතුරු ඒකාබද්ධ කිරීමේ සිද්ධාන්තය (Information Integration Theory)
- බයේසියානු තීරණ න්‍යාය (Bayesian Decision Theory)
- නිර්මාණශීලි න්‍යාය (Creativity Theory)
- ස්මෘතිමත්භාව න්‍යාය (Mindfulness Theory)

සෑම කණ්ඩායමක් විසින්ම පන්ති කාමර සාකච්ඡාවේ දී මෙම න්‍යායන් අනෙකුත් අය වෙත සන්නිවේදනය කිරීමට භාවිත කළ හැකි මූලික පෝස්ටර් සකස් කළ යුතුය. ශික්ෂකයින් සහ ශිෂ්‍යයන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුතු ය (ඊට වෙනත් ප්‍රශ්න එකතු කිරීමද කළ හැකි ය). න්‍යායේ මූලිකාංග මොනවාද? එහි කේන්ද්‍රීය අවධානය සහ ශක්තීන් මොනවාද? එය අවම වශයෙන් තවත් එක් න්‍යායකින් වෙනස් වන්නේ හෝ වෙනත් න්‍යායකට අදාළ වන්නේ කෙසේද? එහි දුර්වලතා මොනවාද? මෙම න්‍යාය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට උපකාර වන බවට සැබෑ ජීවිතය ආශ්‍රයෙන් අවම වශයෙන් එක් උදාහරණයක් ලබා දීමට ශික්ෂකයන්ට හෝ ශිෂ්‍යයන්ට හැකිද? න්‍යාය හෝ ආකෘතියට මග හැරී ඇත්තේ කුමක් ද? ඒ සම්බන්ධයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට කළ හැක්කේ කවරාකාරයේ උපකාරයක්ද?

- ඉහත ලැයිස්තුගත කර ඇති න්‍යාය වෙතින් ඔබ්බට යන විවිධ න්‍යාය යොදා ගැනීමේ සිද්ධි අධ්‍යයන සොයා, ඒවාට මග පෙන්වීම ශික්ෂකයන් විසින් සිදු කළ යුතු ය. කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කර සාකච්ඡාව සඳහා මග පෙන්වන්න.

ඇගයීම හා නිර්දේශ

- ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුත් කණ්ඩායම් ව්‍යාපෘති සංවර්ධනය සහ ඇගයීම
- නිශ්චිත අවස්ථාවක් සඳහා සන්නිවේදන හෝ තොරතුරු ආකෘතියක් තෝරාගෙන එය යොදා ගැනීම

111. Lim, Sanghee & Saldanha, Terence & Malladi, Suresh & Melville, Nigel. (2013). Theories Used in Infor- mation Systems Research: Insights from Complex Network Analysis. Journal of Information Technology Theory and Application. 14. 5-46.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- අධ්‍යාපනය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) යන ක්ෂේත්‍ර තුළ කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ නියෝජනය
- ඩිජිටල් නවෝත්පාදනය.

2වන ඒකකය: ඉගෙනුම් න්‍යාය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව

ප්‍රධාන මාතෘකා

- ශික්ෂණවිද්‍යාව සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව
- ඉගෙනුම් න්‍යාය යනු මොනවාද
- පාර සංජානනය යනු කුමක්ද?
- පාර සංජානනය සහ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව: සබැඳිය තැනීම

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ශිෂ්‍යයන් සඳහා සුදුසු අධ්‍යාපනික උපායමාර්ග සංවර්ධනය කිරීම
- ශිෂ්‍යයන් සඳහා පාර සංජානන උපායමාර්ග හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම

ශික්ෂණවිද්‍යා උපායමාර්ග

ඉගෙනුම් න්‍යාය විශාල ප්‍රමාණයක් ඇති අතර ඒවායින් බොහොමයක් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ මෙම විෂයමාලාවේ මොඩියුල 14 තුළ දක්වා ඇති මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සංකල්ප බොහොමයක් හා සමීප සබඳතාවකින් යුත් වේ. අවසානයේ දී, මේ පිළිබඳ දැනුම මගින් මිනිසුන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ගැන ඉගෙන ගන්නා ආකාරය සහ, පොදුවේ සමාජ ජීවිතයට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යොදා ගන්නා ආකාරය තීව්‍ර කෙරෙනු ඇත. ඉගෙනුම් න්‍යාය සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ:[112]

- සංජානන සංවර්ධනය පිළිබඳ පියාජේ න්‍යාය (Piaget's Theory of Cognitive Development)
- වයිගොට්ස්කිගේ ඉගෙනුම් න්‍යාය (Vygotsky's Theory of Learning)
- සමාජ ඉගෙනුම් සිද්ධාන්තය (Social Learning Theory)
- සංජානන ඉගෙනුම් සිද්ධාන්තය (Cognitive Learning Theory)
- බ්‍රූනර්ගේ ආවර්ති විෂයමාලාව (Bruner's Spiral Curriculum)
- චර්යාවාදය ඉගෙනුම් න්‍යාය (Behaviourism Learning Theory)
- අභිසංස්කරණවාදී ඉගෙනුම් න්‍යාය (Constructivism Learning Theory)
- සබැඳුම් ඉගෙනුම් න්‍යාය (Connectivism Learning Theory)

112. Teacherofsci, 15 Learning Theories in Education (A Complete Summary). https://teacherofsci. com/learning-theories-in-education/ බලන්න.

- ඉහත න්‍යාය සැලකිල්ලට ගන්න. ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදන්න. සෑම කණ්ඩායමක්ම මිනිත්තු 5ක ස්වයංනිර්මිත වීඩියෝවක් (ජංගම දුරකථනයක් හෝ පරිගණක මෘදුකාංග යක් ආධාරයෙන්) සකස් කළ යුතු ය. වීඩියෝ පන්තිය ඉදිරියේ ඉදිරිපත් කර, මග පෙන්වන සාකච්ඡාවක් පවත්වන්න. ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුතු ය (ඊට වෙනත් ප්‍රශ්න එකතු කිරීම ද සිදුකළ හැකි ය). න්‍යායේ මූලිකාංග මොනවාද? එහි කේන්ද්‍රීය අවධානය සහ ශක්තීන් මොනවාද? එය අවම වශයෙන් තවත් එක් න්‍යායකින් වෙනස් වන්නේ හෝ වෙනත් න්‍යායකට අදාළ වන්නේ කෙසේද? එහි දුර්වලතා මොනවාද? මෙම න්‍යාය ඔවුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යම් අගයක් එක් කරන බවට සැබෑ ජීවිතය ආශ්‍රයෙන් අවම වශයෙන් එක් උදාහරණයක් ලබා දීමට ශික්ෂකයන්ට හෝ ශිෂ්‍යයන්ට හැකිද? න්‍යාය හෝ ආකෘතියට මග හැරී ඇත්තේ කුමක් ද? ඒ සම්බන්ධයෙන් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවට කළ හැක්කේ කවරාකාරයේ උපකාරයක්ද? ඔවුනට අභිරුචි වෙනත් න්‍යායන් තිබේ ද?
- "ට්විටර් වැනි සමාජ වේදිකා සාපේක්ෂව නව ක්‍රියාකාරීන් ලෙස සැලකිය හැකි නමුත්, සමාජ ඉගෙනුම එසේ නොවේ. සමාජ ඉගෙනුම් න්‍යාය පැවතෙන්නේ අන්තර්ජාලය බිහිවීමට බොහෝ කලකට පෙර දශක ගණනාවක් ඈත සිට ය. නව තාක්ෂණ, නව තොරතුරු ප්‍රවාහ සහ, මාධ්‍ය ව්‍යාප්තිය දෙස ඇතැම් විට සෘණාත්මක ආකල්පයකින් බැලීමට ඉඩ ඇත. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව මගින් අවදානම් වෙතින් ස්වයංආරක්ෂණය වන අතරම ලද අවස්ථාවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට ද පුද්ගලයන් අවස්ථාව සබල කරවයි. වඩා යහපත් සමාජ ඉගෙනුමක් සහ යාවජීව ඉගෙනුමක් සොයා යන්නවුන්ගේ ගවේෂණයට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහාය දක්වයි. සමාජ මාධ්‍ය හරහා සමාජ ඉගෙනුම අලුත් කරගෙන, ඉදිරියට පවත්වාගෙන හැකි බව ප්‍රතිභානීව පෙනී යයි. බරීස් ෆ්‍රෙඩ්රික් ස්කිනර්, ක්ලාක් ලුවිස් හල්, නීල් මිලර්, ජෝන් ඩොලර්ඩ් වැනි ප්‍රකට අධ්‍යාපනික නවෝත්පාදකයින් අද ජීවතුන් අතර සිටියා නම්, සමාජ මාධ්‍ය හරහා පර්යේෂණ සිදු කිරීමේ යහපත් ඵල ප්‍රවර්ධනය කරනු ඇත. සමාජ මාධ්‍ය හරහා පුද්ගලයින්ගේ ඉගෙනුම හා නියැලීම පොහොසත් කිරීමට අනන්‍ය අවස්ථා ශික්ෂකයන් සහ පිළිබඳ වෙනත් සමාජ ක්‍රියාකාරිකයන් සතුව ඇති බව ඇල්බර්ට් බන්දුරා නිසැකයෙන්ම පිළිගනු ඇත." ට්විටර් සමග ඉගෙනුම් ඉගැන්වීම් වෙතින් ලබාගත් පහත ප්‍රකාශය සාකච්ඡාවට ලක් කරන්න: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, යුනෙස්කෝව සමග සහයෝගයෙන් සංවර්ධනය කරන ලද ඩිජිටල් පන්තිකාමර සම්පත්. මෙම මෙවලමෙහි ප්‍රයෝජනය තක්සේරු කිරීම සඳහා විවිධ ප්‍රශ්න සකස් කර පිළිතුරු ලබා දෙන්න. ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් ලෙස ඔබ විධිමත් ඉගෙනුම් අවකාශ තුළ සහ ඉන් පිටත ඉගෙනුම් ඉගැන්වීම් සඳහා ට්විටර් භාවිත කරන්නේද?
- ට්විටර් සමග ඉගෙනුම් ඉගැන්වීම්: මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළින් යෝජනා කර ඇති ඉගෙනුම් ඉගැන්වීම් සඳහා වන විවිධ ක්‍රියාකාරකම් අධ්‍යයනය කර, අත්හදා බලන්න. සිය අත්දැකීම් ලේඛනගත කිරීමටත්, විවිධ හැෂ් ටැග් හරහා සහ විවිධ මාර්ගගත සමාජ මාධ්‍ය වේදිකාවල බෙදා ගැනීමටත් ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් සඳහා වන මාර්ගෝපදේශයක් මෙයට ඇතුළත් වේ. වෙනත් සමාජ මාධ්‍ය වේදිකා හෝ ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් සපයනු ලබන අනෙකුත් ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන්ගේ මාර්ගෝපදේශ සහ මෙවලම් සඳහා ඔබටද එවැන්නක් කළ හැකිද? මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ආශ්‍රිත නිපුණතා මෙම සම්පත්වල ප්‍රධාන ප්‍රවාහය බවට පත්ව තිබේද? මීට එක් කළ හැකි වැඩිදියුණු කිරීම් මොනවාද?
- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව හා බිල්ලම්ගේ ඉගෙනුම් ක්ෂේත්‍ර සම්බන්ධ කරන්න:
    - කාර්යය අර්ථ දැක්වීම
    - තොරතුරු සෙවීම
    - නිශ්චයනය සහ ප්‍රවේශය
    - සන්දේශ සහ තොරතුරු විශ්ලේෂණය
    - සන්දේශ සහ තොරතුරු සඳහා සන්දර්භය තක්සේරු කිරීම
    - තොරතුරු භාවිතය
    - සංශ්ලේෂණය
    - ඇගයීම

ඔබගේ ඉගෙනුම් අවකාශය තුළ ශිෂ්‍යයන්ට අදාළ කුසලතා වර්ධනය කර, ප්‍රදර්ශනය කළ හැකි ක්‍රම හඳුනා ගන්න. මෙය සිදුකළ හැකි නිශ්චිත ශික්ෂණවිද්‍යා උපායමාර්ග හෝ ක්‍රියාකාරකම් විස්තර කරන්න.

- මෙම උපායමාර්ග සහ ක්‍රියාකාරකම් ඇතුළත් විෂයමාලා ඒකකයක් සඳහා පාඩම් සැලැස්මක් හෝ දළ සටහනක් සකස් කරන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තනි පාඩමක්/දළ සැලැස්මක් ලෙස හෝ පවතින පාඨමාලාවකට මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඒකාබද්ධ කරන පාඩමක්/ දළ සටහනක් සංවර්ධනය කිරීම පිළිබඳ සලකා බලන්න. ශිෂ්‍යයන් මෙම කුසලතා සාර්ථකව ප්‍රදර්ශනය කිරීම සඳහා ශික්ෂකයන් විසින් සිදු කළ යුතු ප්‍රධාන සලකාබැලීම්/ අවකාශ ලබාදීම් හඳුනා ගන්න.
- පෙර ඒකකයේ දක්වා ඇති සන්නිවේදන සහ තොරතුරු න්‍යාය/ආකෘති සැලකිල්ලට ගනිමින්, මාධ්‍ය, පුස්තකාල, ලේඛනාගාර සහ අනෙකුත් අන්තර්ගත සපයන්නන් ඔබේ පාඩම්/ඒකක දළ සටහනෙහි ඉටු කරන භූමිකා පැහැදිලි කර, සාධාරණීකරණය කරන්න. ශික්ෂකයෙකු ලෙස ඔබ භාරගන්නේ කුමන භූමිකාව ද? ශිෂ්‍යයන්ගේ භූමිකාව කුමක් ද? මෙම භූමිකා තුළින් ඉගෙනුම් ක්‍රියාවලිය වැඩිදියුණු කරන්නේ කෙසේද?
- අභ්‍යාසලාභීන් ශිෂ්‍යයන් ලෙස සාර්ථකත්වයක් අත්විඳීමට නම්, පාරසංජානනය සහ පාර සංජානනීය උපායමාර්ග පිළිබඳ දැනුම වැදගත් වේ. පාරසංජානනය යනු 'සංජානනය පිළිබඳ සංජානනය' හෝ 'දැන ගැනීම පිළිබඳ දැන ගැනීම' ලෙස අර්ථ දැක්විය හැක. ඊට ස්වරූප ගණනාවක් ගැනීමේ හැකියාව ඇති අතර, ඉගෙනුම හෝ ගැටලු විසඳීම සඳහා විශේෂිත උපායමාර්ග භාවිත කළ යුත්තේ කවදාද සහ කෙසේද යන්න පිළිබඳ දැනුමින් සමන්විත වේ. ප්‍රායෝගිකව, තමන්ගේම සංජානනය නියාමනය කිරීමට, සිතීමට සහ ඉගෙනීමට ඇති ස්වකීය හැකියාව උපරිම කිරීමට සහ, නිසි ආචාරධර්මීය/සදාචාරාත්මක රීති ඇගයීමට මෙම ශක්‍යතා උපයෝගී කර ගනේ.
- ඉහත දිස්වන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා වන නිපුණතා ලැයිස්තුව පරීක්ෂා කරන්න. සෑම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතාවක් සඳහාම, ශිෂ්‍යයන්ට සිය ඉගෙනුම් අත්දැකීමට උපකාර කරගැනීම සඳහා භාවිත කළ හැකි පාරසංජානන උපායමාර්ග ලැයිස්තුගත කර, විස්තර කරන්න. උදාහරණයක් ලෙස, සංකල්ප සිතියමක් භාවිතයෙන් කාර්ය අර්ථ දැක්වීමට සහය විය හැකි අතර, විචාරශීලී ප්‍රශ්න ඇතුළත්ව, තොරතුරු පෙළක විවිධ කොටස් නම් කරන රූප සටහනක් මගින් සන්දේශ සහ තොරතුරු විශ්ලේෂණයට සහාය විය හැකි ය.
- ඔබ කැමති මොඩියුලයකින් ක්‍රියාකාරකම් කිහිපයක් තෝරන්න. එක් එක් ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන් තුළ තිබිය යුතු කුසලතා හඳුනා ගන්න. ඉගෙනුම මෙම ක්‍රියාකාරකමේ සිට, විධිමත් ඉගෙනුම් අවකාශවලින් පරිබාහිර පුස්තකාල, ලේඛනාගාර, කෞතුකාගාර, මාධ්‍ය, ඩිජිටල් සන්නිවේදන සමාගම් සහ මෙවලම් වැනි තොරතුරු සපයන්නන් සමග ශිෂ්‍යයන්ගේ නියැලීම දක්වා පරිවර්තනය වීමේ දී පාරසංජානනයේ අනුගත විය හැකි භූමිකාව කුමක්ද?
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඉගැන්වීම සඳහා ශික්ෂණවිද්‍යා උපායමාර්ග පිළිබඳ 1වන මොඩියුලයේ, 5වන ඒකකය වෙත යොමු වන්න. විෂයමාලා සන්දර්භය තුළ, විශේෂිත උපායමාර්ග යක් තෝරා ශිෂ්‍යයන් සඳහා එය අනුවර්තනය කිරීම හෝ සංවර්ධනය කරන්න. මෙම ප්‍රවේශය මගින් සන්නිවේදන හා තොරතුරු න්‍යාය සහ ඉගෙනුම් න්‍යාය සමග මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් අත්දැකීම තුළට ඒකාබද්ධ කරනු ලබන්නේ කෙසේද? මෙම උපායමාර්ගය ඔබේ නිශ්චිත විෂයමාලා අපේක්ෂාවන්ට සම්බන්ධ වන්නේ කෙසේද? ඒවා සාර්ථක වී ඇත්දැයි ශික්ෂකයන් හෝ ශිෂ්‍යයන් දැන ගන්නේ කෙසේද? (එනම්, තක්සේරුව සහ ඇගයීම සඳහා වන වැඩසටහනක් ලෙස මෙම උපායමාර්ගය ගැලපෙන්නේ කවර අවස්ථාවකට ද?)
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා වර්ධනය කිරීමේදී පුස්තකාල, ලේඛනාගාර සහ කෞතුකාගාරවල භූමිකාව සැලකිල්ලට ගන්න. මෙම පරිසරයන්ගෙන් එකක් තුළ නිශ්චිත ශික්ෂණවිද්‍යා උපායමාර්ගයක් භාවිත කළ හැකි ආකාරය විදහා දක්වන ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න. මෙම පරිසරයේ කොටසක් වන සහ, ඉගෙනුම් ඉගැන්වීම් අත්දැකීම කෙරෙහි ධනාත්මක ආකාරයකින් බලපෑම් කළ හැකි සුවිශේෂී ලක්ෂණ සලකා බලන්න.
- මෙම විෂයමාලාවේ එක් මොඩියුලයක ක්‍රියාකාරකම් මත පදනම්ව, හෝ ඔබේම කටයුතු මත පදනම්ව, විභින්න උපදේශන සහ ඉගෙනුම සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවක් අවකාශ සලසන ආකාරය පැහැදිලි කරන්න (එනම් කාය චලන ඉගෙනුම, දෘශ්‍ය ඉගෙනුම, ශ්‍රව්‍ය ඉගෙනුම, ගැඹුරු කියවීම, සමාජ ඉගෙනුම ආදිය).

ඇගයීම සහ නිර්දේශ

- ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුත් කණ්ඩායම් ව්‍යාපෘති සංවර්ධනය සහ ඇගයීම

- ප්‍රතිචාර දැක්වීමේ එකම පදනම සමාජ මාධ්‍ය වන තනි පුද්ගල පැවරුම්. පැවරුම සම්පූර්ණ කිරීමේදී තෝරාගත් මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා නිපුණතා පෙන්නුම් කළ යුතුය.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව
- සංක්‍රමණිකයන්, සරණාගතයින්, ගැහැණු ළමයින් සහ පිරිමි ළමයින් වැනි විවිධ සමාජ කණ්ඩායම් සඳහා මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව සැලසුම් කිරීම.
- අධ්‍යාපනය තුළ තොරතුරු තාක්ෂණය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ඉගෙනුම් ප්‍රවේශ
- ඩිජිටල් නවෝත්පාදනය

3වන ඒකකය: ඉගෙනුම් අවකාශ තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සඳහා සබල පරිසරයක් පෝෂණය කිරීම සඳහා විපර්යාස කළමනාකරණය කිරීම

ප්‍රධාන මාතෘකා

- ගෝලීය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ධාවකය: ලොව පුරා ක්‍රියා පිළිබඳ දළ විශ්ලේෂණයක්, ප්‍රතිපත්ති සංවර්ධනය, ආදිය.
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව විධිමත්, අවිධිමත් සහ අවිධිමත් ඉගෙනුම් අවකාශ වෙත ගෙන යාමට අවශ්‍ය සබල පරිසරය
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඉගෙනුම් අවකාශ වෙත ඒකාබද්ධ කිරීමේ දී සහ මෙම අභියෝග ජය ගැනීම සඳහා උපායමාර්ග සැකසීමේ දී මුහුණ දිය යුතු අභියෝග.

ඉගෙනුම් අරමුණු

මෙම ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු, ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් පහත හැකියාවන් ලබා තිබිය යුතු ය:

- දේශීය හා ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රාරම්භ හඳුනාගෙන විස්තර කිරීම
- විවිධ පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් සඳහා මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පාසල්වලට ඒකාබද්ධ කිරීම සැලසුම් කිරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු විස්තර කිරීම

ශික්ෂණවිද්‍යා උපාය මාර්ග:

පහත දැක්වෙන සම්ප්‍රජානන හත පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය කර, ඒ පිළිබඳ ඔවුන්ගේම ස්වයං-ඇගයීම පිළිබඳ කෙටි පොදු ජර්නලයක් ලිවීමට ශික්ෂකයන්ට මග පෙන්වන්න.[113] ඔවුන් මෙය කළ යුත්තේ වැඩිදුර පර්යේෂණයකින් තොරව ය. අනතුරුව, ඔවුන්ට වැඩිදුර පර්යේෂණ කිරීමට, ප්‍රත්‍යවේක්ෂණය

113. ආචාර්ය ඩ්‍රිසියා ශුයිට් ගේ (Dr. Drissia Chouit) Power of Language නම් දේශනය ඇසුරෙනි. https://www.youtube.com/watch?v=5yGWASki1OU

කිරීමට සහ ජර්නලය නැවත ලිවීමට මග පෙන්වන්න; බ්ලොගයක් ආරම්භ කිරීමටත්, ඔවුන්ගේ අත්දැකීම් හා ආවර්ජනා ප්‍රකාශයට පත් කිරීමටත් හෝ සමාජ මාධ්‍ය තුළ බෙදා ගැනීම සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ව දිරිමත් කරන්න.

- ස්වයං සම්ප්‍රජානනය
- තොරතුරු අවශ්‍යතා සම්ප්‍රජානනය
- සන්නිවේදන සම්ප්‍රජානනය
- භාෂා සම්ප්‍රජානනය
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සම්ප්‍රජානනය
- ඉගෙනීම සම්ප්‍රජානනය
- විපර්යාස කළමනාකරණ සම්ප්‍රජානනය

සෙවුම් යන්ත්‍ර සහ අනෙකුත් සම්පත් භාවිත කරමින්, ගුරු අධ්‍යාපනය සඳහා වන මාර්ගගත, ප්‍රජාවන්, පාසල් සහ ආයතන ඇතුළු විවිධ ඉගෙනුම් අවකාශ තුළ දැනට පවතින, මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා වැඩසටහන්, ව්‍යාපෘති හෝ ප්‍රාරම්භ පිළිබඳ සොයා බලන්න. එහිදී දේශීය හා ජාත්‍යන්තර උදාහරණ දෙකම සලකා බලන්න. මෙම උදාහරණවලින් එකක් තෝරාගෙන ඉන් ආමන්ත්‍රණය කරන ඇති ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනා ගන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ඇතුළත් මෙම විෂයමාලාවට වඩා එම වැඩසටහන වෙනස් වන්නේ කුමන ආකාරයෙන් ද? මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳව උනන්දුවක් දක්වන ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා එම වැඩසටහන තව දුරටත් සම්පතක් ලෙස භාවිත කළ හැක්කේ කුමන ආකාරයෙන් ද?

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ අරමුණු සඳහා සහාය දක්වන සංගම් සහ සංවිධාන පිළිබඳ සොයා බලන්න. මෙම වැඩසටහන් තුළින් ශික්ෂකයන්ට සහ ශිෂ්‍යයන්ට පිරිනැමෙන තොරතුරු සහ සම්පත් (මානව සහ ද්‍රව්‍යමය) මොනවාද?

ශික්ෂකයන්ට සහ ශිෂ්‍යයන්ට පර්යේෂණ කටයුතුවල නියැලීම සහ ක්‍රියාකාරීව සම්බන්ධවීම සඳහා මග පෙන්වන්න:

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ යුනෙස්කෝ සන්ධානය (UNESCO MIL Alliance), https://en.unesco.org/themes/media-and-information-literacy/ MIL

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ජාතික මට්ටමේ සංවිධාන හෝ ජාල, සහ

UNESCO MIL CLICKS? https://en.unesco.org/ MIL CLICKS

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා පාඨමාලා සහ වැඩසටහන්වල සාර්ථකත්වය සහතික කිරීම සඳහා, බොහෝ ප්‍රවීණයන් විසින් නිර්දේශ මාලාවක් සකස් කරනු ලැබ ඇත. මෙම නිර්දේශවලින් කිහිපයක් පහත දැක්වේ. ඔබගේ විශේෂිත තත්ත්වයට මෙම ලැයිස්තුව යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න. ඔබේ දෙපාර්තමේන්තුව හෝ ආයතනය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාවේ සාර්ථකත්වය සහතික කිරීම සඳහා ඔබට ඉදිරිපත් කළ හැකි අමතර නිර්දේශ හඳුනා ගන්න.

යෝජිත නිර්දේශ:

- අන්තර්ගතය හඳුනා ගන්න
- වැඩසටහන් සහ ප්‍රතිපත්ති මට්ටම්වල ප්‍රධාන සහභාගිවන්නන් සහ ආධාරකරුවන් හඳුනා ගන්න
- ක්‍රියාත්මක කිරීම/ඒකාබද්ධ කිරීම ආදිය සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කරන්න.
- මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා සැලැස්මක් සකස් කරන්න
- උපකාරක ආයතන/සංගම් හඳුනා ගන්න
- පවතින සහ අවශ්‍ය සම්පත් හඳුනා ගන්න

- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා පාඨමාලා සහ වැඩසටහන් සඳහා ඇගයුම් මෙවලම් සංවර්ධනය කරන්න.

සිසුන් සඳහා සාර්ථක වැඩසටහනක නිර්ණායක සලකා බලන විට මෙම ලැයිස්තුව වෙනස් වේද? මෙහි අමතර සලකාබැලීම් ඇත්නම් හඳුනා ගන්න.

තමන්ගේම ඉගෙනුම් සහ අධ්‍යාපනික ප්‍රජාවගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ශික්ෂකයන් සහ ශිෂ්‍යයන් සඳහා පවතින වැඩසටහන්වලට ඒකාබද්ධ කළ හැකි හෝ ස්වාධීන වැඩසටහනක් ලෙස සංවර්ධනය කළ හැකි ක්‍රම මොනවා ද? එක් එක් ක්‍රමයේ වාසි සහ අවාසි මොනවාද? උදාහරණ ලෙස අදාළ මොඩියුල සඳහන් කරන්න.

වෙනසක් සිදු කිරීම සඳහා පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම සහ, වෙනස්වීමට ඇති බාධා හා එහි ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ. එහි දී ප්‍රමුඛතා තෝරාගැනීම සහ සන්ධාන ගොඩනැගීම අවශ්‍ය වේ. යම් නිශ්චිත ක්‍රියාවක් සඳහා උපායමාර්ගයක් සහ සැලැස්මක් දැනුවත් කළ හැකි, විපර්යාස පිළිබඳ න්‍යායක් ගොඩ නගන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටින්න.

ප්‍රතිපත්ති සම්පාදකයින්, වැඩසටහන් අධ්‍යක්ෂවරුන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර සංවර්ධන සංවිධාන, සහ ඔබේ ආයතනයේ හෝ ප්‍රජාවේ ශික්ෂකයන් වෙත මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා සැලැස්මක් සකස් කරන්න. එක් එක් කණ්ඩායම සඳහා ප්‍රධාන ප්‍රමුඛතා හෝ අවශ්‍යතා මොනවාද? මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව එම අවශ්‍යතා සපුරාලීමට උපකාර වන ආකාරය පැහැදිලි කරන්න. මීට ඇතුළත් කළ හැකි වෙනත් පාර්ශ්වකාර කණ්ඩායම් හඳුනා ගන්න. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනයේ දී එක් එක් පාර්ශ්වයේ භූමිකාව කුමක්ද?

ඇගයීම සහ නිර්දේශ

- කණ්ඩායම් ව්‍යාපෘතිවල අදහස් උත්පාදනය, සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම.

වැඩිදුර සලකාබැලීම් සඳහා මාතෘකා

- ජාතික හෝ ආයතනික මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ප්‍රතිපත්ති සහ උපායමාර්ග ප්‍රකාශ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගී වීම
- විපර්යාස කළමනාකරණය
- තිරසර සංවර්ධන අරමුණු සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව

මෙම මොඩියුලය සඳහා සම්පත් සහ යොමු

Big6. 2010.Teaching Information Literacy Through Literature, Big6 eNewsletter 11.1, 4. www.big6.com

Geek the Library, International Federation of Library Association and Institution, https://www.facebook.com/geekthelibrary

Media as partners in education for sustainable development: A training and resource kit, https://unesdoc.unesco.org/ark:/48223/pf0000158787

Teaching and Learning with Twitter: Media and Information Literacy, Digital Classroom, https://en.unesco.org/sites/default/files/gmw2019_twitter_mil_guide.pdf

Teaching information literacy through learning styles: The application of Gardner's multiple intelligences. Intan Azura Mokhtar, Wee Kim Wee, School of Communication and Information (WKWSCI) at Nanyang Technological University (NTU), Singapore, 2008.

University Library Service. 2009. Handbook for Information Literacy Teaching, third revision.

Paris, UNESCO. 2003. Media Education in the Pacific: A Guide for Secondary School Teachers

AI



පාරිභාෂික පදමාලාව

පාරිභාෂික පදමාලාව[114]

(Access to information) **තොරතුරු වෙත ප්‍රවේශය:** තොරතුරු වෙත ප්‍රවේශය යනු තොරතුරු ඵලදායී ලෙස හඳුනා ගැනීමට, ලබා ගැනීමට සහ භාවිත කිරීමට ඇති අයිතිය, හව්‍යතාව සහ හැකියාව යි. තොරතුරු සඳහා වන නීත්‍යානුකූල හෝ වෙනත් අයිතියක් සහ එය කොතෙක් දුරට "විවෘත" වී ඇත් ද සහ "විවෘත" විය යුතු ද යන්න මෙන් ම, මෙම අයිතිය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා අන්තර්ජාල සම්බන්ධතාවල පැවැත්ම සහ ඒ සඳහා යන පිරිවැය ආදී කොන්දේසි ද මෙමගින් දැක්වේ. හැකියා පිළිබඳ ගැටලුව, අවස්ථා අර්ථවත් ලෙස භාවිත කිරීම සඳහා වන නිපුණතා හා සම්බන්ධ වේ. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතියක (තොරතුරු ලබාගැනීමේ නිදහස පිළිබඳ නීතිය ලෙසද හඳුන්වනු ලබන) සහතික කිරීමකින් තොර ව වන ප්‍රවේශය සීමා සහිත වේ. එහෙත් හිතකර කොන්දේසි සහ ශක්‍යතා නොමැති අවස්ථාවන්හි දී මෙම අයිතිය නිෂ්ඵල එකක් වේ.

(Accuracy) **නිරවද්‍යතාව:** නිරවද්‍යතාවෙන් දැක්වෙන්නේ පෙළ මගින් නිරූපණය කෙරෙන දේ පවතින සාක්ෂි සමග කෙතරම් දුරට අනුකූල වන්නේ ද යන්න යි.

(Active audience) **සක්‍රීය ග්‍රාහක පිරිස:** විවිධ පුද්ගල කණ්ඩායම් විසින් එකම සන්දේශය විවිධ ආකාරයෙන් අර්ථකථනය කිරීම සිදු විය හැකි පරිදි පුද්ගලයන් විසින් තම ඉතිහාසය, අත්දැකීම් සහ පර්යාලෝක අනුව මාධ්‍ය සන්දේශ ලබා ගන්නා සහ අර්ථකථනය කරන න්‍යායකි

(Advertising regulation) **වෙළෙඳ ප්‍රචාරණ කටයුතු නියාමනය:** විනීතභාවය, අවංකභාවය සහ සත්‍යවාදී බව ආදී පද, අනුදත් දෙයට අදාළ විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ අර්ථකථන සපයමින් වෙළෙඳ ප්‍රචාරණයට අදාළ වන නියාමනය (ස්වයං-නියාමනය හෝ ව්‍යවස්ථාපිත නියාමනය).

(Advertising) **වෙළෙඳ ප්‍රචාරණ කටයුතු:** ප්‍රචාරණය කරන ලද භාණ්ඩය හෝ සේවාව මිල දී ගැනීමට හෝ ඔවුන්ගේ ආකල්ප සහ හැසිරීම් වෙනස් කිරීමට ඔවුන් පොළඹවා ගැනීමේ අරමුණින් නිෂ්පාදන හෝ සේවා වෙත පාරිභෝගික අවධානය යොමු කරන පරිචය සහ ශිල්පීය ක්‍රම සමූහයක්

(Affiliate marketing) **අනුබද්ධ අලෙවිකරණය:** කිසියම් අනුබද්ධ පාර්ශ්වකරුවෙකු වෙනත් පුද්ගලයෙකුගේ හෝ සමාගමක නිෂ්පාදන අලෙවිකරණයෙන් කොමිස් මුදලක් උපයන ක්‍රියාවලිය

(algorithm) **ඇල්ගොරිතම:** මෙය සාමාන්‍යයෙන් ගැටලු සමූහයක් විසඳීමට හෝ පරිගණනය කිරීමට අවශ්‍ය, මනාව නිශ්චිත, පරිගණක ආශ්‍රිතව ක්‍රියාත්මක කළ හැකි උපදෙස්, වැඩසටහන් හෝ කේතයන්හි අනුක්‍රමණයකි.

(Alternative media) **විකල්ප මාධ්‍ය:** විකල්ප මාධ්‍ය යනු ඒවායෙහි අන්තර්ගතය, සම්පාදනය හෝ බෙදා හැරීම අනුව ස්ථාපිත හෝ ප්‍රමුඛ මාධ්‍යවලින් (ප්‍රධාන ධාරාවේ මාධ්‍ය හෝ ජන මාධ්‍ය වැනි) වෙනස් වන මාධ්‍ය මූලාශ්‍ර වේ. ඇතැම් විට විශාල මාධ්‍ය සංස්ථා වෙතින් ස්වාධීනත්වය පිළිබිඹු කිරීම සඳහා ස්වාධීන මාධ්‍ය යන පදය පර්යාය පදයක් ලෙස භාවිත වුව ද මෙම යෙදුම මාධ්‍ය නිදහස භුක්ති විඳින මාධ්‍ය සහ රජයේ පාලනයෙන් ස්වාධීනත්වය දැක්වීමට ද භාවිත වේ. විකල්ප මාධ්‍ය විශේෂිත ආකෘතියක් යටතට ඇතුළත් නොවන අතර ඒ සඳහා මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය මාධ්‍ය, චිත්‍රපට/වීඩියෝ, මාර්ගගත/ඩිජිටල් සහ වීදි චිත්‍ර ද ඇතුළත් විය හැකි ය.

(Archetype) **මූලාකෘතිය:** මෙය කිසියම් පුද්ගලයකුගේ හෝ වස්තුවක පසුකාලීන අනුවාද නිරූපණය කිරීම සඳහා තබා ඇති මොඩලයක් පරමාදර්ශී ආකෘතියකි.

(Archivist) **අධිලේඛනාරක්ෂක:** දිගු කාලීන වටිනාකමක් ඇතැයි සැලකෙන වාර්තා සහ අධිලේඛන තක්සේරු කරන, එකතු කරන, සංවිධානය කරන, සංරක්ෂණය කරන සහ ඒවායෙහි පාලනය පවත්වාගෙන සහ, ඒ වෙත ප්‍රවේශය ලබා දෙන තොරතුරු වෘත්තිකයෙකි.

(Artificial Intelligence (AI)) **කෘත්‍රිම බුද්ධිය:** භාෂාව තුළ සැරිසැරීමට, පින්තූර හඳුනා ගැනීමට, ගැටලු විසඳීමට සහ ඉගෙනීමට ඇති හැකියාව වැනි මිනිස් මනස සතු ඇතැම් ශක්‍යතාවලින් සමන්විත යන්ත්‍ර

සහ මෘදුකාංග අධ්‍යයනය, යෙදවීම සහ නිෂ්පාදනය කිරීම මෙයින් අදහස් කරයි. 2021 නොවැම්බර් මාසයේ දී යුනෙස්කෝ සාමාජික රටවල් එක්ව කෘත්‍රිම බුද්ධියේ ආචාරධර්ම පිළිබඳ නිර්දේශයක් සම්මත කර ගැනීම සලකා බලන ලදී. කෘත්‍රිම බුද්ධි වර්ග 3කි.

එම බුද්ධි වර්ග අතරින් පොදු අරමුණැති කෘත්‍රිම බුද්ධිය (AGI) මානව හැකියාවන්ට සමාන වන අතර, එක් අරමුණැති කෘත්‍රිම බුද්ධිය (ANI) සතු හැකියාව පටු පරාසයකට සීමා වේ. එය දුබල කෘත්‍රිම බුද්ධිය හෝ පටු අරමුණැති බුද්ධිය ලෙස ද හඳුන්වනු ලබන අතර අද දක්වා සාර්ථකව සාක්ෂාත් කරගෙන ඇති එක ම කෘත්‍රිම බුද්ධිය ද වේ. එක් අරමුණැති කෘත්‍රිම බුද්ධිය (ANI) ඉලක්ක පාදක වන අතර ඒකල කාර්යයන් ඉටු කිරීම සඳහා සකස් කර ඇත - එනම් මුහුණු හඳුනාගැනීම, හඬ හඳුනා ගැනීම/හඬ සහායකයින්, මෝටර් රථයක් පැදවීම, හෝ අන්තර්ජාලය පිරික්සා බැලීම සහ, එය ක්‍රමලේඛනය කර ඇති අදාළ නිශ්චිත කාර්යය සම්පූර්ණ කිරීමේ දී ඉතා බුද්ධිමත්ව කටයුතු කරනු ලැබේ.

සුපිරි කෘත්‍රිම බුද්ධිය (ASI), මිනිසාට වඩා ශක්‍යතාවෙන් ඉහළ ය.

(Audience) **ග්‍රාහක පිරිස:** යම් නිශ්චිත අන්තර්ගත පෙළෙහි විභවීය පාරිභෝගිකයන් වශයෙන් ඒකරාශී වන, ආමන්ත්‍රණය කෙරෙන සහ ගොඩ නැගෙන කණ්ඩායමකි. වර්තමානයේ විවිධ ඩිජිටල් සන්නිවේදන සමාගම් විසින් විශේෂයෙන් සපයනු ලබන අන්තර්ගත සමග සක්‍රීය නියැලීම සැලකිල්ලට ගනිමින් (අක්‍රීය) "පාරිභෝගිකයන්ට" වඩා ග්‍රාහක පිරිස වශයෙන් ඉහත දී හඳුන්වනු ලැබූ කණ්ඩායමට සහ "සම්පාදක-පාරිභෝගිකයන්" වෙත යම් අවස්ථාවන්හි දී යොමු ගත වේ.

(Auditory learning) **ශ්‍රව්‍ය ඉගෙනුම:** ඉගෙනුම් ආකාර ත්‍රිත්වයෙන් එකක් වශයෙන්, දෘශ්‍ය ඉගෙනුම සහ කාය චලන ඉගෙනුම (පහත බලන්න) සමග යම් අවස්ථාවන්වල කාණ්ඩගත කෙරෙන, සවන් දීමෙන් ඉගෙනුම.

(Bandwagon advertising) **බැන්ඩ්වැගන් වෙළෙඳ ප්‍රචාරණය:** හුදකලා වීම වළක්වා ගනු පිණිස, යම් නිෂ්පාදනයක් හෝ සේවාවක් මිල දී ගැනීම හෝ යම් හැසිරීමක් හෝ ආකල්පයක් අනුගමනය කිරීම සඳහා, ජනතාව තුළ විශ්වාසය උපදවීමට තැත් කරන පෙළඹවීම් ආකාරයකි.

(Blockbustor) **බ්ලොක්බස්ටර්:** විශාල මුදලක් උපයනු ලබන ඉතා සාර්ථක නිෂ්පාදන, චිත්‍රපට යනාදිය වේ.

(Blockchain) **බ්ලොක් චේන්:** ස්ථාන හරහා තිළැලි (built-in) සත්‍යාපනයක් සහිතව බහුවිධ ස්ථානවල සිදු වන සියලුම ගනුදෙනුවල ඩිජිටල් වාර්තාවක් සකස් කිරීමට භාවිත කරනු ලබන පද්ධතියකි. මිල දී ගත හැකි හෝ විකිණිය හැකි සහ වාර්තාවලට කාණ්ඩ (blocks) දිගින් දිගටම එකතු වන විට, ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කළ හැකි ක්‍රිප්ටෝ මුදල් (බිට්කොයින් වැනි) යෙදවුම් පිළිබඳ සඳහන් කිරීමට බොහෝ විට භාවිත විය.

(Blocking) **අවහිර කිරීම:** අන්තර්ගත කොටසකට හෝ අන්තර්ගත මූලාශ්‍රයක ලිපිනයට ප්‍රවේශය වැළැක්වීමෙන් ඩිජිටල් අන්තර්ගතයට ප්‍රවේශය අවහිර කිරීමේ තාක්ෂණික හෝ සංස්කරණ මාර්ගයක් පිළිබඳ මෙමගින් අදහස් වේ. මින් පෙර පැවති විකල්ප හුදෙක් අවහිර කිරීම හෝ ඉඩ දීම සඳහා වූ අතර, ඇතැම් අන්තර්ගත හෝ සේවා මන්දගාමී කිරීමේ සිට, යම් ක්‍රමවලින් අන්තර්ගතය ලේබල් කිරීම, වෙනත් අන්තර්ගත සමග එය සමතුලිත කිරීම යනාදිය දක්වා වූ පරාසයක විහිදෙන අමතර ක්‍රමවේද රාශියක් මේ වන විට ඇත.

(Blog) **බ්ලොගය:** තමා විසින් සිදු කරන විවරණ, සිද්ධි පිළිබඳ විස්තර, පින්තූර හෝ වීඩියෝ පට පළ කෙරෙන, සාමාන්‍යයෙන් එක් පුද්ගලයෙකු විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවියකි. අනෙකුත් පරිශීලකයන්ට බ්ලොග් නිවේශිත (entry) මගින් අදහස් පළ කළ හැකි නමුත් සැබෑ බ්ලොගය සංස්කරණය කළ හැක්කේ හිමිකරුට පමණි. බ්ලොග බොහෝ විට 'මාර්ගගත ජර්නල්' ලෙස හඳුන්වනු ලැබේ.

(Boolean operators) **බූලිය මෙහෙයවන:** බූලීය මෙහෙයවන (AND, OR, NOT හෝ AND NOT) යනු සෙවුමක නිශ්චිත හා ඵලදායී ප්‍රතිඵල ලැබෙන පරිදි මූල පද ඒකාබද්ධ කිරීම හෝ බැහැර කිරීමේදී සම්බන්ධක ලෙස භාවිත වන සරල වචන වේ.

(Box Office) **බොක්ස් ඔෆිස්:** චිත්‍රපටයක් හෝ නළුවෙක් කෙතරම් ජනප්‍රිය ද, මූල්‍යමය වශයෙන් කෙතරම් සාර්ථක ද යන්න සඳහා වූ මානයකි. බොක්ස්ඔෆිස් යනු ප්‍රවේශ පත්‍ර අලෙවි ප්‍රමාණය මගින් මනිනු ලබන චිත්‍රපටයක හෝ නාට්‍යයක මූල්‍ය සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය ද වේ.

(Brand & Product Integration) **සන්නාම සහ නිෂ්පාදන අනුකලනය:** සන්නාම හෝ නිෂ්පාදන පෙර පැවති විනෝදාස්වාදී ගතිලක්ෂණවලට අන්තර්ගත කිරීමේ ක්‍රියාවලිය. සරලව නිසොල්මන්ව) පසුබිමේ පැවතීම වෙනුවට, සන්නාමය හෝ නිෂ්පාදනය වස්තු සන්දර්භයට හෝ අත්දැකීමට එක් කෙරේ.

(Brand & Product Placements) **සන්නාම සහ නිෂ්පාදන ප්‍රදර්ශනය:** බොහෝ විට "නිෂ්පාදන ස්ථානගත කිරීම" ලෙස හැඳින් වෙන සන්නාම ස්ථානගත කිරීම - ඉහළ යන මාධ්‍යක තුළ වර්ධනය වෙමින් පවතින පරිචයකි. ස්ථානගත කිරීම තුළින් වෙළඳ ප්‍රචාරකයාගෙන් යම් මුදලක් ලබා ගැනීම සඳහා ජන මාධ්‍ය වැඩසටහනක හෝ ඩිජිටල් වේදිකා අන්තර්ගතයක කොටසක් ලෙස සන්නාමයක් ඇතුළත් කෙරේ. සන්නාම අනුමත කිරීම ද ඒ හා සමානව රහසිගත සන්නිවේදන ක්‍රමයක් විය හැකි ය. එනම් මාර්ගගත "බලපෑම්කරුවන්" ඔවුන් එය භාවිත කරන විට හෝ වෙනත් ආකාරයකින් විශේෂිත නිෂ්පාදන නිර්දේශ කරන විට සැඟවුණු අනුග්‍රාහකත්ව හෙළි නොකිරීම වැනි දෑය.

(Citizen journalism) **පුරවැසි මාධ්‍යවේදය:** පුවත් සහ තොරතුරු රැස්කිරීම, වාර්තා කිරීම, විශ්ලේෂණය සහ බෙදා හැරීමේ ක්‍රියාවලියේ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන, වෘත්තීය මාධ්‍යවේදියෙකු නොවන පුරවැසියෙකුගේ ක්‍රියාව.

(Citizen driven information) **පුරවැසි මූලික තොරතුරු:** තොරතුරු ජීවන චක්‍රය හෝ තොරතුරු අගය දාමය ඔස්සේ, එක් ස්ථානයක හෝ ස්ථාන කිහිපයක දී පුරවැසියන් විසින්ම සෘජු භූමිකාවක් ඉටු කරනු ලබන, බාහිර පාර්ශ්වකරුවන් විසින් ඇතැම් විට තොරතුරු නිර්මාණය කරනු ලබන, පුරවැසි මූලික සංකල්පය පුරවැසි මධ්‍යගත (citizen-centric) හෝ පුරවැසි කේන්ද්‍රීය (citizen-focused) සංකල්ප එක් පියවරකින් අභිබවා ගොස් ඇත.

(Citizenship (active)) **පුරවැසිභාවය (සක්‍රිය):** නිශ්චිත ප්‍රජාවක (දේශපාලන, ජාතික හෝ සමාජයීය) සාමාජිකයෙකි. පුරවැසිභාවය අයිතිවාසිකම් (උදා: ඡන්දය ප්‍රකාශ කිරීම සහ සුබසාධනය සඳහා ප්‍රවේශය) සහ වගකීම් (උදා: සහභාගීත්වය) සමූහයකින් සමන්විත වන්නක් බව සාමාන්‍ය අවබෝධය වේ. ක්‍රියාකාරී පුරවැසිභාවය යනු පුරවැසියන්ගේ සහභාගීත්වය, පොදු සහ ස්වේච්ඡා සේවය සහ සියලුම පුරවැසියන්ගේ ජීවිතය වැඩිදියුණු කිරීම සඳහා එවැනි වෙනත් ප්‍රයත්න තුළින් තම ප්‍රජාවේ අභිවෘද්ධිය සඳහා කටයුතු කළ යුතු බවට වන දර්ශනයයි.යම් රටක නීත්‍යානුකූල පුරවැසිභාවය මගින් වයස හෝ ජාතිකත්වය යන හේතු මත එම රට තුළ ජීවත් වන බොහෝ ජනතාව බොහෝ විට බැහැර කරනු ලබන බව අවධානයට ගත යුතු ය.

(Citizenship/civic responsibility) **පුරවැසි වගකීම:** යම් නිශ්චිත සමාජ, දේශපාලන හෝ ජාතික ප්‍රජාවක සාමාජිකයෙකු වීමේ තත්ත්වය මෙයින් අදහස් කෙරේ. සමාජ ගිවිසුම් න්‍යාය යටතේ පුරවැසි තත්ත්වය මගින් අයිතිවාසිකම් සහ වගකීම් පවරනු ලැබේ.

(Code of conduct vs Code of ethics) **චර්යාධර්ම සංග්‍රහය හා ආචාරධර්ම සංග්‍රහය:** ආචාරධර්ම සංග්‍රහයක් පුළුල් වන අතර, එමගින් ව්‍යාපාරයක හෝ සංවිධානයක පිළිගත හැකි සහ දිරිගන්වන කුමන ආකාර හැසිරීම් සහ තීරණ පිළිගනු ලබන්නේද සහ දිරි ගන්වනු ලබන්නේ ද යන්න පිළිබඳව සාමාන්‍ය අදහසක් සේවකයන්ට සහ සාමාජිකයන්ට ලබා දෙනු ලැබේ. චර්යාධර්ම සංග්‍රහයක් යනු වඩාත් කේන්ද්‍රගත වූවකි. සුවිශේෂී අවස්ථාවන්හි දී සේවකයන් හෝ සාමාජිකයන් ක්‍රියා කළ යුතු ආකාරය එමගින් නිර්වචනය කෙරේ. පහත "ජනමාධ්‍යවේදී ආචාරධර්ම" බලන්න.

(Cognitive system) **ප්‍රජානන පද්ධතිය:** මානව විශේෂඥතාව සහ ප්‍රජානනය පුළුල් කිරීමට සහ විශාලනය කිරීමට ස්වාභාවික ලෙස අන්තර්ක්‍රියා කිරීම සඳහා මිනිසුන් සහ යන්ත්‍ර සබල කරනු පිණිස ප්‍රජානන පරිගණනය, ස්වාභාවික භාෂා සැකසුම සහ යන්ත්‍ර ඉගෙනීම භාවිත කරනු ලබන තාක්ෂණ ප්‍රවර්ගයකි.

(Communication) **සන්නිවේදනය:** යම්කිසි අන්තර්ගතයක් සිත් ගන්නා ලෙස ඉදිරිපත් කර, යොමු කර, යවන්නකු විසින් යම් මාධ්‍යයක් හරහා ග්‍රාහකයෙකු වෙත ලබා දෙන ක්‍රියාවලිය යි. සෑම සන්නිවේදන ආකාරයකටම රේඛීය සහ චේතනාන්විත ආකාරයකින් යවන්නෙකු, සන්දේශයක් සහ අපේක්ෂිත ග්‍රාහකයෙකු අත්‍යවශ්‍ය නොවේ. සන්නිවේදන ක්‍රියාව සිදුවීම සඳහා සන්නිවේදනය කරන අවස්ථාවේ දී ග්‍රාහකයකු එහි සිටීම හෝ යවන්නාගේ අභිප්‍රාය පිළිබඳ ග්‍රාහකයා දැනුවත්ව සිටීම ද අවශ්‍ය නොවේ. උත්තේජක-ප්‍රතිචාර ක්‍රියාවලියක අවසානයේ ග්‍රාහකයෙකු සිටීම ද අවශ්‍ය නොවේ; අන්තර්ගතය ලබා ගැනීමේ ක්‍රියාව යනු මුලින් නිර්මාණය කරන ලද සන්දර්භයට බෙහෙවින් වෙනස් අර්ථයන් ඇති කිරීම සඳහා සන්දේශ "විකේතනය" කළ හැකි නියැලුමකි.

(Community media) **ප්‍රජා මාධ්‍ය:** වාණිජ සහ මහජන විකාශනයට අමතරව ගුවන්විදුලි විකාශනයේ තුන්වන මාදිලියක් සපයනු ලබන ගුවන්විදුලි සේවාවකි. එය එමගින් සේවය සැලසීමට අපේක්ෂිත ප්‍රජාව විසින්ම පාලනය කළ යුතු සහ නිෂ්පාදනය කළ යුතු සේවාවකි. මෙය භූගෝලීය හෝ සමාජීය අනන්‍යතාවක් හෝ අභිලාෂයක් සහිත ප්‍රජාවක් විය හැකි ය (උදා: ස්වදේශීය භාෂා).

(Content) **අන්තර්ගතය:** බොහෝ ආකාරයේ ගුණාංග සහ තාක්ෂණික ආකෘති වර්ග ගණනාවක් ඔස්සේ විහිදෙන අර්ථාන්විත සන්දේශ අදහස් කෙරේ. අන්තර්ගතයට තොරතුරු පමණක්ම නොව, ඒ හා සමගම (එය අභිබවා යන හෝ එමගින් අතිච්ඡාදනය කෙරෙන), විනෝදාස්වාදය (උදා: චිත්‍රපට), අධ්‍යාපනික (උදා. වාර්තා චිත්‍රපට) හෝ පෙළඹවීම (උදා: ප්‍රචාරණය) යන මානයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන වෙනත් අර්ථයන් ද මෙයට ඇතුළත් වේ. උදාහරණ වශයෙන්, තොරතුරු සහ විනෝදාස්වාද අන්තර්ගතයෙහි ශානරයන්ගෙන් අයුතු ප්‍රයෝජන ලබා ගන්නා සහ, වෙනත් කිසිදු න්‍යාය පත්‍ර නොමැති සේ පෙනී සිටින දුස්තොරතුරු, සාවද්‍ය තොරතුරු සහ වෛරී ප්‍රකාශ ද අන්තර්ගතයට ඇතුළත් වේ.

(Contextual analysis) **සන්දර්භීය විශ්ලේෂණය:** පෙළෙහි තාක්ෂණික, ආඛ්‍යානමය සහ ආවස්ථික සන්දර්භ අධ්‍යයනය සහ විශ්ලේෂණය කෙරෙහි අවධානය යොමු කරන, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ඉගැන්වීමේ ශික්ෂණවිද්‍යා ප්‍රවේශය

(Convergence) **අභිසාරීතාව:** හඬ, ශබ්ද, අනුරූප හෝ පෙළ යනාදී විවිධ අන්තර්ගත වර්ග ඩිජිටල් ක්ෙතයකට පරිවර්තනය කිරීමේ හැකියාව මින් අදහස් වේ. පරිවර්තිත ක්ෙතය වෙත අනතුරුව, පෞද්ගලික පරිගණකයේ සිට ජංගම දුරකථනය දක්වා උපාංග පරාසයක් ඔස්සේ ප්‍රවේශ විය හැකි අතර, එමගින් ඩිජිටල් සන්නිවේදන පරිසරයක් නිර්මාණය කෙරේ. ආයතන සහ පරිචය ඒකාබද්ධ වීම හැඳින්වීමට ද මෙම පදය භාවිත වේ. උදාහරණ වශයෙන් ඩිජිටල් සන්නිවේදන සමාගම් වේදිකාවක මුදා හැරීම සඳහා වීඩියෝ නිෂ්පාදනය කරන පුවත්පත් සමාගමක්.

(Copyright) **ප්‍රකාශන අයිතිය:** අන්තර්ගතය පිටපත් කිරීමට, නැවත බෙදා හැරීමට සහ ප්‍රති නිර්මාණය කිරීමට අන් අයට ඇති හැකියාව සීමා කිරීම සඳහා, යම් නිර්මාණයක කර්තෘට හෝ නිර්මාතෘට ලබා දී ඇති අයිතිවාසිකම් සමූහයකි. අයිතිය බොහෝ විට අයිති වන්නේ නිර්මාණකරුවන්ට වඩා එම නිර්මාණයට අනුග්‍රහය දක්වනු ලබන සමාගම්වලට හිමි අතර ඒවා වෙළඳපොලේ මිලදී ගැනීමට සහ අලෙවි කිරීමට හැකි ය.

(Critical thinking) **විචාරශීලී චින්තනය:** මතුපිට වටිනාකම තුළින් තාර්කික සම්බන්ධතා තේරුම් ගැනීමට සහ තක්සේරු කිරීමට අන්තර්ගතය පරීක්ෂා කිරීමට සහ විශ්ලේෂණය කිරීමට ඇති හැකියාව. එමගින් ප්‍රශ්න කිරීමේ ආකාරයේ සංශයවාදයක් ගම්‍ය වන අතර එය දෝෂදර්ශිතාවෙන් වඩා වෙනස් වේ (පිළිතුරු කල්තියා දැන සිටීම, අන්‍යාකාරයනේ පැවසුවහොත් පූර්ව විනිශ්චයන්ට එළැඹීම).

(Culture) **සංස්කෘතිය:** සංජානනය සහ හැසිරීම හැඩගස්වන සහ එයට බලපෑම් කරන සාරධර්ම, විශ්වාස සහ ආකල්පවලින් සමන්විත සභාග, ව්‍යක්ත සහ සංකේතාත්මක පද්ධතියක් - වියුක්ත 'මානසික සැලැස්මක් (mental blueprint)' හෝ 'මානසික කේතයක් (mental code)' වශයෙන් හැඳින් වේ. සංකේතාත්මක චින්තනය සහ සමාජ ඉගෙනුම් සඳහා වන ධාරිතාව මත රඳා පවතින මානව දැනුම, විශ්වාස සහ හැසිරීම්වල ඒකාබද්ධ රටාවක් ද අදහස් කෙරේ.

(Curriculum) **විෂයමාලාව:** ඉගෙනීමට අනුක්‍රමික ප්‍රවේශයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති පාඨමාලා සමූහයකි

(Cyberbullying) **සයිබර් හිංසනය:** සයිබර් හිංසනය සිදු කිරීම යනු ජංගම දුරකථන, පරිගණක සහ ටැබ්ලට් වැනි ඩිජිටල් උපාංග හරහා සිදුවන හිරිහැරයකි. පුද්ගලයන්ට අන්තර්ගතය නැරඹීමට, සහභාගී වීමට හෝ බෙදා ගැනීමට හැකි, කෙටි පණිවිඩ, පෙළ, සහ යෙදවුම් හරහා හෝ සමාජ මාධ්‍ය, සංසද, හෝ ක්‍රීඩා තුළින් ද සයිබර් හිංසනය සිදු විය හැකි ය. සයිබර් හිංසනයට වෙනත් පුද්ගලයෙකු පිළිබඳ සෘණාත්මක, හානිකර, සාවද්‍ය හෝ පහත් කොට සැලකීමේ අන්තර්ගත හුවමාරු කිරීම, පළ කිරීම හෝ බෙදාගැනීම ද ඇතුළත් වේ. වෙනත් කෙනෙකු අපහසුතාවයට හෝ අපකීර්තියට පත් කරන ආකාරයේ පෞද්ගලික හෝ පුද්ගලික තොරතුරු බෙදා ගැනීම එයට ඇතුළත් වේ. ඇතැම් සයිබර් හිංසන සීමා ඉක්මවා නීති විරෝධී හෝ සාපරාධී හැසිරීම්වලට මග පාදයි.

(Data) **දත්ත:** මේවා තොරතුරුවල අමු ද්‍රව්‍ය වන අතර, විභවීය වැදගත්කමක් ඇතැයි උපකල්පනය කරන ලද විවික්ත ඛණ්ඩ (discrete fragments) මගින් අර්ථය ලබාගන්නා ආකාරය වේ. දත්ත මගින් කරුණු නිර්මාණය කළ හැකි අතර, කරුණු තවදුරටත් අර්ථ-ගැන්වීමේ ක්‍රියාවලි සඳහා නව දත්ත ලෙස එම දත්ත යොදා ගත හැකි ය. කරුණු හෝ සංඛ්‍යා වැනි දත්ත අර්ථවත් සමුද්දේශ බවට පරිවර්තනය කළ විට, එය තීරණ ගැනීම පොහොසත් කරයි. විශාල දත්ත ප්‍රමාණයක් ඩිජිටල් මංපෙත් හරහා හෝ වෙනත් ක්‍රම හරහා රැස් කර, පසුව තනි පුද්ගලයන්ට කළ නොහැකි ආකාරයෙන් සකසා, පරිගණක බලයෙන් ගබඩා කිරීම සහ භාවිත කිරීම සිදු කෙරේ. විශාල ප්‍රමාණයකින් දත්ත රැස් කිරීම, හිමිකාරීත්වය දැරීම සහ භාවිත කිරීම සිදු කරනු ලබන්නේ කවුරුන් විසින් ද යන්න හා මෙම දත්ත කෙතරම් නිරූපණාත්මක වන්නේ ද මෙන්ම පුද්ගල ස්වාධිකාරයට සහ පෞද්ගලිකත්වය වැනි මානව හිමිකම්වලට මෙමගින් උද්ගත වන බලපෑම් මොනවා ද යන්න දැඩි ලෙස විවාදයට තුඩු දෙන කරුණු වේ.

(Database) **දත්ත සමුදාය:** දත්ත සමුදායක් යනු සංවිධිත තොරතුරු ගබඩා කරන දත්ත ව්‍යුහයකි. බොහෝ දත්ත සමුදායන්හි බහු සංඛ්‍යාංක වගු අඩංගු වන අතර, ඒ සෑම එකක් තුළ ම විවිධ ක්ෂේත්‍ර කිහිපයක් ඇතුළත් විය හැකි ය. උදාහරණයක් වශයෙන්, සමාගම් දත්ත සමූහයක නිෂ්පාදන, සේවකයන් සහ මූල්‍ය වාර්තා සඳහා වගු ඇතුළත් විය හැකිය.

(Democracy) **ප්‍රජාතන්ත්‍රවාදය:** නිදහස් මැතිවරණ ක්‍රමයක් තුළ තම නියෝජිතයන් සෘජුව හෝ අන්‍යාකාරයකින් තෝරා ගැනීමට මහජනයාට අවසානාත්මක අධිකාරීත්වය හිමි ආණ්ඩු ක්‍රමයකි. පුද්ගලයාගේ ජීවිතයට බලපාන තීරණ සහ මූලික අයිතිවාසිකම් සහ නානාවිධ නිදහස ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වරණය පාවිච්චි කිරීමේ නිදහස ද එයින් ගම්‍යමාන වේ.

(Digital citizenship) **ඩිජිටල් පුරවැසිභාවය:** ඩිජිටල් පුරවැසිභාවය යනු සහභාගීත්වය, අයිතිවාසිකම් සඳහා ඇති හිමිකම්, ගෝලීය සහයෝගීතාවය සහ ප්‍රජා සැලකිල්ල වැනි පුරවැසිභාවයේ ලක්ෂණ වර්ධනය කරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නියැලීමයි. සයිබර් හිංසනය වැළැක්වීම, මාර්ගගත ආරක්ෂාව, ඩිජිටල් වගවීම, සහ ඩිජිටල් සෞඛ්‍යය සහ සුවතාව වැනි ගැටලු විසඳීමේ දී ඩිජිටල් පුරවැසිභාවය මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සහ ඩිජිටල් කුසලතා සමග සමීපව සම්බන්ධ වේ. ඒ වනාහී තාක්ෂණය විසින් මිනිසුන් හැඩගස්වා ගැනීම සහ යොදා ගැනීම වෙනුවට මහජන සුබ සිද්ධිය සඳහා තාක්ෂණ සේවා හැඩගස්වා ගැනීමට සහ භාවිත කිරීමට මිනිසුන් ක්‍රියාශීලීව උත්සාහ කිරීමය.

(Digital footprint) **ඩිජිටල් පියසටහන:** ඩිජිටල් පියසටහන් යනු අන්තර්ජාලය හෝ ඩිජිටල් උපාංග ඔස්සේ විද්‍යමාන වන, යම් පුද්ගලයකුට අනන්‍ය වූ අනුරේඛනීය ඩිජිටල් ක්‍රියාකාරකම්, ක්‍රියා, දායකත්ව සහ සන්නිවේදන සමූහයකි.

(Digital literacy) **ඩිජිටල් සාක්ෂරතාව:** මෙම සංකල්පය බොහෝ දේ ආවරණය කිරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම විෂයමාලාව සඳහා වන අර්ථ නිරූපණය පටු අර්ථ නිරූපණයක් වන අතර, අනෙකුත් සාක්ෂරතා සමග ද රැඳී පවතී. එබැවින් එය ඩිජිටල් සන්නිවේදන සමාගම් පිළිබඳ සාක්ෂරතාව වශයෙන්, හෝ ඒවා මගින් ලබා දෙන අන්තර්ගත වශයෙන් සැලකිය නොහැකි ය. මන්ද යත්, මෙම අන්තර්ගත දැනටමත් දේශපාලන ආර්ථික සාක්ෂරතාවෙන් සහ ශානර සාක්ෂරතාවෙන් ආවරණය වී ඇති මූලිකාංග බැවිනි. ඒ හා සමානව, ඩිජිටල් සාක්ෂරතාව පෞද්ගලිකත්ව සාක්ෂරතාව සමග

නොගැළපෙන අතර දත්ත සාක්ෂරතාව සමග ද නොගැළපෙයි. ඒ වෙනුවට, මෙම විෂයමාලාවේ අරමුණ සඳහා ඩිජිටල් සාක්ෂරතාව යනු අන්තර්ගතය නිශ්චයනයට, ඇගයීමට, භාවිත කිරීමට, නිර්මාණය කිරීමට සහ බෙදා ගැනීමට ඩිජිටල් තාක්ෂණය, සන්නිවේදන මෙවලම් හෝ ජාල අවබෝධ කර ගැනීමට සහ භාවිත කිරීමට ඇති හැකියාවයි. ඩිජිටල් හැසිරවීම මගින් දත්ත සහ අනුරූප පරිවර්තනය කිරීමේ හැකියාව ද මෙයට ඇතුළත් වේ. හැකියාව පැවතියද එය කේතන සාක්ෂරතාව දක්වා අත්‍යවශ්‍යයෙන්ම විහිද නොයයි.

(Digital skills) **ඩිජිටල් කුසලතා:** ඩිජිටල් තාක්ෂණයේ අධිස්ථ කේතය හෝ ස්වභාවය අවබෝධ කර නොගෙන වුව ද ඩිජිටල් මෙවලම් භාවිත කිරීමට ඇති තාක්ෂණික හැකියාව ඩිජිටල් සාක්ෂරතාවේ කොටසක් වේ. පරිගණක කේත කියවීම සහ ලිවීම බොහෝ විට ඩිජිටල් කුසලතාවල කොටසක් වන නමුත් ඩිජිටල් කුසලතා යනු ඉන් ඔබ්බට ගිය කුසලතා පරාසයකි.

(Directional and aspirational codes) **නිර්දේශී හා අභිලාෂී ආචාරධර්ම:** නිර්දේශී ආචාරධර්ම, ඇතැම් ක්‍රියාකාරීන් විසින් සදාචාර විරෝධී ලෙස අර්ථ දක්වනු ලබන හැසිරීම් වළක්වා ගැනීම අරමුණු කොට ගත්තක් වන අතර, ඒ හේතුවෙන් මේවා ප්‍රධාන වශයෙන් රීති-පාදක වේ. චර්යාව සඳහා නිශ්චිත නිර්දේශ සපයනු ලැබීම හෝ, පිළිගත හැකි සහ පිළිගත නොහැකි හැසිරීම් ඔවුන් විසින් සවිස්තරාත්මකව විග්‍රහ කෙරේ. අභිලාෂී ආචාර්ධර්ම වනාහී අර්ථ දක්වා ඇති සම්මතවලට අනුව ස්වේච්ඡා සදාචාරාත්මක හැසිරීම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගත්තකි.

(Discourse) **කතිකාව:** දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් කරනු ලබන විෂයයක් හෝ ගැටලුවක් පිළිබඳ දක්වන (වාචික හෝ ලිඛිත) සැලකිල්ලයි.

(Disinformation) **දුස්තොරතුරු:** අසත්‍ය සහ/හෝ නොමග යවනසුලු අන්තර්ගතය. කෙසේ වෙතත්, මෙම යෙදුමේ වඩාත් නිශ්චිත භාවිතය වන්නේ අන්තර්ගතයෙහි අසත්‍යය ගැන දැනුවත් සහ හානියක් කිරීමට අදහස් කරන අන්තර්ගත සපයන්නන් විසින් නිර්මාණය කරන ලද ව්‍යාජ අන්තර්ගතයට එය සීමා කිරීමයි. දැනුවත්භාවය සහ චේතනාව යන මූලිකාංග දෙකම නොමැති සාවද්‍ය අන්තර්ගතයක් වන සාවද්‍ය තොරතුරු යන්නෙන් "දුස්තොරතුරු" නමැති මෙම සංකල්පය වෙනස් වේ. කෙසේ වෙතත්, මෙම අවස්ථා දෙකෙහිම විභවීය බලපෑම එක හා සමාන විය හැකි ය. දැනුවත්භාවය සහ චේතනාව පිළිබඳව දැන ගැනීමට අපහසු නිසා අන්තර්ගතය බෙදා හැරීමට භාවිත කරන ශිල්පීය ක්‍රම හරහා ව්‍යාජ අන්තර්ගත හඳුනා ගැනීමේ ප්‍රවේශයක් මතු වී තිබේ. විශේෂයෙන්ම, උදාහරණයක් වශයෙන්, ව්‍යාජ ගිණුම් සහ ප්‍රත්‍යක්ෂ ප්‍රචාරක ව්‍යාපාර ආදිය මගින් පෙන්නුම් කරන සත්‍ය නොවන හා සුසමාහිත හැසිරීම්, අසත්‍ය අන්තර්ගත පිළිබඳ ඉඟි පළ කරයි. අදහස් ප්‍රකාශනයේ නිදහසට අයිතිය අර්ථවත් කරන, සත්‍යාපනීය සහ විශ්වසනීය තොරතුරු වෙත ප්‍රවේශයට එරෙහිව අත්‍යන්තයෙන් ක්‍රියා කිරීමෙන්, පොදුවේ ගත් කළ දුස්තොරතුරු විබලිතකාරී වේ. දුස්තොරතුරු සාමාන්‍යයෙන් උත්සාහ කරනු ලබන්නේ කුමන්ත්‍රණ න්‍යායන් වැනි පහසු පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමෙන් තම ඉලක්කගත ග්‍රාහක පිරිස පොළඹවා ගැනීමට වන අතර, එසේ නොමැති නම් එය විශ්වාස ගැන්වීමට නම් සහජයෙන්ම විතැන් කළ යුතු සත්‍ය පවසන්නන් බිය වැද්දීම සහ අපකීර්තියට පත් කිරීමටය.

(Diversity) **විවිධත්වය:** බහුත්වය පිළිබඳ අදහසට අනුපූරකය වශයෙන් වෙනස සඳහා නිර්ව්‍යාජ ගරුත්වය සහ ඇගයුමයි. ප්‍රජාතන්ත්‍රික සමාජ හෝ ක්‍රම මගින් මානව අයිතිවාසිකම්වල කොටසක් වශයෙන් සහ මානව අභිමානයට ගරු කිරීමක් වශයෙන් විවිධත්වය සුරැකීම හා ඇගයීම සිදු කරනු ලබයි. ඒ පිළිබඳ විස්තර සඳහා පහත මාධ්‍ය බහුත්වය බලන්න.

(Editor) **සංස්කාරක:** පෙළක, විශේෂයෙන් ම පුවත්පතක හෝ සඟරාවක අවසාන අන්තර්ගතය නිර්ණය කරමින් ප්‍රකාශනයක සංස්කරණ පැතිකඩ සඳහා වගකිව යුතු පුද්ගලයා. මෙම පදය මාධ්‍ය හිමිකරු සඳහා වන අර්ථ දැක්වීමෙන් (හෝ ඩිජිටල් සන්නිවේදන සමාගම් හිමිකරුගෙන්) පැහැදිලිව වෙන් කර දැක්විය යුතු ය. මාධ්‍ය හිමිකරු යන්නෙන් අදහස් වන්නේ මාධ්‍ය සමාගම හිමි පුද්ගලයා හෝ පාර්ශ්වකරුවන් කණ්ඩායම වන නමුත් තනි පුද්ගලයෙකු තුළ එම භූමිකා ගැටලු සහගත ලෙස ඒකාබද්ධ වන අවස්ථා බොහොමයක් ද ඇත.

(Editorial independence) **සංස්කාරක ස්වාධීනත්වය:** මාධ්‍ය ආයතනයේ හිමිකරුගේ හෝ වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ බාධාවකින් තොරව ආයතනයේ සංස්කාරක ප්‍රතිපත්තියට සහ පුළුල් වෘත්තීය ප්‍රමිතීන්ට අනුව සංස්කරණය පිළිබඳ තීරණ ගැනීමට සංස්කාරකවරුන්ට පැවරී ඇති වෘත්තීය නිදහස. මෙහිදී "මාධ්‍ය අවනත කරගැනීම" යන සංසිද්ධිය වළක්වා ගැනීම අත්‍යවශ්‍ය වේ (පහත බලන්න).

(Education for sustainable development) **තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපනය:** තිරසර සංවර්ධනය සඳහා වන අධ්‍යාපනය මගින් වර්තමාන සහ අනාගත පරම්පරා සඳහා පාරිසරික අඛණ්ඩතාව, ආර්ථික ශක්‍යතාව සහ සාධාරණ සමාජයක් සඳහා අවබෝධිත තීරණ සහ වගකිව යුතු ක්‍රියාමාර්ග ගැනීමට සිසුන්ව සවිබල ගන්වනු ලැබේ. එය ඉගෙනුම් අන්තර්ගතය සහ ඵල, ශික්ෂණවිද්‍යාව සහ ඉගෙනුම් පරිසරය අවධානය යොමු කරන සර්වග්‍රාහී හා පරිවර්තීය අධ්‍යාපනයකි.

(Emotional appeal) **භාවාත්මක ආකර්ෂණය:** පරිසිද්ධි සහ තර්කනයට වඩා චිත්තවේගීය ප්‍රතික්‍රියා මත පදනම් වූ පෙළඹවීම මෙයින් අදහස් කෙරේ.

(Equality) **සමානාත්මතාව:** වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආගම සහ වාර්ගික භේදයකින් තොරව සෑම කෙනෙකුටම සමාන අයිතිවාසිකම් හිමි වේ යන අදහස යි. එය මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ මූලික මූලධර්මයක් වන අතර එය 'ලෝකයේ පවත්නා නිදහස, යුක්තිය සහ සාමය යන්නෙහි පදනම මිනිස් පවුලේ සියලු දෙනාගේම සහජ ගරුත්වය හා අන්සතු කළ නොහැකි වූ සම අයිතිවාසිකම් පිළිගැනීම වන්නේය' යන වචනවලින් ඉදිරිපත් කර ඇත. පුරවැසිභාවය පිළිබඳ අදහස මගින් සමානාත්මතාව පිළිබඳ ගැටලු පිළිගනු ඇත.

(Fabricated content) **කල්පිත අන්තර්ගතය:** ගරුත්වය, දේශපාලන සහභාගීත්වය, අනන්‍යතාව යනාදී මානව අයිතිවාසිකම්වලට හානි කළ හැකි, සාවද්‍ය හා රැවටීම නිර්මාණය කර ඇති අන්තර්ගතය යි.

(Fact check) **තතු පිරික්සීම:** බොහෝ විට පර්යේෂණයක හෝ සංස්කාරක ක්‍රියාවලියේ කොටසක් ලෙස, යම් ප්‍රකාශනයක (වාචිකව හෝ ලිඛිතව, හෝ ගම්‍ය වන ලෙස සත්‍ය අනුරූපයක් මගින් කෙරෙන නිශ්චිත ප්‍රකාශනයක්) සත්‍යය තහවුරු කිරීම සඳහා කරන ලද ප්‍රකාශයකි.

(Facts) **කරුණු:** මේවා සැබෑ ලෝකයට සහසම්බන්ධ යැයි විශ්වාස කරනු ලබන නිශ්චිත අර්ථ වේ. කරුණු ප්‍රකාශනයක් සම්බන්ධයෙන් සාමාන්‍ය පරීක්ෂණය වන්නේ සත්‍යාපනයයි. එනම්, සංජානනයට අනුරූප වන පරිදි තර්කානුකූලව තහවුරු කළ හැකි ද යන්නයි. සියලුම අන්තර්ගත සත්‍ය නොවේ (නිදසුන් වශයෙන් මත යනු ඔප්පු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ නොහැකි දෙයකි). බොහෝ අවස්ථාවල දී එනම් කොරෝනා වෛරසය වැනි අවස්ථාවල දී, විද්‍යාව දියුණු වෙමින් පවතින තත්ත්වයක් තුළ දී නොදන්නා කරුණු රැසක් ඇත. එහි දී සත්‍යතාව එදිරිව අසත්‍යතාව පිළිබඳ නිශ්චිත තත්ත්වයක් ලබා දිය නොහැකි අතර, වෙනත් කරුණු අනාවරණය වන විට හෝ පුළුල් ආඛ්‍යානයකට ගෙන එන විට ස්ථාපිත කරුණු පවා නව අර්ථයක් ගත හැකි ය.

(False connection) **ව්‍යාජ සම්බන්ධතා:** එහි සිරස්තල, දර්ශන හෝ යටිලියමන එම අන්තර්ගතයටම නොගැළපෙන අන්තර්ගතයයි. තව ද, කුමන්ත්‍රණ න්‍යායන් ගොඩනැගීම සඳල කරන්නා වූ, කරුණු අතර ව්‍යාජ සම්බන්ධතා ය.

(False context) **ව්‍යාජ සන්දර්භය:** ව්‍යාජ සන්දර්භීය තොරතුරු සමග බෙදාගත් නිර්ව්‍යාජ අන්තර්ගතය යි. මෙය "ද්වේෂී තොරතුරු" ලෙස ද හැඳින්වේ

(Femininity) **ස්ත්‍රීත්වය:** සාමාන්‍යයෙන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් හා බැඳුණු ගුණාංග, හැසිරීම් සහ භූමිකා සමූහයකි

(Folk appeal) **ජන ආකර්ෂණය:** නිෂ්පාදනයක් හෝ සේවාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා සාමාන්‍ය මිනිසුන් භාවිත කිරීමයි. ඉලක්කය වන්නේ භාණ්ඩය හෝ සේවාව සෑම කෙනෙකුටම ආකර්ෂණීය සහ වටිනාකමක් ඇති බව පෙන්වීමයි.

(Freedom of expression) **අදහස් ප්‍රකාශනයේ නිදහස:** මෙය මූලික මානව අයිතිවාසිකමකි. එය වාචික භාෂණයේ නිදහස පමණක් නොව තොරතුරු සෙවීමේ, ලැබීමේ සහ බෙදා හැරීමේ ඕනෑම ක්‍රියාවක් ඇඟවීමට භාවිත කෙරේ. මාධ්‍ය නිදහස (පහත බලන්න) මෙම අයිතියේම අනුසිද්ධාන්තයක් වන අතර ප්‍රජාව සහ සිවිල් සමාජය ගොඩනැගීමට සහ එයට සහයෝගය දැක්වීමට අත්‍යවශ්‍ය වන්නකි. අනෙකුත් බොහෝ මානව හිමිකම් සමග මෙන්ම අදහස් ප්‍රකාශනයේ නිදහසට අදාළ ප්‍රතිමානය වන්නේ නිදහස යනු පෙරනිමි කොන්දේසිය වන බවත් මෙයට කරන කවර හෝ බාධාවක් ව්‍යාතිරේක විය යුතු බවත්ය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව, රාජ්‍යයන්ට ප්‍රකාශනයේ නිදහස සීමා කළ හැක්කේ සීමිත හේතු ප්‍රමාණයක් සඳහා පමණි (උදා: පුද්ගලයාගේ ගරුත්වය ආරක්ෂා කිරීම; මහජන සෞඛ්‍යය සහ මහජන සාමය) එමෙන්ම මෙම සීමාවන් නීතිගතව තිබිය යුතු මෙන්ම අපේක්ෂා කරන අරමුණට සමානුපාතික විය යුතු ය.

(Freedom of information) **තොරතුරු ලබාගැනීමේ නිදහස:** ජන වරම යටතේ සම්පාදිත (උදා: බදු ගෙවන්නන්ගේ අරමුදලින් යැපෙන ආයතනවල පර්යේෂණ) හෝ මහජන සුබ සිද්ධියට අදාළ ප්‍රධාන කරුණක් (උදා: තෙල් කාන්දුවක්) සම්බන්ධයෙන් සම්පාදිත රාජ්‍ය ආයතන සතු හෝ පෞද්ගලික සන්තකයේ ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීමට පුරවැසියන්ට ඇති අයිතියයි.

(Freedom of the press (press freedom)) **මාධ්‍ය නිදහස:** සංහතික බෙදා හැරීමට ඉඩ සලසනු ලබන සන්නිවේදන මාධ්‍යයක් යොදා ගනිමින් ඔවුන්ගේ අදහස් ප්‍රකාශනයේ නිදහස භාවිත කර මහජනතාව වෙත අන්තර්ගත ලබා දීමට පුද්ගලයන් හෝ ආයතනවලට (මාධ්‍ය ආයතන පමණක් නොව) ඇති නිදහස වේ. ඍජු වාරණයෙන් හෝ රජයේ පාලනයෙන් නිදහස් වීමේ ප්‍රතිමානයක් මින් අදහස් වේ. මෙමගින් ම ාධ්‍ය හෝ ඩිජිටල් සන්නිවේදන ආයතනයන්හි ඒකාධිකාරය වැළැක්වීම සඳහා තරගකාරී නීතිය යොදා ගැනීම නිවාරණය නොකෙරෙන අතර, එමගින් ජාත්‍යන්තර තත්ත්ව යටතේ සාධාරණීකරණය කරනු ලබන, රජය විසින් විකාශන සංඛ්‍යාත වෙන් කිරීම හෝ ප්‍රකාශන අයිතිය බලාත්මක කිරීම, ළමා ආරක්ෂණය හෝ අනෙකුත් සීමාකිරීම් යනාදිය බැහැර කිරීම ද සිදු නොකෙරේ.

(Gatekeeper) **ද්වාරපාලක:** ප්‍රකාශනය හෝ විකාශනය සඳහා අන්තර්ගත තෝරා වෙන් කරන හෝ එසේත් නැත්නම් එම අන්තර්ගත සලකා බලන ඕනෑම අයෙකුට (තනි පුද්ගලයෙකු, ආයතනයක් හෝ ඇල්ගොරිතමක්) සඳහා භාවිත වන්නා වූ පොදු යෙදුමකි. මාධ්‍ය ආයතන තුළ, මාධ්‍ය ධුරාවලියේ - එනම් වෘත්තාන්තයකට කවර මූලාශ්‍ර ඇතුළත් කළ යුතු දැයි තීරණය කරන වාර්තාකරුගේ සිට, කුමන වෘත්තාන්ත පළ කළ යුතු දැයි තීරණය කරන සංස්කාරකවරු දක්වා ධුරාවලියෙහි - සියලු මට්ටම්වල දී දොරටුපාලනය සිදු වේ. ඩිජිටල් සන්නිවේදන සමාගම්වල, ද්වාරපාලනය ඇල්ගොරිතමීය ක්‍රම ඔස්සේ සිදු වේ. උදාහරණ වශයෙන් ඇතැම් අන්තර්ගත පහත හෙළීම මගින් වෙනත් අන්තර්ගත උසස් කිරීම සහ, ඇතැම් විටෙක අන්තර්ගතය පිළිබඳ සමාගම් මාර්ගෝපදේශ අර්ථ කථනය කිරීමට උත්සාහ කරන අභ්‍යන්තර හෝ පිටස්තර මානව ප්‍රමිතිකරුවන් විසින් මෙම ද්වාරපාලන ක්‍රියාවලිය සිදු කෙරේ.

(Gender blindness) **ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනවධානය:** ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනවධානය යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය අදාළ නොවේ යන්න ගම්‍යමාන උපකල්පනයක්, එනම්, ජීව විද්‍යාත්මක හෝ ඓතිහාසික විෂමතා නොතකා, සියලුම ලිංග සමාජභාවිතවලට එක හා සමානව සැලකීම. මතුපිටින් ගත් කල මෙය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවට දායකත්වය ලබා දෙන්නක් ලෙස දිස් වුවද, මෙම සර්වග්‍රාහී සැලකිල්ල තුළින් සැබෑ විෂමතා නොසලකා හැරීම හා චිරස්ථායි කිරීම සිදු විය හැකි ය.

(Gendered privacy) **ලිංගික සමාජභාවිත පෞද්ගලිකත්වය:** පෞද්ගලිකත්වය මගින් කාන්තාවන් සහ පිරිමින් සඳහා විවිධ ක්‍රියාකාරී ප්‍රතිමාන ගෙන එනු ලබන්නේ සහ අදහස් කරනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳව පර්යේෂණ කිරීමේ දී ඇතැම් ශාස්ත්‍රඥයන් විසින් භාවිත කරනු ලබන, ප්‍රකට වෙමින් පවතින යෙදුමකි.

(Gender-sensitive) **ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදිතාව:** ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදිතාව යනු ඔවුන් අන්‍යයන්ට සලකන ආකාරය අනුව ස්ත්‍රී පුරුෂසමාජභාවය ජීවිතයේ භූමිකාවක් ඉටු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාවලිය යි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සියලු ආයතනවල පවතින අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදිතාව, විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය වටා ඇති වරප්‍රසාද සහ වෙනස්කොට සැලකීම් හඳුනාගැනීමේ දී විද්‍යමාන වේ. සෑම කාන්තාවක්ම ප්‍රචණ්ඩත්වය

සහ වෙනස්කොට සැලකීම් එක හා සමානව අත්නොවිඳිය ද, සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඒකාකෘති හේතුවෙන් කාන්තාවන් සෑම සමාජයකම අවාසි සහගත තත්ත්වයකට පත් වීමේ ස්වාභාවයක් ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතා පුහුණු කිරීම් භාවිත කරනුයේ සමස්තයක් ලෙස ඔවුන්ගේ ජීවිතවල හෝ සේවා ස්ථාන, ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වඩාත් දැනුවත් වීමට සහ සංවේදී වීම සඳහා ජනතාව, විශේෂයෙන්ම සේවා නියුක්තිකයන් දැනුවත් කිරීමට ය.

(Gender-responsive) **ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රතිචාරඃ** ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ක්‍රියාකාරකම් සහ කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ විවිධ අවශ්‍යතා, අභිලාෂ, ශක්‍යතා සහ දායකත්ව පිළිබඳ අවධානයට ලක් කෙරෙන ප්‍රතිපත්ති සහ ප්‍රාරම්භ ව්‍යක්ත කෙරෙන ක්‍රියාකාරකම්.

(Gender-transformative) **ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරිවර්තනීයත්වයඃ** දැනට පවතින සහ, පක්ෂග්‍රාහී/වෙනස් කොට සැලකීමේ ප්‍රතිපත්ති, පරිචය, වැඩසටහන්වල මූල හේතු අභියෝගයට ලක් කරන සහ සමානාත්මතාව කෙරෙහි වූ වෙනසට බලපාන ප්‍රතිපත්ති සහ ප්‍රාරම්භ

(Genre) **ශානරයඃ** යම් නිශ්චිත ශෛලියක්, ආකෘතියක් හෝ අන්තර්ගතයක් මගින් සංලක්ෂිත කලාත්මක වූ, සංගීතමය හෝ සාහිත්‍යමය නිර්මාණ ප්‍රභේදයකි.

(Global citizenship education) **ගෝලීය පුරවැසි අධ්‍යාපනයඃ** ගෝලීය පුරවැසිභාවය යනු පුළුල් ප්‍රජාවකට සහ පොදු මානව වර්ගයා හට අයිති බවට හැඟීමක් ලබා දෙන්නකි. එමගින් ප්‍රාදේශීය, ජාතිකමය, සහ ගෝලීයමය වශයෙන් දේශපාලනික, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අන්‍යෝන්‍යයන්තතාව සහ අන්තර් සම්බන්ධතාව එමගින් අවධාරණය කෙරේ. 2030 අධ්‍යාපන න්‍යාය පත්‍රයේ 4.7 ඉලක්කයට අනුව, ගෝලීය පුරවැසි අධ්‍යාපනය පරිවර්තනීයත්වය කෙරෙහි සහ වඩාත් අන්තර්කරණීය යුක්ති සම්පන්න සහ සාමකාමී ලොවකට දායක වීම සඳහා ශිෂ්‍යයන්ට අවැසි දැනුම, කුසලතා, වටිනාකම් සහ ආකල්ප ගොඩනැගීම කෙරෙහි අරමුණුගත වේ. ගෝලීය පුරවැසි අධ්‍යාපනය මානව හිමිකම් අධ්‍යාපනය, සාම අධ්‍යාපනය, තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය සහ ජාත්‍යන්තර අවබෝධය සඳහා අධ්‍යාපනය ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රයන්හි දැනටමත් යොදා ගෙන ඇති සංකල්ප, පර්යේෂණ ක්‍රමවේද යොදා ගනිමින් බහුවිධ ප්‍රවේශයක් ගනු ලබන අතර ඒවායෙහි පොදු අරමුණු ඉදිරියට ගෙන යාම අරමුණු කරයි.

(Governance) **පාලනයඃ** විධිමත් ආයතනවල සහ සිවිල් සමාජයේ පුද්ගලයන් අතර සිදුවන අන්තර්ක්‍රියාව හා සම්බන්ධ වන පාලන ක්‍රියාවලියක් ලෙස වඩාත් නිවැරදිව හඳුනාගත හැකි ය. බලය, අධිකාරිය සහ බලපෑම සිදු කරනු ලබන්නේ කවුරුන් ද, මේවා භාවිත කරනු ලබන්නේ කෙසේද සහ සමාජ සහ පොදු ජීවිතය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ තීරණ ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව පාලනය මගින් සැලකිල්ල දක්වනු ලැබේ. මෙය මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන සමාගම් වැනි අන්තර්ගත සපයන්නන්ට බෙහෙවින් අදාළ වේ. ඉ-රජය යන්න, පාලන ගැටලු සමග ව්‍යාකුල කර නොගත යුතු ය. ඉ-රජය යනු, රජය විසින් තම කාර්යයන් ඉටු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිත කිරීමයි.

(Hate speech) **වෛරී ප්‍රකාශඃ** ඔවුන්ගේ සාමූහික ලක්ෂණ (ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය යනාදිය) හේතුවෙන්, නිශ්චිත වශයෙන් දක්වා ඇති පුද්ගලයන් පිරිසකට එරෙහිව සතුරුකම, වෙනස්කොට සැලකීම හෝ ප්‍රචණ්ඩත්වය ඉස්මතු කරනු ලබන ඕනෑම සන්නිවේදනයකි.

(Human agency or autonomy) **මානව කාරකත්වය හෝ ස්වාධිකාරයඃ** යම් පුද්ගලයෙකුගේ ජීවිතය හැඩගස්වා ගැනීමේ හැකියාව මානව කාරකත්වය ලෙස සලකයි. ස්වයං පාලනය යනු පුද්ගලයෙකුගේ ස්වයං අධිෂ්ඨානය හෝ ස්වයං පාලනය සඳහා ඇති හැකියාවයි. යමෙකුගේ ආකල්ප සහ චර්යා හැසිරවීමට හෝ "සුළු අභිප්‍රේරණයක්" ගනු ලබන බාහිර ප්‍රයත්න පිළිබඳ පූර්ණ දැනුවත්භාවයක් අවශ්‍ය වේ. අදාළ පුද්ගලයා සහ අනෙකුත් ක්‍රියාකාරීන් (සහ ඇල්ගොරිතම) අතර තොරතුරු අසමමිතියක් ඇති විට ස්වයං-අධිෂ්ඨානය තර්ජනයට ලක් වේ. එම පුද්ගලයාගේ මනෝවිද්‍යාව, අභිලාෂ, බලාපොරොත්තු, බිය සහ සමාජ සබැඳුම් කෙරෙහි බලපෑම් ඇති වන පරිදි, අදාළ පුද්ගලයා පිළිබඳ වඩා වැඩි පරිඥානයක් ලබා ගැනීමට, නැවත අවධානයට ලක් කිරීමට සහ භාවිත කිරීමට ඉහත සඳහන් අනිකුත් ක්‍රියාකාරීන්ට හැකි ය. මෙය තවමත් තම අනන්‍යතාව නිර්මාණය කර ගැනීමේ ක්‍රියාවලියේ සිටින සහ අනිසි ලෙස හසුරුවනු ලැබීමට වඩාත් විවෘතව සිටින ළමුන් සහ තරුණ පුද්ගලයන් සම්බන්ධයෙන් විශේෂයෙන්

ම අදාළ වන කරුණකි. එය මානසික අවපීඩනය, තනිකම හෝ වියෝව වැනි සාධක හේතුවෙන් අවදානමට ලක්විය හැකි වැඩිහිටියන්ට ද අවදානමක් වන අතර, එවැනි කාලවල දී ඔවුන්ගෙන් අයුතු ප්‍රයෝජන ගත හැකි දත්ත සන්තකයෙහි තබාගන්නන් හට ද ගොදුරු විය හැකිය.

(Human rights) **මානව අයිතිවාසිකම්:** මිනිසෙකුගේ ගෞරවය සහ ආත්ම-වටිනාකම ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන හිමිකම් සහ රැකවරණ සමූහයකි. එකී අයිතිවාසිකම් සාමාන්‍යයෙන් මෙම අයිතිවාසිකම් ප්‍රකාශ කෙරෙන ජාතික සහ ජාත්‍යන්තර ලේඛනවල සඳහන් කර ඇත (උදා: මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, මානව හිමිකම් පිළිබඳ යුරෝපීය සම්මුතිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, ආදිය). එසේ ම, කණ්ඩායම් හෝ ජාතීන්ගේ අයිතිවාසිකම් මගින් සමාජයේ විශේෂයෙන්ම දුප්පත් සහ/හෝ ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් ආරක්ෂා කිරීමට උත්සාහ දරනු ලබයි.

(ICT) **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය:** පරිගණක සහ ජාල දෘඪාංග මෙන්ම අවශ්‍ය මෘදුකාංග ඇතුළුව තොරතුරු හැසිරවීමට සහ සන්නිවේදනය පහසු කිරීමට භාවිත කරනු ලබන සියලුම තාක්ෂණික මාධ්‍යවලින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සමන්විත වේ. අන්‍යාකාරයෙන් කිවහොත්, තොරතුරු තාක්ෂණය මෙන්ම දුරකථන පද්ධති, විකාශන මාධ්‍ය සහ සියලු වර්ගවල ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සැකසුම් සහ සම්ප්‍රේෂණවලින් එය සමන්විත වේ. එමගින් නවීන තොරතුරු තාක්ෂණ සන්නිවේදනයේ (දුරකථන මාර්ග සහ රැහැන් රහිත සංඥා) භූමිකාව අවධාරණය කරනු ලබයි. එසේම, සියලුම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වුවද ඒ සියල්ලම ඩිජිටල් නොවේ (මෙම තත්ත්වය වෙනස් වෙමින් පැවතියද). එමෙන්ම,මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යන අර්ථයෙන් ගත් කල සියලුම ඩිජිටල් තාක්ෂණ තොරතුරු හා සන්නිවේදනය සමග බැඳී නොපවතින නමුත්, උදාහරණයක් වශයෙන් වාණිජ මෙහෙයුම්, උසස් මෝටර් වාහන, දේශගුණ නිරීක්ෂණ ආදියෙහි දත්ත එමගින් විශ්ලේෂණය කරනු ලබයි.

(Image) **අනුරූපය:** සංකේතාත්මකව මනසින් මවා ගනු ලබන නිරූපණයක් හෝ පින්තූරයකි.

(Imposter content) **ප්‍රතිරූපක අන්තර්ගතය:** සැබෑ මූලාශ්‍ර සමාරෝපණය වූ අන්තර්ගතයකි.

(Incognito or private mode) **අප්‍රකට හෝ රහස්‍ය ප්‍රකාරය:** එවැනි මාදිලියක ක්‍රියාත්මක වන අවස්ථාවක දී, බ්‍රවුසරයේ ප්‍රධාන සැසිය සහ පරිශීලක දත්තවලින් හුදකලා වූ තාවකාලික සැසියක් බ්‍රවුසරය විසින් නිර්මාණය කරගනු ලබයි. බ්‍රවුස් කිරීමේ ඉතිහාසය මතකයේ ගබඩා කර නොගන්නා අතර, සැසිය වසා දැමූ විට කුකීස් වැනි සැසිය හා සම්බන්ධ දේශීය දත්ත ඉවත් කෙරේ. කෙසේ වෙතත්, ක්‍රියාවන් ගුප්ත කේතනය කර ඇති බවක් හෝ කුකීස් හෝ සාමාන්‍යයෙන් භාවිත වන වෙනත් මෘදුකාංග හමායෑමෙන් ආරක්ෂිත වන බවක් මින් අදහස් නොකෙරේ.

(Information ethics) **තොරතුරු ආචාරධර්ම:** තොරතුරු නිර්මාණය කිරීම, සංවිධානය කිරීම, බෙදා හැරීම හා භාවිතය අතර සම්බන්ධය සහ, ආචාරධර්ම සහ සමාජයෙහි මානව චර්යාවන්ට බලපාන ආචාරධර්මීය සම්මත සහ සදාචාර සංග්‍රහ කෙරෙහි අවධානය යොමු කරන ආචාරධර්මවල අනු ක්ෂේත්‍රයකි.

(Information for public good) **පොදු යහපත සඳහා තොරතුරු:** පුළුල් අන්තර්ගත සංකලනයක් තුළ, මහජනතාවට තොරතුරු විශේෂ වටිනාකමකින් යුත් බවට වන සංකල්පයයි. අවශ්‍යතා පවතින්නේ ජනතාව හට සම්පත් ලබා දීම කෙරෙහි වුවද, මෙම සංකල්පය වඩා යෝග්‍ය වන්නේ මහජන සහාය කෙරෙහි ය. පුස්තකාල, කෞතුකාගාර, ලේඛනාගාර, ඇතැම් ප්‍රවෘත්ති මාධ්‍ය (උදා: ප්‍රජා මාධ්‍ය) සහ විශේෂිත මාර්ගගත ආයතන (උදා: ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන), ඒවායේ ක්‍රියාකාරිත්වය සහ අවශ්‍යතා මත පදනම්ව සලකා බැලිය යුතු නිදසුන් වේ. ආචාරධර්ම හා වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව කාර්යය ඉටු කෙරෙන විට, ජනමාධ්‍යවේදය වනාහී තොරතුරු උත්පාදනය කරන ප්‍රධාන කාරකයකි.

(Information lifecycle) **තොරතුරු ජීවන චක්‍රය:** තොරතුරු ජීවන චක්‍රය එක් එක් තොරතුරු (ලිඛිත හෝ පරිගණකගත) පිළිබඳ වාර්තාවක් නිර්මාණය කිරීමේ සිට ගබඩා කිරීම සහ බෙදා හැරීම දක්වාත්, ඒවා අධිලේඛනකරණය හෝ විනාශය/නැති වීම දක්වාත් වන අදියරවලින් සමන්විත වේ. ආකෘතිය වෙනස්

කිරීම හෝ, වඩා පහසු ප්‍රවේශය හෝ වඩාත් සුරක්ෂිත ගබඩා කිරීම සඳහා මාධ්‍ය වාර්තා කිරීම මෙම අදියරවලට ඇතුළත් විය හැකි ය. කාලයත් සමග තොරතුරුවල වටිනාකම වෙනස්වීමක් සමග, අන්තර්ගතය දැනුම හා ප්‍රඥාව බවට හැරවීමත් තොරතුරු ජීවන චක්‍රය තුළ ඇතුළත් විය හැකි ය. තොරතුරු ජීවන චක්‍රයේ විවිධ අවස්ථා තුළ ඒවායේ නියැලීමේ වටිනාකම සහ ගම්‍යාර්ථ පිළිබඳව ජනතාව දැනුවත්ව සිටිය යුතු ය.

(Information literacy) **තොරතුරු සාක්ෂරතාව:** තොරතුරු අවශ්‍ය විට හඳුනා ගැනීමට සහ එහි විවිධ ආකෘතිවලින් තොරතුරු නිශ්චය කිරීමට, ඇගයීමට, ඵලදායී ලෙස භාවිත කිරීමට සහ සන්නිවේදනය කිරීමට ඇති හැකියාව අදහස් කෙරේ.

(Information privacy/data protection) **තොරතුරු පෞද්ගලිකත්වය/ දත්ත ආරක්ෂණය:** තොරතුරු රහස්‍යභාවය, හෝ පෞද්ගලික දත්ත රහස්‍යභාවය (දත්ත ආරක්ෂණයේ කොටසක් වන) යනු දත්ත එක්‍රස් කිරීම හා බෙදා හැරීම, තාක්ෂණය, සහ පෞද්ගලිකත්වය පිළිබඳ මහජන අපේක්ෂාව අතර සම්බන්ධය යි. දත්ත ආරක්ෂණය වර්ගීකරණය කළ දත්ත හෝ වෙළෙඳ රහස් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ව්‍යාපාරයන්හි සහ රජයේ අපේක්ෂා ද ආවරණය කළ හැකි නමුත් එවැනි අවස්ථා පෞද්ගලිකත්වයට ඇති අයිතිය කෙරෙහි අදාළ වන කාරණා නොවේ. එසේ වුවද, පුරවැසියන් පිළිබඳ තමන් සතුව ඇති පෞද්ගලික දත්ත සම්බන්ධව මෙම අයිතිය ආරක්ෂා කිරීමට ව්‍යාපාර සහ රජයන්ට යුතුකමක් ඇත.

(Information provider) **තොරතුරු සපයන්නා:** එක්‍රස් කරන ලද තොරතුරු සපයන පුද්ගලයෙකු හෝ සංවිධානයක් වේ. විවිධ අන්තර්ගත සපයන්නන් වෙනත් ආකාරයේ අන්තර්ගතවලට වඩා, තොරතුරු පිළිබඳ විශේෂඥ වන නමුත්, බහුතරයක් අන්තර්ගත සපයන්නන් විසින් මිශ්‍රිත අන්තර්ගතයක් සපයනු ලැබේ. ප්‍රවෘත්ති මාධ්‍ය තොරතුරු සඳහා විශේෂකරණය වී ඇති වුව ද බොහෝ මාධ්‍ය සමාගම් විටෙක සීමා අවිශද කරමින් ප්‍රවෘත්ති සහ විනෝදාස්වාදය යන ද්විත්වයම සපයයි. පුස්තකාල මගින් විශ්වකෝෂ සහ ජර්නල (තොරතුරු) මෙන්ම නවකතා (ප්‍රබන්ධ) යන ද්විත්වයම සපයනු ලැබේ. තොරතුරු, නිර්මාණාත්මක කලා සහ විනෝදාස්වාද වීඩියෝ, මීම්ස් (memes), වෙළෙඳ ප්‍රචාරණ සහ තවත් බොහෝ දේවල් ද සමග, සාවද්‍ය තොරතුරු, දුස්තොරතුරු සහ වෛරී ප්‍රකාශ ඇතුළත් විශාල අන්තර්ගත මිශ්‍රණයක් බෙදා හැරීමට ඩිජිටල් සන්නිවේදන සමාගම් සත්කාරකත්වය දරන බව මතභේදාත්මකව පිළිගත් කරුණකි.

(Information society) **තොරතුරු සමාජය:** තොරතුරු සමාජය යනු අන්තර්ගත නිර්මාණය, බෙදා හැරීම සහ හැසිරවීම ප්‍රමුඛ ආර්ථික හා සංස්කෘතික ක්‍රියාකාරකමක් බවට පත්ව ඇති සමාජයක් සඳහා යොදා ගනු ලබන යෙදුමකි. තොරතුරු සමාජය, ආර්ථික පදනම මූලික කරගත් කාර්මික හෝ කෘෂිකාර්මික සමාජ සමඟ වෙන් කොට හඳුනා ගත හැකිය. තොරතුරු සමාජයේ යන්ත්‍ර මෙවලම් වනුයේ පරිගණක සහ විදුලි සංදේශ වේ.

(Intellectual property) **බුද්ධිමය දේපළ:** බුද්ධිමය දේපළ (IP) යනු මානව බුද්ධියේ අස්පර්ශනීය නිර්මාණ ඇතුළත් දේපළ ප්‍රවර්ගයකි. බුද්ධිමය දේපළ වර්ග බොහොමයක් ඇති අතර ඇතැම් රටවල ඒවාට වඩා වැඩි පිළිගැනීමක් ඇත. ඉන් වඩාත්ම ප්‍රසිද්ධ වර්ග වනුයේ ප්‍රකාශන හිමිකම්, පේටන්ට් බලපත්‍ර, වෙළෙඳ ලාංඡන සහ වෙළෙඳ රහස්ය.

(Internet governance) **අන්තර්ජාල පාලනය:** රජයන්, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජය විසින්, ඔවුනට අදාළ භූමිකා තුළ, පොදුවේ පිළිගත් ප්‍රතිපත්ති, ප්‍රතිමාන, රීති, තීරණ ගැනීමේ ක්‍රියා පටිපාටි සහ, අන්තර්ජාලයේ පරිණාමය සහ භාවිතය හැඩගස්වන වැඩසටහන් සංවර්ධනය කිරීම සහ යෙදවීම මින් අදහස් කරයි. බහුපාර්ශ්වික පාලනයෙහි, එනම්, විවිධ අංශ අතර ඩිජිටල් දිශානතිය එක් අස්ථිත්වයක් (උදා: සමාගම් හෝ රජයන්) විසින් පමණක් යටපත් කරගනු ලැබීම වළක්වන සම්මුතියක වටිනාකම යුනෙස්කෝ සංවිධානය විසින් අවධාරණය කෙරේ. මෙය නීති සම්පාදනය, ප්‍රතිපත්ති සංවර්ධනය සහ ක්‍රියාවට නැංවීම (රජයේ, සමාගම් සහ ආයතනික මට්ටමින්) මෙන්ම, අධීක්ෂණය සහ සමාලෝචනය සඳහා ද අදාළ වේ.

(Internet) **අන්තර්ජාලය:** ලොව පුරා සිටින බිලියන ගණනක් පරිශීලකයන්ට සේවා සැපයීම සඳහා සම්මත අන්තර්ජාල ප්‍රොටෝකෝල කට්ටලය (TCP/IP) භාවිත කරන අන්තර් සම්බන්ධිත පරිගණක ජාලවල

ගෝලීය පද්ධතියකි. එය පුළුල් පරාසයක ඉලෙක්ට්‍රොනික සහ දෘශ්‍ය ජාලකරණ තාක්ෂණවලින් සම්බන්ධ වී ඇති දේශීය මට්ටමේ සිට ගෝලීය මටටම දක්වා වූ පරාසයෙහි මිලියන ගණනක පෞද්ගලික, පොදු, ශාස්ත්‍රීය, ව්‍යාපාරික සහ රජයේ ජාලවලින් සමන්විත තවත් ජාලවල එකතුවකින් සමන්විත ජාලයකි.

(Intolerance) **නොඉවසීම:** ස්වකීය අදහස්, විශ්වාස හෝ හැසිරීම්වලට වඩා වෙනස් අදහස්, විශ්වාස හෝ හැසිරීම් සලකා බැලීමට සහ ඒවාට ගරු කිරීමට ඇති අකැමැත්ත

(In video shoutouts/ads) **වීඩියෝ තුළ වෙළෙඳ ප්‍රචාරණය:** අනුග්‍රහය දක්වන සන්නාමයේ නම සහ/හෝ නිෂ්පාදනය වීඩියෝවේ යම් ස්ථානයක පැහැදිලිව සඳහන් කිරීම

(Jigsaw learning) **ජිග්සෝ ඉගෙනුම:** ජිග්සෝ යනු එමගින් "ප්‍රධාන" කණ්ඩායමකට අයත් වන සෑම සිසුවෙකුටම මාතෘකාවක එක් අංශයක් සඳහා විශේෂීකරණය කළ අධ්‍යයනයක නියැලීමට හැකියාව ලබා දෙන සහයෝගී ඉගෙනුම් උපායමාර්ගයකි (උදාහරණයක් ලෙස, එක් කණ්ඩායමක් විසින් වැසි වනාන්තර ආශ්‍රිත සතුන්ගේ වාසස්ථාන අධ්‍යයනය කරනු ලබන අතර, තවත් කණ්ඩායමක් විසින් වැසි වනාන්තර ආශ්‍රිත විලෝපිකයන් පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි).

(Journalism) **ජනමාධ්‍යවේදය, පුවත්පත් කලාව:** සත්‍යාපිත තොරතුරු සහ අවබෝධිත මත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම, සංස්කරණය කිරීම සහ ඉදිරිපත් කිරීම වේ. ඇතැම් ක්‍රියාකාරීහු එක්රැස් කිරීම (වාර්තා කිරීම) කෙරෙහි ද, අනෙකුත් පිරිස සංස්කරණය (සංස්කාරක) කෙරෙහි ද අවධානය යොමු කරති. වෘත්තීය ආචාරධර්ම සහ ප්‍රමිති අනුගමනය කරන තාක්, වෘත්තීය මාධ්‍යවේදීන් නොවන පුද්ගලයන්ට ජනමාධ්‍යවේදයේ නියැලිය හැකි ය. අදහස් ප්‍රකාශනයේ නිදහස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිවෙකු විවේචනයට ලක් නොකළ යුතු අතර, විශේෂයෙන් මහජන සේවයක් වන ප්‍රවෘත්තිකරණය හරහා එසේ කරන්නන්ට පහර නොදිය යුතු ය. යුනෙස්කෝව විසින් මෙහෙයවනු ලබන, ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ දණ්ඩමුක්තිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමට උත්සාහ දරනු ලැබේ.

(Journalistic codes) **ජනමාධ්‍යවේදී ආචාරධර්ම:** ජනමාධ්‍යවේදය පිළිබඳ ආචාරධර්ම/ චර්යාධර්ම සංග්‍රහ/ වෙනත් සංග්‍රහ (උදා: විවිධත්වය පිළිබඳ) මීට උදාහරණ වේ. ඉහළම වෘත්තීය ප්‍රමිති සපුරාලීම සඳහා සුදුසු හැසිරීම විස්තර කෙරෙන, මාධ්‍යවේදීන් සඳහා වන චර්යාධර්ම ප්‍රතිපත්ති සමූහයකි. එවැනි සංග්‍රහ සඳහා උදාහරණ ජාත්‍යන්තර මාධ්‍යවේදීන්ගේ සම්මේලනය (IFJ) විසින් ස්ථාපනය කර ඇත. පවතින නානාවිධ සංග්‍රහ අතර වෙනස්කම් ඇති නමුත්, ප්‍රවෘත්තිමය වටිනාකමින් යුත් තොරතුරු උපාර්ජනය කර ගැනීමේදී සහ එම තොරතුරු පසුව මහජනතාව වෙත බෙදා හැරීමේදී සත්‍යවාදී බව, නිරවද්‍යතාව, සත්‍යාපනය, අපක්ෂපාතීත්වය, සාධාරණත්වය සහ මහජන වගවීම ඇතුළු පොදු මූලධර්ම අදාළ වන හෙයින් එම සංග්‍රහ බොහොමයක් එකී මූලධර්මවලට අනුගතව කටයුතු කරයි.

(Kineasthetic learning) **කාය චලන ඉගෙනුම:** උදාහරණයක් වශයෙන් දේශනයකට සවන් දීම වෙනුවට ශාරීරික ක්‍රියාකාරකම් ඇතුළත් ඉගෙනුම් ප්‍රවේශයක් අදහස් කෙරේ.

(Knowledge society) **දැනුම් සමාජය:** "දැනුම් සමාජ" යනු ඉහළ මට්ටමේ තොරතුරු සමාජ විස්තර කිරීමට යුනෙස්කෝව විසින් දායකත්වය ලබා දුන් සංකල්පයකි. එය "දැනුම් ආර්ථික තත්ත්ව" යන සංකල්පයෙන් වෙනස් වේ. යුනෙස්කෝ අර්ථයෙන් ගත් කල, දැනුම් සංගම් යනු මානව සංවර්ධනය සඳහා දැනුම ගොඩනැගීමට සහ යොදවා ගනු පිණිස, තොරතුරු හඳුනා ගැනීමට, නිෂ්පාදනය කිරීමට, සැකසීමට, පරිවර්තනය කිරීමට සහ භාවිත කිරීමට ඇති හැකියාවන් වේ. අදහස් ප්‍රකාශනයේ නිදහස, තොරතුරු සහ දැනුම සඳහා ඇති සාර්වත්‍ර ප්‍රවේශය, සංස්කෘතික හා භාෂාමය විවිධත්වයට ගරු කිරීම සහ සැමට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම යන කුලුනු හතර මත දැනුම් සමාජ නිසගයෙන්ම රඳා පවතී.

(Knowledge) **දැනුම:** යම් කිසි කාරණයක් සඳහා යෙදවිය හැකි දෙයක් (ප්‍රායෝගික දැනුම) බවට පරිවර්තනය කළ හැකි හෝ අවබෝධය සඳහා භාවිත කළ හැකි තොරතුරු. දැනුම යනු උගත හැකි දෙයකි. දැනුම ප්‍රඥාවේ පදනම වන අතර ප්‍රඥාව යනු යම් නිශ්චිත අවස්ථාවල දී කවර දැනුමක් යොදා ගත යුත්තේද යන්න පිළිබඳ විනිශ්චයයි.

(Learner centred) **ශිෂ්‍ය කේන්ද්‍රීයඃ** ශිෂ්‍යයාව අධ්‍යාපන ක්‍රියාවලියෙහි ප්‍රමුඛතම ස්ථානයෙහි තබන අධ්‍යාපන ප්‍රවේශයකි. මෙහිදී පුද්ගලයන්ගේ අවශ්‍යතා සහ අභිලාෂ ඕනෑම ඉගෙනුම් ක්‍රියාවලියක හෝ වැඩසටහනක කේන්ද්‍රයේ තබනු ලබන අතර, ඔවුන් එම ඉගෙනීමේ අවස්ථාවට රැගෙන එන අත්දැකීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. මෙම සංකල්පය සහභාගිත්වය යන අදහසට ඉඩ දෙන අතර, ඉගෙනුම් ප්‍රජාව වෙත ශිෂ්‍යයා ලබා දෙන දායකත්වය අගය කරයි.

(Library skills) **පුස්තකාල කුසලතාඃ** අන්තර්ගත සම්පත් සොයා ගැනීමට, ඇගයීමට සහ භාවිත කිරීමට පුස්තකාලයක් භාවිත කිරීමේ නිපුණතාව

(Life-long learning) **යාව-ජීව ඉගෙනුම්ඃ** ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ අදහසට මෙය සම්බන්ධ වේ. නිශ්චිත කාලයක් සහ අවකාශයක් තුළ උපදේශන සහිත වැඩසටහනකින් පසු ජීවිතය 'ආරම්භ' සහ 'අවසාන' නොවන බව මෙමගින් හඳුනා ගැනේ. සෑම පුද්ගලයෙකුම නිරතුරුව ඉගෙන ගනිමින්, අන්තර්ගත සපයන්නන් සමග අන්තර්ක්‍රියා කරමින්, මෙවැනි ඉගෙනීම් පවත්වා ගෙන යයි. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සංවර්ධනය හුදෙක් වැඩසටහනක් සම්පූර්ණ කිරීමට පමණක් සීමා නොවී, විධිමත් අධ්‍යාපන සන්දර්භයෙන් ඔබ්බට යයි. එය විවිධ පරිසර (රැකියා ස්ථානවල දී, ප්‍රජා කටයුතුවල දී සහ නොවිධිමත් අධ්‍යාපන පරිසරයන්හි දී) අතරතුර දී සිදු වේ.

(Machine learning) **යන්ත්‍ර ඉගෙනුම්ඃ** දත්ත රටා විශ්ලේෂණය කිරීමට සහ එම රටා මගින් අනුමාන ඇල්ගොරිතම සහ සංඛ්‍යාන මාදිලි භාවිත කරමින් නිශ්චිත උපදෙස් අනුගමනය කිරීමකින් තොරව ඉගෙනීමට සහ අනුවර්තනය වීමට හැකි පරිගණක පද්ධති භාවිතය සහ සකස් කිරීම.

(Mainstream media) **ප්‍රධාන ධාරාවේ මාධ්‍යඃ** විශාලතම බෙදාහැරීමේ නාලිකා හරහා බෙදා හරිනු ලබන හෙයින් මාධ්‍ය පාරිභෝගිකයන් බහුතරයකට අත්දකින්නට ලැබෙන මාධ්‍ය. මෙම පදය මගින් සාමාන්‍යයෙන් දැනට පවතින චින්තන ප්‍රවාහ, බලපෑම් හෝ ක්‍රියාකාරකම් පිළිඹිබු කෙරෙන මාධ්‍ය ද අදහස් වේ. අන්තර්ගත ඩිජිටල් සන්නිවේදන සමාගම් හරහා අඛණ්ඩව වර්ධනය වන බැවින්, ප්‍රධාන ධාරාවේ මාධ්‍ය ආයතනවල භූමිකාව සහ ග්‍රාහක පිරිස් වෙත ළඟා වීම අඩු කිරීමේ භාගීකරණයක් පවතී.

(Manipulated content) **අනිසි ලෙස හසුරුවන ලද අන්තර්ගතයඃ** රැවටීමේ පරමාර්ථයෙන් අනිසි ලෙස හසුරුවනු ලබන නිර්ව්‍යාජ අන්තර්ගත හෝ සංකල්ප රූප

(Marketing) **අලෙවිකරණයඃ** සමාගම් විසින් භාණ්ඩ, සේවා සහ අදහස් කෙරෙහි අභිරුචියක් ඇති කරන ක්‍රියාවලිය. අලෙවිකරණය මගින් විකුණුම් ශිල්පීය ක්‍රම, ව්‍යාපාර සන්නිවේදනය සහ ව්‍යාපාර සංවර්ධන ඇතුළත් වන උපායමාර්ග උත්පාදනය කරයි. උපායමාර්ගික සන්නිවේදන සහ තොරතුරු මෙහෙයුම්, බොහෝ විට දිසි අදිසි සංරචක ඇතුළත්ව, අලෙවිකරණයේ මූල ආකාර මට්ටමේ පවතී.

(Masculinity) **පුරුෂත්වයඃ** සාමාන්‍යයෙන් පිරිමින් සහ පිරිමි ළමයින් හා බැඳුණු ගුණාංග, හැසිරීම් සහ භූමිකා සමූහයකි.

(Mass media) **ජනමාධ්‍යඃ** ක්ෂුද්‍ර-ඉලක්කගත වෙළඳ ප්‍රචාරණ සහ පුද්ගලීකරණය කළ අන්තර්ගත පෝෂණ විභවීය ලෙස සපයන අතරතුර පවා, විශාල ග්‍රාහක පිරිස් ගොඩනගා ගැනීමට උත්සාහ කරන්නා වූ මාධ්‍ය ආයතන සහ අන්තර්ගත සපයන්නන්

(Media capture) **මාධ්‍ය අවනත කර ගැනීමඃ** රජයන් සහ බලගතු උත්සුක කණ්ඩායම් විසින් ගනු ලබන ක්‍රමානුකූල පියවර තුළින් සාක්ෂාත් කර ගන්නා මාධ්‍ය පාලන ආකාරයකි. මාධ්‍ය පාලනය කරනු ලබන නියාමන යාන්ත්‍රණ; රජය සතු හෝ රාජ්‍ය පාලිත මාධ්‍ය මෙහෙයුම්; ජනමාධ්‍යවේදයට මුදල් යෙදවීමට භාවිත කරනු ලබන මහජන මුදල්; සහ පුද්ගලිකව පවත්වාගෙන යනු ලබන ප්‍රවෘත්ති ආයතනවල අයිතිය යන දෑ පාලනය සහ අවභාවිතාව මගින් මෙම අවනත කර ගැනීම සිදු වේ.

(Media diversity) **මාධ්‍ය විවිධත්වයඃ** මෙය සමහර අවස්ථාවල දී "අභ්‍යන්තර බහුත්වය" ලෙස හැඳින්වුව ද, මාධ්‍ය බහුත්වයට සමාන නොවේ (පහත බලන්න). මාධ්‍ය ආයතනයක් තුළ හෝ මාධ්‍ය අංශය තුළ ඇති මත, අදහස් සහ විශ්ලේෂණ පරාසය එමගින් අදහස් කෙරේ. මෙහි විවිධත්වයේ වපසරිය

බොහෝ විට මාධ්‍ය ආයතනවල හිමිකාරිත්වයේ පටු බව හෝ පුළුල්භාවය , එහි කාර්ය මණ්ඩලය සහ ඉලක්කගත ග්‍රාහක පිරිස සමග සම්බන්ධ වේ. අන්තර්කරණීය මාධ්‍ය පද්ධතියක් මගින් මහජන කැමැත්ත සහ ජනවිකාස අන්තර්කරණය පිළිබඳ දැනුවත්භාවය සබල කරමින් විවිධ ආකාරවලින් සහ භාෂාවලින් විවිධ වූ අන්තර්ගත සපයනු ලබයි.

(Media ethics) **මාධ්‍ය ආචාරධර්ම:** මාධ්‍ය ආචාරධර්ම යනු විකාශන මාධ්‍ය, සිනමා චිත්‍රාගාර, සිනමාහල්, චිත්‍රාගාර, ප්‍රදර්ශන අවකාශ සහ මුද්‍රිත මාධ්‍ය ඇතුළු මාධ්‍ය ආයතනවල මාර්ගගත හා මාර්ග අපගත මානයන් ඔස්සේ සිදුවන, එවැනි ආයතනවල නිශ්චිත සදාචාරාත්මක මූලධර්ම හා ප්‍රමිති හා සම්බන්ධ ව්‍යවහාරික ආචාරධර්මවල විභේදනයයි. මාධ්‍ය ආචාරධර්ම මගින්, සංස්කෘතික ප්‍රකාශනවල විවිධත්වය කෙරෙහි ඇති ගරුත්වය, සමානාත්මතාව සහ වෙනස් කොට නොසැලකීම, අවංකභාවය සහ තෝරා ගැනීමට ඇති හැකියාව වැනි සාරධර්ම ප්‍රවර්ධනය කෙරේ. ජනමාධ්‍යවේදී ආචාරධර්ම වඩාත් විශේෂිත වන අතර ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනවලට (ආයතනවලින් පිටත ක්‍රියාත්මක වන පුරවැසි මාධ්‍යවේදීන් සඳහා ද අදාළ වුව ද) වඩාත් අදාළ වේ.

(Media freedom) **මාධ්‍ය නිදහස:** ඉහත "මාධ්‍ය නිදහස" බලන්න

(Media independence) **මාධ්‍ය ස්වාධීනතාව:** මාධ්‍ය ස්වාධීනත්වය යනු මාධ්‍ය තුළ කටයුතු කරන ආයතනයකට හෝ පුද්ගලයෙකුට බාහිර පාලනයක් සහ බලපෑමක් නොමැති වීමයි. එය සංස්කරණ ප්‍රතිපත්ති සහ ව්‍යාත්තීය ප්‍රමිතිවලට අනුව තීරණ ගැනීමේ හැකියාව මැනීමේ මිනුමක් වන අතර ස්වාධීන මාධ්‍ය රජයේ හෝ ව්‍යයෙන් වෙන්කර හඳුනා ගනී. එහි ප්‍රතිවිරුද්ධය "මාධ්‍ය ග්‍රහණය" යි. (ඉහත බලන්න).

(Media languages) **මාධ්‍ය භාෂා:** ග්‍රාහක පිරිසකට මාධ්‍ය සන්දේශවල අර්ථය පෙන්වන සම්මුති, ආකෘති, සංකේත සහ ආඛ්‍යාන ව්‍යුහ. සංකේතාත්මකව, මුද්‍රිත මාධ්‍යවල ව්‍යාකරණ ක්‍රියා කරන ආකාරයටම විද්‍යුත් මාධ්‍ය භාෂාව ද ක්‍රියා කරයි.

(Media literacy) **මාධ්‍ය සාක්ෂරතාව:** මාධ්‍ය ආයතන, ඒවායේ හිමිකාරිත්වය, ප්‍රතිමානක හා තථ්‍ය කාර්යයවල යෙදවීම සහ ඒවායේ අන්තර්ගතයේ යෙදවීම හා බලපෑම පිළිබඳ දැනුවත් හා විචාරශීලි අවබෝධය ඇතුළුව, ජන මාධ්‍ය ස්වාධිකාරාත්මක හෝ ස්වාධිකාරාත්මක-නොවන ආකාරයෙන් අවබෝධ කර ගැනීම සහ භාවිත කිරීම මෙයින් අදහස් කරනු ලැබේ. එසේම, විවිධ මාධ්‍ය ආකාරවලින් (උදා: ශ්‍රව්‍ය දෘශ්‍ය, ලිඛිත, ග්‍රැෆික්, අන්තර්ක්‍රියාකාරී ක්‍රීඩා ආදිය) සන්නිවේදන කියවීමට, විශ්ලේෂණය කිරීමට, ඇගයීමට, සම්පාදනය කිරීමට ඇති හැකියාව යි.

(Media ownership) **මාධ්‍ය හිමිකාරිත්වය:** තනි පුද්ගලයන්, සංස්ථා, සහ/හෝ රජයන් විසින් සිදු කෙරෙන අන්තර් පුද්ගල සහ ජන සන්නිවේදන තාක්ෂණවල වාණිජ සහ නෛතික පාලනය. අන්තර්ගත සැපයීමේ දී (මාධ්‍ය ආයතනවල අන්තර්ගත ඇතුළුව) ඩිජිටල් සන්නිවේදන සමාගම් සතු භූමිකාව සැලකිල්ලට ගත් කල, වර්තමානයේ , ඩිජිටල් සන්නිවේදන සමාගම්වල හිමිකාරිත්වය සහ වගවීම ද සැලකිල්ල යොමු කළ යුතු ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත.

(Media pluralism) **මාධ්‍ය බහුත්වය:** මාධ්‍ය බහුත්වය යනු එකිනෙකට වෙනස් සහ විවිධකාර වූ මාධ්‍ය අතර සහජීවනයයි. එය මධ්‍යගත, ඒකාබද්ධ හෝ ඒකාධිකාරී මාධ්‍ය සේවාවන්ට ප්‍රතිවිරුද්ධ වූවකි. පිවිසුම් පිරිවැය අවම කරගැනීමෙහි ලා සමාජ යහපතක් ලෙස බහුත්වය දකින්නා වූ,අන්තර්ජාල සම්බන්ධතා සේවා වැනි විවිධ ඩිජිටල් සේවා සඳහා ද මෙම සංකල්පය අදාළ වේ. එය "app stores" වැනි කතිපයාධිකාරී මධ්‍යගත පහසුකම් වටා ඇති ගැටලු කෙරෙහි ද අවධානය යොමු කරයි. විශේෂයෙන්ම මේවා ප්‍රතිවාදී-නොවන යෙදවුම්වලට වරප්‍රසාද ලබා දෙන සහ තරගකරුවන්ට අවාසි සහගත තත්ත්වයක් උදා කර දෙන විට හෝ, මේවායින් පෞද්ගලිකත්ව විධිවිධාන සක්‍රීය කරන (හෝ අක්‍රිය කරන) විට එලෙස අවධානය යොමු වේ. මාධ්‍ය අවකාශය තුළ, බහුත්වය මගින් මාධ්‍ය ආයතනවල අංශ තුනක, එනම්, පෞද්ගලික මාධ්‍ය, ප්‍රජා මාධ්‍ය සහ මහජන මාධ්‍ය තුළ සුවිශේෂී භූමිකා ද ආවරණය කෙරේ. ප්‍රාථමික තාර්කිකය, අරමුදල් ක්‍රම, පාලනය සහ අන්තර්ගතය අනුව එක් එක් අංශය එකිනෙකට වෙනස් වේ. මාධ්‍ය බහුත්වය මගින් මාධ්‍ය විවිධත්වය සහතික කිරීමක් සිදු නොවේ.

(Media violence) **මාධ්‍ය ප්‍රචණ්ඩත්වය:** මාධ්‍ය ප්‍රචණ්ඩත්වය යනු රසඥතාව සහ විභවීය බලපෑම සම්බන්ධයෙන් විවිධ උපකල්පන හා සම්බන්ධ අතිශයින් විවාදාත්මක සංකල්පයකි. බලය භාවිත කරන බවට වන තර්ජනය, බලය භාවිත කිරීමේ ක්‍රියාව හෝ සජීවී ජීවීන්ට (කාටූන් චරිත හෝ වෙනත් ජීවී විශේෂ මෙන්ම මිනිසුන් ද ඇතුළුව) එරෙහිව බලය භාවිත කිරීමේ ප්‍රතිවිපාක නිරූපණය කෙරෙන අන්තර්ගත මෙමගින් පුළුල්ව අදහස් වේ. දශක ගණනාවක විද්‍යාත්මක දත්තවලට අනුව ප්‍රණ්ඩ මාධ්‍යවලට නිරාවරණය වීම ආක්‍රමණශීලී බව වැඩි කරන බව දැක්වුනද, එයට වෙනස් මතයක් දැක්වෙන අධ්‍යයන ගණනාවක් මෙන්ම, එයට ප්‍රතිවිරුද්ධ මතයක් දරන අධ්‍යයනද පවතී. ජාත්‍යන්තර ප්‍රමිතීවලට අනුව, සැබෑ ප්‍රචණ්ඩත්වය සහ වාර්ගික වෛරයට පොළඹවන අන්තර්ගත නීත්‍යානුකූලව සීමා කර ඇත. එසේ වුවද, ප්‍රධාන කරුණු කිහිපයක් (කථිකයාගේ තත්ත්වය, ප්‍රහාරයක් ඇති වීමේ සම්භාවිතාව හා ආසන්නතාව) ඇගයීමට ලක් කිරීම පාදක කරගෙන, සැලකිය යුතු තරමේ අන්තරාදායක ප්‍රකාශන සඳහා පමණක්, ගෙන එන ඕනෑම තහනමක් සීමා කළ යුතු බවට පෙළඹවීම තහනම් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ රබාත් ක්‍රියාකාරී සැලැස්ම (Rabat Plan of Action on the prohibition of incitement) මගින් පෙන්වා දෙයි. ඩිජිටල් සන්නිවේදන සමාගම් සතුව, ඔවුන්ගේ තථ්‍යකාලීන දත්ත තුළින් කුමන ප්‍රකාශන (බොහෝ විට "මතුපිටින් යහපත් ලෙස පෙනුණද අදාළ පාර්ශ්වවලට යටි පණිවුඩයක් ලබා දෙන dog whistles" ලෙස හඳුන්වනු ලබන සියුම් ප්‍රකාශන පවා) සැබෑ පෙළඹවීම් බවට පත්වන්නේදැයි තක්සේරු කිරීමේ හැකියාව ඇත. න්‍යායාත්මකව, පූර්ව හංගත්වයකින් කටයුතු කිරීමේ හා සැබෑ ප්‍රචණ්ඩත්වය වැළක්වීමට අප්‍රමාදව ක්‍රියාත්මක වීමේ හැකියාව ඔවුන් සතු වේ.

(Media) **මාධ්‍ය:** සමාජ ආයතන හැඳින්වීම සඳහා මෙන්ම සන්නිවේදනය සඳහා වන තාක්ෂණික උපාංග හැඳින්වීමටද ආදී වශයෙන් මෙම පදය අවම වශයෙන් දෙයාකාරයකින් භාවිත වේ. සමාජ ආයතන ලෙස, උදාහරණ වශයෙන්, සමාජ ආයතන ලෙස ගත් කල, ජනමාධ්‍යවේදී වටිනාකම් සහ සංවිධානයක් හෝ නෛතික පුද්ගලයකු වෙත ආරෝපණය කරන ලද සංස්කාරක වගවීම මගින් නිර්ණය කරන ලද සංස්කාරක ක්‍රියාවලියක් මත පදනම්ව, විශ්වසනීය තොරතුරු සඳහා සම්මත සහ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු ප්‍රවෘත්ති නිෂ්පාදන ආයතන බොහෝ විට මාධ්‍ය ආයතන යනුවෙන් හැඳින්වේ. තාක්ෂණය යන සන්දර්භය තුළ, මාධ්‍ය යන යෙදුමෙන් කඩදාසි, විකාශනය, චිත්‍රපට සහ ඩිජිටල් සම්ප්‍රේෂණය වැනි සන්නිවේදනය සඳහා භාවිත කරනු ලබන භෞතික මාධ්‍යය ද අදහස් වේ.

(Medium) **මාධ්‍යය:** මෙම යෙදුම තාක්ෂණික අර්ථයෙන් ගත් කල "මාධ්‍ය" යන්නට සමාන විය හැකි ය (ඉහත බලන්න). කෙසේ වෙතත්, එය යම් නිශ්චිත තාක්ෂණයක් හෝ තාක්ෂණ මත පදනම් වූ නාලිකාවක් වශයෙන් ද නම් කළ හැකි ය. උදාහරණයක් ලෙස, රූපවාහිනිය යනු ඩිජිටල් හෝ චන්ද්‍රිකා විකාශන මාධ්‍ය හරහා හෝ Wi-Fi හෝ 3G ටෙලිකොම් හරහා හෝ ස්ථාවර අන්තර්ජාලය පද්ධතියක් හරහා බෙදා හැරිය හැකි නාලිකාවකි.

(MIL) **මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව:** MIL යනුවෙන් අදහස් කරනු ලබන්නේ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව වන අතර, පුරවැසියන්ට අන්තර්ගත සපයන්නන් සමග ඵලදායී ලෙස සම්බන්ධ වීමට සහ සමාජගත වීමට මෙන්ම ක්‍රියාශීලී පුරවැසියන් බවට පත්වීම සඳහා විචාරශීලී චින්තනය සහ යාවජීව ඉගෙනුම් කුසලතා වර්ධනය කිරීමට ඉඩ සලසන අත්‍යවශ්‍ය නිපුණතා (දැනුම, කුසලතා සහ ආකල්ප) වෙත යොමු වීම ද මෙයින් අදහස් වේ.

(Minsinformation) **සාවද්‍ය තොරතුරු:** අසත්‍ය සහ නොමග යවන සුලු අන්තර්ගත වේ. මෙම විෂයමාලාව තුළ දී මෙම පදය එවැනි අන්තර්ගත වංචාකාරීව හෝ නොදැනුවත්ව නිර්මාණය කිරීම සහ බෙදා හැරීම යන අවස්ථා දෙකම ආවරණය කිරීම සඳහා භාවිත වේ. පටු අර්ථයකින් ගත් කල, ඒ වනාහී අසත්‍ය නමුත් හානියක් කිරීමේ චේතනාවෙන් නිර්මාණය නොකළ, හානිකර බලපෑමක් ඇති කළ හැකි අන්තර්ගත වේ (එන්නත් පිළිබඳව අසත්‍ය ප්‍රකාශ වැනි උදාහරණ). සාවද්‍ය තොරතුරක මූලාරම්භය බොහෝ විට දුස් තොරතුරකි. යම් අන්තර්ගතයක් (උදා: මැතිවරණයක් "දූෂිත වීම") වංචාකාරී චේතනාවෙන් ආරම්භ කරන්නට ඉඩ ඇති නමුත්, එය සත්‍ය තක්සේරුවක් යැයි අවංකව විශ්වාස කරන්නා වූ පුද්ගලයෙක් විසින් එය පතුරුවා ලීමට ඉඩ ඇත. අන්‍යාකාරයකින් කියතොත්, එකිනෙකට හැම අතින්ම සමාන වූ අසත්‍යයක් දුස්තොරතුරක් මෙන්ම සාවද්‍ය තොරතුරක් ද වීමේ හැකියාවක් ඇත.

(Misleading content) **නොමඟ යවන සුලු අන්තර්ගතය:** සත්‍ය නොවන යමක් සත්‍ය බවට විශ්වාස ගැන්වෙන පරිදි යමෙකු ප්‍රයෝගයෙන් රවටා ගැනීමට උත්සාහ කරන අන්තර්ගත

(Museum curator) **කෞතුකාගාර අභිරක්ෂක:** කෞතුකාගාරයක භාණ්ඩ එකතුව භාරව සිටින සහ ඓතිහාසික කෞතුක වස්තු ඇතුළු උරුම අර්ථකථනය කිරීමේ නියැලී සිටින, අන්තර්ගත විශේෂඥයෙකි. "පරිරක්ෂණය" යන යෙදුම ඩිජිටල් සන්නිවේදන සමාගම් දක්වා ව්‍යාප්ත වී ඇති අතර, ඇල්ගොරිතම ආදිය මගින් ප්‍රවර්ධනය කරනු ලබන්නේ කුමන අන්තර්ගත ද යන්න අනුව එවැනි ආයතන ඔවුන්ගේ "ගබඩාව" සකසන ආකාරය ද එමගින් අදහස් කෙරේ. පරිශීලකයන් අභිරක්ෂණය/පරිරක්ෂණය හා අන්තර්ක්‍රියා කරන ආකාරය හා සම්බන්ධ මැදිහත්වීම් හැඳින්වීමට "ප්‍රමිතකරණය" යන යෙදුම භාවිත වේ.

(Narrative) **ආඛ්‍යානය:** සිද්ධි අනුපිළිවෙලක් ඔස්සේ කතාවක් හෝ කථා වස්තුවක් පැවසීම මෙයින් අර්ථකථනය වේ. බොහෝ කරුණු මත පදනම් වූ තොරතුරු ව්‍යුහගත කර ඇත්තේ යම් යම් කරුණුවලට වැදගත්කමක් ලබා දෙන පුළුල් ආඛ්‍යානයක් තුළ වන අතර, තම අතැති පෙළ සමග සම්බන්ධ වන පුද්ගලයෙකුට මෙමගින් අර්ථකථනය මග පෙන්වීමක් සැපයේ. එබැවින් ආඛ්‍යාන වෙනස් විය හැකි අතර, එතකුදු වුවත්, සියල්ල තවදුරටත් සත්‍ය කරුණු වේ. කෙසේ වෙතත්, සමහර ආඛ්‍යාන සාවද්‍ය තොරතුරු සහ දුස්තොරතුරු ශිල්පීය ක්‍රමයක් වශයෙන් සාවද්‍ය හෝ නොමඟ යවන සුලු අන්තර්ගත ඒවායේ ව්‍යුහය තුළට ඇතුළත් කරයි.

(Narrow AI) **එක් අරමුණැති කෘත්‍රිම බුද්ධිය:** එක් අරමුණැති කෘත්‍රිම බුද්ධිය යනු තනි හෝ සීමිත කාර්යයක් හැසිරවීමට නිශ්චිතව දක්වා ඇති කෘත්‍රිම බුද්ධි පද්ධති විස්තර කිරීමට භාවිත කරන යෙදුමකි.

(New media) **නව මාධ්‍ය:** ඩිජිටල් වේදිකාවල සංවිධානය කර බෙදාහරිනු ලබන අන්තර්ගතය

(News media) **ප්‍රවෘත්ති මාධ්‍ය:** වත්මන් පුවත් මහජනතාවට ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ජන මාධ්‍ය අංශයකි. එයට ඓතිහාසික මුද්‍රිත මාධ්‍ය (උදා. පුවත්පත් සහ සඟරා), විකාශන මාධ්‍ය (ගුවන්විදුලිය සහ රූපවාහිනිය), මාර්ගගතව පමණක් විකාශය වන ප්‍රවෘත්ති මාධ්‍ය, මෙන්ම ප්‍රවෘත්ති නිෂ්පාදනය කළ හැකි රාජ්‍ය නොවන සංවිධාන හෝ තනි පුද්ගලයන් වැනි වෙනත් අස්ථිත්ව (උදා: ලෝක ව්‍යාප්ත ජාල පිටු සහ බ්ලොග් හරහා)

(News values) **ප්‍රවෘත්තිමය වටිනාකම්:** විටෙක ප්‍රවෘත්ති නිර්ණායක ලෙසද හඳුන්වනු ලබන ප්‍රවෘත්තිමය වටිනාකම් තුළින්, සාමාන්‍යයෙන් මාධ්‍ය ආයතනයක් විසින් ප්‍රවෘත්තියකට කෙතරම් ප්‍රමුඛතාවයක් ලබා දෙන්නේ ද යන්න සහ එයට ග්‍රාහක පිරිස කෙතරම් අවධානයක් ලබා දෙන්නේද යන්න නිර්ණය කෙරේ. මේ අතරින් වැඩිම බලපෑම් කළ හැකි වටිනාකම් අතරට නිරන්තරතාව, අනපේක්ෂිත බව, පුද්ගලායනය, අර්ථවත් බව හෝ ගැටුම්-උත්පාදනය කරවන සුලු බව ඇතුළත් වේ. නමුත්, මෙම ප්‍රවෘත්ති වටිනාකම් මගින්, සිද්ධිවලට (කුණාටු වැනි) වඩා ක්‍රියාවලි ද (ගෝලීය උණුසුම වැනි), ප්‍රභූන්ට වඩා සාමාන්‍ය ජනතාව ද, "තුරඟ තරගවලට" වඩා ගැටලු-පාදක මැතිවරණ ද ආදී වශයෙන් තොරතුරුමය අන්තර්ගතවල වැදගත් මානයන් ද අවප්‍රමාණය කරනු ලබයි.

(Open educational resource) **විවෘත අධ්‍යාපනික සම්පත්:** විවෘත අධ්‍යාපනික සම්පත් (OER) යනු, පොදු වසම තුළ ඇති හෝ තහනමකින් තොරව හෝ සීමිත තහනමකින් යුතුව තොරව, ගාස්තු රහිතවම ඒ වෙත ප්‍රවේශ වීමට, භාවිත කිරීමට, අනුවර්තනය කිරීමට හා නැවත බෙදා හැරීමට අන්‍යයන්ට ඉඩ ලබා දෙන විවෘත බලපත්‍රයක් යටතේ නිකුත් කර ඇති, ඕනෑම මාධ්‍යයක් හරහා වන ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ වේ - ඩිජිටල් හෝ වෙනත් ආකාරයක විය හැකි ය.

(Participation (civic participation)) **සහභාගීත්වය (පුරවැසි සහභාගීත්වය):** සහභාගීත්වය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංගයක් වන අතර, එහි ප්‍රධාන අරමුණ වන්නේ සෑම පුද්ගලයෙකුටම සමාජය තුළ තමන්ට හිමි ස්ථානය අත්කර ගැනීමට සහ එහි සංවර්ධනයට දායක වීමට හැකි බව සහතික කිරීම යි. එය ප්‍රජාතන්ත්‍රවාදී පරිචයේ වැදගත් අංගයක් වන අතර මූලික මානව හිමිකම්වල මුඛ්‍ය ප්‍රතිඵලය ලෙස සැලකෙන තීරණ ගැනීමේ ක්‍රියාවලි සඳහා ද අතිශය වැදගත් වේ.

(Pedagogical approach) **ශික්ෂණවිද්‍යා ප්‍රවේශය:** ඉගැන්වීමේ පරිචයෙහි දී භාවිත කරන අධ්‍යාපනයේ පුළුල් මූලධර්ම සහ ක්‍රම. මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ ශික්ෂණවිද්‍යා ප්‍රවේශවලට නිදසුනක් වශයෙන් මෙම මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාවේ 01වන මොඩියුලය බලන්න.

(Perfect information) **සර්ව සම්පූර්ණ තොරතුරු:** පුද්ගලයෙකුට නිසි වේලාවට තීරණ ගැනීමට අවශ්‍ය සියලුම නිවැරදි තොරතුරු තිබීම පිළිබඳ උපන්‍යාසයකි

(Pluralism) **බහුත්වය:** ඉහත සඳහන් කර ඇති "මාධ්‍ය බහුත්වය" බලන්න

(Popular culture) **ජනප්‍රිය සංස්කෘතිය:** යම් නිශ්චිත සංස්කෘතියක ප්‍රධාන ප්‍රවාහයේ, විශේෂයෙන් 20වන සියවසේ මුල් භාගයේ සිට මැද භාගයේ බටහිර සංස්කෘතිය සහ 20වන සියවසේ අගභාගයේ සහ 21වන සියවසේ මුල් භාගයේ නැගී එන ගෝලීය ප්‍රධාන ධාරාවේ අවිධිමත් එකඟතාවකින් ඉදිරිපත් වන අදහස්, පර්යාලෝක, ආකල්ප, තේමා, අනුරූප සහ වෙනත් සංසිද්ධි සමස්තයයි.

(Portal) **පිවිසුම් ද්වාරය:** පිවිසුම් ද්වාරයක් යනු විද්‍යුත් තැපෑල, ක්‍රීඩා, මිල ගණන් ඉදිරිපත් කිරීම්, සෙවුම්, ප්‍රවෘත්ති සහ වෙළෙඳපල කොටස් වැනි පුළුල් පරාසයක සේවා සපයන වෙබ් අඩවියක හෝ සේවාවක් පිළිබඳ අදහසකි. පිවිසුම් ද්වාරයක්, වෙබ් පිවිසුම් ද්වාරයක් හෝ වෝටෙක්ස් වෙබ් අඩවියක් තුළින්, පැමිණෙන්නන් නිරන්තරයෙන් පිවිසීමට ඉඩ ඇති, එවැනි පුළුල් පරාසයක් තුළ වූ ඉහළ පිවිසුමක් සහිත සේවා සපයනු ලැබේ. ඇල්ගොරිතමීය නියැලීම සහ නිර්දේශ හරහා පරිශීලක අවධානය රඳවා ගැනීම ඇතුළුව පරිශීලකයා ඒ වෙත 'ඇලී ගැලී සිටීම' සාක්ෂාත් කර ගැනීම සඳහා මනෝවිද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කරන විශේෂිත සමාජ ජාල යෙදවුමක් වැනි සීමිත පරිසරයක් තුළ පරිශීලකයන් තබා ගැනීමට උත්සාහ කරන "පිරිවට පිවිසුම්" (walled garden) යනු පිවිසුම් ද්වාරයක ප්‍රතිවිරුද්ධයයි. පිවිසුම් ද්වාර සහ පිරිවට පිවිසුම් යන සේවා ද්විත්වයම පුළුල් අන්තර්ජාලය හරහා, කුකීස් හඹා යෑම සහ අනන්‍ය අන්තර්ජාල නියමාවලි ලිපිනය විවිධ අන්තර්ජාල ස්ථාන හරහා රැස් කරන ලද දත්ත සමග ගැලපීම වැනි පරිශීලකයන්ගේ හැසිරීම් රටා අධීක්ෂණය කිරීමට නිත්‍ය වශයෙන් ක්‍රම සොයා ගන්නා බව අන්තර්ජාලය හරහා තෝරාගැනීම සඳහා ඇති අවස්ථා යන්නෙන් අදහස් වේ. "ඇප් ස්ටෝර්ස්" ලෙස හැඳින්වෙන පිවිසුම් ද්වාර මේ වන විට වැඩි වැදගත්කමක් අත්කරගනිමින් තිබෙන අතර, ඒවාට ඇතුළත් කරගන්නා සහ ඒවායින් බැහැර කරන යෙදවුම් මෙන්ම ඇතැමුන් විසින් ත්‍රාසාද්ග්‍රහණීය ලෙස දකිනු ලබන ඔවුන්ගේ ව්‍යාපාර ආකෘති ද මේ වන විට මතභේදාත්මක තත්ත්වයකට මුහුණ දෙමින් පවතියි.

(Privacy settings) **පෞද්ගලිකත්ව සිටුවම්:** තෙවන පාර්ශ්ව අතරින් පරිශීලකයා පිළිබඳ තොරතුරු සෘජුව දැකගැනීමට හෝ ඒ වෙත ප්‍රවේශ විය හැක්කේ කාටද යන්න පිළිබඳ පරිශීලකයාට අර්ධ වශයෙන් පාලනය කිරීමට ඉඩ සලස්වනු ලබන, සමාජ ජාල වෙබ් අඩවියක, අන්තර්ජාල බ්‍රවුසරයක, මෘදුකාංගයක, ඩිජිටල් උපාංගයක ආදියෙහි කොටසක්. මෙම සේවය/සේවා භාවිතයේ දී සාමාන්‍යයෙන් ඔබ පිළිබඳ දත්ත එක්රැස් කෙරෙන බව හෝ ඔබ භාවිත කරන යෙදවුම් මගින් එය රැස් කිරීමට ඉඩ සලස්වන බව සිහි තබා ගත යුතු ය. ඔබ භාවිත කරන අන්තර්ජාල සබඳතා සැපයුම්කරු මීට උදාහරණයක් වේ. ඊට අමතරව පුළුල් පරාසයක වන විකල්ප සමග, ඔබ භාවිත කරන යෙදවුම් ද මීට අයත් වේ.

(Product or service reviews) **නිෂ්පාදන හෝ සේවා ප්‍රතිචාර:** යම්කිසි නිෂ්පාදනයක් හෝ සේවාවක් සඳහා ලැබෙන පාරිභෝගික අදහස් හෝ ප්‍රතිපෝෂණ (උදා: අවන්හල් සඳහා)වේ. යටි අභිප්‍රායන් සඟවා ගැනීම හෝ ධනාත්මක හෝ ඍණාත්මක වන විචාර සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් මේවා නිරන්තර විවේචනයට ලක් වේ.

(Prosumer) **සම්පාදක-පාරිභෝගික:** අන්තර්ගතය පරිභෝජනය කරන සහ සම්පාදනය කරන පුද්ගලයකු

(Public domain information) **පොදු අවකාශීය තොරතුරු:** කාව්‍ය, සංගීතය, චිත්‍ර, පොත්, චිත්‍රපට, නිෂ්පාදන සැලසුම් සහ පරිගණක වැඩසටහන් වැනි වෙනත් ආකාරයේ බුද්ධිමය දේපළ ඇතුළු මුල් නිර්මාණ කෘති සඳහා යෙදෙන යෙදුමකි. පොදු වසම තුළ පැවතීම යනු නිර්මාණ කෘතිය පරිශීලකයාට රිසි ඕනෑම අරමුණක් සඳහා භාවිත කළ හැකි බවයි. පොදු වසම අයිතම වනාහී තනි පුද්ගලයෙකුට අයත් දේපළ මෙන් නොව, සාමාන්‍යයෙන් ගත් කල සමාජයේ සාමූහික සංස්කෘතික උරුමයේ කොටසක් ලෙස සැලකේ.

(Public interest) **මහජන සුබසිද්ධිය :** පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක විශේෂ අවශ්‍යතාවලට ප්‍රතිවිරුද්ධව, සමස්තයක් ලෙස පොදු සුබසාධනය හෝ මහජනතාවට ප්‍රතිලාභ අත්කර දීම පිළිබඳ සංකල්පයයි. මහජන සුබසිද්ධිය ලෙස සැලකෙන්නේ මොනවාද යන්න පිළිබඳ පොදු එකඟතාවයක් නොමැති නමුත් මෙම පදය මගින් පිළිබිඹු වන්නේ කෙනෙකුගේ තරාතිරම හෝ තනතුර අදාළ නොවන ඇතැම් අවශ්‍යතා සෑම කෙනෙකුටම වන බවත්, ඒවා ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග අවශ්‍ය වන බවත්ය. පොදු සුබසිද්ධිය සඳහා උදාහරණ ලෙස දූෂණ හෙළිදරව් කිරීම, දරුවන් ආරක්ෂා කිරීම සහ දේශගුණික විපර්යාසවලට එරෙහිව සටන් කිරීම දැක්විය හැකි ය.

(Public service ad) **මහජන සේවා වෙළෙඳ දැන්වීම:** නිෂ්පාදනයක් හෝ සන්නාමයකට වඩා මහජන සුබ සිද්ධිය පිළිබඳ යම් පැතිකඩක් කෙරෙහි අවධානය යොමු කරනු ලබන වෙළඳ දැන්වීම් වර්ගයකි.

Public service announcement) **මහජන සේවා නිවේදනය:** සමාජ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මහජනතාව තුළ දැනුවත්භාවය ඇති කරන්නා වූ සහ ඒ පිළිබඳ මහජන ආකල්ප සහ හැසිරීම් වෙනස් කරන්නා වූ, ගාස්තුවකින් තොරව නිෂ්පාදනය කර බෙදා හැරෙන මහජන සුබ සිද්ධිය සඳහා වූ සන්දේශයකි.

(Public service media) **මහජන සේවා මාධ්‍ය:** සමස්ත සමාජය නියෝජනය කරන සමතුලිත සහ විවිධ වැඩසටහන් සැපයීම මගින් මහජන සුබ සිද්ධිය සඳහා සහාය දැක්වීමේ කාර්යභාරයක් ඉටු කරනු ලැබීම බොහෝ විට අවශ්‍ය වන, මහජන අරමුදලින් යැපෙන මාධ්‍ය වේ.

(Public sphere) **පොදු අවකාශය:** සමාජයේ සාමාජිකයින්ට ප්‍රවෘත්ති, තොරතුරු සහ මත නිදහසේ හුවමාරු කර ගත හැකි පොදු අවකාශයක් පිළිබඳ සංකල්පය - සමානාත්මතාව සහ අන්තර්කරණය පදනම් කරගනිමින්, පොදු අවධානයට ලක්විය යුතු කරුණු පිළිබඳව පුද්ගලයන් එකිනෙකා හමු වී අදහස් හුවමාරු කර ගන්නා ස්ථානයකි. ජර්ගන් හබර්මාස් යනු පොදු අවකාශය තුළ වඩාත්ම බලපෑමක් ඇති කරන නූතන න්‍යායාචාර්යවරයෙකි .

(Racism) **ජාතිවාදය:** ජාතියක් හැඟවෙන සංඥාකාරක ලෙස සමාජය විසින් ගොඩනගන ලද ජානමය හෝ සංස්කෘතිකමය සාධක, මානව ගතිලක්ෂණ සහ ශක්‍යතාවල මූලික නිර්ණායකයක් වන බවටත්, වර්ගීකරණයකට ලක් වූ කණ්ඩායමක සහජ පහත් හෝ උසස් බව වාර්ගික වෙනස්කම් තුළින් ඇති කරවන බවටත් වන විශ්වාසය.

(Regulation) **නියාමනය:** රීති සහ සංග්‍රහ සංවර්ධනය කිරීම සහ බලාත්මක කිරීම මගින් ආයතනවල සහ ක්‍රියාකාරීන්ගේ හැසිරීම් පාලනය කිරීමට හෝ බලපෑම් කිරීමට දරන උත්සාහ පිළිබඳව මෙමගින් කියැවේ. ප්‍රජාතාන්ත්‍රිකව තීරණය කරන ලද ප්‍රතිපත්තිමය හා නෛතික රාමු අනුගමනය කරමින්, රජයන් මගින් මෙම නියාමන රෙගුලාසි පැනවීම වඩාත් සුදුසු වේ. සාධාරණ තරගකාරිත්වයට එදිරි ව වෙළෙඳ ඒකාධිකාරය පිළිබඳ රෙගුලාසි, එසේත් නැතහොත් පරාස වෙන් කිරීම, පෞද්ගලිකත්වය, ප්‍රකාශන හිමිකම් සහ වෛරී ප්‍රකාශ යනාදිය පිළිබඳ රෙගුලාසි මීට උදාහරණ වශයෙන් සැලකිය හැකි ය. අදාළ ආයතන විසින් සෘජුව ම සිදු කරනු ලබන නියාමනය ස්වයං-නියාමනය හෝ සමපදස්ථ-නියාමනය ලෙස හඳුන්වනු ලබන අතර, මහජන නියෝජිතයන්ද ඇතුළත් වන පුවත්පත් මණ්ඩල වැනි ආයතනවල ස්වාධීන ඇගයීමට හා ආකර්ෂණයට ඉඩ සලසනු පිණිස, සිවිල් සමාජය ද අයත් වන්නා වූ විධිවිධාන ඊට ඇතුළත් විය යුතු ය. ඩිජිටල් සන්නිවේදන සමාගම් අවකාශයේ සමකාර්ය ආයතනයක් වන්නේ ෆෙස්බුක් අධීක්ෂණ මණ්ඩලයයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධව සහභාගී වන පද්ධති "සහ-නියාමනය" යන යෙදුමෙන් සාමාන්‍යයෙන් අදහස් වේ (උදාහරණයක් ලෙස, සයිබර් ආරක්ෂණ ගැටලු, ත්‍රස්තවාදයට එරෙහි වීම සහ ළමා ආරක්ෂණය).

(Repository) **සුරක්ෂිතාගාරය:** දේවල් තැන්පත් කිරීම, ගබඩා කිරීම හෝ, බෙදා හැරීම හෝ ප්‍රවේශ වීම සඳහා ඉදිරිපත් කිරීම සඳහා වන ග්‍රාහකයක් හෝස්ථානයකි; බහුලව පවතින මූලාශ්‍රයක් හෝ සැපයුමකි; සුරක්ෂිතාගාරයක් යනු තොරතුරු ගබඩාවකි. එය භෞතික හෝ ඉලෙක්ට්‍රොනික විය හැකි ය (මින් දෙවැන්න සාමාන්‍යයෙන් ඩිජිටල් ස්වරූපයක් ගනියි).

(Representation) **නිරූපණය:** තථ්‍ය හා පෙළට පරිභාහිරව පවතින පුද්ගලයන්, ස්ථාන, සිද්ධි හෝ අදහස් යන දෑ වෙනුවෙන් පෙනී සිටීම සංකේතවත් කිරීම, විස්තර කිරීම හෝ නිරූපණය කිරීම නිර්මිත පෙළ මගින් සිදු කරන ක්‍රියාවලි වේ. එමගින් සැබෑ ස්ථාන, පුද්ගලයන්, සිද්ධි සහ අදහස් සහ අන්තර්ගතය අතර සම්බන්ධය ද එමගින් අදහස් කළ හැකිය.

(Revisionism and negationism) **ප්‍රතිසංස්කරණවාදය සහ නිෂේධනවාදය:** ප්‍රතිෂේධනවාදය (denialism) ලෙසද හඳුන්වනු ලබන ඓතිහාසික නිෂේධනවාදය යනු ඓතිහාසික වාර්තා අසත්‍යකරණය හෝ විකෘති කිරීමකි. ඓතිහාසික ප්‍රතිසංස්කරණවාදය යනු ඉතිහාසය පිළිබඳ නවතම සාක්ෂි සහිත, සාධාරණ විමර්ශනයට ලක් කළ ශාස්ත්‍රීය පුනර්-අර්ථකථන දක්වා විහිදෙන පුළුල් යෙදුමකි. ඉතිහාසය පිළිබඳ වැරදි සහගත සහ දේශපාලනික හෝ මතවාදාත්මක ලෙස අභිප්‍රේරිත "පුනර්-අර්ථකථන" නීත්‍යානුකූල කිරීමට ඓතිහාසික ප්‍රතිසංස්කරණවාදය උපක්‍රමශීලී වී ඇති බවට ඇතැම්හු තර්ක කරති. එසේ ගත් කල, ඓතිහාසික ප්‍රතිසංස්කරණවාදය යනු දේශපාලනික සහ මතවාදාත්මක හේතු මත ශාස්ත්‍රීය වශයෙන් ස්ථාපිත ඓතිහාසික කරුණු සචේතනිකව විකෘති කිරීමක් විය හැකි ය.

(Right to information) **තොරතුරු ලබාගැනීමේ අයිතිය:** ඉහත සඳහන් කර තිබෙන "තොරතුරු වෙත ප්‍රවේශය" අර්ථකථනය බලන්න

(Right to privacy) **පෞද්ගලිකත්වය සඳහා වන අයිතිය:** අනවසර පිවිසීම්වලින් නිදහස් වීම; තම පෞද්ගලික කාරණා සහ සබඳතා රහසිගතව තබා ගැනීම පුද්ගලයෙකු සතු ඇති අයිතිවාසිකමකි. සමකාලීන ලෝකයේ බොහෝ අවදානමට ලක්ව ඇති මෙම මූලික අයිතිවාසිකම, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 17 වැනි වගන්තියේ පහත පරිදි අර්ථ දක්වා ඇත: "කිසිදු පුද්ගලයකු සිය පෞද්ගලිකත්වය, පවුල, නිවස හෝ ලිපි හුවමාරුව සම්බන්ධයෙන් අත්තනෝමතික හෝ නීති විරෝධී ඇඟිලි ගැසීමකට හෝ, ඔහුගේ (sic) ගරුත්වයට සහ කීර්ති නාමයට එල්ල කරන නීති විරෝධී ප්‍රහාරයකට හෝ යටත් නොකළ යුතු ය.

(Self-censorship) **ස්වයං-වාරණය:** ස්වයං-වාරණය යනු තමන්ගේ ම කතිකාවක් යටපත් කිරීමට තීරණය කිරීමේ ක්‍රියාවයි. අන් අයගේ සංවේද්‍යතා හෝ අභිරුචි (සැබෑ හෝ සංජානිත) කෙරෙහි දක්වන බිය හෝ ගරුත්වය හේතුවෙන්, කිසියම් නිශ්චිත පාර්ශ්වයකින් හෝ අධිකාරී ආයතනයකින් සෘජු උපදෙසක් නොලබාව මෙය සිදු කරනු ලැබේ. බාහිර පාර්ශ්වයක නියෝගයක් මත යටපත් කරන විට මෙය වාරණයකි.

(Self-regulation) **ස්වයං-නියාමනය:** ඉහත සඳහන් කර ඇති "නියාමනය" සඳහා වන අර්ථකථනය බලන්න.

(Sexism) **ලිංගවාදය:** ලිංගිකත්වය මත පදනම් වූ අගතිය හෝ වෙනස් කොට සැලකීම, විශේෂයෙන් කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම - ලිංගිකත්වය මත පදනම් වූ සමාජ භූමිකාවල ඒකාකෘති පෝෂණය කරන හැසිරීම්, කොන්දේසි හෝ ආකල්ප

(Social and emotional literacy) **සමාජයීය හා භාවාත්මක සාක්ෂරතාව:** සමාජ-භාවාත්මක ඉගෙනුම යනු සමාජීය හා භාවාත්මක කුසලතා වර්ධනය කර භාවිත කිරීමේ ක්‍රියාවලියයි. ඒ වනාහී හැඟීම් සාර්ථකව හසුරුවා ගැනීම, ඉලක්ක තබා ගැනීම, තීරණ ගැනීම සහ අන් අය සමග සුහදව සිටීම සහ සානුකම්පිත බව ආදිය ඇතුළත් කුසලතා මාලාවයි. (SEL යන කෙටි යෙදුම සමාජ-භාවාත්මක ඉගෙනුම හෝ සමාජයීය හා භාවාත්මක සාක්ෂරතාව ලෙස ද හැඳින්වේ.)

(Social marketing) **සමාජයීය අලෙවිකරණය:** "සමාජ යහපත" සාක්ෂාත් කර ගැනීමේ මූලික අරමුණින් යුත් අලෙවිකරණය. නිදසුනක් වශයෙන්, මහජන සෞඛ්‍ය සන්දර්භය තුළ, පොදු සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම, දැනුවත්භාවය ඇති කිරීම සහ හැසිරීම්වල වෙනස්කම් ඇති කිරීමට සමාජ අලෙවිකරණය උත්සාහ කරයි.

(Social networking) **සමාජ ජාලකරණය:** පොදු රුචිකත්වයක් හෝ ක්‍රියාකාරකමක් වටා සිටින ජාලවල පුද්ගලයන් සමග ඇතිකරගන්නා මාර්ගගත සම්බන්ධතා. පුද්ගලයන් තමන් ගැන තොරතුරු සැපයෙන

චරිත සටහන් ප්‍රකාශයට පත් කිරීම සමාජ ජාල ක්‍රියාකාරකම්වලට ඇතුළත් වේ. Facebook, WeChat සහ VK ජනප්‍රිය සමාජ ජාලා සඳහා උදාහරණ වේ. සමාජ ජාල පරිශීලකයෝ බොහෝ දෙනෙක් තමන් අන්තර් ක්‍රියා කරන්නේ වෙනත් පරිශීලකයන් සමග බව සිතා සිටියද, යථාර්ථය නම් ඔවුන් අන්තර්ක්‍රියා කරනුයේ සමාජාලා වේදිකාව අයත් ආයතනය මගින් දියත් කෙරෙන වෙළෙඳ ප්‍රචාරණ සන්දේශ සහ දත්ත රැස් කිරීමේ ශිල්පීය ක්‍රම ඇතුළු, එම අස්ථිත්වයේ පරිරක්ෂණ හා ප්‍රමිතකරණ පද්ධති මෙන්ම අවශ්‍යතා සමග බවයි. අන්‍යාකාරයෙන් කියතොත්, "වේදිකාව" යනු මිනිසුන්ට රඟ දැක්විය හැකි නිශ්ක්‍රිය ව්‍යුහයක් නොවේ - එය එහි හිමිකරුවන්ගේ ව්‍යාපාරික ආකෘතිය සක්‍රීයව ඉටු කිරීම සඳහා නිර්මාණය කරනු ලදුව, මෙහෙයවනු ලබන්නකි

(STEM) **විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය:** STEM යනු විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය යන ක්ෂේත්‍ර ඒකාබද්ධ කරන ඉගෙනුම සහ සංවර්ධනය සඳහා වන ප්‍රවේශය හඳුන්වන කෙටි යෙදුමකි.ඔෑඑ හරහා සිසුනු ගැටලු නිරාකරණය ඇතුළු ප්‍රධාන කුසලතා වර්ධනය කර ගනිති.

(Target audience) **ඉලක්කගත ග්‍රාහක පිරිස:** වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආත්තිය, පන්තිය යනාදී පොදු ලක්ෂණ සමූහයක් මත පදනම්ව, පෙළ මගින් නිශ්චිතව ආමන්ත්‍රණය කර ඇති සහ, නිර්මාපකයා හෝ බෙදාහරින්නා විසින් ඒකරාශී කරගැනීමට බලාපොරොත්තු වන පුද්ගලයන් සමූහයක්

(Targeted advertising) **ඉලක්කගත වෙළෙඳ ප්‍රචාරණය:** වෙළෙඳ ප්‍රචාරකයා විසින් ප්‍රවර්ධනය කරනු ලබන භාණ්ඩය හෝ පුද්ගලයා මත පදනම්ව, යම් යම් ගතිලක්ෂණ සහිත ග්‍රාහක පිරිස් වෙත යොමු කරනු ලබන මාර්ගගත වෙළඳ ප්‍රචාරණ ඇතුළු වෙළඳ ප්‍රචාරණ ක්‍රමයකි. මෙමගින් එක් එක් පුද්ගලයා පිළිබඳ එකතු කර ඇති දහස් ගණනක් වූ දත්ත ලක්ෂ්‍ය මත පදනම් වූ ක්ෂුද්‍ර, ඉලක්කගත වෙළඳ ප්‍රචාරණයට ඉඩ සැලසී ඇති අතර, පුද්ගලයකු යමකට පෙළඹීමට ඇති නැඹුරුව එකී නිශ්චිත පුද්ගලයාටත් වඩා හොඳින් අවබෝධ කර ගැනීමේ විභවයක් මෙම ප්‍රචාරණ ක්‍රමයට ඇත. මේ සියල්ලටම වඩා වෙනස් වන්නේ සන්දර්භීය ප්‍රචාරණයයි. එහි දී වෙළෙඳ දැන්වීම් බෙදා හැරෙන්නේ පුද්ගලයාගේ විශේෂිත චරිත සටහනට (profile) අනුව නොව විශේෂිත අන්තර්ගතයට අදාළ වන පරිදි ය. පුද්ගලයන් ඉලක්ක කරගත් ප්‍රචාරණය දිනෙන් දින වඩ වඩාත් ස්වයංක්‍රීයකරණය වෙමින් පවතින අතර, ලබා දී විශේෂිත අන්තර්ගතයෙන් ස්වාධීන වූවක් ලෙස දිස්විය හැකි ය. අන්තර්ගත-අනවධානයෙන් යුත් ඇල්ගොරිතමීය මෙහෙයුම්වල සෘජු ප්‍රතිඵලයක් ලෙස, වෛරී ප්‍රකාශ හා ස්ත්‍රීවිරෝධී අන්තර්ගත සමග සම්බන්ධ වනු ඇතැයි සන්නාම ගණනාවක් දැඩි සැලකිලිමත් බවක් දක්වයි.

(Text) **පෙළ:** මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව තුළ, පෙළ යන්නෙන් ලිඛිතව පමණක් නොව, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය, චිත්‍රක සහ ක්‍රීඩා-සබැඳි මාධ්‍ය වශයෙන් ද පවතින මාධ්‍ය නිෂ්පාදනයේ තනි ප්‍රතිඵල අදහස් කෙරේ (උදා: රූපවාහිනී කථාංගයක්, මීම්, පොතක්, සඟරාවක හෝ පුවත්පතක නිකුතුවක්, බලපෑම්කරුවන්ගේ වීඩියෝ, වෙළඳ දැන්වීම් ආදිය).

(The Big 6 model of information processing) **දත්ත සැකසීමේ ප්‍රධාන මාදිලි 6:** Big 6 යනු සියලු වයස් කාණ්ඩවල පුද්ගලයන් විසින් තොරතුරු ගැටලුවක් විසඳනු ලබන ආකාරය පිළිබඳ සැකසුම් ආකෘතියකි. සැකසුම් ක්‍රියාවලිය විචාරශීලී චින්තන කුසලතා මත රඳා පවතින්නා වූ, තොරතුරු ගැටලු විසඳීමේ ක්‍රමානුකූල ප්‍රවේශයකි. 1. කාර්ය අර්ථ දැක්වීම 2. තොරතුරු සෙවීමේ උපායමාර්ග 3. නිශ්චයනය සහ ප්‍රවේශය 4. තොරතුරු භාවිතය 5 සංශ්ලේෂණය 6. ඇගයීම.

(User Generated Content (UGC)) **පරිශීලක විසින් ජනිත අන්තර්ගතය:** පාරිභෝගික විසින් ජනිත ලද මාධ්‍ය (CGM) සහ පරිශීලක විසින් නිර්මිත අන්තර්ගතය ලෙසද හැඳින්වෙන, පරිශීලක විසින් ජනිත අන්තර්ගත යනු ඩිජිටල් මාධ්‍යයේ පරිශීලකයන් විසින් සම්පාදනය කළ හැකි නානාවිධ වූ, ප්‍රසිද්ධියේ ලබා ගත හැකි මාධ්‍ය අන්තර්ගත වේ. එහෙයින් අන්තර්ගත පරිභෝජනය කරන්නෝ අන්තර්ගත සම්පාදනයේ ද නියැලෙන අතර එහි දී බොහෝ විට නිශ්චිත සදාචාරාත්මක ප්‍රමිතිවලට අනුව කටයුතු කිරීමක් සිදු නොවේ.

ඩිජිටල් සන්නිවේදන සමාගම්වල පරිරක්ෂණ ආකෘති මගින්, ඇතැම් පරිශීලක-විසින්-ජනිත අන්තර්ගතවලට ආරාධනා කිරීම, දරා සිටීම හෝ විස්තාරණය කිරීම සිදු කෙරෙන අතර, ඔවුන්ගේ ප්‍රමිතකරණ ක්‍රියාකාරකම් අන්තර්ගත සම්බන්ධ ඔවුන්ගේ ප්‍රතිපත්ති බලාත්මක කිරීමට උත්සාහ කරනු ඇත. මේ සඳහා විටෙක සාමාන්‍යයේ පරිශීලකයන්, සහතික කළ පරිශීලකයන් මෙන්ම ගෙවීම් පදනම යටතේ බාහිර තතු පිරික්සුම්කරුවන්ගේ සහාය ද, විවිධ මට්ටමේ සාර්ථකත්ව සමග ලබා ගනු ඇත.

(Virtual private network) **අතථ්‍ය පෞද්ගලික ජාලය:** අතථ්‍ය පෞද්ගලික ජාලයක් (VPN) මගින් පෞද්ගලික ජාලයක් පොදු ජාලයක් හරහා ව්‍යාප්ත කෙරෙන අතර, සිය පරිගණක උපාංග පෞද්ගලික ජාලයට සෘජුවම සම්බන්ධ වී ඇතිවාක් මෙන් හවුල් හෝ පොදු ජාල හරහා දත්ත යැවීමට සහ ලබා ගැනීමට එමගින් පරිශීලකයන්ට හැකියාව ලබා දෙයි. අවහිර කරන හා තෝරා බේරා ගන්නා ලද අන්තර්ගත මග හැර යාමට අතථ්‍ය පෞද්ගලික ජාලවලට හැකි නමුත්, එම ජාල භාවිත කිරීම මගින් වුවද සුපරික්ෂාවට යටත් වීමෙන් හෝ ආයතන විසින් සිය මංපෙත් සටහන් කරගැනීමෙන් ස්වයංක්‍රීයව මිදීමට පරිශීලකයන් හට නොහැකි ය.

(Visual learning) **දෘශ්‍ය ඉගෙනුම:** අනුරූප අවශෝෂණය කරගැනීම හෝ ආදර්ශන නැරඹීම පාදක කරගත් ඉගෙනුම් විලාසයකි

(Vlog) **විලොගය:** විලොගයක් යනු, යම් පුද්ගලයකු අන්තර්ජාලයේ නිතිපතා පළ කරන වීඩියෝ සමූහයකි. එමගින් තම අදහස් හෝ අත්දැකීම් පටිගත කිරීම හෝ විෂයයක් ගැන කතා කිරීම සිදු කරයි.

(Web 2.0) **වෙබ් 2.0:** අන්තර්ක්‍රියාකාරීත්වය සුසාධ්‍ය කරන සහ පරිශීලකයන්ට ඔවුන්ගේම මෘදුකාංග විශේෂාංග නිර්මාණය කිරීමට ඉඩ සලසන යෙදවුම්. වෙබ් 2.0 යෙදවුම් මගින් සහයෝගීතාවයේ සහ බෙදාගැනීමේ වැදගත්කම අවධාරණය කරනු ලැබේ.

(Website) **වෙබ් අඩවිය:** පොදු ඒකාකාර සම්පත් නිශ්චායකයක් (URL) සහිත වෙබ් පිටු, අනුරූප සහ දත්ත එකතුවක් (පහත ලෝක ව්‍යාප්ත ජාලය බලන්න).

(Wiki) **විකි:** සාමාන්‍යයෙන් එක් පුද්ගලයෙකුට වඩා වැඩි ගණනක් විසින් පවත්වාගෙන යනු ලබන, අන්තර්ගතය සම්බන්ධයෙන් පරිශීලකයන් සහයෝගීව කටයුතු කරගෙන යන වෙබ් අඩවියකි. බොහෝ විට මේවා අදහස් පළ කිරීම්, සිද්ධි පිළිබඳ විස්තර, ලේඛන ආදියද ඇතුළත් අන්තර් සම්බන්ධිත පිටු සහ අන්තර්ගත ගණනාවකින් සමන්විත වේ. එහි අන්තර්ගතය සාමාන්‍යයෙන් පරිශීලකයන් ගණනාවක් විසින් යාවත්කාලීන වන බැවින් හා වඩා වැඩි විවිධත්වයකින් යුත් ද්‍රව්‍ය ඊට බාගත කළ හැකි බැවින් එය බ්ලොගයකට වඩා වෙනස් වේ.

(Wikibook) **විකිබුක්:** විකිබුක්ස් (විකි මීඩියා නිදහස් පෙළපොත් ව්‍යාපෘතිය සහ විකි මීඩියා - පෙළ පොත් ලෙස ඉහත දී හැඳින්වුනු) යනු ඕනෑම කෙනෙකුට සංස්කරණය කළ හැකි, නොමිලේ පිවිසිය හැකි අන්තර්ගත, විද්‍යුත් පොත්, පෙළපොත් සහ විවරණ පෙළ නිර්මාණය කිරීම සඳහා විකි මීඩියා පදනම විසින් සත්කාරකත්වය දරන විකි-පාදක විකිමාධ්‍ය ව්‍යාපෘතියකි.

(World Wide Web) **ලෝක ව්‍යාප්ත ජාලය:** අන්තර්ජාලය ඔස්සේ ක්‍රියාත්මක වන, ප්‍රධාන කාර්ය තුනක් ඉටු කර දීම මගින් විශාල අන්තර්ගත පරිමාවක් ලබා ගැනීම සබල කරවන සේවාවකි. අධි පාඨ සංලක්ෂණ භාෂාව (HTML) හෙවත් ප්‍රකාශන ආකෘතියක්; එක් එක් තොරතුර සඳහා අනන්‍ය වූ ලිපිනයක් (පොදු ඒකාකාර සම්පත් නිශ්චායකය හෝ URL ලෙස හැඳින්වෙන); අධි පාඨ තැන්මාරු නියමාවලිය (http) හරහා තොරතුරු මාරු කර යැවීමේ මාධ්‍යයක් එම කාර්ය තුන අතරට ගැනේ.

ස්තුතිය

දෙවන සංස්කරණය

සමාලෝචකයන්

බර්නාඩ් කොම්බිස් (Bernard Combes), වැඩසටහන් විශේෂඥ, අධ්‍යාපන අංශය, තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය, යුනෙස්කෝ.

ඩැමියානෝ ජැම්පවුලී (Damiano Giampaoli), වැඩසටහන් විශේෂඥ, ස්ත්‍රී පුරුෂ සමානාත්මතා අංශය, යුනෙස්කෝ.

ඉසබෙල් ටමෝජ් (Isabel Tamoj), ආශ්‍රිත ව්‍යාපෘති නිලධාරියා, අධ්‍යාපන අංශය, ගෝලීය පුරවැසිභාවය සහ සාම අධ්‍යාපන අංශය, යුනෙස්කෝ.

ජොයිස් මොන්තේරෝ (Joyce Monteiro), සහකාර වැඩසටහන් විශේෂඥ, සමාජ සහ මානව විද්‍යාව, අන්තර් ආගමික සංවාදය, යුනෙස්කෝ.

කැරල් ෆ්‍රැකාපේන් (Karel Fracapane), වැඩසටහන් විශේෂඥ, අධ්‍යාපන අංශය, ගෝලීය පුරවැසිභාවය සහ සාම අධ්‍යාපන අංශය, යුනෙස්කෝ.

කි ලැන්ග් (KeLeng), වැඩසටහන් සම්බන්ධීකාරක, සංස්කෘතික අංශය, සංස්කෘතික ප්‍රතිපත්ති සහ සංවර්ධනය, යුනෙස්කෝ.

පීටර් වොලට්ස් (PeterWallets), ව්‍යාපෘති නිලධාරියා, අධ්‍යාපන අංශය, ගුරු අධ්‍යාපන අංශය, යුනෙස්කෝ.

දායක්වය සැපයූවන්:

ගුරුවරුන් සඳහා මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව පිළිබඳ ජාත්‍යන්තර උපදේශනාත්මක රැස්වීම, 2019 සැප්තැම්බර් 12-13

ඇල්බර්ට්.කේ.බ'ක්හෝස්ට් (AlbertK Boekhorst), පර්යේෂක, ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලය/ප්‍රෙටෝරියා විශ්වවිද්‍යාලය

ඇලෙක්සොන්ද්‍ර සයාද් (Alexandre Sayad), සම-සභාපති, යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්ධාන අන්තර්ජාතික මෙහෙයවීම් කමිටුව

ඇලිස් ලී (Alice Lee) මහාචාර්ය, හොංකොං බැප්ටිස්ට් විශ්වවිද්‍යාලය

ඇල්ටන් ග්‍රිස්ල් (Alton Grizzle), වැඩසටහන් විශේෂඥ, යුනෙස්කෝ

අරුල් සෙල්වන් (Arul Selvan), ආශ්‍රිත මහාචාර්ය, ජනමාධ්‍යවේදය හා නව මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ආයතනය, IGNOU

බෝග්දාන් ට්‍රිෆුනොවික් (Bogdan Trifunovic), සභාපති, සර්බියානු පුස්තකාල සංගමය

කැරොලින් විල්සන් (Carolyn Wilson), යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්ධාන අන්තර්ජාතික මෙහෙයවීමේ කමිටුවේ හිටපු සභාපති, මීඩියා ස්මාර්ට්ස් (කැනඩාව) හි කමිටු සාමාජික,

අපරදිග විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ මාධ්‍ය සාක්ෂරතාව සඳහා වූ සංවිධානයේ (ස්පාඤ්ඤය) අනුශාසක.

ඩැලිබෝර් ටොඩොරොවික් (Dalibor Todorovic), පරිගණක විද්‍යාව පිළිබඳ ගුරු, සර්බියාව

ඩිවීනා ෆ්‍රෞ-මයිග්ස් (Divina Frau-Meigs), මහාචාර්ය හා යුනෙස්කෝ සභාපති, පැරිස්3සෝබෝන් නුවෙල් විශ්වවිද්‍යාලය

ෆෙලිපෙ චිබාස් ඕර්තිස්(Felipe Chibas Ortiz), මහාචාර්ය, සාඕ පාඔලෝ විශ්වවිද්‍යාලය

ඊගොර් සිමික් (IgorSimic) චිත්‍රපට/පරිගණක ක්‍රීඩා කලාකරු, ඩෙමගොග් චිත්‍රාගාරය

ඉරීනා සිලව්ස්කායා(Irina Zhilavskaya), යුනෙස්කෝ ප්‍රධානී මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව හා පුරවැසියන් සඳහා මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ සභාපති, මොස්කව් අධ්‍යාපන රාජ්‍ය විශ්වවිද්‍යාලය

හෙසුස් ලෞ (Jesus Lau), අධ්‍යක්ෂ USBIVER පුස්තකාලය, වෙරාකෘසානා විශ්වවිද්‍යාලය, සහ සම-සභාපති යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා සන්ධාන අන්තර්ජාතික මෙහෙයවීමේ කමිටුව

කැතරිනා ඇලෙක්සික්(Katarina Aleksic), ප්‍රධානී අධ්‍යාපන තාක්ෂණවේද මධ්‍යස්ථානය, අධ්‍යාපන ගුණාත්මකභාවය හා ඇගයීම් ආයතනය

ලීසා සෙරේරෝ (Lisa Serero), අධ්‍යාපනික ව්‍යාපෘති කලමනාකරු, සාමය සඳහා කාටූන් ඇඳීම

මාෂා බශ්රි (Maha Bashri), මහාචාර්ය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය විශ්වවිද්‍යාලය

මාජා සරික් (Maja Zaric), ඒකක ප්‍රධානී මාධ්‍ය අධ්‍යයන අංශය, සංස්කෘතික කටයුතු හා මාධ්‍ය පිළිබඳ අමාත්‍යාංශය, සර්බියානු ජනරජය

මර්ජානා බ්‍රිකික් (Marjana Brkic), සර්බියාවේ විද්‍යාව ප්‍රවර්ධනය කිරීමේ මධ්‍යස්ථානය.

මවුනා බෙන්ස්ලිමාන් (Mouna Benslimane), ගුරුවරයා, තොරතුරු විද්‍යා පාසල.

ඔලුනිෆෙසි සුරාජ් (Olunifesi Suraj), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජන සන්නිවේදන දෙපාර්තමේන්තුව, ලාගෝස් විශ්වවිද්‍යාලය.

රේචල් ෆිෂර් (Rachel Fisher), පර්යේෂක සහ සම්බන්ධීකාරක, අප්‍රිකාව සඳහා තොරතුරු ආචාරධර්ම ජාලය, අනාගත අප්‍රිකානු ආයතනය, ප්‍රිටෝරියා විශ්වවිද්‍යාලය සහ සම සභාපති, තොරතුරු ආචාරධර්ම සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICIE).

රැමෝන් ටුවසෝන් (Ramon Tuazon), සභාපති, ආසියානු ජන මධ්‍ය ආයතනය සහ ආසියානු මාධ්‍ය තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ මහ ලේකම්, ආසියානු ජන මාධ්‍ය ආයතනය/ ආසියානු මාධ්‍ය තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය.

රොක්සානා මොර්ඩුකොවික්ස් (Roxana Morduchowicz), මාධ්‍ය සාක්ෂරතා වැඩසටහනේ හිටපු අධ්‍යක්ෂක, ආජන්ටිනාවේ අධ්‍යාපන අමාත්‍යාංශය.

සසා මිර්කෝවික් (Sasa Mirkovic), මාධ්‍ය හා සන්නිවේදන පීඨයේ මාධ්‍ය විශේෂඥ සහ කථිකාචාර්ය, සර්බියාව.

ටටියානා මුරොවානා (Tatyana Murovana), වැඩසටහන් විශේෂඥ, අධ්‍යාපනයේ තොරතුරු තාක්ෂණය සඳහා යුනෙස්කෝ ආයතනය.

වයලෙටා කෙක්මන් (Violeta Kecman), පස්වන බෙල්ග්‍රේඩ් උසස් පාසලේ භාෂා ගුරුවරයා, සර්බියාව.

වොලස් ගිහන්ජ් (Wallace Gichunge), අධ්‍යක්ෂ, කෙන්යාවේ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා මධ්‍යස්ථානය.

සූ ජින්ග් (Xu Jing), සහකාර ව්‍යාපෘති නිලධාරී, යුනෙස්කෝ

අරාබි රාජ්‍ය තුළ කලාපීය උපදේශනය, 2020 දෙසැම්බර් 8 සහ 10

අබ්දුල් හමීඩ් එන්ෆිසි (Abdel Hamid Nfissi), සභාපති, මාධ්‍ය සහ ජාත්‍යන්තර සාක්ෂරතාව පිළිබඳ ජාත්‍යන්තර සංසදය.

අබ්තර් දර්ස්බව් සිංග් (Abtar Darsbau Singh), මහාචාර්ය, හමඩන් බින් මොහොමඩ් ස්මාර්ට් විශ්වවිද්‍යාලය.

ඇල්ටන් ග්‍රිසල්(Alton Grizzle), වැඩසටහන් විශේෂඥ, යුනෙස්කෝ.

ඇනා පේජ් (Anna Page), ජ්‍යෙෂ්ඨ නිශ්පාදක, එක්සත් රාජධානියේ විවෘත විශ්වවිද්‍යාලය.

බාසු ඩර් කාහේ (Basu Der Kahe), මහාචාර්ය, මිහුවන් විශ්වවිද්‍යාලය.

බුෂ්රෝ බින්ටි අලි (Bushro binti Ali), ජේෂ්ඨ කථිකාචාර්ය, ගුරු අධ්‍යාපන ආයතනය.

කාතල් ඩි පාවෝ (Cathal de Paor), අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය පිළිබඳ අධ්‍යක්ෂ, මේරි ඉමැකියුලේට් විද්‍යාලය, ලිමරික් විශ්වවිද්‍යාලය.

කොනී ඉලේන් ජෝර්ජ් (Connie Elaine George), අධ්‍යාපන පරිපාලක, අධ්‍යාපන අමාත්‍යාංශය, බ්‍රිතාන්‍ය වර්ජින් දූපත්.

ඩැනිලෝ පඩීලා (Danilo Padilla), වැඩසටහන් විශේෂඥ, යුනෙස්කෝ.

ඩ්‍රිසියා එන්ෆිසි (Drissia Nfissi), මහාචාර්ය, මවුලේ ඉස්මයිල් මෙක්නස් විශ්වවිද්‍යාලය.

ඊනාස් අබුලිබ්දේ (Enas Abulibdeh), සහකාර මහාචාර්ය, අල් අයින් විශ්වවිද්‍යාලය.

ගේබ්‍රියෙල් එලහෙලි (Gabriel Elrhili), වැඩසටහන් විශේෂඥ, යුනෙස්කෝ.

ගිහාන් ඔස්මන් (Gihan Osman), උපදේශන සැලසුම් සහ තාක්ෂණය පිළිබඳ සහකාර මහාචාර්ය, කයිරෝහි ඇමෙරිකානු විශ්වවිද්‍යාලය.

නග්ලා එමරි (Naglaa Emary), ඊජිප්තුවේ බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලයේ උපදේශක සහ මාධ්‍ය විශේෂඥ.

රේමන් ආර්. ටුවසන් (RamonR.Tuazon), සභාපති, ආසියානු ජන මාධ්‍ය හා සන්නිවේදන ආයතනය.

ස්ටීව් එන්වෝකිඕචා (Steve Nwokeocha), විධායක අධ්‍යක්ෂ, අප්‍රිකානු ඉගැන්වීම් නියාමන අධිකාරීන්ගේ සම්මේලනය (AFTRA).

සුවාඩ් අල් ෆරායින් (Suad Al-Furrain), සහයක මහාචාර්ය, අධ්‍යාපන පීඨය කුවේට් විශ්වවිද්‍යාලය.

සුමයියා අබුහම්ඩී (Sumayyah Abuhamdieh), අධ්‍යාපන උපදේශක,ජෝදාන් විශ්වවිද්‍යාලය.

නැගෙනහිර අප්‍රිකාවේ කලාපීය උපදේශනය, 2020 මාර්තු 5

අබාස් එම්පිණ්ඩි (Abas Mpindi), ප්‍රධාන විධායක නිලධාරී, මාධ්‍ය අභියෝග මුලපිරීම.

අබ්දිරාහ්මන් මොආලින් ඇඩෝව් (Abdirahman Moallin Addow), අධ්‍යක්ෂක, ජාතික විදුලි සංදේශ ආයතනය, තැපැල් අමාත්‍යාංශය, විදුලි සංදේශ සහ තාක්ෂණය.

බෘස් විටලිස් (Bruce Vitalis) , විධායක අධ්‍යක්ෂක, මාධ්‍ය සාක්ෂරතාව සහ ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානය, (CEMCOD), උගන්ඩා.

ගන්ඩියා නරීනන් (Gundeea Narrainen), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සන්නිවේදන පාසල, මොරිෂස් විශ්වවිද්‍යාලය.

එලිෆස් බිසන්ඩ (Elifas Bissanda), යුනෙස්කෝහි උපකුලපති සහ සභාපති, ටැන්සානියාවේ ජාතික කොමිසන් සභා විවෘත විශ්වවිද්‍යාලය.

එමානුවෙල් මුන්යාරුකුම්බුසි (Emmanuel Munyarukumbuzi), සහකාර කථිකාචාර්ය, රුවන්ඩා විශ්වවිද්‍යාලය.

ෆාරා ජූඩිත් අයිසාක්ස් (Farah Judith Isaacs), වැඩසටහන් නිලධාරී, මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා ඉගෙනීමේ මූලපිරීම(මිලි) නැම්බියාව

හෙන්රි කබ්වේ (Henry Kabwe), විධායක අධ්‍යක්ෂක, ළමා අයිතිවාසිකම් පිළිබඳ මාධ්‍ය ජාලය, සැම්බියාව.

ජොහාන් ඔලූච් (John Oluoch), පීඨාධිපති, තොරතුරු හා සන්නිවේදන පාසල, රොන්ගෝ විශ්වවිද්‍යාලය, කෙන්යාව.

ජොහාන් ඔකන්දේ (John Okande), ජාතික වැඩසටහන් නිලධාරී, යුනෙස්කෝ.

කාරා චැප්ලේයින් (Kara Chaplain), නියෝජ්‍ය පීඨාධිපති, ජනමාධ්‍ය හා සන්නිවේදන දෙපාර්තමේන්තුව, ජූබා විශ්වවිද්‍යාලය, දකුණු සූඩානය.

ලෙවි ඔබෝනියෝ (Levi Obonyo), පීඨාධිපති, ජනමාධ්‍ය පාසල, ඩෙස්ටාර් විශ්වවිද්‍යාලය.

මෙනෙකල් මෙසෙරෙඩ් අබීබ් (Menychle Meseret Abebe), මාධ්‍ය විශේෂඥ, පර්යේෂක සහ දේශක, පුවත්පත් හා සන්නිවේදන දෙපාර්තමේන්තුව, ගොන්දර් විශ්වවිද්‍යාලය, ඉතියෝපියාව.

මීරියම් ගර්කි (Mirjam Gehrke), වැඩසටහන් අධ්‍යක්ෂ, දේශීය සම්බන්ධීකාරක, DW උගන්ඩාව.

ඔලුනිෆෙසි සුරාජ් (Olunifesi Suraj), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජන සන්නිවේදන දෙපාර්තමේන්තුව, ලාගෝස් විශ්වවිද්‍යාලය, නයිජීරියා.

ප්‍රොසී කවාලා (Prossy Kawala), විධායක අධ්‍යක්ෂ, මාධ්‍ය සාක්ෂරතාවය සහ ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානය (CEMCOD), උගන්ඩා.

රේචල් ෆිෂර් (Rachel Fischer) , පර්යේෂක සහ සම්බන්ධීකාරක, අප්‍රිකාව සඳහා තොරතුරු ආචාරධර්ම (IEN4A), අනාගත අප්‍රිකා ආයතනය, ප්‍රෙටෝරියා විශ්වවිද්‍යාලය සහ සම සභාපති, තොරතුරු ආචාරධර්ම සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICIE).

රෙබෙකා රියාකිටිම්බෝ (Rebecca Ryakitimbo), දේශීය සම්බන්ධීකාරක, ඩිජිටල් ග්‍රාස්රූට්, ටැන්සානියාව.

තෝමස් සිතෝල් (Thomas Sithole), මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව සඳහා සිම්බාබ්වේ මධ්‍යස්ථානය සම -නිර්මාතෘ සහ විධායක අධ්‍යක්ෂ.

විටාලිස් බෘස් සිරාබා (Vitalis Bruce Ziraba) , විධායක අධ්‍යක්ෂ, මාධ්‍ය සාක්ෂරතාව සහ ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානය (CEMCOD)

වොලස් ගිචුන්ජ්(Wallace Gichunge), විධායක අධ්‍යක්ෂක, කෙන්යාවේ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා මධ්‍යස්ථානය.

විලියම් තයේබ්වා(William Tayebwa) ප්‍රධානී, මාධ්‍යවේදය සහ සන්නිවේදන අංශය, මැකේරේ විශ්වවිද්‍යාලය, උගන්ඩාව.

ලතින් ඇමරිකාවේ කලාපීය උපදේශනය,2020 ජූනි 29-30

ඇන්ටෝනියෝ ග්‍රිජාල්වා ඒබල් වර්ඩුගෝ (Antonio Grijalva Abel Verdugo), පීඨ සාමාජික, සමාජ සහ මානව විද්‍යා දෙපාර්තමේන්තුව, යුනිවසිඩඩ් ද ඕක්සිඩන්ටේ.

ඇබිගේල් කැස්ට්‍රෝ ද පරෙස් (AbigailCastro de Pérez), එල් සැල්වදෝරයේ හිටපු අධ්‍යාපන ඇමති.

ඇඩෙලේඩා ට්‍රූජිලෝ (AdelaidaTrujillo), සිනමාකරු.

ඇලෙක්සෝන්ද්‍ර බියන්කිනි ඩු ඇමරල් (Alexandre Bianquini do Amaral), මාධ්‍යවේදී සහ චිත්‍රපට අධ්‍යක්ෂ, සාඕ පවුලෝ විශ්වවිද්‍යාලය.

ඇලෙක්සැන්ඩ්‍රි ෆර්නැන්ඩස් බාබෝසා (Alexandre Fernandes Barbosa), ප්‍රධානියා, තොරතුරු සමාජයේ සංවර්ධනය පිළිබඳ අධ්‍යයන සඳහා කලාපීය මධ්‍යස්ථානය.

ඇලෙක්සෙන්ඩර් සෙයාඩ් ලී වොචී (Alexandre Sayad Le Voci), ප්‍රධාන විධායක නිලධාරි, යුගවාදී සහ ජාත්‍යන්තර මෙහෙයවීමේ සම සභාපති යුනෙස්කෝ MIL සන්ධානය සඳහා කමිටුව.

ඇනා මරියා රොඩිනෝ (Ana Maria Rodino), මානව හිමිකම් අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර උපදේශක

ඇනාබෙලා සෙරිග්නීස් (Anabella Serignese), අධ්‍යක්ෂක, කොන්සියන්සියා සංගමය.

ඒන්ජල් මාර්ටින් පෙක්සිස් (Angel Martin Peccis), අධ්‍යක්ෂක, ඉබෝරෝඇමරිකන් රාජ්‍ය සංවිධානය (OEI)

කැමිලා මුනොස් චුරුකා (Camila Munoz Churruca), ගුරුවරුන්ගේ ව්‍යාපෘතිය සඳහා ඩිජිටල් පුස්තකාලයේ උපදේශක,සන්තියාගෝ විශ්වවිද්‍යාලය.

කැමිලා පොන්ස් (Camila Ponce), අධ්‍යක්ෂ, ඇමෙරිකා සොලිඩරිය.

කාලෝස් ස්ටාෆ් (Carlos Staff), මහ ලේඛම්, CECC-SICA, පැනමාවේ හිටපු අධ්‍යාපන ඇමති.

කාලෝස් වාර්ගස් ටැමෙස් (Carlos Vargas Tamez), ලතින් ඇමෙරිකාවේ සහ කැරිබියානු අධ්‍යාපනය සඳහා යුනෙස්කෝ කලාපීය කාර්යාංශය.

කැරොලිනා කැසාස් (Carolina Casas), ප්‍රාදේශීය අධ්‍යක්ෂ, සෙසමි වීදිය.

සෙසිලියා මාර්ටින්ස් (Cecilia Martins), අධ්‍යාපනය පිළිබඳ අන්තර් ඇමෙරිකානු කමිටුවේ සම්බන්ධීකාරක.

ක්ලෝඩියා ඩුල්සෙ රොමෙරෝ (Claudia Dulce Romero), යුනෙස්කෝ අධ්‍යාපනයේ සහ සාමයේ සංස්කෘතියේ සභාපති.

ක්ලෝඩියා ටෝබර් (Claudia Tobar), තාක්ෂණ හා ඉගෙනුම් ආයතනයේ අධ්‍යක්ෂ, යුනිවර්සඩැඩ් සැන් ෆ්‍රැන්සිස්කෝ ද කීටෝ.

කරීනා ග්‍රේස් (Corrina Grace), විධායක අධ්‍යක්ෂක, SERES සංගමය.

ඩැනියෙලා සලාකෝ (Daniela Zallocco), යුනෙස්කෝ ASP නෙට් ජාතික සම්බන්ධීකාරක.

එඩ්ගාර් මයස්ට්‍රි සියෙරා (Edgar Maestre Sierra), ලතින් ඇමෙරිකාව සඳහා වැඩටහන් අධ්‍යක්ෂන, තරුණ ඇමෙරිකානු ව්‍යාපාර භාරය.

එඩිසන් ලාන්සා (Edison Lanza), අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා හිටපු විශේෂ වාර්ථාකරු, මානව හිමිකම් පිළිබඳ අන්තර් - ඇමෙරිකානු කොමිසම.

එඩුවාඩෝගොන්සාලේස්සා (Eduardo González Saá), විධායකඅධ්‍යක්ෂක, අධ්‍යාපනිකපර්යේෂණ සහ ක්‍රියාව සඳහා බොලිවියානු මධ්‍යස්ථානය.

එමීලියෝ ගාර්සියා (Emilio Garcia Mendez), දරුවන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ විශේෂඥයෙක්.

අර්නස්ටෝ රෙනා අල්කන්ටරා (Ernesto Reyna Alcántara) විධායක උප සභාපති, දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික සභාව.

එස්තර් හැම්බර්ගර් (Esther Hamburger), මහාචාර්ය, සාඕ පවුලෝ විශ්වවිද්‍යාලය.

එස්තර් කුයිෂ් ලරෝච් (Esther Kuisch-Laroche), අධ්‍යක්ෂ, සැන් ජෝස්හි යුනෙස්කෝ කාර්යාලය.

ෆකුන්ඩෝ ගල්වැන් (Facundo Galván), GCED සහ ගුරු වෘත්තීය සංවර්ධනය පිළිබඳ විශේෂඥ, SERES සංගමය.

ෆෙලීපී චිබස් ඔටිස් (Felipe Chibás Ortiz), සහකාර මහාචාර්ය, සාඕ පවුලෝ විශ්වවිද්‍යාලය.

ෆලීසා ටිබිට්ස් (Felisa Tibbits), දේශපාලන විද්‍යාඥ, මහාචාර්ය, හිටපු මැතිවරණ අධ්‍යාපන අධ්‍යක්ෂ,ආර්ජන්ටිනාවේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය.

ගාබ්‍රියෙල් මාර්ටිනී (Gabriela Martini), දේශපාලන විද්‍යාඥ, ආර්ජන්ටිනාවේ විවිධ විශ්වවිද්‍යාලවල මහචාර්ය,ආර්ජන්ටිනාවේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ හිටපු මැතිවරණ අධ්‍යාපන අධ්‍යක්ෂ.

ගිල්සන් ෂවර්ට්ස් (Gilson Schwartz), සහකාර මහාචාර්ය, සාඕ පවුලෝ විශ්වවිද්‍යාලය.

ග්ලෙන්ඩා මරිසෙල් සුලු පෙරෙස් (Glenda Marisol Xulu Perez), ගුරුවරයා, SERES සංගමය.

ගිලෙමෝ ඔරොස්කෝ ගෝමස් (Guillermo Orozco Gómez), මහාචාර්ය, ග්වාඩලජාරා විශ්වවිද්‍යාලය

හෙන්රි ඇරියස් ගයිඩෝ (Henry Arias Guido), තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපන උපදේශක, ජාත්‍යන්තර කටයුතු සහ සහයෝගීතා කාර්යාලය, කොස්ටාරිකා රාජ්‍ය අධ්‍යාපන අමාත්‍යාංශය.

ඉස්මාර් ඔලිවේරා සෝරෙස් (Ismar Oliveira Soares), සන්නිවේදනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සන්නිවේදන හා කලා පාසල, සාඕ පවුලෝ විශ්වවිද්‍යාලය.

ජැමියන් නයිට් (Jamion Knight), ආශ්‍රිත වැඩසටහන් විශේෂඥ, යුනෙස්කෝ.

ජීසස් ලෝ (Jesus Lau), USBIVER පුස්තකාලයේ අධ්‍යක්ෂක, වෙරෙක්රුසානා විශ්වවිද්‍යාලය සහ යුනෙස්කෝ එම්බ සන්ධානය සඳහා වන ජාත්‍යන්තර මෙහෙයුම් කමිටුවේ සම සභාපති.

ජොසේ ෆර්නැන්ඩෝ මෙජියා (Jose Fernando Mejia), GCED අධ්‍යක්ෂ, කන්වෙන්සියා ප්‍රඩක්ට්වා.

කර්ස්ටින් ෆෝස්බර්ග් (Kerstin Forsberg), අධ්‍යක්ෂක, ප්ලැටිනා ඕෂනා පෙරු.

ලෝරා එංගල් (Laura Engel), GCED හි යුනෙස්කෝ සභාපති, ජෝර්ජ් වොෂින්ටන් විශ්වවිද්‍යාලය.

ලුයීසා වෙලිගස් (Luisa Villegas), අධ්‍යාපන විශේෂඥ, ඇමෙරිකානු ජනපද ගොඩැඟීමේ ඇමෙරිකානු සංවර්ධන පදනමේ සංවිධානය.

මැනුවෙල් සලමන්කා රේන්ජල් (Manuel Salamanca Rangel), අධ්‍යක්ෂ, ඉන්ස්ටිටියුඩෝ දෙ ඩෙරෙචෝස් හියුමානෝස් ඇල්ෆ්‍රෙයිඩෝ වෑස්කවුස් කැරිසෝසා.

මර්චලා බ්‍රවුන් (Marcela Browne), සහයෝගීතා සම්බන්ධීකාරක, SES අරමුදල.

මර්සියෝ ග්ඒරා මොරීම් (Marcio Guerra Amorim), අධ්‍යයන සහ අනාගත ඒකකයේ විධායක කළමනාකරු, ජාතික කර්මාන්ත සම්මේලනය.

මරියා සොල්ඩඩ් බොස් (Maria Soledad Bos), අධ්‍යාපන විශේෂඥ, අන්තර් - ඇමරිකානු සංවර්ධන බැංකුව.

මිරියන් විලේලා (Mirian Vilela), විධායක අධ්‍යක්ෂ, අර්ත් චාටර් ජාත්‍යන්තර ලේකම් කාර්යාලය.

මොන්කා රෙයිනෝසෝ (Monica Reinoso), හිටපු උප ඇමති, අධ්‍යාපන කළමනාකරණය.

නසීරා රේමියා (Nascira Ramia), අධ්‍යාපන සම්බන්ධීකාරක, යුනිවර්සයිඩඩ් සැන් ෆ්‍රැන්සිස්කෝ ද කීටෝ.

ඕලන්ඩෝ සීන්ස් (Orlando Sáenz), සම්බන්ධීකාරක, ARIUS සන්දානය.

රොබර්ටෝ බෙල්ට්‍රන් (Roberto Beltrán), යුනෙස්කෝ අධ්‍යාපන හා සාමයේ සංස්කෘතියේ සභාපති.

රෝසා කැම්පුසානෝ (Rosa Campusano), විධායක අධ්‍යක්ෂ, ඩොමිනිකන් ජනරජයේ ජාතික ගුරු පුහුණු ආයතනය.

රොක්සානා මෝර්ඩුකොවික්ස් (Roxana Morduchowicz), මාධ්‍ය සාක්ෂරතා වැඩසටහනේ හිටපු අධ්‍යක්ෂ, ආර්ජන්ටිනාවේ අධ්‍යාපන අමාත්‍යාංශය.

සාරා ජරමිලෝ (Sara Jaramillo), ඉක්වදෝර් ජාතික කාර්යාලයේ අධ්‍යක්ෂ, ඉබෙරෝ ඇමෙරිකන් සංවිධානය.

සිල්වියා බැචර් (Silvia Bacher), සභාපති, ලාස් ඔට්‍රාස් වෝකස්.

සොලීඩඩ් මීනා (Soledad Mena) , ගුරුවරයා, යුනිවසර්ඩාඩ් ඇන්ඩිනා සයිමන් බොලිවර්.

ටයිස් ගඩේ ලාරා (Tais Gadea Lara), මාධ්‍යවේදී, කනෙක්සියන් කොරල්.

තෝමස් ඩ්‍රාන් බෙසේරා (TomasDurán-Becerra), ජාතික පර්යේෂණ අධ්‍යක්ෂක, ජාතික ඒකාබද්ධ සංස්ථාව ජාතික අධ්‍යාපනය

විකී කොල්බට් (VickyColbert), අධ්‍යක්ෂක, එස්ක්වෙලා නුවා පදනම.

බටහිර අප්‍රිකාවේ කලාපීය උපදේශනය, 2020 ජූලි 7

අබුබකර් අලි කෝරේ (Aboubakar Ali Kore), සාමාන්‍ය අධ්‍යක්ෂ , ජාතික විෂයමාලා අධ්‍යක්ෂක.

අකෝරා මාසා යූමැනිගුයි (Akore Massa Zoumanigui), සාමාන්‍ය අධ්‍යක්ෂක, ගිනියාවේ උසස් අධ්‍යාපන විද්‍යා ආයතනය (ISSEG).

අලාන් සෙසූ (Alain Sessou), අධ්‍යක්ෂක, මේසාන් දෙ මේඩියස්.

එමිවි ක්‍රා කොම්ලන් (Amivi Cra Komlan), පුහුණු අධ්‍යක්ෂක, ප්‍රාථමික ද්විතීය අධ්‍යාපන සහ ටෝගෝ සාක්ෂරතා අමාත්‍යාංශය.

බයෙකෝකොව් එසහානම් (BiyaoKokou Essohanam), පුහුණු අධ්‍යක්ෂක, ප්‍රාථමික ද්විතීය අධ්‍යාපන අමාත්‍යාංශය.(MEPS).

කැමිල් බුලබුලා (Camille Bulabula), සන්නිවේදන සහ තොරතුරු කාර්යාලයේ ප්‍රධානී, ප්‍රාථමික, ද්විතීය සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

සිරිල් ගුවෙල් (Cyrille Guel), ආරම්භක සභාපති සහ විශේෂඥ, එඩියුකමියුනික්ඇෆ්රික්

එල්විස් මයිකල් කෙන්මෝ (Elvis Michel Kenmoe), සන්නිවේදන සහ තොරතුරු උපදේශක, යුනෙස්කෝ.

එමිල් පියෙර් බාස්යෝමෝ (Emile-Pierre Bazyomo), ගුරුවරයා සහ පර්යේෂක, මහජන ප්‍රතිපත්ති නිරීක්ෂණාගාරය අප්‍රිකාවේ මාධ්‍ය සහ ඩිජිටල් අධ්‍යාපනය (OPENEMA)

එමානුඑල් එඩිමා එනී ගුසාන් (Emmanuel Edima N’Guessan), සභාපති, ජාතික තරුණසේවා සභාව.

එටියෙන් ඩමෝම් (Etienne Damome), කථිකාචාර්ය, බෝඩෝ - මොන්ටේන් විශ්වවිද්‍යාලය

එවරිස්ටේ හෝඩෝනු (Evariste Hodonou), සභාපති, CNPA-BENIN

ෆ්‍රැන්සිස් බැබී (Francis Babbey), අප්‍රිකාවේ මාධ්‍ය සහ ඩිජිටල් අධ්‍යාපනය පිළිබඳ මහජන ප්‍රතිපත්ති නිරීක්ෂණාගාරය (OPENEMA)

ජෝර්ජස් මඩිබා (Georges Madiba), ගුරුවරයා සහ පර්යේෂක, සමාජ හා මාධ්‍ය සන්නිවේදන හා සන්නිවේදන දෙපාර්තමේන්තුවේ රසායනාගාරය, ලිපි සහ මානව පීඨය, ඩුවාලා විශ්වවිද්‍යාලය.

ජෙරල්ඩින් අපෝ යනොන් (Géraldine Apo Yanon), විශේෂඥ සහ පර්යේෂක.

පීමේන් ගොන්සාලෝ (Germain Gonzalo), අධ්‍යක්ෂක, පොටෝ නෝවෝ ගුරු අභ්‍යාස විද්‍යාලය

(භාෂා, නූතන සාහිත්‍ය, ඉතිහාසය - භූගෝල විද්‍යාව සහ දර්ශනය)

ඊබ්‍රාහිම් හරූනා (Ibrahim Harouna), අධ්‍යක්ෂක, මේසාන් ඩි ලා ප්‍රෙස්

ඊබ්‍රාහිමා සාර් (Ibrahima Sarr), සහකාර, CESTI/CODESRIA

ඉස්මාලා කැමරා (Ismaila Camara), සභාපති, ෂඞ්ඔ මාධ්‍යවේදීන්ගේ ජාලය (සෘෂධඔෂක).

ජීන් ක්ලූඩ් බයෝනෝ (Jean Claude Bationo), සාමාන්‍ය අධ්‍යක්ෂක, කුඩුගු උසස් පාසල (ෑහී/ඕණ).

ජීන් ක්ලූඩ් කුලිබේ (Jean-Claude Coulibay), විධායක මණ්ඩලයේ සභාපති, කෝට් ඩි අයිවෝර්හි මාධ්‍යවේදීන්ගේ ජාතික සංගමය (UNJCI).

කේට් අඩූ අඩූකු (Kate Adoo-Adeku), විධායක කමිටුවේ සභාපති, අප්‍රිකාවේ සංවර්ධනය සඳහා මාධ්‍ය සහ අධ්‍යාපනය පිළිබඳ සභාග සංසදය (CAFOR).

කඩීන් ඩිඕප් (Kadihm Diop),සභාපති, ජාතික තරුණසේවා සභාව.

ලියොන්සේ ගමනි (Leonce Gamai), සාමාන්‍යාධිකාරි, BANOTOU (අන්තර්ජාල මාධ්‍ය)

මයිදාජි මහමදු (Maidaji Mahamadou) , සාමාන්‍ය අධ්‍යක්ෂක, ද්විතියික අධ්‍යාපන අමාත්‍යාංශය.

මැමඩූ කොනේ (Mamadou Kone) මූලික ගොඩනැඟීමේ අධ්‍යක්ෂක, එකෝලේ නොමලේ සුපීරිය අබිජාන්.

එල්විස් මිචෙල් කෙන්මෝ (Elvis Michel Kenmoe), සන්නිවේදන සහ තොරතුරු සඳහා උපදේශක, යුනෙස්කෝ.

නොඑල් බැගිඩි (Noël Gbaguidi), සභාපති, ජාතික අධ්‍යාපන සභාව.

පියරේ චානු (Pierre Chanou), අධ්‍යක්ෂ, අධ්‍යාපනය පිළිබඳ ජාතික පුහුණු හා පර්යේෂණ ආයතනය (INFRE)

රොජර් කබෝර් (Roger Kabore), අධ්‍යක්ෂක ජනරාල්, ප්‍රාථමික ගුරු පුහුණු පාසල (ENEP) ද බෝබෝ ඩයලසෝ.

රොමෙයින් රාසා සිඩුම්බා (Romaine Ra"ssa 'idouemba), සම්බන්ධීකාරක, මාධ්‍යවේදීන්ගේ මුල පිරීම් ජාලය.

සල්සාබෝ ඩිමොග්නා (Salzabo Dimougna), සන්නිවේදන කළමනාකරු, චැඩ් ජාතික තරුණසේවා සභාව.

සොන්මා ලමෝවිනි (Sounma"la Moumouni), අධ්‍යක්ෂක, ඉකෝල් නෝර්මල් සුපීරියර් නටයිටින්ගෝ

වැලි සිදිබ් (Valy Sidibé), සාමාන්‍ය අධ්‍යක්ෂක, අබිජාන් උසස් පාසල

විනෝද් සීගම් (Vinod Seegum), සභාපති, රජයේ ගුරු සංගමය (GTU).

යඕවි යකුවේ (Yaovi Ekoue), අධ්‍යක්ෂක, නොට්සේ ගුරු අභ්‍යාස විද්‍යාලය.

සැකියත් ලැටොන්ජි (Zakiath Latondji), සභාපති, බෙනින් මාධ්‍ය වෘත්තිකයන්ගේ සංගමය (UPMB).

සාරා බෙකින් ගාඕ (Zara Bakingue Gaoh) පුහුණු අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන, සාක්ෂරතා අමාත්‍යංශය, ජාතික භාෂා සහ සිවිල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

කැරිබියානු කලාපය තුළ කලාපීය උපදේශන, 2020 ජූලි 30

අලෙක්සොන්ද්‍ර ලෙ වොචි සයාඩ් (Alexandre Le Voci Sayad), CEO, සයිගෙස්ට් සහ යුනෙස්කෝ MIL සන්දානය සඳහා වන ජාත්‍යන්තර මෙහෙයුම් කමිටුවේ සම සභාපති.

ඇන්තියා හෙන්ඩසන් (Anthea Henderson), කථිකාචාර්ය, කැරිබියන් මාධ්‍ය හා සන්නිවේදන පාසල (CARIMAC).

අසීෆ් ඩොවර් (Asif Dover), සාක්ෂරතාව පිළිබඳ අධ්‍යාපන නිලධාරී, ශාන්ත වින්සන්ට් අධ්‍යාපන අමාත්‍යාංශය

කැතරිනා ශෝන්හැමර් (Catherina Schönhammer), මහජන තොරතුරු නිලධාරී, යුනෙස්කෝ.

චාලින් ජේම්ස් (Charlene James), වැඩසටහන් සහකාර යුනෙස්කෝ.

ශෙරිල් බනර්බේ බිෂොප් (Cheryl Bernabe Bishop), විෂය මාලා ප්‍රධානී, අධ්‍යාපන අමාත්‍යාංශය, මානව සම්පත් සංවර්ධන සහ ආගමික කටයුතු, ග්‍රෙනාඩා.

කෝඩෙල් ග්‍රීන් (Cordel Green), විධායක අධ්‍යක්ෂ, ජැමෙයිකාවේ විකාශන කොමිෂන් සභාව.

ඩේසි සෙන්ට් රෝස් (Daisy St. Rose), පුස්තකාලාධිපති, බටහිර ඉන්දීය කොදෙව් විවෘත විශ්වවිද්‍යාලය.

ඩේවිඩ් ජෙන්කින්ස් (David Jenkins), තොරතුරු තාක්ෂණ සහකාර, යුනෙස්කෝ.

ඩෝකේස් ආර්. බොව්ලර් (Dorcas R. Bowler), පුස්තකාල අධ්‍යක්ෂ, ජාතික පුස්තකාලය සහ තොරතුරු සේවා, බහමාස් අධ්‍යාපන අමාත්‍යාංශය.

එවර්ටන් හැනම් (Everton Hannam), ජැමෙයිකාවේ යුනෙස්කෝ ජාතික කොමිසම

ෆර්යාල් ඛාන් (Faryal Khan), වැඩසටහන් විශේෂඥ, යුනෙස්කෝ

ජෝර්ජියෑන් අද්‍රියානා-හෙන්රිකේස් (Georgiane Adriana - Henriquez), පොදු අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ පාසල් පුහුණුකරු, පොදු අධ්‍යාපන පාසල්

ඉන්ග්‍රිඩ් පර්ට් විල්මට් (Ingrid Peart-Wilmot), ප්‍රධාන උපදේශක නිලධාරී, ජැමෙයිකාවේ ඉගැන්වීම් කවුන්සිලය.

ඉසබෙල් වේරා බර්මුඩෙස් (Isabel Viera Bermudez), සන්නිවේදන සහ තොරතුරු උපදේශක, යුනෙස්කෝ.

ජෝන් මැක්ඩර්මොට් (Joan McDermott), පුස්තකාලාධිපති, ෂෝට්වුඩ් ගුරු විද්‍යාලය.

කැතරින් ග්‍රිගිස්බි (Katherine Grigsby), අධ්‍යක්ෂ සහ නියෝජිත, කැරිබියන් සඳහා යුනෙස්කෝ කිංග්ස්ටන් කාර්යාල සමූහය

කැතී මැක් ඩියාමිඩ් (Kathy Mc Diarmed), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති, හන්ටර් ජේ ෆ්‍රොන්සුවා පුස්තකාලය.

කිරන් මහරාජ් (Kiran Maharaj), සභාපති, කැරිබියන් මාධ්‍ය ආයතනය.

ලැටෝයා ස්වාබී ඇන්ඩර්සන් (Latoya Swaby-Anderson), ජාතික නිලධාරී, යුනෙස්කෝ.

මර්සිලියා හෙන්රි (Marcellia Henry), මහලේකම්, යුනෙස්කෝ සඳහා සින්ට් මාර්ටින් ජාතික කොමිසම.

මර්වා සී. බ්‍රවුන් (Marva C' Browne), මහලේකම්, යුනෙස්කෝ සඳහා කුරකාවෝ ජාතික කොමිසම.

නුරිස්කා ඉවර්ට්ස් (Nurizcka Everft), අධ්‍යාපන, විද්‍යා, සංස්කෘතික සහ ක්‍රීඩා අමාත්‍යාංශය.

පෝලෙත් ස්ටුවර්ට් (Paulette Stewart), ප්‍රධානීන්, පුස්තකාල සහ තොරතුරු අධ්‍යයන දෙපාර්තමේන්තුව, බටහිර ඉන්දීය කොදෙව් මොනා විශ්වවිද්‍යාලය.

වැලරි ක්ලාක් (Valerie Clarke), විශ්වවිද්‍යාල පුස්තකාලාධිපති, බටහිර ඉන්දීය කොදෙව් විශ්වවිද්‍යාලය, කේව් හිල් විශ්වවිද්‍යාලය.

පළමු සංස්කරණය

දායකත්වය ලබා දුන් පිරිස

විෂයමාලාව සැකසීම සඳහා උපායමාර්ග පිළිබඳ උපදෙස් ලබා දීම සඳහා වූ අන්තර්ජාතික විශේෂඥ කණ්ඩායම් හමුව

ඇල්බට් කේ. බොක්හෝස්ට් (Albert K. Boekhorst), බාහිර මහාචාර්ය, තොරතුරු විද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රෙටෝරියා විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

බන්දුල පී. දයාරත්න (Bandula P.Dayarathne) , උපාධිධාරී ගුරු සහ විෂයමාලා සංවර්ධක, ජාතික අධ්‍යාපන ආයතනය සහ මාධ්‍යය අධ්‍යාපන බාහිර කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

කාර්මිලා ෆ්ලොයිඩ් (Carmilla Floyd), ලේඛක, මාධ්‍යවේදී සහ මාධ්‍ය පුහුණුකරු, ස්ටොක්හෝම්, ස්විඩනය.

කැරොලින් පොන්ටෆ්‍රැක්ට් (Caroline Pontefract), ගුරු අධ්‍යාපන අංශ ප්‍රධානී, යුනෙස්කෝ, පැරිස්.

කැරොලින් විල්සන් (Carolyn Wilson), සභාපති, මාධ්‍ය සාක්ෂරතා සංගමය (AML), ඔන්ටාරියෝ, කැනඩාව සහ උපදේශක,ඔන්ටාරියෝ අධ්‍යාපන අධ්‍යයන ආයතනය, ටොරොන්ටෝ විශ්වවිද්‍යාලය, කැනඩාව.

කේ. චන්ග් (K.Cheung), ගුරු පුහුණුකරු, අධ්‍යාපන පීඨය. හොංකොං විශ්වවිද්‍යාලය, චීනය.

ඩිවිනා ෆ්‍රාව් මේග්ස් (Divina Frau-Meigs), උප සභාපති, මාධ්‍යය සහ සන්නිවේදන පර්යේෂණ සඳහා ජාත්‍යන්තර සංගමය (IAMCR), පැරිස් විශ්වවිද්‍යාලය - සෝබෝන්, ප්‍රංශය.

එව්ලින් බෙවෝර් (Evelyne Bevort) , නියෝජ්‍ය අධ්‍යක්ෂක, සෙන්ටර් දි ලයිසන් දි එන්සෙයින්මන්ට් සහ දෙස් මොයෙන්ස් ඩී ඉන්ෆොමේෂන්(CLEMI),පැරිස්, ප්‍රංශය.

ෆැක්සන් බන්ඩා (Fackson Banda), SAB ලිමිටඩ් - යුනෙස්කෝ මාධ්‍ය සහ ප්‍රජාතන්ත්‍රවාදයේ සභාපති, රෝඩ්ස් විශ්වවිද්‍යාලය, ග්‍රැහැම්ස්ටවුන්, දකුණු අප්‍රිකාව.

හෙසුස් ලාඕ (Jesus Lau), අධ්‍යක්ෂක, USBI VER පුස්තකාලය, යුනිවර්සිඩාඩ් වෙරකෘසානා, මෙක්සිකෝව.

ජෝදි ටොරෙන්ට් (Jordi Torrent), ව්‍යාපෘති කළමනාකරු, මාධ්‍ය සාක්ෂරතා අධ්‍යාපනය, ශිෂ්ටාචාර සන්ධානය, එක්සත් ජාතීන්ගේ සංවිධානය.

හොසේ මනුවෙල් පෙරෙස් තොරනෙරෝ (Jose Manuel Perez Tornero), උප සභාපති, නරඹන්නන්ගේ උනන්දුව සඳහා යුරෝපීය සංගමය (EAVI), ප්‍රධාන ලේකම්, මාධ්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (උපදේශක), යුනිවර්සිඩාඩ් ඔටෝනොමා දෙ බාසිලෝනා, ස්පාඤ්ඤය.

ක්වාමේ අකියම්පොන්ග් (Kwame Akyempong), නියෝජ්‍ය අධ්‍යක්ෂක, ජාත්‍යන්තර අධ්‍යාපන මධ්‍යස්ථානය, සසෙක්ස් විශ්වවිද්‍යාලය, බ්‍රයිටන්, එක්සත් රාජධානිය.

මනුවෙල් කින්තෙරෝ (Manuel Quintero), අධ්‍යක්ෂක ජෙනරාල්, ඉන්ස්ටිටියුටෝ ලැටිනැමෙරිකානෝ දෙ ලා කොමියුනිකේශන් එඩියුකැටිවා, මෙක්සිකෝව.

මරියා එස්ටර් මැන්සෙබෝ (Maria Ester Mancebo), අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳ මහාචාර්ය, යුනිවර්සඩාඩ් දෙ ලා රිපබ්ලික් , මොන්ටෙවීඩියෝ උරුගුවේ.

මාර්ටින් හැඩ්ලෝ (Martin Hadlow), අධ්‍යක්ෂක, සන්නිවේදන හා සමාජ වෙනස්වීම් සඳහා මධ්‍යස්ථානය, ජනමාධ්‍ය හා සන්නිවේදන පාසල, ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලය, බ්‍රිස්බේන්, ඕස්ට්‍රේලියාව.

නොඑල් චිකියුකියූ (Noel Chicuecue), ජාතික වෘත්තීය නිලධාරී, යුනෙස්කෝ, මොසැම්බික්.

පෙනී මුවර් (Penny Moore), අධ්‍යාපන පර්යේෂණ උපදේශක සහ විධායක අධ්‍යක්ෂක, ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපති සංගමය, වෙලිංටන්, නවසීලන්තය.

රාමොන් ආර් ටුවේසොන් (Ramon R. Tuazon), සභාපතී, සන්නිවේදනය සඳහා වූ තාක්ෂණික කමිටුව, උසස් අධ්‍යාපන කොමිෂන් සභාව (CHED) සහ සභාපති, ජනමාධ්‍ය හා සන්නිවේදනය පිළිබඳ ආසියානු ආයතනය, පිලිපීනය.

රාෂා ඕමාර් (Rasha Omar), අධ්‍යක්ෂක, විද්‍යා තාක්ෂණ ධාවන පථය, පලස්තීන විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, රමල්ලා, පලස්තීන බල ප්‍රදේශ.

රෙනාටෝ ඔපර්ටි (Renato Opertti), ජාත්‍යන්තර අධ්‍යාපන කාර්යාංශය, යුනෙස්කෝ ජිනීවා.

සමී ටෙයී (Samy Tayie), සභාපතී, මධ්‍යම අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (MENTOR), කයිරෝ, ඊජිප්තුව.

තුසැන් චිටිචි (Toussaint Tchitchi) අබෝමී විශ්වවිද්‍යාලය - කැලවි, බෙනින්.

විෂයමාලාවේ මුල්ම කෙටුම්පත විචාරය සඳහා වූ අන්තර්ජාතික විශේෂඥ කණ්ඩායමේ දෙවන හමුව

ඇනා නායිඩු (Ana Naidoo), නියෝජ්‍ය පීඨාධිපති, අධ්‍යාපන පීඨය, ප්‍රිටෝරියා විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

අසීම් අබ්දුල් සට්ටර් (Asim Abdul Sattar), පීඨාධිපති, අධ්‍යාපන පීඨය, මාලදිවයින් උසස් අධ්‍යාපන විද්‍යාලය, මාලදිවයින.

සී.කේ. චුන්ග් (C.K.Cheung), ගුරු පුහුණුකරු, අධ්‍යාපන පීඨය, හොංකොං විශ්වවිද්‍යාලය, චීනය.

කැරොලින් විල්සන් (Carolyn Wilson), සභාපති, මාධ්‍ය සාක්ෂරතා සංගමය (AML), ඔන්ටාරියෝ, කැනඩාව සහ උපදේශක, ඔන්ටාරියෝ අධ්‍යාපන අධ්‍යයන ආයතනය, ටොරොන්ටෝ විශ්වවිද්‍යාලය, කැනඩාව.

ක්ලෙමෙන්ට් ලැම්බර්ට් (Clement Lambert), කථිකාචාර්ය, භාෂා කලා /සාක්ෂරතා අධ්‍යාපනය, බටහිර ඉන්දීය කොදෙව් අධ්‍යාපන විශ්වවිද්‍යාලය, ජැමෙයිකාව.

ජෝදි ටොරෙන්ට් (Jordi Torrent), ව්‍යාපෘති කළමනාකරු, මාධ්‍ය සාක්ෂරතා අධ්‍යාපනය, ශිෂ්ටාචාර සන්ධානය, එක්සත් ජාතීන්ගේ සන්ධානය.

ජුටා ක්‍රෝල් (Jutta Croll), කළමනාකරණ අධ්‍යක්ෂක, ස්ටිෆ්ටන් ඩිජිටල් චැන්සන්, බර්ලින්, ජර්මනිය.

ක්වමේ අකියම්පොන්ග් (Kwame Akyempong), නියෝජ්‍ය අධ්‍යක්ෂක, ජාත්‍යන්තර අධ්‍යාපන මධ්‍යස්ථානය, සසෙක්ස් විශ්වවිද්‍යාලය, බ්‍රයිටන්, එක්සත් රාජධානිය.

මවුනා බෙන්ස්ලිමාන් (Mouna Benslimane) , ගුරුවරයා, තොරතුරු විද්‍යා පාසල, මොරොක්කෝව.

ප ලුන්ග්‍රෙන් (Per Lundgren), සාමාජික, අධ්‍යක්ෂක මණ්ඩලය, ළමා හා තරුණ මාධ්‍ය පිළිබඳ ලෝක සමුළුව, කාල්ස්ටඩ්, ස්වීඩනය.

රමොන් ආර් ටුසන් (Ramon R. Tuazon), සභාපති, සන්නිවේදනය සඳහා වූ තාක්ෂණික කමිටුව, උසස් අධ්‍යාපන කොමිෂන් සභාව (CHED) සහ සභාපති, ජනමාධ්‍ය හා සන්නිවේදනය පිළිබඳ ආසියානු ආයතනය, පිලිපීනය.

රෙනාටෝ ඔපෙරති (Renato Opertti), වැඩසටහන් විශේෂඥ, ජාත්‍යන්තර අධ්‍යාපන කාර්යාංශය, යුනෙස්කෝ, ජිනීවා.

රොක්සානා මෝඩුකොවික්ස් (Roxana Morduchowicz), අධ්‍යක්ෂක ඩෙල් වැඩසටහන එස්කියුලා වයි මෙඩියෝ ඩෙල් මිනිස්ටෙරියෝ දෙ එඩියුකේශන් දෙ ලා නේශන්, බුවනෝස් අයර්ස්, ආර්ජන්ටිනාව.

සුසාන් මෝලර් (Susan Moeller), අධ්‍යක්ෂක, මාධ්‍ය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ මහජන න්‍යාය පත්‍රය (ICMPA), සල්ස්බර්ග්, ඔස්ට්‍රියාව.

දකුණු අප්‍රිකානු කලාපය, ලතින් ඇමරිකාව, කැරිබියානු කලාපය සහ දකුණු ආසියාව සඳහා කලාපීය වශයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු සහ උපදේශන මාලාව

දකුණු අප්‍රිකානු කලාපය

ඇලන් චයිඩා (Allen Chaida), කථිකාචාර්ය, කැප්රිවි අධ්‍යාපන විද්‍යාලය, නැමීබියාව.

ඇනා නයිඩෝ (Ana Naidoo), නියෝජ්‍ය පීඨාධිපති, අධ්‍යාපන පීඨය, ප්‍රිටෝරියා විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව..

ඇන්ඩෲ ස්ටීවන්ස් (Andrew Stevens), කථිකාචාර්ය, රෝඩ්ස් විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

එලිසබත් බ්‍රවුන් (Elizabeth Brown), කථිකාචාර්ය, නැමීබියා විශ්වවිද්‍යාලය, නැමීබියාව.

ගෙහාඩ් නලන්ගී (Gerhard Ngalangi), කථිකාචාර්ය, රුණ්ඩු අධ්‍යාපන විද්‍යාලය, නැමීබියාව.

ගෙරිට් ස්ටෝල්ස් (Gerrit Stols), ප්‍රිටෝරියා විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

ඉනා ෆුරි (Ina Fourie), සහකාර මහාචාර්ය, තොරතුරු විද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රිටෝරියා විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

ජොහාන් වාන් වයික් (Johan Van Wyk), පුස්තකාලයාධිපති, ප්‍රිටෝරියා විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

ජෝන් නියම්බේ (John Nyambe), ජාතික අධ්‍යාපන සංවර්ධන ආයතනය, නැමීබියාව.

ලෙස් මීරිං (Les Meiring), කථිකාචාර්ය, නෙල්සන් මැන්ඩෙලා මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය, පෝට් එලිසබෙත්, දකුණු අප්‍රිකාව.

මබටව්න් මෙටිසින් (Mabataung Metsing), ජාතික විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය, දකුණු අප්‍රිකාව

මෆාටා පෝල් මෆාටා (Mafata Paul Mafata), ලෙසෝතෝ අධ්‍යාපන විද්‍යාලය, ලෙසොතෝ.

මැන්ඩි උයිස් (Mandie Uys), කථිකාචාර්ය, වයඹ විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

මරියැන් හික්ස් (Marianne Hicks), කථිකාචාර්ය, ජාත්‍යන්තර අධ්‍යයනය, මොනාෂ් විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

මේරි ඈන් හූඩ් (Mary Anne Hood), කථිකාචාර්ය, ෆෝර්ට් හාරේ විශ්වවිද්‍යාලය, නැගෙනහිර ලන්ඩනය, දකුණු අප්‍රිකාව.

මරිනා රූඩ්ට් (Maryna Roodt), කථිකාචාර්ය, මධ්‍යම තාක්ෂණ විශ්වවිද්‍යාලය, බ්ලූම්ෆොන්ටේන්, දකුණු අප්‍රිකාව.

මුසා ලොෆෙ (Musa Hlophe), ගණිත විෂයමාලා නිර්මාණකරු, NCC ජාතික විෂයමාලා මධ්‍යස්ථානයේ තොරතුරු සඳහා දකුණු අප්‍රිකාවේ වගකිව යුතු, දකුණු අප්‍රිකාව.

පෙන්තකොස්ත් නඛෝමා (Pentecost Nkhoma), කථිකාචාර්ය, ටශ්වේන් තාක්ෂණ විශ්වවිද්‍යාලය, ප්‍රිටෝරියා, දකුණු අප්‍රිකාව.

ෆයින්ඩල් මුරීන් නක්සුමලෝ (Phindile Maureen Nxumalo), අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධානි, විලියම් පිචර් විද්‍යාලය.

සිකොන්සිල් එන්ඩ්ලොව් (Sikhonzil Ndlovu), මාධ්‍ය පුහණුකරු, ස්ත්‍රී පුරුෂ සමාභාවී සම්බන්ධතා, ජොහැන්ස්බර්ග්, දකුණු අප්‍රිකාව.

ටුලොන්ගා හිනොක් (Tulonga Henoch), කථිකාචාර්ය, ඔන්ග්වෙඩිවා අධ්‍යාපන විද්‍යාලය, නැමීබියාව

වෑන් හර්ඩන්, කථිකාචාර්ය, බටහිර කේප් විශ්වවිද්‍යාලය, දකුණු අප්‍රිකාව.

වැන්ඩිල් සිෆන්ඩ්සා (Wandile Sifundza), ස්වාසිලන්ත ජාතික ගුරු සංගමය SNAT පුවත්පත් කර්තෘ

ලතින් ඇමරිකාව සහ කැරිබියානු කලාපය

බාබරා ෆොස්ටර් (Barbara Foster), සම්බන්ධීකාරක, බටහිර ඉන්දීය කොදෙව් විශ්වවිද්‍යාලය.

බොබ් හැරිස් (Bob Harris), නිදහස් මාධ්‍යවේදී, PBC ටීවී, කිංග්ස්ටන්, ජැමෙයිකාව.

කැතරින් ගිබ්සන් (Catherine Gibson), ව්‍යාපාර අධ්‍යයන උපදේශක, ඒඩිස්ටන් ගුරු පුහුණු විද්‍යාලය, බාබඩෝස්.

ඩාලියා පාමර් (Dahlia Palmer), කථිකාචාර්ය. ෂෝට්වුඩ් ගුරු විද්‍යාලය, කින්ග්ස්ටන්, ජැමෙයිකාව.

ඩෙබ්‍රා ෆ්‍රැන්සිස් (Deborah Francis) , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශාන්ත ජෝසප් ගුරුවරු, කින්ග්ස්ටන්, ජැමෙයිකාව.

එරිකා වාස්කේස් (Erika Vasquez), අධ්‍යක්ෂ සහ මූලික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික විශ්වවිද්‍යාලය, කොස්ටරිකා.

එරිකා වෝල්කර් (Erika Walker), සන්නිවේදන සහ තොරතුරු සඳහා ජාතික වැඩසටහන් නිලධාරිනි, යුනෙස්කෝ, කිංග්ස්ටන්, ජැමෙයිකාව.

ජිලියන් බර්නාඩ් (Gillian Bernard), උපදේශක, යුනෙස්කෝ, කිංග්ස්ටන්, ජැමෙයිකාව.

හිර්ෆා මොරිසන් (Hirfa Morrison) , විද්‍යාලයීය පුස්තකාධිපති, එක්සෙල්සියර් ප්‍රජා විද්‍යාලය, කිංග්ස්ටන්, ජැමෙයිකාව.

ඉසිද්රෝ, ෆර්නැන්දෙස්-අබාලි (Isidro Fernandez-Aballi), කැරිබියන් සඳහා උපදේශක තොරතුරු සහ සන්නිවේදනය, යුනෙස්කෝ, කිංග්ස්ටන්, ජැමෙයිකාව.

ජැක්ලින් මොරිස් (Jacqueline Morris), කථිකාචාර්ය, ට්‍රිනිඩෑඩන්ඩ් සහ ටොබාගෝ විශ්වවිද්‍යාලය.

ජෙනිෆර් පාමර් ක්‍රෆර්ඩ් (Jennifer Palmer Crawford), දෙපාර්තමේන්තු ප්‍රධානි, ගුරු අධ්‍යාපනය, ක්ලැරන්ස් ෆිට්ස්රෝයි බ්‍රයන්ට් විද්‍යාලය, ග්වඩලූප්.

ජෝසෆ් මැකෙන්සි (Joseph Mckenzie), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,මොනීජ් ගුරු විද්‍යාලය, ජැමෙයිකාව

ලින්ඩා රොසෙන්බෝල්ඩ් (Linda Rozenbald), ගුරු අධ්‍යාපනඥ, උසස් ගුරු පුහුණු විද්‍යාලය, ලේස්වෙග්, සුරිනම්.

ලයනල් ඩග්ලස් (Lionel Douglas), සහකාර මහාචාර්ය, ට්‍රිනිඩෑඩ් විශ්වවිද්‍යාලය, ටොබාගෝ

ලොරේන් ජොනෙත් කැම්ප්බෙල් (Lorraine Jeanette Campbell), අධ්‍යාපන අධ්‍යක්ෂක, එඩ්නා මැන්ලි දෘශ්‍ය සහ රංගකලා විද්‍යාලය, කින්ග්ස්ටන්, ජැමෙයිකාව.

මාර්ලන් ඩික්සන් (Marlon Dixon), කැමරා ශිල්පියා, PBCTV, කිංග්ස්ටන්, ජැමෙයිකාව.

මෙලඩි පාමර් (Melody Palmer), වැඩසටහන් කළමනාකරු සහ ජාල සම්බන්ධීකාරක, ICT4D, ජැමෙයිකාව.

රෝයිස්ටන් එම්මැනුවෙල් (Royston Emmanuel), කථිකාචාර්ය, සර් ආතර් ලුවිස් කොමියුනිටි විද්‍යාලය, ශාන්ත ලුසියා.

සෝනියා බෙනට් - කනින්හැම් (Sonia Bennet - Cunningham), ප්‍රධාන අධ්‍යක්ෂක, VTDI, HEART Trust/NTA, කිංග්ස්ටන්, ජැමෙයිකාව.

සිල්වියා ජේම්ස්- මිචෙල් (Sylvia James-Mitchell), කථිකාචාර්ය, ටී.ඒ.මේරිෂෝ කොමියුනිකේෂන් විද්‍යාලය, ග්‍රෙනාඩා.

වලෙන්තින් තෙලෙමක් (Valentine Telemaque), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපදේශක, ඊසාන දිග විස්තීර්ණ පාසල, වෙස්ලි, ඩොමිනිකා.

සෙලින් ජෙනින්ග්ස්- ක්‍රේග් (Zellyne Jennings-Craig), අධ්‍යක්ෂක, අධ්‍යාපන පාසල, බටහිර ඉන්දීය කොදෙව් විශ්වවිද්‍යාලය, මොනා, ජැමෙයිකාව.

දකුණු ආසියාව

අබ්දුල් රෂීඩ් අලි (Abdul Rasheed Ali), පීඨාධිපති, කලා පීඨය, මාලදිවයින් උසස් අධ්‍යාපන විද්‍යාලය, මාලේ, මාලදිවයින.

අන්ජුම් සියා (Anjum Zia), සභාපති, D/O ජන සන්නිවේදනය, කාන්තාවන් සඳහා ලාහෝර් විශ්වවිද්‍යාලය, පකිස්තානය.

ඇන්තනී ද සිල්වා (Anthony D'Silva), නොට්රේ ඩෑම් අධ්‍යාපන ආයතනය, කරච්චි, පකිස්තානය.

අරුල් සෙල්වන් (Arul Selvan), සහකාර මහාචාර්ය, ජනමාධ්‍ය පාසල සහ නව මාධ්‍ය ආයතනය, IGNOU, නව දිල්ලි, ඉන්දියාව.

බ්‍රාසා ගෝපල් භෝමික් (Braza Gopal Bhowmick), ලේකම්, ජාතික විෂයමාලා සහ පෙළ පොත් මණ්ඩලය, බංග්ලාදේශය.

ඉමා නාර්යන් ශ්‍රේස්තා (Ima Naryan Shrestha), පුහුණු නිලධාරිනි, අධ්‍යාපන සංවර්ධන ජාතික මධ්‍යස්ථානය (NCED), නේපාලය.

ජිග්මේ චෝඩන් (Jigme Choden), තොරතුරු හා සන්නිවේදන පාසල, තිම්පු, භූතානය.

මහාලක්ෂ්මි ජයරාම් (Mahalakshmi Jayaram), හිටපු පීඨාධිපති, ජනමාධ්‍ය පිළිබඳ ආසියා විද්‍යාලය, චෙන්නායි.

මොහොමඩ් අක්තාර් සිද්දිකි (Mohammad Akhtar Siddiqui), සභාපති, ගුරු අධ්‍යාපනය සඳහා වූ ජාතික කවුන්සිලය (NCTE), නව දිල්ලිය, ඉන්දියාව.

ප්‍රදීපා විජේතුංග (Pradeepa Wijetunge), අධ්‍යක්ෂක, ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය, (NILIS), කොළඹ, ශ්‍රී ලංකාව.

ප්‍රමිලා ගමගේ (Premila Gamage), පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS), කොළඹ, ශ්‍රී ලංකාව.

රයිහානා තස්ලිම් (Rayhana Taslim), සහකාර මහාචාර්ය, ගුරු අභ්‍යාස විද්‍යාලය, ඩකා, බංග්ලාදේශය.

ෂාමීම් රිසා (Shameem Reza), සහකාර මහාචාර්ය, ජන සන්නිවේදන හා ජනමාධ්‍ය අංශය, ඩකා විශ්වවිද්‍යාලය, බංගලාදේශය.

ශ්‍රීරාම් ලමිච්චනේ (Shreeram Lamichhane), ගුරු අභ්‍යාස ආයතනය, නේපාලය.

ශුහුධා රිස්වාන් (Shuhudha Rizwan), අධ්‍යාපන සංවර්ධන නිලධාරී, අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය, අධ්‍යාපන අමාත්‍යාංශය, මාලේ, මාලදිවයින.

යෙෂී යන්ග් (Yeshey Yang), ප්‍රතිපත්ති සහ සැලසුම් නිලධාරී, තොරතුරු සන්නිවේදන අමාත්‍යාංශය, තිම්පු, භූතානය.

unesco

United Nations
Educational, Scientific
and Cultural Organization

"මෙම ව්‍යවස්ථාවෙහි පාර්ශ්වකාර රාජ්‍ය, වාස්තවික සත්‍යය කරා නිර්බාධිත සොයා යෑමෙහි ලා සහ, දැනුම සහ අදහස් නිදහසේ හුවමාරු කරගැනීමෙහි ලා සැමට අධ්‍යාපනය සඳහා වන පූර්ණ සහ සමාන අවස්ථා පිළිබඳ විශ්වාසය තබමින්, සිය ජනතාව අතර සන්නිවේදන මාර්ග ගොඩනැගීම සහ ඉහළ නැංවීම සඳහාත්, අන්‍යොන්‍ය අවබෝධය සහ එකිනෙකාගේ ජීවිත පිළිබඳව වඩාත් සත්‍යවාදී සහ වඩාත් පරිපූර්ණ දැනුමක් අත්කරගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට මෙම මාර්ග යොදා ගැනීම සඳහාත් එකඟව අධිෂ්ඨාන කර ගන්නාහ."

- යුනෙස්කෝ ව්‍යවස්ථාවෙන් උපුටා ගන්නා ලදි

"මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව යනු සදාචාරාත්මක හා පුරවැසි අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය මානයකි. එමෙන්ම එය ලෝකයේ ඕනෑම රටක වෙසෙන සෑම පුරවැසියෙකුගේම මූලික අයිතිවාසිකමක් වන අතර එබැවින් එය, තාක්ෂණික පරිසරය වඩ වඩාත් සීඝ්‍රයෙන් වෙනස්වන සමාජයක ස්වකීය පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමට සහ, සමාජය තුළ තමන්ට හිමි ස්ථානය සොයා ගැනීමට සෑම පුද්ගලයකුම සබල කරයි".

- ඔද්‍රේ අසූලෙ, අධ්‍යක්ෂ ජනරාල්, යුනෙස්කෝ සංවිධානය,
සර්බියාවේ බෙල්ග්‍රේඩ්හි දී, 2019 සැප්තැම්බර් මස 13 වන දින පැවති
මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලාව පිළිබඳ
ජාත්‍යන්තර උපදේශක රැස්වීමේ දී